ආයුර්වේද ඖෂධ සංග්‍රහය

ප්‍රථම භාගය

පළමුවන කොටස

ආයුර්වේද දෙපාර්තමේන්තු ප්‍රකාශනයකි



ජීවක වෙදැදුරු බුදුරදුන්ට බෙහෙත් ගැල්වූ මහනෙල්මල් තුනක්
ආඝ්‍රාණය කරවා විරේචනය කරවූ වගයි
(පෙරවදන xxiii වන පිටුව හා පරිශිෂ්ට 298 පිටුව බලන්න.)

"The great Physician Jeevaka made the Lord Buddha to smell three medicated Blue Lamses & causing purification of Bowels"

(vide Sinhalese introduction page XXX & appendix page 298

ආයුර්වේද ඖෂධ සංග්‍රහය

ප්‍රථම පියවර

පළමුවන කොටස

සංශෝධනය
2008 | 20
2009
2012
2018

1961 අංක 31 දරන ආයුර්වේද පනත

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ අංක 41 (2) (ඇ)
"ආයුර්වේද ඖ ධ කිරීම"
යන
ආයුර්වේ මයෙන්
ඖෂධ සංග්‍රහ කමිටුව මගින් සකස් කරන ලදී.

013726
GWAIL

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

ප්‍රවේශ අංකය 13726
වර්ග අංකය 615.11 AYU

ආයුර්වේද ඖෂධ සංග්‍රහය

හැඳින්වීම

1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ 89 ඡේදයෙහි එන අර්ථ නිරූපනය යටතේ ''ආයුර්වේද'' යන නාමය ආයුර්වේද, සිද්ධ, යුනානි යන වෛද්‍ය ක්‍රම තුනටම සංගෘහිත නාමයක් වශයෙන් හඳුන්වා ඇත. ''ආයුර්වේද ඖෂධ සංග්‍රහය'' වශයෙන් හැඳින්වෙන මෙම ග්‍රන්ථයට ආයුර්වේද, සිද්ධ හා යුනානි කාණ්ඩ තුනම ඇතුළත් කරන්නට යෙදුනේ එහෙයිනි.

ආයුර්වේද පනතේ පූර්විකාවෙහි එම පනත නීතිගත කිරීමේ පරමාර්ථ සඳහන් වේ. ''ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ ශාලා සහ ආයුර්වේද බෙහෙත් ගබඩා ලියා පදිංචි කිරීම සඳහා ද ....ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයට හා ආයුර්වේද මහාරෝග්‍යශාලාවට ද. ඊට සම්බන්ධ ඖෂධ නිෂ්පාදනාගාරයට ද, ඖෂධ නිධියට හා ඖෂධ ශාලාවට ද, අදළ වන යම් යම් කටයුතු ඉෂ්ට කිරීම සඳහා ද. ....''ආයුර්වේදය පිළිබඳ පර්යේෂණයට යම් යම් කටයුතු ඉෂ්ට කිරීම සඳහා ද,...... ....'' යනු එම පරමාර්ථයන්ගෙන් සමහරකි. මෙම පරමාර්ථයන් ඉෂ්ට කරගැනීමට නව මූලික අවශ්‍යතාවයක් සපුරා ගත යුතුය. එනම්: පොදු වශයෙන් භාවිතය සඳහා සම්මත කර ගත් ආයුර්වේද, සිද්ධ හා යුනානි ඖෂධ පන්තියක් සකස් කිරීමය. ආඥ පනතින් ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බලතල අනුව ආයුර්වේදය දියුණු කිරීමෙහි ලා ගතයුතු නා නා පියවර ගැනීමට චිකිත්සාව—ඖෂධ නිෂ්පාදන ද්‍රව්‍ය පරිහරණය—කිරුම් මැණුම් යෙදුම ආදියෙහි කිසියම් විනයක් අවශ්‍ය වේ. එසේ විනයක් සකස් කර ගැනීම ආයුර්වේද ඖෂධ සංග්‍රහය ආරම්භ කිරීමේ මූලික පරමාර්ථයක් බව සඳහන් කරනු කැමැත්තෙමි. ආඥ පනතේ 41 වෙනි ඡේදයෙහි 2 ''ඇ'' කොටසින් ආයුර්වේද ඖෂධ සංග්‍රහය සකස් කිරීම හා ප්‍රසිද්ධ කිරීම'' ද ''ඇ'' කොටසින් ''ආයුර්වේද ඖෂධ ප්‍රමිත කිරීම සඳහා ද''—ආඥ පනත යටතේ සංස්ථාපනය වන පර්යේෂණ කාරක සභාවට නීති ප්‍රකාර බලය පැවරේ. මෙම ආයුර්වේද ඖෂධ සංග්‍රහය ආයුර්වේද ඖෂධ සම්බන්ධ පැන නැගෙන ඊට විෂය වන සෑම ප්‍රශ්නයක දී ම නීතිමය වශයෙන් දක්විය හැකි අවසාන තීරණය වශයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

පාමකෝපියා යන වචනය ග්‍රීක ''පාමකෝන්''=ඖෂධය, සහ ''පොයිකො''=සකස් කිරීම—යන වචන වලින් සැදුණකි. පාමකෝපියා ග්‍රන්ථයක් වූ කලී එය නිකුත් කිරීමට ව්‍යවස්ථාපිත බලය ඇති බලධාරියකු හෝ බල මණ්ඩලයක් විසින්, ඒකීය හා මිශ්‍ර ඖෂධවල අඩංගු ගුණ පිළිබඳ විස්තර සහිතව ප්‍රමාණ අනුකූලව තත් ඖෂධ යෙදෙන සංයෝගයන් පැහැදිළි ලෙස දක්වන්නකි.- චිකිත්සාවල යොදන විවිධ සංයෝගයන් සංස්කරණයෙහි ඒකාකාර සමානාත්මතාවයක් ඇති කිරීම හා සංයෝගයන්හි යොදන ඖෂධ. යන්හි ඖෂධ ප්‍රමාණයන්ගේ ශක්තිය පිරිසිදු බව හා හානිකර නොවන බව ආරක්ෂා කිරීම ද, චිකිත්සා ලබන රෝගියාගේත්—චිකිත්සා යොදන වෛද්‍යවරයාගේත් ආරක්ෂාව සැලැස්වීම ද එවන් පාමකෝපියා ග්‍රන්ථයක වෙනත් පරමාර්ථයන් වේ. තදසන්න කාලය දක්වා වූ වෛද්‍ය චිකිත්සාවෙහි ප්‍රගතිය පෙන්වීම හා ගුණදායක වූ හා ගුණ පක්ෂය ස්ඵුට වූ පැරණි චිකිත්සා ක්‍රම බාහිර වශයෙන් ඇලි ගත් සැක සහිත කොටස් ඉවත්කොට ඇතුළත් කිරීම පාමකෝපියා සකස් කිරීමේදී සාමාන්‍යයෙන් කරනු ලැබේ.

වෛද්‍ය විද්‍යාව දියුණු වූ සෑම රටකම පාහේ පොදු වශයෙන් සම්මත පාමකෝපියා ග්‍රන්ථ තිබේ. එක්සත් රාජධානියේ—''බ්‍රිටිෂ් පාමකෝපියා'' (1963) ඇමෙරිකා එක්සත් ජනපදයේ—''යුනයිටඩ් ස්ටේට්ස් පාමකෝපියා, ඉන්දියාවේ ''පාමකෝපියා ඔප් ඉන්ඩියා'' 1953—ජගත් සෞඛ්‍ය සංවිධානයේ—''ඉන්ටනැෂනල් පාමකෝපියා'' I, II නිදසුන් වෙති. රටක භාවිතයේ පවතින සෑම චිකිත්සා යෝගයක්ම පාමකෝපියාවට ඇතුළත් කළ නොහැකිය. කල්යාමේදී ඒ ඒ වෛද්‍යවරුන්, වෛද්‍ය සමාගම හෝ වෛද්‍ය පරම්පරා විසින් ගුණ සම්ප්‍රදයයන් ආශ්‍රයෙන් පොදු සම්මත වශයෙන් පිළිගත හැකි යෝගයන් පාමකෝපියා වලට ඇතුළත් වේ. එසේ ප්‍රධාන පාමකෝපියාවට ඇතුළු කරන තුරු එවැනි යෝග වෙනම අනු ග්‍රන්ථ ලෙස භාවිත වේ. එක්සත් රාජධානියේ බ්‍රිටිෂ්

පාමසියුටිකල් කෝඩෙක්ස්, බ්‍රිටිෂ් ෆෝමියුලරි, ඉන්දියාවේ ඉන්ඩියන් පාමසියුටිකල් කෝඩෙක්ස් නිදසුනි. එනයින් බලන කල වෛද්‍ය විද්‍යාවේ ඉදිරි ගමන පෙරට යනතාක් පාමකෝපියා ග්‍රන්ථ ද වෙනස් වෙමින් හා සකස් වෙමින් ඉදිරියට යන්නේය. ඒ කවර රටකට හෝ ජාතියකට හෝ අවුරුදු කීපයක් තුළදී අංග සම්පූර්ණ හා නො වෙනස්වන සුලු පාමකෝපියා ග්‍රන්ථයක් සකස් කළ නො හැක. එක්සත් රාජධානියේ 1963 මුද්‍රිත පාමකෝපියාව ඒ මුහුණුවර ගැනීමට සියවස් තුනක් ගත විය. එහි ආරම්භය 1542 දී ඇපොතිකරිවරුන් සකස් කළ දේශීය වට්ටෝරු ග්‍රන්ථයකි. 1618 දී කොලේජ් ඔෆ් ෆිසිෂන්ස් නමින් හැඳින්වුණු වෛද්‍යවරුන්ගේ සංවිධානයෙන් නිකුත් වූ පාමකෝපියාව නූතන බ්‍රිටිෂ් පාමකෝපියාවේ ආදි පිතෘ ග්‍රන්ථය වුව ද, මුල් ස්වරූපය සම්පූර්ණයෙන්ම පාහේ නව ග්‍රන්ථයෙහි මැකී ගොස් ඇත. මෙම විස්තරය කළේ අප විසින් සකස් කොට ඉදිරිපත් කරන ඖෂධ සංග්‍රහයෙන් අපේක්ෂා කෙරෙන්නේ ආයුර්වේද ඖෂධ චිකිත්සා විෂයයෙහි කිසියම් මූලික විනයක් ඇති කිරීමට බවද මෙම සංග්‍රහය කලින් කලට වෙනස්වන බවද, විශේෂයෙන් විද්‍යානුකූල විශ්ලේෂණ අනුව මෙහි අඩංගු සෑම කොටසක්ම පාහේ ඉදිරියට වෙනස් විය හැකි බවද අවධාරණයෙන් පැහැදිලි කිරීමට ය.

ආයුර්වේද ඖෂධ සංග්‍රහය

වර්ෂ 1930-1932 අතර තුර කාලයේදී එවකට පැවැති සමස්ත ලංකායුර්වේද මහා සම්මේලනයේ අධිකාරිහු ආයුර්වේද පාමකෝපියා ග්‍රන්ථයක අවශ්‍යතාව ගැන නොයෙක් වර සාකච්ඡා කළහ. යෝජනා ද සම්මත කළහ. එහෙත් ඒ සඳහා නිසි පියවරෙක් නො ගැනිණ. ඒ සාකච්ඡාවන්හි මාතෘකාව වූයේ ද ''ආයුර්වේද පාමකෝපියාවක්'' යන වචනයයි. මෙහි ආරම්භයෙහි දී ම ඒ වචනය භාවිත කරණ ලද්දේ අතීතය සිහියට නැංවීම පිණිසය.

ලංකාවේ ආයුර්වේද අධ්‍යාපනය හා එම චිකිත්සා ක්‍රමයත් සංවර්ධනය කිරීම පිණිස යෝජනා ක්‍රමයක් සම්පාදනය සඳහා 1946 වර්ෂයේදී දස්ගුප්ත කොමිෂන් සභාව පත් කරණ ලදී. එම කොමිෂන් සභාවේ පළමුවන රැස්වීම 1946 නොවැම්බර් මස 27 වෙනි දින කොළඹ දී පැවැත්විණ. මහනුවර ආයුර්වේද වෛද්‍ය සංගමය මගින් දස්ගුප්ත කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරණ ලද (1946.11.16 දරණ) සංදේශයෙන් ද සමස්ත ලංකායුර්වේද මහා සම්මේලන සභාවේ 1946 දෙසැම්බර් මස දරණ සංදේශයෙන් ද රජයේ ආයුර්වේද විද්‍යාලීය උපාධිධාරීන්ගේ සංගමය වන ස්වදේශීය වෛද්‍ය සංගමය මගින් ද රජයේ පාලනයෙන් ආයුර්වේද පාමකෝපියා ග්‍රන්ථයක් සම්පාදනය කරණ ලෙස ඉල්ලා සිටියහ. එහෙත් එම ඉල්ලීම ක්‍රියාත්මක නො වූයේය.

1950 අගෝස්තු මාසයෙහි දී ගරු ඒ. රත්නායක (වර්තමාන උත්තර මන්ත්‍රී සභාවේ ගරු සභාපති) මැතිතුමා සහ මහනුවර වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ මහතා ද මහාමාත්‍ය ඩී. ඇස්. සේනානායක අගමැතිතුමා හමුව, ආයුර්වේද පාමකෝපියා ග්‍රන්ථයක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව ගැන කරුණු ඉදිරිපත් කළහ. එම කරුණු සම්බන්ධයෙන් බලවත් ලෙස ම සැලැකිල්ල යොමු කළ එතුමා සමස්ත ලංකායුර්වේද මහා සම්මේලන සභාවේ අධිකාරීන් සමග ද වැඩිදුරටත් සාකච්ඡා කොට ආයුර්වේද ශාස්ත්‍රී ආර්. බුද්ධදස මහතාගේ ප්‍රධානත්වයෙන් ආයුර්වේද පාමකෝපියා කොමිටියක් පත් කෙළේය. එහි වියදම් සඳහා රු. 22,000/- ක මුදලක් ද වෙන් කොට එම ග්‍රන්ථය සැපැයීම සඳහා බලය පවරණ ලදී. අවාසනාවකට මෙන් බුද්ධදස කොමිටිය වැඩි වගවිභාගයක් නොකොට පොතක් ලියන ලදී. එය ද්‍රව්‍යගුණ ග්‍රන්ථයෙකි. දැනුදු එය නාවින්නේ ආයුර්වේද පර්යේෂණායතනයෙහි තැන්පත්ව තිබේ.

1951.9.29 දින මහාමාත්‍ය ඩී. ඇස්. සේනානායක අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහනුවර දී පවත්වන ලද එක්සත් ජාතික පක්ෂයේ සිව්වෙනි සාංවත්සරික මහා සභාව ඉදිරියෙහි ආයුර්වේද පාමකෝපියා ග්‍රන්ථය ලිවීමේ වැඩ පිළිවෙළ ගැන සාකච්ඡා කොට වඩා උසස් පුළුල් ක්‍රියාමාර්ගයක් ඇති කරණ ලෙස ඉල්ලා සිටීමේ යෝජනාවක්, මහනුවර වෛද්‍යාචාර්ය ඩී.ඇම්. ජයසිංහ මහතා විසින් ඉදිරිපත් කරණ ලදුව, එය වෛද්‍යාචාර්ය ජේ. කුළුපන මහතා ස්ථිර කෙළේය. එය සභා සම්මත වුවද, ඩී. ඇස්. සේනානායක අගමැතිතුමාගේ හදිසි අභාවයත් සමග ම ආයුර්වේද පාමකෝපියාවක් සැපැයීමේ කාර්යයත් එතුමා අදහස් කොට තිබුනු වෙනත් ආයුර්වේද සංවර්ධන කටයුතුත් යටපත්ව ගිය බව පෙනේ.

දිවංගත ගරු ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ ශ්‍රී නාමයට උපහාරයක් වශයෙන්, 1962.10.14 දින භාරත අගමැති ගරු ශ්‍රී නේරු තුමන් අතින් බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය විවෘත විය. පර්යේෂණායතනය කේන්ද්‍රස්ථානය කොට ආයුර්වේද පර්යේෂණ කටයුතු මෙහෙයවීම අරභයා එවකට සෞඛ්‍ය අමාත්‍ය ධුරය දැරූ ගරු ඒ. පී. ජයසූරිය මැතිතුමා විසින් 1961 අංක 31 දරණ ආයුර්වේද ආඥා පනත යටතේ ආයුර්වේද පර්යේෂණ කාරක සභාව පත් කරණ ලදී. එහි ප්‍රථම රැස්වීම 1963.4.4 වැනි දින නාවින්නේ ආයුර්වේද පර්යේෂණායතනයේ දී ගරු ඒ. පී. ජයසූරිය ඇමති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. ප්‍රථම ආයුර්වේද කොමසාරිස් තැන්පත් ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා එහි සභාපති තුමා විය.

කලක් යටපත්ව තිබුණු ආයුර්වේද පාමකෝපියා ප්‍රශ්නය 1963 සැප්තැම්බර් 13 දින පැවැත්වුනු පර්යේෂණ කාරක සභා රැස්වීමේදී නැවතත් වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ මහතා විසින් මතු කරන ලදී. මහාචාර්ය කේ. රාජසූරිය, මහාචාර්ය ඇස්. ඩබ්ලිව්. බිබිලේ, ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි, පණ්ඩිත කවිචින්තාමණි පී. ඇම්. පී. අභයසිංහ ආදි විද්වතුන්ගේ අනුකූලතාවද ලැබී එම යෝජනාව ගැන වැඩිදුරටත් ක්‍රියාරම්භ විය. එම සාකච්ඡාවන්හි දී ආයුර්වේද පාමකෝපියා යන නාමයට ''ආයුර්වේද ඖෂධ සංග්‍රහ'' යනු ඉතා සුදුසු සිංහල යෙදුම වශයෙන් සම්මත වූ අතර එතැන් පටන් එම නාමය ව්‍යවහාරයට පත් වූයේය.

1964.9.11 වැනි දින ආයුර්වේද කොමසාරිස් ඩබලිව. ජේ. ප්‍රනාන්දු මහතා, මහාචාර්ය ඇස්. ඩබලිව. බිබිලේ සහ ඩී. ඇම්. ජයසිංහ මහතුන් සමග සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් කු. බාලසිංහම් මහතා හමුවී බුද්ධදස කොමිටිය මගින් ලියන ලද ග්‍රන්ථය ඖෂධ සංග්‍රහයක් නොව ද්‍රව්‍යගුණ ග්‍රන්ථයක් බව ද පැහැදිලි කරණ ලදින් නැවතත් ක්‍රමානුකූල ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් සකස් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවසරය ලබා ගත හැකිවිය. ඉන්පසු ඖෂධ සංග්‍රහය සැපයීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ගය පැහැදිලි කර ගැනීම පිණිස වාර්තාවක් සැපැයීමේ බලය පවරා, වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ (සභාපති), වෛද්‍යාචාර්ය ඩී. එච්.

රාජපක්ෂ (ලේකම්), පණ්ඩිත කේ. ජී. පී. ජයතිලක සහ රජයේ ඖෂධ ගබඩා අධිකාරී, ඩී. ඒ. ඊ. මුණසිංහ යන මහතුන් අතුරු කාරක සභාවක් ලෙස පත් කරණ ලදී. (1963 ඔක්තෝබර් 4 දින) එම අනු කාරක සභාව ඉතා පැහැදිළි වාර්තාවක් සැපයූ අතර ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් පිළියෙල කිරීම සඳහා කොමිෂන් සභාවක් මගින් කරුණු පරීක්ෂා කිරීමේ අවශ්‍යතාව ද යෝජනා කළාය.

ඉහත සඳහන් වාර්තාවේ නිර්දේශයන් ගැන සැලකිල්ල යොමු කළ ගරු ඇම්. ඩී. එච්. ජයවර්ධන එවකට සිටි සෞඛ්‍ය අමාත්‍ය තුමා ඖෂධ සංග්‍රහයේ මූලික කටයුතු මාස 18 ක් තුළ නිම කිරීමේ බලය පවරා, පහත නම් සඳහන් මහතුන් ආයුර්වේද ඖෂධ සංග්‍රහ (පාමකෝපියා) කොමිටිය වශයෙන් පත් කෙළේය.

(1) අධ්‍යක්ෂ, ආයුර්වේද පර්යේෂණායතනය, නාවින්න (සභාපති) ආචාර්ය ආර්. ආර්. පාඨක් මහතා.

(2) වෛද්‍ය අධිකාරී, ආයුර්වේද මහාරෝග්‍යශාලාව, බොරැල්ල, වෛද්‍යාචාර්ය එච්. කේ. බුද්ධදාස මහතා.

(3) රජයේ බෙහෙත් ගබඩා අධිකාරී, ඩී. ඒ. ඊ. මුණසිංහ මහතා.

(4) පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි මහතා, අධ්‍යක්ෂ, ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය, යක්කල.

(5) වෛද්‍යාචාර්ය ආර්. ඩී. ඒ. සෙනෙවිරත්න මහතා, ආයුර්වේද විද්‍යාලය, කොළඹ.

(6) වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ මහතා, 61, රජවීදිය, මහනුවර.

(7) වෛද්‍යාචාර්ය ඇස්. ඇම්. පොන්නයියා මහතා, මරිසන්කුඩයි, ඉල්ලාවලෙයි.

(8) වෛද්‍යාචාර්ය එම්. එම්. ජාෆර් මහතා, 210, ආදුරුප්පු වීදිය, කොළඹ.

(9) වෛද්‍යාචාර්ය පණ්ඩිත කේ. ජී. පී. ජයතිලක මහතා, රත්ගම, දෙඩන්දූව.

යන මහත්වරු 1966.7.4 වැනි දින පත්කරණු ලැබූහ. ආයුර්වේද පර්යේෂණායතනයේ වැඩ බලන පර්යේෂණ හා වෛද්‍ය නිලධාරි එච්. අයි. චන්ද්‍රසේකර මහතා ලේකම් වශයෙන් පත් කරණ ලදී. මෙම කාරක සභාව ඖෂධ සංග්‍රහය සැපයීමට වෛද්‍ය සමාජයේ අදහස් ලබාගැනීම පිණිස ප්‍රශ්න මාලාංක් නිකුත් කළාය. (එම ප්‍රශ්න මාලාව හා වෙනත් විස්තර පෙර වදනෙහි සඳහන් වේ). ලියා පදිංචි වෛද්‍යවරයන් 6,723 ක් වෙත යවන ලද එම ප්‍රශ්න මාලාවෙන් වෛද්‍ය සමාජයට අදහස් ප්‍රකාශ කිරීමේ අවස්ථාවක් දුන් අතර ඉතා ප්‍රයෝජනවත් පිළිතුරු ද ලැබිණි. එම පිළිතුරු මෙම ඖෂධ සංග්‍රහය සකස් කිරීමේදී ප්‍රයෝජනවත් වූ බව කිවයුතුය. සමස්ත ලංකාවාසීන්ගේ මෙන්ම සියලු ම ආයුර්වේද වෛද්‍යවරයන්ගේ සම්මානයට පාත්‍රවී සිටින ශ්‍රෙෂ්ඨ වෛද්‍යවරයා වන, ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි මහතා ද ඉතා වටිනා පිළිතුරු මාලාවක් එවා තිබුණ අතර එම පිළිතුරු ඖෂධ සංග්‍රහ මුල් පියවර සැපයීමේ කාරක සභාව ඉතා ගෞරවයෙන් ප්‍රයෝජනයට ගත් බව කෘතඥතා පූර්වකව යදහන් කරමි. ප්‍රශ්න මාලාවට පිළිතුරු එකතු කිරීම හා වට්ටෝරු සංග්‍රහ කිරීම හැර වෙන කටයුත්තක් එම කාරක සභාවට නිම කිරීමට නොහැකි විය.

මා ආයුර්වේද කොමසාරිස් පදවියට පත්වීමෙන් පසු ආයුර්වේද පර්යේෂණ කාරක සභාව මගින් අරඹා අඩාලව පැවැති කටයුතු පිළිබඳ මනා පරීක්ෂණයක් කිරීමට සිදු විය. ඒ කටයුතු අතුරෙන් ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් සැපයීමෙ යෝජනා ක්‍රමය ඉතා අගය කොට සැලකුවෙමි. පාරම්පරිකව පැවත එන වෛද්‍ය ක්‍රමයක් නූතන වෛද්‍ය ක්‍රම හා සැසඳෙන තත්ත්වයකට නඟා සිටුවීමේ ප්‍රයත්නයක දී පොදු ශාස්ත්‍ර සම්මුතිමය ඖෂධ පංක්තියක් සකස් කර ගැනීම මූලික වශයෙන් ගතයුතු පියවරක් ලෙස පිළිගැණෙන හෙයිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගරු ඊ. ඇල්. සේනානායක සෞඛ්‍ය අමාත්‍ය තුමා විසින් පහත නම් සඳහන් මහතුන්ගෙන් යුත් ආයුර්වේද ඖෂධ සංග්‍රහ කොමිටියක් (1968 නොවැම්බර් මස 20) දින පත් කරණ ලදී.

වෛද්‍යාචාර්ය ආර්. ආර්. පාඨක් (සභාපති)
,, පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි
,, පණ්ඩිත කේ. ජී. පී. ජයතිලක
,, ඩී. ඇම්. ජයසිංහ
,, ඇස්. ඇම්. පොන්නයියා
,, ඇස්. සභාපතිපිල්ලේ
,, එච්. ඇම්. ජාෆර්
,, පණ්ඩිත විලියම් අල්විස්
,, ඩී. එච්. රාජපක්ෂ
,, ඇස්. ඩී. ඇස්. නානායක්කාර (ලේකම්)
ඩී. ඒ. ඊ. මුණසිංහ මහත්මා, රජයේ බෙහෙත් ගබඩා පාලක
මහාචාර්ය එස්. ආර්. කෝට්ටෙගොඩ මහත්මා
දෙස්තර ඇන්. කෝදගොඩ මහත්මා
,, කේ. ඩී. එෆ්. පියසිලි මහත්මා

සභාපති වශයෙන් පත් කළ ආර්. ආර්. පායස් මහත්මා ආයුර්වෙද උපදේශක තනතුරෙන් ඉවත්වී ආපසු සියරට බලා යාම නිමිත්තෙන් සභාපති පදවියෙන් ඉල්ලා අස්වීම හේතුකොට ගෙන, වෛද්‍යාචාර්ය එච්. කේ. බුද්ධදාස මහතා සභාපති වශයෙන් පත් කරන ලදි. පුරප්පාඩු වූ ස්ථානයට ආයුර්වෙද ඖෂධ නිෂ්පාදනාගාරයේ කළමනාකරු, ජිනදාස විරසිංහ මහතා පත්විය. අනතුරුව 1969 පෙබරවාරි 6 වැනි දින පළමු වරට රැස් වූ ඖෂධ සංග්‍රහ කොමිටිය ආයුර්වෙද, සිද්ධ හා යුනානි ඖෂධ ක්‍රමත්‍රය සඳහා එකම සැලැස්මක් අනුව වෙන් වෙන් වශයෙන් ඖෂධ සංග්‍රහයේ පළමුවැනි පියවර සකස් කිරීමට සම්පාදක මණ්ඩල තුනක් පත් කරණ ලදි. ඒ සම්පාදකවරු නම්—

ආයුර්වෙද ඖෂධ සංග්‍රහය

වෛද්‍යාචාර්ය එච්. කේ. බුද්ධදාස මහතා (සභාපති)
,, ඩී. එච්. රාජපක්ෂ මහතා
,, ඩී. එම්. ජයසිංහ මහතා
,, පණ්ඩිත කේ. ජී. පී. ජයතිලක මහතා
,, ඇස්. ඩී. ඇස්. නානායක්කාර මහතා (ලේකම්)

සිද්ධ ඖෂධ සංග්‍රහය

වෛද්‍යාචාර්ය එස්. එම්. පොන්නයියා මහතා
,, ඇස්. සභාපතිපිල්ලේ මහතා

යුනානි ඖෂධ සංග්‍රහය

වෛද්‍යාචාර්ය එච්. එම්. ජාෆර් මහතා

පළමු වරට තෙමසක කාල සීමාවක් දී ඇමති තුමා විසින් පත් කරන ලද ප්‍රධාන ඖෂධ සංග්‍රහ කාරක සභාව අවශ්‍ය හේතුන් නිසා 1970 පෙබරවාරි 15 ද තෙක් වරින් වර කාලය දීර්ඝ කර ගන්නා ලදි. එම කාරක සභාවේ සාමාජික මහතුන්ගේ බලවත් පරිශ්‍රමයෙන් මෙම ඖෂධ සංග්‍රහයේ පළමුවැනි පියවරේ කටයුතු අධික ප්‍රමාණයක් නිමවූ බව සඳහන් කරනු කැමැත්තෙමි.

ඖෂධ සංග්‍රහ කොමිටියේ වසරක කටයුතු පුනරීක්ෂණය කිරීමෙන් පසු මෙම කටයුත්ත වඩාත් ඉක්මණින් හා සංවිධානාත්මකව කළයුතු යැයි හැඟී ගියෙන් ගරු සෞඛ්‍ය ඇමති තුමා විසින් එම කොමිටිය ප්‍රතිසංවිධානය කොට පහත සඳහන් අන්දමට 1970 පෙබරවාරි 15 සිට පත් කරන්නට යෙදුනි.

(1) වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ (සභාපති)
(2) ,, ආර්. රාජපක්ෂ, සිද්ධායුර්වෙද විද්‍යාලය, යක්කල.
(3) ,, ඩී. ඒ. අයිලප්පෙරුම
(4) ,, ඩී. එච්. එදිරිසිංහ
(5) ,, පණ්ඩිත කේ. ජී. පී. ජයතිලක
(6) ,, ඩී. එච්. රාජපක්ෂ
(7) ,, එස්. එම්. පොන්නයියා (සිද්ධ)
(8) ,, ඒ. සභාපතිපිල්ලේ (සිද්ධ)
(9) ,, එච්. එම්. ජාෆර් (යුනානි)

උපදේශක සභිකවරු

(1) මහාචාර්ය එස්. ඩබ්ලිව්. බිබිලේ
(2) මහාචාර්ය එස්. ආර්. කෝට්ටෙගොඩ
(3) දෛස්තර කේ. ඩී. එජ්. පියසිලි
(4) දෛස්තර එන්. කෝදගොඩ
(5) ඩී. ඒ. ටී. මුණසිංහ මහතා, රජයේ බෙහෙත් ගබඩා පාලක.

වෛද්‍යාචාර්ය ඇස්. ඩී. ඇස්. නානායක්කාර මහතා ලේකම් වශයෙන් පත් කරන ලදි. පූර්වයෙහි සඳහන් කළ සම්පාදකවරුන් එපරිදිම කටයුතු කරගෙන ගිය අතර, ආයුර්වෙද ඖෂධ සංග්‍රහ සම්පාදක මණ්ඩලයේ සභාපති වශයෙන්, ඖෂධ සංග්‍රහ කොමිටියේ සභාපති තැන්පත් වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ මහතා පත් කරන ලදි.

අද දින ගරු අගමැති ඩඩ්ලි සේනානායක මහත්මා වෙත සෞඛ්‍ය ඇමති ගරු ඊ. ඇල්. සේනානායක මහතා විසින් ඉදිරිපත් කෙරෙන මෙම ඖෂධ සංග්‍රහයෙහි පළමුවැනි කොටසට ආයුර්වේද-සිද්ධ හා යුනානි කාණ්ඩ ඇතුළත් වේ. ඒ ඒ සම්පාදකවරුන් විසින් වෙන් වෙන් වශයෙන් සකස් කෙරුණු කාණ්ඩත්‍රයට ම ප්‍රධාන ඖෂධ සංග්‍රහ කොමිටියේ සහ ආයුර්වේද පර්යේෂණ කාරක සභාවේ අනුමැතිය ලැබී තිබේ.

ස්තුතිය

මෙම ආයුර්වේද ඖෂධ සංග්‍රහයෙහි පළමුවැනි පියවර සකස් කිරීම ලංකා ආයුර්වේද ඉතිහාසයෙහි කොමැකෙන අකුරෙන් ලියැවෙන සිද්ධියක් බව කිවමනා නොවේ. ඉදිරි කාලයේදී ජාත්‍යන්තර මට්ටමේ ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් සකස් වීමේ ප්‍රාරම්භක පියවර මෙයින් ගන්නා ලද හෙයිනි. මෙවැනි ඉතිහාස ගතවන කටයුත්තක දී මෙම පියවර සාර්ථක කර ගැනීමට පුරෝගාමීව කටයුතු කළ හා නන් අයුරින් ආධාර හා උපදෙස් දුන් භවතුන් කිප දෙනෙකු ගැන කෘතඥතා පූර්වකව විශේෂයෙන් සඳහනක් කරනු කැමැත්තෙමි.

නිදහස් ලංකාවේ පළමුවැනි අගමැති මහාමාන්‍ය ගරු ඩී. ඇස්. සේනානායක මැතිතුමාත්, අනතුරුව අගමැති පදවිය දරූ ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැති තුමාත්, ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියත්, වත්මන් රජයේ අගමැති ගරු ඩඩ්ලි සේනානායක මැති තුමාත්, අවංක හිතින් ආයුර්වේදයට දුන් දිරි ගැන්ම නොවන්නට මෙවැනි කටයුත්තක ලුහුඬු ප්‍රතිඵලයක් වත්, දකින්නට නොලැබෙනු ඇත. ඒ ඒ රජයන්හි සෞඛ්‍ය ඇමතිවරුන් වශයෙන් සිටි ගරු ඒ. පී. ජයසූරිය, ගරු බදි උද්දීන් මහමුද්, ගරු ඇම්. ඩී. එච්. ජයවර්ධන හා වත්මන් සෞඛ්‍ය ඇමති ගරු ඊ. ඇල්. සේනානායක මහතුන් අතින් ලැබුණු අනුග්‍රහය හා ආධාරය කෘතඥතා පූර්වකව සිහි කරමු.

ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ මුල් පියවර සකස් කිරීමේ සෑම අවස්ථාවකදීම ඒ පිළිබඳව උපදෙස් හා මාර්ගෝපදේශ දුන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් කු. බාලසිංහම් මහතාට ද අපගේ හෘදයංගම ස්තුතිය පුද කරමු.

1961 අංක 31 දරණ ආයුර්වේද ආඥා පනත නීතිගත කරවා ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවා ඖෂධ සංග්‍රහය පිළියෙල කිරීම නීතියෙන් භාරවන ආයුර්වේද පර්යේෂණ කාරක සභාව පිහිටුවීමට පුරෝගාමී වූ පළමුවැනි ආයුර්වේද කොමසාරිස් වරයා ලෙස කටයුතු කළ ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහත්මා අතින් මෙහිලා සිදුවූ ආරම්භ සේවය ආයුර්වේදයට හිතැතියන් විසින් කිසි දිනක අමතක නොකරනු ඇත. අනතුරුව මේ පිළිබඳව කටයුතු රාශියක් කළ හිටපු කොමසාරිස් ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න මහත්මා ද මෙම අවස්ථාවේදී සිහි කරමු.

පුරා අවුරුදු විසිපහක් තුළ ඖෂධ සංග්‍රහයක් බිහි කිරීම සඳහා මහත් උද්ඝෝෂණ කරමින් හා රජයේ නිලධාරීන්, මැති ඇමති වරුන් හා අනෙකුත් වගකිවයුතු භවතුන් අවදි කරවමින්, ආයුර්වේදයේ ඉදිරි ගමන සඳහා අත්‍යවශ්‍යවූ මෙම කටයුත්ත දිවි දෙවැනි කොට අගයමින් පුරෝගාමීව කටයුතු කළ දැනට ඖෂධ සංග්‍රහ කාරක සභාවේ සභාපති ධුරය හොබවන ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජික වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ (සිද්ධායුර්වේදඥ, ඩී.ඇස්.ඒ.සී. ගෞරව—ලංකා, ප්‍රාණාචාර්ය) ශ්‍රීමතාණන්ට මෙම ඖෂධ සංග්‍රහය බිහි කිරීමෙන් ලැබෙන ගෞරව හා උපහාර ලැබිය යුතු බව සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවේ. සිය වියදමෙන්, භාරතයට පවා ගොස් අවශ්‍ය කරුණු හා උපදෙස් ලබාගෙන මෙම කාණ්ඩය ක්‍රමානුකූල සැකැස්මක් අනුව පිළියෙල කිරීම හා විශේෂයෙන් සදාකාලිකව පවතින මාන පරිභාෂා සම්මත ක්‍රමයක් සකස් කිරීම උදෙසා දරූ පරිශ්‍රමය ලංකා ආයුර්වේද ඉතිහාසයෙහි එතුමන්ගේ නමට විශේෂ තැනක් හිමි කරවන්නේය. ජයසිංහ මහත්මාගේ උනන්දුව ආශාව හා අප්‍රතිහත ධෛර්යය නොවන්නට මෙම කටයුත්ත මෙවන් අයුරින් ඉටු නොවිය හැකිව තුබූ බව නොපැකිලව සහ කෘතඥතා පූර්වකව සඳහන් කරමි.

ආයුර්වේද ඖෂධ සංග්‍රහය සම්පාදක මණ්ඩලයේ සිටි වෛද්‍යාචාර්ය ආර්. ආර්. පාඨක් මහතාට ද, වෛද්‍යාචාර්ය එච්. කේ. බුද්ධදස මහතාට ද දැනට සිටින වෛද්‍යාචාර්ය පණ්ඩිත කේ. ජී. පී. ජයතිලක වෛද්‍යාචාර්ය ඩී. එච්. රාජපක්ෂ මහතුන්ට ද ආරම්භයේ සිට මේ දක්වා ලේකම් වශයෙන් කටයුතු කරන වෛද්‍යාචාර්ය ඇස්. ඩී. ඇස්. නානායක්කාර වෛද්‍ය අධිකාරී මහතාට ද මෙම කටයුත්ත මෙතෙක් දුරට සාර්ථක කර ගැනීම උදෙසා ආත්ම පරිත්‍යාගයෙන් යුතුව ගන්නා ලද වෙහෙස ගැන ආයුර්වේදයට සම්බන්ධ හා හිතැති සියලු දෙනාගේම කෘතඥතා පූර්වක ස්තුතිය හිමිවන්නේය. එසේම සිද්ධ කාණ්ඩය සකස් කළ වෛද්‍යාචාර්ය එස්. එම්. පොන්නයියා, වෛද්‍යාචාර්ය ඒ. සභාපතිපිල්ලේ මහතුන් ද, යුනානි කාණ්ඩය සකස් කළ රාජ වෛද්‍ය එච්. එම්. ජාෆර් මහතාට ද ඒ ඒ වෛද්‍ය අංශවල නියුක්ත වෛද්‍යවරුන්ගේ හා සමස්ත වශයෙන් ආයුර්වේදයට හිතැති සියලු දෙනාගේම ස්තුතිය හිමිවන්නේය.

ඖෂධ සංග්‍රහ කාරක සභාවලට පත්වූ සියලුම සාමාජික මහතුන්ට හා විශේෂයෙන් නව මුහුණුවරක් ගැන්වීම උදෙසා අගනා උපදෙස් දුන් මහාචාර්ය සේනක බිබිලේ, දෙස්තර නන්දදස කෝදාගොඩ, දෙස්තර කේ. ඩී. එෆ්. පියසිලි හා රජයේ බෙහෙත් ගබඩා පාලක ඩී. ඒ .ටී. මුණසිංහ මහතුන්ට ද, විශේෂයෙන් කිරුම් මිණුම් සම්මත ක්‍රම සකස් කර ගැනීමට නොමසුරු සහයෝගය දුන් මහාචාර්ය ඇස්. ආර්. කෝට්ටෙගොඩ මහතුන්ටද නොයෙක් අවස්ථාවල උපදෙස් දුන් ආයුර්වේද පර්යේෂණ කාරක සභාවේ සාමාජික මහතුන්ට ද මෙහිදී හෘදයංගම ස්තුතිය පුද කරමි.

ප්‍රාර්ථනය

ආරම්භයේ දී සඳහන් කළ පරිදි මෙම ඖෂධ සංග්‍රහය ලංකා ආයුර්වේද ඖෂධ සංග්‍රහය සකස් කිරීමෙහි ලුහුඬු මුල පිරීමක් පමණි. ආයුර්වේද ආඥාපනත යටතේ කොමසාරිස් වරයාට පැවරී ඇති බලතල අනුව විවිධ වූ ආයුර්වේද සංවර්ධනාත්මක කටයුතු රාශියක් කිරීමට නීතිගත වූ පොදු සම්මුතිමය ඖෂධ සංග්‍රහ ග්‍රන්ථයක අවශ්‍යතාවය මෙයින් තරමක් දුරට හෝ සපුරාලනු ඇතැයි හඟිමි. විශේෂයෙන් නිෂ්පාදිත ඖෂධ ප්‍රමිති කිරීම ආනයනය කරනු ලබන නිෂ්පාදිත ඖෂධ පාලනය කිරීම, ප්‍රචාරක දැන්වීම් මගින්,

වෙළඳ පලට යවනු ලබන නා නා මාදිලියේ සැක සහිත ඖෂධ පාලනය කිරීම හා ආයුර්වේද චිකිත්සා කර්මයෙහි නියුක්ත වෛද්‍යවරුන්ටත්, ආයුර්වේද ක්‍රමයට ප්‍රතිකාර ලබන කෝටි සංඛ්‍යාත රෝගීන්ටත් ආරක්ෂාව ලබාදීම ආදී ආයුර්වේදයෙහි ඉදිරි ගමනෙහිලා අනිවාර්යයෙන්ම ගතයුතු පියවර රාශියක් ගැනීමට මෙම ග්‍රන්ථය නිසා මුලපුරනු හැකි වන්නේය.

පුරා අවුරුද්දක කාල සීමාවක් තුළ සකස්කොට නිම කරන ලද මෙම පළමුවැනි කාණ්ඩය සම්පූර්ණ ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් වශයෙන් සැලකිය යුතු නොවේ. එසේ නම් අප ලෝක වාර්තාවක් පිහිටුවා ඇත. මෙම කාණ්ඩයට ඇතුළත් නොවූ ඒ ඒ චිකිත්සා සඳහා යෙදිය හැකි පර්යාය වට්ටෝරු සිය දහස් ගණනින් තිබිය හැකිය. එවැනි වට්ටෝරු සම්පාදක මණ්ඩලයේ සභාපතිතුමා වෙත එවා සුහද සාකච්ඡා මගින් හෝ චිකිත්සාගාර පරීක්ෂණ මගින් අඩු වැඩි ගුණාගුණ තීරණය කොට යහපත් යැයි නිගමනය කළහැකි සංයෝග වඩ වඩාත් ඇතුළත් කිරීමද, ඖෂධීය ද්‍රව්‍ය වශයෙන් තවමත් අවිනිශ්චිත පැලෑටි, ඛනිජ ද්‍රව්‍ය පිළිබඳව ශාස්ත්‍රානුකූල පරීක්ෂණ පවත්වා නිශ්චිත ද්‍රව්‍ය සංග්‍රහයක් සකස් කිරීම ද දැනට ආයුර්වේද, සිද්ධ හා යුනානි චිකිත්සාවල නියුක්ත කෘතහස්ත වෛද්‍යවරුන් සතු යුතුකම වන්නේය. රහස් වශයෙන් තබාගන්නා චිකිත්සා ක්‍රම ද රෝගවලින් පෙළෙන පොදු ජනතාවගේ හිතසුව පිණිස එළි දරව් කොට ගුණාගුණ ස්ඵුට කොට ඖෂධ සංග්‍රහයට ඇතුළත් කිරීමට සියලුම වෛද්‍යවරු උත්සුක වනු ඇතැයි අපේක්ෂා කරමි. රෝගියාගේ යහපත තකා චිකිත්සා ක්‍රමවලට කිසියම් විනයක් පැනවීමේදී ඒ ඒ වෛද්‍යවරයා රහස් වශයෙන් කරන ප්‍රතිකර්ම නීතියෙන් තහනම් විය හැකි බැවින් හා වෛද්‍ය ශාස්ත්‍රය විශ්වසාධාරණ ශාස්ත්‍රයක් වියයුතු බැවිනි. විවිධ කටයුතු සඳහා ක්‍රියා කැරෙන අනුකාරක සභා පත්කොට රසායනාගාර සහායද ඇතිව ආයුර්වේද ඖෂධ සංග්‍රහ සම්පාදක මණ්ඩල ඉදිරියට නොනවත්වාම කටයුතු කිරීමට අපේක්ෂිත හෙයින් මෙම කාණ්ඩවල අඩුපාඩු සකස් කොට කෝෂය වශයෙන් වැඩිදුර දියුණු කොට — කල් යාමේදී ඖෂධ, ද්‍රව්‍ය විශ්ලේෂණයන්ද සහිතව අන්තර්ජාතික මට්ටමක ඖෂධ සංග්‍රහයක් සකස් කිරීමට හැකිවේයයි ද හා එනයින් ආයුර්වේදයෙහි සැඟවී ඇතැයි අවිවාදයෙන් පිළිගන්නා අගයෙන් අපරිමිත වූ චිකිත්සා ක්‍රම ජගත් වෛද්‍ය ඥාන කෝෂය වඩාත් පොහොසත් කොට දෙලෝ අභිවෘද්ධිය සලකා ගැනීමට ආයුර්වේද වෛද්‍යවරුන්ගේත්—ආයුර්වේදයට හිතැති විද්වත් සියලු දෙනාගේත් පරිත්‍යාගශීලී සහයෝගය නොමසුරුව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

මේ වගට,

විමල් නවගමුව

ආයුර්වේද කොමසාරිස්.

1970 ක්වූ මැයි මස 2 වැනි දින,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.
කොළඹ 8.

ආයුර්වේද ඖෂධ සංග්‍රහය

පෙරවදන

වර්ෂ 1961 අංක 31 දරණ ආයුර්වේද ආඥපනතේ පස්වෙනි කොටසේ 41 වගන්තියේ 2 වෙනි ඡේදයෙහි (ඉ) අක්ෂරය දරණ කොටසින්, ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් සකස් කිරීම හා ප්‍රසිද්ධ කිරීමේ බලය ආයුර්වේද පර්යේෂණ කාරක සභාව වෙත පැවරී ඇත්තේය. එම බලය අනුව, ආයුර්වේද පර්යේෂණ කාරක සභාවේ ඉල්ලීමෙන් ගරු ඊ. ඇල්. සේනානායක සෞඛ්‍ය අමාත්‍ය තුමා විසින් පත් කරණ ලද ආයුර්වේද ඖෂධ සංග්‍රහ කොමිටිය මගින් පහත නම් සඳහන් අපි, ආයුර්වේද ඖෂධ සංග්‍රහය මුල්පියවර සම්පාදනය කිරීමේ මණ්ඩලය වශයෙන් පළමුවෙන් පත්කරණු ලැබුවෙමු.

වෛද්‍යාචාර්ය එච්. කේ. බුද්ධදස (සභාපති)
වෛද්‍යාචාර්ය ඩී. එච්. රාජපක්ෂ
වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ
වෛද්‍යාචාර්ය පණ්ඩිත, කේ. ජී. පී. ජයතිලක
වෛද්‍යාචාර්ය ඇස්. ඩී. ඇස්. නානායක්කාර (ලේකම්), වෛද්‍ය අධිකාරී.

මෙම අනුකාරක සභාව විසින් ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ මුල් පියවරෙහි වැඩි කොටසක් සම්පාදනය කරණ ලදී.

ශතවර්ෂ තිහකටත් වැඩි තරම් කලක් මුලුල්ලේ අවිච්ඡින්නව ක්‍රියාත්මකව පැවත එන ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සම්බන්ධ ''ඖෂධ සංග්‍රහයෙක්'' නොමැතිද? යන ප්‍රශ්නය නිතැතින් ම පහළ වන්නේය. ඊට දියයුතු පිළිතුර සරලය. ඖෂධ සංග්‍රහයෙක්හි ඇතුළත් වියයුතු සියළු ම කරුණු එක්තැන් කළ, හුදු ඖෂධ සංග්‍රහයෙක් දනට ලැබී ඇති ග්‍රන්ථ අතරෙහි අවිද්‍යමාන බවය. එහෙත් ආචාර්ය ශාර්ඞ්ගධර එම අඩුපාඩුව සලකා බලා ස්වකීය ශාර්ඞ්ගධර සංහිතාව රචනා කිරීමෙන් ආයුර්වේද ඖෂධ සංග්‍රහයෙක පදනම ලූ බව පිළිගත හැකිය.

ආයුර්වේදය හේතුසූත්‍ර, ලිංගසූත්‍ර, ඖෂධසූත්‍ර යන ත්‍රිස්කන්ධයට අයත්ය යි චරකය උගන්වයි. * (හෙතු ලිඞ්ගෞෂධඥානං ස්වස්ථාතුරපරායණම්, ත්‍රිසූත්‍රං ශාශ්වතං පුණ්‍යං බුබුධෙ යං පිතාමහඃ'' ච.සූ.1අ.) ඖෂධ සංග්‍රහයෙක්හි ඇතුළත් වියයුතු සැම කරුණෙක්ම ඖෂධසූත්‍රස්කන්ධයට අයත් වේ. එම ඖෂධසූත්‍රස්කන්ධය චරක, සුශ්‍රැතාදි සංහිතාවන්හි නොයෙක් ස්ථානයන්හි පැතිරී ඇත්තේය. ඇතැම් කරුණු සූත්‍රස්ථානයෙහි ද තවත් කොටසෙක් චිකිත්සාස්ථානයෙහි ද කල්පස්ථානයෙහි ද සිද්ධිස්ථානයෙහි දැයි මෙසේ ස්ථාන කීපයෙක්හි ඇතුළත් වෙති. අතීතයෙහි කෙසේ වෙතත් මේ යුගයෙහි වෛද්‍යවරයන්ට එය මහත් අපහසුවට කරුණෙකි. එනිසා හුදු ''ආයුර්වේද ඖෂධ සංග්‍රහයක්'' සැපයීමේ අවශ්‍යතාව ඉන්දියාවේ සහ ලංකාවේ කෘතහස්ත ආයුර්වේද වෛද්‍යවරයන්ට එක ම කාලසීමාවක් තුළදී අවබෝධ විය.

වර්ෂ 1930–1932 අතර කාලයෙහි සමස්ත ලංකායුර්වේද මහා සම්මේලන සභාවේ අධිකාරීහු ආයුර්වේද පාමකෝපියා ග්‍රන්ථයක් සැපයීමේ අවශ්‍යතාව ගැන සාකච්ඡා කළහ. ඉන්දියාවේ සුප්‍රසිද්ධ වෛද්‍යවරු ද එම අවස්ථාවෙහි මෙම කරුණ සම්බන්ධයෙන්

---

* බ්‍රහ්ම තෙමේ, යම් ත්‍රිසූත්‍ර—ත්‍රිස්කන්ධ, ශාශ්වත—නිත්‍ය, පුණ්‍ය—පුණ්‍යප්‍රද ආයුර්වේදයක් අවබෝධ කළේ ද එම පරතෙරක් නැති (අනන්තපාර), අනන්ත, හේතු-ලිංග-ඖෂධ යන ත්‍රිස්කන්ධයෙන් යුත් ආයුර්වේද මහෝදධිය (සමස්ත ආයුර්වේදය) මහර්ෂි භරද්වාජ තෙමේ අවබෝධ කෙළේය. (ශරීරය සම්බන්ධ ඥානය ද හේතු-ලිංග දෙක්හි අන්තර්ගත ය. ''ශරීරං චාත්‍ර හෙතෞ ලිඞ්ගෙචාන්තර් භවති.'' ශ්‍රී චක්‍රපාණී දත්ත. ච.සූ.1.අ. 23–24 පද්‍ය) බ්‍රහ්ම විසින් ශ්ලෝක ලක්ෂයෙකින් හා අධ්‍යාය දහසකින් යුක්තව ප්‍රකාශ කරණ ලද්දේ (බ්‍රහ්ම සංහිතාව) ද මෙම ත්‍රිසූත්‍ර. පුණ්‍ය, ශාශ්වත, ආයුර්වේදය මැයි. හේතු ආදි ත්‍රිසූත්‍රය මෙසේ විග්‍රහ වන්නේය.

1. ස්වස්ථපරායණ හේතුසූත්‍රඥානස්කන්ධය,
2. ස්වස්ථපරායණ ලිඞ්ගසූත්‍රඥානස්කන්ධය,
3. ස්වස්ථපරායණ ඖෂධසූත්‍රඥානස්කන්ධය,
4. ආතුරපරායණ හේතුසූත්‍රඥානස්කන්ධය,
5. ආතුරපරායණ ලිඞ්ගසූත්‍රඥානස්කන්ධය,
6. ආතුරපරායණ ඖෂධසූත්‍රඥානස්කන්ධය යනුවෙන් ය.

බලවත් සැලකිල්ලක් දක්වූහ. 1932 සැප්තැම්බර් මාසයෙහි දී ඉන්දියානු රජය මගින් ශ්‍රී රාම්නාථ්ජී චෝප්රාගේ අධ්‍යක්ෂතාවෙන් යුක්ත ආයුර්වේද පාමකෝපියා කොමිටියක් පත් කිරීම ඊට සාධකයෙකි. දෙරටේ ම වෛද්‍යවරයන් අතර එක් අවස්ථාවෙහිම සමාන අදහසක් පහළ වීම සැලැකියයුතු සිද්ධියෙකි. ''ආයුර්වේද පාමකෝපියා'' යන නාමයත් දෙරටේ ම එක් අයුරු මුලදී භාවිත වී ඇත. ඊට හේතුව, බ්‍රිතාන්‍ය පාමකෝපියා ග්‍රන්ථයේ ඇති විද්‍යාත්මක අගයත් එබඳු ග්‍රන්ථයක් ආයුර්වේද වෛද්‍යවරයන්ගේ ප්‍රයෝජනය සඳහා බිහි කිරීමේ අවශ්‍යතාවත් දෙරටේ ම කෘතහස්ත විද්වතුන්ට එක් අයුරින් ම අවබෝධ වීම ය. එහෙත් දෙරටේ ම මේ ප්‍රශ්නය නො විසඳී වර්ෂ තිස්පහක් තරම් දිගු කලක් මුලුල්ලේ ඇදෙමින් පැවතිණ.

1951 වර්ෂයෙහි දී මහාමාන්‍ය ඩී. ඇස්. සේනානායක අගමැතිතුමා විසින් ආයුර්වේද පාමකෝපියා ග්‍රන්ථයක් සම්පාදනය කිරීම පිණිස කාරක සභාවක් පත් කරණ ලද නමුදු එයින් සාර්ථක ප්‍රතිඵලයක් නො ලැබිණ. සමස්ත ඉන්දියා ආයුර්වේද මහා සම්මේලනය පසුගිය විසිවස තුළ, පැවැත්වූ සාංවත්සරික මහා සභා සැමෙකකදී ම පාහේ මේ යෝජනාව ගැන සාකච්ඡා කළාය. එම සාකච්ඡාවල ප්‍රතිඵල විසින් ඉන්දියාවේ මධ්‍යම රජය විසිනුදු 1966 වර්ෂයෙහි දී නැවතත් ආයුර්වේද පාමකෝපියා කොමිටියක් පත් කරණ ලදී. ඒ කොමිටිය 1967.1.27 දින පටන් 1967.6.29 දින දක්වා රැස්වීම් පහක්, දින විසි එකක් මුලුල්ලෙහි පවත්වා මාන පරිභාෂා ආදි කොටස් සහිතව ඖෂධ සංයෝග 452 කින් යුත් ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ කටයුතු බොහෝ දුරට සමාප්ත කර ඇත්තේය. 1969 පෙබරවාරි මස හවෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරණ ලද ලංකාවේ ආයුර්වේද ඖෂධ සංග්‍රහ මුල් පියවර සැකසීමේ අනුකාරක සභාවත් එම කාර්යය බලවත් පරිශ්‍රමයෙන් සාර්ථක ලෙස අවසන් කර ඇති බව මහත් ප්‍රීතියෙන් යුක්තව ප්‍රකාශ කළ හැකිය.

ඉන්දියාවේ සහ ලංකාවේ ආයුර්වේද වෛද්‍ය විශාරදයන් බ්‍රිතාන්‍ය පාමකෝපියා ග්‍රන්ථය කෙරෙහි මහත් සැලැකිල්ලක් හා ගෞරවයක් දක්වූ නමුදු දෙරටේ ම ඖෂධ සංග්‍රහය එහි අනුකරණයක් හෝ කොපි කිරීමක් නොවන බව සැලැකියැ යුතුය. වෙසෙසින් ම අපේ ඖෂධ සංග්‍රහය මෙරටේ ආයුර්වේද වෛද්‍යවරයන්ගේ චිකිත්සා ක්‍රමය සම්බන්ධ සැම අවශ්‍යතාවක් ම සපුරා ලීමට ප්‍රමාණවත් අයුරු සැපයීම පිණිස හැකි සැම උත්සාහයක් ම යොද ඇති බව මැදහත් විචාරකයන්ට අවබෝධ වනු නිසැකය. මෙය බ්‍රිතාන්‍ය පාමකෝපියා ග්‍රන්ථයෙහි අනුකරණයක් නොවතුදු පාමකෝපියාවෙක්හි විය යුතු කරුණු අතරින් සියයට ඉතා වැඩි සංඛ්‍යාවක් මනාලෙස ඇතුළත් වූ සංග්‍රහයක් බව නිසැකව ප්‍රකාශ කළ හැකිය.

නිවැරැදි මැනුම් කිරුම් (මානපරිභාෂා), දුෂ්ප්‍රාප්‍ය හෝ අභාවප්‍රාප්ත ද්‍රව්‍ය වෙනුවට ගතයුතු ප්‍රතිනිධි ද්‍රව්‍ය, භෛෂජ්‍ය කල්පනා (ඖෂධයෝග සංස්කරණ විධි), ඖෂධ සංස්කරණය පිණිස උපයෝගී වන යන්ත්‍රෝපකරණ, රසදිය ප්‍රධාන කොට ඇති රසෞෂධ ධාතු-උපධාතු-රත්න-උපරත්න ආදිය පිළිබඳ ශෝධන-මාරණාදි සංස්කරණ විධි, වච්චනාවි, අබිං, ජයපාල, ගොඩකදුරු වැනි විෂ-උපවිෂ පදර්ථ ශෝධනය කිරීම, අරිෂ්ට-ආසව, ගුලි, කල්ක, වටිකා, මෝදක, තෛල, ඝෘත ආදි වශයෙන් යෝග විශෙෂ, යෝගයන්හි ඇතුළත් ද්‍රව්‍ය ලේඛනය, ද්‍රව්‍යයන් පිළිබඳ ලුහුඩු හැඳින්වීම, ද්‍රව්‍ය සංරක්ෂණය, ද්‍රව්‍ය සංග්‍රහ කිරීම, යෝගයන්හි සඳහන් දීපන-පාචනාදි පාරිභාෂික ශබ්ද විස්තර කිරීම, ත්‍රිකටුක ත්‍රිඵලා, ත්‍රිසුගන්ධ ආදි විසින් සඳහන් සංඛ්‍යාවාචකයන් විස්තර කිරීම, දෛනික චිකිත්සාවෙහි ප්‍රසිද්ධ ක්වාථ, සුරාසව (Tinctures) සාර (Extracts) ආදි නූතන සංස්කරණ පරිභාෂා, රෝග නාම ලේඛනය හා එක් එක් රෝග යෙහි ප්‍රයෝග කටයුතු සංයෝග ආදි (මෙය උප ග්‍රන්ථයක් වශයෙන් යෙදේ) වශයෙන් චිකිත්සාවෙහි දී අවශ්‍ය වන සැම කරුණක් ම මෙහි ඉතා සරල අයුරින් විස්තර කොට ඇත්තේය. පාමකෝපියා ග්‍රන්ථයෙකින් විස්තර වියැයුතු එක් එක් ද්‍රව්‍යයක් සහ එක් එක් යෝගයක් සම්බන්ධ රසායනික විශ්ලේෂණ මෙහි ඇතුළත් කිරීමට තවමත් මෙරටේ එම අංශයෙහි දියුණුවක් නැති කම බාධාවක් නිසා අපට නොහැකි වූ බව වෙසෙසින් සඳහන් කළ යුතුය.

ලංකාවේ සහ ඉන්දියාවේ ආයුර්වේද වෛද්‍යවරයන් දසදහස් ගණනක් අතර නිරතුරු ම භාවිත වන සංයෝග දහස් ගණනෙකි. ග්‍රන්ථයන්හි සඳහන් යෝග දස දහස් ගණනෙකි. රසයෝග සාගර නමැති ග්‍රන්ථයෙහි පමණක් යෝග සාරදහස් පන්සියයෙකි. මේ යෝග සියල්ල ම සාද ගැනීම හෝ රෝග විෂයෙහි යෙදීම හෝ එක් වෛද්‍යවරයකු හට පහසු කාර්යයක් නොවන්නේය. එමෙන් ම අවශ්‍ය කරුණෙක් ද නොවේ. එක් එක් වෛද්‍යවරයකුට ස්වකීය චිකිත්සාව සාර්ථක ලෙස පවත්වා ගැනීම පිණිස සීමාසහිත යෝග සංඛ්‍යාවක් වුවමනා ය.

දිවංගත, ඍෂිකල්ප ආචාර්ය යාදවජී ත්‍රිකම්ජී ඉන්දියාවේ මෑත යුගයෙහි ජීවත්ව සිටි අති ශ්‍රෙෂ්ඨ වෛද්‍යවරයෙකි. එතුමෝ, පුරා පනස් වසක් මුලුල්ලෙහි සාර්ථක ලෙස යොද විශේෂ ප්‍රතිඵල ලබා ගන්නා ලද ඖෂධ සංයෝග එක්රැස් කොට සිද්ධයෝග සංග්‍රහ නමැති ග්‍රන්ථය සැපයූහ. එහි ඇතුළත් යෝග සංඛ්‍යාව දෙසිය පනස්හයකි. එම සංඥපනයෙහි ආචාර්‍ය යාදවජී මෙසේ ප්‍රකාශ කරයි. ''විශේෂ පළපුරුද්දක් නොමැති, කෘතහස්ත ආචාර්යවරයකු යටතෙහි කර්මාභ්‍යාසය නොලද, වෙදකම ආරම්භ කරන ආධුනික වෛද්‍යයන්ට ශාස්ත්‍රයෙහි සඳහන් අසංඛ්‍ය යෝගයන් අතුරෙන් කිනම් කිනම් යෝග සම්පාදනය කරගත යුතුද යනු බලවත් ප්‍රශ්නයක් වී තිබෙ. එහෙයින් එබඳු වෛද්‍යයන්ට මඟ පෙන්වීම පිණිස මගේ පනස් අවුරුදු චිකිත්සාවෙහි දී විශේෂයෙන් ප්‍රතිඵල ලද යෝග යන් සංග්‍රහ කොට මෙම සිද්ධයෝග සංග්‍රහ නම් ග්‍රන්ථය සම්පාදනය කෙළෙමි'' යනුයි. ආචාර්‍ය යාදවජීගේ මෙම උපදේශය ඖෂධ සංග්‍රහ මුල් පියවර සැපයීමේ කාරක සභාව ඉතා අගය කොට සැලකූ බව සඳහන් කළ යුතුය. ලංකාවේ සහ ඉන්දියාවේ ආයුර්වේද වෛද්‍යවරයන් අතර බහුල වශයෙන් ව්‍යවහාරයෙහි ඇති අතිශය ගුණදායක ලෙස පිළිගත හැකි යෝග පමණක්, මෙම මුල් පියවරෙහි ඇතුළත් කිරීමට අපි සැම උත්සාහයක් ම දැරූ බව සඳහන් කරමු.

නීතිගත වන, ඖෂධ සංග්‍රහයක් සැපයීමේ දී වෛද්‍ය සමාජයේ අදහස් විමසීම අනිවාර්ය වශයෙන් ම කළ යුතු ය. මෙහි ලා එය මැනවින් ඉටුකර ඇති බව ප්‍රකාශ කළ හැකිය. 1966 මැයි 29 වෙනි දින දරණ ආයුර්වේද කොමසාරිස් තුමාගේ නිවේදනයෙන්, එවකට සෞඛ්‍ය අමාත්‍ය ධුරය දැරූ ගරු ඇම්. ඩී. එච්. ජයවර්ධන ඇමති තුමා .විසින් ඖෂධ සංග්‍රහ කොමිටියක් පත් කරණ ලද බව

ප්‍රකාශයට පත් විය. එම ආයුර්වේද ඖෂධ සංග්‍රහ (පාමකෝපියා) කොමිටිය මගින් පහත සඳහන් ප්‍රශ්න මාලාව ලියාපදිංචි වූ ආයුර්වේද වෛද්‍යවරයන් 5,745 ක් ද සිද්ධ වෛද්‍ය වරයන් 705 ක් ද යුනානි වෛද්‍යවරයන් 278 ක් ද (මුළුගණන 6.728ක්) වෙත ලියාපදිංචි තැපෑලෙන් යවන ලදී.

ප්‍රශ්න මාලාව:—''සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තුමා විසින් එවන ලද අංක ඒ.ඩී. 67/66 සහ 1966.7.4වැනි දින දරණ ලිපියේ සඳහන් ආයුර්වේද ඖෂධ සංග්‍රහ කොමිටියේ කාර්ය නියමයන් පරිදි ආයුර්වේද චිකිත්සා ක්‍රම සහ ඖෂධ සංස්කරණය ක්‍රමවත් ලෙස සකස් කිරීමේ පරමාර්ථය උඩ යෝග සංහිතාවක් (වට්ටෝරු ලැයිස්තුවක්) සහ ඖෂධ සංග්‍රහයක් (භෛෂජ්‍ය සංහිතාවක්) සකස් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය බලාපොරොත්තු වෙයි. යෝග සංහිතාව කොටස් දෙකකට සකස් කළ හැකියි.

(1) මතභේද රහිත තනි ඖෂධ යෝග.

(2) ආයුර්වේද, සිද්ධ, යුනානි වෛද්‍යවරයන් විසින් බහුල වශයෙන් භාවිත කරණු ලබන මිශ්‍රිත යෝග.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්නයන්ට ඔබගේ අදහස් හා පිළිතුරු බලාපොරොත්තුවනු ලැබේ.

(1) රජයේ හෝ රජයෙන් ආධාර ලබන ආරෝග්‍යශාලා සහ ඩිස්පැන්සරි, පෞද්ගලික ආයතන, ඖෂධ නිෂ්පාදනාගාර, පෞද්ගලික වෛද්‍යවරයන් සහ පාරම්පරික විශෙෂ වෛද්‍යවරයන් විසින් භාවිත කරනු ලබන ආයුර්වේද ග්‍රන්ථවල සඳහන් උද්භිද, ප්‍රාණිජ සහ ඛනිජ ඖෂධ ද්‍රව්‍යයන් මේ යෝග සංහිතාවට ඇතුළත් වියැ යුතුය.

මේ යෝජනාවට ඔබ එකඟ වන්නෙහි ද? එසේ නැත්නම් කරුණාකර ඔබගේ අදහස් සවිස්තරව දන්වන්න.

(2) වෛද්‍යවරයන්ගේ පරිශීලනයේ පහසුව සඳහා තනි ඖෂධ වර්ග ක්‍රමවත් ලෙස අකාරාදි පිළිවෙලට සටහන් කිරීමට බලාපොරොත්තු වෙයි. පහත සඳහන් ක්‍රම දෙකට ඒවා දක්වෙයි:—

(1) උද්භිද නාමයන්ට අනුව,

(2) සංස්කෘත සහ සිංහල නාමයන්ට අනුව,

ඔබ එකඟ වන්නේ මෙයින් කවර ක්‍රමයකට ද? මේ ක්‍රම දෙකට ම ඔබ එකඟ නොවන්නේ නම් වඩා යෝග්‍ය ක්‍රමයක් හේතු සහිතව දක්වන්න.

(3) ඖෂධ වර්ග කොටස් තුනකට ප්‍රභෙද කළ හැකිය.

(I) ශරීරයේ විවිධ ඉන්ද්‍රියයන් හා ව්‍යුහවල ක්‍රියා කරන ඖෂධ වශයෙන්, එනම්:— හෘදය, යකෘතය, වෘක්ක ආදි ඉන්ද්‍රියවල හා නාඩි, රක්ත ආදි ව්‍යුහවල ක්‍රියා කරන ඖෂධ වශයෙන්,

(II) රෝගවලදී ඖෂධ ක්‍රියා කරන ආකාරයට,

(III) සංහිතා ග්‍රන්ථවල වර්ග කර ඇති ආකාරයට,

මේ ප්‍රභෙදත්‍රය අතුරින් කුමන ප්‍රභෙදයකට ඔබ වඩා කැමැති ද? ඔබගේ අදහස් හේතු සහිතව දක්වන්න.

(4) ආයුර්වේද මිශ්‍රිත යෝග පහත සඳහන් ලෙස යෝග සංහිතාවෙහි ඇතුළත් කළ හැකිය.

(I) ආයුර්වේද ග්‍රන්ථවල සඳහන් මිශ්‍රිත යෝග අනුව,

(II) රජයේ සහ රජයෙන් ආධාර ලබන ආරෝග්‍යශාලා සහ ඩිස්පැන්සරිවල භාවිත කරන මිශ්‍රිත ඖෂධ යෝග අනුව,

(III) ඖෂධ සංස්කරණ ආයතනවල සාදනු ලබන මිශ්‍රිත ඖෂධ යෝග අනුව, මෙවායින් ඔබ වඩා කැමැති කොයි ක්‍රමයට ද?

ඔබ මේ ක්‍රමයන්ට වඩා වෙනස් ක්‍රමයකට කැමැති නම් කරුණාකර එය හේතු සහිතව දක්වන්න.

(5) දේශීය වෛද්‍ය ග්‍රන්ථ, හස්ත ලේඛන සහ වෙද පරම්පරාවල ඖෂධ යෝග රාශියක් දක්නා ලැබේ. යෝගසංහිතාවෙහි ඇතුළත් කිරීමට ඔබ විසින් අනුමත කරනු ලබන එම ග්‍රන්ථ, හස්තලේඛන හෝ වෙද පරම්පරාවල නම් සඳහන් කරන්න. ඒවා ලබාගත හැක්කේ කවර ස්ථානවලින් ද?

(6) වෛද්‍යවරයන් විසින් භාවිත කරනු ලබන වෛද්‍ය ග්‍රන්ථවල සඳහන් නැති ඉතා ගුණදායී ඖෂධයන් යෝග සංහිතාවේ ඇතුළත් කළ යුතු ද? එසේ ඇතුළත් කළ යුතු නම් එම ඖෂධ යෝගවල නම්, වට්ටෝරු සහ ගුණ සඳහන් කරන්න.

(7) මිශ්‍රිත යෝග සම්බන්ධයෙන් පහත සඳහන් යෝජනාවන්ට ඔබ එකඟ ද?

(I) ආයුර්වේද ග්‍රන්ථවල සඳහන් වර්ගීකරණයන් නොසලකා අකාරාදි පිළිවෙළින් මිශ්‍රිත යෝග දැක්වීම.

(II) මිශ්‍රිත යෝග ඖෂධ සංස්කරණයන්ට අනුව චූර්ණ, ක්වාථ, තෛල, ඝෘත, ආසව, ද්‍රාවක, අරිෂ්ට, අර්ක, සත්ව, ඝනසත්ව, වටිකා, මෝදක, අවලේහ, කූපීපක්ව, බල්ලීරසායන, සින්දූර ආදි වශයෙන් විස්තර කිරීම,මේවායින් කවර යෝජනාවකට ඔබ කැමති ද? ඔබ අන්‍ය යෝජනාවකට කැමති නම් එය හේතු සහිතව දක්වන්න.

(8) මිශ්‍රිත යෝගවල හා ඖෂධ සංස්කරණය කිරීමේදී නා නා මත දක්නට ලැබේ. වෛද්‍ය ග්‍රන්ථවල ඖෂධ යෝගයකට ගතයුතු ඖෂධ වර්ග, ඒවායේ මැනුම් හා ප්‍රමාණය, මාත්‍රා ආදිය සම්බන්ධයෙන් නොයෙක් නොයෙක් වෙනස්කම් දක්නාලැබේ. එවැනි ඖෂධ සංස්කරණය සඳහා පහත දැක්වෙන යෝජනා සැලකිල්ලට භාජන කළ හැකියි:—

(I) ඖෂධ සංස්කරණ යෝගවල ඇති සුලු වෙනස්කම් සැලකිල්ලට භාජනය නො කළ යුතුයි.

(II) එකම සංස්කරණයක වැදගත් වෙනසක් දක්නා ලැබේ නම් එය පාද ටිප්පණි වශයෙන් සඳහන් කළ යුතුයි.

(III) ඖෂධ සංස්කරණවල විශේෂ වෙනස්කම් දක්නා ලැබේ නම් ඒවා වෙනස් යෝග ලෙස සැලකිය යුතුයි.

(9) රෝග නිවාරණය සඳහා යෙදෙන ඖෂධයන්හි පවත්නා ක්‍රියා සහ එල පෙන්වීමට ඒවායේ භෞතික ස්වරූප, රසායනික සහ ජීවරසායනික විශ්ලේෂණයන් දැක්වීම අත්‍යවශ්‍යයි. මෙය ඖෂධ ද්‍රව්‍යවල ශුද්ධතාවය දැනගැනීමටත් යෝගවල ගුණකර්ම පැහැදිලි කිරීමටත් යෝගවල වැදගත්තාවය පැහැදිලිව දැක්වීමටත් ආධාර වෙයි.

(10) භෛෂජ්‍ය කල්පනා වෙනම පරිච්ඡේදයකට ඇතුළත් කළ යුතුයි. ඔබ මෙයට එකඟ ද? එසේ නැත්නම් ඔබේ යෝජනාව කුමක් ද?

(11) ඉහත සඳහන් ප්‍රශ්නමාලාවන් ගැන සලකා බැලීමෙන් පසු යෝගසංහිතාවේ ඇතුළත් කළයුතු වෙනස් තනි ඖෂධ යෝග සහ මිශ්‍රිත ඖෂධ යෝගත් ඒවායේ වැදගත්තාවය සහ ප්‍රයෝජනත් ඒවා යෙදීම සම්බන්ධයෙන් ඔබගේ අදහසුත් දන්වන්න.

(12) ආයුර්වේද ඖෂධ සංග්‍රහය සකස් කිරීමට ආධාරවන යෝග සංහිතාව පිළියෙල කිරීමට අවශ්‍ය අන්‍ය යෝජනා ඇතොත් සඳහන් කරන්න.''

මෙම ආයුර්වේද ඖෂධ සංග්‍රහ (පාමකෝපියා) ප්‍රශ්නමාලාව යවනු ලැබූ වෛද්‍යවරයන් 6,728 දෙනා අතුරෙන් සංගම්,ඖෂධ නිෂ්පාදන ආයතන හා පුද්ගලයන් වශයෙන් පිළිතුරු 273 ක් ලැබිණ. සාමාජිකයන් සිය ගණනින් යුත් සංගම් මගින්, සාමූහික වශයෙන් ද පිළිතුරු එවා ඇති හෙයින් මේ පිළිතුරු සංඛ්‍යාව ඉතා විශාල බව කිව යුතු ය. එම පිළිතුරු අතරින් අංක 5 දරණ ප්‍රශ්නයට විපක්ෂව පිළිතුරු 3 ක්ද, අංක 6 දරණ ප්‍රශ්නයට විපක්ෂව පිළිතුරු 8 ක්ද, අංක 10 දරණ ප්‍රශ්නයට විපක්ෂව පිළිතුරු 2 ක්ද අංක 11 දරණ ප්‍රශ්නයට විපක්ෂව පිළිතුරු 3 ක්ද ලැබිණ. එසේ විපක්ෂ වූ වෛද්‍යවරයන් විසින් ඒවාට දක්වන ලද හේතූන් සතුටුදායක නොවූ අතර වැඩි අවබෝධයක් ඇතිව පිළිතුරු නො සැපයූ බව ද පැහැදිලි විය. මෙම පිළිතුරු පසළොස හැර අනික් සියළු ම පිළිතුරු පක්ෂ ඒවා වෙති. අංක 11 දරණ ප්‍රශ්නය නො පැහැදිලි නිසා ඊට ද පිළිතුරු ප්‍රයෝජනවත් නො විය.

ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි, සිද්ධායුර්වේද විද්‍යාලයාධ්‍යක්ෂ තුමාගේ පිළිතුරු ඉතා පක්ෂපාතී වූ අතර එම පිළිතුරු මෙම ග්‍රන්ථයේ මුල් පියවර සම්පාදනය කිරීමේදී ගුරුපදේශ වශයෙන් ඉතා අගය කොට සැලැකූ බව ගෞරවයෙන් සඳහන් කරමු. නාවින්නේ ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ හිටපු කළමනාකාර හර්ෂ මහතා ද මානපරිභාෂා, ආසවාරිෂ්ට සන්ධාන පරිභාෂාවන්හි පවත්නා විෂමතානැති කොට සමතාවයක් ඇති කිරීමෙ අවශ්‍යතාව පෙන්වා දුන්නේය. පළාත් පාලන සේවයෙහි නියුක්ත ආයුර්වේද වෛද්‍යවරයන් විසිනුදු දැනට ව්‍යවහාරයෙහි බහුලවඇති සංයෝග සම්බන්ධයෙන් අගනා උපදෙස් දැනුම් දුන් බව ස්තුතියෙන් සිහිපත් කළ යුතුය. මහනුවර ආයුර්වේද වෛද්‍ය සංගමය හා මහනුවර සීමාසහිත ආයුර්වේද ඖෂධ වෙළඳ සමාගමේ ඒකාබද්ධ පිළිතුරු පංක්තියෙහි ඇතුළත් පහත සඳහන් කොටස් ඉතා අගය කොට සලකා ක්‍රියාත්මක කිරීමට සෑම උත්සාහයක්ම දැරූ බව ස්තුතියෙන් සිහිපත් කරවමු. එනම්: ''ඖෂධ සංස්කරණය පහසු කිරීම සහ ප්‍රමිති කිරීම ඖෂධ සංග්‍රහයක් සකස් කිරීමේ එක් පරමාර්ථයක් බව ප්‍රශ්න මාලාවේ මුලම සඳහන්ය. එම පරමාර්ථය ඉටු කිරීම පිණිස දැන් රටේ පවතින මානපරිභාෂාවේ සහ ඖෂධ සංස්කරණ පරිභාෂාවේ විවිධත්වයන් නැති කොට මුළු රටේ ම එකම පරිභාෂාවක් අනුව මැනුම් කිරුම් ආදිය සිදු කිරීමට විධිවිධාන යොදන මෙන් යෝජනා කරමු.''

''දැනට තරලසාර, ඝනසාර, ක්වාථ ආදි නවසංස්කරණ මේ රටේ ප්‍රතිකාර ක්‍රමයෙහි බහුල ලෙස භාවිත වේ. එය නැති කිරීමට නො හැකි අතර ප්‍රයෝජනවත් අංශයක්ව ද පවතී. මේ රටේ ද ඒවා නිපදවති. එනමුත් රහසක් වශයෙන් පවතී. තරලසාර-ටිංචර්, ඝනසාර-ඇක්ස්ට්‍රැක්ට් සහ ක්වාථ සංස්කරණය සඳහා පරිභාෂා ක්‍රමයක් සකස් කොට කාගේත් ප්‍රයෝජනය සඳහා ඉක්මනින් ඖෂධ සංග්‍රහයට ඇතුළත් කරණ ලෙස යෝජනා කරමු. ඈත අතීතයේ සිටම ප්‍රතිනිධි ව්‍යවහාරය පැවතින. දැන් අතීතයටත් වඩා නොයෙක් ද්‍රව්‍ය දුෂ්ප්‍රාප්‍යය. එනිසා ප්‍රතිනිධි කාණ්ඩයක් ද එකතු කළ යුතුය.'' මෙම යෝජනා මැනැවින් ම ක්‍රියාත්මක කර ඇති බව ප්‍රකාශ කරමු. 1966 මැයි මාසයේදී පත් කරණ ලද කොමිටියට නියමිත මාස 18 අවසන් වුවද එම කොමිටිය මගින් එක්රැස් කරණ ලද කරුණු මෙම මුල් පියවර සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී.

නිවැරැදි මැනුම්-කිරුම්:- මැනිමෙන් තොරව ද්‍රව්‍යයන්ගේ සංයෝග වීමක් නො වේ ය යි ආචාර්ය ශාර්ඞ්ගධර උගන්වයි. (''න මානෙන විනා යුක්තිර් ද්‍රව්‍යානාං ජායතේ ක්වචිත්'') භෛෂජ්‍ය කල්පනා (සංයෝග සංස්කරණය) උදෙසා ඉතාමත් නිවැරැදි මානචක්‍රයක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව මෙබඳු ආචාර්ය මත අනුව ද පැහැදිළිය. නූතනයෙහි පමණක් නොව ඈත අතීතයෙහි පවා මැනිම ක්‍රම සම්බන්ධයෙන් විවිධත්වයක් පැවැති බව කාලිඞ්ගමාන, මාගධ මාන ආදි වශයෙන් චක්‍ර කීපයක් පැවැත්මෙන්, ඔප්පු වන්නේය. මේ විවිධත්වය වෙනස් කිරිම සඳහා අපට බලවත් පරිශ්‍රමයක් යෙදිය යුතු විය.

සෛද්ධාන්තික වශයෙන් ආයුර්වෙදීය මාන ක්‍රමයේ ආරම්භය පරමාණුවෙනි. සූලහෙහි පාවෙන එක් දූවිලි කඩෙකින් තිහෙන් එක් කොටසක් පරමාණුව බව ආචාර්ය ශාර්ඞ්ගධර උගන්වයි. ප්‍රායෝගික වශයෙන් පරමාණුවෙන් මැනිම කිසිවකුටත් නො කළ හැකිය. එනිසා ආර්ෂයුගයෙහි පටන් ම මැනීමේ මාධ්‍යය වශයෙන් ධාන්‍ය, ඇට, ගෙඩි, කාසි ආදිය භාවිත කළහ. වී, යව, උඳු, තල, අබ, අමු, මසන් (කෝල-වදර-බදර) බුලු, (කර්ෂඵල-අක්ෂ),ආදිය බෙහෙවින් ම ව්‍යවහාර වූ බව දක්නා ලැබේ. ප්‍රායෝගික අංශයෙන් ගුංජා-රක්තිකාව (ඔලිඳ ඇටය) ප්‍රමුඛ වශයෙන් සැලැකිය හැකිය. ලංකාවේ චිරාගත මානක්‍රමයෙහි මදටිය ඇටය (මංචාඩිය) මුල් තැනක් ගනී. මසුරන් (ස්වර්ණමාෂ-රන්මසු-මසුරන්) කහවණු (කහාපණ) පණම, ඇනා, රුපියල් ආදි කාසි වර්ග, ඖෂධ හෝ වෙනත් ද්‍රව්‍ය කිරුම් සඳහා භාවිත විය. එක සමාන බරැති ධාන්‍ය, ඇට, ගෙඩි සැපයීම දුෂ්කර මෙන් ම රටක ආර්ථික ශක්තිය අනුව කාසිවල බර ප්‍රමාණයන් ද වරින් වර වෙනස් වීම ස්වාභාවිකය.

ඉන්දියාවේ පයිසා, ඇනා එක, ඇනා 4, ඇනා 8, ඇනා 16=රුපියල යන කාසි ද ලංකාවේ පණම 16=රුපියල, පණම 8, පණම 4, ශතය, ශත 1/2 යන කාසි ද මෑතක් වන තුරු ම කිරුම් සඳහා භාවිත කළහ. අද දවසේ පවා කලඳට ශතයේ කාසිය භාවිත කිරීම මුලුමනින් ම අභාවයට ගොස් නැත. ක්‍රිස්තු පූර්ව ශත වර්ෂ එකකට හෝ දෙකකට පෙර කාසියක වටිනාකම වශයෙන් ''පලපංච'' යන පදය යෙදී ඇති බව ද, පළමුවන කාශ්‍යප සමයෙහි ''පලපංච'' සංකේතය සහිත රන්කලං කාසියක් සහ දෙළොස්වන සියවසෙහි තඹ කාසියක් තිබුණු බව ද මහාචාර්ය සෙනරත් පරණවිතාන මහත්මාගේ පර්යේෂණ වලින් අනාවරණය වී ඇත්තේය. එතුමා සඳහන් කරණ අයුරු පලපංච-කලකංච-කලහංච-කලංජු-කලඳ යි අනුක්‍රමයෙන් භින්න වෙමින් අවුත් ''කලඳ'' යන පදය සිද්ධ වී ඇත. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා කලං ව්‍යවහාරය සම්බන්ධයෙන් මෙසේ ප්‍රකාශ කරයි. ''කර්ෂාපන කහාපන (පාලි)— මාසක 20 වශයෙන් බුද්ධ කාලයේ මගධ දේශයෙහි භාවිත විය. කහාපනයක බර-ට්‍රෝයි ග්‍රේන්ස් 56 කි. එසේ වුව ද සාමාන්‍ය කලඳක බර ට්‍රෝයි ග්‍රේන්ස්-70 කි. කලඳ කහාපනයකින් පහෙන් කොටසකි. එම එක කොටසක් ''පල'' වශයෙන් හැඳින්වේ. එබැවින් කොටස් 5 ක් පලපඤ්ච ලෙස හැඳින්විය. පලපඤ්ච-කලඤ්ච -කලහංච-කලංජු (දෙමළ) කළඳ, යනු විසිනි.'' ලංකා, ඉතිහාසයේ ආරම්භයේ පටන්ම ''කලං'' ව්‍යවහාරයත් කලඳ කිරුම පිණිස කාසියත් භාවිත කිරීමත් අවිච්ඡන්නව පැවත ආ බව, පිළිගත හැකිය. එනිසා අපේ පැරණි වෛද්‍යවරු කලඳ කිරුම පිණිස තඹ කාසියක් භාවිත කිරීමෙන් වරදක් නොකළ බව කිව හැකිය. එහෙත් ඉහතින් ප්‍රකාශ කළාක් මෙන් ම රටක ආර්ථික ශක්තිය අනුව කලින් කල කාසිවල බර ප්‍රමාණයන් ද වෙනස් වීම ස්වාභාවිකය. එහෙයින් ධාන්‍ය, ඇට, ගෙඩි, කාසි ආදිය කිරුමේ මාධ්‍යය වශයෙන් ව්‍යවහාර කිරීම අයෝග්‍යය. කොපමණ අපහසුකම් විඳ දරා ගෙන හෝ ලංකා (මංචාඩි-කලං) මාන ක්‍රමයත් ඒ සඳහා ස්ථීර ශුද්ධ මානචක්‍රයක් සැපයීමත් අප විසින් කළයුතුම විය.

මගධ දේශයෙහි සුප්‍රසිද්ධ ''මාගධමානය'' මානක්‍රම අතුරින් ශ්‍රෙෂ්ඨය යි, මානක්‍රම සම්බන්ධ විශෙෂඥයන්ගේ පිළිගැනීම බව ආචාර්ය චරක සඳහන් කරයි. (''කාලිඞ්ගාන්මාගධං ශ්‍රෙෂ්ඨමෙවං මානවිදෙ විදුඃ'' චරක. කල්ප. 12අ.) එම ශ්‍රෙෂ්ඨ මාගධ මානයත් ලංකාවේ චිරාගත දේශීය ලංකා (මංචාඩි-කලං) මානක්‍රමයත් ඒකාබද්ධ කොට අතිශයින් ම ශාස්ත්‍රීය වූ මානචක්‍රයක් සැපයීමට පුළුවන් වීම අපට බලවත් සතුටට කරුණෙකි. සාරාර්ථ සංග්‍රහය හා සිංහල යෝගරත්නාකරයේ මානපරිභාෂාව පදනම් කොට ගෙන ඔලිඳ ඇට දෙක මදටිය (මංචාඩි) එකයි, මදටිය ඇට (මංචාඩි) විස්ස කලං එකයි, යනුවෙන් ඇරැඹී මානචක්‍රය අප විසින් සම්පාදනය කරණ ලදී. ඒ සඳහා ඔලිඳ ඇට දහසක් හා මදටිය ඇට දහසක් ඉතා සියුම් ලෙස එකින් එක කිරා ශුද්ධබර ප්‍රමාණයන් සපයා අවශ්‍ය සියලු උපදෙස් දුන් ලංකා (කොළඹ) විශ්වවිද්‍යාලයේ ඖෂධවිද්‍යා මහාචාර්ය ඇස්. ආර්. කෝට්ටෙගොඩ මහත්මා වෙත අපගේ හෘදයංගම ස්තුතිය පිරිනමමු. (මානපරිභාෂා විවේචනය පරිශිෂ්ට සංග්‍රහයෙහි බලන්න).

මෙට්‍රික් (දශම) ක්‍රමය:—අද ලෝකයේ දියුණු ජාතීන් අතර (රටවල් 126 ක පමණ) මෙට්‍රික් ක්‍රමය අති ශීඝ්‍රයෙන් භාවිත වේගන යයි. ඉන්දියාවේ ආයුර්වේද ඖෂධ සංස්කරණය හා වෙළඳ කටයුතු සඳහා දැන් භාවිත වන්නේ මෙට්‍රික් ක්‍රමයයි. ඉන්දියාවේ මධ්‍යම රජය මගින් පනවන ලද 1956 අංක 89 දරණ කිරුම් හා මැනුම් සම්බන්ධ ආඥපනතින් පැරණි තෝලා, ජටාංක, සේරු, පසේරි, මන් (මෝන්ඩ්) ආදි කිරුම් අවලංගු කොට දශ අවුරුද්දක් තුළ දී මෙට්‍රික් (දශම) ක්‍රමයට පරිවර්තනය වීමට නියෝග කරණ ලදී. එම නීතිය අනුව අද ඉන්දියාවේ සියලුම මැනුම් කිරුම් මෙට්‍රික් (දශම) ක්‍රමයට පරිවර්තනය වී ඇත්තේය. අපේ ආයුර්වේද ඖෂධ සංග්‍රහ කොමිටිය ද ලංකා (මංචාඩි-කලං) මාන ක්‍රමය මෙට්‍රික් ක්‍රමයට පරිවර්තනය කළ යුතුය යන යෝජනාව ඒකච්ඡන්දයෙන් පිළිගෙණ ඊට අනුව මානචක්‍රය සපයා ඇත. ලංකා මාන (මංචාඩි-කලං) චක්‍රය සම්බන්ධයෙන් නියෝජ්‍ය සම්මත ප්‍රමාණ භාරකාර එච්. ඇල්. ආර්. ඩබ්ලිව්. මදනායක (බී.ඇස්.සී.) මහතාගේ ප්‍රකාශනයක් ඉදිරියෙහි ඇතුළත්ව ඇත. ඖෂධ සංස්කරණයෙහි දී දිග

මැනීම ද (පාය්‍යමානය) නිරතුරු ම වුවමනා වන්නේය. එම චක්‍රය ද දශම ක්‍රමය අනුව සම්පාදිතය. රස ඖෂධ නිෂ්පාදනාදියෙහි ලා, කාල නියමයන් බෙහෙවින් ම බලපවත්වයි. එනිසා පැරණි ඝටිකා, ප්‍රහර ආදි චක්‍රය නවීන තත්පර මිනිත්තු ක්‍රමයට පරිවර්තනය කොට මෙම ග්‍රන්ථයට ඇතුළත් කරණ ලදී. නුදුරු අනාගතයේ දී ලංකා සම්මත ප්‍රමාණ භාරකාර කාර්යාංශය මගින් අපේ ලංකා (මංචාඩි–කලං) මාන චක්‍රයට අදල මිලිග්‍රෑම්, ග්‍රෑම් ප්‍රතිමාන සාද නීතිගත කරණවා ඇත. මෙය ඓතිහාසික සිද්ධියක් බව කිව යුතුය.

ටින්ක්චර්, ඇක්ස්ට්‍රැක්ට්, ක්වාථ ආදි නම් වලින් ප්‍රසිද්ධ නවීන මුහුණුවරෙකින් ප්‍රචාරය වී ඇති සංයෝග බටහිර වෙදකමින් කොපි කරණ ලදැයි සමහර අය විරුද්ධ වනු නිසැකය. එය ආයුර්වේද භෛෂජ්‍ය කල්පනාවේ පතුල නොදැනීම නිසා සිදුවන වරදෙකි. චරක සංහිතා කල්පස්ථානයෙහි සඳහන් අති සූක්ෂ්ම භෛෂජ්‍ය කල්පනා අනුව මේ නූතන සංස්කරණ බිහි වී ඇති බව ඒ සම්බන්ධයෙන් පරිශිෂ්ට සංග්‍රහයෙහි ඇතුළත් විවේචනයෙන් අවබෝධ වෙනවා ඇත. ආයුර්වේදීය භෛෂජ්‍ය කල්පනාව (ඖෂධ සංස්කරණය) ඉතා සියුම්ය. ආචාර්ය ජීවක, බෙහෙත් ගල්වන ලද මහනෙල්මල් තුනක් ආඝ්‍රාණය කරවා බුදුරදුන්ට විරේචනය කරවූ බව බෞද්ධ සාහිත්‍යයෙහි සුප්‍රසිද්ධය. ''ජීවකාචාර්ය තෙමේ මහනෙල් මල් පිළිගන්වා බුදුරදුන්ට මෙසේ ප්‍රකාශ කෙළේය. ''ස්වාමීනි! මේ පළමුවන මල එක් වාරයක් ආඝ්‍රාණය කළ කල්හි දශවාරයක් විරේකව ශරීරයෙහි උග්‍ර වූ දෝෂ පලා යෙයි. දෙවන මහනෙල් මල ආඝ්‍රාණය කළ කල ද දශවාරයක් විරේකව මධ්‍යම වූ දෝෂ පලා යෙයි. පසුව තුන්වන මහනෙල් මල ආඝ්‍රාණය කළ කල ද දශවාරයක් විරේක ව සියුම් වූ දෝෂ පලා යෙයි.'' (පූජාවලිය 28 පරිච්ඡේදය) ජීවකයෝ මෙසේ මහනෙල් මල් තුනක් ආඝ්‍රාණය කරවා බුදුරදුන්ට සමතිස් වරක් විරේචනය කරවූහ. ආයුර්වේදීය ඖෂධ සංස්කාරය පරගැති වූවක් නොව ස්වාධීන වූ ද අති සියුම් විද්‍යාත්මක පදනමක් මත ගොඩනැහුනා වූ ද ක්‍රමයක් බව පැහැදිලිය. අපේ ඖෂධ සංග්‍රහයෙහි ආඝ්‍රාණ විරේචන යෝගයක් සහ ආඝ්‍රාණ වමනයෝගයක්ද ඇතුළත් කරණ ලද්දේ ශාස්ත්‍රගෞරවය පිණිස බව සිහිපත් කරවමු. (චරක. කල්ප. 3–10 යන අධ්‍යායයන්හි බලන්න.) නවීන වෛද්‍ය විද්‍යානුකූලව ටින්ක්චර්ස්, ඇක්ස්ට්‍රැක් පිළියෙල කිරීම අරභයා උපදෙස් සපයා දුන් ඩී. ඒ. ඊ. මුණසිංහ (රජයේ බෙහෙත් ගබඩා අධිකාරි) මහතාගේ සේවයද කෘතඥතා පූර්වකව සඳහන් කරමු.

ඉන්දියාවේ ඖෂධ සංග්‍රහ කොමිටිය මානපරිභාෂා, ඝෘත–තෛල කල්පනා, අරිෂ්ට–ආසව කල්පනා, ආදි එක් එක් අංශය සඳහා වෙන් වෙන් අතුරු කාරක සභා පත්කළ නමුත් අපේ ඖෂධ සංග්‍රහ මුල් පියවර සකස් කිරීමේ කාරක සභාවට සියලුම කටයුතු සිදු කිරීමට සැලැසීම බලවත් අපහසුවෙක් විය. එහෙත්, අප මහත් පරිශ්‍රමයෙන් හා බලවත් ආශාවෙකින් යුක්තව සියලු කටයුතු ප්‍රවේශමින් ඉටු කර ඇති බව පාඨකයන්ට අවබෝධ වනු නිසැකය. ඒ සඳහා නොයෙකුත් පොතපතින් කරුණු එක්රැස්කර ගැනීමට අපට උපකාර කළ වෛද්‍යාචාර්ය ඇම්. එච්. ඇස්. ගුණතිලක, ඩී.අයි.ඇම්.ඇස්., එච්.පී.ඒ. මෙනෙවිය, වෛද්‍යාචාර්ය ඇම්. ඇස්. කැකුලාවල, ඩී.අයි.ඇම්.ඇස්., එච්.පී.ඒ., මෙනෙවිය හා ටී. ඒ. චන්ද්‍රවතී මෙනෙවියටයද, ටයිප් ගැසීමේ කටයුතු සඳහා සහාය වූ ඇම්.කේ. කුලරත්න හා ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු යන මහතුන් ඇතුළු ආයුර්වේද දෙපාර්තමේන්තුවේ යතුරු ලේඛිකාවනට ද අපේ බලවත් ස්තුතිය හා කෘතඥතාව පිරිනමමු.

ඉන්දියාවේ ආයුර්වේද ඖෂධ සංග්‍රහය සම්බන්ධ නොයෙක් තොරතුරු රජයෙන් කිසිදු වියදමක් නොමැතිව සපයා ගෙන ඇති බව පාඨකයන්ට අවබෝධ වනු නිසැකය. ඒ තොරතුරු සපයා ගැනීමට උපකාර කළ බිහාර් රාජ්‍ය ආයුර්වේද-යුනානි-විද්‍යාපීඨයේ (ෆැකල්ටියේ) සභාපති, සමස්ත ඉන්දියා ආයුර්වේද හා යුනානි පීඨයේ හා මණ්ඩලයේ මධ්‍යම කාරක සභාවේ සභාපති (Chairman of the Central Council of the Indian Ayurvedic and Unani faculties and Board) පණ්ඩිත ප්‍රාණාචාර්ය ශ්‍රී දුර්ගා ප්‍රසාද් ශර්මාගේ නම ගෞරව සම්ප්‍රයුක්තව හා කෘතඥතා පූර්වකව සිහිපත් කරවමු. රසසංස්කරණ ඛණ්ඩයෙහි ඇතුළත් පාරද අෂ්ට සංස්කරණ තාලිකාව සහ වාසුදේව යන්ත්‍රයත් රාම නාරායණ යන්ත්‍රයත් අපේ ඖෂධ සංග්‍රහයට ඇතුළත් කිරීමට අවසර දුන්, ජාම්නගර ආයුර්වේද විශ්වවිද්‍යාලයයෙහි, හිටපු රසශාස්ත්‍ර–භෛෂජ්‍ය කල්පනා මහාචාර්ය ශ්‍රී වාසුදේව මූලශංකර් ද්විවේදි මහතා සහ එම පාරද අෂ්ටසංස්කාර පර්යේෂණය පැවැත්වූ ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයේ දතියා හි ශ්‍රී ශර්මා ආයුර්වේද මන්දිරයේ අධ්‍යක්ෂ මණ්ඩලය ද ඉන්දියාවේ මානපරිභාෂාව දශම (මෙට්රික්) ක්‍රමයට පරිවර්තනය කිරීම සම්බන්ධ වාර්තා සහ එම මාන චක්‍ර සපයා එවන ලද නව දිල්ලියේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ජ්‍යෙෂ්ඨ ආයුර්වේද පර්යේෂණ නිලධාරි වෛද්‍ය ශිව කුමාර් මිශ්‍ර (ඇම්.ඒ.) මහතා ද ඉතාමත් ගෞරව සම්ප්‍රයුක්තව සිහිපත් කරවමු.

හිටපු සෞඛ්‍ය අමාත්‍යවරුන් වන ගරු ඒ. පී. ජයසූරිය, ගරු බදි උද්දීන් මහමූද්, ගරු ඇම්. ඩී. එච්. ජයවර්ධන මහතුන් හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් කු. බාලසිංහම් මහතා ද ඒ මහතුන් සමග ඖෂධ සංග්‍රහය සම්බන්ධ සාකච්ඡා පැවැත්වූ හිටපු ආයුර්වේද කොමසාරිස් තැන්පත් ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු, මහාචාර්ය ඇස්. ඩබ්ලිව්. බිබිලේ මහතුන් ද හිටපු ආයුර්වේද කොමසාරිස් ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න මහතා ද, ආචාර්ය ආර්. ආර්. පාඨක් මහතා ද ස්තුති පූර්වකව සඳහන් කළ යුතුය. දැනට වැඩ නිම කර ඇති ඖෂධ සංග්‍රහ මුල් පියවරේ කටයුතු සාර්ථක කර ගැනීමට සෑම අනුබලයක් ම සහයෝගයක්ම දුන් රාජකාරි කටයුතු ඉතා දක්ෂ අන්දමින් කාර්යක්ෂමව සම්පාදනය කළ වර්තමාන ආයුර්වේද කොමසාරිස් තැන්පත් විමල් නවගමුව මහතා විශිෂ්ට ගෞරවයට හිමිකරුවකු බව සතුටින් ප්‍රකාශ කරමු. දිවංගත මහාමාන්‍ය ඩී. ඇස්. සේනානායක අගමැතිතුමා මුලින් ම අතගැසූ මෙම ඖෂධ සංග්‍රහ ප්‍රශ්නය අවසන් වරට විසඳා සාර්ථක ලෙස අවසන් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සියලු අවශ්‍යතා සම්පූර්ණ කොට බලය ලබා දුන් වර්තමාන සෞඛ්‍ය අමාත්‍ය ගරු ඊ. ඇල්. සේනානායක මහතාගේ නාමය ලංකා ඉතිහාසයෙහි රන් අකුරින් ලියැවෙනු නිසැකය.

අවසාන වශයෙන්, මෙම ඖෂධ සංග්‍රහ මුල් පියවර සර්ව සම්පූර්ණ නොවන බව කිව යුතුය. බොහෝ අඩුපාඩු කම් ඇති බවට කිසි සැකයෙක් නැත. අවුරුද්දක් පමණ සුලු කලෙක දී මෙතරම් බරපතල වගකීමකින් යුත් කාර්යයක් සම්පූර්ණ ලෙස අවසන් කිරීම දුෂ්කරය. ආයුර්වේද ඖෂධ සංයෝගයන්හි (සන්දිග්ධ) අවිනිශ්චිත ද්‍රව්‍ය බොහෝ තන්හි විද්‍යමානය. එබඳු ඖෂධ සංස්කෘත නාමයෙන් ම යොද ඇත. ''බාලා'' ''බාලක'' යන නමින් සඳහන් ද්‍රව්‍යය ලංකාවේ වෛදවරු අතර ඉරිවේරිය වශයෙන් ව්‍යවහාරය.

එහෙත් බාලා ඉරිවේරිය නොවේ. එය සැවැන්දරා වැනි සුවඳ මුල් විශේෂයකි. එබඳු අවිනිශ්චිතව පවත්නා ද්‍රව්‍ය, මුල් නාමයෙන් ම යොදන ලදී. අනාගතයේදී විනිශ්චයක් ලද විට එය වෙනස් කළයුතුය. ඉන්දියාවේ (සන්දිග්ධ) අවිනිශ්චිත ද්‍රව්‍ය විනිශ්චය සඳහා වෙනම කාරක සභාවක් පත්කර ඇත. නුදුරු අනාගතයේ දී ලංකාවේද එය සිදුවීමට පුළුවන.

ඖෂධ සංග්‍රහයක් වූ කලී වැඩෙන ගසෙක් වැනිය. වැඩෙන ගසෙක පැරණි අතුපතර දිරාපත් වන අතර අලුත් අතු පතර ලියලයි. එමෙන් ම ඖෂධ සංග්‍රහයෙක් හි ද ඇතැම් කරුණු වෙද සමාජයට අනවශ්‍යය යි පෙනී යන විට ඉවත්ව, වඩා සුදුසුකරුණු අලුතෙන් එක්වන්නේය. මෙම ඖෂධ සංග්‍රහයෙහි ද අඩුපාඩු, අයෝග්‍ය තැන්, භාවිතයේදී පෙනී යාමට පුළුවන. අනුග්‍රහ බුද්ධියෙන් එබඳු තැන් පෙන්වා දීම බුද්ධිමත් වෛද්‍ය සමාජයේ යුතුකමෙකි. එබඳු කරුණු වරින්වර සංශෝධනය කිරීමට අනාගත ඖෂධ සංග්‍රහ කොමිටි අදහස් කරණුවට සැකයෙක් නැත. එනිසා ඖෂධ සංග්‍රහ ග්‍රන්ථයෙන් ප්‍රයෝජන ගන්නා වෙද සමාජයෙන්, එහි අඩුලුහුඩු කම් පෙන්වා දෙන අතර වඩ වඩා සුදුසු අදහස් ඉතසිතින් පෙන්වා දෙන ලෙස ඖෂධ සංග්‍රහ කොමිටිය ගෞරවයෙන් ඉල්ලා සිටී. ලියාපදිංචි වූ සැම වෛද්‍යවරයකු විසින් ම මෙම ඖෂධ සංග්‍රහය අනිවාර්ය වශයෙන්ම භාවිත කළයුතු වන හෙයින් සැම දෙනාට ම අදහස් දැක්වීමට අවස්ථාව විවෘතව ඇත්තේය.

මේ වගට,

ආයුර්වේද ඖෂධ සංග්‍රහ කොමිටියේ සම්මතය හා
මුල්පියවර සැපයීමේ කාරක සභාවේ නියමය පරිදි,

1970ක්වූ මැයි මස 2 වෙනි දිනදීය.

වෛද්‍යාචාර්ය ඩී. ඇම්. ජයසිංහ
(1970/71 කාරක සභාවේ සභාපති)

ආයුර්වේද ඖෂධ සංග්‍රහ සම්පාදක මණ්ඩලය

1969—1970

සභාපති: වෛද්‍යාචාර්ය, එච්. කේ. බුද්ධදස, D.I.M. & S. (Hon) Cey. මහතා
"වෛද්‍යශිරෝමණි"
විශ්‍රාමලත් වෛද්‍යාධිකාරි, රජයේ ආයුර්වේද මහාරෝග්‍යශාලාව, කොළඹ.

වෛද්‍යාචාර්ය, ඩී. ඇම්. ජයසිංහ D.S.A.C. (Hon) Cey. මහතා,
"සිද්ධායුර්වේදඥ" ප්‍රාණාචාර්ය.

වෛද්‍යාචාර්ය, ඩී. එච්. රාජපක්ෂ, D.I.M.&S. (Hon) Cey. මහතා.
විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය, කොළඹ.

වෛද්‍යාචාර්ය, පණ්ඩිත, කේ. ජී. පී. ජයතිලක, D.I.M. & S. (Hon) Cey. M.A.M.S. (Hon. Cal.) A.S.F. & M.A.S.F. (Bengal) මහතා.

වෛද්‍යාචාර්ය, ඇස්. ඇම්. පොන්නයියා, L.I.M. Madras, මහතා.
විශ්‍රාමලත් සිද්ධකථිකාචාර්ය, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය, කොළඹ.

වෛද්‍යාචාර්ය. ඒ. සභාපති පිල්ලේ, L.I.M. Madras මහතා.
විශ්‍රාමලත් සිද්ධ වෛද්‍යාචාර්ය, රජයේ ආයුර්වේද මහාරෝග්‍යශාලාව, කොළඹ.

වෛද්‍යාචාර්ය, එච්. ඇම්. ජාපර්, L.I.M. Madras, මහතා.
"රාජවෛද්‍ය" J.P.
විශ්‍රාමලත් යුනානි ප්‍රධාන කථිකාචාර්ය සහ විශ්‍රාමලත් වෛද්‍යාධිකාරි, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය සහ මහාරෝග්‍ය ශාලාව, කොළඹ.

ලේකම්: වෛද්‍යාචාර්ය, ඇස්. ඩී. ඇස්. නානායක්කාර, D.I.M. & S. (Hon.) Cey. මහතා.
"වෛද්‍යශිරෝමණි"
වෛද්‍යාධිකාරි, රජයේ ආයුර්වේද මහාරෝග්‍යශාලාව, කොළඹ.

1970—1971

සභාපති: වෛද්‍යාචාර්ය, ඩී. ඇම්. ජයසිංහ, D.S.A.C. (Hon. Cey.) මහතා.
"සිද්ධායුර්වේදඥ" ප්‍රාණාචාර්ය.

වෛද්‍යාචාර්ය, ඩී. එච්. රාජපක්ෂ, D.I.M. & S. (Hon. Cey.) මහතා.
විශ්‍රාමලත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය, කොළඹ.

වෛද්‍යාචාර්ය, පණ්ඩිත, කේ. ජී. පී. ජයතිලක, D.I.M. & S. (Hon. Cey.) M.A.M.S. (Hon. Cal.) A.S.F. & M.A.S.F. (Bengal) මහතා.

වෛද්‍යාචාර්ය, ඩී. එච්. එදිරිසිංහ, D.I.M. & S. Cey. L.M. Dub. මහතා.
හිටපු විද්‍යාලයාධිපති, රජයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය, කොළඹ.
විශේෂ ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි, රජයේ ආයුර්වේද මහාරෝග්‍යශාලාව, කොළඹ..

වෛද්‍යාචාර්ය, ඇස්. ඇම්. පොන්නයියා, L.I.M. Madras මහතා.
විශ්‍රාමලත් සිද්ධ කථිකාචාර්ය, රජයේ ආයුර්වේද මහාරෝග්‍යශාලාව, කොළඹ.

වෛද්‍යාචාර්ය, ඒ. සභාපතිපිල්ලේ, L.I.M. Madras මහතා.
විශ්‍රාමලත් සිද්ධවෛද්‍යාචාර්ය, රජයේ ආයුර්වේද මහාරෝග්‍යශාලාව, කොළඹ.

වෛද්‍යාචාර්ය, එච්. ඇම්. ජාපර්, L.I.M. Madras මහතා.
''රාජවෛද්‍ය'' J.P.
විශ්‍රාමලත් යුනානි ප්‍රධාන කථිකාචාර්ය සහ
විශ්‍රාමලත් වෛද්‍යාධිකාරී, ආයුර්වේද විද්‍යාලය සහ මහාරෝග්‍යශාලාව, කොළඹ.

ලේකම්: වෛද්‍යාචාර්ය, ඇස්. ඩී. ඇස්. නානායක්කාර, D.I.M. & S. (Hon.) Cey. මහතා.
''වෛද්‍යශිරෝමණි''
වෛද්‍යාධිකාරී, රජයේ ආයුර්වේද මහාරෝග්‍යශාලාව, කොළඹ.

සහායක ග්‍රන්ථ

අභිධාන චින්තාමණි ... මණිප්‍රභා හින්දිව්‍යාඛ්‍යා, ශ්‍රී හරගෝවින්ද ශාස්ත්‍රී, චෞඛම්බා, බාරාණසී, 1964.
අමරකොෂ ... ... අමරසිංහාචාර්ය, වැ. විමලජෝති හිමි සංස්කරණය 1934.
අර්කප්‍රකාශ ... ... ශාලිග්‍රාමජී වෛශ්‍ය, භාෂාටීකා සහිත, බොම්බාය, ශ.ව. 1828.
අෂ්ටාංග සංග්‍රහ ... ... සර්වාංගසුන්දරී ව්‍යාඛ්‍යා, පණ්ඩිත ශ්‍රී ලාල් චන්ද්‍ර ශාස්ත්‍රී, ශ්‍රී වෛද්‍යනාථ ආයුර්වේද භවන්, කල්කටා 1965.
අෂ්ටාංග හෘදය සංහිතා ... අන්නා මොරේශ්වර්කුංටෙ සංස්කරණය, බොම්බාය, නිර්ණය සාගර, 1925.
ආයුර්වේද විඥාන ... ... කවිරාජ විනෝද ලාල් සේන් සංස්කරණය, කල්කටා. 1916.
ආයුර්වේද සංග්‍රහ ... ... කවිරාජ ශ්‍රී නරේන්ද්‍ර නාථ සේන්, කල්කටා, 1928.
ආයුර්වේද සංග්‍රහ, සචිත්‍ර ... ශ්‍රී වෛද්‍යනාථ ආයුර්වේද භවන් ප්‍රකාශන කල්කටා, 1968–69.
ආයුර්වේද සාර සංග්‍රහ ... 6 වෙනි සංස්කරණය, රාම් නාරායණ වෛද්‍ය, ශ්‍රී වෛද්‍යනාථ ආයුර්වේද භවන් ප්‍රකාශන, කල්කටා, 1966.
ආසවාරිෂ්ට විඥාන ... ... ආචාර්ය ශ්‍රී පක්ෂධරඣා, පටනා ආයුර්වේද විද්‍යාලය, චෞඛම්බා බාරාණසී මුද්‍රණය, 1962.
කාය චිකිත්සා 2 භාග ... ආචාර්ය රාම්රක්ෂ පාඨක්, චෞඛම්බා මුද්‍රණය, 1965.
කුමාරෞෂධමාලා ... ... ඒ. ජේ. පෙරේරා අප්පුහාමි, පැලියගොඩ සත්‍යසමුච්චය, 1889.
කෞටිලීය අර්ථශාස්ත්‍රම් ... හින්දිව්‍යාඛ්‍යා, ශ්‍රී වාචස්පති ගෛරෝලා, චෞඛම්බා, බාරාණසී, 1962.
චක්‍රදත්ත ... ... ශ්‍රීමත් ජයදේව විද්‍යාලංකාර සංස්කරණය, මෝතිලාල් බනාර්සිදස්, ලාහෝර්, 1925.
චක්‍රදත්ත සිංහලානුවාදය ... ආයුර්වේද ශාස්ත්‍රී, ආර්. බුද්ධදස, කොළඹ අනුලා මුද්‍රණය, 1961.
චරක සංහිතා ... ... කවිරාජ් නරේන්ද්‍රනාථ ශාස්ත්‍රි සංශෝධනය, මෝතිලාල් බනාර්සිදස්, ලාහෝර්, 1929.
චරක සංහිතා සිංහලානුවාදය ... ආයුර්වේද ශාස්ත්‍රී, ආර් බුද්ධදස, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, 1960.
දේශීය වට්ටෝරු
මුද්‍රිත හා අත්පිටපත් ආදිය ...
ද්‍රව්‍යගුණ,
9 සංස්කරණය ... ... කවිරාජ් දේවේන්ද්‍රනාථ හා උපෙන්ද්‍රනාථ සේන් ගුප්ත කල්කටා, වංගාබ්ද, 1342.
පරිභාෂා ප්‍රදීප (වෛද්‍යක) ... ශ්‍රී ගෝවින්දසේන, කල්කටා, 1906.
පාචන සංග්‍රහ ... ...
10 සංස්කරණය ... ... කවිරාජ් දේවේන්ද්‍ර නාථ සේන්, කල්කටා, වංගාබ්ද 1344.
පාරද විඥානීයම් ... ... වෛද්‍ය වාසුදේව මූලශංකර් ද්විවේදී, දතියා මධ්‍යම ප්‍රදේශ, ඉන්දියා, 1969.
ප්‍රයොග සමුච්චය ... වෛද්‍යක ජේ. ඇස්. රාජසුන්දර ආරච්චි තැන, ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලය, ශ්‍රී බු ව. 2438.
ඵලිත චිකිත්සාවිධාන
2 සංස්කරණය ... ... කවිරාජ් ශ්‍රී රාබාල්දත්ත වෙද්‍ය ශාස්ත්‍රි, ඪැකා, 1928.
භයිසජ්‍ය තෙල් පොත ... දෙන් ජෝන් වයිද්‍යාචාරි තැන, ශාස්ත්‍රධාර යන්ත්‍රාලය, 1897.
භාරත භෛෂජ්‍ය රත්නාකර ... 1–5 කාණ්ඩ, ශ්‍රී නගීන්දස් ජගන්ලාල්ශාන්, චෞඛම්බා, 1935.
භාරතීය වනෞෂධි ... 1–3 කාණ්ඩ, දෙස්තර ශ්‍රී කාලීපද විශ්වාස, කල්කටා විශ්ව විද්‍යාලය මුද්‍රණය, 1950.
භාරතීය භෛෂජ්‍යතත්ව ... දෙස්තර ශ්‍රී කාර්තික් චන්ද්‍ර බසු, කල්කටා, වංගාබ්ද, 1342.
භාව ප්‍රකාශ ... ... කවිරාජ් ශ්‍රී දේවේන්ද්‍රනාථ සේන් සංස්කරණය කල්කටා, වංගාබ්ද 1338 (1938).
I භෛෂජ්‍යරත්නාවලි ... කවිරාජ් විනෝදලාල් සේන් සංස්කරණය, වංගානුවාද සහිත 6 මුද්‍රණය, කල්කටා, 1909.

II භෛෂජ්‍යරත්නාවලී ...	... කවිරාජ් ශ්‍රී නරේන්ද්‍රනාථ මිත්‍ර සංස්කරණය, මෝතිලාල් බනාරසීදස්, ලාහෝර්, 1930.
ඖෂධ මංජූෂා ...	... කවිරාජ් ශ්‍රී සුශීල කුමාර් සේන්, විශ්වනාථ ආයුර්වේද මහා විද්‍යාලය, කල්කටා, වංගාබ්ද, 1342.
යාදවස්මෘති ග්‍රන්ථ ...	... ශ්‍රී යාදවජී ත්‍රිකමජී ආචාර්ය අභිනන්දන ග්‍රන්ථය.
යෝගදර්ණ සිංහල පද්‍ය ...	
යෝගරත්නාකර, ශ්‍රී (සංස්කෘත)	භිෂග්වර්ය කෘෂ්ණශර්මනාබරේ, බොම්බාය, නිර්ණයසාගර, 1920.
යෝගරත්නාකර (සිංහල)	... දෙන් ජෝර්ජ් සමරතුංග රත්ඥ සංස්කරණය, සත්‍යසමුච්චය, 1897.
රසජලනිධි ...	... ශ්‍රී භූදේව මුඛර්ජී, කල්කටා.
රසතරංගිනී ...	... සදානන්ද ශර්මා සංස්කරණය.
රසරත්න සමුච්චය ...	... කවිරාජ් දේවේන්ද්‍ර නාථ සේන් ගුප්ත සංස්කරණය, කල්කටා, 1930.
රස ශාස්ත්‍ර (සංස්කෘත)	... කවිරාජ් ශ්‍රී රාඛාල්දස් කාව්‍යතීර්ථ, කල්කටා.
රස ශාස්ත්‍ර (සිංහල) ...	... රාජ වෛද්‍ය ඩී. ඩී. උඩයසේකර, කොළඹ.
රස හෘදය ...	... මුකුන්ද ගුරි, කල්කටා.
I රසේන්ද්‍රසාර සංග්‍රහ	... කවිරාජ් දේවේන්ද්‍රනාථ සේන් ගුප්ත සංස්කරණය, කල්කටා, 1931.
II රසේන්ද්‍රසාර සංග්‍රහ	... හරිදස සංස්කෘත ග්‍රන්ථ මාලා.
වනෞෂධි දර්පණ	... රාජ වෛද්‍ය කවිරාජ් විරජාචරණ ගුප්ත කවිභූෂණ, කල්කටා, 1908.
වට්කාප්‍රකරණය	... අයිලප්පෙරුම 1933 හා නව සංස්කරණය.
වෛද්‍යාත්තංස ...	... ජේ. ඇස්. රාජසුන්දර වෙද ආරච්චි,ආනන්ද යන්ත්‍රාලය, මද්‍රාසිය, 1919.
I ශාර්ඞ්ගධර සංහිතා	... පරශුරාම ශාස්ත්‍රී සංස්කරණය.
II ශාර්ඞ්ගධර සංහිතා	... සිංහලානුවාදය, පණ්ඩිත ආර්යදස කුමාරසිංහ, 1962.
ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය (සිංහල-සිංහලාර්ථ)	... ශ්‍රී සෝරත නාහිමි 1952.
ස්නේහවිධිය හෙවත් බෙහෙත් තෙල් පොත	
සර්පවිෂ සංහාරය ...	... තලගම ඥනාලෝක හිමි, 1954.
සාර සංක්ෂේපය ...	... දෙන් හරමානිස් සමරසිංහ කවිරත්න සන්නය 1911.
සාරාර්ථ සංග්‍රහය ...	... පුස්කොල පොත, නාවින්නේ බ.අ. ආයුර්. පර්යේෂණ පුස්තකාලය.
සිද්ධයෝග සංග්‍රහ ...	... වෛද්‍ය යාදවජී ත්‍රිකමජී ආචාර්ය, 5 සංස්කරණය, ශ්‍රී වෛද්‍යනාථ ආයුර්වේද භවන් ප්‍රකාශන, කල්කටා, 1957.
I සුශ්‍රැත සංහිතා ...	... වෛද්‍ය යාදවජී ත්‍රිකමජී ආචාර්ය සහ නාරායණ රාම් ආචාර්ය සංස්කරණය, බොම්බාය, 1938.
II සුශ්‍රැත සංහිතා ...	... සිංහලානුවාදය ආයුර්වේද ශාස්ත්‍රී ආර්. බුද්ධදස, ලංකාණ්ඩුවේ මුද්‍රණය, 1962.

විෂයානුක්‍රමණිකාව

1. මාන පරිභාෂා—ලංකා (මංචාඩි -කලං) මාන චක්‍රය

    I. කඨින ද්‍රව්‍ය මානය
    II. ද්‍රව ද්‍රව්‍ය මානය
    III. කාලමාන චක්‍රය
    IV. පාය්‍ය (දිග) මාන චක්‍රය

2. දීපන පාචනාදි (සාංකේතික) පරිභාෂාව
3. සංඛ්‍යාවාචක ද්‍රව්‍ය පරිභාෂාව
4. ප්‍රතිනිධි පරිභාෂාව
5. පඤ්චාශත් මහාකෂාය

    1. ප්‍රථම වර්ගය
    2. ද්විතීය වර්ගය
    3. තෘතීය වර්ගය
    4. චතුර්ථ වර්ගය
    5. පංචම වර්ගය
    6. ෂෂ්ඨම වර්ගය
    7. සප්තම වර්ගය
    8. අෂ්ටම වර්ගය
    9. නවම වර්ගය
    10. දශම වර්ගය

6. සප්ත ත්‍රිංශත් ද්‍රව්‍ය ගණය

    1. අංජනාදි ගණය
    2. අම්බෂ්ඨාදි ගණය
    3. අර්කාදි ගණය
    4. ආමලක්‍යාදි ගණය
    5. ආරග්වධාදි ගණය
    7. ඌෂකාදි ගණය
    8. එලාදි ගණය
    9. කාකෝල්‍යාදි ගණය
    10. ගුඩූච්‍යාදි ගණය
    11. තණපස් මුල
    12. ත්‍රප්වාදි ගණය
    13. ත්‍රිකටු ගණය
    14. ත්‍රිඵලා ගණය
    15. දශමූල ගණය
    16. න්‍යග්‍රෝධාදි ගණය
    17. පටෝලාදි ගණය
    18. පරූෂකාදි ගණය
    19. පිප්පල්‍යාදි ගණය
    20. ප්‍රියංග්වාදි ගණය
    21. මහපස්මුල් ගණය
    22. මුස්තාදි ගණය
    23. මුෂ්කකාදි ගණය
    24. ලාක්ෂාදි ගණය
    25. ලෝධරාදි ගණය
    26. වචාදි ගණය
    27. වරුණාදි ගණය
    28. වැල්පස්මුල් ගණය
    29. විදරිගන්ධාදි ගණය
    30. වීරරතර්වාදි ගණය
    31. වෘහත්‍යාදි ගණය
    32. ශාරිබාදි ගණය
    33. ශ්‍යාමාදි ගණය
    34. ශාලසාරාදි ගණය
    35. සුරසාදි ගණය
    36. සුළු පස්මුල් ගණය
    37. හරිද්‍රාදි ගණය

7. ද්‍රව්‍ය ග්‍රහණ නිර්දේශය

    I. ද්‍රව්‍ය ග්‍රහණ විධිය
    II. වර්ජනීය ඖෂධ ග්‍රහණය
    III. ද්‍රව්‍යමාන ක්‍රමය
    IV. යෝග ගුණ හීනත්වය
    V. ඖෂධ ප්‍රයෝග කාල
    VI. ඖෂධ සංරක්ෂණ නියමය

8. භෛෂජ්‍ය කල්පනා පරිභාෂාව—කෂාය සංස්කරණ විධි

    1. ස්වරස
        I. පුටපාක ස්වරය
        II. දෝපාලක ස්වරස
    2. කල්ක
    3. ක්වාථ=ශෘත කෂාය
        I ප්‍රමථ්‍යා කෂාය
        II ක්ෂීර කෂාය
        III ස්වර්ණසත්නිර කෂාය
        IV වාලු කෂාය
    4. හිම–ශීත කෂාය
    5. ඵාණ්ට කෂාය
    6. චූර්ණ
    7. භාවනා
    8. ක්ෂාර නිර්මාණය
    9. සත්ව කල්පනා

10. ගුටිකා
    I වර්ති
    II චක්‍රිකා

11. අවලේහ

    1. රසක්‍රියා

12. ඝෘත තෛල කල්පනා

1. විධි නියමය
2. පාකය
3. තෛල මූර්ච්ඡා

    I තිල තෛල මූර්ච්ඡා
    II ඝෘත මූර්ච්ඡා
    III එරණ්ඩ තෛල මූර්ච්ඡා
    IV කටු තෛල මූර්ච්ඡා
    V නාරිකේල තෛල මූර්ච්ඡා

13. සන්ධාන කල්පනා
1. ආසව
2. අරිෂ්ට

    I පරිභාෂාව
    II මධුර පදර්ථ යෙදීම
    III ප්‍රක්ෂේපය
    ස්වර්ණප්‍රක්ෂේපය
    IV 1. ස්වර්ණ ලවරණය
    ලෞහමිශ්‍රණය
    V 1. ලෞහද්‍රැතිය
    VI ධාතකීපුෂ්ප-මධූක පුෂ්ප ප්‍රයෝගය
    VII සුරා බීජ=කිණවප්‍රයෝගය
    VIII සන්ධානභාජන මුඛ බන්ධනය
    IX සන්ධානකාලය
    X රක්ෂණ කාර්‍යය
        1. වක්තව්‍යය

14. සුරාසන්ධානය
    I ප්‍රසන්නා
    II කාදම්බරී
    III ජගල
    IV සුරාබීජ
    V සීධු
    VI වාරුණී
    VII සුරාසාර

15. ශුක්ත සන්ධානය
    I ගුඩ ශුක්තය
    II ඉක්ෂු ශුක්තය
    III කාංජික
    IV තුෂාම්බු
    V සෞවීර
    VI ආරනාල
    VII සංධාකී
    VIII දේශීය බස්න ක්‍රමය
    IX නාරිකේලාසව

16. ඖෂධසාර-තරල සාර සංස්කරණය (ඉංග්‍රීසි පිටපත)
1. ද්‍රවසාර ගණය
    I මිශ්ශේරියා ද්‍රව සාරය
    II ත්වක් ද්‍රව සාරය
    III පුදිනා ද්‍රව සාරය
    IV අජමෝද ද්‍රව සාරය
    V කර්පූර ද්‍රව සාරය

2. ඖෂධසාරගණය

1. හිංගුසාරය
2. මාංසී සංයෝග සාරය
3. ශුණ්ඨී සාරය
4. විෂතින්දුක සාරය
5. අහිඵේන සාරය
6. එලා සාර සංයෝග සාරය
7. කර්පූරසාර සංයෝග සාරය
8. ලශුන සාරය
9. ගුග්ගුලු සාරය
10. අප්වාත් සාරය
11. චිරතා සාරය
12. කුෂ්ඨ සාරය
13. කතක සාරය

3. ඖෂධ තරල සාර ගණය

1. යෂ්ටි මධු තරල සාරය
2. ස්වර්ණ පත්‍ර තරල සාරය
3. ධාන්‍යක තරල සාරය
4. ගුඩූචි තරල සාරය
5. සප්තපර්ණී තරල සාරය
6. තුලසි තරල සාරය
7. කිරාතතික්ත තරල සාරය
8. පර්පටක තරල සාරය
9. ධන්වයාස තරල සාරය
10. භූනිම්බ තරල සාරය
11. මංජිෂ්ඨා තරල සාරය
12. නිම්බත්වක් තරල සාරය
13. ලතා හරිද්‍රා තරල සාරය
14. ශාරිබා තරල සාරය
15. බිල්ව තරල සාරය
16. කුටජ තරල සාරය
17. ලෝධ්‍ර තරල සාරය
18. අර්කමුල තරල සාරය
19. දශමූල තරල සාරය
20. අර්ජුන තරල සාරය
21. වාසක තරල සාරය
22. කණ්ටකාරී තරල සාරය
23. ගෝක්ෂුර තරල සාරය
24. පුනර්නවා තරල සාරය
25. කුෂ්ඨ තරල සාරය
26. සර්පගන්ධා තරල සාරය
27. විඩංග තරල සාරය
28. බ්‍රාහ්මී තරල සාරය
29. අශෝක තරල සාරය
30. අජමෝද තරල සාරය
31. අශ්වගන්ධා තරල සාරය
32. ශතාවරී තරල සාරය

4. ක්වාථ සාර සංස්කරණය.

1. මද්‍යසාර මිශ්‍ර ක්වාථය
2. මද්‍යසාර ස්වයංජාතකරණය
3. ක්වාථ තරල සාර පරිභාෂාව

I. මහාරාස්නාදි ක්වාථ තරල සාරය
II. මංජිෂ්ඨාදි ක්වාථ තරල සාරය
III. දශමූල ක්වාථ තරල සාරය

1. අමෘතෝශිරාදි තරල සාර ක්වාථය
2. ප්‍රාණදජමෝදවිශ්වාදි තරල සාර ක්වාථය
3. දරුපර්පටාදි තරල සාර ක්වාථය
4. නිධිග්දිකාදි තරල සාර ක්වාථය
5. ක්ෂුද්‍රාමෘතාදි තරල සාර ක්වාථය
6. ධාන්‍ය පංචක තරල සාර ක්වාථය
7. කාලශාකාභයාදි තරල සාර ක්වාථය
8. ශතාවාරී ගෝපකන්‍යාදි තරල සාර ක්වාථය
9. ත්‍රිවෘත්ද්‍රාක්ෂාභයාදි තරල සාර ක්වාථය
10. විරබිල්ව පුනර්නවාදි තරල සාර ක්වාථය
11. අභයකණාදි තරල සාර ක්වාථය
12. බලාබිල්ව ශුණ්ඨී තරල සාර ක්වාථය
13. පුනර්නවාෂ්ටක තරල සාර ක්වාථය
14. මුස්තාබුකර්ණ්‍යාදි තරල සාර ක්වාථය
15. දන්තිමූල බලාදි තරල සාර ක්වාථය
16. ඒරණ්ඩ සප්තක තරල සාර ක්වාථය
17. රාස්නාපංචක තරල සාර ක්වාථය
18. දශමූල තරල සාර ක්වාථය
19. පටෝලකටුකාදි තරල සාර ක්වාථය
20. මහාමංජිෂ්ඨාදි තරල සාර ක්වාථය
21. මහා රාස්නාදි තරල සාර ක්වාථය
22. ගුඩුව්‍යාදි තරල සාර ක්වාථය
23. බිල්ව ඉන්ද්‍රයවාදි තරල සාර ක්වාථය
24. මූර්වාදි තරල සාර ක්වාථය
25. බාකුව්‍යාදි තරල සාර ක්වාථය
26. ත්‍රිකටුකාදි තරල සාර ක්වාථය
27. රාස්නාදි තරල සාර ක්වාථය
28. දෙනිඹාදි තරල සාර ක්වාථය
29. කළුහර තරල සාර ක්වාථය
30. දේවදර්ව්‍යාදි තරල සාර ක්වාථය
31. පංචමූලී ලඝු ද්‍රාක්ෂාදි තරල සාර ක්වාථය
32. පිප්පල්‍යාදි තරල සාර ක්වාථය
33. ශඨ්‍යාදි තරල සාර ක්වාථය
34. තිකුළුහිංග්වාදි තරල සාර ක්වාථය
35. සප්තපර්ණාදි තරල සාර ක්වාථය
36. බෘහත්‍යාදි ගණ තරල සාර ක්වාථය
37. තාමලක්‍යාදි තරල සාර ක්වාථය
38. දර්ව්‍යාදි තරල සාර ක්වාථය
39. යක්ෂාක්ෂ්‍යාදි තරල සාර ක්වාථය
40. දේවදර්ව්‍යාදි තරල සාර ක්වාථය

17. අර්ක කල්පනා

1. නියමය
2. කාර්‍ය විධිය
3. පොදු අර්ක නීතිය
4. ද්‍රව ද්‍රව්‍යාර්කය
5. දුර්ගංධ නාශනය
6. අග්නිය
7. විධිය
8. අර්කපාත්‍රය
9. අර්ක පානය

18. ද්‍රාවක
I. ශංඛද්‍රාවකය
II. ශංඛ ද්‍රාවය
III. යන්ත්‍රවිධය

9. ද්‍රව්‍ය ශෝධන මාරණ විධිය
1. රස අෂ්ට විධ සංස්කරණය

I. ස්වේදන
II. මර්දන
III. මූර්ච්ඡන
IV. උත්ථාපන
V. පාතන
VI. රෝධන
VII. නියමන
VIII. දීපන
2. සාධාරණ විධිය
3. මාරණ විධිය

I. රසභස්මය
II. රසසින්දූරය
III. රසකර්පූරය
IV. රස පර්පටිය
V. මකරද්ධවජය
VI. පීතභස්මය
VII. කජ්ජලිය
VIII. හිංගුලෝත්ථරස

4. උපරස ශෝධන මාරණ විධිය
1. ගන්ධක
2. වජ්‍ර
3. වජ්‍රභස්මය
4. වෛක්‍රාන්ත
5. අභ්‍රක
I. ධාන්‍යාභ්‍ර සංස්කරණය
6. හරිතාල
7. මනඃශිලා
8. බර්පර
9. තුත්ථක
10. චපල
11. ස්වර්ණමාක්ෂික
12. රජතමාක්ෂික
12. කාශීස
14. කාන්තපාෂාණ
15. වරාටිකා
16. අඤ්ජන
17. හිංගුල

18. ගෛරික
19. ශංඛ
20. ටංගණ
21. ස්ඵටිකා
22. ගෞරිපාෂාණ
23. රිදී තුත්ථං
24. ශිලාජතු

5. ධාතු උපධාතු ශෝධන මාරණ විධිය

1. ස්වර්ණ
2. රජත
3. තාම්‍ර
    I. තාම්‍ර අමෘතීකරණය
4. සීසක
5. වංග
6. යශද
7. ලෞහ
    I. භානුපාකය
    II. ස්ථාලීපාකය
8. මණ්ඩූර
9. මෘද්දරශෘංග
10. කාංස්‍ය
11. පිත්තල
12. මාණික්‍ය
13. මුක්තා
14. ප්‍රවාල
15. නවසාදර
16. සෝරක
17. ශුක්ති
18. මෘගශෘංග
19. සමුද්‍ර ඵේණ
20. ගල්මද–ගල්නහර
21. ලවණ ශුද්ධිය

6. රස පරිභාෂාව

1. රේඛාපූර්ණ භස්මය
2. වාරිතර භස්මය
3. නිරුත්ථ භස්මය
4. ස්වාංග ශීත ක්‍රමය
5. බාහ්‍ය ශීත විධිය

7. විෂ උප විෂ ශෝධනය

1. වත්සනාභ
2. විෂතින්දුක බීජ
3. ජයපාල බීජ
4. ධුස්තූර බීජ
5. කංසා
6. ගුඤ්ජා
7. අහිඵේන
8. ක්ෂ්ණුහී ක්ෂීර
9. භල්ලාතක
10. ගුග්ගුලු
11. චිත්‍රක
12. හිංගු
13. වෘද්ධධාරක

යෝග සංග්‍රහය

10. ස්වරස (අනුපාන ඛණ්ඩය)

1. උක්පැණි අනුපානය
2. කොහොඹ රඹුක් අනුපානය
3. යකිනාරන් කොල අනුපානය
4. මාතාවෘහති අනුපානය
5. කුබෙර ලඝුනාදි අනුපානය
6. මකරන්දං අනුපානය
7. හිඟුරුපට අනුපානය (1)
8. හිඟුරුපට අනුපානය (2)
9. එරඬුදළු නිකදළු අනුපානය
10. මාත්තුපහ ගුලි අනුපානය—
    (පඹුරු දෙඩම් නිකදළු අනුපාන)
11. දෙහිපොතු ඉඟුරු අනුපානය
12. සීතාරාම ගුලි අනුපානය—
    (ඔලිඳ ආදී දළු අනුපානය)
13. කොහොඹ දළු අනුපානය
14. ඇහැළ දළු අනුපානය
15. කුඹුරු දළු අනුපානය
16. ගොටුකොල අනුපානය
17. මහදළු අනුපානය—
    (චන්ද්‍රකල්කය–දෙසිද දෙඩං නික ආදි)

11. කල්ක ඛණ්ඩය

(අ) 1. නිම්බ කල්කය
2. රසෝන කල්කය (1)
3. රසෝන කල්කය (2)
4. ශුණ්ඨී–තිල–ගුඩ–කල්කය

(ආ) 1. කණ්ඩමාල කල්කය
2. චන්ද්‍ර කල්කය
3. ජීවක කල්කය
4. නවරත්න කල්කය
5. දෙමටමල් කල්කය
6. දෙසඳුන් කල්කය
7. බාලකුමාර (වැල්මී) කල්කය
8. බුද්ධරාජ කල්කය (1)
9. බුද්ධරාජ කල්කය (2)
10. බුද්ධරාජ කල්කය (3)
11. යශෝධරා කල්කය
12. යෂ්ටි කල්කය
13. විජයකුමාර කල්කය
14. ශර්කරාදි කල්කය
15. සුරජීවක කල්කය

12. ක්වාථ ඛණ්ඩය

1. අභයාදි ක්වාථය (සන්නිපාත ජ්වර))
2. අභයාකණාදිය
3. අමෘත වෘෂාදි කෂාය 1
4. අමෘත වෘෂාදි කෂාය 2
5. අමෘතාෂ්ටක ක්වාථය
6. අර්කග්‍රන්ථ්‍යාදි කෂාය
7. අර්කානන්තාදි කෂාය
8. අරළු මාසක්කාදි කෂාය
9. අළු කෙහෙල් ආදි කෂාය
10. අශ්වගන්ධාමෘතාදි ක්වාථය
11. අඹු ආදි කෂාය
12. ආරෝග්‍ය (ආරග්වධ) පඤ්චකය
13. ඉරමුසු ආදි කෂාය
14. උක් පුරුක් කෂාය
15. උක් ගැට කෂාය
16. උත්පලාෂ්ටක පෙයා
17. උණ ගොබ කෂාය
18. උශීරාදි කෂාය 1
19. උශීරාදි කෂාය 2
20. ඒරණ්ඩසප්තක කෂාය
21. ක්ෂුද්‍රාදි ක්වාථය
22. කටඑලාදි ක්වාථය
23. කණ්ටකාර්‍යාදි ක්වාථය 1
24. කණ්ටකාර්‍යාදි ක්වාථය 2
25. කණමදු ආදි කෂාය
26. කටුවැල්බටු මුඩමහණ කෂාය
27. කතකබදිරධාත්‍රී ආදි කෂාය
28. කප්පරවල්ලිය ආදි කෂාය
29. කලාඳුරු ආදි කෂාය
30. කලාඳුරු ජලදර ආදි කෂාය
31. කාලිංගාදි ක්වාථය 1
32. කාලිංගාදි ක්වාථය 2
33. කාලිංගාදි කෂාය
34. කාරව්‍යාදි ක්වාථය
35. කාලශාකාදි ක්වාථය
36. කිරාත තික්තාදිය
37. කිරාතාදි කෂාය
38. කුඹුරු කොහොඹ ආදි කෂාය
39. කුටජාදි ක්වාථය
40. කුලත්ථාදි ක්වාථය I
41. කුලත්ථාදි ක්වාථය II
42. ගන්සූරිය පොතු කෂාය
43. ගන්ධර්වහස්තාදි කෂාය
44. ග්‍රන්පීන්ද්‍රාදි මහා කෂාය
45. ගුඩූච්‍යාදි කෂාය
46. ඝනකරඤ්ජාදි ක්වාථය
47. චන්දනාදි ක්වාථය
48. චන්දනාදි කෂාය
49. ජලග්න ආදි කෂාය
50. ත්‍රයෝදශාංග ක්වාථය
51. තාමලක්‍යාදි කෂාය
52. තිකුළුතිපල් ආදි කෂාය
53. තිකුළුහිංගු කෂාය
54. තිප්පිලි ආදි කෂාය
55. ත්‍රිඵලාදි ක්වාථය
56. ත්‍රිවෘතාදි කෂාය
57. තුන්දෙස් කෝල කෂාය
58. තුඹමුල් ආදි කෂාය ද්වයය
59. තොටිල පොතු ආදිය
60. ද්‍රාක්ෂාදිය I
61. ද්‍රාක්ෂාදිය II
62. ද්‍රාක්ෂාදිය III
63. ද්‍රාක්ෂාදිය IV
64. ද්‍රාක්ෂාමෘතා ක්වාථය
65. ද්‍රාක්ෂාඛර්ජූරාදි ක්වාථය
66. ද්‍රාක්ෂාභයාදි ක්වාථය
67. දන්තිමූලාදි ක්වාථය
68. දළද බටුන් කුප්පමේනිය ආදිය
69. දශමූල ක්වාථය
70. දසමුල් ඉඟුරු ආදි ක්වාථය
71. දශමූලබලාදි ක්වාථය I
72. දශමූල බලාදි ක්වාථය II
73. දශමූලාදි ක්වාථය
74. දරුපර්පටාදි ක්වාථය
75. දූරාලභාදිය
76. දෙදුරු අත්‍රපට්ටා ආදිය
77. දෙනිඹ දෙබටු ආදිය
78. දෙසඳුන් උළුවා ආදි කෂාය
79. දෙසඳුන් ආදි කෂාය
80. ධාන්‍යකාදි ක්වාථය
81. ධාන්‍ය පංචක ක්ථාවය
82. ධාන්‍යාක ශුණ්ඨී ක්වාථය
83. නවකාර්ෂිකය
84. නාගරාදි ක්වාථය I
85. නාගරාදි ක්වාථය II
86. නාරිකේලෝදක යෝගය I
87. නාරිකේලෝදක යෝගය II
88. නික නිම්බ කෂාය
89. නිකමුල්බර කෂාය
90. නිදිග්ධිකාදි ක්වාථය
91. නිම්බාදිය
92. නීලොත්පලාදි ශීත කෂාය
93. ප්‍රාණදදි ක්වාථය
94. පටෝලාදි ක්වාථය I
95. පටෝලාදි ක්වාථය II
96. පටෝලාදි කෂාය III
97. පටෝලමූලාදි ක්වාථය
98. පඤ්චකෝල ක්වාථය
99. පඤ්චතික්ත ක්වාථය
100. පර්ණාසපංචක ක්වාථය
101. පංචමූලාදි ක්වාථය I
102. පංචමූලාදි ක්වාථය II
103. පථ්‍යාදි ක්වාථය
104. පාචනාමෘත ක්වාථය
105. පාඨාදි ක්වාථය I
106. පාඨාදි ක්වාථය II
107. පාඨාකරංජාදි ක්වාථය
108. පාඨා සමංගාදි ක්වාථය
109. ප්‍රියංගුකාදි ක්වාථය
110. පිත්ත ශ්ලේෂ්මහර අෂ්ටාදශාංග ක්වාථය

111. පුනර්නවාදිය
112. පුනර්නවාෂ්ටකය
113. පෙරුංකායම් ආදි කෂාය
114. ඵලත්‍රිකාදිය
115. බවුඳෙවගේ කෂාය
116. බලාකෝරණ්ඩාදි ක්වාථය
117. බලාබිල්වාදි කෂාය
118. බලාමෘතාදි කෂාය
119. බලාමුස්තාදිය
120. බිල්ව විරබිල්ව ආදි කෂාය
121. බිල්වාදි කෂාය
122. බිල්වාමෘතාදි ක්වාථය
123. බිල්වෝරාස්නාදි ක්වාථය
124. බෙලිමුල් බර (පථ්‍යාදි) ක්වාථය
125. භාර්ග්‍යාදිය (තිස්දෙවගෙ)
126. මඤ්ජිෂ්ඨාදි ක්වාථය (ගුඩුච්‍යාදි නමින්ද දක්වේ)
127. මකරන්ද කෂාය
128. මධුකාදි ක්වාථය
129. මල් කෂාය
130. මහරත්හඳුන් කෂාය
131. මහා මඤ්ජිෂ්ඨාදිය
132. මාෂ බලාදි ක්වාථය
133. මුකුණුවැන්න තුන්බර
(මහා ත්‍රිඵලාදි ක්වාථය)
134. මුද්ගාදි ක්වාථය
135. මුද්ගාදි පේයාව
136. මුස්තාකරඤ්ජාදි කෂාය
137. මුස්තාබුකර්ණ්‍යාදි ක්වාථය
138. මුස්තාදි ක්වාථය
139. මුස්තාදි කෂාය
140. මුස්තා ශුණ්ඨි ආදිය (මූර්වා දහය) ක්වාථය
141. මෘද්වීකාදිය
142. යක්ෂාක්ෂ්‍යාදිය
143. යෂ්ටිමධු ආදිය
144. රතුලූණු අක්‍රපට්ටා ආදිය
145. රාස්නා විශ්වාදි, රාස්නා දශමුල
146. රාස්නා සප්තකය
147. රාස්නා ශිග්‍රු ක්වාථය
148. ලාජා පේයාව
149. ලූණු ඉඟුරු කෂාය
150. වම්මුතු ආදිය
151. වම්මුතු ආදි කෂාය
152. මධවාදිගණ ක්වාථය
153. වත්සකාදි (හතලිස් වගය) ක්වාථය
154. වදසිවිය ආදිය
155. වරාලාදි (පේයා) ක්වාථය
156. වාතශ්ලේෂ්මහර අෂ්ටාදශාංග ක්වාථය
157. වාලු කෂාය 1
158. වාලු කෂාය 2
159. වාසාද්‍රාක්ෂාදි ක්වාථය
160. වාසාමුස්තකාදි ක්වාථය
161. වාසාමුස්තකාදිය II
162. වැල්පෙනෙල කෂාය
163. විශ්වාමෘතාදි (නවාංග) ක්වාථය
164. වෘහත් පඤ්චමූලාදි කෂාය
165. වෘහත්‍යාදි ගණ ක්වාථය
166. වෘහත් ශාලපර්ණ්‍යාදි (පේයා) ක්වාථය
167. ශ්‍රී පර්ණ්‍යාදි කෂාය
168. ශටී ආදිය (ශඨ්‍යා-ශඨාදි)
160. ශට්‍යාදි ක්වාථය
170. ශතාවරී ආදි ක්වාථය
171. ශතාවයඞාදිය
172. ශර්කරාදි කෂාය
173. ශාරිබාදි ක්වාථය I
174. ශාරිබාදි ක්වාථය II
175. ශුණ්ඨීදරු ක්වාථය
176. ශුණ්ඨීබලා මෘත කෂාය
177. සුදුහඳුන් ආදි කෂාය
178. සුළුපහ ආදි කෂාය
179. සුවදහොට ආදි කෂාය
180. සුවද හොට ආදිය II
181. හරිතක්‍යාදිය
182. හරිද්‍රාදිගණ ක්වාථය

13. හිමකෂාය

1. ආම්‍රාදි හිමකෂාය
2. නිලෝත්පලාදිහිමකෂාය
3. ධාන්‍යාදි හිමකෂාය I
4. ධාන්‍යාදි හිමකෂාය II

(අ) මන්ථ
1. ඛර්ජූරාදි මන්ථය
2. මසූරාදිමන්ථය

14. ඵාණ්ඨ කෂාය

1. ත්‍රිඵලා ඵාණ්ට කෂාය
2. ලඝු මධූක ඵාණ්ටය
3. වෘහත්මධූකඵාණ්ටය

15. චූර්ණ ඛණ්ඩය

1. අජමෝදදි චූර්ණය
2. අලබෙත් චූර්ණය I
3. අලබෙත් චූර්ණය II
4. අෂ්ටාංග ලවණය (චූර්ණය)
5. අවිපත්තිකර චූර්ණය
6. අශ්වගන්ධාදි චූර්ණය
7. ආමලක්‍යාදි චූර්ණය
8. ඒලාදි චූර්ණය I
9. ඒලාදි චූර්ණය II
10. ඒලාදි චූර්ණය III
11. ඒලාදි චූර්ණය IV
12. වෘහත්කට්ඵලාදි චූර්ණය
13. කකුභාදි චූර්ණය
14. කපිත්ථාෂ්ටක චූර්ණය
15. කර්පූරාදි චූර්ණය I
16. කර්පූරාදි චූර්ණය II
17. කොත්තමල්ලි චූර්ණය
(ශර්කරාදිය =විනාකිරි බස්නය)

18. චන්දනාදි චූර්ණය
19. චෝපචීනි චූර්ණය
20. ජාතිඵලාදි චූර්ණය
21. තාලීසාදි චූර්ණය
22. ත්‍රිඵලාදි චූර්ණය
23. ත්‍රිවෘතාදි චූර්ණය
24. දඩිමාෂ්ටක චූර්ණය
25. දඩිමකුටජ චූර්ණය
26. ධාත්‍රී චූර්ණය
27. නාරසිංහ චූර්ණය
28. නාරායණ චූර්ණය
29. නිම්බාදි චූර්ණය
30. පඤ්චසම චූර්ණය
31. පිප්ල්‍යාදි චූර්ණය
32. පිප්පල්‍යාදි ගණ චූර්ණය
33. පුෂ්‍යානුග චූර්ණය
34. භාස්කර ලවණ චූර්ණය
35. භුක්තපාක චූර්ණය
36. භූනිම්බාදි චූර්ණය
37. මහානිම්බ චූර්ණය
38. මහා සරස්වතී චූර්ණය
39. මානිමන්ථ චූර්ණය
40. සරස්වතී චූර්ණය
41. ලවංගාදි චූර්ණය .
42. ලොහිත චූර්ණය
43. වජ්‍රක්ෂාරය
44. වැල්දෙහි චූර්ණය–ගෝදඹු චූර්ණය
45. විඩංගාදි චූර්ණය
46. විෂමජ්වරාන්තක චූර්ණය
47. වෛශ්වානර චූර්ණය
48. වෘහත්ගංගාධර චූර්ණය
49. ශඨ්‍යාදි චූර්ණය 1
50. ශඨ්‍යාදි චූර්ණය 2
51. ශතාවරී චූර්ණය
52. ශෘංග්‍යාදි චූර්ණය
53. ෂඩ්ධරණයෝග චූර්ණය
54. සර්පගන්ධා චූර්ණය
55. සරස්වතී චූර්ණය
56. සාරස්වතී චූර්ණය
57. සිතොපලාදි චූර්ණය
58. සුකුමාර චූර්ණය (1)
59. සුකුමාර චූර්ණය (2)
60. සුදර්ශන චූර්ණය
61. හිංග්වෂ්ටක චූර්ණය
62. හිංග්වාදි චූර්ණය

2. **ලෞහ ඛණ්ඩය**

1. අමෘතාංකුර ලෞහය
2. ගගනාදි ලෞහය
3. ධාත්‍රී ලෞහය (1)
4. ධාත්‍රී ලෞහය (2)
5. නවායස ලෞහය
6. පුටපාකවිෂමජ්වරාන්තක ලෞහය
7. ප්‍රදරාන්තක ලෞහය
8. ප්‍රදරාරි ලෞහය
9. යකෘදරි ලෞහ
10. වරුණාදි ලෞහ
11. වෘහත් සර්වජ්වරහර ලෞහ
12. ශාරිබාදි ලෞහ
13. සප්තාමෘත ලෞහ
14. සර්වජ්වරහර ලෞහ

3. **පර්පටි**

1. තාම්‍ර පර්පටී
2. මණ්ඩූර පර්පටී
3. පංචාමෘත පර්පටී
4. රසපර්පටී
5. ලෞහ පර්පටී
6. විජය පර්පටී
7. ස්වර්ණ පර්පටී

14. **වටී–වටිකා ඛණ්ඩය**

1. වටී–වටීකා

1. අතීසාර වටී (1)
2. අතිසාර වටී (2)
3. අබිං ගුලිය
4. ආකාරකරභාදිවටිය (කුංකුමාදි වටිය)
5. කරල් ගුලිය
6. කෝල දවුණ්ඩය
7. ගොපලු ගුලිය
8. ජීවානන්ද ගුලිය
9. දළු පණු ගුලිය
10. දියතාරාමය
11. නාගරාදි ගුලිය
12. පලු ගුලිය
13. මදුවලිප්පු ගුලිය .
14. මහාසන්නිවජ්‍රකපාට ගුලිය
15. මහාවර්තිකාව
16. මාත්තු පහ
17. රත්නාදි ගුලිය
18. ශාන්ති රසය
19. සන්නිගංජාකුශය
20. සීතාරාමය
21. සුරන්විද්‍ර
22. හඳුන්තිලක ගුලිය
23. හිංගුලාදි රසය
24. ලුණු විරේක වටී
25. භුක්තපාක වටී
26. වායුවිරේකය (අණ්ඩවෘද්ධිගුලිය)

2. **ගුග්ගුලු ඛණ්ඩය**

1. අමෘතාගුග්ගුලුව
2. කාඤ්චනාර ගුග්ගුලුව
3. කෛශෝර ගුග්ගුලුව
4. ගොක්ෂුරාදි ගුග්ගුලුව

5. ත්‍රිඵලා ගුග්ගුලුව
6. පඤ්ච තික්ත ඝෘත ගුග්ගුලුව
7. පත්ථ්‍යාදි ගුග්ගුලුව
8. පුනර්නවාදි ගුග්ගුලුව
9. යෝගරාජ ගුග්ගුලුව
10. රාස්නාදි ගුග්ගුලුව
11. ලාක්ෂා ගුග්ගුලුව
12. ලෞහ ගුග්ගුලුව
13. වෘහත් යෝග රාජ ගුග්ගුලුව
14. වෘහත් සිංහනාද ගුග්ගුලුව
15. සප්ත විංශතික ගුග්ගුලුව
16. සිංහනාද ගුග්ගුලුව

3. මෝදක

1. අගස්ති හරීතකී
2. අභයාමෝදකය 1
3. අභයාමෝදකය 2
4. ආමවාතගජසිංහ මෝදකය
5. කංසහරීතකී
6. කස්තූරි මෝදකය
7. කාංකායන මෝදකය
8. කාමේශ්වරී මෝදකය
9. ගොක්ෂුරාදි මෝදකය
10. මදනමෝදකය
11. මාණිභද්‍ර මෝදකය
12. මුස්තකාදි මෝදකය
13. මෙථී මෝදකය
14. සූරණ මෝදකය
15. සෞභාග්‍ය ශුණ්ඨී මෝදකය
16. ශිවාමෝදකය

5. පිණ්ඩ–ගුඩ

1. ප්‍රමේහගජකේශරී
2. ප්‍රමේහ ගජාංකුශය
3. භාර්ගී ගුඩය
4. රණහංස රසායනය
5. කල්‍යාණ ගුඩය
6. ගුඩ කුෂ්මාණ්ඩය
7. ධාත්‍රී රසායනය
8. හරිද්‍රා ඛණ්ඩය
9. ආර්ද්‍රක ඛණ්ඩය

15. රස ඛණ්ඩය

1. අග්නි කුමාර රසය
2. අග්නි තුණ්ඩී රසය
3. අග්නි රසය
4. අර්ශස් කුඨාර රසය
5. ආනන්ද භෛරව රසය (1)
6. ආනන්ද භෛරව රසය (2)
7. ආනන්ද භෛරව රසය (3)
8. ආරෝග්‍යවර්ධනී වටී
9. ඉච්ඡාභේදී රසය
10. ඉන්ද්‍ර වටී
11. උන්මාද ගජාංකුශ
12. කනක සුන්දර රසය
13. කන්දර්ප රසය
14. කඵකේතු රසය (1)
15. කඵකේතු රසය (2)
16. කර්පූර රසය
17. කස්තූරි භෛරව රසය
18. කාඤ්චනාභ්‍ර රසය
19. කීටාරි රසය
20. කීටමර්දරසය
21. ක්‍රිමි මුද්ගර
22. කුමාරකල්‍යාණක රසය
23. කුෂ්ඨඝ්නී වටිකාව
24. ක්‍රිමිකාලානල රසය
25. ක්‍රිමි නාශක රසය
26. ක්‍රිමිඝ්න රසය
27. කෘෂ්ණ චතුර්මුඛ රසය
28. ගගන සුන්දර රසය
29. චන්ද්‍රප්‍රභා වටී (1)
30. චන්ද්‍රප්‍රභා වටී (2)
31. චතුර්භුජ රසය
32. චන්ද්‍රාමෘත වටී
33. චන්ද්‍රාමෘත රසය
34. චින්තාමණී රසය
35. ජයමංගල රසය
36. ජලෝදරාරි රසය
37. ජ්වර මුරාරි රසය
38. ජ්වර කෙශරිකා රසය
39. නාරදීය ලක්ෂ්මී විලාශ රසය
40. නිත්‍යානන්ද රසය
41. නිද්‍රොදය වටී
42. තාලකේශ්වර රසය (1)
43. තාලකේශ්වර රසය (2)
44. ත්‍රිභුවනකීර්ති රසය
45. පීයූෂවල්ලී රසය
46. වෘහත්පූර්ණ චන්ද්‍ර රසය
47. පුෂ්පධන්වා රසය
48. ප්‍රලාපාන්තක රසය
49. බාලරොගාන්තක රසය
50. මහාභ්‍ර වටිකාව
51. මහාමෘගාංක රසය
52. මහාශංඛවටී රසය
53. මාණික්‍ය රසය
54. මෙහවජ්‍ර රසය
55. රත්නගර්භ පොට්ටලී රසය
56. රාමබාණ රසය
57. රාජමෘගාංක රසය
58. ලක්ෂ්මීවිලාශය (1)
59. ලක්ෂ්මීවිලාශය (2)
60. ලග්වානන්ද රසය
61. ලක්ෂ්මීවිලාශ රසය
62. ලෝකනාථ රසය
63. වසන්තමාලිනී රසය
64. වසන්තකුසුමාකර රසය
65. වංගාෂ්ටක
66. වාතකුලාන්ත රසය

67. වාතාරි රසය
68. වාතගජේන්ද්‍රසිංහ රසය
69. වාතගජාංකුශ රසය
70. වාතනාගාංකුශය රසය
71. විද්‍යාධරාභ්‍ර රසය
72. වෘහත් කනකසුන්දර රසය
73. වෘහත් කස්තූරිභෛරව රසය
74. වෘහත් සෝමනාථ රසය
75. වෘහත් කාංචනාභ්‍ර රසය
76. වේදනාන්තක රසය
77. වෛශ්වානරී වටී
78. ශංඛපුෂ්පාදි රසය
79. ශ්වාස කුඨාර රසය
80. ශම්බුනාථ රසය
81. ශෘංගාරාභ්‍ර රසය
82. ශූලහරණ වටිය
83. ශ්‍රී ජයමංගල රසය
84. ශ්‍රීමත් ජයතිලක රසය
85. ශ්‍රී මෘත්‍යුංජය රසය
86. ශ්ලේෂ්ම ශෛලේන්ද්‍ර රසය
87. ස්වර්ණවංග පඤ්චක රසය
88. සර්වතොභද්‍ර වටි
89. සර්වතොභද්‍ර රසය
90. සර්වාංග සුන්දර රසය
91. සිද්ධප්‍රාණේශ්වර රසය
92. සෞභාග්‍ය වටිය
93. සොමේශ්වර රසය
94. හිංගුලේශ්වර රසය
95. හෘදයාර්ණව රසය

16. අවලේහ ඛණ්ඩය

1. අෂ්ටාංගාවලේහය
2. කණ්ටකාර්‍යාවලේහය
3. කල්‍යාණාවලේහය
4. කුටජාවලේහය
5. කූෂ්මාණ්ඩාවලේහය
6. ච්‍යවනප්‍රාශය
7. රක්තකල්‍යාණාවලේහය
8. ශ්වාසාදි ලේහය
9. ගොටහර ලේහය (ඉංඩි කුලමිටුව)

17. ආසව ඛණ්ඩය

1. අංගුරාසවය 1, 2
2. අයස්කෘතිය
3. අරවින්දාසවය ✓
4. අහිඵේනාසවය
5. උශීරාසවය
6. කනකාසවය
7. කර්පූරාසවය
8. කුමාර්‍යාසවය ✓
9. ඛර්ජූරාසවය
10. චන්දනාසවය ✓
11. චවිකාසවය
12. ජම්බ්වාසවය
13. ත්‍රිඵලාසවය
14. ද්‍රාක්ෂාසවය
15. පත්‍රාංගාසවය
16. පිප්පල්‍යාද්‍යාසවය (පිප්පල්‍යාසවය) ✓
17. පුනර්නවාසවය
18. මධූකාසවය
19. මෘගමදාසවය
20. ලෝහාසවය ✓
21. ලෝධ්‍රාසවය
22. වාසකාසවය
23. සෝමරාජ්‍යාසවය
24. සාරිවාද්‍යාසවය
25. ශ්‍රීඛණ්ඩාසවය

18. අරිෂ්ට ඛණ්ඩය

1. අභයාරිෂ්ටය (1)
2. අභයාරිෂ්ටය (2)
3. අමෘතාරිෂ්ටය ✓
4. අශ්වගන්ධාරිෂ්ටය
5. අශෝකාරිෂ්ටය ✓
6. කනකාරිෂ්ටය
7. කිරාතාද්‍යරිෂ්ටය
8. කුටජාද්‍යරිෂ්ටය
9. ඛදිරාරිෂ්ටය
10. ඛර්ජූරාරිෂ්ටය
11. ජීරකාද්‍යරිෂ්ටය
12. තක්‍රාරිෂ්ටය (1) ✓
13. තක්‍රාරිෂ්ටය (2) ✓
14. දන්ත්‍යරිෂ්ටය
15. දශමූලාරිෂ්ටය ✓
16. දේවදාරු රිෂ්ටය
17. ද්‍රාක්ෂාරිෂ්ටය ✓
18. ධාත්‍ර්‍යරිෂ්ටය
19. නිම්බාරිෂ්ටය (1)
20. නිම්බාරිෂ්ටය (2)
21. පර්පටාද්‍යරිෂ්ටය
22. පාර්ථාද්‍යරිෂ්ටය (අර්ජුනාරිෂ්ටය)
23. පුනර්නවාද්‍යරිෂ්ටය
24. බබ්බූලාරිෂ්ටය
25. බලාරිෂ්ටය ✓
26. මුස්තකාරිෂ්ටය
27. මෘතසංජීවනී සුරාව
28. රෝහිතකාරිෂ්ටය
29. වාසකාරිෂ්ටය
30. විඩංගාරිෂ්ටය
31. ශිරීෂාරිෂ්ටය
32. සාරස්වතාරිෂ්ටය ✓

19. දේශීය ඛස්ත ඛණ්ඩය

1. පුහුල් ඛස්තය (සන්ධාන විධිය)
2. රා ඛස්තය
3. එළ මිදුලු ඛස්තය
4. තෝර ඛස්තය
5. තා ඛස්තය (සස ඛස්තය)

20. තෛල ඛණ්ඩය

1. අණු තෛලය
2. අම්බාදි තෛලය
3. අමුක්කු තෛලය
4. අර්ක තෛලය
5. අර්ශස් තෛලය
6. අශ්වගන්ධා තෛලය 1,2,3
7. ඉරිමේදදි තෛලය
8. උශීරාදි තෛලය 1,2
9. කනක තෛලය
10. කාර්පාසාදි තෛලය
11. කාසිසාදි තෛලය
12. කාසිසාද්‍ය තෛලය
13. කැඩුම් බිඳුම් තෛලය
14. කුංකුමාදි තෛලය
15. කුබ්ජප්‍රසාරණී තෛලය
16. කුමාරි තෛලය
17. කෙණ්ඩාපෙරලුම්හර තෛලය
18. කෝලශ්ලෙෂ්මා තෛලය
19. ගරුඩරාජ තෛලය
20. ගුග්ගුලාදි තෛලය
21. ගුඩුච්‍යාදි තෛලය
22. ගුරුළුරාජ තෛලය
23. ග්‍රහණී චන්ද්‍රකාන්ති තෛලය
24. චන්ද්‍රකාන්ති තෛලය
25. චිත්‍රකරඤ්ජ තෛලය
26. ජාත්‍යාදි තෛලය
27. තෝරවතුර තෛලය
28. ත්‍රිඵලා තෛලය
29. දශපාක අණු තෛලය
30. දශපාක බලා තෛලය
31. දශබලා තෛලය
32. දශමූල තෛලය 1,2
33. දශවග ප්‍රමෙහ තෛලය
34. දිව්‍ය නාග තෛලය
35. දිව්‍යාංගනාදි තෛලය
36. දූර්වාදි තෛලය
37. නයනකේතකී තෛලය
38. නයනාභරණ තෛලය
39. නවපටල තෛලය
40. නාරායණ තෛලය
41. නාරායණ තෛල ය (මධ්‍යම)
42. නිම්බාදි තෛලය
43. නිර්ගුණ්ඩ්‍යාදි තෛලය
44. නිශාදි තෛලය
45. නීල්‍යාදි තෛලය
46. නීලරාජ තෛලය
47. නෙත්‍රපටලකාන්තිරත්න තෛලය
48. පක්ෂඝාතවායුසූන්‍ය තෛලය
49. පසකුරු තෛලය
50. පිණ්ඩ තෛලය I, II, III, IV
51. පිළිස්සුම් තෛලය
52. බවු තෙල
53. බලා කෝරණ්ඩ තෛලය
54. බුද්ධරාජ තෛලය
55. බෝධිසත්ව තෛලය
56. භානුපාක කුෂ්ඨ තෛලය
57. භෘංගරාජ තෛලය
58. මංජිෂ්ඨාදි තෛලය
59. මහා කොරණ්ඩ තෛලය
60. මහා නාරායණ තෛලය
61. මහා බලා තෛලය
62. මහා වාතමෙස තෛලය
63. මහා මාෂ තෛලය
64. මහාවායුරාක්ෂස තෛලය
65. මහා විකාර තෛලය
66. මාෂ තෛලය
67. යමදේවරාජ තෛලය
68. රත්පිත්කේතකී තෛලය
69. රත තෙල
70. රතිකාමරත්න තෛලය
71. රතුලූනු තෛලය
72. ලඝුනෛරණ්ඩ තෛලය
73. ලෝකනාථ තෛලය
74. ලුණුකඩවැල්ලෙ පිනස් තෙල
75. වජ්‍රකන්ද තෛලය
76. වාත තෛලය
77. වාතරාක්ෂස තෛලය
78. වාත (වෘණ) විදූරංග තෛලය
79. විෂ්ණු තෛලය
80. විෂගර්භ තෛලය
81. විෂස්නනිල තෛලය
82. විෂහරනාදි තෛලය
83. විසර්පහර තෛලය
84. වෘහත් සෛන්ධවාදි තෛලය
85. සත්තවාදි තෛලය
86. සර්වවිෂාදි තෛලය
87. සිද්ධාර්ථ තෛලය
88. සිද්ධාර්ථක තෛලය
89. සිතෝදක තෛලය
90. සෛන්ධවාදි තෛලය
91. සෝමරාජි තෛලය
92. ශ්වාසවජ්‍ර තෛලය
93. ශ්විත්‍රහර තෛලය
94. ශුද්ධ බලා තෛලය
95. ශුෂ්ක මූලකාදි තෛලය
96. ෂඩ්බින්දු තෛලය
97. හිංගුත්‍රිගුණ තෛලය
98. හිමසාගර තෛලය

21. ඝෘත ඛණ්ඩය

1. අමෘතප්‍රාශ ඝෘතය
2. අර්ජුන ඝෘතය
3. අශ්වගන්ධා ඝෘතය
4. අශෝක ඝෘතය
5. ඉන්ද්‍රකාන්ත ඝෘතය
6. කල්‍යාණ ඝෘතය
7. කාමදේව ඝෘතය
8. කුමාර කල්‍යාණ ඝෘතය
9. චව්‍යාදි ඝෘතය

10. වාංගෙරි ඝෘතය
11. ඡාගලාදි ඝෘතය
12. ජාත්‍යාදි ඝෘතය
13. දශමූලෂට් ඵල ඝෘතය
14. පංචගව්‍ය ඝෘතය
15. පංචතික්ත ඝෘතය (1)
16. පංචතික්ත ඝෘතය (2)
17. ඵලකල්‍යාණ ඝෘතය
18. ඵල ඝෘතය
19. බලාදි ඝෘතය
20. බ්‍රාහ්මී ඝෘතය
21. මහා චෛතස ඝෘතය
22. මහාතික්තක ඝෘතය
23. වෘහත් අශ්වගන්ධාදි ඝෘතය
24. වෘහත් ඡාගලාදි ඝෘතය
25. සිද්ධාර්ථක ඝෘතය
26. ශතාවරී ඝෘතය

22. ආලේප ඛණ්ඩය

1. අනෝද කොල ආලේපය
2. කජ්ජලිකොදය මලහර
3. තිලාදි ලෙපය (I)
4. තිලාදි ලෙපය (II)
5. දරුහෙම්වති ලෙපය
6. දෙෂඝ්න ලෙපය
7. ධුස්තුරාදි ලෙපය (1)
8. ධුස්තුරාදි ලෙපය (2)
9. ඵලවර්ති (I)
10. ඵලවර්ති (II)
11. මකුළුඇට ආදි ලෙපය
12. මුරුංගාදි ලෙපය
13. රණවරාදි ලෙපය
14. රසපුෂ්පාද්‍යමලහර
15. රසොත්තමාදි ලෙපය
16. වියත්පිලු ආදි ලෙපය
17. ශ්විත්‍ර ලෙපය–තාලකාදි ලේපය (I)
18. ශ්විත්‍ර ලෙපය–තාලකාදි ලෙපය (II)
19. සික්ථ තෛලය

23. නෙත්‍ර බිංදු

1. නෙත්‍ර බිංදු I, II, III, IV, V

අතිරික්තය:—

1. ඖෂධ සංග්‍රහ ද්‍රව්‍ය නාම ලේඛනය
2. ආනයනය කළ හැකි ඖෂධ
3. ආනයනය කළ හැකි අමු ඖෂධ

ආයුර්වේද ඖෂධ සංග්‍රහය

ප්‍රථම පියවර — පළමුවන කොටස

මානපරිභාෂා

වෛද්‍යකිය ව්‍යවහාරය සඳහා සම්මත ලංකා (මංචාඩි - කලං) මානචක්‍රය

ලංකා (මංචාඩි - කලං) මානය, දශම (මෙට්‍රික්) ක්‍රමයට පරිවර්තිත ය.

රක්තිකා (ගුංජා)	1	=			=	125	මිලිග්‍රෑම්
රක්තිකා (ගුංජා)	2	=	මංචාඩි	1	=	250	,,
මංචාඩි	20	=	කලං	1	=	5	ග්‍රෑම්
කලං	3	=	කර්ෂ	1	=	15	ග්‍රෑම්
කර්ෂ	2	=	අඩපලං	1	=	30	ග්‍රෑම්
අඩපලං	2	=	පල (පලං)	1	=	60	ග්‍රෑම් (කලං 12යි)
පලං	2	=	ප්‍රසෘති	1	=	120	ග්‍රෑම්
ප්‍රසෘති	2	=	අර්ධශරාව	1	=	240	ග්‍රෑම්
අර්ධශරාව	2	=	ශරාව	1	=	480	ග්‍රෑම්
ශරාව	2	=	ප්‍රස්ථ	1	=	960	ග්‍රෑම්
ප්‍රස්ථ	4	=	ආඪක	1	=	3840	ග්‍රෑම්
ආඪක	4	=	ද්‍රෝණ	1	=	15360	ග්‍රෑම්
ද්‍රෝණ	2	=	ශූර්ප	1	=	30720	ග්‍රෑම්
ශූර්ප	2	=	ද්‍රෝණී	1	=	61440	ග්‍රෑම්
පලං	100	=	තුලා	1	=	6000	ග්‍රෑම්

නියෝජ්‍ය සම්මත ප්‍රමාණ භාරකාර මහතා විසින් මෙට්රික් (දශම) ක්‍රමයට පරිමෙය කරණ ලද කඨීන ද්‍රව්‍ය මාන චක්‍රය හා ද්‍රව මාන චක්‍රය පරිශිෂ්ට සංග්‍රහයෙහි බලන්න.

ලංකා ද්‍රවමාන–ක්‍යුබික් සෙන්ටිමීටර් සමක චක්‍රය

1 රක්තිකා	= 125 මි.ග්‍රෑ.		= 1/8 මිලිලීටර්			
2 රක්තිකා	= 1 මංචාඩි	= 250 මි.ග්‍රෑ.	= 1/4 මි.ලී.			
*4 මංචාඩි	= 1 මාෂ	= 1 ග්‍රෑම්	= 1 මි.ලී.	= 1 ක්‍යු.සෙ.මී.	= 15 බින්දු (පමණ)	
†20 මංචාඩි	= 1 කලං	= 5 ග්‍රෑම්ස්	= 5 මි.ලී.	= 51/3 ක්‍යු.සෙ.මී.	= 80 බිං	
3 කලං	= 1 කර්ෂ	= 15 ග්‍රෑ.	= 15 මි.ලී.	= 16 ක්‍යු.සෙ.මී.	= 240 බිං	
2 කර්ෂ	= අර්ධපල	= 30 ග්‍රෑ.	= 30 මි.ලී.	= 32 ක්‍යු.සෙ.මී.	= 480 බිං	= 1 අවු.
2 අර්ධපල	= 1 පලං	= 60 ග්‍රෑ.	= 60 මි.ලී.	= 64 ක්‍යු.සෙ.මී.	= 960 බිං	= 2 අවු.
2 පලං	= 1 ප්‍රසෘති	= 120 ග්‍රෑ.	= 120 මි.ලී.	= 128 ක්‍යු.සෙ.මී.	= 32 ඩ්‍රැම්ස්	= 4 අවු.
2 ප්‍රසෘති	= අර්ධශරාව (පත)	= 240 ග්‍රෑ.	= 240 මි.ලී.	= 256 ක්‍යු.සෙ.මී.	= 8 අවුන්ස	

ඉන්දියානු චක්‍රය අනුව:

4 මාෂක	= 1 ශාණ	= 4 ග්‍රෑ.	= මි.ලී. 4	= ක්‍යු.සෙ.මී. 4	= බින්දු 60
2 ශාණ	= 1 කෝල	= 8 ග්‍රෑ.	= මි.ලී. 8	= ක්‍යු.සෙ.මී. 8	= බින්දු 120
2 කෝල	= 1 කර්ෂ	= 16 ග්‍රෑ.	= මි.ලී. 16	= ක්‍යු.සෙ.මී. 16	= බින්දු 240

† ක්‍යු.සෙ.මී. 5 = බින්දු 75කි. එහෙත් දැනට ව්‍යවහාරයෙහි මුල්බැස ඇති බින්දු ඩ්‍රැම්ස්-අවුන්ස චක්‍රය හා සමවීමේ පහසුව පිණිස කලං 1 = ක්‍යු.සෙ.මී. 5 1/3 = බින්දු 80 වශයෙන් සලකා චක්‍රය සැපයීම සුදුසුය යි නියෝජ්‍ය සම්මත ප්‍රමාණය භාරකාර තුමා විසින් අනුමත කරන ලදී.

ද්‍රව මාන චක්‍රය

රක්තිකා	1	=	.125	මිලිලීටර්	(මිලිලීටරයකින් 1/8 කි)
මංචාඩි	1	=	.250	,,	
කලං	1	=	5	,,	
කලං	3	=	15	,,	
අඩපලං	1	=	30	,,	
පලං	1	=	60	,,	
ප්‍රසෘති	1	=	120	,,	
අර්ධශරාව	1	=	240	,,	(පත 1යි)
ශරාව	1	=	480	,,	(මනා 1යි)
ප්‍රස්ථ	1	=	960		(නැලි 1යි)
ආඪක	1	=	3.840	ලීටර්	(ලාස් 1යි)
ද්‍රෝණ	1	=	15.360	,,	
ශූර්ප	1	=	30.720	,,	
ද්‍රෝණි	1	=	61.440	,,	
තුලා	1	=	6.000	,,	

මිලි ලීටර් 1 ක් බිංදු 15 කි. එහෙත් නියෝජ්‍ය සම්මත ප්‍රමාණ භාරකාර මහතා කලඳ මිනිම (බිංදු) 80 වශයෙන් ගැනීම සුදුසු ලෙස සටහන් කර ඇත්තේය. ඒ අනුව ගත් විට පලම් 1 පොදු ව්‍යවහාරයේ එන අවුන්ස 2 ය. පරිශිෂ්ට සංග්‍රහයේ සඳහන් සම්මත ප්‍රමාණ භාරකාර මහතාගේ මාන චක්‍රය විමසන්න.

කාල මාන චක්‍රය

'අ' වැනි ලඝු අක්ෂරයක් උසුරුවන කාලය 'අක්ෂිනිමේෂ'' 1 කි.

අක්ෂිනිමේෂ	1	=	තත්පර 1/3යි (ඉතා කිට්ටු වශයෙනි)			
අක්ෂිනිමේෂ	15	=	කාෂ්ඨා	1 යි	=	තත්පර 4, 2/3 යි (ඉතා කිට්ටු වශයෙනි)
කාෂ්ඨා	30	=	කලා	1 යි	=	මිනිත්තු 2, තත්පර 20 ,,
කලා 20 යි 1/10		=	මුහූර්ත	1 යි	=	මිනිත්තු 48 යි.
මුහූර්ත	30	=	අහෝරාත්‍ර	1 යි	=	(දින 1 යි = පැය 24 යි)
අහෝරාත්‍ර	15	=	පක්ෂ	1 යි	=	දින 15 යි.
පක්ෂ	2	=	මාස	1 යි	=	දින 30 යි.
මාස	2	=	ඍතු	1 යි	=	දින 60 යි.
ඍතු	3	=	අයන	1 යි	=	මාස 6 යි.
අයන	2	=	සංවත්සර	1 යි	=	(වර්ෂ 1 යි).
සංවත්සර	5	=	යුග	1 යි		
සටී	1	=	මිනිත්තු	24 යි.		

පාද්‍යමාන (දිග මැනීම්) චක්‍රය

යවමධ්‍යා (යවෝදර)	8	=	අංගුලි	1 යි					
යවමධ්‍යා	1	=	අඟලෙන්	3/32 යි				සෙන්ටිමීටර	0.24
අංගුලි	1	=	අඟල්	3/4 යි				,,	1.95
අංගුලි	12	=	විතස්ති (වියත්)	1 යි	=	අඟල්	9	,,	22.86
විතස්ති	2	=	රියන් (හස්ත)	1 යි	=	,,	18	,,	45.72
අරත්නි (මිටිරියන්)	1	=			=	,,	16 1/2	,,	41.91
රාජ (නෘප) හස්ත	1	=			=	,,	22	,,	55.88
හස්ත	4	=	බඹ	1 යි	=	,,	72	,,	182.98

කෞටිලීය අර්ථශාස්ත්‍රම ග්‍රන්ථය අනුව ය.

මෙම චක්‍ර දෙක නවදිල්ලියේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රධාන ආයුර්වේද පර්යේෂණ නිලධාරි තැන්පත් වෛද්‍ය ශිව කුමාර් මිශ්‍ර (ඇම්.ඒ.) මහතා විසින්ද අනුමත කර ඇත්තේය.

මාන පරිභාෂා

ලංකා (මංචාඩි-කලං) මානය

තල ඇට	3	=	අමු ඇට	1 යි.		
අමු ඇට	3	=	වී ඇට	1 යි.		
වී ඇට	4	=	රක්තිකා (ගුංජා)	1 යි.	*	
රක්තිකා (ගුංජා)	2	=	මංචාඩි (මදට)	1 යි.	(වී ඇට 8)	
මංචාඩි	20	=	කලං	1 යි.		
කලං	3	=	කර්ෂ (හුණ)	1 යි.		
කර්ෂා (හුණ)	2	=	අඩ පලං	1 යි.		
අඩ පලං	2	=	පලං	1 යි.		
පලං	2	=	ප්‍රසෘති (කුළුදුල්)	1 යි.		
ප්‍රසෘති (කුළුදුල්)	2	=	අර්ධශරාව	1 යි.	(පත–කුඩව–අන්ජලි)	1 යි)
අර්ධශරාව (පත)	2	=	ශරාව	1 යි.	(මානිකා–මනා	1 යි)
ශරාව (මානිකා–මනා)	2	=	ප්‍රස්ථ	1 යි.	(නැලි–නැඹුඹ	1 යි)
ප්‍රස්ථ (නැලි)	4	=	ආඪක	1 යි.	(ලාස්–කුරුණි	1 යි)
ආඪක (ලාස්)	4	=	ද්‍රෝණ	1 යි		
ද්‍රෝණ	2	=	ශූර්ප	1 යි.		
ශූර්ප	2	=	ද්‍රෝණි	1 යි.		
පලං	100	=	තුලා	1 යි.		

සාරාර්ථ සංග්‍රහය, සිංහල යෝගරත්නාකරය හා ශාර්ඞ්ගධර සංහිතා ප්‍රථම ඛණ්ඩ ප්‍රථම අධ්‍යාය ඇසුරෙනි.

ශාර්ඞ්ගධර චරීහාදි මානය අනුව වී ඇට 4 ක් ගුංජා 1 කි. සාරාර්ථ සංග්‍රහය අනුව වී ඇට 8 ක් මදට එකකි. එනිසා රක්තිකා (ගුංජා) 2 ක් පදට්ය එකක් වශයෙන් නිශ්චය වේ.

* විවිධ මානවක්‍ර 336-352 දක්වා පිටු බලන්න.

ස්වර්ණඵලක පිණ්ඩය..............................1992.04.07 දිනමිණ පුවත්පත.

''අනුරාධපුරයේ අභයගිරි විහාර භූමියේ තැනිම් කටයුතු වලදී හමු වූ ස්වර්ණඵලක පිණ්ඩයේ බර එහි එකසිය දෙකලන්දයි යනුවෙන් සටහන් කර තිබිණ. එය කිරා බැලූ විට ග්‍රෑම් 438.10 ක් වේ. ඒ අනුව රන් කළඳක බර ග්‍රෑම් 4.30 කි. ලෝහ මිශ්‍රණයෙන් 80%ක් පමණ රන් ඇති අතර කැරට් 20 කට නොඅඩු රත්රන් එහි ඇත.

මෙය උපයෝගි කර ගනිමින් පැරණි ලංකාවේ පැවැති බර කිරුම් පිළිබඳව ඉතිහාසය අළුත්කර ගත හැකිය. පැරණි මිනුම් අනුව, තල ඇට 3 අමු ඇට 1ක් වශයෙන්ද, වී ඇට 8 ක් මදට්ය ඇටයක් වශයෙන්ද, මදට්ය 20 කළඳක් වශයෙන් ද සඳහන්වේ. අත කාසි ආදිය පැරණි කාලයේදී ලැබී ඇති නමුත් ඒවායේ නියම බර ග්‍රෑම් වශයෙන් කොපමණ විය යුතුද යන්න මේ අනුව නිශ්චය කර ගත හැකිය.

පැරණි බර මිණුම් ක්‍රම පිළිබඳව විශේෂ අධ්‍යයනයක් කර ඇති එච්. ඩබ්. කොඩ්රින්ටන් මහතා පැරණි පොත්වල සාක්ෂි අනුව කළඳක් වූ කලී ට්‍රෝයි ග්‍රෙන්ස් 72 ක් පමණ බව දක්වා ඇත. මෙම හමු වී ඇති රන් ඵලකයේ බර සමීක්ෂණ කළ කල්හි කළඳක බර ට්‍රොයි ග්‍රෙන්ස් 73.16 ක් වේ. මීට පෙර ක්‍රි.ව. 1791 දී රාජාධිරාජසිංහ රජතුමා විසින් සිය අග මෙහෙසියට පිං පිණිය දළඳා මාළිගාවට පියන සහිත පාත්‍රයක් පූජා කර ඇත. එය කළං 462 යි මදට්ය 9 ක් බර ඇතැයි එහිම සඳහන් කොට තිබේ. එහෙත් එම පාත්‍රයේ පියන දූනට මාරු වී ඇත. එසේම එම පාත්‍රය ගෙවී ගොස් ඇති නිසා ද එහි රන් ප්‍රමාණය හරියටම මැන ගැනීමට නොහැකිව ඇත. එහෙත් සාමාන්‍ය වශයෙන් ඒ මිණුම් අනුව නම් මංචාඩියක් ට්‍රෝයි ග්‍රෙන්ස් 3.3 ක් අනුව වේ.

එහෙත් අභයගිරියෙන් ලැබී ඇති ඉහත සඳහන් පුරාවස්තුවේ කිරුම් මිනුම් අනුව රන් මංචාඩියක් යනු ට්‍රෝයි ග්‍රෙන්ස් 3.66 කි. කොටා ඇති අක්ෂරවල කාල නිර්ණය අනුව එය 7–9 සියවස අතරට අයත් වෙතැයි සිතිය හැකිය.''

දීපන–පාචනාදි වර්ගය (සාංකේතික පරිභාෂාව)

1. දීපන ද්‍රව්‍ය:— Stomachics

ආමය නොපැසවයි. එහෙත් අග්නිය ඇති කරයි.
ශතපුෂ්ප මෙනි.

2. පාචන ද්‍රව්‍ය: Digestives

ආමය පැසවයි. එහෙත් අග්නිය ඇති නො කෙරේ.
නාමල් රේණු මෙනි.

3. දීපන පාචන ද්‍රව්‍ය:— Stomachics and Digestives

ආමය පැසවයි. අග්නිය ද උපදවයි.
රත්නිවුල් මෙනි.

4. ශමන ද්‍රව්‍ය:— Gestric Sedatives

සමදෙෂ විෂම නොකොට, විෂම දෙෂ ශමනය කරයි. එහෙත් ශෝධන වශයෙන් පිට කිරිමක් නො කෙරේ.
රසකිඳ මෙනි.

5. අනුලෝමන ද්‍රව්‍ය:— Carminatives

මලාදීන් පැසවීම කොට බන්ධන ලිහා පහතට පමුණුවනු ඇත.
අරළු මෙ ක්‍රියාව කරයි.

6. ස්‍රංසන ද්‍රව්‍ය:— Simple and Anthracene Purgatives

රැස්වූ, පැසවූ හෝ නොපැසවූ කෝෂ්ඨගත මලාදිය නො පැසවාම පහතට ඇද පිට කරයි.
ඇසළ කරල් පැණිය මෙනි.

7. භේදන ද්‍රව්‍ය:— Drastic Purgatives

බැඳුණු හෝ නොබැඳුණු, දෙෂයන්ගෙන් පිඩුවූ මල කොටස් බිඳ දමා පහතට හෙලයි.
කටුකරෝසන මෙනි.

8. රෙචන ද්‍රව්‍ය:— Purgatives

පැසවූ හෝ නොපැසවූ මලාදිය ද්‍රව බවට පමුණුවා පිට කෙරේ.
තිරස්සවාලු මෙනි.

9. වමන ද්‍රව්‍ය:— Emetics

නොපැසවූ සෙම්, පිත් බලයෙන් උඩට පමුණුවයි; හෙවත් වමනය උපදවා ලයි.
කුකුරුමුවන් ගෙඩි මෙනි.

10. සංශෝධන ද්‍රව්‍ය:— Emetics and Purgatives

මල සහ දෙෂාදිය රැස්වූ ස්ථානයෙන් ඉහළින් හෝ පහළින් හෝ–(මුව, නාසා මගින් හෝ මල මූත්‍ර මාර්ගවලින්) පිට කරයි.
දේවදලී මෙනි.

11. ඡේදන ද්‍රව්‍ය:— Fxpectorarants

බැඳුණු (ඇලුණු) සෙම් ආදි දෙෂයන් බලයෙන් මුලින් උපුටා ලයි.
යවක්ෂාර ආදි ක්ෂාර, ගම්මිරිස්, ශිලාජතු ආදිය මෙනි.

12. ලේඛන ද්‍රව්‍ය:— Curatives

ශරීර ගත රස ආදි ධාතූන් හෝ වාතාදි මල වියලවා ශරීරය කෘෂ කරයි.
මී පැණි, උණුදිය, වදකහ, යව ආදි ද්‍රව්‍යයන් මෙනි.

13. ග්‍රාහී ද්‍රව්‍ය:—

යම් ද්‍රව්‍යයක් දීපන පාචන ගුණ යුක්ත ද, එහි ඇති උෂ්ණ වීර්යය නිසා ද්‍රව ස්වරූප දෝෂ, ධාතු, මලාදීන් වියලවා ලයි ද ඒ ද්‍රව්‍ය ග්‍රාහී නම්.

වියලි ඉඟුරු, සුදුරු, ගජතිප්පිලි මෙනි.

14. ස්තම්භන ද්‍රව්‍ය:—

යම් ද්‍රව්‍යයක් රූක්ෂ ගුණය, ශීත වීර්යය, කෂාය රස, ලඝුපරිපාකය යන වාත ගුණ සාධර්ම්‍ය හේතු චතුෂ්ටය කරණ කොටගෙන වාතය වඩන සුලු ද ඒ ද්‍රව්‍යය ස්තම්භන නම්.

කුටජ (කෙළිඳ)· තොටිල දෙවගය මෙනි.

වාතයාගේ ශෝෂණාත්මක ගුණ ඊට හේතුව ය. වාත ගුණ භූයිෂ්ඨ ද්‍රව්‍ය ස්තම්භනය යනු අභිප්‍රාය යි.

15. රසායන ද්‍රව්‍ය:—

යම් ද්‍රව්‍යයක් ජරා, ව්‍යාධි නසයි ද, ඒ ද්‍රව්‍යය රසායන නම්.

රසකිඳ, රුදන්ති, ගුගුල්, අරළු යනාදිය මෙනි.

16. වාජීකරණ ද්‍රව්‍ය:— Aphrodisiacs

යම් ද්‍රව්‍යයෙකින් ස්ත්‍රී පුරුෂයන් කෙරෙහි, හර්ෂය පහළ කෙරේ ද, හෙවත් කාමසම්භෝග ශක්තිය වර්ධනය කෙරේ ද, ඒ ද්‍රව්‍යය වාජීකරණය නම්.

නාග බලා, වඳුරු මෑ ඇට ආදියමෙනි.

17. ශුක්‍රල ද්‍රව්‍ය:—

යම් ද්‍රව්‍යයකින් ශුක්‍ර ආර්තව වැඩි කෙරේ ද, ඒ ශුක්‍රල නම්.

අමුක්කරා, බින්තල් අල, සීනි, හාතාවාරිය ආදිය මෙනි.

18. ශුක්‍ර රෙතඃප්‍රවර්තක ද්‍රව්‍ය:—

රේතස් (ශුක්‍ර) ප්‍රවර්තක හා ජනක ද්‍රව්‍ය යි. රේතස් ඇතිකිරීම හා පැවැත්ම මෙයින් සිදුවේ.

කිරි, උඳු, භල්ලාතක, නෙල්ලි යනාදිය මෙනි.

19. ශුක්‍ර රේචක ද්‍රව්‍ය:—

ශුක්‍ර වගුරුවා ලන්නේ ශුක්‍ර රේචක නම්.

වෘහත් කණ්ටකාරිකා (මහ කටුවැල්බටු) ගෙඩි මෙනි.

20. ශුක්‍රස්තම්භන ද්‍රව්‍ය:—

ශුක්‍ර ධාතුව (ස්තබ්ධ) තද බවට පත්කරන්නේ ශුක්‍රස්තම්භන නම්.

සාදික්කා මෙනි.

21. ශුක්‍රශෝෂණ ද්‍රව්‍ය:—

ශුක්‍ර ක්ෂය කොට වියලවා ලනුයේ ශුක්‍ර ශෝෂණ නම්.

අරළු මෙනි.

22. සූක්ෂ්ම ද්‍රව්‍ය: Minuteness

ශරීරයෙහි සියුම් සිදුරුවල (ස්රෝතසුන්හි) පිවිසීමෙ ශක්තියක් ඇති ද්‍රව්‍ය සූක්ෂ්ම නම්.

සිදුලුණු, මීපැණි, කොහොඹ තෙල්, එරඩු තෙල්, යනාදිය මෙනි.

23. ව්‍යවායී ද්‍රව්‍ය:—

පළමුව අපක්ව අවස්ථාවෙහිම සියලු සිරුරෙහි පැතිර, පසුව පැසවීමට (පාකයට) යයි.

අබින්, කන්සා මෙනි.

24. විකාශී ද්‍රව්‍ය:—

සන්ධි බන්ධනයන් ලිහිල් කොට, ධාතු ඕජය වියලවා (ඕජඃක්ෂය දනවා) පැසීමට යනුයේ විකාශී ද්‍රව්‍ය නම්.

පුවක්, අමු යන ද්‍රව්‍ය මෙනි.

25. මදකාරී ද්‍රව්‍ය:— Narcotics

බුද්ධිය, අධික තමෝගුණ බලයෙන් වසා (ආච්ඡාදනය කොට) මත් ගතිය උපදවයි.
සුරා හා සුරා සංස්කරණ මෙනි.

26. යෝගවාහී ද්‍රව්‍ය:—

යම් යෝගයකට අයත් සෙසු ද්‍රව්‍යයන්ගේ ගුණරාගිය හෙවත් එය හා සංයෝග වන අනික් ද්‍රව්‍යයන්ගේ ගුණ, ඇද ගනී. එම (සංසර්ග ගුණග්‍රාහක) ද්‍රව්‍ය, යෝගවාහී නම්.
රසදිය, මීපැණි, ගිතෙල්, තලතෙල් මෙනි.

27. ආග්නේය ද්‍රව්‍ය:—

ශරීරය උෂ්ණකොට නාඩීන්ගේ ශක්තිය ඇතිකරන්නේ ආග්නෙය (අග්නිගුණභූයිෂ්ඨ) ද්‍රව්‍ය නම්.
ගොඩකදුරු (කුචිලා ඇට) මෙ ගණයට අයත් ය.

28. විෂ ජීවිතහර (ප්‍රාණහර) ද්‍රව්‍ය:— Poisonous

ව්‍යාවායි, විකාශී, සූක්ෂ්ම, ඡෙදි, මාදක, ආග්නෙය, යෝගවාහී යන කර්ම ශක්තීන් සියල්ල ඇති ද්‍රව්‍ය ජීවිතහර (ප්‍රාණහර) ද්‍රව්‍ය නම්.
විෂ වර්ග, වච්චනාවි, පාෂාණම් මෙ ගණයට අයත් ය.

29. ප්‍රමාථී ද්‍රව්‍ය:—

ස්වකීය ප්‍රභාවයෙන් ස්රෝතස්හි රැස්වූ දෙෂ සමූහය බැහැරකර ලනුයේ ප්‍රමාථී නම්.
ගම්මිරිස් වදකහ මෙනි.

30. අභිෂ්‍යන්දි ද්‍රව්‍ය:—

ගුරු හා පිච්ඡල (බෙලසුල්) ගුණ යුත් හෙයින්, ශාරීරික රස වහනය වන ශිරා ආවරණය කොට, සිරුරේ බර බවක් ඇති කරයි.
දයි (දීකිරි) මෙනි.

31. විදහී ද්‍රව්‍ය:— Irritents

හෘත් දහයත්, අම්ලෝද්ගාරය හා පිපාසාව ඇතිකර ප්‍රමාද වී පාකයට යන ද්‍රව්‍ය විදහී නම්.
අවර, කොල්ලු, අබපලා මෙනි.

32. වෘෂ්‍ය ද්‍රව්‍ය:—

ශරීරය පුෂ්ටිමත් කරන සප්ත ධාතු වර්ධක ද්‍රව්‍ය, වෘෂ්‍ය නම්.
ජීවකාදි අෂ්ට වර්ග, ජීවනීය ගණ, බලාචතුෂ්ටය ආදිය මෙ ගණයට අයත් ය.

33. පිඩන ද්‍රව්‍ය:—

යම් ද්‍රව්‍යයක ලේපයෙන් ව්‍රණයන්ගේ පූසාදිය නිර්ගත වෙද එය පිඩන නම්.
ලෝලු, ශාල්මලි, වචාදිය මෙනි.

34. දහන ද්‍රව්‍ය:—

ක්ෂාර ආදියෙන් ශල්‍ය කර්මයට අයත්, දැවීම ක්‍රියා මින් සිදුවෙ.

35. මාදන:— Anaesthetic

ශල්‍යකර්මයන් සඳහා රෝගියා සිහිනැති කිරීම (හෝ ස්ථානික හිරිය ඇති කිරීම) මින් සිදු කෙරේ.
මද්‍යසාර මෙනි.

36. විෂප්‍රශමන ද්‍රව්‍ය:— Antidote

උද්භිජ්ජ, පාර්ථිව, ජාන්තව විෂ ද්‍රව්‍යවලින් පෙළෙනවුන් සුවපත් කරණු සඳහා යෙදේ.

සාංකේතික සංඛ්‍යාවාචක ද්‍රව්‍ය පරිභාෂාව

දෙකසා = වියලි කහ, වෙනිවැල්ගැට
දෙදුරු = සුදුරු, කලුදුරු,
දෙමොද = හින් අසමෝද, මහ අසමෝද,
දෙසඳුන් = සුදුහඳුන්, රත්හඳුන්,
ත්‍රික'ත්‍රික = තිකුළු, තිපල්, තිසුගන්ධ,
තිකුළු = වියලි ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි,
ත්‍රිකටු = වියලි ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි,
ත්‍රිකණ්ටක = කටුවැල්බටු, දුරාලභා, (ධන්වයාස), ගොක්ෂුර,
ත්‍රික්ෂාර = ස්වර්ජික්ෂාර, යවක්ෂාර, පුෂ්කර,
ත්‍රිකාර්ෂික = වියලි ඉඟුරු, අතිවිඩයම්, කළාදුරු,
ත්‍රිගන්ධ = ගෙන්දගම්, හිරියල්, මනෝශිල,
ත්‍රිජාත = එන්සාල්, හින් කුරුඳුපොතු, තේජපත්‍ර,
ත්‍රිඵලා (තිපල්) = අරළු, බුළු, නෙල්ලි,
ත්‍රිඵලා (සුගන්ධ) = සාදික්කා මද, එන්සාල්, කරාබු,
ත්‍රිඵලා (මධුර) = මිදි, ඇද්දෙමට, රටඉඳි,
ත්‍රිඵලා (ස්වල්ප) = ඇද්දෙමට ගෙඩි, උගුරැස්ස, මිදි,
ත්‍රිමද = වළහසාල්මද, රත්නිටුල්, කලාදුරු,
ත්‍රිමධුර = ගිතෙල්, මීපැණි, උක්හකුරු,
ත්‍රිලවණ = සවිදලුණු, සුවසලුණු, බළල්ලුණු (කාලලවණ සුවස වෙනුවට ඇතැම්),
ත්‍රිසම = අරළු, වියලි ඉඟුරු, රසකිඳ,
ත්‍රිසුගන්ධ = හින්එන්සාල්, කුරුඳුපොතු, තේජපත්‍ර,
චතුර්ජාත = එන්සාල්, කුරුඳුපොතු, තේජපත්‍ර, නාමල්රේණු,
චතුරම්ල = මසන්, දෙළුම්, වෘක්ෂාම්ල, අම්ලවේතස,
චතුරුෂ්ණ = වියලි ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, තිප්පිලිමුල්,
චතුර්සම = අරළු, සවිදලුණු, කරාබු, අසමෝදගම්,
චතුඃ ස්නෙහය (මහාස්නේහය) = ගිතෙල්, තලතෙල්, වසා, මජ්ජා,
චතුෂ්පර්ණි = ශාල පර්ණි, පෘෂ්ණිපර්ණි, මුද්ගපර්ණි, මාෂපර්ණි,
චතුර්බලා = බලා, මහාබලා, අතිබලා, නාගබලා,
චතුර්බීජ = උළුහාල්, චන්ද්‍රශූර, කළුදුරු, අසමෝද,
චාතුර්භද්‍ර = වියලි ඉඟුරු, අතිවිඩයම්, කළාදුරු, රසකිඳ,
කටුපස්මුල = කරඹමුල්, ගොකටු, කටුවැල්බටු, කටුකරඩු දෙවගය,
තණ පස්මුල = රීතණ, උක්, වැලුක්, රණ උණ, ඉලුක්,
වැල් පස්මුල = කිරිබද්ද, ඉරමුසු, මැඩහඟු, පුවඩා, කසඹිලියා,
පංචක්ෂාර = තල, කැල, අපාමාර්ග, ස්වර්ජික්ෂාර, යවක්ෂාර,
පංචකෝල = තිප්පිලි, තිප්පිලි මුල්, සිවිය, රත්නිටුල්, වියලි ඉඟුරු
පංච ගව්‍ය = දධි, කිරි, ගිතෙල්, ගෝමූත්‍ර, ගොම,
පංච ද්‍රාවක = එළ ඔළිද, පුෂ්කර, මීපැණි, ගිතෙල්, පැරණි උක්හකුරු,
පංච තික්ත = රසකිඳ, කොහොඹ, කටුවැල්බටු, දුම්මැල්ල (පටොල), ආඩතෝඩා,
පංච පල්ලව = අඹ, දඹ (මාදං), දිවුල්, නස්නාරං, බෙලි (දළු),
පංච මෘත්තිකා = ඉෂ්ටිකා =ගඩොළු, ගෛරික, ලවණ, භස්ම =කළුමැටි, හුඹස්මැටි,
පංචමධුර (පඤ්චාමෘත) = කිරි, උක්සකුරු, ගිතෙල්, දධි, මීපැණි,
පංච මහා විෂ = ගෞරි පාෂාණ, තාලක, මනඃශිලා, වත්සනාභ, සර්පවිෂ,

පංච මිත්‍ර (මිත්‍ර පංචකය) = මීපැණි, ගිතෙල්, ඔළිඳ, ටංගන, ගුග්ගුලු, (ඇතැම් තැනක මීපැණි වෙනුවට ගුඩ) එළඟි තෙල්, ඔළිඳ ඇට, පුස්කර, මී පැණි, ගුගුල්, යන මෙ පංචකය ලෝහ ආදි ධාතු ද්‍රාවණය සඳහා ද භස්ම වර්ග සම්පූර්ණයෙන් භස්ම වී තිබේදැයි පරික්ෂාව පිණිසද රස ශාස්ත්‍රයෙහි භාවිත කෙරේ. (රස තරංගිණි)

පංච මූල (වෘහත්) = බෙලිමුල්, මිදිමුල්, තොටිලමුල්, පළොල්මුල්, ඇද්දෙමට මුල්,

පංචමූල (ලඝු) = (I) ශාලපර්ණි, පෘෂ්ණිපර්ණි, එළබටුමුල්, කටුවැල්බටු, නෙරෙංචි
(II) ශාලපර්ණි, පෘෂ්ණිපර්ණි, බෙත්එරඬුමුල්, කටුවැල්බටු, එළබටුමුල්,

පංචමූල (මධ්‍යම) = බැවිල, සාරණ, එරඬුමුල්, මුන්වැන්න, මස්වැන්න,

පංච ලවණ = සවිඳලුණු, ලේවාලුණු, සුවසලුණු, උද්භිදලුණු, බළල්ලුණු,
(ඇතැම් තැනෙක උද්භිද ලවණ වෙනුවට කාල ලවණ),

පංච වල්කල = නුග, දිඹුල්, ඇසතු, පුලිල, ප්ලක්ෂ-පොතු,

පංච සුගන්ධි = ශීතලචිනි, සුපාරි, (පුවක්), කරාබු, සාදික්කා, වසාවාසි,
(ඇතැම් තැන ශීතලචීනි වෙනුවට කපුරු),

පංචාංගය = මුල්, මල්, කොළ, පොතු, ගෙඩි (ඇතැම් තැන ඇට),

පංචාම්ල = චතුරම්ල සහ ලජ්නාරං,

පස්කුළුබඩු = ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, අබ, වියලිකහ,

පස් කොළ වර්ග = නික, එරඬු, තොටිල, බෙලි, කුඹුරු කොළ,

පස්ගෝරස = කිරි, දීකිරි, මෝරු, ගිතෙල්, වෙඬරු,

පස්තෙල් = ගිතෙල්, තලතෙල්, එරඬුතෙල්, කොහොඹතෙල්, මීතෙල්,

පස්දුරු = සුදුදුරු, කළුදුරු, මහදුරු, අසමෝදගම්, ශතපුෂ්ප,

පස් පලවත = සාදික්කා, තකුල්, හින් එන්සාල්, අරළු, පූගඵල,

පස් පැණි = මීපැණි, කණමීපැණි, බඹරපැණි, දඬුවල්බැ පැණි, උක්පැණි,

පස්පැහිරි = දෙහි, දෙඩං, නාරං, යකිනාරං, පුඩලුදෙහි,

පස්මල් (ලදපස්මල්) = විළඳ, සමන්කැකුළු, හෙලඅබ, හිතණ, සුදුමල්කැකුළු,
(ඇතැම් තැන සුන් සහල්)

පසකුරු = (1) ඇසතු, බෝ, නුග, පුලිල, අට්ටික්කා හෝ (2) අඹ, දඹ, ගිවුලු, ලජ්නාරං, බෙලි

ෂඩ් ලවණ = ලේවාලුණු, සවිඳලුණු, රුවකලුණු, බළල්ලුණු, රෝමලුණු, ගල්ලුණු,

ෂඩූෂණ = ඉඟුරු ගම්මිරිස්, තිපපිලි, තිප්පිලිමුල්, රත්නිටුල්, සිවිය,

සප්ත ධාතු = ස්වර්ණ, රජත, තාම්ර, යශද, සිස, ලෞහ,

සප්ත උපධාතු = ස්වර්ණ මාක්ෂික, රෞප්‍යමාක්ෂික, පල්මාණික්කම්, මුද්‍රාශංඛ, ඛර්පර, සින්දූර, මණ්ඩූර,

සප්ත උපරත්න = වෛක්‍රාන්ත, රාජාවර්ත, පිරොජා, ශුක්ති, ශඞ්ඛ, සූර්‍යකාන්ත, චන්ද්‍රකාන්ත,

සප්ත සුගන්ධි = අගරු, ශීතලමිරිච, ලෝබාන්, කරාබු, කපුරු, නාමල්රේණු, චතුර්ජාත මිලිතව,

අෂ්ටක්ෂාර = පලාශ, අපාමාර්ග, කදලී, තින්තිඩී, අර්ක, තිල, ස්වර්ජිකාක්ෂාර, යවකාර,

අෂ්ටක්ෂීර = බැටළු, එළු, ගව, මහිස, ඔටු, ඇත්, අස්, නාරි කිරි,

අෂ්ට ගණය = කපුරු, සුදුහඳුන්, කළාඳුරු, කුංකුම, දේවදර, ගෙරෝචන, නාමල්රේණු, සැවැන්න (ගන්ධ මුස්තකද මුස්තක සඳහා ගනු ලැබේ.)

අෂ්ට මූත්‍ර = මිගව, ගව, එළු, බැටළු, කොටළු, අශ්ව, ඔටු, ඇත් මූත්‍ර,

අෂ්ට ලවණ = සුවස, සවිඳ, කලු, ලේවා, මැටි බළල්, උද්භිද, රෝමලුණු,

අෂ්ට වර්ග = ජීවක, ඍෂභක, මේද, මහාමේද, කාකෝලී, ක්ෂීරකාකෝලී, ඍධි, වෘද්ධි.

අෂ්ට සුගන්ධ = (සර්වසුගන්ධ), එන්සාල්, කුරුඳුපොතු, තේජපත්‍ර, නාමල්රේණු, කපුකිනිස්ස, අගිල්, ශිලා රස, කපුරු,

නවරත්න = රතුකැට, මුතු, පබළු, මරකත, පුෂ්පරාග, දියමන්ති, නිල්කැට, ගෝමේද, වෛදූර්‍ය

දසමූල = බෙලි, මිදි, තොටිල, පළොල්, ඇද්දෙමට, ශාලපර්ණි, පෘෂ්ණිපර්ණි, එළබටුමුල්, කටුවැල්බටු, නෙරෙංචි,

දශාංගය = මුල්, ගෙඩි, මල්, පොතු, හර, කොළ, කටු, මද, මැලියම, නැටි,

මහිෂාක්ෂපංචකය = ගුගුල්, සල්මැලියම, හොරමැලියම, කළු අගිල්, කරාබු,

සූතිකා දසමූල = ප්‍රසාරනී මුල්, ඉඟුරු, රසකිඳ, කලාදුරු අල, කටුකරඬු, සුලුපහ,

ප්‍රතිනිධි පරිභාෂාව

අභාව ද්‍රව්‍යයන් වෙනුවට ප්‍රතිනිධි යෙදීම.

(1) යෝගයෙක්හි යම්කිසි ඖෂධ ද්‍රව්‍යයන් අභාව (අප්‍රාප්‍ය) හෝ දුෂ්ප්‍රාප්‍ය කල්හි ඒ වෙනුවට වෙනත් ද්‍රව්‍යයක් යෙදීම ප්‍රතිනිධි නම්. එසේ වෙනුවට යොදනු ප්‍රතිනිධි ද්‍රව්‍යය රස, ගුණ, වීර්‍ය, විපාක විසින් අප්‍රාප්‍ය ද්‍රව්‍යය හා සමගුණවිශිෂ්ට විය යුතුය.

(2) ප්‍රතිනිධි පූර්ව-පර වශයෙන් යෙදිය හැකියි.

නිදසුන්:—

කොත්තමල්ලි අභාවයේ දී ශතපුෂ්ප, ශතපුෂ්ප අභාවයෙහි කොත්තමල්ලි, චිත්‍රක අභාවයෙහි දන්ති, දන්ති අභාවයෙහි චිත්‍රක මෙනි.

(3) යෝගයෙක්හි අප්‍රධාන ද්‍රව්‍ය සඳහා ප්‍රතිනිධි යෙදීම මැනවි. එහෙත් ප්‍රධාන ද්‍රව්‍යයන් වෙනුවට ප්‍රතිනිධි ද්‍රව්‍යය යෙදීම නො මැනවි. ද්‍රාක්ෂා සඳහා අද්දෙමට ගෙඩි ප්‍රතිනිධි ද්‍රව්‍යය ලෙස යෙදිය හැකිය. ද්‍රාක්ෂාරිෂ්ටයෙහි ද්‍රාක්ෂා ප්‍රධාන ද්‍රව්‍යය වේ. ඒ සඳහා ඇද්දෙමට ගෙඩි යෙදීම නො මැනවි.

(4) ප්‍රතිනිධි ද්‍රව්‍යය අභාවයෙහි මූල ද්‍රව්‍යය ද, මූල ද්‍රව්‍යය අභාවයෙහි ප්‍රතිනිධි ද්‍රව්‍යය ද ගත යුතුය. මේ නියමය ''අප්‍රධාන'' ද්‍රව්‍ය විෂයයෙහි පමණි. ''ප්‍රධාන'' ද්‍රව්‍ය විෂයයෙහි කිසිවිටෙකත් නො යෙදේ.

		අභාවයෙහි	
1.	අක්ෂොට = (Indian Walnut)	,,	පියල් (ඇටඹ හෝ කොට්ටම්බා),
2.	අගරු = අගිල්	,,	කුරුඳුපොතු, කරාබු, නාමල්රේණු,
3.	අජමෝද	,,	අජ්වායන (අසමෝදගම් විශෙෂයක්),
4.	අජාමූත්‍ර = එළුමූත්‍ර	,,	ගොමූත්‍ර,
5.	අජාක්ෂීර = එළුකිරි	,,	එළකිරි,
6.	අතිවිෂා	,,	කලාඳුරු,
7.	අභ්‍රක භස්ම	,,	ලෞහ භස්ම,
8.	අම්ලවෙතස	,,	චුක්‍ර = චුකා පාලම්, (බෙං) කෝකම් (ලංකාවේ ගොරක ව්‍යවහාරයි.)
9.	අර්කක්ෂීර = වරාකිරි	,,	පැසුනු වරාකොළ යුෂ,
10.	අහිංස්‍රා	,,	මාණකන්ද = හබරල අල,
11.	අහිඵේන = අබිං	,,	කොරාසානි, කුව්ලා = ගොඩකදුරු, අබිංගෙඩියේ පොතු = පෝස්තක කසායේ ඝන සාරය.
12.	ආඪකි (හිං) අර්හර් = රටතෝර	,,	මයිසූර් පරිප්පු,
13.	ආකාරකරභ = අක්කරපට්ටා	,,	තිප්පිලි, මහාරාෂ්ට්‍රී මල්,
14.	ආර්ද්‍රක = අමුඉඟුරු	,,	වියලි ඉඟුරු
15.	ඉක්ෂු මූල	,,	නල = බට මුල්,
16.	ඉන්ද්‍රයව	,,	කෙළිඳ පොතු, සාදික්කා,
17.	ඊසබගෝල් (හිං) අයිසගුල්) = ශීතබීජ	,,	බිහිදනා = බේදනම් ඇට,
18.	ඔලිව්තෙල්	,,	තලතෙල්,
19.	ඍද්ධි, වෘද්ධි	,,	බලා = බැබිලමුල්, මහාබලා = මහබැබිල මුල්,
20.	කක්කෝල	,,	ජාතිපුෂ්ප = දෑසමන් මල්,
21.	කණ්ටකාරිමූල	,,	නිම්බපංචාංගය,
22.	කණ්ටකාරි = ක්ෂුද්‍රා	,,	මහ කටුවැල්බටු, කොට්ටං,
23.	කමලකේශර = නෙළුම්රේණු	,,	නාමල්රේණු,
24.	කර්චූර	,,	අමු ඉඟුරු හෝ හිඟුරුපියලි,
25.	කර්පූර	,,	බාලා, ග්‍රන්ථිපර්ණී,
26.	කළු ඉරමුසු	,,	සුදු ඉරමුසු
27.	කස්තූරි	,,	ලතාකස්තූරි = කපුකිනිස්ස ඇට, වසාවාසි, වාල්මොල්ගු,

28.	කට්ඵල	අභාවයෙහි	ඇද්දෙමට පොතු
29.	කාංජි	,,	දෙහි ඇඹුල්,
30.	කාකෝලි	,,	අශ්ව ගන්ධා = අමුක්කරා, ශතාවරී,
31.	කාන්තලෞහ = කාන්දම්	,,	තීක්ෂ්ණ ලෞහ = වානේ, (ඉස්පාත්, බෙංගාලි),
32.	කාලමුෂලී = කළුබිංතල්	,,	සුදුබිංතල්,
33.	ලවණ = කළු ලුණු,	,,	සාම්බර ලවණ
34.	කුංකුම = කුංකුමප්පු	,,	කුසුම්භ පුෂ්ප, වසාවාසි, සපුමල් කැකුළු, සමන්පිච්ච, (වෘද්ධ වෛද්‍ය ව්‍යවහාරයකි.)
35.	කුෂ්ඨ	,,	සුවඳකොට්ටං, අක්කරපට්ටා,
36.	කුශතණ	,,	සැන්දරා, ඊතණ,
37.	කුලිංජන = සුගන්ධවචා, මහාහරිවචා	,,	කුරුඳුපොතු,
38.	කිණ්ව = සුරාබීජ මුහුං	,,	ධාතකී, මිපුප්, (මී මල්),
39.	කේතකී	,,	රක්ත චන්දන, දුනුකේ,
40.	කේශර	,,	වසාවාසි, සපුමල් කැකුළු
41.	කෘෂ්ණජීර = කලුදුරු	,,	සුදුදුරු,
42.	ක්ෂීරකාකෝලි	,,	ශතාවරි, කිරිබදු අල,
43.	ඛදිර = කිහිරි	,,	ගෛරික = සිවංගුරු, ඛදිරසාර, (කයිප්පු)
44.	ඛදිරත්වක් = කිහිරිපොතු	,,	කොහොඹ ගසෙහි ඇතුළු පොත්ත,
45.	ගුඩූචීසත්ව = රසකිඳ පිටි	,,	රසකිඳ ඝනසාරය,
46.	ගෝක්ෂුර = ගොකටු	,,	කැකිරි ඇට,
47.	ගෝදුග්ධ	,,	මීකිරි = මී ගවකිරි, මුංයුෂ හෝ පරිප්පු යුෂ,
48.	ගෝපී චන්දන	,,	සිනක්කාරං
49.	චිත්‍රක = රත්නිටුල්	,,	දන්තී හෝ අපාමර්ගක්ෂාර, හෙළනිටුල් මුල් හෝ සිවිය මුල්
50.	චවිකා = සිවිය	,,	තිප්පිලිමුල්,
51.	චීන අල	,,	කබරසමුල්,
52.	ජාතිපුෂ්ප = සමන්මල්,	,,	ලවංග = කාරබු, ගැටපිච්චාමල්,
53.	ජාතිකෝෂ = වසාවාසි	,,	සාදික්කා, කරාබු,
54.	ජීරක = සුදුදුරු	,,	කොත්තමල්ලි
55.	ජීවක, ඍෂභක	,,	ශතාවරි, කිරිබදු අල, උණකපුරු, රසකිඳ,
56.	තගර	,,	සීහලිජටා, කොට්ටං, සේපාලිකාමල්, ජටාමාංස,
57.	තාලීසපත්‍ර	,,	ස්වර්ණනාලී, කටුවැල්බටු,
58.	දඩිම = දෙළුම්	,,	වෘක්ෂාම්ල, සියඹලා,
59.	දරුහරිද්‍රා	,,	හරිද්‍රා = වියලි කහ,
60.	දේවදලි	,,	වැටකොළු, හීනි වැටකොළු, තිත්ත වැටකොළු,
61.	ද්‍රාක්ෂා	,,	ගාම්භාරීඵල = ඇද්දෙමට ගෙඩි, රට ඉඳි,
62.	ධන්වයාස	,,	දූරාලභා, ධන්වයාස දූරාලභා අභාවයෙහි වැල්කහඹිලියා,
63.	ධාන්‍ය = කොත්තමල්ලි	,,	ශතපුෂ්ප,
64.	නඛ	,,	ලවංග = කරාබු,
65.	නාගකේශර	,,	නෙළුම්රේණු,
66.	නිර්ගුණ්ඩි = නික	,,	තුලසි, මදුරුතලා,
67.	නීලෝත්පල = නිල්මානෙල්	,,	කුමුදු,
68.	නීලකලම් = කාලාදනා (බෙං)	,,	ගොංකැකිරි ඇට,
69.	නෙත්‍රබාලා = සුගන්ධබාලා	,,	කලාඳුරු, සැවැන්දරා, (ලංකාවේ ඉරිවේරිය),
70.	රක්ත චන්දන	,,	නව උශීර = අලුත් සුවඳහොට, පතඟිහර, මදටහර,
71.	රජත භස්ම = රිදී අළු	,,	කාන්තලෞහ භස්ම, රජතමාක්ෂික භස්ම,
72.	රසාංජන	,,	දරුහරිද්‍රා ක්වාථ ඝන සාරය,
73.	රස භස්ම	,,	රස සින්දූර,
74.	රාස්නා	,,	හීන් අරත්ත හෝ මහ අරත්ත, චීන අල,

75.	රුචක ලවණ	අභාවයෙහි	පාංශු ලවණ,
76.	රෝහිතක	,,	කොහොඹපොතු, ලාක්ෂා, යක්ඵරබදු,
77.	රෞප්‍යමාක්ෂික භස්ම	,,	ස්වර්ණමාක්ෂික භස්ම, විමල භස්ම,
78.	පංචක්ෂාර	,,	අපාමාර්ගක්ෂාර,
79.	පංච ලවණ	,,	සහිද ලුණු,
80.	පද්මකාෂ්ඨ	,,	නෙළුම්දඬු, කීණ අරටු,
81.	පන්නා භස්ම	,,	ප්‍රවාල භස්ම,
82.	පටෝල	,,	දුම්මැල්ල,
83.	පාෂාණභේද	,,	පොල්පලා, අක්කපාන, කප්පරවල්ලිය,
84.	පෞෂ්කර	,,	කොට්ටං,
85.	පිප්පලි	,,	ගම්මිරිස්, තිප්පිලිමුල්,
86.	පිත්ත	,,	මාංස මිරිකා ගත් යූෂ,
87.	ජීවක, ඍෂභක	,,	විදරි = කිරිබදු අල, ශතාවරී, උණකපුරු,
88.	පිප්පලිමූල	,,	රත්නිවුල්, ජටාමාංසි, තිප්පිලි,
89.	පුනර්නවා	,,	රක්තපුනර්නවා,
90.	පුරාතනගුඩ	,,	යාම සතරක් අව්වේ වියලා ගත් ගුඩ හෝ එබදු සීනි,
91.	පුෂ්කර මූල	,,	කොට්ටං, එරඬුමුල්,
92.	පුෂ්ප = මල්	,,	අපක්ව ඵල = ගැට
93.	පුෂ්පරාග භෂ්ම	,,	අභ්‍රක භස්ම,
94.	පෘෂ්ණිපර්ණි	,,	පොල්පලා,
95.	ප්‍රියංගු	,,	රුක්මල්
	බාලා = ඉරිවේරිය	,,	කලාඳුරු සැවැන්න
96.	බ්‍රාහ්මී	,,	ගොටුකොළ,
97.	භාර්ගි	,,	සිරිතේක්කු
98.	භල්ලාතක = සෙම්කොට්ටං	,,	බදුල්ල ඇට,
99.	මත්ස්‍යණ්ඩිකා = සූකිරි බවට පත් ගුඩ	,,	සුදුසීනි,
100.	මද්‍ය	,,	ආසව, අරිෂ්ට,
101.	මධු = මීපැණි	,,	පුරාතණ ගුඩ, (පරණ උක්හකුරු)
102.	මධුයෂ්ටි = වැල්මී	,,	ධාතකී = මලිතමල්, ඔලිද මුල්,
103.	මයූරමාංස	,,	කුකුළු, හංස හෝ හාමස්,
104.	මාහිෂක්ෂීර = මීකිරි	,,	එලකිරි,
105.	මාණික්‍ය භස්ම	,,	රිදී භස්ම,
106.	මිශ්‍රී = සූකිරි	,,	සීනි, පුරාණ ගුඩ,
107.	මුක්තා	,,	මුක්තා ශුක්ති = මුතුබෙලි කටු භස්ම,
108.	මූල රාස්නා	,,	වීන අල,
109.	මූර්වා	,,	කුරුඳුපොතු, වැල්මදට, තිප්පිලිමුල්,
110.	මේද, මහාමේද	,,	අශ්වගන්ධා (අමුක්කරා) ශාරිබා (ඉරමුසු) හාතාවාරිය අල,
111.	යවාස	,,	වැල්කහඹිලියා,
112.	ලක්ෂ්මණාමූල	,,	මොණරකුඩුම්බිය, සුදු මල් සහිත හීන් කටුවැල්බටු හෝ මහකටු වැල්බටු,
113.	ලවංග	,,	ගම්මිරිස්,
114.	ලාංගලි = නියහලා	,,	කොට්ටං,
115.	ලොධ්‍ර	,,	ඛදිර, බෝඹු පොතු (ඖ.සං. II ලොත් බලන්න.)
116.	ලෞහ භස්ම	,,	ලෞහමල = යබොර භස්ම,
117.	වකුල = මූනමල්	,,	කහ්ලාර, උත්පල හෝ පද්ම,
118.	වජ්‍ර = දියමන්ති	,,	වෛක්‍රාන්ත,
119.	වාරාහීකන්ද	,,	කිරිබදු අල,
120.	විදරි = කිරිබදු	,,	අමුක්කරා, හාතාවාරිය, සුදුබිංතල්අල,
121.	වෛදූර්‍ය භස්ම	,,	යසද භස්ම, ශුක්ති භස්ම,

122.	වෘද්ධදරක	අභාවයෙහි	ගිරිතිල්ල,
123.	වෘක්ෂරුහා	,,	පිළිල,
124.	ස්ත්‍රීදුග්ධ = තනකිරි	,,	එලකිරි, එළුකිරි,
125.	ස්වර්ණ භස්ම	,,	ස්වර්ණමාක්ෂික හෝ රජත මාක්ෂික භස්ම,
126.	රජත භස්ම	,,	කාන්ත ලෞහ භස්ම,
127.	ස්වර්ණ මාක්ෂික = රන්මැසිදැ	,,	ගෛරික = සිවංගුරු (ලෞහ එක් කොටසකට ගෛරික කොටස් 3 ක් එක් කිරීමද කෙරේ.)
128.	සෛන්ධව ලවණ	,,	මුදුලුණු හෝ බළල් ලුණු. පෝරන් ලුණු,
129.	සෞරාෂ්ටර මෘත්තිකා = සුරත්මැටි	,,	පඨකපර්පටී = වියලි පුපුරන ලද මඩ,
130.	සිතා (සීනි)	,,	ඛණ්ඩශර්කරා = සුකිරි,
131.	සුවර්ණ-රෞප්‍ය = රන්, රිදී	,,	ලෞහ
132.	සෝමරාජී = කරුවාඅරිසි, කරොල්දරිසි	,,	ප්‍රපුන්නාඩ = ඇත්තෝර ඇට,
133.	ඍද්ධි-වෘද්ධි	,,	වරාහීකන්ද, බලා, කිරිබද්ද අල, මහබැබිල මුල්,
134.	ශටී	,,	රක්ත චන්දන, ඉහුරුපියලි, හරංකහ,
135.	ශඨබිනි	,,	එළකටරොළු,
136.	ශ්‍රී ඛණ්ඩචන්දන	,,	කර්පූරද්වය (කපුරු දෙක)
137.	ශිලාජතු	,,	වෙඩි ලුණු,
138.	ශාලි = ඇල්වී	,,	ෂෂ්ටි = හැට ද වී,
139.	ශ්‍යාමා = කලු ඉරමුසු,	,,	සුදු ඉරමුසු,
140.	ශුක්ල සර්ෂප = එළ අබ	,,	සාමාන්‍ය ව්‍යවහාර අබ,
141.	හංස ඩිම්බ (බිත්තර)	,,	කුකුළු බිත්තර,
142.	හපුෂා	,,	ගම්මිරිස්, මුඩමහණ මල්,
143.	හීරා = දියමන්ති	,,	වෛක්‍රාන්ත භස්ම,

පඤ්චාශත්මහාකෂාය ද්‍රව්‍ය ගණය

1. ප්‍රථම වර්ගය

1. ජීවනීය ගණය
2. බෘංහණීය ,,
3. ලේඛනීය ,,
4. භෙදනීය ,,
5. සන්ධානීය ,,
6. දීපනීය ,,

යන මේ ගණ සය ප්‍රථම වර්ගයට අයත් වේ. මෙය මහා කෂාය යනුවෙන් ද සඳහන් වේ.

1. ජීවනීය ගණය:—

ජීවක, ඍෂභක, මේද, මහාමේද, කවෙලු, කිරිකවෙලු, මුංවැන්න, මස්වැන්න, ජීවන්ති, වැල්මී යන දශකය ජීවනීය = ආයුවර්ධක වේ.

2. බෘංහණීය ගණය:—

ක්ෂිරිණී, රාජක්ෂවක, බැබිල, කවෙලු, කිරි කවෙලු, සුදු බැබිල, කහ බැබිල, වන කපු, සුදු කිරිබද්ද, වෘධදරක යන දශකය බෘංහණීය = පුෂ්ටිකාරක වේ.

3. ලේඛනීය ගණය:—

කලාදුරු, සුවඳ කොට්ටම්, කහ, දරාහරිද්‍රා, වදකහ, අතිවිඩයම්, කුළුරැණ, රත්නෙටුල්, කරඳ, සුදු වදකහ, යන දශකය ලේඛනීය = කෘශකාරක වේ.

4. භේදනීය ගණය:—

තිරස්සවාලු, වරා, එරඬු, හල්ලාතක, දූන්ත, රත්නෙටුල්, කරඳ, ශඞ්ඛිණී, කුළුරැණ, රන්කිරි ගොකටු යන දශකය භේදනීය = මල විරේචක වේ.

5. සන්ධානීය ගණය:—

වැල්මී, රසකිඳ, පෘශ්ණිපර්ණී, දියමිත්ත, නිදිකුම්බා, ඉඹුල් මැලියම්, මලිතමල්, ලොත්, පුවඟු, කටඑල යන මේ දශකය සන්ධානීය (භග්න සංයෝජක) වෙයි.

6. අග්නිදීපක ගණය:—

තිප්පිලි, තිප්පිලි මුල්, සිවිය, රත්නෙටුල්, ඉඟුරු, අම්ලවෙතස, ගම්මිරිස්, අසමෝදගම්, හල්ලාතක ඇට (ශුද්ධ).. පෙරුම්කායම්, යන මේ දශකය දීපනීය හෙවත් අග්නි දීපක වෙයි. මේ ෂඩ්විධ ප්‍රථම කෂාය වර්ගය යි.

2. ද්විතීය වර්ගය

1. බලකාරක ගණය (බල්‍ය),
2. වර්ණකාරක ,, (වර්ණ්‍ය),
3. ස්වරකාරක ,, (කණ්ඨ්‍ය),
4. හෘදයට හිතකර ,, (හෘද්‍යය),

යන ගණ හතරකින් යුක්ත වේ.

1. බලකාරක ගණය:—

ගොන් කැකිරි, වදුරු මැඇට, හාතාවාරිය, මස්වැන්න = මාෂපර්ණී, කිරිබද්ද, අමුක්කරා ශාලපර්ණී, කුළුරැණ, මල් සුදු බැබිල, මල් කහ බැබිල, යන දශකය බලකාරක (බල්‍ය) වේ.

2. වර්ණකාරක ගණය:—

රත්හඳුන්, දෙඹ, පද්මකාෂ්ඨ, සැවැන්දරා මුල්, වැල්මී, වැල්මදට, ඉරමුසු, කිරිබඳු, ශර්කරා, දූර්වා = ඊතණ යන දශකය වර්ණ්‍ය = වර්ණකාරක වේ.

3. ස්වරකාරක ගණය:—

ඉරමුසු, උක්මුල්, වැල්මී, තිප්පිලි, මුද්දරප්පලම්, කිරිබඳු, කවඑල, ගොටුකොළ, එළබටු, කටුවැල්බටු යන දශකය කණ්ඨ්‍ය = ස්වරකාරක වෙයි.

4. හෘද්‍ය ගණය:—

අඹ, ඇඹරැල්ල, නිකුව, කරඹ, සියඹලා, ගොරක, මහ මසන්, කුඩා මසන්, දෙළුම්, ලප්නාරං, යන දශකය හෘද්‍ය = හෘදයට හිත වෙයි.

සැ:යු: =නිකුව = වල්දෙල් හෙවත් සිංහල දෙල්යයි ද, ඇතැමෙක් වැල්දෙහි ය යි ද කියති.

3. තෘතීය වර්ගය

1. තෘප්තිඝ්න ද්‍රව්‍ය,
2. අර්ශෝඝ්න ද්‍රව්‍ය,
3. කුෂ්ඨඝ්න ද්‍රව්‍ය,
4. කණ්ඩුඝ්න ද්‍රව්‍ය,
5. ක්‍රිමිඝ්න ද්‍රව්‍ය,
6. විෂඝ්න ද්‍රව්‍ය,

යන ගණ සයකින් යුක්ත ය.

1. තෘප්තිඝ්න ද්‍රව:—

ඉඟුරු, සිවිය, රත්නෙටොල්, වළහසාල්, මූර්වා, රසකිඳ, වදකහ, කලාඳුරු, තිප්පිලි, පටෝල, යන දශකය තෘප්ති නාශක = ක්ෂුධාවර්ධක වේ,

2. අර්ශෝඝ්න ද්‍රව:—

කෙළිඳ, බෙලි, රත්නෙටොල්, ඉඟුරු, අතිවිඩයම්, අරළු, දුරාලභා, දරුහරිද්‍රා, වදකහ, සිවිය යන දශකය අර්ශස් නාශක වෙයි.

3. කුෂ්ඨඝ්න ද්‍රව්‍ය:—

කිහිරි, අරළු, නෙල්ලි, කහ, හල්ලාතක, රුක්අත්තන, ඇසළ, කනේරු, වළහසාල්, අමු දැසමන් කොළ යන මේ දශකය කුෂ්ඨ නසන්නේ ය.

4. කණ්ඩුඝ්න ද්‍රව්‍ය:—

රත්හඳුන්, ජටාමාංශ, ඇසළ, කරඳ, කොසඹ, කෙළිඳ, අඹ, වැල්මී, දරුහරිද්‍රා, කලාඳුරු, යන දශකය කැසීම් නසන්නේ වෙයි.

5. ක්‍රිමිඝ්න ද්‍රව්‍ය:—

මුරුංගා, ගම්මිරිස්, ගණ්ඩීර, කේබුක = තෙබු, වළහසාල්, නික, දුහුදු, ගොකටු, මීකත්පලා, දූත්ත යන දශකය ක්‍රිමි නාශක වෙයි.

6. විෂඝ්න ද්‍රව්‍ය:—

කහ, වැල්මදට, අරත්ත, හින් එන්සාල්, කළු ඉරමුසු, රත්හඳුන්, ඉහිනි ඇට, මහරි, නික, ලෝලු යන දශකය විෂ, නාශක වෙයි.

4. චතුර්ථ වර්ගය

1. ස්තන්‍ය ජනන ගණය,
2. ස්තන්‍ය ශෝධන ගණය,
3. ශුක්‍ර ජනන ගණය,
4. ශුක්‍ර ශෝධන ගණය,

යන ගණ සතරකින් යුක්ත ය.

1. ස්තන්‍ය ජනන ගණය:—

සැවැන්දරා, ශාලි ධාන්‍ය = ඇල්, හැටද ඇල්, ඉක්ෂු බාලිකා, ඉලුක්, කුශතණ, වැලුක්, රසකිඳ, ඉත්කට, පැඟිරිමාන්, යන මේ දශකය ස්තන්‍ය ජනන වෙයි.

2. ස්තන්‍ය ශෝධන ගණය:—

දියමිත්ත, ඉඟුරු, දේවදර, කලාඳුරු, මූර්වා, රසකිඳ, කෙළිඳ, බිංකොහොඹ, කුළුරැණ, ඉරමුසු යන මේ දශකය ස්තන්‍ය ශෝධන වෙයි.

3. ශුක්‍ර ජනන ගණය:—

ජීවක, ඍෂභක, කවෙලු, කිරිකවෙලු, මුංවැන්න, මස්වැන්න, මේද, වෘක්ෂරුහා, (පිලිල) කිරිබදු හෝ ජටාමාංශ, කකුළු සුඟු යන මෙ දශය ශුක්‍ර ජනන වෙයි.

4. ශුක්‍ර ශෝධන ගණය:—

කොට්ටම්, එල්වලු, කට්එල, මුහුදු පෙන, කොළොම් මැලියම්, කළු උක්, ඉකිරි, කතුරුමුරුංගා, සැවැන්දරා යන දශකය ශුක්‍ර ශෝධන වෙයි.

5. පඤ්චම වර්ගය

1. ස්නේහෝපග ද්‍රව්‍ය.
2. ස්වෙදෙපග ද්‍රව්‍ය,
3. වමනෝපග ද්‍රව්‍ය,
4. විරේචනෝපග ද්‍රව්‍ය,
5. ආස්ථාපනෝපග ද්‍රව්‍ය,
6. අනුවාසනෝපග ද්‍රව්‍ය,
7. ශිරෝවිරේචනෝපග ද්‍රව්‍ය,

1. ස්නේහෝපග ද්‍රව්‍ය:—

මුද්දිරප්පලම්, වැල්මී, රසකිඳ, මේද, කිරිබදු, කවෙලු, කිරිකවෙලු, ජීවක, ජීවන්ති, ශාලපර්ණී, යන මේ දශකය ස්නේහ කාර්‍යයන්හි ප්‍රයෝජ්‍ය යි.

2. ස්වෙදෙපග ද්‍රව්‍ය:—

මුරුංගා, එරඬු, වරා, සුදුසාරණ, රතුසාරණ, යව, තල, කොල්ලු, උඳු, මසන් යන මේ දශකය ස්වෙදකාර්‍යයන්හි ප්‍රයෝජ්‍ය යි.

3. වමනෝපග ද්‍රව්‍ය:—

මීපැණි, වැල්මී, රතු කොබෝලීල, සුදු කොබෝලීල, කොළොම්, ජලවේතස, කොවක්කා, වන හණ = කැලෑ හණ, වරා, කරල් හැබ යන මේ දශකය වමන කාර්‍යයන්හි ප්‍රයෝජ්‍ය යි.

4. විරේචනෝපග ද්‍රව්‍ය:—

මුද්දිරප්පලම්, ඇද්දෙමට ගෙඩි, බොරළුදමුනු ගෙඩි, අරළු, බුළු, නෙල්ලි, මහ මසන්, කුඩා මසන්, කැළෑ මසන්, මොර යන මේ දශකය විරේචනයෙහි ප්‍රයෝජ්‍ය වෙයි.

5. ආස්ථාපනෝපග ද්‍රව්‍ය:—

තිරස්සවාලු, බෙලි, තිප්පිලි, කොට්ටම්, අබ, වදකහ, කෙළිඳ, ශතපුෂ්ප, වැල්මී, කුකුරුමාන් යන මේ දශකය ආස්ථාපනයෙහි ප්‍රයෝජ්‍ය යි.

6. අනුවාසනෝපග ද්‍රව්‍ය:—

අරත්ත, දේවදර, බෙලි, කුකුරුමාන්, ශතපුෂ්ප, සුදු සාරණ, රතු සාරණ, ගොකටු, මිදි, තොටිළ යන මේ දශකය ස්නෙහ වස්තිකර්මයන්හි ප්‍රයෝජ්‍ය යි.

7. ශිරෝවිරේචනෝපග ද්‍රව්‍ය: =

දුහුදු, ක්ෂවක, ගම්මිරිස්, තිප්පිලි, වළහසාල්, මුරුංගා ඇට, අබ, කරල් හැබ ඇට, එළ කටරොළු, නිල් කටරොළු, යන මේ දශකය ශිරෝවිරේචනයෙහි ප්‍රයෝජ්‍ය යි.

6. ෂෂ්ඨ වර්ගය

1. ඡර්දිනිග්‍රහණ ද්‍රව්‍ය,
2. තෘෂ්ණානිග්‍රහණ ද්‍රව්‍ය,
3. හික්කානිග්‍රහණ ද්‍රව්‍ය,

1. ඡර්දිනිග්‍රහණ ද්‍රව්‍ය:—

මාදම් කොළ, අඹ කොළ, ලප්නාරං, ඇඹුල් මසන්, දෙළුම, යව, වැල්මී, සැවැන්දරා, සෞරාෂ්ටර මෘත්තිකා = සුරත්මැටි විලඳ යන මේ දශකය වමන නිවාරක වේ.

2. තෘෂ්ණානිග්‍රහණ ද්‍රව්‍ය:—

ඉඟුරු, දුරාලභා, කලාඳුරු, පැපිලිය, රත්හඳුන්, බිම්නිඹ, රසකිඳ, බාලක, කොත්තමල්ලි, පටෝල යන මේ දශකය තෘෂ්ණා නිවාරක වෙයි.

3. හික්කානිග්‍රහණ ද්‍රව්‍ය:—

ශටී, පොකුරු මුල්, මසන් ඇට, කටුවැල්බටු, එළබටු, පිලිල, අරළු, තිප්පිලි, දුරාලභා, කකුළුපුහු යන මේ දශකය හික්කා නිවාරක වෙයි.

7. සප්තම වර්ගය

1. පුරීෂ සංග්‍රහණීය ද්‍රව්‍ය,
2. පුරීෂ විරජනීය ද්‍රව්‍ය,
3. මූත්‍ර සංග්‍රහණ ද්‍රව්‍ය,
4. මූත්‍ර විරජනීය ද්‍රව්‍ය,
5. මූත්‍ර විරේචනීය ද්‍රව්‍ය,

1. පුරීෂ සංග්‍රහණීය ද්‍රව්‍ය:—

පුවඟු, ඉරමුසු, අඹ ඇට, තොටිල, ලොත්, ඉඹුල් මැලියම්, නිදිකුම්බා, මලිත මල්, භාර්ගී, නෙළුම්රේණු යන මේ දශකය මල = පුරීෂ දෘඩ කෙරේ.

2. පුරීෂ විරජනීය ද්‍රව්‍ය:—

මාදම් පොතු, ශල්ලකීත්වක් = ඉන්සල් පොතු, වඳුරු මැඇට, වැල්මී, ඉඹුල් මැලියම්, සිරිවටු, දෑවුනු මැටි, කිරිබද්ද, නිලුපුල්, පොතු රහිත තල, යන මේ දශකය මල පිරිසිදු කොට ස්වාභාවික වර්ණයට පමුණුවන්නෝ ය.

3. මූත්‍ර සංග්‍රහණ ද්‍රව්‍ය:—

මාදම්, අඹ, පුලිළ, නුග, ඇඹරැල්ලා, අට්ටික්කා, බෝ, භල්ලාතක, අශ්මන්තක, කිහිරි යන මේ දශකය මූත්‍ර සංග්‍රහණීය වෙයි.

4. මූත්‍ර විරජනීය:—

සුදු නෙළුම්, නිල් මානෙල්, රතු නෙළුම්, සුදු මානෙල්, අතිශයින් සුවඳවත් නිල් මානෙල්, සුදු නෙළුම්, ශතපත්‍ර නම් නෙළුම්, වැල්මී, පුවඟු, මලිත මල් යන මේ දශකය මූත්‍ර ස්වාභාවික වර්ණයට පමුණුවයි.

5. මූත්‍ර විරේචනීය ද්‍රව්‍ය:—

පිලිල, ගොකටු, කතුරුමුරුංගා, වශිර = වල් අබ හෝ වෙලා, පාෂාණභේද, ඉළුක්, කුශතණ, වැලුක්, රසකිඳ, ඉත්කට යන මේ දශකය මූත්‍ර විරේචන වෙයි.

8. අෂ්ටම වර්ගය

1. කාසහර ද්‍රව්‍ය,
2. ශ්වාසහර ද්‍රව්‍ය,
3. ශෝථහර ද්‍රව්‍ය,
4. ජ්වරහර ද්‍රව්‍ය,
5. ශ්‍රමහර ද්‍රව්‍ය,

1. කාසහර ද්‍රව්‍ය:—

මුද්දිරප්පලම්, අරළු, නෙල්ලි, තිප්පිලි, දූරාලභා, කකුළු සුඟු, කටුවැල්බටු, රතු සාරණ, සුදු සාරණ, එල පිටවක්කා, යන දශකය කාසය නසන්නේ ය.

2. ශ්වාසහර ද්‍රව්‍ය:—

ශටී, සුවඳ කොට්ටං, එන්සාල්, අම්ලවේතස, පෙරුම්කායම්, අගිල්, මදුරුතලා, එල පිටවක්කා, ජීවන්ති, චෝරපුෂ්පී යන දශකය ශ්වාසහර වෙයි.

3. ශෝථහර ද්‍රව්‍ය:—

පළොල්, මිදි, බෙලි, තොටිල, ඇද්දෙමට, කටුවැල්බටු, එළබටු, ශාලපර්ණී, පෘශ්ණිපර්ණී, ගොකටු යන දශකය ශෝථහර වෙයි.

4. ජ්වරහර ද්‍රව්‍ය:—

ඉරමුසු, සිනි, දියමින්න, වැල්මදට, මුද්දිරප්පලම්, මොර, බොරළුදමුනු, අරළු, බුළු, නෙල්ලි යන දශකය උණ නසන්නේ වෙයි.

5. ශ්‍රමහර ද්‍රව්‍ය:—

මුද්දිරප්පලම්, රටඉඳි, කොට්ටම්බා, මයන්, දෙළුම්, කොටදිඹුලා, බොරළුදමුනු, උක්, යව, සැවඳ හැල් යන දශකය විඩා දුරුකරන්නේ ය.

9. නවම වර්ගය

1. දහප්‍රශමන ද්‍රව්‍ය,
2. ශීතප්‍රශමන ද්‍රව්‍ය,
3. උදර්දප්‍රශමන ද්‍රව්‍ය,
4. අංගමර්දප්‍රශමන ද්‍රව්‍ය,
5. ශූලප්‍රශමන ද්‍රව්‍ය,

යන පස්වැදරුම් ද්‍රව්‍ය ගණ නවම කෂාය වර්ගයට අයත් වෙති.

1. දහප්‍රශමන ද්‍රව්‍ය:—

විලඳ, සුදුහඳුන්, ඇද්දෙමට ගෙඩි, වැල්මී, ශර්කරා, නිල් මානෙල්, සැවැන්දරා, ඉරමුසු, රසකිඳ, ඉරිවේරිය යන මේ දශකය දවිලි සංසිඳුවාලයි.

2. ශීතප්‍රශමන ද්‍රව්‍ය:—

තුවරලා, අගිල්, කොත්තමල්ලි, ඉඟුරු, අසමෝදගම්, වදකහ, කටුවැල්බටු, මිදි, තොටිල, තිප්පිලි යන මේ දශකය ශීතය සංසිඳුවන්නේ ය.

3. උදර්දප්‍රශමන ද්‍රව්‍ය:—

තිඹිරි, කොට්ටම්බා, මයන්, කිහිරි, සුදු කිහිරි, රුක්අත්තන, සල්, කුඹුක්, අසන, අරිමේද යන මේ දශකය උදර්ද ප්‍රශමනය කරයි.

4. අංගමර්දප්‍රශමන ද්‍රව්‍ය:—

ශාලපර්ණී, පෘශ්ණිපර්ණී, එළබටු, කටුවැල්බටු, එරඬු, කවෙලු, සඳුන්, සැවැන්දරා, එන්සාල්, වැල්මී යන මේ දශකය අංගමර්දය සංසිඳුවන්නේ ය.

5. ශූලප්‍රශමන ද්‍රව්‍ය:—

තිප්පිලි, තිප්පිලි මුල්, සිවිය, රත්නෙටොල්, ඉඟුරු, ගම්මිරිස්, අසමෝදගම්, වල් අසමෝදගම්, සුදුරු, ගණ්ඩීරශාක යන මේ දශකය ශූලය සංසිඳුවන්සේ ය.

10. දශම වර්ගය

1. ශොණිතස්ථාපන ද්‍රව්‍ය,
2. වේදනාස්ථාපන ද්‍රව්‍ය,
3. සංඥාස්ථාපන ද්‍රව්‍ය,
4. ප්‍රජාස්ථාපන ද්‍රව්‍ය,
5. වයඃස්ථාපන ද්‍රව්‍ය,

1. ශෝණිතස්ථාපන ද්‍රව්‍ය:—

    මීපැණි, වැල්මී, කුංකුමප්පු, ඉඹුල් මැලියම්, කැබිලිති, ලොත්, සිවංගුරු, පුවඟු, සීනි, විලඳ යන දශකය රක්තස්ථාපන වේ.

2. වේදනාස්ථාපන ද්‍රව්‍ය:—

    සල්, කටඑල, කොළොම්, පද්මකාෂ්ඨ, දෙඹ, ඉඹුල් මැලියම, මහරි, වේ, එල්වලු, අශෝක යන දශකය වේදනා නවත්වයි.

3. සංඥස්ථාපන ද්‍රව්‍ය:—

    පෙරුම්කායම්, කටඑල, අරිමෙද, වදකහ, චෝරපුෂ්පි, බ්‍රාහ්මී, ගෝලෝමී — නික, ජටාමාංශ, ගුගුල්, කුළුරැණ යන දශකය සංඥස්ථාපන නම්.

4. ප්‍රජාස්ථාපන ද්‍රව්‍ය

    ගොන්කැකිරි, ලුණුවිල, දූර්වා = ඊතණ, ශ්වෙත දූර්වා, පළොල්, නෙල්ලි, අරළු, කුළුරැණ, බැබිල, පුවඟු යන දශකය ප්‍රජාස්ථාපන (ගප්සාවීම වලක්වන්නේ) වේ.

5. වයඃස්ථාපන ද්‍රව්‍ය:—

    රසකිඳ, අරළු, නෙල්ලි, අරත්ත, එළකටරොළු, ජීවන්ති, හාතාවාරිය, ගොටුකොළ, ශාලපර්ණී, සාරණ යන දශකය වයඃස්ථාපන (තරුණ බව රකින්නේ) වේ.

සප්ත ත්‍රිංශත් ද්‍රව්‍ය ගණය

1. අඤ්ජනාදි ගණය

සෞවීරාඤ්ජන
රසාඤ්ජන
නාමල් රේණු
පුවඟු
නිලුපුල්
ජටාමාංස
නෙළුම් රේණු
වැල්මී යනු වේ

මේ ගණය රත් පිත් පහ කෙරේ. විෂ ශමනය කරයි. අභ්‍යන්තර දහය බෙහෙවින් නසාලයි.

2. අම්බෂ්ඨාදි ගණය

අම්බෂ්ඨා
ධාතකී
නිදිකුම්බා
තොටිල
වැල්මී
බෙලිගැටමද
ලොත්
සාවරලොත්
කැළ
නන්දි වෘක්ෂ
නෙළුම් රේණු යනු වේ.

පක්වාතිසාර නසයි, භග්න සන්ධානය කරයි; පිතට හිතකර ය. ව්‍රණ රෝපණය කෙරේ.

3. අර්කාදි ගණය

රතුවරා
එළවරා
කරඳ
කුණුකරඳ
නාගදන්ති
කරල්හැබ
සිරිතේක්කු
අරත්ත
ඉන්ද්‍රපුෂ්පි
එළකටරොළු
නිල්කටරොළු
කහඹිලියා
අලවණ = දුහුදු
තාපසවෘක්ෂ — ඉඩිගුදි යනු වේ.

මේ ගණය කඵ, මේදස්, විෂ පහ කෙරේ. කෘමි හා කුෂ්ඨ ශමනය කෙරේ. ව්‍රණ ශුද්ධිය කෙරේ.

4. ආමලක්‍යාදි ගණය

නෙල්ලි
අරළු
තිප්පිලි
රත්නෙටුල් යනු වේ.

මෙම ගණය සියලු උණ පහ කෙරේ. ඇසට හිතකර ය. ගින්න දල්වයි. වෘෂ්‍ය ය. සෙම අරුචි නසයි.

5. ආරග්වධාදි ගණය

ඇහැළ
කුකුරුමාන්
ගෝපඝෝණ්ටා
කටුවැල්බටු
කෙළිඳ පොතු
දියමිත්ත
පළොල්
මූර්වා
කෙළිඳ ඇට
රුක්අත්තන
කොහොඹ
කහකටුකරඬු
රසකිඳ
රත්නිටුල්
ශාර්ඞ්ගෂ්ටා
කරඳ
කුණුකරඳ
පටෝල
බිං කොහොඹ
කරවිල යනු වේ.

මෙම ගණය සෙම හා විෂ පහ කෙරේ. මේහ, කුෂ්ඨ, උණ, වමන, කැසිලි යන මේවා නසාලයි. ව්‍රණ ශෝධනය කරයි.

6. උත්පලාදි ගණය

නිලුපුල්
රතුපුල්
හෙළකොඳ
හෙල්මැලි
මදක් නිල්පාට හෙළකොඳ
හෙළ නෙළුම්
වැල්මී යනු වේ.

මෙම ගණය දහ, පිත්ත, රක්ත දුෂ්ටි, පිපාස, විෂ, හෘදරෝග, වමන, මූර්ච්ඡා යන මේවා නසයි.

7. ඌෂකාදි ගණය

ඌෂක
සවිද ලුණු
ශිලාජතු
කසිස් දෙවර්ගය
පෙරුංකායම්
පල්මානික්කම්
යනු වේ.

මේ ගණය සෙම නසාලයි. මේදස් වියළවයි. අශ්මරී, ශර්කරා, මූත්‍රකෘච්ජ්‍ර ශූල, ගුල්ම නසයි.

8. එලාදි ගණය

එන්සාල්
සුවඳකොටටන්
පැහිරිමාන්
තේජපත්‍ර
නාමල්රේණු
පුවඟු
වටරැහැණි
නඛී
ශුක්ති
ග්‍රන්ථිපර්ණී
හොරමැලියම්
චෝච
චෝරක
හ්‍රීවේර
ගුගුල්
හල්දුම්මල
කුරුෂ්ක
අගිල්
පික්මල්
සැවැන්දරා
දේවදර
කුංකුමප්පු
දෙඹ
මූණමල්
යනු වේ.

මෙම ගණය වාත, කඵ, විෂ, කැසිලි, පිඩකා, කෝඨ යන මේවා නසාලයි. වර්ණය පහන් කෙරේ.

9. කාකෝල්‍යාදි ගණය

කවෙලු
කිරිකවෙලු
දිවි—ජීවක
ඔසබිය—ඍෂභක
මුංවැන්න
මස්වැන්න
මෙවන්—මේද
මහමෙවන්—මහමේද
රසකිඳ
කකුළු සුඟු
උණකපුරු
පද්මකාෂ්ඨ
පොඩරු
ඍද්ධි
වෘද්ධි
මුද්දිරප්පලම්
ජීවන්ති
වැල්මී
යනු වේ.

මෙම ගණය පිත්ත—රක්ත හා වායුව ද නසාලයි. ජීවනයට හිත යි. වෘංහණ ය; වෘෂ්‍ය ය; තනකිරි වඩයි; සෙම ඇති කරයි.

10. ගුඩුච්‍යාදි ගණය

රසකිඳ
කොසඹ
කොත්තමල්ලි
හඳුන්
පද්මකාෂ්ඨ
යනු වේ.

මෙම ගණය සියලු උණ නසාලයි; ගින්න දල්වයි; ඔක්කාර, අරුචි, වමන, පිපාසය, දහ යන මේවා නසයි.

11. තණ පස්මුල

කුශ තණ
වැලුක්
බට
ඉළුක්
උක්
යනු වේ.

මෙම ගණය එළකිරි සමඟ ප්‍රයෝග කිරීමෙන් මූත්‍ර දෝෂ, රත් පිත්, වහා විනාශ කෙරේ.

12. ත්‍රප්වාදි ගණය

ත්‍රපු (වංග)
කළුඊයම්
තඹ
ලෝහමල = යබොර
රිදී
කෘෂ්ණලෝහ (වානේ)
රත්රන්
යනු වේ.

මෙම ගණය ගරවිෂ, ක්‍රිමි, පිපාසා, විෂ, හෘද්රෝග, පාණ්ඩු රෝග, ප්‍රමේහ යන මේ සියළු රෝග නසයි.

13. ත්‍රිකටු-ත්‍ර්‍යූෂණ

තිප්පිලි
ගම්මිරිස්
වියලි ඉඟුරු යනු වේ.

මෙම තිකුළු සෙම, මේදස්, මේහ, කුෂ්ඨ, චර්ම රෝග, ගුල්ම, පීනස, අග්නිමාන්ද්‍ය යන රෝග නසයි. ගින්න දල්වයි.

14. ත්‍රිඵලා-තිපල්

අරළු
බුළු
නෙල්ලි යනු වේ.

මෙම තිපල සෙම, පිත්, මේහ, කුෂ්ඨ, නසයි; ඇසට හිතයි; ගින්න දල්වයි; විෂමජ්වරය ද නසයි.

15. දසමුල්

සුළු පස්මුල
මහ පස්මුල යනු වේ.

මෙම දශමූල ශ්වාස, සෙම, පිත්, වායු නසයි. ආමය පැසවයි. උණ නසයි.

16. න්‍යග්‍රෝධාදි ගණය

නුග
අත්තික්කා
බෝ
පුලිල
වැල්මී
ඇඹරැල්ල
කුඹුක්
අඹ
කොහු අඹ
චෝරකපත්‍ර
කුඩාමාදම
මහමාදම
මොර
මීපුප්
කටඑල
වේතස
බක්මී
ඩෙබර
තිඹිරි
සල්ලකීවෘක්ෂ
ලොත්
සාවරලොත්
හල්ලාතක
කැළ
නන්දිවෘක්ෂ 'යනු වේ.

මෙම ගණය වණවලට හිතකර ය. සංග්‍රාහී ය. භග්නසන්ධාන ය. රත් පිත්, දහ, ප්‍රමේහ, යෝනි දෝෂ යන රෝග සුව කරයි.

17. පටෝලදි ගණය

පටෝල
සුදුහඳුන්
රත්හඳුන්
කුළුරැණ
මූර්වා
රසකිඳ
දියමිත්ත
යනු වේ.

මෙම ගණය පිත්ත, කඵ, අරුචි, ජ්වර, වමන, කැසිලි, යන මේවා පහ කෙරේ. වණ වලට හිතකර යි.

18. පරූෂකාදි ගණය

පරූෂක
මුද්දිරප්පලම්
කටඑල
දෙළුම්
කිරිපළු
ඉඟිනි ඇට
තේක්ක ගෙඩි
තිපල් යනු වේ.

මෙම ගණය වායු හා මූත්‍ර දෝෂ නසයි. හෘදයට හිත කරයි. පවස නසයි. රුචිය ඇති කරයි.

19. පිප්පල්‍යාදි ගණය

තිප්පිලි
තිප්පිලි මුල්
සිවිය
රත්නෙටොල්
දියමිත්ත
සූදුරු
අබ
ලුණුමිදෙල්ල ගෙඩි

ඉඟුරු
ගම්මිරිස්
ගජතිප්පිලි
[illegible]
එන්සාල්
අසමෝදගම්
කෙළිඳ
පෙරුංකායම
සිරිතේක්කු
මූර්වා
අතිවිඩයම
වදකහ
වලඟසාල්
කුළුරැණ යනු වේ.

මෙම ගණය සෙම පහ කෙරේ. ප්‍රතිශ්‍යාව, වාඨූ, අරුචි, ගුල්ම, ශූල නසාලයි. ආමය ද පැසවයි.

20. ප්‍රියංග්වාදි ගණය

පුවඟු
සමඞගා
මලිතමල්
දෙඹ
නාමල්රේණු
සුදුහඳුන්
රත්හඳුන්
ඉඟුල්මැලියම
රසාඤ්ජන
කුම්භිකා
සෞවීරාඤ්ජන
නෙළුම්රේණු
වැල්මී
දීර්ඝමූලා යනු වේ.

මෙම ගණය පක්වාතිසාර නසයි. භග්න සන්ධානය කරයි. පිතට හිතකර යි. වරණ රෝපණය කෙරේ.

21. මහපස්මුල්

බෙලි මුල්
මිදි මුල්
ඇද්දෙමට මුල්
තොටිල මුල්
පළොල් මුල් යනු වේ.

මෙම පස් මුල් සෙම්, වා දෙක නසයි. ගින්න දල්වයි.

22. මුස්තකාදි ගණය

කලාඳුරු
කහ
දරුහරිද්‍රා
අරළු
නෙල්ලි
බුළු
සුවඳකොට්ටන්
එළවදකහ
වදකහ
කුළුරැණ
දියමිත්ත
ශාර්ඞගෂ්ටා
අතිවිඩයම
එන්සාල්
හල්ලාතක යනු වේ.

මෙම ගණය සෙම හා යෝනි දෝෂ පහ කෙරේ. තනකිරි ශෝධනය කෙරේ. ආමදෝෂ පැසවා ලයි.

23. මුස්කකාදි ගණය

එළපළොල්
කැල
දූව
රත්නිටුල්
කුකුරුමාන්
කෙළිඳ
ඇටවෙරිය
දළුක්
තිපල් යනු වේ.

මෙම ගණය මේදස් නසා ලයි. ශුක්‍ර දෝෂ පහ කෙරේ. ප්‍රමේහ, අර්ශස්, පාණ්ඩු, ශර්කරා, අශ්මරි නසා ලයි.

24. ලාක්ෂාදි ගණය

ලාකඩ
ඇසළ
කෙළිඳ
කතෝරු
කට්ඵල
ත්‍රායමාණ
කහ
දරුහරිද්‍රා
කොසඹ
රුක්අත්තන
දෑසමන් යනු වේ.

මෙම ගණය කඵ රෝග, පිත්ත රෝග, කුෂ්ඨ, ක්‍රිමි රෝග නසයි. දුෂ්ට වරණ ශෝධනය කෙරේ.

25. ලෝද්ධරාදි ගණය

ලොත්
සවරලොත්
කැළ
තොටිල
අශෝක
සිරිතේක්කු
කෙසෙල්
කට්ඵල
එල්වලු
ශල්ලකී
වැල්මදට
කොලොම්
හල්
යනු වේ.

මෙම ගණය මේදස් හා සෙම් පහ කෙරේ. යෝනි දෙෂ නසා ලයි. ස්ථම්භන ගුණයෙන් යුක්ත යි. වර්ණයට හිතකරයි විෂ ද නසයි.

26. වචාදි ගණය

වදකහ
කලාඳුරු
අතිවිඩයම්
අරළු
දේවදර
නාකෙසරු
යනු වේ.

මෙම ගණය තනකිරි ශුද්ධ කරයි. ආමාතිසාරය සංසිඳවයි. විශේෂයෙන්ම ආම දෙෂ පැසවයි.

27. වරුණාදි ගණය

ලුණුවරණ
කුඹුක්
මුරුංගා
රතුමුරුංගා
ජයන්ති
මැඩහඟු
කරඳ
කුණුකරඳ
මෝරටා
මිදිමුල්
නිල්කටුකරඬු
කහකටුකරඬු
කෙම්වැල්
කතුරුමුරුංගා
සැබෝ
රත්නිටුල්
සාතාවාරිය අල
බෙලි
අජශෘඞ්ගි
කුශතණ
එළබටු
කටුවැල්බටු
යනු වේ.

මෙම ගණය කඵ, මේදස් දෙකින් වන දෙෂ නිවාරණය කෙරේ. ශිරඃශූල, ගුල්ම අන්තර් විද්‍රධි නසා ලයි.

28. වැල් පස්මුල

කිරිබදු
ඉරමුසු
කහ
රසකිඳ
අජශෘඞ්ගි
යනු වේ.

මෙම ගණය රත්පිත, තෙවැදෑරුම් ශෝථය, සියළුම ප්‍රමේහ, ශුක්‍ර දෙෂයන් යන මේවා පහ කෙරේ.

28. කටු පස්මුල

කරඹ
ගොකටු
කටුකරඬු
හාතාවාරිය
ශෘඞ්රතබ
යනු වේ.

මෙම ගණය රත්පිත තෙවැදෑරුම් ශෝථය, සියළු ප්‍රමේහ, ශුක්‍ර දෙෂයන් යන මේවා පහ කෙරේ.

29. විදරිගන්ධාදි ගණය

ශාලපර්ණී
කිරිබදු
විශ්වදේවා
පෘශ්ණිපර්ණී
හාතාවාරිය
ඉරමුසු
සෘෂභක
මස්වැන්න
මුංවැන්න
සාරණ
එරඬු
හංසපාදී

සහදේවා
ගොකටු
කළු ඉරමුසු
ජීවක
එළබටු
කටුවැල්බටු
කහඹිලියා
වදුරු මෑ
යනු වේ.

මෙම ගණය පිත් හා වායු පහකර ලයි. ශෝෂ, ගුල්ම, (අඩගමර්ද) ඇඟමැඩුම, ඌර්ධවශ්වාස, කාස යන මේවාද නසා ලයි.

30. විරතර්වාදි ගණය

අන්දර
නිල් කටුකරඬු
කහ කටුකරඬු
ඉළුක්
වෘක්ෂාදනී
ගුන්ද්‍රා
කුශතණ
වැලුක්
පාෂාණභේද
මිදි මුල්
මෝරටා
කතුරුමුරුංගා
කරල්හැබ
තොටිල
ඇත්සොඩ
සුඇත්හොඩ
කොබෝවක්කා
ගොකටු
බට
යනු වේ.

මෙම ගණය වාත විකාර නසා ලයි. අශ්මරි, ශර්කරා, මූත්‍රකෘච්ඡ්‍ර, මූත්‍රාඝාත යන රෝග ද පහ කෙරේ.

31. වෘහත්‍යාදි ගණය

එළබටු
කටුවැල්බටු
කෙළිඳ
දියමිත්ත
වැලමී
යනු වේ.

මෙම ගණය ආමදෝෂ පැසවා ලයි. පිත්, වායු, කඵ, අරුචි, හෘද්රෝග, මූත්‍රකෘච්ඡ්‍ර පහ කෙරේ.

32. ශාරිවාදි ගණය

ඉරමුසු
වැල්මී
සුදුහඳුන්
රත්හඳුන්
පද්මකාෂ්ඨ
ඇද්දෙමට
මීපුප්
සැවැන්දරා
යනු වේ.

මෙම ගණය පිපාසය රත්පිත්, පිත් උෂ්ණ පහ කරයි. දහ නසා ලයි.

33. ශ්‍යාමාදි ගණය

කළුතිරස්සවාළු
වෘද්ධදර
අරුණුවන් තිරස්සවාලු
දන්ත
ශඞ්ඛිණී
තිල්වක
කඹපිල්ල
රම්‍යක
පුවක්
පුත්‍රශ්‍රේණි
ගොන්කැකිරි
ඇසළ
කුණුකරඳ
රසකිඳ
සප්තලා
ජගලාන්ත්‍රි
දළුක්
රත්කිරිගොකටු
කරඳ
යනු වේ.

මෙම ගණය ගුල්ම හා විෂ පහ කෙරේ. ආනාහ, උදවර්ත නසයි.

34. සාලසාරාදි ගණය

හල්අරටු
අජකර්ණ
කිහිරි
ගුරුන්ද
කාලස්කන්ධ
පුවක්
භූර්ජ
මැඩහහු
කොබුගස්
සුදුහඳුන්
පතඟි
ඇටවෙරියා
මහරි
අසන
දූව
කුඹුක්
තල්
තේක්ක
කරඳ
කුණුකරඳ
අශ්වකර්ණ
කාලියක
යනු වේ.

මෙම ගණය කුෂ්ඨ, ප්‍රමේහ, පාණ්ඩු යන රෝග පහ කරයි. සෙම මේදස් වියලවයි.

35. සුරසාදි ගණය

කළුමල් මදුරුතලා
සුදුමල් මදුරුතලා
සුවඳතලා
අර්ජක
පැඟිරිමාන්
තුඹ
සුමුව
කාලමාල
පෙතිංතෝර
ක්ෂවක
වලහසාල්
කවරල
සුරසී
නික
කුලහල
මීකන්පලා
සිරිතේක්කු
මුකුණුවැන්න
කළුකැම්මෙරිය
ලුණුමිදෙල්ල
හිරපුෂ්පා
යනු වේ.

මෙම ගණය සෙම පහ කෙරේ. කෘමි, ප්‍රතිශ්‍යාය, කාස, අරුචි, ශ්වාස, නසයි. ව්‍රණ ශෝධනය කරයි.

36. සුළු පස්මුල

ගොකටු
එළබටු
ශාලපර්ණී
පෘශ්නිපර්ණී
කටුවැල්බටු
යනු වේ.

මෙම සුළු පස්මුල කසට, තික්ත, මිහිරි යන රසවලින් යුක්ත ය. වායුව නසන අතර පිත ශමනය කෙරේ. වෘංහණ හා බලය වර්ධනය වේ.

37. හරිද්‍රාදි ගණය

කහ
දරුහරිද්‍රා
පෘශ්ණිපර්ණී
කෙළිඳ
වැල්මී
යනු වේ.

මෙම ගණය තනකිරි ශුද්ධ කරයි. ආමාතිසාර සංසිඳවයි. විශේෂයෙන්ම ආම දෝෂ පැසවයි.

13726

ද්‍රව්‍ය ග්‍රහණ නිර්දේශය

1. සියලු ඖෂධ කල්පනාවන් සඳහා ශුෂ්ක ද්‍රව්‍ය යෙදිය යුතු ය. එහෙත් ආර්ද්‍රතාවයෙන් යුක්ත වූ ද්‍රව්‍ය අමුව ගත යුතු වේ. එය අභාවයෙහි දී වර්ෂයකට නොවැඩි වියලි අලුත් ද්‍රව්‍ය ගනු උචිත වේ. එහෙත් වළඟහල්-තිප්පිලි දෙවගය, ගුඩ, ගිතෙල් ධාන්‍ය, මීපැණි, ආදිය පුරාතණ වූයේ ම යෝගයන් සඳහා මනා ය.

2. ප්‍රයෝගයන්හිදී කාලය නොදක්වූ කල ප්‍රභාතය ද ද්‍රව්‍යයෙහි අංගය නොකී කළ මුල් ද, මානය (භාගය) නොදක් වූ අවස්ථාවෙහි සමභාගව ද පාත්‍රය නොදක් වූ කල මැටි බඳුන් ද, ද්‍රව නොකී කල ජලය ද, තෛලය නොදක් වූ අවස්ථාවෙහි තල්තෙල් ද ගත යුතු වේ.

3. චන්දන සඳහා රත්හඳුන් යෙදිය යුතු වේ. එහෙත් චූර්ණ, ස්නේහ, ආසව, ලේහ උදෙසා සුදු හඳුන් ද, කෂාය, ලේප සඳහා රත් හඳුන් ද යොදන්නේ ය. යෝගයන්හි නිර්දේශයක් නොකළ කල්හි ලවණ සඳහා සෛන්ධව ලවණ ද, මූත්‍ර උදෙසා ගෝමූත්‍ර ද, ශකෘත් රස ක්ෂීර, ඝෘත පිණිස එළ ගව ගොම, කිරි ගිතෙල් ද යෙදිය යුතු ය. උත්පල සඳහා නිල්මහනෙල් ද, සිද්ධාර්ථ උදෙසා සුදු අබ ද, ක්ෂාර සඳහා යවක්ෂාර ද ප්‍රයෝග කටයුතු වේ.

4. එක් යෝගයක එක් ද්‍රව්‍යයක් දෙවරක් යෙදුනහොත්, එය දෙවරක් කිරා ගත යුතු වේ.

5. ද්‍රව්‍ය ගණයන්හි හා යෝගයන්හි දක්වන ලද නමුදු යම් ද්‍රව්‍යයක් රෝගයට අහිත වේ නම්, එය ඉවත් කළ යුතු ය. නො කියන ලද ද්‍රව්‍යයක් වුව ද රෝගයට යෝග්‍ය නම් එය යෝගයට එකතු කළ යුතු වේ.

ද්‍රව්‍ය ග්‍රහණ විධිය:—

1. සියලු භෛෂජ්‍ය කාර්යයන් සඳහා ශරත් කාලයෙහි ද්‍රව්‍ය රැස් කළ යුතු වේ. එහෙත් විරේක, වමන කාර්‍ය්‍යයන් සඳහා යෙදෙන ද්‍රව්‍ය වසන්තාන්තයෙහි හෙවත් ග්‍රීෂ්ම ඍතුවෙහි මුල් භාගයෙහි දී ලබා ගත යුතු වේ.

ඍතු භේදය:—

ඍතු—රාශිය	මාසය	ඍතුව	සිංහල මාස ක්‍රමය
මීන — මේෂ	මාර්තු — අප්‍රියෙල්	වසන්ත	මැදින් — බක්,
වෘෂභ — මිථුන	මැයි — ජූනි	ග්‍රීෂ්ම	වෙසක් — පොසොන්,
කටක — සිංහ	ජූලි — අගෝස්තු	වර්ෂා	ඇසළ — නිකිනි,
කන්‍යා — තුලා	සැප්තැම්බර් — ඔක්තෝබර්	ශරත්	බිනර — වප්,
වෘශ්චික — ධනු	නොවැම්බර් — දෙසැම්බර්	හේමන්ත	ඉල් — උඳුවප්,
මකර — කුම්භ	ජනවාරි — පෙබරවාරි	ශිශිර	දුරුතු — නවම්

සිංහල යෝගරත්නාකරයෙහි ෂඩ් ඍතුවක් සඳහන් කළ ද, ලංකාවෙහි එය ප්‍රකටව නො පවතී. එහෙයින් විකල්පයක් එහිලා වුව එය නිවරද වේ.

බක් — වෙසක් — වසන්ත, පොසොන් — ඇසළ = ගිම්හාන,
නිකිණි — බිනර — වර්ෂා, වප් — ඉල් = ශරත්,
උඳුවප් — දුරුතු — හිම, නවම් — මැදින් = ශිශිර, යනුවෙනි.

3. විශෙෂයෙන් සිසිර, ග්‍රීෂ්ම ඍතුන්හි දී මුල් ද, වර්ෂා වසන්ත කාලයන්හි දී පත්‍ර ද, ශරත් ඍතුවෙහි අල ද, කිරි, මල්, ගෙඩි ඒවා උපදනා ඍතුන්හි ද, අරටු වර්ග හේමන්තයෙහිදී ද රැස් කළ යුතු වේ.

මල් පිපීමට ආසන්න කාලයෙහි කොළවල වීර්‍ය්‍යය අධික ය. එහෙයින් වර්ෂා වසන්ත කාලයන්හි දී පත්‍ර රැස් කරණු යෝග්‍ය වේ. යුහුව ප්‍රයෝජනයට ගනු සඳහා මල්, අලුයම හෝ සන්ධ්‍යා සමයෙහි ද, සුගන්ධය උදෙසා සූර්‍ය්‍යෝදයට පෙර ද දිගු කලක් තබා ගනු පිණිස පිනි සහිත අළුයම ද රැස්කොට පවනේ වියලා සුරැකිව තැබිය යුතු වේ. ගෙඩි ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව රැස් කළ යුතු වේ. බෙලි ගැට මද උදෙසා මදක් පැසුණු ගෙඩි ද, බීජ සඳහා පක්ව ඵල ද ගත යුතු වෙති. ශීත ඍතුවෙහි දී කාෂ්ඨ ද, වසන්තයෙහි පොතු ද සපයා ගනු යෝග්‍ය වේ.

4. අති මහත් මුල්හි පොතු ද, වෘහත් මුල යුක්ත වට, ආම්‍ර ආදියෙහි පොතු සුඹුළු ද, කුඩා මුල් යුක්ත ඖෂධීන්ගේ මුල්, පත්‍ර, පුෂ්ප, ශාඛාදි සමස්තය ද, ඛදිර, අසන, බබ්බුල ආදියෙහි අරටු ද, තාලීශාදියෙහි පත්‍ර ද, ත්‍රිඵලා, ප්‍රියංගු, කංකෝල, මදන ආදියෙහි ගෙඩි ද, ධාතකී ආදියෙහි මල් ද ස්නුහී ආදියෙහි කිරි ද, අනුක්තයන්ගේ යෝග්‍ය භාගයන් ද නිර්දේශිත යෝගයන් සඳහා යෙදිය යුතු වේ.

5. වින්ධ්‍යාදි ප්‍රදේශ අග්නි ගුණ යුක්ත වේ. හිමවත් පෙදෙස් සෞම්‍ය ගුණයෙන් සමන්විත වෙයි. එහෙයින් ඒ ඒ තන්හි උපන් ඖෂධ වර්ග ඒ ඒ ගුණයෙන් යුක්ත වනු ඇත. මේ අයුරින් ඉන් අනෙක් වන, උපවනයන්හි උපන් ඖෂධ ද හේතු විසින් ද, ඍතු ආදීන්ගෙන් ද ඒ ඒ ස්ථාන, කාල ගුණ අනුව වීර්ය දනවයි.

6. ඒ තත්ත්ව සලකා පවිත්‍රව, සුමනස්කව, මනා දිනයන්හි දී උදය වරුවෙහි හිරුට මුහුණ ලා උතුරු දිශා ගත ඖෂධ ද්‍රව්‍ය රැස් කර ගන්නේ යි.

වර්ජනිය ඖෂධ ග්‍රහණය:—

හුඹස්, කුත්සිත කැලි-කසලාදිය ලන ප්‍රදේශ, ආනුපභූමි (දිය සිරාව සහිත බිම්) සොහොන්, කරමැටි බිම්, මාර්ග යනාදී ස්ථාන යන්හි උපදනා ඖෂධ වර්ග ද, කෘමි, අග්නි, හිම ආදියෙන් විපත් වන් ඖෂධ ද යෝග සඳහා නො ගත යුතු වේ.

ද්‍රව්‍ය මාන ක්‍රමය:—

1. ආර්ද්‍ර අමු ද්‍රව්‍ය කිරිමෙහි දී ශුෂ්ක = වියලි ද්‍රව්‍ය බර මෙන් දෙගුණයක් ගත යුතු වේ. එහෙත් රසකිඳ, කෙළිඳ, වංඇපල, පුහුල්, හාතාවාරිය, අශ්වගන්ධා, සහචරී, ශත පුෂ්පා, ප්‍රසාරණී, යන ද්‍රව්‍ය අමුව ගත යුතු වුව ද, දෙගුණයක් ගත යුතු නො වේ. නිම්බ, පටෝල, කේතකී, බලා, හිංගු, ඉන්දීවර = නිල් උපුල්, පුනර්නවා, මාංස, නාගබලා, ගුග්ගුලු යන ද්‍රව්‍යයන්ගේ ගැනීම ද ඒ නියමයට අනුව වේ. එහෙත් චූර්ණය කළ යුතු අවස්ථාවන්හි දී මෙම ද්‍රව්‍ය ද වියලා ගත යුතු වේ.

2. ගුඤ්ජාවෙහි පටන් කුඩවය දක්වා ද්‍රව, ආර්ද්‍ර, ශුෂ්ක ද්‍රව්‍යයන්ගේ මැනිම් ක්‍රමයෙහි වෙනසක් සිදු නො කෙරේ. (ගුඤ්ජා, මාෂ, කෝල, අක්ෂ, ශුක්ති යන ලෙයින් කුඩවය දක්වා යි.) එහෙයින් ජල ආදී ද්‍රව වර්ග ද, එකෙණෙහි උදුරා ගත් අමු ද්‍රව්‍ය ද, වියලි ද්‍රව්‍ය ද පුර්වෝක්ත මැනුම්වලින් කිරිමෙහිදී ද, මැනිමෙහිදී ද ද්විගුණ කිරිමක් අවශ්‍ය නො වේ.

3. ප්‍රස්ථයෙහි පටන් තුලාව දක්වා ද්‍රව, ආර්ද්‍ර ද්‍රව්‍ය දෙගුණයක් ගත යුතු ය; හෙවත්, වියලි ද්‍රව්‍ය ප්‍රස්ථ 1 ක් යෙදේ නම්, අමු ද්‍රව්‍යය ප්‍රස්ථ 2 ක් ද, ද්‍රව වර්ග ප්‍රස්ථ 2 ක් ද යන අයුරිනි. මෙහි ලා, සැලකිය යුත්තේ කිරිමෙන් මිස මැනිමෙන් නො වේ.

4. තුලාවේ සිට ඉහළට ද්‍රව, ඇර්ද්‍ර, ශුෂ්ක ද්‍රව්‍යයන්ගේ මාන ක්‍රමය සමාන වේ. හෙවත් ද්‍රව, ආර්ද්‍ර, ශුෂ්ක ද්‍රව්‍ය දෙගුණ කිරිමක් අවශ්‍ය නොවේ. මේ නියමය ඝෘත, තෛල, සාධනයෙහි දී බෙහෙවින් අනුගමනය කරණු උචිත වේ.

5. කුඩව, මානිකා, තුලා, පල යන වචන ව්‍යවහාරයෙන් ද්‍රව්‍ය ප්‍රමාණය නියමිත තන්හි විශේෂ නිර්දේශයක් යෝගයෙහි නොවේ නම් දෙගුණ කිරිමක් අනවශ්‍ය වේ.

   දන්ති ඝෘතයෙහි කුඩව වචනය සඳහා දෙබරක් ගත යුතු ය යි නිර්දිෂ්ට ය. ඉන් අන් තැන ද්විගුණත්වය අපේක්ෂා නො කෙරේ.

6. ගිතෙල්, සිනි, ජල, මධු, තෛල, දුග්ධ, ආසව, නාරිකේලජල යන ද්‍රව්‍ය විෂයෙහි කුඩව මානය නියමිත තන්හි පල අටකින් සමන්විත කුඩවය ප්‍රයෝග කළ යුතු ය.

   (ඒ සඳහා පලම ලකුණු කළ මැනුම් භාජන භාවිත කරණු උචිත වේ.) එය ද්විගුණ කළ යුතු නොවේ.

සංලක්ෂ්‍යය:—

1. විළඳ තම්බාගත් වතුර, තැඹිලි වතුර, ගෝ මූත්‍ර, ජලය, කාඩි,
   පල 32 කින් ප්‍රස්ථ 1 යි. = නැළි 1 යි. (ග්‍රෑම්ස් 1920 යි)

2. කොල, පොතු, ආදිය කොටා මිරිකා ගත් ස්වරසය
   පල 16 කින් ප්‍රස්ථ 1 යි. = නැළි 1 යි. (,, 960 යි)

3. ගෝ දුග්ධ (ගවාදීන්ගේ කිරි),
   පල 30 කින් ප්‍රස්ථ 1 යි. = නැළි 1 යි. (,, 1800 යි)

4. දධි, පල 25 කින් ප්‍රස්ථ 1 යි = නැලි 1 යි. (,, 1500 යි)

5. ගුඩ, පල 18 කින් ප්‍රස්ථ 1 යි. = නැලි 1 යි. (,, 1080 යි)
මෙහි ලා, පල ශබ්දය යොදනුයේ කිරා ගැනීම සඳහා යි.
පොදුව පල 16 ක් ප්‍රස්ථ 1 ක් වේ. ශරාවය = පල 8 කි.

ශරාව ශබ්දය ග්‍රන්ථාන්තරයෙහි සේර් = සේරු ශබ්දයෙන් ප්‍රකාශ වුව ද, රාත්තල් දෙකේ = සේරුව නොවේ. හිංදි, බෙංගාලි වෛද්‍ය ග්‍රන්ථයන්හි ශරාවය සඳහා යෙදෙනුයේ ද සේර් යන වචනය යි. එය රාත්තල් 1 ට සමාන වේ. (රාත්තල් 2 ට ද සේර් යන වචනය ව්‍යවහාරයෙහි යෙදේ). පරිශිෂ්ටයෙහි බලන්න.

1. දේවදුර ප්‍රස්ථ 1 = පල 16 = ශරාව (සේර්) 2.
2. තලතෙල් ප්‍රස්ථ 1 = පල 32 = ශරාව (සේර්) 2. (තලතෙල් ද්‍රව පදර්ථයක් හෙයිනි.)
3. අමු ද්‍රව්‍ය ප්‍රස්ථ 1 = පල 32 යන ක්‍රමය නිදසුන් සඳහා වේ.

ගුඤ්ජාවේ සිට කුඩවය දක්වා මෙසේ දෙගුණ නොවේ:—

1. ගිතෙල් මාෂ 1 ක් පිප්පලි මාෂ 1 ක් ද යනු කියූ කල එය රක්තිකා 8 = මාෂයක් වේ. එහි දී ගිතෙල් මාෂයක් සඳහා රක්තිකා 16 ක් ගත යුතු නොවේ.

2. කුඩව, මානිකා, තුලා, පල යන වචන යෙදුනු තන්හි දෙගුණ කිරීම අනවශ්‍ය ය.
ගිතෙල් තුලා 1 = පල 100 = ශරාව (සේර්) 12 1/2 යි.
දේවදුර තුලා 1 = පල 100 = ශරාව (සේර්) 12 1/2 යි.
තලතෙල් පල 16, තිප්පිලි පල 16 (දෙගුණ නොවේ).
ගිතෙල් කුඩව 1 = පල 4 යි.
තිප්පිලි කුඩව 1 = පල 4 යි.
නිර්දේශයක් ඇති තන්හි පමණක් දෙගුණ කළ හැකි වේ. දන්ති ඝෘතයෙහි මෙනි.

(භෛෂජ්‍ය රත්නාවලි. විනෝද්ලාල් සේන්, සංස්කරණය. පිටු 8 — 10 වංග භාෂා)

3. ගිතෙල්, සීනි, ජලය, මීපැණි, තෛල, කිරි, ආසව, කාඩි, නාරිකේලජල, මේවා පල 8 — කුඩව 1 යි.
මේ පරිභාෂා නියමය නිත්‍ය නොවේ. අවස්ථා විශේෂයෙන් වෙනස් වේ. ''අනිත්‍යා පරිභාෂෙයං යථා දර්ශන මුච්‍යතෙ''

(භෛෂජ්‍ය රත්නාවලි විනෝද්ලාල් සේන්.)

යෝග ගුණ හීනත්වය :—

1. වර්ෂයකට වඩා ශක්තියක් නොපවත්නා තද්රූප (හුදු) ද්‍රව්‍යයන්හි ශක්තිය වර්ෂයකින් හීන වේ.

2. ලඝුපාක ඖෂධීන්ගේ හෙවත් යව, ගෝධූම, තිල, මාෂ ආදීන්ගේ වීර්යය වර්ෂයකින් පිරිහෙයි.

3. චූර්ණ සංස්කරණ මාස ද්වයකින් හීන වීර්යත්වයට භාවමාත්‍ර වශයෙන් පැමිණේ. (මාස 3 කින් පමණ ය යි භාරතීය භෛෂජ්‍ය තත්වය කියයි). තාලීසාදී චූර්ණය මෙනි. භාවමාත්‍ර යනු එක් ප්‍රමාණයකින් යෝගයෙහි ශක්තිය හීන වීම යි. සම්පූර්ණයෙන් ගුන හීනත්වයක් නොවේ. එහෙත් ද්‍රව්‍ය සම්භාරයෙන් යෞගික චූර්ණය එසේ ගුණ හීන නොවේ. ලවණ භාස්කර චූර්ණය මෙනි.

4. ගුටිකා, ලේහ සංස්කරණයන්ගේ ශක්තිය වර්ෂයකින් පිරිහේ. විජයාදී ගුටිකාව මෙනි. එහෙත් ඇතැම් ලේහ වර්ග චිර කාලයක් වුව ද ශක්තියෙන් යුක්ත වේ. එය එසේ වුව ද, කිසියම් ගුණයකින් ඌන වනු ඇත.

5. ඝෘත, තෛල සංස්කරණ සිවු මසකින් ගුණ හීන වේ. එහෙත් වර්ෂයකින් පසුව වුව ද ශක්තිය පවතින ඝෘත තෛල කල්පනා ඇත්තේ වේ. එය එසේ වුව ද යම්කිසි ශක්තියක් අඩු වේ. වර්ෂා කාලයෙහි නිර්මාණය කරන ලදුයේ ද එසේ වනු ඇත.

6. ආසවාදී සන්ධාන වර්ග ද, ධාතු, රස සංස්කරණ යෝග සහ දේශීය, රසයුක්ත ගුලි ද පුරාණ වූ කල්හි ද ගුණයෙන් යුක්ත වේ.

ඖෂධ ප්‍රයෝග කාලය :—

1. විශෙෂයෙන් ස්වරයාදි කෂාය සංස්කරණ ප්‍රභාතයෙහි = අලුයම යෙදීම සාමාන්‍යයෙන් පොදු නියමය වේ.

2. එහෙත් රෝග තත්වයන් අනුව සකසා ගත් යෝග යොදනුව කාල පංචකයක් සම්මතයෙහි පවතී.

    1. සූර්යෝදයෙන් අනතුරුව ද,
    2. දහවල් භෝජන සමයෙහි ද,
    3. සන්ධ්‍යා භෝජන කාලයෙහි ද,
    4. නිති නිති ද,
    5. ආහාර රහිතව රාත්‍රියෙහි ද යනුවෙනි.

1. පිත්ත උත්ක්ලේෂයෙහි විරේකය ද, කඵෝල්බණයෙහි වමනය ද, ලේඛන කාර්යය ද උදෙසා සූර්යෝදයෙන් අනතුරුව ඖෂධ ප්‍රයෝග කටයුතු වේ.

2. අපාන වාතය කුපිත කල ද, අරුචියෙහි ද, රුචිජනක දහවල් භෝජනය සමග ඔසු යෙදිය යුතු වේ.
සමාන වාත කෝපයෙහි දී ද, මන්දාග්නියෙහි අග්නි දීපනය සඳහා ද බොදුන් මැද දී ඖෂධ යෙදිය යුතු වේ.
ව්‍යාන වාතය කුපිත කල භෝජනාන්තයෙහි ද, හික්කා, ආක්ෂෙප, කම්ප යන රෝගෝපද්‍රවයන්හි ද බොදුනෙන් පෙර සහ අන්තයෙහි ඖෂධ ප්‍රයෝග කළ යුතු වේ.

3. ස්වරභංග, මූකත්ව, කණ්ඨ ගත රෝග අවස්ථා සහිත උදන වාත කෝපයෙහි දී සන්ධ්‍යා භෝජනයෙහි ආහාර පිඩක් පිඩක් අතර දී ඖෂධ යෙදිය යුතු වේ.

4. පිපාසා, වමන, විෂාවස්ථා යන උපද්‍රවයන්හි දී ආහාර පාන සමග නිති නිති (විටින්විට) ඖෂධ යොදනු යෝග්‍ය වේ.

5. ඌර්ධ්වජත්‍රු රෝගයන්හි ද, ලේඛන, වාංහණ කාර්යයන්හි ද ආහාර විරහිතව ඖෂධ යෙදිය යුතු වේ.

6. එහෙත් මේ නියමය විකල්ප වේ. අතිපාතිත අවස්ථාවන්හි දී ශීඝ්‍ර ප්‍රතික්‍රියා පිළියෙළ යෙදිය යුතු වේ.
අතිපාතික යනු ඇට සම්පූර්ණයෙන් බිඳී ගිය අවස්ථාවය. (සු. නි. 15. අ. 11–අස්රී නිඃශෙෂෙණ හින්නං, භවති වෛ. ශ: සි:)

7. **වරක මතානුකූලව :—**

    1. අභක්ත = උදෑසන හිස්බඩ බෙහෙත් වැළඳීම.
    2. ප්‍රාක්භක්ත = ඖෂධ වළඳා ඉක්බිතිව ආහාර ගැනිම හෙවත් ආහාර ගැනිමට ආසන්නයෙහි දී ම බෙහෙත් ගැනිම.
    3. අධෝභක්ත = ආහාරගත් ඉක්මණින් බෙහෙත් වැළඳීම.
    4. මධ්‍යභක්ත = ආහාර කොටසක් වළඳා ඉක්බිති බෙහෙත් බී යළි ආහාර ගැනිම.
    5. අන්තරාභක්ත = උදය සවස ආහාර ද්වය මධ්‍යයෙහි බෙහෙත් වැළඳීම.
    6. සභක්ත = ආහාර සමග බෙහෙත් වැළඳීම.
    7. සාමුද්ග = හික්කාදියෙහි දී කෂාය අවලේහ සංස්කරණ ලඝු අල්ප ආහාරයාගේ ආදි අන්ත දෙක අතර වැළඳීම.
    8. සග්‍රාස = ආහාර පිඩු අතර, තබා ඖෂධ වැළඳීම. යන විධි ද ප්‍රකටව පවතී.

ඖෂධ සංරක්ෂණ නියමය :—

1. භෛෂජ්‍ය කල්පනා සඳහා ගනු ලබන අමු ද්‍රව්‍ය මනාව වියලා හොඳින් ආවරණය කළ පවිත්‍ර භාජනවල හෝ ගෝනි මලු ආදියෙහි අහුරා වාතාශ්‍රයෙන් තොරව තැන්පත් කළ යුතු ය.

    සෙනෙහෙකොළ, සුදුලූනු, වදකහ, ඉඟුරු, වැනි ද්‍රව්‍ය ආලෝකයෙන් සහ තද සූර්ය කිරණින් ගුණ හීන බවට පත් වේ.
    ලවණ වර්ග ජලය ඇද ගන්නා හෙයින් සම්පූර්ණ රුඩ භාජනයන්හි තැන්පත් කළ යුතු වේ.

2. විෂ ද්‍රව්‍ය අනෙක් ද්‍රව්‍යයන්ගෙන් වෙන් කොට භාජනයන්හි ලා, රක්ත වර්ණ ලේබල්වල ද්‍රව්‍යනාම සඳහන් කොට අලවා ආරක්ෂා සහිතව තැබිය යුතු ය.

3. පිළියෙල කළ යෝග පවිත්‍ර රුද්ධ භාජනයන්හි ලා, නාම සහිත ලේබල් අලවා ගුණ හීන වන කාලය හෝ යෝගය පිළියෙළ කළ වකවානුව සඳහන් කළ යුතු ය.

භෛෂජ්‍ය කල්පනා පරිභාෂාව

රෝග උපද්‍රව ප්‍රශමනය සඳහා ප්‍රයෝග කරන ද්‍රව්‍යයන් හෝ යෝගයන් භෛෂජ්‍යය යනුවෙන් සැලැකේ. එහි සංස්කරණ ක්‍රම කල්පනා යන නමින් ගැනේ. එයින් ද්‍රව්‍යයන්හි පවත්නා රස, ගුණ, වීර්‍ය, විපාක, ශක්ති යන අවස්ථාවන්ගේ යථායෝග්‍ය සංයෝගය අවස්ථානුකූලව උපදී.

1. කෂාය සංස්කරණ විධි පසෙකි :

1. ස්වරස (කෂාය) :—

(I) කෘමිභක්ෂණ ආදි හේතු විසින් දූෂිත නො වූ, එකෙණෙහි ලබාගත් අමු ද්‍රව්‍ය පවිත්‍ර කොට සියුම්ව කොටා වස්ත්‍ර කැබැල්ලක ලා, අතින් හෝ යන්ත්‍රයෙන් මිරිකා ගන්නේ ස්වරස නමි.

මාත්‍රාව :— අඩපලං 1 කි — (මි: ලි: 30 යි)

(II) අමු ද්‍රව්‍ය අභාවයෙහි දී චූර්ණකොට ගත් වියලි ද්‍රව්‍ය කුඩව 1 ක් හා දිය කුඩව 2 ක් සමග භාජනයක බහා දිවරැයක් පෙහෙනුව තබා මිරිකා ගත්තේ ද ස්වරස ගණයෙහි වැටේ.

මාත්‍රාව :— පලං 1 කි. — (මී. ලී. 60 යි)

(III) වියලි ද්‍රව්‍ය භාග 1 ක් හා ජල භාග 8 ක් යොද පාදවශේෂ කොට (4 — 1 ට) සිඳුවා ගන්නේ ද ස්වරස නම.

මාත්‍රාව :— පලං 1 කි. — (මී. ලී. 60 යි).

(I) පුටුපාක ස්වරස :—

යෝගයන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය පවිත්‍ර කොට ජලය ලා, සියුම්ව අඹරා ගුලියක් තනා අඹ, නුග, ඇත්දෙමට, එරඬු යන වර්ගයක පත්‍රයන්ගෙන් ඔතා හුයකින් බැඳිය යුතු ය. ඉක්බිතිව ඊමත අඟුල් 1 ක් 2 ක් පමණ වන සේ, (තිරිඟු පිටි ගා) මැටි ආලේප කොට, ගිනි අඟුරු යට තබා අංගාර වර්ණය වන තෙක් දවා ගන්නේ ය. පසුව මැටි සහ එතුම් පත්‍ර ඉවත් කොට යෝගය මිරිකා පෙරා ගත යුතු යි. අතිසාරයෙහි ශ්‍යෝනාක සහ කුටජ පුටපාක මෙනි.

මාත්‍රාව :— පලං 1 කි. — (මී. ලී. 60 යි)
ප්‍රක්ෂේපය :— මී පැණි කර්ෂ 1 කි.— (මී. ලී. 15 යි.)

(II) දෝලාපාක ස්වරස :—

නියමිත ද්‍රව්‍ය පවිත්‍රකොට, සියුම්ව කොටා, පොට්ටනි බැඳ දෝලා යන්ත්‍රයෙන් ස්වේද දී හෝ තම්බා හෝ ගෙන මිරිකා ගන්නේ යි. යෝගය යුක්ත පොට්ටනිය දෝලා යන්ත්‍රයෙහි ලූ ද්‍රවයට ඉහළින් සිටින සේ යොද ගිනි දීම ස්වේද දීම වේ. පොට්ටනිය ද්‍රවයෙහි ගිල්වා ගිනි දීම පාක තැම්බීම යනුවෙන් සැලැකේ.
තලා අඹරාගත් ද්‍රව්‍යයන් කඩ උන්නේ තබා තම්බා ගැනීම ද දෝලාපාක විධියේ තවද අවස්ථාවකි. දේශීය චිකිත්සා ක්‍රමයන්හි එන දළු අනුපාන සංස්කරණ මෙනි.

2. කල්ක කෂාය :—

අමු ද්‍රව්‍ය පවිත්‍රකොට ජලය සමග හෝ වියලි ද්‍රව්‍ය සුණුකොට, දියෙන් හෝ අඹරා ගන්නේ කල්ක නමි.

මාත්‍රාව :— කර්ෂ 1 කි. — (ග්‍රෑ. 15 යි.)

ප්‍රක්ෂෙපය :—
මී පැණි, ගිතෙල්, තලතෙල් ආදිය කල්කය මෙන් දෙගුණයක් ද, සීනි, ගුඩ ආදිය සමභාගව ද යෙදිය යුතු වේ. ද්‍රවය සිව් ගුණයකි.

3. ක්වාථ = ශෘත කෂාය :—

(I) පවිත්‍රකොට සිනිඳුව කපා කොටා ගත් ද්‍රව්‍ය පලං 1 ක්, (ග්‍රෑ: 60) ක් දිය සොළොස් — 16 ගුණයක් ලා, මැටි හෝ ලෝහ බඳුනක මෘදු අග්නි යෙන් අෂ්ටමාංශාවශේෂ (8—1 ට) කොට සිඳුවා පෙරා ගන්නේ ක්වාථ කෂාය නම් වේ.

(II) ක්වාථ්‍ය ද්‍රව්‍ය පලං 1 ක් (ග්‍රෑ: 60 ක්) ජලය අට පතක (ලී 1.920) ලා, පෙර පරිදි පත 1 (මි: ලි: 240) ට සිඳුවා ගැනීම ද ව්‍යවහාර ක්‍රමය වේ. ජ්වරයෙහි පංචතික්තකෂාය මෙනි.

(III) දිය ද්‍රෝණද්වයකට යෝජිත ද්‍රව්‍ය තුලාවක් ලා, චතුර්භාගවශේෂ කොට (4—1 ට) සිඳුවා ගන්නේ ද ක්වාථ විධියකි. ඒ අනුව, මෘදු ද්‍රව්‍ය විෂයෙහි සිව් ගුණයක් ද කඨින ද්‍රව්‍ය සඳහා අට ගුණයක් ද අත්‍යර්ථකඨින ද්‍රව්‍යයන්හි සොළොස් ගුණයක් ද ජලය යොදනුව පරිභාෂාව අවස්ථාව සලසා තිබේ. මේ ක්‍රම තෛල, ඝෘත, සන්ධාන (=අරිෂ්ට ආසව) නිර්මාණය සඳහා උපයෝගී වේ.

මාත්‍රාව :—		පලං 1 කි.	(මි: ලී: 60 යි)
විශෙෂය :—	උත්තම මාත්‍රාව	පලං 1 කි.	(මි: ලී: 60 යි)
	මධ්‍යම ,,	අක්ෂ 3 කි.	(මි: ලී: 45 යි.)
	හීන ,,	අර්ධ පලං 1 කි.	(මි: ලී: 30 යි.)

ප්‍රක්ෂේපය:—	වාතජ රෝගයන්හි දී සීනි 1/4	— මී පැණි 1/16 යි.	ක්වාථයෙන්
	පිත්තජ රෝගයන්හිදී සීනි 1/8	— මී පැණි 1/8 යි.	
	කඵජ රෝගයන්හි දී සීනි 1/16	— මී පැණි 1/4 යි.	

සුදුදුරු, ශෝධික, ගුග්ගුලු, ලවණ, ක්ෂාර, ශෝධිත හිංගු, ශෝධිත ශිලාජතු, ත්‍රිකටු ආදිය අවිශෙෂයෙන් ශාණ 1 කි. (ග්‍රෑ: 4) කිරි, ගිතෙල්, ගුඩ, තෙල්, මූත්‍ර කර්ෂ 1 කි. (ග්‍රෑ 15 යි) චූර්ණ ආදිය කර්ෂ 1 කි. (ග්‍රෑ: 15 යි.)

(I) ප්‍රමථ්‍යා කෂාය:—

යෝජිත ද්‍රව්‍ය පලං 1 ක් මනාසේ ජලයෙන් අඹරා දිය අට පලමක් ලා, චතුර්භාගාවශෙෂ කොට සිඳුවා නිවා පෙර ගත්තේ ප්‍රමථ්‍යා නමි.

මාත්‍රාව :—	පලං 2 කි. (මි: ලී: 120 යි.)
ප්‍රක්ෂේපය :—	මධු, ගුඩ, ආදිය වේ.
මාත්‍රාව :—	පෙර පරිදි ය. රක්තාතිසාරයෙහි මුස්තකේන්ද්‍රයවාදී ප්‍රමථ්‍යාව මෙනි.

(II) ක්ෂිර කෂාය :—

යෝගයෙහි නිර්දිෂ්ට ද්‍රව්‍ය ප්‍රමාණය මෙන් අට ගුණයක් කිරි ද, කිරි මෙන් සිව් ගුණයක් දිය ද ලා, චතුර්භාගාවශෙෂ වන තෙක් සිඳුවා පෙරා ගනුයේ වේ.

යෝජිත ද්‍රව්‍ය	පලං 1	— ද්‍රව්‍ය පලං 1 යි. (ග්‍රෑ: 60 යි.)
කිරි	පලං 8	— කිරි පත 2 යි. (මි: ලී: 480 යි.)
ජලය	පලං 32	— ජලය පත 8 යි. — ශෙෂය පත 2 යි. (ලී: 1,920 මි: ලී: 480 ව.)

සුළුපස්මුල් කිරි කෂාය (ක්ෂිර පාකය) මෙනි.

(III) ස්වර්ණ සන්නිර කෂාය — තැඹිලි දිය කෂාය :—

1. ජලය වෙනුවට තැඹිලි හෝ නිල්පොල්වැවර දිය හෝ යොද ක්වාථ පරිදි සිද්ධ කරණුයේ යි.
2. තැඹිලි (හෝ නිල්පොල්) වැවරයෙහි ඇස්ස කපා මඳක් දිය ඉවත් කොට අඹරා ගත් හෝ උරගා ගත් ද්‍රව්‍ය ප්‍රමාණය ලා, පියන් පත වසා රාත්‍රියක් පින්නෙහි තබා උදය කලතා පෙරා ගන්නේ ද තැඹිලි කෂාය ක්‍රමයකි.

(IV) වාලු කෂාය :—

යෝජිත ද්‍රව්‍ය සමව ගෙන මනාව කොටා සියුම් කඩක ලිහිල්ව පොට්ටනි බැඳ වතුර පත 8 ක් ලූ භාජනයක බහා එය හිල් කළ පොල්කටුවකින් වසා පත 2 ට සිඳුවිය යුතු ය. එහි දී ගහකින් හෝ ඔයකින් ගත් පවිත්‍ර දෝරවැලි මිටක් පමණ ගිනියම් වනතෙක් කබලෙන් බැද හිල් පොල්කටුවෙන් කෂාය සැලියට ලන්නේ ය. එපරිදි පත 8-2 ට සිඳුවා ගනු ක්‍රමය යි.

විශේෂය :—වාලු කෂාය සැකැසීමෙහි ගිනියම් කළ වැලි කෂාය සිඳෙන අවස්ථාවෙහි ලීම ද, කෂාය නියමිත ප්‍රමාණයට සිඳගත් පසු ලීම ද ව්‍යවහාරික ක්‍රම වෙති. (පරිශිෂ්ටය බලන්න.)

උණු දිය:—

ජලය අටෙන් එකට හෝ දෙකෙන් එකට හෝ හතරෙන් එකට සිඳුවා ගැනීමෙන් සිද්ධි දයක උණු ජලය ලබාගත හැකිය.

ෂඩඞ්ග පානය :—

සැවැන්න මුල්, පැපිලිය, කලාඳුරු, වියලි ඉඟුරු, සුදුහඳුන් පානීය ක්‍රමයෙන් සාද සිසිල් කර ගැනීම.

පානීය යූෂ :—

චූර්ණ කල ද්‍රව්‍ය පලම් 01
ජලය පලම් 64 අඩකට සිඳුවා පෙරා ගැනීම.

යවාගු — (කැඳ)

ද්‍රව්‍ය පලම් 04
ජලය පලම් 64
අඩකට සිඳුවා පෙරාගැනීම.
සහල් භාග 01, ජලය භාග 06, යොද උකුවන තුරු සිඳුවා ගැනීම.

මණ්ඩ (කැඳ වතුර) :—

සහල් පලම් 04, ජලය 32 දෙගුණයක් දමා පිස පෙරා ගැනීම. එයට වියලි ඉඟුරු සවිඳ ලුනු චූර්ණය දමා ගත යුතු ය.

වාට්‍ය මණ්ඩය :—

පොතු හා නිවුඩු හළ යව සහලින් සෑදූ මණ්ඩය මෙනම් වේ. මෙය පානයෙන් සෙම පිත් නැසේ. රත්පිත් සංසිඳේ. ගෙළ රෝගවලට හිත යි.

ලාජ මණ්ඩ (පොරි කැඳ)

බැදි සහලින් හෝ විලඳින් සෑදූ මණ්ඩය මෙනම් වේ. එය පානයෙන් සෙම්පිත් දුරුවේ. මල බැඳේ. පිපාසය හා උණ නසයි.

යූෂ විධි :—

බෙහෙත් ද්‍රව්‍ය පලම් 1 ක් කල්ක පදමට අඹරා එය ජලය නැලි එකක බහා වියලා ඉඟුරු තිප්පිලි කලං 1 1/2 බැගින් සුනු කර දමා සිඳුවා යූෂය සාදන්න.

හිම =ශීත කෂාය

මනාව චූර්ණ කොට ගත් ද්‍රව්‍ය පලං 1 (ග්‍රෑ: 60) ක් දිය පලං 6 (මි: ලී: 360) ක් සමග මැටි හෝ වීදුරු බඳුනක බහා රාත්‍රියක් තබා මිරිකා පෙරා ගන්නේ වේ. මේ අරබයා ජලය අට පලමක් යෙදිය යුතු ය යි ද ග්‍රන්ථාන්තරයෙහි සඳහන් වේ.

මාත්‍රාව :—

පලං 2 කි. (මි: ලී: 120)

ප්‍රක්ෂේපය :—

සීනි, මීපැණි, සූකිරි ආදිය යි.
ශීත වියළි, සුගන්ධිත ද්‍රව්‍ය යෝගයන් බෙහෙවින් හිම කෂාය සංස්කරණයෙහි යෙදෙනු විශේෂත්වයකි. (තැම්බීමේදී එම ද්‍රව්‍යයන්ගේ වාෂ්පශීලී තෛල වාෂ්පාකාරයෙන් පිටවන හෙයිනි.)
රක්ත පිත්තයෙහි ධාන්‍යකාදී හිම කෂාය මෙනි.

5. ඵාණ්ට කෂාය:—

(i) ඉතා සිනිඳුව චූර්ණ කොට ගත් ද්‍රව්‍ය පලං 1 (ග්‍රෑ: 60) ක් මැටි බඳුනක බහා එයට ,අඩක් සිඳුවා ගත් (අර්ධශෘත) උෂ්ණ ජලය කුඩවයක් ලා, දෙළොස් පැයක් වසා තබා පෙරා ගන්නේ වේ. චූර්ණ ද්‍රවය යනු ද මෙයට නමකි.

මාත්‍රාව :—

පලං 2 කි. (මි. ලී: 120)

ප්‍රක්ෂේපය :—

සීනි, මීපැණි, සූකිරි ආදිය ද, ඝෘත, ක්ෂිර තෛල, මූත්‍ර ආදිය ද වේ.

මාත්‍රාව :—

ක්වාථයෙහි මෙනි. ජ්වරාදියෙහි ආම්රාදි ඵාණ්ටය සේ ය.

(ii) චූර්ණ ද්‍රව්‍ය භාග 1 ක් හා අර්ධ ශෘත උෂ්ණ ජලය භාග 8 ක් සමග මැටි බඳුනක බහා සම්පූර්ණ රාත්‍රියක් තබා (පසුද) උදය පෙරා ගන්නේ ද ඵාණ්ට ගණයෙහි ලා සැලැකේ.

(iii) මන්ථය :—

මනාව කුඩුකොටගත් ද්‍රව්‍ය පලං 1 ක් (ග්‍රෑ. 60 ක්) සිහිල් දිය පලං 4 (මි: ලී: 240) ක බහා යෝග්‍ය පරිදි මන්ථනය කොට (කලතා) පෙරා ගන්නේ යි. මදත්‍යයෙහි බර්ජුර මන්ථය මෙනි.

(iv) පානීය :—

චූර්ණකොට ගත් ද්‍රව්‍ය පලං 1 ක් (ග්‍රෑ: 60 ක්) ජලය පලං 64 ක් හි (ලී: 3,840 ක) බහා අර්ධාවශේෂ කොට (64—32=1 1/2 ට) සිඳුවා සිහිල් කොට ගන්නේ පානීය නම්. ජ්වරාදියෙහි ෂඩංගපානීය මෙනි.

(v) පේයාව :—

ෂඩංගපානීය සිද්ධ කරන අයුරින් සකසා ගත්තේ වේ.

ද්‍රව්‍ය පලං 1 යි. (ග්‍රෑ: 60 යි)
ජලය පලං 64 යි. (ලී: 3,840 යි)

විශේෂත්වය :—

මෙහි දී ලාජා — විලද එකතු කිරීම සිදු වේ. (පරිශිෂ්ටය බලන්න) යව, මුංපියලි, බැදි සහල් යන ද්‍රව්‍ය ද පේයා සංස්කරණ යෙහි යෙදේ.

6. චූර්ණය:—

අව්වෙන් වියලා හෝ වර්ෂා සෘතුවෙහිදී කබලෙන් බැද ගත් හෝ ද්‍රව්‍ය මනාව කොටා (හෝ අඹරා) පෙනේරයෙන් හලා ගත් සියුම් කුඩු චූර්ණය යනුවෙන් සැලැකේ. ක්ෂෝද යනු ද මෙයට නමකි.
156 — චූර්ණ ඛණ්ඩය බලන්න.

මාත්‍රාව :—

කර්ෂ 1 යි. (ග්‍රෑ: 15 යි)

ප්‍රක්ෂේපය :—

ගුඩ චූර්ණ ප්‍රමාණය හා සමව ද, ශර්කරා චූර්ණය මෙන් දෙගුණයක් ද විය යුතු ය. ලේහය සඳහා මධු, ඝෘත, තෛල, චූර්ණය මෙන් දෙගුණයක් ද පානය උදෙසා තෝය, ක්ෂීර, මද්‍ය, මූත්‍ර, සිව් ගුණයක් ද යෙදිය යුතු ය.

7. භාවනා:—

(i) චූර්ණ කොට ගත් ද්‍රව්‍ය යෝගය නිර්දේශිත ද්‍රවයන් චූර්ණ ප්‍රමාණය වැසෙන තෙක් බහා දහවල අව්වෙහි ද රාත්‍රියෙහි පින්නෙහි ද, තබා වියලා ගත යුතු වේ. දින නියමයක් නො දක්වූ කල ,දින 7 ක් ඒ සඳහා යෙදිය යුතු ය.

(ii) භාවනා යුක්ත ඇඹරීම නම්, චූර්ණය වැසෙන තෙක් ද්‍රව හෝ ද්‍රවයන් හුදුව හෝ වෙන් වෙන්ව හෝ බහා සිඳෙන තෙක් අඹරා (පේෂණය කර) ගැනීම යි.

(iii) ක්වාථයෙන් භාවනා දිය යුතු කල භාවනා කටයුතු චූර්ණය හා සමඟ සමාන භාගයක් ක්වාථ්‍ය ද්‍රව්‍ය ගෙන එයට අට ගුණයක් ජලය ලා ඒකභාගාවශේෂ වන තෙක් (8—1 ට) සිඳුවා ක්වාථය සකසා ගත යුතු වේ. මේ අයුරින් පිළියෙළ කොට ගන්නේ භාවනා චූර්ණ නම් වේ.

(iv) ලවණ, ක්ෂාර, ලෞහ භස්මය, මණ්ඩූර භස්මය ආදිය විශේෂත්වයෙන් යොදු චූර්ණ පරිභාෂා අනුව සංස්කරණය කළ යෝග ද මේ ගණයෙහි වැටේ. භාස්කර ලවණය, පුනර්නවාමණ්ඩූරය මෙනි.

8. **ක්ෂාර නිර්මාණය:—**

ක්ෂාර සඳහා නිර්දේශිත ගස්, පැලැටිවල පංචාංගය දෝෂ වියුක්තව ගෙන කපා, කොටා මනාව වියලා ලෝහ බඳුනක ලා හෝ ගජපුටයකින් හෝ දවා ගත යුතු ය. පසුව එය පෙනේරයෙන් හලා මැටි බඳුනක ලා එමෙන් සය (6) ගුණයක් දිය ද යොද කලතා, රැයක් තබා පසු ද උදැසන ද්‍රව ප්‍රමාණය බෙරා පිරිසිදු රෙදි කඩින් 21 වරක් පෙරන්නේ ය. ඉක්බිතිව එය සිඳෙනා තෙක් ගින්නෙන් සිඳුවා ක්ෂාර චූර්ණය ලබා ගත යුතු වේ. සිතප්‍රභ (සීනි අයුරු) ක්ෂාරය යෝගයන් සඳහා යෙදේ.

වක්තව්‍යය :—

ක්ෂාර නිර්මාණය සඳහා දවාගත් ද්‍රව්‍ය අළු ප්‍රමාණය මෙන් අට ගුණයක් ජලය සමග බඳුනක ලා, ලී දණ්ඩකින් මනාව කලතා දින 2—3 ක් නිශ්චලව පැදෙනුව තබා පසුව යතරට නමාගත් රෙදි කඩකින් පෙරන්නේය. ඉක්බිතිව පෙරාගත් ජලය යලි ලිප තබා සිඳුවිය යුතු ය. එය අඩක් සිඳුනු පසු ද්‍රවය ධූම්‍ර වර්ණව තිබේ නම්, නැවත එයට අලුත් ජලය සිඳුනු ප්‍රමාණය ලා ගිනි නොලා සිසිල් වනුව තැබිය යුතු ය. දිනකට පසුව යලි පෙරා ලිප තබා ගිනි දෙන්නේ ය. එයින් ඝන අවස්ථාවට පැමිණි පාකය අව්වේ තබා ජලය සිඳෙන තෙක් වියලවා සිතප්‍රභ ක්ෂාරය ලබා ගන්නේ ය. එය වායු නිවාරක පිධානක මේ බෝතල් තැන්පත් කරන්නේ ය.

අෂ්ට ක්ෂාර

දළුක් ක්ෂාර, පලාශක්ෂාර, අපාමාර්ගක්ෂාර, චිංචා, (සියඹලා පොතු) ක්ෂාර, අර්ක ක්ෂාර, තිලක්ෂාර, ස්වර්ජිකාක්ෂාර, යවක්ෂාර (ර. ත.)

රස තරංගිණී 2 අධ්‍යාය පරිභාෂා :—

9. ක්ෂාර වෘක්ෂ — ඖෂධි :—

කුටජ, සැල, අශ්වකර්ණ, පාරිභද්‍ර, බුළු, ඇසළ, බෙලි, වරා, දලුක්, කරල්සැබෝ, පලොල්, කරඳ, කදලි = අළුකෙසෙල් රත්නිටුල් පූතික = කුඹුරු, ඉන්ද්‍රවෘක්ෂ, ආස්ඵොත = කවරොළු, හයමාර — කනේරු, රුක් අත්තන, මිදි, ගුඤ්ජා වර්ග, තිත්ත වැටකොලු, සියඹලා (කරල් පොතු), ඉක්ෂුර = නිරමුල්ලි යනු ක්ෂාර ද්‍රව්‍ය ගණය වේ.

සත්ව කල්පනා :—

ගුඩූචි = රසකිඳ මනාව සෝද කුඩා කැබලිවලට කපා සියුම් වන සේ කොටා බඳුනක බහන්නේ ය. ඉක්බිතිව ද්‍රව්‍ය මෙන් සිවුගුණයක් ජලය ලා දෙඅතින් මඩිමින් මිරිකා රොඩු හැර වස්ත්‍රයකින් පෙරා රාත්‍රියක් පැදෙනුව තැබිය යුතු ය. පසුව එහි මතුපිට පවත්නා ද්‍රව කොටස බේරා හැර බඳුන පතුලෙහි පිහිටි පිටි වැනි සත්ව කොටස වියලා ගත යුතු ය.
හුලංකිරිය — අරලොප්පිටි, කිතුල් පිටි, ආදිය ද මේ අයුරින් පිළියෙළ කෙරේ.

10. ගුටිකා :—

(I) ගුඩ, සිනි, ගුග්ගුලු, ආදිය ගින්නෙන් පැසවා, එය ලේහ පදමට ආ කල එයට යෝජිත ද්‍රව්‍ය චූර්ණය ලා මිශ්‍ර කොට, සිහිල් වූ කල නිර්දේශිත ප්‍රමාණයෙන් ගුලි කොට ගන්නේ ගුටිකා නම්. අවහ්නි සිද්ධයෙන් ද, ගුග්ගුලු ආදියෙන් වටිකා පිළියෙළ කෙරේ.

(II) ද්‍රව හෙවත් රසාදිය ද මධු, ගිතෙල් ආදිය ද සමග යෝජිත ද්‍රව්‍ය චූර්ණය ගලෙහි ලා භාවනා යුක්තව හෝ වියුක්තව හෝ අඹරා ගුලි කොට ගන්නේ ද වටිකා නම්.

(III) අති සියුම්ව චූර්ණකොට ගත් ඖෂධ යෝගය ද්‍රවයන් (ස්වරසාදිය) සමග අති සියුම් වන සේ අඹරා නිර්දේශිත මාත්‍රාවෙන් ගුලි කොට ගන්නේ ද ගුලි = ගුටිකා නම්. සිතාරාම ගුලිය මෙනි.
ගුටිකා, වටී, මෝදක, වටිකා, පිණ්ඩි, ගුඩ, වර්ති යන නාම ගුලි යන්නට පර්යාය ලෙස යෙදේ.

ප්‍රමාණය :—

ගුටිකා සාධනයෙහි දී

සිනි චූර්ණය මෙන්	භාග 4 කි
ගුඩ ,,	භාග 2 කි
ගුගුල් ,,	භාග 1 කි
මධු ,,	භාග 1 කි
කිරි ස්වර ආදිය චූර්ණය මෙන්	භාග 2 කි

මාත්‍රාව :—

කර්ෂ 1 ක් (ග්‍රෑ. 15 ක්) හෝ දෝෂ වයස් ආදියට අනුරූපව හෝ යෙදිය යුතු ය. රස විෂ ද්‍රව්‍ය ආදීන්ගෙන් කරනු ලබන සංස්කරණ යෝජිත මාත්‍රාවෙන් ගුටිකා සකසන්නේ ය.

නිදර්ශන :—

පීනසයෙහි — ව්‍යොෂාදි ගුටිකාව
අර්ශස්හි — සූරණ වටකය.
ආමවාතයෙහි — යෝගරාජ ගුග්ගුලුව.
ග්‍රහණී රෝගයෙහි — මදන මෝදකය.
ජ්වරයෙහි — මෘත්‍යුංජය රසය.
අර්ශස් රෝගයෙහි — බාහුශාල ගුඩ මෙනි.

(IV) වර්ති :—

වර්ති නම් චූර්ණකොට ගත් ඖෂධ යෝගය යෝජිත ද්‍රවයන්ගෙන් අති සියුම් වන සේ අඹරා කරල් මෙන් නිර්දේශිත මාත්‍රාවෙන් පිළියෙල කිරීම යි.

ඵල වර්ති :—

ගුදයෙහි ගැසීම සඳහා ගුඩ පාක විධියෙන් පිළියෙල වේ.

නෙත්‍ර වර්ති :—

ඇසෙහි ගෑම උදෙසා සැකසෙන බෙහෙත් කරල් විශේෂය වේ.

(V) චක්‍රිකා :—

පෙර පරිදි ගුටිකා සඳහා පිළියෙලකරගත් සැකසුම් යන්ත්‍ර සහායකත්වයෙන් පෙති අයුරින් නිර්මාණය කිරීම චක්‍රිකා නම්

අනුපානය :—

(සාධාරණ) ජල, අර්ක, ක්ෂීර, තක්‍ර, මධු, ඵල රස ආදිය යි.

11. අවලේහ :—

ස්වරස ආදිය යලි සිඳුවා ඝන බවට පමුණුවන ලද්දයේ අවලේහ නම්. එහි දී ප්‍රක්ෂේපය ලෙස යෝජිත චූර්ණ යෙදීමත් මධු ගුඩ ආදී කාලාපෙක්ෂිත ද්‍රව්‍ය යෙදීමත් සිදු වේ.

(i) ක්වාථ කල්පනා අනුව කෂාය සිඳ පෙරා යලි ඝන වන තුරු සිඳුවා ගැනීම ද,

(ii) අවලේහයෙහි චූර්ණය මෙන් සිවුගුණයක් ද්‍රවය ද, චූර්ණය මෙන් සිව්ගුණයක් සීනි ද, චූර්ණය මෙන් දෙගුණයක් ගුඩ ද යෙදීම සිදු වේ.

පාකය:—

මඳ ගින්නෙන් සිඳුවා නූල් ඇදෙන පමණට බා නිවා ගන්නේ යි. ඇඟිලි දෙකකින් පාක ද්‍රව්‍යය තද කළ විට ඇඟිලි රේඛා (අංගුලි මුද්‍රා) පිහිටීම ද පාක ලක්ෂණයකි. ක්ෂය රෝගයෙහි වාසාවලේහය මෙනි.

අග්නි සංයෝගයෙන් තොරව ද්‍රව, ද්‍රව්‍යයන් ගලෙහි ලා, අඹරා ගැනීමෙන් ද අවලේහ සංස්කරණ පිළියෙල වේ.
පිත්තජ කාසයෙහි ද්‍රාක්ෂාවලේහය මෙනි.

රසක්‍රියා :—

ක්වාථාදීන් යලි සිඳුවා ඝන අවස්ථාවට පැමිණවීම රස ක්‍රියා යනුවෙන් සැලැකේ. එය ම ලේහ, අවලේහ යන පර්යායයන් ගෙන් ද හැඳින්වේ. ද්‍රවරසක්‍රියා ය, ඝන රසක්‍රියාය යනුවෙන් එය දෙපරිදි වේ.

ඉන් පැණි පදමට සිඳුවා ගන්නේ ද්‍රවරසක්‍රියා ද, ගුලි කළ හැකි පදමට කකාරා ගන්නේ ඝනරසක්‍රියා ලෙස ද හැඳින් වේ.

ද්‍රව්‍ය — භාග 1 යි.
ජලය — භාග 16 ක්. අෂ්ටාවශෙෂ කොට (16—8) හෝ.
ද්‍රව්‍ය — භාග 1 යි.
ජලය — භාග 8 යි. චතුර්භාගාවශිෂ්ට කොට (8—4) හෝ සිඳුවා පැණි පදමට ගැනීම එහි ක්‍රමය වේ. එය ඵාණිත යනුවෙන් ද සැලැකේ. ඝන වූ රසක්‍රියාව ලේහ, අවලේහ ලෙස ගැනේ. මෙහි ප්‍රක්ෂේපයන් යෙදීම පාක අවස්ථාවට පෙර සිදු කළ යුතු වේ.

මාත්‍රාව :—

කර්ෂ 1 කි. (ග්‍රෑ: 15 යි).

කිරි, යූෂ වර්ග, කෂාය, ජලය, ඵල රස අනුපාන ලෙස යෙදේ.

ඝෘත—තෛල කල්පය :—

ක්වාථ, ස්වරස, මාංස රස, ආදි ද්‍රවයන් සමග ඝෘත හෝ තෛල හා ඖෂධ ද්‍රව්‍යයන්ගේ කල්කය යොදා පාක කොට ගනුයේ ඝෘත—තෛල ගණයෙහි ලා සැලැකේ.

එහි ක්වාථය සඳහා,

ද්‍රව්‍ය — 1 යි.
ජලය — භාග 4 යි.
ශේෂය — භාග 1 යි.
හෙවත් චතුර්භාගාවශිෂ්ට කොට ගන්නේ ය. එහෙත්,
මෘදු ද්‍රව්‍ය සඳහා 4 ගුණයක් ද,
මධ්‍ය ද්‍රව්‍ය සඳහා 8 ගුණයක් ද,
අතිකඨින ද්‍රව්‍ය සඳහා 16 ගුණයක් ද ජලය යෙදිය යුතු ය යි නියමයෙකි.

ඝෘත—තෛල නිර්මාණයෙහි දී ද්‍රව්‍ය	භාග 16 යි.
ඝෘත හෝ තෛල	භාග 4 යි.
කල්කය	භාග 1 යි.

නිර්දේශ නොකළ කල්හි කිරි, තෛලය හා සමභාගව වේ. එහෙත් ඇතැම් යෝගයන්හි දී කිරි තෛලය මෙන් සිව් ගුණයකි. ද්‍රවය නොදැක් වූ කල ජලය ද කල්කය නො දැක්වූ කල අභීෂ්ට (යෝගයට නියමිත) ගණයන් ද ප්‍රයෝග කළ යුතු ය.

පාකය :—

ඝෘත-තෛල පාකයෙහි මෘදු මධ්‍ය, බර යන අවස්ථා තුනක් සැලැකේ. පාකයෙහි දී කල්කය ඉටි හා සමානව උපදනා අවස්ථාව මෘදුපාකය වේ. කල්කය විසිරෙණ නිර්යාසයක් මෙන් පවත්නේ බර පාකයෙහි දී ය. තෛල-ඝෘතසුපාකයෙහි දී කල්කය ඇඟිලි තුඩින් අඹරණ ලද්දයේ වැටි ගැසේ. තෙල ගින්නෙහි ලූ කල, චිට්, චිට් අනුකරණයෙන් ශබ්ද නොනංවයි. තෛලයෙහි දග්ධපාකය වර්ජනීය වේ. ප්‍රයෝගයන් සඳහා අයෝග්‍ය ද වේ.

මෘදුපාක තෛලය	නස්‍ය කර්ම සඳහා ද,
මධ්‍යපාක තෛලය	පාන, වස්තිකර්ම සඳහා ද,
ඛර පාක තෛලය	අභ්‍යංග කර්ම සඳහා ද යෙදේ.

මාත්‍රාව :—

පලං 1 කි. (මි: ලි: 60 යි) කර්ෂ 1/2—1 දක්වා ය. (මි: ලි: 7.50—15 යි.)

ඝෘත කල්පනා :—

කල්කය මෙන් සිවුගුණයක් ඝෘතය ද, ඝෘතය මෙන් සිවුගුණයක් ද්‍රවය ද යොද සුපාක අවස්ථාව සලකා පිළියෙලකර ගන්නේ ඝෘත නම්. ඝෘත පාකයේ දී ස්නෙහපාක ලක්ෂණ සාධාරණ වේ.

13. තෛල මූර්ච්ඡා :—

තෛලයන්හි පවත්නා ගන්ධාදී දෙෂයන් දුරු කරණුව ද යෝග ශක්තිය තෛලයට වැද ගනුව ද මූර්ච්ඡා විධිය අනුගමනය කරණු ලැබේ.

1. තිල තෛල මූර්ච්ඡා :—

ලෝහ භාජනයක මද ගින්නෙන් තලතෙල් පැසවා නිෂ්ඵෙන භාවයට වන් කල, බා මදක් සිසිල් වූ පසු එයට අඹරාගත් වියලි කහ, වැල්මදට ජලයෙහි දියකොට ක්‍රමයෙන් ලා, පසුව ලොත්, කලාඳුරු, නාලිකා, අරළු, බුළු, නෙල්ලි, වැටකේ මුල්, හ්රිවෙර යන ද්‍රව්‍ය අඹරාගත් කල්කය තෙලට යොදන්නේ ය. ඉක්බිතිව තෙල් මෙන් සිවුගුණයක් ජලය ලා ස්නෙහපාක විධියෙන් මදක් ජලය ශෙෂ වන සේ පැසවා, සත් දිනක් නිශ්චලව තබා පෙරා ගත යුතු ය.

2. ඝෘත මූර්ච්ඡා :—

අරළු, බුළු, නෙල්ලි, කලාඳුරු අල, වියලි කහ, මාතුලුංග රස. කුඩව 1 (ග්‍රෑ: 240) බැගින් ගෙන, ගිතෙල් ප්‍රස්ථ 1 ක් (ග්‍රෑ 960) ක් ලා, ලෝහ භාජනයක මන්දග්නියෙන් පෙන රහිත වන තෙක් මූර්ච්ඡා විධියෙන් පැසවා පෙරා ගත යුතු ය. ඉන් ඝෘතයෙහි ආම දෝෂාදිය නැසී වියඝීවත් භාවය උපදී.

3. ඒරණ්ඩ තෛල මූර්ච්ඡා :—

වැල්මදට, කලාඳුරු අල, කොත්තමල්ලි, තිපල්, ජයන්ති පත්‍ර, හ්රිවෙර, ඉඳිමුල්, නුගඅරළු, වියලි කහ, වෙනිවැල් ගැට, නාලිකා, වැටකේඅරළු, දධි, කාඩි යන ද්‍රව්‍ය කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් ගෙන කල්ක කොට එරඩු තෙල් සේරු 4 ක ලා, මූර්ච්ඡා විධියෙන් සකසා ගත යුතු ය.

4. කටුතෛල — අබතෙල් මූර්ච්ඡා :—

අබතෙල් නිෂ්ඵෙන වන තුරු සිඳුවා මදක් නිවී ගිය පසු, වැල්මදට, වියලි කහ, නෙල්ලි, කලාඳුරු, බෙලිපොතු, දෙළුම ලෙලි, නාමල්රේණු, කළුදුරු, හ්රිවෙර, නාලිකා, බුළු, කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් ගෙන කල්ක කොට, තෛල ප්‍රමාණය මෙන් සිව්ගුණයක් ජලය ද සමඟ මෘදු පාකයට පැසවා නිවා පෙරා ගන්නේ ය.

5. නාරිකෙල තෛල මූර්ච්ඡා :—

දෙහි ලෙලි, බුලත් නැටි, කළුදුරු, සැවැන්නමුල්, අඹරා තිල තෛල පරිභාෂා අනුව මූර්ච්ඡා කොට ගන්නේ යි.

පොල්තෙල් මූර්ච්ඡාව නො ඉවසන තරම් මෘදු හෙයින් තෙල් හා සමප්‍රමාණයක් ජලය යොද මඳගින්නෙහි, තෙල් නො දැවෙන සේ ඉතා ප්‍රවේසමින් මූර්ච්ඡාව කටයුතු ය.

සැ: යු :—

ඝෘත තෛල පාක සඳහා මූර්ච්ඡා කොට ගත් තෛල යෙදිය යුතුයි. ඝෘත—තෛලපාකයන්හි සැම විට ම මද ගින්න යෙදිය යුතු ය. තීක්ෂ්ණග්නියෙන් තෛල ජාතීන්ගේ ප්‍රකෘති ගුණ පවා දැවී යන හෙයිනි.

සන්ධාන කල්පනා

ද්‍රවයන්හි ද්‍රව්‍යයන් බහා චිරකාලයක් තබා සන්ධිත කරන ලද්දයේ සන්ධාන නම්. ආසව අරිෂ්ටාදී භේදයෙන් එය චිකිත්සා ව්‍යවහාරයෙහි පවතී. ද්‍රව හා ද්‍රව්‍ය බහා ලූ බඳුනෙහි කට වසා මැටි බැඳ කිණ්වීකරණය (සුරාබීජ ඉපදීම) සඳහා තැන්පත්කර තැබීම සන්ධිත කිරීම නම්. එහි දී සාමාන්‍යයෙන් ආසව අරිෂ්ට කල්ඛය සඳහා පක්ෂයක් හෝ පක්ෂද්වයක් හෝ විශේෂ අවස්ථාවන්හි දී නියමිත කාලයක් හෝ පැසීමට (උත්සේචනයට) තබා පෙරා ගැනීම ක්‍රමය වේ. පූර්වෝක්ත සන්ධාන නිර්මාණය, මද්‍ය, ශුක්ත ය යි දෙපරිදි ය. ඉන් මද්‍යගණයේ සංස්කරණයන්හි මද්‍ය ශක්තිය ද ශුක්ත ගණයේ නිර්මාණයන්හි අම්ල ශක්තිය ද පවතී.

1. ආසව :—

නොපැස වූ හෙවත් අපක්ව ඖෂධ ද්‍රව්‍ය ජලය සමඟ සන්ධානය කොට ගත් මද්‍යය ආසව නම්.

2. අරිෂ්ටය :—

පක්ව ක්වාථයන්ගෙන් සන්ධානය කර ගත් මද්‍යය අරිෂ්ට නම්.

I. පරිභාෂාව :—

I. ආසව අරිෂ්ට නිර්මාණය සඳහා යෝගයන්හි දක්වන ලද ද්‍රව ද්‍රව්‍යයන්ගේ පරිමාණය සාධාරණ මිමි ලෙස අනුමත කරනු ලැබේ.

II. එහෙත් ද්‍රව, ද්‍රව්‍යයන් නො දැක්වූ කල,

ද්‍රවය	ද්‍රෝණ	1 යි.	(ලී: 15,360 යි.)
ගුඩ	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)
මධු	තුලා	1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)
ශර්කරා	තුලා	1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)

ධාතකී, ද්‍රාක්ෂා, චූර්ණ ආදිය දශමාංශකය යි.

III. ආසව, අරිෂ්ට නිර්මාණය සඳහා යොදන භාජන උදෙසා,

1. මැටි භාජන.
2. චීන මැටි භාජන.
3. තේක්ක ලී භාජන යන උපකරණ භාවිත කළ යුතු වේ.

IV. ආසව අරිෂ්ට සැකැසීම සඳහා ප්‍රථම කොට, භාජනය සෝදහැර එහි ධාතකී, කුඹුක්, මාදම් වැනි ද්‍රව්‍යයන් ලා, ප්‍රමාණවත්ව ජලය යොද තැම්බිය යුතු ය. එයින් බඳුනෙහි වන කුඩා සිදුරු ඇහිරේ. පසුව අගිල්, කපුරු, සුදුහඳුන්, ජටාමාංස, ගුගුල්, දුම්මල, හොරඳවී, යන ද්‍රව්‍ය දවා එහි දුම භාජනයේ ඇතුළතට මනාව වැදෙන සේ තැබිය යුතුය. එයින් විෂාණුන්ගේ විනාශයක් සිදු වේ. ඉක්බිතිව භාජනයෙහි ඇතුළත ගිතෙල් ගා වියලා ධාතකී, ලෝධ්‍ර කල්ක කොට යලි එහි ගා වියලා ගත යුතු වේ. එයින් භාජනාභ්‍යන්තරයෙහි සන්ධාන ජනක අණුන්ගේ ආරක්ෂාව ද, ක්ෂුද්‍ර ඡිද්‍රයන්හි වැසීම ද සිදු වේ. තැම්බීම මැටිභාජන සඳහා පමණෙකි.

V. පූර්වෝක්ත අයුරින් සකස් කළ භාජනයට ජලය හෝ ක්වාථය හෝ බහා ගුඩාදී මධුර ද්‍රව්‍ය ද්‍රවයෙහි දියකොට පෙරා යොද ඉක්බිතිව පවිත්‍ර කොට තලා ගත් ධාතකී ආදී සන්ධානීය ද්‍රව්‍යයන් ද, චූර්ණකොට ගත් ප්‍රක්ෂේපය ද දමා මිශ්‍රකොට බඳුන් කට කුඩා දැල් රෙදි ආවරණයකින් වසාතබා පසුව කඩ මැටි බැඳ අවශ්‍යතම හෝ නිර්දේශිත උෂ්ණ ප්‍රමාණය රැකෙන විධි-විධාන අනුව භාජනය තැබිය යුතු වේ. වළැ දැමීම, වී පෙට්ටියෙහි තැබීම යන ක්‍රියා ඉන් අදහස් කරණු ලැබේ. (වක්තව්‍යය විමසන්න.)

II. මධුර පදර්ථ යෙදීම :—

1. ආසව, අරිෂ්ට නිර්මාණයෙහි දී යෙදෙන මධුර ද්‍රව්‍ය ඌනව හෝ අධිකව හෝ නො යෙදිය යුතු ය. ඉදින් එය අඩුවුව සන්ධානය අම්ලතාවයට යෙයි. අධික වූව සන්ධානයෙහි සුරාබීජ වර්ධනයට බාධා පැමිණේ.

2. එහෙත් යෝගයන්හි නිර්දේශිත ප්‍රමාණ අනුව සංස්කරණ පිළියෙල කිරීමෙහි දී මධුර ද්‍රව්‍ය යොදන ප්‍රමාණය අවධානයට යොමු කළ යුතු ය.

3. ආසව, අරිෂ්ට නිර්මාණයෙන් පසු පෙරා රක්ෂිත කිරීමෙහි දී ද මධුර පදර්ථ මිශ්‍ර කිරීමේ ක්‍රමයක් පවතී. එය වක්තව්‍යයෙහි දැක්වේ. රක්ෂිත කිරීම නම් බෝතල්හි ඇහිරීම යි.

III. ප්‍රක්ෂේපය :—

1. ආසව අරිෂ්ටයන්හි ප්‍රක්ෂේපය ලෙස යෙදෙන සුගන්ධ ගින ද්‍රව්‍යයන්හි සූක්ෂ්ම චූර්ණය ද, සුගන්ධ ද්‍රව්‍යයන්හි දළ චූර්ණය ද කාර්‍ය්‍ය සිද්ධියෙහි භාවිත කළ යුතු ය.
2. එහෙත් ඇතැම් සුගන්ධ ද්‍රව්‍ය යෙදිය යුත්තේ සන්ධාන නිර්මාණයෙන් පසුව ය. දශමූලාරිෂ්ටයෙහි කස්තුරි මිශ්‍රණය මෙනි. කස්තුරි ප්‍රමාණය සුරාසාරයෙන් (ඇල්කොහොලින්) අඹරා මිශ්‍ර කිරිම ඒ අනුව ප්‍රතිඵලදායී ක්‍රමය වේ.

IV. ස්වර්ණ ප්‍රක්ෂේපය :—

ආසව අරිෂ්ටයන්හි ස්වර්ණ ප්‍රයෝගය ද එක් ප්‍රක්ෂේප ක්‍රමයකි. සාරස්වත අරිෂ්ටයෙහි මිශ්‍රණය මෙනි. එහි ලා,

ස්වර්ණ පත්‍ර යෙදීම,
ස්වර්ණ භස්ම යෙදීම,
ස්වර්ණ ලවණ යෙදීම,
ස්වර්ණ ද්‍රාව (ද්‍රැත) යෙදීම.

යන ක්‍රම ව්‍යවහාරයෙහි පවතී. එහෙත් එහි දක්වෙන විධින්ගෙන් ස්වර්ණයෙහි සම්‍යක් යෝගයක් අරිෂ්ටය හා සිදුවනු දුර්ලභ ය. එහෙයින් රසතරංගිනී නිර්දේශිත අයුරින් සැකැසූ ස්වර්ණ ලවණය සන්ධානය රක්ෂිත කිරීමෙහිදී මිශ්‍රකරනු යෝග්‍ය වේ.

V. ස්වර්ණ ලවණය :—

ශොධිත ස්වරණ පත්‍ර කාච ශරාවයක ලා, ත්‍රිපාදිකා උදුනක තබා සුරාප්‍රදීපයෙන් මඳව ගිනි දෙන්නේ ය. පසුව ස්වර්ණ ප්‍රමාණයෙන් 1/4 ක් පමණ වූ සෞරාම්ලය = නයිට්‍රික් ඇසිඩ් මඳව මඳව එයට ලිය යුතු ය. එකල ස්වර්ණය ද්‍රව බවට පැමිණ සෞරක අම්ලය හා මිශ්‍ර වූ කල එයට 10 ගුණයක් පමණ සෛන්ධව ලවණ ලා, කුරු ගා රක්ත පීත වන තෙක් ගිනි දී බා නිවා ගත යුතු ය. එයින් හටගත් ස්වරණ ලවණය විදුරු බඳුනක බහා යෝගයන් සඳහා ජලය සමඟ යෙදිය යුතු වේ.

VI. ලෞහ මිශ්‍රණය :—

ලෞහ මිශ්‍රණය කිරීමක් ඇතැම් ආසව, අරිෂ්ටයන් සමඟ යෙදේ. ලෞහාසවය කුමාර්‍ය්‍යාසවය මෙනි. එහි ලා උපයෝගී කරගන්නා ක්‍රම නම් :—

1. ලෞහ චූර්ණය යෙදීම,
2. මණ්ඩූර චූර්ණය යෙදීම,
3. ලෞහ භස්මය යෙදීම,
4. මණ්ඩූර භස්මය යෙදීම. යනු වේ.

එහෙත් එය සන්ධානය හා මනා අයුරින් මිශ්‍ර නොවේ. එහෙයින් ලෞහ ද්‍රැතය එහි ලා මිශ්‍ර කරනු යෝග්‍යය යි නව්‍ය කෘත හස්තයන්ගේ නිගමනය යි.

VII. ලෞහ ද්‍රැතය :—

ත්‍රිපලා චූර්ණය ලෞහ චූර්ණය හා පාත්‍රයක ලා, ජලය ද මිශ්‍රකොට සත් රැයක් තබන්නේ ය. එයින් පිළියෙල කර ගත් ලෞහ ද්‍රැතය පෙරා සන්ධාන කාර්‍ය්‍යයෙහි යොදන්නේ ය.

VIII. ක්‍රමය — නිදර්ශන :—

තිපල් ප්‍රත්‍යෙකව තෝලා 10 (ග්‍රෑ: 120) බැගින් ගෙන වතුර සේරු 4 (ලි: 3,840) ක් දමා 4—1 (මි: ලි: 960) ට සිඳුවා පෙරා ඊට මණ්ඩූර භස්ම තෝලා 10 (ග්‍රෑ: 120) ක් දමා වසා දින 3 ක් තබා ගන්නේ ය.

IX. ධාතකී පුෂ්ප, මධූක පුෂ්ප ප්‍රයෝගය :—

ආසවාරිෂ්ටයන්හි සන්ධාන ක්‍රියාව ශක්තිමත් කරනුව, මලිත මල් හෝ මීපුප් හෝ සංයෝග කිරිම යෝගයන්හි නිර්දේශිතව පවතී. එහෙයින් එය පරිභාෂා මාන ක්‍රමය අනුව යෙදිය යුතු වේ. එහෙත් මීපුප්හි මධුර පදර්ථ ප්‍රමාණයක් අතිරේකව පවත්නා හෙයින් සන්ධානයෙහි මද්‍යාංශ ප්‍රමාණය අධිකව ලබනු අවශ්‍ය නම් මීපුප් ප්‍රයෝගය උචිත වේ.

X. සුරාබීජ (කිණ්ව) ප්‍රයෝගය :—

එක් එක් අරිෂ්ටයක් හෝ ආසවයක් සඳහා ඊට ම විශෙෂ වූ කිණ්ව = මුහුන් යෙදිය හැකි ය. එනම් : ද්‍රාක්ෂාරිෂ්ටය පෙරා ගත් පසු එහි මණ්ඩි කොටස වෙන්කර වේලා ගැනීමෙන් ඊට යෝග්‍ය මුහුන් ලැබේ. දශමූලාරිෂ්ට, පිප්පල්‍යාසව ආදිය සඳහා ද එසේ ම ය. සුරාබීජ යනු ආසවාරිෂ්ට සුරාසන්ධානයෙහි දී භාජනයේ අධෝභාගයෙහි පවත්නා මණ්ඩි කොටස වේ. කිණ්ව (මුහුන්) යනු ද එයට නමකි. ආසවාරිෂ්ට සන්ධානයේදී එය යෙදීමෙන් සන්ධාන කාර්‍ය්‍යයෙහි ශක්තිය වැඩේ. ඒ ඒ යෝගයට විශෙෂ වූ කිණ්ව නො ගතහැකි කල්හි ඊස්ට යෙදීම ද පොදු මුහුන් ක්‍රමයක් වේ.

ඒ අනුව :—

ද්‍රව ද්‍රව්‍ය	ද්‍රෝණ 1 ක්, (ලී: 15,360 ක්).
කිණ්ව	ප්‍රස්ථ 1 (ග්‍රෑ: 960) ක් හා යොදනු යෝග්‍ය වේ.

එවැනි සන්ධානයක් සඳහා දින 15—20 ක් පමණ කාලයක් අවශ්‍ය වේ. එහෙත් එයට ද මධුර ද්‍රව්‍යයන්ගේ යෝග්‍ය ප්‍රමාණය යෙදීම ද අවශ්‍ය තාප පරිමාණය දැනවීම ද කළ යුතු ය.

XI. සන්ධාන භාජන මුඛබන්ධනය :—

ආසවාරිෂ්ට සඳහා සන්ධාන කාර්යයෙහි දී භාජනයෙහි මුඛබන්ධනය ද විශෙෂ පරිචිතියෙන් සහ විද්‍යානුකූලව සිදු කළ යුතුව තිබේ. සන්ධානයට අංගාරිකාම්ල වායුව වැනි විෂ වායුන්ගේ පිවිසීමක් විය හැකි හෙයිනි. වක්තව්‍යයෙහි එය සඳහන් වේ.

XII. සන්ධාන කාලය:—

ශරත්, හේමන්ත යන ඍතු. සන්ධාන කාර්යය සඳහා යෝග්‍ය වේ. එහි දී ස්වාභාවික තාපයේ යෝග්‍ය ප්‍රමාණයක් සන්ධාන කාර්යයට අදාලව ලැබෙන හෙයිනි. ඒ අනුව ශීත ඍතුවල දී සන්ධානයට දින 20–25 ක් පමණ කාලය ද, ග්‍රීෂ්මාදි ඍතුන්හි දී දින 15-20 ක් පමණ කාලය ද යොදනු යෝග්‍ය වේ. එහෙත් ඇතැම් යෝගයන්හි නිර්දේශිත කාලය වෙනස් කරණු නො යෙදේ.

XIII. රක්ෂණ කාර්යය:—

ආසව අරිෂ්ට නිර්මාණයෙන් පසු එය මනාව පෙරා බෝතල්වල හෝ බරණිවල ඇහිරීම රක්ෂණ කාර්යය යනුවෙන් සැලැකේ. එහි දී එය ධූම්‍ර වර්ණකාව බෝතල්වල (නිල් හෝ-දුඹුරු පාට) ඇහිරීම ද එහි මූඩිය තදව සහ කාබන් මිශ්‍රිත වායුව නො ඇතුළු වන සේ යෙදීම ද කටයුතු වේ.

වක්තව්‍යය:—

1. අතිශයින් පවිත්‍ර, ක්‍රමානුකූලව සකසා ගත් භාජන ආසව අරිෂ්ට නිර්මාණය සඳහා යොද ගත යුතු වේ.
2. අරිෂ්ටය සඳහා පිළියෙලකර ගත් ක්වාථය සිසිල් වූ පසු පෙරා ගුඩ, සිනි, මධු, ආදි මධුර ද්‍රව්‍ය එහි දිය කොට නැවත පෙරා සන්ධාන භාජනවලට ලිය යුතු ය.
3. ඉක්බිති රොඩු-කුණු ඉවත්කොට සෝද වේලා මැනැවින් කොටා ගත් ධාතකී ආදි සන්ධාන ද්‍රව්‍යයන් ද තද උණු දියෙන් සෝද තලාගත් මිදි, මිපුප් ආදිය ද එයට දැමිය යුතු වේ. (මෙහි දී වඩා යෝග්‍ය වනුයේ මිදි තම්බා මර්දනය කොට යෙදීම යි.)
4. පරිභාෂාවෙහි නියමිත ප්‍රමාණයෙන් මුහුං යෙදීම ද එහි දී අනුගමනය කළ යුතු වේ.
5. පසුව පවිත්‍ර දණ්ඩකින් හෝ හැන්දකින් සියල්ල මනාව කලතා බඳුනෙහි කට සියුම් දැල් රෙද්දකින් වසා බැඳ, සමශීතෝෂ්ණ පවිත්‍ර ස්ථානයක සන්ධාන බඳුන තැබිය යුතු ය.
6. දිනපතා නියමිත වේලාවෙහි කඩ වැසුම් හැර දණ්ඩකින් සන්ධානය මන්ථනය කළ යුතු ය. එයින් අරිෂ්ටාසව යෙහි උපදනා කාබන් වායු වර්ග (කාබනික් ඇසිඩ් ගෑස්) බැහැර කළ හැකි වේ. ඉදින් ද්‍රව්‍යයන් සහිත ප්‍රක්ෂෙපයන් බඳුනට ලූ අවස්ථාවෙහි ම කට කඩමැටි බැඳුම් කළහොත්, එහි උපදින කාබනික වායු, සන්ධානය අම්ලතාවයට යොමු කරණ හෙයිනි. එහෙයින් දිනපතා සන්ධාන බඳුනට කණ තබා ඉන් නඟනා සුරු, සුරු යන ශබ්දය නව තනා තෙක් දින කිපයක් එය කලතා (මන්ථනය කොට), කට වැසුම් දැමිය යුතු වේ. ඉන් සන්ධානයේ සුරාසාර උපැත්ම යෝග්‍ය ප්‍රමාණයෙන් ඉක්මන් වෙයි. පූර්වෝක්ත කාර්යය සඳහා දින 5 සිට 7 දක්වා කාලයක් ගත වේ.
7. ගිනිකූරක් හෝ පහන් තිරයක් හෝ දල්වා භාජනයේ මුවවිටට ළං කළ විට ගිනිදළුව නිවීගියේ නම් සුරාසාර නො පහළ බව දත යුතු ය. ඉදින් ඒ පරීක්ෂණයේ දී ගිනි දළුව නො නිවී මනාව දැල්වේ නම් බාහිර වාතය ඇතුළු නොවන සේ වහාම බඳුනෙහි කට කඩමැටි බැඳුම් යොද සන්ධාන කාර්යයේ අවසානය සඳහා තැබිය යුතු වේ. සුරු සුරු ශබ්දය නැවතීම ද ගිනි දැල්ල මනා සේ දැල්වීම ද කඩමැටි බැඳීමට යෝග්‍ය අවස්ථාව වන්නේ ය.
8. කට කුඩා භාජන සන්ධාන කාර්යය සඳහා අයෝග්‍ය වේ. කට පුළුල් බඳුන් එයට යෝග්‍ය ය. සන්ධාන ද්‍රව ද්‍රව්‍ය ලූ පසු බඳුනෙහි 1/3 ක් හිස්ව පවත්නා සේ භාජන පිළියෙල කිරීම ද අනුගමනය කළ යුතු ය.
9. සන්ධාන ක්‍රියාරම්භයෙහි දී භාජනයට ක්ෂුද්‍රප්‍රාණීන්ගේ පතිතවීම හෝ අපවිත්‍ර ද්‍රව්‍යයන්ගේ වැටීම හෝ වළක් වනුව සියලු විධි-විධාන යෙදිය යුතු වේ.
10. සන්ධාන කාලය නිම වූ පසු ආසව අරිෂ්ට පෙරීමට පෙර එය පවිත්‍ර දණ්ඩකින් හෝ හැන්දකින් හෝ මනාව ආලෝඩනය කරණු යෙදේ. එසේ නො කළහොත් මිහිරි පදර්ථ බඳුන් පතුලෙහි මිදී පැවැතිය හැකි ය.
11. ඉක්බිතිව බාහිර වාතාක්‍රමණය හැකිතෙක් අඩුවන අයුරින් ඝන වස්ත්‍රයකින් පෙරා, සියුම් චූර්ණාදිය ඉවත්කොට සතියක් පමණ කල් පැදෙනුව තබා යලි පෙරා රක්ෂණය කළ යුතු ය.

12. රක්ෂණයෙහි දී හෙවත් බෝතල්වල ඇඹිරිමට පළමු අරිෂ්ටාසවයන්හි මධුරතර භාවය හා යළි අම්ලතාවයට නොයනු පිණිස සීනි මිශ්‍ර කළ යුතු ය. එහි අනුපාතය 8-1 ප්‍රමාණයට වේ; හෙවත් සන්ධානය රාත්තල් 80 ට සීනි රාත්තල 10 බැගිනි. ඉන්පසු පෙරා බෝතල්වල අහුරා බාහිර වාතය ඇතුළු නොවන සේ පොරොප්ප සවිකොට සිල් තබනු යෝග්‍ය වේ. බෝතල් මූඩි ශබ්ද නගා ගැලවී යාම අරිෂ්ටාසව මිශ්‍රණයේ අයෝග්‍යතාවයක් දක්වයි. එහි කාබනික් වායුව (කාබනික් ඇසිඩ්) ඇති වූ හෙයිනි. ඒ අනුව අම්ලත්වය ද එහි උපදී. එහෙයින් ආසව, අරිෂ්ට බෝතල්වලට පිරවීමේ දී බාහිර වාතය එය තුළට නො වදනා සේ කටයුතු යෙදිය යුතුය.

13. ආසවාරිෂ්ට නිර්මාණය සඳහා ක්ලෝරින් ආදි රසායනික ද්‍රව්‍ය මිශ්‍රකළ ජලය යොදනු අයෝග්‍ය වේ. පවිත්‍ර, උල්පත් ජලය ඒ සඳහා යෙදිය යුතු වේ.

14. මෘතසංජීවනි සුරාව මෙන් පළමුව සන්ධාන කොට ඉක්බිති වාරුණී යන්ත්‍රයෙන් පෙරා ගන්නා ලද්දේ උත්කෘෂ්ට සුරා වශයෙන් සැලකිය යුතු ය.

15. විශේෂයෙන් ආසවාරිෂ්ට කල්පනා සඳහා ද්‍රව්‍ය, භාජන, ඍතු, ස්ථාන යන මේ සිවු කරුණෙහි විශේෂ අවධානය යොමු කළ යුතු යි.

16. අරිෂ්ට, ආසවයන් නියමිත සන්ධාන කාලය සම්පූර්ණ වූ වහාම පෙරා ගතයුතු ය. එසේ නොකොට කල්ගත කළහොත් නැවතත් උත්සේචනය ඇරඹී අම්ලත්වයට පැමිණේ.

17. සෞඛ්‍ය නිති අනුව බෙදහරිනු ලබන ජලයෙහි අඩංගු ක්ලෝරින් මාත්‍රාව සන්ධානකාර්යයට බාධක නොවේ. එහෙත් පිවිතුරු ලිං වතුර පෙරා ගැනීම වඩා උචිත ය.

මාත්‍රාව:—

තෝලා 1—2 1/2 වේ. (ග්‍රෑ. 12—30)
එය දෙගුණයක් ජලය හා ආහාරයට පසුව ගනු අනුදන්නා ලැබේ. බාල, මධ්‍ය, වෘද්ධ යන අවස්ථා සඳහා මාත්‍රා විකල්පයක් යොදගනු උචිත වේ.

සුරා සන්ධානය:—

පැසවා ගත් අන්නයෙන් — බතින් සන්ධානය කරණ ලදුයේ සුරා නම්. අන්න සඳහා ශාලි, යව ආදි ධාන්‍ය වර්ග යොද ගනු ලැබේ.

නිර්දේශිත ජල ප්‍රමාණය හා යෝග කොට ගත් අන්න, කිණ්ව — (මුහුං) සමඟ පෙර පරිදි සන්ධානය කොට පෙරා ගැනීම සාධාරණ ක්‍රියාමාර්ගය වේ.

සන්ධාන කාර්‍ය්‍ය සඳහා පක්ෂද්වයක් හෝ එයට වැඩි කලක් හෝ යොද ගැනීම ද ආසවාරිෂ්ට නිර්මාණයෙහි දී දක්වූ ක්‍රම විධිය ද අනුගමනය කළ යුතු ය.

1. ප්‍රසන්නා:—
   සන්ධානය වූ සුරාවෙහි මතුපිට පවත්නා පැහැදිලි ද්‍රවභාගය ප්‍රසන්නා නම්.
2. කාදම්බරි:—
   එහි ගාඪභාගය කාදම්බරී සුරා යනුවෙන් ගැනේ.
3. ජගල — මේදක:—
   එහි දූ යටි කොටස ජගල යනුවෙන් ද, එහි දූ යට භාගය මේදක යන නාමයෙනු දූ හැඳින්වේ.
4. සුරාබීජ:—
   සාධිත සුරාවෙහි මණ්ඩි කොටස හෙවත් මුහුන් භාගය සුරාබීජ යනුවෙන් සැලැකේ. කිණ්ව යනු ද එයට නමකි.

සීධු:—

1. ඉක්ෂුරස වැනි අපක්ව මධුර ද්‍රව්‍යයන්ගෙන් සන්ධානය කොට ගන්නේ අපක්වරසසීධු (ශීතරසසීධු) නම්.
2. මනාකොට පැසවා ගත් මධුර ද්‍රව්‍යයන්ගෙන් සන්ධාන පරිභාෂා අනුව පිළියෙල කරන ලදුයේ පක්වරසසීධු නම් වේ
3. මෙහි දූ සන්ධාන විධිය ආසව අරිෂ්ට නියමය මෙනි. ප්‍රක්ෂෙපය ලෙස කිණ්වයන් යොදනු ලැබේ.

වාරුණී:—

තල්, ඉදි, නාලිකේර ආදි ඵල හා පුෂ්ප රසයෙන් සන්ධානය කරණ ලදුයේ වාරුණී සුරා නම්. ඉදි වෘක්ෂයෙහි උපරි භාගය සිදුරු කොට වැහෙන රසය යොද ද මේ නිර්මාණය සකසනුව අනු දක්නා ලැබේ. එහෙත් තල්, පොල්, වෘක්ෂ පුෂ්පයෙන් ලබාගන්නා රසය ද වාරුණී සුරා සඳහා උපයෝගී කරගනු ප්‍රකට ය.

සුරාසාරය:—

පරිශිෂ්ටය බලන්න.

ශුක්ත සන්ධානය:—

සූරණ, රාබු යන කන්දමූලයන් ද, කරමර්ද, රම්භා වැනි ඵලයන් ද, පුෂ්ප පත්‍ර ද යොද රාජිකා, හරිද්‍රා, ලවණ, ස්නෙහ සමඟ ජලය බහා සන්ධානය කොට ගන්නේ ශුක්ත නමි. එහි ලා අභිෂූය කිරීම යන ක්‍රමය යෙදේ. ඒ නම්: අරිෂ්ට ආසව සන්ධානය මෙන් පැසීමට තැබීම යි. එයින් ශුක්තය අම්ල බවට පැමිණි විනෂ්ට මද්‍යය ලෙස සැලැකේ. ඉක්ෂු රස, දම් ගෙඩි ආදියක් ජලය සමඟ මැටි භාජනයක ලා කට කඩවැසුම් බැඳ අව්වෙහි තබන්නේ ය. එය අම්ලතාවයට වන් පසු පෙරා, යලි මැටි බඳුනක ලා කඩමැටි බැඳ සන්ධානය සඳහා තබන්නේ ය. දින 45-60 ක් පමණ කාලයක් එයට යෙදිය යුතු ය. එයින් ද සිර්කා = විනාකිරි සන්ධානය වේ. චුක්‍ර යනු ද එයට නමකි.

ගුඩ ශුක්තය:—

උක් හකුරු දියකොට ගත් ජලය සමඟ තෛල, ලවණ, කන්දමූල ඵලාදිය යොද සන්ධානය කරණ ලද්දයේ යි.

ඉක්ෂු ශුක්තය:—

උක් රස යොද පෙර පරිදි සකසා ගන්නේ යි. එ පරිදි මිදිඵල රස යොද මාද්විකා ශුක්තය පිළියෙල කළ හැකි වේ.

කාඤ්ජික:—

1. උඳු (කුල්මාෂ), ධාන්‍ය (රක්තශාලි) ආදියෙහි මණ්ඩය හෙවත් බත්හුළු රහිත කැඳ පෙරා, ජලය සමඟ පෙර පරිදි සන්ධානය කරන ලදුයේ වේ.
2. සහල් ජලයෙන් සිද්ධකොට හෙවත් කැඳ පිස පෙරා එමෙන් තෙගුණයක් ජලය සමඟ මැටි බඳුනක කට කඩ වැසුම් බැඳ සත් දිනක් සන්ධානයට තබා අම්ල රස යුක්ත වූ කල පෙරා ගන්නේ ද වේ.
3. මණ්ඩ විරහිතව ධාන්‍ය යොද ශුක්ත පරිභාෂා අනුව සකසා ගන්නේ ධාන්‍යාම්ල යනුවෙන් ගැනේ.
4. රසසංස්කරණයන්හි නිර්දිෂ්ට විශෙෂ කාංජිකයෝ ද වෙති.

සංලක්ෂ්‍යය:—

කාඩිය:—

කුරුඳුපොතු, ගම්මිරිස්, එන්සහල්, වසාවාසි, විලඳ, සුදුලූනු, ඉඟුරු, තිප්පිලි කලං 1 යි මදටිය 10 (ග්‍රෑ. 7.5) බැගින් ගෙන තලා, නැවුම් බඳුනක ලා උණුදිය පත 8 (ලී: 1.920) ක් වත්කොට මැටි බැඳ ලිප අළුයට හෝ වී අටුවෙහි (වීමැද) හෝ දින 7 ක් තබා පෙරා ගන්නේ යි.

තුෂාම්බු හෝ පක්ව යව:—

1. පොතු සහිත අමු යව හෝ ජලය හා යොද ශුක්ත පරිභාෂාවෙන් සකසා ගන්නේ තුෂාම්බු (තුෂෝදක) යනුවෙන් ගැනෙයි.
2. පොතු රහිත පැසුනු යවධාන්‍යයෙන් පෙර පරිදි පිළියෙල කර ගන්නේ සෞවීර නම් වේ.
3. යව, කොටා සය ගුණයක් ජලය සමඟ මැටි බඳුනක කට කඩවැසුම ලා අභිෂූය කොට පෙරා ගන්නේ ද තුෂෝදක වේ
4. යව වෙනුවට ගොධූම (තිරිඟු) ඇට ද මේ කාර්‍ය්‍යය සඳහා යොද ගනු ලැබේ.

සෞවීර:—

පොතු රහිත යව හෝ ගෝධූම හෝ තම්බා හෝ අමුවෙන් හෝ තුෂාම්බු සංස්කරණ විධියෙන් සන්ධානය කොට ගන්නේ වේ.

ආරනාල:—

පොතු රහිත ගෝධූම ධාන්‍යයෙන් සකසා ගන්නේ යි.

සංධාකීය:—

රාබු, අබකොල යොද ශුක්ත පරිභාෂා අනුව පිළියෙල කර ගනු ලැබේ.

දේශීය බස්න ක්‍රමය:—

1. පොල් රා, දෙහි ඇඹුල්, ඉඟුරු යුෂ, කිතුල් පැණි හෝ පොල් පැණි, ආදිය සංයෝගය කොට පුහුල් ගෙඩියක් තුළ හෝ නැවුම් බඳුනෙක්හි ලා වසා තැබීමෙන් කෙරෙණ සන්ධාන විශේෂයකි. එයට යෝගයන්හි නිර්දේශිත ප්‍රක්ෂේපය ද යොදනු ලැබේ. සන්ධාන කාලය යෝගයෙහි උක්ත අයුරෙනි.

නාරිකේලාසව:—

ජලය වෙනුවට තැඹිලි වතුර හෝ නිල් කුරුම්බා වතුර හෝ යොද සෙසු ඖෂධ චූර්ණ හා සන්ධාන ද්‍රව්‍ය සංයෝග කොට කෙරෙණුයේ නාරිකේලාසව නමි.

ආ: ඖ: සං: 2 කොටසෙහි නාරිකේලාසවය ඇතුළත් වේ. පොල් විස්තරයෙහි බලන්න.

ඇකුවා—ටින්ක්චර්ස්—ලික්විඩ් එක්ස්ට්‍රැක්ට්ස්—සහ ක්වාථ

ඖෂධ ද්‍රව සාර ගණය (AQUAS)

1. සුරා (මද්‍ය) ආසව:— ච.ක. 2 අධ්‍යාය. 6 පද්‍යය.

ජීමූතක ගෙඩි සුරා මණ්ඩයෙහි බහා රැයක් තබා ඉන්පසු සුරා මණ්ඩයෙන් ම අඹරා ඊට දිය කර පෙරා ගන්නා ලද, සුරාසවය අරුචි, කාස, පාණ්ඩු, ක්ෂය, රෝගයන්හි වමනය සඳහා මාත්‍රානුසාරයෙන් පානය කරවන්නේ ය.

2. මිශ්‍රෙයා ද්‍රව සාරය:— (Aq: Anethi Co.)

සංයෝගය:—

ශතපුෂ්ප තෛලය	20 මි: ලි:
සුරා (90%)	600 මි: ලි:
පරිස්රුත ජල	1000 මි: ලි:

ආමාශය ආන්ත්‍රික කලා ශාන්තකර ය. ආමපාචක, රුචක ක්‍රියා දනවයි. උදරශූල නාශක ශක්තියෙන් ද ගර්භාශය සංකෝච ක්‍රියාවෙන් ද යුක්ත වේ.

මාත්‍රාව:—බින්දු 5-15 දක්වා වේ.

3. ත්වක් ද්‍රව සාරය:— (Aqua Cinnamomi Conc.)

සංයෝගය:—

ත්වක් තෛලය	2,
සුරාසාරය (90%)	60,
වාරුණී පාත (පරිස්රුත) ජල	100.

ප්‍රයෝගය:—

පූර්වෝක්ත ගුණයන් හා සමානව ක්‍රියා කෙරේ. අතිරේකව එය ශෝෂක ගුණයෙන් යුක්ත වේ. එහෙයින් විසූචිකා, අතිසාර ආදී ආන්ත්‍රික ප්‍රදාහ යුක්ත අවස්ථාවන්හි දී ප්‍රයෝග කරනු ලැබේ.

මාත්‍රාව:—බින්දු 5-15 දක්වා වේ.

4. පුදිනා ද්‍රව සාරය:— (Aqua Menthae Piperitae Conc.)

සංයෝගය:—

පුදිනා තෛලය	2,
සුරා සාරය (90%)	60,
වාරුණීපාත ජලය	100,

ප්‍රයෝගය:

අග්නිමාන්ද්‍ය නාශක යි. ආම පාචක යි.

මාත්‍රාව:—බින්දු 5-15 දක්වා වේ.

5. අජමෝද ද්‍රව සාරය:— (Aqua Ajwan or Pthychotis)

සංයෝගය:—

අජමෝද තෛලය	2,
සුරාසාර (90%)	60,
වාරුණී පාත ජලය	100,

ප්‍රයෝගය:—

ආධ්මාන, උද්ගාර, ආම අවස්ථා නසයි. කාමිරෝග අවස්ථාවනට ද යෝග්‍ය වේ.

මාත්‍රාව:—බින්දු 5-15 දක්වා වේ.

6. කර්පූර සාරය:— (Aqua Camphar)

සංයෝගය:—

කර්පූර	1,
සුරසාර (90%)	2,
වාරුණි පාත ජලය	100.

ප්‍රයෝගය:—

අන්ත්‍ර ශූල නාශක ය; ආම පාචක ය; ඝර්ම කාරක ය; ජ්වරයනට ද හිත වේ.

මාත්‍රාව:—අවුන්ස 1/2-1 දක්වා වේ.

ඖෂධ සාර ගණය

1. හිංගු සාරය:— (Tinc Asafoetida)

සංයෝගය:—

හිංගු	2,	
සුරාසාරය (70%)	10,	
ශෝධිත ජලය	15,	(අවශ්‍ය ප්‍රමාණය)

ප්‍රයෝගය:—

ආමපාචක ය; මලබද්ධහාරක ය; උදර ශූල නාශක ය.

මාත්‍රාව:—බින්දු 30-60 දක්වා වේ.

2. මාංසි සංයෝග සාරය:— (The Veleriana Co.)

සංයෝගය:—

මාංසි චූර්ණය	200,
ජාතිඵල තෛලය	3,
නිම්බු තෛලය	2,
තනු ඇමෝනියා ද්‍රාවක	100,
සුරා සාරය (60%)	1000,
ශොධිත ජලය	5.

ප්‍රයෝගය:—

නාඩික්‍රියා අවසාදකත්වය දනවයි. අපස්මාර ගණයේ රෝග සඳහා හිතවති.

මාත්‍රාව:—බින්දු 30-60 දක්වා වේ.

3. ශුණ්ඨි සාරය:— (Tinc Zingiberis)

සංයෝගය:—

තනු වර්ගය	1.	ශුණ්ඨි සත්වය	5,
		සුරා සාරය (90%)	10,
සාන්ද්‍ර වර්ගය	2.	ශුණ්ඨි සාරය	20,
		සුරාසාරය	100.

ප්‍රයෝගය:—

අග්නිවර්ධක වෙ. ආම පාචක ය.

මාත්‍රාව:—සාන්ද්‍රය, බින්දු 5-10 යි. — තනු බින්දු 30-60 යි.

4. විෂතින්දුක සාරය:— (Tinc Nux Vomica)

සංයෝගය:—

විෂතින්දුක තරල සාරය	83.4,
සුරා සාරය (90%)	500,
වාරුණී පාන ජලය	1000,

ප්‍රයෝගය:—

විෂ ද්‍රව්‍යයකි. එහෙයින් අධික මාත්‍රාව මාරක වෙ.

මාත්‍රාව:—බින්දු 5-30 දක්වා වෙ.

5. අහිඵේන සාරය: (Tinc Opii)

සංයෝගය:—

අහිඵේන	200,
සුරා සාර (90%)	500,
ශොධිත ජලය	1000,

මිශ්‍රණය මෝෆින් 10% ක් යෙදෙන අයුරිනි.

ප්‍රයෝගය:—

අහිඵේන ද විෂ ද්‍රව්‍යයකි. එහෙයින් එහි අධික මාත්‍රාව මාරක වෙ. අජීර්ණ, විසූචිකා, අතිසාර රෝග වලට පක්වාවස්ථාවෙහි යෝග කළ හැකි ය. පුරාණ කාසයට මනා ය. නාඩික්‍රියා අවසාදය කෙරෙයි. නිද්‍රා කාරක, ශාන්ත කාරක ද වනු ඇත.

මාත්‍රාව:—බින්දු 5-30 දක්වා වෙ.

6. එලා සාර සංයෝගය:— (Tinc Cardamom Co)

සංයෝගය:—

එලා බීජ	14,
ජීරක	14,
ත්වක්	28,
කොචිනීල්	7,

ග්ලසරින්, 50 මි:ලි:

සුරා සාර (60%) 1000.

ප්‍රයෝගය:—

ආමපාචක. අග්නි වර්ධක වෙ.

මාත්‍රාව:—බින්දු 30–60 දක්වා වෙ.

7. කර්පූර සාර සංයෝගය:— (Tinc Comphor Co)

සංයෝගය:—

අහිඵේන සාරය	50,
බෙන්සොයික් ඇසිඩ්	5,
කර්පූර	3,
ශුල්ඵා තෙලය	3,
සුරාසාර (60%)	1000.

ප්‍රයෝගය:—

ආම පාචක වේ; හෘත් උත්තේජක ය; ඝර්ම කාරක ය; ජ්වරඝ්න ය; පුරාතන කාසය සඳහා මනා ය. කඵනිඃසාරක ද වේ.

මාත්‍රාව:—බින්දු 30–60 දක්වා වේ.

8. ලශුන සාරය:— (Tinc Garlic)

ප්‍රයෝගය:—

විෂබීජ නාශකය; ආධ්මාන හර ය; අග්නිමාන්ද්‍යය, පුරාතන කාසය, සූතිකා රෝග අවස්ථා සඳහා යෙදේ.

මාත්‍රාව:—බින්දු 30–60 යි.

9. ගුග්ගුලු සාරය:— (Tinc Guggul)

ප්‍රයෝගය:—

ඝර්මකාරක, මූත්‍රකාරක ශක්තියෙන් යුක්ත වේ. ආමවාත, වාතරක්ත. වාතරෝග අවස්ථා සඳහා ද ප්‍රයෝග කෙරේ.

මාත්‍රාව:—බින්දු 30–60 දක්වා.

10. අජ්වාන් සාරය:— (Tinc Ajwan)

ප්‍රයෝගය:—

අග්නිමාන්ද්‍යය, කෘමි රෝග, අජීර්ණ, ආධ්මාන නසයි.

මාත්‍රාව:—බින්දු 30–60 යි.

11. චිරතා සාරය:— (Tinc Chirata)

ප්‍රයෝගය:—

විෂමජ්වර නාශක වේ. පුරාතන ජ්වර, කාමලා, අග්නිමාන්ද්‍ය, යනාදි රෝග අවස්ථා සඳහා ද මනා ය.

මාත්‍රාව:—බින්දු 30–60 දක්වා වේ.

12. කුෂ්ඨ සාරය:— (Tinc Kusta)

ප්‍රයෝගය:—

කම්පනිවාරක වේ. කඵනිඃසාරක ද වනු ඇත. කාස, ශ්වාස, රාජයක්ෂ්මා, ගලරෝග, ඵුප්ඵුස රෝග සඳහා යෝග්‍ය වේ.

මාත්‍රාව:—බින්දු 5–30 දක්වා වේ.

13. කනක සාරය:— (Tinc Kanaka)

ප්‍රයෝගය:—

කම්ප නිවාරක වේ.

මාත්‍රාව:—බින්දු 5–30 දක්වා වේ.

ඖෂධ තරලසාර ගණය

1. සංස්කරණය:—යෂ්ටිමධු තරලසාරය:—

යෂ්ටිමධු චූර්ණය (පොතුහැර)	1000
මෝහිනී = ක්ලොරොපෝම් ද්‍රවය,	
සුරාසාරය = 90%ඇල්කොහොල්	යෝග්‍ය ප්‍රමාණය

ප්‍රයෝගය:—

නෙත්‍ර රෝගයනට හිතවති; බලකාරක ය; වර්ණකාරක ය; ශුක්‍ර ජනක ය; කේශ්‍ය ය; පිත්ත, වාත රක්ත රෝග නසයි. වර්ණශෝථ, විෂ, වමනය, තෘෂ්ණා, ග්ලානි යන උපද්‍රවයනට යෝජ්‍ය වේ. ක්ෂය, ශෝෂ රෝගයනට ද ප්‍රත්‍යක්ෂ ය.

මාත්‍රාව:—බින්දු 30-60 දක්වා වේ.

2. ස්වර්ණ පත්‍රි තරල සාරය:—

සංස්කරණය:—

ස්වර්ණපත්‍රි = සෙනෙහෙකොළ චූර්ණය	1000	(ග්‍රෑ:)
ධාන්‍යක තෛලය	6	(මි:ලි:)
සුරාසාර (90%)	250	(මි:ලි:)
මොහිනි ද්‍රව්‍ය (ක්ලොරොපෝම්) මිශ්‍ර		
වාරුණී පාත ජලය යෝග්‍ය ප්‍රමාණය, එනම්:	1000	(මි:ලි:)

ප්‍රයෝගය:—

මල භේදකය, අග්නිමාන්ද්‍යය දුරු කෙරේ. යකෘත්දාල්‍යුදරය, ප්ලිහෝදර, බද්ධ ගුදය, අජීර්ණය, විෂමජ්වරය, කාමලා, පාණ්ඩු යන රෝගයනට යෝග්‍ය වේ·

මාත්‍රාව:—බින්දු 10–30 දක්වා වේ.

3. ධාන්‍යක තරල සාරය :—

සංස්කරණය :—

වියලි කොත්තමල්ලි බීජයන්ගෙන් තරල සාර පරිභාෂා අනුව පිළියෙල වේ.

ප්‍රයෝගය :—

මූත්‍රකාරක ය, අග්නිවර්ධක ය, ආමපාචක ය, ජ්වර නසයි. ත්‍රිදෙෂ නාශක ය. තෘෂ්ණා, දහ, වමන, ශ්වාස, කාස, අර්ශස්, කෘමි යන රෝගෝපද්‍රව නාශක ද වේ.

මාත්‍රාව :—ධරම 1/2 – 1 දක්වා වේ.

4. ගුඩූචි තරල සාරය :—

සංස්කරණය :—

රසකිඳ දඬුයෙන් තරල සාර පරිභාෂා අනුව පිළියෙල වන්නේ යි.

ප්‍රයෝගය :—

ත්‍රිදෙෂඝ්න ය, මූත්‍රකාරක ය, ජ්වරඝ්න ය, අග්නිදීපක ය, කුෂ්ට, කාමලා, පාණ්ඩු, වාතරක්ත, කෘමි යන රෝගාවස්ථාවනට ද යෝග්‍ය වේ. ප්‍රදර, සොමරොග, මෙහ යන රෝගයනට ද හිතවති. ආම, තෘට, දහ කාස, හික්කා, වමන, යන උපද්‍රවයනට ප්‍රයෝග කරණු ලැබේ.

මාත්‍රාව :—ධරම 1/2 – 1 යි.

5. සප්තපර්ණී තරල සාරය :—

සංස්කරණය :—

වියලි රුක් අත්තන පොතු වලින් තරල සාර නිර්මාණ විධි අනුව පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

වරණ, ශ්ලේෂ්මවාත රෝග, කුෂ්ඨ, ඇස්රෝග, කෘමිරෝග, නාශක ය. ශ්වාස, ගුල්ම, ශූල යන උපද්‍රව දුරු කෙරේ. විෂමජ්වරයට ද යෝග්‍ය වේ.

මාත්‍රාව :—ධරම 1/2 – 1 යි.

6. තුලසි තරල සාරය :—

සංස්කරණය :—

වියලි මදුරු තලා පැලෑටියෙන් පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

හෘද්‍ය ය; උෂ්ණ ය, දහය පිත්තය වඩයි. කුෂ්ඨ, මූත්‍රකෘච්ඡ්‍ර, ඇස්රෝග, පාර්ශ්වරුජා සහ කඵවාත රෝග අවස්ථා නසයි. තවද විෂමජ්වරයට ද, කඵජ කාසයට ද යෝග්‍ය වේ.

මාත්‍රාව :—ඩ්‍රැම් 1/2 - 1 යි.

7. කිරාතතික්ත තරල සාරය :—

සංස්කරණය :—

වියලි වල් බිංකොහොඹ පැලෑටියෙන් තරලසාර පරිභාෂා අනුව සකස් කරනු ලැබේ.

ප්‍රයෝගය :—

සන්නිපාත ජ්වරය, ශ්වාස, කඵපිත්තජ අවස්ථා, රක්තරෝග, දහ, කාස, ශෝථ, තෘට, කුෂ්ඨ, විෂමජ්වර ව්‍රණ, කෘමිරෝගාවස්ථාවනට ද යෝග්‍ය වේ. මලධ්වංසක ය. බාලක රෝග සඳහා ද හිතවත් වේ.

මාත්‍රාව :—ඩ්‍රැම් 1/2 – 1 දක්වා වේ.

8. පර්පටක තරල සාරය :—

සංස්කරණය :—

වියලි පත්පාඩගම් පැලෑටියෙන් තරල සාර පරිභාෂා අනුව පිළියෙල වේ.

ප්‍රයෝගය :—

පිත්තාස්‍රරෝග, කඵජ්වර, කඵපිත්තජ්වර, නසයි. භ්‍රම, තෘෂ්ණා, දහ, අරුචි, ග්ලානි, මද යන උපද්‍රව ද දුරු කෙරේ.

මාත්‍රාව :—ඩ්‍රැම් 1/2 – 1 දක්වා වේ.

9. ධන්වයාස තරල සාරය :—

සංස්කරණය :—

වැල්කසඹිලියා පැලෑටියෙන් තරලසාර පරිභාෂා අනුව පිළියෙල කරනු ලැබේ. (වැල්කසඹිලියා ප්‍රතිනිධිය යි.)

ප්‍රයෝගය :—

කඵජ රෝග, මේද, මද, භ්‍රම, පිත්තාස්‍ර, කුෂ්ඨ, කාස, තෘෂ්ණා, විසර්ප, වාතරක්ත, විෂමජ්වර, යන රෝගෝපද්‍රව නසයි. ශ්ලේෂ්ම පිත්ත, ඡර්දි, දහ යන උපද්‍රව අවස්ථා ද ශමනය කෙරේ.

මාත්‍රාව :—ඩ්‍රැම් 1/2 – 1 යි.

10. භූනිම්භ තරල සාරය :—

සංස්කරණය :—

බිංකොහොඹ පැලෑටියෙන් සකස් කරණු ලැබේ.

ප්‍රයෝගය :—

විෂම ජ්වරය, ආධ්මානය, යකෘත්රෝග සඳහා යෝග්‍ය වේ. තික්ත ය, සාරක ය, කෘමිඝ්න ය, අග්නි වර්ධක ය. පාණ්ඩු, ශ්වාස යනා දී උපද්‍රවයන් ද නසයි.

මාත්‍රාව :—ඩ්‍රැම් 1/2 - 1 දක්වා වේ.

11. **මඤ්ජිෂ්ඨා තරල සාරය :—**

සංස්කරණය :—

වියලි වැල් මදටිය වැලින් තරල සාර පරිභාෂා අනුව සකස් කරණු ලැබේ.

ප්‍රයෝගය :—

ස්වර කාරක, වර්ණකාරක වේ. ශ්ලේෂ්මජ රෝග අවස්ථා නසයි. යෝනි, අක්ෂි, කර්ණ රුජාවනට යෝග්‍ය වේ. රක්තාතීසාර, කුෂ්ඨ, වාතරක්ත, විසර්ප, වර්ණ, මේහ යන රෝගයනට හිතවත් ය. ශෝථඝ්න ය. මූත්‍ර කාරක ය.

මාත්‍රාව :—ඩරැම 1/2 - 1 දක්වා වේ.

12. **නිම්බත්වක් තරල සාරය :—**වියලි කොහොඹපොතු වලින් තරලසාර විධියෙන් සකස් කෙරේ. මාත්‍රාව **ඩරැම 1/2 — 1 දක්වාය.**

13. **වෙනිවැල් තරල සාරය :—**වියලි වෙනිවැල් වලින් තරලසාර පරිභාෂා අනුව පිළියෙල කෙරේ. ,, ,, ,,

14. **ශාරිබා තරල සාරය :—**වියලි ඉරමුසු වලින් තරලසාර පරිභාෂා අනුව පිළියෙල කෙරේ. ,, ,, ,,

15. **බිල්ව තරල සාරය :—**

සංස්කරණය :—

වියලි බෙලි මද වලින් තරල සාර පරිභාෂා අනුව පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

වාතශ්ලේෂ්ම නාශක ය. ග්‍රාහී ය, අග්නි වර්ධක ය, බල්‍ය ය, ආමපාචක ය, වමනනාශක ය, ග්‍රහණී-අතීසාර අජීර්ණ, යන රෝගයනට ශ්‍රේෂ්ඨ ය. මූත්‍රකාරක ද ජ්වරඝ්න ද වේ.

මාත්‍රාව :—ඩරැම 1/2 - 1 දක්වා වේ.

16. **කුටජ තරල සාරය :—**

සංස්කරණය :—

වියලි කෙළිඳ පොතු වලින් පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

දීපන, තික්ත, ග්‍රාහි, ගුණයෙන් යුක්ත වේ. අර්ශස්, අතීසාර, පිත්තාස්ර, කඵ රෝගයනට යෝග්‍ය වනු ඇත. තෘෂ්ණා, ආමදෝෂ, කුෂ්ඨ, ප්ලීහාමය, කෘමි රෝග යන අවස්ථාවනට ද මනා ය .

මාත්‍රාව :—ඩරැම 1/2 - 1 දක්වා වේ.

17. **ලෝධ්‍ර තරල සාරය :—**

සංස්කරණය :—

ලොත් වලින් තරල සාර පරිභාෂා අනුව පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

ග්‍රාහී ය, ලඝු ය, නෙත්‍රරෝගයනට යෝග්‍ය වේ. රක්ත පිත්ත, අස්රුරෝග, ජ්වරාතීසාර, ශෝෂ යන රෝග උදෙසා ද මනා ය. තෘෂ්ණා, භ්‍රම, අරෝචක, විෂ යන උපද්‍රවයනට ද සුදුසු ය.

මාත්‍රාව :—ඩරැම 1/2 - 1 දක්වා වේ.

18. **අර්කමූල තරල සාරය :—**

සංස්කරණය :—

වියලි එලවරා මුල්පොතු වලින් පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

වාත, කුෂ්ඨ, කණ්ඩු, විෂාවස්ථා, ව්‍රණ, ප්ලීහ, ගුල්ම, අර්ශස්, ශ්ලේෂ්මෝදර, කෝෂ්ඨකෘමි රෝග ශාන්ත කෙරේ. කාසශ්වාස රෝගාවස්ථා සඳහා ද යෝග්‍ය ය. ශ්ලේෂ්ම හාරක ය.

මාත්‍රාව :—බින්දු 5 – 30 යි.

19. දශමූල තරල සාරය :—

සංස්කරණය :—

බෙලිමුල්, මිදිමුල්, පළොල්මුල්, ඇත්දෙමට මුල්, තොටිලමුල්, ශාලපර්ණි, පෘශ්නිපර්ණි, බටුමුල්,කටු වැල්බටු, ගොකටු යන ද්‍රව්‍යයන්ගේ සමභාග සංයෝගයෙන් තරලසාර පරිභාෂා අනුව පිළියෙල වේ.

ප්‍රයෝගය :—

වාතරෝග අවස්ථා සඳහා විශෙෂ වේ. විෂමජ්වර, සූතිකාජ්වර, ඵුප්ඵුස රෝග සඳහා ද යෝග්‍ය වේ.

මාත්‍රාව :—ඩ්‍රෑම 1/2 – 1 දක්වා වේ.

20. අර්ජුන තරල සාරය :—

සංස්කරණය :—

වියලි කුඹුක් පොතු වලින් තරල සාර පරිභාෂා අනුව පිළියෙල කළ යුතු ය.

ප්‍රයෝගය :—

හෘද්‍යය, ක්ෂත, ක්ෂය, විෂ, අස්රුරෝග, මේද, මේහ, කඵ පිත්ත රෝග නසයි. ව්‍රණ ශෝධක ය, පිත්තාස්‍ර අවස්ථා, තෘට, භග්න යන රෝග අවස්ථාවනට ද යෝග්‍ය වේ. රක්ත ශමනය ද වේ.

මාත්‍රාව :—ඩ්‍රෑම 1/2 – 1 දක්වා වේ.

21. වාසක තරල සාරය :—

සංස්කරණය :—

වංඇපල මුල් පොතු වියලා එයින් තරල සාර පරිභාෂා අනුව පිළියෙල කළ යුතු ය.

ප්‍රයෝගය :—

ස්වර ප්‍රසාදකය; කඵපිත්ත, රක්ත දෙෂ නසයි. ශ්වාස, කාස, ජ්වර, ඡර්දි, මේහ කුෂ්ඨ යන රෝගවස්ථාවනට ද, හිතවත් ය. ක්ෂය රෝගය, අර්ශස්, හෘද්රෝගයනට ද ශ්‍රේෂ්ඨ ය.

මාත්‍රාව :—ඩ්‍රෑම 1/2 – 1 දක්වා වේ.

22. කණ්ටකාරි තරල සාරය :—

සංස්කරණය :—

වියලි කටුවැල් බටු පැලෑටියෙන් පිළියෙල කළ යුතු ය.

ප්‍රයෝගය :—

අග්නිදීපක ය. ආමපාචක ය, කාස, ශ්වාස, ජ්වර, කඵවාතජ රෝග, පීනස, පාර්ශ්ව ශූල, කෘමි, හෘද්රෝග, ආමදෙෂ, ගුල්ම, ප්ලීහ රෝග යන රෝග උපද්‍රවයන් උදෙසා යෝග්‍ය වේ. වාත කඵ උල්බන, අවස්ථා සඳහා ද මනා ය.

මාත්‍රාව :—ඩ්‍රෑම 1/2 – 1 දක්වා වේ.

23. ගෝක්ෂුර තරල සාරය :—

සංස්කරණය :—

වියලි ගොකටු පැලෑටියෙන් තරල සාර පරිභාෂා අනුව පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

වස්ති ශෝධක ය, බල්‍ය ය, පුෂ්ටිකාරක ය, අශ්මරි නාශක ය. ප්‍රමේහ, මූත්‍ර කෘච්ඡ්‍ර, හෘද්රෝග. ශ්වාස, කාස, වාතරෝග සඳහා ද යෝග්‍ය වේ.

මාත්‍රාව :—ඩ්‍රැම් 1/2 – 1 දක්වා වේ.

24. පුනර්නවා තරල සාරය :—

සංස්කරණය :—

වියලි සාරණ පැලැටියෙන් පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

වාතජනක ය, ග්‍රාහී ය, ශ්ලේෂ්ම, පිත්ත රක්ත රෝග නසයි. සාරක ය, ශෝථ, රක්ත ප්‍රදර, පාණ්ඩු, පිත්තජ රෝග, හෘද් රෝග, ශ්වාස, වාත කඵජරෝග යන අවස්ථාවනට යෝග්‍ය වේ.

මාත්‍රාව :—ඩ්‍රැම් 1/2 – 1 දක්වා වේ.

25. කුෂ්ඨ තරල සාරය :—

සංස්කරණය :—

කොට්ටං අලයෙන් තරල සාර පරිභාෂා අනුව සකස් වේ.

ප්‍රයෝගය :—

වාතරක්ත, වාතකඵ රොගාවස්ථා ද, විසර්ප, කාස, කුෂ්ඨ යන රෝග ද නසයි. හික්කා, ජ්වර, ශ්වාස, විෂාවස්ථා ද ශාන්ත කෙරේ.

මාත්‍රාව :—බින්දු 5 – 15 දක්වා වේ.

26. සර්පගන්ධා තරල සාරය :—

වියලි ඒකාවේරිය මුල්වලින් තරල සාර ක්‍රමයෙන් පිළියෙල කෙරේ.

මාත්‍රාව :—බින්දු 2 – 5 දක්වා ය.

ප්‍රයෝගය :—

අධික රුධිර පිඩන, අනිද්‍රා, උන්මාද, මානසික රෝග අවස්ථාවන් හි යෙදේ.

27. විඩංග තරල සාරය :—

සංස්කරණය :—

වියලි වළභසාල් බීජයන්ගෙන් පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

උදරගත කෘමිඝ්න ය, රූක්ෂ ය, බලකාරක ය, ශූල, ආධ්මාන, උදර රෝග, වාතවිබන්ධ නසයි. වාත කඵජ අවස්ථා ශමනය කෙරේ. අග්නිමාන්ද්‍යය දුරු කෙරේ.

මාත්‍රාව :—ඩ්‍රැම් 1/2 – 1 දක්වා වේ.

28. බ්‍රාහ්මී තරල සාරය :—

සංස්කරණය :

වියලි ලුණුවිල පැලැටියෙන් තරල සාර පරිභාෂා අනුව පිළියෙල කෙරේ.

ප්‍රයෝග :—

මේධ්‍ය ය, බුද්ධිවර්ධක ය, සර ගුණයෙන් යුක්ත ය, රසායන ය, ස්වරදයක ය. ස්මෘතිජනක ය. පාණ්ඩු, මේහ, අස්රුරෝග, කාස, විෂාවස්ථා, තෘෂ්ණා, ශෝථ, ජ්වර යන රොගෝපද්‍රවයනට යෝග්‍ය වේ. කුෂ්ඨ, කණ්ඩු, ප්ලීහ, රෝග, වාත කඵ රෝග නසයි.

මාත්‍රාව :—බින්දු 10 – 60 දක්වා වේ.

29. **අශෝක තරල සාරය :—**

සංස්කරණය :—

වියලි අශෝක පොතුවලින් පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

ග්‍රාහි ය, අපචි, තෘට, දහ, කෘමි, ශෝථ, විෂ, අස්රුරෝග නාශක ය, පිත්තජ රෝග. ගුල්ම, උදර, ශූල, ආධමාන, අර්ශස්, විරණ, ජ්වර, රක්ත ප්‍රදර යන උපද්‍රවයනට ද යෝග්‍ය වේ.

මාත්‍රාව :—ඩ්‍රැම 1/2 - 1 දක්වා වේ.

30. **අජමෝද තරල සාරය :—**

සංස්කරණය :—

අයමෝදගම් බීජයෙන් තරල සාර පරිභාෂා අනුව සැකැසේ.

ප්‍රයෝගය :—

පිත්ත කාරක ය. ශූල නාශක ය, වාත ශ්ලේෂ්ම රෝග නසයි. උදර, ආනාහ, ගුල්ම, ප්ලීහ රෝග, කෘමි, යන රෝගාවස්ථාවනට ද යෝග්‍ය වේ. වමනය,, ශුක්‍ර දෙෂ, හෘද්රෝග, ගුල්ම, යන අවස්ථාවනට ද සුදුසු ය.

මාත්‍රාව :—ඩ්‍රැම 1/2 – 1 දක්වා වේ.

31. **අශ්වගන්ධා තරල සාරය :—**

වියලි අමුක්කරා අල වලින් සංස්කරණය කෙරේ.

32. **ශතාවරි තරල සාරය :—**

වියලි හාතාවාරිය අල වලින් සංස්කරණය කෙරේ.

ප්‍රයෝගය මාත්‍රාව :—

එම ද්‍රව්‍යයන්ගේ ගුණ ප්‍රයෝගයනට අනුරූපව ය.

335-336-337 පිටුවල ඇතුළත් සුරාසව වර්ග පහත සඳහන් ක්‍රමයට පිළියෙල වේ.

ක්වාථ සංස්කරණ.

ක්වාථ කල්පනා

පැරණි ක්වාථ කල්පනාවේ ම විකාශයක් වන නවීන මද්‍ය සංයුක්ත ක්වාථ පරිභාෂාව ආයුර්වේද භෛෂජ්‍ය කල්පනා සිද්ධාන්ත යන්ට, වෙනම මෙහි ඇතුළත් කළ යුතු ය. චරක කල්පස්ථානයෙහි සුරා යුක්ත ලොධ්‍ර කෂාය ආදර්ශයක් ලෙස ගැනේ.

1. මද්‍යසාරමිශ්‍ර ක්වාථ :— ශක්තිය රාශිභූත කොට සිද්ධ කරණ ලද ක්වාථයන්හි මද්‍යසාර (Alcohol) හෝ ස්ප්‍රිතු (Rectified Spirit) සියයට ගණනක් මිශ්‍ර කිරීමෙන් සිද්ධ කෙරේ. ඒ සඳහා මද්‍යසාර 5 – 10% දක්වා ප්‍රමාණයෙන් මිශ්‍ර කෙරේ.

2. මද්‍යසාර ස්වයංජාත කරණය :— ශක්තිය රාශිභූත කොට සිද්ධ කරණ ලද ක්වාථයන්හි මධු, ගුඩ, සීනි, ද්‍රාක්ෂා, මීපුප්, ධාතකී සංයෝගයෙන් අරිෂ්ට ආසව පරිභාෂාව අනුව සුරා ඉපදවීමෙන් සිද්ධ කෙරේ.

නිදර්ශන :

සුරා යුක්ත ලෝධ්‍ර ක්වාථය :— චරක, කල්ප, 9 අධ්‍යාය. 5 පද්‍යය.

ලෝධ්‍ර ක්වාථය හා සම ප්‍රමාණයක් සුරා මිශ්‍රකොට සුදුසු බඳුනෙක්හි බහා කඩමැටි බැඳ පසළොස් දිනක් තබා ඉක්බිති පෙරා ගන්නේ ය. විරේචනය සඳහා ය.

දශමූල ක්වාතය

දශමූල එක් එක් ද්‍රව්‍යය තෝලා 64 බැගින්	=	තෝලා	640	යි.	(ග්‍රෑ: 7680) හෙවත්
		රාත්තල්	16	යි.	(ලී. 7680 යි)
ජලය		රාත්තල්	128	යි.	(ලී. 61,440 යි)

ශේෂය	රාත්තල්	32	යි.	(ලී. 15. 360 යි)
ගුඩ හෝ සීනි	රාත්තල්	12 1/2	යි.	(ග්‍රෑ: 6000 යි)
ධාතකී (ඡටාංක 10)	තෝලා	50	යි.	(ග්‍රෑ: 600 යි)
*මුද්දරප්පලම් මීපුප් හෝ රටඉඳි	තෝලා	50	යි.	(ග්‍රෑ: 600 යි)

සංස්කරණය:—ක්වාථ්‍ය ද්‍රව්‍ය සෝද පවිත්‍ර කොට වියලා සියුම් ලෙස කිරා, සමාන ලෙස කපා. තලා, පවිත්‍ර ජලය (රසායන ද්‍රව්‍ය ආදිය අමිශ්‍රව) බහා මධ්‍යම අග්නියෙන් සතරින් එකට සිඳුවා ගන්නේ ය. සිසිල් වූ පසු ගුඩ හෝ සීනි දියකර පෙරා ගත යුතු ය. සෝද, වියලා, ඉතා හොඳින් තලා ගත් ධාතකී සහ සෝද, තම්බා ගත් මුද්දරප්පලම්, මීපුප් හෝ රටඉඳි මිශ්‍ර කළ යුතු යි. කට පළල් මැටි—චීන මැටි හෝ තේක්ක ලී භාජනයෙක්හි බහා පෙනේර රෙද්දක් වැනි දුහුලකින් මුව වසා තැබිය යුතු යි. දිනපතා නියමිත වේලාවන්හි පවිත්‍ර දණ්ඩකින් ක්වාථය තදින් ආලොඩනය කරන්නේ ය. එහි උපදින අංගාර වායුව (Carbonic acid gas) ඉවත් වීමට අවකාශ දිය යුතු ය. මෙසේ දිනපතා ආලොඩනය කරණ අතර පහන් තිරයක් හෝ ගිනිකූරක් දල්වා භාජනය තුළට ලංකරන්න. වහා නිවී යේ නම්, සන්ධානය අයථාපන්න ය. දින 5–7 අතර කාලයේ දී සන්ධානය සම්පූර්ණ වන්නේ ය. ගිනිදැල්ල මනා සේ දල්වේ නම් සුරාසාර උපන් බව සැලකිය යුතු ය. එවිට බාහිර වායුව ඇතුළු නො වන සේ වහා ම කඩමැටි බඳින්නේ ය. රෙදි පට 5–7 ක් පමණ සෑහෙයි. මසක් සම්පූර්ණ වූ විට මැටිකඩ ඉවත් කොට කට කුඩා භාජනයෙක් හි බාහිර වාතය ඇතුළු වීමට අවකාශ නො තබා වහා පෙරා ගන්නේ ය. ඉන්පසු දින කිපයකට පසු නැවත පෙරා ක්වාථයෙන් 1/8 ක් සීනි මිශ්‍ර කොට පෙරා ගැනීමෙන් නැවත සන්ධාන ක්‍රියාරම්භය වළකින අතර රසය මිහිරි වේ.

මාත්‍රාව :— කර්ෂ 1–2 (ග්‍රෑ: 15–30) දක්වා ආහාරයට පසු සමභාග ජලය සමග තිප්පිලි සුණු ප්‍රතිවාප යොද ගැනේ.

ප්‍රයෝග :— වා සෙම් උණ, සූතිකා රෝග, හෘදය රෝග, පාර්ශ්ව ශූල ආදියෙහි යෙදේ.

අති කඨින ද්‍රව්‍ය ක්වාථකරණයෙහි දී අටින් එකට සිඳුවා ගත යුතු ය.

කාඨා, ප්‍රවාහි, කඩු යන නාමයෝ ක්වාථ පර්‍යාය වෙති.

*ඖෂධ සංග්‍රහ සම්පාදක කමිටුවේ තීරණයෙකි. (පරිශිෂ්ටය බලන්න).

ක්වාථතරලසාර.

පරිභාෂාව :—

ක්වාථ්‍ය ද්‍රව්‍ය එක් ගුණයකට අට ගුණයක් ජලය ලා එකට සිඳුවා පෙරා ගනු ලැබේ. පසුව එය සුරා සාර ප්‍රමාණයට සමාන වන සේ ජලය සිඳෙන අයුරින් යලි කකාරා එම ක්වාථ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණයක් ගෙන විනිසේටර් යන්ත්‍රයෙන් කුඩා කැබලිවලට කඩා සුරාසාර බහා රැයකට වරක් කලතමින් තුන් රැයක් තබා, එයට කලින් පිළියෙල කළ ක්වාථය බහා සත් රැයක් තබා පීඩන යන්ත්‍රයෙන් පෙරා ගන්නේ යි. සුරාසාර 5–10% අතර සුදුසු ප්‍රමාණයක් යොදන්නේ ය. කල්කය 1/4 කි.

යෝගය ක්වාථ ශීර්ෂයෙන් බලන්න.

1. **මහාරාස්නාදි ක්වාථතරලසාරය :—**

සංස්කරණය :—

මහාරාස්නාදි ක්වාථ්‍ය ද්‍රව්‍ය ක්වාථතරලසාර ක්‍රමය අනුව පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—

සර්වාංග කම්පය, කුබ්ජත්වය, පක්ෂාඝාත, අවබාහුක, ශාධරසි, ආමවාත, ශ්ලීපද, අපතානක, අන්ත්‍රවෘධි, ආධ්මාන, ජංඝා-ජානුගත වාත, අර්දිත, ශුක්‍ර රෝග, මෙඪ්‍ර රෝග, යෝනි රෝග යන රෝගයනට යෝග්‍ය වේ.

මාත්‍රාව :—ඩ්‍රැම් 1 – 2 යි.

2. **මහා මඤ්ජිෂ්ඨාදි ක්වාථතරලසාරය :—**

මහාමංජිෂ්ඨාදි ක්වාථ්‍ය ද්‍රව්‍ය ක්වාථතරලසාර සංස්කරණ පරිභාෂා අනුව පිළියෙල කෙරේ.

ප්‍රයෝගය :—ක්වාථ ශීර්ෂයෙහි බලන්න.

මාත්‍රාව :—ඩ්‍රැම් 1 – 2 යි.

3. දශමූල ක්වාථතරලසාරය :—ඉහත දී විස්තර විය.

1. අමෘතෝශිරාදී තරලසාරක්වාථය:

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— ආමජ්වර පාචක යි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

2. ප්‍රාණදජමොදවිශ්වාදී තරලසාරක්වාථය:

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— මන්දග්නි, ආම, ගුල්ම, අජීර්ණ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

3. දරුපර්පටාදී තරලසාරක්වාථය:

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— කඵවාත ජ්වර හික්කාශ්වාස, කාසක්ෂය යනාදි රෝගවලට නියමිත ය.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

4. නිදිග්ධිකාදී තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— ජ්වර කාසශ්වාස නාශක යි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

5. ක්ෂුද්‍රාමෘතාදී තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— ශ්වාසකාස, අරුචි, ජ්වර.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

6. ධාන්‍යපංචක තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— ජ්වරාතිසාර, ආම, අජීර්ණ නසයි. දීපන පාචක ය.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

7. කාලශාකාභයාදී තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— ආම, ගුල්ම, ශූල, පිනස සඳහා යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

8. ශතාවරිගෝපකන්‍යාදී තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— අධෝගත හා ඌර්ධ්වගත රක්ත පිත්ත, ප්‍රදර, උන්මාද, දහ, යන රෝග සඳහා යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

9. ත්‍රිවෘත්ද්‍රාක්ෂාභයාදී තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය:
ප්‍රයෝගය :— ඌර්ධ්වගත රක්තපිත්ත නාශක යි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

10. විරබිල්ව පුනර්නවාදී තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— අර්ශස්, භගන්දරා, ගුල්ම නසයි. ජඨරාග්නි වර්ධනය කරයි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

11. **අභයාකණාදි තරලසාරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— උදවර්ත, මන්දග්නි නසයි. වාතානුලෝමන යි.

12. **බලාබිල්වශුණ්ඨී තරලසාරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— ජ්වර, ගුල්ම, අර්ශස්, වාතරෝග, අරුචි, වමන, ශිරෝරෝග සඳහා නියමිත ය.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

13. **පුනර්නවාෂ්ටක තරලසාරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— සර්වාංග ශෝථ, උදර, පාර්ශ්ව ශූල, පාණ්ඩු, රෝග සඳහා යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

14. **මුස්තාඛුකර්ණාදි තරලසාරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— කෘමි රෝග සඳහා නියමිත ය.
මාත්‍රාව :— තේ හැදි 1/2 සිට 1 දක්වා.

15. **දන්තිමූලබලාදී තරලසාරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— වාත රෝග, ගෘධ්‍රසී, ක්‍රෝෂ්ටුකශිර්ෂ, අර්දිත, පක්ෂඝාත, අවබාහුක, ඌරුස්ථම්භ සඳහා යොදති.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

16. **ඒරණ්ඩසප්තක තරලසාරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— කටි, හෘද්, ලිංග, දැල ආදියෙහි ඇතිවෙන ශූලයනට නියමිත ය.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

17. **රාස්නාපංචක තරලසාරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— සන්ධිගත, අස්ථිගත, මජ්ජාගත, ආමවාත සඳහා නියමිත යි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

18. **දශමූල බලාරාස්නා තරලසාරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ, පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— සන්නිපාත උණ, කැස්ස, ඇදුම, දැල වේදනා නාශක යි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

19. **පටෝලකටුකාදී තරලසාරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— දහ සහිත වාත රක්තයට නියමිත යි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

20. **මංජිෂ්ඨාදී තරලසරක්වාථය.**

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— අෂ්ටාදශ කුෂ්ඨ, වාත රක්ත, අර්දිත, උපදංශ, ශ්ලීපද, පක්ෂඝාත, මෙදෝදෝෂ නේත්‍ර රෝග යන රෝග සුව කෙරේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

21. මහා රාස්නාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— කම්පවායු, කුදුගැසීම, අංශභාගය, අවබාහුක, ගෘධ්‍රසී, ආමවාත, ශ්ලීපද, අපතානක, අන්ත්‍රවෘධි, අර්දිත, යන රෝග නාශක යි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

22. ගුඩූච්‍යාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— සියලුම උණ, දුවිලි, පිපාසය, වමන, අරුචි, රෝග සඳහා යෝග්‍ය යි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

23. බිල්වඉන්ද්‍රයවාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— වමන, අතිසාර, ග්‍රහණි,
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

24. මූර්වාදි තරලසාරක්වාථය:

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— කළුජවර සඳහා.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

25. බාකුචි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— සියලුම කුෂ්ඨ රෝග හා ශ්විත්‍ර.
මාත්‍රැව :— තේ හැදි 1 – 2 දක්වා.

26. ත්‍රිකටුකාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— සන්නිපාත උණ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

27. රාස්නාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— සියලුම වාතරෝග, පක්ෂාඝාත, අපතානක, හනුස්තම්භ, අර්දිත.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

28. දෙනිඹාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— සන්නිපාත උණ, වා සෙම් උණ සඳහා යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

29. කළුහර තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— කාස, ශ්වාස සඳහා.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

30. දේවදර්ව්‍යාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— සූතිකා ජ්වර, කාස, ශ්වාස, ශූල, මූර්ච්ඡා, කම්ප, ශීර්ෂ ශූල යන රෝගයන්හි යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

31. පංචමූලීලඝුද්‍රාක්ෂාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— වාත පිත්ත ජ්වර, කාමලා, ජීදහ වර ආදියෙහි යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

32. පිප්පල්‍යාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— කඵ ජ්වර, පිටගැස්ම, සන්නිපාත උණ සඳහා යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

33. ශඨ්‍යාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— සන්නිපාත උණ, කැස්ස, ඇදුම, තන්ද්‍රාව ආදියෙහි යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

34. තිකුළුහිංග්වාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— ඇදුම, කැස්ස, වාත කඵ ජ්වරයෙහි යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

35. සප්තපර්ණ්‍යාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝග :— විෂම ජ්වරයෙහි යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

36. බෘහත්‍යාදිගණ තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— සන්නිපාත උණ, ශ්වාස, කාසයන්හි යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

37. තාමලක්‍යාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— පීනස, අර්ශස්, කැස්ස, ඇදුම, ක්ෂය අග්නිමාන්ද්‍ය යන රෝගයන්හි යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

38. දර්ව්‍යාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— විවිධ පාටින් යුත් ප්‍රදර හා ශූල නසයි.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

39. යක්ෂාක්ෂ්‍යාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— සියලුම කෘමිරෝග සඳහා යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1/2 සිට 1 දක්වා.

40. ශුණ්ඨීදර්වාදි තරලසාරක්වාථය.

සංස්කරණය :— තරලසාරක්වාථ පරිභාෂා අනුව ය.
ප්‍රයෝගය :— සූතිකාජ්වර, කාස, ශ්වාස, ශූල, මූර්ච්ඡා, කම්ප, ශීර්ෂ ශූල, පක්ෂාඝාත යනාදියෙහි යෙදේ.
මාත්‍රාව :— තේ හැදි 1 – 2 දක්වා.

සැ.යු. මෙම ක්වාථයන්ගේ වට්ටෝරු ක්වාථ ඛණ්ඩයෙහි විමසන්න. මෙහි සඳහන් නො කරණ ලද ක්වාථයන් ද ඉහත පෙනෙන පාරිභාෂික නියමයන් අනුව තරලසාරක්වාථ වශයෙන් සංස්කරණය අනුමත කෙරේ.

17. අර්ක කල්පනා

ද්‍රව, ද්‍රව්‍යයන් ජලය සමඟ යෝග්‍ය අග්නියෙන් පැසවා ඉන් නඟනා වාෂ්පය යළි ද්‍රව බවට පමුණුවා ගනුයේ අර්ක විධි නම්. අර්ක ශබ්දයෙහි අර්ථය ක්වාථ යනුවෙන් ද තැනෙක විග්‍රහ කෙරේ. ඒ අනුව පැසවීමේ තවත් ක්‍රමයකින් ද්‍රව්‍යගත සාරභූතය ලබා ගැනීම අර්ක විධියෙන් සිදු වේ.

1. නියමය :—

   1. කිටාදීන් විසින් නො සපන ලද ගන්ධාදියෙන් තොර, රසාදියෙන් යුක්ත නවීන උත්තම ද්‍රව්‍ය අර්ක කාර්‍යය සඳහා යොද ගත යුතු වේ.

   2. එහි ලා යෙදෙන ද්‍රව්‍ය අත්‍යන්ත කඨිනය, කඨිනය, ආර්ද්‍රය, බුල්බුලය, ද්‍රව ද්‍රව්‍යය යනුවෙන් පස් වැදෑරුම් වේ. එයින් ආර්ද්‍ර ද්‍රව්‍ය සරස ය, නිරස ය යි දෙපරිදි ය. නිරස ද්‍රව්‍යය ද සදුග්ධ ය, ගුප්ත රස ය යි දෙඅයුරු වේ.

      1. දේවදර, සඳුන්, කිහිරි ආදිය අත්‍යන්ත කඨින ද්‍රව්‍ය වෙති.
      2. අසමෝද, ඉඟුරු, තිප්පිලි, දූරු, බිංකොහොඹ ආදිය කඨින ද්‍රව්‍ය ගණයෙහි වැටෙති.
      3. කුරනම්පලා, අබපලා, නික කොළ, එරඬු, කීකිරිඳිය ආදිය ආර්ද්‍ර සරසද්‍රව්‍ය වෙති.
      4. නුග, ඇසතු, කරීර ආදිය නිරස ආර්ද්‍ර ද්‍රව්‍ය තීක්ෂ්ණදුගධ ද්‍රව්‍ය වෙති.
      5. සාතලා, වජ්‍ර, සේහුණ්ඩ, ශෛරිණී යන ද්‍රව්‍ය තීක්ෂ්ණදුග්ධ ද්‍රව්‍ය වෙති.
      6. දද කිහිරිය, වරා ක්ෂිරිණී ආදිය මෘදුදුග්ධ ද්‍රව්‍ය නම්.
      7. කෝමාරිකා, අක්කපාන ආදිය බුල්බුල ද්‍රව්‍ය වෙති.
      8. බහුවාර (ලෝලු) ඈදිය පිච්ඡිල ද්‍රව්‍ය ගණයෙහි වැටෙති.
      9. දෙඩම්, අන්නාසි ආදිය ඵල වර්ගය වේ.
      10. ද්‍රව පදර්ත්ථ ද්‍රව ගණයෙහි වැටේ. දී ගිතෙල් ආදිය යි.

2. කාර්‍ය විධිය :—

   1. අත්‍යන්ත කඨින ද්‍රව්‍ය කෙඳි ඉහිරී බූසි (හුසි) වන ආකාරයට කොටා එමෙන් දෙගුණයක් ජලය ලා ප්‍රහර 4 ක් අව්වේ ද ප්‍රහර 4 ක් පින්නේ ද තබා ද්‍රවය සිඳුවා ද්‍රව්‍ය මෘදු කොට ගත යුතු ය. ඉක්බිතිව ද්‍රව්‍යය හා සමාන භාගයක් ජලය ලා අර්ක යන්ත්‍රයෙහි ලා පෙරා ගන්නේ ය.

   2. සරස ගණයෙහි ද්‍රව්‍ය නාලාදිය කුඩුකොට එමෙන් 20 ගුණයක් ජලය ලා මුහුර්තයක් උෂ්ණයෙහි තබා අර්කය පෙරා ගත යුතු ය.

   3. නිරස ආර්ද්‍ර ද්‍රව්‍ය චූර්ණයට 20 ගුණයක් ජලය ලා යාමයක් ඝර්මයෙහි තබා අර්කය පෙරා ගන්නේ ය.

   4. සදුග්ධ ද්‍රව්‍ය කුඩා කැබලිවලට කපා උෂ්ණ ජලය භාගයක් ලා දින තුනක් තබා පසුව යළි ජලය ලා කොටන්නේ ය. පසුව එහි කිරි ගතිය පහවූ කල 10 ගුණයක් ජලය ලා අර්කය පෙරිය යුතු වේ.

   5. දුග්ධිකා, අර්ක ආදි ද්‍රව්‍ය කුඩා කැබලිවලට කපා කොටා 4 ගුණයක් ජලය ලා අව්වෙහි තබන්නේ ය. ජලය රත් වූ පසු එය යන්ත්‍රයට යොද අර්කය පෙරිය යුතු වේ.
      වියලි ද්‍රව්‍ය දළ වැ චූර්ණකොට 16 ගුණයක් ජලය ලා අර්කය පෙරා ගැනීම එහි ලා අනුදන්නා ලැබේ.

   6. අමුගෙඩි ආදි සරස ද්‍රව්‍යයන්හි අර්කය ජලය රහිතව ලබා ගත යුතු වේ. කාෂ්ඨෝදුම්බරාදී ඵලයන් කුඩා කැබලිවලට කපා වෙන් වෙන්ව ස්වර්ජික්ෂාර, සෛන්ධව යොද අතින් මිශ්‍රකොට සතලිස් ගුණයක් ජලය ලා යාමාර්ධයක් ඝර්ම යෙහි තබා රත් වූ පසු අර්කය පෙරා ගත යුතු ය.

   7. අතිපක්ව ඵලයන්ගෙන් සහ අපක්ව ඵලයන්ගෙන් පානීය ලෙස අර්කය පෙරිය යුතු ය. පුෂ්පයන්ගෙන් අර්ක පෙරිය යුත්තේ 16 ගුණයක් ජලය හා මිශ්‍රණයෙනි.

   8. ද්‍රව්‍ය පොඟවන ජලයෙන් 2/3 ක් අර්ක ගත යුතු ය.
      පෙරාගත් අර්කය ගැලුම් 1 කට, ඉතා පිරිසිදු චෝක් පවුඩර් = කඨික චූර්ණ (රටහුණු) අවුන්ස 1/2 ක් මිශ්‍රකර, දෙතුන් පැයක් තබා ඉන්පසු සතරට නමා ගත් රෙදි කඩකින් හෝ පිල්ටර් බෑගයකින් පෙරා වායු නිරෝධකයන්ගෙන් වසා තැබිය යුතු ය. බාහිර වාතය ඇතුළු වීමෙන් අර්කය දූෂිත වන හෙයිනි.

3. පොදු අර්ක නීතිය :—

ද්‍රව්‍ය රාත්තල් 5 යි = සේරු 2 1/2 යි. = පල 40 = ග්‍රෑ :2400 යි.
වතුර සේරු 20 යි = රාත්තල් 40 — පල 320 = ලී. 19,200 යි.
අර්කය රාත්තල් එකේ බෝතල 20 යි.

නිදර්ශන :—

දශමූල අර්කය :—

දශමූල රාත්තල් 5 යි = පල 40 = ග්‍රෑ: 2400 යි.
හොඳට කපා, කොටා, තලා ගෙන වතුර රාත්තල් 40 = ක් ලී: 9.200 දමා රාත්‍රියක් පෙඟෙන්නට තබා උදෑසන අර්ක යන්ත්‍රයෙහි ලා පෙරා, රාත්තල් 20 ක් අර්කය ලබා ගත යුතු ය.

මාත්‍රාව :—කෝප්ප 2 – 10 යි. (ග්‍රෑ: 24 – 120 යි.)

4. ද්‍රව ද්‍රව්‍යාර්කය :—

1. කිරි, දී, වසා = වුරුණු තෙල්, තක්‍ර, මී පැණි, තෛල, ගිතෙල්, මූත්‍ර යනාදීන්ගෙන් අර්ක පෙරා ගන්නා කල සමන් මලින් වසන්නේ ය. තවද පද්ම, සමන්, මාලතී, පාරිජාත, කේතකී ආදි පුෂ්පයන්ගෙන් ද පිධාන යෙදිය යුතු වේ.

2. ඒ සඳහා ස්තම්භක ද්‍රව්‍යයන්ගෙන් හෙවත්, ලෝහ හෝ පාෂාණයෙන් නිර්මාණය කරණ ලද පාත්‍ර උත්තම වේ.

3. දධි, නවනීත, ජලය හා මිශ්‍ර කොට මී, ගිතෙල් ද යොද කිරි, තෛල, පිණ්‍යාක යනාදිය ගිතෙල සමානව ගෙන එද සැලියට බහා කලතා එය බීම තබා අනෙක් සැලියෙන් වසා පෙන ඉවත් කොට යන්ත්‍රයෙහි ලා අර්කය පෙරා ගත යුතු වේ.

5. දුර්ගන්ධ නාශනය :—

1. පෙරුංකායම්, සුදුදුරු, උළුහාල්, අබ යන ද්‍රව්‍ය චූර්ණකොට ගිතෙලින් අනා, නැවුම් හට්ටියක ලා දවා එහි දුම අර්කයට ඇල්ලීමෙන් ගන්ධය නැසේ.

2. සියලුම අර්කයනට ගන්ධ ධූපයෙන් දුම් දී වාසනා කරන්නේ ය.

   1. වාත රෝගයන් සඳහා යෙදෙන අර්ක මහිෂාක්ෂ = ගුගුල් ධූපයෙන් වාසනා කළ යුතු ය.
   ගුගුල්, සල් මැලියම්, හොර මැලියම්, කළු අගිල්, කරාබු, යන මහිෂාක්ෂ පංචකයෙන් දුම් දීම එහි ලා යෙදේ.

   2. සියලු පිත්තජ රෝගයන් සඳහා යෙදෙන අර්ක චන්දනාදියෙන් දුම් දෙන්නේ ය. සුදු හඳුන්, සැවැන්න, කපුරු, සුගන්ධ බාකුචී, එන්සහල්, හිඟුරුපියලි, පුෂ්ප ප්‍රියංගු යන යෝගය ඒ සඳහා ගැනෙයි.

   3. කඵජ රෝගයන් සඳහා යෙදෙන අර්කයන් ජටාමාංසාදියෙන් වාසනා කරන්නේ ය. ජටාමාංස, නබී, තේජපත්‍ර, කරාබු, තුවරලා, රස කපුරු, ගන්ධක යන ද්‍රව්‍යයන්ගෙන් යෝගය සෑදේ.

   4. ත්‍රිදෝෂජ රෝගයන් සඳහා යෙදෙන අර්කයන් දශාංග ධූපයෙන් වාසනා යෙදිය යුතු වේ.

දශාංග ධූපය :—

ගන්ධක	භාග	5 යි.	ස්වර්ජික්ෂාර	භාග	3 යි.
ගුගුල්	,,	5 යි.	සල්මැලියම්	,,	3 යි.
සුදුහඳුන්	,,	4 යි.	සැවැන්නමුල්	,,	3 යි.
ජටාමාංස	,,	4 යි.	ගිතෙල්	,,	8 යි.
ශතාවරී	,,	4 යි.	කපුරු	,,	1 යි.
කස්තූරි	,,	1 යි.			

යන ද්‍රව්‍ය චූර්ණය ගිතෙලින් අනා පෙර සේ දුම් දෙන්නේ ය.

6. අග්නිය :—

අර්ක කල්පනාවෙහි දී ගිනි දිය යුතු ආකාරය මෙසින් දක්වේ :—

1. ධූමාග්නිය නම් දැල්වෙන ගිනිදැල් සහිත වූයේ වේ.
2. දෙගුණයක් හෝ සිවුගුණයක් හෝ පමණ ශක්තියෙන් යුත් දැල්වෙන ගින්න දීප්තාග්නිය නමි.
3. දීප්තාග්නියෙන් සතරින් කොටසක් පමණ ශක්තියෙන් යුක්ත වූයේ මන්දග්නිය යි.
4. දැලි බැඳෙන අයුරින් ගින්න නැගීම හෝ මන්දග්නියෙන් අඩක් පමණ වූයේ හෝ මධ්‍යමාග්නිය වේ.
5. පූර්වාග්නිය මෙන් පස් ගුණයක් පමණ ශක්තිමත් වූයේ ඛරාග්නිය නමි. සියලු අර්කකර්මයන්හි දී එය පසස්නා ලැබේ.

7. විධිය :—

1. අර්කපාකයෙහි දී ප්‍රථම කොට ද්වියාමයක් ද, දෙවැනිව සාර්ධ යාමයක් ද, තෙවැනිව යාමයක් ද, සිවුවැනිව දෙමුහුර්තයක් ද, පස් වැනිව මුහුර්තයක් ද අග්නිය යෙදිය යුතු ය.
2. හර සහිත, අතිවියලි, මිටින් ගත හැකි ප්‍රමාණ මහතින් යුත් දර, ගින්න දල්වනුව අනු දන්නා ලැබේ.

8. අර්ක පාත්‍රය :—

ජීර්ණාස්ථි මිශ්‍රණයෙන් හෝ කාව හෝ පාෂාණයෙන් හෝ අර්ක පාත්‍රය නිර්මිත විය යුතු ය. එය අභාවයෙහි මැටි බඳුනක් යෙදිය හැකි වේ. මේ සඳහා නූතනයෙහි සම්පාදිත ව ඇති අර්ක යන්ත්‍ර ව්‍යවහාරය වඩා පහසු ය. යෝග්‍ය ය.

9. අර්ක පානය :—

අර්ක පානයෙන් අනතුරුව තාම්බූල භක්ෂණය කටයුතු වේ. එය අභාවයෙහි ලවංග හැපිම අනු දන්නා ලැබේ.

18. ද්‍රාවක

1. යෝග නාමය :—ශංඛ ද්‍රාවකය.

යෝගය :—

ශංඛ චූර්ණය,
යවක්ෂාර,
ස්වර්ජික්ෂාර
පුෂ්කර
පංච ලවණ,
සිතක්කාරං,
වෙඩිලුණු.

සංස්කරණය :— සමභාගව ගෙන අඹරා කාවකූපිකාවක බහා වාරුණී යන්ත්‍රයෙන් පෙරා ගන්නේ ය.

ප්‍රයෝගය :— සවැදැරුම් අර්ශස්, උදර, ගුල්ම, ප්ලීහාභිවෘද්ධි රෝග, යකෘත් රෝගයන් සඳහා මනා ය. අජීර්ණයෙහි උත්කෘෂ්ට යි.

මාත්‍රාව :— බින්දු 10 – 12 දක්වා වේ.

2. යෝග නාමය :—ශංඛද්‍රාවය (ක්ෂාරාර්කය)

යෝගය :—

ස්වර්ජික්ෂාර,
යවක්ෂාර,
ශ්වේතක්ෂාර = කෞඩිභස්ම (කවඩි අළු),
ටංගණ,
සෞභාග්‍යක්ෂාර,
සෞරක්ෂාර = වෙඩිලුණු,
ශංඛ භස්ම,
අර්ක,
සේහුණ්ඩ,
පලාය,
තුවරි,
අපාමාර්ග

සංස්කරණය :— යන ද්‍රව්‍යයන්ගේ ක්ෂාර, අෂ්ට ලවණ යන ද්‍රව්‍ය සමභාගව ගෙන 21 වරක් දෙහි ඇඹුලෙන් (= නිම්බු නීරයෙන්) භාවනා යුක්තව අඹරා එමෙන් 20 භාගයක් පමණ දෙහි ඇඹුල් යොද ගුලියක් තනා කාව කූපිකාවක බහා යන්ත්‍රයෙහි යොද ක්‍රමයෙන් යාමයෙන් යාමය යාම පහක් ගිනි දී පෙරා ගන්නේ ය.

3. යන්ත්‍ර විධිය :—

පරිශිෂ්ටය බලන්න.

(1) රස – උපරස ද්‍රව්‍ය ශෝධන මාරණ විධිය

රස අෂ්ටවිධ සංස්කරණ

- (1) ස්වේදන,
- (2) මර්දන,
- (3) මූර්ච්ඡන,
- (4) උත්ථාපන,
- (5) පාතන,
- (6) රෝධන (බෝධන),
- (7) නියමන,
- (8) දීපන,

1. ස්වේදන :—

1. ස්වේදන සංස්කාරය :—

ක්ෂාර, අම්ල ද්‍රව්‍ය සමග දෝලා යන්ත්‍රයෙහි ස්වේද දීම මෙයින් අදහස් කෙරේ.

ස්වේදන විධිය :—

(ආසුරී, පටුක, කටුත්‍රය, චිත්‍රක, ආර්ද්‍රක, මූලක,) අබ, සහිඳලුණු, ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, රත්නිටුල්, අමුඉඟුරු, රාබුඅල යන මේ ද්‍රව්‍ය එකක් එකක් පාරදවලින් 1/16 (දහසයෙන් එක) බැගිනි. (පාරද පලං 16 ක් නම් ද්‍රව්‍ය එක් එක් වගෙන් පලම බැගිනි.)

අමු ඉඟුරු සහ රාබු හැර අනික් ද්‍රව්‍ය ඉතා සියුම් ලෙස චූර්ණ කරන්නේ ය. අමු ඉඟුරු සහ රාබු අල ඉතා සියුම් ලෙස අඹරා කල්කය සකසා ගන්නේ ය. ඉන්පසු ඒ සියල්ල කාඩියෙන් අඹරා, සියුම් කල්කය සාද ගත යුතු යි. ඉක්බිති සතරට නවාගත් වස්ත්‍රයෙක්හි පලාශපත්‍ර වලින් ගොටුව සාද එහි තුළ පළමු කල්කය අංගුලියක් පමණ ඝන ලෙස ලේප කරන්නේ ය. එහි පාරද තැන්පත් කළ යුතු ය. ඉතිරි කල්කය පාරද මතුපිටින් බහා වස්ත්‍රය පොට්ටනියක් ලෙස බැඳිය යුතු යි. එම රසදිය පොට්ටනිය ලෝහ කුරක (දණ්ඩක) මැද භාගයෙහි එල්ලා ලෝහ බඳුනෙක්හි කාඩියෙන් දින තුනක් ස්වේදනය කරන්නේ ය.

දෝලා යන්ත්‍රයෙහි (බඳුනෙහි) රසදිය පොට්ටනිය ගිලෙන පරිදි කාඩි පිරවියැ යුතු යි. රසදිය පොට්ටනිය භාජනය පතුලේ නොගැවෙන පරිදි මධ්‍යස්ථව විය යුතු යි. දින තුනක් ස්වේදනය කොට ඉක්බිති පලාශපත්‍ර ගොටුව ඉවත් කර පොට්ටනිය මර්දනය කරමින් උණු දියෙහි හෝ උෂ්ණ කාංජිකයෙහි සෝද ගත යුතු යි.

2. මර්දන සංස්කාරය :—

නියමිත ඔසු සමග සර්වාම්ල හෝ කාංජික සමඟ ඇඹරීම මර්දන සංස්කාරය වේ.

මර්දන සංස්කරණ විධිය :—

ගුඩ, දවාගත් බැටළු ලොම් (දග්ධෝර්ණා), සහිඳලුණු, වියන් දූවිලි, ගඬොල් කුඩු සහ අබ පාරදයෙන් දහසයෙන් එක බැගින් ගෙන, ගුඩ හැර සෙස්ස සූක්ෂ්ම චූර්ණය කොට ඉක්බිති සියල්ල තප්ත ලෝහ බල්වයෙහි කාඩියෙන් දින තුනක් අඹරන්නේ ය. ඉක්බිති උෂ්ණ ජලයෙන් හෝ උෂ්ණ කාංජිකයෙන්, වස්ත්‍රයෙක්හි පොට්ටනිය බැඳ බහා, මිරිකා සෝද ගත යුතු යි.

3. මූර්ච්ඡන සංස්කාරය :—

නියමිත ඖෂධ ද්‍රව්‍ය සමග අඹරා ''නෂ්ට පිෂ්ට'' භාවයට පත් කිරීම හෙවත් පාරදවල ද්‍රව ස්වරූපය නැති කිරීම මූර්ච්ඡන ය යි.

මූර්ච්ඡන සංස්කාර විධිය :—

ගෘහ කන්‍යා (කෝමාරිකා මද) අරළු, බුළු, නෙල්លි, රත්නිටුල් යන ද්‍රව්‍ය සමඟ බල්වයෙහි ''නෂ්ට පිෂ්ට'' වන තෙක් දින තුනක් අඹරන්නේ ය. ත්‍රිඵලා සහ චිත්‍රක චූර්ණකර පාරද සමග කෝමාරිකා යුසින් දින තුනක් ඇඹරිය යුතු යි.

ඉහත ප්‍රකාශිත අයුරු එක් එක් වර්ගය පාරදයෙන් දහසයෙන් එකක් බැගින් ගත යුතු යි. මූර්ච්ඡන සංස්කාරය සම්පූර්ණ වීම සඳහා දින 3 ක් ඇඹරිය යුතු යි. පළමුව කුමාරි ස්වරසින් ඇඹරීම කළ යුතු ය. ඊට පසු ත්‍රිඵලා චූර්ණය සමඟ, ඉන්පසු චිත්‍රක මූල චූර්ණය සමග දින දෙකක් පාෂාණ බල්වයෙහි ද, තුන් වෙනි දින ලෝහතප්ත බල්වයෙහි ද අඹරන්නේ ය.

4. උත්ථාපන සංස්කරණය :—

මූර්ච්ඡන සංස්කාරයෙන් ලබාගත් නෂ්ට පිෂ්ට පාරද (කල්ක සහිත) නැවත ප්‍රකෘති ස්වභාවයට පත් කිරීම උත්ථාපන නම්.

උත්ථාපන සංස්කාර විධිය :—

(1) කල්කය සහිත මූර්ච්ඡිත පාරද දෙහි ඇඹුලෙහි (ගිංලන සේ) බහා අව්වෙහි වියලා, පාරද වෙන්කොට උෂ්ණ කාංජිකයෙන් සෝද ගත යුතු යි.

(2) පාරද මිශ්‍ර කල්කය සෝද හැරීමෙන් පාරද වෙන් කිරීම.

(3) අවසාන වශයෙන් කල්කය මිශ්‍ර පාරද අව්වේ වියලා පාතන යන්ත්‍රයෙන් වෙන්කර ගත යුතු යි.

5. පාතන සංස්කාරය :—

ඌර්ධ්ව පාතන අධඃ හෝ තිර්‍යක්පාතන යන්ත්‍රයෙන් පෙරා ගැනීම අදහස් කෙරේ.

පාතන සංස්කාර විධිය :—

උත්ථාපිත (රසදිය) පාරද	භාග 1 යි.
තඹ සුණු	භාග 1/3 යි.
සහිඳ ලුණු	භාග 1/20 යි.

දෙහි ඇඹුලෙන් ලෝහ බල්වයෙහි දෙදිනක් අඹරන්නේ ය. ඉන්පසු වෙඩරු පිඩක් බඳු රස පිෂ්ටයක් ලැබේ. එප පාතන යන්ත්‍රයෙහි බහා, පැයක් ගිනි දීමෙන් ශුද්ධ පාරද ලැබේ. පාතනය තුන් වරක් කළ යුතු යි. (පරිශිෂ්ට සංග්‍රහයෙහි පාතන යන්ත්‍ර ආකෘතිය දක්වේ.)

6. රෝධන — බෝධන සංස්කාරය :—

මර්දන, මූර්ච්ඡන ආදියෙන් ෂණ්ඩ භාවයට පැමිණි කදර්ථිත පාරදයෙහි නැවත බල වෘද්ධිය ඇති කිරීම මෙයින් අදහස් කෙරේ.

රෝධන සංස්කාර විධිය :—

තෘතීය පාතනයෙන් පසු උණුදියෙන් සෝදගත් රසදිය, චීන මැටි බරණියෙක්හි හෝ එබඳු ශක්තිමත් බඳුනෙක්හි සහිඳ ලුණු දියකර ගත් ජලයෙහි බහා දින තුනක් අව්වේ තබා හෝ අව්ව නැති සමයෙක්හි නම්, ලෝහ භාජනයෙයෙක්හි බහා මඳ ගින්නේ තබා ගත යුතු ය. (සි. 100 පමණ) ජලය ප්‍රස්ථ තුනකට සහිඳලුණු පලං 10 අනුපාතයට ගත යුතු යි. දින තුනකට පසු උණුදියෙන් සෝද ගත යුතු වෙයි.

7. නියමන සංස්කාරය :—

පාරදයාගේ චපල භාවය නැති කිරීම මෙයින් අදහස් කෙරේ.

නියමන සංස්කාර විධිය :—

බුලත්, සුදුලූනු, කිකිරිදිය, තුඹකරවිල අල, සියඹලා යන මොවුන්ගේ කල්කය සමඟ දින තුනක් කාඩියෙහි ස්වේදනය කරන්නේ ය. ඒ ද්‍රව්‍ය වෙන් වශයෙන් පාරදයෙන් 1/16 ක් විය යුතු යි. එකී ද්‍රව්‍ය කාඩියෙන් අඹරා කල්ක කොට, එය ලෝහ භාජනයෙක්හි දෙදිනකට පෙර අඟල් 3/4 ක් පමණ ඝන ලෙස ආලේපකර තෙවෙනි දිනයෙහි පාරද එහි බහා ඉතිරි කල්කය ඊපිට බහා තුන්වන දිනයෙහි සතරට නමා ගත් වස්ත්‍රයෙක්හි පාරද පොට්ටනිය බැඳ දෝලා යන්ත්‍රයෙහි කාඩියෙන් දින තුනක් දිවා රාත්‍රි ස්වේදනය කරන්නේ ය. ඊට පසු උෂ්ණ ජලයෙන් හෝ උෂ්ණ කාඩියෙන් සෝද පොට්ට නිය මිරිකා පොඩිකර රසදිය වෙන්කර ගත යුතු යි.

8. දීපන සංස්කරණය :—

වැළඳීමට යෝග්‍ය කිරීම පිණිස තීව්‍රත්වය ආදිය ඉපදවීම යි.

දීපන සංස්කාර විධිය :—

සීනක්කාරං, කාසිය, පුෂ්කර, ගම්මිරිස්, සහිඳලුණු, අබ, මුරුංගා පොතු, මේ ද්‍රව්‍යයන්ගේ කල්කය හා කාඩි සමඟ දෝලා යන්ත්‍රයෙන් දින තුනක් ස්වේදනය කරන්නේ ය. ද්‍රව්‍ය ප්‍රමාණය හා දෝලා යන්ත්‍රයෙහි එල්ලීම ඉහත 1 ස්වේදන සංස්කාරයෙහි කී පරිදි වේ.

කාංජිකය :—

අබ	රාත්තල්	2 1/2 ඕ.	=	පලං 20	=	ග්‍රෑ:	1200
සහිදලුණු	,,	5 ඕ.	=	පලං 40	=	ග්‍රෑ:	2400
සහල්	,,	2 1/2 ඕ.	=	පලං 20	=	ග්‍රෑ:	1200
පෙරුංකායම්	,,	1/32 ඕ.	=	පලං 1/4	=	ග්‍රෑ:	15
ඇල්වී සහල් හෝ සීන් උඳු	,,	1 ඕ.	=	පලං 8	=	ග්‍රෑ:	480
වියලි කහ	,,	1/2 ඕ.	=	පලං 4	=	ග්‍රෑ:	240
අමුඉඟුරු කල්කය	,,	1/8 ඕ.	=	පලං 1	=	ග්‍රෑ:	60
උණකොල	,,	1/2 ඕ.	=	පලං 4	=	ග්‍රෑ:	240
වතුර	,,	80 ඕ.	=	ලී: 38,400			

දින 10 – 12 ක් මැටි භාජනයෙහි මුඛ බන්ධකර (කඩමැටි බැඳ) තබා පෙරා ගන්නේ ය. සියලු රස කර්ම සඳහා අතිශයින්ම යෝග්‍ය වේ.

වක්තව්‍යය :—

(1) වෙළඳපොලේ ඇති සාමාන්‍ය රසදිය ස්වේදන, මර්දන, මූර්ච්ඡන, උත්ථාපන, විධිවලින් පසු ඌර්ධව, තිර්‍යක්, අධඃ යන පාතනත්‍රයයෙන් ම පාතනය කොට ගත යුතු ය. ඒ සඳහා වාසුදේව යන්ත්‍රය හෝ ශ්‍රී රාම් නාරායණ යන්ත්‍රය විශේෂයෙන් උපයෝගී වේ. (පරිශිෂ්ටය බලන්න.) ඉන්පසු ඉතිරි සංස්කාර තුන යොදගත් පාරද හෝ,

(2) හිංගුලාකෘෂ්ට රස හෝ රසායන විද්‍යානුකූලව දෙවරක් පාතනය කරන ලද (Double distilled mercury) පාරද සර්වදෝෂහර ශුද්ධියෙන් ශොධනය කොට ඉක්බිති බුලත් යුෂ හා සුදුලූනු යුෂ සමඟ මර්දනය කොට කාඩියෙන් සෝද ගත් විට රස කර්ම සඳහා යෝග්‍ය වන්නේ ය.

(3) කෘත්‍රිම හිංගුල වෙළඳ පොලේ ඇති හෙයින් හිංගුලෝත්කෘෂ්ට රස වුව ද නැවත දෙවෙනි වරටත් පාතනය කර ගත යුතු ය. පාරද අෂ්ටසංස්කාර ප්‍රත්‍යක්ෂ විවරණය පරිශිෂ්ටයෙහි බලන්න.

99.9999 % ශුද්ධ රසදිය භාවිතය

වෙළඳ පොලෙහි තිබෙන නාග ඊයම්, වංග (ටින්) යශද (සින්ක්) ආදිය මිශ්‍රිත සාමාන්‍ය රසදිය දෙළොස් ආකාර මහා දෝෂයන් ගෙන් දූෂිත නිසා අෂ්ටසංස්කාර විධි යොද යලිත් ඌර්ධවපාතනය කොට ශෝධන විට ද යොද රස ඖෂධ යෝග සංස්කරණය පිණිස යෙදිය යුතු ය. එසේ නැතහොත් ශුද්ධ සාදිලිංගං වලින් දෙවරක් ඌර්ධව පාතනය කොටැ ලබාගත් රසදිය ශෝධන විධි ද යොද රස ඖෂධ සංස්කරණ සඳහා යෙදියැ යුතුය. මෙම ක්‍රම දෙකෙන් ම ලැබෙන ශුද්ධ රසදිය ප්‍රමාණය ඉතා අල්ප ය.

ආර්ථික වශයෙන් හා පරිශ්‍රමය වශයෙන් එසේ මහත් දුෂ්කරතාවකට මුහුණ දී රසෞෂධ නිෂ්පාදනය වෛද්‍යවරුන්ට මහත් අපහසු වෙකි. එ නිසා චිකිත්සාක්ෂේත්‍රයෙහි රසෞෂධ නිෂ්පාදනය බෙහෙවින් පිරිහී තිබේ. 99.9999 % රසදිය සඳහා ශෝධන ආදි සංස්කාර විධි අල්ප වශයෙන් යෙදීම ප්‍රමාණවත් ය. සර්වදෝෂහර ශුද්ධියෙන් සහ කොල්ලු කෂාය බුලත් ඉස්ම, සුදුලූනු, සේම ආදිය සමග මර්දන සංස්කාර ය යොද උණුදියෙන් සෝද රසඖෂධ සංස්කරණය සඳහා යෙදීම සුදුසු ය. පරිස්සම් සහිත ය.

සර්වදෝෂහර ශුද්ධිය

"කුමාරිකා චිත්‍රක රක්තසර්ෂපෛ: කෘතෛර්කෂායෛර්වෘහතිවිම්ශ්‍රෛ:
ඵලත්‍රිකේනාපි විමර්දිතෝ රසෝ දිනත්‍රයං සර්වමලෛර්විමුච්‍යතෙ" (ආයුර්වේද සංග්‍රහ)

කෝමාරිකාමද ,රත්නෙිටුල්, රතුඅබ, එළබටුමුල්, අරළු, බුළු, නෙල්ලි යන මේ ද්‍රව්‍ය සමභාග කෂායයෙන් දින තුනක් මර්දනය කිරීමෙන් රසදිය සර්වදෝෂයන්ගෙන් විනිර්මුක්ත වන්නේ ය. 99.9999 % රසදිය සුප්‍රසිද්ධ බටහිර ඖෂධ වෙළඳ ව්‍යාපාර වලින් ලබාගත හැකිය.

(2) රස–උපරස ශෝධන මාරණ විධිය

සාධාරණ විධිය

රස — රසදිය:—

I රසදිය කෝමාරිකා ස්වරසින් ද, චිත්‍රකමූල ක්වාථයෙන් ද, කලුකැම්මෙරිය ස්වරසින් ද දිනක් බැගින් අඹරා ගත යුතු ය.

II. කෝමාරිකා, රක්ත චිත්‍රක, රක්ත සර්ෂප, බටුමුල් ක්වාථයෙන් හෝ ත්‍රිඵලා ක්වාථයෙන් හෝ තෙදිනක් බල්වයෙහි මර්දනය කිරීමෙන් රසදිය ශොධනය වේ.

III. සුදුලූනු, බුලත් යන ද්‍රව්‍යයන්ගේ ස්වරසින් ද, ත්‍රිඵලා ක්වාථයෙන් ද දිනක් බැගින් අඹරා ගැනීමෙන් ශොධනය වේ.

IV. පූර්වෝක්ත ශෝධන කාර්‍යයන් සඳහා ඌර්ධ්වපාතන ක්‍රමයෙන් ලබාගත් රසදිය යෙදීම සුදුසු ය. (දැනට ලබා ගත හැකි පොදු රසදිය තෙවරක් පාතනය කොට ගත යුතු යි.)

මාරණ විධිය

දෙවරක් පාතනය කළ හිංගුලාකෘෂ්ටරසය යෝග සඳහා සුදුසු ය.

1. රස භස්මය :—

අෂ්ටවිධ සංස්කාරයෙන් ශෝධිත රසදිය පල 2 යි = ග්‍රෑ: 120 යි.
ශෝධිත ගන්ධක පල 1 යි. = ග්‍රෑ: 60 යි.

කුමාරිකා ස්වරසයෙන් දින තුනක් නිරන්තර ප්‍රයෝගයෙන් අඹරා භූධර යන්ත්‍රයෙන් පුට දී ගන්නේ මාරණය වේ.

කුපිපක්ව රසායන :—

රස සින්දූර, ස්වර්ණ සින්දූර (මකරද්වජ), තාම්‍ර සින්දූර, ශිලා සින්දූර, මල්ල සින්දූර, යන මේවා කුපිපක්ව රසායන නම්. කාච කූපි (වීදුරු බෝතල) තුළ භස්මකරණ හෙයින් කුපිපක්ව නම්.

2. රස සින්දූර :—

I. අෂ්ට විධ සංස්කාරයෙන් ශෝධිත රසදිය පල 2 යි. = ග්‍රෑ: 120 යි.
ශෝධිත ගන්ධක පල 3 යි. = ග්‍රෑ: 180 යි.
ශෝධිත සීසක මාෂ 1 යි. = ග්‍රෑ: 1 යි.

යන ද්‍රව්‍ය කජ්ජලිකොට අඹරා වීදුරු බෝතලයක ලා ඊ වටා මැටි රෙදි බැඳ වියලා, රටහුනු මූඩියෙන් වසා, වාලුකා යන්ත්‍රයෙහි ක්‍රමාග්නියෙන් යාම 4 ක් දවා ගත යුතු වේ. කජ්ජලිය වදමල් වර්ණය වන තෙක් ගිනි දීම පදම වනු ඇත. රටහුණු මූඩිය වරින් වර විවෘත කළ යුතු හා අංශයකට ඇල කර තැබිය යුතු ය. ඒ අතර යකඩ කූරකින් වරින් වර කූරු ගාන්නේ ය.

II. ශෝධිත රසදිය කෝලා 8 යි. = ග්‍රෑ: 96 යි.
ශෝධිත ගන්ධක කෝලා 8 යි. = ග්‍රෑ: 96 යි.

යන ද්‍රව්‍ය කජ්ජලි කොට පසුව නුග අරළු ස්වරසින් දින තුනක් භාවනා යුක්තව අඹරා වියලා වීදුරු බෝතලයක ලා, පියන වසා (රටහුණු මූඩියෙන්) කඩරෙදි මැටි බැඳ වියලා වාලුකා යන්ත්‍රයෙහි ක්‍රමාග්නියෙන් ගිනි දී ගත යුතු වේ. කජ්ජලිය රක්තාභවර්ණයෙන් යුක්තව රස සින්දූර බවට පැමිණීම පදම වේ. දැවීම සඳහා යෙදෙන කාලය යාම–යුගලයෙකි.

III. රස කර්පූරය :—

ශෝධිත වංගණ, මධු, ලාක්ෂා, මෙෂ (බැටළු) රෝම, ගුඤ්ජා බීජ, ශෝධිත රසදිය යන ද්‍රව්‍ය සමභාගව ගෙන භෘංගරාජ ස්වරසින් අඹරා ශරාව බද්ධකොට ගජපුටයෙන් දවා ගන්නේ යි.

IV. රස පර්පටිය :—

ශෝධිත රසදිය ගන්ධක සමභාගවගෙන කජ්ජලිකොට ගිතෙල ගා ලූ ලෝහ හැන්දක බහා දෙබර දර හෝ ගල් අඟුරු ගින්නෙන් වෙඩරු වැනිව උණුවන තෙක් ගිනි දිය යුතු ය. පසුව එය ගොම පිඩක් මත එලා ලූ කෙසෙල් දළුවක් මත ලා, කෙසෙල් දළුවක ඔතා ගත් ගොම පිඩකින් පැතලි කරන්නේ ය. නිවීගිය පර්පටිය ඉක්බිතිව චූර්ණ කොට ගන්නේ යි.

V. මකරද්ධ්වජය :—

ශෝධිත ස්වර්ණ පත්‍ර	තෝලා		(ග්‍රෑම් 12 යි.)
ශෝධිත රසදිය	තෝලා	8	(ග්‍රෑම් 96 යි.)
ශෝධිත ගන්ධක	තෝලා	16	(ග්‍රෑම් 192 යි.)

යනුවෙන් සංයෝගය ගත යුතු වෙ. ස්වර්ණ පත්‍ර අති සියුම් කැබලිවලට කපා රසදිය සමග බල්වයෙහි ඇඹරිය යුතු ය. ඉක්බිතිව ගන්ධක ලා, කජ්ජලි වන සේ යලි පේෂණය කොට රතු කපුමල්, රුක් අඟන මුල්, කෝමාරිකා යන ද්‍රව්‍යයන්ගේ ස්වරසින් භාවනා දී වියලා රෙදි මැටි බැඳ ලූ විදුරු බෝතලයක බහා වාලුකා යන්ත්‍රයෙහි දවන්නේ ය. බෙලි අරටු ආදි දරින් යාම දෙකක් මන්දග්නිය ද, යාම දෙකක් මධ්‍යාග්නිය ද, යාම දෙකක් ප්‍රබරාග්නිය ද ඒ සඳහා ගිනි යෙදිය යුතු වෙ. රත් උපුල් මල් පැහැයෙන් යුත්ව කජ්ජලිය දුවී ගිය කල, ස්වාංගශීත වීමට තබා යෝගය බෝතලයෙන් ඉවත් කොට චූර්ණ කර ගත යුත්තේ ය. මෙහි දී රස සින්දූර පරිභාෂාව අනුගමනය කළ යුතු ය.

VI. ෂඩ්ගුණ බලිජාරණ විධිය :—

රස ගන්ධක සමානව ගෙන කජ්ජලි කොට රස සින්දූර සමව ක්‍රමයෙන් දවා ගන්ධක අඩක් දුවී ගිය පසු ශෝධිත ගන්ධක ප්‍රමාණයක් යොදා දවන්නේ ය. මෙසේ සය වරක් ගන්ධක යොද දවා ගන්නේ ෂඩ්ගුණ බලිජාරණය නම්.

VII. පීත භස්මය :—

ශෝධිත රසදිය ගන්ධක සම භාගව ගෙන කජ්ජලි කොට හස්තිශුණ්ඩි (ඇත්හොඬ) එළපිටවක්කා (භූධාත්‍රි) ස්වරස යෙන් දින සතක් භාවනා යුක්තව අඹරා කෝවයක ලා සන්ධි බන්ධනය මැටි අලෙව් දී වාලුකා යන්ත්‍රයෙහි මන්දග්නි යෙන් දිනක් දවා ගත යුතු වේ. එහි දී හට ගන්නා පීත වර්ණ භස්මය යෝගයන් සඳහා යෙදේ.

VIII. කජ්ජලිය :—

යෝගයන්හි නිර්දේශිත ප්‍රමාණයෙන් හෝ සමභාගව හෝ ශෝධිත රසදිය ගන්ධක ගෙන ද්‍රෝණි බල්වයෙහි ලා, දූලිමෙන් වන සේ සියුම්ව චූර්ණය අඹරා ගත යුතු ය. එය නිශ්චන්ද්‍ර වන තුරු ඇඹරිය යුතු ය.

IX. හිංගුලෝත්ථ රස :—

I. ශෝධිත සාදිලිංගම් ජම්බීර (දෙහි) ඇඹුලින් දිනක් භාවනා යුක්තව බල්වයෙහි අඹරා ඌර්ද්ධවපාතන යන්ත්‍රයෙන් රස දිය පෙරා ගත යුතු වේ. එය යෝගයන් සඳහා යෙදෙයි. අඹරාගත් හිංගුල සිනිඳු රෙදි කැබලිවල ගා මනාව වියලා ඌර්ධ්වපාතන යන්ත්‍රයෙහි යොද පෙරා ගනු ක්‍රමය වේ.

II. හිංගුලාකෘෂ්ට රස :—

සාදිලිංගම් දෙහි ඇඹුලෙන් භාවනා දී ශුද්ධ කර ගන්නේ ය. ඉන්පසු දෙහි ඇඹුලෙන් ඉතා සියුම් ලෙස අඹරා තුනී සිනිඳු රෙදි කැබලිවල ගා අව්වේ වියලා නැවුං හැළියක් තුළ තැන්පත් කොට නැවුං ඇතිළියක් උඩුකුරුව තබා මුඛය කඩමැටි බඳින්නේ ය. රෙදි පට 7–8 ක් වැටෙන සේ බැඳිය යුතු යි. උඩ ඇතිළියේ සිසිල් ජලය පුර වන්නේ ය. ඉක්බිති ක්‍රමාග්නියෙන් ගිනි දෙන අතර ඇතිළියේ ජලය රත් විය නොදී නිරතුරු ජලය මාරු කරන්නේ ය. තිස් (30) වරක් ජලය ඉවත් කරන විට හිංගුලයෙන් පාරද වෙන්වී ඇතිළියේ යටි පැත්තේ බැඳෙයි. ස්වාංගශීත වූ කල්හි කඩමැටි ගලවා පාරද වෙන් කර ගන්නේ යි. වෙළඳපලෙහි කෘත්‍රිම හිංගුල ඇති හෙයින් එම රසදිය නැවත වරක් පාතනය කළ යුතු යි. ඉක්බිති සර්වදෙෂ හර ශුද්ධියෙන් ශෝධනය කර ගත් විට සියලු රස කර්ම සඳහා යෝග්‍ය ය.

වක්තව්‍යය :—

හිංගුලයෙන් පාරද වෙන්කර ගැනීම පිණිස නූතන යන්ත්‍ර ව්‍යවහාරය වඩා යෝග්‍ය ය. (යන්ත්‍ර ඛණ්ඩය බලන්න.) ශ්‍රීමත් ගණනාථ රසාකර්ෂණ යන්ත්‍රය (ගණනාථසෙන් තුමාගේ නිර්මාණයෙකි.) ඒ සඳහා යෙදේ.

ගණ නාථ ක්‍රමය :—

ශුද්ධ හිංගුල	ප්‍රස්ථ	1/2 යි.	ග්‍රෑ: 480 යි.
(රට හුණු) ශුද්ධ ඛටිකා චූර්ණය	ප්‍රස්ථ	1/2 යි.	ග්‍රෑ: 480 යි.

බල්වයෙහි ඉතා දැඩි ලෙස මර්දනය කරන්නේ ය. එම චූර්ණය ලෞහ බෝතලයෙහි (ලෞහ කූප්‍යාං) පුරවා වක්‍ර ලෞහ නාලයෙන් මුව වසා ගිනි උදුන මත තබා එහි අග දිය සහිත අනික් විදුරු බෝතලය හා ඒකාබද්ධ කොට, ජලපූර්ණ භාජනයෙහි තබා තියුණු ලෙස යාමයක් ගිනි දල්වන්නේ ය. වාෂ්පාකාරයෙන් නිර්ගත පාරද දිය සහිත විදුරු බෝතලයෙහි තැන්පත් වන්නේ ය.

කඩමැටි :—

හිංදියෙහි කපර්මිට්ටි නම්. මුල්තානිමිට්ටි (මුල්තාන් මැටි), රටහුණු හා සියුම් ලෙස කතුරෙන් කපාගත් කපුනූල්, වතුර දමා කොටා ගලේ අඹරාගත් බදමය කපර්මිට්ටි නම්. කූපීපක්ව සංස්කරණ සඳහා මෙම බදමය අති විශිෂ්ටය. බෝතල් පිපිරීම වළකී. කළුපාට බීර බෝතල් කාචකූපී සඳහා යෙදේ. මුල්තානිමැටි මඳ කසාවත්, පදම් කළ මැටිමෙන් දැඩි හා සිනිඳු ය.

උපරස ශෝධන මාරණ විධිය

1. **ගන්ධක = නෙල්ලික්කා ගෙන්දගම් :—**

I. මැටි හැලියක එළකිරි ලා, එහි කට තුනී කඩකින් (කම්බි ලේන්සුවකින්) වැසුම බැඳ, ඊමත ගන්ධක තබා පියන වසා සන්ධි බන්ධය යොද භූම්‍යන්තර පුටයෙහි ගොම වැරටි 100 කින් මඳ ගින්නෙන් දැවිය යුතු වේ. ඉක්බිතිව උණුව රෙදි කඩින් පෙරී කිරට වන් ගන්ධක යෝගයන් සඳහා යොදන්නේ යි.

II. ගිතෙල් ප්‍රමාණයක් ලෝහ පාත්‍රයක ලා, උණුකොට එයට සම ප්‍රමාණයක් ගන්ධක යොද පැයවා විද්‍රාවණය =දියවන සේ උණුකොට, එළකිරට හෙලා, නිවී ගිය පසු පෙරා ගත යුතු ය. යෝගයන් සඳහා එපරිදි ශොධනය කළ ගන්ධක යෙදිය යුතු වේ. I-II. කිරෙන් ඉවත් කොට තද උණු දියෙන් සෝද වේලා ගත යුතු ය.

2. **වජ්‍ර (දියමන්ති) :—**

I. කටුවැල් බටු මුලක් පලා ඉහි වජ්‍ර තබා බැඳ අමු හෝ කොල්ලු හෝ ක්වාථයෙන් දෝලා යන්ත්‍රයෙහි සත් දිනක් තම්බා ගන්නේ ය.

II. පෙර පරිදි එක් දිනක් තම්බා ගත් වජ්‍ර අශ්ව මූත්‍රයෙහි හෝ ස්නුහික්ෂීරයෙහි හෝ තබා නිවා ගන්නේ ය. මෙ පරිදි සත් වරක් බැගින් කිරීමෙන් ශෝධනය වේ.

3. **වජ්‍ර භස්ම :—**

ශෝධිත වජ්‍ර හා සමභාගව ශෝධිත හරිතාල, හිංගුල, ගන්ධක, ස්වර්ණ මාක්ෂික යොද ඩෙබර එල ස්වරසින් අඹරා පසුව බෝ පොතු ස්වරසින් භාවනා දී වියලා සම්පුටගතව ගජපුටයෙන් දවා ගන්නේ ය. එසේ පුට 7 ක් දීමෙන් උත්තම භස්මය නිර්මාණය වේ. භස්ම වීම ප්‍රමාද වුවහොත් 2 වැනි පුටයෙහි සිට ස්වර්ණ මාක්ෂික හැර ඉතිරි ද්‍රව්‍ය යොද අඹරා පෙර පරිදි පුට දෙන්නේ ය.

4. **වෛක්‍රාන්ත = දශ්ධහීරක :—**

වජ්‍ර ශෝධන අයුරින් මෙය ද ශෝධනය කට යුතු වේ.

වෛක්‍රාන්ත භස්ම :—

ශෝධිත වෛක්‍රාන්ත හා සමභාගව ශෝධිත හිංගුල ගන්ධක යොද දෙහි ඇඹුලෙන් සියල්ල අඹරා වියලා සම්පුට ගත ගජ පුටයකින් දවා ගන්නේ ය. පසුව එය පාරද ගන්ධක යුක්තව දෙහි ඇඹුලෙන් අඹරා සම්පුට යුක්තව ගජ පුටයෙන් දවා ගත යුතු ය. මෙසේ 8 වරක් පුට දීමෙන් වෛක්‍රාන්ත හොඳින් භස්ම වේ.

5. **අභ්‍රක = තලඅතු මිනිරන් :—**

I. තල අතු මිනිරන් යකඩ බඳුනක ලා ගිනියම් කොට කාඤ්ජිකයෙහි සත් වරක් හෙලා නිවා ගැනීමෙන් ශෝධනය වේ. පසුව ඇඹුල් වර්ගයේ ස්වරසයකින් දිනක් අඹරා ගැනීම ද කළ යුතු ය.

II. ලෝහ භාජනයක ලා, ගිනියම් කොට ගත්, වජ්‍රාභ්‍ර සත් වරක් එළකිරෙහි හෝ ත්‍රිඵලා ක්වාථයෙහි හෝ ගෝ මූත්‍රයෙහි කාඤ්ජිකයෙහි වෙන් වෙන්ව හෙළා නිවා ගැනීමෙන් ශෝධනය වේ.

III. ධාන්‍යාභ්‍රක, පෙති තෝර කොළ ස්වරසයෙන් දිනක් අඹරා චක්‍රිකා කොට වියලා ,ගජපුටයෙහි දස වාරයක් මාරණය සඳහා දවා ගන්නේ ය. වරා කිරෙන් අඹරා පෙර දක් වූ අයුරින් විසි වරක් පුට දී දවා ගැනීමෙන් සින්දූර සදෘශ මාරණ යුක්ත අභ්‍ර භස්මය ලැබේ.

ධාන්‍යාභ්‍ර සංස්කරණය :—

I. අභ්‍ර කම්බලයක ධාන්‍ය සමග බැඳ මැඩීමෙන් ධාන්‍යාභ්‍ර සාද ගත හැකිය.

II. අභ්‍ර භාග 1 යි.

ධාන්‍ය (භාග) 2 යි.
යන ද්‍රව්‍ය කම්බලයක = ඝන රෙද්දක ලා, බැඳ දියෙහි රැයක් බහා තබා පෙඟී ගිය පසු දෙඅතින් මර්දනය කිරීමෙන් අභ්‍ර කැබලි වී දිය බඳුනෙහි තැන්පත් වේ. පසුව දිය පෙරා හැර ධාන්‍යාභ්‍ර ලබා ගනු ද ක්‍රමයකි.

6. හරිතාල = හිරියල් :—

I. හරිතාල කුඩා කැබලි කොට කුෂ්මාණ්ඩ ස්වරසින් දෝලා යන්ත්‍රයෙහි ස්වේද දී හෝ හුණු දියෙහි ගලා ඉන් ප්‍රහරයක් ස්වේද දී හෝ පසුව උණු දියෙන් සෝද ගත යුතු ය. ඉක්බිතිව පොට්ටනි බැඳ තල තෙලින් යලි ස්වේද දී උණු දියෙන් සෝද වියලා ගන්නේ ය.

II. හිරියල් කැබලි පොට්ටනි බැඳ දෙහි ඇඹුලෙන් දෝලා යන්ත්‍රයෙහි යාමයක් තම්බා ගැනීමෙන් හෝ කාඩියෙන් තම්බා ගැනීමෙන් හෝ ශෝධනය වේ.

III. ශෝධිත හරිතාල සාරණ ස්වරසින් දිනක් අඹරා චක්‍රිකා කොට වියලා ශරාවයක තබා පුනර්නවාක්ෂාරයෙන් වසා, භස්ම යන්ත්‍රයෙන් දවා ගන්නේ හරිතාල මාරණය වේ.

IV. හරිතාල චූර්ණෝදකයෙහි ලා සත් වරක් භාවනා දී ගන්නේ ය.

රසමාණික්‍යය :—

V. හරිතාල කුෂ්මාණ්ඩ ස්වරසින් දෝලා යන්ත්‍රයෙහි යාමයක් ස්වේද දෙන්නේ ය. අනතුරුව දෙහි ඇඹුලෙන්, පෙරසේ ස්වේද දී ඉක්බිතිව වියලා සහල් කැබලි පමණ කුඩු කොට ඇතිලියක තලාතු මීනිරන් පතුරු තබා ඊපිට හරිතාල දමා ඊමත තලාතු මීනිරන් පතුරින් වසා, මෙසේ තට්ටු කීපයක් ශරාවයක ලා, තැන්පත් කොට වෙබර පත්‍ර කල්කයෙන් ශරාව බද්ධය වසා වියලා, යටි බඳුන ගිනියම් වනතෙක් දවා ගත යුතු ය. මෙහි පදම් නම් ශරාවයෙහි පතුල ගිනියම් වන තරම් වේ. ශරාවය තුළ දැවී ගිය මාණික්‍ය සදෘශ හරිතාල යෝග සඳහා යොදනු යෙදේ.

7. මනඃශිලා = මනෝශිල :—

I. මනෝශිල කුඩා කැබලිවලට කඩා පොට්ටනි බැඳ ජයන්ති ස්වරසින් දෝලා යන්ත්‍රයෙහි දිනක් තම්බා ගත යුතු ය. පසුව කිකිරිදිය ස්වරසින් ද, රතු කතුරු මුරුංගා ස්වරසින් ද තම්බා ගන්නේ ය. ඉක්බිතිව එය එළු මූත්‍රයෙන් යාමයක් පාක දී කාඩියෙන් සෝද ගත යුත්තේ වෙයි.

II. මනෝශිල කුඩා කැබලි හුණු වතුරෙහි දිනක් ගලා තබා සෝද ගත යුතු වේ. භෘංගරාජ ස්වරසින් දෝලා යන්ත්‍රයෙහි සිව් යාමයක් තම්බා ගැනීමෙන් ද ශොධනය වෙ.

III. මනෝශිල කැබලි දෙහි ඇඹුලින් භාවනා දී උණුදියෙන් සෝද ගත යුතු ය.

8. ඛර්පර = රසක :—

I. ඛර්පර බල්වයක ලා ලෝහ මෝලකින් කොටන්නේ ය. එහි දී පතුරු ලෙස නො කෙටී පවත්නා කොටස ඉවත් කොට, සෙසු භාගය දෙහි ඇඹුලෙන් දින හතක් අඹරා වියලා ගන්නේ ය. එකල එහි පිතාභවර්ණයක් උපදී. යෝග සඳහා එය යොදනු ලැබේ.

II. ඛර්පර දූඩි ගින්නෙහි ගිනියම් කොට දෙසි ඇඹුලට ලා, සත් වරක් නිවා ගැනීමෙන් ද ශෝධනය වේ.

III. ශෝධිත ඛර්පර පල දෙකක් ගෙන ශෝධිත පාරද පල දෙකක් ද ලා, අඹරා ගොම වැරටි යොද තෙවරක් පුටදී ගැනීමෙන් මාරණය වේ.

IV. ඛර්පර චූර්ණ කොට වීදුරු බඳුනක ලා, ගෝමූත්‍ර පුරවා දිනපතා පරණ මූත්‍ර ඉවත්කොට අලුත් මූත්‍ර යොද 7 දිනක් ශෝධනය කළ යුතු ය.

9. තුත්ථක = පල්මානික්කම් :—

I. චූර්ණ කරන ලද තුත්ථක, දශ පලමක් ගෙන අත්‍යුෂ්ණ ජලය පල පහක් ලා, මනාව කලතා සාරක පත්‍ර = ෆිල්ටර් පේපර් හෝ වස්ත්‍ර කැබැල්ලක් හෝ යොද භාජනයකට පෙරන්නේ ය. එය විදුරු බඳුනක නිශ්චලව තැබීමෙන් පල්මානික්කම් සියුම් කැබලි බඳුන පතුලෙහි රැස්වේ. දිය පෙරා හැර එය වියලා ගනු නිර්මලිකරණය යි.

II. තුත්ථක සුණුකොට නව නිම්බු ස්වරසයෙහි යාම දෙකක් පමණ ගලා තබා, අඹරා ගැන්මෙන් ශෝධනය වේ.

III. ශෝධිත තුත්ථක දෙහි ඇඹුල් සහ ඇල්දියෙන් අඹරා චක්‍රිකා කොට වියලා ලඝුපුටයක් දී දවා ගත යුතු ය. ඉක්බිති එය දධි මස්තුවෙන් දින තුනක් අඹරා ප්‍රයෝග සඳහා යොදන්නේ යි.

IV. පල්මානික්කම් කබලෙහි ලා, සුදු පාට අළු වන තෙක් බැද ගැනීමෙන් ශොධන මාරණ වෙ. ප්‍රචලිත ක්‍රමය යි.

10. චපල :

I. ජම්බීර, කර්කෝට, අමු ඉඟුරු ස්වරසින් භාවනා දීමෙන් චපල ශෝධනය වේ.

II. චපල පාරද සමභාගව ගෙන නික කොළ ස්වරසයෙන් භාවනා යුක්තව අඹරා වාලුකා යන්ත්‍රයෙහි පැසවා ගනුයේ රක්ත වර්ණ භස්මය උපදී. ඒ සඳහා කාචකූපිකාවක් යෙදිය යුතු වේ.

11. ස්වර්ණ මාක්ෂික — රන්මැසිදු :—

I. ස්වර්ණ මාක්ෂික පූර්ණය තුනී පත්‍ර කැබැල්ලක පොට්ටනි බැඳ කවු තම්පලා, හාල් ක්වාථයෙන් දෝලා යන්ත්‍රයෙහි ස්වේද දී ඉන් භාජනයට දිය වී වැටෙන ස්වර්ණ මාක්ෂික යෝග සඳහා ගන්නේ යි.

II. ශෝධිත ස්වර්ණ මාක්ෂික භාග 4 යි.
ශෝධිත ගන්ධක භාග 1 යි.

එරඬු තෙලින් අඹරා චක්‍රිකා තනා වියලා, ශරාව බද්ධකොට ගජ පුටයකින් දවා ගන්නේ සින්දූර සමාන මාක්ෂික භස්මය ලැබේ.

III. සහිඳලුණු භාග 1 යි.
ස්වර්ණ මාක්ෂික පූර්ණය භාග 3 යි.

ඇඹුල් දෙඩම් හෝ දෙහි ඇඹුලෙන් යකඩ තාච්චියේ බහා භස්ම වන තුරු යකඩ හැන්දෙන් හැඳි ගා ගත යුතු ය. සහිඳ ලුණු සම්පූර්ණයෙන් දැවී යන තෙක් භස්ම කළ යුතු ය.

12. රජත මාක්ෂික ශොධනය :—

ස්වර්ණ මාක්ෂික ශෝධනය පරිදි ය.

13. කාශීස — කසීස් :—

I. කාශීස කිකිරිඳිය ස්වරසින් දෝලා යන්ත්‍රයෙහි ස්වේද දී ගැනීමෙන් ශොධනය වේ.

II. ජම්බීර ස්වරසින් දෝලා යන්ත්‍රයෙහි ස්වේද දී මඳ උණුසුම් දියෙන් සෝද වියලා ගැනීමෙන් ද, කාශීස ශෝධනය වේ.

III. ශොධිත කාශීස සීනුක් පත්‍ර ස්වරසින් අඹරා චක්‍රිකාකාරයෙන් හෝ ලඝුපුටයක් දී ගැනීමෙන් භස්මතාවයට හෙවත් මාරණයට පැමිණේ.

14. කාන්තපාෂාණ = කාන්දම් ගල් :—

I. කාන්ත පාෂාණ කුඩුකොට පොට්ටනි බැඳ ගව ගිතෙල සහිත මී කිරෙන් ලෝහ භාජනයක දෝලා යන්ත්‍රයෙහි යාම තුනක් තීව්‍ර අග්නියෙන් පැසවන්නේ ය. පසුව උණු දියෙන් සෝද ලවණ ක්ෂාර මිශ්‍රිත මුරුංගා පොතු ස්වරසින් දිනක් අඹරා අව්වේ වියලා ගත යුතු ය. පසුව අම්ල වර්ග ස්වරසින් දිනක් අඹරා අව්වෙන් වියලා ඉක්බිතිව පෙර මෙන් දෝලා යන්ත්‍රයෙහි ස්වේද දී වියලා ගත යුතු ය.

15. වරාටිකා = කවඩි (කපර්දක) :—

I. වරාටිකා පොට්ටනි බැඳ කාඤ්ජිකයෙන් දෝලා යන්ත්‍රයෙහි ස්වේද දී උණු දියෙන් සෝද ගැන්මෙන් ශෝධනය වේ.

II. ශෝධිත වරාටිකා ශරාවයක ලා, සන්ධිබන්ධ කොට ගොමවැරටියෙන් පුටයක් දී අඹරා ගත යුතු වේ. එය මාරණය හෙවත් භස්මය යනුවෙන් සැලැකේ.

III. සමභාග වළක් කැණ එහි ලෝහ පාත්‍රයක් තබා අඩක් දහයියාවලින් එය පුරවා ශෝධිත වරාටිකා චූර්ණය මූෂා යන්ත්‍රයෙහි ලා, සන්ධිබන්ධන යුක්තව එහි තබා ගොම වැරටි උඩින් ලා ගිනි දී දවා ගන්නේ යි.

16. අඤ්ජන = අඤ්ජන කැට :—

I. නීලාඤ්ජන චූර්ණකොට ජම්බීර නිම්බු ස්වරසින් දිනක් භාවනා දී අව්වෙන් වියලා ගත යුතු ය.

II. සෞවීරාඤ්ජන වරාටිකා ශෝධන විධියෙන් ද ශෝධන මාරණ කරණු අනුදන්නා ලැබේ.

III. සියලු අඤ්ජන වර්ග භෘංගරාජ ස්වරසින් භාවනා දී ගැන්මෙන් ශෝධනය වේ.

17. **හිංගුල = සාදිලිංගම් :—**

i හිංගුල කුඩා කැබලි වලට කඩා අමු ඉඟුරු යුෂයෙන් භාවනා දී සෝද ගත යුතු ය.
ii හිංගුල කුඩා කැබලි අම්ල වර්ගයෙහි ද්‍රවයෙන් අඹරා යළි මී කිරෙන් අඹරා වියලා ගන්නේ යි.
iii හිංගුල කුඩා කැබලිවලට කඩා දෙහි ඇඹුලෙන් භාවනා දී උණුදියෙන් සෝද වියලා ගන්නේයි.

18. **ගෛරික = සිවන්ගුරු :—**

i ගෛරික එළකිරෙන් භාවනා යුක්තව ඇඹරීමෙන් ශෝධනය වේ.
ii ගෛරික එළගිතෙලින් මන්දග්නියෙන් බැද ගැනීමෙන් ශෝධනය වේ.

19. **ශංඛ = හක් :—**

i පලමක් පමණ සක් කැබලි පොට්ටනි බැඳ ජම්බිර ස්වරසයෙන් යාමයක් දෝලා යන්ත්‍රයෙහි ස්වේද දී මාෂ අර්ධයක් ශෝධිත වංගණ සමග මූෂාවෙක අසුරා දණ්ඩ යන්ත්‍රයෙන් මාරණය කොට චූර්ණය පිළියෙල කරගත යුතු වේ.
ii වරාටිකා ශෝධන ක්‍රමය ද මෙහි දී අනුදන්නා ලැබේ.
iii ශංඛ අම්ලවර්ග ජලයෙන් යාමයක් භාවනා දී ගජපුටයකින් දවා ගන්නේ ය.

20. **වංගණ = පුස්කර :—**

i වංගණ කබලක ලා, බැද ගැනීම ශොධනය සඳහා යෝග්‍ය වේ.

21. **ස්ඵටිකා = සිනක්කාරම් :—**

i කබලෙහි ලා බැද ගනු ශෝධනය සඳහා යෝග්‍ය වේ.

22. **ගෞරී පාෂාණ :—**

i පාෂාණ කැබලි, කරිවිල යුෂයෙන් දෝලා යන්ත්‍රයෙන් දිනක් ස්වේද දීමෙන් ශෝධනය වේ.
ii පාෂාණම් කුඩා කැබලිවලට කඩා සිහින් රෙදි කඩක පොට්ටනි බැඳ ඇට ඉවත් කළ කරිවිල ගෙඩියක බහා,නූල්වලින් වෙළා එළකිරෙන් තම්බා ඉක්බිති උණු දියෙන් සෝද ගත යුතු ය.

23. **රිදී තුත්ථං :—**

කුඩා කැබලිවලට කඩා. දුන්තෙලින් අනා පොට්ටනි බැඳ එළමූත්‍රයෙන් දෝලා යන්ත්‍රයෙන් තම්බා ගත යුතු වේ.

24. **ශිලාජතු :—**

i ශිලාජතු ශුද්ධකොට කැබලි කොට දැඩි උණු දියෙහි බහා යාමයක් තබන්නේ ය. පසුව බඳුනෙහි ම තබා මන්ථනය කොට රෙද්දකින් පෙරා, එය පවිත්‍ර මැටි භාජනයක දමා දැඩි අව්වේ ලා වියලා ගත යුතු ය. එහි දී ක්‍රමයෙන් ද්‍රවය උඩ බඳින යොදය (ඝන සාරය) බේරා ගත යුතු ය.

උෂ්ණෝදකය වෙනුවට ත්‍රිඵලා ක්වාථය හෝ ශාලසාරාදී ගණ ක්වාථය හෝ යෙදීම වඩා යෝග්‍ය ය.
ii ශිලාජතුවල මල කොටස් ඉවත් කොට, එළකිරි ත්‍රිඵලා ක්වාථය, භෘංගරාජ ස්වරස යන ද්‍රව්‍යන්ගෙන් එක් දිනක් බැගින් ලෝහ පාත්‍රයක තබා ගන්නේ ශෝධනය වේ.
ශිලාජතු සමග කළුකැම්මෙරිය සහ කොල්ලු සේවනය නිසිද්ධ ය.

පිෂ්ටි :— මුක්තා, ප්‍රවාල, මුක්තා ශුක්ති (සිප්පි) යන මේවා, ශුද්ධියෙන් පසු අති සූක්ෂ්ම ලෙස ගලෙහි ලා අඹරා ගැනීම පිෂ්ටි නම් භස්ම නොකළ හුදු පිෂ්ටි යෝගයන්හි ද කේවලව ද යෙදේ.

සූර්යතාපි දෙවරක් ශෝධිත (Ripined) ශිලාජතු.

අශුද්ධ ශිලාජතු පලං 12 යි. = භාග 01 යි. උතුරුවා ගත් දැඩි උණුවතුර පලං 24 යි. = භාග 02 යි. තිපල් කෂායපලං 06 යි. = භාග 1/2 යි. (යන මේ අනුපාතයට)

මෙම මිශ්‍රණය 01 දරණ ලෝහ යකඩ භාජනයට දමා දැඩි හිරුරැසෙහි දැඩි අව්වෙහි පැය 03 ක් තබා ඉන්පසු ඉතා හොඳට මිශ්‍රණය පොඩිකර රෙද්දකින් පෙරා ගන්නේය. එම පෙරා ගත් වැලි ගල් කුඩු ආදිය රහිත පිරිසිදු මිශ්‍රණය අංක 02 දරණ ලෝහභාජනයට දමා දැඩි උණු වතුර දමා, පෙරා සේමැ දැඩි අව්වෙහි තබන්නේය. එම අංක දෙක දරණ භාජනයෙහි වතුර මත මිදෙන ශිලාජතු පරිස්සමින් එකතු කර අංක 03 දරණ ලෝහ භාජනයෙහි බහා දැඩි වතුර දමන්නේය. එම භාජනයෙහි දිය මතුපිට මිදෙන ශිලාජතු පරිස්සමින් (වතුර නො කළඹා) එකතු කැර අංක 04 දරණ ලොහ භාජනයට දමා දැඩි අව්වෙහි සම්පූර්ණයෙන් වේලෙන තෙක් තබා එකතු කැර සුදුසු භාජනයක සංරක්ෂණය කරන්නේය. එය දෙවරක් හිරුරැසින් ශෝධිත සූර්යතාපි (Ripined) ශිලාජතුය. (රසතරංගිනි)

කල්කටාවේ දෙස්තර කාර්තික් චන්ද්‍ර බසු (බෝස් රසායනාගාරය) මහතා මෙම ශෝධනයට උණුවතුර වෙනුවට තිපල් කෂාය සහ දසමුල් කෂාය යෙදීම සුදුසු යැයි සඳහන් කරයි. (භාරතීය භෛෂජ්‍යය)

ධාතු – උපධාතු ශෝධන මාරණ විධිය

1. ස්වර්ණ = රන් :—

I. කටුවෙන් සිදුරු කළ හැකි තරම් තුනී වූ ශෝධිත ස්වර්ණ පත්‍ර මාතුලුංග ස්වරසින් අඹන ලද පඤ්චමෘත්තිකාවෙහි බහා ඉන් මර්දනය කර. පසුව පඤ්චමෘත්තිකා, ගොම්වැරටි, අලු, ලවණ යෝගය දෙහි ඇඹුලෙන් අඹරා රන් පත්හි ගා වියලා කපෝත පුටයෙන් පුට දී ගන්නේ ය.

II.

ශුද්ධ රස	භාග	1 යි;
ශුද්ධ ගන්ධක	භාග	2 යි;
ශුද්ධ ස්වර්ණ	භාග	1/4 යි.

කජ්ජලිකොට මැටි මූෂාවක ලා ගොම්වැරටි 30 කින් පුට දෙන්නේ ය. පුට දෙකකින් නිරුත්ථ භස්ම වේ. (රස හෘදය)

III. වරා කිරෙන් අඹරන ලද ශෝධිත ස්වර්ණ මාක්ෂික, සීසක කල්කය ශෝධිත ස්වර්ණ පත්‍රයන්හි ගා වියලා මූෂාවක අහුරා කුක්කුට පුටයක් දිය යුත්තේ ය. මාරණය වේ.

IV. ශෝධිත ස්වර්ණ පත්‍ර කර්ෂයක් ගෙන, ඊ සමාන භාගයක් ශෝධිත රසදිය ලා, දෙහි ඇඹුලෙන් අඹරා පසුව සෝදා හරනේ ය. ඉක්බිතිව, ශෝධිත හිංගුල, ගන්ධක, මනෘශිලා, නවසාර කර්ෂය බැගින් ගෙන දෙහි ඇඹුලෙන් අඹරා ස්වර්ණ සමග මර්දනය කොට රන් කැබලි නො දිස්නා තෙක් (නිශ්චන්ද්‍ර වනතෙක්) පුට දී ගන්නේ ය. ඒ අනුව පුට 1—2 ක් යෙදිය යුතුව ඇත. ඉන් ස්වර්ණ භස්ම ලැබේ.

2. රජත = රිදී :—

I. ශෝධිත නාග චූර්ණය (සීසක), ටංකණ ක්ෂාරය සමග තුනී රජත පත්‍රයන්හි ආලේප කොට, ඉක්බිතිව යවක්ෂාර සහිත දෙහි හෝ දෙඩම් ඇඹුලෙන් දෝලා යන්ත්‍රයෙහි පැසවා ගන්නේ ශෝධනය වේ.

II. ශෝධිත හිංගුල දෙහි ඇඹුලෙන් අඹරා රජත පත්‍රයන්හි ආලේප කොට, ඌර්ධ්වපාතන යන්ත්‍රයෙන් නෙවරක් පැසවිය යුතු ය. එකල ඌර්ධ්ව පාත්‍රයෙහි රසදිය ද, යටි බඳුනෙහි ශෝධිත රජත ද පිහිටයි.

III. ශෝධිත හරිතාල, ගන්ධක, රජතපත්‍ර සමව ගෙන දෙහි ඇඹුලෙන් අඹරා ශරාවයක ලා, පුටයක් දී දවා ගත යුතු වේ. මෙසේ පුට තුනක් යෙදීමෙන් රජත භස්මය ලබා ගත හැකි ය.

. තාම්‍ර = තඹ :—

I. සෛන්ධව ලවණ වරා කිරෙන් අඹරා එය තුනී තඹපත්හි ගා තීව්‍ර අග්නියෙන් ගිනියම් කොට නික කොළ ස්වරසයෙහි සත් වරක් හෙළා නිවා ගන්නේ ය.

II.

ශෝධිත රසදිය	භාග	1 යි;
ශෝධිත ගන්ධක	භාග	2 යි;
ශෝධිත තාම්‍ර පත්‍ර	භාග	3 යි.

රසදිය ගන්ධක කෝමාරිකා ස්වරසින් අඹරා තඹපත්හි ආලේපකොට වියලා එය ශරාවයක බහා ඊ මත සූරණ කන්ද කල්කය යොදා ශරාව බද්ධ කොට ගොම වැරටියෙන් යාම සතරක් ගිනි දෙන්නේ ය. ඒ අතර, පුටය වටේ ආලවාලයක් තනා එය පවිත්‍ර ජලයෙන් වරින් වර පිරවිය යුතු වේ. පසුව ශරාවය ස්වාංගශීත කොට තාම්‍ර භස්මය ගත යුතු වේ.

III. තාම්‍ර අමෘතීකරණය :—

I. තාම්‍ර භස්ම, ගිතෙල්, කිරි, රස, ගන්ධක සමභාගව ගෙන නික කොළ යුෂ යොදා අඹරා චක්‍රිකා කොට පුට දී ගන්නේ ය.

II. තාම්‍ර භස්ම කිඩාරන් අල යුෂයෙන් අඹරා, කිඩාරන් අලය තුළ බහා බැඳ, උණු අලුවෙන් හෝ ගින්නෙන් තම්බා ගත යුතු යි.

ශෝධිත තාම්‍ර	භාග	1 යි;
ශෝධිත රසදිය	භාග	1/4 යි;
ශෝධිත ගන්ධක	භාග	1 යි.

යතුවෙන් ගෙන පාරද තාම්‍ර අඹරා පසුව ගන්ධක සමහ ඇඹුලැඹිලිය ස්වරසින් මනාව පේෂණය කොට වියලා ශරාව යෝගයෙන් ගජපුටයෙහි දවා ගන්නේ ය. මෙසේ නෙවරක් පුට දී ගැන්මෙන් තාම්‍ර හස්ම ලැබේ. ඉක්බිතිව එය අමෘතීකරණය කොට ගත යුත්තේ යි.

4. **සීසක = කළු ඊයම් = නාග :—**

I. නාග (කළු ඊයම්), වංග (සුදු ඊයම්), ලෝහ බඳුනක උණුකොට ඇතුළත තලතෙල් හෝ වරාකිරි හෝ පිරවූ සිදුරක් සහිත බද්ධකොට ලූ ශරාවයකට සිදුරෙන් වත්කළ යුතු ය. මෙ අයුරෙන් සත් වරක් අලුත් තෛල යොද ශෝධනය කරන්නේ ය. පසුව මෝරු, ගෝමුත්‍ර, කාඤ්ජික, උදක, කුලත්ථ ක්වාථය යන ද්‍රව්‍යයන් ද යොදමින් පෙර පරිදි ශෝධනය කළ යුතු ය. නාග (කළු ඊයම්) විශෙෂ ශෝධනය ලෙස, පෙර පරිදි වරාකිරි යොද නෙවරක් ස්වරස හෝ ක්වාථය හෝ යොද ගත හැකි වෙ.

II. ශෝධිත නාගපත්‍ර කතුරුමුරුංගා පත්‍ර කල්කය හා මැටි වළඳක ලා, ගින්නෙන් උණුකොට එයට නාග ප්‍රමාණයෙන් 1/4 ක් වංඇපල, කරල්හැබක්ෂාරය මඳ මඳව ඉස පැසවා හස්මය වූ පසු වංඇපල ස්වරසින් අඹරා ගජ පුටයෙන් පුටයක් දී ගන්නේ ය. ඉන් සීසක හස්මය ලැබේ.

5. **වංග = සුදු ඊයම් :—**

(I) ලෝහ හැන්දක ලූ වංග ප්‍රමාණය ගිනියම් කොට පෙර පරිදි අම්ලතක්‍ර යෙදූ බඳුනකට ලා නිවා ගන්නේ ය. පසුව යලි උණුකොට කෝමාරිකා ස්වරසින් යෙදූ බඳුනකට ලා නිවා ගත යුතු ය. මෙ අයුරින් නෙවර බැගින් ශෝධනය කටයුතු වේ.

(II) ශෝධිත වංග පත්‍රයන් වරා කිරෙන් අඹරා ගත් ශෝධිත හරිතාල කල්කය ගා වියලා, අඹරා ගත් බෝ පොතු කල්කය හා මධ්‍ය ගත කොට ශරාවයෙහි ගජපුටයකින් දවා ගන්නේ ය. මෙසේ සත් වරක් හස්ම කටයුතු ය.

(III) වංග යකඩ බඳුනක උණුකොට එයට කහ කුඩු, යමානිකා, ජීරක, සියඹලා කරල් පොතු, ඇසතු පොතු චූර්ණය වංග හා සමාන බරක් වෙන් වෙන්ව ක්‍රම ක්‍රමයෙන් යොද හැඳි ගෑ යුතු ය. ශෝධන හස්ම වේ. ප්‍රසස්ථයි.

6. **යශද = තුත්ථනාගම්** (දස්තා) :—

(I) යශද ලෝහ හැන්දක ලා තීව්‍ර අග්නියෙන් උණුකොට හුණුදිය පිරවූ ශරාවයකට මුව වසා ලූ සිදුරක් සහිත ශරාවයේ සිදුරෙන් වත් කරන්නේ ය. මෙසේ සත් වරක් යෙදීමෙන් ශෝධනය වේ.

(II) පෙර පරිදි යශද උණුකොට නිකමුල් ස්වරසයෙහි සත් වරක් හෙළා නිවා ගැනීමෙන් ද ශෝධනය වේ.

(III) ශෝධිත යශද ලෝහ බඳුනක ලා උණුකොට ඒ හා සමාන බරක් රසදිය යෙදූ බල්වයක ලා යුහු යුහුව අඹරන්නේ ය. ඉක්බිති එය දෙහි ඇඹුලෙන් සෝද හැර යලි යශද හා සමාන බරක් ශෝධිත ගන්ධක යොද අඹරා ශරාවයකලා පුටයක් දී ගත්තේ හස්ම වේ.

7. **ලෞහ** = යකඩ :—

(I) තීක්ෂ්ණ, කාන්තාදී ලෞහ කැබලි ලෝහ බඳුනක ලා ගිනියම් කොට තෛල, තක්‍ර, ගෝමූත්‍ර, කාඤ්ජික, කුලත්ථ ක්වාථය යන ද්‍රව්‍යයන්හි වෙන් වෙන්ව සත්වර බැගින් ලා නිවා ගැනීමෙන් ද, ගිනියම් කොටගත් ලෝහ කැබලි කෙසෙල් අල ස්වරසෙහි සත් වරක් බහා නිවා ගැනීමෙන් ද ශෝධනය වේ.

(II) හානුපාකය :—

(I) ශෝධිත ලෝහ කැබලි ලෝහ වංගෙඩියක ලා, සියුම්ව කොටා ත්‍රිඵලා ක්වාථයෙන් සත් වරක් සෝද ගත යුතු ය. පසුව ලෝහ බඳුනක හෝ මැටි පාත්‍රයක හෝ එය ලා, ත්‍රිඵලා ක්වාථය වරින් වර යොදමින් අත අනා දින තුනක් වියලා ගත යුතු ය. ඒ සඳහා ලෝහ ප්‍රමාණය හා සමව ත්‍රිඵලා ගෙන එමෙන් දෙගුණයක් දිය ලා 1/4 ට සිඳුවා ගත් ක්වාථය යෙදිය යුතු වේ.

(අ) ස්ථාලි පාකය :—

(II) හානු පාකයෙන් සකසා ගත් ලෝහ චූර්ණය ස්ථාලි පාකයෙන් ද සංස්කරණය කරගත යුතු ය. ඒ සඳහා ලෝහ මෙන් තුන් ගුණයක් ත්‍රිඵලා ගෙන එමෙන් සොළොස් ගුණයක් දිය ලා 1/8 ට සිඳුවා ක්වාථය තනා ගත යුත්තේ ය. ලෝහ චූර්ණය එය හා මැටි හැලියකට ලා, බරාග්නියෙන් සිඳවා ගත යුතු ය. මේ කාර්‍ය්‍යය සඳහා හස්තිකර්ණපලාශ හෝ වන්‍ය පලාශ හෝ ශතාවරි මූල, හෘංගරාජ යන ද්‍රව්‍යයන්ගේ ස්වරස වෙන් වෙන්ව හෝ මිලිතව හෝ යෙදිය හැකි ය.

(III) ශෝධිත ලෝහ චූර්ණය හා සමානව ශෝධිත හිංගුල යොද කෝමාරිකා ස්වරසින් අඹරා චක්‍රිකා කොට වියලා ගජ පුටයකින් දවා ගත යුත්තේ ය. යළි ඉන් 1/20 ක් පමණ ශොධිත හිංගුල යොද ත්‍රිඵලා ක්වාථයෙන් ද, භෘංගරාජ ස්වරසින් ද අඹරා චක්‍රිකා කොට ගජපුටයෙහි දවා ගත යුතු ය. මේ විධිය තීක්ෂ්ණ, කාන්ත ආදි ලෞහ භස්ම-කරණය සඳහා යෙදේ.

(IV) සාමාන්‍ය ලෝහ ශෝධනය කොට දියෙන් යෝද වියලා චක්‍රිකා කොට පුට දී ගැනීම ක්‍රමය වේ. එපරිදි පුට 10—100 ක් දක්වා යොදනු ලෞහ භස්මයේ ගුණොත්කර්ෂය සඳහා යෙදෙයි. සහස්‍රපුටිත භස්මය අති ශ්‍රේෂ්ඨ ය.

8. **මණ්ඩූර** = යබොර :—

(I) තෙල තක්‍රාදියෙන් සාමාන්‍ය ශෝධනය කළ මණ්ඩූර ලෝහ බඳුනක ලා බුලු දරින් ගිනියම් කොට ගෝමූත්‍රයෙහි ලා නිවා ගන්නේ ය. මේ අයුරින් සත් වරක් සැකැසිය යුතු යි.

ශෝධිත මණ්ඩූර ත්‍රිඵලා ක්වාථයෙන් අඹරා වියලා තිස්වරක් පුට දී ගැනීමෙන් රක්තචන්දනසදෘශ මණ්ඩූර භස්මය ලැබේ.

9. **මාද්දර ශෘංග (මුද්‍රා සංබ)** :—

(I) මාද්දර ශෘංග කැබලි වංගෙහි ලා, සියුම් වන සේ කොටා පතුරු වැනි කොටස් ඉවත් කොට අඹරන්නේ ය. පසුව වස්ත්‍රයකින් හලා ජලයෙන් පක්ෂයක් අඹරා අව්වෙහි ලා වියලා චූර්ණකොට ගත යුතු වේ.

10. **කාංස්‍ය** = ලෝකඩ :—

(I) කාංස්‍ය තුනී පත්‍ර තනා අග්නියෙන් ගිනියම් කොට යුහුව ගෝමූත්‍රයෙහි සත් වරක් ලා නිවා ගැනීමෙන් ශෝධනය වේ. එක් එක් වාරයක් සඳහා නව ගෝමූත්‍ර යෙදිය යුතු වේ.

(II) ශෝධිත කාංස්‍ය පත්‍ර හා සමභාගයක් ශෝධිත ගන්ධක යොද වරාකිරෙන් මනාව අඹරා දැඩි අව්වෙහි ලා, වියලා ගජ පුටයෙහි ලා, පුට දී ගන්නේ ය. වාර තුනක් පුට දීමෙන් භස්මය ලැබේ.

11. **පිත්තල** :—

(I) පිත්තල තුනී පත්‍ර පිළියෙල කොට ඊයම් ආලේප කළ ලෝහ භාජනයක ගෝමූත්‍ර ලා, එයට යොද ප්‍රබර අග්නියෙන් යාම හතරක් තම්බා ගන්නේ ශෝධනය වේ.

(II) ශෝධිත පිත්තල පත්‍ර සම ප්‍රමාණ වූ ශෝධිත ගන්ධක සමඟ අර්කක්ෂීරයෙන් අඹරා වියලා සම්පුට යුක්ත ගජපුටයෙන් දවා ගන්නේ ය. මෙසේ තෙවරක් යෙදීමෙන් පිත්තල භස්මය ලැබේ.

(III) ශෝධිත මනෝශිල, ශෝධිත ගන්ධක නිකකොළ යුෂයෙන් අඹරා තුනී පිත්තල පත්‍රයන්හි ආලේප කොට අට වරක් ගජපුට දී ගන්නේ යි.

12. **මාණික්‍ය** = රතු කැට (පද්මරාග):—

(I) මාණික්‍ය දෙහි ඇඹුල් යෙදූ දෝලා යන්ත්‍රයෙහි යාමයක් ස්වේද දී ගන්නේ ය. ඒ සඳහා අම්ල ගණයේ ද්‍රව්‍යයන් ද දෝලා ස්වේදය සඳහා යොදත හැකි ය.

(II) ශෝධිත මාණික්‍ය චූර්ණකොට සමභාගව ගත් ශෝධිත මනෝශිල, හරිතාල, ගන්ධක යන ද්‍රව්‍ය සමඟ දෙහි ඇඹුලෙන් දින සතක් අඹරා චක්‍රිකා කොට වියලා ගජපුටයෙන් අට වරක් පුට දී ගන්නේ මාණික්‍ය භස්මය පඩුවන්ව ලැබේ.

13. **මුක්තා** = මුතු:—

(I) මුතු, ජයන්ති ස්වරස යුක්ත දෝලා යන්ත්‍රයෙහි යාමයක් ස්වේද දී ගත යුතු ය.

(II) ශෝධිත මුක්තා එළ කිරෙන් සිනිඳුව අඹරා තෙවරක් ලඝු පුට දී ගැනීමෙන් භස්මතාවට පැමිණේ.

14. **ප්‍රවාල** = පබලු:—

(I) පබලු (විද්‍රැම) ජයන්ති පත්‍ර ස්වරසින් දෝලා යන්ත්‍රයෙහි යාමයක් මනාව ස්වේද දී ගැනීමෙන් ශෝධනය වේ.

(II) ශෝධිත පබලු සිනිඳුව චූර්ණකොට කෝමාරිකා ස්වරසයෙන් අඹරා චක්‍රිකා තනා වියලා තෙවරක් ලඝු පුට දී ගැනීමෙන් භස්ම වේ.

15. **නව සාදර** = (නවසාර):—

(I) නවසාර ප්‍රමාණය මෙන් තෙගුණයක් දිය ලා දියකොට වස්ත්‍රයකින් පෙරා එය හට්ටියක ලා, තීව්‍ර අග්නියෙන් සිඳුවා ගත යුතු ය.

(II) නවසාර ජලයෙහි දිය කොට පෙරා වියලා ගත යුතු ය.

16. **සෞරක** = වෙඩිලුණු (යවක්ෂාර):—

(I) සෞරක ප්‍රමාණයෙන් අඩක් වූ අති උෂ්ණ ජලය ලා දිය කොට පෙරා අව්වෙහි තැබිය යුතු ය. භාජනය පතුලෙහි නිර්මල සෞරක රැස් වේ. පසුව එය බල්වයෙහි ලා චූර්ණ කොට එන්සහල් ජලයෙන් තෙවරක් භාවනා දී ගන්නේ ශෝධනය වේ.

(II) වෙඩි ලුණු වතුරෙහි දියකර පෙරා මැටි බඳුනෙක් හි ලා සිඳුවා ගත යුතු ය.

17. **ශුක්ති** = මුතුබෙලිකටු:—

(I) මුතු බෙලිකටු ජයන්ති ස්වරසින් දෝලා යන්ත්‍රයෙහි යාමයක් පැයවාගන්නේ ශෝධනය වේ.

(II) බෙලිකටු අම්ල වර්ගයක ස්වරසින් දෝලා යන්ත්‍රයෙහි තම්බා ගන්නේ ද, ශෝධනය වේ.

(III) ශෝධිත ශුක්ති සියුම්ව කැබලි කොට ශරාව බද්ධ කොට පුටයක් දී ගන්නේ ශ්වෙත භස්මය ලැබේ. මාරණය ද වේ.

18. **මෘගශෘංග** = මුව අං:—

(I) මෘගශෘංග කියතකින් කැබලිවලට කපා සුණුකොට පසුව අර්කක්ෂීරයෙන් අඹරා චක්‍රිකා කොට වියලා ශරාව බද්ධකොට පුට දී ගන්නේ ය. මෙසේ තෙවරක් යෙදීමෙන් මෘගශෘංග භස්මය ලැබේ.

(II) මයූර පුච්ඡ භස්ම:—

මොණර පිල්, ගිතෙල් පහන් තිරයක දල්ලෙන් දවාගත් කල භස්මය ලැබේ. මොණර පිලේ චක්‍රිකා කොටස විශේෂයෙන් ගුණදායක වේ. එම නිසා එම කොටස වෙන්කර දවා ගැනීම උචිත ය.

19. **සමුද්‍ර ඵේන** = මුහුදු පෙන:—

(I) සමුද්‍ර ඵේන කැබලි වල වැලි ආදි අනවශ්‍ය දෑය ඉවත් කොට සියුම්ව චූර්ණකොට දෙහි ඇඹුලෙන් එක් දිනක් භාවනා දී වියලා ගන්නේ ශෝධනය වේ.

20. **ගල්මද ගල්නහර:**—

(I) යන ද්‍රව්‍යයන් දේශීය චිකිත්සාවේ ගුලි, කල්ක, සඳහා බෙහෙවින් ව්‍යවහාර වන පාර්ථිව ද්‍රව්‍ය වෙති. විශේෂ ශෝධන මාරණ ක්‍රමයක් නොදක්නා ලැබේ. එහෙත් දූලි වැලි අපවිත්‍ර දෑය ඉවත් කොට යෝග සඳහා ගනු ක්‍රමය යි.

21. **(1) ලවණශුද්ධිය:**—

(I) මුදුලුණු, සන්තෘප්තික (Saturate—ද්‍රාවයන්) වන අයුරු තැඹිලි වතුරෙහි (ජලයෙහි දියවන උපරිම ප්‍රමාණයට) දියකර රෙදිකඩින් හොඳාකාර පෙරා ඉක්බිති ලෝහ හෝ මැටි බඳුනෙක්හි බහා චූර්ණයක් ලෙස ජලය සම්පූර්ණයෙන් සිඳී යන තෙක් සිඳුවා ගන්නේ ය. ආහාර පිණිස හෝ ඖෂධ පිණිස යෝග්‍ය ය.

(II) කටුඑරමුදු කොළ යූෂයෙහි සන්තෘප්තික ද්‍රාවයක් වන අයුරු ලුණු දියකර පෙරා පෙර සේ ම සිඳුවා ගන්නේය. මෙය අක්ෂි රෝගීන්ට එතරම් අහිතකර නොවන්නේ ය

(III) මුරුංගා කොළ යූෂයෙහි සන්තෘප්තික ද්‍රාවයක් වන අයුරු ලුණු දිය කොට පෙර සේ ම පෙරා සිඳුවා ගනනෙ ය. අධික රුධිර පීඩනයෙන් පෙළෙන්නවුනට මෙයින් ඉතා ස්වල්පයක් යෙදීම අන්තරාදායක නොවේ.

(IV) වල්හබරල අල කොටා මිරිකා ගත් යූෂයෙහි සන්තෘප්තික ද්‍රාවයක් වන අයුරු ලුණු දියකොට පෙරා ඉහත සඳහන් ලෙස සිඳුවා ගන්නේ ය. විශේෂයෙන් ම මෙසේ සිඳුවා ගත් ලවණ ශෝථ රෝගීන්ට ඉතා ස්වල්ප වශයෙන් දීම අනතුරුදායක නොවේ.

(2) සහිඳලුණු ශුද්ධිය:—

කීකිරිදිය යූෂයෙහි සහිඳලුණු සන්තෘප්තික ප්‍රමාණයට දියකර පෙරා ඉහත සඳහන් පරිදි සිඳුවා ගන්නා ලද්දේ ඔසු පිණිස ද ශෝථ ආදි රෝගයන්හි ද අල්ප වශයෙන් යෙදිය හැකි ය. විශේෂයෙන් ලවණ වර්ජිතව සේවනය කළයුතු රසපර්පටි ආදි සංයෝග වැළඳීමෙහිදී ද මෙසේ ශෝධිත සහිඳලුණු මද වශයෙන් ගත හැකි ය. හබරල අල යූෂයෙහි ඉහත පරිදි ශෝධිත සහිඳලුණු ශෝථ රෝගීන් විෂයයෙහි ඉතා අයෝග්‍ය නොවේ.

සුවය පුෂ්ප, වලල් ලුණු ආදිය ද ඉහත සඳහන් කිසියම් ආකාරයෙකින් ශෝධනය කොට ගැනීම යෝග්‍ය ය. සිද්ධ වෛද්‍ය ක්‍රමයෙහි ලවණ ශුද්ධිය වෙසෙසින් සඳහන් ය. ("ලවණානි පෘථක් පෘථක් ශොධ්‍යාන්‍යෙත මායවීන්තෙව") එහි සඳහන් එක් ක්‍රමයක් නම් භාවනා දීම ය. සිවගුණයෙන් වූ භාවනා ජලයෙහි ලවණ දිය කොට පෙරා අව්වේ සිඳුවා ගැනීම ය. භාවනා ජලය සඳහා ගිම් වැටෙන කාලයේදී අලුයම පිරිසිදු බඳුනෙක්හි රැස් කර ගත් පිනිදිය ගත යුතු ය.

22. රස පරීක්ෂා :—

(I) රේඛාපූර්ණ භස්ම:

කිසියම් භස්මයක් මාපටැඟිල්ල හා තර්ජනී අංගුලියෙන් තුඩු දෙකින් මර්දනය කළ කල්හි භස්මය එහි ඇඟිලි තුඩු රේඛා තුළ පිවිසෙන සුලු ද ඒ රේඛා පූර්ණ ලක්ෂණ නමි.

(II) වාරිතර භස්ම:—

වීදුරු හෝ ලෝහ බඳුනෙක්හි නිශ්චල ජලය මත යෙමින් යෙමින්, ඇඟිලි තුඩින් බහා ලූ භස්මය නොගිලී මතුපිට පාවෙන සුලු ද එය වාරිතර භස්ම නමි.

(III) නිරුත්ථ භස්ම:—"නිරුත්ථං යන්න පුනර්ජීවති"

ස්වර්ණාදි ධාතු භස්ම උත්තාප සහ මිත්‍ර පංචක සහායත්වයෙන් නැවත මුලින් පැවති ධාතු අවස්ථාවට පත් නොවන සේ සම්පූර්ණ ලෙස භස්ම වූයේ ද එය නිරුත්ථ භස්ම නමි.

(IV) කිසියම් ධාතුවකගේ භස්මය ගුඩ, පුස්කර, මීපැණි, ගිතෙල් ආදියත් සමග කෝවයෙක්හි ලා පුට දීමෙනුදු භස්මයෙන් ධාතුව වෙන්වී නොපෙනේ ද, එම භස්මය අපුනර්භව භස්ම නමි. (නිරුත්ථ මෙනි)

(V) ස්වාංග ශීත:—

පුටදුන් වළෙන් හෝ ලිපෙන් ඉවත් නොකොට භස්ම භාජනය එහි ම සම්පූර්ණයෙන් නිවී ගියේ ස්වාංගශීත නමි.

(VI) බාහ්‍ය ශීත:—

පුටදුන් වළෙන් හෝ ලිපෙන් ඉවත්කර තබා සිසිල් වූයේ බාහ්‍ය ශීත නමි.

(VII) නිශ්චන්ද්‍ර:—

අභ්‍ර රජත ආදිය භස්ම කිරීමෙන් පසු විපුලදර්ශක කාචයෙකින් (මැග්නිෆයින් ග්ලාසයෙකින්) බැලූ විට එම අභ්‍ර රජත ආදියේ ඇති සූක්ෂ්ම කැබලි හෝ නොපෙනී යේ නම් එය නිශ්චන්ද්‍ර බව දත යුතුය.

විෂ – උප විෂ ශෝධනය

1. **වත්සනාභ = වච්චනාවි :—**

(I) වච්චනාවි අල කුඩා කැබලි වලට කපා මැටි බඳුනක ලා, එය වැසෙන සේ ගෝ මූත්‍ර වත්කොට දැඩි අව්වේ තැබිය යුතු වේ. ඉක්බිතිව ද්‍රවය සිඳී ගිය පසු යළි අලුත් ගෝමූත්‍ර යොදමින් දින තුනක් භාවනාදී පසුව උනු දියෙන් සෝද අව්වේ ලා වියලා ගත යුතු වේ. මෙය අමෘතීකරණය යනුවෙන් සඳහන් වේ. අවශ්‍ය ම ශෝධනය ද මෙය වේ.

(II) වච්චනාවි කුඩා කැබලි වලට කපා රෙදි කඩක බැඳ, එළකිරි ලා, දෝලා යන්ත්‍රයෙන් යාම 1-2 ක් තම්බා උණුදියෙන් සෝද අනතුරුව වියලා ගනු යෙදේ.

(III) වච්චනාවි, ත්‍රිඵලා ක්වාථය යොද, දෝලා යන්ත්‍රයෙන් ස්වේද දී වියලා ගත යුතු ය.

(IV) වච්චනාවි කැබලිවලට කපා පොට්ටනි බැඳ එළකිරෙහි ලා, තම්බා වියලා ගැනීම ද අනු දන්නා ලැබේ.

(V) වච්චනාවි අල කැබලි එන්සහල් සුණු සහිත සාල්පානු දියෙන් දෝලා යන්ත්‍රයෙන් ස්වේද දී ගැනීම ද ක්‍රමයකි.

2. **විෂතින්දුක බීජ = ගොඩකදුරු ඇට (කුචිලා) :—**

(I) ගොඩකදුරු ඇට කාඤ්ජිකයෙහි ලා දින තුනක් තබා පොතුහැර අංකුරය ඉවත් කොට කැබලි කපා වියලා ගත යුතු ය.

(II) අංකුරය ඉවත්කොට ගත් ගොඩකදුරු ඇට පිට පොත්ත කරවන තෙක් ගිතෙලින් බැද ගත යුතු යි.

(III) ගොඩකදුරු ඇට කැබලිවලට කපා ගිතෙලින් මඳව බැද ගත යුතු ය.

(IV) පැසුණු ගොඩකදුරු ඇට මැටි හෝ වීදුරු හෝ බඳුනෙක්හි ගෝමූත්‍ර සමඟ බහා දිනකට පසු ගෝමූත්‍ර ඉවත් කළ යුතු ය. අලුත් මූත්‍ර යොදමින් මෙසේ දින 7 ක් පොහවා, අටවැනි දින ඇට දෙකට පලා එහි පොත්ත සහ අංකුර ඉවත්කොට පසුව එළකිරෙන් දෝලා යන්ත්‍රයෙන් තම්බා ගත යුතු ය. මෙය යෝග්‍යතම ශොධන විධිය යි.

3. **ජයපාල බීජ = ජයපාල ඇට:—**

(I) ජයපාල ඇට පොතු හැර මද පලා ඊ මැද වූ පත්‍ර ඉවත්කොට, ඉන් 1/8ක් ශෝධිත ටංගණ යොද, පොට්ටනි බැඳ මැටි පාත්‍රයක දුග්ධ ලා, දෝලා යන්ත්‍ර නියමයෙන් රාත්‍රි තුනක් ස්වේද දී වියලා ගත යුතු වේ.

(II) ජයපාල ඇට පොතු හැර පලා දලුව ඉවත්කොට, පොට්ටනි බැඳ මැටි පාත්‍රයක ගොදුග්ධ සහිතව දෝලා යන්ත්‍රයෙන් ස්වේද දිය යුතු ය. පසුව, එය අඹරා මැටි කබලක හෝ රෙදි කඩක හෝ මයිශෝෂණ පත්‍රයක (බ්ලොටින් පේපරයක) හෝ ආලේප කොට, මඳ පවනේ, වියලා ගත යුතු ය.

(III) ජයපාල ඇට පොතු හැර මී ගොමයෙහිලා, තම්බා පසුව පලා දලුව ඉවත්කොට එළකිරෙන් තම්බා වියලා ගත යුතු ය.

(IV) මේ සියලු ශොධන අවසානයෙහිදී නවමු මැටි වළඳක ලා බැද ගත යුතු ය. මෙය යෝග්‍ය තම ක්‍රමය වේ.

4. **ධුස්තුර බීජ** = අත්තන ඇට:—

(I) අත්තන ඇට පොට්ටනි බැඳ එළ කිරෙන් දෝලා යන්ත්‍රයෙහි යාමයක් ස්වේද දී පසුව උණු දියෙන් සෝද වියලා ගත යුතු වේ.

(II) අත්තන ඇට, පොට්ටනි බැඳ ගෝමූත්‍රයෙන් දෝලා යන්ත්‍රයෙන් යාමයක් ස්වේද දී වියලා චූර්ණකොට රෙදි කඩින් හලා ගත යුතු ය.

(III) අත්තන ඇට, ගෝමූත්‍රයෙහි යාම සතරක් පෙඟෙන්නට තබා, පොතු හැර, වියලා ගත යුතු වේ. (දේශීය ක්‍රමයකි).

5. **කංසා** = ගංජා:—

(I) වියලි කංසා කොළ (පැලෑටිය) ජලයෙහි ලා මැඩ සෝද වියලා එළඟි තෙලින් මඳක් බැද ගත යුතුවේ.

(II) වියලි කංසා සමස්තය පොට්ටනි බැඳ බබ්බුල ක්වාථය යොද මඳ ගින්නෙන් දෝලා යන්ත්‍රයෙහි ස්වේද දී ගත යුතු ය.

6. **ගුංජා** = ඔලිඳ:—

(I) ඔලිඳ ඇට චූර්ණය දෙපටක් වූ රෙදි කඩක පොට්ටනි බැඳ එළකිරෙන් යාමද්වයක් දෝලා යන්ත්‍රයෙහි ස්වෙද දී ගන්නේ ය.

(II) ඔලිඳ ඇට එක්පට රෙද්දක පොට්ටනි බැඳ කාඩි යොද දෝලා යන්ත්‍රයෙහි ස්වෙද දී ගනු යෝග්‍යවේ.

(III) ඔලිඳ ඇට කාඩියෙන් හෝ එළකිරෙන් තම්බා ගනු ද යෙදේ. (දේශීය ක්‍රමයකි.)

7. **අහිඵෙන** = අබින්:—

(I) අබින් අමු ඉඟුරු ස්වරසින් සත් වරක් භාවනා දීමෙන් ශෝධනය වේ.

(II) අබින්, අමු ඉඟුරු යූෂයෙහි එක් විසිවරක් බහා තබා ගැනීමෙන් ද ශෝධනය වේ.

(III) අබින් කබලක ලා, බැද ගැනීම ද ශෝධනය සඳහා යෙදේ.

(IV) අබින් තද උණුසුම් සඳුන් කෂායෙහි දියකොට පෙරා භාවානා දී ගත යුතු යි.

8. **ස්නුහික්ෂීර** = දළුක්කිරි:—

(I) දළුක් කිරි පල දෙකක් වස්ත්‍රයක යොද කොසඹ කොල ස්වරස කුඩවයක බහා තබා පසුව දැඩි අව්වෙන් වියලා ගත යුතු වේ.

9. **භල්ලාතක** = සෙමකොට්ටං:—

(I) භල්ලාතකඵල ඉෂ්ටිකා = ගඩොළු චූර්ණය සහිතව පොට්ටනි බැඳ තදින් ඝර්ෂණය කළ යුතු ය. අනතුරු ව එහි තෙල සහ පොතු ඉවත් වූ පසු උණු දියෙන් සෝද වියලා ගත යුතු වේ.

(II) භල්ලාතකඵල පොට්ටනි බැඳ කසපැන් දියෙන් දෝලා යන්ත්‍රයෙහි ස්වෙද දී වියලා ගනු ද යෙදේ.

10. **ගුග්ගුල** = ගුගුල්:—

(I) ගුගුල්හි අපවිත්‍ර රොඩු ගල් ආදිය ඉවත් කොට එමෙන් සිවු ගුණයක් ගව්‍ය දුගධ = එළකිරි යොද දෝලායන්ත්‍රයෙන් ස්වෙද දී ගන්නේ ය.

(II) දශමූල හෝ රසකිඳ හෝ ත්‍රිඵලා හෝ ක්වාථය දැඩි උණුසුම් කොට, ගුගුල් එයට ලා, දියකර මිරිකා පෙරා වියලා ගත යුතු ය.

(III) වර්ෂා ඍතුවේ දී නම් ගිතෙල් මදක් සමඟ ලෝහ භාජනයෙක්හි මඳගින්නේ හැඳි ගා පදමට බා ගන්නේ ය.

11. **චිත්‍රක** = රත්නිටුල් මුල්:—

(I) රත්නෙටුල් මුල් නාරටි හැර කැබලි හුණුදියෙහි ගලා එහා ම සෝද වියලා ගනු යෙදේ.

12. **හිංගු** = පෙරුංකායම්:—

(I) පෙරුංකායම් ගිතෙල් ගා ලූ බඳුනක ලා බැද ගනු යෙදේ.

13. **වෘද්ධදරක**:—

(I) වෘද්ධදරක බීජ එළ කිරෙන් යාමයක් දෝලා යන්ත්‍රයෙහි ස්වෙද දී පවනැ වියලා ගත යුතු ය.

යෝග සංග්‍රහය

ස්වරස අනුපාන, ඛණ්ඩය

1. යෝග නාමය:— **උක්පැණි අනුපානය**

යෝගය:— උක්පැණි, මීපැණි, දෙහි ඇඹුල්, විළඳකුඩු, යාදික්කා ගලගා දියකර සීතාරාම ගුලි හෝ සුරන්විදුර ගුලි සමග දෙන්නේ ය.

ප්‍රයෝග — සියලු වමනයට සීතාරාම ගුලි සමග යෙදිය යුතු ය.

2. යෝග නාමය:— **කොහොඹ, රඹුක් අනුපානය**

යෝගය:—
කොහොඹපොතු,
රඹුක් බඩ,
සුදුලූනු,

සංස්කරණය:— සමව ගෙන කොටා උනාළුවෙන් හෝ වණ්ඩුවෙන් තම්බා මිරිකා පෙරා ගත යුතු යි.

ප්‍රයෝග:— වැදූගෙයි සන්නියට හා වැදූගෙයි උණට යෙදේ.

අනුපාන:— කොහොඹ තෙල්, කෝලදවුණ්ඩ හෝ මාත්තුපහ ගුලි සමග වේ.

3. යෝග නාමය:— **යකිනාරන් කොළ අනුපානය**

යෝගය:— යකිනාරන් කොළ හා පොතු වේ.
කොටා වණ්ඩුවෙන් තම්බා මිරිකා, පෙරා කෝලදවුණ්ඩ මාත්තු පහ හෝ සීතාරාම ගුලි හා මී පැණි දමා දෙන්න.

ප්‍රයෝග:— සියලු ආම සහිත අජීර්ණ උණට යෝග්‍ය වේ.

4. යෝග නාමය:— **මාතා වෑහති අනුපාන**

යෝගය:—
පාවට්ටා දළු*
බටු දළු,
නික දළු,
කිරිඅඟුන දළු
අමුඉඟුරු
සුදුලූනු

සංස්කරණය:— මීට මීට සමව ගෙන කොටා වණ්ඩුවෙන් හෝ උනාළුවෙන් තම්බා මිරිකා පෙරා ගත යුතුය.

ප්‍රයෝග:— සෙම් වා ප්‍රධාන සන්නිපාත උණට (ශ්වසනක ජ්වරයට) සුදුසු අවස්ථාවන්හි යෙදිය යුතු ය. ශ්වාස කාස ශමනය කරයි.

අනුපාන:— සීනි, මීපැණි. ඇඹුල් දෙඩම් යුෂ හා බුද්ධරාජ කල්කය දියකර ගත යුතු ය.

* පාවට්ටා නාමය සඳහා මේ සියළු යෝගයන්හි ආඩාතෝඩා ගත යුතු ය. පාවට්ටා නමින් ප්‍රසිද්ධ වෙනත් ද්‍රව්‍යයක් ද තිබේ.

5. යෝග නාමය:— **කුවෙර ලසුනාදි අනුපානය**

යෝගය:—
කුඹුරු දළු,
අමු ඉඟුරු
සුදුලූනු
යකිනාරන් දළු, යකුවනස්ස දළු
දෙහි දළු,
නික දළු,

සංස්කරණය:— මීට මීට සමව ගෙන කොටා, වණ්ඩුවෙ හෝ උනාළුවෙන් තම්බා මිරිකා පෙරා ගත යුතු ය.

ප්‍රයෝග:— සන්නිපාතජ්වරයෙහි තරුණ අවස්ථාවෙ සිට දිය හැකි පැරණි වෛද්‍යවරුන්ගේ නිතර භාවිතයෙහි යෙදෙන අනුපානයකි. වා, සෙම්, ප්‍රධාන ශ්වාස කාස නසයි.

අනුපාන:— ඇඹුල් දෙඩම් යුෂ, බුද්ධරාජ කල්කය සමග වේ.

6. යෝග නාමය:— **මකරන්දන් අනුපානය**

යෝගය:—

ඇඹුල් දෙඩම් යුෂ (වරකට)	තේ හැඳි 3 යි,
අමු ඉඟුරු යුෂ	තේ හැඳි 2 යි,
මී පැණි	තේ හැඳි 1 යි,
සීනි	තේ හැඳි 2 යි.

ප්‍රයෝග:— වා සෙම් අධික කඵජ රෝගයන්හි දී, පපුවෙ සොට වියලුම, කරවිට (ඉලප්පු) කැස්ස, හික්කා, ඇදුම බලවත් රෝගීන්ට වරින් වර ටික ටික රසායනයක් වශයෙන් ලේහ කිරීමට යොදති. ක්ෂණික ගුණ දෙන යෝගයකි.

අනුපාන:— බුද්ධරාජ කල්කය සමග ය.

7. යෝග නාමය: **ගිඟුරුපට අනුපානය (I)**

යෝගය:— ගිඟුරුපට
කුප්පමේනිය දළු,
සුදුලූනු
ඇඹුල් දෙඩම් පැඟිරි,
අමු ඉඟුරු

සංස්කරණය: - සමව ගෙන කොටා වණ්ඩුවෙන් හෝ උනාළුවෙන් තම්බා මිරිකා පෙරා ගත යුතු යි.
ප්‍රයෝග:— දෙඅත්, දෙපා ශීතලව කථා කිරීම ගොත ගසන කල්හි ද, ඉලප්පු අවස්ථාවට ද යොදයි.
අනුපාන:— තලතෙල්, සීනි, මීපැණි, ඇඹුල් දෙඩම් යුෂ, ලුණුදියර, බුද්ධරාජ කල්කය දියකර දෙනු.

8. යෝග නාමය:— **ගිඟුරුපට අනුපානය -(II)**

යෝගය:— ගිඟුරුපට,
කුප්පමේනිය දළු,
බුලත්ගිරිද
ඇඹුල්දෙඩම් පැඟිරි,

සංස්කරණය: — සමව ගෙන කොටා වණ්ඩුවෙන් තම්බා මිරිකා පෙරා ගත යුතු ය.
ප්‍රයෝග:— දරුණු උණ ඉලප්පු ඇතිව බස ගොළු වී ඇඟ සීතල වී ඇති අවස්ථාවට යොදයි.
අනුපාන:— ඇඹුල්දෙඩම් යුෂ, ලුණුදියර සමඟ බුද්ධරාජ කල්කය දියකර දෙන්න.

9. යෝග නාමය:— **එරබු දළු, නිකදළු අනුපානය**

යෝගය:— එරබුදළු
නිකදළු
බුලත්දළු

ප්‍රයෝග:— අජීර්ණ බඩේ රුද නසයි.

10. යෝග නාමය :— **මාත්තුපහ** — පඹුරු දෙඩම් නිකදළු අනුපාන

යෝගය :— පඹුරුදළු,
දෙඩම්දළු,
නිකදළු
දෙහිදළු
යකුවනස්සදළු,
බෙලිකොළ,
පාවට්ටදළු,
කුඹුරුදළු,
හින්නාරංදළු
කුප්පමේනියදළු
කුඩුමිරිසදළු
අමුඉඟුරු, සුදු ලූනු

සංස්කරණය :— දළු අනුපාන සංස්කරණ ක්‍රමය අනුව ය.
ප්‍රයෝග :— රුදුරු සන්නි උණ ගිනියම් වනසා ලයි. සූතිකා ජ්වරයට විශේෂ යි.
අනුපාන :— මීපැණි, තලතෙල්, කොහොඹතෙල්, ගිතෙල්, මාත්තුපහ ගුලි සමඟ වේ.

11. යෝග නාමය :— **දෙහිපොතු ඉඟුරු අනුපානය**

යෝගය :— දෙහිපොතු
දෙහිදළු

අමුඉඟුරු, අනුපාන සංස්කරණ විධියෙනි.

ප්‍රයෝග :— වමන, අතිසාර නසයි. ශ්‍රෙෂ්ඨ යි.
අනුපාන :— මාත්තුපහ ගුලි සමඟ ය. මේ සමඟ ඉරිවේරිය මුල් කාෂය ද යෙදේ.

12. යෝග නාමය :— **ඔළිඳ ආදී දළු අනුපානය**

යෝගය :— ඔලිඳ දළු
පාවට්ට දළු
කොහොඹ දළු
කුප්පමේනිය දළු

සංස්කරණය :— සමව ගෙන කොටා වණ්ඩුවෙන් තම්බා මිරිකා පෙරා ගැනීම වේ.
ප්‍රයෝග :— වාත පිත්ත සන්නියට, උණ වැඩිවීම, දෙඩවීම් අවස්ථාවලට යොදයි
අනුපාන:— ගිතෙල්, තලතෙල්, සීතාරාම ගුලි සමඟ දෙනු ලැබේ.

13. යෝග නාමය :— **කොහොඹ දළු අනුපානය**

යෝගය :— කොහොඹදළු
නිකදළු
වෙලාදළු
සුදුලූනු
යකුවනසුදළු
පාවට්ටදළු
අමුවදකහ

සංස්කරණය :— සමව ගෙන කොටා පස් තෙලෙන් අනා, හෝ උනාළුවෙන් වණ්ඩුවෙන් තම්බා මිරිකා පෙරා ගත යුතුයි.

ප්‍රයෝග :— අත-පය දරදඬුව පිටට බෙල්ල නැමී හුස්ම ගැනුමට අපහසුව ඇති සෙම් ප්‍රධාන උණ රෝග අවස්ථාවන්ට යොදති.

අනුපාන :— සීතාරාම ගුලි සමහ ය.

14. යෝග නාමය — **ඇහැළ දළු අනුපානය**

යෝගය :—

ඇහැළ දළු
සියඹලා දළු

අනුපාන :— කොටා වණ්ඩුවෙ තම්බා මිරිකා පෙරා සූරංවිදුර විරේක ගුලි සමග දෙන්නේ ය.
ප්‍රයෝග :— විරේකය සඳහා මනා ය.

15. යෝග නාමය :— **කුඹුරු දළු අනුපානය**

යෝගය :—

කොහොඹදළු
නිකදළු, කුඹුරුදළු

සංස්කරණය :— පුටපාක කොට ගත යුතු ය.
ප්‍රයෝග :— සියලු රූජාවට බඩේ කැක්කුමට
අනුපාන :— සූරංවිදුර ගුලි සමහ ය.

16. යෝග නාමය :— **ගොටුකොළ අනුපාන**

යෝගය :—

ගොටුකොළ
උඳුපියලිය
අමු ඉඟුරු
බිම්කරල්හැබ
කුඹුරුදළු

සංස්කරණය :— සමව ගෙන කොටා දෙහි ඇඹුලෙන් අනා ගිනි පුටයෙනි.
අනුපාන :— සූරංවිදුර ගුලි සමහ ය. තුන්වරක් පමණ දීමෙන් ලේමුසු බඩයාම නවතී. මෙ යෝගයට ම, රතුලූනු දෙහිගැට එක්කොට කොටා, දෙහි ගෙඩි 3 ක ඇඹුලෙන් අනා වණ්ඩුවෙ තම්බා, මිරිකා, පෙරා ගුලි සමහ දීමෙන් සංක්‍රාමක රක්තාතීසාරය ගුණ වෙ. ළදරුවනට විශේෂ යි.

17. යෝග නාමය :— **දළුද කුප්පමේනිය දළු අනුපානය**

යෝගය :—

කුප්පමේනිය
පාවට්ටදළු
සුදුලූනු
ඔලිඳදළු
අමුඉඟුරු

සංස්කරණය :— ගිනි පුටයෙනි.
ප්‍රයෝග :— සෙම් වා ප්‍රධාන ළදරු උණට යොදති. මාන්දම උණ ද නයයි. බඩවක පිටවක සන්නි වලිප්පු නයයි.
අනුපාන :— තලතෙල්, ගිතෙල් තනකිරි, සීනි, සූරංවිදුර ගුලි දියකොට දෙන්නේ ය.

18. යෝග නාමය :— **චන්ද්‍ර කල්ක මහදළු අනුපානය**

දෙහිදළු,
නිකදළු,
යකිනාරන්දළු,
පාවට්ටදළු
කුප්පමේනිය ,
කුඹුරු ඇට
දෙඩම් දළු
බටු දළු
හීන්නාරංදළු
ඔලිඳ දළු
කුඹුරුදළු
සුදුලූනු

අනුපාන :— කොටා වණ්ඩුවෙ තම්බා මිරිකා, පෙරා සීනි මීපැණි එළඟි තෙල්, දෙඩම් ඇඹුල් යොද දෙන්න.

දේශීය කල්ක

කල්ක ඛණ්ඩය

1. යෝග නාමය :— **කණ්ඩමාල කල්කය**

යෝගය :—

කළුදුරු
සුදුදුරු
ඕංකාරම
පත්පාඩගම
කරාබු
සිනක්කාරම
සවිඳ ලුණු
සවුක්කාරම
අසමෝදගම්
තිප්පිලි
නවසාරම
වසාවාසි
පල්මානික්කම්
සාදික්කා
වෙඩිලුණු
කොසඹ ඇටමද
මීමුරු
ගස්පෙනෙල ගොඩිපොතු

සංස්කරණය :— (ග්‍රෑ. 5) කලඳ බැගින් කිරා ඉතා සියුම්ව චූර්ණ කර දෙමටගෙඩි යුෂ, කුකුරුමාන් ගෙඩි යුෂ, හිඟුරුපට යුෂ, යන ද්‍රව්‍යත්‍රයයෙන් එක එකින් දින බැගින් අඹරා රක්තිකා එක (මි. ග්‍රෑ. 125) පමණට ගුලි කරන්න.

ප්‍රයෝග :— උගුර ඉදිමීම, කටහඬ වෙනස් වීම, උගුරේ ගෙඩි, උගුර කැසීම-දහය, උගුරේ සෙම් වියලීම, නාසය ඇහිරී හිසරුජා ඇතිවීම, ගිලීමට අපහසුව, ගොළුවීම, උගුර ඉදිමීම, කාස, කණ යට වේදනා යන උගුර හා අවට රෝග නසා ලයි.

අනුපාන :—

කුකුරුමාන් ගෙඩි යුෂ
හිඟුරුපට යුෂ
හබරල පිති යුෂ,
දෙමටගෙඩි යුෂ
තලතෙල්
කොසඹතෙල්,

යන මේවා කීපයක් හෝ සියල්ල සමඟ කල්කය මිශ්‍රකර දීම මැනවි.

මාත්‍රාව :— ගුලි 1–3 දක්වා වෙ.

2. යෝග නාමය :— **චන්ද්‍ර කල්කය**

යෝගය :—

සුදුහඳුන්,
වැල්මී,
තිප්පිලි
ත්‍රිවර්ග,
දෙදුරු
අසමෝදගන්,
දේවදර,
(ඉවද) අතිවිඩයම
ඉඟුරු,
කොත්තමල්ලි,
කෙළිඳ ඇට,
වළහසාල්
උපුල් කොළ,
යහවපු (ශතපුෂ්ප)
කටුකරෝහිණී,
තිපල්
වැල්තිබ්බටු මුල්
හීන්අරත්ත අල
හිඟුරුපියලි
එන්සාල්
කටුකරෝසන
සුවඳකොට්ටම්
නිකදළු
සාරණමුල්
කලාඳුරු අල

සංස්කරණය :— මෙ ද්‍රව්‍ය සියල්ල සමභාගව ගෙන සිනිඳුව චූර්ණකර තලතෙලින් අනා තබා අඹරා ගන්න. පසුව නැවත වරක් මීපැණියෙන් අඹරා කල්කය සාදන්නේ ය.

ප්‍රයෝග :— සන්නි, කෝල, වලිප්පු, හතිකැක්කුම, සෙම් වියලීම සහ ශ්වාසය යන රෝග සංසිඳුවන්නේය. බඩ පිපීම, කාස, ජ්වර, රතගාය, උල්ලෝගම් යන රෝගයන් ද සංසිඳුවයි.

අනුපාන :— බුද්ධරාජ කල්කයේ අනුපානවලින් මෙ කල්කයත් දිය හැකි ය.

මාත්‍රාව :— (මි.ග්‍රෑ: 250) මංචාඩිය ප්‍රමාණ ගුලි 1-2 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි. කුඩා දරුවන්ට ඔළිඳ ඇට ප්‍රමාණ යොදනු ලැබේ.

3. යෝග නාමය :— **ජීවක කල්කය**

යෝගය :—

දෙදුරු,
ත්‍රිවර්ග,
ක්‍රිමිශස්ත්‍රැ,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
වදකහ,
රතුලූනු,
තිපල්,
කොත්තඹුරු,
සමභාගව ගත යුතු වේ.
ඉඟිනිඇට
පුස්කර
වැල්මී
යවක්ෂාර
සවිඳලුණු

ඒ බරින් අර්ධයක් රත්හඳුන් ද ඉතිරි අර්ධය සුකිරි ද ගත යුතු වෙ.

සංස්කරණය :— මේවා සියල්ල සිනිඳුව චූර්ණකර පළමුව තනකිරෙන් අඹරා ගන්න. දෙවනුව දෙඩම් ඇඹුලෙන්, තෙවනුව ගිතෙලින් අඹරා ගත යුතු ය. පසුව වීදුරු බඳුනෙක බහා සුක්රෂිතව තබන්න.

ප්‍රයෝග :— කුඩා දරුවන්ගේ රක්තජ රෝග, උණ, වමනය, බඩ පිපුම, උල්ලෝගම, කිරිමැලියම, කාස, මලමූත්‍ර බද්ධය, වෙව්ලුම, සිහිනැතිව යන රෝගයනට හිත යි.

අනුපාන :—

(1) සුදුහඳුන්,
ඉඟිනි ඇට,
යවක්ෂාර,
රතුලූනු
වදකහ
වැල්මී

(2) වමමුතු,
වැල්තිබ්බටුමුල්
කොත්තමල්ලි
වැල්මී—ආඩතෝඩ පංචාංගය

කලං 1 (ගුෑ: 5) බැගින් ගෙන පත 4-1/2 (මි: ලි: 960-120) ට සිඳුවා උදය, දවල්, සවස, රාත්‍රී කල්කය සමඟ දිය යුතුය.

(3) තිප්පිලි
කලාඳුරු අල
කොත්තමල්ලි
වැල්තිබ්බටුමුල්
සැවැන්දරා මුල්
වැල්මී
ඉඟුරු

මිලිතව අඩ පලමකි. ක්වාථය කල්කය සමඟ උක්පැණි තනකරි ප්‍රක්ෂේප කොට යොදන්න.

(4) ගංසූරිය පොතු
මදටිය පොතු
අරළු
සහිඳලූණු

කලඳ (ගුෑම 5) බැගින්, පත 2–පත 1/4 ට (මි:ලි: 480-60) සිඳ පෙරා කල්කය සමඟ යොදනු. විරේචනය සඳහා ය. ලේ ගෙඩි වලට හිත ය.

මාත්‍රාව :— ඔළිඳ ඇට 1 ප්‍රමාණයේ සිට මදටිය ඇට 1 ප්‍රමාණ (මි:ගුෑ: 125-250) යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි. (කෂාය ඛණ්ඩයෙහි ද බලන්න)

4. යෝග නාමය :— නවරත්න කල්කය

යෝගය :—

අසමෝදගම්,
දෙව්දුරු
වාසාවාසි
වැල්මී,
කරාබු,
පෙරුම්කායම
සන්නිනායම් ඇට,
දෙදුරු,
ඉඟුරු
තිප්පිලි,
සාදික්කා,
කටුකරෝසන

කලං 1 (ගුෑ: 5) බැගිනි.
අරළු කලං 26 යි. (ගුෑ: 130 යි).
බුළු කලං 13 යි. (ගුෑ: 65 යි).

සංස්කරණය :— සියල්ල සිනිඳුව චූර්ණකර හලා මීපැණියෙන් ඉතා සිනිඳුව අඹරා ගත යුතු වෙ.

ප්‍රයෝග :— අජීර්ණ සහිත වමන, අතීසාර, ජ්වර, ඇම්ම, අඩස්සිය යන රෝග සුව කරන්නේ ය.

අනුපාන :— අමුඉඟුරු යුෂ, දෙහි ඇඹුල්, මීපැණි සමඟ කල්කය දෙනු ලැබේ. සුදුලූනු, ගම්මිරිස් තැම්බූ කෂාය සමඟ ද යොදනු ලැබේ. ළදරුවන්ට තනකිරි සිනි අවස්ථානුකූලව අනුපාන යෙදිය හැකි ය.

මාත්‍රාව :— මදටිය ඇට 3 සිට 5 (මි:ගුෑ: 750-1250) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය හැක.

5. යෝග නාමය :— දෙමටමල් කල්කය

යෝගය :—

දෙමට මල්,
ශුද්ධ අබින්,
දුම්මල,
ගොලෑපුවක්,
දිවුල්ලාටු
සාදික්කා
වජ්‍රවල්ලි (හිරැස්සපලු)
කයිප්පු
හීනටි හාල් පිටි

සමභාගව ගෙන ගිතෙලින් තම්බා මීපැණියෙන් අඹරා ගත යුතු වෙයි.

ප්‍රයෝග සහ අනුපාන :— උග්‍ර කැක්කුම් වේදනා
සහිත පක්වාතීසාරයට — උණුවතුරෙන් දීම ද,
හික්කාවට — උක්පැණියෙන් ද,
අතීසාරයට — උඳුපියලි, අමු ඉඟුරු, අසමෝද, ගොටුකොළ. දෙහිගැට, රතුලූනු උණුඅළුවෙන් තම්බාගත් යුෂින් දීමෙන් ද ගුණ වන්නේ ය.

මාත්‍රාව : – මදට 1-2 (මි:ගුෑ: 250-500) දක්වා යෝග්‍ය පරිදි අවස්ථානුකූලව යෙදේ.

6. යෝග නාමය :— දෙසඳුන් කල්කය

යෝගය :—

කොල්ලු,
වදකහ,
වැල්මී
රත්හඳුන්,
සුදුහඳුන්
සමභාගව ගන්නේ ය.
සවිඳලුණු—බරට බරක් ගත යුතු ය.

සංස්කරණය:— සියල්ල දෙහි ඇඹුලෙන් තම්බා අඹරා ගත යුතු ය.

ප්‍රයෝග :— ළදරු වලිප්පු, උණට සහ සාමාන්‍ය මෘදු විරේචනයක් වශයෙන් යොදනු ලැබේ. මේ කල්කයට රත කල්කය, රත්හඳුන් කල්කය, දෙසඳුන් කල්කය, කොත්තමල්ලි කල්කය යන නම් ව්‍යවහාර කරති.

අනුපාන :— කොත්තමල්ලි තැම්බූ දිය සමඟ යෙදිය යුතු ය. ළදරු රතගායට විශේෂ යි.

මාත්‍රාව :— රක්තිකා 1-2 (මි. ග්‍රෑ. 125-250) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු ය.

7. යෝග නාමය :— බාලකුමාර-වැල්මී කල්කය

යෝගය :—

දෙදුරු,
අසමෝදගන්
කටුකරෝසන
ක්‍රිමිශත්‍රු
ලශුන
පුස්කර
පැපිළිය
අක්‍රපට්ටා
වළහසාල් ඇට මද
ත්‍රිවර්ග
පල්මානික්කම්
සීනක්කාරම්
තිප්පිලි — සමභාගව ගත යුතු වේ.
වැල්මී—මේ හැම බරට බරක් ගත යුතු ය.

සංස්කරණය :— පස්තෙලින් කල්කය අඹරා ගත යුතු වේ.

ප්‍රයෝගය :— ළදරුවන්ගේ සන්නි රෝග, වලිප්පු, ශ්වාස, කාස රෝග ශාන්ත වේ.

අනුපාන :—

පුපුල
නික
කුප්පමේනිය
වල්තිප්පිලි
ඔළිඳ
පාවට්ටා
බෙලි
එළබටු සහ මුල

යන ද්‍රව්‍ය කොටා වණ්ඩුවේ තම්බා ගත් සවරසය සමඟ කල්කය දෙනු ලැබේ. තවත් හිත අනුපාන සමඟ ද දිය හැකි ය.

මාත්‍රාව :— මංචාඩි 1-2 (මි:ග්‍රෑ: 250-500) දක්වා ප්‍රමාණයෙන් දිය හැකි ය.

8. යෝග නාමය :— බුද්ධරාජ කල්කය (I)

යෝගය :—

සාදිලිංගම්,
කළුදුරු,
සුදුදුරු,
රත්හිරියල්
කරාබු,
වසාවාසී,
සාදික්කා,
ඉඟුරු
ගල්මද,
ගල්නගර,
උළුහාල්,
සුවඳ කොට්ටං,
වැල්මී,
පෙරුංකායම්,
අබිං,
පුස්කර
සීනක්කාරම්,
පල්මාණික්කං,
ගෞරිපාෂාණම්,
මනෝසිල,
හිඟුරුපියලි,
සහිඳලුණු,
අක්කරපට්ටා,
කටුකරෝසන, පීතකරෝසන

මෙම ද්‍රව්‍ය එක් වගෙන් කලං 8 (ග්‍රෑ: 40) බැගින්, (කලං 200 සියලු බර) = (ග්‍රෑ: 1000 යි.)
රත්හඳුන් කලං 100 යි. (ග්‍රෑ: 500 යි.)
සුදුහඳුන් කලං 100 යි. (ග්‍රෑ: 500 යි.)
සම්පූර්ණ යෝගය කලං 400 යි. (ග්‍රෑ: 2000 යි.)

සංස්කරණය : ද්‍රව්‍ය ඉතා සිනිඳුව චූර්ණකර කීප වරක් පෙනේරයෙන් හලා ගත යුතු යි. පැසුනු (නොඉදුනු) ඇඹුල් දෙඩම් ගෙඩි 100 ක ඉස්මෙන් භාවනා දී අඹරා අවසන්හි මී පැණියෙන් අඹරා ගන්නේ ය.

සැ: යු: —

(1) රස බෙහෙත් ද්‍රව්‍ය සහ අබිං, පෙරුංකායම්, සහිඳලුණු වෙන් වශයෙන් ගලේ දමා අඹරනු විනා ද්‍රව්‍ය සියල්ල සමඟ චූර්ණ නො කළ යුතුයි.

(2) පුස්කර, සිනක්කාරං සහ පල්මාණික්කං කබලේ බැදගත් භස්මය ගත යුතු යි.

(3) ගල්මද, ගල්නහර, දෙවගය ද්‍රව්‍ය සමඟ චූර්ණ කිරීම මැනවි.

(4) සාදිලිංගම්, ගෞරිපාෂාණම්, රත්හිරියල්, සහ මනෝසිල පළමු ගලට දමා ඇඹරිය යුතු ය. ඉතා හොඳින් ඇඹරුණාට පසු පුස්කර, සිනක්කාරං, පල්මාණික්කං, සහිඳළුණු, පෙරුංකායම්, අබිං එකතු කළ යුතු ය. මේ සියල්ල අඹරන්නේ ඇඹුල් දෙඩම් යුෂයෙන් ය.

(5) රස බෙහෙත් සහ ලවණ වර්ග අබිං ආදිය දින 3 ක් පමණ ඇඹරුණාට පසු, දෙඩම් ඇඹුලෙන් භාවනා දුන් චූර්ණය එකතු කරන්නේ ය.

(6) දෙඩම් යුෂ හොඳ හැටි වියලුණ තත්ත්වයට පැමිණියාට පසු මීපැණියෙන් අඹරා ගන්නේ ය.

(7) අබිං ඉඟුරු යුෂින් හෝ සුදුහඳුන් කෂායයෙන් ශුද්ධ කරගැනීම මැනැවි.

(8) සාදිලිංගම් සහ මනෝසිල දෙහි ඇඹුලෙන් භාවනා දී උණුවතුරෙන් සෝද ගන්නේ ය.

(9) රත්හිරියල්, හුණුවතුරෙන් භාවනා දී උණුවතුරෙන් සෝද ගන්නේ ය.

(10) ගෞරිපාෂාණම් කුඩා කැබලිවලට කඩා සිහින් රෙදි කඩක බැඳ කරවිල ගෙඩිය තුළ බහා වේලා එලකිරෙන් තම්බා ගෙන තද උණු වතුරෙන් සෝද වේලා ගත යුතු ය.

(දේශීය ලේඛනයකිනි. වෛද්‍යාචාර්ය ඩී. එම්. ජයසිංහ මහතාගේ ප්‍රත්‍යක්ෂ ක්‍රමය යි.)

9. **යෝග නාමය :—** **බුද්ධරාජ කල්කය (II)**

යෝගය :—

සාදිලිංගම්,
වසාවාසි,
කෙළිඳ හාල්,
කරාබු,
ගල් නහර,
ගල්මද,
පල්මාණික්කන්,
සුවඳකොට්ටන්,
පෙරුංකායම්,
සුදුරු,
රත් හිරියල්,
අතිවිඩයන්,
හිඟුරුපියලි,
අක්‍රපට්ට,
සිනක්කාරං,
රිදීතුත්තං,
ගෞරිපාෂාණම්,
අබිං,
කළුදුරු,
උළුහාල්,
වැල්මී,
වියලිඉඟුරු,
පුස්කර,
සාදික්කා,

සංස්කරණය :— මේවා සමව ගෙන ඒ සියල්ල බරට සුදු හඳුන් ද, සුදුහඳුන්වලට සමාන බරක් රත්හඳුන් ද ගෙන මදුරුතලා කොළ ඉස්මෙන් පළමුව අඹරා ඊට පසු මීපැණියෙන් අඹරා ගත යුතු යි.

(ගම්පහ සිද්ධායුර්වේද වෛද්‍ය විද්‍යාලයේ වට්ටෝරුවකි.)

10. **යෝග නාමය :—** **බුද්ධරාජ කල්කය (III)**

යෝගය :—

සාදිලිංගම්,
දෙදුරු,
රත්හිරියල්,
ත්‍රිවර්ග,
ඉඟුරු,
ගල්මද,
ගල්නහර,
උලාඅරිසි,
සුවඳකොට්ටම්,
වැල්මී
පෙරුංකායම්
අබින්
හීන්අරත්ත
මහඅරත්ත
පල්මාණික්කම් අළු
කන්සා ඇට
ගම්මිරිස්
මනෝසිල
ඉඟුරුපියලි
අක්‍රපට්ට.

කලං 1 (ගු: 5) බැගින් ගෙන සුදුහඳුන් කලං 5 මදට 5 යි. (ගු: 26,250 යි.) රත්හඳුන් කලං 10 1/2 යි. (ගු: 52,500)
මේවා සිහින්ව චූර්ණකර මීපැණියෙන් අඹරා කල්කය සාද ගන්නේ ය.

අනුපාන :— (I) ඉඟුරු යුෂ, ඇඹුල් දෙඩම් යුෂ, මීපැණි මිශ්‍රණය සමඟ කල්කය දෙනු ලැබේ.

(II) කටුවැල්බටු, ඉඟුරු, කෂාය සමඟ යොදයි.
අනුපාන ශීර්ෂය බැලිය යුතු ය.

ප්‍රයෝගය :— පපුවේ සෙම් බුරුල්ව ඇති අවස්ථාවන්හි විශේෂයෙන් යොදනු ලබයි. උගුරේ සෙම් හිරවීම, කාස, ශ්වාස, ප්‍රතිශ්‍යාය, ශ්වසනක ජ්වරය යන පෙනහළු ගත සෙම් බහුල අවස්ථාවට හිත යි.

මාත්‍රාව :— මංචාඩි 1-2 යි. (මී:ගු: 250-500)

11. යෝග නාමය :— **යසෝදරා කල්කය**

යෝගය :—

අබින්,
දෙදුරු,
තිවග = ත්‍රිවර්ග,
තිකුළු,
අසමෝදගම්,
කර්කටකශෘංගි,
ලූණුදෙහි ඇට,
සුදුහඳුන්,
සුදුලූනු,
පල්මාණික්කම්,
තිපල්,
රන් හිරියල්,
අබ,
සිවන්ගුරු,
දේවදර,
වදකහ,
වැල්මී,
ගතපුෂ්ප,
කොහොඹ ඇට මද,
කෙළිඳසහල්,
කුළුරණ,
උළුහාල්,
වළහසාල් ඇට මද,
කහ,
කුරුඳුඇට,
වෙප්පල් අරිසි = කෙළිඳ,
කොට්ටම්,
පුෂ්කර,
රත්හඳුන්,
හින්අරත්ත අල,
මීපුප්,
ගජතිප්පිලි,
සිවිය මුල්,
ඕංකාරන්,
සිනි,
සමභාගව ගත යුතුයි.

සංස්කරණය :— මේ ද්‍රව්‍ය සමභාගව ගෙන ඉතා සියුම්ව චූර්ණකර, ඒ චූර්ණයෙන් දෙකෙන් කොටසක් බරට ශුද්ධ ජයපාල දමා සියල්ල දෙඩම් ඇඹුලෙන් අඹරා කල්කය සාද ගත යුතු ය.

ප්‍රයෝග :— සූතිකාවන්ගේ කෝල, සන්නි, ජ්වර, අතිසාර, වේදනාව, කර්ණ ශූල, ඇවිලිලි, කාස, කදගැට රුද පිටගැස්ම, වෙව්ලීම, දෙඩවිලි, හනුපූට්ටු, ශ්වාස, තෘෂ්ණා, අඩස්සි, තුන්දෙස් කිපුම ආදි රෝගයන්ට පත්තියං පංගුව යෙදේ.

අනුපාන :— සිනි, මීපැණි, පරණ පොල් අරක්කු, ඇඹුල් දෙඩම් යුෂ යන මේවායින් එකකින් හෝ කීපයකින් මිශ්‍ර කර දීම හිත යි.

මාත්‍රාව :— මංචාඩි 1–2 (මී: ගු: 250—500) දක්වා යි.

සැ: යු:— ජයපාල මිශ්‍ර කොටස විරේක පංගුව ද අමිශ්‍ර කොටස පත්තියම් පංගුව ද වේ.

12. යෝග නාමය :— **යෂ්ටි කල්කය**

යෝගය :—

සුදුදුරු,
කළුදුරු,
අසමෝදගම්,
ත්‍රිවර්ග
පල්මානික්කම,
මාසක්කා,
සිනක්කාරං,
කටුකරෝසන,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
තිපල්,
අක්‍රපට්ටා,
ඉඟිනි ඇට,
අතිවිඩයම්
සුදුලූනු.
රතු ලූනු,
සුදුහඳුන්,
උළුවා,
මාලතිපත්‍ර = සමන්පිච්ච කොළ
තිරස්සවාළු,
සවිදලූණු,
සමභාගව ගත යුතු ය.

සංස්කරණය :— සියල්ල බරට වැල්මී යොදන්න. සියළු ද්‍රව්‍ය සිනිඳුව චූර්ණකර ගිතෙල්, මීපැණි යන මේවායින් අඹරා ගත යුතු ය. කොටසකට සමාන බරක් ශුද්ධ ජයපාල දමා වෙනම අඹරා තබා ගන්නේ ය. එය විරේක පංගුව යි. විරේචනය අවශ්‍ය විට එය යොදන්නේ ය.

ප්‍රයෝගය :— උණ, හති, පණුරෝග, වලිප්පු, වමන, ඔක්කාරය, සන්නි, ශ්වාස, කාස, ප්‍රවාහිකා, ග්‍රහණි, මාන්දම්, අතීසාර, උල්ලෝගම්, ඉදිමීම, ආදි සියළු බාල රෝගයන්ට හිත යි.

අනුපාන :— කුඩා දරුවන්ගේ උණට

(I) දෙඩම් ඇඹුල්, මීපැණි, ගිතෙල්, තලතෙල් හා කල්කය සමඟ,

(II) තනකිරි, කුඹුරුපත්‍ර යුෂ, සමඟ කල්කය හා,

(III) තනකිරි, ගිතෙල් සමඟ, කල්කය යොදනු ලැබේ.

(IV) පණුකෝප, වමන, ඔක්කාරය ඇතිවිට, සස්සඳමුල් දෙහි ඇඹුලෙන් උරගා කල්කය සමඟ යෙදේ.

(V) උණ, හති කැක්කුම, කෝල, වලිප්පු, කටතොල වියලීම, බඩයාමට තිප්පිලි, දිමිබිජු, වැල්මී, සුදුලූනු, රතුලූනු, අක්‍රපට්ට, කටුකරෝසන, මායක්කා, කලං 1 මදට 10 (ගු: 7,500) බැගින් ගෙන, පත අට එකට සිඳ (ලී: 1,920 — මි: ලී: 240 ට) උදේ සවස මීපැණි හෝ සීනි නැතහොත් ගිතෙල් තලතෙල් වැනි අනුපානයෙන් සමඟ දිය යුතු ය.

මාත්‍රාව :— මංචාඩි 1–2 (මි: ගු: 250 – 500) දක්වා වේ.

සැ: යු :— විරේචනය සහිත නම් කටුකරෝසන ඉවත් කර කලාඳුරු අල සමඟ යොදන්න. බාල දරුවන් සඳහා ද්‍රව්‍ය අඩ පලමක් (ගු: 30) පත 4 පත 1/2 ට සිඳුවා (මි: ලී: 960–120) සිව වරකට යෙදීම මැනවි.

13. යෝග නාමය :— **විජය කුමාර කල්කය**

යෝගය :—

අරළු,
බුළු,
නෙල්ලි,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
යවකර ලුණු,
වදකහ,
සුදුලූනු,
පෙරුම්කායම්,
උළුහාල්,
සුවඳකොට්ටං
සාදිලිංගම්,
අබිං,
රන් හිරියල්,
කළුදුරු,
සුදුදුරු,
ගස්පෙනෙල ගෙඩියේ පොතු,
වාල්මොලගු ඇටමද,
කොරාසානි,
කොහොඹ ඇට මද,
සුදුහඳුන්,
කොත්තමල්ලි,
පුස්කර,
දේවදර,
කටුකරෝසන,

සංස්කරණය :— චූර්ණකර රෙදිකඩින් හලා,

(1) දෙඩම් ඇඹුලින්,

(2) ඉඟුරු යුෂින්,

(3) කොල්ලු කෂායෙන්,

(4) මීපැණියෙන් — අඹරා කල්කය සාද ගන්නේ ය.

ප්‍රයෝගය :—

අතීසාර,
රක්තාතීසාර,
රක්ත ප්‍රදර,
සූතිකා රෝග, ආදී
රක්තස්‍රාවයන්හි, ශ්‍රේෂ්ඨ යි.

මාත්‍රාව :— මංචාඩි 1–2 (මි: ගු: 250–500) දක්වා වේ.

14. යෝග නාමය :— **ශර්කරාදී කල්කය**

යෝගය :—

ගම්මිරිස්,
සව්දලුණු,
වැල්මී,
තිප්පිලි,
වළහසාල් ඇට මද,
ගස් පෙනෙලගෙඩියේ පොතු,
වාල්මොලගු ඇටමද,
උපුල් කොල = සුවඳ කොට්ටන්
අතිවිඩයන්,
යවක්ෂාර,
සුවසලුණු,
සිරිතේක්කු,
සුදුලූනු,
කුකුළුසුගු = කර්කටක ශෘංගි
(ගු: 5) කලං 1 බැගිනි.

අක්‍රපට්ට (ගු: 15) කලං 3 යි;
කටුකරෝසන (ගු: 30) කලං 6 යි.

සංස්කරණය :— සියල්ල බරට සීනි, චූර්ණය සාද, මීපැණියෙන් අඹරා ගත යුතු යි.

ප්‍රයෝග :— ළදරුවන්ගේ ජ්වර, කාශ, ශ්වාස, මලමූත්‍ර බද්ධය, ඇම්ම, වෙවුලුම් යන රෝග සුව කෙරේ.

අනුපාන :—

(1) කටුවැල්බටු,
දෙදුරු,
කටුකරෝසන,
සිරිතේක්කු,

(2) ඉඟුරු,
සහිඳලුණු,
සීනි,

(3) සුවසලුණු,
සහිඳලුණු,
දෙහි යුෂ
ඇඹුල් දෙඩම් යුෂ
නස්නාරන් යුෂ
සීනි,
ඉඟුරු යුෂ

කෂාය හෝ අනුපාන සමඟ මේ කල්කය දිය යුතු වේ. අවස්ථාවනට සුදුසු අනෙක් අනුපානයකින් දීම ද මැනවි.

මාත්‍රාව :— උපන් දින සිට තුන් මසක් යන තුරු වී ඇට ප්‍රමාණ දිය හැකි යි. තුන් මස සිට අවුරුද්ද දක්වා ළදරුවන්ට ගම්මිරිස් ප්‍රමාණ දිය යුතු ය. අවුරුද්දෙන් ඉහළ දරුවන්ට මදටිය පමණ දෙන්න.

15. යෝග නාමය :— **සූරජීවක කල්කය**

යෝගය :—

ශාදිලිංගම්,
තිප්පිලි,
කවෙළු,
කිරිගරුඬ ගල්,
වැල්මී,
වසාවාසි,
සාදික්කා,
සුවඳ කොට්ටම්,
සවිඳලුණු,
කරාබු,
කළුදුරු,
සුදුරු,
අසමෝද,
සුදුපාෂාණම්,
සුදුලූනු,
ගම්මිරිස්,
අරළු,
බුළු,
නෙල්ලි,
ශුද්ධඅත්තන ඇට,
කංසා ඇට,
කුඹුරු ඇට මද,
අබ,
මෛවා කළඳ (ගු: 5) බැගිනි.

අබිං කලන් 2 යි. (ගු: 10)

සංස්කරණය :— ඇඹුල් දෙඩම් යුෂින් භාවනා යුක්තව දින 3 ක් අඹරා සැවැන්දරා කෂායෙන් ද භාවනා යුක්තව දින 3 ක් අඹරා රක්තිකා (මි:ගු: 125) පමණ ගුලි පිළියෙල කරන්නේ ය.

ප්‍රයෝග :— පච්‍යමාන හා පක්ව අතිසාරයට යොදනු මනා ය.

මාත්‍රාව :— ගුලි 1/2–1 දක්වා යි. ගුලි 1/2 ළදරුවන් සඳහා ය.

ක්වාත ඛණ්ඩය.

1. යෝග නාමය :— **අභයාදි ක්වාථය** (සන්නිපාත ජ්වරයෙහි).

යෝගය :—
අරළු,
කලාඳුරු,
කොත්තමල්ලි
රත්හඳුන්,
පද්මකාෂ්ඨ,
ආඩතෝඩා,
කටුකරෝසන,
කෙළිඳසහල්,
සැවැන්දරා,
රසකිඳ,
ඇහැළ පොතු,
දියමිත්ත,
වියලිඉඟුරු,

ප්‍රයෝග :— ත්‍රිදෝෂජ්වර, පිපාසා, කාස, දහ, ප්‍රලාප, ශ්වාස, තන්ද්‍රා යන මේවා නසයි. දීපන, පාචන, ගුණ යුක්ත යි. මල, මූත්‍ර, වාත යන මේවායේ විෂ්ටම්භය, වමනය, අරුචිය, නසයි. පිටගැස්ම වැනි අවස්ථාවනට ද යෙදේ.

අනුපාන :— තිප්පිලි, සුණු.

2. යෝග නාමය :— **අභයා කණාදිය.**

යෝගය :—
අරළු,
තිප්පිලි,
කරපිංචා නැටි,
දූත්ත අල,
තිරස්සවාලු,
එරඬු,
සාරණ,
බෙලි මුල්,

ප්‍රයෝග :— අර්ශස් රෝගයට අනුලෝමන කෂායෙකි.

අනුපාන :— සිනි, පෙරුම්කායම්, මීපැණි, යොදන්නේ යි.

3. යෝග නාමය :— **අමෘතවෘෂාදි කෂාය.** (I)

යෝගය :—
රසකිඳ,
ආඩතෝඩා මුල්,
පටෝල, (දුම්මැල්ල),
කොහොඹ පොතු,
අරළු,
බුළු,
නෙල්ලි,
රත්කිහිරිය,
ඇහැළ පොතු,

ප්‍රක්ෂේපය :— ශුද්ධ ගුගුල්.

ප්‍රයෝග :— විෂ, විසර්ප, අෂ්ටාදශ කුෂ්ඨ රෝගයනට මනා ය.

4. යෝග නාමය :— **අමෘතවෘෂාදි කෂාය** (අංක II)

යෝගය :—
රසකිඳ,
ආඩතෝඩා මුල්,
පටෝල, (දුම්මැල්ල),
කලාඳුරු අල,
රුක්අත්තන පොතු,
රත්කිහිරිය,
වේබොඩ,
කොහොඹ කොළ,
වියලි කහ,
වෙනිවැල්ගැට,

ප්‍රයෝග :— විවිධ විෂ, විසර්ප, කුෂ්ඨ, විස්ඵොට, කණ්ඩු, වසූරිය, ශීත පිත්ත, උණ නසයි.

ප්‍රක්ෂේපය :— ශුද්ධ ගුගුල්.

5. යෝග නාමය :— **අමෘතාෂ්ටක ක්වාථය.**

යෝගය :—
රසකිඳ,
කෙළිඳ සහල්,
කොහොඹ පොතු,
දුම්මැල්ල.
කටුකරෝසන,
ඉඟුරු,
සුදුහඳුන්,
කලාඳුරු අල.

ප්‍රයෝගය :— හාල්ලාස, අරෝචක, ඡර්දි, තෘෂ්ණා, දහ සහිත පිත්තශ්ලේෂ්මජ්වර නාශක යි.

අනුපාන :— තිප්පිලි සුණු.

6. යෝග නාමය :— **අර්කග්‍රන්ථිකාදි කෂාය.**

යෝගය :—
වරාමුල්,
සිවිය මුල්,
කීකිරිදිය,
බිංකොහොඹ,
තිප්පිලි මුල්,
නික මුල්,
සාරණ මුල්,
ඉඟුරු,
මුරුංගා මුල්,
තිප්පිලි,
ශුද්ධ රත්නිටුල්,
දේවදර,
හීන්අරත්ත අල,
වදකහ,

ප්‍රයෝග :— වාත ප්‍රධාන සන්නිපාත, ශ්වාස, සූතිකා සන්නි, වාත ජනිත ශෛත්‍යය, අපස්මාර යන රෝගයන්හි යෙදේ.

7. යෝග නාමය :— **අර්කානන්තාදි කෂාය.**

යෝගය :—
වරාමුල්,
(රාස්නා) අරත්ත අල
මුරුංගා මුල්,
ශුද්ධරත්නිටුල් මුල්
ඉරමුසුමුල්,
නිකමුල්,
තිප්පිලි,
ඉඟුරු,
බිංකොහොඹ,
වදකහ,
තිප්පිලිමුල්,
අතිවිඩයම්,
දේවදර
මිදිමුල්,
සිවියමුල්
කීකිරිදිය =මාර්කව.

ප්‍රයෝග :— වාතප්‍රධාන සන්නිපාත, පිටගැස්ම, හනුපූටටුව, අධික ශීත සහිත සන්නිපාත, සූතිකා සන්නි, ශ්වසනක ජ්වරයන්හි යෙදේ.

8. යෝග නාමය :— **අරළු මාසක්කා ආදි කෂාය.**

යෝගය :—
අරළු,
මාසක්කා,
රතුලූනු,

ප්‍රයෝග :— ළදරු රත, උල්ලෝගම ආදියට හිත යි.

අනුපාන :— යෝග්‍ය පරිදි සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

9. යෝග නාමය :— **අළු කෙහෙල් ආදි කෂාය.**

යෝගය :—
අළුකෙහෙල්අල,
දීඹුල් පොතු,
මාදම්පොතු
පොල්මල්,

ප්‍රයෝග :— රක්තමේහ, රක්ත ප්‍රදර නසයි.

අනුපාන :— ලාකඩ, කයිප්පු, මීපැණි.

10. යෝග නාමය :— **අශ්වගන්ධාමෘතාදි ක්වාථය.**

යෝගය :—
අමුක්කරා,
රසකිඳ
හාතාවාරිය,
දශමූල,
බැබිලමුල්,
පාවට්ට මුල්,
සුවඳකොට්ටම්,
අතිවිඩයම්.

මේ යෝගය භාවිත කිරීමේ දී කිරි සහ මාංස රස වැළඳිය යුතු ය.

ප්‍රයෝග :— ක්ෂය රෝග නාශක යි.

අනුපාන :— සුදුසු අනුපානයක් සමඟ යොදන්නේ ය.

11. යෝග නාමය :— **අඟු ආදි කෂාය.**

යෝගය :—
අඟු,
කොහොඹ,
බිංකොහොඹ,
නික,
කරපිංචනැටි,
සුදුලූනු,
වංඇපල,
ඉඟුරු.

ප්‍රයෝග :— සූතිකා උණට විශේෂ යි.

අනුපාන :— නිඹ තෙල්, සීනි, මී, තනකිරි. ගුලි සමග ප්‍රයෝග ය.

12. යෝග නාමය :— **ආරෝග්‍ය (ආරග්වධ) පංචකය.**

ඇහැළපොතු,
කටුකරෝසන,
කලාඳුරුඇල,
තිප්පිලිමුල්,
අරළු,

ප්‍රයෝගය :— ආම, ශූල සහිත කඵවාතජ්වරයෙහි යෙදේ. දීපන, පාචන යි. උණ රෝගයෙහි අගනා විරේචන යෝගයෙකි.

13. යෝග නාමය :— **ඉරමුසු ආදි කෂාය.**

යෝගය :—
ඉරමුසු
ඉරිවේරිය,
කලාඳුරු,
විෂ්ණුක්‍රාන්තිය,
බැවිල,
සැවැන්න,
වංඇපල,
එලබටු,
කොත්තමල්ලි
වැල්මී,
කටුකරෝසන,
වළහසාල්
අසමෝදගම්,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
යකිනාරංමුල්,
අරළු,
බුළු,
නෙල්ලි,

ප්‍රයෝග :— කෝල, සන්නි, වලිප්පු සහ උණසන්නිපාතයට විශේෂ යි.

අනුපාන :— සුදුසු ගුලි සමඟ යෙදිය යුතු ය.

14. යෝග නාමය :— **උක්පුරුක් කෂාය.**

යෝගය :—
උක්දඬු,
නිල්මානෙල් අල,
නෙළුංරේණු,
ඉඹුල්මැලියම්,
වැල්මී,
පද්මකාෂ්ඨ (ප්‍රතිනිධි රෝස දඬු),
නුගඅරළු,
නුගදළු,
මුද්දරප්පලම්,
රටඉඳි,

ප්‍රයෝග :— රක්ත පිත්ත, ප්‍රමේහ නසයි. සෝම රෝගයට විශේෂ යි.

අනුපාන :— මීපැණි.

15. යෝග නාමය :— **උක්ගැට කෂාය.**

යෝගය :—
උක්ගැට = උක්දඬු
සුදුහඳුන්,
විලඳ,
බෙලිමුල්,
සුවඳහොට,

ප්‍රයෝග :— ගැබිණි වමනයට විශේෂ යි.

16. යෝග නාමය :— **උත්පලාෂ්ටක (පේයා).**

යෝගය :—
උඳුපියලි,
බැබිල මුල්,
බෙලිමුල්,
ඉඟුරු,
මානෙල්අල,
කොත්තමල්ලි,

ප්‍රයෝග :— ජ්වරාතීසාරයෙහි පේයාව හෝ ක්වාථය වශයෙන් යොදති.

අනුපාන :— සහිඳලුණු.

17. යෝග නාමය :— **උණගොබ කෂාය.**

යෝගය:—
උණගොබ කලං 6 යි. (ග්‍රෑම් 30 යි).
අට්ටික්කාපොතු කලං 6 යි. (ග්‍රෑම් 30 යි).

ප්‍රයෝගය :— සූතිකා රක්තස්‍රාවය අධික බවට හිත යි.

අනුපාන :— තිකුළු සුණු.

18. යෝග නාමය :— **උශිරාදි ක්වාථය. (1)**

යෝගය :—
සැවැන්දරා,
සුහඳුන්,
පාවට්ටා මුල්,
මුද්දිරප්පලම්,
වැල්මී,
තිප්පිලි,

ප්‍රයෝගය :— රක්ත පිත්ත නාශක ය.

අනුපාන :— මීපැණි සමඟ යි.

19. යෝග නාමය :— **උශිරාදි ක්වාථය. (2)**

යෝගය :—
සැවැන්දරා,
ඉරිවේරිය,
කලාඳුරු අල,
කොත්තමල්ලි,
වියලි ඉඟුරු,
නිදිකුඹ,
මලිතමල්,
ලොත්,
බෙලිමුල්,

ප්‍රයෝග :— අරුචි, පිච්ඡා, ආම, විබන්ධ, අතිවේදනා සහිත රක්තාතිසාරයෙහි යෙදේ.

අනුපාන :— යෝග්‍ය අනුපානයක් යොදන්න.

20. යෝග නාමය :— **එරණ්ඩ සප්තකය.**

යෝගය :—
එඬරුමුල්,
බෙලිමුල්,
එළබටුමුල්,
හින්ගොකටු.
කටුවැල්බටු,
නස්නාරන්මුල්,
පොල්පලා (පාෂාණභේද වෙනුවට),

ප්‍රයෝග :— ශ්‍රෝණි, ඌරු, මෙඪ්‍ර, හෘදය, ස්තන වේදනා නසයි. කටිවායුවට විශෙෂ යි. හෘත්වේදනාවට ද මනාය. වෘක්ක ගුලයට ද හිතවති.

අනුපාන :— පෙරුංකායම්, සවිදලුණු, එඬරුතෙල්, යවක්ෂාර සමඟ ය.

21. යෝග නාමය :— **ක්ෂුද්‍රාදි ක්වාථය.**

යෝගය :—
කටුවැල්බටු,
රසකිඳ,
කර්කටකශෘංගි,
ඉඟුරු,
සුවඳකොට්ටං,

ප්‍රයෝග :— ශ්වාස, කාස, අරුචි, පාර්ශ්වශූල සහිත වාත කඵජ්වරයෙහි යෙදේ.

අනුපාන :— සුදුසු අනුපානයක් සමඟ යොදන්න.

22. යෝග නාමය :— **කට්ඵලාදිය.**

යෝගය :—
කට්ඵල,
කට්තෘණ, (ප්‍රතිනිධි), සැවැන්දරා,
හාර්ංගි,
කලාඳුරු,
කොත්තමල්ලි,
දේවදර.
වදකහ,
අරළු,
කර්කටකශෘංගී,
පත්පාඩගම්,
ඉඟුරු,

ප්‍රයෝග :— වාත කඵාධික කාස, ශ්වාස, සඳහා යෙදේ.

අනුපාන :— මීපැණි, පෙරුංකායම්.

23. යෝග නාමය :— **කණ්ටකාර්‍යාදි ක්වාථය, (1).**

යෝගය :
කටුවැල්බටු,
රසකිඳ,
සිරිතේක්කු,
ඉඟුරු,
කෙළිඳසාල්,
කටුකරෝසන,
කහඹිලියාමුල්, (යවාස)
බිංකොහොඹ,
සුදුහඳුන්,
කලාඳුරුඅල,
දුම්මැල්ල,
ආඩතෝඩා,

ප්‍රයෝග :— දහ, තෘෂ්ණා, අරුචි, ඡර්දි, කාස, හෘත්පාර්ශ්වශූල සහිත පිත්තශ්ලේෂ්මජ්වරහර යි.

අනුපාන :— යෝග්‍ය අනුපානයක් යොදන්නේ යි.

24. යෝග නාමය :— **කණ්ටකාර්යාදි ක්වාථය, (2)**

යෝගය :—
කටුවැල්බටු,
එලබටුමුල්,
මුද්දිරප්පලම්,
ආඩතෝඩාමුල්,
රටඉඟි,
ඉරිවේරිය, (බාලක)
ඉඟුරු,
තිප්පිලි,

ප්‍රයෝග :— පිත්තකාස, ක්ෂය, රක්තපිත්තකාස, නසයි. ඉඟුරු අත්හැර වාසා පංචාංගය සමඟ යෙදීම පෙනහලු වලින් ලේ යන කැස්සට ප්‍රත්‍යක්ෂ යි.

අනුපාන :— ශර්කරා, මධු,

25. යෝග නාමය :— **කණමදු ආදිය.**

යෝගය :—
තිප්පිලි,
වැල්මී,
කොත්තමල්ලි,
සුදුහඳුන්,
රත්හඳුන්,

ප්‍රයෝගය :— ළදරුවාගේ සෙම් උණට. ඇදුමට, ජීවක, කල්කය හෝ යෂ්ටි කල්කය සමඟ යොදනු ලැබේ.

26. යෝග නාමය :— **කටුවැල්බටු, මුඩමහණ කෂාය.**

යෝගය :—
කටුවැල්බටු,
මුඩමහණ,
සැවැන්න,
කලාදුරු,
තිප්පිලි,
කොත්තමල්ලි,

ප්‍රයෝග :— වැඩිහිටියන්ගේ ශ්වාස, කාස ආදියට හිත යි.
අනුපාන :— සුදුසු අනුපානයක් සහ බුද්ධරාජ කල්කය යෙදිය යුතු ය.

27. යෝග නාමය :— **කතකබදිරධාත්‍රී ආදිය.**

යෝගය :—
ඉඟිනි ඇට,
රත්කිහිරි,
නෙල්ලි,
රණවරා,
වෙනිවැල්ගැට, (දර්වි)
වැල්මදට
විදුල (මාවේබොඩ),
කහ,
දියමිත්ත,
අඹඇටමද,
අරළු,
කලාදුරු,

ප්‍රයෝග :— ප්‍රමේහ නසයි. මධු මේහයට විශේෂ යි.
අනුපාන :— මීපැණි.

28. යෝග නාමය :— **කප්පරවල්ලිය ආදි කෂාය.**

යෝගය :—
කප්පරවල්ලිය,
අරළු,
වැල්මී,
බැමිතිරිය, (ලුනුවිල)
තිප්පිලි,
විෂ්ණුක්‍රාන්තිය,
මහෞෂධ (වියලි ඉඟුරු),
රතුලූනු,

ප්‍රයෝගය :— ළදරු කැසි සහිත සෙම් උණට ද, කක්කල්කැස්සට ද, විශෙෂ යි.
අනුපාන : සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

29. යෝග නාමය :— **කලාදුරු ආදි කෂාය.**

යෝගය :—
කලාදුරු,
ඉරමුසු,
ඉරිවේරිය,
විෂ්ණුක්‍රාන්තිය,
බැවිල,
සැවැන්න,
කුප්පමේනිය,
වංඇපල,
තිපල්.
බෙලිමුල්,
යකිනාරන්මුල්,
කටුකරෝසන,
වැල්මී,
වළහසාල්,
අසමෝදගම්,
කොත්තමල්ලි,
තිකුළු.

ප්‍රයෝග :— උණ සන්නිපාතයේ තුන්වෙනි අවස්ථාවට යෝග්‍ය වේ.
අනුපාන :— සුදුසු අනුපානයකින් යෙදිය යුතු ය.

30. යෝග නාමය :— **කලාඳුරු ජලදර ආදි කෂාය.**

යෝගය :—
කලාඳුරු, ඉරිවේරිය,
සුදුහඳුන්, ආඩතෝඩා පංචාංගය — ප්‍රත්‍යෙකව.

ප්‍රයෝග :— පිත්තජ්වරයට හා රත්පිත් උපද්‍රව සඳහා ද සන්නිපාතයට ද අවස්ථානුකූලව යොදනු ලැබේ.
අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

31. යෝග නාමය :— **කාලිංගාදි ක්වාථය.** (1).

යෝගය :—
කෙළිඳසාල්, කලාඳුරුඅල,
ඇත්දෙමටමුල්, දියමිත්තමුල්,
කටුකරෝසන,

ප්‍රයෝග :— පිත් උණ පැසවීමට යෙදේ.
අනුපාන :— ශර්කරා සමඟ ය.

32. යෝග නාමය :— **කාලිංගාදි ක්වාථය.** (2.)

යෝගය :— කෙළිඳහාල්, දුම්මැල්ලකොළ, කටුකරෝසන.
ප්‍රයෝග :— සන්තතජ්වර නසයි.

33. ගෝග නාමය:— **කාලිංගාදී ක්වාථය.** (3.)

යෝගය :—
කෙළිඳහාල්, ඉඟුරු, කලාඳුරුඅල, කටුකරෝසන,
බිංකොහොඹ කොහොඹපොතු, රසකිඳ කොත්තමල්ලි,
පත්පාඩගම්, කටුවැල්බටු, සුවඳකොට්ටං, රත්හඳුන්,
පටෝල, භාර්ගී, ආඩතෝඩාමුල්, පද්මකාෂ්ඨ,

ප්‍රයෝග :— වාතපිත්තෝල්බණ සන්නිපාත ජ්වරයෙහි ද, දහ සහිත උණ, ක්‍රිමිරෝග, අරුචි, කාමලා රෝගයන්හි ද, යෙදේ. ආන්ත්‍රිකජ්වරයෙහි විශෙෂ යි. මලභේද සහිත නම් කටුකරෝසන ඉවත් කළ යුතු යි.
ප්‍රක්ෂේප :— මීපැණි සමඟ යි.

34. යෝග නාමය :— **කාරව්‍යාදි ක්වාථය.**

යෝගය :—
කළුදුරු, ඉඟුරු, කර්කටකශෘංගී,
සුවඳකොට්ටං, රසකිඳ, කහඹිලියමුල්, (යවාස)
එරඬුමුල්, දශමූල, සිරිතේක්කු,
ලුණුවිල, හිඟුරුපියලි, සාරණ,

ප්‍රයෝග :— උග්‍ර අභින්‍යාසජ්වරයෙහි යෙදේ. ගෝමූත්‍ර යොද මෙ කෂාය සෑදීමට නියමිත ය. ස්‍රෝතස් ශුද්ධ කරයි.
අනුපාන :— යෝග්‍ය අනුපානයකින් යෙදිය හැකි ය.

35 යෝග නාමය :— **කාලශාකාදි ක්වාථය.**

යෝගය :—
කරපිංචනැටි,
අරළු,
ඉඟුරු,

ප්‍රයෝග :— ආම, ගුල්ම ජනිත ශූල හා පිපාසා මලබද්ධ නසයි.

36. යෝග නාමය :— **කිරාත තික්තාදිය.**

යෝගය :—
බිංකොහොඹ, රත්හඳුන්,
රසකිඳ, වියලිඉඟුරු,

ප්‍රයෝග :— තෘතියක ජ්වරයට හිත යි.

37. යෝග නාමය :— **කිරාතාදි කෂාය.**

යෝගය :—
බිංකොහොඹ, කටුකරෝසන, කලාඳුරුඅල,
පත්පාඩගම, රසකිඳ, පස්වගෙයෙ කෂාය.

ප්‍රයෝග :— පුනරාවර්තක ජ්වරයෙහි යොදනු ලැබේ.
ප්‍රක්ෂේප :— මීපැණි සමඟ යි.

38. යෝග නාමය : **කුඹුරු කොහොඹ ආදි කෂාය.**

යෝගය :—
කුඹුරු, කොහොඹ, යකුගඬු, වෙලං, බුලත්හිරිද, විෂ්ණුක්‍රාන්තිය, ඉඟුරු,
මුරුංගාපොතු, සුදුළූනු, සාරණ, අසමෝද, අමුක්කරා, තිප්පිලි, තිපල්,
දේදුරු, වදකහ, අබ, ශතපුෂ්ප, කහ, ගම්මිරිස්, පෙරුංකායම්,

ප්‍රයෝග :— කන්කල්ල ශූලය, පුතිගන්ධස්රාව නිකුත්වන අවස්ථාවට හිත යි. කැසි, හති, උණ, ඔක්කාරය නස යි.
අනුපාන :— යවකාරලුණු, සවිද ලුණු

39. යෝග නාමය :— **කුටජාදි ක්වාථය.**

යෝගය :—
කෙළිඳසහල්, දෙළුම්ගැට, කලාදුරුඅල,
මලිතමල්, බෙලිගැටමද, ඉරිවේරිය,
ලොත් (ලොධ්‍ර), සුදුහඳුන්, දියමිත්තමුල්,

ප්‍රයෝග :— ආම ශූල හා පිච්ඡාස්රාව (හීදම) සහිත රක්තාතිසාරයෙහි යෙදේ. සියලු අතිසාර නසයි. රක්ත ප්‍රවාහිකාවට ද ප්‍රසිද්ධ ය.
අනුපාන :— මීපැණි.

40. යෝග නාමය :— **කුලත්ථාදි ක්වාථය (1)**

යෝගය :—
කොල්ලු , ඉඟුරු, සුවඳකොට්ටම,
කටුවැල්බටු, පාවට්ටමුල්, (ආඩතෝඩා)

ප්‍රයෝග :— හික්කා ශ්වාස නසයි.

41. යෝග නාමය :— **කුලත්ථාදි ක්වාථය (2)**

යෝගය :—
කොල්ලු, බෙලිමුල්, තිපල්
ත්‍රිකටු, දේදුරු, අසමෝදගම්,
සිවියමුල්, සුදුළූනු,

ප්‍රයෝග :— හික්කා, ශ්වාස, කාස නසයි. විවිධ පීනසට හා අර්ධාවභේදක, සූර්යාවර්ත යන රෝගයනට විශිෂ්ට යි.

42. යෝග නාමය :— **ගංසූරිය පොතු කෂාය.**

යෝගය :—
ගංසූරිය පොතු,
අරළු,
මදටිය පොතු,

ප්‍රයෝග :— දරුවන්ගේ ජලමල අඩස්සිය, ගල් රත, රත ගෙඩි නසයි.
අනුපාන :— සහිඳලුණු හා ජීවක කල්කය.

43. යෝග නාමය :— **ගන්ධර්වහස්තාදි කෂාය. 1.**

යෝගය :—
එරඬුමුල්, රසකිඳ, ආඩතෝඩමුල්,
බැබිලමුල්, නෙරෙංචි, ඉකිරි,

වාතරක්තයට විශේෂයෙන් දනින් පහළ පුපුරා තෙත දියර ගලන වාතරක්ත රෝගයට හිත ය.
අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

ගන්ධර්වහස්තාදි කෂාය. 2.
එරඬු මුල්, කරඳ මුල්, රත්නිටුල්, ඉඟුරු, අරළු, සාරණ මුල්, යවාස (ප්‍රතිනිධි වැල්කහඹිලියා මුල්), මිංතල්අල, අෂ්ටාවශේෂිතව, ප්‍රක්ෂේපය සවිඳලුණු සහ උක්හකුරු.
ප්‍රයෝග :— කේරලීය පංචකර්ම චිකිත්සාවෙහි පළමුකොට වාතය ශමනය වීම, ජඨරාග්නිය දල්වීම, රුචිය සහ මලශෝධනය පිණිස යොදන්නේ ය.

44. යෝග නාමය :— **ග්‍රන්ථින්ද්‍රාදි මහා කෂාය.**

යෝගය :—

තිප්පිලිමුල්,
භාර්ගී, (සිරිතේක්කු),
තිප්පිලි
හිංඅරත්තඅල,
අසමෝදගම්,
සිවියමුල්,
කෙළිදහාල්,
කිකිරිදිය,
ගුද්ධරත්නිවුල්
අරළු,
නිකමුල්,
දියමිත්ත,
දේවදර,
ඉඟුරු,
කච්චල
එළබටුමුල්,
බිංකොහොඹ,
ක්‍රිමිශත්‍රු,
ගම්මිරිස්,
සුවදකොට්ටං,
කටුවැල්බටු,
වදකහ,

ප්‍රයෝග :— උග්‍ර සන්නිපාත ජ්වර, වාතප්‍රබල සන්නිපාත, ප්‍රලාප සහිත සිහිය නැති සන්නිපාත රෝග, දරුණු සූතිකා රෝග, පක්ෂාඝාතාදී දරුණු වාතරෝගයන්හි යෙදේ.

45. යෝග නාමය :— **ගුඩූචාාදි කෂාය.**

යෝගය :

රසකිඳ,
අතිවිඩයම්,
කොත්තමල්ලි,
ඉඟුරු,
බෙලිගැටමද,
කලාඳුරු,
පද්මකාෂ්ඨ,
හ්රීවේර (බාලක)
දියමිත්ත,
බිංකොහොඹ,
කෙළිඳඇට,
රත්හඳුන්,
සැවැන්දරා,

ප්‍රයෝග : ජ්වරාතිසාර, ඔක්කාර,, අරුචි, වමන, පිපාසා, දැවිලි යන මේවාට හිත ය.

අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

46. යෝග නාමය:— ඝන කරඤ්ජාදි ක්වාථය. (මුස්තාකරංජාදිය)

යෝගය :—

කලාඳුරු,
මඟුල්කරඳ මුලේ පොතු,
ඉඟුරු,

ප්‍රයෝග :— ග්‍රහණි, අතිසාර, අජීර්ණ නසයි.

අනුපාන :— තිප්පිලි සුණු,

සැ: යු:— බාල ග්‍රහණි රෝගයේ දී මේ කෂාය ප්‍රත්‍යක්ෂ යි. අනුපාන වශයෙන් යොද ඇති තිප්පිලි කෂායට ම යෙදුම පහසු ක්‍රමයකි. එහෙත් මාත්‍රා නියමය වයස අනුව ප්‍රමාණ කර ගත යුතු ය.

47. යෝග නාමය :— **චන්දනාදි ක්වාථය. (1)**

යෝගය :—

සුදුහඳුන්,
තිප්පිලි,
ලොත්,
සැවැන්දරා,
නෙළුම්රේණු,
බෙලිගැටමද,
කෙකටිය අල,
කලාඳුරු,
විෂ්ණුක්‍රාන්තිය,
භාතාවාරිය,
ඉරිවේරිය, (හ්රීවේර)
දියමිත්තමුල්,
කෙළිඳසහල්,
කෙළිඳපොතු,

ප්‍රයෝග :— උණ, තෘෂ්ණා දහ ආදි උපද්‍රව සහිත අතිසාරය, රක්තපිත්ත, රක්තාර්ශස් නසයි. රක්ත ප්‍රදරයෙහි විශිෂ්ට යි. ප්‍රසව පූර්ව චලිතගර්භ අවස්ථාවට ද යෝග්‍ය යි. මෙහි ශීත කෂාය හෝ ශෘත කෂාය යෙදිය හැකි ය.

48. යෝග නාමය :— **චන්දනාදි කෂාය. (2)**

යෝගය :—

සුදුහඳුන්,
බාලක — ඉරිවේරිය = (ප්‍රතිනිධි)
මුද්දිරප්පලම්,
වැල්මී,
පත්පාඩගම්,
සැවැන්දරා,
කලාඳුරු,
ඉඟුරු,

ප්‍රයෝග :— රත්පිත්, ශීර්ෂ රුජා, දහ නසයි.

අනුපාන :— සීනි, මීපැණි.

49. යෝග නාමය :— **ජලස්න ආදි කෂාය.**

යෝගය :—

රණවරා,
මාදං පොතු.
කුඹුක්පොතු.
කලාඳුරු,
මුද්දිරප්පලම්,
නුගඅරළු,
දෙකසා,
අරළු,
බුලු,
නෙල්ලි,

ප්‍රයෝග :— ප්‍රමේහ, මධුමේහවලට විශේෂ යි.

50. යෝග නාමය :— **ත්‍රයෝදශාංග ක්වාථය.**

යෝගය :—
කොත්තමල්ලි,
තිප්පිලි,
ඉඟුරු,
දශමූල.

ප්‍රයෝග :— පාර්ශ්වශූල, ජ්වර, ශ්වාස, කාස, පීනස නසයි.
අනුපාන :— යෝග්‍ය අනුපානයක් යොදන්න.

51. යෝග නාමය :— **තාමලක්‍යාදි කෂාය.**

යෝගය :—
එළ පිටවක්කා,
අරළු,
සිරිතේක්කු,
සිවිය,
තිප්පිලි,
නාගර,
වැල්තිබ්බටු මුල්,
රසකිඳ,
වංඇපල,
එළබටුමුල්,
ගම්මිරිස්,
කටුවැල්බටු,

ප්‍රයෝග :— පීනස, ළය පීනස, ඇදුම, කැස්ස, යන රෝගයනට යෝග්‍ය වේ.
අනුපාන :— යෝග්‍ය අනුපානයක් සමඟ යෙදිය යුතු ය.

52. යෝග නාමය :— **තිකුළු තිපල් ආදි කෂාය.**

යෝගය :—
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
අරළු,
බුළු,
නෙල්ලි,
කොත්තමල්ලි
වදකහ,
කටුකරෝසන
රසකිඳ,
කොහොඹපොතු,
කලාඳුරුඅල,

අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

53. යෝග නාමය :— **තිකුළු හිංගු කෂාය.**

යෝගය :—
ඉඟුරු,
ගම්මිරිස්,
කොත්තමල්ලි,
තිප්පිලි,
පෙරුංකායම්,

ප්‍රයෝග :— ශ්වාස රෝගයට විශෙෂ යි. සීතාරාමය ගුලි සමග ය.

අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු යි. මී පැණි සමඟ විශෙෂ ය.
සැ: යු:— කෙනෙක් වැල්මී සමඟ ද යොදති.

54. යෝග නාමය :— **තිප්පිලි ආදි කෂාය.**

යෝගය :—
තිප්පිලි,
කලාඳුරුඅල,
කොත්තමල්ලි,
ඉඟුරු,
වැල්මී,
වැල්තිබ්බටුමුල්,
සැවැන්දරාමුල්,

ප්‍රයෝග :— ළදරු ශ්ලෙෂ්මජ්වරයට යෝග්‍ය වේ.

අනුපාන :— උක්පැණි, තනකිරි, ජීවක කල්කය සමඟ ය.

55. යෝග නාමය :— **ත්‍රිඵලාදි ක්වාථය.**

යෝගය :—
අරළු,
බුළු,
නෙල්ලි,
ඉඟිනි ඇට,
දියමිත්තමුල්,
කලාඳුරුඅල,
මාදං පොතු,
දෙකසා,
වැල්මදට,
රණවරාමුල් හා පොතු,

ප්‍රයෝගය :— සියලු ප්‍රමේහ නසයි. මූත්‍ර ශර්කරා රෝගය (අශ්මරී) සහ විශෙෂයෙන් ප්‍රමේහ පිඩකා නසයි.

අනුපාන :— මීපැණි.

56. යෝග නාමය :— **ත්‍රිවෘතාදි කෂාය.**

යෝගය :—
තිරස්සවාලු,
මුද්දිරප්පලම්,
අරළු,
නෙල්ලි.

ප්‍රයෝග :— රක්තපිත්ත, අර්ශස්, අග්නිමාන්ද්‍ය ආදියට අගනා මෘදු විරේකය යි. කාමලා මුල් අවස්ථාවට යෝග්‍ය වේ.

අනුපාන :— සීනි, මීපැණි,

57. යෝග නාමය :— **තුන්දෙස් කෝල කෂාය.**

යෝගය :—
දුම්මැල්ල,
වංඇපල,
එලබටු මුල්,
වැල්තිබ්බටු මුල්,
කලාදුරු,
වැල්කසඹිලියා,
මිදිමුල්,
සැවැන්න,
ඉරිවේරිය,

ප්‍රයෝග :— තුන්දෙස් කෝලයට සන්නිපාත ජ්වරයට යෙදේ.

අනුපාන :— කෝලදවුන්ඩ ගුලි සමහ යෙදිය යුතු ය.

58. යෝග නාමය :— **තුඹමුල් ආදි කෂායද්වය.**

යෝගය :—
තුඹමුල්,
කරඳමුල්
නිකමුල්,
හෝ
දෙදුරු,
ගම්මිරිස්,
කුරුඳුමුල්,
පෙරුම්කායම්,
වියලිකහ,

ප්‍රයෝග :— සූතිකාවන්ගේ මක්කල්ලශූලය — බඩේ කැක්කුමට යෝග්‍ය යි.

අනුපාන :— මේ යෝග හෙණරාජගුලි (නැතිනම් මාත්තු සහ)හැලි අරක්කු සමහ ගුලි සහිතව යොදනු.

59. යෝග නාමය :— **තොවිල පොතු ආදිය.**

යෝගය :—
තොවිල පොතු,
අමුඉඟුරු,
කොල්ලු,
ගම්මිරිස්,
වදකහ,
බැබිල,
මුරුංගා පොතු,
සුදු ලූනු,

ප්‍රයෝග :— සූතිකා සන්නියට විශෙෂ යි.

අනුපාන :— තලතෙල්, කොහොඹතෙල් සමහ ය.

60. යෝග නාමය :— **ද්‍රාක්ෂාදිය (I)**

යෝගය :—
මුද්දිරප්පලම්,
මීමල් (මීපුප්),
වැල්මී,
ලෝධ්‍රපොතු,
ඇද්දෙමටගෙඩි, (හෝ පොතු),
ඉරමුසුමුල්,
කලාඳුරුඅල,
නෙල්ලි,
ඉරිවේරිය (ප්‍රතිනිධි),
නෙළුම්රේණු,
පද්මකාෂ්ඨ, (ප්‍ර. නි. රෝස දඬු)
නෙළුම්අල,
සුදුහඳුන්,
සැවැන්දරාමුල්,
නිල්මානෙල්අල,
පරුෂක (බොරළු දමනු හෝ උගුරැස්ස ගෙඩි),

සංස්කරණය :— ක්වාථය බෝතලයෙක්හි බහා ඊ මතු පිටින් දැසමන් මල් යොද රාත්‍රී පින්නෙහි තබා උදැසන පෙරා, සීනි, මීපැණි, ප්‍රක්ෂේපකර පානය කරන්න.

ප්‍රයෝග :— වා පිත් උණ, මදාත්‍යය, වමන, මූර්ච්ඡා, භ්‍රම, පිපාසා, කමාලා නසයි. මෙය ඵාණ්ඨ හිම සහ ක්වාථය විසින් යෙදේ.

ප්‍රත්‍යක්ෂතා :— උන්මාදයෙහි විශිෂ්ට යි. ක්ෂය, රක්ත පිත්ත, හේතුවෙන් ලේ ගැලීමට හෝ අන්ත්‍රමාර්ගයෙන් ලේ ගැලීමට හා රක්තප්‍රදරයට විශිෂ්ට යි. ගර විෂ අවස්ථාවට ද සුදුසු ය.

61. යෝග නාමය :— **ද්‍රාක්ෂාදි ක්වාථය (II).**

යෝගය :—
මුද්දිරප්පලම්,
සුදුහඳුන්,
පද්මකාෂ්ඨ,
කලාඳුරුඅල,
කටුකරෝසන,
රසකිඳ,
නෙල්ලි,
ඉරිවේරිය (ප්‍රතිනිධි),
සැවැන්දරාමුල්,
ලොධ්‍රපොතු,
කෙළිඳසාල්,
පත්පාඩගම්,
පරුෂක (උගුරැස්ස ගෙඩි ප්‍ර. නි.),
ප්‍රියංගු,
වැල්කහඹිලියා (ප්‍රතිනිධි, යවාස),
ආඩතෝඩාමුල්,
වැල්මී,
දුම්මැල්ල,
බිංකොහොඹ,
කොත්තමල්ලි,

ප්‍රයෝග :— පිත්තජ්වර, පිත්ත ප්‍රධාන සන්නිපාත ජ්වර, භ්‍රම, මූර්ච්ඡා, ඡර්දි, ශූල, මුඛශෝෂ, අරුචි, අර්ශස් යන රෝගයන්හි යෙදේ.

අනුපාන :— මීපැණි,

62. යෝග නාමය :— **ද්‍රාක්ෂාදි ක්වාථය :— (III) (අෂ්ටාදශාංගය)**

යෝගය :—
මුද්දිරප්පලම්,
රසකිඳ,
ශඨී,
කර්කටකශෘංගි,
කලාඳුරුඅල,
රත්හඳුන්,
ඉඟුරු,
කටුකරෝසන,
දියමිත්ත,
බින්කොහොඹ,
දුරාලභා (වැල්කහඹිලියා),
සැවැන්දරාමුල්,
කොත්තමල්ලි,
පද්මකාෂ්ඨ,
බාලා, (ඉරිවේරිය ප්‍රතිනිධි),
කටුවැල්බටු,
සුවඳකොට්ටං,
කොහොඹපොතු,

ප්‍රයෝග — පිත්තජ ජ්වර, පිත්ත ප්‍රධාන සන්නිපාත ජ්වර, භ්‍රම, ක්ලම, මූර්ච්ඡා, ඡර්දි, ශූල මුඛශෝෂ, අරුචි, කාස, ශ්වාස, හෘල්ලාස යන රෝග සඳහා යෙදේ.

අනුපාන :— මීපැණි,

63. යෝග නාමය :— **ද්‍රාක්ෂාදි කෂාය (IV)**

යෝගය :—
මුද්දිරප්පලම්,
අරළු,
නෙල්ලි,
එළ පිටවක්කා,
කර්කටකශෘංගි,
වැල්කහඹිලියා,
තිප්පිලි,
සාරණ,
රතුසාරණ,
කටුවැල්බටු,

ප්‍රයෝගය :— පිනස, කැස්ස, ඇදුම, ළය පිනස රෝගවලට යෝග්‍ය වේ.

64. යෝග නාමය :— **ද්‍රාක්ෂාමෘතා ක්වාථය**

යෝගය :—
මුද්දිරප්පලම්,
නෙල්ලි,
රසකිඳ,
වැල්මී,
සුදුහඳුන්,
පද්මකාෂ්ඨ (ප්‍රතිනිධි නෙළුං අල),

ප්‍රයෝග :— පිත්තජ උණ, රක්ත පිත්ත ආදිය නසයි.

අනුපාන — සීනි,

65. යෝග නාමය :— **ද්‍රාක්ෂා ඛර්ජුරාදි ක්වාථය**

යෝගය :—
මුද්දිරප්පලම්,
ශතපුෂ්ප = මිශි,
කරාබු,
ඉරිවේරිය (ප්‍රතිනිධි),
කොට්ටං,
රටඉඳි,
වැල්මී,
සුදුහඳුන්,
කලාඳුරු,
ඉඟුරු,
ලෝධ්‍ර,
බෙලිගැටමද,
සැවැන්දරා,
ඇද්දෙමටගෙඩි,
තිප්පිලි,
එන්සාල්,
නෙළුම්රේණු,

ප්‍රයෝග :— උන්මාද, භූත, මූර්ච්ඡා, පිපාසා,කාස, දාහ, ජ්වර, වමන, මද, ඌර්ධ්වගත රක්තපිත්ත නසයි.

අනුපාන :— මීපැණි, සීනි,

66. යෝග නාමය :— **ද්‍රාක්ෂාභයාදි ක්වාථය.**

යෝගය :—
මුද්දිරප්පලම්,
අරළු,
පත්පාඩගම්,
කලාඳුරුඅල,
කටුකරෝසන,
අහැළකරල්පැණි.

ප්‍රයෝග :— පිත්ත ජ්වර නසයි. ප්‍රලාප, මූර්ච්ඡා, භ්‍රම, දාහ, ශෝථ, තෘෂ්ණා, පිත්තකජ්වරාදියට ශ්‍රේෂ්ඨ මෘදු විරේචනයකි. කාමලා රෝගයට ද යෝග්‍ය වේ.

අනුපාන— සුදුසු අනුපානයක් යොදනු.

67. යෝග නාමය :— **දන්තිමූලාදි ක්වාථය:**

යෝගය :—
දන්තමුල්,
බැබිලමුල්,
ඉඟුරු,
කටුකරඩුමුල්,
එරඬුමුල්,
කොල්ලු,
දේවදර,
නිකමුල්,
බෙලිමුල්,
සුදුලූනු,
උඳු.

ප්‍රයෝග :— ඉතා බලවත් වාත රෝග, විශ්වාචි, ගෘධ්‍රසී, ක්‍රෝෂ්ටුක, ශිර්ෂ, අපතාන, අර්දිත, පක්ෂාඝාත, අවබාහුක, ඌරුස්තම්භ, ශිරස්තෝද හා ශුක්‍රධාතු ගත රෝග ද වෙනත් වාතයෙන් හට ගත් රෝග ද නසයි.

අනුපාන :— සුදුසු අනුපානයක් යෝග්‍ය පරිදි යොදන්න.

68. යෝග නාමය :— **දලුද බටුත් කුප්පමේනිය ආදිය.**

යෝගය :—
බටුදළු,
කුප්පමේනිය දළු,
කිරිඅඟුනදළු,
පාවට්ටාදළු,
මලිදදළු,
ඇඹුල්දෙඩම් යුෂ,
හ්‍රංජන (කොත්තමල්ලි හෝ කරාබු),
රතු ලූනු.

සංස්කරණය :— මේ සියල්ල සමව ගෙන කොටා වණ්ඩුවෙන් තම්බා, යුෂ මිරිකා ගත යුතු යි.

ප්‍රයෝග :— උණ, කැසි, කෝල, වලිප්පු, කටතොල වියලුම, හතිය සහිත ඊලේ ඇදුම, අතීසාරය. සෙමෙන් ගෙල ඇහැරීම, හුස්ම ගැනීමේ අපහසුව නසයි.

අනුපාන :— යෂ්ටි කල්කය, ගිතෙල්, තලතෙල්, මීපැණි. යොදන්නේ ය. වෙනත් සමාන කල්ක සමඟ යෙදිය හැක

69. යෝග නාමය — **දශමූල ක්වාථය.**

යෝගය :—
බෙලිමුල්,
තොටිලමුල්,
මිදිමුල්,
පළොල්මුල්,
ඇත්දෙමටමුල්,
අස්වැන්නමුල්,
පොල්පලාමුල්,
බටුමුල්,
කටුවැල්බටුමුල්,
ගොකටුමුල්,

ප්‍රයෝග :— කාස, ශ්වාස, තන්ද්‍රා, පාර්ශ්වශූල, කණ්ඨග්‍රහ හා සන්නිපාතජ්වර නසයි.

අනුපාන :— තිප්පිලි සුණු.

70. යෝග නාමය :— **දසමුල් ඉඟුරු ආදි ක්වාථය**

යෝගය :—
දසමුල්,
ඉඟුරුපියලි,
අරත්තඅල,
සිරිතේක්කු,
බෙලිමුල්,
බැවිලමුල්,
ඉඟුරු,
කොට්ටං,
තිප්පිලි,
කර්කටකශෘංගි,
තිප්පිලිමුල්,
එල පිටවක්කා,
රසකිඳ,

ප්‍රයෝග :— ශ්වාසය නසයි.

71. යෝග නාමය :— **දශමූලබලාදි ක්වාථය (I)**

යෝගය :—
දසමුල.
බැබිල.
උඳු.

ප්‍රයෝග :— විශ්වාචී, අවබාහුක රෝග නසයි. සායං කාලයෙහි ආහාර ගැනුමෙන් පසු මෙ කෂාය ශක්ති පරිදි නාසයෙන් පීමට අනුදන්නා ලදී.

අනුපාන :— තලතෙල්, ගිතෙල්.

72. යෝග නාමය :— **දශමූලබලාදි ක්වාථය (II)**

යෝගය :—
දසමුල්,
බැබිලමුල්,
එරඬු මුල්,
නිකමුල්,
දේවදර,
වේලා මුල්, වල්වෙලා මුල්,
පංචකෝල (තිප්පිලි, තිප්පිලිමුල්, සිවියමුල්, රත්නිවුල්, ඉඟුරු),

ප්‍රයෝග :— සියලු වාත රෝග නසයි.

අනුපාන :— සුදුසු අනුපානයක් යෝග්‍ය පරිදි යොදන්න.

73. යෝග නාමය :— **දශමූලාදි ක්වාථය**

යෝගය :—
දශමූල,
බැබිලමුල්,
අරත්තඅල,
සුවඳකොට්ටම්,
දේවදර,
ඉඟුරු,

ප්‍රයෝග :— පාර්ශ්ව අංශ, ශිරෝරුජා, සහිත ක්ෂය කාස නාශක යි.

අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

74. යෝග නාමය :— **දරුපර්පටාදි ක්වාථය (I)**

යෝගය :—
දේවදර,
පැපිලිය,
සිරිතේක්කු, (භාර්ගී)
කලාඳුරුඅල,
වදකහ,
කොත්තමල්ලි
කටුඑල,
අරළු,
ඉඟුරු,
බිම්කොහොඹ,

දරුපර්පටාදි ක්වාථය (II)

දේවදර,
පැපිලිය,
කලාඳුරුඅල,
අරළු
ඉඟුරු,
කටුඑල
සුවඳකොට්ටම්,
සිරිතේක්කු,
කටුවැල්බටු,
තිප්පිලි

ප්‍රයෝග අංක (I) මෙනි

ප්‍රයෝග :— හික්කා, ශ්වාස, කඑජ්වර, ගලග්‍රහ නසයි. කාස, ශ්වාස, ප්‍රසේක යනාදි උපද්‍රව දුරු කෙරේ.

අනුපාන :— පෙරුම්කායම්, මීපැණි,

75. යෝග නාමය :— **දුරාලභාදිය (I)**

යෝගය :—
දුරාලභා (කහඹිලියා),
පත්පාඩගම්,
රුක්මල් (ප්‍රතිනිධි),
බිංකොහොඹ,
පාවට්ටාමුල්,
කටුකරෝසන,

ප්‍රයෝග :— දහ, ජ්වර, තෘෂ්ණා, රක්ත පිත්ත ආදිය නසයි. අගනා විරේචනයකි.

අනුපාන :— යෝග්‍ය පරිදි සුදුසු අනුපානයෙන් යොදන්න.

යෝග නාමය :— **දුරාලභාදිය (II)**

යෝගය :—
දුරාලභා (වැල්කහඹිලියා)
කලාඳුරුඅල,
රසකිඳ
කටුවැල්බටු
පත්පාඩගම්
ඉඟුරු
කොත්තමල්ලි

ප්‍රයෝග :— ආම සහිත ජ්වරයෙහි, ආන්ත්‍රික ජ්වරයෙහි ආරම්භයෙහි විශේෂ යි. අධික මල බද්ධය සහිත අවස්ථාවෙහි කටුකරෝසන සමඟ ද විරේචන අවස්ථාවෙහි ඉරිවේරිය සමඟ ද යෙදේ.

අනුපාන :— යෝග්‍ය පරිදි සුදුසු අනුපානයෙන් යොදන්න.

76. යෝග නාමය :— **දෙදුරු අක්‍රපට්ට ආදිය.**

යෝගය :—
දෙදුරු,
අක්‍රපට්ටා,
වැල්මී,
කොත්තමල්ලි,
ඉඟිනිඇට,
වංඇපල,
කටුකරෝසන
තිකුළු,
යකුවනසු,
දේවදර,
රත්හඳුන්,

ප්‍රයෝග :— සියලු සන්නි, සෝල, වලිප්පු නසයි.

අනුපානය :— තලතෙල්, ගිතෙල්, තනකිරි, උක්යුෂ, සීනි, මීපැණි, ඉඟුරු යුෂ මෙකී අනුපාන සමඟ මොර ඇටයක් පමණ චන්ද්‍රකල්කය සහිතව දෙන්න.

77. යෝග නාමය :— **දෙනිඹ දෙබටු ආදි කෂාය.**

යෝගය :—
කොහොඹපොතු,
බිංකොහොඹ,
එලබටු,
කටුවැල්බටු,
තොටිල පොතු,
දියමිත්ත,
ලුණුවරණ පොතු,
ඉඟුරු,

ප්‍රයෝග :— වාත කළුජ්වර හා ඇමම, අඩස්සි, සන්නි කෝලවලට හිත ය.

අනුපාන :— සිතාරාම ගුලි හා සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

78. යෝග නාමය :— **දෙසඳුන් උළුවා ආදි කෂාය.**

යෝගය :—
සුදුහඳුන්,
රත්හඳුන්,
උළුහාල්,
වැල්මී,
කොත්තමල්ලි,
රතුලූනු,
ඉඟිනිඇට,
සාරණමුල්,
හිඟුරුපට,
බැබිලකොළ,

සංස්කරණය :— සමභාගව ගෙන, කයපැන්, එලකිරි, වත්කොට කෂාය සිඳගත යුතු යි.

ප්‍රයෝග :— උණ, අතීසාර, ලේහිදම් යාම, ගත ඉදිමුම, උගුර-තොලකට වියලුම්, උල්ලෝගම, උස්මුරුත, ගත සුදුවීම, පාණ්ඩුව, මාන්දමින් ඇති වන නොයෙක් උපද්‍රවවලට බිළිඳුන් හට ද මේ කෂාය සුදුසු ය.

අනුපාන :— යෂ්ටි කල්කයෙහි අනුපාන.

79. යෝග නාමය :— **දෙසඳුන් ආදි කෂාය.**

යෝගය —
රත්හඳුන්,
සුදුහඳුන්,
රතුලූනු,
වැල්මී,
ඉරමුසුමුල්;
සැවැන්දරා, මුල්,
පත්පාඩගම්,
වදමල් කැකුළු,
රත්මල්,

ප්‍රයෝග :— ළදරුවන්ගේ බරපතල රතගායට විශෙෂ යි.

අනුපාන :— යෝග්‍ය පරිදි සුදුසු අනුපානයකින් යෙදිය යුතු ය.

80. යෝග නාමය :— **ධාන්‍යකාදි ක්වාථය.**

යෝගය :—
කොත්තමල්ලි,
නෙල්ලි,
වංඇපල,
වියලිමිදි,
පැපිළිය,
සුදුහඳුන්,

සැ: යු: — මෙහි විශෙෂයක් ලෙය හිම යන්නට සුදුහඳුන් යෙදේ. එහෙත් යෝගයෙහි අදහස් කරන ලද්දේ පූර්වෝක්ත යෝගයේ හිම කෂාය යි.

81. යෝග නාමය :— **ධාන්‍යපඤ්චක ක්වාථය.**

යෝගය :—
කොත්තමල්ලි,
ඉඟුරු,
බෙලිගැටමද,
කලාඳුරුඅල,
ඉරිවේරිය (ප්‍රතිනිධි)

මෙය ඉඟුරු රහිත වූ කල ධාන්‍ය චතුෂ්කය නම්.

ප්‍රයෝග :— ආමශූල, විබන්ධ නසා දීපන පාචන ඇති කරයි. රක්තාතීසාරයේදී ධාන්‍යචතුෂ්කය වශයෙන් හෝ ඉඟුරු අස්කොට අතිවිඩයම් සහිත පංචකය හෝ වෘද්ධ ව්‍යාවහාරය යි.

අනුපාන :— මීපැණි.

82. යෝග නාමය :— **ධාන්‍යාකගුණ්ඨි ක්වාථය**

යෝගය :—
කොත්තමල්ලි,
ඉඟුරු,
දේවදාර,
එඬරු මුල්,
බැවිල මුල්,
බෙලිමුල්,

ප්‍රයෝග :— හෘද්ග්‍රහ, කෝෂ්ඨවාත, ගුල්ම, ප්ලීහ, පාර්ශ්වරුජා,

අනුපාන :— සෛන්ධව සමඟ ය.

83. යෝග නාමය :— **නවකාර්ෂාය**

යෝගය :—
වෙනිවැල් (දරුහරිද්‍රා),
වදකහ,
අරළු,
රසකිඳ,
වැල්මදට,
බුළු,
කටුකරෝසන,
කොහොඹපොතු,
නෙල්ලි,

ප්‍රයෝග :— කුෂ්ඨ, ස්‍රාවයුක්ත-දාහයුක්ත, දරුණු වාතරක්තයට හිත ය.

අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

84. යෝග නාමය :— **නාගරාදි ක්වාථය (I)**

යෝගය :—
ඉඟුරු,
අතිවිඩයන්,
කලාඳුරු,
බිම්කොහොඹ,
රසකිඳ,
කෙළිඳසාල්,

ප්‍රයෝග :— උණ සහ අතීසාර නාශක යි.

අනුපාන :— යෝග්‍ය අනුපානයක්.

85. යෝග නාමය :— **නාගරාදි ක්වාථ (II)**

යෝගය :—
ඉඟුරු,
දේවදාර,
කටුවැල්බටු,
කොත්තමල්ලි,
බටුමුල්,

ප්‍රයෝග :— ජ්වරයෙහි ආමය පැසවීමට යෙදේ. ජ්වර නාශක යි. කඵඝ්න යි.

86. යෝග නාමය :— **නාරිකේලෝදක යෝගය. (I)**

යෝගය :— තැඹිලිවතුර හෝ පොල් (කුරුම්බා) වතුර

ප්‍රක්ෂේපය :— උක්හකුරු සහ බුළු සුණු,

ප්‍රයෝග :— දාහජ්වර ප්‍රලාප හා සන්නිපාත උණ නසයි.

87. යෝග නාමය :— **නාරිකේලෝදන යෝගය (II)**

යෝගය :— තැඹිලි වතුර හෝ කසපැන් සමඟ ඉදුණු කදලි ඵල (කෙසෙල්ගෙඩි),

ප්‍රයෝග :— ශ්‍රම දාහ ජ්වරය නසයි.

88. යෝග නාමය :— **නිකනිඹ කෂාය.**

යෝගය :—
කොල්ලු,
වදකහ,
නිකමුල්,
කුඩුමිරිසමුල්,
අරළු,
ඉඟුරු,
කොහොඹමුල්,
මදුරුතලා,
බුළු,
නෙල්ලි,

ප්‍රයෝග :— වැදුගෙයි සන්නියට විශේෂ යි. (ගුලි සහ කොහොඹ තෙල් ප්‍රතිවාප) ඇතැම් කෙනෙක් තිපලුත් ගන්නට ''තිකුළුත්'' යි කියත්. එය ද නිවැරදි ය. සීතාරාමය ගුලි සමඟ යෙදේ.

89. යෝග නාමය :— **නිකමුල් බර කෂාය :—**

යෝගය :—
දශමූල,
දේවදාර,
ගම්මිරිස්,
අසමෝදගම්,
පංචකෝල,
දෙදුරු,
වේලාමුල්,
රම්මනිස්ස මුල්,
සමභාගව ගත යුතු යි.
නිකමුල් බරක් ගත යුතු යි.
ඇතැම් කෙනෙක් රම්මනිස්ස වෙනුවට වල්වෙලා ගනිත්.

ප්‍රයෝග :— අනේකහේතුජබාධිර්‍ය, පෘෂ්ට ශූල, ශීර්ෂකම්ප, ආධ්මාන, අන්ත්‍රවාත, හෘද්ශූල, අන්තරායාම බාහිරායාම ආදිය නස යි.

90. යෝග නාමය :— **නිදිග්ධිකාදි ක්වාථය.**

යෝගය :— කටුවැල්බටු.
ඉඟුරු,
රසකිඳ,

ප්‍රයෝග :— අරුචි, කැස්ස, පිනස, ඇදුම, ජීර්ණජ්වර නසයි.
අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

91. යෝග නාමය :— **නිම්බාදිය.**

යෝගය :— කොහොඹපොතු,
දුම්මැල්ල,
අරළු,
බුළු,
නෙල්ලි,
මුද්දිරප්පලම්,
කලාදුරු,
කෙළිඳහාල්,

ප්‍රයෝග :— අන්‍යෙද්‍යුෂ්ක ජ්වරය නසයි.
අනුපාන :— යෝග්‍ය අනුපානයකි.

92. යෝග නාමය :— **නීලෝත්පලාදි ශීත කෂාය.**

යෝගය :— නිල්මානෙල් අල,
බැබිල මුල්,
මුද්දිරප්පලම්,
මීමල්,
වැල්මී,
සැවැන්දරාමුල්,
පද්මකාෂ්ඨ,
ඇද්දෙමටගෙඩි.
යන මේවායේ ශීත කෂාය.

ප්‍රයෝග :— වාත පිත්ත ජ්වර, ප්‍රලාප, ග්‍රම, ඡර්දි, මෝහ, තෘෂ්ණා නසයි.

93. යෝග නාමය :— **ප්‍රාණදදි ක්වාථය.**

යෝගය :— අරළු,
අසමෝද,
ඉඟුරු,
කරපිංචනැටි,

ප්‍රයෝග :— සෙම් පිනස, අග්නිමාන්ද්‍ය, ආම, කාස, වාතගුල්ම, ප්ලීහ, යකෘත් ශූල, ශ්වාස සඳහා යොදති.

94. යෝග නාමය :— **පටෝලාදි ක්වාථය (I)**

යෝගය :— දුම්මැල්ල,
දැසමන්,
කොහොඹපොතු,
සුදුහඳුන්,
රත්හඳුන්,
පද්මකාෂ්ඨ,

ප්‍රයෝග :— රත්පිත්, ක්ෂය නසයි.
අනුපාන :— යෝග්‍ය අනුපානයක් යොදන්න.

95. යෝග නාමය :— **පටෝලාදි ක්වාථය (II)**

යෝගය :— දුම්මැල්ල,
ඉරමුසු,
කටුකරෝසන,
කලාදුරු,
දියමිත්ත,

ප්‍රයෝග :— සන්තත ජ්වරය නසයි.

96. යෝග නාමය :— **පටෝලාදි ක්වාථය (III)**

යෝගය :— දුම්මැල්ල,
හාතාවාරිය අල,
බුළු,
රසකිඳ,
කටුකරෝසන,
අරළු,
නෙල්ලි,

ප්‍රක්ෂේපය :— සීනි, මීපැණි,
ප්‍රයෝග :— වාතරක්තයෙහි යෙදේ.

97. යෝග නාමය :— **පටෝල මූලාදි ක්වාථය**

යෝගය :—
දුම්මැල්ල,
ලුණුවිල,
වැල්මී,
කටුකරෝසන,
අරළු,
වෙනිවැල්ගැට,
දේවදර,
සුදුහඳුන්,
දැත්ත,
ගොංකැකිරිඅල,
නිවුල, (දීයම්දෙල්ල එල)
තිප්පිලි,

ප්‍රයෝග :— අෂ්ඨවිධ ශෝථ, විසර්ප, දහ, විෂමජ්වර නසයි.

98. යෝග නාමය :— **පඤ්චකෝල ක්වාථය.**

යෝගය :—
තිප්පිලි,
තිප්පිලිමුල්,
වියලි ඉඟුරු,
සිවිය,
ශොධිත රත්නිටුල්,

ප්‍රයෝග :— අජීර්ණ (ආහාර නොදිරුම් දෙෂාවස්ථාවන්ට) විශෙෂයෙන් ගුණ යි. ගුල්ම, ශූල, උදවර්ත, ආම නාශක යි. මක්කල්ල ශූලයට පංචකෝල චූර්ණය මද්‍යසාරය සමඟ යෙදුමෙන් විශෙෂ ගුණ ලැබේ ය යි සඳහන් කළ හැකි ය.

99. යෝග නාමය :— **පඤ්චතික්ත ක්වාථය.**

යෝගය :—
කටුවැල්බටු,
රසකිඳ,
බිංකොහොඹ,
ඉඟුරු,
සුවඳකොට්ටම්,

ප්‍රයෝග :— අට වැදෑරුම් උණ නසයි.
අනුපාන :— සීනි,

100. යෝග නාමය :— **පර්ණාසපඤ්චක ක්වාථය.**

යෝගය :—
රසකිඳ,
ඉඟුරු,
මදුරුතලා,
සිරිතේක්කු,
කටුවැල්බටු,

ප්‍රයෝග :— කාස, ශ්වාස නසයි.
අනුපාන :— තිප්පිලි සුණු, මී පැණි,

101. යෝග නාමය :— **පඤ්චමූලාදි ක්වාථය.** (I)

යෝගය :—
සුළුපහ,
මුද්දිරප්පලම්,
දියමිත්තමුල්,
කටුකරෝසන,
නෙල්ලි,
රසකිඳ,

ප්‍රයෝග:— වාතපිත්තජ්වරයෙහි ප්‍රත්‍යක්ෂ යි. කඵාධික වූ කල මෙය මහත් පංචමූල සහිතව යෙදේ. කාමලා රෝගයට ද විශෙෂ යි.
අනුපාන :— උක්හකුරු සහ යෝග්‍ය අනුපානයකින් යොදනු ලැබේ.

102. යෝග නාමය :— **පඤ්චමූල්‍යාදි ක්වාථය** (II)

යෝගය :—
සුළුපස්මුල
බැබිලමුල්
බෙලිමුල්,
රසකිඳ,
කලාඳුරු,
ඉඟුරු,
දියමිත්තමුල්,
බිම්කොහොඹ,
ඉරිවේරිය,
කෙළිඳපොතු,
කෙළිඳහාල්,

ප්‍රයෝග :— ජ්වර, වමන, ශූල, දරුණු ශ්වාස, කාස සහිත ජ්වරාතිසාරයට හිත යි.
අනුපාන :— යෝග්‍ය පරිදි

103. යෝග නාමය :— **පථ්‍යාදි ක්වාථය.**

යෝගය :—
අරළු,
බුළු,
නෙල්ලි,
බිංකොහොඹ,
වියලිකහ,
කොහොඹපොතු,
රසකිඳ,

ප්‍රයෝග :— අක්ෂි රෝග, දරුණු ශීර්ෂරෝග නසයි.

104. යෝග නාමය :— **පාචනාමෘත ක්වාථය.**

යෝගය :—
රසකිඳ,
සැවැන්දරා,
දියමිත්ත,
කලාඳුරුඅල,
ඉඟුරු,
බිම්කොහොඹ,
හ්‍රීවේර (බාලක)
පැපිලිය,
කොත්තමල්ලි,
කහඹිලියමුල්, (ධන්වයාස)

ප්‍රයෝග :— උණ පැසවීම සඳහා යෙදේ. ආන්ත්‍රික ජ්වරය පිළිබඳ මුල් අවස්ථාවට විශෙෂයෙන් ගුණ ලැබේ.

අනුපාන :— සිනි.

105. යෝග නාමය :— **පාඨාදි ක්වාථය (I)**

යෝගය :—
දියමිත්තමුල්,
කෙළිඳසාල්,
බිම්කොහොඹ,
ඉඟුරු,
කලාඳුරුඅල,
පැපිලිය,
රසකිඳ,

ප්‍රයෝග :— ආම සහිත ජ්වරාතිසාරයෙහි යෙදේ.

106. යෝග නාමය :— **පාඨාදි කෂාය. (II)**

යෝගය :—
ඉඟුරු,
කලාඳුරුඅල,
දියමිත්ත,
පත්පාඩගම්,
කෙළිඳහාල්,
රසකිඳ,
නිංකොහොඹ,

ප්‍රයෝග :— ජ්වරාතිසාරය, ආමාතිසාරයන්හි යොග්‍ය වෙ.

107. යෝග නාමය :— **පාඨාකරඤ්ජාදි ක්වාථ.**

යෝගය :—
දියමිත්තමුල්,
මහල්කරඳ මුල්,
කුණුකරඳමුල්, (කුඹුරු)
තිප්පිලිමුල්,
සිවියමුල්,
රත්නිවුල්,
ඉඟුරු,
කරපිංචනැටි,
අරළු,
පිලමුල්,
බෙලිමුල්,
තිප්පිලි,

ප්‍රයෝග :— ආම අතිසාරයට විශිෂ්ට ය. අග්නිමාන්ද්‍ය, ග්‍රහණි, අර්ශස් යන රෝගයන් සඳහා යෝග්‍ය වේ.

අනුපාන :— යෝග්‍ය අනුපානයක් යොදන්නේ ය.

108. යෝග නාමය :— **පාඨාසමංගාදි ක්වාථය.**

යෝගය :—
දියමිත්තමුල්,
තිදිකුම්බා,
අතිවිධයම්,
කලාඳුරුඅල,
බෙලිගැටමද,
කහඹිලියාමුල්, (ප්‍රතිනිධි),
ඉරිවේරිය,
ඉඟුරු,

ප්‍රයෝග :— සාම, නිරාම, ජ්වරයුක්ත, රක්තාතිසාරයෙහි සුදුසු ය.

අනුපාන :— යෝග්‍ය අනුපානයක් යොදනු.

109. යෝග නාමය :— **ප්‍රියංගුකාදි ක්වාථය.**

යෝගය :—
රැක්මල් (ප්‍රතිනිධි),
සුදුහඳුන්
ලොධ්‍ර
මලිතමල්, (ධාතකී),
ඉරිවේරිය (ප්‍රතිනිධි),
මීමල් (මීපුප්),
කලාඳුරුඅල,
සැවැන්තමුල්,
ඉරමුසුමුල්.

ප්‍රයෝග :— දරුණු රක්ත පිත්ත නසයි. රක්ත ප්‍රදරයෙහි විශිෂ්ට යි.

අනුපාන :— සුදුසු අනුපානයක් යොදනු.

110. යෝග නාමය :— **පිත්ත ශ්ලේෂ්මහර අෂ්ටාදශාංග ක්වාථය**

යෝගය :—
බිම්කොහොඹ,
දේවදර,
දශමූල,
ඉඟුරු,
කලාඳුරුඅල,
කටුකරෝසන,
කෙළිඳසාල්,
කොත්තමල්ලි,
ගජතිප්පිලි,

ප්‍රයෝග :— තන්ද්‍රා, ප්‍රලාප, කසනා (කැස්ස) අරුචි, දහ, මොහ, ශ්වාස සහිත සන්නිපාත ජ්වර නසයි.

අනුපාන :— යෝග්‍ය අනුපානයක් යොදන්න.

111. යෝග නාමය :— **පුනර්නවාදිය.**

යෝගය :—
සාරණමුල්,
එරඬුමුල්,
ඉඟුරු,
සුදුළූනු,
කුඹුරුඇටමද,

ප්‍රයෝග :— අණ්ඩවෘධිය නසයි.

112. යෝග නාමය :— **පුනර්නවාදි මහා කෂාය.**

යෝගය :—
සාරණ මුල්,
දේවදර,
අරළු,
තිප්පිලිමුල්,
සිවියමුල්,
රත්නිටුල්,
තිප්පිලි,
ඉඟුරු,

දසමුල් ප්‍රත්‍යෙකව ගන්න. (මෙම කෂාය ගෝමූත්‍ර පත 2 ක් වතුර පත 14 ක්, දමා පත 2 ට සිඳුවාගෙන ද, දිය හැක. (අවස්ථානුකූලව යොදන්න.)

ප්‍රයෝග :— වාත, කඵප් ප්‍රබල සර්වාංග ශෝථ.

113. යෝග නාමය :— **කුණ්ඩිකා කර්ණිකා වල්ලි ආදි කෂාය.**

යෝගය :—
කොතල හිඹුටු (මුල්)
තිපල්,
සුදුහඳුන්,
අළුකෙසෙල් අල,
ගොකටු මුල්,
බැබිලමුල්,

ප්‍රයෝග :— සියළු ප්‍රමේහ නසයි. මධුමේහයෙහි විශෙෂ යි.

අනුපාන :— සුදුසු පරිදි අනුපානයක් යෙදිය යුතු ය.

114. යෝග නාමය :— **පුනර්නවාෂ්ටකය.**

යෝගය :—
සාරණමුල්,
කොහොඹපොතු,
පටෝල,
ඉඟුරු,
කටුකරෝසන,
රසකිඳ,
දරුහරිද්‍රා,
අරළු,

ප්‍රයෝග :— ශෝථ, සර්වාංග, ශෝථ, උදර, පාණ්ඩු, නසයි.

අනුපානය :— යෝග්‍ය අනුපානයකි.

115. යෝග නාමය :— **පෙරුම්කායම් ආදි කෂාය.**

යෝගය :—
පෙරුම්කායම්,
අසමෝද,
ඉඟුරු,
ගම්මිරිය,
කහ,
හරන්කහ,
කංසා,
කුඹුරුඇටමද,
දේදුරු,
මුරුංගාපොතු,
බුලත් මල්, (හෝ මුල්)

ප්‍රයෝග :— මක්කල්ල ශූලයට විශේෂ යි.

අනුපාන :— හෙණරාජ ගුලි සමඟ යෙදීම. (හෝ මාත්තුපහ)

116. යෝග නාමය :— **එලත්‍රිකාදිය.**

යෝගය :—
අරළු.
බුළු,
නෙල්ලි.
රසකිඳ
ආඩතෝඩාමුල්.
කටුකරෝසන.
ගිංයොහොඹ,
කොහොඹපොතු.

ප්‍රයෝග :— කුෂ්ඨ නසයි. කාමලාවෙහි විශේෂ ය.
ප්‍රක්ෂේපය :— මීපැණි යොදනු ලැබේ.

117. යෝග නාමය :— **එලත්‍රයාදි ක්වාථය.**

යෝගය :—
අරළු,
බුළු,
නෙල්ලි,
වෙනිවැල්ගැට,
ගොංකැකිරි අල,
කෝවක්කා අල, (වෘද්ධ වෛද්‍ය ව්‍යවාරයෙකි.)
කලාඳුරුඅල,
වියලිකහ,

අනුපාන :— මීපැණි සහිතව ය. යම්හර තැනෙක්හි වියලිකහ චූර්ණ කොට ප්‍රක්ෂේප විසින් ද යෙදේ.
ප්‍රයෝග :— ප්‍රමේහ, මධුමේහ, විෂමේහයන්හි උත්කෘෂ්ට ය.

118. යෝග නාමය :— **බටුදෙවගේ කෂාය.**

යෝගය :—
එරඬු මුල්,
එලබටුමූල්,
කටුවැල්බටු,
පුස්වැන්න,
හාතාවාරියඅල,
බැබිලමුල්,
අස්වැන්න,

ප්‍රයෝග :— ගර්භස්රාව, ප්‍රදර ආදි ගර්භාශය ගත ස්රාවයන් සඳහා යෙදේ.
අනුපාන :— කිරි කෂාය වශයෙන් වෙසෙසින් යෙදේ. සුදුසු අනුපානයක් යොදන්න.

119. යෝග නාමය :— **බලාකෝරණ්ඩාදි ක්වාථය.**

යෝගය:—
බැබිල්මුල්,
කටුකරඬු මුල්,
ඉඟුරු,

ප්‍රයෝග :— වාතරෝග නසයි. කෝෂ්ඨගත වායු, විටභෙද, ගුල්ම, ශූල, යකෘත්-ප්ලීහ රෝග නසයි.
අනුපාන :— තලතෙල්.

120. යෝග නාමය :— **බලාබිල්ව කෂාය.**

යෝගය :—
බැවිලමුල්,
බෙලිමුල්,
තිකමුල්,
පුස්වැන්න.
පංචකෝල,
වේලාමුල්,
එරඬුමුල්,

ප්‍රයෝග :— වාත රෝග, වාතාධික වාතරක්ත රෝග සඳහා ශ්‍රෙෂ්ඨ වේ.
ප්‍රක්ෂේපය :— එරඬුතෙල්,

121. යෝග නාමය :— **බලාමෘතාදි කෂාය.**

යෝගය :—
බැවිලමුල්.
රසකිඳ,
දේවදර,
ඉඟුරු,
බෙලිමුල්,
නෙරෙංචි,
එරඬුමුල්,
හාතාවාරිය අල

ප්‍රයෝග :— වාතරක්තයෙහි විශෙෂ යි.
ප්‍රක්ෂේපය :— සුසු පරිදි අනුපානයක් යෙදිය යුතු ය.

122. යෝග නාමය :— **බලාමුස්තාදිය.**

යෝගය :—
බැබිලමුල්,
එළබටුමූල්,
නෙල්ලි,
මාදංපොතු,
කටුකරඬු මුල්,
අටවික්කා ගෙඩි, (හෝ පොතු)
කලාඳුරුඅල,
කටුවැල්බටු,
කුරුඳුපොතු,
නෙරෙංචි,
දේවදර,
ඉඟුරු,
පොල්මල්.

ප්‍රයෝගය :— රක්තප්‍රදර නසයි.

ප්‍රක්ෂේපය :— ගිතෙල් සමඟ වේ.

123. **යෝග නාමය :—** **විරබිල්වාදි කෂාය.**

යෝගය :—

බෙලිමුල්,
කරඳමුල්,
තිප්පිලි,
තිප්පිලිමුල්,
වියලිඉඟුරු,
සුදුලූනු.

ප්‍රයෝගය :— වාත ශූලයට ශ්‍රේෂ්ඨ යි. ප්ලීහ, තුනී, අෂ්ඨිලිකා, ආම ශූලයනට ද මනා ය.

ප්‍රක්ෂේපය :— යවක්ෂාර, හිංගු, ලවණ සහිතව ය.

124. **යෝග නාමය :—** **බිල්වාදි කෂාය.**

යෝගය :—

බෙලිගැටම්ද,
ධාතකී,
ගජතිප්පිලි,
කලාඳුරු,
ලොධ්‍රපොතු,

ප්‍රයෝග :— ලදරු අතිසාරයට අතිශය යෝග්‍ය වේ.

අනුපාන :— මීපැණි,

125. **යෝග නාමය :—** **බිල්වාමෘතාදි ක්වාථය.**

යෝගය :—

බෙලිමුල්,
රසකිඳ,
ඉඟුරු,
පැපිලිය,
කලාඳුරුඅල,
දේවදර,
කහඹිලියා, (දුඃස්පර්ශ)
බිංකොහොඹ, (කිරාත)
එලබටුමුල්,
සැවැන්දරා, (ලාමජ්ජා)
ඉරිවේරිය, (හ්‍රීවේර)
බැබිල,
දුම්මැල්ල,
කොත්තමල්ලි,
දියමිත්ත,
තිප්පිලිමුල්,

ප්‍රයෝග :— අග්නිමාන්ද්‍ය, කාස සහිත තරුණ ජ්වර හා සන්නිපාතයට විශේෂයෙන් යෙදේ.

අනුපාන :— යෝග්‍ය පරිදි සුදුසු අනුපානයක් යෙදිය යුතු යි.

126. **යෝග නාමය :—** **බිල්වෝරාස්නාදි ක්වාථය.**

යෝගය :—

බෙලිමුල්,
බැවිලමුල් කලං 2 බැගිනි.
කලාඳුරුඅල,
බිංකොහොඹ, කලං 1 බැගිනි.
අරත්තඅල,
දේවදර,
පත්පාඩගම්,
වැල්කහඹිලියා, (ධන්වයාශ ප්‍රතිනිධි).

ප්‍රයෝග:— සර්වාංග වේදනා සහිත තරුණජ්වරය, වාතශ්ලේෂ්මජ උණ, සන්නිපාත ජ්වර යන් රෝගයන්හි යෙදේ. ආමවාත (සන්ධික) ජ්වරයෙහි විශේෂ යි.

127. **යෝග නාමය:—** **බෙලිමුල් බර (පථ්‍යාදි) ක්වාථය.**

යෝගය:—

අරළු,
එන්සාල්,
පත්පාඩගම්,
සුදුහඳුන්,
ඉඟිනි ඇට,
සැවැන්දරාමුල්,
වියලිඉඟුරු
කරාබු,
වැල්මී,
කළුදුරු,
සුදුදුරු,
තිප්පිලි,

සංස්කරණය:— බෙලිමුල් සියල්ල බරට ගත යුතු ය. තැඹිලි වතුර යොද 1/8 ට සිඳවා ගන්නේ ය.

ප්‍රයෝග:— රත්පිත්, හස්තපාද දහ, තමකය, මද, උග්‍ර වූ ශීර්ෂ ශූල නසයි. අක්ෂිරෝගයන්හි ප්‍රත්‍යක්ෂ යි. උන්මාදයෙහි විශේෂ යි.

128. **යෝග නාමය:—** **භාර්ග්‍යාදි (තිස් දෙවගේ) කෂාය**

යෝගය:—

භාර්ගී (සිරි තේක්කු),
කටුකරෝසන,
තිප්පිලි,
ඉරමුසුමුල්,
වියලිකහ,
වෙනිවැල් (දරුහරිද්‍රා),
සුවඳකොට්ටං,
කෙළිඳහාල්,
බිංකොහොඹ,
වදකහ,
ආඩතෝඩා,
පටෝල,
පළොල්මුල්,
රසකිඳ,
ත්‍රායමාණ,
අරළු,
කොහොඹපොතු,
ඉඟුරු,
ගොංකැකිරි අල,
දේවදර,
තොටිලමුල්,
තිරස්සවාලු,
කටුවැල්බටු,
බුළු,
කලාඳුරුඅල,
ගම්මිරිස්,
හිංඅරත්ත අල,
බ්‍රාහ්මී,
අතිවිඩයම,
එලබටුමුල්,
නෙල්ලි,
ශටී,

ප්‍රයෝග:— ත්‍රයෝදශ සන්නිපාතයෙහි ප්‍රයෝජ්‍ය ය. ශූල, කාස, ශ්වාස, හික්කා සහ දරුණු ආධ්මාන, ඌරුස්තම්භ, අන්ත්‍රවෘද්ධි, ගලරෝග, සන්ධිග්‍රහ, ආදියෙහි යෙදේ.

129. යෝගමනාය:— **මංජිෂ්ඨාදි ක්වාථය** (ගුඩූච්‍යාදිය නමින් ද දැක්වේ)

යෝගය:—
වැල්මදට,
රසකිඳ,
කොහොඹමුල්,
ආඩතෝඩා,
වැල්මී,
සැවැන්දරා,
බාකුචි
අරළු,
හාතාවාරිය,
රත්හඳුන්,
ඇත්තෝර,
වියලිකහ,
බැවිල,
ඉකිරිය,
කොහොඹපොතු,
තෙල්ලි,
නාගබලා,
පටෝල,

ප්‍රයෝග:— කුෂ්ඨ, කණ්ඩු, මණ්ඩලකුෂ්ඨ, වාතරක්ත, ශ්විත්‍ර ආදියෙහි ශ්‍රෙෂ්ඨ යි.

130. යෝග නාමය:— **මකරන්දං කෂාය**

යෝගය:—
නෙළුම්රේණු,
වැල්මී,
හාතාවාරිය අල,
සුදුහඳුන්,
රසකිඳ,
රසාඤ්ජන (ප්‍රතිනිධි වෙනිවැල්),
කුරතම්පලා,
උක්හකුරු,

ප්‍රයෝග:— රක්ත ප්‍රදරයෙහි වෙසෙසින් යෙදේ.

ප්‍රක්ෂේපය:— මීපැණි සමඟ ය.

131. යෝග නාමය:— **මධුකාදි ක්වාථය.**

යෝගය:—
වැල්මී,
මහඉරමුසු,
හීංඉරමුසු,
මුද්දරප්පලම,
මීමල් (මීපුප්),
නෙළුම්අල,
සුදුහඳුන්,
මානෙල්අල,
ඇද්දෙමටගෙඩි,
පද්මකාෂ්ඨ,
ලෝධ්‍ර,
අරළු,
බුළු,
තෙල්ලි,
නෙළුම්රේණු,
පරූෂක, (ප්‍රතිනිධි, උගුරැස්ස)

සංස්කරණය:— සහල් දෙවුන් දියෙහි රැයක් තබා හිම කෂාය හෝ අෂ්ටාවශෙෂිත කෂාය යොදන්නේ ය.

ප්‍රයෝග:— වාත පිත්ත ජ්වර, දහ, තෘෂ්ණා, මූර්ච්ඡා, වමන, භ්‍රම, රක්ත පිත්ත යන රෝග නසයි.

විශේෂතා:— විෂ, උන්මාදයන්හි ද, රක්තාර්ශස්, ඌර්ධ්වගත, අධොගත, රක්ත පිත්ත යනාදි රෝගවලට ප්‍රත්‍යක්ෂ යි. විෂ කැවුනු අයට ද ගර්භිණී වමනයට ද යෝග්‍ය වේ.

132. යෝග නාමය:— **මල්කෂාය.**

යෝගය:—
ඔලිඳ,
හාතාවාරිය,
පෙනෙල,
වැටහිර,
දෙමට,
රසකිඳ,
කරල්හැබ,
බෙලි,
වැල්මී,
ඉඟිනිඇට,
තිපල්,
නාමල්,
කලාඳුරු,
නාමල්රේණු,
රණවරා,
සපු,
නෙළුම,
පුහුල්,
එලබටු,
නික,
රත්හඳුන්,
වැටකේ,
(මෙයින් ලදහැකි හැම මල් වර්ගයක් ම ගත යුතු ය.)

ප්‍රයෝග:— සන්නිපාතජ්වරයේ තුන්වන සතියට ඉතා හොඳ ය.

අනුපාන:— සීනි, මීපැණි, ගුලි සමඟ.

133. යෝග නාමය:— **මහරත්හඳුන් කෂාය.**

යෝගය:—
රත්හඳුන් පල 1යි (ග්‍රෑම 60යි)
දෙදුරු,
සුදුහඳුන්
තිබ්බටුමුල්,
වැල්තිබ්බටු,
සැවැන්න මුල්
දේවදර,
එන්සහල්,
කුරමුල්,
ඉරිවේරිය,
මාසක්කා,
අක්‍රපට්ටා,
කරල්හැබ,
කලං 1 බැගින් (ග්‍රෑම 5 බැගින්)

සංස්කරණය:— නැඹිලි වතුර පත 16–2 ට සිඳුවා ගත යුතු ය.

ප්‍රයෝග:— උග්‍ර වාතරක්ත සර්වවිධ කුෂ්ඨ මේහ ආදියට විශේෂ යි.

අනුපාන:— මීපැණි.

134. යෝග නාමය:— **මහාමංජිෂ්ඨාදිය.**

යෝගය:—
වැල්මදට,
කොට්ටං,
වදකහ,
අරළු
රත්නිටුල්,
කෙළිඳහාල්,
දියමිත්ත,
ලුණුවරණ පොතු,
ගැටනෙටුල්පොතු,
පත්පාඩගම්,
කලාඳුරුඅල,
ඉඟුරු,
කොහොඹපොතු,
බුළු,
මුරුවා (මූර්වා)
හාතාවාරියඅල,
ආඩාතෝඩාමුල්,
රත්කිහිරිය,
බිංකොහොඹ,
ලුණුමිදෙල්ලපොතු,
ගොන්කැකිරිඅල,
ඉරිවේරිය (ප්‍රතිනිධි)
කෙළිඳපොතු,
භාර්ගි,
වියලිකහ,
තෙල්ලි,
වළහසාල්,
ත්‍රායමාණ,
කිකිරිඳිය,
රත්හඳුන්,
කරොල්අරිඹ,
කරඳමුල්,
ඉරමුසු,
රසකිඳ
කටුවැල්බටු,
වෙනිවැල්ගැට,
පටෝල,
ගම්මාලුඅරටු (හෝ පොතු)
තිප්පිලි,
දේවදර,
තිරස්සවාලුමුල්,
ඇසළකරල්පැණි,
අතිවිඩයම්,
මහඉරමුසුමුල්.

ප්‍රයෝග:— අෂ්ටාදශ කුෂ්ඨ, වාත රක්ත, උපදංශ, ශ්ලීපද, සුප්තිවාත-හිරිය, ශ්විත්‍ර ආදියෙහි ශ්‍රෙෂ්ඨ ය.

අනුපාන:— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

135. යෝග නාමය— **මාෂබලාදි ක්වාථය.**

යෝගය:—

උඳු,
බැබිලමුල්,
වදුරුමැඇට,
බෙත්එඬරුමුල්,
පැගිරිමාන්,
අරත්තඅල,
අමුක්කරා,

ප්‍රයෝග:— පක්ෂවාත, මන්‍යාස්තම්භ, කර්ණනාද, රුජා, අර්දිත වාත සඳහා යෙදේ. (මේ කෂාය මද උණුසුම් සහිතව නාසයෙන් බීමට නියමිත ය.)

අනුපාන:— පෙරුම්කායම්, සහිඳලුණු,

136. යෝග නාමය:— **මුකුණුවැන්න තුන්බර** (මහා ත්‍රිඵලාදි ක්වාථය)

යෝගය:—

වැල්මී,
මුංපියලි,
වළහසාල්,
ගම්මිරිස්,
කෙළිඳහාල්,
දේවදර,
සැවැන්දරාමුල්,
හාතාවාරියඅල,
නෙල්ලි,
කටුකරෝසන,
බැවිලමුල්,
සුදුහඳුං,
ඉරමුසුමුල්,
රසකිඳ,
තිප්පිලි,
මොණරකුඩුම්බිය,
මුද්දරප්පලම්,
අරළු,
ඉරිවේරිය,
කොට්ටං,
කුරතම්පලාමුල්,
එන්සාල්,
අසමෝදගම්.
ඉඟුරු,
බෙලිගැටමද,
පත්පාඩගම්,
ලුණුවරණපොතු,
බුළු,
දියමිත්ත,
ශටී, (හිඟුරුපියලි)
කොත්තමල්ලි,

සංස්කරණය:— මේ සියල්ල බරට මුකුණුවැන්න මුල් භාග 3 යි. තැඹිලි වතුර පත 16/2 ට සිඳුවා ගත යුතු ය.

ප්‍රයෝග:— නයනරෝග, වාතරක්ත, දහයන්හි අති ශ්‍රේෂ්ඨයි. වාතරක්තජ උන්මාදයට ද යෝග්‍ය වේ.

අනුපාන:— ගිතෙල්, මීපැණි සහ සීනි.

137. යෝග නාමය:— **මුද්ගාදි ක්වාථය:—**

යෝගය:—

මුංපියලි,
උක්පුරුක්,
ඉරිවේරිය (ප්‍රතිනිධි)
සුදුහඳුන්,
ඉරමුසු,
සැවැන්දරා,

ප්‍රයෝග:— පිත්ත ජ්වර හා රක්ත පිත්ත නසයි.

අනුපාන:— සුදුසු අනුපානයක් යොදන්නේ ය.

138. යෝග නාමය:— **මුද්ගාදි පේයාව.**

යෝගය:—

මුංඇට පියලි,
ඉඟුරු,
කොත්තමල්ලි.

ප්‍රයෝග:— පිපාසා, දහ සහිත උණ රක්ත පිත්තජ්වරය නසයි.

139. යෝග නාමය:— **මුස්තාකරංජාදි කෂාය.**

යෝගය:—

කලාඳුරුඅල,
ශුද්ධරත්නිවුල්,
තිප්පිලිමුල්,
කරඳමුලේ පොතු,
බෙලිගැටමද,
කෙළිඳහාල්,
අතිවඩයම්,
ඉඟුරු,

ප්‍රයෝග:— ශුල, ආම සහිත බලවත් අතීසාරය නසයි.

අනුපාන:— යෝග්‍ය අනුපානයෙනි.

140. යෝග නාමය:— **මුස්තාබුකර්ණාදි ක්වාථය.**

යෝගය:—

කලාඳුරුඅල,
මීකන්පලා,
යාදික්කා,
මුරුංගාමුල්,
දේවදර,

ප්‍රයෝග:— ක්‍රිමිරෝග නසයි.

අනුපාන:— ක්‍රිමිශත්‍රු, තිප්පිලි සුණු,

141. යෝග නාමය:— **මුස්තාදි ක්වාථය.**

යෝගය:—

කලාඳුරු,
පත්පාඩගම්,
ඉඟුරු,
බිංකොහොඹ.
කහඹිලියමුල්, (ධන්වයාස)

ප්‍රයෝග: – සියළුම උණ පැසවීමට යෙදේ. පිත්තජ්වර නසයි.

142. යෝග නාමය:— **මුස්තාදි කෂාය.**

යෝගය:—
කලාඳුරුඅල,
කෙළිඳහාල්,
සාරණමුල්,
දේවදර,
දුඃස්පර්ශ (වැල්කහඹිලියා),
ඉඟුරු,

ප්‍රයෝග:— ඉදිමීම සහිත ජ්වරාතිසාරයෙහි යෝග්‍ය වේ.

143. යෝග නාමය:— **මුස්තාශුණ්ඨි ආදිය** (මුරුවදහය) **ක්වාථය.**

යෝගය:—
කලාඳුරුඅල,
රසකිඳ,
බෙලිමුල්,
කටුකරෝසන,
ඉඟුරු,
එලබටුමුල්,
ඉරිවෙරිය (බාලක)
කොත්තමල්ලි,
දුම්මැල්ල,
මූර්වා,

ප්‍රයෝග:— ආම හා මලබද්ධ සහිත තරුණජ්වරයෙහි යෙදේ. විරේචක ය.
ප්‍රක්ෂේපය— තිප්පිලි කුඩු සහිත වය.

144. යෝග නාමය:— **මෘද්විකාදිය.**

යෝගය:—
මුද්දරප්පළම,
නාමල්රේණු,
වැල්මී,
ඉරමුසු,
මානෙල්අල.

ප්‍රයෝග:— අර්ශස්, රත්පිත්, රක්තජ කාශ, පොදු කාස, ආදියට ගුණ යි.
අනුපාන:— සීනි, මීපැණි සමඟ වේ.

145. යෝග නාමය:— **යක්ෂාක්ෂ්‍යාදි කෂාය.**

යෝගය:—
කුඹුරුඇටමද,
සුදුලූනු
අරළු
වළඟසාල්,
එළබටුමුල්,
කටුවැල්බටු,
කොහොඹනැටි,
කළුදුරු,

ප්‍රයෝග:— සියලු ක්‍රිමි රෝග සුව කරයි.

146. යෝග නාමය:— **යෂ්ටිමධු ආදිය.**

යෝගය:—
වැල්මී,
මීමල්,
වියලි මිදි,
ඉරමුසු,

ප්‍රයෝග:— පිත්ත ජ්වර, රක්ත පිත්ත නසයි.

147. යෝග නාමය:— **රතුලූනු අක්‍රපට්ට ආදිය.**

යෝගය:—
රතුලූනු,
අක්‍රපට්ටා,
ඉඟිනිඇට,
කටුකරෝසන,
මාසක්කා,
වැල්මී,

සංස්කරණය:— සමභාගව ගෙන අඹරා කෂාය සිඳිනු ලබන භාජනයට බහා, ජලය පත 4 ක් දමා, පත 1 ට සිඳුවා ගත යුතු ය.
ප්‍රයෝග:— සියලු කෝල, හතිකැක්කුම, උණ ගිනියම, කට තොල් වියලුම, දිය පිපාසය නසයි.
අනුපාන:— යෂ්ටි කල්කය, තලතෙල්, සීනි, ගිතෙල්, සමඟ ය.

148. යෝග නාමය:— **රාස්නාවිශ්වාදිය** (රාස්නා දශමූල).

යෝගය:—
අරත්ත,
ඉඟුරු,
වළඟසාල්,
එරඬුමුල්,
ශ්‍යාමා (කළු ඉරමුසුමුල්),
අරළු,
බුළු,
තෙල්ලි,
දශමූල්,

ප්‍රයෝග:— ආමවාත, වාතරක්ත, අර්ධාවභේද, අර්දිත ආදියෙහි ශ්‍රේෂ්ඨ ය.
අනුපාන:— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

149. යෝග නාමය:— **රාස්නා සප්තකය.**

යෝගය:—
අරත්ත,
රසකිඳ,
ඇහැළ,
සාරණමුල්,
ගොකටු,
එරඬු,
දේවදර,

ප්‍රයෝග:— ආමවාත ජනිත සියලු වේදනා නසයි.
අනුපාන:— ඉඟුරු චූර්ණය.

150. යෝග නමය:— **රාස්නාශිග්රුක්වාථය.**

යෝගය:—

අරත්තඅල,
මුරුංගමුල්,
සාරණමුල්,
අගිල්,
හිඟුරුපියලි,
නිකමුල්,
පිවියමුල්,
බැබිලමුල්,
එරඬුමුල්,
සිරිතේක්කු (භාර්ගි)
සුදුළූනු,
සුවඳකොට්ටන්
වියලිකහ,
කටුකරඬුමුල්,
ඉඟුරු
රත්නිටුල්
දසමුල,
දේවදර,

ප්‍රයෝග:— සියලු වාතරෝග නසයි. පක්ෂඝාත, අපතානක, හනුස්තම්භ, අර්දිත, ආමවාත ආදි වූ වාත රෝගයන්ට විශෙෂ යි.

අනුපාන:— සුදුසු අනුපානයක් යෝග්‍ය පරිදි යොදනු.

151. යෝග නාමය **ලාජා පේයාව.**

යෝගය :—

විපොරි	කලං 12	යි.	(ග්‍රෑම 60 යි.)
කොත්තමල්ලි	කලං 1 1/2	යි.	(ග්‍රෑම 7.5 යි.)
වියලිඉඟුරු	කලං 3	යි.	(ග්‍රෑම 15 යි.)
සහිඳලුණු	කලං 1 යි.	යි.	(ග්‍රෑම 5 යි.)

ප්‍රයෝග :— ආම, නිරාම, ජ්වරයෙහි යෝග්‍ය වේ.

152. යෝග නාමය :— **ලූණුඉඟුරු කෂාය.**

යෝගය :—

සුදුළූනු,
වියලිඉඟුරු,
කොල්ලු,
තිප්පිලිමුල්
තිප්පිලි,
කලාඳුරු,
සුවසලුණු.
බැවිල,
බෙලිමුල්,
මිදිමුල්,
එරඬුමුල්,
වදකහ,

ප්‍රයෝගය :— දරුණු වාත රෝග අවස්ථාවන්හි දී මනා ය.
අනුපාන :— ගිතෙල්, තලතෙල් සමඟ දිය යුතු වේ.

153. යෝග නාමය :— **වම්මුතු ආදිය.**

යෝගය :—

කලාඳුරු,
වැල්තිබ්බටුමුල්,
ආඩාතෝඩා පංචාංගය.
කොත්තමල්ලි,
වැල්මී,

ප්‍රයෝග :— ළදරුවන්ගේ සෙම් කෝප සහිත උණට යෝග්‍ය ය.
අනුපාන :— ජීවක කල්කය. මී පැණි

154. යෝග නාමය :— **වම්මුතු ආදි කෂාය.**

යෝගය :—

වංමුතු,
ඉරිවේරිය,
දියමිත්ත,
බිංකොහොඹ,
කටුකරෝසන,
රසකිඳ

ප්‍රයෝග :— වා, පිත් උණට යෝග්‍ය ය.
අනුපාන :— සුදුසු අනුපානයක් සහ සීතාරාමය ගුලි සමඟ යෙදිය යුතු ය.

155. යෝග නාමය :— **වචාදි ගණ ක්වාථය :—**

යෝගය :—

වදකහ,
කලාඳුරුඅල,
දේවදර,
ඉඟුරු,
අතිවිඩයම,
අරළු,

ප්‍රයෝග :— විශෙෂයෙන් බාලයන්ගේ ආමාතිසාර නස යි. මලබද්ධ සහිත ශොථාතිසාරයට විශිෂ්ට යි. ස්තන්‍ය ශෝධනය ද කරයි.

156. යෝග නාමය :— **වත්සකාදි (40) වගය) ක්වාථය.**

යෝගය :—

කෙළිඳහාල්,
කටුකරෝසන
පටෝල,
වැල්මී,
සුවඳකොට්ට
ඇහැළපොතු,
දේවදර,
ධන්වයාස,
හ්රීවෙර (ඉරිවේරිය),
කොහොඹපොතු,
දියමිත්ත,
වියලිකහ,
පත්පාඩගම,
බැවිලමුල්,
රත්හඳුන්,
වදකහ,
වෙනිවැල්,
සැවැන්දරාමුල්,
රසකිඳ,
ඉඟුරු,

ගම්මිරිස්, තිප්පිලි, අරළු, බුළු,
නෙල්ලි, සහදේවි, මුරුවා, බෙලිගැටමද,
(මොණරකුඩුම්බිය),
තිප්පිලිමුල්, කලාදුරුඅල, ආඩාතෝඩාමුල්, නෙළුම්රේණු,
රටඉඳි, මීමුජ්, මුද්දිරප්පලම්, මානෙල්අල,
කොට්ටං අතිවිඩයම් ඉරමුසුමුල් භාතාවාරිය අල

ප්‍රයෝග :— ජීර්ණජ්වරයෙහි ශ්‍රේෂ්ඨ යි. විෂමජ්වර, සන්නිපාත ජ්වර, ශීතජ්වරයන්හි යෙදේ. වාතරක්තයට ද මැනවි.

ප්‍රක්ෂේපය :— මීපැණි බොහෝ කොට යෙදිය යුතු යි.

157. යෝග නාමය :— **වදසිවි ආදිය.**

යෝගය :—
වදකහ, දේවදුරු, මුරුවා, කහඹිලියාමුල්,
සිවිය, කොත්තමල්ලි, අරළු, එරඬු,
සාරණ, යහවපු (ශතපුෂ්ප), වම්මුතු, නෙරෙංචි,
වගපුල්, රසකිඳ, අස්ගොඳු, ඇහැළ,
දෙබටු, භාතාවාරිය, ඉවද, කටුකරඬුමුල්,

ප්‍රයෝග :— සූතිකා සන්නි, අන්තරායාම, බහිරායාම, සූතිකා විකාර, හනුපූට්ටු ආදියට ගුණ ය.

අනුපාන :— වියලි ඉඟුරු, පෙරුංකායම්, අසමෝදගම්, තිප්පිලි, බැද සුණු කොට යොදන්නේ යි.

158. යෝග නාමය :— **වරාලාදි (පේයා) ක්වාථය.**

යෝගය :—
කරාබු, තිප්පිලි,
අසමෝදගම, ඉඟුරු,
විලඳ,

ප්‍රයෝග :— අජීර්ණ, විසූචිකා, (වමන අතීසාර) ආදියෙහි යොදනු ලැබේ.

අනුපාන :— යෝග්‍ය අනුපානයකින් යෙදිය යුතු ය.

159. **වාජිගන්ධාදි කෂාය :**

අමුක්කරා අල, බැවිල මුල්, සිරිවැඩිබැවිල මුල්, බෙත් අනෝද මුල්, දසමුල (ප්‍රත්‍යෙකව) ඉඟුරු, කළු වෙල්ලන්ගිරිය මුල්, සුදු වෙල්ලන්ගිරිය මුල්, (අභාවයෙහි මසන් මුල් සහ මහ එරමිණියා මුල්) අරත්ත අල සියල්ල කලං 24 පත 16/2 ට සිඳුවා අවස්ථානුසාරයෙන් ප්‍රක්ෂේපය සහිතව හතරවරකට.

ප්‍රයෝග :— ස්නායුව්‍යූහගත බලවත් වාතරෝගයන්හි ද මස්තිෂ්ක ගත වාතයන්හි ද යෙදේ.

160. යෝග නාමය :— **වාතශ්ලේෂ්මහර අෂ්ටාදශාංග ක්වාථය.**

යෝගය :—
දශමුල, කහඹිලියමුල්,
හිඟුරුපියලි, සිරිතේක්කු, (භාර්ගී)
කර්කටකශෘංගි, කෙළිඳසාල්,
සුවඳකොට්ටම්, දුම්මැල්ල,
කටුකරෝසන,

ප්‍රයෝග :— කාස, හෘද්ග්‍රහ, පාර්ශ්වාර්ති, ශ්වාස, හික්කා, වමන සහිත වාතකඵෝල්වණ සන්නිපාතජ්වරයෙහි යෙදේ. ආන්ත්‍රිකජ්වරයෙහි උපද්‍රවයක් වශයෙන් එන ශ්වසනකජ්වරයට විශෙෂයෙන් ගුණ ය.

අනුපාන :— යෝග්‍ය අනුපානයක් යොදනු.

161. යෝග නාමය :— **වාලු කෂාය (I).**

යෝගය :—
සුදුලූනු, අරළු,
අසමෝදගම, රසකිඳ,
තිප්පිලි, ඉරමුසුමුල්,
ඉඟුරු, ගම්මිරිස්,
කළුදුරු, සුදුදුරු,
භාතාවාරිය අල, සස්සඳමුල්,

සංස්කරණය :— ද්‍රව්‍ය කලඳ බැගින් හොඳට කොටා, ලිහිල් පොට්ටනියක් බැඳ වතුර පත 8 ක් ලා, එහි බහා ඔයකින් හෝ ගඟකින් ගත් පිරිසිදු වැලි (දෝරවැලි) වියලා, ගිනියන් වන තුරු බැද කෂාය භාජනය හිල් පොල් කටුවෙන් වසා, එම සිදුරෙන් වැලි දමන්නේ ය. ඉන්පසු කෂාය පත 2 ට සිඳුවා පෙරා, එම කෂාය උදය තුනක් බොන්නේ ය.

ප්‍රයෝග :— වැදූගෙයි උන්මාදයට විශෙෂ යි. සූතිකා රෝග, සූතිකා උන්මාද, හිස දහ-රුද, උණ, වෙව්ලුම, අත්-පා-කලවා හිරිවැටීම සහ හිරි වාතයට හිත යි.

162. යෝග නාමය :— **වාලු කෂාය (II).**

යෝගය :—
කළුදුරු,
සුදුදුරු,
කලාදුරු,
අසමෝදගම්,
සුදුහඳුන්,
රත්හඳුන්,
ඉරිවෙරිය,
පැපිලිය,
කිරිඅඟුණමුල්,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
සුදුළූණු,
කොහොඹපොතු,
යස්සඳමුල්,
වළගසාල්,
උණකුඩු (කුරුටු),
ඉරමුසු,
හාතාවාරිය,

සංස්කරණය :— මේවා සමව ගෙන හොඳට කොටා, ලිහිල් සේ පොට්ටනියක් බැඳ වතුර පත 8 ක් ලා කෂාය භාජනය හිල් පොල්කට්ටෙන් වසා, පිරිසිදු දෝරවැලි ගිනියම් වෙන තුරු බැඳ මිටක් පමණ ගෙන හිල් පොල්කටුවෙන් කෂායට බහා පත 2 ට සිඳුවා ගන්න. ද්‍රව්‍ය මංචාඩි 15 බැගින් ගන්නේ ය.

ප්‍රයෝග :— වැදුගෙයි උන්මාදයට විශේෂ යි. සූතිකා රෝග, සූතිකා උන්මාද, හිස-දාහ-රුද, උණ, වෙව්ළුම්, අත්-පා කලවා හිරිවැටීම සහ හිරි වාතයට හිත යි.

163. යෝග නාමය :— **වාසා ද්‍රාක්ෂාදි ක්වාථය.**

යෝගය :—
ආඩතෝඩමුල්,
මුද්දිරප්පලම්,
අරළු,

ප්‍රයෝග :— අර්ශස් හා රත්පිතෙහි මෘදු විරේචක ය. රත්තකාස ආදියෙහි ද යෙදේ.

අනුපාන :— මීපැණි, සීනි,

164. යෝග නාමය :— **වාසා මුස්තකාදි ක්වාථය.** (I)

යෝගය :—
ආඩාතෝඩා මුල්,
බැවිල,
කත්තිරික්කා බටු,
බෙලිමුල්,
කිරිඅඟුණ,
කලාදුරුඅල,
දුම්මැල්ල,
වැල්තිබ්බටු,
රසකිඳ,
ඉරිවේරිය,
තිපල්,
කසඹිලියා,
ඉරමුසු,
යස්සඳ,
කොහොඹ,
දෙදුරු,
අසමෝද,
වැල්මී,
තිප්පිලි,

ප්‍රයෝග :— ජ්වරාතීසාර, සන්නිපාත, ශ්වාස, උපද්‍රවයන්ට ඉතා යෝග්‍ය යි.

අනුපාන :— සීනි, මීපැණි, සමඟ.

165. යෝග නාමය :— **වාසා මුස්තකාදිය (II)**

යෝගය :—
ආඩතෝඩාමුල්,
කලාදුරු,
කොහොඹපොතු,
සුදුහඳුන්,
මීපුප්,
සැවැන්දරා,
වැල්මී,
මානෙල් අල,
ලුණුවිල,
මදයන්ති (ඉද්දමුල්),
කෙළිඳසාල්,
නෙළුම්මල්,
ඉරමුසු,
රුක්මල්,
ඉරිවේරිය,

ප්‍රයෝග :— රත්පිතට විශේෂයෙන් යෙදේ.

අනුපාන :— මීපැණි සමග යොදන්නේ යි.

166. යෝග නාමය :— **වැල්පෙනෙල කෂාය.**

යෝගය :—
වැල්පෙනෙල සහමුල,
සුදුළූණු.
පෙරුම්කායම්,
කුඹුරුඇට මද,

ප්‍රයෝග :— අණ්ඩ වෘද්ධි නසයි.
විරේචනය සඳහා එරඬුතෙල් යෙදිය යුතු ය.

167. යෝග නාමය :— **විශ්වාමෘතාදි (නවාංග) ක්වාථය.**

යෝගය :—
ඉඟුරු,
රසකිඳ,
(ලඝු) පඤ්චමූල (සුළුපස්මුල)
කලාදුරුඅල,
බිංකොහොඹ,

ප්‍රයෝග :— වාත පිත්තජ්වර හර ය. මීට සුළු පස්මුල හැර වෘහත් පඤ්චමූලය යෙදීමෙන් වාත කඵජ්වර හර වේ.

168. යෝග නාමය :— **වෘහත් පංචමූල්‍යාදි කෂාය.**

යෝගය :—
බෙලිමුල්,
මිදිමුල්,
තොටිලමුල්,
පලොල්මුල්,
ඇද්දෙමට මුල්,
ඉඟුරු,
කටුපෙදකොල (ශෘංගාට),
කඤ්වට, (පොල්පලා)
කලාඳුරුඅල,
මාදංදළු,
දෙළුංදළු,
බැවිලමුල්,
බාලක (සැවැන්දරා),
රසකිඳ,
දියමිත්ත,
බෙලිගැටමද,
හින්නිදිකුම්බ,
කෙළිඳපොතු,
කෙළිඳහාල්,
කොත්තමල්ලි
මලිතමල්, (ධාතකී)

ප්‍රයෝග :— ලේ සහිත-ලේ රහිත-අතීසාර, ජ්වරාතිසාරයන්හි ද, අසාධ්‍ය අතීසාරයෙහි ද සුප්‍රසිද්ධ යි.

ප්‍රක්ෂෙපය :— සුදුදුරු සහ අතිවිඩයම් චූර්ණය මාෂ 2 (ග්‍රෑම් 2) බැගින් යොදනු.

සැ: යු: — ශෘංගාට :—

කටුපෙඳ, දියඉකිලි, විලකටු නමින් ප්‍රසිද්ධ ජලාශයන්හි විශෙෂයෙන් වැව්වල වැවෙන ජලජ පැලෑටියෙකි. ගෙඩියේ මදය රසවත් ආහාරයකි.

කඤ්වට :—

වියලි කලාපයේ විශෙෂයෙන් හලාවත ප්‍රදේශයේ තෙල්පලා නමින් හැඳින්වෙන දිය මතුපිට පැතිරී වැවෙන මල් සහිත ජලජ පැලෑටියෙකි. ප්‍රතිනිධිය වශයෙන් දියකොච්චි=වෙල්කිරිහැන්ද=වනලවංග යෙදිය හැකි ය.

169. යෝග නාමය :— **වෘහත්‍යාදිගණ ක්වාථය.**

යෝගය :—
දෙබටු,
සුවඳකොට්ටම්,
සිරිතේක්කු,, (භාර්ගී)
හිඟුරුපියලි,
කටුකරෝසන,
කර්කටකශෘංගී,
කහඹිලියාමුල්,
කෙළිඳසාල්,
දුම්මැල්ල,

ප්‍රයෝග :— කාස උපද්‍රව සහිත සන්නිපාත උණට යොදති.

අනුපාන :— යෝග්‍ය පරිදි,

170. යෝග නාමය :— **වෘහත් ශාලපර්ණ්‍යාදි (පෙයා) ක්වාථය.**

යෝගය :—
අස්වැන්න, (ශාලපර්ණී)
පොල්පලා, (පෘෂ්ණිපර්ණී)
එලබටුමුල්,
කටුවැල්බටු,
බැවිලමුල්,
ගොකටුමුල්,
බෙලිගැටමද,
දියමිත්තමුල්,
ඉඟුරු,
කොත්තමල්ලි,

ප්‍රයෝග :— ආම, පච්‍යමාන, පක්ව යන සියලු අතීසාර අවස්ථාවන්හි පේයාව හෝ ක්වාථය වශයෙන් යෙදිය හැක.

අනුපාන :— යෝග්‍ය පරිදි.

171. යෝග නාමය :— **ශඨීආදි (ශඨ්‍යා—ශඨාදි).**

යෝගය :—
ශඨී,
වදකහ,
රසකිඳ,
කර්කටකශෘංගී,
මුරුංගාමුල්,
දියමිත්ත,
ගොංකැකිරිඅල,
පටෝල,
ආඩතෝඩා,
කටුකරඬුමුල්,
හිංඅරත්තඅල,
දුරාලභා,
කෙළිඳපොතු,
කටුකරෝසන,
වියලිකහ,
බිංකොහොඹ,
භාර්ගී,
කෙළිඳහාල්,
කොත්තමල්ලි,
අරළු,
කොට්ටං,
වෙනිවැල්ගැට,
දශමූල,
භාතාවාරියඅල,
දේවදර,
වියලිඉඟුරු,
ත්‍රායන්ති,

ප්‍රයෝග :— ශ්වාස, කාස, ශූල සහිත ශ්ලේෂ්මවජ්වර, පෙනහළු ආක්‍රාන්ත, ශ්ලේෂ්මකජ්වර සන්නිපාත, වාතාධික සන්නිපාත, විරජ්වර, මලග්‍රහයන්හි විශිෂ්ට ය.

අනුපාන :— යෝග්‍ය අනුපානයක් සමඟ යොදන්නේ ය.

172. යෝග නාමය :— **ශ්‍රීපර්ණ්‍යාදි කෂාය.**

ඇද්දෙමට ගෙඩි,
භාතාවාරියඅල,
මුද්දිරප්පලම්,
චන්දන, (සුදුහඳුන්)
ඉරිවේරිය (ප්‍රතිනිධි)
කලාඳුරුඅල,
පත්පාඩගම්,
වැල්මී — සමභාගව ය.

ප්‍රයෝග :— පිත් උණ, භ්‍රම, දහ, චර්ම රෝග නස යි.

අනුපාන :— සීනි. මී පැණි ය.

173. යෝග නාමය :— **ශඨ්‍යාදි ක්වාථය.**

යෝගය :—
හිඟුරුපියලි.
සුවඳකොට්ටම්,
කටුවැල්බටු,
කර්කටකශාංගි,
කහඹිලියමුල්,
රසකිඳ,
ඉඟුරු,
දියටින්නමුල්,
බිම්කොහොඹ,
කටුකරෝසන,

ප්‍රයෝග :— කාස, හෘද්ග්‍රහ, පාර්ශ්වාර්ති, ශ්වාස, තන්ද්‍රා, (සහිත වූ) සන්නිපාතජ්වරයෙහි යෙදේ.

අනුපාන :— යෝග්‍ය අනුපානයකි.

174. යෝග නාමය :— **ශතාවාරි ආදි ක්වාථය.**

යෝගය :—
හාතාවාරිය, අල
ඉරමුසුමුල්,
සුදුහඳුන්,
සැවැන්දරාමුල්,
ඉරිවේරිය,
සුළුකුර මුල්.
මුද්දිරප්පලම්.
වැල්මදට,
මානෙල්අල,
වැල්මී,

ප්‍රයෝග :— ඌර්ද්ධවගත රක්ත පිත්ත, අධෝගත රක්ත පිත්ත, ප්‍රදර, උන්මාද, දහ, පිත්තජ්වර යන අවස්ථාවනට යෝග්‍ය ය.

අනුපාන :— සීනි මීපැණි.

175. යෝග නාමය :— **ශතාවර්‍යාදිය.**

යෝගය :—
හාතාවාරිය අල,
කාශ (ප්‍රතිනිධි, ඉළුක්),
කුශතෘණ, (ප්‍රතිනිධි, සැවැන්දරා),
ඉඟුරු,
ඉරිවේරිය (ප්‍රතිනිධි),
නෙල්ලි,
කොත්තමල්ලි,
පත්පාඩගම්,

ප්‍රයෝග :— අශ්මරි, මුත්‍රකෘච්ජ්‍ර, මුත්‍රාඝාතාදිය නස යි.

176. යෝග නාමය :— **ශර්කරාදි කෂාය.**

යෝගය :—
කටුවැල්බටු,
සුදුදුරු,
සිරිතේක්කු,
කළුදුරු,
කටුකරෝසන,

ප්‍රයෝග :— බාලයින්ගේ ශ්වාස, කාස, ප්‍රතිශ්‍යා ආදියට හිත යි.

අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

177. යෝග නාමය :— **ශාරිවාදි ක්වාථය (I)**

ඉරමුසු,
කලාඳුරුඅල,
හාතාවාරිය,
මිදි (මුද්දරප්පලම්),
වැල්මී,

ප්‍රයෝග :— ඌර්ධ්වගත රත්පිතට ගුණ යි.

අනුපාත:— සීනි මීපැණි සමග.

178. යෝග නාමය :— **ශාරිවාදි ක්වාථය (II).**

යෝගය :—
මහඉරමුසු,
තිරස්සවාලු,
මුද්දිරප්පලම්,
හිංඉරමුසු,
සෙනෙහෙකොළ,
කටුකරෝසන,
ආඩාතෝඩා,
අරළු,
කොහොඹපොතු,
වියලිකහ,
වෙනිවැල්,
නෙරෙංචි ඇට,

ප්‍රයෝග :— වාතරක්ත, කුෂ්ඨ, ප්‍රමේහ පිඩකා. විසර්ප ආදියට හිත යි. පුරාතන වෘක්කප්‍රදාහයට විශේෂ යි.

අනුපාන :— සුදුසු අනුපානයක් යෙදිය යුතු ය.

179. යෝග නාමය :— **ශුණ්ඨිදරු ක්වාථය.**

යෝගය :—
ඉඟුරු,
දේවදර,
ශඨි,
එලබටුමුල්,
කටුකරෝසන,
බිංකොහොඹ,
පර්පට,
ඉරමුසුමුල්,
ඉරිවේරිය.

ප්‍රයෝග :— සන්නිපාත ජ්වරයෙහි යෙදේ.

අනුපාන :— තිප්පිලිකුඩු, මීපැණි.

180. යෝග නාමය :— **ගුණ්ඩිබලාමෘත කෂාය.**

යෝගය :—
වියලිඉඟුරු,
බැවිලමුල්,
රසකිඳ,
දගමුල,
අරත්ත,
හාතාවාරිය,

ප්‍රයෝගය :— වාතාධික වාත රක්තයට ශ්‍රේෂ්ඨ යි.
අනුපාන :— එරඬුතෙල් සමඟ යි.

181. යෝග නාමය :— **සඳුන් ආදි කෂාය.**

යෝගය :—
සුහඳුන්,
සුවඳහොට,
නෙළුම්අල,
වැල්මී,
නෙළුම්රේණු,
බැබිල,
සිරිවැඩිබැබිල,
තිපල්,

ප්‍රයෝගය :— වමන නසයි.
අනුපාන :— මීපැණි, උක්සකුරු,

182. යෝග නාමය :— **සුලුපහ ආදි කෂාය.**

යෝගය :—
අස්වැන්න,
පොල්පලා,
බටුමූල්,
කටුවැල්බටු,
නෙරෙංචි,
බැබිල,
බෙලිමද, (වියලි)
රසකිඳ,
කලාඳුරු,
ඉඟුරු,
දියමිත්ත,
කොහොඹපොතු,
සුගන්ධබාලා (ඉරිවේරිය ප්‍රතිනිධි)
කෙළිඳපොතු,
කෙළිඳහාල්,

ප්‍රයෝග :— සියලු අතීසාර, ජ්වර, වමන ශූලෝපද්‍රව සහිත ශ්වාස, කාස නස යි.

183. යෝග නාමය :— **සුවඳ හොට ආදි ක්වාථය (I)**

යෝගය :—
සුවඳහොට,
මානෙල්අල,
ඉරිවේරිය,
විළඳ,
සුදුහඳුන්,

ප්‍රයෝග :— මද, තෘෂ්ණා, පිත් කෝප, දහ, රත්පිත් නසයි. උන්මාදයෙහි ප්‍රථම අවස්ථාවට මෙය විශෙෂයෙන් ගුණ ය.

184. යෝග නාමය :— **සුවඳහොට ආදිය. (II)**

යෝගය :—
සුවඳහොට,
සුවඳකොට්ට,
නෙළුම්අල,
සුදුහඳුන්,
හාතාවාරිය,
කෙළිඳඇට,
ආඩතෝඩා,
ඉරිවේරිය,

ප්‍රයෝග :— රක්තාර්ශස් නස යි.

185. යෝග නාමය :— **හරිතක්‍යාදිය.**

යෝගය :—
අරළු,
ඇහැළපොතු,
කපුඇටමද,
මාදම්පොතු,
ඉඟිනිඇට,
කහ,
වෙනිවැල්ගැට,
වැල්පෙනෙල,

ප්‍රයෝග :— ශුක්‍රාශ්මරි, මධුමෙහ, මෙහජසන්ධිවාත, රක්තජ සන්ධිවාත නස යි.

186. යෝග නාමය :— **හරිද්‍රාදි ගණ ක්වාථය.**

යෝගය :—
වියලිකහ,
වෙනිවැල්ගැට,
වැල්මී,
එලබටුමූල්,
කෙළිඳසාල්,

ප්‍රයෝග :— බාලයන්ගේ (විශෙෂයෙන්) ආමාතිසාර නසයි. ක්ෂිර ශෝධනයට විශිෂ්ට යි. උණ අතිසාර නස යි.

චූර්ණ ඛණ්ඩය

අතිශයින් වියලා ගත් ඖෂධ ද්‍රව්‍ය ඉතා සියුම් ලෙස සුණු කර රෙදි කඩින් පෙරා හලා ගන්නා ලද්දේ චූර්ණය යි. චූර්ණ, රජඃ, ක්ෂෝද යනු පර්යාය වේ. චූර්ණයෙහි ගුඩ, සිනි, මිශ්‍ර කළ යුතු අවස්ථාවන්හි එම මධුර පදර්ථ දෙගුණයක් ගත යුතු ය. චූර්ණයට පෙරුංකායම් ගත යුතු කල්හි ගිතෙලින් බැද ගන්නේ ය. එලහිතෙල්, මීපැණි, ආදිය සමග ගත යුතු කල්හි ඒවා දෙගුණයක් ද එළකිරි හෝ මුත්‍ර වැනි අත්‍යන්ත ද්‍රව පදර්ථ සමග නම් එම ද්‍රව චූර්ණය මෙන් සිව් ගුණයෙකි. (ශාර්ංගධර)

කරාබු, එන්සාල්, කුරුඳු පොතු වැනි වාෂ්පශීලි තෙල සහිත සුගන්ධ ද්‍රව්‍ය දැඩි හිරු රැසින් වේලීම නුසුදුසු ය. චූර්ණයක් අධික ප්‍රමාණයෙන් සෑදීමේ දී එක් එක් ද්‍රව්‍යය වෙන වෙනම චූර්ණකොට ඉක්බිති අනුපාතයට අනුව මිශ්‍ර කර ගන්නේ ය. අරිෂ්ට ආසව ප්‍රක්ෂේප සහ ඵාණ්ඨ සඳහා අංක 60 හෝ 40 පෙනේර දැලෙන් ද අති සූක්ෂ්ම චූර්ණ සඳහා අංක 80 න් ද, සූක්ෂ්මාති සූක්ෂ්ම චූර්ණ සඳහා හිසකේ තරම් සියුම් පෙනේරයෙන් (Fine - hair - seive) ද හලා ගත යුතු ය. (අංක ක්‍රමය හතරැස් අඟලක කම්බි සංඛ්‍යාව අනුව ය.)

චරක, කල්ප 10 අධ්‍යාය
13–14–15–16 පද්‍ය.

ආඝ්‍රාණ විරේචන යෝගය :

තිරස්සවාලු මුල්, ඇහැළ, දන්ත, ශංඛිනි, සප්තලා, යන මේ ද්‍රව්‍ය සමභාගව ගෙන සියුම් ලෙස චූර්ණකොට රාත්‍රි ගෝමූත්‍රයෙහි බහා තබා, පසුදින අව්වේ වියලා ගන්නේ ය. මෙසේ සත් දිනක් භාවනා දී ඉක්බිති සතියක් දළුක් කිරෙන් භාවනා දී වියලා සුණුකොට ගත යුතු ය. එම චූර්ණය සුවඳ මල්දමෙක්හි තවරා, සිරුර වස්ත්‍රයකින් වසා එම මල්දම ආඝ්‍රාණය කරවන්නේ ය. රජදරුවන් වැනි මෘදු කෝෂ්ඨ ඇති අයට සුව සේ විරේචනය සඳහා ය.

චරක, කල්ප, 3 අධ්‍යාය.
10 – පද්‍යය.

ආඝ්‍රාණ වමන යෝගය :

තුම්බි (තිත්තලබු) ගෙඩි කොටා මිරිකා ගත් යූෂයෙහි තුම්බි මල් බහා තබා වියලා සුණුකොට එම චූර්ණය මල්දමෙක්හි ගල්වා ආඝ්‍රාණය කරවන්නේ ය.

(පරිශිෂ්ටය බලන්න.)

1. යෝග නාමය :— * අජමෝදදි චූර්ණය

අසමෝදගම්,
වළහසාල්,
සහිඳලුණු,
දේවදර,
රත්නෙටුල්,
තිප්පිලිමුල්,
ශතපුෂ්ප,
තිප්පිලි,
ගම්මිරිස්,

ප්‍රත්‍යෙකව කර්ෂ 1 (ග්‍රෑම් 15) බැගින් ගත යුතු යි.

අරළු	කර්ෂ	5 යි.	(ග්‍රෑම් 75)
වෘද්ධදාරක	කර්ෂ	10 යි.	(ග්‍රෑම් 150)
ඉඟුරු	කර්ෂ	10 යි.	(ග්‍රෑම් 150)

ප්‍රයෝග :— ශෝථ නස යි. ආමවාතරුජා, සන්ධි පීඩා ,ගෘධ්‍රසී, කටිය-පෘෂ්ටය-ගුද යන ස්ථාන රුජා, ජංඝාරුජා, නසයි. තැනි, ප්‍රතැනි, විශ්වාචී, කඵ-වාත රෝග නසන්නේ ය. ගුඩ මිශ්‍රකර මෙය වටකයක් මෙන් ද, සාද ගත හැකි වේ.

අනුපාන :— උෂ්ණෝදකය වේ.
මාත්‍රාව :— කලං 1/2 – 1 දක්වා දීම මැනවි. (ග්‍රෑම් 2.5 – ග්‍රෑම් 5)

2. යෝග නාමය :— **අලබෙත් චූර්ණය.** (1)

යෝගය :—

චීන අල	පලං	1 යි.	(ග්‍රෑම් 60)
තිප්පිලි,			
කරාබු,			
වසාවාසි,			
	කලං	1 බැගින්	(ග්‍රෑම් 5)
සාදික්කා	කලං	2 යි.	(ග්‍රෑම් 10)
ගම්මිරිස්	කලං	2 යි.	(ග්‍රෑම් 10)

ප්‍රයෝග :— දූෂිත පීනස, ළය පීනස ආදි රෝගාවස්ථාවනට මනා ය.

---

*චූර්ණ සංස්කරණයේ දී ද්‍රව්‍ය සමභාගව හෝ විෂමභාගව කිරා චූර්ණ කරණුවට වඩා එක් එක් ද්‍රව්‍යයන්ගේ චූර්ණ, කිරා මිශ්‍ර කිරීම සුදුසු ක්‍රමය බව සැලකිය යුතු ය.

අලම්බුෂාදි චූර්ණය. (ආයුර්වේද සංග්‍රහය)

මුඩ මහණ සහමුලින්, හිංනෙරෙංචි, රසකිඳ, වෘද්ධදරක (ප්‍රති: ගිරිතිල්ල) තිප්පිලි, තිරස්සවාලු, කලාඳුරු අල, ලුණුවරණ මුල්, සාරණ මුල්, අරළු, බුළු, නෙල්ලි, ඉඟුරු, සමභාග සියුම් චූර්ණය.

ගුණ :— ආමවාත, සන්ධිවාතජ ශෝථ, සන්ධි මජ්ජාගත වාත ආදියෙහි යෙදේ.

මාත්‍රාව :— කලං 1 1/2 – 3 දක්වා, අනුපාන මෝරු, කාංජික, ආදි අවස්ථානුකූල කෂාය ඵාණ්ට ආදිය වේ.

. 3. යෝග නාමය :— **අලබෙත් චූර්ණය.** (2)

යෝගය :—

වීන අල	පලං 1 යි. (ග්‍රෑම 60)
තිප්පිලි,	පෙරුංකායම්,
කරාබු,	සුදුදුරු,
වසාවාසි,	සුදුලූනු,
	කලං 1 බැගින් (ග්‍රෑම 5)
සාදික්කා	කලං 2 යි. (ග්‍රෑම 10)
ගම්මිරිස්,	කලං 2 යි (ග්‍රෑම 10)
කොරාසානි,	කලං 1/2 යි. (ග්‍රෑම 2.5)
කළුදුරු	කලං 1 1/2 යි (ග්‍රෑම 7.5)
අරළු	කලං 2 යි. (ග්‍රෑම 10)
අබ	,
ඉඟුරු,	
	කලං 1 බැගින්. (ග්‍රෑම 5)
උළුහාල්	කලං 2 යි. (ග්‍රෑම 10)
ශෝධිත අබිං	මංචාඩි 5 යි. (ග්‍රෑම 1,250)
ශෝධිත සාදිලිංගං	කලං 1/2 යි. (ග්‍රෑම 2,500)

සංස්කරණය :— අව්වෙන් වේලා චූර්ණකර රෙදි කඩින් හලා ගත යුතු වේ.

ප්‍රයෝග :— අරමණ වණ, පරංගි, සූලකට්ටු, කොරවාදන්, උපදංශ, කුෂ්ඨ, උදර වණ, පීනස යන රෝග සුව කරයි·

අපථ්‍ය :— ලුණු හා ඇඹුල් ය. දවසක් ඇර දවසක් නාන්න. දින 16 ක් වළඳන්නේ ය.

අනුපාන :— මීපැණි ය.

මාත්‍රාව :— වරකට මංචාඩි 5 බැගින්. (ග්‍රෑම 1.25)

4. යෝග නාමය :— **අෂ්ටාංග ලවණය.** (චූර්ණය)

යෝගය :—

සිනි,	
සුවසලුණු,	
කළුදුරු,	
සියඹලා,	
ගොරක,	භාග 1 බැගින් ගත යුතු වේ.
කුරුඳුපොතු,	
එන්සාල්,	
ගම්මිරිස්,	භාග 1/2 ය බැගින් ගත යුතු යි.

ප්‍රයෝග :— සෙම බහුලව ඇති මදාත්‍යයෙහි මෙම ලවණය යෙදීමෙන් ස්රෝතස් සියල්ල ශුද්ධ වන අතර කුසගින්න දළු වේ.

මාත්‍රාව :— කලං 1/2 – 1 දක්වා වේ. (ග්‍රෑම 2.5 – ග්‍රෑම 5).

. 5. යෝග නාමය :— **අවිපත්තිකර චූර්ණය.**

යෝගය :—

තිකුළු, මිලිතව	භාග	03	වළහසාල්	භාග	01
තිපල්, මිලිතව	භාග	03	හීන්එන්සාල්	භාග	01
කලාඳුරුඅල,	භාග	01	තේජපත්‍ර (කුරුඳුකොළ)	භාග	01

සමභාගව සියල්ලෙන්ම කලං 10 යි. (ග්‍රෑම 50 යි.)

කරාබු,	කලං	10 යි.	(ග්‍රෑම 50)
තිරස්සවාලු	කලං	40 යි.	(ග්‍රෑම 200)
ශර්කරා	කලං	60 යි.	(ග්‍රෑම 300)

සංස්කරණය :— ශර්කරා හැර යෝගයෙහි සඳහන් සියල්ල වියලා චූර්ණකොට නැවත ශර්කරා චූර්ණය සමඟ මිශ්‍ර කොට පිළියෙල කරන්නේ ය.

ප්‍රයෝග :— මෙය ආහාරයට පෙර හා පසුව ප්‍රයෝග කට හැකි ය. අම්ලපිත්ත, ශූල, මලමූත්‍ර රෝධ, අග්නිමාන්ද්‍ය ජනිත රෝග සමූහ, ප්‍රමේහ, අශ්මරී සන්සිඳුවයි.

අනුපාන :— ගිතෙල්, මී, තැඹිලිවතුර, ශීතල ජලය වේ.

මාත්‍රාව :— කලං 1/2 සිට 1 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය. (ග්‍රෑම 2.5 – ග්‍රෑම 5)

සැ: යු :— කරාබු වැනි සුගන්ධ ද්‍රව්‍ය තද අව්වෙන් වේලීම නො මැනවි.

6. යෝග නාමය :— **අශ්වගන්ධාදි චූර්ණය.**

යෝගය :—

අමුක්කරා	පලම්	10 යි.	(ග්‍රෑම් 600))
වියලි ඉඟුරු,	පලම්	5 යි.	(,, 300)
තිප්පිලි	පලම්	2 1/2 යි.	(,, 150)
ගම්මිරිස්	පලම්	1 1/4 යි.	(,, 75)
චතුර්ජාත	කලං	3 යි.	(,, 15)
කරාබු	කලං	3 යි.	(,, 15)
(භාර්ගී) සිරිතේක්කු	කලං	3 යි.	(,, 15)
තාලීසපත්‍ර	කලං	3 යි.	(,, 15)
හිඟුරු පියලි	කලං	3 යි.	(,, 15)
සුදුදුරු	කලං	3 යි.	(,, 15)
කරපිංචාකොළ	කලං	3 යි.	(,, 15)
ජටාමාංස	කලං	3 යි.	(,, 15)
කපුකිනිස්ස ඇට	කලං	3 යි.	(,, 15)
කලාදුරු අල	කලං	3 යි.	(,, 15)
අරත්තඅල	කලං	3 යි.	(,, 15)
කටුකරෝසන	කලං	3 යි.	(,, 15)
ජීවන්ති	කලං	3 යි.	(,, 15)
කොත්තම	කලං	3 යි.	(,, 15)

ද්‍රව්‍ය බරට බරක් සීනි ගත යුතු යි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය පිරිසිදුව කිරාගෙන වියලා ඉතා සිනිඳුව චූර්ණකර ගත යුතු ය. පසුව සීනි මිශ්‍රකර ගන්නේ යි.

ප්‍රයෝග :— ක්ෂතක්ෂීණයෙහි විශේෂ බල වර්ධක වේ. මේදස් නස යි. මන්දග්නි, කුක්ෂි ශූල, උදර නස යි.

අනුපාන :— උණුසුම් ජලය භාවිත කළ යුතු ය. (පොදු අනුපාන ය). වාතක්ෂයෙහි ද පිත්ත ශෝෂයෙහි ද, එළගිතෙල් ද, ශ්ලේෂ්මක්ෂයෙහි මීපැණි ද, ප්‍රමේහයෙහි නවනීත ද, ශිරෝභ්‍රම, පිත්ත රෝගවලදී එළකිරි ද සමඟ ගත යුතු ය.

මාත්‍රාව :— කලං 1/2 – 1 දක්වා වේ. (ග්‍රෑම් 2.5 – ග්‍රෑම් 5).

7. යෝග නාමය :— **ආමලක්‍යාදී චූර්ණය.**

යෝගය :—
වියලි නෙල්ලි,
රත්නෙටුල්,
අරළු,
තිප්පිලි,
සවිඳලුණු,

ප්‍රයෝග :— සියලු ජ්වර නස යි. භේදන යි; රුචිකරයි. ශ්ලේෂ්මහර ය; දීපන පාචන වේ.

මාත්‍රාව :— කලං 1/2 – 1 දක්වා යෙදේ. (ග්‍රෑම් 2.5 – ග්‍රෑම් 5)

8. යෝග නාමය :— **ඒලාදි චූර්ණය (1)**

යෝගය :—
එන්සාල්,
තේජපත්‍ර,
නාමල්රේණු,
කරාබු,

භාග 1 බැගින් ගත යුතු යි.

රටඉඳි භාග 2 යි.
මුද්දිරප්පලම්,
වැල්මී,
සීනි,
තිප්පිලි,

භාග 4 බැගින් ගත යුතු යි.

ප්‍රයෝග :— රාජයක්ෂ්මාවට විශෙෂයෙන් ගුණ ය. කාසයට හිත ය.

අනුපාන :— මී පැණි ය.

මාත්‍රාව :— කලං 1 යි. (ග්‍රෑම් 5 යි).

9. යෝග නාමය :— **ඒලාදි චූර්ණය (2)**

යෝගය :—

හීන්එන්සාල්	භාග	1 යි.
කුරුඳුපොතු	,,	2 යි.
නාමල්රේණු	,,	3 යි.
ගම්මිරිස්	,,	4 යි.
සුවඳකොට්ටන්	,,	5 යි.
තිප්පිලි	,,	6 යි.
සීනි	,,	21 යි.

ප්‍රයෝග :— ග්‍රහණී, අර්ශස්, යක්ෂ්ම, රක්ත පිත්ත, කළු, කණ්ඨ රෝග. අරුචි, කාස, ප්ලීහ, රෝග සුව කෙරේ.
අනුපාන :— මී පැණි ය.
මාත්‍රාව :— කලං 1 යි. (ග්‍රෑම් 5 යි.)

10. යෝග නාමය :— **ඒලාදි චූර්ණය (3)**

යෝගය :—
එන්සාල්,
ප්‍රියංගු,
කලාඳුරුඅල,
බදර (මසන් ඇට)
තිප්පිලි,
සූහඳුන්,
විලඳ,
කරාබු,
නාමල් රේණු,

ප්‍රයෝග :— වාත, පිත්ත, කඵෝද්භූත ,ඡර්දි නසයි.
අනුපාන :— සීනි, මීපැණි, සහිතව ලේහ කරන්නේ ය.
මාත්‍රාව :— කලං 1/2 – 1 දක්වා වේ. (ග්‍රෑම් 2.5 – ග්‍රෑම් 5)

11. යෝග නාමය :— **ඒලාදි චූර්ණය (4)**

යෝගය :—
එන්සාල්,
අශ්මභේද — පොල්පලා, (ප්‍රතිනිධි)
ශිලාජතු,
පිප්පලි,
සමභාගව ගත යුතු වේ.

ප්‍රයෝග :— ප්‍රමේහ, අශ්මරී, නාශක යි. මූත්‍ර අඩස්සියට ද යෝග්‍ය වේ.
අනුපාන :— හාල්පානු ජලය වේ.
මාත්‍රාව :— කලං 1 යි. (ග්‍රෑම්ස් 5)

12. යෝග නාමය :— **කකුභාදි චූර්ණය.**

යෝගය :—
කුඹුක්පොතු,
වදකහ,
අරත්ත
බැවිල,
නාගබලා, (සිරිවැඩිබැවිල)
අරළු,
ශඨී,
පුෂ්කර මූල (සුවඳකොට්ටං)
තිප්පිලි,
වියලි ඉඟුරු,
සමභාගව ගත යුතු ය.

ප්‍රයෝග :— හෘදය රෝග නසයි.
අනුපාන :— ගිතෙල් වේ.
මාත්‍රාව :— ශාණ 1 කි. (ග්‍රෑම් 4 යි).

13. යෝග නාමය :— **කට්ඵලාදි චූර්ණය.** (වෘහත්)

යෝගය :—
කට්ඵල,
සුවඳකොට්ටං,
කකුළුසුඟු,
කලාඳුරුඇල,
ත්‍රිකටු,
ශඨී,

ප්‍රයෝග :— කළු නසයි. ශූල වාත, අරුචි, වමන, කාස, ශ්වාස, ක්ෂය නසයි.
අනුපාන :— අමුඉඟුරු යූෂ, මී පැණි, සමඟ ලේහ කළ යුතු ය.
මාත්‍රාව :— කලං 1/2 – 1දක්වා වේ. (ග්‍රෑම් 2.5 – ග්‍රෑම් 5)

•14. යෝග නාමය :— **කපිත්ථාෂ්ටක චූර්ණය.**

යෝගය :—
අසමෝදගම්,
තිප්පිලිමුල්,
චතුර්ජාත,
වියලිඉඟුරු,
ගම්මිරිස්,
චිත්‍රක,
ජල (සැවැන්දරා, ප්‍රතිනිධි)
කළුදුරු,
කොත්තමල්ලි,
සෞවර්චල — සුවස ලුණු,
භාග 1 බැගිනි.
අම්ලවේතස, (ගොරක)
ධාතකී,
තිප්පිලි,
බෙලිගැටමද,
දෙළුම්ගැට,
ශුද්ධවිෂතින්දුක, (ගොඩකදුරුඇට),
භාග 3 බැගිනි.
සිනි භාග 6 යි.
වියලි දිවුල් මද භාග 8 යි.

ප්‍රයෝග :— අතිසාර, ග්‍රහණී, ගුල්ම, ගල රෝග, කාස, ශ්වාස, අරුචි, හික්කා නසයි.
අනුපාන :— මීපැණි ය.
මාත්‍රාව :— කලං 1/2 – 1 (ග්‍රෑ: 2.5 – ග්‍රෑම් 5) දක්වා වේ. යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය.

•15. යෝග නාමය :— **කර්පූරාදි චූර්ණය (I)**

කපුරු,
තිප්පිලි,
රාස්නා,
අරළු,
යවක්ෂාර,
ඉඟුරු,
ගම්මිරිස්,
පංචලවණ,
සුවර්ජිකාක්ෂාර
නස්නාරංමුල්,
මෙම ද්‍රව්‍ය සමභාගව ගන්නේ ය.

සංස්කරණය :— චූර්ණ පරිභාෂාවෙනි.
ප්‍රයෝග :— වාසෙම්ජනිත ග්‍රහණී රෝග, ග්‍රහණී ජනිත අන්ත්‍ර ශූල අන්ත්‍ර වාතයන්හි යෙදේ.
මාත්‍රාව :— කලං 1 බැගින් උණු දියෙන් වළඳන්නේ ය. (ග්‍රෑම් 5)

යෝග නාමය :— **කර්පූරාදි චූර්ණය (II)**

කපුරු
එන්සාල්
නාමල්රේණු,
සැවැන්දරාමුල්
කළුදුරු,
කරාබු
කුරුඳුපොතු
සාදික්කා
ඉඟුරු
කළුඅගිල්

උණකපුරු
නිල්මානෙල් අල
සුදුහඳුන්
බාලක
ජටාමාංස
තිප්පිලි
තුවරලා
කක්කෝල
මෙම ද්‍රව්‍ය සමභාගව ගන්නේ ය. අර්ධයක් සිනි ගත යුතු ය.

සංස්කරණය :— චූර්ණ පරිභාෂාවෙනි.
ප්‍රයෝග :— වාතාර්ශසෙහි ශ්‍රේෂ්ඨ ය. හෘද්‍රෝග, ක්ෂය, අතිසාර, ග්‍රහණි, ගුල්ම රෝගයන්හි යෙදේ. බලකාරක වෘෂ්‍ය හා තෘප්තිජනක ය.
මාත්‍රාව :— වරකට කලං 1 (ග්‍රෑම් 5) බැගින් උණු දියෙන් දිනකට තුන්වරකි.

16. යෝග නාමය :— **කොත්තමල්ලි චූර්ණය** (ශර්කරාදිය).

යෝගය :— කොත්තමල්ලි සෝද ගරා වේලා පත 1 යි.
කළුදුරු,
සුදුදුරු,
වැල්මී,
කලං 5 බැගිනි. (ග්‍රෑම් 25)
කරාබු,
වසාවාසි,
සාදික්කා,
කුරුඳුපොතු,
අසමෝදගම්,
කලං 3 බැගිනි. (ග්‍රෑම් 15)
චීනා අල පලං 3 බැගිනි. (ග්‍රෑම් 180)
සංස්කරණය :— මේ සියල්ල දිනක් (පැය 24 ක්) පොල් විනාකිරේ තබා ඊට පසු වේලා සිනිඳුව චූර්ණකර රෙදි කඩින් හලා ඊට සිනි එලං 5 ක් මිශ්‍රකර විදුරු බරණියක සුරැකිව තබා ගන්නේ ය.
ප්‍රයෝග :— ද්‍රය පිනස, කුවාල සහිත පිනස්, පැරණි වූ ඇදුමට විශිෂ්ට ගුණදයි වේ.

17. යෝග නාමය — **චන්දනාදි චූර්ණය.**

යෝගය :—
රත්හඳුන්,
ජටාමාංස
ලෝධ්‍ර,
සැවැන්දරා,
නෙළුම්රේණු,
නාමල්රේණු,
බෙලිගැටමද,
කලාදුරුඅල,
සිනි,
සැවැන්දරා,
දියමිත්ත,
කෙළිඳහාල්,
කුටජපොතු,
වියලිඉඟුරු,
අතිවිඩයම්,
ධාතකී,
රසාංජන (දරුහරිද්‍රා කෘත),
අඹඇටමද,
මාදන්ඇට,
ඉඹුල්මැලියම්,
නිල්මානෙල්අල,
හින්නිදිකුම්බා,
හින්එන්සාල්,
දෙළුම්ලෙලි,
සමභාගව ගත යුතු වේ.
ප්‍රයෝග :— ප්‍රදර, රක්තාතිසාර, රක්තාර්ශස්, රත්පිත් රෝග නසයි.
අනුපාන :— තණ්ඩුලෝදක හෝ මීපැණි යෙදිය හැකි ය.
මාත්‍රාව :— මාෂක 4 යි. (ග්‍රෑම් 4 යි).

18. යෝග නාමය :— **වෝපචිනි චූර්ණය.** (චීන අල)

යෝගය :—

වෝපචිනි (චීන අල),	කුඩව	1 යි.	(ග්‍රෑම් 240 යි).
ශර්කරා	පල	1 යි.	(ග්‍රෑම් 60 යි.)

තිප්පිලි,
තිප්පිලිමුල්,
ගම්මිරිස්.
කරාබු,
අක්කරපට්ට,
කොරාසානි,

ඉඟුරු,
වළගසාල්,
කුරුඳුපොතු,
තෝලා 1 බැගිනි. (ග්‍රෑම් 8).
ඉතා සියුම් චූර්ණය (80 පෙනේරයෙන් හලා) වායු නිවාරක වීදුරු බඳුනෙක්හි සංරක්ෂණය කරන්නේ ය.

මාත්‍රාව :— ග්‍රෑම් 5 – 6 දක්වා – උදේ සවස මී පැණි එලගිතෙල් සමග.
ප්‍රයෝග :— පස්වැදැරුම් උපදංශ, කුෂ්ඨ, පුරාතන වරණ නසයි.
අනුපාන :— එළකිරි හෝ මද උණුසුම් ජලය

• 19. යෝග නාමය :— **ජාතිඵලාදි චූර්ණය.**

යෝගය :—
සාදික්කා
තලිස්
කළුදුරු
ගම්මිරිස්
තේජපත්‍ර
වළගසාල්
රත්හඳුන්
කපුරු
තිපල්
එන්සාල්
රත්නිටුල්
ඉඟුරු
අරළු
උණකපුරු
නාමල්රේණු
තුවරලා (අභාවයෙහි ජටාමාංස)
කරාබු
තෙල්ලි
කුරුඳුපොතු

මෙම ද්‍රව්‍ය කර්ෂය බැගින්, (ග්‍රෑම් 15).
කංසා කොළ පලං 7 යි. (ග්‍රෑම් 420 යි).
සියලු චූර්ණය බරට බරක් සීනි.

සංස්කරණය :— චූර්ණ පරිභාෂාවෙනි.
ප්‍රයෝග :— ග්‍රහණී, අතීසාර, අග්නිමාන්ද්‍ය, ප්‍රතිශ්‍යාය ආදියෙහි යෙදේ.
මාත්‍රාව :— මාෂක 2 යි. (ග්‍රෑම් 2 යි).

20. **තුලසි ඵාණ්ඨය.**

ආඩතෝඩාකොල,
මදුරුතලා කොල
කප්පරවල්ලිය කොල
කුප්පමේනිය කොල
නික කොල
කොත්තමල්ලි ඇට
වියලි ඉඟුරු
කළු දුරු
කටුවැල්බටු කෂාය හෝ ඵාණ්ඨය වශයෙන්.

21. **තුලසි ඵාණ්ට කෂාය.**

ආඩතෝඩා කොල
මදුරුතලා කොල
කුප්පමේනිය කොල
නික කොල
කොත්තමල්ලි ඇට
සම බරට ගෙන ද්‍රව්‍ය සියල්ල අවුන්ස 10 ට ගත හොත් එයට වියලිඉඟුරු හා කලුදුරු කලං 2 බැගින් ගෙන අමුවෙන් ම කබලෙ බැද කුඩු කර ගන්න.
කෂාය හෝ ඵාණ්ඨ වශයෙන් භාවිත කරන්න.

ගුණ :— ඇදුම, පීනස්, සුව කෙරේ.

• 22. යෝග නාමය :— **තාලීසාදි චූර්ණය.**

යෝගය :—

තාලීස පත්‍ර	කර්ෂ	1 යි.	(ග්‍රෑම්	15 යි.)
ගම්මිරිස්	කර්ෂ	2 යි.	(ග්‍රෑම්	30 යි.)
වියලිඉඟුරු	කර්ෂ	3 යි.	(ග්‍රෑම්	45 යි.)
තිප්පිලි	කර්ෂ	4 යි.	(,,	60 යි.)
උණකපුරු	කර්ෂ	5 යි.	(,,	75 යි.)
හීන්එන්සාල්	කර්ෂ	1/2 යි.	(,,	7.5 යි.)
කුරුඳුපොතු	කර්ෂ	1/2 යි.	(,,	7.5 යි.)
සූකිරි (ශර්කරා)	කර්ෂ	32 යි.	(,,	480 යි.)

සූකිරි පැණිකර චූර්ණය බහා ගුලි සාද ගැනීම ද ක්‍රමයකි.

මාත්‍රාව :— මංචාඩි 5 - 10 දක්වා. (ග්‍රෑම් 1.25 - ග්‍රෑම් 2.5 යි.)
ප්‍රයෝග :— රුචිකර යි. පාචක යි. කාස, ශ්වාස, ජ්වර, ඡර්දි, අතිසාර නාශක යි. ශෝෂ, ආධ්මාන, ප්ලීහ, ග්‍රහණි, පාණ්ඩු රෝග නසයි.
අනුපාන :— මී පැණි හෝ සුදුසු අනුපානයක් සමඟ දිය හැකි ය.

23. යෝග නාමය :— **ත්‍රිඵලාදි චූර්ණය.**

යෝගය :—

අරළු	භාග	1 යි.
බුළු	භාග	2 යි.
නෙල්ලි	භාග	4 යි.

ප්‍රයෝග :— කාස, ශ්වාස, ජ්වර නසයි. භේදනීය යි. අග්නි දීපනය කරයි.
අනුපාන :— මී පැණි.
මාත්‍රාව :— කලං 1/2 - 1 දක්වා. (ග්‍රෑම් 2.5 - 5)

24. යෝග නාමය :— **ත්‍රිවෘතාදි චූර්ණය.**

යෝගය :—
තිරස්සවාලු,
සව්දලුණු,
ඉඟුරු,
සමභාගව ගත යුතු යි.
ප්‍රයෝග :— විරේචන යි: ආම වාත නසයි.
අනුපාන :— කාඩි වතුර සමඟ යෙදේ.
මාත්‍රාව :— මාෂ 1–3 (ග්‍රෑම් 1–3) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

25. යෝග නාමය :— **දඩිමාෂ්ටක චූර්ණය.**

යෝගය :—

උණකපුරු	කර්ෂ	1 යි.	(ග්‍රෑම් 15 යි),
චතුර්ජාත (ප්‍රත්‍යෙකව)	කර්ෂ	2 බැගින්.	(ග්‍රෑම් 30).
අසමෝදගම්,			
කොත්තමල්ලි,			
කළුදුරු,			
තිප්පිලිමුල්,			
ත්‍රිකටුක (ප්‍රත්‍යෙකව)	පල	1 බැගින්,	(ග්‍රෑම් 60යි.).
වියළි දෙළුම් ගෙඩි	පල	8 යි.	(ග්‍රෑම් 480 යි).
සීනි	පල	8 යි.	(ග්‍රෑම් 480 යි).

සංස්කරණය:— චූර්ණ පරිභාෂා අනුව වේ.
ප්‍රයෝග:— කපිත්ථාෂ්ටක චූර්ණයේ ගුණවලට සම යි. අතිසාර, ග්‍රහණි, ක්ෂය, ගුල්ම, ගල රෝග නසයි.
අනුපාන:— තක්‍ර — මෝරු සමඟ ය.
මාත්‍රාව:— මාෂක 1–3 (ග්‍රෑම් 1–3) දක්වා වේ. බාලකයනට රක්තිකා 3–6 (ග්‍රෑම් 375–750) දක්වා වේ.

26. යෝග නාමය:— **දඩිම කුටජ චූර්ණය.**

යෝගය:— දෙළුම් ලෙලි ඝන කෂාය වියලා ගන්න.
කුටජපොතු ඝන කෂාය වියලා ගන්න.
සංස්කරණය:— වියලා ගත් දඩිම කුටජ ඝන කෂාය චූර්ණකොට ගත යුතු ය.
ප්‍රයෝග:— රක්තාතිසාරයට විශෙෂයෙන් යෙදේ.
අනුපාන:— මීපැණි හෝ සුදුසු අනුපානයකින් යොදන්නේය.
මාත්‍රාව:— මංචාඩි 10-20 දක්වා වේ. (ග්‍රෑම් 2.5–ග්‍රෑම් 5 යි.)

27. යෝගනාමය:— **ධාත්‍රී චූර්ණය.**

යෝගය:—
අරළු,
බුළු,
නෙල්ලි,
වැල්මී,
සමභාගව ගත යුතු යි.
සෙනෙහෙකොළ පළමු ද්‍රව්‍ය බරින් 1/2 යි.
සීනි සෙනෙහෙකොළ මෙන් 3 ගුණය යි.
ප්‍රයෝග:— මෘදු විරේචක යි; ලේ පිරිසිදු කරයි; ඵාණ්ට කෂාය වශයෙන් රාත්‍රී නින්දට පෙර ගත යුතු යි.
මාත්‍රාව:— කලං 1/2 සිට 2 දක්වා වේ. (ග්‍රෑම් 2.5–ග්‍රෑම් 10)

28. යෝග නාමය:— **නාරසිංහ චූර්ණය.**

යෝගය:—

හාතාවාරිය	ප්‍රස්ථ 1 යි,	(ග්‍රෑම 960 යි.)	ශුද්ධ කළ තල	ප්‍රස්ථ 1 යි.	(ග්‍රෑම 960 යි.)
ගොක්ෂුරබීජ	ප්‍රස්ථ 1 යි,	(ග්‍රෑම 960 .යි)	ත්‍රිකටු මිලිතව	පලම් 8 යි.	(ග්‍රෑම 480 යි.)
වාරාහීකන්ද-(ප්‍රතිනිධි)					
කිරිබදු	පලම් 20 යි,	(ග්‍රෑම 1200 යි.)	ශර්කරා	පලම් 70 යි.	(ග්‍රෑම 4200 යි.)
රයකිඳ	පලම් 20 යි,	(ග්‍රෑම 1200 යි.)	මීපැණි	පලම් 35 යි.	(ග්‍රෑම 2100 යි.)
ශුද්ධ හල්ලාතක	පලම් 32 යි,	(ග්‍රෑම 1920 යි.)	ගිතෙල්	පලම් 17 1/2යි	(ග්‍රෑම 1050 යි.)
රත්නෙටොල්	පලම් 10 යි,	(ග්‍රෑම 600 යි,)	කිරිබදු අල පිටි	ප්‍රස්ථ 1 යි.	(ග්‍රෑම 960 යි.)

සංස්කරණය:— සියල්ල චූර්ණකොට සීනි, මීපැණි, ගිතෙල් මිශ්‍රකොට අඹරා පිරිසිදු භාජනයක බහා තබන්නේ ය.

ප්‍රයෝග:— අෂ්ටාදශ කුෂ්ඨ, භගන්දර, මූත්‍රකෘච්ඡර, නානාවිධ රෝග සහ ජරා වනසයි; බලවීර්‍ය සහ ඉන්ද්‍රිය ශක්තිය වඩයි.

අනුපාන:— එළකිරි සමඟ ය.

මාත්‍රාව:— කර්ෂ 1 කි. (ග්‍රෑම 15 යි.)

29. යෝග නාමය:— **නාරායණ චූර්ණය.**

යෝගය:—

අසමෝදගම්,
හපුෂා, (ප්‍ර. නි. ගම්මිරස)
කොත්තමල්ලි,
ත්‍රිඵලා,
කළුදුරු,
හීන්දුරු,
කාරවි,
තිප්පිලිමුල්,
වල්අසමෝදගම්,
ශයී
වදකහ,
ශතපුෂ්ප
සුදුදුරු,
තිකුළු,
ස්වර්ණක්ෂීරි,
රත්නෙටුල්,
යවක්ෂාර,
ස්වර්ජික්ෂාර.
පුෂ්කරමූල (සුවඳකොට්ටම්),
කුෂ්ඨ (කොට්ටම්),
ලවණපංචකය, වළහසාල්, සමභාගව ගතයුතු යි.

දන්ත	භාග 3 යි.	විශාලා (ගොන්කැකිරි අල)	භාග 2 යි.
තිරස්සවාලු	භාග 2 යි.	ශාතලා	භාග 4 යි.

චූර්ණය සාද ගන්නේය.

ප්‍රයෝග:— උදර රෝගයට ශ්‍රේෂ්ඨ ය, ග්‍රහණී දෝෂ, කුෂ්ඨ, මන්දග්නි, ජ්වර සහ විෂ දෝෂ සුව කරයි.

අනුපාන:— උදර රෝගයට තක්‍ර සමඟ ද, ගුල්මයේ දී බදර කෂාය සමඟ ද, ආනාහයෙහි සුරා සමඟ ද, වාත රෝගයේ දී ප්‍රසන්නසුරා සමග ද, මලබද්ධයේ දී දධිමස්තු සමඟ ද, අර්ශස්වල දී දෙළුම් යූෂ සමග ද, පරිකර්තිකා රෝගයෙහි දී වෘක්ෂාම්ල සමඟ ද අජීර්ණවල දී උණුදියෙන් ද යොදන්නේ ය.

මාත්‍රාව:— මංචාඩි 10–30 (ග්‍රෑම 2.5-7.5) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

30. යෝග නාමය:— **නිම්බාදි චූර්ණය.**

යෝගය:—

කොහොඹපොතු,	අරළු
රසකිඳ	නෙල්ලි,
ප්‍රත්‍යෙකව පලම් 1 බැගිනි.	(ග්‍රෑම 60)
බාකුචි,	පලම් 1 යි, (ග්‍රෑම 60 යි.)
වියලිඉඟුරු,	ඛදිර (රත්කිහිරිය),
වළහසාල්,	සෛන්ධව ලවණ (සවිඳ ලුණු),
ඇත්තෝර ඇට,	යවක්ෂාර,
තිප්පිලි,	වියලිකහ,
අසමෝදගම්,	වෙනිවැල්ගැට, (දරුහරිද්‍රා)
වදකහ,	කළාදුරුඅල,
සුදුදුරු,	දේවදර,
ගම්මිරිස්,	කොට්ටම,
	කර්ෂ 1 බැගිනි. (ග්‍රෑම 15)

සංස්කරණය:— ද්‍රව්‍ය පිරිසිදුව වියලා ගෙන ඉතා සියුම්ව චූර්ණ කරන්න. ලවණ වර්ග වෙනම චූර්ණ කරන්න. පසුව චූර්ණ දෙවර්ගය මිශ්‍ර කරන්න.

ප්‍රයෝග:— උග්‍ර වාතරක්ත, ශ්වේතකුෂ්ඨ, උදුම්බරකුෂ්ඨ, කෝඨ, චර්මදල, සිධ්ම, පාමා, විප්ලුතා, කණ්ඩු, විචර්චිකා, විස්තෘත දද්‍රු, මණ්ඩල, කිටිභ, ආමවාත ජනිත ශෝථ, සියළු සන්නිපාත රෝග, උදර, ප්ලීහ, වෘද්ධි, ගුල්ම, පාණ්ඩු, කාමලා. නසයි.

අනුපාන:— රසකිඳ කෂාය.

මාත්‍රාව:— මාස 2-4 දක්වා. (ග්‍රෑම 2-4 යි.)

31. යෝග නාමය:— **පංච සම චූර්ණය**

යෝගය:—
ඉඟුරු
අරළු.
තිප්පිලි,
ත්‍රිවෘත්,
සුවසලුණු,
සියල්ල සමභාගව ගත යුතු යි.

ප්‍රයෝග:— ශූල නසන ගුණය ශ්‍රේෂ්ඨ යි. ආධ්මාන, ජ්වර, අර්ශස් රෝග, ආමවාත නසන්නේ ය.

මාත්‍රාව:— කලං 1/2–1 දක්වා යෝග්‍ය වේ. (ග්‍රෑම් 2.5–5 දක්වා.)

32. යෝගනාමය:— **පිප්ඵල්‍යාදි චූර්ණය (I)**

යෝගය:—
තිප්පිලි,
එන්සාල්,
වදකහ,
පෙරුංකායම්,
යවක්ෂාර,
සව්දලුණු,
සුවසලුණු,
වියළි ඉඟුරු,
වල්අසමෝදගම්,

සංස්කරණය:— ද්‍රව්‍ය සමභාගව ගෙන සාද ගත් චූර්ණය මාතුලුංග රසයෙන් භාවනා දී වියලා ගත යුතු යි.

ප්‍රයෝගය:— හෘද්රෝග නසයි. ශ්‍රේෂ්ඨ යි.

අනුපාන:— කාඩි, කුටජත්වක්වාථ, දධි, සුරා, ආසව, තලතෙල්, සමඟ අවස්ථානුකූලව යොදන්නේ යි.

මාත්‍රාව:— කලං 1 යි. (ග්‍රෑම් 5 යි.)

33. යෝග නාමය:— **පිප්පල්‍යාදි ගණ චූර්ණය. (II)**

යෝගය:—
තිප්පිලි,
තිප්පිලිමුල්,
සිවිය,
රත්නෙටුල්,
ඉඟුරු,
ගම්මිරිස්,
ගජතිප්පිලි,
කුළුරැණ,
වාල්මොලඟු,
එන්සාල්,
අසමෝදගම්,
කෙළිඳ,
දියමිත්ත,
සුදුදුරු,
අබ,
ලුනුමිදෙල්ල ගෙඩි,
පෙරුංකායම්,
සිරිතේක්කු, (භාර්ගී)
මූර්වා,
අතිවිඩයම්,
වදකහ,
වළඟසාල්,
සමභාගව ගත යුතු වේ.

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.

ප්‍රයෝග:— සෙම් පහ කෙරේ. ප්‍රතිශ්‍යාය, වායු, අරුචි, ගුල්ම, ශූල යන මේවා නසා ලයි. ආමය පැසවයි.

මාත්‍රාව:— මංචාඩි 10–20 (ග්‍රෑම් 2.5–5) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අනුපානයෙන් දිය යුතු ය. ඵාණ්ට කෂාය ලෙස ද යෙදිය හැකි ය.

34. යෝග නාමය:— **පූෂ්‍යානුග චූර්ණය:—**

යෝගය:—
දියමිත්ත මුල්,
මාදංඇට,
අඹඇටමද,
අශ්මභේද (පොල්පලා),
රසාඤ්ජන (දර්වීරසාඤ්ජන)
අම්බෂ්ඨා, (ප්‍ර. නි. දියමිත්ත)
එළඉඹුල් මැලියම්,
සමංගා-වැල්මදට,
පද්මකේශර (නෙළුම්රේණු)
කෙළිඳපොතු,
බාහ්ලික (කුංකුමප්පූ),
අතිවිඩයම්,
බෙලිගැටමද,
කලාඳුරුඅල,
සිවංගුරු,
ලොධ්‍ර,
කට්වංග (තොට්ලපොතු),
ගම්මිරිස්,
වියලිඉඟුරු,
මුද්දිරප්පලම්,
රත්හඳුන්,
කට්ඵල,
කෙළිඳසහල්,
අනන්තා (ඉරමුසු),
ධාතකී,
වැල්මී,
කුඹුක්පොතු,
පූෂ්‍ය නැකතින් ගත් ද්‍රව්‍ය සමභාගව ගන්නේ ය.

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.

ප්‍රයෝග:— අර්ශස්, අතීසාර ආදි ශරීරයෙන් රක්තය පිටවන රෝග, යෝනි දෝෂ, රජෝ දෝෂ නසයි; සුදු, නිල්, කහ සහ ශ්‍යාව වර්ණව ඇති වන ප්‍රදරයට විශේෂයෙන් ගුණ යි.

අනුපාන:— මීපැණි හා තණ්ඩුලෝදකය යි.

මාත්‍රාව:— මදට10-20 (ග්‍රෑම් 2.5-5 දක්වා)වේ.

35. යෝග නාමය:— **භාස්කර ලවණ චූර්ණය:—**

යෝගය:—
තිප්පිලි
තිප්පිලිමුල්,
කොත්තමල්ලි,
සාදුරු,
සව්දලුණු,
බලල්ලුණු,
තේජපත්‍ර,
තලිස්පතුරු,

නාමල්රේණු,	පලම් 2 බැගිනි.	(ග්‍රෑම් 120)
සුවසලුණු,	පලම් 5 යි.	(ග්‍රෑම් 300)
ගම්මිරිස්,		
අසමෝදගම්,		
වියලිඉඟුරු,	පලම් 1 බැගින්ය.	(ග්‍රෑම් 60)
කුරුඳුපොතු,	පලම් 1/2යි.	(ග්‍රෑම් 30)
ගින්එන්සාල්	පලම් 1/2 යි.	(ග්‍රෑම් 30)
මුහුදුලුණු	කුඩව 2 යි.	(ග්‍රෑම් 480)
දෙළුම්ලෙලි	කුඩව 1 යි.	(ග්‍රෑම් 240)
අම්ලවේතස (ගොරක)	පලම් 2 යි.	(ග්‍රෑම් 120)

සංස්කරණය:— ලුණු වර්ග වෙනම ඉතා සිනිඳුට චූර්ණකර ගන්නේ ය. ද්‍රව්‍ය වර්ග පිරිසිදුව ගෙන වියලා වෙනම සිනිඳුව චූර්ණකර ගෙන, චූර්ණ දෙවගය ම මිශ්‍රකර ගත යුතු ය.

ප්‍රයෝග:— වා සෙම් රෝග නසයි. වාත ගුල්ම, වාත ශූල, මන්දග්නි නසයි. අර්ශස්, ග්‍රහණි දෝෂ, කුෂ්ඨ, භගන්දර, හෘද්රෝග, ආමදෝෂ. විබන්ධ, උදර, ප්ලීහ, අශ්මරි, ශ්වාස, කාස, උදර ක්‍රිමි, පාණ්ඩු, හික්කා නසයි.

අනුපාන:— තක්‍ර, මස්තු, සුරා, සීධු, කාඩි, මාංසරය (ජාංගල) යන ද්‍රවයන් අවස්ථානුකූලව යෙදිය යුතු ය.

මාත්‍රාව:— මදටිය 5–10 දක්වා වේ. (ග්‍රෑම් 1.25-2.5)

36. යෝග නාමය:— **භුක්තපාක චූර්ණය.**

යෝගය:—
සෛන්ධව,
අරළු,
බුළු,
වියන්දුඹුළු.
තෙල්ලි,
අසමෝදගම්,
බෙලිගැටමද,

සමභාගව ගත යුතු යි.

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.

ප්‍රයෝග:— ආමය ඉක්මනින් පැසවීම සඳහා ද බඩ රුජා අඩු කිරිමට ද විශේෂයෙන් යොදනු ලැබේ.

අනුපාන:— උණු වතුරෙන් හෝ සුදුසු අනුපානයකින් යොදන්න.

මාත්‍රාව:— වරකට මාෂ 1 යි. (ග්‍රෑම් 1 යි.)

37. යෝග නාමය:— **භූනිම්බාදි චූර්ණය.**

යෝගය:—
බිංකොහොඹ,
කුළුරණ,
කලාදුරුඅල,
තිකුළු,
කෙළිඳඇට,

කර්ෂ 2 බැගින් ප්‍රත්‍යෙකව ගත යුතු ය. (ග්‍රෑම් 30)

කෙළිඳපොතු, කලං 16 යි. (ග්‍රෑම් 80)

ප්‍රයෝග:— ග්‍රහණි, ගුල්ම, කාමලා, ජ්වර, පාණ්ඩු, ප්‍රමේහ, අරුචි, අතිසාර නසයි.

අනුපාන:— උණුදිය වේ.

මාත්‍රාව:— කලං 1/2–1 දක්වා වේ. (ග්‍රෑම් 2.5–ග්‍රෑම් 5)

38. යෝග නාමය:— **මහානිම්බ චූර්ණය.**

යෝගය:—
අතිවිඩයම්,
ඉඟුරු,
වසාවාසි,
තිප්පිලි,
එන්සාල්,
සාදික්කා,
ගම්මිරිස්,
කොරාසානි.

කුරුඳුපොතු,	කලං 1 බැගිනි.	(ග්‍රෑම් 5)
අසමෝදගම්	කලං 2 යි.	(ග්‍රෑම් 10)
ගංසූරිය පොතු	පලං 1 යි.	(,, 60)
ඇත්තෝරඇට	පලං 1 යි	(,, 60)
කොහොඹපොතු	පලං 1 යි.	(,, 60)
බිංකොහොඹ	පලං 3 යි.	(,, 180)
වීතඅල	පලං 3 යි.	(,, 180)

ප්‍රයෝග:— සප්තවිධ කුෂ්ඨ, වාතරක්ත, පරංගි නසන්නේ ය.
අනුපාන:— උණුවතුරෙන් හෝ ගිතෙල් මීපැණි සමග යෙදිය යුතු ය.
මාත්‍රාව:— කලං 1 යි. (ග්‍රෑම් 5)

39. යෝග නාමය:— **මහා සරස්වති චූර්ණය (I)**

යෝගය:—

අමුක්කරා
අසමෝදගම්,
වදකහ,
කොට්ටන්
ත්‍රිකටු,
ශතපුෂ්ප,
බ්‍රහ්ම බීජ (කැල ඇට)
සවිඳලුණු.

සමභාගව ගත යුතු වේ.
මුළු බරෙන් අර්ධයක් වදකහ චූර්ණය යෙදිය යුතුය.

ප්‍රයෝග:— ශාස්ත්‍ර හදරණ අයට ද, ගොළුවන්ට ද, කථා කිරීම අපහසු වූවන්ට ද, ඉතා ගුණදයක ය. බුද්ධි වර්ධනය කෙරේ.
අනුපාන:— මීපැණි සමඟ හෝ ගිතෙල් සමඟ යෙදීම මැනවි. කිරි පානය කළ යුතු යි.
මාත්‍රාව:— කර්ෂ 1 යි. (ග්‍රෑම් 15 යි.)

40. යෝග නාමය:— **මහා සරස්වති චූර්ණය (II)**

යෝගය:—

කරාබු,
වසාවාසි,
සාදික්කා,
බිංතල්අල,
හාතාවාරියඅල,
ඉකිරිඇට,
නෙරංචිඇට,
උළු,
ශුද්ධගුගුල්,
රසකිඳපිටි,
අමුක්කරා අල,
වැල්මී,
කිරිබදුඅල,
ජටාමාංස,
තෙල්ලි,
ඉඹුල්මැලියම්,
හිංඑන්සාල්,
කුරුඳුපොතු.
අක්‍රපට්ට,
ලොධ්‍රපොතු,
කොට්ටං,
සැවැන්දරාමුල්,
ගම්මිරිස්,
ඉඟුරු,
කපුකිනිස්ස ඇට,
කලාඳුරුඅල,
මුද්දරප්පලම්,
කර්කටකශෘංගි,
ඉරිවේරිය,
කැප්පෙටිලාකඩ,
උණකපුරු,
නෙළුම්අල,
නෙළුම්රේණු,
නෙළුම්ඇටමද,
බෙලිගැටමද,
කපුඇටමද,
විලඳ (හිනටි),
ආඩතෝඩාමුල්,
ආඩතෝඩාපොතු,
ආඩතෝඩාමල්,
මානෙල්අල,
සුදුහඳුන්,
නාමල්රේණු,
මීමල්,
රටඉඳි,
හිඟුරුපියලි,
කටුකරෝසන,
ඉරමුසුමුල්,
දියමිත්ත,
වියලිකහ,
වෙන්වැල්ගැට,
කොත්තමල්ලි,
තිත්තකපුරු,
තිප්පිලි,
වැල්තිබ්බටුමුල්,
කළුදුරු,

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.
ප්‍රයෝග:— රත්පිත්, උන්මාද, රක්තප්‍රදර දහ ආදියෙහි යෙදේ.
අනුපාන:— ගිතෙල්, මීපැණි, එළකිරි සමඟ ය.
මාත්‍රාව:— වේලකට කලං 1 1/2 සිට 3 දක්වා වේ. -(ග්‍රෑම් 7.5-ග්‍රෑම් 15)

41. යෝග නාමය:— **මානිමන්ථ චූර්ණය.**

යෝගය:—

සෛන්ධව (ලවණ)	කලං	1 යි.	(ග්‍රෑම් 5)
සුදුදුරු	කලං	2 යි.	(,, 10)
අසමෝදගම්	කලං	3 යි.	(,, 15)
තිප්පිලි	කලං	4 යි.	(,, 20)
ඉඟුරු	කලං	5 යි.	(,, 25)
සියල්ල බරට අළු චූර්ණය කලන් 15 යි.			(,, 75)

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.
ප්‍රයෝග:— අජීර්ණ, ශූල ආදි උදර ව්‍යාධීන්ට ශ්‍රේෂ්ඨ යි. ආම පාචක යි. රුචිය වඩයි. අග්නිදීපන යි. විරේචක යි. වාත, ගුල්ම හා මූල රෝග නසාලයි. රසායන යි.
අනුපාන:— උණුදියෙන් හෝ සුදුසු අනුපානයකින් දෙන්නේ ය.
මාත්‍රාව:— කලං 1/2-1 දක්වා ය. (ග්‍රෑම් 2.5-ග්‍රෑම් 5)

42. යෝග නාමය:— **ලවංගාදි චූර්ණය.**
යෝගය:—

කරාබු.
වණ්ඩුකපුරු.
හින්එන්සාල්.
කුරුඳුපොතු.
නාමල්රේණු.
සාදික්කා.
සැවැන්දරා.
වියලි ඉඟුරු.
කළුදුරු,
කළුඅගිල්.
තුගාක්ෂිරි (උණකපුරු)
ජටාමාංශ.
නෙළුම්ඇට,
තිප්පිලි,
සුදුහඳුන්,
තුවරලා,
බාලා (සැවැන්දරා),
කපුකිනිස්සඇට.

සියල්ල සමභාගව ගතයුතු වේ.
සියළු ද්‍රව්‍යයන්ගේ බරින් භාගයක් සීනි ගත යුතු ය.

ප්‍රයෝග:— අග්නි දීපන, රෝපණ, තර්පණ, වෘෂ්‍ය, ත්‍රිදෝෂ හර සහ බලප්‍රද වේ. හෘද්රෝග, කණ්ඨරෝග, කාස, හික්කා, පීනස, රාජයක්ෂ්මා, තමකශ්වාස, අතිසාර, උරඃක්ෂත, ප්‍රමේහ, අරුචි, ගුල්ම, ග්‍රහණී යන රෝග නසන්නේ වේ.

මාත්‍රාව:— කලං 1/2-1 දක්වා යොදන්නේ ය. (ග්‍රෑම 2.5-ග්‍රෑම 5)

43. යෝග නාමය:— **ලෝහිත චූර්ණය. I. (ලාල් චූර්ණය)**

යෝගය:—

රසසින්දූර	ඇනා	8 යි.	(රක්තිකා 48 = ග්‍රෑම 6 යි).
උණකපුරු	ඇනා	6 යි.	(රක්තිකා 36 = ග්‍රෑම 4.5 යි).
ශෝධිත ටංගණ	ඇනා	6 යි.	(රක්තිකා 36 = ග්‍රෑම 4.5 යි).
(අබින්) අහිඵේන	ඇනා	2 යි.	(රක්තිකා 12 = ග්‍රෑම 1.5 යි).

සංස්කරණය:— යෝගයෙහි සඳහන් අහිඵේන හැර අන් සියල්ල සියුම්ව චූර්ණකර පසුව අබින් ද, මිශ්‍රකොට මෝටරයකින් සූක්ෂ්ම පරිදි අඹරා ගන්නේ ය.

ප්‍රයෝග:— පක්වාතිසාර හා ග්‍රහණී රෝග සඳහා යොදති.

මාත්‍රාව:— ගුඤ්ජා 2 යි. (මදටිය 1 යි) යථා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදේ. (මි.ග්‍රෑ. 250යි). ලාල් චූර්ණය, ලාල් වටී යනුවෙන් ද ව්‍යවහාර ය.

යෝග නාමය:— **ලෝහිත (ලාල්) චූර්ණය II.**

රස සින්දූර	තෝලා	1 යි.	(ග්‍රෑම 12 යි).
උණ කපුරු	තෝලා	1 යි.	(ග්‍රෑම 12 යි). චූර්ණ කර ගන්නේ ය.

මාත්‍රාව:— ගුංජා 2 යි— මි.ග්‍රෑ. 250 කි.

ප්‍රයෝග:— අංක I–II ග්‍රහණී, උදර, ශොථ රෝගයන්හි විශිෂ්ට ය.

සැ.යු.:— මේ යෝග දෙකටම ස්වර්ණ සින්දූර නියමිත ය. ප්‍රතිනිධිය රස සින්දූර වේ.

44. යෝග නාමය:— **වජ්‍රක්ෂාර (1) (ශ්වෙත පර්පටි)**

යෝගය:—

සීනක්කාරම	භාග	1 යි.
වෙඩිලුණු	භාග	4 යි.

සංස්කරණය:— මේවා වෙන වෙනම චූර්ණකර තාච්චියක් ලිප තබා චූර්ණ දෙවගය උණු කරණු ලැබේ. හොඳට උණු වන විට යකඩ මෝලක අගින් ගෙන බිත්තර කටු මෙන් තනා ගත යුතුවේ. පසුව ඒවා මෝටරයකින් අඹරාගත යුතු ය.

යෝග නාමය:— **වජ්‍රක්ෂාර (2)**

යෝගය:—

නවසාරන්	භාග	1 යි.
වෙඩිලුණු	භාග	4 යි. (සංස්කරණය අංක 1 මෙනි)

ප්‍රයෝග:— මූත්‍ර සුද්ධි කර, අග්නිදීපන හා වේදනා හර වේ. අම්ල පිත්තය නසයි.

මාත්‍රාව:— රක්තිකා 5-10 දක්වා සුදුසු පරිදි යෝග්‍ය අවස්ථාවට යෙදේ.

45. යෝග නාමය:— **වැල්දෙහි චූර්ණය – ගෝදඹු චූර්ණය.**

යෝගය:—

චීන අල	රාත්තල්	1 යි,	(ග්‍රෑම 480)
සාදික්කා	කලං	8 යි,	(,, 40)
ගම්මිරිස්	කලං	6 යි,	(,, 30)
වියලි ඉඟුරු	කලං	5 යි,	(,, 25)
සපුකැකුළු (වියලා)	කලං	5 යි,	(,, 25)

කරාබු,
වසාවාසි,
කලං 4 බැගින් වේ. (ග්‍රෑම 20)
තිරිඟුහාල්,
කොරාසානි,
කළුදුරු,
වැල්දෙහිමුල්,
කොට්ටං,
රසකිඳ,
වැල්මී,
ගල්කුරමුල්,
කුරිඤ්ඤංමුල්,
මේ ද්‍රව්‍ය කලං 3 බැගිනි. (ග්‍රෑම 15)

සංස්කරණය:— චූර්ණකොට රෙදි කඩින් හලා විදුරු බරණියක සුරැකිව තබාගන්නේ ය.

ප්‍රයෝග:— පරංගි, අලු පරංගි, ඔඩුවණ, අරමණ වණ, ගඩු, උගුරේ වණ, කබර, කුෂ්ඨ, භගන්දර, මූලවායු, අර්ශස්, ලිඟුවන, උපදංශ හා විෂවාතජ සන්ධි කොරවීම් ආදියට පරණ පිනස් රෝගීන්ට විශේෂයෙන් ගුණ දායක වේ. දින 4 ක් බෙහෙත වළඳා 5 වෙනි දින උදේ තලතෙල් ඉස අල්ලා උණුවතුර නාන්නේ ය.
අපථ්‍යය:— විනාකිරි, දෙහි ඇඹුල් ය.
අනුපාන:— උණුදිය.
මාත්‍රාව:— වරකට කර්ෂ 1 ක්.

46. යෝග නාමය:— **විඩංගාදි චූර්ණය.**

යෝගය:—
වළඟසාල්,
සෛන්ධව ලවණ,
යවක්ෂාර,
කම්පිල්ල,
අරළු,
සමභාගව ගතයුතු ය.

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.
ප්‍රයෝග:— ක්‍රිමිපාතනය සඳහා යොදති. රවුම් පණු, කොකු පණු, පටිපණු නාශක වේ.
අනුපාන:— කොරාසානි තැම්බූ ජලය, බටකිරිල්ල චූර්ණය හා මීපැණි, පිලමුල් තැම්බූ ජලය, ක්‍රිමිශත්‍රැ තැම්බූ ජලය, සන්නිපායම් චූර්ණය.
මාත්‍රාව:— රක්තිකා 6–12 (ග්‍රෑම් .75-1.5 දක්වා) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

47. යෝග නාමය:— **විෂමජ්වරාන්තක චූර්ණය.**

යෝගය:—

හිංගුල	භාග	1 යි.	ඉඟුරු	භාග 1 යි,
වච්චනාවි	භාග	1 යි,	ගම්මිරිස්	භාග 1 යි,
කොහොඹපොතු,	භාග	1 යි,	තිප්පිලි	භාග 1 යි,
රසසින්දූර	භාග	6 යි.		

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.
ප්‍රයෝග:— විෂමජ්වරයට විශෙෂයෙන් ගුණ යි.
අනුපාන:— මදුරුතලා යුෂින් හෝ සුදුසු අනුපානයකින් අවස්ථාවට අනුව යොදන්න.
මාත්‍රාව:— රති 1–4 දක්වා වේ. (මිලිග්‍රෑම් 125-500)

48. යෝග නාමය:— **වෛශ්වානර චූර්ණය.**

යෝගය:—

සව්ඳලුණු	භාග	2 යි,
අජමෝද	භාග	5 යි,
වියලි ඉඟුරු	භාග	5 යි,
හරිතකී	භාග	12 යි,

ප්‍රයෝග:— ආමවාත, ගුල්ම, හෘදය රෝග, වස්ති රෝග, ප්ලීහවෘද්ධි, ග්‍රන්ථි රෝග, විවිධශූල, අර්ශස්, ආනාහ, විබන්ධ, වාත රෝග යන රෝග සුව කරන්නේ ය. වෛශ්වානර චූර්ණය වාතානුලෝමනය කරන්නේ ය.
අනුපාන:— මස්තු, ආරනාල, තක්‍ර, ගිතෙල්. උෂ්ණ ජලය යන මේවායින් එකක් සමග යෙදිය යුතු වේ.
මාත්‍රාව:— කර්ෂ 1/2–1 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු වේ. (ග්‍රෑම් 7.5- ග්‍රෑමස් 15)

49. යෝග නාමය:— **වෘහද්ගංගාධර චූර්ණය.**

යෝගය:—
බෙලිගැටමද,
කටුඉඹුල්මැලියම්,
දියමිත්තමුල්,
ධාතකී,
කොත්තමල්ලි,
හ්රිවේර (ඉරිවේරිය),
ඉඟුරු,
ශෝධිත ගන්ධක.
කළාඳුරුඅල,
අතිවිඩයම්,
අබින්,
ලොධ්‍ර,
දෙළුම්ලෙලි,
කෙළිඳසාල්,
ශෝධිත රසදිය,
සමභාගව ගන්නේ ය.

සංස්කරණය:— පළමුව රස ගන්ධක කජ්ජලිකොට, සෙසු ද්‍රව්‍ය චූර්ණකොට එකට මිශ්‍ර කොට අඹරා ගත යුතු ය.
ප්‍රයෝග:— දරුණු උණ අතිසාරයෙහි විශෙෂයෙන් යොදති. ජ්වරාතිසාර හා උග්‍ර විවිධ ග්‍රහණී රෝගයන් ද, කෝෂ්ඨ ව්‍යාධීන් ද නාශක ය.
අනුපාන:— තක්‍ර ය.
මාත්‍රාව:— රක්තිකා 2–4 දක්වා වේ. (මි.ග්‍රෑම් 250–ග්‍රෑම් 5 දක්වා)

50. යෝග නාමය:— **ශඨ්‍යාදි චූර්ණය (1)**

යෝගය:—
ශඨී,
ව්‍යෝෂ,
අරළු,
බීජපූරක (නස්නාරං මුල්)
ස්වර්ජික්ෂාර,
යවක්ෂාර,
තිප්පිලිමුල්.
සමභාගව ගත යුතු යි.

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.

ප්‍රයෝග:— ශ්ලේෂ්මග්‍රහණී රෝග නසයි.

අනුපාන:— ලවණ-අම්ල සහිතව භාවිත කළ යුතු ය.

මාත්‍රාව:— මාෂක 1–2 (ග්‍රෑම් 1–2) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට දිය යුතු යි

51. යෝග නාමය— **ශඨ්‍යාදි චූර්ණය (2)**

යෝගය:—
ශඨී,
තිප්පිලිමුල්.
ජීවන්ති,
කුරුඳුපොතු,
කලාඳුරුඅල,
සුවඳකොට්ටම්,
මදුරුතලා,
පිටවක්කා. (ඵල)
එන්සාල්,
තිප්පිලි,
අගිල්,
ඉඟුරු,
සුගන්ධබාලා—(සැවැන්දරා)
සමභාගව ගතයුතු වන්නේ ය.

සංස්කරණය:— ද්‍රව්‍ය චූර්ණය මෙන් අට ගුණයක් සීනි මිශ්‍ර කළ යුතු යි.

ප්‍රයෝග:— තමකශ්වාස සහ හික්කාවට හිත වන්නේ යි.

මාත්‍රාව:— කලං 1/2–1 දක්වා සුදුසු අනුපාන සමඟ ගන්නේ ය. (ග්‍රෑම් 2.5 –ග්‍රෑ. 5)

52. යෝග නාමය:— **ශතාවරි චූර්ණය.**

යෝගය:—
ශතාවරි (හාතවාරිය),
ගොකටුබීජ,
වදුරු මෑ ඇට,
ගාංගේරුකී (නාගබලා)
අතිබලා, (බෙත් අනෝද)
ඉකිරිඇට.

ප්‍රයෝග:— වාජීකරණය වේ.

අනුපාන:— එළකිරි ය.

මාත්‍රාව:— කලං 1/2–1 දක්වා යි. (ග්‍රෑම් 2.5–ග්‍රෑම් 5)

53. යෝග නාමය:— **ශෘංග්‍යාදි චූර්ණය.**

යෝගය:—
කර්කටකශෘංගී,
කටුත්‍රය (ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි),
ඵලත්‍රය (අරළු, බුළු, නෙල්ලි),
කටුවැල්බටු,
සිරිතේක්කු (භාර්ගි)
පුෂ්කරමූල–සුවඳකොට්ටන්,
පංචලවණ,
සමභාගව ගතයුතු ය.

සංස්කරණය:— ලවණ වෙනම ඉතා සිනිඳුව චූර්ණකර ගන්නේ යි. අනෙක් ද්‍රව්‍ය පිරිසිදුව ගෙන වියලා ඉතා සියුම්ව චූර්ණකර, චූර්ණ දෙවර්ගය එකට මිශ්‍ර කර ගත යුතු ය.

ප්‍රයෝග:— හික්කා, ශ්වාස, ඌර්ධ්ව වාත, අරුචි. පීනස් නසයි.

අනුපාන:— උෂ්ණ ජලය.

මාත්‍රාව:— මංචාඩි 5–10 (ග්‍රෑම් 1.25–2.50) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදනු මනා ය.

54. යෝග නාමය:— **ෂඩ්ධරණයෝග චූර්ණය.**

යෝගය:—
රත්නිටුල්මුල්,
දියමිත්තමුල්.
කෙළිඳයාල්
කටුකරෝසන,
අතිවිඩයම්,
අරළු,
සමභාගව ගත යුතු වේ.

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.

ප්‍රයෝග:— වාතව්‍යාධිකයනට ඉතා ශ්‍රේෂ්ඨ යි.

අනුපාන:— සුදළුනු තැම්බූ ජලයෙන් හෝ සුදුසු අනුපානයකින් අවස්ථාව බලා යොදන්නේ යි.

මාත්‍රාව:— කලං 1/2 සිට 1 දක්වා වේ. (ග්‍රෑම් 2.5–ග්‍රෑම් 5)

55. යෝග නාමය:— **සර්පගන්ධා චූර්ණය.**

යෝගය:

ඒකාවෙරි (සර්පගන්ධා) භාග 1 යි.
අරළු භාග 1/2 යි.

සියුමව චූර්ණකොට වස්ත්‍රයකින් හලා ගන්න.

ප්‍රයෝග:— උන්මාද රෝගයට ප්‍රත්‍යක්ෂයි. අතිරක්තචාපයට ද හිත යි.

අනුපාන:— ගිතෙල් සමග වේ.

මාත්‍රාව:— මාෂ 1–2 යි (ග්‍රෑම 1–2) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු වේ.

56. යෝග නාමය:— **සරස්වති චූර්ණය.**

යෝගය:—

කලාඳුරුඅල,
ඉරිවේරිය,
නාමල්රේණු,
අමුක්කරාඅල,
බිංකොහොඹ,
බිංතල්අල,
ඉඳිඅල (ඉඳිබෝඩ),
සැවැන්දරාමුල්,
එළනෙළුං අල,
අගිල්,
දේවදර.

එන්සාල්,
සුදුදුරු,
තිප්පිලි,
කළුදුරු,
දේවදුරු,
අසමෝදගම,
සුදුලූනු,
කොට්ටං,
කලාඳුරුඅල,
කුඹුරුඇටමද,

වැල්මී,
ඉඟිනිඇට,
වළගසාල්,
එළ ඔලිදඇට,
හොරඅරටු,
වසාවාසි,
කරාබු,
උළුහාල්,
සාදික්කා,
ගිඟුරුපියලි,

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි. ඇතැම් වට්ටෝරුවක වියලි ලූණුවිල හා වියලි වදමල් සඳහන් ය.

ප්‍රයෝග:— අක්ෂිරෝග, රත්පිත්, භ්‍රම, මූර්ච්ඡා යන රෝගයන්හි අති විශේෂ යි.

අනුපාන:— තැඹිලි වතුර, එළකිරි, උක්යුෂ, සමව ගෙන ඊට චූර්ණය බහා උණුකර සීනි දමා බොන්නේ ය.

මාත්‍රාව:— කර්ෂ 1 යි. (ග්‍රෑම 15 යි.)

57. යෝග නාමය:— **සාරස්වත චූර්ණය.**

යෝගය:—

කොට්ටම්,
අශ්වගන්ධා,
සවිඳලුණු,
අයමෝදගම,
සුදුදුරු,
ශංඛපුෂ්පි. (ප්‍ර. නි. විෂ්ණුක්‍රාන්තිය)

කළුදුරු,
වියලිඉඟුරු,
ගම්මිරිස්,
දියමිත්ත,
තිප්පිලි,

ප්‍රයෝග:— උන්මාද, අපස්මාරයට හිත යි. බුද්ධිය, ධාරණ ශක්තිය, ධෛර්‍ය්‍යය, ස්මරණ ශක්තිය යන මේවා වැඩේ.

අනුපාන:— බ්‍රාහ්මී ස්වරස, මීපැණි, ගිතෙල් සමඟ යොදනු ලැබේ.

මාත්‍රාව:— කර්ෂ 1/2 සිට කර්ෂය දක්වා වේ. (ග්‍රෑම 7.5-15)

58. යෝග නාමය:— **සිතෝපලාදි චූර්ණය.**

යෝගය:—

සූකිරි	කර්ෂ	16 යි,	(ග්‍රෑම 240 යි.)
උණකපුරු	කර්ෂ	6 යි,	(ග්‍රෑම 90 යි).
තිප්පිලි	කර්ෂ	4 යි,	(ග්‍රෑම 60 යි).
කුරුඳුපොතු	කර්ෂ	1 යි,	(ග්‍රෑම 15 යි.)
හින්එන්සාල්	කර්ෂ	2 යි.	(ග්‍රෑම 30 යි.)

සංස්කරණය:— සූකිරි ඉතා සිනිඳුව චූර්ණකර ගන්න. අනෙක් ද්‍රව්‍ය පිරිසිදුව ගෙන වියලා වෙනම සිනිඳුව චූර්ණකර චූර්ණ දෙවර්ගය එකට මිශ්‍ර කරන්න.

ප්‍රයෝග:— ශ්වාස, කාස, ක්ෂය නසයි; හස්ත, පාදයන්හි දහ නසයි; අග්නිමාන්ද්‍ය නසයි; සුප්ත ජිහ්වා රෝග, පාර්ශ්ව ශූල, අරුචි, ජ්වර, ඌර්ධ්ව ගත රක්ත පිත්ත නසයි.

අනුපාන:— මීපැණි හා ගිතෙලින් ලේහ කරන්නේ ය.

මාත්‍රාව:— මදටිය 5–10 දක්වා වේ. (ග්‍රෑම 1.25–2.5 දක්වා).

59. යෝග නාමය:— **සුකුමාර චූර්ණය** (1)

යෝගය:—

සෙනෙහෙකොළ,
අරළු,
සමභාග ව චූර්ණකර බරක් සීනි දමා.

අනුපාන:— අර්ශස් කුෂ්ඨ, වාතරක්ත, අක්ෂිරෝග,

අනුපාන:— උණුවතුර, එළකිරි, තැඹිලිවතුර,

මාත්‍රාව:— කලං 1 යි (ග්‍රෑම 5)

60. යෝග නාමය:— **සුකුමාර චූර්ණය (2)**

යෝගය:—

වීත අල	පලං 2 යි, (ග්‍රෑම 120)	වැල්මී	පලං 1 යි, (ග්‍රෑම 60)
සෙනෙහෙකොළ	පලං 2 යි, (ග්‍රෑම 120)	සුකිරි	පලං 6 යි, (ග්‍රෑම 360)
සුදුදුරු	පලං 1 යි, (ග්‍රෑම 60)		

ප්‍රයෝග:— අර්ශස්, කුෂ්ඨ, වාතරක්ත, වාත රෝගාදියට.
අනුපාන:— නැඹිලිවතුර, උණුවතුර,
මාත්‍රාව: කලං 1 යි. (ග්‍රෑම 5 යි).

61. යෝග නාමය:— **සුදර්ශන චූර්ණය.**

යෝගය:—
තිපල්,
වෙනිවැල්ගැට, (දාරුහරිද්‍රා)
කටුවැල්බටුමුල්,
ගයී,
ත්‍රිකටු,
තිප්පිලිමුල්,
මූර්වා,
රසකිඳ,
දුරාලභා (වැල්කහඹිලිය ප්‍රතිනිධි)
කටුකරෝහන,
පත්පාඩගම්,
කලාඳුරුඅල,
ත්‍රායමාණ (ලුණුවිල ප්‍රතිනිධි)
බාලක (ඉරිවේරිය ප්‍රතිනිධි)
කොහොඹපොතු,
කොට්ටන්,
වැල්මී,
කෙළිඳපොතු,
අසමෝදගම්,
කෙළිඳසාල්,
සිරිතේක්කු, (භාර්ගී),
මුරුංගාඇට,
සෞරාෂ්ට්‍රමෘත්තිකා, (සුරත්මැටි),
කුරුඳුපොතු,
වියලිකහ,
එළබටුමුල්,
තාලිසපත්‍ර,
පද්මකාෂ්ඨ,
සැවැන්දරා
සුදුහඳුන්,
අතිවිඩයන්,
බැවිලමුල්,
ශාලපර්ණි,
පෘශ්ණිපර්ණි,
වළහසාල්,
තුවරලා,
රත්නෙටොල්.
දේවදාර.
සිවිය,
පටෝලපත්‍ර,
ජීවක,
ඍෂභක,
කරාබු,
උණකපුරු,
ප්‍රපෞණ්ඩරික
කාකෝලි,
තේජපත්‍ර,
වයාවාසි
සමභාගව ගතයුතු යි.
සම්පූර්ණ චූර්ණයෙන් 1/2 ක් කිරාත (ප්‍රතිනිධි බිංකොහොඹ)

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.
ප්‍රයෝග:— විශේෂයෙන් ජ්වර රෝගයන්හි යොදති. තුන්දෙස් සමනය කරයි. ආන්ත්‍රික උණ, විවිධ විෂම ජ්වර හා ධාතු ගත උණ ද නසයි. ජ්වර උපද්‍රව වශයෙන් ඇති වන මෝහ, තන්ද්‍රා, භ්‍රම, තෘෂ්ණා, ශ්වාස, කාස නසයි. පාණ්ඩු, හෘද්‍රෝග, කාමලා හා ත්‍රික-පෘෂ්ඨ-කටි-ජානු, පාර්ශ්වශූල නිවාරණය කරයි.
අනුපාන:— ශීත ජලයෙන් හෝ සුදුසු අනුපානයකින් දියයුතු වේ.
මාත්‍රාව:— කලං 1/2 සිට 1 දක්වා වේ. (ග්‍රෑම 2.5–ග්‍රෑම 5).

62. යෝග නාමය:— **සුරසාදි පේයාව.**

සුරසා (තුලසි-හිං මදුරුතලා සහමුලින්) භාර්ඞ්ගි, වාසා මුලේ පොතු, කටුවැල්බටු, වැල්මී, සේර, (ජම්බීර තෘණ) ඇන් අඩි (ගෝජිත්වා) සහමුලින් ගත පුෂ්ප, ගම්මිරිස්, සම භාග දළ චූර්ණය. (එක් වය) මාත්‍රාව වරකට කලං 2 යි.
ගුණ:— වසංගතාකාර ශ්ලේෂ්ම (ඉන් ප්ලූවන්සා) ජ්වරයෙහි ප්‍රශස්ත ය.
(පණ්ඩිත ශිවශර්මා)

63. යෝග නාමය:— **ශිංග්වෂ්ටක චූර්ණය.**

යෝගය:—
ත්‍රිකටු (ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි).
අසමෝදගම්,
සහිදලුණු,
සුදුදුරු,
කළුදුරු,
පෙරුංකායම්,
සමභාගව ගතයුතු වේ.

සංස්කරණය:— චූර්ණ පරිභාෂාවෙනි.
ප්‍රයෝග:— අග්නිදීපනකර ය; වාතගුල්ම හා වාතරෝග නසයි.
මාත්‍රාව— මාෂක 1–2 දක්වා වේ (ග්‍රෑම් 1–2)
අනුපාන:— ගිතෙල්, උණුදිය වේ.

64. යෝග නාමය:— **හිංග්වාදි චූර්ණය.**

යෝගය:—

පෙරුංකායම්,
දියමිත්ත,
අරළු,
කොත්තමල්ලි
දෙළුම්ඇට,
රත්නෙටුල්,
ශඨී
අසමෝදගම්,
ත්‍රිකටු,
හපුෂා, (ගම්මිරිස් ප්‍රතිනිධි).
අම්ලවේතස (ප්‍රතිනිධි ගොරක).
අජගන්ධා—(බර්බරිකා),
සියඹලා,
සූදුරු,
සුවඳකොට්ටම්,
වදකහ,
සිවිය,
යවක්ෂාර,
ස්වර්ජික්ෂාර,
පංචලවණ,

ප්‍රයෝග:— වාත-කඵ ගුල්ම, හෘද්ග්‍රහ, අෂ්ඨීලා, හෘද්-වස්ති,-පාර්ශ්වශූල, ගුද-යෝනි ශූල, මූත්‍ර කෘච්ඡ්‍ර, ආනාහ, පාණ්ඩු රෝග, අරුචි නසයි. හික්කා, යකෘත්-ප්ලීහ රෝග, ශ්වාස, කාස, ගලග්‍රහ, ග්‍රහණී, අර්ශස් යන රෝග සුවය කරයි.

මේ චූර්ණයට මාතුලුංග ස්වරස මිශ්‍රකර ගුටිකා සාද ගැනීම ද ක්‍රමයකි.

අනුපාන:— පැසුණු සුරා, තක්‍ර, උෂ්ණෝදක ආදිය වේ.
මාත්‍රාව:— කලං 1/2–1 දක්වා යෝග්‍ය යි. (ග්‍රෑම් 2.5–5).

ලෞහ ඛණ්ඩය

1. ලොහ නාමය:— **අමෘතාංකුර ලෞහය.**

යෝගය:—

(හිංගුලාකෘෂ්ට) රසදිය	පලං 1 යි,	(ග්‍රෑම 60)
ශුද්ධ ගන්ධක	පලං 1 යි,	(ග්‍රෑම 60)

කජ්ජලිකොට වර්තුල බල්වයක ලා අඹරා පිඩුවක් මෙන් තනා ඊපිට ගිනියම් කළ තඹ පතෙකින් තද කොට පර්පටියක් බවට පත්කරන්නේ ය. ඉන්පසු පුස්කර තෝලා එකක් මිශ්‍ර කොට, මූෂාවෙක්හි ලා මඳක් ගිනියම් කරන්නේ ය. ඉක්බිති එම කජ්ජලිය සමග

ලෞහ හස්ම	පල 1 යි,	(ග්‍රෑම 60)	ශුද්ධ ගුගුල්	පල 1 යි.	(ග්‍රෑම 60)
තාම්‍ර හස්ම	පල 1 යි,	(ග්‍රෑම 60)	ගිතෙල්	පල 16 යි,	(ග්‍රෑම 960)
ශුද්ධ හල්ලාතක	පල 1 යි,	(ග්‍රෑම 60)	ත්‍රිඵලා ක්වාථය	සේරු 4 යි	(ලී. 3.84)
අභ්‍ර හස්ම	පල 1 යි,	(ග්‍රෑම 60)			

(මිලිතව ත්‍රිපලා සේරු 2 ජලය සේරු 16–4 ට සිදුවා මිශ්‍රකොට පාක කරන්නේ ය.)

පාක ශේෂය ආසන්න වූ කල්හි	අරළු චූර්ණය	තෝලා 4 යි,	(ග්‍රෑම 48)
	බුළු චූර්ණය	තෝලා 4 යි,	(ග්‍රෑම 48)
	නෙල්ලි චූර්ණය	තෝලා 12 යි,	(ග්‍රෑම 144)

සංස්කරණය:— නැවත මෙම චූර්ණය ප්‍රයෝග කොට පාකය අවසන් කරන්නේ ය.
ප්‍රයෝග:— සර්වප්‍රකාර කුෂ්ඨ, වලිපලිත, පාණ්ඩු, මේහ, ආමවාත, වාතරක්ත, අර්ශස්, වාත රෝගාදිය ද නසයි.
අනුපාන:— ගිතෙල් මී සමඟ අඹරා උදෑසන කුරුම්බා වතුර හෝ එළකිරි සමඟ වළඳන්නේය.
මාත්‍රාව:— රති 1–4 සිට ක්‍රමයෙන් වැඩි කරන්නේ ය. (මි. ග්‍රෑ. 125–මි.ග්‍රෑ. 500)

2. යෝග නාමය:— **ගගනාදි ලෞහය.**

යෝගය:—

අභ්‍රක හස්මය,
අරළු,
බුළු,
නෙල්ලි,
ශෝධිත රසදිය,
ශෝධිත ගන්ධක,
ශෝධිත වච්චිනාවි,
ශෝධිත පුස්කර,
ස්වර්ජික්ෂාර,
කළුදුරු,
ලෞහ හස්මය,
කෙළිඳපොතු,
වියලි ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
කුරුඳුපොතු,
එන්සහල්
තේජපත්‍ර,
වංග හස්මය,
සුදුදුරු,

මේවා සමභාගව ද. රත්නෙටුල් මුල් චූර්ණය ඒ සියල්ලෙහි බරෙන් අඩක් ද යොද ගන්නේ වේ.

සංස්කරණය:— රසදිය ගන්ධක කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ අති සියුම්ව පිළියෙල කරගත් චූර්ණය ද, යොද මනාව අඹරා චූර්ණය වීදුරු බඳුනක ලා තැබිය යුතු වේ.
ප්‍රයෝගය:— මූත්‍රාතිසාරය හා සෝම රෝගයට යෝග්‍ය වේ.
අනුපාන:— මීපැණි සමඟ බෙහෙත් මාත්‍රාව ලේහ කටයුතු වේ.
මාත්‍රාව:— කර්ෂ 1 යි. (ග්‍රෑම 15 යි.)
සැ.යු.— ග්‍රන්ථ නිර්දේශයෙහි මාත්‍රාව කර්ෂයක් නියමිතව ඇතද. එය අධික මාත්‍රාවක් බැවින් රක්තිකා 10 ක් මාත්‍රාව වශයෙන් සලකනු ලැබේ. (ග්‍රෑම 1.25)

3. යෝග නාමය:— **ධාත්‍රී ලෞහය (1)**

යෝගය:—

ධාත්‍රී (නෙල්ලි),
ලෞහ හස්ම,
තිප්පිලි,
ඉඟුරු,
ගම්මිරිස්,
කහ,

සමභාගව යි.

සංස්කරණය:— සියල්ල චූර්ණකොට අඹරා ගත යුතු ය.
ප්‍රයෝග:— උග්‍ර කාමලා නසයි. පාණ්ඩු රක්තක්ෂය, අම්ලපිත්ත, පරිණාමශූල, ආනාහ ශූල නසයි.
අනුපාන:— මීපැණි, ගිතෙල්, සර්කරා, රසකිඳ ක්වාථය සමඟ යෙදිය යුතුයි.
මාත්‍රාව:— රක්තිකා 6 (මි.ග්‍රෑ. 750) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

4. යෝග නාමය:— **ධාත්‍රී ලෞහය (2)**

යෝගය:—

නෙල්ලි චූර්ණය	පල 8 යි. (ග්‍රෑම් 480)	වැල්මී චූර්ණය පල 2 යි. (ග්‍රෑම් 120)
ලෞහ භස්ම	පල 4 යි. (.. 240)	කරදමුල්පොතු පල 2 යි. (ග්‍රෑම් 120)

සංස්කරණය:— රසකිඳ ක්වාථයෙන් සියළු චූර්ණය සත්වරක් භාවනා දිය යුතු වේ.

ප්‍රයෝග:— භෝජනයට පෙර ගැනීමෙන් පිත් රෝග නසයි. අනුභව කරන අතර ගැනීමෙන් ආනාහ සහ විෂ්ටම්භ නසයි. ආහාරයට පසු ගැනීමෙන් මන්දග්නි, රත්පිත් සහ සියළු රෝග නසයි.

අනුපාන:— දිනකට තෙවරක් දෝෂයට හිත අනුපාන සමඟ ගැනීම මැනවි.

මාත්‍රාව:— රක්තිකා 3–6 යි. (මි.ග්‍රෑ. 375–750)

5. යෝග නාමය:— **නවායස ලෞහය.**

යෝගය:—

ත්‍රිකටු,	කලාඳුරුඅල,
තිපල්,	වළහසාල් මද

රත්නෙටුල් සමභාගව ගත යුතුයි.
ලෞහ භස්ම බරට බරකි.

සංස්කරණය:— චූර්ණ කොට ගන්නේ ය.

ප්‍රයෝග:— පාණ්ඩු, හෘද්රෝග, කුෂ්ඨ, අර්ශස්, කාමලා නසයි.

අනුපාන:— මීපැණි, ගිතෙල්.

මාත්‍රාව:— මදටිය 1–2 දක්වා වේ. (මි:ග්‍රෑ: 250–500)

6. යෝග නාමය:— **පුටපාක විෂම ජ්වරාන්තක ලෞහය.**

ශෝධිත රසදිය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)	අභ්‍ර භස්මය තෝලා	2 යි.	(ග්‍රෑ: 24)
ශෝධිත ගන්ධක	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)	වංග භස්මය මාෂක	6 යි.	(ග්‍රෑ: 6)
ස්වර්ණ භස්මය	මාෂක 3 යි.	(ග්‍රෑ: 3)	ප්‍රවාල භස්මය මාෂක	6 යි.	(ග්‍රෑ: 6)
ලෞහ භස්මය	තෝලා 2 යි.	(ග්‍රෑ: 24)	මුක්තා භස්මය මාෂක	3 යි.	(ග්‍රෑ: 3)
තාම්‍ර භස්මය	තෝලා 2 යි.	(ග්‍රෑ: 24)	ශංඛ භස්මය තෝලා	3 යි.	(ග්‍රෑ: 36)
මුක්තා (ශුක්ති) භස්මය	මාෂක 3 යි.	(ග්‍රෑ: 3)			

සංස්කරණය:— රසදිය ගන්ධක කජ්ජලිකොට එයින් පර්පටී පිළියෙල කරගත යුතු වේ. ඉක්බිතිව එය සෙසු ද්‍රව්‍ය යන්ගේ චූර්ණය ද ලා, කෝමාරිකා ස්වරසයෙන් දෙදිනක් භාවනා යුක්තව අඹරා ගත යුතු ය. එය මුතු බෙලිකටු තුළැ අසුරා, ලඝුපුටයකින් දවා ගුඤ්ජා දෙකක් පමණ ගුලි සකසා ගත යුතු වෙයි.

ප්‍රයෝග:— වාතජ, පිත්තජ, කඵජ, අෂ්ටවිධ ජ්වරයනට ද, විෂමජ්වරයනට ද යෝග්‍ය වේ. ප්ලීහ, යකෘත්, ගුල්ම කාමලා, පාණ්ඩුරෝග, ශෝථ, මේහ, අරෝචක, ග්‍රහණි, ආමදෝෂ, කාස, ශ්වාස, මූත්‍රකෘච්ඡ්‍ර, අතිසාර යන රොගෝපද්‍රවයනට ද හිතවති.

අනුපාන:— තිප්පිලි, පෙරුංකායං, සෛන්ධව යන ද්‍රව්‍යයන්ගේ චූර්ණය සමඟ අවස්ථාවෝචිතව යෝග්‍ය අනුපාන යකින් යොදන්නේය.

මාත්‍රාව:— වටිකා 1–2 යි.

7. යෝග නාමය:— **ප්‍රදරාන්තක ලෞහය.**

යෝගය:—

ලෞහභස්ම,	වච්‍ය,
තාම්‍රභස්ම,	පිප්පලි,
හරිතාල,	ශංඛභස්ම,
වංගභස්ම,	වචා,
අභ්‍රභස්ම,	හපුෂා, (ගම්මිරිස්, ප්‍රතිනිධි),
වරාටිකාභස්ම,	කොට්ටම්,
ත්‍රිකටු,	ශඨී,
ත්‍රිඵලා,	දියමිත්ත,
චිත්‍රක,	දේවදර,
විඩංග,	බලා,
පංචලවණ,	වෘද්ධදරක, — සමභාගව ගතයුතු වේ.

සංස්කරණය:— සියල්ල චූර්ණකොට ගතයුතු ය.

ප්‍රයෝග:— ශ්වෙත, රක්ත, නීල සහ පීත ආදි දුෂ්කර ප්‍රදර, කුක්ෂිශූල, කටිශූල, සියලු දේහ ශූල නසයි. අග්නිය වඩයි. යෝනිශූල, මන්දග්නි, අරුචි, ශ්වාසහර, වේ. බල වඩයි.

අනුපාන:— ගිතෙල්, මධු, සීනි සමඟ ය.

මාත්‍රාව:— රක්තිකා 1–2 දක්වා වේ. (මි:ග්‍රෑ: 125–250 යි).

8. යෝග නාමය:— **ප්‍රදරාරි ලෞහය.**

යෝගය:—

කෙළිඳපොතු,	තුලා 1 යි, (ග්‍රෑම් 6000)
ජලය	සේරු 64--1/8 ට සිඳුවන්නේ ය.

හීන්නිදිකුඹ,
ඉඹුල්මැලියම්,
දියමිත්ත,
බෙලිගැටමද,
කලාඳුරු,
ධාතකී
අරුණ (අතිවිඩයම්)
අභ්‍රභස්ම,
ලෞහ භස්ම,
චූර්ණ පලං 1 බැගිනි. (ග්‍රෑමස් 60)

සංස්කරණය:— චූර්ණ මිශ්‍ර කොට ගත යුතු ය.

ප්‍රයෝග:— ශ්වෙත, රක්ත, නීල, පීත ආදි ස්‍රාවයන්ගෙන් යුක්ත ප්‍රදර,කුක්ෂිශූල, කටිශූල, යෝනි ශූල, මන්දග්නි, අරුචි, පාණ්ඩු, මූත්‍රකෘච්ඡ්‍ර, ශ්වාස සහ කාස ආදි රෝග නසයි. ආයුෂ, බල, වර්ණ වඩයි.

අනුපාන:— කුශමුල් ශීත කෂාය සමඟ යි.

මාත්‍රාව:— කර්ෂ 1/4–1/2 (ග්‍රෑම් 3.75–7.5) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

9. යෝග නාමය:— **යකෘදරි ලෞහය.**

යෝගය:—

ලෞහ භස්මය	කර්ෂ	2 යි,	(ග්‍රෑ: 30)
අභ්‍රක භස්මය	පල	1/2 යි,	(ග්‍රෑ: 30)
තාම්‍ර භස්මය	කර්ෂ	1 යි,	(ග්‍රෑ: 15)
දෙහි මුලේ පොතු (නිම්බුකමූල චූර්ණය)	පල	1 යි,	(ග්‍රෑ: 60)
අන්තර්ධූමදග්ධ—මෘගචර්ම භස්මය (මුවහං භස්ම) පල 1 යි			(ග්‍රෑ: 60)

සංස්කරණය:— ද්‍රව්‍ය සියල්ල මනාව සුණුකොට වියලා බඳුනක අසුරා තැබිය යුතු වේ.

ප්‍රයෝගය:— යකෘත්, ප්ලීහ, උදර සඳහා යෝග්‍ය වේ. තවද කාමලා, හලීමක, කාස, ශ්වාස, ජ්වර, වාත, ගුල්ම යන රෝගාවස්ථාවනට ද හිතවති. සිරුරෙහි බලය වර්ණය හා පාචකාග්නිය ද දනවයි.

අනුපාන:— යෝග්‍ය අනුපානයකින් යොදන්නේය.

මාත්‍රාව:— රක්තිකා 1–2 යි. (මි:ග්‍රෑ: 125–250)

10. යෝග නාමය:— **වරුණාදි ලෞහය.**

යෝගය:—

ලුණුවරණ පොතු,	තෝලා	16 යි,	(ග්‍රෑ: 192)
නෙල්ලි,	,,	16 යි,	(ග්‍රෑ: 192)
ධාතකී,	,,	8 යි,	(ග්‍රෑ: 96)
අරළු	,,	4 යි,	(ග්‍රෑ: 48)
පෘශ්ණිපර්ණි	,,	2 යි,	(ග්‍රෑ: 24)
ලෞහ භස්ම	,,	2 යි,	(ග්‍රෑ: 24)
අභ්‍ර භස්ම	,,	2 යි,	(ග්‍රෑ: 24)

සංස්කරණය:— සියල්ල චූර්ණකොට ගත යුතු ය.

ප්‍රයෝග:— මූත්‍රාඝාතය, උග්‍ර මූත්‍ර කෘච්ඡ්‍රය නසයි. අශ්මරී, ප්‍රමෙහ, විෂමජ්වර නසයි. බල පුෂ්ටි කර ය. වෘෂ්‍යය,

මාත්‍රාව:— ශාණ 1 යි. (ග්‍රෑ: 4 යි).

11. යෝග නාමය:— **විඩංගලෞහ.**

ශුද්ධ පාරද—ගන්ධක, ගම්මිරිස්, සාදික්කා, කරාබු, තිප්පිලි, ශුද්ධ රත්හිරියල්, ඉඟුරු, වංගභස්ම, සියල්ල භාග 09 යි; ලෞහභස්ම භාග 09 යි; වළඟසාල් භාග 18 යි.

මාත්‍රාව:— රක්තිකා 02 යි. අනුපාන මීපැණි. සර්වප්‍රකාර ආභ්‍යන්තර ක්‍රිමි රෝගයන්හි ප්‍රත්‍යක්ෂ ඵලදායක ය. අවශ්‍යතා අනුව දවසකට වාර 3—4 දක්වා යෙදියැ හැකිය.

කල්කටා අෂ්ටාංගායුර්වේද විද්‍යාලයානුබද්ධ ආරෝග්‍යශාලාවෙහි පර්යේෂණාත්මක වැ ප්‍රතිඵල සහතික කැර තිබේ. (අෂ්ටාංගායුර්වේද ස්වර්ණ ජයන්ති සංග්‍රහය.)

12. යෝග නාමය:— **වෘහත් සර්වජ්වරහර ලෞහය.**

යෝගය:—

ශෝධිත රසදිය	කර්ෂ 1 යි,	ග්‍රෑ: 15 බැගින්	ස්වර්ණ මාක්ෂික භස්මය	කර්ෂ 1 යි,	ග්‍රෑ: 15 බැගින්
ශෝධිත ගන්ධක	කර්ෂ 1 යි,		ස්වර්ණ භස්මය	කර්ෂ 1 යි,	
ශෝධිත තාම්‍ර භස්මය	කර්ෂ 1 යි,		රජත භස්මය	කර්ෂ 1 යි,	
අභ්‍ර භස්මය	කර්ෂ 1 යි,		ශෝධිත හරිතාල භස්මය	කර්ෂ 1 යි,	

කාන්තලෞහ භස්මය පල 1 යි, (ග්‍රෑ: 60)

සංස්කරණය:— රසදිය ගන්ධක කජ්ජලිකොට, එයට සෙසු ද්‍රව්‍ය චූර්ණය දමා, කරිවිල ස්වරස, දසමූලක්වාථය, පැපිළිය, ක්වාථය, ත්‍රිඵලා ක්වාථය, රසකිඳ කෂාය, බුලත් ස්වරස, කළුකැම්මෙරිය ස්වරස නික කොළ ස්වරස, සාරණ ස්වරස, අමු ඉඟුරු ස්වරස, යන ද්‍රව්‍යයන්ගෙන් වෙන් වෙන්ව දින සත බැගින් භාවනා යුක්තව අඹරා රක්තිකාවක් පමණ ගුලි පිළියෙල කළයුතු වේ.

ප්‍රයෝගය:— අෂ්ටවිධ ජ්වරයට හිතවති, ජීර්ණ ජ්වරය, වාරිදෙෂජ ජ්වරය, සතතාදි ක්ෂයජ ජ්වරය, ධාතුගත ජ්වරය, කාම-ශෝක-භූත ජ්වරය, අභිඝාත-අභිචාර යන රෝගාවස්ථාවනට ද යෝග්‍ය වේ අභින්‍යාසය, දහ, ශීත, විෂම, ප්‍රලේපක, ප්ලීහ යන ජ්වරයනට ද, කාස, පාණ්ඩුරෝග, කාමළුපද්‍රවයනට ද ප්‍රයෝග කරණු ලැබේ.

අනුපාන:— තිප්පිලි සුණු, උක්සකුරු සමග යෙදිය යුතු වේ. ඇල්හාලේ බත මෝර හා බළල්ලුණු සහිතව යෙදීම පථ්‍ය වේ. කකාරාදි ගණයේ ද්‍රව්‍ය ප්‍රයෝගය අපථ්‍යවනු ඇත. මෙවුන් දම් සේවනය ද අයෝග්‍ය වේ.

මාත්‍රාව:— වටිකා 1–2 දක්වා ය.

13. යෝග නාමය:— **ශාරිවාදි ලෞහය.**

යෝගය:—

ඉරමුසු,
අවරිය,
අරත්ත,
රසකිඳ,
එන්සාල්,
රත්නෙටොල්,
මානකන්ද (පරණ හබරල අල),
සූරණකන්ද (කිඩාරම්අල),
ශංඛපුෂ්පී, (ප්‍ර. නි. විෂ්ණුක්‍රාන්ති)
ත්‍රිවෘත්,
ශුද්ධ හල්ලාතක,
අරළු, — සමභාගව ගතයුතු වේ.
ලෞහ භස්ම සමබරක් ගත යුතු ය.

සංස්කරණය:— චූර්ණකොට ගන්නේ යි.

ප්‍රයෝග:— විශේෂයෙන් ප්‍රමේහ පිඩකා නසයි: වාතරක්ත, සයාකාර අර්ශස්, චර්මරෝග නාශක යි.

මාත්‍රාව:— රති 3–6 දක්වා සුදුසු මාත්‍රාවකින් දිය යුතු වේ. (මි:ග්‍රෑ: 375–750).

14. යෝග නාමය— **සප්තාමෘත ලෞහය.**

යෝගය—

වැල්මී භාග 1 යි,
තිපල් (ප්‍රත්‍යෙකව) භාග 1 යි,
ලෞහ භස්ම භාග 4 යි,

සංස්කරණය:— ගිතෙල්, මීපැණි, දෙකින් අඹරා ගෙන සේවනය කරන්නේ ය.

ප්‍රයෝග:— වමන, තිමිර රෝග, ශූල, අම්ලපිත්ත, ජ්වර, ක්ලාන්ත, ආනාහ, මූත්‍රබද්ධතා, ශෝථ යන රෝග නසන්නේ ය.

අනුපාන:— එළකිරි සමඟ ය.

මාත්‍රාව:— මදට 5–15 දක්වා යි. (ග්‍රෑම් 1.25–ග්‍රෑම්ස් 3.75)

15. යෝග නාමය:— **සර්වජ්වරහර ලෞහය.**

යෝගය:—

රත්නෙටුල්,
තිපල්,
තිකුළු,
වළහසහල්,
කලාදුරුඅල,
ගජතිප්පිලි,
තිප්පිලිමුල්,
සැවැන්දරා,
දේවදර,
බිංකොහොඹ,
දියමිත්ත,
කටුකරෝහන,
කටුවැල්බටු,
මුරුංගා ඇට,
වැල්මී,
කෙළිදහාල්,—සමභාගව,
බරට බරක් ලෞහ භස්ම ගත යුතු යි.

සංස්කරණය:— සියල්ල චූර්ණකොට ගන්නේ ය.

ප්‍රයෝග:— වාත, පිත්ත, කළු සහ සන්නිපාතික, ද්වන්ද්වජ, විෂමජ්වර, ශීත, කම්ප, තෘෂ්ණාදෙෂ, ප්‍රස්වේද, වමන, භ්‍රම, රත්පිත්, අතීසාර, මන්දග්නි, කාස, ප්ලීහ, යකෘත්රෝග, ගුල්ම, ආමවාත, අර්ශස්, උද්ගාර මූර්ච්ඡා පාණ්ඩු, හලීමක, අජීර්ණ, ග්‍රහණි, යක්ෂ්මා, ශෝථ යන රෝග නසයි. බල්‍ය යි. වෘෂ්‍ය ය. පුෂ්ටි කරද වේ.

මාත්‍රාව:— මංචාඩි 1–2 යි. (මි:ග්‍රෑ: 250–500)

පර්පටි ඛණ්ඩය

1. යෝග නාමය:— **පඤ්චාමෘත පර්පටිය.**

යෝගය:—

ශොධිත ගන්ධක	තෝලා 8	යි.	(ග්‍රෑම් 96)
ශොධිත රසදිය	තෝලා 4	යි.	(ග්‍රෑම් 48)
ලෞහ භස්මය	තෝලා 2	යි,	(ග්‍රෑම් 24)
අභ්‍ර භස්මය	තෝලා 1	යි,	(ග්‍රෑම් 12)
තාම්‍ර භස්මය	තෝලා 1/2	යි,	(ග්‍රෑම් 6)

සංස්කරණය:— රසදිය ගන්ධක කජ්ජලිකොට එයට ද්‍රව්‍යයන්ගේ චූර්ණය ද ලා මිශ්‍රකර පර්පටි නිර්මාණ ක්‍රමය අනුව පිළියෙල කර ගත යුතු වේ.

ප්‍රයෝග:— නානා වර්ග ග්‍රහණී රෝගයනට ද, අර්ශස් රෝග අවස්ථාවනට ද, වමනය, විරෝත්පිත අතිසාරය, ජ්වරය, රක්තපිත්තය, ක්ෂය යන උපද්‍රවයනට ද යෝග්‍ය වේ. තවද මේ යෝගය ශරීරය වෘෂ්‍ය කෙරෙයි. පැසිගිය කෙස් කළු කෙරේ. නේත්‍රරෝගයනට ද හිතවති.

අනුපානය:— මීපැණි සමඟ ගිතෙලින් යෙදිය යුතු වේ. රසපර්පටි ප්‍රයෝගයෙහි දි එන පථ්‍යාපථ්‍ය විධිය ද සලකත්

මාත්‍රාව:— තේය. ගුඤ්ජා 2–8 දක්වා (මි:ග්‍රෑ: 250–ග්‍රෑම් 1) ක්‍රමයෙන් වර්ධිත මාත්‍රාව යොදන්නේය.

2. යෝග නාමය:— **රස පර්පටිය.**

යෝගය:— ශෝධිත රසදිය,
ශෝධිත ගන්ධක, සමාන භාගව ගන්නේ වෙයි.

සංස්කරණය:— රසදිය ගන්ධක මනාව කජ්ජලිකොට එය ගිතෙල් ආලේප කළ ලෞහ හට්ටියක බහා බදර (මසන්) දරින් ගිනි දී උණු කළ යුතුය. ලෝහ හැන්දකින් මිශ්‍ර කරමින් ද්‍රවතාවයට වත් එය අමු ගොම පිඩක් මත එලා ලූ ලා කෙසෙල් පතක් මත හෙළා තවද ගොම පිඩක් කෙසෙල් පතක දවටා එයින් පර්පටි (පප්පඩම්) ආකාරය වන සේ පැතලි කර ගත යුතු වේ. පසුව නිවී ගිය එය මනාව සුණු කොට වීදුරු බඳුනක අසුරා තැබිය යුතු වේ.

ප්‍රයෝගය:— ග්‍රහණීරෝග සඳහා විශේෂයෙන් හිතවත් වේ. ක්ෂය, කුෂ්ඨය, ශොථ, අජීර්ණ ආදි උපද්‍රව අවස්ථා සඳහා ද මනාය.

අනුපානය:— යෝගය–ගැනීමෙන් ඉක්බිතිව පූග (පුවක්) සේවනය ද, දෙවැනි තෙවැනි අවස්ථාවන්හි දී මාංසරස, කිරි, ගිතෙල් ප්‍රයෝගය ද සුදුසු වේ. සිනි, සූකිරි සහිත කිරි අධිකව බීම අනුදන්නා ලැබේ. විදාහි ආහාර, ස්ත්‍රී සේවනය, කෙසෙල් ශාක සහ පක්ව ඵල, අබ තෙල, කෘෂ්ණ මත්ස්‍ය, පක්ෂිමාංස, අධික නිද්‍රාව අත් හරින්නේ ය. අපථ්‍ය හෙයිනි. වතුර, ලුණු, සේවනය ද අහිතය. අධික පිපාසාවට කුරුම්බා වතුර දිය යුතු ය.

මාත්‍රාව:— රක්තිකා 2–10 (මි:ග්‍රෑ: 250–ග්‍රෑම් 1.25) දක්වා ක්‍රමයෙන් වර්ධිත මාත්‍රාව යෙදිය යුතුය.

3. යෝග නාමය:— **ලෞහ පර්පටිය.**

යෝගය:—

ශෝධිත රසදිය	භාග 1 යි,
,, ගන්ධක	භාග 1 යි,
,, ලෞහ භස්මය	භාග 1 යි,

යන ද්‍රව්‍යයන්ගෙන් සමන්විත වේ.

සංස්කරණය:— රසදිය ගන්ධක කජ්ජලිකොට එයට ලෞහභස්මය ද මිශ්‍රකොට රස පර්පටි පිළියෙල කර ගන්නා අයුරින් සකසා ගත යුතුය.

ප්‍රයෝගය:— සාධ්‍ය සහ අසාධ්‍ය දුෂ්කර වූ ග්‍රහණී රෝග අවස්ථා සඳහා යෝග්‍ය වේ. තවද, සූතිකා රෝග, පුරාතන, ජ්වර, ආමශූල, අතිසාර, පාණ්ඩු, කාමලා, ප්ලීහරෝග, අග්නිමාන්ද්‍යය, ආමවාත, උදවර්ත, ගරවිෂ, කුෂ්ඨ ආදි රෝග අවස්ථාවනට ද සුදුසු වේ.

අනුපාන:— ශීත ජලයෙන් හෝ කොත්තමල්ලි, සුදුදුරු ක්වාථයෙන් හෝ අනෙක් යෝග්‍ය අනුපානයකින් හෝ යෙදිය හැකි වේ.

මාත්‍රාව:— රක්තිකා 1–10 (මි:ග්‍රෑම් 125–ග්‍රෑම් 1.25) දක්වා ක්‍රමයෙන් වර්ධිත මාත්‍රාව යොදනු උචිත වේ.

4. යෝග නාමය:— **විජය පර්පටි.**

යෝගය:—

ශෝධිත ගන්ධක	භාග 8	යි,
පාරද	භාග 4	යි,
රජත භස්ම	භාග 2	යි,
ස්වර්ණ භස්ම	භාග 1	යි,
වෛක්‍රාන්ත භස්ම	භාග 1/2	යි,
මුක්තා භස්ම	භාග 1/2	යි,

සංස්කරණය:— සියල්ල එකට අඹරා ලෞහ බඳුනක බහා මසන් දරඅඟුරු වලින් උණුකොට පර්පටි සංස්කරණය අනුව සාද, අඹරා ගත යුතු යි.

ප්‍රයෝග:— ප්‍රවාහිකා, ග්‍රහණි හා පුරාණ අතිසාරයෙහි මනා ය.

මාත්‍රාව:— රක්තිකා 2 යි. (මි:ග්‍රෑ: 250 යි).

5. යෝග නාමය:— **මණ්ඩූර පර්පටි.**

යෝගය:— ශුද්ධ පාරද පල 1 යි, (ග්‍රෑම් 60) ශුද්ධ ගන්ධක පල 2 යි. (ග්‍රෑම් 120)
මණ්ඩූර භස්ම පල 1 යි. (ග්‍රෑම් 60)

සංස්කරණය:— පළමුව පාරද ගන්ධක කජ්ජලිකොට ඉන්පසු මණ්ඩූර භස්ම යොද දිනක් අඹරා පසුව පර්පටි විධානයෙන් පර්පටිය සාද ගන්නේ ය.

ප්‍රයෝග:— පාණ්ඩු, කාමලා, යකෘත් — ප්ලිහ රෝග, ශෝථ, ග්‍රහණි, මන්දග්නි රෝගයන්හි යෙදේ.

මාත්‍රාව:— රති 1–3 දක්වා ය. (මි: ග්‍රෑම් 125–375 දක්වා)

6. යෝග නාමය:— **ස්වර්ණ පර්පටිය.**

යෝගය:—

ශෝධිත රසදිය	පල	1 යි,	(ග්‍රෑම් 60)
ගන්ධක	පල	1 යි,	(ග්‍රෑම් 60)
ස්වර්ණ භස්මය	තෝලා	1 යි,	(ග්‍රෑම් 12)

සංස්කරණය:— රසදිය, ස්වර්ණ මනාව අඹරා එයට ගන්ධක යොද යලි අඹරා හෙවත් කජ්ජලිකොට පර්පටි නිර්මාණ විධි අනුව පිළියෙල කරගත යුතු ය.

ප්‍රයෝගය:— විවිධ ග්‍රහණි රෝග සඳහා ශ්‍රෙෂ්ඨ වේ. විශේෂයෙන් ග්‍රහණි යුක්ත ක්ෂය රෝගයට ද, අෂ්ටවිධ ශූලය උදෙසා ද, වෘෂ්‍යතාවයට ද යෝග්‍ය වේ. යකෘත් ප්‍රදහ සහිත කමලාවට විශේෂ වේ.

අනුපාන:— යෝග්‍ය අනුපානයක් අවස්ථාවට සුදුසු පරිදි ප්‍රයෝග කරන්නේ ය.

මාත්‍රාව:— රක්තිකා 1 සිට 10 (මි:ග්‍රෑම් 125–ග්‍රෑ: 1.25) දක්වා ක්‍රමයෙන් වර්ධිත මාත්‍රාව දක්වා යෙදිය හැකි වේ.

7. යෝග නාමය:— **තාම්‍ර පර්පටි.**

යෝගය:—

තාම්‍ර භස්ම	කර්ෂ 3	(ග්‍රෑම්	45 යි.)
ශුද්ධ පාරද	කර්ෂ 3	(ග්‍රෑම්	45 යි.)
ශුද්ධ ගන්ධක	කර්ෂ 6	(ග්‍රෑම්	90 යි.)
ශුද්ධ වච්චනාවි චූර්ණය	කර්ෂ 1	(ග්‍රෑම්	15 යි.)

සංස්කරණය:— පළමුව පාරද ගන්ධක කජ්ජලි කොට ඉන්පසු අනිත් ද්‍රව්‍ය සමඟ දවසක් ම අඹරා ඊට පසු පර්පටි පරිභාෂාවෙන් පර්පටි කරන්නේ ය.

ප්‍රයෝග:— අතිසාර, ග්‍රහණි, ප්‍රමේහ, පාණ්ඩු, ශූල, ශ්විත්‍ර, යකෘත්රෝග, ප්ලිහ රෝගාදියෙහි යෙදේ.

අනුපාන:— අතිසාරයෙහි බිල්වාදි චූර්ණය සමඟ, පාණ්ඩු — ග්‍රහණි රෝගයන්හි ශතපත්‍රාදි චූර්ණය සමඟ මේ අයුරු ඒ ඒ රෝගයනට හිත චූර්ණ ආදිය සමඟ යෙදේ.

මාත්‍රාව:— රති 1–3 (මි:ග්‍රෑම් 125–375) දක්වා උදේ සවස සීනි එන්සාල් හෝ සුදුරු බැද ගත් සුණු සමඟ වේ.

වටි – වටිකා ඛණ්ඩය

''වටක, ගුටිකා, මෝදක, වටිකා, පිණ්ඩී, ගුඩ, වර්ති යන මේවා වටිකා පර්යායයෝ වෙති. (ශා. සං.) දේශීය වශයෙන් ගුලි හෝ කල්ක කරල් පෙති වශයෙන් සංස්කරණය ඒ ඒ වට්ටෝරු සමග සඳහන් ය.

1. යෝග නාමය:— **අතිසාර වටී (I)**

යෝගය:—

ඉඟුරු,
අතිවිඩයම්,
සාදික්කා,
කරාබු,
වසාවාසි,
තිප්පිලි,
ගම්මිරිස්,
සහිඳලුණු,
කළුදුරු,
අසමෝදගම්,
සුදුරු,
කයිප්පු,
කෙළිඳසාල්,
ලුණුඅඹඇට මද,
අට්ටික්කා දළු,
මාදම් දළු,
අළුකෙහෙල්අල,
මයිලමල්,
එලඉඹුල් මැලියම,
කලන් 2 (ග්‍රෑම 10) බැගිනි.

සංස්කරණය:— කලාඳුරු අල පල 12 (ග්‍රෑම 720) ක් ගෙන කොටා යුෂ මිරිකා ඒයුෂින් භාවනා යුක්තව දින තුනක් අඹරා මංචාඩි 1 ක් පමණ ගුලි කරන්නේ ය.

අනුපාන:— කලාඳුරු අල කෂාය හෝ අවස්ථා අනුව වෙනත් සුදුසු අනුපානයකින් දෙන්න.

ළදරු අතිසාරයට:— වදකහ, කලාඳුරු, ඉඟුරු, පත්පාඩගම්, රසකිඳ, සැවැන්දරා මුල්, කෂායෙන් ගුලි යොද දෙන්න.

මාත්‍රාව:— ගුලි 1–4 දක්වා වේ.

2. යෝග නාමය:— **අතිසාර වටී (II)**

යෝගය:—

ඉඹුල් මැලියම්	භාග 2	—	කලන් 2 (ග්‍රෑම 10) යි.
සාදික්කා මද	භාග 2	—	කලන් 2 (ග්‍රෑම 10) යි.
අබින්	භාග 1/2	—	කලන් 1/2 (ග්‍රෑම 2.5) යි.

සංස්කරණය:— තරමක බෙලි ගැටයක් ගෙන ඇස්ස කපා මදය තරමක් අස්කර ඉහත සඳහන් කිරාගත් ඖෂධ අඹරා බෙලි ගෙඩිය මැද තබා ඇස්ස වසා රත් කළ කෙහෙල් කොලයක් එහි ඔතා කෙහෙල් පට්ටයකින් වෙළා මැටි ආලේපකොට, ගිනි අඟුරු මැද තබා, පැය 1/2 ක් තම්බා, නිවුනාට පසු, මැටි කඩා පියන් පත හැර, බෙලි මදයත් සමඟ මීපැණියෙන් අඹරා රක්තිකා තරමට ගුලි කරන්නේ ය.

ප්‍රයෝග:— පචයමාන, පක්වාතීසාර සඳහා යෙදේ.

විශෙෂ අනුපාන:— බෙලිගැටමද, කලාඳුරු අල තැම්බූ වතුර සමඟ ය.

මාත්‍රාව:— ගුලි 1 – 2 දක්වා අවස්ථාවට අනුව සුදුසු අනුපානයකින් යොදන්න.

3. යෝග නාමය:— **අබිං ගුලිය.**

යෝගය:—

කළුදුරු,
අසමෝදගම්,
දත්ත
රතුලූනු,
රත්හඳුන්,
ත්‍රිජාත,
වදකහ,
කොත්තමල්ලි,
සව්දලුණු,
කංසාකොළ,
අබිං,
සස්සඳ,
ක්‍රිමිශත්‍රු,
උළුහාල්,
පෙරුංකායම්,
සස්සඳමුල්,
කුඹුරුඇටමද,
දෙහිඇට මද,
වළහසාල් ඇට මද,
වැල්මී,
දෙඩංදළු,
දෙහිදළු,
නස්නාර, දළු, — මදට 5 (ග්‍රෑම 1.25) බැගිනි.

මාත්‍රු:— කුඹුරුකොළ යුෂ,
කොහොඹකොළ යුෂ,
මේ යුෂයෙන් අඹරා රක්තිකා 1 ක් (මි: ග්‍රෑම 125) පමණ ගුලි කර ගත යුතු යි.

ප්‍රයෝග:— ක්‍රිමි රෝග සඳහා යි. වමන හා ආම අතිසාරයට යෙදේ.

මාත්‍රාව:— වටිකා 1 යි.

4. යෝග නාමය:— **ආකාරකරභාදි වටිය** (කුංකුමාදි වටී).

යෝගය:—
අත්‍රපට්ටා, තිප්පිලි,
වියලිඉඟුරු, සාදික්කා,
කපුකිනිස්සඇට, කරාබු,
කුංකුමප්පු, සුදුහඳුන් කර්ෂ 1 (ගෑම 15) බැගිනි.
අහිඵේන පල 1 (ග්‍රෑම 60) යි.

සංස්කරණය:— උණු දියෙන් අඹරා. යලි මීපැණියෙන් අඹරා රක්තිකා 2 ප්‍රමාණ ගුලි කරන්නේය.
ප්‍රයෝග:— ස්වප්න මෝචනයට විශේෂයෙන් ගුණ යි, ධාතු ස්තම්භන ය.
මාත්‍රාව:— ගුලි 1 යි.

5. යෝග නාමය:— **කිංශුක වටිය** —

පලාශබීජ භාග 01 යි, අසමෝදගම් භාග 01 යි.

මාත්‍රාව:— රක්තිකා 03 — 04 දක්වා ය.

සර්වප්‍රකාර අභ්‍යන්තර ක්‍රිමි රෝගයන්හි විශිෂ්ට ඵලදායක ය. ඉයොසිනකාමයෙහි (Eosinophilia) හි අතිශයින් මැ ඵලදය කබව කල්කටා අෂ්ටාංගායුර්වෙද විද්‍යාලයානුබද්ධ ආරෝග්‍යශාලාවෙහි පර්යේෂණාත්මක වැ ඔප්පු වී තිබේ. ලංකාවෙ පලාශ බීජදුර්ලභ නිසා එරබදුඇට ප්‍රතිනිධිය වශයෙන් යෙදේ.

6. යෝග නාමය:— **කෝල දවුණ්ඩය.**

යෝගය:—
දෙදුරු,
අසමෝදගම්,
පෙරුංකායම්,
අතිවිඩයන්,
පුස්කර,
ත්‍රිජාත,
ත්‍රිවර්ග,
සුදුලූනු,
වියලි ඉඟුරු,
කුකුළුසුඟු,
සොත්තලල්ලි,
කොට්ටම්,
තිප්පිලි,
පල්මානික්කම්,
සවිඳලුණු,
වාල්මොලගු ඇටමද,
අත්‍රපට්ටා,
මාසක්කා,
කටුකරෝසන,
වැල්මී,
සිරිතේක්කු,
තිපල්.
වළගසාල් ඇටමද,
මනෝසිල,
සිනක්කාරම,
සන්නිනායම්,
කෙළිඳහාල්,
පෙනෙලගෙඩියේ පොතු,
ගම්මිරිස්,
අබින්,
වැල්තිබ්බටු මුල් — සමභාගව කිරා ගත යුතු වේ.

සංස්කරණය:—
1. ඇඹුල්දෙඩන් යුෂ,
2. තැඹිලි දිය,
3. මී පැණි,
4. ගිතෙල්,

යන ද්‍රවයන්ගෙන් දින බැගින් අඹරා ගත යුතුයි. ඉන්පසු කල්කය දෙකට බෙද කොටසක බරට ශුද්ධ ජයපාල ගෙන එක කොටසක් සමඟ දිම්බිප්පු, බිම්මුල්, කෂායෙන් අඹරා ගන්න. එය විරේක කෝල දවුණ්ඩය යි. අනෙක් කොටස (ජයපාල රහිත) වෙනම අඹරා ගුලි කර පවනේ වියලා ගන්න. එය පත්තියම් පංගුවයි.

ප්‍රයෝග:— ත්‍රිදෙෂ ජනිත රෝග සුව කෙරේ. කළු-වාතරෝග, පිත්ත-සළු රෝග, සූතිකා සන්නි, කෝල වලිප්පු ඉලප්පු, වාතවේදනා හා වෙනත් සූතිකාරෝග, බිළිඳුන්ගේ සන්නි කෝල වලිප්පු, පිටගැස්ම, හනුපූට්ටු, ගොළුවීම, වෙව්ලීම, අතීසාර, කළුඅක්කාරම්, හික්කා අන්තරායාම, බහිරායාම, වාත රෝග, විෂමජ්වර (මුර උණ) නසන්නේය.
අනුපාන:— තනකිරි, මීපැණි, ගිතෙල්, හෝ රෝගයට හිත ක්වාථ හා දළු අනුපානයන් සමඟ ගුලි දිය හැකි වේ.
මාත්‍රාව:— රක්තිකා ප්‍රමාණ ගුලි 1–4 (මි:ග්‍රෑම් 125-500) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

7. යෝග නාමය:— **ගොපලු ගුලිය.**

යෝගය:—
තිකුළු,
තිපල්,
අබ,
සුදුලූනු,
දෙදුරු,
අසමෝද,
තිවග,
කොට්ටම්,
වදකහ,
කෙළිඳසාල්,
අතිවිඩයන්,
වළගසාල් ඇට මද,
(ග්‍රෑම් 5.) කලඳ බැගිනි.

සංස්කරණය:— එලකිරෙන් තම්බාගත් කෝන්තාලන් (ගොපලු) ඇට ගෙන වියලා, කලන් 19 (ග්‍රෑම් 95) යි. නික කොළ යුෂින් අඹරා රක්තිකා තරමට ගුලි කරන්න.

අනුපාන:—
උණට, මුර උණට — ඉඟුරුයුෂින් ද පැපිලිය කිඳි කෂායෙන් ද දෙන්න.
වෙව්ලුම් උණට:— — තොටිලපොතු කෂායෙන් දෙන්න.
දහ පිත් උණට — කිඳි කෂායෙන් දෙන්න.
කළුජ්වරයට — කළුදුරු කෂායෙන් දෙන්න.
අතීසාරයට — උඳුපියලි යුෂයෙන් දෙන්න.
ග්‍රහණී අතීසාරයට — කෙළිඳ කෂායෙන් දෙන්න.

මාලේට — නාරම්මල් කෂායෙන් දෙන්න.
ඇව්ලිල්ලට — සුදුලූනු වතුරෙන් දෙන්න.
මුත්‍ර බද්ධයට — සුදුහඳුන් කෂායෙන් දෙන්න.
ආමාතිසාරයට — කලාඳුරු, දියමිත්ත, කෙළිඳඇට කෂායෙන් දෙන්න.
ලේ අතිසාරයට — කිරිඅඟුන, වැල්මී, ලොත්, වැල්මදට, කෂායෙන් දෙන්න.

මාත්‍රාව :— ගුලි 1 — 3 දක්වා වේ.

8. යෝග නාමය :— **ජීවානන්ද ගුලිය.**

යෝගය :—
අබ,
තිකුළු,
පෙරුංකායම්,
සව්ඳලුණු,
වදකහ,
තිවග,
වළඟසාල් ඇටමද,
සුදුලූනු,
අසමෝදගම්,
අබින්,
කොත්තමල්ලි
තිපල්,
ගලිස්,

සංස්කරණය :— සමභාගව ගෙන සියුම්ව චූර්ණකර ගත යුතු ය. පසුව, අමුඉඟුරු යුෂ, එරබදු කොළ යුෂ යන මේවායින් දින දෙකක් අඹරා රක්තිකා 1 ක් (මි. ග්‍ර. 125) පමණ ගුලි සාද පවනේ වියලා තබා ගන්නේ ය.

ප්‍රයෝග :— බිළිඳුන්ගේ බඩේ කැක්කුම, වමනය, විසූචිකා, ක්‍රිමිරෝග, සන්නි, වලිප්පු, උල්ලෝගම්, යන රෝග සුව කරයි.

අනුපාන :—
1. ගැටතුඹ, ඉඟුරු යුෂ සහ මී පැණියෙන් ගුලි දිය යුතු වේ.
2. ගොටුමුල්, සුදුලූනු, ඉඟුරු කොටා වණ්ඩුවේ තම්බා යුෂ ගෙන විලඳ කුඩු මීපැණි එක්කර ගුලි යොද දෙන්න.
3. මීන්චි, සුදුලූනු, බෙලිමුලේ පොතු යන ද්‍රව්‍ය කොටා, කඩපිම්මෙ තම්බා යුෂ මිරිකා මීපැණි මුසු කොට ගුලි යොද දෙන්න. යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට සුදුසු අනුපානයකින් දෙන්න.

මාත්‍රාව :— ගුලි 1/2 – 2 දක්වා වේ.

9. යෝග නාමය :— **දළුපණු ගුලිය.**

යෝගය :—
කොහොඹඇට මද,
කුඹුරුඇට මද,
කන්සා ඇට,
ලුණුදෙහි ඇට මද,
දෙහිදළු,
නිකදළු,
කොහොඹදළු,
කුඹුරුදළු,
කන්සාදළු,
සුදුරු,
කළුදුරු
පෙරුංකායම්,
අසමෝදගම්,
සුදුලූනු,
තිප්පිලි,
කරාබු,
වසාවාසි,
සාදික්කා,
සමභාගව ගත යුතුය.

සංස්කරණය :— සියල්ල චූර්ණකොට දෙහි ඇඹුලෙන් අඹරා මංචාඩි 1 ක් (මි: ග්‍රෑ: 250) පමණ ගුලි කරන්න.
ප්‍රයෝග :— ළදරුවන්ගේ හා ලමයින්ගේ පණු වමන, අතීසාර, අජීර්ණ, අග්නිමාන්ද්‍ය, බඩරුජා ආදියට යොද්
අනුපාන :— දෙහි ඇඹුල් සමඟ ය.
මාත්‍රාව :— ගුලි 1 — 4 දක්වා වේ.

10. යෝග නාමය :— **දියතාරාමය.**

යෝගය :—
දෙදුරු,
තිවග,
අතිවිඩයන්,
පල්මාණික්කම්,
යිනක්කාරම්,
වාල්මොලඟුඇටමද,
අසමෝදගම්,
පුස්කර,
මාසක්කා,
පෙරුංකායම්,
කටුකරෝසන,
තිකුළු,
සෙව්වෙල්කොඩි,
වළඟසහල්ඇටමද,
වැල්මී,
රිදීතුත්තන්,
සිරිතේක්කු,
සව්ඳලුණු,
කොත්තමල්ලි,
ඉඟිනිඇට,
වැලිතිබ්බටුමුල්,
සිවියමුල්,
කුංකුමප්පු,
සුදුලූනු.
රත්නිවුල්, ශුද්ධ නවසාරම් — සියලු ද්‍රව්‍ය මදට 10 (ගු: 2.5) බැගින් ගත යුතු ය.
රත්හඳුන් කලං 1 (ගු: 5) යි. පෙනෙලගෙඩි පොතු කලං 2 (ගු: 10) යි.

සංස්කරණය :—
1. කුප්පමෙනිය යුෂ,
2. දෙඩම් යුෂ,
3. තනකිරි,
4. ඉඟුරු යුෂ,
5. දිමිබිජු කෂාය,
6. බිම්මුල් කෂාය,
7. මීපැණි,
8. ගිතෙල්.
9. කොහොඹතෙල්.

යන ද්‍රව්‍යයන්ගෙන් ඉතා සිනිඳුව, අඹරා සමාන කොටස් දෙකකට බෙද එක් කොටසක බරට ශුද්ධ ජයපාල ගෙන අඹරා ගත යුතු වේ. එය විරේක පංගුව වේ. අනෙක් කොටය ජයපාල රහිතව අඹරා ගත මැනවි. එය පථ්‍ය කොටස යි. පත්තියම් පංගුව මංචාඩි 1 ක් (මි:ග්‍රෑ: 250) පමණට ගුලි තනනු.

ප්‍රයෝග :— සියළු කෝල, යන්නි, වලිප්පු, ඉලප්පු, සෙම් කිපීම, පිපාස, නෙත් රතුවීම, උමතු, දෙඩවීම, ඇවිලිලි, තදඋණ, තෘෂ්ණා, අතීසාර, බඩරුජා, අන්තරායාම, බහිරායාම, ඇඹුම හනුවැටීම, සූතිකා රෝග, අක්කාටම්, කාස, ශ්වාස, හති කැක්කුන්, අරුචි යනාදි රෝගාබාධ සුව කරයි.

අනුපාන :—

1. ආඩතෝඩා කොළ කොටා, වණ්ඩුවේ තම්බා යුෂ තනකිරි ලා ගුලි දිය යුතු වේ.
2. පැවටටාකොළ, (ආඩතෝඩ)
   මලිඳකොළ,
   තනකිරි,
   සිනි,
   අමුඉඟුරු,
   රතුලූනු,
   කුප්පමේනිය — කොටා වණ්ඩුවේ තම්බා යුෂට,
   දෙඩම් ඇඹුල්,
   ගිතෙල් — සමග ගුලි දිය හැක.
3. සුදුහඳුන්,
   කටුකරෝසන,
   ඉඟිනිඇට,
   සුදුලූනු,
   වැල්මී,
   ආඩතෝඩා,
   වැල්තිබ්බටුමුල්,
   රතුලූනු,
   දිමිබිජු,
   බිම්මුල්,

මේ ද්‍රව්‍ය තනකිරෙන් අඹරා හෝ ක්වාථ සාද තනකිරි ගුලි මිශ්‍රකර දෙනු ලැබේ.

මාත්‍රාව :— ගුලි 1 — 3 දක්වා දිය හැකි ය.

11. යෝග නාමය :— **නාගරාජ ගුලිය.**

යෝගය :—

නෙරිවිෂ,
පුස්කර,
රසදිය,
කිරිගරුඬ ගල්,
තිත්ත ලබුඇට,
තිත්ත වැටකොළු ඇට,
කුළුබඩු පස (ප්‍රත්‍යෙකව).
දෙදුරු,
පාෂාණම් පස්වගය (ප්‍රත්‍යෙකව),
ගන්ධක,

සංස්කරණය :— සියල්ල සමභාගව ගෙන සියුම් චූර්ණකොට, දෙහි ඇඹුල්, බුලත් යුෂ, මීපැණියෙන් වෙන් වෙන්ව අඹරා පනට පෙති හැඩයට වක්‍රිකා පිළියෙල කොට වියලා ගන්නේ යි. පසුව වායු නිවාරක බෝතලවල අසුරා තැබිය යුතු ය.

ප්‍රයෝගය :— සර්ප විෂ සඳහා, සර්පයා කෑ මුඛයෙහි තදකොට අලවන්නේ ය. පැය තුනකට පසු විෂ උරා ගැලවී වැටේ.

12. යෝග නාමය :— **පලු ගුලිය.**

යෝගය :—

අසමෝදගම්,
වදකහ,
ගම්මිරිස්,
සිවියමුල්,
කුඹුරුඇටමද,
යවක්ෂාර,
අතිවිඩයන්,
දෙදුරු,
අරළු,
කර්කටකශෘංගි,
මුඩමහණමුල්,
පුස්කර,
සව්දලුණු,
වියලිඉඟුරු,
තිප්පිලි,
වලගසාල්ඇට මද,
කොත්තමල්ලි,
සුදුලූනු
කටුකරෝසන,

සංස්කරණය :— සමභාගව කිරා ඉතා සියුම්ව සුණුකර තනකිරෙන් අඹරා කල්කය සාද ගත යුතු ය. පසුව පෙති ලෙස රක්තිකා 1 — ක් පමණ (මි: ග්‍රෑ: 125) පිළියෙල කරගත යුත්තේ ය.

ප්‍රයෝග :— කුඩාදරුවන්ගේ බඩ උත්තිල, බඩරුජා, වමන, කිරිමැලියම්, උණ, ශෝථ, ගුල්ම, පණුරෝග, අජීර්ණ, ඉල්ප්පු, අතිසාර, වාතරුජා, ඇනුම, සහ බැරන්ඩි යන රෝග ගුණ කෙරේ.

අනුපාන :— තනකිරි හෝ සුදුසු කෂායක් සමඟ යෙදිය හැකි වේ.

මාත්‍රාව :— පෙති 1 — 2 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

13. යෝග නාමය:— **පිප්පලාදි ගුලිය :—**

තොවිල ඇට, දුම්මැල්ල මුල්, අති විඩයම්, කළු දුරු, සුදුදුරු, සුදුලූනු, රතුලූනු, වලගසාල්, වැල්මී, කරාබු වසාවාසි, සාදික්කා, අබ, වදකහ, ඉරමුසු මුල්, ගම්මිරිස්, මෙම ද්‍රව්‍ය සම භාගව, සියල්ල බරට තිප්පිලි මේ සියල්ල බරට සුදුහඳුන් දෙබරක්, රත්හඳුන් සුදුහඳුන් බරට අති සියුම් චූර්ණය පළමුව තන කිරෙන්ද ඉන්පසු අබ තැම්බූ වතුරෙන් ද අඹරා ගලේම වේලෙන්ට ඇර යලි මීපැණි ගිතෙල් සමඟ අඹරා මුංඇට පමණට ගුලි කරන්න (වටිකා ප්‍ර)

ගුණ :— ළදරුවන්ගේ අධික සෙම්කෝප උණ ඇදුම ආදියෙහි සුදුසු අනුපානයක් සමග යෙදේ. සෙම්කෝප සහිත [illegible] ප්‍රශස්ත ය.

14. යෝග නාමය :— **ශුක්තපාක වටිය.**

යෝගය :—

අසමෝදගම	භාග 2
අරළු	භාග 2
බුළු	භාග 2
සහිඳලුණු	භාග 1
වියන්ගුලිල	භාග 1

චූර්ණ කොට උණුදියෙන් අඹරා කලං 1/2 ට (ග්‍රෑම් 2.5) ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— අජීර්ණ, අග්නිමාන්ද්‍ය, අරුචි, ආදියෙහි ගුලි 1 — 2 දක්වා ආහාරයට පසු වළඳන්නේ ය

15. යෝග නාමය :— **බුද්ධරාජ ගුලිය.**

යෝගය :—

සාදිලිංගම්
ගොදුරු,
කරාබු නැටි,
වසාවාසි,
සාදික්කා,
හිරියල්,
අබිං,
කුරිසි,
හිඟුරු,
මනෝසිල,
ගල්මද,
ගල්නහර
උලාඅරිසි,
කිංපල (සුවඳ කොට්ටන්)
වැල්මී,
පෙරුංකායම්
කටුකරෝසන,
පීතකරෝසන,
හිඟුරුපියලි,
අතිලඩයන්,
සවිඳුව
අක්‍රපට්ටා,

සංස්කරණය :— මෙවා සම බරව කිරාගෙන ඒ සියලු බර මෙන් දෙබරක් දෙසඳුන් කිරාගෙන හීන් මදුරුතලා කොල යුමින් අඹරා මීමල් ප්‍රමාණයට ගුලිකර පවන තබා වියලා සුරැකිව තබාගත යුතු ය.

ප්‍රයෝග :— සෙම් ඉලප්පු, නොබසින උණට, ඉලප්පුවට, ඇවිලිල්ලට, උණට, කෝලෙට, සන්නියට, යෝග්‍ය වේ.

අනුපාන :— යෝග්‍ය අනුපානයකින් අවස්ථාවෝචිතව බලා දෙන්න.

16. යෝග නාමය :— **මදුවලිප්පු ගුලිය.**

යෝගය :—

අයමෝදගම්,
කළුදුරු,
සුදුදුරු,
සිනාක්කාරම්,
වසාවාසි,
සාදික්කා,
කටුකරෝසන,
මාසක්කා,
පල්මානික්කම්,
රතුලූනු,
අක්කරපට්ට,
කරාබු,
සුදුලූනු,
ඉඟුරු,
ඉඟිනිඇට,
තිප්පිලි,
ගම්මිරිස්,
අරළු,
බුළු,
නෙල්ලි.

සංස්කරණය :— මෙම ද්‍රව්‍ය සියල්ල සමභාගව ගෙන එම සියල්ල බරට වැල්මී ගෙන චූර්ණකොට ගලෙහි ලා මීපැණියෙන් හා ගිතෙලින් අඹරා ගන්නේ ය. එය පත්තියම් පංගුව වේ. එම කල්කයෙන් හරි අඩක් ගෙන එම බරට ශුද්ධ ජයපාල යොද නැවත අඹරා ගන්නා ලද්දේ විරේක පංගුව ය.

ප්‍රයෝග හා අනුපාන:—
බිලිඳු වමනයට :— — ඇඹුල් දෙඩම් හා මීපැණි මිශ්‍රව ද,
නොබසින උණට :— — තනකිරි කොහොඹතෙල්, ගිතෙල් මිශ්‍රණයෙන් ද,
වමන ඔක්කාරයට :— — සස්සඳ යුෂ, ඇඹුල්දෙඩම් යුෂ, මීපැණි මිශ්‍රණයෙන් ද,
උණ කෝලෙට :— — රතුලූනු, කටුකරෝසන, සුදුලූනු, වැල්මී, කෂාය සමඟ ද,
බඩයාමට :— — අක්‍රපට්ටා, මාසක්කා, ඉඟිනිඇට, මෙවා කෂාය කර තලතෙල් සමඟද
සන්නි වලිප්පුවට :— — ඔළිඳ දළු, රතුලූනු, සුදුලූනු, ඉඟුරු, දෙඩම්පැහිරි, මෙවා තලා වණ්ඩුවේ තම්බා මිරිකා, තලතෙල්, ගිතෙල් ඇඹුල් දෙඩම් යුෂ, මීපැණි සහ ගුලි මිශ්‍රකර දෙන්නේ ය.

මාත්‍රාව :— මදට 1/2 — 1 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

සැ: යු :— විරේකය අවශ්‍ය තන්හි දී විරේක පංගුව යෙදිය යුතු වේ.

17. යෝග නාමය :— **මහාසන්නි වජ්‍රපාය ගුලිය.**

යෝගය :—

සාදිලිංගම්
හිරියල්,
වච්චනාවි,
බුළු,
නෙල්ලි,
පිදිකුන්තං,
සුවඳකොට්ටං,
අසමෝද,
සිනාක්කාරම්,
වැල්තිබ්බටුමුල්,
ගල්මද,
මහඅරත්ත.

මනෝසිල.
රසදිය,
ගෙන්දගම.
පුස්කර,
පෙරුංකායම්.
ශතපුෂ්ප.
වදකහ.
කරාබු,
සාදික්කා.
වසාවාසි.
ඉඟුරු,
ගම්මිරිස්.
තිප්පිලි.
අරළු,
පල්මානික්කං,
සුදුලූනු,
වෙනිවැල්ගැට.
සුදුහඳුන්,
වල්ගම්මිරිස්.
ජටාමාංස.
අතිවිඩයම්.
සුදුපාෂාණම්,
කොත්තමල්ලි,
කිරිගරුඬ,
සවින්දව,
යවකර,
බළල්ලුණු,
සුවසලුණු.
වළහසාල්ඇටමද,
කෘමිශත්‍රු.
කළුදුරු.
සුදුදුරු,
කුරුඳුපොතු.
කුඹුරුඇටමද,
කිරිකවඩිඅළු,
දේවදර,
කංසා,
අබින්,
නාමල්රේණු,
ඉඟිනිඇට,
කයිප්පු.
එන්සාල්,
වැල්මදට,
යකිනාරංමුල්,
දෙහිමුල්,
මදුරුතලාමුල්.
කුඹුරුමුල්,
නිකමුල්,
වෙලාමුල්,
අමුක්කරාමුල්.
ඇඹුල්දෙඩම්මුල්,
හීන්නාරන්මුල්.
කොල්ලු,
සාරණමුල්,
කහ,
කොහොඹමුල්,

මේවා සමභාගව ගෙන චූර්ණ කරන්න.

නිකකොළ,
කුඹුරු කොළ,
යකිනාරං කොළ,
ගැටතුඹ කොළ,
ඇඹුල්දෙඩම්,
මදුරුතලා කොළ,
වේලා කොළ,
වදකහ,
තනකිරි,
අමුඉඟුරු,

සංස්කරණය :— මෙම යුෂින් දින දින බැගින් වෙන වෙනම භාවනා යුක්තව අඹරා, රක්තිකා 1 (මී: ග්‍රෑ: 125) ක් පමණ ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— උණ, අතිසාර, වාත නසයි. ළදරුවන්ගේ සියළු රෝග හා විශෙෂයෙන් සූතිකා රෝග අවස්ථාව අනුව අනුපාන යොද ගුලි දෙන්න.

මාත්‍රාව :— වටිකා 1/2 — 1 දක්වා ළදරු මාත්‍රාව වේ. වැඩිහිටියන්ට වටිකා 1 — 2 දක්වා ය.

18. යෝග නාමය :— **මහාවර්තිකාව.**

යෝගය :—

දෙදුරු,
සුදුලූනු,
අසමෝදගම්,
උලාඅරිසි,
වියලිඉඟුරු,
පෙරුම්කායම්,
තිප්පිලි,
ගම්මිරිස්,
කුඹුරුමුලේ පොතු,
තිපල්.
තිවග,
පත්පාඩගම්,
කුඹුරුඇටමද,
දෙව්දුරු,
කුරුඳුපොතු,
වදකහ,
තල,
අබ,
වළහසාල්ඇටමද,
සුදුහඳුන්,
කයිප්පු,
නාමල්රේණු,
මලබුලත්කරල් හෝ නැටි,
නිකදළු,

සමභාගව කිරා ගත යුතු වෙයි.

සංස්කරණය :—

බුලත්කොළ යුෂ,
ඉඟුරු යුෂ,
නිකකොළ යුෂ,
මීපැණි,

යන ද්‍රව්‍යයන්ගෙන් අඹරා මංචාඩි 1 ක් (මී: ග්‍රෑ: 250) ප්‍රමාණ ගුලි සාද ගන්නේ ය.

ප්‍රයෝග :— වමනයට, ගොළු වන සන්නියට හා වෙනත් සන්නිරෝගයන්වද, ජ්වර, බඩරුජා, උදාවර්ත, (බඩඋත්තිල) අජීර්ණ, අතිසාර, කර්ණරෝග (කණ වත්කිරීමට), හිසරදයට (පිටින් නලලේ ගෑමට), සර්පවිෂට (කෑ මුඛයේ ගෑමට), උගුරේ රෝග, යනාදි ආබාධ වලට යෙදේ.

අනුපාන :— යෝග්‍ය පරිදි සුදුසු අනුපානයකින් යොදන්නේ ය.

මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා ය.

19. යෝග නාමය :— **මහ මාක්කුපහ.**

යෝගය :—

දෙව්දුරු,
අසමෝදගම්,
දෙදුරු,
තිවග,
තිප්පිලිමුල්,
තිකුළු,
සිනක්කාරම්,
ශතපුෂ්ප,
පිදිකුත්තං,
කටුකරෝසන,
සවිදලුණු,
වලහසාල්ඇටමද,
අතිවිඩයන්,
වදකහ,
කර්කටකශෘංගි,
මුන්ඇට,
සාදිලිංගම්,
තිපල්,
වැල්මී,
නවසාරන්,
අත්තනඇට,
නෙල්ලික්කාගෙන්දගම්,
වැල්මදට,
අහිඵේන = අබින්
කාන්තලෞහ = උෟසිකාන්දම්,
මාසක්කා,
මහදුරු,
සන්නිපායම්,
කයිප්පු,
අක්‍රපට්ටා,

කොරාසානි,
ගල්මද,
ගල්නහර,
යවක්ෂාර,
සිවංගුරු,
පල්මානික්කම්,
පුෂ්කර,
ගන්ධක,
මනෝසිල,
කොත්තමල්ලි,
කංසා,
නෙරිවිෂ,
සුදුහඳුන්,
රත්හඳුන්,
සුවඳකොට්ටන්,
හරිතාල,
සුරභි = ඉරමුසු,
ක්‍රිමිශත්‍රැ,
සුදුලූනු,
පත්පාඩගම්,
උළුහාල්,
කොල්ලු,
වියලිකහ,
ශස්ත්‍රවෙල්ලිය,
සවුක්කාරම්,
නිකමුල්,
කුඹුරුමුල්,
හරන්කහ,
කුඩුමිරිසමුල්,
කුරුඳුමුල්,

සංස්කරණය :— මේ ද්‍රව්‍ය සමභාගව ගෙන සිනිඳුව චූර්ණකර අමු ඉඟුරු යුෂ ,නිකකොළ යුෂ, යකිනාරන්කොළ යුෂ, තඹල කොළ යුෂ, මීපැණි යන ද්‍රව්‍යයන්ගෙන් අඹරා රක්තිකා 1 ක් (මි: ග්‍රෑ: 125) පමණ ගුලි සාද ගන්න.

ප්‍රයෝග :— සන්නි, කෝල, වලිප්පු, වමන, අතීසාර, කෙණ්ඩා පෙරලීම, තෘෂ්ණා, බිහිරිවීම, ශීත සන්නිය, සූතිකා රෝග, විලිරුද නැතිවීම, වැදෑමස නොවැටීම, හනුපුවටු, පිටගැස්ම, ඉලප්පු, දෙඩවිලි, කාස, ශ්වාස, ආදි සියළු රෝගයන්ට හිත වන්නේ ය. සූතිකා රෝගවලට විශෙෂ යි.

අනුපාන :— පඹුරු, දෙඩම් ආදි අනුපාන ආදිය.

මාත්‍රාව :— ගුලි 1 — 3 දක්වා යෝග්‍ය අනුපාන වලින් සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

20. යෝග නාමය :— **රත්නාදි ගුලිය :—**

යෝගය :—

ජීරක	මදටිය	1 යි.	(මි: ග්‍රෑ: 250 යි.)
වසාවාසි	,,	1 යි.	(මි: ග්‍රෑ: 250 යි.)
සාදික්කා,	,,	5 යි.	(ග්‍රෑම් 1.25 යි.)
අත්තනඇට,	,,	5 යි.	(ග්‍රෑම් 1.25 යි.)
කංසා ඇට,	,,	5 යි.	(,, 1.25 යි,)
කුඹුරුඇටමද,	,,	5 යි.	(,, 1.25 යි,)
මීමුරුවට	,,	3 යි,	(මි:ග්‍රෑ: 750 යි.)
ශුද්ධ සුදු පාෂාණම්	,,	4 යි.	(ග්‍රෑ 1 යි.)

සංස්කරණය :— මේ හැම බරට ශුද්ධ සාදිලිංගම් ගත යුතු ය. ඉඟුරු යුෂින් අඹරා රක්තිකා 1 ක් (මි: ග්‍රෑ: 125) පමණ ගුලි සාද පවනේ වියලා තබා ගත යුතු ය.

ප්‍රයෝග :— කෝල, සන්නි, වලිප්පු, කළු අක්කාරම්, දෙඩවිලි, හති, සූතිකා කෝලය, ජ්වර, ගොලුවීම, බිහිරිවීම, සූතිකාබඩරුජා, ජ්වර, අතීසාර, ප්‍රවාහිකා, ඇම්ම, අඩස්සි, රක්ත ප්‍රදර, මාන්දම් රෝග, හික්කා, විසූචිකා ආදි රෝග සුව කරයි.

මාත්‍රාව :— ගුලි 1/2 — 1 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට දිය යුතු යි.

21. යෝග නාමය:— **වරාල වර්තිකාව (කරල් ගුලිය)**

තිපල්,
තිවග,
අසමෝද,
මල්බුලත් නැට්,
ලසුණු,
ඉවද,
නිකදළු,

සමව කිරා හැම බරට ගම්මිරිස් ඇට ඉඟුරු යුෂින් අඹරා කරාබු නැටි සේ ගුලිකර ගන්න.

ගුණ :

දහ අට සන්නි, කෝල, වැදූ අයගේ බඩ කැක්කුම, සර්ප, දෙබර විෂට ඇස ලෑම. වමනය බඩයාළ ශීතලය, සහිත ජලසන්නියට ඉඟුරු යුෂ මීපැණි සමඟ.

22. යෝග නාමය :— **ශාන්ති රසය.**

යෝගය :—

කලාඳුරු,
වදකහ,
ඉඟුරු,
කළුදුරු,
අතිවිඩයන්,
කෙළිදඇට,
අරළු,
කරාබු,
වැල්මී,
තිප්පිලි,

සමභාගව තන කිරෙන් අඹරා රක්තිකා පමණ ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— ළදරුවන්ගේ ලවුන, බඩරුජා, කිරි පණුගාය, බඩ දූහලීම, වමන, ඔක්කාර, මාන්දම්විකාර, අතීසාර, සහ බඩින් යන සියළු රෝග ද සුව කෙරේ.

අනුපාන :— තන කිරි,

මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට.

23. යෝග නාමය :— **සන්නි ගජාංකුසය.**

යෝගය :—

වච්චනාවි,
රසදිය,
පුස්කර.
නාමල්රේණු,
සවිඳලුණු,
සුදුපාෂාණම්,
අක්‍රපට්ටා,
කටුකරෝසන.
ඉඟුරු,
ගම්මිරිස්,

පල්මාණික්කම්, මදට 5 (ග්‍රෑම් 1.25) බැගින් කිරා සුණුකොට ගත යුතු වේ.

සංස්කරණය :— ඒ සියළු බරට සාදිලිංගම් ගත යුතුයි. එම සියළු ද්‍රව්‍ය බරට රත්සඳුන් ගත යුතු යි. ඒ සියළු ද්‍රව්‍ය බරින් අඩක් කරිවිල ඇට මද, උණු අළුයට තබා තම්බාගත් කරිවිල යුෂ, දෙහි යුෂ, තනකිරි, කොහොඹතෙල්, යන ද්‍රව්‍යයන්ගෙන් දින බැගින් අඹරා රක්තිකා 1 ක් ප්‍රමාණ ගුලි සාද පවනේ වියලා තබා ගන්නේ ය.

ප්‍රයෝග :— නොබසින උණ, වාත කඵාධික ජ්වරය, සන්නිපාත ජ්වර, ආක්ෂේපක ජ්වරය, පණ්ඩුරෝගාගත ජ්වර ආදි උග්‍ර අවස්ථාවනට යෝග්‍ය වේ.

අනුපාන :— තනකිරි, කොහොඹතෙල්, ආදි රෝගයට හිත අනුපාන සමඟ යෙදේ.

මාත්‍රාව :— ගුලි 1/2 — 1 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට දෙනු ලැබේ.

24. යෝග නාමය :— **සීතාරාමය.**

යෝගය :—

සුදුදුරු,
කළුදුරු,
අසමෝදගම්,
මහදුරු,
ශතපුෂ්ප,
වියලි ඉඟුරු,
ගම්මිරිස්
තිප්පිලි,
කරාබු,
වසාවාසී,
සාදික්කා,
නෙරිවිෂ,
සුවඳකොට්ටම්,
වැල්මී
හිංමදුරුතලා,
නික
වේලා.
කුඩුමිරිස,
කොහොඹ,
තුඹ,

මේවා එක වගෙන් කලං 5 (ග්‍රෑ. 25) බැගිනි).

මෙම දළු හය වගය පවනේ වේලා කලං දෙක (02) බැගින්.

රිදීතුත්තං,
මනෝශිල,
කොත්තමල්ලි,
පල්මාණික්කම්,
සහිඳලුණු,
පුෂ්කර,
කෙළිඳහාල්,
සීනක්කාරම්,

මේ ද්‍රව්‍ය එක වගෙන් කලං 4 (ග්‍රෑම් 20) බැගිනි.

අතිවිඩයම්,
ගල්මද,
රන්හිරියල්,
කටුකරෝසන,
සාදිලිංගම්,

මේවා එකෙන් කලං 3 (ග්‍රෑම් 15) බැගිනි.

සුදුලූනු පොතු හැර කලං 70 යි. (ග්‍රෑ. 350 යි.)
වදකහ කලං 12 යි. (ග්‍රෑ. 60 යි.)
රත්හඳුන් කලං 32 යි. (ග්‍රෑ: 160 යි.)
පෙරුංකායම් කලං 15 යි. (ග්‍රෑ. 75 යි.)

සංස්කරණය :— වියලා සිනිඳුව චූර්ණ කොට රෙද්දෙන් හලා, හිංමදුරුතලා කොළ යුෂින් නිකකොළ යුෂින්, කොහොඹ කොළ යුෂින්, ඉඟුරු යුෂින්, ඇඹුල්දෙඩං යුෂින්, එක වගෙන් එක එක දවස අඹරා, මදක් තෙත හිඳී ගිය විට, ගිතෙල්, කොහොඹතෙල්, දෙවගෙන් වෙන වෙනම දෙදිනක් අඹරා රක්තිකා 1 (මි:ග්‍රෑ: 125) පමණට ගුලිකර පවනේ වියලා ගත යුතු යි.

ප්‍රයෝග :— උණ, අතීසාර, සූතිකා රෝග, ශීතල සන්නි ආදියෙහි යෙදේ.

අනුපාන :— අවස්ථානුසාරයෙන් ක්වාථ, ස්වරස ආදිය සමහ යෙදේ.

මාත්‍රාව :— ගුලි 1 — 4 දක්වා වේ.

25. යෝග නාමය :— **සූරන් විදූර.**

යෝගය :—

පුස්කර,
සීනක්කාරම්,
ශුද්ධ පල්මාණික්කම්,
ශුද්ධ තෙල්ලිකා ගෙන්දගම්,
තිප්පිලි,
ශුද්ධ හිරියල්,
කොට්ටං,
වැල්මී,
දෙදුරු,
අසමෝදගම්,
ත්‍රිවර්ග,
වියලි ඉඟුරු,
අබින්,
සවිඳලුණු,
ක්‍රිමිරුපු — වළහසාල් ඇට මද
අබිං,
පෙරුම්කායම්,
සුදුලූනු,
තිපල්,
ගම්මිරිස්,
එරඬු ඇට මද,
සිවන්ගුරු,
කටුකරෝසන,
පරණ සියඹලා බොර,
කත්සාකොළ,
සමභාගව ගත යුතු යි.

සංස්කරණය :— ද්‍රව්‍ය සියල්ල කුඩුකොට දෙවට තිරෙන් අඹරා එම කල්කය දෙකට බෙද ඉන් එක් කොටසක බරට ශුද්ධ ජයපාල එක්කර එම කොටස අඹරා ගත යුතු ය. ජයපාල රහිතව අනික් කොටස අඹරා ගත යුතු ය. පථ්‍ය සුරන්විදුරු සහ විරේක සුරන් විදුරු වෙන වෙනම වදකහ යුෂයෙන් සහ දුන් තෙලෙන් අඹරා රත්තිකා ප්‍රමාණයට ගුලි කරන්න.

ප්‍රයෝග :— බිළිඳුන්ගේ සෙම් අධිකව කිපීම, ක්‍රිමිරෝග, ජ්වර, වෙව්ලුම, කිරිමැලියම, උස්මුරුත්තාව, මාන්දම, සන්නි, බඩ රුජාව, වමනය යන රෝග සඳහා යෙදේ.

අනුපාන :— මීපැණි, විලඳ කුඩු සමඟ, වටිකා ප්‍රකරණයේ සඳහන්ව ඇති අනෙක් අනුපාන සමඟ ද යෙදීම මැනවි.

මාත්‍රාව :— පථ්‍ය සුරන් විදුරු ගුලි 1 — 2 දක්වා දිය යුතු යි. විරේකය සඳහා ගුලි 1 යි.

26. යෝග නාමය :— **හඳුන්තිලක ගුලිය.**

යෝගය :—
හරන්කහ,
තිත්තවැලේ පොතු,
ගොඩපර ගසේ පොතු,
සතුරුසම්මැට්ට,
කාමරංගමුල්,
තොටිලමුල්,
වනරාජ,
තිලෝගුරු,
ඩෙබරඇට,
රසදිය,
සමභාගව ගත යුතු යි.

සංස්කරණය :— සියල්ලෙහි චූර්ණය ගොඩපර ගෙඩි ලෙලි යුෂයෙන් අඹරා කඩල ඇට පමණ ගුලි තනා පවනේ වියළා විදුරු බඳුනක අසුරා තබන්නේ ය.

ප්‍රයෝගය :— විෂ වර්ග ශරීරගත වීම සහ ශරවිෂ ඇමිනියා අවස්ථාවනට යෝග්‍ය වේ.

අනුපාන :— සුදුහඳුන් ජලය තැඹිලි වතුර සමඟ යෙදිය හැකි ය.

27. යෝග නාමය :— **හිංගුලාදි රසය.**

යෝගය :—
දේදුරු,
අසමෝදගම්,
තිප්පිලි,
පෙරුංකායම්,
කරාබු,
වසාවාසි,
සාදික්කා,
තෙරිවිෂ,
සිනාක්කාරං,
ඕංකාරන්,
විදිතුත්තං,
පුස්කර,
වැල්මී,
අක්‍රපට්ටා,
රත්හඳුන්,
සුදුහඳුන්,
වච්චනාවි,
සුදුලූනු,
මංචාඩි 5 (ග්‍රෑ: 1.25) බැගින් ගත යුතු වේ.

රසදිය (බුලත් යුෂින් ශොධනය කර) මදට 5 (ග්‍රෑ: 1.25) යි. සාදිලිංගම්, සියල්ල බරට දෙගුණයක් ගත යුතු යි.

1. පළමුව රස බෙහෙත් හැර සියලු ද්‍රව්‍ය චූර්ණකර දෙහි ඇඹුලෙන් අඹරා ගත යුතු වේ.
2. කංසාකොළ යුෂ,
3. උක්දඹු ඉස්ම,
4. ගිතෙල්,

යන මේවායින් අඹරා ගන්නේ වේ. පළමුකොට රස බෙහෙත් අඹරා ගත යුතු වේ.

සංස්කරණය :— අඹරන ලද කල්කය දෙකට බෙද එක් කොටසකට ශුද්ධ ජයපාල මිශ්‍රකර අඹරා රත්තිකා 1 පමණ ගුලි සාද ගන්නේ ය.

ප්‍රයෝග :— සූතිකා රෝගයන්ට විශිෂ්ට යි.

අනුපාන :— තොටිල පොතු යුෂ අනුපාන වේ.

ප්‍රසූත වීමට :— — උක්පැණි, රඹුක්බඩ යුෂ, සුදුහඳුන්, වැල්මී, ගලගා දියහර දීම මැනවි.
ඉස්ගැන සිටින විට :— — වැකරද කොළ යුෂ, ලබුකොළ යුෂ සමඟ.
රුද වැඩිවී බිහිවෙන්ට :—
1. බක්මී පොතු, වල් අවර දළු, යුෂ තලතෙල් සමඟ,
2. උළුහාල් කැද ගිතෙල් සමඟ,
3. පතං පෙති යුෂ, තලතෙල් සමඟ.

කුණු වැටෙන්නට :— මී අරටු, වෙඅල, රතුලූනු, උක්පැණි, කෝමාරිකා යුෂ සමඟ.
වැදෑමහ වැටෙන්නට :—
1. කරඹිංච දෙවගේ මුල් කෂාය සමඟ,
2. ඔලිද කපුමල්, කෂාය, සමඟ,

28. යෝග නාමය:— **හීන් ගුලිය.**

දේදුරු,
හිංගුල,
කිරිගරුඬ,
කංසා,
අසමෝදගම්,
සුදුපාෂාණම්
ත්‍රිවර්ග,
කළු අත්තන ඇට,
වැල්මී,
සහිඳ ලුණු,
තිකුළු,
හිරියල්,
අබින්,
කිරිබදු අල,
අබ,
කුඹුරුඇට මද,
සුදුලූනු.

මේවා සමභාගව ගෙන, ඇඹුල් දෙඩම් ඉස්මෙන් අඹරා සැවැන්දරා තැම්බූ වතුරෙන් අඹරා ඕලු ඇට පමණට ගුලි කරගන්න.

ප්‍රයෝග :— උදර ශූල, අතීසාර, ප්‍රවාහිකා,
මාත්‍රාව :— ගුලි 1 සිට 2 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට.

29. **ලුණු විරේක වටිය.**

ඉඟුරු,
වියලිකහ,
ගම්මිරිස්,
සුදුලූනු,
අරළු,
වදකහ,

මේ ද්‍රව්‍ය සමභාගව,	(6 භාග)
නැවත ඒ සියල්ල බරට ගොරක,	(6 භාග)
නැවත ඒ සියල්ල බරට ශුද්ධ ජයපාල,	(12 භාග)
නැවත ඒ සියල්ල බරට තිරස්සවාලු මුල්,	(24 භාග)

චූර්ණ කළ යුතු ද්‍රව්‍ය චූර්ණකොට ඉන්පසු සියල්ල ලුණු වතුරේ දිනක් භාවනා දී අඹරා මංචාඩියට ගුලි කර ගන්නේ ය.

ප්‍රයෝග :— දරුණු මලබද්ධ පුරාතන අජීර්ණ, උදර රෝග, ශෝථ, සන්ධිවාත, ආදියෙහි යෙදේ.
මාත්‍රාව :— වටිකා 1 — 2 දක්වා හෝ කෝෂ්ඨ තත්වය අනුව යෙදේ.

30. **වායු විරේකය (අණ්ඩවෘද්ධි ගුලිය)**

සුදුලූනු,
කළුදුරු,
පෙරුංකායම්,
කුඹුරු ඇටමද,
සහිඳලුණු,
ඉඟුරු,

මෙම ද්‍රව්‍ය සමභාගව කිරා මුරුංගා කොළ යුෂින් අඹරා මංචාඩි 3 (මි.ග්‍රෑ: 750) පමණ ගුලිකර පවනෙහි වියලා ගන්නේ ය,

මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා.
අනුපාන :— එරඬුතෙල් සමඟ උදේ හිස්බඩ වළඳන්නේ ය. ක්වාථ ආදී වෙනත් අනුපාන සමඟ දිය හැකි ය.
ප්‍රයෝග :— නාභි ශූල, ගුල්මරුජා, අණ්ඩවාත, අෂ්ඨීලා වාත, හා විවිධ වාතජ අන්ත්‍ර ශූලයන්හි යෙදේ.

ගුග්ගුලු ඛණ්ඩය

1. **යෝග නාමය :—** **අමෘතා ගුග්ගුලුව.**

යෝගය :—

රසකිඳ	ප්‍රස්ථ	1 යි.	(ග්‍රෑ:. 960)	බුළු	ප්‍රස්ථ	1/2 යි.	(ග්‍රෑ: 480)
ශුද්ධ ගුග්ගුල්	ප්‍රස්ථ	1/2 යි.	(ග්‍රෑ: 480)	නෙල්ලි	ප්‍රස්ථ	1/2 යි.	(ග්‍රෑ: 480)
අරළු	ප්‍රස්ථ	1/2 යි.	(ග්‍රෑ: 480)	ජලය	ද්‍රෝණ	1 යි.	(ලී. 15.36)

පාදයට (4 — 1 ට) සිඳුවා ගත යුතු වේ.

දන්ත, තිප්පිලි,
ඉඟුරු, වළඟසාල්,
ගම්මිරිස්, රසකිඳ
ත්‍රිඵලා වෙන වෙනම පලම 1/2 බැගින්. (ග්‍රෑ: 30 යි.)
තිරස්සවාලු කර්ෂ 1 යි. (ග්‍රෑ: 15 යි.)

සංස්කරණය :— කෂාය සිඳුවා ගුග්ගුලුපාක පරිභාෂා අනුව සිද්ධ කටයුතු ය.
ප්‍රයෝග :— වාත රක්ත, කුෂ්ඨ, ගුද රෝග, නසයි. අග්නි දීපන කරයි. දුෂ්ට ව්‍රණ, ප්‍රමේහ, ආමවාත, භගන්දර, නාඩීගත වාත, ශෝථ,, ආම නසයි.
අනුපාන :— උෂ්ණ ජලය සමඟ දීම මැනවි.
මාත්‍රාව :— තෝලා 1/2 යි. (ග්‍රෑ: 6 යි),

2. **යෝග නාමය :—** **කාඤ්චනාර ගුග්ගුලුව.**

යෝගය :—

කොබෝලීල පොතු	පලං	5	යි.	(ග්‍රෑ: 300)
ත්‍රිඵලා ප්‍රත්‍යෙකව	පලං	1 1/2	යි.	(ග්‍රෑ: 90)
ත්‍රිකටු මිලිතව	පලං	3	යි.	(ග්‍රෑ: 180)
ලුණුවරණ පොතු	කර්ෂ	1	යි.	(ග්‍රෑම: 15)

එන්සාල්
කුරුඳු පොතු
තේජපත්‍ර (කර්ෂ 1/2) (ග්‍රෑ: 7.5) බැගින්.
ගුග්ගුලු සියලු චූර්ණය බරට ගත යුතු යි.

සංස්කරණය :— චූර්ණකොට අඹරා පිළියෙල කළයුතු වේ.
ප්‍රයෝග :— උග්‍ර ගණ්ඩමාල, අපචි, අර්බුද, ග්‍රන්ථි, ව්‍රණ, ගුල්ම, කුෂ්ඨ, භගන්දර නසයි.
අනුපාන :— කොබෝලීල පොතු තැම්බූ ක්වාථය හෝ යෝග්‍ය අනුපානයක් සමඟ දිය හැකි ය.
මාත්‍රාව :— ශාණ 1 යි. (ග්‍රෑම 4 යි).

3. **යෝග නාමය :—** **කෛශෝර ගුග්ගුලුව.**

යෝගය :—

ශුද්ධ ගුගුල්	ප්‍රස්ථ	1	යි.	(ග්‍රෑ: 960)
රසකිඳ	පල	32	යි.	(ග්‍රෑ 1920)
තිපල්	ප්‍රස්ථ	1	යි.	(ග්‍රෑ: 960)
ජලය	සේරු	96	යි.	(ලීටර් 92.16)

චූර්ණය:—

තිපල් සුණු (ප්‍රත්‍යෙකව)	තෝලා 4 යි.	(ග්‍රෑ: 48)	තිරස්සවාලු සුණු	තෝලා	2 යි.	(ග්‍රෑ. 24)
තිකුළු සුණු මිලිතව	තෝලා 12 යි.	(ග්‍රෑ: 144)	දන්ත මුල් සුණු	තෝලා	2 යි.	(ග්‍රෑ. 24)
වළඟසාල් සුණු	තෝලා 4 යි.	(ග්‍රෑ: 48)	රසකිඳ පිටි	පල	1 යි.	(ග්‍රෑ: 60)

සංස්කරණය:— ගුගුල් ලිහිල්ව පොට්ටනිය බැඳ තිපල් රසකිඳ ජලය නියමිත පමණ ලා පාදයට සිඳුවා පෙරා, ඒ කෂාය ලෙහෙ බඳුනක බහා පොට්ටනි කළ ගුගුල් එයට මිශ්‍රකර යළිත් පිසන්නේ ය. ඝන වූ කල සියඵ චූර්ණ එයට මිශ්‍රකර හොඳින් හැඳිගා බා ගන්නේ ය.
ප්‍රයෝග :— ඒකජ, ද්වන්ද්වජ, චිරකාලජ, ස්‍රාව සහිත, වියලි, පිපුරු, දණහිස තෙක් පැතුරුණු ආදි තත්වයන්ගෙන් යුක්ත සර්ව ප්‍රකාර වාතරක්ත, ව්‍රණ, කාස, කුෂ්ඨ, ගුල්ම, ශෝථ, උදර, පාණ්ඩු රෝග ප්‍රමේහ, අග්නි මාන්ද්‍ය, වාත ආදීන්ගේ විබන්ධ, ප්‍රමේහ පිඩකා යන රෝග නසයි.
අනුපාන :— කඩල යූෂ, කිරි හෝ සුගන්ධි ජලය සමඟ ය.
මාත්‍රාව :— තෝලා 1/2 — 1 යි. (ග්‍රෑම 6 — 12)
සැ: යු: — සුගන්ධි ජලය — සුදුහඳුන්, සැවැන්දරා, සමන්පිච්චමල්, ආදිය තැම්බූ ජලය යි.

4. යෝග නාමය :— **ගෝක්ෂුරාදි ගුග්ගුලුව.**

යෝගය :— ගොකටු පලං 28 යි. (ග්‍රෑම 1680)
ජලය හය ගුණය යි.
අර්ධයට සිඳුවා ඊට ශුද්ධ ගුග්ගුලු පලං 7 ක් (ග්‍රෑම 420) දියකර නැවත ගුඩ පාකයක් මෙන් ඝන වූ කල්හි
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
අරළු,
බුළු,
නෙල්ලි, කලාඳුරුඅල,
කර්ෂ 4 (ග්‍රෑම 60) බැගින් (මිලිතව පලං 7 යි) චූර්ණකර කල්කය යොද ගිතෙල් හෝ එරඬු තෙල් මාත්‍රාවක් යොද පදමට ගෙන රක්තිකා 3 ට (මි. ග්‍රෑ. 375) ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— මූත්‍රකෘච්ඡ්‍ර, මූත්‍රාඝාත අශ්මරී, වෘක්කරෝග, මධුමෙහ, ප්‍රමේහ, ආදියෙහි යෙදේ.
මාත්‍රාව :— ගුලි 1 — 3 දක්වා දිනකට තුන් වරක් මූත්‍රකාරක ද්‍රව්‍ය අනුපාන වශයෙන් යෝග්‍ය ය.
ප්‍රත්‍යක්ෂතා :— යවක්ෂාර කර්ෂ 4 ක් (ග්‍රෑම 60) යෙදීමෙන් විශිෂ්ට ගුණ ලැබේ. (කල්කයට)

5. යෝග නාමය :— **ත්‍රිඵලා ගුග්ගුලුව.**

යෝගය :—
අරළු
බුළු
නෙල්ලි
අතිවිඩයම්
දේවදර
දරුහරිද්‍රා
කලාඳුරුඅල
පරූෂක
රත්කිහිරිය
ගම්මාලු අරටුව
කරඳමුල්
රසකිඳ
ඇසළ කරල් පැණි
චිරතා (භූනිම්බ ප්‍රතිනිධි)
කොහොඹපොතු
කටුකරෝසන
කෙළිඳහාල්
පටෝලපත්‍ර (දුම්මැල්ල) ප්‍රතිනිධි

මේ ද්‍රව්‍ය සම භාගව ගන්නේ ය.
ජලය අට (8) ගුණය යි.
ශේෂය චතුර්ථාංශය යි. (1/4)

සංස්කරණය :— ක්වාථයෙන් අර්ධාංශයක් රසකිඳ මිශ්‍රකොට අලුත් බඳුනෙක්හි රාත්‍රියක් බහා තබා පසු දින පොඩිකර පෙරා ගන්නේ ය. ඉන්පසු ශුද්ධ ගුගුල් සහ ශිලාජතු, කෂායෙන් 1/6 ක් ක්වාථයෙහි දියකර දින 7 ක් භාවනා දෙන්නේ ය. ඊට පසු ශුක්ත = කාඩි සේරු 1 යි. (මි: ලී: 960) ස්වර්ණ මාක්ෂික පල එක යි. (ග්‍රෑම 60) මීපැණි පල 1 යි. (මි: ලී: 60) ගිතෙල් පල 1 යි (—මි: ලී: 60) මිශ්‍රකොට පාක පරිභාෂාවෙන් සිද්ධකොට ගන්නේ ය.

ප්‍රයෝග :— වාතරක්ත, කුෂ්ඨ, දුෂ්ට ව්‍රණයන්හි යෙදිය යුතු ය.

6. යෝග නාමය :— **පංචතික්ත ඝෘත ගුග්ගුලුව.**

යෝගය :—
කොහොඹපොතු
රසකිඳ -
පාවට්ටා
දුම්මැල්ල
කටුවැල්බටු
පලං 10 බැගිනි. (ග්‍රෑ: 600)
ජලය ද්‍රෝණ 2 යි. (ලී: 30.72)
4–1 ට සිඳ පෙරා ගන්න.
ගිතෙල් ප්‍රස්ථ 1 යි. (ග්‍රෑ: 960)

දියමිත්ත
වළහසාල්
දේවදර
ගජතිප්පිලි
ස්වර්ජික්ෂාර
යවක්ෂාර
ඉඟුරු
හරිද්‍රා
ශතපුෂ්ප,
වදකහ
තිප්පිලිමුල්
වැල්මදට
අතිවිෂා
අරළු
බුළු
නෙල්ලි
යමානි
ශුද්ධ ගුගුල් ග්‍රෑම 300යි
සිවිය මුල්
කොට්ටම්
ජ්‍යොතිෂ්මතී = දූහුදු
ගම්මිරිස්
කෙළිඳසාල්
සුදුරු
රත්නෙවුල්
කටුකරෝසන
ශුද්ධ භල්ලාතක

ගුගුල් හැර අනික් කල්ක ද්‍රව්‍ය කර්ෂය (ග්‍රෑම 15) බැගින් ගන්නේ ය.

සංස්කරණය :— ගුග්ගුලු පරිභාෂා අනුව පිළියෙල කට යුතු ය. ඝෘතය සහ කල්කය ගුලි කර ගුගුල වශයෙන් භාවිත කෙරේ.

ප්‍රයෝග :— විෂදෝෂ, ප්‍රබල වාතරෝග, සන්ධි, අස්ථි මජ්ජාදි ගම්භිර ධාතු ගත කුෂ්ඨ විකාර, නාඩිව්‍රණ, අර්බුද, භගන්දර, ගණ්ඩ මාලා, ඌර්ධ්ව ජත්‍රුගත සියලු විකාර, ගුල්ම, ගුද රෝග, ප්‍රමේහ, රාජයක්ෂ්මා, අරුචි, ශ්වාස, පීනස, කාස, හෘදය රෝග, පාණ්ඩු රෝග, ගලවිද්‍රධි සහ වාතරක්ත යන රෝග නසයි.

මාත්‍රාව :— මාෂ 3 — 6 (ග්‍රෑ: 3 — 6 දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය.

7. යෝග නාමය :— **පථ්‍යාදි ගුග්ගුලුව.**

යෝගය :—
අරළු ගෙඩි 100 යි. නෙල්ලි ගෙඩි 400 යි.
බුළු ගෙඩි 200 යි. ගුගුල් සේරු 2 යි. (ග්‍රෑ: 1920)
ජලය සේරු 64 යි. (ලී: 61.44)

රාත්‍රියක් පෙහවීමට තබා පසුව 1/2 ට සිඳුවා ගත යුතු යි.

කල්කය :— වළහසාල්, නෙල්ලි, බුළු, තිප්පිලි, ඉඟුරු, දන්ත, අරළු, රසකිඳ, තිරස්සවාලු, ගම්මිරිස්, තෝලා 4 (ග්‍රෑම් 48) බැගින්.

සංස්කරණය :— නියමිත ජලය බහා බාගයට සිඳුවා පෙරා ලෝහ බඳුනක බහා ඊට කල්කය යොද පදම් දක බා ගන්නේ ය.

ප්‍රයෝග :— ක්ෂත සන්ධාන ගුණය විශේෂ යි. ගෘධරසි, බංජ, ප්ලීහ , ගුල්ම, පාණ්ඩු, ගාත්‍ර කණ්ඩු වාතරක්ත රෝග නසයි. චක්ෂුෂ්‍ය යි. ආයුෂ්‍ය යි.

අනුපාන :— ශීත ජලය සමඟ ය.

මාත්‍රාව :— කලං 1/2 — 1 දක්වා යි. (ග්‍රෑම් 2.5 — ග්‍රෑම් 5)

8. යෝග නාමය :— **පුනර්නවාදි ගුග්ගුලුව.**

යෝගය :—

සාරණ මුල්	පල	100 යි.	(ග්‍රෑ: 6000)	ඉඟුරු	පල	16 යි.	(ග්‍රෑ: 960)
එරඬු මුල්	පල	100 යි.	(ග්‍රෑ: 6000)	ජලය	ද්‍රෝණ	2 යි.	(ලී: 30.72)

සතරින් එකට සිඳවා ගත යුතුයි.

ශුද්ධ ගුගුල්	පල	8 යි.	(ග්‍රෑ: 480)	රත්නෙවුල්	පල	1/2 යි.	(ග්‍රෑ: 30)
එරඬුතෙල්	කුඩුව	1 යි.	(ග්‍රෑම් 240)	සවිඳ ලුණු	පල	1 යි.	(ග්‍රෑ: 60)
තිරස්සවාලු	පල	5 යි.	(ග්‍රෑම් 300)	භල්ලාතක	පල	1 යි.	(ග්‍රෑ: 60)
දන්ති	පල	1 යි.	(ග්‍රෑම් 60)	විඩංග	පල	1 යි.	(ග්‍රෑ: 60)
රසකිඳ පිටි	පල	2 යි.	(ග්‍රෑම් 120)	ස්වර්ණමාක්ෂික	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)
තිපල් (ප්‍රත්‍යෙකව)	පල	1/2 යි.	(ග්‍රෑ: 30)	පුනර්නවා	පල	1 යි.	(ග්‍රෑ: 60)
තිකුළු (ප්‍රත්‍යෙකව)	පල	1/2 යි.	(ග්‍රෑ: 30)				

සංස්කරණය :— ගුග්ගුලු පරිභාෂා අනුව එඬරු තෙලෙන් අඹරා ගන්න.

ප්‍රයෝග වාත රක්ත, ගෘධ්‍රසි, ජංඝා—ඌරු—පෘෂ්ට—අස්ථි වාත සහ ආමවාත නසයි.

මාත්‍රාව :— මාෂ 3 යි. (ග්‍රෑම් 3 යි)

9. යෝග නාමය:— **මහා යෝග රාජ ගුග්ගුලුව**

ඉඟුරු, තිප්පිලි,මුල්, සිවිය මුල්, රත්නිවුල් පෙරුංකායම් (බැද) අසමෝදගම්, අබ, සුදුරු, කළුදුරු, රේණුකා (නිකඇට) කෙළිඳහාල් වළහසාල් දියමිත්ත, ගජතිප්පිලි, කටුකරෝසන, අතිවිඩයම්, සිවි තේක්කු, වදකහ, මුරුවාමුල්,මෙම ද්‍රව්‍ය විස්ස (20) මාෂා හතර (4) බැගින්, අරළු, බුළු, නෙල්ලි තුන් වගය මිලිතව සියලු ද්‍රව්‍ය බරට, එම සියලුම ද්‍රව්‍ය බරට ශුද්ධ ගුගුල්, වංගභස්ම ,රිදීභස්ම, නාගභස්ම අභ්‍රභස්ම ලෞහභස්ම, මණ්ඩූරභස්ම, රසසින්දූර මෙම වර්ග එක් වගෙන් පලම් බැගින් ගන්නේය.

පළමුව භස්ම වර්ග සියල්ල බල්වයෙහි ලා කජ්ජලියක් වන තුරු අඹරා ගන්නේය. ඉන්පසු අනිත් කාෂ්ඨෞෂධ ඉතා සියුම් ව චූර්ණ කොට කජ්ජලිය සමග අඹරන්නේ ය. සුද්ද ගුගුල් වතුර ප්‍රමාණයක් දමා ලිපේ තියා ගුඩයක් මෙන් වනතුරු හැඳිගා චූර්ණයමිශ්‍ර කරන්නේය. ගුලි පදමට ආ කල ලිපෙන් බා ගුගුල පිණ්ඩයක් මෙන් සකසා තබාගෙන මාෂා 03 ප්‍රමාණයට ගුලි කරන්නේ ය. (ශාර්ංගධර)

මාත්‍රාව:— දවසට ගුලි තුනකි.

දරුණු නූතන, පුරාතන සන්ධි වාතයන්හි උපයුක්ත අනුපාන සමග යොදන්නේ ය.

10. යෝග නාමය :— **යෝගරාජ ගුග්ගුලුව.**

යෝගය :—

රත්නෙවුල්
තිප්පිලිමුල්
අසමෝදගම්,
කළුදුරු
වළහසාල්
වල්අසමෝදගම්
සුදුරු
දේවදර
සිවිය මුල්
එත්සාල්
සවිඳලුණු
සුවඳකොට්ටන්
අරත්ත
ගොකටු
කොත්තමල්ලි
තිපල්
කලාදුරු අල
තිකුළු
කුරුඳුපොතු
සැවැන්දරා
යවකාර ලුණු
තාලිසපත්‍ර
තේජපත්‍ර — සමභාගව ගත යුතු යි.

ශුද්ධ ගුගුල් සමාන බරක් ගත යුතු යි. ගිතෙල් අවශ්‍ය පමණ වේ.

සංස්කරණය :— සියළු චූර්ණය ගිතෙලින් අඹරා ගුටිකා සාද වීදුරු බඳුනක බහා තබන්නේ ය.
ප්‍රයෝග :— ආමවාත, ක්‍රිමි, දුෂ්ටව්‍රණ, ප්ලීහ, ගුල්ම, උදර, ආනාහ, සන්ධිගත වාත හා මජ්ජා ගත වාත ද ශමනය කරයි.
මාත්‍රාව :— මාෂ 2 (ග්‍රෑම 2) යි. ගුලි 1 — 2 දක්වා යි.

11. යෝග නාමය:— **රසාභ්‍රගුග්ගුලුව**

රසදිය කර්ෂ 02 යි,
ගන්ධක කර්ෂ 02 යි.
ශුද්ධ ගුගුල් පලං 08 යි.
ලෝහභස්ම කර්ෂ 02 යි,
අභ්‍රභස්ම කර්ෂ 02 යි,

ක්වාථය:— රසකිඳ පලම් 16 යි, අරළු, බුළු, නෙල්ලි (තිපල්) මිලිතව පලම් 16 යි, වතුර ද්‍රෝණ 01 ද්‍රෝණ 1/4 ට සිඳුවා පෙරා ඊට ගුගුල් දියකර ලිප තබා හොඳාකාර දිය වීමෙන් පසු,

කල්කය — තිකුළු, තිපල්, මිලිතව, දන්ති, රසකිඳ, ගොංකැකිරි, අල වළඟසාල් ,නාමල්රේණු, තිරස්ස වාලුමුල්, මෙම ද්‍රව්‍ය කර්ෂය බැගින්, සියුම් චූර්ණය, පළමුව රසඖෂධ සිවුවගය බල්වයෙහි ලා කජ්ජලීයක් වනතුරු අඹරා ඉක්බිති අනික් ද්‍රව්‍ය චූර්ණය සමග අඹරා ගුඩපාතයට කල්කය මිශ්‍ර කොට හැඳිගා, හොඳාකාර මිශ්‍රවන තෙක් හැඳිගා පදමට බා ගන්නේ ය. (මෙම ගුඩය ලිපෙන් බා ගත්තාට පසු ගිතෙල් ස්වල්පයක් සහිතව ගලෙහි අඹරා ගැනීම සුදුසු ය.)

මාත්‍රාව:— වරකට කර්ෂ 1/2 සිට 01 දක්වාය. අනුපාන — රසකිඳ කෂාය වේ.
ආජානුස්ඵුටික වාතරක්තය ආදි දරුණු වාතරක්ත අවස්ථා සහ එබඳු කුෂ්ඨ රෝගයෙහි ශ්‍රේෂ්ඨ ය. (ආයුර්වේද සංග්‍රහ වාතරක්ත)

12. යෝග නාම :— **රාස්නාදි ගුග්ගුලුව.**

යෝගය :— අරත්ත
රසකිඳ
දේවදර
ඉඟුරු
එරඬු මුල් — සමභාගව සුණු කොට ගන්නේ ය.
ශුද්ධ ගුග්ගුලු සියළු ද්‍රව්‍ය බරට ගත යුතු යි.
සංස්කරණය :— ගිතෙලින් අඹරා ගත යුතුය.
ප්‍රයෝග :— වාතරෝග, කර්ණරෝග, ශිරෝරෝග, නාඩිව්‍රණ, භගන්දර යන රෝග නසයි.
අනුපාන :— උෂ්ණෝදක සමඟ ය.
මාත්‍රාව :— මාෂ 1 — 2 (ග්‍රෑම 1 — 2). දක්වා යි.

13. යෝග නාමය :— **ලාක්ෂා ගුග්ගුලුව.**

යෝගය :— ලාක්ෂා චූර්ණ
හිරැස්ස
අමුක්කරා
නාගබලා මුල්
කුඹුක්පොතු — සම භාගව ගෙන චූර්ණකර ශුද්ධ ගුගුල් සම බරක් ගන්නේ ය.
සංස්කරණය :— ජලයෙන් අඹරා මාෂක දෙකේ (ග්‍රෑම 2) ගුලි තනා ගන්න.
ප්‍රයෝග :— භග්න සන්ධානය කරයි. අස්ථි වේදනා නසයි.
අනුපාන :— මඳක් උෂ්ණ කිරි සමඟ ය.
මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා ය.
සැ: යු:— ආයුර්වේද සංග්‍රහ භග්න චිකිත්සාවෙහි භග්න සහ (සන්ධිව්‍යුහවලට) අවභන්දිවලට ලේපයක් වශයෙන් මෙය දක්වා තිබේ.

14. යෝග නාමය :— **ලෞහ ගුග්ගුලුව.**

යෝගය:— ලෞහ භස්ම පල 5 යි. (ගු: 300)
ශුද්ධ ගුග්ගුලු පල 15 යි. (ගු: 900)
ත්‍රිකටු (මිලිතව) පල 25 යි. (ගු1500)
තිපල් (මිලිතව) පල 40 යි. (ගු: 240)
සංස්කරණය :— ගුග්ගුලු පරිභාෂා අනුව ගිතෙලින් අඹරා ගත යුතු ය.
ප්‍රයෝග :— රක්තහීනතා සහිත වාතරෝග ආමවාත නසයි.
මාත්‍රාව :— කලං 1 — 3 දක්වා වේ. (ග්‍රෑම 5 — 15)

15. යෝග නාමය :— **වෘහත් යෝගරාජ ගුග්ගුලුව.**

යෝගය :— ත්‍රිකටු
තිපල්
දියමිත්ත
හාතාවාරිය අල
කහ
වෙනිවැල්ගැට
අසමෝදගම්
කුරුඳුපොතු
එන්සාල්
තේජපත්‍ර
නාමල්රේණු
හීන් මදුරුතලා
ලෞහ භස්ම
දෙළුම්ලෙලි
එරඬුමුල්
අමුක්කරා,
තිරැස්සවාලු
දන්ත
මසන්ගෙඩි
දේවදර

වදකහ
පෙරුංකායං
හපුෂා (ප්‍රතිනිධි ගම්මිරිස්)
ගජතිප්පිලි
කළුදුරු
ශඨි
කොත්තමල්ලි
බළල්ලුණු
සෞවර්චල ලවණ
සවිඳලුණු
තිප්පිලිමුල්

හල්දුම්මල
ගොක්ෂුර
අරත්ත
අතිවිඩයට
වියලිඉඟුරු
යවක්ෂාර
අම්ලවෙතස
රත්නිවුල්
සුවඳකොට්ටං
සිවිය
වෘක්ෂාම්ල,

කහ
කටුකරෝසන
මූර්වා
ත්‍රායමාණා (ප්‍රතිනිධි ලුණුවිල)
දුරාලභා (ප්‍රතිනිධි වැල්කහඹිලිය)
වළහසාල් මද
වංගභස්ම
අසමෝදගම්
ආඩතෝඩා මුල්
අභ්‍රක භස්ම
මේ සියළු ද්‍රව්‍ය සමභාගව ගැනේ.

ශුද්ධ ගුගුල් සියල්ල බරට බරකි.

සංස්කරණය:— ප්‍රථම සඳහන් ද්‍රව්‍ය සියල්ල හොඳින් චූර්ණකර රෙද්දකින් හලා ගුගුල් සමග ගිතෙලින් අඹරා මාෂක 1 ට (ග්‍රෑම් 1) ගුලි කර ගන්නේ ය.

ප්‍රයෝග:— ආමවාත (රසවාත), කටී වාත, ඒකාංග ශෝෂ, කුෂ්ඨ ක්ෂත, කුෂ්ඨ හා වාතජනිත පාද හිරිය, ගෘද්ධරසි, සන්ධිවාත, ක්‍රොෂ්ටුක ශීර්ෂ, සියලු ශරීරයෙහි ප්‍රකුපිත වාත ආදිය නාශක යි.

මාත්‍රාව:— වටිකා 1 – 2 දක්වා ය.

16. යෝග නාමය:— **වෘහත් සිංහනාද ගුග්ගුලුව.**

යෝගය:—
අරළු   බුළු
නෙල්ලි ප්‍රස්ථ 1 බැගිනි. (ග්‍රෑම් 960)
ජලය ද්‍රෝණ 1, 1/2යි. (ලීටර් 23.04 යි).

ගුගුල් පලං 8 යි. (ග්‍රෑම් 480) පොට්ටනි බැඳ කෂායට දමා 4 – 1 ට සිඳවා ගත යුතුය.
අබතෙල් පලං 8 යි. ගුගුල් අඹරා ක්වාථයට මිශ්‍රකර,

තිකුළු
තිපල්
කලාඳුරු

වළහසාල්
දේවදර
රසකිඳ

රත්නෙටුල්
දූත්ත
සිවිය

කිඩාරං අල
හබරල අල
රසදිය } කජ්ජලිය
ගෙන්දගම්

කර්ෂ 2 බැගිනි. (ග්‍රෑම් 30)
ශුද්ධ ජයපාල ඇට 1000 යි.

සංස්කරණය:— සියල්ල සුණුකොට දමා උයා ගත යුතු යි.

ප්‍රයෝග:— අග්නිවර්ධක වේ. ආමවාත, සන්ධිවාත, කටිග්‍රහ, අශ්මරි, මූත්‍රකෘච්ඡ්‍ර, භග්න, තිමිර දෙස, අම්ල පිත්ත කුෂ්ඨ, ප්‍රමේහ, ගුදභ්‍රංශ, කාස ශ්වාස, ක්ෂය, විෂමජ්වර, ප්ලීහ, ශ්ලිපද, ගුල්ම, පාණ්ඩු, කාමලා, ශෝථ, අන්ත්‍රවෘද්ධි, ශූල, අර්ශස්, නසයි. විරේචක බව සැලකිය යුතු ය.

අනුපාන:— උණුදිය හෝ උණු එලකිරි සමඟ ය.

මාත්‍රාව:— මාෂක 2 යි. (ග්‍රෑම් 2 යි).

17. යෝග නාමය:— **සප්ත විංශතික ගුග්ගුලුව.**

යෝගය:—
ත්‍රිකටු
තිපල්
කලාඳුරු අල
වළහසාල් මද
රසකිඳ
රත්නිවුල්
ශඨි
හීන්එන්සාල්
තිප්පිලිමුල්
හපුෂා (ප්‍ර. ගම්මිරිස්)
දේවදර
කොත්තමල්ලි

සුවඳ කොට්ටන්
සිවිය
ගොන්කැකිරි අල
වියලිකහ
වෙනිවැල්ගැට
බළල් ලූණු
සුවසලුණු
යවක්ෂාර
ස්වර්ජික්ෂාර
සවිඳලුණු
ගජතිප්පිලි
අසමෝදගම්

මේ සියළු ද්‍රව්‍ය සමව කිරා ගත යුතු වේ. එම බර මෙන් දෙගුණයක් ශුද්ධ ගුගුල් ගත යුතු වන්නේය

සංස්කරණය:— ගුග්ගුලු පරිභාෂා අනුව ගුටිකා පිළියෙල කර ගත යුතු ය.

ප්‍රයෝග:— කාස, ශ්වාස, ශෝථ, අර්ශස්, භගන්දර, හෘද්ශූල, පාර්ශ්වශූල, කුක්ෂිශූල, වස්ති—ගුද රුජා, අශ්මරී. මූත්‍ර කෘච්ඡ්‍ර, උන්මාද, කුෂ්ඨ, උදර, දුෂ්ටනාඩීව්‍රණ, සියළු ප්‍රමේහ, ශ්ලීපද යන සියළු රෝග නසයි.

මාත්‍රාව:— ගුලි 1 – 4 දක්වා යි.

අනුපාන:— මීපැණි.

සැ:යු:— සුවඳ කොට්ටන් වෙනුවට හල්ලාතක, යෙදී ඇත. (ආයුර්වේද සංග්‍රහ)

18. යෝග නාමය:— **සිංහනාද ගුග්ගුලුව.**

යෝගය:— අරළු බුළු නෙල්ලි
පල 3 (ග්‍රෑ. 180) බැගින් වතුර සේරු 8 – 2 ට (ලී. 7.68 – 1.92) සිඳුවා ගත යුතු යි.

කල්කය:— අරළු බුළු නෙල්ලි

චූර්ණය	පල 3 බැගින්.	(ග්‍රෑම 180 යි.)
ගන්ධක	පල 1 යි.	(ග්‍රෑම 60 යි.)
ගුගුල්	පල 1 යි.	(ග්‍රෑම 60 යි.)
එරඬුතෙල්	පල 8 යි.	(මි:ලී: 480 යි.)

සංස්කරණය:— ලෝහ භාජනයෙහි ගුග්ගුලු පාක විධියෙන් සකස් කර ගන්නේ ය.

ප්‍රයෝග:— ආමවාත — ගෘධ්‍රසී රෝග සඳහා මනා ය.

මාත්‍රාව:— කර්ෂ 1 – 2 යි. (ග්‍රෑම 15 - 30 යි.)

මෝදක බණ්ඩය

1. **යෝග නාමය :—** **අගස්ත්‍ය හරිතකී.**

යෝගය :—

දසමුල්
වඳුරු මෑඇට
ශංඛපුෂ්පි,
ශඨී,
බැවිල
ගජතිප්පිලි,
අපාමාර්ග
තිප්පිලිමුල්,
රත්නෙටොල්
භාර්ගී (සිරිතේක්කු)

සුවඳකොට්ටං,
පලම් 2 බැගිනි. (ග්‍රෑම් 120)
යව (පොට්ටනිබැඳ) ආඪක 1 , (ග්‍රෑ. 3840))
සම්පූර්ණ මනාව වැඩුණු අරළු ගෙඩි 100 යි.
ජලය ආඪක 5 යි, (ලීටර් 19.200) (1/4 ට සිඳවන්න)
ගිතෙල් කුඩව 1 යි, (ග්‍රෑම් 240)
තලතෙල් කුඩව 1 යි, මි. ලී. 240)
උක්සකුරු, තුලා 1 යි, (ග්‍රෑම් 6000)
තිප්පිලි චූර්ණය කුඩව 1 යි, (ග්‍රෑම් 240)
මී පැණි, කුඩව 1 යි, (ග්‍රෑම් 240)

සංස්කරණය :— තම්බන ලද අරළු අඹරා ගිතෙලින් හා තලතෙලින් මඳක් බැද ක්වාථයට දියකර, උක්හකුරු ද දිය කර සිඳුවා ඝන වූ කල, කුරුඳුපොතු, එන්සාල්, තේජපත්‍ර, නාමල්රේණු, මිලිතව පල 2 ක් (ග්‍රෑ: 120 යි.) චූර්ණකර දමා මෝදක පදමට සාද ගත යුතු යි. නිවුනාට පසු මී පැණි මිශ්‍ර කර ගන්නේ ය.

ප්‍රයෝග :— කාස, ශ්වාස, ක්ෂය, හික්කා, විෂමජ්වර, ග්‍රහණි, අර්ශස්, හෘද්‍රෝග, පීනස, වලිපලිත යන රෝගයන්. ට හිතයි; ආයුෂ්‍ය යි; බලකාරක යි.

අනුපාන :— අවස්ථාවට අනුව සුදුසු අනුපානයකින් ප්‍රයෝග කරන්න.

මාත්‍රාව :— කර්ෂ 1/2 — 1 දක්වා යි. (ග්‍රෑමස් 7.5 — 15).

2. **යෝගනාමය :—** **අභයාදි මෝදකය** (I)

යෝගය :—

අරළු,
ගම්මිරිස්,
වියලිඉඟුරු,
වළගසාල්,
කුරුඳුපොතු,

කලාදුරු,
නෙල්ලි,
තිප්පිලි,
තිප්පිලිමුල්,
තේජපත්‍ර,

යන මේවා කර්ෂ 1 බැගිනි. (ග්‍රෑම් 15,)

දන්ත අල, භාග 3 යි,
තිරස්සවාලු භාග 8 යි
සිනි කර්ෂ 6 යි. (ග්‍රෑම් 90 යි.)

සංස්කරණය :— චූර්ණකර සියල්ල මීපැණියෙන් අඹරා මෝදකය තනා ගත යුතු වෙ.

ප්‍රයෝග :— විරේචන වේ. ගුල්ම, අර්ශස්, මන්දාග්නි, උදවර්ත, කුෂ්ඨ, ගලගණ්ඩ, භ්‍රම, උදර, විෂමජ්වර, පාණ්ඩු, කාස යන රෝග නස යි.

අනුපාන :— ශීත ජලය යෙදිය යුතු යි.

මාත්‍රාව :— කර්ෂ 1/2 — 1 දක්වා යි. (ග්‍රෑම් 7.5 — 15 යි.)

3. **යෝග නාමය :—** **අභයාදි මෝදකය** (II)

යෝගය :—

අරළු,
තිප්පිලිමුල්,
ගම්මිරිස්,

ඉඟුරු,
කුරුඳුපොතු,
තේජපත්‍ර,
නෙල්ලි

තිප්පිලි,
කලාදුරු අල,
වළගසාල්,

යන මේවා කර්ෂය බැගිනි. (ග්‍රෑම් 15)

දන්තමුල්, කර්ෂ 6 යි, (ග්‍රෑ: 90 යි.)
තිරස්සවාළු පලම් 2 යි, (ග්‍රෑ: 120 යි.)

සංස්කරණය :— සියල්ල චූර්ණකර මීපැණියෙන් අඹරා මෝදකය සාද ගත යුතු යි.

ප්‍රයෝග :— විෂමජ්වර නසයි.

අනුපාන :— ශීත ජලය සමඟ යි. උණු දිය බීමෙන් විරේචනය නවතී.

මාත්‍රාව :— කර්ෂ 1/2 — 1 දක්වා ය.

4. යෝග නාමය :— **ආමවාත ගජසිංහ මෝදකය.**

යෝගය :—

වියලි ඉඟුරු චූර්ණය	ප්‍රස්ථ 1 යි, (ග්‍රෑ: 960)	යවක්ෂාර	පල 1 යි, (ග්‍රෑ: 60)
අසමෝදගම්	පල 8 යි, (ග්‍රෑ: 480)	තිප්පිලි	පල 1 යි, (ග්‍රෑ: 60)
සුදුදුරු	පල 2 යි, (ග්‍රෑ: 120)	ශටී	පල 1 යි, (ග්‍රෑ: 60)
කොත්තමල්ලි	පල 2 යි, (ග්‍රෑ: 120)	එන්සාල්	පල 1 යි, (ග්‍රෑ: 60)
කරාබු	පල 1 යි, (ග්‍රෑ: 60)	සිවිය	පල 1 යි, (ග්‍රෑ: 60)
පුස්කර	පල 1 යි, (ග්‍රෑ: 60)	අභ්‍රහස්ම	පල 1 යි, (ග්‍රෑ: 60)
ගම්මිරිස්	පල 1 යි, (ග්‍රෑ: 60)	ලෞහ භස්ම	පල 1 යි, (ග්‍රෑ: 60)
තිරස්සවාලූ	පල 1 යි, (ග්‍රෑ: 60)	වංග භස්ම	පල 1 යි, (ග්‍රෑ: 60)
ත්‍රිඵලා	පල 1 යි. (ග්‍රෑ: 60)	සූකිරි සියළු ද්‍රව්‍ය මෙන් සිව් ගුණය යි.	

සංස්කරණය :— මීපැණි සහ ගිතෙලින් අඹරා මෝදකය සාද ගන්නේ ය. ශටී, එන්සාල්, තේජපත්‍ර, කුරුඳුපොතු, කර්ෂ 2 බැගින් සිනිඳුව චූර්ණ කොට එයින් සුවඳ කවා (අධිවාසනය කොට) ගන්නේ ය.

ප්‍රයෝග :— ශූල, රත්පිත්, අම්ලපිත්ත නස යි. විශේෂයෙන් ආමවාත රෝගය නසන්නේ ය.

අනුපාන :— ගිතෙල්, එලකිරි, සමඟ වේ.

මාත්‍රාව :— කර්ෂ 1/2 — 1 දක්වා යි. (ග්‍රෑම් 7.5 — 15 යි.)

5. යෝග නාමය :— **කංසහරිතකී (I)**

යෝගය :—

දසමුල්	ආඪක 1 යි. (ග්‍රෑ: 3840)	යවකාරලුණු	ග්‍රෑම් 240 යි.
අරළුගෙඩි	100 යි.	පුරාණගුඩ	තුලා 1 යි. (ග්‍රෑ: 6000)
ජලය	ද්‍රෝණ 1 යි. (ලී: 15.36)	තිකුළු සුණු	(ග්‍රෑම් 240 යි)

මීපැණි ප්‍රස්ථ 1/2 යි. (ග්‍රෑ: 480)

සංස්කරණය :— දසමුල් සහ ලිහිල්ව පොට්ටනි බැඳගත් අරළු නියමිත ජලය බහා, පාදයට (4—1) සිඳුවා පෙරා ගත් ක්වාථයට අරළු ගෙඩි 100 ඇට ඉවත්කර අඹරා ගුඩ සමඟ මිශ්‍රකර සිඳුවා, එය ඝන වූ පසු තිකුළු ආදි චූර්ණ මිශ්‍ර කර පදම දූන ගුඩ පාකයෙන් බානු. නිවුණ පසු, මීපැණි සංයෝග කරන්නේ ය.

ප්‍රයෝග :— ශෝථ, කාස, ජ්වර, අරුචි, මෙහ, ගුල්ම, ප්ලීහ, ත්‍රිදෝෂජ උදර රෝග, පාණ්ඩු කෘශතා, ආමවාත රක්ත පිත්ත, අම්ල පිත්ත, විවර්ණතා මූත්‍ර දෝෂ යන රෝග නසන්නේ ය.

අනුපාන :— තෝලා 1/4 — 1/2 දක්වා දිය හැකි වේ. (ග්‍රෑ: 3 – 6)

යෝග නාමය :— **කංසහරිතකී (II) (කංස 1 = ආඪක 1).**

දශමූල පලං 64 = ආඪක 1 යි. (ග්‍රෑම්: 3840)

සම්පූර්ණ අරළු ගෙඩි 100 යි.

ජලය ද්‍රෝණ 1 යි. (ලීටර් 15.36)

පුරාතන ගුඩ තුලා 1 යි. (ග්‍රෑ: 6000)

මීපැණි ප්‍රස්ථ 1/2 යි. (ග්‍රෑම් 480)

කල්කය :— ත්‍රිකටුක, යවක්ෂාර, කුරුඳුපොතු, තේජපත්‍ර, එන්සාල්, චූර්ණය (ග්‍රෑ. 240)
සංස්කරණ ප්‍රයෝග ආදිය අංක 1 මෙනි.

6. යෝග නාමය :— **කස්තූරි මෝදකය.**

යෝගය :—

කස්තූරි
ප්‍රියංගු
කටුවැල්බටු
අරළු,
බුළු
නෙල්ලි
කළුදුරු

සුදුරු
හින්එන්සාල්
(ත්වක්) කුරුඳුපොතු
වැල්මී
ශතපුෂ්ප
බාලක (හ්‍රීවෙර)
ශතපුෂ්ප
මාෂක 1 බැගිනි. (ග්‍රෑම් 1)

මානෙල් අල
නෙල්ලි
භද්‍රමුස්තක
පැසුණු අළුකෙහෙල් ගෙඩි
රටඉඳි ඇට
කළුතල
ඉකිරි ඇට

කස්තූරි හැර අන්‍ය ඖෂධ චූර්ණ කරන්න.

සංස්කරණය :— (සිතශර්කරා) සුදුසීනි සියළු ඖෂධ මෙන් දෙගුණයකි. එලකිරි, චූර්ණය මෙන් සය ගුණයකි. ඒ සමාන නෙල්ලි යුෂ, පුහුල් යුෂ, මේවා ගෙන මෝදක පදමට සාද කස්තූරි ද මිශ්‍ර කොට ගත යුතු ය.

ප්‍රයෝග :— සියලු ප්‍රමේහ, වාපිත්, සෙම්, සන්නිපාත, සෝමරොග, බහුවිධ මූත්‍රාතිසාර, මූත්‍රකෘච්ඡ්‍ර, මූත්‍රාඝාත, අශ්මරී, ග්‍රහණී, පාණ්ඩුරෝග, කාමලා, කුම්භ කාමලා, නසයි. හෘද්‍ය යි. වෘෂ්‍ය යි. බලකර යි.

මාත්‍රාව :— අක්ෂ ප්‍රමාණයකි. (ග්‍රෑ: 15 කි.)

7. යෝග නාමය :— **කාංකායන මෝදකය.**

යෝගය :—

අරළු චූර්ණය	පලම්	5 යි.	(ග්‍රෑ: 300)
කළුදුරු			
ගම්මිරිස්			
තිප්පිලි චූර්ණය	පල	1 බැගිනි	(ග්‍රෑම් 60)
තිප්පිලිමුල් චූර්ණය	පල	2 යි.	(ග්‍රෑම් 120)
සිවිය චූර්ණය	පල	3 යි.	(ග්‍රෑම් 180)
රත්නෙටොල්මුල් චූර්ණය	පලම්	4 යි.	(ග්‍රෑම් 240)
වියලි ඉඟුරු	,,	5 යි.	(ග්‍රෑම් 300)
ශුද්ධ යවක්ෂාර	,,		(ග්‍රෑම් 220)
ශුද්ධ භල්ලාතක	,,	8 යි.	(ග්‍රෑම් 480)
කිඩාරම් අල	,,	16 යි.	(ග්‍රෑම් 960)
පුරාණගුඩ	,,	96 යි.	(ග්‍රෑම් 5760)

සංස්කරණය :— අඹරා මෝදක පරිභාෂා අනුව සකසන්නේ ය.

ප්‍රයෝග :— අග්නිය දල්වයි. ග්‍රහණි, පාණ්ඩු රෝග නසයි. විශෙෂයෙන් ශස්ත්‍රක්ෂාරාග්නි කර්ම නොයෙදිය හැකි අර්ශස්වලට විශේෂයෙන් ගුණයි.

අනුපාන :— ශීතල ජලය හෝ සුදුසු අනුපානයක් යෙදිය යුතු යි.

මාත්‍රාව :— ශාණ 2 ක් (ග්‍රෑම් 8) හෝ යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

8. යෝග නාමය :— **කාමේශ්වරි මෝදකය.**

යෝගය :—

නෙල්ලි,
සවිඳලුණු,
කොට්ටං,
කට්එල,
තිප්පිලි,
වියලි ඉඟුරු,
හීන්අසමෝදගම්,
මහඅසමෝදගම්,
වැල්මී,
සුදුදුරු,
කළුදුරු,
කොත්තමල්ලි,
ශටී,
කර්කටකශෘංගි,
වදකහ,
නාමල්රේණු,
තාලිසපත්‍ර,
ත්‍රිසුගන්ධි,
ගම්මිරිස්,
අරළු.
බුළු,
බුළු, සමභාග යි.

කංසා ඇට සහ කොළ (ගිතෙලින් බැද) සියල්ල බරට ගත යුතු යි.
ඒ සියල්ල මෙන් දෙබරක් සීනි ගත යුතු යි.
ගිතෙල් සහ මීපැණි අවශ්‍ය ප්‍රමාණයෙනි.

සංස්කරණය :— සියල්ල චූර්ණකර ගිතෙල් සහ මීපැණි සමඟ මෝදක පරිභාෂා අනුව සාද ගත යුතු යි. පසුව බැදි තල සහ කපුරු යොද යෝගය සුවඳවත් කරනු ලැබේ.

ප්‍රයෝග :— ආධිව්‍යාධි, (මනොව්‍යථා, කායිකව්‍යථා) හර ය. ක්ෂය, කුෂ්ඨ, නාශක යි. වෘංහණ යි, කාමවර්ධක යි. සෞන්දර්‍ය්‍යය වඩයි. කාමාග්නිය දීප්ති කරයි. කාස සහ කළු රෝග නාශක යි. ග්‍රහ දෝෂ නසයි. විශේෂයෙන් ග්‍රහණි නසයි.

මාත්‍රාව :— තෝලා 1/4 — 1/2 (ග්‍රෑ: 3 — 6) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

අනුපාන :— කිරි සමඟ යොදනු ලැබේ.

9. යෝග නාමය :— **ගෝක්ෂුරාදි මෝදකය. (ත්‍රිකණ්ටකාදි මෝදකය)**

යෝගය :—

ගොකටු ඇට,
ඉකිරි ඇට,
අශ්වගන්ධා,
භාතාවාරිය අල,
බිංතල්,
වදුරු මෑ ඇට,
වැල්මී,
නාගබලා,
බලා,

චූර්ණ පලං 2 බැගිනි. (ග්‍රෑම් 120)
එළකිරි චූර්ණය මෙන් අට ගුණය යි.
ශර්කරා දෙගුණය යි.
ගිතෙල් චූර්ණය සමව ගත යුතු ය.

සංස්කරණය :— චූර්ණය ගිතෙලින් බැද එළකිරි සහ සීනි සමඟ මෝදක පාක ක්‍රමයට ගිතෙල් ද යොද මෝදකය සාදා ගන්නේ ය.

ප්‍රයෝග :— වාජීකරණ යි.

මාත්‍රාව :— මාෂක 2 — 4 (ග්‍රෑ: 2 — 4) දක්වා යෝගය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

10. යෝග නාමය:- - **චෝපචිනී පාකය**

චීන අල අති සූක්ෂ්ම චූර්ණය තෝලා 48 යි, තිප්පිලි, තිප්පිලි මුල්, ඉඟුරු, ගම්මිරිස්, කුරුඳුපොතු, අක්කරපට්ට, කරාබු, තෝලා 01 බැගින්, (තෝලා 55 යි), සිනි තෝලා 55 යි, සිනි වතුර සමඟ දියකර පත්පැණි පදමට උණු කර, චූර්ණ මිශ්‍ර කොට මෝදකයක් වශයෙන් බාගෙන වායු නිවාරණ බඳුනෙක සංරක්ෂණය කෙරේ.

මාත්‍රාව :— තෝලා 01 යි. උදේ සවස. අනුපාන මඳ උණු වතුර ය.
ගුණ :— උපදංශ, පරංගි, පීරංග, ව්‍රණ, කුෂ්ඨ, භගන්දර, ප්‍රමේහජ සහ වාතජ සන්ධිවාත, ධාතුක්ෂ, කාස. ක්ෂය, ප්‍රතිශ්‍යාය සුව කෙරේ. පුෂ්ටිකර ය.

(ආයුර්. සාර. සං — ශ්‍රී යෝ. 6.)

11. යෝග නාමය :— **මදන මෝදකය.**

යෝගය :—

තිකුළු,
තිපල්,
කකුළු සුඟු,
කොට්ටම්,
කොත්තමල්ලි,
සව්දලුණු,
ශයී,
තාලිසපත්‍ර,
කට්ඵල,
නාමල්රේණු,
අසමෝදගම්,
යමානි,
වැල්මී,
උළුහාල්,
දෙදුරු, සමභාගව ගත යුතු යි.

කල්කය හා සමාන බරක් ගිතෙලින් බැද ගත් කංසා ඇට සහ කොළ ගත යුතු යි.
ඒ සියල්ල බරට සීනි ගත යුතු යි.

සංස්කරණය :— ත්‍රිසුගන්ධ, කපුරු, ප්‍රමාණවත්ව යොද මීපැණි, ගිතෙල් යොද මෝදක පරිභාෂාව අනුව සාද ගන්නේ ය. මෙහි දී අඹරා ගැනීම අනුදන්නේ ය.

ප්‍රයෝග :— වාතජ සහ කඵජ රෝග, කාස, සියළු ශූල, ග්‍රහණි, වලිපලිත, ආමවාත විකාර, සංග්‍රහ ග්‍රහණි, යන රෝග නසයි. රුචිකර යි. අග්නි වර්ධක යි. කාමදීපන යි.

මාත්‍රාව :— මාෂක 1 — 2 දක්වා යි. (ග්‍රෑම් 1 — 2)

12. යෝග නාමය :— **මුස්තකාදි මෝදකය.**

යෝගය :—

කොත්තමල්ලි,
තිපල්,
කීකිරිදිය,
එන්සාල්,
තේජපත්‍ර,
කරාබු,
නාමල්රේණු,
ශිලාජතු,
වියලිඉඟුරු,
තිප්පිලි,
ගම්මිරිස්,
සුදුදුරු,
කළුදුරු,
අයමෝදගම්,
බාලා (ඉරිවේරිය)
ධාතකී,
කොට්ටම,
වසාවාසි,
කුරුඳුපොතු,
ශතපුෂ්ප,
අජමෝද,
හපුෂා,
නාගපර්ණි (බුලත් මුල් සහ කොළ),
වදකහ,
ශටි,
ජටාමාංසි,
කෙළිදසාල්,
උණකපුරු,

කට්ඵල — සමභාගව ගෙන චූර්ණකර ගත යුතු යි.

මුස්තක චූර්ණය, සියළු චූර්ණය බරට ගන්නේ ය.

සිනි චූර්ණය මෙන් දෙ ගුණය යි.

සංස්කරණය :— මීපැණි, ගිතෙල් සමඟ අඹරා මෝදකය සාද ගත යුතු යි.

ප්‍රයෝග :— පාචකාග්නිය බොහෝ සෙයින් දල්වයි. රක්තස්‍රාව යුක්ත සය වැදෑරුම් ග්‍රහණි, අතිසාර, දරුණු උණ, පාණ්ඩු රෝග, හලීමක, කෘමි රෝග, රක්තපිත්ත, සහ අසාධ්‍ය අර්ශස් රෝග යන මේවා නසයි.

මාත්‍රාව :— කලං 1/2 — 1 — (ග්‍රෑම් 2.5 — ග්‍රෑම් 5) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු ය.

13. යෝග නාමය :— **මාණිභද්‍ර මෝදකය.**

වළහසාල් මද,	තිරස්සවාලුමුල්, පලං 3 යි. (ග්‍රෑ: 180)
තෙල්ලි,	උක්හකුරු පලං 6 යි. (ග්‍රෑම් 360).

අරළු, මෙවා පලං 1 (ග්‍රෑ: 60) බැගින්.

සංස්කරණය :— චූර්ණකොට ඇඹරීමෙන් මෝදකය සාද ගන්නේ ය.
ප්‍රයෝග :— අර්ශස්, කාස, ක්ෂය, කුෂ්ඨ, හා භගන්දරයෙහි යෙදේ.
මාත්‍රාව :— තෝලා 2 මාෂා 1 රති 6 යි, වරකට දිය යුතු මාත්‍රාව ය. (ග්‍රෑ: 25-75)

14. යෝග නාමය :— **මෙථි මෝදකය.**

යෝගය :—

ත්‍රිකටු,	කර්කටකශෘංගි,	එන්සාල්
තිපල්,	අසමෝදගම්,	සාදික්කා,
කලාඳුරු අල,	සහිඳලුණු,	වසාවාසි,
සුදුදුරු,	බළල්ලුණු,	කරාබු,
කළුදුරු,	තාලිසපත්‍ර,	මුරාමාංසි,
කොත්තමල්ලි,	නාමල්රේණු,	කපුරු,
කටඑල,	තේජපත්‍ර,	සුදුහඳුන්,
සුවඳකොට්ටං,	කුරුඳුපොතු,	අසමෝදගම්,

සමභාගව ගත යුතුයි.

උළුහාල්. සියළු චූර්ණ බරට බරකි. ඒ සියල්ල බරට බරක් පුරාණ ගුඩ ගත යුතු යි.

සංස්කණය :— සියල්ල මැනැවින් චූර්ණ කොට ගිතෙල් සහ මධු මිශ්‍රකොට අඹරා මෝදකය පිළියෙල කර ගත යුතු ය.
ප්‍රයෝග :— අග්නිය දල්වයි. ආමදෝෂ නසයි. මේදෙ රෝග හර යි. බල–වර්ණ ඇති කරයි. සංග්‍රහ ග්‍රහණි, ප්‍රමේහ, මූත්‍රඝාත. අශ්මරි, පාණ්ඩු රෝග, කාස. යක්ෂ්මා සහ කාමලා නසයි. දෘෂ්ටි ප්‍රසාදය ස්ත්‍රී-පුරුෂ වීර්‍ය්‍ය, පුත්‍ර ලාභය ඇති කරයි.
අනුපාන :— ගිතෙල්, මීපැණි සමඟ යොදනු ලැබේ.
මාත්‍රාව :— තෝලා 1/2 — 1 (ග්‍රෑ: 6 — 12) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට අග්නිබලය දැන යෙදිය යුතු ය.

යෝග නාමය :— **සූරණ මෝදකය.**

යෝගය :—

කිඩාරම් අල,	වියලි ඉඟුරු,	
වෘද්ධදරු,	තිප්පිලි,	
භාග 16 බැගිනි.	හල්ලාහක (ශෝධිත),	
බිංතල් අල,	තිප්පිලිමුල්,	
රත්නෙටුල්,	තාලිසපත්‍ර,	
භාග 8 බැගිනි.	භාග 4 බැගිනි.	
අරළු,	කුරුඳුපොතු,	
බුළු,	හින්එන්සාල්,	
නෙල්ලි,	ගම්මිරිස්,	භාග 2 බැගිනි.

ගුඩ සියල්ල බරට දෙගුණයක් ගත යුතු ය.

සංස්කරණය :— අඹරා මෝදකය පිළියෙල කළ යුතු ය.
ප්‍රයෝග :— අග්නිවර්ධක යි. අර්ශස් නසයි. ග්‍රහණි, වාතය, සෙම, ශ්වාස, කාස, ක්ෂය, ප්ලීහ රෝග, ශ්ලීපද, ශෝථ, හික්කා, මේහ, භගන්දර, පලිත නසයි. වෘෂ්‍ය යි.
මාත්‍රාව :— කලං 1 — 2 (ග්‍රෑම් 5 — 10) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

15. යෝග නාමය :— **සෞභාග්‍ය ශුණ්ඨි මෝදකය.**

යෝගය :—

ත්‍රිකටු,	ලෝහභස්ම,	තේජපත්‍ර,
තිපල්,	අභ්‍ර භස්ම,	තාලිසපත්‍ර,
කුරුඳුපොතු,	කර්කටකශෘංගි,	නාමල්රේණු,
සුදුදුරු,	කටඑල,	ගන්ධමාත්‍රා,
කළුදුරු,	කලාඳුරු අල,	ශටී,
කොත්තමල්ලි,	හින්එන්සාල්,	වැල්මී,
කොට්ටම්,	සාදික්කා,	කරාබු,
අසමෝදගම්,	ජටාමාංස,	රත්සඳුන්,
		සමභාගව ගත යුතු ය.

වියලි ඉඟුරු සියල්ල බරට ගත යුතුය.
සීනි සියල්ල මෙන් දෙගුණය යි. ඒ සියල්ල මෙන් සිවු ගුණයක් එළකිරි ද ගත යුතු ය.

සංස්කරණය :— පාක මෝදකය පිළියෙල කරන්නේ ය.

ප්‍රයෝග :— අම්ලපිත්ත, අරෝචක, ශූල, හෘද්‍රෝග, වමන, කණ්ඨදහ, හෘදදහ, ශිරඃ ශූල, මන්දග්නි. හෘත් ශූල, පාර්ශ්ව ශූල, කුක්ෂි ශූල, වස්ති ශූල, ගුද ප්‍රදේශයෙහි පීඩා නසයි. බල-පුෂ්ටිකරයි. වාජීකරණ යි. විශේෂයෙන් අම්ලපිත්ත, මූත්‍රකෘච්ඡ්‍ර, ජ්වර භ්‍රම නස යි.

අනුපාන :— එළකිරි හෝ ජලය සමඟ ය.

මාත්‍රාව :— තෝලා 1 (ග්‍රෑම් 12) බැගින් යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට දෙන්නේ ය.

16. යෝග නාමය :— **ශිවා මෝදකය.**

යෝගය :—

අරළු,
එළපිටවක්කා,
මූර්වා,
ශතපුෂ්ප,
හරිද්‍රා,
දරු හරිද්‍රා,
වඳුරු මෑ ඇට,
බැබිල,
බෙලි,
කරාබු,
හාතාවාරිය,
මුරාමාංසි,
ශතපුෂ්ප,
ජටාමාංස,
කිරිබද්ද,
ඉඟුරු,
ඉරමුසු = (අනන්තා)
ශ්‍යාමා (කළු ඉරමුසු)
හාර්ගී, (සිරිතේක්කු),
ගජතිප්පිලි,
තිප්පිලි,
කුරුඳුපොතු,
හීන්එන්සාල්,
තේජපත්‍ර,
නාමල්රේණු,
උළුහාල්,
* චන්ද්‍ර ශූර,
කළුදුරු,
අසමෝද,
සුදුහඳුන්,
රත්හඳුන්,
බින්තල්,
අශ්වගන්ධ,
ගොක්ෂුර ඇට, — **සම භාගව ගත යුතු ය.**

ද්‍රාක්ෂා සියළු චූර්ණය බරට බරක් ගත යුතු ය.
ද්‍රාක්ෂා බරට සීනි හෝ මීපැණි යෙදිය යුතු ය.

සංස්කරණය :— අඹරා මෝදකය සාදා ගත යුතු ය.

ප්‍රයෝග :— බාලයින්ගේ සියළු රෝග නසයි. පුෂ්ටිකර යි. බල වඩ යි. පාචකාග්නිය, මේධා, ආයුවර්ධක යි.

අනුපාන :— මන්දෝෂ්ණ කිරි සමඟ ය.

මාත්‍රාව :— මාෂක 1 — 2 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

---

* චන්ද්‍ර ශූර, අබ (Crucifereae) කුලයට අයත්. Lepidium Sativum Linn නැමැති පැලෑටියේ ඇටය. අබ ප්‍රතිනිධිය වේ.

පිණ්ඩි – ගුඩ ඛණ්ඩය

1. යෝග නාමය :— **ආර්ද්‍රක ඛණ්ඩය.**

යෝගය :—

අමුඉඟුරු යුෂ	ප්‍රස්ථ	1 යි.	(මි: ග්‍රෑ 960)
ගිතෙල්	කුඩව	2 යි.	(ග්‍රෑ: 480)
එළකිරි	ප්‍රස්ථ	2 යි.	(ලී: 1.92)
ශර්කරා	ප්‍රස්ථ	1 යි.	(ග්‍රෑ: 960)

ප්‍රක්ෂෙපය :—
ගජතිප්පිලි,
තිප්පිලිමුල්,
ගම්මිරිස්,
වියලි ඉඟුරු,
රත්නිවුල්,
වළගසාල්,
කලාදුරු,
නාමල්රේණු,
කුරුඳුපොතු,
එන්සාල්,
තේජපත්‍ර,
ශයී — පල 1 බැගිනි. (ග්‍රෑ: 60)

සංස්කරණය :— ප්‍රක්ෂෙපය සියුම්ව චූර්ණකොට යොදා, ඛණ්ඩ පාකයට පිළියෙල කොට ගත යුතු යි.

ප්‍රයෝග :— ශීතපිත්ත, උදර්ද, කෝඨ, යක්ෂ්මා, රක්තපිත්ත, අම්ල පිත්ත, රෝගයනට යෝග්‍ය වේ.

මාත්‍රාව :— කර්ෂ 1 යි. (ග්‍රෑ: 15)

2. යෝග නාමය :— **කල්‍යාණ ගුඩය.**

යෝගය :— නෙල්ලි සවරස හෝ ක්වාථය ප්‍රස්ථ 6 යි. (ලීටර් 5.76 යි.)
ගුඩ පලම් 50 යි. (ග්‍රෑ: 3000)
තිප්පිලි මුල් චූර්ණය
සුදුදුරු,
සිවිය,
තිකුළු,
ගජතිප්පිලි,
හපුෂා (ප්‍රතිනිධි ගම්මිරිස්)
කොත්තමල්ලි — පලම් 1 බැගිනි, (ග්‍රෑම් 60)
අසමෝදගම්,
වළගසාල්,
සහිඳලුණු,
ත්‍රිඵලා,
අසමෝදගම්,
දියමිත්ත,
රත්නෙවුල් මුල්,

තිරස්සවාලු චූර්ණය	පලම්	8 යි.	(ග්‍රෑම් 480)
ත්‍රිසුගන්ධ මිලිතව	පලම්	1 බැගිනි.	(ග්‍රෑම් (60)

සංස්කරණය :— තිරස්සවාලු සුණු තලතෙලින් මඳක් බැද, ඉන්පසු, නෙල්ලි යුෂ හා ගුඩ යොද ගුඩ පරිභාෂාව අනුව පාකය සාද ගත යුතු ය.

ප්‍රයෝග :— ශ්වාස, කාස, ස්වරභේද, ශෝථ සහිත, ග්‍රහණී රෝගයට හිත යි. අග්නි වඩයි.

මාත්‍රාව :— තෝලා 1/2 (ග්‍රෑම් 6 යි.)

3. යෝග නාමය :— **ගුඩ කුෂ්මාණ්ඩකය.**

යෝගය :—

පුරාතන පුහුල් මද	පලම්	100 යි.	(ග්‍රෑ: 6000)
තලතෙල්	පලම්	1 යි.	(ග්‍රෑ: 60)
ගිතෙල්	පලම්	1 යි.	(ග්‍රෑ: 60)
උක්සකුරු	පලම්	100 යි.	(ග්‍රෑ: 6000)

චූර්ණය :—
කුරුඳුපොතු
තේජපත්‍ර,
කොත්තමල්ලි,
තිකුළු,
කළුදුරු,
සුදුදුරු,
මහඑන්සාල්,
හීන්එන්සාල්,
රත්නිවුල්,
තිප්පිලිමුල්,
සිවිය,
ගජතිප්පිලි,
ඉඟුරු,
කටුපෙදගෙඩි (ශෘඩගාටක),
කෙකටිය අල,
කොට්ටකෙලෙංගු,
තල්ගොබ,

පලම් 1 බැගිනි. (ග්‍රෑ: 60)
මීපැණි පලම් 8 යි. (ග්‍රෑ: 480)

සංස්කරණය :— පුරාතන පුහුල් ඇට පොතු හැර මිරිකා, යුෂ වෙන්කර, ඉන් ස්වේද දී පසුව තලතෙල් සහ ගිතෙල් මිශ්‍රකර, රත් පැහැ වනතුරු ඒ තෙලින් පුහුල් බැද ගත යුතු වේ. මිරිකා වෙන්කළ පුහුල්දිය ආධකයකට උක් සකුරු දියකර පෙරා, බැදි පුහුල් බහා පිස ගන්නේ ය. ආසන්න පාකයෙහි දී නියමිත චූර්ණ මිශ්‍රකර බා, නිවුනා පසු, මී පැණි සංයෝග කරන්නේ ය. මෙම ගිතෙල් ප්‍රමාණය අවශ්‍ය පදමට වැඩි කළ යුතු ය.

ප්‍රයෝග :— සෙම්, පිත් වායු නාස යි. කෘශ වූවන්ගේ සිරුර පුෂ්ටිමත් කෙරේ. එය උත්තම වාජීකරණයෙකි. ක්ෂය වූවන්ට උතුම් ඔසුවකි. කාස, ස්වාශ, හික්කා, උණ, වමන, අරුචි යන මේවා නසයි.

අනුපාන :— එළකිරි.

මාත්‍රාව :— කලං 1/2 — 3 යි. (ග්‍රෑම්ස් 7.5 — ග්‍රෑ: 15) දක්වාය.

4. යෝග නාමය :— **ධාත්‍රී රසායනය**

යෝගය :—

වියලි නෙල්ලි	පලම	64 යි.	(ග්‍රෑ: 3840)
උණ කපුරු	,,	16 යි.	(ග්‍රෑ: 960)
තිප්පිලි	,,	4 යි.	(ග්‍රෑ: 420)
හීන් එන්සාල්	,,	1 යි.	(ග්‍රෑ: 60)
හීන් කුරුඳුපොතු	,,	1 යි.	(ග්‍රෑ: 60)
තේජපත්‍ර	,,	1 යි.	(ග්‍රෑ: 60)
නාමල්රේණු	,,	1 යි.	(ග්‍රෑ: 60)
සීනි	තුලා	1 යි.	(ග්‍රෑ: 6000)
එලකිරි	ද්‍රෝණ	1 යි.	(ලී: 15.36)
ගිතෙල්	මනා	1 යි.	(ග්‍රෑ: 480)
තලතෙල්	මනා	1 යි.	(මි:ලී: 480)
මීපැණි	නැලි	1 යි.	(ග්‍රෑ: 960)

සංස්කරණය :— එළකිරට සීනි දියකර, උණුකර, චූර්ණ කළ යුතු දෙය චූර්ණ කර ඊට යොදා ලේහ පදමට එනවිට ගිතෙල් තලතෙල් බහා පාකයට ගෙන නිවුනායින් පසු මීපැණි මිශ්‍රකර ගත යුතු යි.

ප්‍රයෝග :— සෝමරෝග, ශ්වේතප්‍රදර, රක්තපිත්ත, නාශක යි. තර්පණ යි. සප්ත ධාතු වඩයි.

5. යෝග නාමය :— **ප්‍රමේහ ගජකේශරී රසායනය.**

යෝගය :—

නෙළුම්මල්රේණු
වැල්මී
මානෙල්අල
හාතාවාරිය අල
අමුක්කරා
ඉකිරි ඇට (ඉක්ෂුගන්ධා)
ත්‍රිසුගන්ධ
ලොධ්‍ර
* තක්කොල (වාල්මොලගු)
ජාතිඵල
පෞෂ්කර (සුවදකොට්ටම්)
කලාදුරු අල.

අමුකපුරු
ලාමජ්ජක (සැවැන්න)
රාජමාශ (ප්‍රතිනිධි — උඳු)
දෙදුරු
මෘද්විකා
තලපොට බීජ (රණවරා ඇට)
සුදුහඳුන්
රත්හඳුන්
කුංකුම
තාලකන්ද (කොට්ටකෙලෙංගු) කෙනෙක් බිංතල් අල යොදති
අබිං
බදරීඵල (මසන්ගෙඩි)
මාදංපොතු — සමභාගව ගත යුතු යි.

චූර්ණකර රසකිඳපිටි බරක් සහ කිරිබදු පිටි බරක් ගෙන නවනීත, මීපැණි, සීනි සමහ අඹරා හෝ යෝග්‍ය මාත්‍රාව නවනීත, මීපැණි, සීනි සමග හෝ වළඳන්නේ ය.

විශේෂ සංස්කරණය :— චූර්ණය ගිතෙලින් මදක් බැද මීපැණි, සීනි යොද, හොඳින් අඹරා බුළු තරමට ගුලි කරන්න.

ප්‍රයෝග :— ශුක්ලමේහ, රක්තමේහ, මූත්‍රාඝාත, මූත්‍රදෝෂ, සෝමරෝග, මූත්‍රකෘච්ඡ්‍ර,සිකතාමේහ, අශ්මරී රෝගයන්හි සුප්‍රසිද්ධ ය.

මාත්‍රාව :— මංචාඩි 10 — 15 දක්වා. (ග්‍රෑ: 2.5 — 3.75).

අනුපාන :— කිරි,

සැ: යු :— *කපුකිනිස්ස ඇට යෙදීම වෘද්ධව්‍යවහාරයෙකි.

6. **යෝග නාමය :—** **ප්‍රමේහ ගජාංකුශය.**

යෝගය :—

කෝමාරිකා යුෂ
හාතාවාරියඅල යුෂ,
කළුලක් යුෂ,
අමුනෙල්ලි යුෂ,
කිරිබදුඅල යුෂ
කිකිරිදිය යුෂ,
පුහුල් යුෂ,
තැඹිලි වතුර — මනා 1 බැගිනි. (මි:ලි: 480)

ශුද්ධ අබින්	පල	1	(ග්‍රෑ: 60)	දෙවිදුරු	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
එළඉඹුල් මැලියම්	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	බිංතල් අල	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
සෙන්කොට්ටන්	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	තිප්පිලි	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
අසමෝදගම්	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	කරාබු	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
වසාවාසි	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	සාදික්කා මද	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
වාල්මොලහු	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	අරළු	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
වැල්මී	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	කංසාකොල	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
වළහසාල්	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	කුරුඳුපොතු	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
තෙල්ලි	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	කොට්ටං (සුවඳ)	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
කළුදුරු	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	සුදුදුරු	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)
රතුලූනු	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)	ඉඟුරු	පල	2 1/2 යි.	(ග්‍රෑ: 150)

ගම්මිරිස්,
කටුකරෝසන,
බෝඇට,
තුන්පත් කුරුඳුකොල
සුදුවදුරු මෑ,
කළුවදුරු මෑ,
ශාලාමිශ්‍රි,
සුදුකසකසා ඇට,
රූමස්තකි,
කලාදුරු,
ඉරමුසු,
අමුක්කරා.
කොහොඹපොතු,
කොත්තමල්ලි,
සුදුලූනු,
පිතකරෝසන,
බිම්පොල්,
අත්තික්කා ඇට,
මුරුංගාඇට,
රටඉදි,
කච්චුක්කායි. (හිඟුරුපියලි)
නුගඇට — පල 2 1/2 බැගින්. (ග්‍රෑම් 150)

සංස්කරණය :— මුලින් සඳහන් කරන ලද ද්‍රව සියල්ල පිරිසිදු බඳුනක බහා ලිප තබා පාදයට සිඳුවා, ඉහත සඳහන් ද්‍රව්‍ය චූර්ණ ඊට බහා ගිතෙල් කිරි සහිතව පදමට උයා බා නිවුන පසු, මීපැණි මිශ්‍රකර ගත යුතු වේ.

ප්‍රයෝග :— විසි වැදෑරුම් ප්‍රමේහ, වාතරක්ත, රක්ත ප්‍රමේහ, අග්නිමාන්ද්‍ය, අර්ශස්, පිළු බව, වාත ග්‍රහණී, ක්ෂය ආදී රෝග නසයි.

සැ: යු:— මෙම සංස්කරණයෙහි දී සිනි, මීපැණි, ප්‍රමාණය වැඩි කිරීම යෝග්‍ය ය යි සලකනු ලැබේ. චූර්ණය පලං 108 1/2 කි. මධුර පදර්ථ අල්ප නිසා යෝගය පුස් සෑදීමෙන් නරක් විය හැකි ය. ඒ නිසා යටත් පිරිසෙයින් බෙහෙත් බරින් අඩක් සිනි ගත යුතු ය යි සලකමු.

7. **යෝග නාමය :—** **හාර්ගි ගුඩය.**

යෝගය :—

හාර්ගි (සිරිතේක්කු ප්‍රතිනිධිය) පලං 100 යි. (ග්‍රෑම් 6000)
දශමූල මිලිතව පලං 100 යි. (ග්‍රෑ: 6000)
ලිහිල් ලෙස පොට්ටනිය බැඳගත් සම්පූර්ණ අරළු ගෙඩි 100 යි. (සේරු 2 යි. විතා)
වතුර සේරු 108 යි. (ලිටර් 103.68)
ශේෂය සේරු 27 යි. (ලිටර් 25.92)
ක්වාථය සිදුනාට පසු පෙරා ගන්නේ ය.

සංස්කරණය :— පළමුකොට පුරාතන ගුඩ පලං 100 ක් (ග්‍රෑම් 6000) ක්වාථයට දියකර පෙරා ගත යුතු ය. ඉන්පසු අරළු සියය නොහොත් සේරු 2 ඇට ඉවත් කර හොඳාකාර අඹරා ක්වාථයට දියකර ගන්නේ ය. එම මිශ්‍රණය මඳ ගින්නෙන් සිඳුවා ඝන අවස්ථාවට ආසන්න වූ කල්හි,

කල්කය :— ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, කුරුඳුපොතු, තේජපත්‍ර, එන්සාල්, පලං 1 (ග්‍රෑම් 60) බැගින්, යවක්ෂාර තෝලා 4 යි. (ග්‍රෑම් 48) චූර්ණ කොට ඊට බහා මිශ්‍ර කොට පදමට බා ගන්නේ ය. සිසිල් වූ කල්හි මීපැණි පලං 6 ක් මිශ්‍ර කළ යුතු ය.

ප්‍රයෝග :— ප්‍රබල ශ්වාස, කාස, පීනස, වුජ්වුස දුර්වලතා ආදියෙහි යෙදේ.

මාත්‍රාව :— කර්ෂ 1/2 — 2 (ග්‍රෑම් 7.5 — 30) දක්වා ය. අරළු ගෙඩියක් හෝ අර්ධයක් සමඟ වළඳන්නේ ය.

8. යෝග නාමය :— **රණහංස රසායනය.**

යෝගය :—

ශුද්ධ අබින් කලං 12 යි. (ග්‍රෑම් 60 යි.)

කරාබු,
වසාවාසි,
සාදික්කා,
එලඟිඹුල් මැලියම්,
කත්සාකොල, (කලං 12 යි.)
සුවඳකොට්ටම්,
අරළු,
බුළු,
නෙල්ලි,
පීතකරෝසන,
වගපුල්,
අසමෝදගම්,
සෙම්කොට්ටං,
කළුදුරු,
සුදුදුරු,
එන්සාල්,

කුංකුමප්පූ,
වැල්මී,
සුදුලූනු,
රත්නිටුල්,
තලිස්පතුරු,
කොත්තමල්ලි,
සුදුහඳුන්,
වළහසාල්,
වාල්මොලඟු මද,
හීන්කුරුඳුපොතු,
කොල්ලන්කොල,
අක්‍රපට්ට,
මානෙල්අල,
එලබලිදමුල්,
මහඑන්සාල්,
කොට්ටකෙලෙංගු, එක වගෙන් කලං 9 බැගින්

මිදි (මුද්දරප්පලම්) පලම් 4 යි. (ග්‍රෑ: 240)
වීන අල පලම් 4 යි. (ග්‍රෑ: 240)
ඉරමුසු පිටි පලම් 4 යි. (ග්‍රෑ: 240)
හීන්ගොකටු පලම් 4 යි. (ග්‍රෑ: 240)
රසකිඳ පිටි පලම් 4 යි. (ග්‍රෑ: 240)
පිටි සීනි පලම් 4 යි. (ග්‍රෑ: 240)

කෝමාරිකා යුෂ,
කිරිබදු අල යුෂ,
නෙල්ලි යුෂ,
පුහුල් යුෂ,
තැඹිලි වතුර,
කළු උක් යුෂ,
ලුණුවිල යුෂ,
රණවරාකොළ මල් යුෂ,
කැහිපිත්තං යුෂ,
නැළි 1 1/4 බැගිනි. (ලී: 1.2)

සංස්කරණය :—

යුෂ වර්ග ලිප තබා නැළි 4 ට (ලී: 3.84) සිඳුවා ඊට,
එළකිරි නැළි 1 යි. (මි:ලී: 960)
ගිතෙල් නැළි 1 යි, (ග්‍රෑම් 960)
යොදා අබින් හැර අනික් චූර්ණය යොදා මඳ ගින්නෙන් උයා පදම් වෙගෙන එන විට අබින් දියකර පදමට බා නිවුන පසු මීපැණි නැළි 1 1/2 ක් (ග්‍රෑම් 1440) දමා කලවන්කර ගත යුතු ය.

ප්‍රයෝග :— පක්ෂාඝාත, විංශතිවිධ ප්‍රමේහ, ධාතුක්ෂය, පරංගි, දද, කුෂ්ඨ, ආදියට හිත යි.

සැ: යු :— මෙයට ද සීනි මීපැණි ප්‍රමාණය ප්‍රමේහ ගජාංකුශයෙහි නියමය අනුව වැඩි කළ යුතුව තිබේ.

9. යෝග නාමය :— **හරිද්‍රා ඛණ්ඩය.**

යෝගය :—

හරිද්‍රා (චූර්ණ) පල 8 යි. (ග්‍රෑ: 480)
ඝෘත පල 6 යි. (ග්‍රෑ: 360)
එලකිරි ආඪක 1 යි. (ලී: 384)
සීනි තුලා 1/2 යි. (ග්‍රෑ: 3000)
මඳ ගින්නෙන් මැටි භාජනයක පාක කොට,

ප්‍රක්ෂේපය :—

තිකුළු,
කුරුඳුපොතු,
තේජපත්‍ර,
එන්සාල්,
කලාඳුරුඅල,
වළහසාල්,
ත්‍රස්තවාලු,
තිපල්,
නාමල්රේණු,
ලෝහ භස්ම. — පල 1 බැගිනි. (ග්‍රෑ: 60).
චූර්ණය යොදා ඛණ්ඩපාකයට සාදා ගත යුතු ය.

ප්‍රයෝග :— ශීතපිත්ත, උදර්ද, කෝඨ ආදි අවස්ථාවනට යෝග්‍ය වේ.

මාත්‍රාව :— කර්ෂ 1 කි. (ග්‍රෑ: 15).

රස බණ්ඩය

1. යෝග නාමය :— **අග්නි කුමාර රසය.**

යෝගය :—

ශෝධිත	රසදිය	තෝලා	1 යි.	(ගු: 12 යි.)
,,	ගන්ධක	,,	1 යි.	(ගු: 12 යි.)
,,	ටංකණ	,,	1 යි.	(ගු: 12 යි.)
,,	වච්චනාවි	,,	3 යි.	(ගු: 36 යි.)
	කපර්ද භස්ම		3 යි.	(ගු: 36 යි.)
	ශංඛ භස්ම	,,	3 යි.	(ගු: 36 යි.)
	ගම්මිරිස් චූර්ණය	,,	8 යි.	(ගු: 96 යි.)

සංස්කරණය :— පූර්වෝක්ත ද්‍රව්‍ය සුණු කොට ජම්බීර රසයෙන් (=ඇඹුල් දෙඩම් ඇඹුලින්) අඹරා රක්තිකා පමණ ගුලි පිළියෙල කර ගත යුතු ය.

ප්‍රයෝගය :— විසූචිකාව, අජීර්ණය, ආපානවායු විකාරය, යන අවස්ථාවල දී ප්‍රයෝග කරනු ලැබේ. ග්‍රහණී රෝගයට ද මනා ය.

අනුපාන :— යෝග්‍ය අනුපානයක් අවස්ථාව පරිදි යොද ගනු උචිත වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

2. යෝග නාමය :— **අග්නි තුණ්ඩි රසය.**

යෝගය :—

ශෝධිත රසදිය
,, වච්චනාවි
,, ගන්ධක
අජමොද චූර්ණය
ත්‍රිඵලා
සර්ජික්ෂාර
යවක්ෂාර
රත්නෙවුල්
සහිඳලුණු
සුදුදුරු
සුවස ලුණු
වළභසාල් මද
සාමුද්‍ර ලවණ
ඉඟුරු
ගම්මිරිස්
තිප්පිලි

යන ද්‍රව්‍ය සම භාගව චූර්ණ කොට ගත යුතු ය.

සංස්කරණය :— ඒ සියල්ල බරට සමව ශෝධිත ගොඩකදුරු ඇට චූර්ණය ද යෙදිය යුතු වේ. එය ඇඹුල් දෙඩම් යුෂ හෝ දෙහි ඇඹුලෙන් අඹරා රක්තිකා පමණ ගුලි පිළියෙල කොට පවනැ වියලා වීදුරු බඳුනක අසුරා තැබිය යුතු ය.

ප්‍රයෝගය :— අග්නිමාන්ද්‍ය රෝගාවස්ථාවනට විශෙෂ වේ. තවද ග්‍රහණී රෝගයෙහි දී ද අවස්ථාවෝචිත පරිදි යෙදිය හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

සැ: යු :— තිකුළු වෙනුවට ටංගණ ද යොදති. (සමහර වට්ටෝරු වල)

3. යෝග නාමය :— **අග්නි රසය.**

යෝගය :—

ගම්මිරිස්	චූර්ණය	තෝලා	1 යි.	(ගු: 12 යි.)
කලාදුරු අල	,,	,,	1 යි.	(ගු: 12 යි.)
වදකහ අල	,,	,,	1 යි.	(ගු; 12 යි.)
කොට්ටං	,,	,,	1 යි.	(ගු: 12 යි.)
ශෝධිත වච්චනාවි		,,	4 යි.	(ගු: 48 යි.)

සංස්කරණය :— පූර්වෝක්ත ද්‍රව්‍ය චූර්ණය අමු ඉඟුරු සවරසයෙන් මනාව අඹරා රක්තිකා 1 ක් (මි. ගු: 125) පමණ ගුලි පිළියෙල කොට වියලා වීදුරු බඳුනක තබා ගත යුතු වේ.

ප්‍රයෝග :— සියළු අජීර්ණ, ආමාජීර්ණ රෝග සඳහා යෙදිය හැකි ය.

අනුපාන :— අවස්ථාවට සුදුසු පරිදි යෝග්‍ය අනුපානයක් යොද ගත හැකි වේ.

මාත්‍රාව :— ගුටිකා 1 — 2 යි.

4. යෝග නාමය :— **අර්ශස් කුඨාර රසය.**

යෝගය :—

ශෝධිත	රසදිය		තෝලා	1 යි.	(ග්‍රෑ: 12 යි.)	
,,	ගන්ධක		,,	2 යි.	(ග්‍රෑ: 24 යි.)	
	ලෞහ	භස්මය	පල	2 යි.	(ග්‍රෑ: 120 යි.)	
	තාම්‍ර	භස්මය	පල	5 යි.	(ග්‍රෑ: 120 යි.)	
	දන්ති මුල	චූර්ණය	පල	15 යි.	(ග්‍රෑ: 300 යි.)	
	තිකුළු	,,	පල	5 යි.	(ග්‍රෑ: 900 යි.)	(මිලිතව)
	කිඩාරම් අල	,,	පල	5 යි.	(ග්‍රෑ: 300 යි.)	
	උණකපුරු	,,	පල	5 යි.	(ග්‍රෑ: 300 යි.)	
	ටංගණ	,,	පල	5 යි.	(ග්‍රෑ: 300 යි.)	
	යවක්ෂාර	,,	පල	5 යි.	(ග්‍රෑ: 300 යි.)	
	සෛන්ධව	,,	පල	5 යි.	(ග්‍රෑ: 300 යි.)	
ශෝධිත	ස්නුහික්ෂීර (දළුක්කිරි)		පල	8 යි.	(ග්‍රෑ: 480 යි.)	
	ගෝමූත්‍ර		පල	32 යි.	(ලී: 1,920 යි.)	

සංස්කරණය :— පළමුව රස–ගන්ධක කජ්ජලි කොට සෙසු ද්‍රව්‍ය චූර්ණය සමඟ ද්‍රවයනට යොද මැටි බඳුනක ඝනීභූත වන තෙක් පැසවා ගුලි ගැසිය හැකි පදමින් බා මාෂ දෙකක් (ග්‍රෑම් 2) පමණ ගුලි පිළියෙල කොට පවනැ වියලා වීදුරු බඳුනක අසුරා තැබිය යුතු වේ.

ප්‍රයෝගය :— අර්ශස් රෝගය සඳහා විශෙෂ වේ. එහෙත් බෙහෙවින් ගුණදයක වනුයේ, ශුෂ්කාර්ශස්හි දී ය. ඒ අනුව අර්ශස් රෝග හේතුවෙන් උපන් රෝග අවස්ථාවනට ද මනා ය.

අනුපාන :— අවස්ථාවට සුදුසු පරිදි යෝග්‍ය අනුපානයක් යෙදිය හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි. රෝග බලය අනුව මාත්‍රාව වැඩි කළ හැකි ය.

5. යෝග නාමය :— **ආනන්ද භෛරව රස (1)**

යෝගය :—
ශුද්ධ සාදිලිංගම්
,, වච්චනාවි
ත්‍රිකටු චූර්ණය, මිලිතව
ගම්මිරිස්

ශෝධිත ටංකණ
තිප්පිලි
වසාවාසි — සමභාගව ගත යුතුය.

සංස්කරණය :— ඇල්දියෙන් අඹරා රක්තිකා 1 ක් (මී: ග්‍රෑ: 125) පමණ ගුලි පිළියෙල කරන්නේ ය.
ප්‍රයෝග :— දරුණු සන්නිපාත, ආමවාත, අතිසාර, ජීර්ණ ජ්වරයන්හි යෙදේ.
අනුපාන :— ඉඟුරු යූෂ සමඟ ය.

6. යෝග නාමය :— **ආනන්ද භෛරවය (2)**

යෝගය :—
ශුද්ධ හිංගුල
ගම්මිරිස්
පුෂ්කර (බැද)
ශුද්ධ වච්චනාවි
තිප්පිලි

සංස්කරණය :— සමභාගව ගෙන උණුදියෙන් අඹරා රක්තිකා 1 ට (මි: ග්‍රෑ: 125) ගුලි කරන්නේ ය.
ප්‍රයෝග :— අතිසාරයෙහි ශ්‍රේෂ්ඨ ය.
අනුපාන :— කෙළිඳහාල් චූර්ණය, කෙළිඳ පොතු කෂාය, මීපැණි සමඟ ය.

7. යෝග නාමය :— **ආනන්ද භෛරවය (3)**

යෝගය :—
ශුද්ධ සාදිලිංගම්
,, වච්චනාවි
ඉඟුරු
තිප්පිලි
ගම්මිරිස්
පුෂ්කර
ශුද්ධ ගන්ධක

සංස්කරණය :— සමභාගව ගෙන දෙහි හෝ ඇඹුල් දෙඩම් ඇඹුලෙන් අඹරා රක්තිකා එක පමණ ගුලි තනා වීදුරු බඳුනක බහා තබන්නේ ය.

ප්‍රයෝග :— ජ්වරාතිසාර, ග්‍රහණී, කාසාදි සංයුක්ත අතිසාර, අජීර්ණ, අග්නිමාන්ද්‍ය, අපස්මාර, යන රෝග සුව කරයි.
අනුපාන :— සුදුසු අනුපානයක් යොදන්නේ ය.
මාත්‍රාව :— රක්තිකා 1 යි. (මි: ග්‍රෑ: 125)

8. **යෝග නාමය :— ආරෝග්‍යවර්ධනී වටිය.**

යෝගය :—

ශෝධිත රසදිය		
,, ගන්ධක		
ලෞහ භස්ම		
අභ්‍ර භස්ම		
තාම්‍ර භස්ම	තෝලා 1 බැගින්.	(ග්‍රෑ: 12)
තිපල්	තෝලා 6 යි.	ග්‍රෑ: 72)
ශිලාජතු	තෝලා 3 යි.	(ග්‍රෑ: 36)
ශුද්ධ ගුගුල්	තෝලා 4 යි.	(ග්‍රෑ: 48)
රත්නෙටොල්	තෝලා 4 යි.	(ග්‍රෑ: 48)
කටුකරෝසන	තෝල 22 යි.	(ග්‍රෑ: 264)

සංස්කරණය :— මේ සියලු චූර්ණ දින දෙකක් කොහොඹ කොළ යුෂින් භාවනා යුක්තව අඹරා රක්තිකා 2 ක් (මි: ග්‍රෑ: 250) ප්‍රමාණයට ගුලි කර පවනේ වියලා ගත යුතු වේ.

ප්‍රයෝග :— කුෂ්ඨ රෝගයන්ට විශේෂ ගුණ යි. වාත, පිත්ත, කඵ යන දොෂත්‍රයෙන් උපන් ජ්වර රෝග නස යි. දීපන, පාචන ය, හෘද්‍ය ය; මෙදෙ නාශක ය; මල ශෝධක ය. යකෘත් රෝගාවස්ථාවනට විශෙෂයෙන් යෝග්‍ය වේ.

අනුපාන :— අවස්ථාවෝචිත පරිදි යෝග්‍ය අනුපානයකින් යොදන්න.

මාත්‍රාව :— ගුලි 1 — 3 දක්වා යි.

9. **යෝග නාමය :— ඉච්ඡා භෙදි රසය.**

යෝගය :—

වියලි ඉඟුරු	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)
ගම්මිරිස්	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)
ශෝධිත රසදිය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)
ශෝධිත ගන්ධක	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)
ශෝධිත ටංකණ	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)
ශෝධිත ජයපාල බීජ	තෝලා 2 යි.	(ග්‍රෑ: 24)

සංස්කරණය :— රසදිය ගන්ධක මනාව කජ්ජලි කොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ලා, ඇල්දියෙන් දැඩි සේ අඹරා ගුඤ්ජාද්වයක් පමණ ගුලි පිළියෙල කොට පවන වියලා වීදුරු බඳුනක අසුරා තබනු යෙදේ.

ප්‍රයෝග :— උදර රෝගයෙහි විරේකය සඳහා විශේෂයක් ද, අනෙක් විරේකය අවශ්‍ය අවස්ථාවන්හි ද යොදනු ලැබේ.

අනුපාන :— යෝග්‍ය මාත්‍රාව සීනි වතුර සමඟ යෙදිය යුතු වේ. එහි දී අවශ්‍ය වන විරේක වාර ගණන සඳහා ශීත ජලය වාර ගණන දිය යුතු වේ. විරේක නිවාරණය උදෙසා මෝරු සහිතව බත දිය යුතු ය.

මාත්‍රාව :— ගුඤ්ජා 2 — (මි: ග්‍රෑ: 250) දක්වා අනුදක්නා ලැබේ.

10. **යෝග නාමය :— ඉන්ද්‍ර වටිය.**

යෝගය :—
රසසින්දූර
වංග භස්ම
කුඹුක්පොතු චූර්ණය සමභාගව ගන්නේ ය.

සංස්කරණය :— මේ ඔසු කටුඉඹුල් මුල් ස්වරසයෙන් හෝ කෂායෙන් දිනක් භාවනා යුක්තව අඹරා මාෂ 1 ප්‍රමාණ ගු කරන්නේ ය.
ප්‍රයෝග :— මධුමෙහයට ශ්‍රේෂ්ඨ යි. බහු මූත්‍ර රෝගයනට ද හිතවති.
මාත්‍රාව :— රක්තිකාවේ පටන් මාෂකය දක්වා සුදුසු අනුපානයකින් යෙදිය හැකි වේ.

11. **යෝග නාමය :— උන්මාද ගජාංකුශය.**

යෝගය :—
ශෝධිත අත්තන ඇට
.. රස
.. ගන්ධක
වංග භස්ම
රජත භස්ම — භාග 1 බැගින් ගත යුතු යි.

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලි කොට කෝමාරිකා යූෂයෙන් භාවනා යුක්තව අඹරා රක්තිකා ප්‍රමාණයට ගුලි තනා ගන්නේ ය.
ප්‍රයෝග :— විශේෂයෙන් උන්මාද නාශක යි.
මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

12. යෝග නාමය :— **කනක සුන්දර රසය.**

යෝගය :—
ශුද්ධ සාදිලිංගම්
ගම්මිරිස්
ශුද්ධ ගන්ධක
තිප්පිලි
ශුද්ධ පුස්කර
ශුද්ධ වච්චනාවි
ශුද්ධ අත්තන ඇට — සමභාගව ගත යුතු ය.
සංස්කරණය :— විජයා පත්‍ර ස්වරසයෙන් අඹරා රක්තිකා 1 ක (මි: ග්‍රෑ: 125) ප්‍රමාණ ගුලි සාදගත යුතු වේ.
ප්‍රයෝග :— ග්‍රහණි, අග්නිමාන්ද්‍ය, ජීර්ණජ්වර, හා අතිසාර නසන්නේ ය.
අනුපාන :— දී, මස්තු, තක්‍ර යෙදිය යුතු ය.
මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදනු ලැබේ.

13. යෝග නාමය :— **කන්දර්ප රසය.**

යෝගය :—
ශෝධිත රස
,, ගන්ධක
ප්‍රවාල භස්ම
ස්වර්ණ භස්ම
ශෝධිත ගෛරික
රජත භස්ම
ශංඛ භස්ම
වෛක්‍රාන්ත භස්ම
මුක්තා භස්ම — සමභාගව ගන්නේ ය.
සංස්කරණය :— පළමුව කජ්ජලිය සාද අන් ඔසු සමඟ මිශ්‍රකොට නුග අරළු කෂායෙන් භාවනා යුක්තව සත් වරක් (දින හතක්) දැඩිව අඹරා, රක්තිකා 1 ක (මි: ග්‍රෑ: 125) ප්‍රමාණයට ගුලි කරන්නේ ය.
ප්‍රයෝග :— පූයා (ඖපසර්ගික) මේහයට විශේෂයෙන් යෙදේ.
අනුපාන :—
1. තිපල් කෂාය.
2. කක්කෝල කෂාය.
3. කුඹුක්පොතු කෂාය — ආදි සුදුසු අනුපානයකින් යොදන්නේ ය.

මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා යි.

14. යෝග නාමය :— **කළුකේතු රසය.** (1)

යෝගය :—
ශෝධිත ටංකණ තිප්පිලි
,, වච්චනාවි ශංඛ භස්මය — යන ද්‍රව්‍ය සමභාගව ගන්නේ වෙයි.
සංස්කරණය :— ද්‍රව්‍ය සියල්ල චූර්ණකොට අමුඉඟුරු, ස්වරසින් භාවනා යුක්තව දින තුනක් අඹරා ගුඤ්ජාවක් පමණ ගුලි පිලියෙල කොට වියලා බඳුනක අසුරා තැබිය යුතු වේ.
ප්‍රයෝග :— පීනස, ශ්වාස, කාස, ගලරෝග, ගලග්‍රහ, අක්ෂිරෝග, කර්ණරෝග, සන්නිපාත යන අවස්ථාවනට යොදනුව අනුදන්නා ලැබේ. ශ්වසනකජ්වරය, ප්‍රතිශ්‍යායජ්වරය, ශ්වාසග්‍රහය යන රෝග සඳහා විශේෂයෙන් ප්‍රයෝග කරනු ලැබේ.
අනුපාන :— අමුඉඟුරු ස්වරස සමඟ හෝ දෝෂ තත්වය අනුව යෝග්‍ය අනුපානයකින් හෝ යෙදිය හැකි වේ.
මාත්‍රාව :— වටිකා 1 යි.

15. යෝග නාමය :— **කළුකේතු රසය.** (2)

යෝගය :—
ශංඛ භස්ම ගම්මිරිස්
ඉඟුරු තිප්පිලි
පුස්කර — සමභාගව ගත යුතු ය.

වච්චනාවි භාග 5 යි.

සංස්කරණය :— අංක 1 මෙනි.

ප්‍රයෝග :— සූර්‍යාවර්තයට යෝග්‍ය යි. කළුකේතු අංක 1 ප්‍රයෝග ද සලකන්නේ ය.

මාත්‍රාව :— රක්තිකා 1/2 යි. (මි. ගු: 62.5)

16. යෝග නාමය :— **කර්පූර රසය.**

යෝගය :—
සාදිලිංගං
අබිං
කලාඳුරු අල
කෙළිඳහාල්
සාදික්කා
කපුරු

සංස්කරණය :— සමභාගව ගෙන වතුරෙන් අඹරා රක්තිකා 2 ට (මි: ගු: 250) ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— ජ්වරාතිසාර, අතීසාර, රක්තාතීසාරයන්හි පක්ව අවස්ථාවෙහි යෙදේ. ග්‍රහණියෙහි ද විශේෂ යි.

අනුපාන :— කලාඳුරු අල කෂාය මීපැණි සමග හා සුදුසු අනුපාන සමග යෙදේ.

මාත්‍රාව :— ගුලි 1 — 3 දිනකට.

සැ: යු :— ඇතැම් කෙනෙක් පුෂ්කර ද යෝගයට යොදති.

17. යෝග නාමය :— **කස්තූරි භෛරව රසය.**

යෝගය :—
ශෝධිත හිංගුල
,, වච්චනාවි
,, ටංගණ
කස්තූරි
සාදික්කා චූර්ණය
වසාවාසි චූර්ණය
ගම්මිරිස් චූර්ණය
තිප්පිලි චූර්ණය

සංස්කරණය :— යන ද්‍රව්‍යයන් සම භාගව ගත යුතු ය. හිංගුල, ටංගණ, හා කස්තූරි හැර අනික් සියළු ද්‍රව්‍ය චූර්ණකොට ඇල්දියෙන් අඹරා රක්තිකා දෙකක් පමණ ගුලි පිළියෙල කොට පවන වියලා වීදුරු බඳුනක අසුරා තබනු යෙදේ.

ප්‍රයෝග :— අති දරුණු සන්නිපාත ජ්වරයට මනා යි. එහෙත් එහි ලා සැලකිය යුතු යේ වාත—ශ්ලේෂ්ම උල්බණ සන්නිපාතය යි.

අනුපාන :— අවස්ථාවට උචිතව යෝග්‍ය අනුපානයක් සමග යෙදිය හැකි වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

18. යෝග නාමය :— **කාඤ්චනාභ්‍ර රසය.**

යෝගය :—
ස්වර්ණ භස්මය
රසසින්දූර
මුක්තා භස්මය
ලෞහ භස්මය
අභ්‍රක භස්මය
ප්‍රවාල භස්මය
අරළු චූර්ණය
රජත භස්මය
කස්තූරි
ශෝධිත මනෝශිල — යන ද්‍රව්‍ය සමභාගව ගන්නේ වෙයි.

සංස්කරණය :— සියළු ද්‍රව්‍ය චූර්ණය ඇල් දියෙන් මනාව අඹරා අර්ධ ගුඤ්ජා (රක්තිකා 1/2) පමණ ගුලි කරනු.

ප්‍රයෝග :— ක්ෂය රෝගය සඳහා හිතවත් වේ. ශ්ලේෂ්ම පිත්ත සමුද්භව කාසය, කළුජ වාතජ රෝග යන අවස්ථා වනට ද යෝග්‍ය වේ. පුෂ්ටිය, වීර්‍යය, බලය වර්ධනය කෙරේ.

අනුපාන :— අවස්ථාවෝචිතව යෝග්‍ය අනුපානයකින් යොදන්නේ යි.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

19. යෝග නාමය :— **කීටමර්ද රසය.**

යෝගය :—

ශෝධිත රසදිය	තෝලා	1 යි.	(ගු: 12 යි.)
ශෝධිත ගන්ධක	,,	2 යි.	(ගු: 24 යි.)
අසමෝදගම් (=යමානි චූර්ණය)	,,	3 යි.	(ගු: 36 යි).
වළහසාල් මද චූර්ණය	,,	4 යි.	(ගු: 48 යි.)
ශෙධිත ගොඩකදුරු ඇට	,,	5 යි.	(ගු: 60 යි.)
පලාශබීජ චූර්ණය	,,	6 යි.	(ගු: 72 යි.)

සංස්කරණය :— ප්‍රථමකොට රසදිය ගන්ධක කජ්ජලිකොට සෙසු ද්‍රව්‍ය චූර්ණය එහි ලා තවද අඹරා ගත යුතු ය. එය චූර්ණය ලෙස යෝගය භාවිත කරනුව පිළියෙල කර ගන්නා අයුරු යි. ඉදින් එය ගුලියක් ලෙස සකසනුව නම් ඇල්දියෙන් අඹරා රක්තිකා 2 (මි: ගු: 250) ක පමණ ගුලි තනා වියලා ගත යුතු වේ.

ප්‍රයෝග :— ක්‍රිමිරෝග අවස්ථාවන්හි දී යොදනු ලැබේ. කෘමි විනාශය උදෙසා මනා ය.

අනුපාන :— මීපැණියෙන් ගුලි හෝ චූර්ණය හෝ යොද කලාඳුරු ක්වාථය ඉක්බිති දෙනුව අනු දන්නා ලැබේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

20. යෝග නාමය :— **කීටාරි රසය.**

යෝගය :—

ශෝධිත රසදිය	භාග	1 යි.
කෙළිඳ සහල් චූර්ණය	,,	1 යි.
අසමෝදගම් චූර්ණය	,,	1 යි.
ශෝධිත මනෝශීල	,,	1 යි.
පලාශබීජ චූර්ණය	,,	1 යි.
ශෝධිත ගන්ධක	,,	1 යි.

සංස්කරණය :— රසදිය ගන්ධක කජ්ජලිකොට එය සෙසු ද්‍රව්‍ය චූර්ණය යොද මිශ්‍රකර දේවදලි ස්වරසයෙන් දිනක් අඹරා ගුඤ්ජාවක් පමණ ගුලි පිළියෙල කොට පවන වියලා තබා ගත යුතු වේ.

ප්‍රයෝග :— කෘමිරෝගයෙහි කෘමිනාශනය සඳහා යෙදේ.

අනුපාන :— සීනි සහිත මුද්ගපර්ණී (—මුන්වැන්න) ස්වරසය යොදනුව අනුදන්නා ලැබේ.

මාත්‍රාව :— වටිකා 1 = 2 යි.

21. යෝග නාමය :— **කුමාර කල්‍යාණක රසය.**

යෝගය :—

රස සින්දූර	
මුක්තා	භස්ම
ස්වර්ණ	,,
අභ්‍ර	,,
ලෞහ	,,
ස්වර්ණමාක්ෂික	,,

සංස්කරණය :— සමභාගව ගෙන කෝමාරිකා යුෂින් භාවනා යුක්තව අඹරා රක්තිකා 1 ක් (මි:ග්‍රෑ: 125) පමණ ගුලි කරනු.

ප්‍රයෝග :— බාලයන්ගේ උණට සුදුසු ය. ශ්වාස, වමන, පාරිගර්භික හා දන්තභේදෝත්ථජ ජ්වරයට හිත යි.

අනුපාන :— තනකිරි, සීනි යුක්තව වේ.

මාත්‍රාව :— වටිකා 1/2 — 1 යි.

22. යෝග නාමය :— **කුෂ්ඨඝ්නි වටිකාව.**

යෝගය :—

ශෝධිත ගොඩකදුරු ඇට චූර්ණය	තෝලා	1 යි.	(ග්‍රෑම් 12 යි.)
වාල්මුග්‍රා ඇට (—කුෂ්ඨවෙරි ඇට)	තෝලා	1 යි.	(ග්‍රෑම් 12 යි.)

සංස්කරණය :— ඇහැළකොළ යුෂ, කොහොඹකොළ යුෂ, රුක්අත්තන පොතු ක්වාථය, යන මෙයින් එක් වගෙන් එක් දින බැගින් භාවනා යුක්තව අඹරා රක්තිකා 2 ක ප්‍රමාණයට ගුලි කරන්න.

ප්‍රයෝග :— වාතශෝණිතජ කුෂ්ඨ, ශීත පිත්ත, උදර්ද, කෝඨ, ව්‍රණ හා මන්දග්නිය ද, නසයි.

අනුපාන :— එළකිරි සමඟ ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

23. යෝග නාමය :— **ක්‍රිමිකාලා නල රසය.**

යෝගය :—

වළහසාල් මද චූර්ණය	පල	2 යි.	(ග්‍රෑ: 120 යි.)
ශෝධිත වව්වනාවි චූර්ණය	පල	1 යි.	(ග්‍රෑ: 60 යි.)
ලෞහ භස්මය	පල	1/2 යි.	(ග්‍රෑ: 30 යි.)
ශෝධිත රසදිය	පල	1/4 යි.	(ග්‍රෑ: 15 යි.)
ශෝධිත ගන්ධක	පල	1/4 යි.	(ග්‍රෑ: 15 යි.)

සංස්කරණය :— රසදිය ගන්ධක ප්‍රථමකොට කජ්ජලිකර එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ලා එළකිරෙන් මනාව අඹරා රක්තිකාවක් පමණ ගුලි පිළියෙල කොට පවන වියලා වීදුරු බඳුනක තබා ගත යුතු වේ.

ප්‍රයෝග :— උදරගත ක්‍රිමිනාශනය සඳහා යෙදේ. ශෝථ, ආනාහ, උදර, ගුල්ම යන උපද්‍රව සහිත අවස්ථාවන්ට ද හිත වන්නේ ය.

අනුපාන :— කොත්තමල්ලි, සුදුරු ක්වාථයෙන් හෝ එහි චූර්ණය සමඟ හෝ තවද යෝග්‍ය අනුපානයකින් හෝ යෙදිය හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

24. යෝග නාමය :— **ක්‍රිමිඝ්න රසය.**

යෝගය :—

වළහසාල් චූර්ණය
පලාශබීජ — කැල ඇට චූර්ණය
කොසඹ ඇට චූර්ණය
රස සින්දූර -- යන ද්‍රව්‍ය සමභාගව ගත යුතු ය.

සංස්කරණය :— සියල්ල සියුම්ව චූර්ණ කොට, ඇල්දියෙන් අඹරා ගුංජා 3 ක් (මි: ග්‍රෑ: 375) පමණ ගුලි පිළියෙල කොට පවනැ වියලා තබා ගත යුතු ය.

ප්‍රයෝග :— කෘමිරෝග අවස්ථාවන්හි දී ප්‍රයෝග කරනු ලැබේ. ක්‍රිමි විනාශය සඳහා ය.

අනුපාන : ආඛුකර්ණී (= මීකන් පලා) ස්වරසින් යොදනුව අනුදන්නා ලැබේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

25. යෝග නාමය :— **ක්‍රිමිනාශක රසය.**

යෝගය :—

ශෝධිත රසදිය		වියලි ඉඟුරු	චූර්ණය
ශෝධිත ගන්ධක		ශෝධිත මුස්තක	,,
ලෞහ භස්මය		ශෝධිත රසාඤ්ජන	,,
ගම්මිරිස් චූර්ණය		දියමිත්ත	,,
ශෝධිත වච්චනාවි චූර්ණය		ත්‍රිකටු	,,
මලිත මල් චූර්ණය		කලාඳුරුඅල	,,
ත්‍රිඵලා චූර්ණය	(ප්‍රත්‍යෙකව)	බාලක	,,
බෙලිමුල් පොතු	— යන ද්‍රව්‍ය සමභාගව වේ.		

සංස්කරණය :— ප්‍රථම කොට රස ගන්ධක කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ද ලා, කිකිරිදිය යුෂයෙන් භාවනා දී අඹරා රක්තිකා එක පමණ ගුලි සකසා වියලා ගත යුතු ය.

ප්‍රයෝග :— ක්‍රිමිනාශය සඳහා යෙදේ. ක්‍රිමි උත්පාදනය වළකාලන රසායනයක් ලෙස ද සැලැකේ.

අනුපාන :— භෘඞ්ගරාජ (කිකිරිදිය) ස්වරස හෝ යෝග්‍ය අනුපානයක් භාවිත කළ හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි. එහෙත් වරාටිකාවක් පමණ ද යෙදිය යුතු බව කියැවේ. එනම්: රසායන සඳහා අල්ප මාත්‍රාවෙන් ආරම්භව යෝජිත මාත්‍රාව දක්වා යෙදීමෙනි.

26. යෝග නාමය :— **ක්‍රිමි මුද්ගර රසය.**

යෝගය :—

රස	භාග	1 යි.
ගන්ධක	,,	2 යි.
වනයවානි	,,	3 යි.
වළහසාල් මද	,,	4 යි.
ගොඩකදුරු	,,	5 යි.
පලාශ බීජ	,,	6 යි.

සංස්කරණය :— ද්‍රව්‍ය චූර්ණය ඇල්දියෙන් අඹරා රක්තිකා 2 ක (මි: ග්‍රෑ: 250) පමණ ගුලි තනා ගත යුතු ය.

ප්‍රයෝග :— කෘමිරෝගය සඳහා යෝග්‍ය වේ.

අනුපාන :— මීපැණි සමඟ ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

27. යෝග නාමය :— **(කෘෂ්ණ) චතුර්මුඛ රසය.**

යෝගය :—

ශෝධිත රසදිය	තෝලා	1 යි.	(ග්‍රෑ: 12 යි.)
ශෝධිත ගන්ධක	තෝලා	1 යි.	(ග්‍රෑ: 12 යි.)
ලෞහ භස්මය	තෝලා	1 යි.	(ග්‍රෑ: 12 යි.)
අභ්‍ර භස්මය	තෝලා	1 යි.	(ග්‍රෑ: 12 යි.)
ස්වර්ණ භස්මය	මාෂක	3 යි.	(ග්‍රෑ: 3 යි.)

සංස්කරණය :— රසදිය ගන්ධක මනාව කජ්ජලිකොට එයට සෙසු භස්ම ද්‍රව්‍යය ද යොද කෝමාරිකා ස්වරසින් භාවනා යුක්තව අඹරා ගුලියක් කොට එරඬු පතින් ඔතා, ධාන්‍යරාශියක් මැද දින තුනක් තබන්නේ ය.

ප්‍රයෝග :— එකාදශවිධ ක්ෂය, පඤ්චවිධ කාසය, එකාදශවිධ කුෂ්ඨය, පාණ්ඩු, විංශති ප්‍රමේහ යන රෝගයනට යොදනු යෝග්‍ය වේ. ශූලය, ශ්වාසය, හික්කාව, මන්දග්නිය, අම්ලපිත්තය යන රෝගාවස්ථාවනට හිතවති. අපස්මාරය, උන්මාදය, අර්ශස්, චර්මරෝග යන රෝග උපද්‍රවයනට ද මනා වේ. මෙය අග්නි බලය දනවයි. සුදු කෙස් කළු කෙරෙයි. පුෂ්ටිකාරක ය. ආයුෂයට හිතවති. ශුක්‍ර දෝෂ නස යි. වන්ධ්‍යතාවය නස යි.

අනුපාන :— ත්‍රිඵලා රසය සමඟ හෝ යෝග්‍ය අනෙක් අනුපානයක් සමඟ හෝ අවස්ථාවට උචිතව ප්‍රයෝග කරනු ලැබේ.

මාත්‍රාව :— රක්තිකා 1 — 2 යි. (මි: ග්‍රෑ: 125 — 250)

28. යෝග නාමය :— **ගගන සුන්දර රසය.**

යෝගය :—
ශෝධිත ටංකණ
ශෝධිත හිඞ්ගුල
ශෝධිත ගන්ධක
අභ්‍රක භස්මය
යන ද්‍රව්‍ය සමභාගව ගත යුතු වේ.

සංස්කරණය :— දින තුනක් දදකිරිය යුෂින් අඹරා ගත යුතු වේ.

ප්‍රයෝග :— විවිධ ප්‍රකාර රක්තස්‍රාව උග්‍ර ජ්වරාතිසාර නසයි. පාචකාග්නිය දල්වයි. ආමජ ශූල නසයි.

අනුපාන:— මීපැණි, හල්දුම්මල, සුදුදුරු, එළුකිරි, මෝරු යොදනු ලැබේ.

මාත්‍රාව :— ද්විගුඤ්ජා ප්‍රමාණ ගුලි 1 — 2 යි. (මි: ග්‍රෑ: 250)

29. යෝග නාමය :— **චන්ද්‍රප්‍රභා වටී (I)**

යෝගය :—
වළහසාල් ඇටමද හුනිඹ,
රත්නෙවුල්, තිප්පිලිමුල්,
ත්‍රිකටු, කලාදුරුඅල,
තිපල්, ශඨී,
දේවදරු, වදකහ,
සිවිය — යන මේ ද්‍රව්‍යයන්ගේ සමභාග චූර්ණ සහ
ස්වර්ණ මාක්ෂික භස්ම දරුහරිද්‍රා (වෙනිවැල් ප්‍රතිනිධි)
සවිදලුණු කොත්තමල්ලි
යවක්ෂාර ගජතිප්පිලි
කහ අතිවිඩයම්
කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් (සමභාගව)
ශුද්ධ ශිලාජතු පලං 8 යි. (ග්‍රෑ: 480) උණකපුරු
ශුද්ධ ගුග්ගුලු පලං 8 යි. (ග්‍රෑ: 480) දත්තමුල්
ලෝහ භස්ම පලං 2 යි. (ග්‍රෑ: 120) ත්‍රිවෘත්
සීනි පලං 4 යි. (ග්‍රෑ: 240) ත්‍රිසුගන්ධ (මිලිතව) පලම් 1 බැගිනි. (ග්‍රෑ: 60)

සංස්කරණය :— සියල්ල චූර්ණකර ගුටිකා පරිභාෂාව අනුව රක්තිකා 3 ට (මි: ග්‍රෑ: 375) ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— ෂඩ්විධ අර්ශස්, භගන්දර, පාණ්ඩු, කාමලාරෝග සුව කරයි. අග්නි දීප්ති කරයි. පිත්ත, කඵ වාත, රෝග සුව වන්නේ ය. නාඩිගත, මර්මගත ව්‍රණ, ග්‍රන්ථි, අර්බුද, විද්‍රධි, රාජයක්ෂමා, මේහ, ප්‍රදර, ශුක්‍ර ක්ෂය, අශ්මරී, මූත්‍රකෘච්ඡ්‍ර, උදර යන රෝගයනට හිතවත් ය.

අනුපාන :— මස්තු, දී, ශීත ජලය, එළුමස් රස, ජාංගල පශු, පක්ෂීන්ගේ මාංසරස, කිරි යන මේවා අනුපාන හිත වේ.

මාත්‍රාව :— වටී 1 — 2 යි.

30. යෝග නාමය :— **චන්ද්‍රප්‍රභා වටී (II)**

යෝගය :—
චන්ද්‍රප්‍රභා = කපුරු තිප්පිලිමුල්
වදකහ රත්නෙටොල්
කලාදුරු අල තිරස්සවාලු
බිංකොහොඹ දැත්තමුල්
දේවදර තේජපත්‍ර
වියලිකහ කුරුඳුපොතු
අතිවිඩයන් එන්සාල්
දරුහරිද්‍රා උණකපුරු — කර්ෂ 1 බැගිනි. (ග්‍රෑම 15)
කොත්තමල්ලි ගම්මිරිස්
තිපල් තිප්පිලි
සිවියමුල් යවක්ෂාර
වළහසහල් සර්ජික්ෂාර
ගජතිප්පිලි සවිදලුණු
ස්වර්ණමාක්ෂික සුවසලුණු
ඉඟුරු බළල්ලුණු — මේවා මාෂ හතර (4) බැගිනි. (ග්‍රෑම 4)
ලෝහ භස්ම කර්ෂ 2 යි. (ග්‍රෑම 30 යි.)
සීනි කර්ෂ 4 යි. (ග්‍රෑ: 60 යි.)
ශිලාජතු කර්ෂ 8 යි. (ග්‍රෑ: 120 යි.)
ගුගුල් කර්ෂ 8 යි. (ග්‍රෑ: 120 යි.)

සංස්කරණය :— ගුටිකා පරිභාෂා අනුව ගුංජා 6 ක පමණ ගුලි පිළියෙල කළ යුතු වේ.

ප්‍රයෝග :— විංශතිවිධ ප්‍රමේහ නසයි. මූත්‍ර කාච්ඡ්‍ර නසයි. අශ්මරී මූත්‍රාඝාත, අණ්ඩවායු, පාණ්ඩු රෝග, කාමලා හලීමක, කාස, ශ්වාස, කුෂ්ඨ, අග්නිමාන්ද්‍ය, අරෝචක, වාත, පිත්ත, කඵරෝග නසයි. බල්‍ය යි. වෘෂ්‍ය යි. රසායන යි.

මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා ය.

31. යෝග නාමය :— **චතුර්භුජ රසය.**

යෝගය :—

රසසින්දූර භාග 2 යි.
ස්වර්ණ භස්ම භාග 1 යි.
ශෝධිත මනෝශිල භාග 1 යි.
කස්තූරි භාග 1 යි.
ශෝධිත හරිතාල භාග 1 යි.

සංස්කරණය :— ද්‍රව්‍ය සියල්ල චූර්ණකොට කෝමාරිකා ස්වරසයෙන් දිනක් අඹරා ගෝලයක් කොට, එය එරඬුපත්හි ඔතා ධාන්‍ය රාශියක් මැද දින තුනක් තබා පසුව, සුණුකොට, චූර්ණය ලෙස හෝ ඇල්දියෙන් අඹරා ගුලි මෙන් හෝ පිළියෙල කරගත හැකි වේ. ගුලියක් රක්තිකාවකි. (මි: ග්‍රෑ: 125 යි.)

ප්‍රයෝග :— අපස්මාරරෝග ශාන්තිය සඳහා යෙදෙයි. ජ්වර, කාස, ශෝෂ, ක්ෂය, මන්දග්නිය යන උපද්‍රව පවත්නා කල ද මනා ය. තවද ශිරඃකම්පය, හස්තකම්පය, ගාත්‍රකම්පය යන අවස්ථා උදෙසා ද සුදුසු වේ. අකාල වලිපලිතයට ගුණදයක ය.

අනුපාන :— ත්‍රිඵලා චූර්ණය සහිත මීපැණි සමඟ ද, අනෙක් යෝග්‍ය අනුපාන සහිතව ද යෙදිය හැකි වේ.

මාත්‍රාව :— ගුලි 1 — 5 දක්වා යි. දේහබලය හා රෝගබලය අනුව යෙදිය යුතු ය.

32. යෝග නාමය :— **චන්ද්‍රාමෘත වටිය.**

යෝගය :—

ත්‍රිකටු (ප්‍රත්‍යෙකව)
ත්‍රිඵලා (ප්‍රත්‍යෙකව)
සිවිය මුල්
කොත්තමල්ලි
සුදුදුරු
සෛන්ධව — තෝලා 1 බැගිනි. (ග්‍රෑම 12)
ශෝධිත රසදිය
ශෝධිත ගන්ධක
ලෞහ භස්මය - කර්ෂ 1 බැගිනි. (ග්‍රෑම 15 යි.)
ගම්මිරිස් පල 1 යි. (ග්‍රෑම 60 යි)
ශෝධිත ටංගණ පල 1/2 යි. (ග්‍රෑම 30 යි.)

සංස්කරණය :— රසදිය ගන්ධක කජ්ජලිකොට සෙසු ද්‍රව්‍ය චූර්ණය සමඟ එළකිරෙන් අඹරා ගුඤ්ජා සතරක් පමණ ගුලි පිළියෙල කළ යුතු වේ.

ප්‍රයෝග :— වාතපිත්ත, වාතශ්ලේෂ්ම, පිත්තශ්ලේෂ්ම ආදි පංචවිධ කාශයට යෝග්‍ය වේ. රක්ත නිෂ්ඨීවනය, ජ්වරය, ශ්වාසය, තෘෂ්ණා, දහ, භ්‍රම, ප්ලීහ, උදර, ගුල්මරෝග, ආනාහ, කෘමි, පාණ්ඩු, ජීර්ණජ්වර යන රෝගෝපද්‍රවයනට ද යහපති. බල-වර්ණකර වේ.

අනුපාන :— රක්තෝත්පල ස්වරස, නීලෝත්පල ස්වරස, කොල්ලු කෂාය, තිප්පිලි සුණු, මීපැණි, ඉඟුරු, ස්වරස යන ද්‍රව්‍යකින් අවස්ථාවෝචිතව යෙදිය හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 යි.

33. යෝග නාමය :— **චන්ද්‍රාමෘත රසය.**

යෝගය :—

ශුද්ධ රස
ශුද්ධ ගන්ධක
ශුද්ධ ලෞහ භස්ම — තෝලා 2 බැගිනි. (ග්‍රෑම 24)
පුෂ්කර තෝලා 8 යි. (ග්‍රෑම 96)
ගම්මිරිස් තෝලා 4 යි. (ග්‍රෑම 48)

ඉඟුරු
ගම්මිරිස්
තිප්පිලි
අරළු
බුළු
නෙල්ලි
සිවිය මුල්
කොත්තමල්ලි
සුදුදුරු
සහිඳලුණු

සංස්කරණය :— (ග්‍රෑම 12) තෝලා 1 බැගින් ගෙන චූර්ණකොට එළකිරෙන් අඹරා රක්තිකා 6 ට ගුලි කරන්නේ ය.

අනුපාන :— රත්මානෙල්, නිල්මානෙල්, කොල්ලු කෂාය, මුඩමහණ යූෂ කිකිරිඳිය යූෂ, එළකිරි, තිප්පිලි කුඩු, මීපැණි සමඟ යථායෝග්‍ය පරිදි යෙදිය හැකි ය. ආඩතෝඩා මුල්, රසකිඳ, භාර්ගී, කලාදුරු, කටුවැල්බටු යන චන්ද්‍රාමෘත කෂාය සමඟ ද යොදනු යෝග්‍ය වේ.

ප්‍රයෝග :— නානා විධ කාසයනට ශ්‍රේෂ්ඨ යි.

34. යෝග නාමය :— **චින්තාමණි රසය.**

යෝගය :—

රසසින්දූර	කර්ෂ 1 යි.	(ග්‍රෑම් 15 යි.)
අභ්‍රභස්මය	කර්ෂ 1 යි.	(ග්‍රෑම් 15 යි.)
ලෞහ භස්මය	කර්ෂ 1/2 යි.	(ග්‍රෑම් 7.5)
ස්වර්ණ භස්මය	කර්ෂ 1 යි.	(ග්‍රෑම් 15 යි.)

සංස්කරණය :— පූර්වෝක්ත ද්‍රව්‍ය සියුම්ව සුණුකොට කෝමාරිකා ස්වරසින් භාවනා යුක්තව අඹරා ගුංජාවක් පමණ ගුලි තනා වියලා බඳුනක අසුරා තබන්නේ යි.

ප්‍රයෝග :— ශ්ලේෂ්ම යුක්ත, පිත්ත යුක්ත කේවල, වාත රෝග සඳහා ප්‍රයෝග කරනු සුදුසු වේ. හෘල්ලාස, අරුචි, වමන, දාහ, භ්‍රම, ශිරෝ ග්‍රහ, ආදි උපද්‍රව යුක්ත කලද යොදනු මනා ය. කර්ණනාදය, ගද්ගදය, මූකතාව, බාධිර්‍ය්‍යය යන ඌර්ධ්වාංග රෝගයනට ද ප්‍රයෝගය අනුදන්නා ලැබේ. ගර්භිණී රෝග, සූතිකා රෝග, අශ්මරී, ප්‍රමේහ, ප්‍රදර, සෝම රෝග, රාජයක්ෂ්මා, ජ්වර යන රෝගාවස්ථාවන්ට ද අවස්ථාව පරිදි යෝග්‍ය වේ.

අනුපාන :— දෝෂබලාබලතාව අනුව යෝග්‍ය අනුපානයකින් යෙදිය හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

35. යෝග නාමය :— **ජයමංගල රසය.**

යෝගය :—

රසසින්දූර	තෝලා 1 යි.	(ග්‍රෑම් 12 යි.)
අභ්‍ර භස්ම	,, 1 යි.	(,, 12 යි.)
රජත භස්ම	,, 1 යි.	(,, 12 යි.)
මණ්ඩූර භස්ම	,, 1 යි.	(,, 12 යි.)
තීක්ෂ්ණලෞහ භස්ම	,, 1 යි.	(,, 12 යි.)
ශෝධිත හරිතාල	,, 1 යි.	(,, 12 යි.)
ස්වර්ණමාක්ෂික	,, 1 යි.	(,, 12 යි.)
රත්නෙටුල් මුල් චූර්ණය	,, 1 යි.	(,, 12 යි.)
ශෝධිත ටංකණ	,, 1 යි.	(,, 12 යි.)
ත්‍රිකටු චූර්ණය (මිලිතව)	,, 1 යි.	(,, 12 යි.)

සංස්කරණය :— ප්‍රථමව සියල්ල සිනිඳුව සුණුකොට දියමිත්ත, ත්‍රිකටු, වැල්මී, බෙලිමුල්, යන ද්‍රව්‍යයන්ගේ වෙන් වෙන්ව ගත් ස්වරසයෙන් හෝ කෂායෙන් හෝ අඹරා, වියලා කෝවයක අසුරා මැටි බැඳ භූධර යන්ත්‍රයෙහි ලා, පුට දී දවාගත යුතු ය. පසුව යෝගය අඹරා රක්තිකා 2 ක (මි:ග්‍රෑ: 250) පමණ ගුලි කරන්නේය.

ප්‍රයෝග :— සන්නිපාත ජ්වරය, පුරාණ ජ්වරය යන අවස්ථාවන්හි දී යොදනු ලැබේ. සන්නිපාත ජ්වරයෙහි අඤ්ජන, නස්‍ය වශයෙන් ද ප්‍රයෝග කට හැකි ය. ක්ෂය සහ ජීර්ණජ්වරයට විශෙෂයෙන් ගුණදායක ය.

අනුපාන :— දශමූල කෂාය යොදනුව අනුදන්නා ලැබේ. තවද, යෝග්‍ය අනුපානයක් අවස්ථාව පරිදි ප්‍රයෝග කට හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

36. යෝග නාමය :— **ජලෝදරාරි රසය.**

යෝගය :—

තිප්පිලි	භාග 1 යි.	වියලි කහ	භාග 1 යි.
ගම්මිරිස්	භාග 1 යි.	ශෝධිත ජයපාල	භාග 4 යි.
තාම්‍ර භස්මය	භාග 1 යි.		

සංස්කරණය :— පූර්වෝක්ත ද්‍රව්‍ය චූර්ණය ශෝධිත දළුක් කිරෙන් දිනක් මනාව අඹරා එයට ජයපාලබීජ චූර්ණය ද ලා, යලි අඹරා රක්තිකා 2 ක (මි: ග්‍රෑ: 250) පමණ ගුලි පිළියෙල කොට විදුරු බඳුනක බහා තැබිය යුතු වේ.

ප්‍රයෝග :— ජලෝදර රෝගයෙහි විරේකය සඳහා මැනවි. එයින් රෝග ශාන්තිය ද වේ.

අනුපාන :— යෝගය ඇල් දියෙන් ප්‍රයෝග කරණු ලැබේ. විරේක නිවාරණය සඳහා දීකිරි සහිත බත දීම හිතවත් වේ. මේ රසය යොදන කල, සවස් ආහාරය මුංයූෂය සමඟ යෙදිය යුතු වේ. කේවල මුද්ග යූෂය ද පථ්‍ය වේ.

මාත්‍රාව :— වටිකා 1 — 4 යි. අග්නි බලය රෝග තත්ත්වය සලකා මාත්‍රාවෙහි අඩු වැඩි කිරීම කරන්නේ ය.

37. යෝග නාමය :— **ජ්වරමුරාරි රසය.**

යෝගය :—

ශෝධිත හිංගුල
වච්චනාවි චූර්ණය
වියලි ඉඟුරු ,,
තිප්පිලි ,,
ගම්මිරිස් ,,
ශෝධිත ටංකණ චූර්ණය
ශුණ්ඨි ,,
අරළු ,,
ශෝධිත ජයපාල ,,

සංස්කරණය :— සමභාගව ගෙන ඇල්දියෙන් අඹරා රක්තිකා (මි: ග්‍රෑ: 125) පමණ ගුලි සකසා පවන වියලා ගත යුතු වේ.

ප්‍රයෝග :— මල බද්ධය, බඩ පිපුම සහිත නව ජ්වරයෙහි දී ප්‍රයෝග කරනු ලැබේ. ආමවාතජ්වරයට විශේෂයෙන් ම ගුණ යි.

අනුපානය :— අවස්ථාව පරිදි සුදුසු අනුපානයන්ගෙන් ප්‍රයෝග කට හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

38. යෝග නාමය :— **ජ්වර කේශරිකා රසය.**

යෝගය :—

ශෝධිත රසදිය
,, වච්චනාවි
ත්‍රිකටු චූර්ණය මිලිතව
ශෝධිත ගන්ධක
ත්‍රිඵලා චූර්ණය මිලිතව
ජයපාල ඇට චූර්ණය
යන ද්‍රව්‍යයන් සමභාගව ගන්නේ වෙයි.

සංස්කරණය :— රසදිය ගන්ධක කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ලා කිකිරිදිය යුෂයෙන් අඹරා ගුඤ්ජා පමණ (මි: ග්‍රෑ: 125) ගුලි පිළියෙල කොට පවන වියලා විදුරු බඳුනක අසුරා තැබිය යුතු වේ. (ළදරුවන් උදෙසා අබ ඇට පමණට ගුලි කරන්නේ ය.)

ප්‍රයෝග :— කෝෂ්ඨබද්ධ සහිත තරුණ ජ්වරයට ද, විෂම ජ්වර්යට ද, භූතෝත්ථජ්වරය, ප්ලිහ රෝගය, අග්නි මාන්ද්‍යය, අජීර්ණය, සුදරුණ ශෝථය, ශූල, ගුල්ම, කුෂ්ඨ යන රෝග අවස්ථාවනට ද මනා වේ.

අනුපාන :— නාලිකේරාදිය සමග සියලු ජ්වරයට ද, සිනි සමඟ පිත්තජ්වරයට ද, ගම්මිරිස් තම්බාගත් දියෙන් හෝ ගම්මිරිස් චූර්ණය සමඟ හෝ සන්නිපාත ජ්වරයට ද යොදනු ලැබේ. දහජ්වරය සඳහා තිප්පිලි, සුදුරු, චූර්ණය සමඟ යෙදිය හැකි ය.

මාත්‍රාව :— ගුලි 1 — 2 යි.

39. යෝග නාමය :— **තාලකේශ්වර රසය** (1).

යෝගය :—

නෙල්ලි චූර්ණය	තෝලා	10 යි.	(ග්‍රෑ: 120 යි.)
ශෝධිත ටංගණ	,,	10 යි.	(ග්‍රෑ: 120 යි.)
ශෝධිත හරිතාල	,,	10 යි.	(ග්‍රෑ: 120 යි.)

සංස්කරණය :— ද්‍රව්‍ය සියල්ලෙහි චූර්ණය නෙල්ලි සවරසින් ද, කරල්හැබ සවරසින් ද වෙන් වෙන්ව සත්වර බැගින් අඹරා රක්තිකාද්වයක පමණ ගුලි පිළියෙල කොට වියලා විදුරු බඳුනක අසුරා තබන්නේය.

ප්‍රයෝග :— සියලු කුෂ්ඨ රෝග අවස්ථා සඳහා යෝග්‍ය වේ. භෝජන රුචිය ද දනව යි.

අනුපාන :— දෙෂබලාබලය අනුව යෝග්‍ය අනුපානයකින් ප්‍රයෝග කටහැකි වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 දක්වා ක්‍රමයෙන් වෘද්ධිකොට මාත්‍රාව යෙදිය හැකි වේ.

40. යෝග නාමය :— **තාලකේශ්වර රසය** (2).

යෝගය :—

රස සින්දූර	භාග	1 යි.
ශුද්ධ තාලක	භාග	1 යි.
ශුද්ධ විජයා චූර්ණය	භාග	8 යි.
පුරාතන ගුඩ	භාග	10 යි.

ප්‍රයෝග :— හිරිය සහිත වාත.

මාත්‍රාව :— මාෂක 1 යි. (ග්‍රෑම 1 යි.)

41. යෝග නාමය :— **ත්‍රිභුවනකීර්ති රසය.**

යෝගය :—

ශුද්ධ තාම්‍ර පත්‍ර	පල	3 යි.	(ග්‍රෑම 180)
ශුද්ධ ගන්ධක	පල	3 යි.	(ග්‍රෑම 180)
රුචක = කළුලුණු	පල	2 යි.	(ග්‍රෑම 120)
ශුද්ධ රසදිය	පල	1 යි.	(ග්‍රෑම 60)

සංස්කරණය :— පළමුව රස ගන්ධක කජ්ජලි කරනු. පසුව කළුලුණු ඊට මිශ්‍රකර නිකකොළ යුෂින් අඹරා, ඒ කල්කය තඹපත්වල ආලේප කරනු. පසුව සම්පුට ගත කොට ගොම්වැරටි ගින්නෙන් යාමයක් ගිනි දී ස්වාංග ශීත වූ කල අඹරා ගත යුතු යි.

ප්‍රයෝග :— අඹරා ගත් බුලත් ගුලියට ගුලියක් මැදිකර ගිලින්න දෙනු.

මාත්‍රාව :— රක්තිකා 1 — 2 දක්වා (ග්‍රෑම් 125 — 250).

42. යෝග නාමය :— **නිත්‍යානන්ද රසය.**

යෝගය :—

ශෝධිත	හිංගුලෝත්ථ	රසදිය	තෝලා	1 යි.	(ග්‍රෑම් 12 යි.)
,,	ගන්ධක		,,	1 යි.	(,, 12 යි.)
	තාම්‍ර	භස්මය	,,	1 යි.	(,, 12 යි.)
	වංග	භස්මය	,,	1 යි.	(,, 12 යි.)
ශෝධිත	හරිතාල	චූර්ණය	,,	1 යි.	(,, 12 යි.)
,,	තුත්ථක	චූර්ණය	,,	1. යි	(,, 12 යි.)
	ශංඛ	භස්මය	,,	1 යි.	(,, 12 යි.)
	කාංස්‍ය	භස්මය	,,	1 යි.	(,, 12 යි.)
	වරාටිකා	භස්මය	,,	1 යි.	(,, 12 යි.)

ත්‍රිකටු චූර්ණය (මිලිතව)	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)	තිප්පිලි මුල් චූර්ණය	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)
ත්‍රිඵලා චූර්ණය (මිලිතව)	,,	3 යි.	(ග්‍රෑ: 36)	හපුෂා (ප්‍ර. ගම්මිරිස්)	,,	1 යි.	(ග්‍රෑ: 12)
ලෞහ භස්මය	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)	වදකහ	,,	1 යි.	(ග්‍රෑ: 12)
වළහසහල් මද	,,	1 යි.	(ග්‍රෑ: 12)	ශඨී	,,	1 යි.	(ග්‍රෑ: 12)
මුහුදු ලුණු	,,	1 යි.	(ග්‍රෑ: 12)	දියමිත්ත	,,	1 යි.	(ග්‍රෑ: 12)
විඩ්ලවණය	,,	1 යි.	(ග්‍රෑ: 12)	දේවදරු	,,	1 යි.	(ග්‍රෑ: 12)
සුවස ලුණු	,,	1 යි.	(ග්‍රෑ: 12)	එන්සහල්	,,	1 යි.	(ග්‍රෑ: 12)
උද්භිද ලවණ	,,	1 යි.	(ග්‍රෑ: 12)	ත්‍රිවෘත් චූර්ණය	,,	1 යි.	(ග්‍රෑ: 12)
සෛන්ධව ලවණ	,,	1 යි.	(ග්‍රෑ: 12)	දන්තිමූල චූර්ණය	,,	1 යි.	(ග්‍රෑ: 12)
සිවියමුල් චූර්ණය	,,	1 යි.	(ග්‍රෑ: 12)	රත්නෙවුල්මූල චූර්ණය	,,	1 යි.	(ග්‍රෑ: 12)
				ශෝධිත වෘධදරු ඇට චූර්ණය	,,	1 යි.	(ග්‍රෑ: 12)

සංස්කරණය :— රසදිය ගන්ධක කජ්ජලිකොට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණ ලා, අරළු ක්වාථයෙන් හෝ ස්වරසින් හෝ අඹරා ගුඤ්ජා පහක පමණ ගුලි තනා පවන වියලා බඳුනක අසුරා තබන්නේ ය.

ප්‍රයෝග :— රක්ත, මාංස, මේදස්, ධාතුගත වූ කඵවාත ප්‍රබල ශ්ලීපද රෝගයට විශෙෂ යි.

මාත්‍රාව :— වටිකා 1 යි.

43. යෝග නාමය :— **නිද්‍රෝදය වටී.**

යෝගය :—

ශෝධිත අහිඵේන	මාෂ	6 යි.	(ග්‍රෑ: 6 යි.)
උණකපුරු (තුගාක්ෂීරි)	මාෂ	6 යි.	(ග්‍රෑ: 6 යි.)
රසසින්දූර	මාෂ	6 යි.	(ග්‍රෑ: 6 යි.)
ධාතකී	මාෂ	2 යි.	(ග්‍රෑ: 2 යි.)
ධාත්‍රි චූර්ණය	තෝලා	2 යි.	(ග්‍රෑ: 24 යි.)

සංස්කරණය :— විජයාපත්‍ර ස්වරසයෙන් හෝ එම කෂායෙන් තෙවරක් භාවනා යුක්තව අඹරා ගන්නේ ය. රක්තිකා 1 ක් (මි: ග්‍රෑ: 125) පමණ ගුලි කරන්නේ ය. ඇට ඉවත් කළ මුද්දරප්පලම් තෝලා 12 ක් (ග්‍රෑ: 144) මිශ්‍ර කොට ඇඹරීමෙන් මැනවින් වටිකා වන්නේ ය. රක්තිකා 2 ට ගුලි කරගන්නේ ය.

ප්‍රයෝග :— නිද්‍රාකාරක යි. වේදනා නාශක යි.

අනුපාන :— යෝග්‍ය අනුපානයකින් දීම මැනවි.

මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා වේ.

සැ යු:— වෘක්ක රෝගීන්ට සහ කෝෂ්ඨබද්ධතාවයෙන් පීඩිතයන්ට මේ ඖෂධය (අබින් ඇති නිසා) අහිත යි.

44. යෝග නාමය :— **පුෂ්පධන්වා රසය.**

යෝගය :—

රස සින්දූර		තෝලා	1 යි.	(ග්‍රෑ: 12 යි.)
නාග	භස්ම	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
ලෞහ	,,	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
අභ්‍රක	,,	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
වංග			1 යි.	(ග්‍රෑ: 12 යි.)

සංස්කරණය :— මේ ඖෂධ සියල්ල එකට මිශ්‍ර කොට අඹරා ශෝධිත අත්තන කෂාය, විජයාපත්‍ර යූෂ හෝ කෂාය, වැල්මී කෂාය, කටුඉඟුල්මුල් කෂාය, බුලත් කොළ යූෂ යන මේ වර්ගයන්ගෙන් එකින් දෙවර දෙවර බැගින් භාවනා යුක්තව අඹරා ගුංජා (මි.ග්‍රෑ. 125) පමණ ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— ධ්වජභංග නාශක යි. කාම ශක්ති වර්ධක යි. දීර්ඝායුෂ්‍ය යි. කාය බලය වඩ යි.

අනුපාන :— ගිතෙල්, මීපැණි, සීනි සමග ලේහකර ඊට පසු මඳ උණුසුම් එළකිරි පානය කළ යුතු ය.

මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා යි.

45. **යෝග නාමය :—** **පූර්ණචන්ද්‍ර රසය, වෘහත්.**

යෝගය :—

ශෝධිත රසදිය	කර්ෂ	2 යි.	(ග්‍රෑ: 30)	රජත භස්මය	තෝලා	2 යි.	(ග්‍රෑ: 24)
,, ගන්ධක	කර්ෂ	2 යි.	(ග්‍රෑ: 30)	වංග ,,	කර්ෂ	2 යි.	(ග්‍රෑ: 30)
ලෞහ භස්මය	පල	1 යි.	(ග්‍රෑ: 60)	ස්වර්ණ ,,	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)
අභ්‍ර භස්මය	පල	1/2 යි.	(ග්‍රෑ: 30)	තාම්‍ර ,,	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)
කාංස්‍ය භස්මය	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)				

සාදික්කා	සුදුදුරු
කරාබු	කර්පූර
එන්සහල්	ප්‍රියංගු
කීකිරිදිය	කලාදුරු අල — කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් වෙයි.

සංස්කරණය :— රසදිය ගන්ධක කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍ය චූර්ණය ද ලා, කෝමාරිකා ස්වරස, හාතාවාරිය, එරඬුමුල් ස්වරස යන ද්‍රව්‍යයන්ගෙන් අඹරා එරඬුපත්හි ඔතා ධාන්‍ය රාශියක් මැද දිවා රැයක් තබා යලි අඹරා ත්‍රි (3) ගුංජා පමණ ගුලි පිළියෙල කර ගත යුතු වේ.

ප්‍රයෝග :— බල්‍ය ය; රසායන ය; වෘෂ්‍ය ය; වාජීකරණ ය. අෂ්ඨීලා, කාස, ශ්වාස, අරෝචක, ආම ශූලය, කටි ශූලය, හෘත් ශූලය, පරිණාම ශූලය, අග්නිමාන්ද්‍යය, අජීර්ණ, පුරාණ ග්‍රහණි, ආමවාත, අම්ලපිත්ත, භගන්දර අරෝචක, කාමලා, පාණ්ඩු, ප්‍රමේහ, වාතරක්ත, වමන, භ්‍රම, යන රෝගෝපද්‍රවයන් ද නසයි.

අනුපාන :— බුලත් ස්වරස සමග දීම යෝග්‍ය වේ.

මාත්‍රාව :— වටිකා 1 යි.

46. **යෝග නාමය :—** **පියූෂවල්ලි රසය.**

යෝගය

ශෝධිත පාරද	ශාණ	1 යි.	(ග්‍රෑ: 4 යි.)	ශෝධිත ටංකණ	ශාණ	1 යි.	(ග්‍රෑ: 4 යි.)
ශෝධිත අභ්‍රක භස්ම	,,	1 යි.	(ග්‍රෑ: 4 යි.)	රසාඤ්ජන	,,	1 යි.	(ග්‍රෑ: 4 යි.)
,, ගන්ධක	,,	1 යි.	(ග්‍රෑ: 4 යි.)	ස්වර්ණමාක්ෂික භස්ම	,,	1 යි.	(ග්‍රෑ: 4 යි.)
රජත භස්ම	,,	1 යි.	(ග්‍රෑ: 4 යි.)	ලෞහ භස්ම	,,	1 යි.	(ග්‍රෑ: 4 යි.)

කරාබු	චූර්ණය	කෙළිඳ සහල්	චූර්ණය
රත්හඳුන්	,,	කුරුඳු පොතු	,,
කලාදුරු අල	,,	සාදික්කා	,,
දියමිත්ත	,,	වියලිඉඟුරු	,,
සුදුරු	,,	බෙලිමද	,,
කොත්තමල්ලි	,,	ශෝධිත අත්තන ඇට	,,
වැල්මදට	,,	දෙළුම් කොළ	,,
අතිවිඩයන්	,,	හීන්නිදිකුම්බ = (සමංගා)	,,
ලෝධ්‍ර	,,	මලිත මල්	,,
කෙළිඳ පොතු	,,	සුවඳකොට්ටං	,, ශාණ 1 බැගින් (ග්‍රෑම 4)

සංස්කරණය :— පාරද ගන්ධක කජ්ජලි කොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණ යොද කීකිරිදිය = කේශරාජ රසයෙන් සත් වරක් භාවනා දී අඹරා යලි එළුකිරෙන් ද මනාව අඹරා ගත යුතු ය. ගුංජා 4 ක් පමණට ගුලිකොට වියලා බඳුනක අසුරා තබනු ක්‍රමය වේ.

ප්‍රයෝග :— අතිසාරය, චිරකාලීන ග්‍රහණී රෝගය, අග්නිමාන්ද්‍යය, ආමජ රෝග, ආමජ ශූල, යන අවස්ථා සඳහා විශේෂයෙන් යොදනු ලැබේ. පිපාස, දාහ, හෘල්ලාස, අරෝචක, ඡර්දි, ගුදභ්‍රංශ, ආදි උපද්‍රව යුක්ත රත්තාතිසාරයට ද පක්වාතිසාරයට ද, ප්ලීහ, ගුල්ම, ආනාහ, රෝගාවස්ථාවනට ද සූතිකා රෝග අසෘක්දර රෝගයනට ද යෝග්‍ය වේ.

අනුපාන :— බෙලිමද කඩලන්නේ තම්බා උක්සකුරු සමඟ යොදනුව අනුදන්නා ලැබේ. තවද අවස්ථාවෝචිතව යෝග්‍ය අනුපාන සමඟ යෙදිය හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

47. යෝග නාමය :— **ප්‍රලාපාන්තක රසය.**

යෝගය :—

ශෝධිත	අත්තන ඇට	චූර්ණය	මාෂ	9 යි.	(ග්‍රෑ: 9 යි.)
,,	රස		,,	6 යි.	(ග්‍රෑම 6 යි.)
,,	ගන්ධක		,,	6 යි.	(ග්‍රෑම 6 යි.)
	ඉඟුරු	චූර්ණය	තෝලා	1 යි.	(ග්‍රෑම 12 යි.)
	ගම්මිරිස්	,,	,,	1 යි.	(ග්‍රෑම 12 යි.)
	තිප්පිලි	,,	,,	1 යි.	(ග්‍රෑම 12 යි.)
ශෝධිත	පුෂ්කර	,,	,,	1 යි.	(ග්‍රෑම 12 යි.)

සංස්කරණය :— මේ ඖෂධ සියල්ල දෙහි ඇඹුලෙන් භාවනා යුක්තව දිනක් අඹරා රක්තිකා (මි:ග්‍රෑ: 125) ප්‍රමාණයට ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— ප්‍රලාප අවස්ථා නැති කරයි. දීපන පාචන යි. අග්නිමාන්ද්‍ය නාශක යි.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

48. යෝග නාමය :— **බාලරෝගාන්තක රසය.**

යෝගය :—

ශෝධිත	රස	ශාණ	1	යි.	(ග්‍රෑ; 4 යි.)
,,	ගන්ධක	,,	1	යි.	(ග්‍රෑ: 4 යි.)
	ස්වර්ණමාක්ෂික භස්ම	,,	1	යි.	(ග්‍රෑ: 2 යි.)
	ගම්මිරිස්	,,	1	යි.	(ග්‍රෑ: 4 යි.)

සංස්කරණය :— පහත සඳහන් යූෂයන්ගෙන් අඹරා ගත යුතු වේ.

කළුකැම්මෙරිය
කහමල් කීකිරිඳිය
නිකපත් යූෂ
ශාලිඤ්ච (ඇඹුලැඹිලිය) යූෂ
වේලා යූෂ
මණ්ඩූකපර්ණී යූෂ
එලකටරොලු යූෂ

පසුව ගම්මිරිස් චූර්ණය දමා අඹරා අබ ඇට පමණට ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— ජ්වර, ආම, පඤ්චවිධ කාස යන රෝගවලට සුදුසු ය.

අනුපාන :— යෝග්‍ය අනුපානයකින් අවස්ථාවට සුදුසු පරිදි යොදනු මනා ය.

මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා යි.

49. යෝග නාමය :— **මහාභ්‍ර වටිකාව.**

යෝගය :—

අභ්‍ර භස්ම	තෝලා	2 යි.	(ග්‍රෑම 24 යි.)
ශෝධිත රස	,,	1 යි.	(ග්‍රෑම 12 යි.)
,, ගන්ධක	,,	1 යි.	(ග්‍රෑම 12 යි.)
ලෞහ භස්ම	,,	1 යි.	(ග්‍රෑම 12 යි.)
ස්වර්ණ භස්ම	,,	1 යි.	(ග්‍රෑම 12 යි.)

සංස්කරණය :— කීකිරිඳිය යුෂින් විසිඑක් වරක් භාවනා දුන් අභ්‍ර භස්ම ගෙන රස ගන්ධක කජ්ජලිය හා අන්‍ය භස්ම වර්ග ද එකට මිශ්‍රකොට ත්‍රිඵලාක්වාථයෙන් අඹරා ඔලිඳැට තරමට ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— ව්‍රණ සහිත මේහයට විශේෂයෙන් යෙදේ.

අනුපාන :— තිපල් කෂාය හෝ සුදුසු අනුපානයකින් යොදන්නේ ය.

මාත්‍රාව :— ගුංජා 1 — 2 යි. (මි. ග්‍රෑ. 125 — 250 යි.)

50. යෝග නාමය :— **මහාමෘගාංක රසය.**

යෝගය :—

ස්වර්ණ භස්ම	භාග	1 යි.	ස්වර්ණමාක්ෂික	භස්ම	භාග	5 යි.
රස සින්දූර	භාග	2 යි.	රජත	භස්ම	භාග	5 යි.
මුක්තා භස්ම	භාග	3 යි.	ප්‍රවාල	භස්ම	භාග	7 යි.
ශෝධිත ගන්ධක	භාග	4 යි.	ශෝධිත ටංකණ	භස්ම	භාග	1 යි.

සංස්කරණය:— රස සින්දූර ගන්ධක පළමුව අඹරා එයට සෙසු ද්‍රව්‍ය ද ලා, දෙහි ඇඹුලෙන් දින තුනක් භාවනා යුක්තව අඹරා ගත යුතු ය. ඉක්බිතිව එය ගෝලයක් කොට දැඩි අව්වෙන් වියලා මූෂාවක බහා, එය ලුණු පිරවූ බඳුනක ශරාව බද්ධකොට යාම තුනක් පුට දී දවා ගත යුතු වේ. පසුව යෝගයට වජ්‍ර භස්ම ඉන් 1/64 ක් හෝ වෛක්‍රාන්ත භස්ම 1/16 ක් හෝ යොද අඹරා චූර්ණය ලෙස වීදුරු බඳුනක අසුරා තැබිය යුතු වේ.

ප්‍රයෝග :— බහුරූපියක්ෂ්මා රෝගයට හිතවත් වේ. ජ්වර, ගුල්ම, විද්‍රධි, කාමලා ආදි අවස්ථාවනට ද මන්දග්නි ස්වරභේද, කාස, අරුචි, පාණ්ඩු, වමන සඳහා ද යෝග්‍ය වේ. මහාරෝග හා ගරවිෂට ද හිත ය.

අනුපාන :— ගම්මිරිස් සුණු සහිත ගිතෙලින් හෝ තිප්පිලි සුණු හා මීපැණියෙන් යෙදිය යුතු යි.

මාත්‍රාව :— ගුංජා 3 යි. (මි. ග්‍රෑ: 375 යි.)

51. යෝග නාමය :— **මහාශංඛවටී රසය.**

යෝගය :—

ශංඛ	භස්මය	භාග 1 යි.	විෂ්වාක්ෂාරය (සියඹලාපොතු ක්ෂාරය)		භාග 1 යි.
ලවණ	පංචකය (ප්‍රත්‍යෙකව)	භාග 1 යි.	ත්‍රිකටු චූර්ණය		භාග 1 යි. (ප්‍රත්‍යෙකව)
ශෝධිත	හිංගු චූර්ණය	භාග 1 යි.	ශෝධිත	රසදිය	භාග 1 යි.
,,	වච්චනාභි චූර්ණය	භාග 1 යි.	,,	ගන්ධක	භාග 1 යි.
ලෝහ	භස්ම	භාග 1 යි.			
වංග	භස්ම	භාග 1 යි.			

සංස්කරණය :— පාරද ගන්ධක කජ්ජලි කොට එයට සුදුසු සෙසු ද්‍රව්‍ය චූර්ණය ද යොද කරල් හැබ ස්වරසයෙන් ද, රත්නිවුල් මුල් ක්වාථයෙන් ද, දෙහි ඇඹුලෙන් ද අම්ල ගණයෙහි රසයෙන් ද භාවනා දී අඹරා රක්තිකාද්වයක් පමණ ගුලි කොට පවන වියලා විදුරු බඳුනක අසුරා තැබිය යුතු වේ.

ප්‍රයෝග :— මන්දාග්නි, අජීර්ණ, ජ්වර, ගුල්ම, පාණ්ඩු, ශූල යන රෝගයනට හිතවත් වේ. ප්‍රමේහ, වාතරක්ත, වාත පිත්ත කඵ ජනිත මහා ශෝථ, අර්ශස් යන රෝග අවස්ථාවනට ද යෝග්‍ය වේ.

අනුපාන :— උෂ්ණ ජලයෙන් බෙහෙවින් ප්‍රයෝග කරණු ලැබේ. තවද සුදුසු අනුපාන ප්‍රයෝග ද කටහැකි වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

සැ: යු:— මෙහි ලෝහ, වංග දෙකෙන් තොරව ගත් කල ශංඛවටී නම් වේ. ශංඛවටි 6 ක් තිබේ. කිසිවක ලෝහ වංග නැත.

52. යෝග නාමය :— **මාණික්‍ය රසය.**

යෝගය :—

ශෝධිත	හරිතාල	පල	1 යි.	(ග්‍රෑ: 60)	නාග	භස්මය	තෝල	1 යි.	(ග්‍රෑ: 8)
,,	ගන්ධක	,,	1 යි.	(ග්‍රෑ: 60)	තාම්‍ර	,,	,,	1 යි.	(ග්‍රෑ: 8)
,,	මනඃශිලා	,,	1/2 යි.	(ග්‍රෑ: 30)	අභ්‍රක	,,	,,	1 යි.	(ග්‍රෑ: 8)
,,	රසදිය	,,	1 යි.	(ග්‍රෑ: 60)	ලෝහ	,,	,,	1 යි.	(ග්‍රෑ: 8)
රසකිඳ චූර්ණය		ශාණ	1 යි.	(ග්‍රෑ: 4)	මුරුංගා ඇට		ශාණ	1 යි.	(ග්‍රෑ: 4)
වාලක චූර්ණය (ප්‍ර.සැවැන්දරා)		,,	1 යි.	(ග්‍රෑ: 4)	මුරාමාංසි		,,	1 යි.	(ග්‍රෑ: 4)
කිතුල් මුල්		,,	1 යි.	(ග්‍රෑ: 4)	සුදුදුරු		,,	1 යි.	(ග්‍රෑ: 4)
ශෝධිත චදුරුමෑ ඇට		,,	1 යි.	(ග්‍රෑ: 4)	තිකකොළ චූර්ණය		,,	1 යි.	(ග්‍රෑ: 4)
කෘෂ්ණපුෂ්පී (නිල්කටුකරඬු)		,,	1 යි.	(ග්‍රෑ: 4)	හයමාරක (කනේරු)		,,	1 යි.	(ග්‍රෑ: 4)

සංස්කරණය :— රසදිය ගන්ධක මනාව කජ්ජලිකොට එයට හරිතාලාදි භස්ම වර්ග යොද නුග කිරෙහි ගල්වා ඇඹරිය යුතු ය. ඉක්බිතිව කොසඹ පොතු ක්වාථයෙන් අව්වෙහි තබා දින තුනක් අඹරනු යෙදේ. පසුව එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ලා යලි අඹරා ගත යුතු ය. දැඩි මැටි භාජනයෙක්හි ලා පියන වසා කඩ මැටි බැඳ නදී හෝ පොකුණු ඉවුරක රාත්‍රියෙහි දී හුදකලාව සංසුංසිතින් යුක්තව අග්නියෙන් දවා ගත යුතු ය. පසු ද උදය සිහිල් වූ මාණික්‍ය සදෘශ සංස්කරණය භාවිතය සඳහා ගත යුතු වේ.

ප්‍රයෝග :— සියලු කුෂ්ඨ සඳහා ප්‍රශස්ත වේ. උග්‍ර වාතරක්තය, ශීතපිත්තය, හික්කාව, යන රෝගයනට ද, ජ්වර, පාණ්ඩු, කාමලා යන උපද්‍රවයනට ද හිතවත් වේ.

අනුපාන :— ගිතෙල් සහ මීපැණියෙන් ලෝහබල්වයක ලෝහ දණ්ඩකින් ඖෂධ මාත්‍රාව අඹරා යෙදිය යුතු ය. සිහිල් තඩාගදිය හෝ උණුකොට ශීත කොට ගත් කිරි හෝ පිමට යෙදිය හැකි ය.

මාත්‍රාව :— රක්තිකා 2 යි. (මි. ග්‍රෑ: 250)

53. යෝග නාමය :— **මේහවජ්‍ර රසය.**

යෝගය :—

රසසින්දූර	තිප්පිලි	චූර්ණය
කාන්තලෝහ භස්ම	අරළු	,,
ශුද්ධ ශිලාජතු	බුළු	,,
ස්වර්ණමාක්ෂික භස්ම	නෙල්லි	,,
ශුද්ධ මනඃශිලා	බෙලිගැටමද	,,
ඉඟුරු චූර්ණය	සුදුදුරු	,,
ගම්මිරිස් චූර්ණය	දිවුල්පොතු	,,
වියලිකහ චූර්ණය	— සමභාගව ගන්නේ ය.	

සංස්කරණය :— කිකිරිඳිය යුෂින් භාවනා යුක්තව තිස්වරක් දෘඪව අඹරා, පවනේ වියලා ගත යුතු වේ.

ප්‍රයෝග :— දරුණු මූත්‍රකෘච්ඡ්‍ර නසයි. චිරකාලීන ප්‍රමේහ නාශක යි.

අනුපාන :— ශුද්ධ මහානිම්බ බීජ (ලුණුමිදෙල්ල) චූර්ණය ගිතෙලින් අනා, තණ්ඩුලෝදක සමඟ බීමට යෝග්‍ය ය.

මාත්‍රාව :— රක්තිකා 5, (මි: ග්‍රෑම් 625) වටිකා 1 — 2 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය.

54. යෝග නාමය :— **රත්නගර්භ පෝට්ටලි රසය.**

යෝගය :—

රස සින්දූර		භාග	1 යි.	තාම්‍ර භස්මය	භාග	1 යි.
වජ්‍ර	භස්ම	,,	1 යි.	ගම්මිරිස් චූර්ණය	,,	1 යි.
ස්වර්ණ	,,	,,	1 යි.	මුක්තා චූර්ණය	,,	1 යි.
තාරක (රිදී)	,,	,,	1 යි.	ස්වර්ණමාක්ෂික චූර්ණය	,,	1 යි.
නාග	,,	,,	1 යි.	විද්‍රුම භස්මය	,,	1 යි.
ලෞහ	,,	,,	1 යි.	ශංඛ භස්මය	,,	1 යි.
තුත්ථක	,,	,,	1 යි.			

සංස්කරණය :— පූර්වෝක්ත ද්‍රව්‍ය රත්නෙටුල් මුල් ක්වාථයෙන් සත් දිනක් අඹරා ශෝධිත කවඩි තුළ පුරවා වරා කිරෙන් අඹරා ගත් ටංගණ ප්‍රලේපයෙන් එහි මුව විට වසා වියලා ගත යුතු ය. ඉක්බිතිව කෝවයක ලා මැටි බැඳ ගජ පුටයකින් දවාගනු ක්‍රමය වේ. අනතුරුව නිවී ගිය ඔසු සහිත කවඩි සුණුකොට නිකකොළ ස්වරසින් අමු ඉඟුරු, ස්වරසින් සත්වර බැගින් ද, රත්නෙටුල් මුල් ස්වරසින් එක් විසිවරක් ද, භාවනා දී රක්තිකා පමණ ගුලි තනා පවන වියලා ගත යුතු ය. එය විදුරු බඳුනක බහා තබනු උචිත වේ.

ප්‍රයෝග :— සාධ්‍ය හෝ අසාධ්‍ය හෝ ක්ෂය රෝග අවස්ථා සඳහා ප්‍රශස්ත වේ. කාස, ජ්වර, අතිසාර, ශ්වාසය යන උපද්‍රව සහිත මහාරෝග අවස්ථාවන්හිදී යොදනුව මනා ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

55. යෝග නාමය :— **රාමබාණ රසය.**

යෝගය :—

ශෝධිත	රසදිය	තෝලා	1 යි.	(ග්‍රෑම	12 යි)
,,	වච්චනාවි	,,	1 යි.	(,,	12 යි.)
	කරාබු චූර්ණය	,,	1 යි.	(,,	12 යි.)
ශෝධිත	ගන්ධක චූර්ණය	,,	1 යි.	(,,	12 යි.)
	ගම්මිරිස් චූර්ණය	,,	2 යි.	(,,	24 යි.)
	සාදික්ක	,,	1/2 යි.	(,,	6 යි.)

සංස්කරණය :— රසදිය ගන්ධක කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ලා සියඹලා බොර ස්වරසින් අඹරා රක්තිකාවක් පමණ ගුලි කොට මඳ පවනැ වියලා ගන්නේ ය.

ප්‍රයෝග :— ආමවාතජනිත ජ්වරය, අග්නිමාන්ද්‍ය, උදරාමය අවස්ථා, අරුචිය යන රෝග අවස්ථාවනට යෝග්‍ය වේ. තරුණජ්වරය සඳහා ද යෙදේ. ජඨරාග්නි දීපනය වේ. සංග්‍රහ ග්‍රහණි නාශක යි.

අනුපාන :— අවස්ථොචෝචිත පරිදි යෝග්‍ය අනුපානයන් සහිතව යෙදිය හැකි වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

සැ: යු:— වෘද්ධ ව්‍යවහාරයෙහි යෝගය ඇඹරීම සඳහා පැරණි සියඹලා බොර ඇල්දියෙන් දියකොට පෙරා ගනු ලැබේ.

56. යෝග නාමය :— **රාජමෘගාංක රසය.**

යෝගය :—

රස සින්දූර	තෝලා	3 යි.	(ග්‍රෑ: 36)	ශෝධිත	මනෝශිල	තෝලා	2 යි.	(ග්‍රෑ: 24)
ස්වර්ණ භස්ම	,,	1 යි.	(ග්‍රෑ: 12)	,,	ගන්ධක	තෝලා	2 යි.	(ග්‍රෑ: 24)
රජත භස්ම	,,	1 යි.	(ග්‍රෑ: 12)	,,	තාලක	,,	2 යි.	(ග්‍රෑ: 24)

සංස්කරණය :— රසසින්දූර, ගන්ධක ප්‍රථම කොට සියුම්ව අඹරා එයට සෙසු ද්‍රව්‍යයන් ද ලා යළි අඹරා ශෝධිත වරාටි = කවඩි තුළ චූර්ණය පුරවා එහි මුවය එළකිරෙන් අඹරා ගත් ටංගණ ප්‍රලේපයෙන් වසා, වියලා, මැටි බඳුනක බහා එද පියන් පතින් වසා මැටි බැඳ, ගජපුටයක ලා, දවා ගත යුතු ය. ස්වාංගශීත වූ පසු ඖෂධ යුක්ත වරාටිකා ඇල්දියෙන් අඹරා ගුංජා පමණ ගුලි තනා පවන වියලා විදුරු බඳුනක අසුරා තබනු ක්‍රමය වේ. මෙය චූර්ණය ලෙස ද භාවිත කෙරේ.

ප්‍රයෝග :— වාතශ්ලේෂ්මයෙන් උපන් ක්ෂය රෝගය සඳහා යොදනු ලැබේ. ක්ෂය ජනිත නානා උපද්‍රවයනට ද යෝග්‍ය වේ.

අනුපාන :— තිප්පිලි චූර්ණය සහිත මීපැණියෙන් ද, ගම්මිරිස් සුණු සහිත ගිතෙලින් ද, අනෙක් අවස්ථාචෝචිත අනුපානයකින් ද ප්‍රයෝග කටහැකි යි.

මාත්‍රාව :— රක්තිකා 1 — 4 දක්වා

සැ: යු :— භාරත භෛෂජ්‍ය රත්නාකරයේ රජත භස්ම වෙනුවට තාම්‍ර භස්ම සඳහන් වේ.

57. යෝග නාමය :— **ලක්ෂ්මී විලාශය.** (1)

යෝගය :—

කෘෂ්ණ අභ්‍ර භස්ම	පල	1 යි.	(ග්‍රෑ: 60)
පාරද ගන්ධක } කජ්ජලි	,,	1 යි.	(ග්‍රෑ: 60)
බැවිල මුල්	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)
නාගබලා (සිරිවැඩි බැවිල) මුල්		1 යි.	(ග්‍රෑ: 15)
වියලි හාතාවාරිය අල	,,	1 යි.	(ග්‍රෑ: 15)
වියලි කිරිබඳු අල	,,	1 යි.	(ග්‍රෑ: 15)
කලු අත්තන ඇට	,,	1 යි.	(ග්‍රෑ: 15)
දියමිදෙල්ල ඇට	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)
නෙරෙංචි ඇට	,,	1 යි.	(ග්‍රෑ: 15)
වෘද්ධදරු ඇට	,,	1 යි.	(ග්‍රෑ: 15)
කංසා ඇට	,,	1 යි.	(ග්‍රෑ: 15)
සාදික්කා	,,	1 යි.	(ග්‍රෑ: 15)
වසාවාසි	,,	1 යි.	(ග්‍රෑ: 15)
කපුරු	,,	1 යි.	(ග්‍රෑ: 15)
ස්වර්ණ භස්ම	,,	1/4 යි.	(ග්‍රෑ: 3.75)

සංස්කරණය :— බුලත් ඉස්මෙන් භාවනා යුක්තව අඹරා ද්විගුංජා පමණට ගුලි කරන්න. ස්වර්ණභස්ම වෙනුවට ලෝහ භස්ම හෝ රස සින්දූර යොදති. (ඇතැම්)

ප්‍රයෝග :— කළුරෝග, වාතරෝග සහ වාතකළු, ක්ෂය, කාස, ශ්වාස, හික්කා, ප්‍රමේහ සහ පක්ෂාඝාත ආදී දරුණු වාතව්‍යාධි යන රෝගයන්හි විශිෂ්ට ය.

සැ : යු:— කජ්ජලි වෙනුවට රසසින්දූර ද ව්‍යවහාර කෙරේ. එය වඩා ගුණදායක ය.

58. යෝග නාමය :— **ලක්ෂ්මී විලාශය** (2) (නාරදිය)

යෝගය :—

අභ්‍ර භස්ම	ග්‍රෑම 96 යි.	=	තෝලා	8 යි.	
පාරද	(,, 48 යි.)	=	,,	4 යි.	} කජ්ජලි 8 යි.*
ගන්ධක	(,, 48 යි.)	=	,,	4 යි.	
කර්පූර	(,, 48 යි.)	=	,,	4 යි.	
සාදික්කා	(,, 48 යි.)	=	,,	4 යි.	
වසාවාසි	(,, 48 යි.)	=	,,	4 යි.	
වෘද්ධදරු බීජ	(,, 24 යි.)	=	,,	2 යි.	
කංසා ඇට	(,, 24 යි.)	=	,,	2 යි.	
කලු අත්තන ඇට	(,, 24 යි.)	=	,,	2 යි.	
කිරිබඳු අල	(,, 24 යි.)	=	,,	2 යි.	
හාතාවාරිය අල	(,, 24 යි.)	=	,,	2 යි.	
නාගබලා මුල් (සිරිවැඩි)	(,, 24 යි.)	=	,,	2 යි.	
බැවිල මුල්	(,, 24 යි.)	=	,,	2 යි.	
දියමිදෙල්ල ඇට	(,, 24 යි.)	=	,,	2 යි.	
ගෝක්ෂුර බීජ	(,, 24 යි.)	=	,,	2 යි.	

සංස්කරණය :— බුලත් ඉස්මෙන් අඹරන්නේ ය.

ප්‍රයෝග :— කළුරෝග වාත රෝග සහ වාතකළු යන රෝගයන්ට හිත යි.

අනුපාන :— බුලත් යුෂ, සීනි, මීපැණි, තිප්පිලි කුඩු ද වාතරෝගයෙහි බැවිල කෂාය ද වේ.

මාත්‍රාව :— (මි: ග්‍රෑ: 125 — 375) රක්තිකා 1 — 3 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

* පාරද වෙනුවට රස සින්දූර ද ව්‍යවහාර කෙරේ. එය ඉතා සුදුසු ය.

59. යෝගනාමය:— **ලස්වානන්ද රසය.**

යෝගය :—

ශෝධිත	රසදිය	තෝලා	1 යි.	(ග්‍රෑම 12 යි.)
,,	ගන්ධක	,,	1 යි.	(,, 12 යි.)
	ලෝහ භස්මය	,,	1 යි.	(,, 12 යි.)
	අභ්‍ර භස්මය	,,	1 යි.	(,, 12 යි.)
ශෝධිත	වච්චනාවි	,,	1 යි.	(,, 12 යි.)
	ගම්මිරිස්	,,	8 යි.	(,, 96 යි.)
,,	ටංගණ	,,	4 යි.	(,, 48 යි.)

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ලා, කිකිරිඳිය ස්වරසයෙන් හත්වරක් භාවනා දී මනාව අඹරා යළි දෙළුම්පල ස්වරසින් ද භාවනා යුක්තව අඹරා ගුංජාද්වයක් පමණ ගුලි පිළියෙල කර ගත යුතු වේ. එය පවන වියලා විදුරු බඳුනක අසුරා තබන්නේ ය.

ප්‍රයෝග :— භ්‍රමය, දහය සහිත වාත රෝගයනට හිතවත් වේ.

අනුපාන :— අවස්ථාවෝචිතව යෝග්‍ය අනුපානයකින් යොදනු උචිත වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

60. යෝග නාමය :— **ලෝකනාථ රසය.**

යෝගය :—

ශෝධිත රසදිය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)	ලෞහ භස්මය	තෝලා 2 යි.	(ග්‍රෑ: 24 යි.)
,, ගන්ධක	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)	තාම්‍ර භස්මය	,, 2 යි.	(ග්‍රෑ: 24 යි.)
අභ්‍රක භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)	වරාටිකා භස්මය	,, 6 යි.	(ග්‍රෑ: 72 යි.)

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය යොදා බුලත් ස්වරසින් සත් දිනක් භාවනා යුක්තව අඹරා, එය ශරාව බද්ධකොට, ගජපුටයකින් දවා ගත යුතු ය. ස්වාංගශීත වූ පසු එය චූර්ණය ලෙස පිළියෙල කොට වීදුරු බඳුනක බහා ලිය යුතු ය.

ප්‍රයෝග :— යකෘත් උදරය, ප්ලීහෝදරය, ගුල්මය, ශෝථය යන රෝග සඳහා ප්‍රශස්ත වේ.

අනුපාන :— තිප්පිලි සුණු සහ මීපැණි සමඟ හෝ අරළු චූර්ණය සහ ගුඩ සහිතව හෝ යෙදිය හැකි ය. අවස්ථාව පරිදි ගෝමූත්‍ර පීමට දීම ද යෝග්‍ය වේ. සුදුදුරු චූර්ණය ගුඩ සහිතව ද යෙදේ.

මාත්‍රාව :— රක්තිකා 2 — 3 යි, (මි: ග්‍රෑ: 250 — 375)

61. යෝග නාමය :— **වසන්තමාලතී රසය.**

යෝගය :—

ස්වර්ණ භස්ම	තෝලා	1 යි.	(ග්‍රෑම් 12 යි.)
මුක්තා භස්ම	,,	2 යි.	(,, 24 යි.)
ශෝධිත හිංගුල	,,	3 යි.	(,, 36 යි.)
ගම්මිරිස් චූර්ණය	,,	4 යි.	(,, 48 යි.)
ඛර්පර භස්ම	,,	8 යි.	(,, 96 යි.)

සංස්කරණය :— මේ ඖෂධ සියල්ල මිශ්‍රකොට (නවනීත) වෙඬුරෙන් පළමුව දිනක් අඹරා, තෙල් වියලී ගිය පසු දෙහි ඇඹුලෙන් අඹරා ගුංජා 2 ක (මි: ග්‍රෑ: 250) ප්‍රමාණයට ගුලි කරන්න.

ප්‍රයෝග :— ජීර්ණජ්වරයට විෂමජ්වර හා කාසාදි උපද්‍රව යුක්ත විට ද යොදන්නේ ය.

අනුපාන :— තිප්පිලි සුණු, මී පැණි.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

62. යෝග නාමය :— **වසන්ත කුසුමාකර රසය. (I)**

යෝගය :—

ස්වර්ණ	භස්ම	භාග 2 යි.
රිදී	,,	,, 2 යි.
වංග	,,	,, 3 යි.
කාන්ත ලෞහ	,,	,, 3 යි.
අභ්‍ර	,,	,, 4 යි.
ප්‍රවාල	,,	,, 4 යි.
මුතු	,,	,, 4 යි.
කස්තුරි	,,	,, 1 යි.

සංස්කරණය :—

එළකිරි	ලාක්ෂාරස
උක්රස	අළුකෙහෙල් අල යුෂ
පාවට්ටා කොළ යුෂ	නෙළුම්මල් යුෂ

සමන්පිච්ච මල් යුෂ — යන මේවායේ ස්වරස හෝ ක්වාථයෙන් භාවනා දී අඹරා පසුව කස්තුරි මිශ්‍රකර යලි අඹරා ගුංජා දෙකේ වටක යොද සාද ගත යුතු වේ.

ප්‍රයෝග :— වලිපලිත නසයි. මේධ්‍ය යි. කාමඋද්දීපන යි. සැප ගෙන දෙයි. විශේෂයෙන් ප්‍රමේහ නස යි. පුෂ්ටිකර යි. වඳ බව නස යි. ක්ෂය, කාස, උන්මාද, ශ්වාස, රක්තජ රෝග, විෂරෝග නසන්නේ ය. මධුමේහයෙහි විශිෂ්ට ය.

අනුපාන :— සීනි, ගිතෙල්, සහ මීපැණි, සීනි, සුදුහඳුන්, සමඟ මේ ඖෂධය ගැනීමෙන් අම්ලපිත්තාදි පිත්තජ රෝග නසාලන්නේ ය.

වසන්ත කුසුමාකර (2)

ප්‍රවාල භස්ම හෝ පිෂ්ටි	භාග 4 යි.
චන්ද්‍රෝදය හෝ රසසින්දූර	,, 4 යි.
මුතු භස්ම හෝ මුතු පිෂ්ටි	,, 4 යි.
අභ්‍ර භස්ම	,, 4 යි.
රිදී භස්ම	,, 4 යි.
සුවර්ණ භස්ම	,, 2 යි.
ලෞහ භස්ම	,, 3 යි.
නාග භස්ම	,, 3 යි.
වංග භස්ම	,, 3 යි.

සංස්කරණය :— සියල්ල ගල් බල්වයෙහි ලා ආඩාතෝඩා කොළ යුෂ, අමුකහ යුෂ, උක්ගස් ඉස්ම, නෙළුම්මල් යුෂ, සමන්මල් යුෂ, හාතාවාරිය අල යුෂ, අළුකෙසෙල් අල යුෂ, සුදුහඳුන් ඵාණ්ටය යන මේ ද්‍රව්‍යන්හි වෙන වෙන ම සත්වර බැගින් භාවනා දෙන්නේ ය. එක් එක් භාවනාවෙහි පැය 3—6 ක් ඇඹරිය යුතු ය. අවසාන භාවනාවෙහි දී උත්කෘෂ්ට කස්තුරි භාග 2 ක් සමඟ පැය 3 ක් අඹරන්නේ ය. ඉක්බිති රක්තිකා 2 පමණට ගුලි කැර පවනැ වියලා වායුනිවාරක බෝතලයක සංරක්ෂණය කෙරේ. මෙම යෝගයට අම්බර භාග 2 ක් මිශ්‍ර කළහොත් විශේෂ ගුණකාරක වන්නේ ය. (ආචාර්ය යාදවජී ත්‍රිකම්ජි) සිද්ධයෝග සංග්‍රහ.

63. **යෝග නාමය :—** **වංගාෂ්ටක.**

යෝගය :—

ශෝධිත රසදිය	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)	බර්පර හස්ම	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)
,, ගන්ධක	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)	අභ්‍රක	,, ,,	1 යි.	(ග්‍රෑ: 12)
ලෞහ හස්ම	,,	1 යි.	(ග්‍රෑ: 12)	තාම්ර	,, ,,	7 යි.	(ග්‍රෑ: 12)
රජත හස්ම	,,	1 යි.	(ග්‍රෑ: 12)	වංග	,, ,,	7 යි.	(ග්‍රෑ: 84)

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලිකොට අන්‍ය හස්ම වර්ග දැඩි ලෙස ජලයෙන් දිනක් අඹරා ගෝලයක් කොට පුටයක් දී නිවීගිය පසු ගුංජාවක් පමණ ගුලි පිළියෙල කර ගත යුතු යි.

ප්‍රයෝග :— විංශතිවිධ ප්‍රමේහ, ආමදෝෂ, විසූචිකා, විෂමජ්වර, ගුල්ම, අර්ශස්, මූත්‍රාතිසාර, පිත්තජරෝග සෝම රෝග නාශක යි. වීර්ය වඩ යි.

අනුපාන :— මීපැණි හෝ කහකුඩු මීපැණි සමග හෝ නෙල්ලි යුෂ සමග දිය හැකි වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

64. **යෝග නාමය :—** **වාතකුලාන්ත රසය.**

යෝගය :—

කස්තූරි	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)	ශෝධිත ගන්ධක	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)
නාමල්රේණු	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)	සාදික්කා	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)
බුළු	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)	එන්සහල්	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)
ශෝධිත රසදිය	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)	කරාබු	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15)

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලිකොට සෙසු ද්‍රව්‍යයන්හි චූර්ණය ද ලා, ඇල්දියෙන් අඹරා රක්තිකාවක් පමණ ගුලි පිළියෙල කොට පවන වියලා ගත යුතු වේ.

ප්‍රයෝග :— ඝෝර අපස්මාර රෝගය සඳහා අති මනා ය. මූර්ච්ඡාව, වාතජ රෝග අවස්ථා උදෙසා ද යෝග්‍ය වේ.

අනුපාන :— අවස්ථාචෝචිතව යෝග්‍ය අනුපානයකින් ප්‍රයෝග කටහැකි ය. අපස්මාරය, වාතජ හෘද්රෝග අවස්ථා සඳහා ජටාමාංස ක්වාථය සමඟ දෙනු ප්‍රශස්ත වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

සැ: යු:— භාරත භෛෂජ්‍ය රත්නාකරයේ මනෝසිල ද ගෙන ඇත.

65. **යෝග නාමය :—** **වාතාරි රසය.**

යෝගය :—

ශෝධිත රස	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)	රත්නිවුල් චූර්ණය	තෝලා	4 යි.	(ග්‍රෑ: 48)
,, ගන්ධක	තෝලා	2 යි.	(ග්‍රෑ: 24)	ශුද්ධ ගුගුල් චූර්ණය	තෝලා	5 යි.	(ග්‍රෑ: 60)
ත්‍රිපලා (මිලිතව).	තෝලා	3 යි.	(ග්‍රෑ: 36)				

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලිකොට ගුගුල් හැර අන්‍ය චූර්ණ සමග සියුම්ව ඇල්දියෙන් අඹරා ගත යුතු ය. පසුව එරඩු තෙලින් අඹරා ගත් ගුගුල් චූර්ණය ද ඊට මිශ්‍රකොට නැවත එරඩු තෙලින් දැඩිව අඹරා කර්ෂ 1/2 (ග්‍රෑ: 7.5) ප්‍රමාණයට ගුලි කරන්න.

ප්‍රයෝග :— වාතරෝග නාශක යි. කටිවාතයට විශේෂ යි.

අනුපාන :— එරඩු මුල් කෂාය කොට ඉඟුරු කුඩු සමඟ වාතාරි රසය යොදන්නේ ය. නාගර එරණ්ඩ ක්වාථයෙන් ද යොදනු ලැබේ. ස්නිග්ධ උෂ්ණ භොජන යෙදිය යුතු යි.

මාත්‍රාව :— රෝගාවස්ථාව වයස ගැන සලකා ශාණයේ සිට කර්ෂය දක්වා.

66. **යෝග නාමය :—** **වාතගජේන්ද්‍රසිංහ රසය.**

යෝගය :—

අභ්‍ර හස්ම	කුරුඳු පොතු
ලෞහ හස්ම	ගිනි එන්සාල්
ශුද්ධ රසදිය	තේජපත්‍ර
ශුද්ධ ගන්ධක	අරළු
තාම්ර හස්ම	බුළු
නාග හස්ම	නෙල්ලි
වංගණ	කළුදුරු තෝලා 1/2 බැගින්. (ග්‍රෑ: 6)

ශුද්ධ වච්චනාවි
සවිඳලුණු
කරාබු
පෙරුංකායම්
සාදික්කා තෝලා 1 බැගින්. (ශු: 12)

සංස්කරණය :— ප්‍රථමයෙන් රස ගන්ධක කජ්ජලි කොට අනෙක් ද්‍රව්‍යයන්ගේ චූර්ණය ද බහා කෝමාරිකා ස්වරසින් අඹරා රක්තිකා තුනේ (මි: ශු: 375) ගුලි කර ගන්නේ ය.

මාත්‍රාව :— ගුලි 1 — 2 දක්වා ය.

ප්‍රයෝග :— වා-පිත්-සෙම් රෝග නසයි. ක්ෂීණයින් තරකර යි. වෘෂ්‍ය යි. බලවර්ධක යි. ආයුවර්ධක යි.

අනුපාන :— මන්දෝෂ්ණ කිරි

67. යෝග නාමය :— **වාතගජාඞ්කුශ රසය.**

යෝගය :—
රස සින්දූර
ලෞහ භස්ම
ස්වර්ණමාක්ෂික
ශෝධිත ගන්ධක
,, තාලක
අරළු
ටඞ්කණ
කර්කටකශෘංගි
ශෝධිත වච්චනාවි
ශුණ්ඨි
තිප්පිලි
ගම්මිරිස්
මිදිමුල්

සංස්කරණය :— රස සින්දූර ගන්ධක පළමුකොට අඹරා සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ද ලා, මුඩමහණ ස්වරසයෙන් දිනක් අඹරා නික කොළ ස්වරසයෙන් භාවනා යුක්තව දිනක් ද අඹරා ද්විගුඤ්ජා පමණ ගුලි තනා පවන වියලා ගත යුතු වේ.

ප්‍රයෝග :— සාධ්‍ය හෝ අසාධ්‍ය හෝ වාත රෝග සඳහා ප්‍රයෝග කරනු ලැබේ. විශේෂයෙන්, ශෘධරසි, ක්‍රෝෂ්ට්‍ර ශීර්ෂවාත, අවබාහුක, ඌරුස්තම්භය, හනුස්තම්භය, මන්‍යාස්තම්භය. පක්ෂාඝාතය යන අවස්ථා සඳහා ද යෝග්‍ය වේ.

අනුපාන :— තිප්පිලි චූර්ණ සහිතව වැල්මදට ක්වාථය පීම අනුදක්නා ලැබේ. තවද යෝග්‍ය අනුපාන අවස්ථානුකූලව ප්‍රයෝග කට හැකි වේ.

68. යෝග නාමය :— **වාතනාගාංකුශය.**

යෝගය :—
රසදිය, ගන්ධක } කජ්ජලිය
වච්චනාවි
ඉඟුරු
රත්නිවුල්
වළභසාල්
කොල්ලං කොළ
රත්හිරියල්
යවක්ෂාර
සුවසලුණු
සහිඳලුණු
කටුකරෝසන
සාරණමුල්
අරළු

සංස්කරණය :— මෙම ද්‍රව්‍ය සමභාගව චූර්ණ කොට, එම සියල්ල බරට ශුද්ධ ජයපාල තුන් බරක් යොද දින තුනක් දෙහි ඇඹුලෙන් අඹරා මංචාඩි එක ප්‍රමාණයට ගුලි කර පවනෙහි වියලා සුරැකිව තබා ගන්නේ ය

අනුපාන :— ඉඟුරු ඉස්ම, උණුවතුර, සීනි හෝ හකුරු මිශ්‍රකොට වළඳා උණුවතුර බොන්නේ ය
විරේක වූ පසු සරක්කු හොදි (මිරිස් ආනම්) සමග බත් වළඳන්නේ ය අධික විරේකයෙහි ඇල්වතුර කිරිමෝරු වළඳන්න

ප්‍රයෝග :— සියලු වාත, උදාවර්ත, උදර රෝග, ශූලරෝග, ජල (අණ්ඩ) වෘද්ධි, ශෘධරසි, වාතරක්ත, ක්‍රෝෂ්ටුකශීර්ෂ ආදි සන්ධිවාතයන්හි ද විරේචනය කළ යුතු අවස්ථාවෙහි වූ පක්ෂාඝාත අවබාහු, අර්දිත රෝගයන්හි ද විශිෂ්ට ය සන්ධිගත කලා කෝෂයන්හි ජල සංචය වූ කල්හි මෙම විරේචනය ඉතා ප්‍රශස්ත ය

69. යෝග නාමය :— **විද්‍යාධරාභ්‍ර රසය.**

යෝගය :—

වළහසාල්ඇට මද	දන්තමුල්		
කලාඳුරු අල	ත්‍රිවෘත්		
අරළු	රත්නිටුල් මුල්		
බුළු	වියලි ඉඟුරු		
නෙල්ලි	ගම්මිරිස්		
රසකිඳ	තිප්පිලි	කර්ෂ 1 බැගින්.	(ග්‍රෑ: 15 යි.)
මණ්ඩූර භස්මය	පල	4 යි.	(,, 240 යි.)
ලෞහ භස්මය	පල	4 යි.	(,, 240 යි.)
කෘෂ්ණාභ්‍රභස්මය	පල	1 යි.	(,, 60 යි.)
ශෝධිත රසදිය	මාෂක	12 යි.	(,, 12 යි.)
,, ගන්ධක	කර්ෂ	1 යි.	(,, 15 යි.)

මෙහි ලඃ ගෝමූත්‍රයෙන් ශෝධිත පුරාතන මණ්ඩූර භස්මය ගත යුතු වේ. ඉදින් එය නොමැත, ලෞහ භස්මය ගත යුතු වේ. රසදිය මණ්ඩූකපර්ණී ස්වරසයෙන් ශෝධනය කොට ගත යුතු ය.

සංස්කරණය :— රස ගන්ධක මනාව කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය යොද මීගිතෙලින් භාවනා යුක්තව අඹරා ගිතෙල් ආලේපිත මැටි බඳුනක බහා තැබිය යුතු වේ.

ප්‍රයෝග :— අග්නිමාන්ද්‍ය, පරිණාම ශූලය, අන්නද්‍රව ශූලය, රාජයක්ෂ්මාව, අම්ලපිත්තය, ග්‍රහණී රෝගය, ජීර්ණ ජ්වරය, උග්‍ර රක්ත පිත්තය යන ව්‍යාධි සඳහා ප්‍රයෝග කරනු ලැබේ.

අනුපාන :— එළකිරි සමඟ හෝ ශීත ජලයෙන් හෝ දිනපතා සේවනයෙහි යෙදිය යුතු වේ.

මාත්‍රාව :— මාෂක 1 යි. (ග්‍රෑ: 1 යි.) මෙහි ලා ක්‍රමයෙන් වැඩි කරණ මාත්‍රාව අනුදන්නා ලැබේ.

70. යෝග නාමය :— **වෘහත් කනක සුන්දර රසය.**

යෝගය :—
ශෝධිත රසදිය
අභ්‍ර භස්ම
ශෝධිත ගන්ධක
ගම්මිරිස්
ශෝධිත ටඞ්කණ
අත්තන ඇට — සමභාගව ගන්නේ ය.

සංස්කරණය :— භාර්ගී ස්වරස හෝ ක්වාථයෙන් පැය 12 ක් නියමිත පරිදි අඹරා ගත යුතු වේ. ද්විගුඤ්ජා (මි.ග්‍රෑ: 250 පමණ ගුලි තනා ගත යුතු ය.

ප්‍රයෝග :— උග්‍ර පිත්තාතීසාර නසයි.

මාත්‍රාව :— ගුලි 1 — 4 දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

71. යෝග නාමය :— **වෘහත් කස්තූරිභෛරව රසය.**

යෝගය :—
කස්තූරි
කර්පූර
තාම්‍ර භස්මය
මලිත මල්
වඳුරු මෑ ඇට
රිදී භස්ම
ස්වර්ණ භස්ම
මුක්තා භස්ම
විද්‍රුම භස්ම (ප්‍රවාල භස්ම)
ලෞහ භස්ම
දියමිත්ත මුල් චූර්ණය
වළහසාල් ඇටමද චූර්ණය
කලාඳුරු අල චූර්ණය
වියලි ඉඟුරු චූර්ණය
සුගන්ධබාලා චූර්ණය (ප්‍රතිනිධි—සැවැන්දරා මුල්)
ශෝධිත හරිතාල
අභ්‍ර භස්මය
නෙල්ලි චූර්ණය — සමභාගව ගත යුතු ය.

සංස්කරණය :— ද්‍රව්‍ය සියල්ල මනාව චූර්ණ කොට වරාකොළ යුෂින් (පත්‍ර ස්වරසින්) අඹරා රක්තිකාවක් පමණට ගුලි කරන්න.

ප්‍රයෝග :— සියලු ජ්වරයනට යෝග්‍ය වේ. ද්වන්දජ, කාමජ, භූතජ, අභිචාර අභිශාපාදිජ ජ්වර අවස්ථාවට ද යෝග්‍ය වන අතර, ඩාකින්‍යාදි ජ්වර අවස්ථාවනට ද හිතවති. එනම්, බාලක ග්‍රහරෝග ගණයෙහි එන ජ්වරයන් සඳහා වේ. ඒ අනුව බාලකයන් විෂයෙහි වන මස්තිෂ්කකලාප්‍රදාහය = මැනින්ජයිටිස් බාලක පක්ෂාඝාතයෙහි මුල් අවස්ථාව = පෝලියෝ මයලයටිස්, ශ්වසනකජ්වරය = නියුමෝනියා, උරඃස්තෝය = ප්ලූරසි අවස්ථාවනට ද යෝග්‍ය වේ. ආන්ත්‍රික ජ්වරයෙහි = තයිපොයිඩ් ෆීවර් මුල් අවස්ථාවට ද යෝග්‍ය වේ. පූයජනක ජ්වර, විෂමජ්වර, අතීසාර, ජ්වරාතීසාර, ග්‍රහණී, කාස, මෝහ, හලීමක යන අවස්ථාවනට ද උචිත වන්නේ ය.

අනුපාන :— විෂමජ්වරයට ඉඟුරු ස්වරසින් ද අතීසාර — ග්‍රහණී රෝගයනට බිල්වදරු චූර්ණය සහිත මීපැණියෙන් ද, අනෙක් තන්හි දී අවස්ථාවෝචිත යෝග්‍ය අනුපානයකින් ද ප්‍රයෝග කට හැකි වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි. බාලක මාත්‍රාව — 1/4 — 1/2 යි.

72. යෝග නාමය :— **වෘහත් සෝමනාථ රසය.**

යෝගය :—

හිඞ්ගුලෝත්ථ රසදිය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)	රිදී භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)
ශෝධිත ගන්ධක	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)	ඛර්පර භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)
ලෞහ භස්මය	තෝලා 4 යි.	(ග්‍රෑ: 48)	සුවර්ණමාක්ෂික භස්මය	,, 1 යි.	(ග්‍රෑ: 12)
අභ්‍රක භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)	සුවර්ණ භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)
වංග භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12)			

මෙහි දී හිඞ්ගුල කොසඹ පත් ස්වරසින් ද, ගන්ධක මූෂිකපර්ණී ස්වරසින් ද ශෝධනය කොට ගත යුතු වේ.

සංස්කරණය :— රසදිය ගන්ධක කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ද යොදා කෝමාරිකා ස්වරසයෙන් සත් වරක් භාවනා දී මණ්ඩූකපර්ණී ස්වරසින් අඹරා ගුංජාද්වයක පමණ ගුලි තනා වියලා බඳුනක අසුරා තැබිය යුතු වේ.

ප්‍රයෝග :— සෝමරෝගය, බහු මූත්‍රය, මූත්‍රාතිසාරය, මූත්‍ර කෘච්ඡ්‍රය, උග්‍ර මූත්‍රාඝාතය බහුදෝෂ යුක්ත බහුවිධ ප්‍රමේහය යන රෝගයන්ට යෝග්‍ය වේ. ඉක්ෂුමේහය, හස්ති මේහය, ලාලා මේහය, වාතික, පෛත්තික ශ්ලෛෂ්මික සෝමරෝග සහ වස්තිගත රෝග ද නසයි.

අනුපාන :— මීපැණියෙන් ප්‍රයෝග කළ හැකි ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

73. යෝග නාමය :— **වෘහත් කාඤ්චනාභ්‍ර රසය.**

යෝගය :—

සුවර්ණ	භස්මය	රජත	භස්මය
රසසින්දූර		තාම්‍ර	භස්මය
මුක්තා	භස්මය	වංග	භස්මය
ලෞහ	භස්මය	කස්තූරි	
අභ්‍රක	භස්මය	කරාබු	චූර්ණය
ප්‍රවාල	භස්මය	වසාවාසි	චූර්ණය
වෛක්‍රාන්ත	භස්මය	එලවාලුක	චූර්ණය

යන ද්‍රව්‍ය සමභාගව ගන්නේ වේ. කර්ෂ 1 බැගිනි. (ග්‍රෑ: 15)

සංස්කරණය :— සියලු ද්‍රව්‍ය චූර්ණය, කෝමාරිකා ස්වරස, කේශරාජ ස්වරස, එළකිරි යන ද්‍රව්‍යයන්ගෙන් දින තුන බැගින් වෙන්ව අඹරා ගුංජා පමණ ගුලි පිළියෙල කළ යුතු වේ.

ප්‍රයෝග :— ක්ෂය රෝගයට යෙදේ. කාස, විංශති ප්‍රමේහ යන රෝග අවස්ථාවනට ද මනා ය.

මාත්‍රාව :— වටිකා 1 යි.

74. යෝග නාමය :— **වේදනාන්තක රසය.**

යෝගය :—

ශෝධිත අහිඵේන	මාෂක	3 යි.	(ග්‍රෑ: 3)
කර්පූර	මාෂක	3 යි.	(ග්‍රෑ: 3)
පාරසිකයමානිකා	මාෂක	6 යි.	(ග්‍රෑ: 6)
රසසින්දූර	මාෂක	6 යි.	(ග්‍රෑ: 6)

සංස්කරණය :— කංසාකොල යුෂින් හෝ එම කෂායෙන් දින තුනක් භාවනා යුක්තව අඹරා රක්තිකාවය තරමට ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— වේදනානාශක යි. විවිධෝත්ථාන, විවිධාශ්‍රයවේදනා නසයි.

අනුපාන :— යෝග්‍ය අනුපානයකින් දෙන්නේ ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

75. යෝග නාමය :— **වෛශ්වානර වටිය.**

යෝගය :—

ශෝධිත රසදිය	තෝලා	1 යි.	(ග්‍රෑ: 12)
,, ගන්ධක	,,	2 යි.	(ග්‍රෑ: 24)
තාම්‍ර භස්මය	,,	1 යි.	(ග්‍රෑ: 12)
ලෞහ භස්මය	,,	1 යි.	(ග්‍රෑ: 12)
ශෝධිත ශිලාජතු	,,	1 යි.	(ග්‍රෑ: 12)
,, වච්චනාවි	,,	2 යි.	(ග්‍රෑ: 24)

වියලි ඉඟුරු	කාකෝලි
ගම්මිරිස්	නිකමුල්
තිප්පිලි	බිම්තල් අල
රත්නෙටුල් මුල්	අසමෝදගම් — තෝලා 1 බැගින් වේ. (ග්‍රෑ: 12)

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලිකර එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය යොද කොසඹ පොතු ක්වාථයෙන් ද, එරඬුමුල් ක්වාථයෙන් ද වෙන් වෙන්ව එක් විසි වරක් භාවනා දී යළි කීකිරිදිය ස්වරසින් සත්වරක් භාවනා දී අඹරා ගත යුතු වේ. ඉක්බිතිව මීපැණියෙහි ගලා වියලා රක්තිකා 2 ක් (මි:ග්‍රෑ: 250) පමණ ගුලි තනා බඳුනක අසුරා තැබිය යුතු වේ

ප්‍රයෝග :— ශ්ලේෂ්මෝදරය සඳහා ප්‍රශස්ත වේ.

අනුපාන :— දහවල සහ රාත්‍රියෙහි දේවදර, රත්නෙටුල් මුල් කල්කය සහ කිරි සමග යොදන්නේ යි. නොහොත් දේවදර රත්නෙටොල්මුල් යෝගයෙන් කළ කිරි කෂාය සමග යෙදිය යුතු ය. එළ කිරි සහ කොල්ලු යූෂය සමග ආහාර දිය යුතු ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

76. යෝග නාමය :— **ශඞ්ඛපුෂ්ප්‍යාදි රස.**

යෝගය :—
ශඞ්ඛපුෂ්පී
වදකහ
බ්‍රාහ්මී
කොට්ටන්
එන්සාල්
රසහස්ම — සමභාගව ගත යුතු වෙයි.

ප්‍රයෝග :— අපස්මාර නසයි.

මාත්‍රාව :— රක්තිකා දෙකේ වටී 1— 2 යි.

77. යෝග නාමය :— **ශ්වාසකුඨාර රසය.**

යෝගය :—
ශෝධිත ටඞ්කණ
,, රසදිය
,, ගන්ධක
ඉඟුරු චූර්ණය
මනෝශිල
වච්චනාවි
ගම්මිරිස්
තිප්පිලි — සමභාගව ගත යුතු ය.

සංස්කරණය:— රස ගන්ධක කජ්ජලිකොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය යොද ඇල්දියෙන් අඹරා ගුඤ්ජා දෙකක පමණ ගුලි පිළියෙල කොට පවන වියලා ගත යුතු වේ.

ප්‍රයෝග :— ශ්වාසයට ශ්‍රේෂ්ඨ යි. පංචවිධ කාසයට ද ශ්ලේෂ්මෝල්බණ ශ්වාසයට ද ශිරෝරෝග සඳහා ද, යෝග්‍ය වේ.

අනුපාන :— උණුදිය, කටුවැල්බටු කෂාය.

මාත්‍රාව :— ගුලි 1 — 2 යි.

78. යෝග නාමය :— **ශම්බුනාථ රසය.**

යෝගය :—

ශෝධිත හිරියල්	භාග 1 යි.	තිප්පිලි	භාග 1 යි.
,, මනෝශිල	භාග 1 යි.	ශෝධිත සිනක්කාරම	භාග 1 යි.
,, සුදුපාෂාණම්	භාග 1 යි.	,, රසදිය	භාග 7 යි.
,, වච්චනාවි	භාග 1 යි.	,, ගන්ධක	භාග 7 යි.
,, පුස්කර	භාග 1 යි.	,, අබිං	භාග 7 යි.

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලිකර එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ලා, අබිං ද එකතු කොට, කංසාකොල යුෂ නිකකොළ යුෂ, අත්තනකොළ යුෂ, කොසඹකොළ යුෂ, යන මේ ස්වරසයන්ගෙන් වෙන් වෙන්ව භාවනා යුක්තව අඹරා රක්තිකා පමණ ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— පුරාතන අතීසාරය, විසූචිකාව, ග්‍රහණී රෝගය, යන අවස්ථා සඳහා සාර්ථකව යෙදිය හැකි වේ. ජල ගිතිකා රෝගයට විශෙෂයෙන් හිත ය.

අනුපාන :— කලාදුරු අල යුෂ සමග විසූචිකාවට විශේෂ යි. අවස්ථාවෝචිතව යෝග්‍ය අනුපානයක් ප්‍රයෝග කළ හැකි වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

සැ: යු :— අතීසාරයට ශ්‍රේෂ්ඨ යි.

• රසහස්ම අභාවයෙහි රසසින්දූර යෙදේ.

79. යෝග නාමය :— **ශෘඞ්ගාරාභ්‍ර රසය.**

යෝගය :—

1. කෘෂ්ණ අභ්‍ර භස්මය පල 2 යි. (ග්‍රෑ: 120)

2. කපුරු	කරාබු
වසාවාසි	ජටාමාංස
බාලක (ප්‍ර. සැවැන්දරා මුල්)	තාලීසපත්‍ර
ගජතිප්පිලි	කුරුඳු පොතු
තේජපත්‍ර	නාමල්රේණු
	මලිතමල් — ශාණ 1 බැගිනි. (ග්‍රෑ: 4)

3. අරළු	නෙල්លි	තිප්පිලි
බුළු	වියලි ඉඟුරු	ගම්මිරිස්
		ශාණ 1/2 බැගිනි. (ග්‍රෑ: 2)
මහ එන්සාල්	ශාණ 2 යි. (ග්‍රෑ: 8)	ශෝධිත රසදිය ශාණ 1 යි. (ග්‍රෑ: 4)
සාදික්කා	ශාණ 2 යි. (ග්‍රෑ: 8)	ශෝධිත ගන්ධක ශාණ 2 යි. (ග්‍රෑ: 8)

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලි කොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ඒයාද ඇල්දියෙන් මනාව අඹරා ගුංජා එක ප්‍රමාණ ගුලි තනා පවන වියලා ගත යුතු ය.

ප්‍රයෝග :— අෂ්ටවිධ ජ්වර, උදර රුජා, රාජයක්ෂ්මා, යනාදි රෝගයනට යෝග්‍ය වේ. කාස, ශ්වාස, ශෝථ, නේත්‍ර රෝග, මේහ, මේදෙ, ඡර්දිය, ශූලය, අම්ල පිත්තය, තෘට, ගුල්ම, පාණ්ඩු, රක්ත පිත්ත, ගරදෝෂ, පීනස, ප්ලීහරෝග, වාත-කඵජ රෝග පිත්තජ රෝගයන් ද නසයි.

අනුපාන :— අමු ඉඟුරු, බුලත් යුෂයෙන් යොදනු ලැබේ. මෙහි දී මාංස රස, ගිතෙලින් සංස්කෘත මුද්ග යූෂය හා ගෝදුග්ධ පථ්‍ය වේ. ශාකවර්ග, අම්ල වර්ග භෝජනය අහිත වේ.

මාත්‍රාව :— වටිකා 1 — 4 යි.

80. යෝග නාමය :— **ශූලහරණ වටී.** (ශූලහරණ යෝග)

යෝගය :—

අරළු	සහිඳලුණු,
ඉඟුරු,	ශුද්ධ ගන්ධක,
ශෝධිත ගොඩකදුරු ඇට,	ගම්මිරිස්,
පෙරුම්කායම්,	තිප්පිලි — සමභාගව ගත යුතු යි.

සංස්කරණය :— උණු දියෙන් අඹරා රක්තිකා 2 ක (මි:ග්‍රෑ: 250) පමණ ගුලිකර ගත යුතු ය.

ප්‍රයෝග :— ගුල්මරුජා, ග්‍රහණිරුජා, අතිසාර, අජීර්ණරෝග, මන්දග්නි නසයි.

මාත්‍රාව :— ගුලි 1/2 — 2 දක්වා

අනුපාන :— උණුදියෙනි.

81. යෝග නාමය — **ශ්‍රී ජයමංගල රසය.**

යෝගය :—

(හිඞ්ගුලෝත්ථ) ශෝධිත රසදිය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
ශෝධිත ගන්ධක	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
,, ටඞ්කණ	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
තාම්‍ර භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
වංග භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
ස්වර්ණමාක්ෂික භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
සහිඳලුණු	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
ගම්මිරිස් චූර්ණය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
ස්වර්ණ භස්මය	තෝලා 2 යි.	(ග්‍රෑ: 24 යි.)
කාන්ත ලෞහ භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
රජත භස්මය	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)

සංස්කරණය :— අත්තන කොළ ස්වරස, සේපාලිකා පත්‍ර ස්වරස, දශමුල් ක්වාථය,. කිරාතතික්ත ස්වරස යන ද්‍රව්‍යයන් ගෙන් වෙන් වෙන්ව තුන්වර බැගින් භාවනා සහිතව අඹරා ගුංජා දෙකක (හෙවත් මදටිය ඇටයක) පමණ ගුලි පිළියෙල කොට පවන වියලා වීදුරු බෝතලයක බහා තැබිය යුතු වේ.

ප්‍රයෝග :— ජීර්ණජ්වරයට ද, විෂමජ්වරයනට ද, අෂ්ටවිධ ජ්වරයට ද, ධාතුගත ජ්වරයට ද, ප්‍රයෝග කරනු ලැබේ. ක්ෂය රෝගයට විශිෂ්ට යි.

අනුපාන :— සුදුදුරු තම්බාගත් දිය මීපැණි සමග හෝ මීපැණි සුදුදුරු චූර්ණය සමග හෝ යෙදිය හැකි ය

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

82. යෝග නාමය :— **ශ්‍රීමත් ජයතිලක රසය.**

යෝගය :—

ශෝධිත පාෂාණම්	භාග	2 යි.
සුදු ලූනු	,,	2 යි.
කටුකරෝසන	,,	4 යි.
රිදීතුත්ථං	,,	4 යි.
ශෝධිත ගොඩකදුරු ඇට	,,	8 යි.

සංස්කරණය :— ද්‍රව්‍ය සියල්ල සියුම්ව චූර්ණ කොට අත්තන කොළ සවරසින් මනාව අඹරා රක්තිකා 1 පමණ ගුලි පිළියෙල කොට පවන වියලා බඳුනක සුරැකිය යුතු ය.

ප්‍රයෝග :— විෂමජ්වරය සඳහා බෙහෙවින් යෙදෙයි. (මැලේරියා උණට යෝග්‍ය වේ.)

අනුපාන :— මදුරුතලා පත් සවරස මීපැණි සමග ද, අනෙක් යෝග්‍ය අනුපාන සහිතව ද යෙදිය හැකි වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

83. යෝග නාමය :— **ශ්‍රී මෘත්‍යුංජය රසය.**

යෝගය :—

ශුද්ධ වච්චනාවි	භාග	1 යි.	ශුද්ධ ගන්ධක	භාග	1 යි.
ගම්මිරිස්	,,	1 යි.	ශුද්ධ පුෂ්කර	,,	1 යි.
තිප්පිලි	,,	1 යි.	ශුද්ධ සාදිලිංගම්	,,	2 යි.

සංස්කරණය :— උණුදියෙන් අඹරා රක්තිකා 1 ට, (මි: ග්‍රෑ: 125) ගුලි කරන්න. මෙහි සාදිලිංගම් දෙඩං ඇඹුලෙන් භාවනා දී ශුද්ධ කර ගත යුතු ය. වච්චනාවි ගෝමූත්‍රයෙන් භාවනා දී අමෘතීකරණය කළ යුතු ය.

අනුපාන :—
(1) පොදු අනුපාන — මීපැණි,
(2) වාතජ්වරයෙහි — දධිමස්තු,
(3) සන්නිපාත ජ්වරයෙහි — ඉඟුරු යූෂ
(4) අජීර්ණ උණෙහි — ඇඹුල් දෙඩම් යූෂ,
(5) විෂමජ්වරයෙහි — සුදුදුරු කුඩු හා පරණ උක් හකුරු,

බාල මාත්‍රාව :— අර්ධ රක්තිකාවකි. (මි: ග්‍රෑ: 62.5 යි.)

පූර්ණ මාත්‍රාව :— ගුලි 4 කි. — පූර්ණ වයස්කයන්ගේ ප්‍රබල ජ්වරයෙහි පමණක් පූර්ණ මාත්‍රාව යෙදිය යුතු ය.

84. යෝග නාමය :— **ශ්ලෙෂ්මශෛලෙන්ද්‍ර රසය.**

යෝගය :—

ශෝධිත රසදිය
,, ගන්ධක
ලෞහ භස්මය
වියලි ඉඟුරු
ගම්මිරිස්
තිප්පිලි
සුදුදුරු
කළුදුරු
ශඨී
කර්කටකශෘංගි
යමානි
පුෂ්කරමූල
අමුඉඟුරු
ගෛරික

යවක්ෂාර
ශෝධිත ටඞ්ගණ
ගජතිප්පිලි
වසාවාසි
අසමෝදගම්
අරළු
බුළු
නෙල්ලි
ධන්වයාස (ප්‍ර. වැල්කහඹිලිය මුල්)
කරාබු
ශෝධිත අත්තන ඇට
,, ගුඤ්ජාබීජ
කට්ඵල
සිවිය මුල්
(ග්‍රෑ: 12) තෝලා 1 බැගින්, ගත යුතු ය.

සංස්කරණය :— රසදිය, ගන්ධක, කජ්ජලිකොට බෙලිමුල්, ක්වාථයෙන් භාවනා යුක්තව අඹරා පසුව වරා, රත්නිවුල්, ත්‍රිඵලා, නික, මිදි, වංඇපල, කංසා, කටුවැල්බටු, ධුස්තුර, කළුදුරු, තිප්පිලි, කොසඹ යන ද්‍රව්‍යයන්ගේ ක්වාථයෙන් හෝ සවරසින් හෝ වෙන් වෙන් ව අඹරා රක්තිකා 1 — 2 පමණ (මි: ග්‍රෑ: 125 — 250) ගුලි තනා වියලා ගන්නේ ය.

ප්‍රයෝග :— ශ්ලේෂ්මජ විකාර, සන්නිපාත විකාර, උදර, අර්ශස්, ආමවාත, පඤ්චවිධ පාණ්ඩු, ක්‍රිමි, ස්ථෞල්‍යය, යන රෝගයන්ට ද හිතවත්. පාචකාග්නිය වර්ධනය වේ.

අනුපානය — මද උණුසුම් දිය සමග යෝගය වේ.

මාත්‍රාව :— වටිකා — 2 යි.

85. යෝග නාමය :— **ස්වණවංග පඤ්චක රසායනය.**

යෝගය :—

සුවර්ණවංග	තෝලා 2 යි.	(ගු: 24 යි.)
ශෝධිත ශිලාජතු	,, 2 යි.	(ගු: 24 යි.)
ලෞහ භස්ම	,, 1 යි.	(ගු: 12 යි.)
අභ්‍ර භස්ම	,, 1/2 යි.	(ගු: 6 යි.)
ෂඩ්ගුණබලිජාරිත මකරධවජ	,, 1/2 යි.	(ගු: 6 යි.)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ඖෂධ සියල්ල දඩිව අඹරා ගුංජා 3 ක් (ගු: 375) පමණ ගුටිකා සාද බෝතලයක බහා තබා ගත යුතු ය.

ප්‍රයෝග :— රසායන ගුණ යුක්ත ය. ශුක්‍රමෙහයට විශේෂයෙන් ගුණ දෙයි. බල-වර්ණකර යි. වෘෂ්‍ය යි. බුද්ධි වර්ධක යි. ශුක්‍ර ස්තම්භක යි. සෝමරෝග නාශක යි.

අනුපාන :— ගිතෙල්, සීනි, එලකිරි, යන ද්‍රවයන් සමග උදේ සවස ගත යුතු වේ. මේ සුවර්ණවංග පංචකය මාස දෙකක් නොකඩවා භාවිත කිරීමට නියමිත ය.

මාත්‍රාව :— වටිකා 1 යි. දවසට දෙවරක් සුදුසු අනුපානයකින් දෙන්නේ ය.

86. යෝග නාමය :— **සර්වතෝභද්‍ර වටිය.**

යෝගය :—

සුවර්ණ	භස්ම	ශෝධිත ගන්ධක
අභ්‍ර	,,	සුවර්ණමාක්ෂික භස්ම
ලෞහ	,,	ශිලාජතු
රජත	,,	— සමභාගව ගන්නේ ය.

සංස්කරණය :— මේ ඖෂධ සියල්ල ලුණුවරණ පොතු යුසින් හෝ ක්වාථයෙන් අඹරා රක්තිකා 1 ට (ගු: 125) ගුලි කරන්නේ ය.

ප්‍රයෝග :— වෘක්කරෝග, වස්ති ශුල නස යි. ශුක්‍ර ස්තම්භක යි.

අනුපාන :— (ලුණුවරණ පොතු) වරුණත්වක් කෂාය සමග යොදනු ලැබේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 දක්වා සුදුසු අනුපානයකින් දෙන්න.

87. යෝග නාමය :— **සර්වතෝභද්‍ර රසය.**

යෝගය :—

අභ්‍රක භස්ම	කර්ෂ 2 යි. (ගු: 30 යි.)
ශෝධිත ගන්ධක	තෝලා 2 යි. (ගු: 12 යි.)
ශෝධිත හිඞ්ගුලොත්ථ–	
පාරද	තෝලා 1/2. (ගු: 6 යි.)
කපුරු	තාලිසපත්‍ර
නාගකේශර	මලිත මල්
ජටාමාංස	කුරුඳු පොතු
තේජපත්‍ර	කලාඳුරු අල
කරාබු	අරළු
සාදික්කා	ගම්මිරිස්
වසාවාසි	වියලි ඉඟුරු
එන්සහල්	බුළු
ගජතිප්පිලි	තිප්පිලි
කොට්ටං	තෙල්ලි — (ගු: 4) ශාණය බැගින් ගන්නේ ය.

සංස්කරණය :— ගන්ධක පාරද කජ්ජලියෙහි යොද ඉක්බිතිව චූර්ණ කොට හලාගත් සෙසු ද්‍රව්‍යයන් ද ලා, ඇල් දියෙන් මනාව අඹරා ගුංජා දෙකක (මි: ගු: 250) පමණ ගුලි පිළියෙල කොට පවන වියලා වීදුරු බඳුනක අසුරා තැබිය යුතු වේ.

ප්‍රයෝග :— පිත්තජ, පුරාතන ජ්වරයනට ද, ධාතුගත විෂමජ්වරයනට ද හිතවති. තවද මන්දග්නිය, ආමදෝෂ, විසූචිකා අවස්ථාවනට ද, පිත්ත ශ්ලේෂ්ම, වාතශ්ලේෂ්ම, ජනිත රෝගාවස්ථාවනට ද ආනාහ, මූත්‍ර කෘච්ඡ්‍ර, සංග්‍රහ ග්‍රහණිය, වමනය යන උපද්‍රව සහිත රෝගාවස්ථාවනට ද යෝග්‍ය වේ. අම්ල පිත්ත, ශීත පිත්ත, රක්තපිත්ත, අවස්ථාවනට ද විශේෂ වේ. පංචවිධ කාසය, කාමලා, පාණ්ඩු රෝගාවස්ථාවනට විශේෂ වේ.

අනුපාන :— බුලත් සවරසය සමග මීපැණි, සීනි සහිතව යොදනු උචිත යි. රෝග තත්වය අනුව යෝග්‍ය අනුපානයන් ගෙන් යොදන්නේ ය.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

88. යෝග නාමය :— **සර්වාංග සුන්දර රසය.**

යෝගය :—

ශෝධිත රසදිය	භාග	1 යි.	ප්‍රවාල	භස්ම	භාග	1 යි.
ගන්ධක	,,	1 යි.	ශඞ්ඛ	,,	,,	1 යි.
ටංකණ	,,	2 යි.	ස්වර්ණ	,,	,,	1/2 යි.
මුක්තා භස්ම	,,	1 යි.	තීක්ෂ්ණලෝහ	,,	,,	1/2 යි.
සාදිලිංගම්	,,	1/4 යි.				

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලි කොට, එයට ලෝහ සාදිලිංගම් දෙවගය හැර සෙසු ද්‍රව්‍ය ලා, දෙහි ඇඹුලෙන් අඹරා ලඝුපුටයකින් දවා ගත යුතු ය. ඉක්බිතිව ලෝහ සාදිලිංගම් යොදා චූර්ණකොට රක්තිකා පමණ ගුලි කර ගත යුතු ය.

ප්‍රයෝග :— රාජයක්ෂ්මා රෝගයට යෝග්‍ය වේ. වාත පිත්ත ජ්වරය, සන්නිපාත ජ්වරය, අර්ශස්, ග්‍රහණී, මේහ, ගුල්ම, භගන්දර යන රෝගයනට ද හිතවත් ය.

අනුපාන :— තිප්පිලි සුණු මීපැණි සමග හෝ ගිතෙලින් හෝ බුලත් ස්වරසය සමඟ හෝ ඉඟුරු යූෂ, සිනි සමග හෝ යොදනු ලැබේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

89. යෝග නාමය :— **සිද්ධප්‍රාණේශ්වර රසය.**

යෝගය :—

ශෝධිත ගන්ධක		තෝලා	4 යි.	(ග්‍රෑ: 48 යි.)
,, රසදිය		,,	4 යි.	(ග්‍රෑ: 48 යි.)
අභ්‍රක භස්මය		,,	4 යි.	(ග්‍රෑ: 48 යි.)
ස්වර්ජික්ෂාර		,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
ශෝධිත ටංකණ		,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
යවක්ෂාර		,,	1 යි.	(ග්‍රෑ: 12 යි)
පංචලවණය		,,	1 යි	(ග්‍රෑ: 12 යි)
ත්‍රිඵලා චූර්ණය		,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
ව්‍යෝෂ චූර්ණය		,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
කෙළිඳ ඇට චූර්ණය		,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
කළුදුරු	චූර්ණය	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
සුදුදුරු	,,	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
රත්නිවුල් මුල්	,,	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
අසමෝදගම්	,,	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
ශෝධිත පෙරුංකායම්	,,	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
වළඟසාල් ඇට මද	,,	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
ශතපුෂ්ප	,,	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)

සංස්කරණය :— ඇල් දියෙන් මනාව අඹරා රක්තිකා තුනක් පමණ ගුලි පිළියෙල කොට ගත යුතු ය.

ප්‍රයෝග :— ජ්වරාතීසාරය සඳහා ශ්‍රේෂ්ඨ යෝගයකි. එහෙත් කේවල අතීසාරයෙහි ද අතීසාරය සහිත ජ්වරයෙහි ආන්ත්‍රික ජ්වරයෙහි මුල් අවස්ථාවෙහි ද ග්‍රහණී රෝග, ශූලය, පරිණාම ශූලය, වාත රෝග යන අවස්ථා උදෙසා ද යෙදේ.

අනුපාන :— බුලත් යූෂ හා උණුදිය. තුවද අවස්ථාවට සුදුසු පරිදි යෝග්‍ය අනුපාන යෙදිය හැකි වේ.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

90. යෝග නාමය :— **සෞභාග්‍ය වටිය.**

යෝගය :—

ශෝධිත ටංකණ
,, වච්චනාවි
සුදුදුරු චූර්ණය
ලවණ පංචකය (ප්‍රත්‍යෙකව)
ත්‍රිකටු චූර්ණය (ප්‍රත්‍යෙකව)
ශෝධිත ගන්ධක
අරළු චූර්ණය
බුළු චූර්ණය
නෙල්ලි චූර්ණය
අභ්‍ර භස්මය
ශෝධිත රසදිය
සමභාගව ගත යුතු ය.

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලි කර ලවණ පංචකය ඇතුළු සෙසු ද්‍රව්‍ය චූර්ණය ලා, නික කොළ, භෘංගරාජද්වය, වංඇපල පත්‍ර, රත් කරල් හැබ, යන ද්‍රව්‍යයන්ගේ ස්වරසයෙන් හෝ ක්වාථයෙන් හෝ ප්‍රත්‍යෙකව (වෙන් වෙන්ව) භාවනා යුක්තව අඹරා රක්තිකාවක් පමණ ගුලි කොට ගත යුතු ය.

ප්‍රයෝග :— සන්නිපාතජ ජ්වර. මූර්ච්ඡා රෝග සඳහා යෙදෙයි. ශීතපූර්වක, දහ පූර්වක, ජ්වරයනට ද හිතවත් ය. දෘඪ නිද්‍රායුක්ත සහ මූර්ච්ඡා සහිත රෝග අවස්ථාවනට ද යෝග්‍ය වේ. ශූල ශ්වාස, කළු කාස, මූර්ච්ඡා පිපාසා අරුචි යන උපද්‍රව සහිත ජ්වරයනට හිත යි.

මාත්‍රාව :— වටිකා 1 — 2 යි.

91. යෝග නාමය :— **සෝමෙශ්වර රසය.**

යෝගය :—

(අ) හල් පොතු
කුඹුක්පොතු
ලොත්පොතු
කොළොම්පොතු
අගිල්
රත්හඳුන්
මීදි මුල්
හරිද්‍රා
දරුහරිද්‍රා
නෙල්លි
දෙළුම් ඇට හෝ ලෙලි
ගොකටු
මාදම් ඇට
සුවඳහොට මුල් — පල 1/2 බැගින් ද ,(ග්‍රෑ: 30)

(ආ) ශෝධිත රසදිය
,, ගන්ධක
කොත්තමල්ලි
කලාඳුරු අල
එන්සහල්
තේජපත්‍ර
සුදුරු
අභ්‍රක හස්මය
ලෞහ හස්මය
රසාංජන චූර්ණය
දියමිත්ත
වළහසහල් ඇට මද
පුෂ්කර
පල 1 බැගින් ද, (ග්‍රෑ: 60.)

(ඇ) ශෝධිත ගුග්ගුලු පල 1/2 ක් ද ගන්නේ වේ. (ග්‍රෑ: 30.)

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලි කොට එයට සෙසු ද්‍රව්‍යයන්ගේ චූර්ණය ද ගුගුල් ද යොද එළඟිතෙලින් මනාව අඹරා සොළොස් (16) රක්තිකාවක් පමණ ගුලි පිළියෙල කර ගත යුතු වේ.

ප්‍රයෝග :— එකදෙෂජ, ද්විදෙෂජ, සන්නිපාතජ සෝම රෝගය, මූත්‍රාඝාතය, මූත්‍ර කෘච්ජ්‍රය යන රෝගයනට ද යෝග්‍ය වේ.

තවද කාමලා, හලීමක, භගන්දර, අර්බුද, උපදංශ, විවිධවණ, කණ්ඩු, මෙහ යන රෝගාවස්ථාවනට ද සුදුසු වේ.

අනුපාන :— දෙෂබලාබලය අනුව යෝග්‍ය අනුපානයකින් අවස්ථාවෝචිතව ප්‍රයෝග කරන්නේ ය.

මාත්‍රාව :— වටිකා 1 යි.

92. යෝග නාමය :— **හිංගුලෙශ්වර රසය.**

යෝගය :—
තිප්පිලි
ශුද්ධ සාදිලිංගම්
ශුද්ධ වච්චනාවි — සමභාගව ගත යුතු ය.

සංස්කරණය :— දියෙන් අඹරා රක්තිකා 1/2 පමණට ගුලි කරන්න. (මි:ග්‍රෑ: 62.5)

ප්‍රයෝග සහ අනුපාන :—මූත්‍රාල්පතා සහිත ශෝථයට සාරණ කොළ හෝ මුල් යුෂින් මධු සමහ, (මීපැණි සමග).

නිෂේධ :— ඔක්කාර, හෘදය දුර්වලතා, අතිසර්ම, ගර්භිණී අයට අයෝග්‍ය වේ. නොකඩවා දින 4 ක් පමණක් දීම මැනවි.

සාධාරණ අනුපාන — ඉඟුරු යුෂ, මීපැණි,
පිත්තාධික ජ්වරයෙහි — තැඹිලි වතුර.
වාතාධික ජ්වරයෙහි — සියඹලා ඇඹුල්
අජීර්ණ සහිත උණට දවසට තුන්වරක් ඉඟුරු යුෂින් යෙදීම මැනවි.

93. යෝග නාමය :— **හෘදයාර්ණව රසය.**

යෝගය :—

ශෝධිත රසදිය	තෝලා	1 යි.	(ග්‍රෑ: 12 යි.)
,, ගන්ධක	,,	1 යි.	(ග්‍රෑ: 12 යි.)
තාම්‍ර හස්මය	,,	2 යි.	(ග්‍රෑ: 24 යි.)

සංස්කරණය :— රස ගන්ධක කජ්ජලි කොට එයට තාම්‍ර හස්ම යොද ත්‍රිඵලා ක්වාථයෙන් දිනක් භාවනා යුක්තව අඹරා පසුව කලුකැම්බෙරිය සවරසින් ද අඹරා රක්තිකා 1 — 2 (මි:ග්‍රෑ: 125 — 250) ප්‍රමාණ ගුලි පිළියෙල කළ යුතු වේ.

ප්‍රයෝග :— කඵජ හෘද්‍රෝගය සඳහා යෝග්‍ය වේ.

අනුපාන :—

ත්‍රිඵලා, කාකමාචි එල	කර්ෂ	1 යි.	(ග්‍රෑ: 15 යි.)
ජලය	තෝලා	32 යි.	(ග්‍රෑ: 384 යි.)

යොද සතරින් එකට සිඳුවා ගත් යෝගය සමග යෙදිය යුතු වේ.

මාත්‍රාව :— වටිකා 1 යි.

අවලේහ ඛණ්ඩය

1. යෝග නාමය :— **අෂ්ටාංගාව ලේහය.**

යෝගය :—

කට්ඵල
සුවඳකොට්ටන්
කර්කටකශෘංගී
ඉඟුරු
ගම්මිරිස්
තිප්පිලි
වැල් කහඹිලියා (ප්‍රතිනිධි)
කළුදුරු

සංස්කරණය :— සියළු ද්‍රව්‍ය සමව ගෙන චූර්ණකර අවලේහ පරිභාෂාව අනුව සාද ගත යුතු ය; මී පැණියෙන් අඹරා.
ප්‍රයෝග :— සන්නිපාත ජ්වරය නසයි. හික්කා, ශ්වාස, කාස ආදි කණ්ඨරෝග නසයි. ඌර්ද්ධවගත ශ්ලේෂ්ම රෝග නසයි.
අනුපාන :— මී පැණියෙන් ලේහ කරනු ලැබේ.

2. යෝග නාමය :— **කණ්ටකාර්‍යාව ලේහය.**

යෝගය :—

කටුවැල්බටු සහමුලින්	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)
ජලය	ද්‍රෝණ	2 ක් ද්‍රෝණ 1/2 ට සිඳවනු.	
රසකිඳ	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
සිවිය මුල්	,,	1 යි.	(ග්‍රෑ: 60 යි.)
චිත්‍රක (රත්නිටුල්)	,,	1 යි.	(ග්‍රෑ: 60 යි.)
කලාඳුරු අල	,,	1 යි.	(ග්‍රෑ: 60 යි.)
කර්කටකශෘංගී	,,	1 යි.	(ග්‍රෑ: 60 යි.)
තිකුළු (මිලිතව)	,,	3 යි.	(ග්‍රෑ: 180 යි.)
ධන්වයාස (වැල්කහඹිලිය)	,,	1 යි.	(ග්‍රෑ: 60 යි.)
භාර්ගී (සිරිතේක්කු)	,,	1 යි.	(ග්‍රෑ: 60 යි.)
රාස්නා (අරත්ත)	,,	1 යි.	(ග්‍රෑ: 60 යි.)
හිඟුරුපියලි	,,	1 යි.	(ග්‍රෑ: 60 යි.)
සීනි	,,	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
එළගිතෙල්	,,	8 යි.	(ග්‍රෑ: 480 යි.)
තලතෙල්	,,	8 යි.	(ග්‍රෑ: 480 යි.)
මීපැණි	,,	8 යි.	(ග්‍රෑ: 480 යි.)
උණකපුරු	,,	4 යි.	(ග්‍රෑ: 240 යි.)
තිප්පිලි	,,	4 යි.	(ග්‍රෑ: 240 යි.)

සංස්කරණය :— මැටි භාජනයක අවලේහ පරිභාෂාව අනුව පිළියෙල කර ගත යුතු යි. ලේහය නිවුන පසු මීපැණි මිශ්‍ර කරන්නේ ය.
ප්‍රයෝග :— හික්කා , ශ්වාස කාස නාශක යි.
මාත්‍රාව :— කර්ෂ 1/2 1 දක්වා යි. (ග්‍රෑම්: 7.5-15)
සැ: යු:— ඇතැම් කෙනෙක් තලතෙල් වෙනුවට අබ තෙල් ගනිති.

3. යෝග නාමය :— **කල්‍යාණක ලේහය.**

යෝගය :—

කහ
වදකහ
කොට්ටම්
තිප්පිලි
ඉඟුරු
සව්දලුණු
අසමෝදගම්
වැල්මී
කළුදුරු

සමභාගව ගත යුතු වෙයි.

සංස්කරණය :— මෙම චූර්ණය හා ගිතෙල් සහිතව අවලේහ පරිභාෂාවෙනි.
ප්‍රයෝග :— විශේෂයෙන් කටහඬ මිහිරි වේ. ගැඹුරු වේ. පපුව, කොන්ද, මන්‍යා යන මේවායෙහි සිටි වායුව සංසිඳේ.
අනුපාන :— ගිතෙලින් ලේහ කරන්නේ ය.
මාත්‍රාව :— කලං 1/2 යි. — (ග්‍රෑම් 2.5 යි.)

4. යෝග නාමය :— **කුටජාවලේහය.**

යෝගය :—	කෙළිඳ පොතු	පලම් 100 යි.	(ග්‍රෑ: 6000 යි.)
	ජලය	ද්‍රෝණ 2 යි.	ද්‍රෝණ 1/2 ට සිඳවනු.
	උක්හකුරු	පලම් 30 යි.	(ග්‍රෑ: 1800 යි.)

පූර්ණය :—
රසාඤ්ජන
එළඉඹුල් මැලියම්
තිකුළු
තිපල්
ගිත්නිදිකුම්බාමුල්
රත්තෙටොල්
වළහසාල්
දියමිත්ත
බෙලිගැට මද
කෙළිඳ ඇට
කුරුඳුපොතු
සෙන්කොට්ටන් (ශුද්ධ)
අතිළඩයන්

බාලක (සැවැන්දරාමුල්) —	පල 1 බැගිනි.	(ග්‍රෑම්: 60)
ගිතෙල්	කුඩව 1 යි.	(ග්‍රෑ: 240 යි.)
මීපැණි	කුඩව 1 යි.	(ග්‍රෑ: 240 යි.)

සංස්කරණය :— අවලේහ පරිභාෂාව අනුව සාදගෙන නිවීගිය පසු මීපැණි මිශ්‍ර කරනු.

ප්‍රයෝග :— අර්ශස්වලට විශේෂයෙන් ගුණ යි. අර්ශසින් හටගත් වෙනත් රෝග ද අතිසාර, අරුචි, ග්‍රහණි, පාණ්ඩු රක්තපිත්ත, කාමලා, අම්ලපිත්ත, ශෝථ, කෘශවීම, ප්‍රවාහිකා ආදියට ගුණ යි.

අනුපාන :— එළකිරි, මෝරු, මිදුනකිරි, ගිතෙල්, සිසිල් දිය.

මාත්‍රාව :— කර්ෂ 1/2 — 1 දක්වා යි. (ග්‍රෑ: 7.5 — 15)

5. යෝග නාමය :— **කුෂ්මාණ්ඩාව ලේහය.**

යෝගය :—	පුසුල් (ඇට, පොතු, හැර ගත් මද)	පලම් 100 යි.	(ග්‍රෑ: 6000 යි.)
	ජලය	පලම් 200 යි.	(ග්‍රෑ: 12000 යි.)
	එළගිතෙල්	පලම් 8 යි.	(ග්‍රෑ: 480) යි.)
	සූකිරි	පලම් 100 යි.	(ග්‍රෑ: 6000 යි.)

තිප්පිලි
වියලි ඉඟුරු
සුදුදුරු — (පලං 2 බැගිනි. (ග්‍රෑ: 120)
කොල්ලන්කොළ (ප්‍රතිනිධි)
එන්සාල්
ගම්මිරිස්
කොත්තමල්ලි — කුරුඳුපොතු — පලං 1/2 බැගිනි. (ග්‍රෑ: 30)

මීපැණි පලං 4 යි. (ග්‍රෑ: 240 යි.) ජලය අඩක් සිඳෙන තෙක් තම්බා මිරිකා අවලෙහ පදමට උයා ගන්නේ ය.

ප්‍රයෝග :— රත් පිත, ක්ෂය, පැරණි උණ, ශෝෂ, පිපාසා, ශ්‍රම, වමන, ඇදුම, කාස-ක්ෂය සුවවේ. බාල, වෘද්ධ සියල්ලන්ටම මෙය යෙදිය හැකි යි. පෙණහලු තුවාල සන්ධානය කරයි. වාජීකරණ යි. වෘෂ්‍ය යි. බල වඩයි. (සංස්කරණ විධි ගුඩකුෂ්මාණ්ඩය හා සමාන ය.)

අනුපාන :— එළකිරි හෝ සුදුසු අනුපානයක් යොදන්නේ ය.

මාත්‍රාව :— තේ හැඳි 1 — 2 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

6. යෝග නාමය :— **ච්‍යවන ප්‍රාශය.**

යෝගය :—
බෙලි මුල්
මිදි මුල්
තොටිල මුල්
ඇද්දෙමට මුල්
පළොල් මුල්
බැවිල මුල්
ශාලපර්ණි
පෘශ්නිපර්ණි
මාෂපර්ණි (මස්වැන්න)
මුද්ගපර්ණි (මුංවැන්න)
තිප්පිලි
ගොකටු
එළබටු මුල්
කටුවැල්බටු
කර්කටකශෘංගි
එළපිටවක්කා (තාමලකි)
මුද්දිරප්පලම්
ජීවන්ති
පුෂ්කර (සුවදකොට්ටම්)
අගිල්
අරළු
රසකිඳ
ඍද්ධි
ජීවක
ක්ෂීරකාකොලි
මහාමේද
වෘද්ධි
ඍෂභක
ශටී
කලාදුරු අල
සාරණ මුල්
මේද
හින්එන්සාල්
නිල්මානෙල් අල
රත්හඳුන්
කිරිබදු අල
පාවට්ටා මුල් (ආඩතෝඩා)
කාකෝලි
කාකනාසිකා
(කළුකැම්මෙරිය)
(කාකනාසිකා
කළුතිරස්සවාලු පර්යාය ද වේ.)

ව්‍යවහාරයෙහි කළු කම්මෙරිය යෙදේ. — ද්‍රව්‍ය සියල්ල පලම් 1 බැගින්. (ග්‍රෑ: 60)

	*ලොකු පැසුණු නෙල්ලි	ගෙඩි 500 යි.	(පොට්ටනි කොට ගත්තේ ය.)
	ජලය	ද්‍රෝණ 2 යි.	ද්‍රෝණ 1/2 ට, සිඳුවා ගත යුතු යි.
	තලතෙල්		
	ගිතෙල් — මිලිතව	පලම් 12 යි.	(ග්‍රෑ: 720 යි.)
	සූකිරි	පලම් 50 යි.	(ග්‍රෑ: 3000 යි.)
	මීපැණි	පලම් 60 යි.	(ග්‍රෑ: 3000 යි.)
ප්‍රක්ෂේප චූර්ණය —	උණකපුරු	පලම් 4 යි.	(ග්‍රෑ: 240 යි.)
	තිප්පිලි	පලම් 2 යි.	(ග්‍රෑ: 120 යි.)
	කුරුඳුපොතු		
	හින්එන්සාල්		
	තේජපත්‍ර		
	නාමල්රේණු — මිලිතව	පලම් 1 යි.	(ග්‍රෑ: 60 යි.)

සංස්කරණය :— බෙලිමුල් වල සිට කාකනාසිකා දක්වා ඇති ද්‍රව්‍ය සියල්ල නියමිත ජලය බහා පොට්ටනි කොට ගත් නෙල්ලි ද එයට දමා 1/4 ට සිඳ ගන්න. ඉන්පසු නෙල්ලි පොට්ටනියෙන් මුදා ඇට හැර, අඹරා තල තෙල් සහ ගිතෙලින් මදක් බැද, පෙරාගත් ප්‍රථම කෂායෙහි බහා සූකිරි ද යොද, ලේහයක් මෙන්, ඝන වූ පසු කල්කය යොද (පදමට සිදෙන විට) උණකපුරු ආදි චූර්ණය ද යොද ලේහ පදමට බා, සිසිල් වූ පසු මීපැණි ද මිශ්‍ර කොට තබාගන්න.

ප්‍රයෝග :— මෙය රසායන යි. විශේෂයෙන් ශ්වාස, කාස හර යි. ක්ෂීණ වූවන්ගේ, උරඃක්ෂත රෝගීන්ගේ, මහලු සහ බාල අයගේ අවයව තර කරයි. ස්වරක්ෂය, උරෝරොග, හෘද්‍රෝග, වාතරක්ත, පිපාස, මූත්‍ර දෙෂ, පහ කරයි. ආහාරයට බාධා නොවන අයුරින් මෙය මාත්‍රා බලා යෙදිය යුතු ය.

අනුපාන :— කිරි, ගිතෙල් උණුදිය හෝ සුදුසු අනුපානයක්.

මාත්‍රාව :— තේ හැඳි 1/2 — 1 දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය.

*අමු නෙල්ලි තෝලා 500 ක් ගැනීම සහ වියලි නෙල්ලි නම් තෝලා 250 ක් ගැනීම ශාර්ඞ්ගධර ටීකා නියමය යි. තෝලා 500 සඳහා ප්‍රස්ථ 5ක් ගැනීම ද ටීකා නියමය යි.

7. **යෝග නාමය :—** **රක්තකල්‍යාණාවලේහය.** (කල්‍යාණාවලේහය, ජීවරක්තකල්‍යාණාවලේහය)

යෝගය :—
ඔළිඳ මුල් සහිතව කොළ හා වැල් (සහමුලින්)
ලුණුවිල
කේශරබැවිල සහ මුලින්
සැවැන්දරාමුල්
රසකිඳ වැල් හා කොළ
හාතාවාරිය අල සහ කොළ (සහමුලින්)
අළුකෙහෙල් අල
ඉරමුසු සහමුලින්
කළුඋක් මුල්

මෙම ද්‍රව්‍ය සෝද පිරිසිදු කර එක් වගෙන් පලං 10 (ග්‍රෑ: 600) බැගින් ගෙන හොඳාකාර කොටා වතුර බෝතල 60 ක් සහ තැඹිලි වතුර බෝතල 60 ක් දමා බෝතල 30 ට (120 — 30 ට) සිඳුවා මිරිකා පෙරා ඊට,

තනකිරි	පත	5 යි.
උක්පැණි	බෝතල	7 1/2 යි.
එලගිතෙල්	පත	7 1/2 යි.
සීනි	රාත්තල්	7 1/2 යි.

කල්කය :—
කොත්තමල්ලි
තිප්පිලි
ගම්මිරිස්
කළුදුරු
රතුලූනු
සුදුලූනු
ඉඟිනි ඇට
සුදුදුරු

මේවා කලං 15 බැගින් (ග්‍රෑ: 75)

සුදුහඳුන්	කලං 75 යි.	ග්‍රෑ: 375 යි.)
වැල්මී	කලං 90 යි.	(ග්‍රෑ: 450 යි.)

රතුලූනු සුදුලූනු අඹරා ගත යුතු යි. ඉඟිනි ඇට සිහින් පෙති කපා තම්බා අඹරා ගත යුතු ය. ඉතිරි ද්‍රව්‍ය සියුම් ලෙස චූර්ණ කර තැඹිලි වතුරෙන් තම්බා ගත යුතු ය.

තනකිරි අභාවයෙහි, එළුකිරි හෝ එළකිරි යොදන්නේ ය.

ලේහ පදමට සිද්ධ කර ගන්නේ ය.

ප්‍රයෝග :— අක්ෂිරෝගයන්හි විශෙෂ යි. රක්තප්‍රදර ශ්වේතප්‍රදර හා ශුක්‍රමෙහ, ස්වප්නමෙහයන්හි ප්‍රශස්ත ය. රක්තපිත්ත හස්ත-පාද දාහයන්හි යෙදේ.

8. යෝග නාමය :— **ශ්වාසාරි ලේහය.**

යෝගය :—

වැල්මී චූර්ණය	පලම්	12 යි.	(ග්‍රෑ: 720 යි.)
ඇටඇරි රට ඉඳි	පලම්	12 යි.	(ග්‍රෑ: 720 යි.)
කළු උක් පැණි	නැළි	2 යි.	(ලී: 1.92 යි.)
මීපැණි	නැළි	2 යි.	(ග්‍රෑ: 1920 යි.)

සංස්කරණය :— වැල්මී චූර්ණය රටඉඳි සමඟ අඹරා එය උක් පැණියට දියකර මඳගින්නෙන් ලේහ පදමට පාකය ගෙන නිවුනායින් පසු මීපැණි මිශ්‍රකර ගන්නේ ය.

ප්‍රයෝග :— ශ්වාය කාස නාශක යි.

මාත්‍රාව :— කලන් 1/2 සිට කලන් 1 1/2 දක්වා. (ග්‍රෑ: 2.5 — ග්‍රෑ: 7.5)

9. යෝග නාමය :— **ශෝථහර ලේහය (ඉන්විකුලම්බුව)**

යෝගය :—

අමුඉඟුරු යුෂ	නැළි	1 යි.	(මි: ලී: 960 යි.)
මාතුලුංග = නස්නාරන් යුෂ	පලම්	4 යි.	(මි: ලී: 240 යි.)
සීනි	පලම්	8 යි.	(මි: ලී: 480 යි.)

කල්කය :—
එන්සාල්,
කරාබු,
කොල්ලන්කොළ,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
අරළු
බුළු
නෙල්ලි,
වළගසාල්
කළුදුරු,
රත්නිවුල්,

මේවා එකින් කලන් 1 1/2 බැගින් ගත යුතු යි. (ග්‍රෑමය් 7.5)

ලේහ පදමට සංස්කරණය කෙරේ.

ප්‍රයෝග :— අග්නිමාන්ද්‍ය, උදර, ශ්වාස, කාස, අර්ශස් හා ශෝථ රෝග නසයි.

මාත්‍රාව :— අක්ෂ 1/2 — 1 දක්වා.

10. යෝග නාමය :— **වාසාවලේහය.**

අවශ්‍ය ඖෂධ :—
ආඩතෝඩා මුල් කෂාය නැලි 01 — (පත 4 බෝ 1)
සීනි පලම් 8 — ග්‍රෑම් 480
ගිතෙල් පලම් 2 ග්‍රෑම් 120
තිප්පිලි චූර්ණය පලම් 2

සංස්කරණය :— පළමුවෙන් ආඩතෝඩා මුලේ පොතු අමුවෙන් කොටා යුෂ නැළි 1 ක් ගත නොහැකි නම් වියලි ආඩතෝඩා මුල් හා පොතු සෑහෙන පමණ ගෙන එමෙන් අට ගුණයක් ජලයෙහි බහා 1/4 ට සිඳුවා පෙරා ගත යුතු යි. එම කෂායට සීනි දමා උයා එය ඝනාවස්ථාවට ආකල්හි, තිප්පිලි චූර්ණ ද දමා හොඳින් හැන්දෙන් කලත කලතා පිසිය යුතු ය. පදමට පැසුන කල ගිතෙල් දමා කලඹා මිශ්‍රකොට බා නිවුන පසු මීපැණි පලම 8 ක් දමා මිශ්‍රකර භාවිතයට ගැනීම මැනවි.

මාත්‍රාව :— තෝලා 1/2 — 1 දක්වා

ගුණ :— ක්ෂය නසයි. කාස, ශ්වාය, පාර්ශ්ව ශූල, හෘදය ශූල, රත්පිත උණ නස යි.

11. යෝග නාමය :— **වෘහත් වාසාවලේහය.**

අවශ්‍ය ඖෂධ :— ආඩතෝඩා මුල් පොතු පලම් 100 ක් ජල නැලි 32 ක් දමා 1/4 ට සිඳුවා බා පෙරා ඊට සීනි පලම 100 දමා පිස පාකසිද්ධිය උදාවෙගෙන එන විට එයට තිකුළු, ත්‍රි සුගන්ධි, කටඵල, කලාදුරු, කොට්ටම්, සුදුදුරු, තිප්පිලි මුල්, තිරස්සවැලු, සිවිය, උණකපුරු, කටුකරෝසන, ගජ තිප්පිලි, තාලිසපත්‍ර, කොත්තමල්ලි මේවා කලන් 3 බැගින් චූර්ණ කර දමා පදමට උයා බා නිවුන පසු මීපැණි පලම් 8 ක් දමා මිශ්‍රකර භාවිත කරන්න.

මාත්‍රාව :— මින් වරකට කලන් 3 ක් වළඳා උණුකර නිවාගත් වතුර බොන්න.

ගුණ :— රාජයක්ෂ්මා, රත්පිත, ක්ෂත ක්ෂය, වා පිත් කාස, දරුණු ඇදුම, වමන, හෘදය ශූල, උරඃ ශූල, අරුචි, උණ සුව වේ.

ආසව ඛණ්ඩය

සන්ධාන කල්පනා ශීර්ෂයෙහි, අරිෂ්ට ආසව සන්ධාන භාජනයෙහි බහා කඩමැටි බැඳීම සම්බන්ධ වූ අංක 6 දරණ නියමයන් වක්තව්‍යයෙහි අංක 06 දරණ නියමයන් නොවරදවා ම ඉටුකරන්න. අරිෂ්ට ආසවයන්හි මද්‍යසාර ශක්තිය ඉපැදීමට පෙර කඩමැටි බැඳීම නොකළ යුතුය. කාබන්ඩයොක්සයිඩ බැහැර වීම සඳහා සන්ධාන භාජනය දින කිපයක් විවෘතව තැබියැ යුතුය. විවෘතව තැබීම පිළිබඳ නියමයන් සහ අරිෂ්ට ආසව සන්ධාන කාර්යය මැනැවින් ඉටුවීම පිළිබඳ සියලු නියමයන් එම සන්ධාන කල්පනා ශීර්ෂයෙහි ඇතුළත් ය. එක් එක් වට්ටෝරුවෙහි සටහන් කැර තිබෙන්නේ සුදුසු භාජනයෙහි ලා කඩමැටි බැඳ මාසයක් තබා පෙරා ගන්නේය කියා ය. එනමුත් කඩමැටි බැඳීම සම්බන්ධ විශෙෂ නිර්දේශය සන්ධාන කල්පනා ශීර්ෂයෙහි සඳහන් ය.

1. යෝග නාමය :— **අංගුරාසවය** (1)

යෝගය :—

හොඳට පැසුණ මිදි යුෂ	ද්‍රෝණ 1 යි.	(ලීටර් 15,36 යි.)
සීනි	තුලා 1 යි.	(ගු: 6000 යි.)
මීපැණි	තුලා 1/2යි.	(ගු: 3000 යි.)
මලිතමල්	පලම් 8 යි.	(ගු: 480 යි.)

අරළු
බුළු
නෙල්លි
ඉඟුරු
ගම්මිරිස්
තිප්පිලි
කර්කටකශෘංගි
කරාබු
වසාවාසි
සාදික්කා
වැල්මී
සුදුහඳුන්
තලිස්පතුරු (තාලිසපත්‍ර)
දෙවපුෂ්ප (කරාබු)
ජාතිපත්‍රී

— මේවා පලම් 1 බැගිනි. (ගු: 60)

වෘහතී කුසුම (කටුවැල්බටු මල්) කළුදුරු

එකින් කර්ෂය බැගින් (ගු: 15) ගෙන සියල්ල තලා සුණු කරන්න.

සංස්කරණය :— මිදි යුෂට සීනි මීපැණි දියකර, තලා සුණු කළ මලිතමල් ආදිය මිශ්‍රකොට සඳුන්, අගිල්, දුම්දුන් සුදුසු බඳුනක බහා කඩ මැටි බැඳ මසක් නිශ්චලව තබා පෙරා ගන්න.

ගුණ :— දුඃසාධ්‍ය කාස ශ්වාස හා රාජයක්ෂ්ම සුව කරයි. දෞර්බල්‍ය නාශක යි. විශේෂ බල කාරක ගුණ යුක්ත යි. ත්‍රිදෝෂජ පාර්ශ්ව ශූලය නසයි. රුචිකර යි. හෘද්‍ය ය. බල-අග්නි-රක්ත වර්ධක යි. ශීත ඍතු වෙහි ශීතලෙන් පීඩිතයන්ට දිය හැක. ශ්ලේෂ්ම කාස නාශක යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 දක්වා (මි: ලී: 15 — 30) සුදුසු පරිදි දිය යුතු ය.

1. යෝග නාමය :— **අංගුරාසවය** (2)

යෝගය :—

ජලය සේරු 37 1/2 යි.
කරාබු
නාමල්රේණු
තිප්පිලි
හින්එන්සාල්
ගම්මිරිස්
කුරුඳුපොතු
උටංගණ බීජ
සාදික්කා
කංකෝල
තිප්පිලිමුල්
අක්කරපට්ටා
වැල්මී
භාතාවාරිය අල
තේජ පත්‍ර
වසාවාසි

ජේර	රා.	3	=	(ගු: 1440 යි.)
ඇපල්	රා.	5	=	(ගු: 2400 යි.)
දෙළුම්	රා.	5	=	(ගු: 2400 යි.)
පැණිදොඩම	රා,	5	=	(ගු: 2400 යි.)
මීපැණි	රා.	4	=	(ගු: 1920 යි.)
ධාතකී	රා.	1		(ගු: 480 යි.)
සීනි	රා.	8	=	(ගු: 3480 යි.)

වාල්මොලගු (ශීතලචීනි)
රේණුකා
ඉඟුරු
අමුක්කරා අල
බිංතල් (සුදු) අල
මේ ද්‍රව්‍ය තෝලා තුන (3) (ගු: 36) බැගිනි.

	බබ්බුල පොතු	තෝලා 5 යි.	(ග්‍රෑ: 60 යි.)
	කොබෝලීල පොතු	තෝලා 5 යි.	(ග්‍රෑ: 60 යි.)
	රටඉඳි	සේරු 1/2 යි.	(ග්‍රෑ: 480 යි.)
	කල්ලිප්පාක්කු	සේරු 1/2 යි.	(ග්‍රෑ: 480 යි.)
	පිස්තා බීජ මද	සේරු 1/4 යි.	(ග්‍රෑ: 240 යි.)
	චිරෞංජී	සේරු 1/2 යි.	(ග්‍රෑ: 480 යි.)
	බාදාම් ඇට මද	සේරු 1/2 යි.	(ග්‍රෑ: 480 යි.)
	මුද්දිරප්පලම් (අංගුර)	සේරු 5 යි.	(ග්‍රෑ: 480 යි.)
සුගන්ධි ප්‍රක්ෂේප ද්‍රව්‍ය -	කුංකුමප්පු	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)
	කස්තූරි	තෝලා 1 යි.	(ග්‍රෑ: 12 යි.)

සංස්කරණය :— චූර්ණ කළ යුතු සියලු ද්‍රව්‍ය තරමකට චූර්ණකර, ඇපල්, පේර ආදි පලතුරු කුඩා කැබලිවලට කපා තලා ගත යුතු ය. ඉන්පසු චූර්ණය, පලතුරු, සීනි, මීපැණි. ආදි සියල්ල ජලය සමග මිශ්‍රකොට භාජනයේ කටමැටි බැඳ, දින 45 ක් තබා ඉක්බිති පෙරා බෝතල් කරන්නේ ය. පෙරුවාට පසු කස්තූරි මිශ්‍ර කරන්නේ ය.

ප්‍රයෝග :— වාජීකරණ යි.

සැ: යු :— මෙහි යෝජිත ජල ප්‍රමාණය මද බව පෙනේ. මේ නිසා ජලය සේරු 12 1/2 ක් වැඩි කිරීම සුදුසු ය. ඒ අනුව මීපැණි සහ සීනි දෙගුණ කළ යුතු වේ.

වක්තව්‍යය :— පිස්තා, චිරෞංජී හින්දි නාම වෙති. මේ දෙවගයම අඹ කුලයට (Anacardiaceac) අයත් ය. (හිංදි) පිස්තා; (සංස්කෘත) මුකූලක; (ලැටින්) Pistachio Vera Linn (ඉංග්‍රීසි) Pistacia; (හිංදි) චිරෞංජී; (සංස්කෘත) ප්‍රියාල; (ලැ) Buchanania Lanzan Spreng මේ දෙවගයම සඳහාම ප්‍රතිනිධි වශයෙන් අඹ ඇට මද ගැනීම සුදුසු ය.

ආසව ඛණ්ඩයෙහි අංක 02 දරණ අංගුරාසවය වට්ටෝරුව අනුව ද්‍රව්‍ය සම්භාරයත් ද්‍රව ප්‍රමාණයත් සැලැකිල්ලට ගත් විට එයින් කිසි සේත්ම ආසවයක් සන්ධානය නොවන්නේ ය. ආසවාරිෂ්ට විඥානය, ආසවාරිෂ්ට සංග්‍රහ ආයුර්වේද සාරසංග්‍රහ ආදි ග්‍රන්ථයන්හි යම් යම් වෙනස් කම් සහිතව මෙම වට්ටෝරුව සඳහන් ය. ආයුර්වේද සාරසංග්‍රහ වට්ටෝරුව ද අතිරේකයක් වශයෙන් ඇතුළත් කර තිබෙන බව කරුණාවෙන් සලකන්න.

අංගුරාංසවය (අංගුර, මුද්දරප්පලම්) අතිරේකය.

කරාබු
සාදික්කා
වසාවාසි
නාමල්රේණු
කංකෝල (ප්‍රති. නි. වාල්මොලගු)
වාල්මොලගු
තිප්පිලි
තිප්පිලිමුල්
රේණුකා (ප්‍ර. නි. නිකඇට)
හින් එන්සාල් ආධ්‍ය
අක්කරපට්ට
ඉඟුරු
ගම්මිරිස්
වැල්මී
අමුක්කරා
කුරුඳුපොතු
භාතාවාරිය අල-වියලි
සුදුබිංතල් අල
සාමදන ඇට (උටංගනබීජ)
කුරුඳුකොළ (තේජපත්‍ර)

මෙම ද්‍රව්‍ය 20 එක වගෙන් තෝලා 03 බැගින් = ග්‍රෑම 720,
බබ්බුල පොතු තෝලා 05 = ග්‍රෑම 60
කොබෝලීල පොතු තෝලා = 05 — ග්‍රෑම 60
රටඉඳි පලං 04 — ග්‍රෑම 240 = (සෝද ඇට ඉවත් කර)
කල්ලිප්පාක්කු පලං 02 = ග්‍රෑම 120
පිස්තා (ප්‍ර. නි. අඹඇට මද) තලං 02 = ග්‍රෑම 120
චිරෞංජී (ප්‍ර. නි. අඹඇට මද) පලං 02 = ග්‍රෑම 120
බාදම් ඇටමද (ප්‍ර. නි. කොට්ටම්බා ඇටමද) පලං 04 = ග්‍රෑම 240
ඇපල් ගෙඩි පලං 20 = ග්‍රෑම 1200
අංගුර පලං 40 = ග්‍රෑම 2400
නාස්පාති = ඉන්දියාපේර පලං 20 = ග්‍රෑම 1200
අනාර් = දෙළුං පලං 20 = ග්‍රෑම 240,
සංතරා = ජමනාරං පලං 12 = ග්‍රෑම 720
සීනි සේරු 04, මීපැණි සේරු 02, ධාතකී පලං 04 = ග්‍රෑම 240,
කුංකුමප්පු තෝලා 01 = ග්‍රෑම 12, කස්තූරි රක්තිකා 24 = ග්‍රෑම 03,

වතුර සේරු 37 1/2 යි. චූර්ණ කළ යුතු ද්‍රව්‍ය දළසුණු කොට ද අංගුර මිදි පලං 40 වතුර සේරු 20 දමා සේරු 10 ට සිඳුවා මීරිකා පෙරා එම කෂාය ද, දෙළුං ඇට ද ඇපල් ඉන්දියා පේර සහ ජම්නාරං සිහින් ලෙය පෙති කපා ද ආසවයට යොදන්නේ ය. කස්තූරි සහ කුංකුමප්පු ආසවය පෙරුවාට පසු රෙක්ටි පයිඩ් ස්පිරිට් වලින් අඹරා යෙදිය යුතු ය.

මාත්‍රාව :— වරකට අවුන්ස 01 යි. උදේ දවල් රාත්‍රි ආහාරයට පසු සමභාග වතුර සමග පානය කරන්නේය.

ගුණ :— මෙම අංගුරාසවය අතිශයින් වාජීකරණ බලවර්ධක සහ පුෂ්ටිකාරක ය. මන්දග්නිය නසා ජඨරාග්නිය ද රස-රක්ත-මාංස ආදි සප්තධාතු වර්ධනය කෙරේ. හෘදය බලකාරක ය. ගතේ සිතේ ප්‍රසන්නතාව වඩන්නේ ය. මස්තිෂ්ක බලකාරක ය. පෙනහලු ශක්තිමත් කෙරේ. ස්මරණ ශක්තිය වඩයි. (ආයුර්වේද සාර සංග්‍රහය ඇසුරෙනි.)

2. යෝග නාමය :— **අයස්කෘතිය.**

යෝගය හා සංස්කරණය :— අසනාදි ගණයට අයත් ද්‍රව්‍ය එකවගෙන් පලම් 20 බැගින් (ග්‍රෑ: 1200) ගෙන, ජලය සේරු 512 ක් දමා 1/4 ට සිඳුවා (සේරු 128 ට) පෙරාගෙන නිවුණාට පසු ඊට උක්හකුරු පලම් 200 ක් ද (ග්‍රෑ: 12,000) මීපැණි පත 32 ක් ද (ග්‍රෑ: 7680) එකවගෙන් පලම (ග්‍රෑ: 60) බැගින් චූර්ණ කර ගත් වත්සකාදි ගණයට අයත් ද්‍රව්‍යයන් ද මිශ්‍ර කරනු.

පසුව ඇතුළත ගිතෙල් ගාන ලද භාජනයක් ගෙන එහි මීපැණියෙන් අඹරන ලද තිප්පිලි තට්ටුවක් ගා, ඊ මතුපිට ඔරුවක දුම්මල ගාන්නාක් මෙන් උණු කරන ලද ලාක්ෂා තට්ටුවක් ගා, යථෝක්ත මිශ්‍රණය එහි බහා එම භාජනය ධාන්‍ය ගොඩක් මැද තබා, රාත්තල් අටක් බරැති තුනී යකඩ පත් ඉරුවක් රත්කිහිරිය දර වලින් ගිනියම් කොට, ඉහත සඳහන් මිශ්‍රණයේ ගිල්වනු. මේ ක්‍රියාව බොහෝ වාර ගණනක් කිරීමේ දී යකඩ පත් ඉරුව සම්පූර්ණයෙන් ම ක්ෂය වන්නේ ය.

මෙසේ සාදගත් මිශ්‍රණය ප්‍රමේහයට පරමඖෂධයකි.

මාත්‍රාව :— අවුන්ස 1/2 සිට 1 දක්වා (ග්‍රෑ: 15 — 30).

3. යෝග නාමය :— **අරවින්දාසවය.**

යෝගය :—

නෙළුම් රේණු
සැවැන්දරාමුල්
ඇත්දෙමට ගෙඩි
නිල්මහනෙල් අල
වැල්මදට
හීන්එන්සාල්
බැබිල මුල්
ජටාමාංස
කලාඳුරු අල
ඉරමුසු මුල්
අරළු
බුළු
වදකහ
නෙල්ලි
ශටී
ශ්‍යාමා = කළුඉරමුසු
අවරිය මුල්
පටෝල — (දුම්මැල්ල)
පත්පාඩගම් (පර්පට)
කුඹුක්පොතු
මී පුප් (මී මල්)
වැල්මී

මුරාමාංසි —	පලම්	1 බැගින්,	(ග්‍රෑ: 60 යි.)
මුද්දිරප්පලම්	පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
ධාතකී	පලම්	16 යි.	(ග්‍රෑ: 960 යි.)
ශර්කරා	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)
මීපැණි	තුලා	1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)
ජලය	ද්‍රෝණ	2 යි.	(ග්‍රෑ: 30.72 යි.)

සංස්කරණය :— ප්‍රථමයෙන් ජලයට ශර්කරා දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා ශර්කරා මිශ්‍රිත ජලයට බහා මීපැණි ද මිශ්‍රකොට අරිෂ්ට ආසව පරිභාෂා අනුව කඩ මැටි බඳුනක තබා පෙරා ගන්නේ ය. (මදක් තලා = දළ ලෙස සුණුකොට)

ප්‍රයෝග :— බාලයන්ගේ රෝගයන්ට හිත යි. බලය, පුෂ්ටිය හා අග්නිය වර්ධනය කරයි. ආයුෂ්‍ය යි. ග්‍රහදෝෂ නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/8 — 1/2 (මි:ලී: 3.75 — මිලී: 15) දක්වා, සුදුසු අවස්ථාවට යෝග්‍ය පරිදි යෙදිය යුතු යි.

4. යෝග නාමය :— **අභිලේනාසවය.**

යෝගය :—

*මධූකමද්‍ය	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)	(මීමල් පැණි)
අභිලේන	කුඩව	1 යි.	(ග්‍රෑ: 240 යි.)	
කලාඳුරු අල	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)	
සාදික්කා	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)	
කෙලිඳසාල්	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)	
හීන්එන්සාල්	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)	

සංස්කරණය :— අබිං මද්‍යවල දිය කරන්න. චූර්ණ කළ යුතු දෑ චූර්ණ කර ගන්න. පසුව, ඒවා මිශ්‍රකර යෝග්‍ය බඳුනක බහා මාස 1 ක් තබා පෙරා ගන්නේ ය.

මාත්‍රාව :— බිංදු 2 — 60 දක්වා යෝග්‍ය පරිදි ජලය සමග සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

ප්‍රයෝග :— උග්‍ර අතිසාර හා දරුණු විසූචිකාවට යෙදේ.

සැ: යු :— *මධූක මද්‍ය නැති විට මීමල් කෂායකර ගන්න.

5. යෝග නාමය :— **උශිරාසවය.**

යෝගය :—

සැවැන්දරා
සැවැන්දරා (බාලක ප්‍රතිනිධි)
නෙළුම් අල
ඇද්දෙමට ගෙඩි (අභාවයෙහි පොතු)
නිල්මහනෙල් අල
ප්‍රියඞ්ගු (ප්‍ර. රුක්මල්)
පද්මකාෂ්ට
ලොද්ධිර
වැල්මදට
ධන්වයාස (ප්‍ර. වැල්කහඹිලියා)
බිංකොහොඹ
නුග පොතු
අත්තික්කා පොතු
ශටී
පත්පාඩගම්
සුදු නෙළුම් අල (පුණ්ඩරීක — ප්‍රතිනිධි)
දුම්මැල්ල
කොබෝලීල පොතු හෝ මල්
මාදම් පොතු
කටු ඉඹුල් මැලියම්
දියමිත්ත — පලම් 1 බැගින්, (ග්‍රෑ: 60)
මුද්දිරප්පලම් පලම් 20 යි. (ග්‍රෑ: 1200 යි.)
ධාතකී පලම් 16 යි. (ග්‍රෑ: 960 යි.)
ජලය ද්‍රෝණ 2 යි. (ලීටර් 30.72 යි.)
ශර්කරා තුලා 1 යි. (ග්‍රෑ: 6000 යි.)
මීපැණි තුලා 1/2 යි. (ග්‍රෑ: 3000 යි.)

සංස්කරණය :— ප්‍රථමයෙන් ජලයට ශර්කරා දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන චූර්ණ කොට ශර්කරා මිශ්‍රිත ජලයට බහා මීපැණි ද මිශ්‍ර කොට ආසව පරිභාෂා අනුව කට මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— විශෙෂයෙන් රත්පිත් නසයි. දහ, පාණ්ඩු, කුෂ්ඨ, ප්‍රමෙහ, අර්ශස්, ක්‍රිමි, ශෝථ නස යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි:ලි: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

6. යෝග නාමය :— **කනකාසවය.**

යෝගය :—

අත්තන පංචාංගය පලම් 4 යි. (ග්‍රෑ: 240 යි.) (දඬු, මුල් කොළ, ගෙඩි, මල්)
ආඩතෝඩ මුලේ පොතු පලම් 4 යි. (ග්‍රෑ: 240 යි.)
මීපුප් (මීමල්)
තිප්පිලි
කටුවැල්බටු
වියලි ඉඟුරු
සිරිතේක්කු
තලිස් පතුරු
නාමල් රේණු — පලම 2 බැගින්, (ග්‍රෑ: 120)
ධාතකී ප්‍රස්ථ 1 යි. (ග්‍රෑ: 960 යි.)
මුද්දිරප්පලම් පලම් 20 යි. (ග්‍රෑ: 1200 යි.)
ජලය ද්‍රෝණ 2 යි. (ලීටර් 30.72 යි.)
ශර්කරා තුලා 1 යි. (ග්‍රෑ: 6000 යි.)
මීපැණි තුලා 1/2 යි. (ග්‍රෑ: 3000 යි.)

සංස්කරණය :— ප්‍රථමයෙන් ජලයට ශර්කරා දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන දළ සුණුකොට ශර්කරා මිශ්‍රිත ජලයෙහි බහා මීපැණි ද මිශ්‍රකොට, යෝග්‍ය බඳුනෙහි ලා, කට මැටි බැඳ, මසක් තබා, පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— ශ්වාස, කාස, රාජයක්ෂ්මා ක්ෂත, ක්ෂීණ, ජීර්ණජ්වර, රක්තපිත්ත, උරඃක්ෂත, රෝගවලට ගුණ යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි, සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

7. යෝග නාමය :— **කර්පූරාසවය.**

යෝගය :—

*පිරිසිදු සුරා සාර තුලා 1 යි. (ලීටර් 6 යි.)
වණ්ඩු කපුරු කුඩු පලම් 8 යි. (ග්‍රෑ: 480 යි.)
හීන්එන්සාල්
කලාදුරු අල
වියලි ඉඟුරු
අසමෝදගම්
ගම්මිරිස් — පලම් එක බැගින්. (ග්‍රෑ: 60)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය පිරිසිදුව ගෙන දළ සුණුකොට, සුරාසාරයට මිශ්‍ර කොට, වායුනිවාරක බෝතලයක බහා මසක් තබා පෙරා ගන්නේ ය. සතියකට දෙතුන් වරක් බෝතලය හොඳාකාර සොලවන්නේ ය.

ප්‍රයෝග :— විශේෂයෙන් විසූචිකා (ජලයන්තිය) හා ප්‍රවාහිකා නසයි. අජීර්ණ උදර ශූලාදියට ගුණ යි.

අනුපාන :— කසපැන් දිය හෝ වෙනත් සුදුසු අනුපානයකි.

මාත්‍රාව :— බාලයන්ට බින්දු 3 — 30 දක්වා, වෘද්ධයන්ට තේ හැදි 1 — 2 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

*පිරිසිදු සුරා සාර වෙනුවට දෙවරක් පෙරූ සුදු අරක්කු උචිත යි.

8. යෝග නාමය :— **කුමාර්යාසවය.** අංක 01.

යෝගය :—

කෝමාරිකා යූෂ	ද්‍රෝණ 1 යි.	(ලීටර් 15,36 යි.)
ගුඩ	තුලා 1 යි.	(ග්‍රෑ: 6000 යි.)
මීපැණි	තුලා 1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)
*පක්වලෞහ	තුලා 1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)
ධාතකී	පලම් 8යි.	(ග්‍රෑ: 480 යි.)

හීන් අරත්ත අල
කහ
මූර්වා
ත්‍රිකටු
කරාබු
චතුර්ජාත
රත්නෙටොල්
තිප්පිලි මුල්
වළහසාල්
ගජතිප්පිලි
සිවිය මුල්
හපුෂා (ප්‍ර. මුඩමහන)
කොත්තමල්ලි
පුවක්
කටුකරෝසන
කලාඳුරු අල
දේවදර
වෙනිවැල්ගැට
වැල්මී
දෑත්ත අල
සුවඳකොට්ටම්
බලා
අතිබලා
වඳුරුමෑ ඇට
ගොකටු ඇට
ශතපුෂ්ප
හිංගු පත්‍රි (ගලිස්)
ආකල්ලක (අක්‍රපට්ටා)
උටංගණ බීජ (සාමදන ඇට)
සාරණ දෙවගය (රතු, සුදු)
ලොද්ධර
ස්වර්ණමාක්ෂික හෂ්ම

තිපල් — පලම් 1/2 බැගින්. (ග්‍රෑ: 30)

සංස්කරණය :— හොඳට මේරූ කෝමාරිකා මද යූෂයට පිරිසිදු ගුඩ දිය කරන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා ගුඩ මිශ්‍රිත කෝමාරිකා යූෂට මීපැණි ද බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— බලය වඩයි. වර්ණ කාරක යි. අග්නිදීපන යි. වෘංහණ යි. රුචිකර යි. වෘෂ්‍ය යි. පාචක යි. ශූල අෂ්ටෝදර, උග්‍රක්ෂය, විංශතිවිධ, ප්‍රමේහ, උදවර්ත, අපස්මාර, මූත්‍රකෘච්ඡ්‍ර, ශුක්‍රදෝෂ, අශ්මරී, කෘමිරෝග රත්පිත් නස යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 – 1 (මි: ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

*ලෞහ චූර්ණය, ශ්‍රී යොග රත්නාකරයෙහි තාම්‍ර හස්ම හා ලෞහ හස්ම කර්ෂ 4 බැගින් නියමිත ය. එය වඩා යෝග්‍ය ය. එහි අරළු කෂාය හා කෝමාරිකා යූෂයෙන් ආසවය සිද්ධ යි. එය වඩා සුදුසු ය.

කුමාර්යාසවය අංක 02 (යෝගරත්නාකර ශ්‍රී, ගුල්ම)

කෝමාරික ස්වරස ද්‍රෝණ	01 යි.
පරණ වූ ගුඩ පලම	100 යි.
අරළු පලම්	25 යි.

වතුර ද්‍රෝණ එකක් ලා සතර එකට සිඳුවා පෙරා මිශ්‍ර කොට සිසිල් වූ පසු ගුඩ සහ මීපැණි ආඪකයක් (ප්‍රස්ථ 04 කි.) ද ධාතකී පලම් 16 ක් ද, කල්කය—සාදික්කා, කරාබු කංකෝල, ප්‍ර. නි. (වාල් මොලගු) තිපිප්ලි, සිවිය මුල්, රත් නිවුල්, වසාවාසි, කර්කටකශෘංගී, බුළු, සුවඳ කොට්ටම්, පලම බැගින් දල චූර්ණයද තාම්‍රහස්ම, ලෞහ හස්ම, අඩ පලම බැගින් ද මිශ්‍රකොට එක් මසක් සන්ධාන කොට පෙරා ගන්නේ ය. (හස්ම වෙනම අඹරා මිශ්‍ර කළ යුතු ය.)

ගුණ :— අට වැදෑරුම් ගුල්ම උදර අර්ශස් අපස්මාර, ආදියෙහි යෙදේ.

සංක්‍රාමක යකෘත් ප්‍රදහ ආදි යකෘත් රෝගයන්හි අත්‍යන්ත ඵල දයක ය. (අත් දැකීම) කාන්තාවන්ගේ නෂ්ට පුෂ්පයෙහි විශිෂ්ට ය.

කෝමාරිකා ස්වරය ලබා ගැනීම.

කෝමාරිකා පත්‍ර සෝද තුනී පෙති කපා එම බරට සමාන ප්‍රමාණයක් වතුර බහා, තඹ පිත්තල හෝ ලෝහ භාජනයෙක්හි ලා ලිපෙහි තියා කීපවරක් වතුර නටන තෙක් තම්බා ලිපෙන් බා තබා නිවුනාම පැහැ පෙට්ටියෙහි ලා මිරිකනයෙන් මිරිකා පෙරා ගන්නේ (අ.සා.සං.)ය.

2. කෝමාරිකා බර මෙන් දෙගුණයක් වතුර දමා අඩක් සිඳෙන තෙක් තම්බා මිරිකා ගන්නේ ය. මෙය වඩා හොඳ ය. (අත්දැකීම්). ඖ. සං. දෙවෙනි භාගයේ කෝමාරිකා බලන්න.

9. යෝග නාමය :— **බර්ජුරාසවය.**

යෝගය :—

රටඉඳි (ඇට අස්කළ)	ප්‍රස්ථ	5 යි. = (ග්‍රෑ: 4800 යි.)
හපුෂා (ප්‍ර. මුඩමහණ)	පලම්	8 යි. = (ග්‍රෑ: 480 යි.)
ධාතකී	පලම්	8 යි. = (ග්‍රෑ: 480 යි.)
ජලය	නැළි	64 යි. = (ලී: 61,44 යි.)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් රට ඉඳි පිරිසිදුව ගෙන නියමිත ජලය බහා භාගයට සිඳුවා පෙරා සිසිල් වූ පසු යෝගයෙහි සඳහන් අනෙක් ද්‍රව්‍ය ද දළ සුණුකොට කෂායට මිශ්‍රකොට යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ දෙසතියක් තබා පෙරා ගන්නේ ය. (ගුඩ හෝ සීනි ප්‍රස්ථ 2 ක් යෙදීම මැනවි.)

ප්‍රයෝග :— රාජයක්ෂ්මා, ශෝථ, ප්‍රමෙහ, පාණ්ඩු, කාමලා, ග්‍රහණි, ගුල්ම හා අර්ශස් නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

10. යෝග නාමය :— **චන්දනාසවය.**

යෝගය :—

සුදුහඳුන්
බාලක (ප්‍ර. සැවැන්දරා)
කලාඳුරු අල
ඇද්දෙමට ගෙඩි
නිල්මානෙල් අල
ප්‍රියංගු (ප්‍ර. රුක්මල්)
පද්ම කාෂ්ට
ලොධ්‍ර
වැල්මදට
රත්හඳුන්
දියමිත්ත
බිංකොහොඹ
නුගපොතු
*තිප්පිලි හෝ බෝපොතු
ශටී
පත්පාඩගම් (පර්පටක)
වැල්මී
හීන් අරත්ත අල
(පටෝල) දුම්මැල්ල
කොබෝලීල පොතු
අඹ පොතු
කටුඉඹුල් මැලියම්

පලම් 1 බැගින්. (ග්‍රෑ: 60)

ධාතකී	පලම් 16 යි.	(ග්‍රෑ: 960 යි.)
මුද්දිරප්පලම්	පලම් 20 යි.	(ග්‍රෑ: 1200 යි.)
ජලය	ද්‍රෝණ 2 යි.	(ලී: 30.72 යි.)
ශර්කරා	තුලා 1 යි.	(ග්‍රෑ: 6000 යි.)
ගුඩ	තුලා 1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)

මෙහි දී ශර්කරා ගුඩ ප්‍රමාණය දෙගුණ කළ යුතු ය. (ආ. සාරසංග්‍රහ)

සංස්කරණය :— ප්‍රථමයෙන් ජලයට ශර්කරා සහ ගුඩ දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා ශර්කරා මිශ්‍රිත ජලයට බහා මිශ්‍රකොට යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා, පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— විශේෂයෙන් ශුක්‍ර මෙහය නසයි. බල පුෂ්ටිකර යි. හෘද්‍ය යි. අග්නිදීපනය කරයි. විශේෂයෙන් ඖපසර්ගික මෙහ, ශ්වේතප්‍රදර හා මුත්‍රදෝෂ නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

*මෙහි මූලික ග්‍රන්ථයන්හි පිප්පලී යනු ද පිප්පල යනු ද සඳහන් වේ. ඒ අනුව තිප්පිලි සහ බෝපොතු ද ගත හැකි ය. එහෙත් ව්‍යවහාරයෙහි පවත්නේ බෝපොතු ගැනීම යි.

11. යෝග නාමය — **චව්කාසවය.**

යෝගය :—

සිවිය මුල්	තුලා 1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)
රත්නෙවුල්	තුලා 1/4 යි.	(ග්‍රෑ: 1500 යි.)

කළුදුරු
පෞෂ්කර මූල (සුවඳකොට්ටම්)
වදකහ
හපුෂා (ප්‍ර. ගම්මිරිස්)
ශඨී
ත්‍රිඵලා
යමානි,
කෙළිඳපොතු
ගොන්කැකිරි අල
කොත්තමල්ලි

පටෝල්මුල් (දුම්මැල්ල මුල්)	අරත්ත අල
දන්ති — මේවා එකින් පලම් දහය බැගිනි.	(ග්‍රෑ: 600)
වළහසාල්	දේවදර
කලාදුරුඅල	ත්‍රිකටු

වැල්මදට — පලම් 5 බැගින් ගත යුතුයි. (ග්‍රෑ: 300)

ජලය ද්‍රෝණ 8 යි. (ලී: 122.88) ද්‍රෝණ දෙකට සිඳුවා ගන්න. (ලී: 30.72)

ශර්කරා*	පලම්	300 යි.	(ග්‍රෑ: 18000 යි.)
ධාතකී	පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
චාතුර්ජාතක	පලම්	8 යි.	(ග්‍රෑ: 480 යි.)
කරාබු	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
තිකුළු (ප්‍රත්‍යෙකව)	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
කපුකිනිස්ස ඇට	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)

සංස්කරණය :— ආසව සංස්කරණ පරිභාෂාවෙනි.

ප්‍රයෝග :— සියලු ගුල්ම විකාර, විංශතිවිධ ප්‍රමේහ, ප්‍රතිශ්‍යාය. ක්ෂය, කාස, අෂ්ඨීලා, වාතශෝණිත, උදර, අන්ත්‍ර වෘධි යන මේවා නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

*ශර්කරා ප්‍රමාණය තුලා බාගයක් වැඩි කිරීම සුදුසු ය.

12. **යෝග නාමය :—** **ජම්බ්වාසවය.**

යෝගය :—

ඉදුනු ජම්බුඵල (මාදං ගෙඩි) යූෂ	ප්‍රස්ථ 5 යි. (ලී: 4.8 යි.)
(ගුඩ) සිනි	පලම් 30 යි. (ග්‍රෑ: 1800 යි.)

අරළු
බුළු
නෙල්ලි
කලාදුරු අල
වළහසාල්
සිද්දිහුරු
ගම්මිරිස්
තිප්පිලි
තිරස්සවාලු
තිප්පිලි මුල්
සෛන්ධව ලුණු
සුවසලුණු
ලේවා ලුණු (සාමුද්‍ර ලවණ)
අසමෝදගම්

මේවා පලම් 1/2 (ග්‍රෑ: 30) බැගින් ගෙන තලා සුණු කරන්න.

සංස්කරණය :— ජම්බුඵල යූෂට සිනි දිය කොට, ඊට තලා සුණු කළ චූර්ණය මිශ්‍ර කොට, සුදුසු බඳුනෙක්හි බහා කට මැටි බැඳ මසක් තබා පෙරා ගන්න.

ගුණ :— ප්‍රමේහයට හිත යි. උදර ශූල නාශක යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) බැගින් යථායෝග්‍ය පරිදි යොදනු.

සැ: යු :— යෝගයෙහි ඇති ලුණු වර්ග සන්ධාන කාර්යයට බාධා විය හැකි යැ යි ඖ.සං.සං. මණ්ඩලය කල්පනා කරන ලදි. මෙ නිසා ලවණවර්ග ආසවය පෙරීමෙන් පසු සංයෝග කිරීම සුදුසුය යි අදහස් කරනු ලැබේ.

13. **යෝග නාමය :—** **ත්‍රිඵලාසවය.**

යෝගය :— තිපල් ක්වාථය (ත්‍රිඵලා, මිලිතව) තුලාව යි. ජලය ද්‍රෝණ 4 — ද්‍රෝණයට (ලී: 61.44 — 15.36) සිඳවනු.

රත්නෙටොල්		
කල්ලිප්පාක්කු		
දශමූල		
දන්තමුල්		
කුරුඳු පොතු	—	එකින් පලම බැගිනි. (ග්‍රෑ: 60)
මීපැණි		තුලා 1/4 යි. (ග්‍රෑ: 1500 යි.)
ගුඩ		තුලා 1 යි. (ග්‍රෑ: 6000 යි.)

සංස්කරණය :— යන මේවා විධිසේ යොද ආසවය සාද ගන්න.

ප්‍රයෝග :— විශේෂයෙන් කුෂ්ඨ රෝග නසයි. වාතරක්ත, පාණ්ඩු, අක්ෂි රෝගාදියට විශේෂ යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

14. **යෝග නාමය :—** **ද්‍රාක්ෂාසවය. (අරිෂ්ටය)**

යෝගය :—

මුද්දිරප්පලම්	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)
ජලය	ද්‍රෝණ	4 යි.	(ලී:61.44 යි.)
ශර්කරා	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)
මීපැණි	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :— ධාතකී පලම් 7 යි. (ගු: 420 යි.)
සාදික්කා
කරාබු
ලවලී ඵල (රට නෙල්ලි ගෙඩි)
කපුකිනිස්ස
සුදුහඳුන්
තිප්පිලි
ත්‍රිගන්ධ (තේජපත්‍ර කුරුඳුපොතු ගින් එන්සාල්)

පලම් භාගය (ගු: 30) බැගින්, පිරිසිදු මුද්දිරප්පලම් නියමිත ජලය බහා පාදයට සිඳුවා අරිෂ්ටය සාද ගන්න.

ප්‍රයෝග :— අර්ශස්, ශෝථ, අරුචි, හෘද්රෝග, පාණ්ඩු, රක්තපිත්ත, භගන්දර, ගුල්ම, උදර රෝග, කෘමි, ග්‍රන්ථි ක්ෂත, ශෝෂ, ජ්වර සහ වාත පිත්තජ රෝග නසයි. බල සහ වර්ණකර යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

15. යෝග නාමය :— **පත්‍රාංගාසවය.**

යෝගය :—
පත්‍රාංග (පතඟි) අරටු
රත්කිහිරිය
ආඩතෝඩා මුලේ පොතු
ඉඹුල්මල්
බැවිල
ගුඩ භල්ලාතක
සුදුඉරමුසු
කළු ඉරමුසු
වදමල් කැකුළු
අඹ ඇට මද
වෙනිවැල් (දරුහරිද්‍රා)
බිංකොහොඹ
ආම්‍රකඵල (අඹ ගෙඩියේ ලෙලි)
සුදුදුරු
ලෝහ භස්ම
රසාඤ්ජන
බෙලිගැටමද
කීකිරිඳිය
කුරුඳුපොතු
කුංකුමප්පූ
(ප්‍ර. නි. නෙළුම රේණු)
කරාබු

පලම් 1 (ගු: 60) බැගින් ගත යුතු.

මුද්දිරප්පලම්	පලම් 20 යි.	(ගු: 1200 යි.)
ධාතකී	පලම් 16 යි.	(ගු: 960 යි.)
ජලය	ද්‍රෝණ 2 යි.	(ලීටර් 30.72 යි.)
ගුඩ	තුලා 1 යි.	(ගු: 6000 යි.)
මීපැණි	තුලා 1/2 යි.	(ගු: 3000 යි.)

ප්‍රයෝග :— උග්‍ර වූ ප්‍රදර නසයි. ශ්වේත සහ අරුණ ද්‍රව පිට වන, වේදනා සහිත ප්‍රදර, ජ්වර, පාණ්ඩු, ශෝථ, සහ මන්දග්නි අරුචි නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 —30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදේ.

16. යෝග නාමය :— **පිප්පල්‍යාද්‍යාසවය. (පිප්පල්‍යාසවය)**

යෝගය :—
තිප්පිලි
ගම්මිරිස්
සිවිය මුල්
වියලි කහ
රත්නෙවුල්
කලාදුරු අල
වළහසාල්
වියලි පුවක් (කල්ලිපාක්කු)
ලෝධ්‍ර
දියමිත්ත
නෙල්ලි
ඒලවාලුක
සැවැන්දරා මුල්
සුදුහඳුන්
කොට්ටං
කරාබු
තගර (තුවරලා)
ජටාමාංස
කුරුඳුපොතු
හීන්එන්සාල්
තේජපත්‍ර
ප්‍රියංගු
නාමල් රේණු

පලම් 1/2 (ගු: 30.) බැගින්.

ජලය	ද්‍රෝණ 2 යි.	(ලි: 30.72 යි.)
ගුඩ	තුලා 3 යි.	(ගු: 18000 යි.)
ධාතකී	පලම් 10 යි.	(ගු: 600 යි.)
මුද්දිරප්පලම්	පලම් 60 යි.	(ගු: 2600 යි.)

සංස්කරණය :— ප්‍රථමයෙන් ජලයට ගුඩ දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන චූර්ණ කොට ගුඩ මිශ්‍රිත ජලයට බහා මිශ්‍රකොට ආසව පරිභාෂා අනුව කළ මැටි බැඳ මසක් තබා පෙරා, ගන්නේ ය.

ප්‍රයෝග :— ක්ෂය, ගුල්ම, උදර, කෘශබව, ග්‍රහණී, පාණ්ඩු, අර්ශස් යන රෝග ශීඝ්‍රයෙන් නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

17. **යෝග නාමය :—** **පුනර්නවාසවය.**

යෝගය :—

ඉඟුරු
ගම්මිරිස්
තිප්පිලි
අරළු
බුළු
නෙල්ලි
වෙනිවැල් ගැට (දරුහරිද්‍රා ප්‍රතිනිධි)
ගොකටු මුල්
එලබටු මුල්
කටුවැල්බටු මුල්
පාවට්ට මුල් (ආඩතෝඩා)
එරඬු මුල්
කටුකරෝසන
ගජතිප්පිලි
සාරණ මුල්
කොහොඹ පොතු
රසකිඳ
වියලි රාබු අල
දුරාලභා (කහඹිලියා ප්‍රතිනිධි)
පටෝල (දුම්මැල්ල ප්‍රතිනිධි)
පලම් 1 බැගින් (ග්‍රෑ: 60)

ධාතකී	පලම්	16යි.	(ග්‍රෑ: 960 යි.)
මුද්දිරප්පලම්	පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
සීනි	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)
මීපැණි	තුලා	1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)
ජලය	ද්‍රෝණ	2 යි.	(ලීටර් 30,72 යි.)

සංස්කරණය :— ප්‍රථමයෙන් ජලයට සීනි දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා සීනි මිශ්‍රිත ජලයට බහා මීපැණි ද මිශ්‍රකොට ආසව පරිභාෂා අනුව කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය. (මදක් තලා = දළ ලෙස සුණු කොට)

ප්‍රයෝග :— විශේෂයෙන් ශෝථයට යෙදේ. උදර, ප්ලීහ, අම්ල පිත්ත, යකෘත් රෝග, ගුල්ම රෝග නස යි. එසේම සියළු කෘච්ඡ්‍රසාධ්‍ය රෝග නිසැකව ම නසන්නේ ය.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

18. **යෝග නාමය :—** **මධූකාසවය.**

යෝගය :—

අමු මීමල් (මීපුප්)	ද්‍රෝණ	1 යි.	(ග්‍රෑ: 15360 යි.)
වළහසාල්	ද්‍රෝණ	1/2 යි.	(ග්‍රෑ: 7680 යි.)
වියලි රත්නෙටොල් මුල්	ද්‍රෝණ	1/4 යි.	(ග්‍රෑ: 3840 යි.)
ශුද්ධභල්ලාතක බීජ	ආඪක	1 යි.	(ග්‍රෑ: 3840 යි.)
වැල්මදට	පලම්	3 යි.	(ග්‍රෑ: 180 යි.)
ජලය	ද්‍රෝණ	3 යි.	(ලී: 46.08 යි.)
මීපැණි	ආඪක	1/2 යි.	(ග්‍රෑ: 1920 යි.)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා (ද්‍රෝණ තුන) ද්‍රෝණයකට සිඳුවා පෙරා සිසිල් වූ පසු මීපැණි මිශ්‍රකොට යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— අග්නිදීපන යි. ග්‍රහණියට හිත යි. ශෝථ, කුෂ්ඨ, වාතරෝග, කිලාස, ප්‍රමේහ යන රෝග නස යි. වෘංහණ යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

19. **යෝග නාමය :—** **මෘගමදසවය.**

යෝගය :—

මෘත සංජීවනී සුරා	පලම්	50 යි.	(ග්‍රෑ: 3000 යි.)	
මීපැණි	පලම්	25 යි.	(ග්‍රෑ: 1500 යි.)	
ජලය	පලම්	25 යි.	(ග්‍රෑ: 1500 යි.)	
කස්තුරි	කුඩව	1 යි.	(ග්‍රෑ: 240 යි.)	(= පලං 4 යි.)
	(කස්තුරි ප්‍ර. නි. කපුකිනිස්ස ඇට)			

ගම්මිරිස්
කරාබු
සාදික්කා
තිප්පිලි
කුරුඳුපොතු — (ග්‍රෑ: 120) පලම් 2 බැගින්.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා සුරා මිශ්‍ර ජලයෙහි බහා එයට මීපැණි ද මිශ්‍රකොට යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ මසක් තබා, පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— විසූචිකා, හික්කා, ත්‍රිදෝෂජ්වර, යන රෝගයනට හිත යි. ශ්‍රේෂ්ඨ යි. අග්නි සහ බල වඩ යි.

මාත්‍රාව :— බිංදු 5 — 30 දක්වා ජලය සමඟ යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

යෝගරාජාසවය.

මුද්දරප්පලම් දස පලම යි, අරලු පලම් හතරයි, කරාබු, මසන් පොතු, හල් පොතු, කුඹුක් පොතු, දේවදාර, රත්නිටොල්, ලොත්, තිප්පිලි මුල්, ධාතකී පුෂ්ප, පෙති පුවක්, මේවා පලම බැගින් වැල්මදට දෙපලමයි මේ හැම කපා තලා භාජනයක ලා වතුර සේරු විසි හතරක් දමා දොළොසෙකින් එකට හෙවත් සේරු දෙකට සිඳුවා පෙරා ගන්න.

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :— උක් හකුරු, දස පලම යි, උක්සීනි දස පලමයි, කරාබු නැටි, තේජපත්‍ර, වසාවාසි, එන්සාල්, නාමල් රේණු, ගම්මිරිස්, තිප්පිලි, ඉඟුරු, කුරුඳුපොතු, ජටාමාංස, සිවිය, කලාදුරු අල, කොට්ටන්, සාදික්කා, ග්‍රන්ථිපර්ණ, දලුක් මුල්, කටුකරෝසන, සාදික්කා මේවා පලම බැගින් ගෙන කුඩුකර ගන්න. භාජනයට නිවුනු කෂාය දමා උක් හකුරු හා සීනි එහි දිය කොට චූර්ණ ද බහා කලනා භාජනයේ කට වසා බැද සත් දිනක් ශීතල ඇති තැනක ද, තුන් දිනක් උෂ්ණ තැනක ද තබන්න.

ගුණ :— වා පිත් රෝග නසයි, රත්පිත් දෝෂ දුරල යි. බඩ ගිනි වඩ යි.

(ගද නිග්‍රහය)

20. යෝග නාමය :— ලෝධ්‍රාසවය. (මධ්වාසවය)

යෝගය :—

ලෝධ්‍ර
ශඨී
සුවඳකොට්ටන්
එන්සාල්
මූර්වා
වලහසාල්
තිපල්
අසමෝදගම්
සිවිය
ප්‍රියංගු
වියලි පුවක්
ගොන් කැකිරි අල
බිංකොහොඹ
කටුකරෝසන

කුවරලා
රත්නෙවුල්
තිප්පිලිමුල්
කොට්ටං
අතිවිඩයන්
දියමිත්ත
කෙළිඳ හාල්
නාමල්රේණු
මහගොන් කැකිරි අල
තබ් (කරාබු ප්‍රතිනිධි)
තේජපත්‍ර
ගම්මිරිස්
(කෛවර්තමුස්තක) මහ කලාදුරු

සිරිතේක්කු —	කර්ෂ	1 බැගින්.	(ග්‍රෑ: 15.)
ජලය	ද්‍රෝණ	1 යි.	(ලී: 15.36 යි.)
මීපැණි	ද්‍රෝණ	1/8 යි.	(ග්‍රෑ: 192 යි.)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා, පාදයකට සිඳුවා පෙරා සිසිල්වූ පසු මීපැණි මිශ්‍රකොට අරිෂ්ට පරිභාෂා අනුව කඩ මැටි බැඳ දෙසතියක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— සෙම්, පිත්, මේහ, පාණ්ඩු, අර්ශස්, අරුචි, ග්‍රහණි දෙෂ, කිලාස යන රෝග නස යි.

මාත්‍රාව :— සාමාන්‍ය — අවුන්ස 1/2 — 1 (මි:ලී: 15.30) දක්වා. යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

21. යෝග නාමය :— ලෞහාසවය.

යෝගය :—

*ලෞහ චූර්ණය (දැතිය)	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
අරළු	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
බුළු	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
නෙල්ලි	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
ඉඟුරු	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
ගම්මිරිස්	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
තිප්පිලි	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
අසමෝදගම්	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
වලහසාල්	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
කලාදුරු අල	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
රත්නෙවුල් මුල්	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
මීපැණි	පලම්	64 යි.	(ග්‍රෑ: 3840 යි.)
ගුඩ	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)
ජලය	ද්‍රෝණ	2 යි.	(ලී: 30.72 යි.)

සංස්කරණය — ප්‍රථමයෙන් ජලයට ගුඩ දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල (ලෞහ හැර) පිරිසිදුව ගෙන චූර්ණ කොට ගුඩ මිශ්‍රිත ජලයට බහා ලෞහ හා මීපැණි ද මිශ්‍රකොට අරිෂ්ට ආසව පරිභාෂා අනුව කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

*මෙහිදී ලෞහ චූර්ණය ලෞහදැති ආකාරයෙන් සකසා ආසවයට මිශ්‍ර කළ යුතු වේ.
ලෞහ වෙනුවට යබර භස්ම යෙදීමද ක්‍රමයෙකි.

ප්‍රයෝග :— පාණ්ඩු, ශෝථ, ගුල්ම, උදර, අර්ශස්, කුෂ්ඨ, ප්ලීහ වෘද්ධි, කණ්ඩු, කාස, භගන්දර, අරුචි, ග්‍රහණි, හෘද් රෝග යන රෝගයන්ට හිත යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30 යි.) දක්වා අහාරයට පසු යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

22. යෝග නාමය :— වාසකාසවය.

යෝගය :—
වාසක (ආඩතෝඩා මුලේ පොතු) තුලා 2 යි. (ග්‍රෑ: 12000 යි
ජලය ද්‍රෝණ 2 (ලීටර් 30.72) ක් බහා 1/4 ට (ලී: 7.68) යි , ගන්න.
ගුඩ තුලා 1 යි. (ග්‍රෑ: 6000 යි.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය—
ධාතකී පලම් 8 යි. (ග්‍රෑ: 480 යි.)
කුරුඳුපොතු
එන්සාල්
තේජපත්‍ර
නාමල්රේණු
කපුකිනිස්ස ඇට
ත්‍රිකටු (ව්‍යොෂ)
සුගන්ධබාලා (ප්‍රතිනිධි ඉරිවෙරිය)
යන ද්‍රව්‍ය පලම් 1 බැගින් (ග්‍රෑ: 60) ගතයුතු වෙ. සන්ධානය පිණිස දෙසතියක් තබා අරිෂ්ටය සෑද ගනු ලැබෙ.

සංස්කරණය :— අරිෂ්ට පරිභාෂාව අනුව ය.

ප්‍රයෝග :— සියළුම කාස, ශ්වාස නසන්නේ ය.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා ,යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

23. යෝග නාමය :— සෝමරාජ්‍යාසවය.

යෝගය :—

සෝමරාජී (බාකුචි)	ප්‍රස්ථ 1 යි.	(ග්‍රෑ: 960 යි.)
වියලි නෙල්ලි	ප්‍රස්ථ 1 යි.	(ග්‍රෑ: 960 යි.)
රත්කිහිරිය	ප්‍රස්ථ 1 යි.	(ග්‍රෑ: 960 යි.)
කළු ඉරමුසු	ප්‍රස්ථ 1/2 යි.	(ග්‍රෑ: 480 යි.)
සුදු ඉරමුසු	ප්‍රස්ථ 1/2 යි.	(ග්‍රෑ: 480 යි.)
ජලය	ද්‍රෝණ 4 යි.	(ලී: 61.44 යි.)
මීපැණි	තුලා 1 යි.	(ග්‍රෑ: 6000 යි.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය
අරළු
බුළු
නෙල්ලි
කොහොඹපොතු
වැල්මදට
වෙනිවැල්ගැට
බිංකොහොඹ
රත්තෙටොල්
පලම් 1 බැගින්, (ග්‍රෑ: 60.)

සංස්කරණය :— යෝගයෙහි සදහන් ද්‍රව්‍ය පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා පාදයකට සිදුවා පෙරා සිසිල් වූ පසු ,පිළියෙල කළ ප්‍රක්ෂේප ද්‍රව්‍ය හා මීපැණි ද කෂායට මිශ්‍රකොට යෝග්‍ය බදුනෙක්හි ලා, කට මැටි බැද මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— ශ්විත්‍ර, කිලාස, හා සියළු කුෂ්ඨ නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

24. යෝග නාමය :— ශාරිවාද්‍යාසවය.

යෝගය :—
කළු ඉරමුසු
කලාදුරු අල
ලෝධර
නුගපොතු
බෝපොතු
ශටී
අනන්තා (ඉරමුසු)
පද්මකාෂ්ට
(සුගන්ධබාලා) සැවැන්දරා ප්‍රතිනිධි
දියමිත්ත
නෙල්ලි
සැවැන්දරා
සුදුහදුන්
රත්හදුන්
අසමෝදගම්
කටුකරෝසන
තේජපත්‍ර
හීන් එන්සාල්
මහ එන්සාල්
කොට්ටං
සෙනෙහෙකොළ
අරළු

රසකිඳ — පලම් 4 බැගින් (ග්‍රෑ: 240.)

ජලය	ද්‍රෝණ	2 යි.	(ලීටර් 30.72 යි.)
ගුඩ	තුලා	3 යි.	(ග්‍රෑ: 18000 යි.)
ධාතකී	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
මුද්දිරප්පලම්	පලම්	60 යි.	(ග්‍රෑ: 3600 යි.)

සංස්කරණය :— ප්‍රථමයෙන් ජලයට ගුඩ දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා ගුඩ මිශ්‍රිත ජලයට බහා මිශ්‍රකොට අරිෂ්ට ආසව පරිභාෂා අනුව කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්න.

ප්‍රයෝග :— ප්‍රමේහපිඩකා, විංශතිවිධ ප්‍රමේහ රෝග, ඖපදංශික රෝග, වාතරක්ත, භගන්දර යන රෝගයන්ට හිත යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30 යි.) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

25. යෝග නාමය :— ශ්‍රී ඛණ්ඩාසවය.

යෝගය :—

සුදුහඳුන්
ගම්මිරිස්
ජටාමාංස
කහ
වෙනිවැල්ගැට
රත්නිවුල්
කලාඳුරු
සැවැන්දරා
තගර (තුවරලා)

රත්හඳුන්
නාමල්රේණු
දියමිත්ත
නෙල්ලි
තිප්පිලි
සිවිය
කරාබු
ඒලවාලුක
ලොධ්‍ර

මුද්දිරප්පලම් — පලම් 2 බැගින්. (ග්‍රෑ: 120)

ජලය	ද්‍රෝණ	2 යි.	(ලීටර් 30,72 යි.)
මුද්දිරප්පලම්	පලම්	60 යි.	(ග්‍රෑ: 3600 යි.)
ගුඩ	තුලා	3 යි.	(ග්‍රෑ: 18000 යි.)
ධාතකී	පලම්	12 යි.	(ග්‍රෑ: 720 යි.)

සංස්කරණය :— ප්‍රථමයෙන් ජලයට ගුඩ දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා, ගුඩ මිශ්‍රිත ජලයට බහා මිශ්‍රකොට යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්න.

ප්‍රයෝග :— මදාත්‍යය, පරමද, පානාජීර්ණ, භයංකර පාන විභ්‍රම, යන රෝගයන්ට හිත යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 දක්වා (මි: ලි: 15 — 30) යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

අරිෂ්ට ඛණ්ඩය

සන්ධාන කල්පනා ශීර්ෂයෙහි, අරිෂ්ට ආසව සන්ධාන භාජනයෙහි ගහා කඩමැටි බැඳීම සම්බන්ධ වූ අංක 5 දරණ නියමයන් වක්තව්‍යයෙහි අංක 06 දරණ නියමයන් නො වරදවා ම ඉටුකරන්න. අරිෂ්ට ආසවයන්හි මද්‍යසාර ශක්තිය ඉපැදවීමට පෙර කඩමැටි බැඳීම නොකළ යුතුය. කාබන්ඩයොක්සයිඩ් බැහැර වීම සඳහා සන්ධාන භාජනය දින කීපයක් විවෘතව තැබිය යුතුය. විවෘතව තැබීම පිළිබඳ නියමයන් සහ අරිෂ්ට ආසව සන්ධාන කාර්යය මැනැවින් ඉටුවීම පිළිබඳ වූ සියලු නියමයන් එම සන්ධාන කල්පනා ශීර්ෂයෙහි ඇතුළත් ය. එක් එක් වට්ටෝරුවෙහි සටහන් කැර තිබෙන්නේ සුදුසු භාජනයෙහි ලා කඩමැටි බැඳ මාසයක් තබා පෙරා ගන්නේය කියා ය. එනමුත් කඩමැටි බැඳීම සම්බන්ධ විශෙෂ නිර්දේශය කල්පනා ශීර්ෂයෙහි සඳහන් ය.

1. යෝග නාමය :— **අභයාරිෂ්ට. (1)**

යෝගය :—

ඇට ඉවත් කළ අරළු	තුලා	1	යි.	(ග්‍රෑ: 6000 යි.)
මුද්දිරප්පලම්	තුලා	1/2	යි.	(ග්‍රෑ: 3000 යි.)
වළගසාල්	පලම්	10	යි.	(ග්‍රෑ: 600 යි.)
මීමල් (මීපුප්)	පලම්	10	යි.	(ග්‍රෑ: 600 යි.)
ජලය	ද්‍රෝණ	4	යි.	(ලීටර් 61.44 යි.)
ගුඩ	තුලා	1	යි.	(ග්‍රෑ: 6000 යි.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—

හින් ගොකටු
තිරස්සවාලු
කොත්තමල්ලි
ධාතකී
ගොන් කැකිරි අල
මධුරිකා (ශතපුෂ්ප)
ශතපුෂ්ප
වියලි ඉඟුරු
දූත්ත අල
කටු ඉඹුල් මැලියම්
සිවිය — එකින් පලම් 2 බැගින්. (ග්‍රෑ: 120).

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු, ගුඩ දියකර නැවත පෙරා මඳක් තලා පිළියෙල කරගත්, ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— අර්ශස් නාශක ගුණය ප්‍රධාන යි. අෂ්ටොදර, මලමූත්‍ර බැඳීම නසයි. පාචකාග්නිය අතිශයින් ප්‍රදීප්ත කරයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි:ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

සැ: යු :—

තුලාවට	රාත්තල් 12 1/2 යි.	මෙම වක්‍රය තාවකාලික බව සලකන්නේ ය.
ද්‍රෝණයට වතුර	රාත්තල් 32 යි.	පරිශිෂ්ට සංග්‍රහය බලන්න.

අරිෂ්ට ආසව සඳහා කල්ක ද්‍රව්‍ය චූර්ණ කිරීමේ දී කරාබු, කුරුඳු, එන්සාල්, තේජපත්‍ර ආදි සුගන්ධ ද්‍රව්‍ය පවනේ වියලා දළ චූර්ණය ලෙස තලා ගත යුතු ය. අවශේෂ කල්ක ද්‍රව්‍යයන් වුව ද අති සියුම්ලෙස චූර්ණ නො කළ යුතු ය.

2. යෝග නාමය :— **අභයාරිෂ්ටය (2)**

යෝගය :—

ඇට ඉවත් කළ අරළු	ප්‍රස්ථ	1/2 යි.	(ග්‍රෑ: 480 යි.)
ඇට ඉවත් කළ නෙල්ලි	ප්‍රස්ථ	1 යි.	(ග්‍රෑ: 960)
දිවුල් මද වියලා	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
ගොන් කැකිරි අල	පලම්	5 යි.	(ග්‍රෑ: 300 යි.)
වළගසාල්			
තිප්පිලි			
ලෝධ්‍ර			
ගම්මිරිස්			
ඒලවාලුක	පලම්	2 බැගින්.	(ග්‍රෑ: 120).)
ජලය	ද්‍රෝණ	4 යි.	(ලීටර් 61.44 යි.)
ගුඩ	පලම්	200 යි.	(ග්‍රෑම් 12000 යි.)

සංස්රණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ සති දෙකක් තබා පෙරා ගන්නේය.

ප්‍රයෝග :— අර්ශස්, ග්‍රහණී දෝෂ, පාණ්ඩු රෝග, හෘද් රෝග, ප්ලීහ, ගුල්ම, උදර, කුෂ්ඨ, ශෝථ, අරුචි යන රෝග පහ කරයි. බල-වර්ණ-අග්නි-වඩයි. කාමලා, ශ්වීත්‍ර, ක්‍රිමි, ග්‍රන්ථි, අර්බුද, ව්‍යංග, රාජ යක්ෂ්මා, ජ්වර යන රෝග නසාල යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 දක්වා, (මි:ලි: 15 — 30) යෝගය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

සැ: යු :— *ධාතකී පලම් 10 ක් (ග්‍රෑ: 600) යෙදීම වඩා සුදුසු ය.

3. යෝග නාමය :— **අමෘතාරිෂ්ටය.**

යෝගය :—	*රසකිඳ (පිට පොත්ත අස්කර)	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)
	දශමූල් එකින් පලම් 10 බැගින්	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)
	*ජලය	ද්‍රෝණ	4 යි.	(ලී: 61.44)
	ගුඩ	තුලා	3 යි.	(ග්‍රෑ: 18000 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	අයමෝදගම්	පලම්	16 යි.	(ග්‍රෑ: 960 යි.)
	පත්පාඩගම්	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	මෝරපු රුක්අත්තන පොතු	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	ත්‍රිකටු (ප්‍රත්‍යෙකව)	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	කළාදුරු අල	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	නාමල් රේණු	පලම්	1 යි.	ග්‍රෑ: 60 යි.)
	කටුකරෝසන	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	අතිවිඩයම්	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	කෙලිඳ සහල්	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මදක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— විශේෂයෙන් ජ්වර, ආම්වාත ජ්වර, වාත වේදනා සඳහා යෙදේ.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

සැ: යු:— *ද්‍රව දෙගුණ කිරීමේ නියමය අනුව ජලය දෙගුණ කිරීම මැනවි.
*ද්‍රව්‍ය විස්තරයෙහි රසකිඳ සම්බන්ධයෙන් විමසන්න.

4. යෝග නාමය :— **අශ්වගන්ධාරිෂ්ටය.**

යෝගය :—	අමුක්කරා අල	තුලා	1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)
	බින්තල් අල	පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
	වැල්මදට	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	අරළු	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	වියලි කහ	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	දරුහරිද්‍රා	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	වැල්මී	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	අරත්ත අල	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	කිරිබදු අල	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	කුඹුක්පොතු	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	කළාදුරු අල	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	තිරස්සවාලු	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	සුදු ඉරමුසුමුල්	පලම්	8 යි.	(ග්‍රෑ: 480 යි.)
	කළු ඉරමුසු මුල්	පලම්	8 යි.	(ග්‍රෑ: 480 යි.)
	සුදුහඳුන්	පලම්	8 යි.	(ග්‍රෑ: 480 යි.)
	රත්හඳුන්	පලම්	8 යි.	(ග්‍රෑ: 480 යි.)
	වදකහ	පලම්	8 යි.	(ග්‍රෑ: 480 යි.)
	රත්නෙටොල්	පලම්	8 යි.	(ග්‍රෑ: 480 යි.)
	ජලය	ද්‍රෝණ	8 යි.	(ලී: 122.88 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	ධාතකී	පලම්	16 යි.	(ග්‍රෑ: 960 යි.)
	මීපැණි	තුලා	3 යි.	(ග්‍රෑ: 18000 යි.)
	ව්‍යොෂ (මිලිතව)	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	ත්‍රිජාත (මිලිතව)	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
	ප්‍රියංගු	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
	නාමල් රේණු	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා ද්‍රෝණයට සිඳුවා පෙරා සිසිල් වූ පසු, ගුඩ දියකර නැවත පෙරා මදක් තලා පිළියෙල කරගත්, ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— මුර්ච්ඡා, අපස්මාර, ශෝෂ, උන්මාද, කෘශ බව, අර්ශස්, මන්දග්නි, වාතරෝග නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

සැ: යු :— ජලය දෙගුණ කිරීමේ නියමය අනුගමනය කිරීම මැනවි.

5. යෝග නාමය :— **අශෝකාරිෂ්ටය.**

යෝගය :—	අශෝක පොතු	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)
	ජලය	ද්‍රෝණ	4 යි.	(ලී: 61.44 යි.)
	ගුඩ	පලම්	200 යි.	(ග්‍රෑ: 12000 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	ධාතකී	පලම්	16 යි.	(ග්‍රෑ: 960 යි.)
	කළුදුරු	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	කලාදුරු අල	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	වියලි ඉඟුරු	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	දරුහරිද්‍රා	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	මානෙල් අල	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	තිපල් (මිලිතව)	පලම්	3 යි.	(ග්‍රෑ: 180 යි.)
	අඹඇට මද	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	සුදුදුරු	පලම	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	ආඩතෝඩ පොතු	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)
	සුදුහඳුන්	පලම්	1 යි.	(ග්‍රෑ: 60 යි.)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු, ගුඩ දියකර නැවත පෙරා මඳක් තලා පිළියෙල කරගත්, ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝගය :— රුජා සහිත අසෘග්දර නසයි. ජ්වර, රත්පිත්, රක්තාර්ශස්. මන්දග්නි, අරුචි, ප්‍රමේහ, ශෝථ ආදිය නස යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි:ලී: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතුයි.

6. යෝග නාමය :— **කනකාරිෂ්ටය.**

යෝගය :—	අමු අලුත් නෙල්ලි	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)
	තිප්පිලි	කුඩව	1 යි.	(ග්‍රෑ: 240 යි.)
	ජලය	ද්‍රෝණ	2 යි.	(ලී. 30.72 යි.)
	ශර්කරා	තුලා	2 යි.	(ග්‍රෑ: 12000 යි.)
	මීපැණි	ප්‍රස්ථ	1 1/2 යි.	(ග්‍රෑ: 1440 යි.)

වලඟසාල්
ගම්මිරිස්
දියමිත්තමුල්
තිප්පිලි මුල්
පුවක්
කොට්ටම්
දරුහරිද්‍රා
දේවදර
සුදුඉරමුසු — පලම් 1/2 බැගින් (ග්‍රෑ: 30)

සිවිය
රත්නෙටොල්
වැල්මදට
ඒලවාලුක
ලෝධ්‍ර — පලම් 1 බැගින්. (ග්‍රෑ: 60).
කළුඉරමුසු
කෙළිඳ ඇට
කළාදුරු අල

නාමල්	පලම්	4 යි.	(ග්‍රෑ: 240 යි.)
මීදියුෂ	ආඪක	2 යි.	(ග්‍රෑ: 7680 යි.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—

කුරුඳුපොතු
හින් එන්සාල්
ප්ලව (කෛවර්ත මුස්තක)
තේජපත්‍ර

අම්බු (ඉරිවේරිය ප්‍රතිනිධි)
සැවැන්දරා
පුවක්
නාමල් රේණු — කර්ෂ 1 බැගින්, (ග්‍රෑ: 15)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල (මීදිහැර) පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා, මීපැණි හා මීදි යුෂ ද, මිශ්‍රකොට යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ, මසක් තබා පෙරා, ගන්නේ ය.

ප්‍රයෝග :— මිහිරි රස යි, හෘද්‍ය යි, රුචි වඩ යි, අර්ශස්, ග්‍රහණි, දෝෂ, ආනාහ, උදර, ජ්වර, හෘද්රෝග, පාණ්ඩු, ශෝථ, ගුල්ම, මලමූත්‍ර බද්ධ, කාස, උග්‍ර කඵජ රෝග නසයි. වලිපලිත ඛාලිත්‍ය නසාල යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

(කනක බින්දු) කනකාරිෂ්ටය — කුෂ්ඨයෙහි (ග.නි.01 ප්‍රයෝග සහ ආසව විඥානය)

රත් කිහිරිය පලම් සියයක් ගෙන කපා තලා, බඳුනක ලා ජලය ද්‍රෝණ අටක් දමා ද්‍රෝණයට සිඳුවා පෙරා ගන්න.

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :— රත් කිහිරි චූර්ණය පලම් 01 යි, අරලු, බුළු, නෙල්ලි, ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, වළගසාල්, කහ, ඉඟිනි ඇට, බාකුචි, මුස්තා, වාසා, කෙළිඳ ඇට, වෙනිවැල්ගැට, කුරුඳු පොතු, රසකිඳ යන මේවා පලම් අට බැගින් ගෙන කුඩුකර ගන්න. ගිතෙල් තවරා සකස් කරගත් සන්ධාන භාජනයකට කෂාය හා චූර්ණයද බහා කලතා බඳුනේ කට වසා බැඳ වී (ධාන්‍ය) ගොඩක් මැද සන්ධානය පිණිස තබන්න. මී පැණි පලං 200 යි, ධාතකී පලං 08 යි, සන්ධාන කාලය මාසය යි.
මසකින් පසුව අරිෂ්ටය පෙරා භාවිතයට ගත යුතුයි.

ගුණ :— උදේ උදේ මසක් බීමෙන් මහා කුෂ්ඨ සුවවෙයි. අඩ මසකින් අර්ශස් සුවවෙයි.
ශ්වාස, භගන්දර, කාස, කිලාස, ප්‍රමේහ, ශෝෂ යන රෝග ශමනය කරයි.

කනකාරිෂ්ටය.

ගද නිග්‍රහය. 01 ප්‍රයෝග ඛණ්ඩය ඇසුරෙනි.

තලා ඇට ඉවත් කළ අළුත් නෙල්ලි පලම් සියයයි.
තිප්පිලි කුඩව එකයි
වළඟ සාල්
ගම්මිරිස්
යවාස
තිප්පිලි මුල්
කල්ලිප්පාක්කු
සිවිය මුල්
රත්නිවුල්
වැල්මදට
ඵලවාලුකා
ලෝධ්‍රපොතු යන මේවා පලම් බැගිනි.
කොට්ටන්
වෙනිවැල්ගැට (දරුහරිද්‍රා)
දේවදර
සුදු හීන් ඉරමුසු
කළු මහ ඉරමුසු
කලාඳුරු
කෙළිඳ ඇට

කෙළිඳ ඇට යන මේවා පලම් භාගය බැගිනි.
අලුත් නාමල් රේණු පලම් හතරයි.

මෙ හැම එකට තලා බඳුනක ලා ජලය ද්‍රෝණ දෙකක් වත්කර ද්‍රෝණයට සිඳුවා පෙරාගන්න.

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :— වියලි මිදි තම්බාගත් යූෂ ආඪක දෙකයි (නැලි අටයි) ශුද්ධ ශර්කරා තුලා දෙකයි. (පලම් දෙසියයි.) අලුත් මීපැණි ප්‍රස්ථ භාගයයි. (පලම් අටයි) කුරුඳු පොතු, එන්සාල්, තේජපත්‍ර, කලාඳුරු අල, සැවැන්දරා මුල්, කරුංගා පුවක්, නාමල් රේණු යන මේවා කලන් තුන බැගින් ගෙන කුඩුකර ගන්න.

ශර්කරා හා ගිතෙල් මිශ්‍රකොට ගා අගිල් දුම් ගසා, සකස් කරගත් සන්ධාන භාජනයකට පිළියෙල කර ගත් කෂායත්, සියලුම ප්‍රක්ෂේප ද්‍රව්‍යයත් දමා කලතා බඳුන වසා සුදුසු තැන සන්ධානය පිණිස තබන්න. සන්ධාන කාලය මාසය යි.

විශේෂයෙන් සැලකිය යුත්තේ — වියලි මිදි ආඪක දෙකක් (පලම් 128) ගෙන ජලය ආඪක අටක් (නැළි 32) දමා හතරින් එකට සිඳුවා පෙරා සන්ධානයට යෙදිය යුතු ය.

ගුණ :— රුචිකරයි. අර්ශස්, ග්‍රහණි, ආනාහ, උදර රෝග, ජ්වර, හෘද් රෝග, පාණ්ඩු, ශෝථ, ගුල්ම, කාස, කඵාමය යන රෝග නසයි. මල මූත්‍ර ප්‍රවර්තක යි. දෝෂ ජනිත වලි-පලිත බලිත (තව්වය පෑදීම) දුරල යි.

7. යෝග නාමය :— **කිරාතාදි අරිෂ්ටය.**

යෝගය :—

විරතා	තෝලා 20	යි.	(ග්‍රෑ: 240 යි.)
නිම්බ	තෝලා 5	යි.	(ග්‍රෑ: 60 යි.)
චිත්‍රක	තෝලා 2 1/2	යි.	(ග්‍රෑ: 30 යි.)
ගුඩුචි	තෝලා 2 1/2	යි.	(ග්‍රෑ: 30 යි.)
සුදර්ශන (පද්මගුඩුචි)	තෝලා 20	යි.	(ග්‍රෑ: 240 යි.)
වාසා	තෝලා 2 1/2	යි.	(ග්‍රෑ: 30 යි.)
සප්තපර්ණී	තෝලා 5	යි.	(ග්‍රෑ: 60 යි.)
ත්‍රිඵලා	තෝලා 15	යි.	(ග්‍රෑ: 180 යි.)

පද්ම ගුඩුචි අභාවයෙහි ගුඩුචි යොදන්නේ ය.

සංස්කරණය :— වතුර සේරු 12 — සේරු 3 ට (රා: 24 රා. 6) සිඳුවා පෙරා නිවුනාට පසු සීනි සේරු 2 1/2 ක් දිය කරන්න.

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—
අතිවිෂා
කර්කටකශෘංගී
මහ එන්සාල්
නාමල් රේණු
වළගසාල්
කුරුඳුපොතු
තේජපත්‍ර
ඉඟුරු
තෝලා 1 බැගිනි. (ග්‍රෑ: 12.)

	ධාතකී	පල 2 යි.	(ග්‍රෑ: 120 යි.)
	ද්‍රාක්ෂා	පල 2 යි.	(ග්‍රෑ: 120 යි.)

අරිෂ්ට පරිභාෂාව අනුව සාද ගන්නේ ය.

ප්‍රයෝග :— විශේෂයෙන් විෂමජ්වර ජීර්ණ ජ්වර නාශක යි.

මාත්‍රාව :— තෝලා 1 — 2 (මි: ලි: 12 — 24) දක්වා ආහාරයට පසු.

8.. යෝග නාමය :— **කුටජාද්‍යරිෂ්ටය.**

යෝගය :—	කෙළිඳ මුලේපොතු	තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)
	මුද්දිරප්පලම්	පලම්	50 යි.	(ග්‍රෑ: 3000 යි.)
	මීමල්	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	ඇද්දෙමට ගෙඩි(අභාවයෙහි පොතු)	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	ජලය	ද්‍රෝණ	4 යි.	(ලී: 61.44 යි.)
	ගුඩ	තුලා	1 යි.	(ග්‍රෑ: 1200 යි.)
ප්‍රක්ෂෙප ද්‍රව්‍ය :—	ධාතකී	පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මදක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— ජ්වර නසයි. අග්නිය දල්වයි. අසාධ්‍ය ග්‍රහණි රෝග නසයි. විශේෂයෙන් රක්තාතිසාර සහ ප්‍රවාහිකා නස යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

9. යෝග නාමය :— **ඛදිරාරිෂ්ටය.**

යෝගය :—	රත්කිහිරි	(තුලා 1/2)	පලම්	50 යි.	(ග්‍රෑ: 3000 යි.)
	දේවදර	(තුලා 1/2)	පලම්	50 යි.	(ග්‍රෑ: 3000 යි.)
	බාකුචි		පලම්	12 යි.	(ග්‍රෑ: 720 යි.)
	දරුහරිද්‍රා		පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
	තිපල් (මිලිතව)		පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
	ජලය		*ද්‍රෝණ	8 යි.	(ලී: 122.88)
	මීපැණි		තුලා	2 යි.	(ග්‍රෑ: 12000 යි.)
	ශර්කරා		තුලා	1 යි.	(ග්‍රෑ: 6000 යි.)
ප්‍රක්ෂෙප ද්‍රව්‍ය :—	ධාතකී		පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
	කපුකිනිස්ස ඇට				
	නාමල් රේණු				
	සාදික්කා				
	කරාබු				
	හීන් එන්සාල්				
	හීන් කුරුඳු පොතු				
	තේජපත්‍ර		පලම්	1 බැගින්.	(ග්‍රෑ: 60.)
	තිප්පිලි		පලම්	4 යි.	(ග්‍රෑ: 240)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා අට එකට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මදක් තලා පිළියෙල කර ගත් ප්‍රක්ෂෙප ද්‍රව්‍ය හා මීපැණි කෂායෙහි බහා, යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— මහාකුෂ්ඨ, හෘද් රෝග, පාණ්ඩු රෝග, අර්බුද, ගුල්ම, ග්‍රන්ථි, කෘමි. කාස.ශ්වාස. ප්ලීහ. උදර නසයි. විශේෂයෙන් සියළු කුෂ්ට නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.
*මෙහි ජලය දෙගුණ කිරීම ආයුර්වේද සංග්‍රහය නියමය වේ.

10. යෝග නාමය :— **ඛර්ජුරාරිෂ්ටය.**

යෝගය :—	රට ඉඳි	ප්‍රස්ථ	5 යි.	(ග්‍රෑ: 4800 යි.)
	ජලය	ද්‍රෝණ	1 යි.	(ලී: 15.36)

(ද්‍රෝණ 1/4 ක් පමණ හිඳී යන තෙක් තම්බා පෙරාගත යුතු ය.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	හපුෂා (ප්‍ර. නි. ගම්මිරිස්)	තෝලා	35 යි.	(ග්‍රෑ: 420 යි.)
	ධාතකී	තෝලා	35 යි.	(ග්‍රෑ: 420 යි.)

සංස්කරණය :— පොතේ කිසි සඳහන් නැත. ගුඩ තුලා 1/2 ක් දැමීම සුදුසු ය. (ග්‍රෑ: 3000 යි.)

සන්ධාන කාලය :— දින 14 යි.

ප්‍රයෝග :— ක්ෂය රෝග, පාණ්ඩු, ශෝථ රෝග සඳහා යෙදේ.

සැ: යු:— ග්‍රන්ථගත යෝගයෙහි ගුඩ සඳහන් නැත. එහෙත් ''ක්වාථ සමං ගුඩං'' යන අරිෂ්ට නිර්මාණ පරිභාෂාව අනුව මෙබඳු තීරණයක් ගන්නා ලදී. ද්‍රාක්ෂා, ඛර්ජුර, ආදි ඵල ශර්කරා අධික ද්‍රව්‍යයන්ගෙන් අරිෂ්ට ආසව නිර්මාණයේ දී ශර්කරා ආදි මධුර පදර්ථ පාරිභාෂික නියමයන්ට අඩු ප්‍රමාණයෙන් යෙදිය යුතු ය යනු ආචාර්ය නියමය වේ.

11. යෝග නාමය :— **ජීරකාද්‍යරිෂ්ටය.**

යෝගය :—	සුදුදුරු	තුලා	2 යි.	(ග්‍රෑ: 12000 යි.)
	ජලය	ද්‍රෝණ	8 යි.	(ලී: 122.88 යි.)
	ගුඩ	තුලා	3 යි.	(ග්‍රෑ: 18000 යි.)
ප්‍රක්ෂෙප ද්‍රව්‍ය :—	ධාතකී	පලම්	16 යි.	(ග්‍රෑ: 960 යි.)
	වියලි ඉඟුරු	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	සාදික්කා			
	කලාදුරු			
	චතුර්ජාත (ප්‍රත්‍යෙකව)			
	අසමෝදගම්			
	කපුකිනිස්ස ඇට			
	කරාබු	පලම්	1 බැගින්,	(ග්‍රෑ: 60)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා ද්‍රෝණ 2 ට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— සූතිකා රෝග නසයි. කල්ගිය ග්‍රහණි, අතිසාරයට විශේෂයෙන් ගුණ යි. අග්නි දීප්තිකර යි. අග්නි මාන්ද්‍ය රෝග නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, යොග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

12. යෝග නාමය :— **තක්‍රාරිෂ්ටය (1)**

යෝගය :—	අසමෝදගම්	පලං	3 යි.	(ග්‍රෑ: 180 යි.)
	අරළු	පලං	3 යි.	(ග්‍රෑ: 180 යි.)
	ගම්මිරිස්	පලං	3 යි.	(ග්‍රෑ: 180 යි.)
	නෙල්ලි	පලං	3 යි.	(ග්‍රෑ: 180 යි.)
	ලුණු පස් වර්ගය එකින් පලම බැගින්			
	මෝරු	ආඪක	1 යි.	(ලී: 3.84 යි.)

සංස්කරණය :— ඉහත කී ද්‍රව්‍ය සුණුකොට මෝරු සමග කලතා යෝග්‍ය බඳුනෙක්හි ලා සිව් දිනක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— අග්නිදීපන යි. ශෝථ, ගුල්ම, අර්ශස්, ක්‍රිමි, මෙහ, උදර යන රෝග නස යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

13. යෝග නාමය :— **තක්‍රාරිෂ්ටය (2)**

යෝගය :—
හබුෂා (ගම්මිරිස් ප්‍රතිනිධි)
කුංචිකා (උළුහාල්)
කොත්තමල්ලි
සුදුදුරු
කාරවි (කළුදුරු)
හිං අසමෝදගම්
ශඨී
තිප්පිලි
තිප්පිලි මුල්
රත්නිටුල්
ගජතිප්පිලි
මහ අසමෝදගම්

යථා යෝග්‍ය ප්‍රමාණයක් ගෙන මෝරු, ද්‍රව්‍ය මෙන් සොළොස් ගුණයකි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා, නියමිත මෝරුවෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා ඇඹුල්, කුළු යන රස දෙක මැනවින් ව්‍යක්ත බවට පැමිණි කල්හි පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— මුඛප්‍රිය වූ මේ තක්‍රාරිෂ්ටය දීපන, පාචන, වාත—කඵානුලෝමන ය. ගුද ශෝථය හා වේදනාව නසා ශරීර වර්ධනය ද ඇති කෙරේ.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, ආහාර ගන්නා කාලයේ, පළමු කොට වරක් ද, ආහාර අවසානයේ දී හෝ පිපාසය ඇති වූ විට වරක් ද යි, යන පිළිවෙලට දවසට තුන් වරක් සුදුසු මාත්‍රාවකින් යථා යෝග්‍ය පරිදි පානය කළ යුතු යි.

14. **යෝග නාමය :—** **දන්ත්‍යාරිෂ්ටය.**

යෝගය :—

දසමුල් (ප්‍රත්‍යෙකව)
දන්ත මුල්
රත්නිවුල් — පලං 1 බැගින්, (ගු: 60)
අරළු
බුළු
නෙල්ලි — යන මේවා සම සමව පල 1 බැගින්, (ගු: 60.)
ගුඩ තුලා 1 යි. (ගු: 6000 යි.)
ජලය ද්‍රෝණ 1 යි. (ලී: 15.36)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා 1/4 ට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා යෝග්‍ය බඳුනෙක්හි ලා කට මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේය.

ප්‍රයෝග :— අර්ශසට විශේෂ ගුණ යි. ග්‍රහණි, පාණ්ඩු, උදාවර්ත, අරුචි යන මේවායේ උපත වැළැකේ. ගින්න දල් වේ.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30 යි.) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

15. **යෝග නාමය :—** **දශමූලාරිෂ්ටය.**

යෝගය :—

ශාල පර්ණි
පෘශ්ණි පර්ණි
එළබටු මුල්
කටුවැල්බටු මුල්
හින් ගොකටු (නෙරෙංචි)
බෙලිමුල්
මිදි මුල්
තොටිල මුල්
පළොල් මුල්
ඇද්දෙමට මුල්

සිවිය මුල්
ජටාමාංස
ප්‍රියංගු (රුක්මල් ප්‍රතිනිධි)
ඉරමුසු
කළුදුරු
තිරස්සවාලු මුල්
වාල්මොළඟු
හින් අරත්ත
තිප්පිලි
පෙතිපුවක්

එකින් පලම 5 බැගින්, (ගු: 300)

රත්නෙවුල්	පලම්	25 යි.	(ගු: 1500)
පෞෂ්කර (සුවඳ කොට්ටම්)	පලම්	25 යි.	(ගු: 1500)
ලෝධ්‍ර	පලම	20 යි.	(ගු: 1200)
රසකිඳ	පලම	20 යි.	(ගු: 1200)
නෙල්ලි	පලම	16 යි.	(ගු: 960)
දුරාලභා (වැල්කහඹිලිය)	පලම	12 යි.	(ගු: 720)
රත්කිහිරිය	පලම්	8 යි.	(ගු: 480)
අසන (ගම්මාලු අරටු)	පලම්	8 යි.	(ගු: 480)
අරළු	පලම්	8 යි.	(ගු: 480)

කුෂ්ඨ (කොට්ටං)
වැල්මදට
දේවදර
වළහසාල්
වැල්මී
සිරිතේක්කු (භාර්ගී)

ශඨී (ඉඟුරු පියලි ප්‍රතිනිධි)
වියලි කහ
ශත පුෂ්ප
පද්මකාෂ්ඨ
නාමල් රේණු
කලාදුරු අල
කෙළිඳ සහල්
කකුළු සුඟු (කර්කටක ශෘංඨී)
ජීවක
ඍෂභක
මේද
මහාමේද
කාකෝලි
ක්ෂිර කාකෝලි
ඍද්ධි
වෘද්ධි — මේවා එකින් පලම් 2 (ගු: 120) බැගිනි.

දිවුල් මද
බුළු
සාරන මුල් පලම 2 බැගිනි. (ගු: 120)
ජලය ද්‍රව්‍ය මෙන් 8 ගුණයකි.

මුද්දිරප්පලම්	පලම	60 යි.	(ගු: 3600)
ජලය	පලම	240 යි.	
මීපැණි	පලම	32 යි.	
ගුඩ	පලම	400 යි.	
ධාතකී	පලම	30 යි.	(ගු: 1800)

ප්‍රක්ෂෙප ද්‍රව්‍ය :—

කපුකිනිස්ස ඇට
ජල = සුගන්ධබාලා (ප්‍රතිනිධි සැවැන්දරා)
සුදුහඳුන්

කුරුඳු පොතු
හින් එන්සාල්
තේජපත්‍ර

සාදික්කා		නාමල් රේණු	
කරාබු		තිප්පිලි —	පලම් 2 බැගින්. (ගු: 120)
කස්තුරි	ශාණ 1 යි. (ගු: 4)		

සංස්කරණය :— යෝගයෙහි සඳහන් පළමුවන කෂාය ද්‍රව්‍ය පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා සතර එකට සිඳුවා පෙරා ගන්න. (එනම් ද්‍රෝණ 8 – 2 ට සිඳුවා ගැනීම උචිත ය.) ඉන්පසු නියමිත මුද්දිරප්පලම් ගෙන ජලය පලං 240 ක් දමා පලං 160 ට සිඳුවා පෙරා, (ජලය රාත්තලේ බෝතල 30 ක් දමා බෝතල 22 1/2 ට සිඳවා ගත යුතු යි.

කෂාය දෙකම මිශ්‍රකොට සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා, මදක් තලා පිළියෙල කර ගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය (කස්තුරි හැර) කෂායෙහි ලා, යෝග්‍ය බඳුනෙක්හි බහා කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්න. ඉන්පසු කස්තුරි සුරා සාරයෙන් අඹරා දියකර පසුව අරිෂ්ටයට මිශ්‍ර කරන්නේ ය.

ප්‍රයෝග :— ග්‍රහණී, අරුචි, ශූල, කාස, භගන්දර, වාතව්‍යාධි, ක්ෂය, වමන, පාණ්ඩු, කාමලා, කුෂ්ඨ, අර්ශස්, ප්‍රමේහ, මන්දග්නි, උදර රෝග, ශර්කරා, අශ්මරී, මූත්‍රකෘච්ඡ්‍ර, ධාතු ක්ෂය ආදි රෝග නසයි. කෘශ අය තර කරයි. වඳ බව නැති කරයි. තේජස, වීර්‍ය්‍ය සහ ශුක්‍ර බලය වඩයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

සැ: යු :— අරිෂ්ටය පෙරා ගත් පසු ඉහිනි ඇට පෙති ගසා කපා දමා පිරිසිදු කොට තබා ගන්න.

16. යෝග නාමය :— **දේවදර්වරිෂ්ටය.**

යෝගය :—

දේවදර	පලම් 50 යි.	(ගු: 3000)	හින් අසමෝදගම්		
වංඇපල මුල්පොතු	පලම් 20 යි.	(ගු: 1200)	කෙළිඳපොතු		
වැල්මදට			සුදුහඳුන්		
කෙළිඳ ඇට			රසකිඳ		
දූත්ත අල			කටුකරෝසන		
තගර (තුවරලා)			රත්නිවුල්	පලම් 8 බැගින්,	(ගු: 480)
දෙකසා			ජලය	ද්‍රෝණ 16 යි.	(ලී: 245.76)
හින් අරත්ත			මීපැණි	පලම් 300 යි.	(ගු: 18000)
වළහසාල්					
කලාඳුරු අල					
මහරි පොතු					
රත්කිහිරි					
කුඹුක්පොතු	පලම් 10 බැගින්.	(ගු: 600)			

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—

ධාතකී	පලම් 16 යි.	(ගු: 960)	ප්‍රියංගු	පලම් 4 යි.	(ගු: 240)
වෙයාෂ (මිලිතව)	පලම් 2 යි.	(ගු: 120)	නාමල් රේණු	පලම් 2 යි.	(ගු: 120)
ත්‍රිජාත (මිලිතව)	පලම් 4 යි.	(ගු: 240)			

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා, අටඑකට (8—1 ට) සිඳුවා පෙරා තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා මීපැණි ද මුසුකොට යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ, මසක් තබා පෙරා ගන්න.

ප්‍රයෝග :— උග්‍ර ප්‍රමේහ සඳහා විශේෂයෙන් ගුණ යි. වාතරෝග, ග්‍රහණී, අර්ශස්, මූත්‍රකෘච්ඡ්‍ර, පාණ්ඩු, කුෂ්ඨ නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

17. යෝග නාමය :— **ද්‍රාක්ෂාරිෂ්ටය.**

යෝගය :—

මුද්දිරප්පලම්	පලම් 50 යි.	(ගු: 3000 යි.)
ජලය	ද්‍රෝණ 2 යි.	(ලී: 30.72)
ගුඩ	තුලා 2 යි.	(ගු: 12000 යි.)
ධාතකී	පලම් 10 යි.	(ගු: 600 යි.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—

හින් කුරුඳු පොතු	ප්‍රියංගු (ප්‍රතිනිධි-රුක්මල්)
හින් එන්සාල්	ගම්මිරිස්
තේජපත්‍ර	තිප්පිලි
නාමල් රේණු	වළහසාල්

යන මේවා එකින් පලම් 1 බැගින්, (ගු: 60)

සංස්කරණය :— මුද්දිරප්පලම් නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු, ගුඩ තුලා 1 1/2 ක් සහ ධාතකී පලම් 07 ක් සෑහෙයි. දියකර නැවත පෙරා, මදක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— උරඃක්ෂත, ක්ෂය, කාස, ශ්වාස, ගල රෝග නසයි. ශරීර බල වඩයි. මලශෝධක යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30 යි) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

18. යෝග නාමය :— **ධාත්‍ර්‍යරිෂ්ටය.**

යෝගය :— නෙල්ලි ගෙඩි 2000 ක යුෂ. ඒ යුෂයෙන් 1/8 ක් මීපැණි.

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	තිප්පිලි	පලම් 2 යි.	(ග්‍රෑ: 120 යි.)
	ශර්කරා (තුලා 1/2)	පලම් 50 යි.	(ග්‍රෑ: 3000 යි.)

සංස්කරණය :— පැසුණු අමු නෙල්ලි කොටා මිරිකා යුෂ ගෙන එයට නියමිත මීපැණි සහ මදක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය එහි බහා ගුඩ ද මිශ්‍ර කර, යෝග්‍ය බඳුනෙක්හි ලා, කට මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— කාමලා, හෘදය රෝග, අජීර්ණ, පාණ්ඩු, වාත රක්ත, විෂමජ්වර, කාස, අරුචි, ශ්වාස නාශ යි.

මාත්‍රාව :— :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30 යි.) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

19. යෝග නාමය :— **නිම්බාරිෂ්ටය. (1)**

යෝගය :—	කොහොඹ පොතු	රාත්තල්	75 යි.
	ජලය	බෝතල	912 යි.
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	වළහසාල්	රාත්තල්	4 යි.
	මී පැණි	බෝතල	48 යි.
	සීනි	රාත්තල්	129 යි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය ගෙන මදක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා (228) පෙරා සිසිල් වූ පසු සීනි දියකර නැවත පෙරා මදක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා මීපැණි ද මිශ්‍රකොට යෝග්‍ය බඳුනෙක්හි ලා, කට මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— ක්‍රිමි රෝග, රක්තජ රෝග, ශීර්ෂ රෝග සඳහා යොදනු ලැබේ. විෂමජ්වරයට විශේෂ ගුණයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි:ලි: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතුයි.

20. යෝග නාමය :— **නිම්බාරිෂ්ටය. (2)**

යෝගය :—
කොහොඹ පොතු,
අරළු,
බුළු,
නෙල්ලි

මෙවා රත්තල් 24 බැගින් වතුර සේරු 384 සේරු 96 ට සිඳ පෙරා සිසිල් වූ පසු ගුඩ රාත්තල් 72 ක් ද, මීපැණි බෝතල් 15 ක් ද, මිශ්‍ර කර අරිෂ්ටය සාද ගන්න.

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—
අරළු,
බුළු,
නෙල්ලි,

රාත්තල් 2 1/4 බැගින් චූර්ණකර යොද අරිෂ්ටය සාද ගන්න.

ප්‍රයෝග :— ක්‍රිමි රෝග, චර්ම රෝග, රක්තජ රෝග හා වාත රක්තයට විශේෂ යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

21. යෝග නාමය :— **පර්පටාද්‍යරිෂ්ටය.**

යෝගය :—	පත්පාඩගම් (පර්පට)	තුලා 1 යි.	(ග්‍රෑ: 6000 යි.)
	ජලය	ද්‍රෝණ 4 යි.	(ලී: 61.44 යි.)
	ගුඩ	තුලා 2 යි.	(ග්‍රෑ: 12000 යි.)
	ධාතකී	පලම් 16 යි.	(ග්‍රෑ: 960).

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—
රසකිඳ
කලාදුරු අල
වෙනිවැල්ගැට
දේවදර
කටුවැල්බටු
දුරාලභා (කහඹිලිය)
සිවිය
රත්නෙටොල්
වළහසාල්
ත්‍රිකටු (ප්‍රත්‍යෙකව)

පලම් 1 බැගිනි. (ග්‍රෑ: 60)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මදක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මදක් තලා පිළියෙල කර ගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කට මැටි බැඳ මසක් තබා පෙරා ගන්න.

ප්‍රයෝග :— ජ්වර, පාණ්ඩු, ගුල්ම, උදර, අෂ්ඨීලා, කාමලා, හලීමක, ප්ලීහ වෘද්ධි, යකෘද්වෘද්ධි, රක්තජ රෝග, ශෝථ සහ සියළු විෂම ජ්වර නාසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට.

22. යෝග නාමය :— **පාර්ථාද්‍යාරිෂ්ටය (අර්ජුනාරිෂ්ටය)**

යෝගය :—	මේරූ කුඹුක් පොතු	තුලා 1 යි.	(ග්‍රෑ: 6000 යි.)
	මුද්දරප්පලම්	තුලා 1/2 යි.	(ග්‍රෑ: 3000 යි.)
	මීමල්	පලම් 20 යි.	(ග්‍රෑ: 1200 යි.)
	ජලය	ද්‍රෝණ 4 යි.	(ග්‍රෑ: 61.44)
	ගුඩ	තුලා 1 යි.	(ග්‍රෑ: 6000 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	මලිත මල් (ධාතකී)	පලම් 20 යි.	(ග්‍රෑ: 1200 යි.)

සංස්කරණය — යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— හෘදය සහ ඵුප්ඵුස රෝග නසයි. බලය සහ වීර්‍ය්‍ය වර්ධනය කෙරේ.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

23. යෝග නාමය :— **පුනර්නවාද්‍යාරිෂ්ටය.**

යෝගය :—	සුදුසාරණ		වංඇපල
	රතුසාරණ		රසකිඳ
	බැවිල		රත්නෙටොල්
	නාගබලා		කටුවැල්බටු
	දියමිත්ත	පලම් 3 බැගින්.	(ග්‍රෑ: 180)
	ජලය	ද්‍රෝණ 4 යි.	(ලී: 61.44 යි.)
	ගුඩ	තුලා 2 යි.	(ග්‍රෑ: 12000 යි.)
	මීපැණි	ප්‍රස්ථ 1 යි.	(ග්‍රෑ: 960 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	නාමල් රේණු		ගම්මිරිස්
	කුරුඳුපොතු		ඉරිවේරිය
	එන්සාල්		තේජපත්‍ර — පලම් 1/2 බැගින්. (ග්‍රෑ: 30)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා මීපැණි ද මිශ්‍ර කොට යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— හෘද් රෝග, පාණ්ඩු රෝග, උග්‍ර ශෝථ, ප්ලීහ වෘද්ධි, ජ්වර, අරුචි, මේහ, ගුල්ම, භගන්දර, උදර, කාස, ශ්වාස, ග්‍රහණිදෝෂ, කුෂ්ඨ, කණ්ඩු, රක්තාදි ධාතු ගත වායු, මල—මූත්‍ර බද්ධ, හික්කා, කිලාස, හලීමක, යන රෝග නසයි. බල, වර්ණ, ආයු, තේජස්, ඕජස්, වඩයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30 යි.) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

24. යෝග නාමය :— **ප්‍රසාරණී සන්ධානය.**

යෝගය :—	ප්‍රසාරණී දඬු	සේරු 8 යි.	—	((ග්‍රෑ: 7680 යි.)
	ජලය	සේරු 64 යි.	—	(ලී: 61.44 යි.)
	ශේෂය	සේරු 16 යි.	—	(ලී: 15.36)
	ගුඩ	සේරු 1 යි.	—	(ග්‍රෑ: 960 යි.)
	ශුද්ධ කළ සුදුලූනු	සේරු 1 යි.	—	(ග්‍රෑ: 960 යි.)

මිශ්‍රකොට මුඛබන්ධ කොට සතියක් තබා පෙරා ඉන්පසු, තිප්පිලි, තිප්පිලි මුල්, සිවිය මුල්, රත්නිටුල්, ඉඟුරු මෙම ද්‍රව්‍ය චූර්ණය මිලිතව සේරු 1/2 ක් මිශ්‍රකොට තබා ගන්නේ ය.

ප්‍රයෝග :— ආමවාත රෝගයෙහි ශ්‍රේෂ්ඨ ය.

25. යෝග නාමය :— **බබ්බුලාරිෂ්ටය.**

යෝගය :—	බබ්බුල (සිනිද්ද පොතු ප්‍රතිනිධි)	පලම්	200 යි.	(ග්‍රෑ: 12000 යි.)
	ජලය	ද්‍රෝණ	4 යි.	(: 61.44)
	ගුඩ	පලම්	300 යි.	(ග්‍රෑ: 18000 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	ධාතකී	පලම්	16 යි.	(ග්‍රෑ: 960 යි.)
	තිප්පිලි	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	සාදික්කා		තේජපත්‍ර	
	කපුකිනිස්ස		නාමල් රේණු	
	කුරුඳු පොතු		කරාබු	
	හීන්එන්සාල්		ගම්මිරිස් — පලම් 1 බැගින්.	(ග්‍රෑ: 60)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා, සිසිල් වූ පසු, ගුඩ දියකර නැවත පෙරා මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා, යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ, මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— ක්ෂය, කුෂ්ඨ, අතිසාර, ප්‍රමේහ, ශ්වාස, කාස නාශක යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

26. යෝග නාමය :— **බලාරිෂ්ටය.**

යෝගය :—	බැබිල මුල්	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)
	අමුක්කරා අල	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)
	ජලය	ද්‍රෝණ	8 යි.	(ලි: 122.88 යි.)
	ගුඩ	පලම්	300 යි.	(ග්‍රෑ: 18000 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	ධාතකී	පලම්	16 යි.	(ග්‍රෑ: 960 යි.)
	ක්ෂිරකාකොලි	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	එරඬු මුල්	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	හින්අරත්ත			
	හින් එන්සාල්			
	ප්‍රසාරණී			
	සැවැන්දරා (ප්‍රතිනිධි)			
	හින් ගොකටු	පලම්	1 බැගින්.	(ග්‍රෑ: 60)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කට මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— විශේෂයෙන් අසාධ්‍ය වාතරෝග නසයි. ශරීරබල-පුෂ්ටි වඩයි. අග්නි දීප්ති කරයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 දක්වා, (මි: ලි: 15 — 30) යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

27. යෝග නාමය :— **මුස්තකාරිෂ්ටය.**

යෝගය :—	කලාදුරු අල	පලම්	200 යි.	(ග්‍රෑ: 12000 යි.)
	*ජලය	ද්‍රෝණ	4 යි.	(ලි: 61.44 යි.)
	ගුඩ	පලම්	300 යි.	(ග්‍රෑ: 18000 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	ධාතකී	පලම්	16 යි.	(ග්‍රෑ: 960 යි.)
	අසමෝදගම්	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	වියලි ඉඟුරු	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	ගම්මිරිස්	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	කරාබු	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	උළුහාල්	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	රත්නෙටොල්	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	සුදුදුරු	පලම්	2 යි.	(ග්‍රෑ: 120 යි.)

*ජලය දෙගුණ කිරීමේ නියමය අනුගමනය කරන්නේ ය.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කට මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— අජීර්ණ, අග්නිමාන්ද්‍ය, දරුණු විසූචිකා, විවිධ ග්‍රහණී රෝග නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලි: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

28. යෝග නාමය :— **මෘතසංජීවනී සුරාව.**

යෝගය :—	අවුරුද්දක් පරණ වූ ගුඩ	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)
	බබුල පොතු	පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
	දෙළුම් පොතු			ශාලපර්ණී
	පාවට්ට මුල් හා පොතු			පෘෂ්ණිපර්ණී
	ඉඹුල් මැලියම්			එලබටු මුල්
	මහනිදිකුම්බා			කටුවැල්බටු
	අතිවිඩයම්			නෙරෙංචි
	අමුක්කරා			ගොන්කැකිරි අල
	දේවදර			මසන් (ඩෙබර)
	බෙලිමුල්			රත්නෙටොල්
	තොටිල් මුල්			(ශුද්ධ) වඳුරු මෑ ඇට
	පළොල් මුල්			සාරණ මුල්
		පලම්	10 බැගින්.	(ග්‍රෑ: 600)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :— කරුංකා පුවක් නැලි 2 යි. (ග්‍රෑ: 1920 යි.)

අත්තන මුල්
කරාබු
පද්මකාෂ්ඨ
සැවැන්දරා
සුදුහඳුන්
ශතපුෂ්ප
අසමෝදගම්
ගම්මිරිස්
සුදුදුරු
කළුදුරු
ජටාමාංස
කුරුඳුපොතු
කර්දමුංගු
සාදික්කා
කලාදුරු අල
ග්‍රන්ථි පර්ණි
වියලි ඉඟුරු
උළුහාල්
මෙෂශෘංගි (මැඩහඟු)
රත්හඳුන්
ශටී (අරන්කහ)

පලම් 2 බැගින්. (ග්‍රෑ: 120)

සංස්කරණය :— ජලය ද්‍රෝණ 10 කට (ලීටර් 153.60) ගුඩ දියකර පෙරා ගන්න. යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා ගුඩ මිශ්‍රිත ජලයට බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ දින සොළසක් තබන්න. දහසය (16) වැනි දින මුඛය හැර, පිරිසිදුව ගෙන මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය පොට්ටනි බැඳ එහි බහා නැවත කඩ මැටි බැඳ සිව් දිනක් තබන්න. පස්වැනි දින ඒ ආසවය පෙරා ගෙන මයූර යන්ත්‍රයෙන් මද්‍යසාර පෙරන ක්‍රමයට පෙරා ගන්නේ ය.

සැ: යු:— සමහරු මෙ යෝගයට මුද්දිරප්පලම් පලම් 100 ද, (ග්‍රෑ: 6000) ධාතකී පලම් 64 ද, (ග්‍රෑ: 3840) එකතු කරති.

ප්‍රයෝග :— බල, ආයු, මේධා, වර්ණ වඩන්නේ ය. අග්නි දීප්තිකර යි. දරුණු වූ සන්නිපාත උණෙහි, විසූචිකාවෙහි ඉතා ශ්‍රෙෂ්ඨ යි. (ඉහත කී රෝගයන්හි වරින් වර ශරිරය ශීත වූ කල්හි මෙය යොදන්නේ ය.) ආරෝග්‍ය කර යි. දේහදාර්ඪ්‍යකර යි. බල වඩයි. මේධා, අග්නි, ස්මෘති, වීර්‍ය, ශුක්‍ර වඩයි. වාත නසයි. පුෂ්ටි කර යි.

මාත්‍රාව :— ඩරුම් 1 — 2 දක්වා. ජලය අවුන්සයක් සමග යොදන්නේ ය.

29. යෝග නාමය :— **රෝහිතකාරිෂ්ටය. (I)**

යෝගය :—

රෝහිතක පොතු	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)
ජලය	ද්‍රෝණ	4 යි.	(ග්‍රෑ: 61.44 යි.)
ගුඩ	පලම්	200 යි.	(ග්‍රෑ: 12000 යි.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—

ධාතකී	පලම්	16 යි.	(ග්‍රෑ: 960 යි.)

පංචකෝල
ත්‍රිජාත
ත්‍රිඵලා — ප්‍රත්‍යෙකව පලම් 1 බැගින්. (ග්‍රෑ: 60)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා, පෙරා, සිසිල් වූ පසු, ගුඩ දියකර නැවත පෙරා, මඳක් තලා පිළියෙල කර ගත් ප්‍රක්ෂෙප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කඩ මැටි බැඳ, මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— සියළු උදර රෝග හා උදර රුජා නසයි. ප්ලීහ, ගුල්ම, අෂ්ඨීලා, ග්‍රහණී, අර්ශස්, කාමලා, කුෂ්ඨ, ශෝථ, අරුචි නස යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

30. යෝග නාමය :— **රෝහිතකාරිෂ්ටය. (II)**

යෝගය :—

රෝහිතක පොතු	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)
ජලය	ද්‍රෝණ	1 යි.	(ලී: 15.36 යි.)
ගුඩ	පලම්	100 යි.	(ග්‍රෑ: 6000 යි.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :— අරළු, බුළු, නෙල්ලි, තිප්පිලි, තිප්පිලිමුල්, සිවිය මුල්, රත්නිටුල්, ඉඟුරු, කර්ෂ 4 (ග්‍රෑ: 60) බැගින් ධාතකී කර්ෂ 12 යි. (ග්‍රෑ: 180 යි.) ජලය දෙගුණ කරන්නේ ය.

සංස්කරණය :— ජලය ද්‍රෝණ 1 — 1/4 ට (ලී: 15.36 — ලී: 3.84) සිද පෙරා අරිෂ්ට සංස්කරණ පරිභාෂාවෙනි.

31. යෝග නාමය :— **වාසකාරිෂ්ටය. (1)**

යෝගය :— වාසා ස්වරස — මෘතසංජීවනී සුරා සමභාගව.

සංස්කරණය :— පිරිසිදු ආටතෝඩා පංචාංගය කොටා නියමිත ප්‍රමාණ යුෂ ගෙන ඒ යුෂ ප්‍රමාණ මෘත සංජීවනී සුරා සමඟ මිශ්‍ර කර යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් නිශ්චලව තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— ශ්වාස, රත්පිත්, කාස, ගලරෝග, උරාක්ෂත නාශක යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

32. යෝග නාමය :— **ලවංගාසවය.**

යෝගය :— හරාබු නැටි, තිප්පිලි, වැල්මදට, ඒලවාලුක, මේවා පලම් දෙක බැගින් ගෙන දිය සතර ද්‍රෝණයක් දමා කකාරා හතරින් එකට සිඳ පෙරා ගන්න.

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :— උක් හකුරු පලම් දෙසියයි,
සන්ධාන කාලය මාස එකයි.

ප්‍රයෝග :— අර්ශස් නසයි. ග්‍රහණී පාණ්ඩු, හෘද් රෝග, ප්ලීහ වෘද්ධි, ගුල්ම, උදර රෝග, අරුචි, කුෂ්ඨ ශෝථ, සුව කෙරෙයි. ක්ෂය කාමලා, ශ්විත්‍ර, කෘමි රෝග, ග්‍රන්ථි, අර්බුද, භංග, රාජයක්ෂම ජනිත කරයි ජ්වර යන රෝග සමනය කරයි. බල, වර්ණ, අග්නි, වර්ධක යි.

මාත්‍රාව :— අවුන්ස 2/1—1 (මි:ලී: 15-30) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

33. යෝග නාමය :— **විඩංගාරිෂ්ටය.**

යෝගය :—
වළගසාල්
තිප්පිලි මුල්
අරත්ත අල
කෙළිඳ පොතු
කෙළිඳ ඇට
දියමිත්ත
එලවාලුක
නෙල්ලි — පලම් 5 බැගින්. (ග්‍රෑ: 300)

	ජලය	ද්‍රෝණ	8 යි.	(ලී: 122.88 යි.)
	මීපැණි	පලම්	300 යි.	(ග්‍රෑ: 18000 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	ධාතකී	පලම්	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
	ත්‍රිජාත (මිලිතව)	පලම	2 යි.	(ග්‍රෑ: 120 යි.)
	ප්‍රියංගු (ප්‍රතිනිධි රුක්මල්)			
	කොබෝලීල පොතු			
	ලොධ්‍ර පොතු	පලම	1	බැගින්. (ග්‍රෑ: 60)
	ව්‍යොෂ (මිලිතව)	පලම්	8 යි.	(ග්‍රෑ: 480 යි.)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා (අට) එකට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා මී පැණි ද මුසු කොට, මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා කඩ මැටි බැඳ මසක් තබා, පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— දරුණු විද්‍රධි, ඌරුස්තම්භ, අශ්මරී, ප්‍රමේහ, ප්‍රත්‍යෂ්ඨීලා, භගන්දර, ගණ්ඩමාලා, හනුස්තම්භ යන රෝග නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

34. යෝග නාමය :— **ශිරීෂාරිෂ්ටය.**

යෝගය :—	ශිරීෂ (හුරිමාර) පොතු	පලම	50 යි.	(ග්‍රෑ: 3000 යි.)
	ජලය	ද්‍රෝණ	2 යි.	(ලී: 30.72 යි.)
	ගුඩ	තුලා	2 යි.	(ග්‍රෑ: 12000 යි.)

ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—
තිප්පිලි
ප්‍රියඞගු
කොට්ටං
හීන් එන්සාල්
අවරිය මුල්
නාමල් රේණු
කහ
වෙනිවැල්ගැට
ඉඟුරු — පලං 1 බැගින්. (ග්‍රෑ: 60)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය පිරිසිදුව ගෙන මඳක් තලා නියමිත ජලය බහා පාදයට සිඳුවා, පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා, මඳක් තලා පිළියෙල කරගත්, ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා කඩමැටි බැඳ, මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— විෂෙන් ඇතිවන සියළු රෝග නසයි. ව්‍රණ රෝගීන්ට හිත යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි, සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

35. යෝග නාමය :— **සාරස්වතාරිෂ්ටය.**

යෝගය :— පුසේ නැකත හා යෝගය ඇති, බ්‍රහ්ම මුහුර්තයෙන් ගත්,

බ්‍රාහ්මී (ලුණුවිල)	පලම	20 යි.	(ග්‍රෑ: 1200 යි.)
පුසේ නැකතින් ගත් හාතාවාරිය	පලම	5 යි.	(ග්‍රෑ: 300 යි.)
කිරිබද්ද	පලම	5 යි.	(ග්‍රෑ: 300 යි.)
අරළු	පලම	5 යි.	(ග්‍රෑ: 300 යි.)
සැවැන්දරා	පලම	5 යි.	(ග්‍රෑ: 300 යි.)
අමු ඉඟුරු	පලම	5 යි.	(ග්‍රෑ: 300 යි.)
සතකුප්ප	පලම	5 යි.	(ග්‍රෑ: 300 යි.)
ජලය	ද්‍රෝණ	1 යි.	(ලී: 15.36 යි.)

	මීපැණි	පලම්	10 යි.	(ග්‍රෑ: 600 යි.)
	උක් සීනි	පලම්	25 යි.	(ග්‍රෑ: 1500 යි.)
ප්‍රක්ෂේප ද්‍රව්‍ය :—	ධාතකී	පලම්	5 යි.	(ග්‍රෑ: 300 යි.)
	වාල්මොළඟු	පලම්	5 යි.	(ග්‍රෑ: 300 යි.)

ත්‍රිවෘත් (තිරස්සවාලු)
තිප්පිලි
කරාබු
වදකහ
කොට්ටං
කුරුඳු පොතු
අමුක්කරා
බුළු
රසකිඳ
හින් එන්සාල්
වළහසාල්
ස්වර්ණ භස්ම හෝ ස්වර්ණ තනුපත්‍ර

මේවා කලං 3 බැගින්. (ග්‍රෑ: 15)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල පිරිසිදුව ගෙන නියමිත ජලය බහා පාදයට සිඳුවා පෙරා සිසිල් වූ පසු ගුඩ දියකර නැවත පෙරා, මීපැණි ද මුසුකොට මඳක් තලා පිළියෙල කරගත් ප්‍රක්ෂේප ද්‍රව්‍ය කෂායෙහි බහා යෝග්‍ය බඳුනෙක්හි ලා, කට මැටි බැඳ මසක් තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— ආයුෂය, වීර්‍ය්‍යය, ස්මෘතිය, මේධා, බලය, කාන්තිය වඩයි. වාග් ශුද්ධිකර යි. හෘද්‍ය යි. ශ්‍රේෂ්ඨ රසායනයකි. බාල, තරුණ, මහලු, හැමට එක සේ හිත යි. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම උතුම් ඕජස් කරයකි. මෙය නිරන්තරයෙන් සේවනය කිරීමෙන්, ස්වරකාරක යි. භාෂණ දෝෂ නසයි. කටහඬ මිහිරි කරයි. රජස් ශුක්‍ර දෝෂ නස යි. දරුඵල ඇති කරයි. උමතු රෝගයට හිත යි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — 1 (මි: ලී: 15 — 30) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

සැ: යු:— ස්වර්ණ භස්ම අරිෂ්ටය පෙරූ පසු සංයෝග කරන්නේ ය.

දේශීය බස්ත ඛණ්ඩය

1. යෝග නාමය :— **පුහුල් බස්තය.**

යෝගය :—	ඉඟුරු ඉස්ම	බෝතල	1 යි.	
	දෙහි ඇඹුල්	බෝතල	1 යි.	
	පොල්පැණි	බෝතල	1 යි.	
	කිතුල්පැණි	බෝතල	1 යි.	
	යබර කුඩු	පලං	4 යි.	(ග්‍රෑ: 240 යි.)

සංස්කරණය :— පුහුල් ගෙඩියේ ඇස්ස කපා මදය තරමක් ඉවත් කර එහි ප්‍රක්ෂේපය බහා පියන වසා දින 3 ක් ලිප ළඟ තබාගෙන ඉක්බිති පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— පාණ්ඩු රෝගයෙහි අග්‍ර ය. (යබර භස්ම යෙදුව මනා ය.)

2. යෝග නාමය :— **රා බස්තය.**

යෝගය :—	ඉඟුරු	කලං	3 යි.	(ග්‍රෑ: 15 යි.)
	ගම්මිරිස්	කලං	3 යි.	(ග්‍රෑ: 15 යි.)
	දෙදුරු අසමෝද ශතපුෂ්ප	චූර්ණ කර		
	කොත්තමල්ලි	කලං	1	(ග්‍රෑ: 5) බැගින්
	යබොර සුණු (භස්ම)	කලං	12 යි.	(ග්‍රෑ: 60 යි.)

සංස්කරණය :— පුහුල් ගෙඩිය සාරා පොල් රා බෝතලයක් වත්කර, බෙහෙත් සුණු ලා, පියන් පත වසා පොළොවේ වළලා ඊ පිටින් වැලිවලින් වසා මිල්ල දරින් රාත්‍රියක් ගිනි කරණු. පසුව පෙරා ගත යුතු ය.

ප්‍රයෝග :— පාණ්ඩුවට ප්‍රත්‍යක්ෂ යි.

මාත්‍රාව :— මෙස හැඳි 2 දක්වා.

3. යෝග නාමය :— **එළු පිකුදු බස්තය**

යෝගය :— එළුවකුගේ පිකුදුවක් ගෙන සෝද ඉන්පසු වණ්ඩුවේ තම්බා, කැබලි කපා,

දෙදුරු
කරාබු
වසාවාසි
සාදික්කා
වළහසාල්
උළුහාල්
කරපිංචාකොළ
කුරුඳුපොතු
සූදුලූනු

මේවා කලං 1/2 බැගිනි. (ග්‍රෑ: 2.5)

පරණ සියඹලා බොර
සහිඳ ලුණු — කලං 2 බැගින් ගෙන

සංස්කරණය :— පිකුදු කරපිංචා කොළ යුෂින් තම්බා කල්ක ද්‍රව්‍ය චූර්ණය සමඟ අඹරා තෙල්ලි ගෙඩි පමණට ගුලිකර වියලා ගන්නේ ය.

සංස්කරණ විශේෂ :—
1. කරපිංචා කොළ යුෂින් තම්බා ඇඹරීම,
2. ඉරිවෙරිය යුෂින් තම්බා ඇඹරීම,
3. එරබදුකොළ යුෂින් තම්බා ඇඹරීම,
මේ අයුරින්ම හරක් පිකුදුවලින් ද සකස් කර ගන්නේ ය.

ප්‍රයෝග :— මාන්දම් ග්‍රහණියට විශිෂ්ට යි.

අනුපාන :—
1. උණු වතුරෙන් දියකර ගන්න.
2. ආහාර සමඟ ද දිය හැකි ය.

මාත්‍රාව :— කලං 1 — 2 දක්වා (ග්‍රෑ: 5 — 10 දක්වා)

4. යෝගනාමය:— **තෝර බස්නය.**

යෝගය :—

ගොටුමුල්
පොල්පලා
අමු ඉඟුරු
සියඹලා කොළ
බිංතල් අල — මේවා යුෂ නැළි 1 (මි: ලී: 960) බැගිනි.
තැඹිලි කසපැන් නැළි 3 යි. (ලී: 2.88 යි.) — සියල්ල නැළි 8 යි. (ලී: 7.68 යි.)
ලිපේ තබා ඊට,

අබ
ගම්මිරිස්
අරළු
උළුහාල්
කොත්තමල්ලි
දෙදුරු
කරාබු
වසාවාසි
සාදික්කා
පෙරුංකායම්
කෙළිඳසාල්
සිරිතේක්කු
කටුකරෝසන
වදකහ
සුවඳලුණු
බළල්ලුණු
යවකාර
සහිඳලුණු

මේවා මංචාඩි 6 (ග්‍රෑ: 1.5) බැගින් චූර්ණ කොට,

තෝර බොකු දෙපලං මංචාඩි 5 යි. (ග්‍රෑ: 121.25 යි.)
තෝර කැවුතු සහ මොල තුන් කලඳයි. (ග්‍රෑ: 15 යි.)

සංස්කරණය :— සියල්ල සංයෝග කොට උණු අළුවෙන් පුටපාක කර ඉන්පසු සිනිඳුව අඹරා, සැලියේ කෂායට යොද, නැළි දෙකට සිඳුවා තබාගෙන ගිතෙල්, මීපැණි ප්‍රක්ෂේප කොට දෙන්නේ ය.

ප්‍රයෝග :— මාන්දම්, උණ, පිපාස, උස්මුරුත, ඇස රත, කබ කඳුළු, උල්වාරම්, ආදියට යෙදේ.

මාත්‍රාව :— කලං 1— 3 දක්වා. (ග්‍රෑ: 5 — 15 දක්වා)

5. යෝග නාමය :— **හා බස්නය (සස බස්නය)**

ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, අබ, කළුදුරු, වදකහ, සුදුලූනු, කොත්තමල්ලි, අතිවිඩයම්, කෙළිඳහාල්, වළඟසාල්, සුදුදුරු, පෙරුංකායම්, අසමෝදගම්, වියලිකහ, සහිඳලුණු, සුදුහඳුං, යන මේ ද්‍රව්‍ය එක්වගෙන් මංචාඩි පහ බැගින් කිරා ගෙන සුණු කර ගන්නේ ය.

කුරුඳුපොතු, කුරුඳුකොළ, කරපිංචා කොළ, මුකුනුවැන්න මුල්, තිප්පිලි, වෙලාමුල්, ඉරමුසුමුල්, කිරි අඟුණ මුල්, ආඩතෝඩාමුල්, බෙලිමුල්, කුප්පමේණියමුල්, මේවා වියලා මංචාඩි හය බැගින් ගෙන දුම් පිට නොයන සේ කබලෙක්හි ලා වසා දවා ගෙන එම භස්මය සහ පළමු චූර්ණය මිශ්‍රකොට ගලෙක්හි ලා ඉතා සිනිඳුව අඹරා ගන්නේ ය.

සම්, කුර, අසුචි ආදි කොටස් ඉවත් කර ගත් සාවකුගේ බඩවැල්, අක්මාව (පිකුදුව) පිත හා හිස පොඩි කර මොලය ද යන මේ කොටස් හා එම කොටස් බරට බරක් මස් ද ගෙන ඉතා සියුම් කැබලිවලට කපා ඊට පළමු ඇඹරූ කල්කය මිශ්‍ර කොට වතුර නැළි සතරක් ලා ගිතෙල් කලං සයක් ද ගෝරෝචන කලඳක් ද යොද කඩක් බැඳ ජලය සිඳෙන තෙක් මඳගින්නේ සිඳුවා ගන්නේ ය.

ගිතෙල් සහ ගෝරෝචන මිශ්‍ර කරන්නේ ජලය බොහෝ දුරට සිඳී ගිය පසු ය. ඉන්පසු බා නිවා සුරැකිව තබා ගන්නේ ය.

මාත්‍රාව :— වරකට දෙහි ගෙඩියක් පමණ දිය යුතුය. අග්නිබලය සලකා මාත්‍රාව අඩු වැඩි කරමින් දිනකට තුන් වරක් දීම සුදුසු ය.

ප්‍රයෝග :— ග්‍රහණි-මාන්දම් රෝගයෙහි විවිධ අවස්ථාවන්හි යෙදේ. නොබසින මාන්දම් උණ, ඇසෙහි ඇතිවන දුවිල්ල, කබ-කඳුළු ගැලීම, උල්වාරම්, ආදි මාන්දමින් හටගන්නා අක්ෂි රෝගයන්හි බඩවැල පහත් වීම හා කුන්ථනය, (තැවම්ම) මලභේදය ආදි අන්ත්‍ර දුර්වලතාවන්හි ද යෙදේ.

තෛල ඛණ්ඩය

1. යෝග නාමය :— **අණු තෛලය.**

යෝගය :—

සුදුහඳුන්
වැල්මී
වළගසාල්
සැවැන්දරා මුල්
ඉරමුසු
දේවදර
කටුවැල්බටු
අගිල්
බැවිල මුලේ පොතු
බෙලිමල් පොතු
රක්තවර්ණ මුස්තක
ශාලපර්ණී
හාතාවාරිය අල
සුරභී (වඳුරු මෑ ඇට)
තේජපත්‍ර
පුණ්ඩරීක කාෂ්ඨ
මාතෙල් මල්
කුරුඳුපොතු
ජීවන්ති
වාල්මොලගු
නෙළුම්රේණු
දරුහරිද්‍රා පොතු
හීන් එන්සාල්
සුගන්ධමාලා
හද්‍රමුස්තක
පෘශ්නිපර්ණී
එලබටු මුල්

සංස්කරණය :— මෙම ද්‍රව්‍ය පල 1 (ග්‍රෑ: 60) බැගින් කොටා වැහිවතුර පල 2700 (ලී: 162) ක් බහා පල 270 (ලී: 16.2) ට සිඳුවා පෙරා එම පල 270 (ලී: 16.2) න් පල 27 (ලී: 1.62) ක් වෙන්කර ගෙන තලතෙල් පල 27 (ලී: 1.62) ක් යොදා තෛලපාක පරිභාෂා අනුව තෙල සිඳින්නේ ය. මෙසේ නව වරක් සිඳුවා දස වැනි වාරයෙහි එළකිරි පල 27 (ලී: 1.62) ක් ද යොදා තෙල පිළියෙල කරගත යුතු වේ. කල්කයට එම ද්‍රව්‍යම මිලිතව 8 පලමක් (ග්‍රෑ: 480) යොදනු උචිත ය.

ප්‍රයෝගය :— නස්‍ය ප්‍රයෝගය සඳහා යෙදේ. නේත්‍රාදීන්ගේ බලවර්ධනය සඳහා ය.

2. යෝග නාමය :— **අම්බාදි තෛලය.**

යෝගය :—

බුරුල්ල
පංචාංගය
හාග 2 යි
මීදෙල්ල කොළ
මීදෙල්ල පොතු
කොහොඹ කොළ
කොහොඹ පොතු
අඹ කොළ
අඹ පොතු
නව හන්දි — හාග 1 බැගින් (යුෂ බෝතල 24 යි.)

කල්කය :—

තිකුළු
කරාබු
වසාවාසි
යාදික්කා
දෙදුරු
අසමෝද
වදකහ
පිඹුරු ඇට

මේවා එකින් කලං 6 බැගිනි. (ග්‍රෑ: 30)

නැඹිලි පොල් කිරි බෝතල 24 යි.
බිං දුම්මල කලං 12 (ග්‍රෑ: 60 යි.)
පොල්තෙල් බෝතල 6 යි.

ප්‍රයෝග :— දග්ධ (පිලිස්සුම්) සඳහා විශේෂයෙන් යෙදේ.

3. යෝග නාමය :— **අමුක්කු තෛලය.**

යෝගය :—

වරාකිරි දෝතයි. (පතයි). (ග්‍රෑ: 240)
කොහොඹ කොළ යුෂ
දෙඩං ඇඹුල්
අමුකහ යුෂ
කහ දෙමට ගෙඩි යුෂ
අහුමුල් යුෂ — මේවා නැලිය බැගිනි. (මි: ලී: 960)
එළඟිතෙල් ග්‍රෑ: 240)
පොල්තෙල්
තලතෙල් (දෝත) පත පතයි (මි: ලී: 240 බැගින්)

ගලිස්
මහ මී ඉටි
බඹර ඉටි
අතිවිඩයං
පෙරුංකායම්
අත්තන ඇට
බිං දුම්මල
කැප්පෙටි ලාකඩ
අබිං
පස්කුළු බඩු (මිලිතව)
ශුද්ධ ජයපාල
කංසා ඇට — කලං 1 බැගිනි. (ගු: 5)

සංස්කරණය :— තෛලපාකය අනුව වේ.

සැ: යු :— දෝත = අංජලි. (පත)

ප්‍රයෝග :— ළදරුවන්ගේ ක්‍රිමිරෝගයට පිටට සහ උදර ප්‍රදේශයෙහි අභ්‍යංගයට යොග්‍ය වේ.

4. **යෝග නාමය :—** **අර්ක තෛලය.**

යෝගය :—

වරාකොළ යුෂ	ප්‍රස්ථ	4 යි.	(ලී: 3.84 යි.)
වියලි කහ	පලම්	4 යි.	(ගු: 240 යි.)
අබතෙල්	ප්‍රස්ථ	1 යි.	(මි: ලී: 960 යි.)

සංස්කරණය :— වියලි කහ චූර්ණය අඹරා තෙලට යොද තෙල පදමට සිඳුවා ගත යුතු යි.

ප්‍රයෝග :— කන් පැසවීම, කන් කැසීම, කන් බිබිලි ආදිය සඳහා කණට දැමීමට හා ගෑමට විශේෂයෙන් යෙදේ. පාමා, කච්චු, විචර්චිකා සඳහා විශේෂයෙන් යෙදේ.

5. **යෝග නාමය :—** **අර්ශස් තෛලය.**

යෝගය :—

ගොමුත්‍ර	නැළි	2 යි.	(ලී: 1.92 යි.)
කිකිරිඳිය යුෂ	නැළි	2 යි.	(ලී: 1.92 යි.)
තලතෙල්	නැළි	1 යි.	(මි: ලී: 900 යි.)

කල්කය :—
රත්නෙටොල්
කුකුරුමුවන්
ඉඟුරු,
මැඩහගු,
කොවක්කා,
සුදුහඳුන්,
සෛන්ධව,
හිරියල්,
කනේරුමුල්,
තලිස් පතුරු,
මනෝසිල
වෙනිවැල්ගැට,
දූත්ත,
වියලිකහ,
මඟුල්කරඳ,
ලියනහලා අල,
අරළු
බුළු
තෙල්ලි
තෙලකිරිය පොතු,
රසකිඳ
දළුක්මුල්,
ලෝකඩ,
තඹ,
වානේ,
යහුණු
මූදුපෙන,
සෙම්කොට්ටම්,
වළහසාල්
දේවදර,
ඔලිඳමුල්,
අසමෝදගම්,
මූනමල් ඇට, — එකින් කලඳ ((ගු: 5) බැගිනි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ගොමුත්‍ර කිකිරිඳිය යුෂ හා තලතෙල් එකට මිශ්‍රකොට, යෝග්‍ය භාජනයක බහා, ඇඹරූ කල්කය ඊට යොද, තෛලපාක ක්‍රමය අනුව සමපාක අවසානයේදී කරපාකයට පළමුව තෙල පෙරා ගන්න.

ප්‍රයෝගය :— බහුල වශයෙන් පාන අභ්‍යංග සඳහා යොදති. විරේචන ගුණය නිසා, මලමුත්‍රවායු බද්ධය නසයි. සියළු අර්ශස් සඳහා විශේෂයෙන් ගුණ යි. කළු වාතජ උන්මාද, ශිර්ෂ රුජා, නසා තුන්දෙස් සමන කරයි. යෝනි රෝග වනසා ලයි.

මාත්‍රාව :— කලන් 1/2, (ගු: 2.5 යි.) උණුපැන් සමඟ යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

6. **යෝග නාමය :—** **අශ්වගන්ධා තෛලය (අංක 1.)**

යෝගය :—

තලතෙල්	සේරු	4 යි.	(ලී: 3.84)
අශ්වගන්ධා කෂාය	සේරු	16 යි.	(ලී: 15.36)
එලකිරි	සේරු	4 යි.	(3.84)
අශ්වගන්ධා කල්කය	සේරු	1 යි.	(ගු: 960)

තෛල පරිභාෂාවෙනි.

ප්‍රයෝගය :— කෘශ වූ ශරීර පුෂ්ටිමත් කෙරෙයි.

7. යෝග නාමය :— **අශ්වගන්ධා තෛලය (2).**

යෝගය :—
අමුක්කරා චූර්ණය
සාතාවාරිය චූර්ණය
කොට්ටං චූර්ණය
ජටාමාංස චූර්ණය
එලබටු ගෙඩි චූර්ණය — සමභාගව, කල්කය මෙන් 4 ගුණයක් තලතෙල්, එමෙන් සිව් ගුණයක් එලකිරි, තෛල පරිභාෂාවෙන් සිදවා ගන්නේ ය. ශරීර වර්ධනය සඳහා අභ්‍යංගය පිණිස ය.

8. යෝග නාමය :— **අශ්වගන්ධා තෛලය (3)**

යෝගය :—
අමුක්කරා අල
බැවිල මුල්
කැප්පෙටිලාකඩ, පලං 8 කලං 4 බැගින් මිලිතව (පලං 25=ග්‍රෑ: 1500), වතුර නැලි 12 (ලි: 11.52) දමා නැලි 3 ට සිඳුවිය යුතු ය. තලතෙල් නැලි 1 යි (මි: ලී: 960). ලාක්ෂා ලිහිල් පොට්ටනිය බැඳ ක්වාථයෙහි ලා සිඳු වන්නේ ය.
දීපෙරලි දිය නැලි 4 යි. (ලී: 3.84)
කිරි නැලි 4 යි. (ලී: 3.84)

කල්කයට
අමුක්කරා අල
බැවිල මුල්,
අරත්ත අල,
වාල්මොලහු,
කලාඳුරු අල,
රත්හඳුන්,
සැවැන්දරා මුල්
වැල්මී, — කලං 3 (ග්‍රෑ: 15) බැගින්.
වදකහ
කටුකරෝසන.
හාතාවාරිය,
මැඩහගුමුල්.
දේවදර,
කැප්පෙටිලාකඩ.
වැල්මදට,

තෛලපාක පරිභාෂා ක්‍රමයට සාද, අභ්‍යංග සඳහා ශ්වාස කාස ක්ෂය රෝගයන්හි යෙදේ. පෙනහලු තුවාල සහිත ක්ෂය රෝගීන්ට අභ්‍යංගය සඳහා විශේෂ ය.

9. යෝග නාමය :— **ඉරිමේදදී තෛලය.**

යෝගය :—
ඉරිමේද පලම 100 යි. (ග්‍රෑ: 6000 යි.)
ජලය ද්‍රෝණ 1 — 1/4 ට (ලී: 15.36 — 3.84) කෂාය සිඳවා ගන්න.

කල්කය :—
වැල්මදට,
ලොඩ්ර,
වැල්මී,
ඉරිමේද පොතු,
කිහිරි,
කට්එල,
ලාකඩ, (ලාක්ෂා)
නුගපොතු,
කලාඳුරු අල.
හීන්එන්සාල්
කපුරු,
අගිල්.
පද්මකාෂ්ඨ,
කරාබු,
කක්කෝල,
වසාවාසි,
සාදික්කා.
පතගි,
සිවංගුරු,
කුරුඳුපොතු,
නාමල්රේණු,
මලිතමල්.
කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් කල්කය සාද ගත යුතුයි.
තලතෙල් ප්‍රස්ථ 2 යි. (ලි: 1.92)

සංස්කරණය :— තෛල පරිභාෂාව අනුව තෙල සිදිනු.

ප්‍රයෝගය :— දන්තභෙද, ගලවිද්‍රධි, ශෛශිර, ශීතාද, දන්තහර්ෂ, ක්‍රිමි, දන්ත දලන, චල දන්ත., පරිදර සහ මුව දුගඳ බව නැසේ. ඉරිමේද අභාවයෙහි සීනිද්ද පොතු ගන්නේ ය.

10. යෝග නාමය :— **උශීරාදි තෛලය. (1)**

කල්කය :—
තුවරලා,
සුවඳකොට්ටං,
වැල්මී,
සුදුහඳුන්,
බුළු,
බැබිල,
අමුක්කරා,
දශමූල
මහහාතාවාරිය අල.
කිරිබද අල,

අරළ
භාතාවාරිය අල.
පද්මකාෂ්ඨ.
මානෙල් අල.
හීන්ඉරමුසුමුල්.
මහඉරමුසු මුල්.
කාකොලී.
රසකිඳ.
අතිබලා.
ගොකටු.
ශතපුෂ්ප දෙවර්ගය.
බැබිල මුල්.

කලං 3 (ගුෑ: 15) බැගින් ගෙන, කල්කයට සාද ගත යුතු ය.

තලතෙල්	ප්‍රස්ථ	2 යි. (ලී: 1.92 යි.)
ගොකටු සහමුලින්	පලම	100 යි. (ගුෑ: 6000 යි.)
ජලය	ද්‍රෝණ	2 — 1/4 ට (ලී: 30.72 — 7.68) සිඳුවා ගත යුතු යි.
මෝරු	ප්‍රස්ථ	1 යි. (මි: ලී: 960)
සැවැන්දරා මුල්	පලම	100 යි. (ගුෑ: 6000 යි.)
ජලය	ද්‍රෝණ	2 — 1/4 ට (ලී: 30.72 — 7.68) සිඳුවා පෙරා ගත යුතුයි.

සංස්කරණය :— ගොකටු හා සැවැන්දරා මුල් කෂාය එක්කොට තෙල් සාද මද ගින්නේ තෛලය සිඳුවා ගත යුතු යි.
ප්‍රයෝග :— මූත්‍රාඝාත, මූත්‍රකෘච්ඡ්‍ර, අශ්මරී, නසයි. වර්ණ්‍ය යි. බලකාරක යි. පාන, අභ්‍යංග සඳහා යොදති.

යෝග නාමය :— **උශිරාදිය අංක (2)**

යෝගය :— නෙල්ලි,
සැවැන්දරා මුල්,
කලාඳුරු අල.
රසකිඳ, — සතර වගෙන් පලං 25 යි. (ගුෑ: 1500)
දියනැලි 16 — 4 ට සිඳුවා ගත යුතු යි. (ලී: 15.36 — 3.84)

තලතෙල්	නැලි	1 යි. (මි: ලී: 960 යි.)
එලකිරි	නැලි	4 යි. (ලී: 3.84 යි.)

කල්කය :— සුදුහඳුන්,
කුරුඳුපොතු.
වැල්මී,
සාදික්කා,
එන්සාල්,
තිකුළු
සැවැන්දරා,
ඉරිවේරිය,
නෙළුම් අල.
කපුරු,
උරුලෑසවටම,
සපුමල් කැකුළු,
කලාඳුරු අල.
හිඟුරුපියලි,
අගිල්,
ජටාමාංස,
තිපල්,
දේවදර,
කලං 3 බැගිනි. (ගුෑ: 15)

ප්‍රයෝගය :— අභ්‍යංගය පිණිස ය. සර්වාංගයෙහි දහය, විෂමජ්වර, අකාල පලිතය ආදියෙහි යෙදේ.

11. යෝග නාමය :— **කනක තෛලය.**

යෝගය :— අත්තන,
වරා,
බැවිල,
දූර්වා,
ආඩතෝඩා මුල්,
ජයන්ති,
නික කොළ,
කුණු කරඳ,
සිරිතේක්කු,
ගැටනෙටුල්,
සාරණ,
මයන් කොළ.
කංසා කොළ,
බෙලිමුලේ පොතු,
එලබටු මුල්,
රත්නිතුල්,
දලුක් මුල්,
සිහින් මිදි මුල්,
එඬරු මුල්,
තිරස්සවාලු,
ත්‍රායමාණ,
තිප්පිලි.
ඇහැළ කොළ.

ගොමටි -(මලබටු)	පලම	2 බැගිනි. (ගුෑ: 120)
ජලය	ද්‍රෝණ	1 යි. 1/4 ට (ලී: 15.36 — 3.84) සිඳුවා ගත යුතු යි.
අබතෙල්	සේරු	2 යි. (ලී: 1.92)

කල්කය :— ඉහත සඳහන් ද්‍රව්‍යයන් ම කල්කය සඳහා මිලිතව සේරු 1/2 (ගුෑ: 480) ගත යුතු යි.
සංස්කරණය :— ක්වාථය විධි සේ පැසවා ගෙන කල්ක යොද තෙල සිඳුවා ගන්නේ ය.
ප්‍රයෝග :— නේත්‍රරෝග, ශීර්ෂ ශූල, මාංස-රක්තජ, ශ්ලීපද, ආමවාත, හෘදය ශූල, අණ්ඩවෘද්ධි, ගලගණ්ඩ, ගොට, බාධිර්ය, උදර, කාස සහ සෙම්රෝග නසයි. පාන. අභ්‍යංග සඳහා යොදනු ලැබේ.

12. යෝග නාමය :— **කාර්පාසාදි තෛලය.**

යෝගය :—
කපු ඇට
බැබිල
දශමූල පලම් 16 යි. (ගු: 960 යි.)
උඳු
කොල්ලු — පලම් 16 බැගින්. (ගු: 960)
දිය නැලි 64 — 16 ට (ලී: 61.44 — 15.36 ට) සිඳුවා ,කෂාය පෙරා ගන්න.

කල්කය :—
කපු ඇට
කොල්ලු
දේවදර
අරත්ත
සවිඳලුණු
රත්නිවුල් — පලම් 2 බැගින් (ගු: 120)

1. පොල්තෙල්
2. තලතෙල්
3. එරඬුතෙල්
4. ඌරු තෙල්
5. ගිතෙල්
6. එළකිරි නැලි 2 බැගිනි. (ලී: 1.92)

කාඩි නැලි 16 යි. (ලී: 15.36)

සංස්කරණය :— කල්ක යොද විධි යේ තෙල සිඳ ගන්න.

ප්‍රයෝග :— ශාද්‍රසි, විශ්වාචි, හස්තපාද අවයගවීම, බාහුශෝෂ, පාදවඝාතන, පක්ෂාඝාත, නාශක යි.

13. යෝග නාමය :— **කාසියාදි තෛලය. (1)**

යෝගය :—
කාසිය
ලාංගලී
කනේරු
සුවඳකොට්ටං
වියලි ඉඟුරු
ගජතිප්පිලි
මනෝසිල
අශ්වමාර
වළගසාල්
රත්නෙවුල්
කුටජ
දන්ත
තිත්තවැටකොලු ඇට
ස්වර්ණක්ෂිරි
හරිතාල — කර්ෂ 1 බැගින් (ගු: 15)
තලතෙල් ප්‍රස්ථ 1 යි. (මි: ලී: 960 යි.)
ස්නුහි ක්ෂිර පලං 2 යි. (ගු: 120 යි.)
වරාකිරි පලං 2 යි. (ගු: 120 යි.)
ගෝමුත්‍ර චතුර්ගුණය යි.

ප්‍රයෝග :— අර්ශස් නසයි. අගාංගයෙන් අර්ශස් ගැලවෙයි.

යෝග නාමය :— **කාසිසාද්‍ය තෛලය. (2)**

යෝගය :—
කාසීස,
අශ්වගන්ධා
ලොධර,
ගජතිප්පිලි, — කල්කය සඳහා
ජලය සිව් ගුණය යි.
තලතෙල් භාග 1 යි.

සංස්කරණය :— තෛල පරිභාෂයට අනුව පිළියෙල කරගත යුතු යි.

ප්‍රයෝග :— ස්තන, කර්ණපාලි, යෝනි, ලිංග, නාඩි වෘද්ධිය පිණිස යෙදේ.

14. යෝග නාමය :— **කැඩුම් බිඳුම් තෙල.**

යෝගය :—
හොරපොතු, නාපොතු, කැකුන පොතු,
රදලිය පොතු, හීන්දම් පොතු, මාදන් පොතු,
මා එරමිණිය පොතු, පලු පොතු, බෝ පොතු,
තෙල්ඇහැටු පොතු — රාත්තල් 1 බැගිනි. (පලං 8 ගු: 480)

සංස්කරණය :— සියල්ල වෙන වෙන ම කොටා එකට මිශ්‍රකර දිය නැළි 16 ක් දමා, (ලී: 15.36) දින 7ක් ඌරු වෙන්ට තබා මිරිකා, පෙරා, නැළි 8 ට සිඳුවා (ලී: 7.68 යි.) ගත යුතුයි.

අමුකහ යුෂ නැළි 2 1/2 යි. (ලී: 2.4 යි.)
පොල්තෙල් නැළි 2 1/2 යි. (ලී: 2.4 යි.)

කල්කය :— කළුදුරු, සුදුරු, අසමෝදගම්, කලන් 8 බැගිනි. (ගු: 40)

සංස්කරණය :— තෛල පාක ක්‍රමය අනුව තෙල පදමට සිඳ ගත යුතු ය.

ප්‍රයෝග :— බීමට, ගෑමට, සහ බැඳීමට යි. කැඩුම්-බිඳුම්,තැළුම්, උළුක්කු, ඇඟ ඇතුලේ තැල්මට සහ බඩ ඇතුලේ තැල්මට, සීනි සමඟ තෙල් මේස හැන්දක් බීමට දෙන්න.
ඇම්මැරිටි, ඔඩු තුවාල ආදියට යෙදිය හැකි ය.

15. යෝග නාමය :— **කුංකුමාදි තෛලය.**

යෝගය :—

රත්හඳුන්,
පද්මකාෂ්ඨ,
ලාකඩ, (ලාක්ෂා)
නිලුපුල්,
වැල්මදට,
නුග අරළු
ජලය
තලතෙල්
වැල්මදට
මීපුප්
වැල්මී — මේවා කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගිනි.
එළකිරි කුඩව 2 යි. (පලං 8 = මි: ලී: 480)
කුංකුමප්පු පල 1 යි. (මි: ලී: 60)

වැල්මී,
පුලිල දළ,
පියුම්රේණු,
කළුඅගිල්
යැවැන්දරා,
දසමුල — පලම 1 (ග්‍රෑ: 60) බැගින් වෙ.
ආඪක 4–1 ට (ලී: 15.36–ලී: 3.84) සිඳවා ගතයුතුය
කුඩව 1යි. (මි. ලී. 240)
ලාකඩ (ලාක්ෂා)
රත්හඳුන්,

සංස්කරණය :— ඉහත සඳහන් ද්‍රව්‍ය ජලයෙහි බහා පාදයට සිඳුවා පෙරා එයට තෙල්, කිරි සහ කල්ක බහා තෙල් පදමට සිඳවා පදම ලඟාවෙද්දී කුංකුමප්පු බහා යලිත් පදමට සාද ගන්නේ ය.

ප්‍රයෝග :— මුහුණේ අභ්‍යංග කිරීමෙන් නීලිකා, පිඩකා, ව්‍යංග යන රෝග පහවේ. මුව කාන්තිමත් වේ.

16. යෝග නාමය :— **කුබ්ජ ප්‍රසාරණී තෛලය.**

යෝගය :—

ප්‍රසාරණී තුලා 1 යි. (ග්‍රෑ: 6000)
ජලය සේරු 64 — 16 ට සිඳුවන්න.
දීපෙරලි දිය සේරු 16 යි. (ලී: 15.36)
කාඩි සේරු 16 යි. (ලී: 15.36)
තලතෙල් සේරු 16 යි. (ක්වාථයට සමව ගන්න.)
එලකිරි කෂාය මෙන් දෙගුණයයි. (සේරු 32 යි.)

කල්කය :—

රත්නිටුල්,
තිප්පිලි මුල්,
වැල්මී,
සවිඳලුණු,
වදකහ,
ශතපුෂ්ප,

දේවදර,
අරත්ත,
ගජතිප්පිලි,
ප්‍රසාරණී මුල්,
ජටාමාංස,
ශුද්ධභල්ලාතක,

පල 2 (ග්‍රෑ: 120) බැගින් අඹරා කල්කය සාද ගන්නේ ය.

සංස්කරණය :— කල්ක යොද විධි සේ තෙල පිස ගන්නේ ය.

ප්‍රයෝග :— කුදුබව, පිළුබව, ගෘධ්‍රසි, බුඩක, අර්දිත, හකු–පිට–හිස–ගෙල යන මේවායේ තදබව, වා–සෙම, ප්‍රධාන රෝග සහ වාතරෝග ද නසයි. පුරාණ ආමවාතයට විශේෂයෙන් ගුණ යි.

17. යෝග නාමය :— **කුමාරි තෛලය.**

යෝගය :—

රසකිඳ යුෂ
කෝමාරිකා යුෂ
කොවක්කා යුෂ } මිලිතව නැළි 4 යි. (ලී: 3.84)
එලකිරි නැළි 4 යි. (ලී: 3.84)
තලතෙල් නැළි 1 යි. (මි: ලී: 960)

කල්කය :—

සැවැන්දරා,
කොල්ලන් කොළ,
සාදික්කා,
සුදුහඳුන්,
කොට්ටන්,
මාතෙල් අල — මේවා එකින් කර්ෂ 1 බැගිනි. (ග්‍රෑ: 15)

හිඟුරුපියලි,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
වැල්මී,

සංස්කරණය :— කල්කය චූර්ණකර තෙලට යොද තෛල පාක ක්‍රමය අනුව මෘදු පාකයට සිද ගත යුතු ය.

ප්‍රයෝග :— නස්‍ය හා ශිර්ෂාභ්‍යංගය සඳහා ය.

විශෙෂ ගුණ :— නින්ද නොයාමට, රත්පිතට හා ස්මෘති හානියට උන්මාදයට ගුණ යි. උෂ්ණයෙන් ඇතිවන අක්ෂිරෝග හා ශීර්ෂ රෝග නාශක යි.

18. යෝග නාමය :— **කෙණ්ඩා පෙරළුම්හර තෛලය.**

යෝගය :—

උළුවාහාල්	නැළි	4 යි.	(ලී: 3.84)
ජලය	නැළි	16 යි.	1/4 ට සිඳුවා. (ලී: 15.36 — 3.84)
පෙරාගත් උළුවා කෂාය	නැළි	4 යි.	(ලී: 3.84)
දෙහිකොළ යුෂ	නැළි	2 යි.	(ලී: 1.92)
කුඹුරු කොළ යුෂ	නැළි	2 යි.	(ලී: 1.92 යි.)
පොල්තෙල්	නැළි	2 යි.	(ලී: 1.92 යි.)

කල්කය :—

කළුදුරු,
උළුවහාල්,
වේලා ගත් දෙහිකොළ,
වේලාගත් කුඹුරු කොළ,
(ගු: 30) කලන් 6 බැගින් ගෙන කුඩුකර ගන්න.

සංස්කරණය :— තෛලපාක ක්‍රමය අනුව තෙල සිඳ පෙරා ගත යුතු යි.

ප්‍රයෝග :— ජලසන්නියට, කෙණ්ඩා පෙරළුමට, බඩරුජාවට, ක්‍රිමි ශූලයට, ශීතලට, සන්නියට තෙල් රත්කර ගා, ඇඟට තෙල උරා ගන්නා තුරු අතුල්ලනු. විශෙෂයෙන් බඩේ. තුනටියේ. පිටේ, හා කෙණ්ඩාවල ගෑ යුතු ය.

19. යෝග නාමය :— **කෝලශ්ලේෂ්මා තෛලය.**

යෝගය :—

පැසුණු එලබටු ගෙඩි	යුෂ	ඇඹුල් දෙඩම්	යුෂ
කුකුරුමාන් ගෙඩි	,,	ඉරමුසු	,,
පැසුණු හීන් දෙමටගෙඩි	,,	සුදු ලූනු	,,
පුස්වැල්	,,	අමුඉඟුරු	,,
හිඟුරුපට්ට වැල්	,,	වේලා	,,
නියඳ	,,	එරබදුකොළ, පොතු	,,
පුපුල	,,	කුප්පමේනිය	,,
මුරුවා	,,	මුරුංගා කොළ, පොතු	,,

මේවා එකින් පත, පත (මි: ලී: 240) බැගිනි.

එරඬුතෙල්				
තලතෙල්	එකින්	නැළි	1 බැගිනි.	(මි: ලී: 960 යි.)
තැඹිලි පොල්කිරි		නැළි	1 යි.	(මි: ලී: 960 යි.)

දේවදර,
වැල්මී,
සහිඳලුණු,
වසාවාසි,
සීනක්කාරම්,
සුවස ලුණු,
තිප්පිලි,
අසමෝදගම්,
අක්‍රපට්ට,
ගලිස්,
කළුදුරු,
සූදුරු,
පෙරුම්කායම්,
යවකාර ලුණු,
පල්මානික්කම්,
තිරුස්සවාලු මුල්,
සාදික්කා,
කරාබු,
මේවා එකින් කලන් 3 (ගු: 15) බැගිනි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ඒ ඒ ද්‍රව්‍ය පිරිසිදුව ගෙන වෙන වෙනම හොඳින් සියුම්ව කොටා. එක් වගෙන් යුෂ පත බැගින් වෙන වෙනම ගෙන එකට මිශ්‍රකොට, යෝග්‍ය බඳුනෙක බහා ඊට තලතෙල් හා එඬරු තෙල් ද, තැඹිලිපොල් කිරි ද මිශ්‍රකොට ලිප තබා රත්කොට, ඇඹරූ කල්කය ද බහා, පැය 4 ක් පමණ ගිනි දමා දෙවනුව ගිනි නොනිවෙන ලෙස මඳ ගිනිකර, දින තුනක් පැසවා, තෛල පාක ක්‍රමය අනුව කරපාකයට පළමුව තෙල පදමට පෙරා ගන්න.

ප්‍රයෝග :— මෙ තෙල, නස්‍ය, පාන අභ්‍යංගයට යොදන්න. විශෙෂයෙන් වලිප්පුවට යොදනු ලැබේ. සෙම්ගෙඩි, ඉදිමුමට ප්‍රත්‍යක්ෂ යි. ඇදුමට, සෙම් බැඳුම් හිරවීමට විශෙෂ යි. ගණ්ඩමාල, ග්‍රන්ථි, ගලගණ්ඩ ආදියට හා උගුරේ සෙම් තදවීමට ප්‍රත්‍යක්ෂ යි.

මාත්‍රාව :— තේ හැඳි 1—2 දක්වා සුදුසු පරිදි යෝග්‍ය අවස්ථාවට යෙදේ.

20. යෝග නාමය : — **ගරුඩ රාජ තෛලය.**

යෝගය:—

තෝරමුල්,		වරා	මුල්
මදුරු තලා	මුල්	තුඹ	,,
බෙලි	,,	අවරිය	,,
ඉකිරි		හීන්දද කිරිය	,,
කරඹ	,,	මහදද කිරිය	

දෙහි මුල්
කුඹුරු ..
නික ..
බිංතඹුරු කලුවාඅල. — පලම 2 (ගු: 120) බැගිනි.
යාරණ,
ඇත්තුත්තිරි,
හරංකහ,
ජලය නැළි 6 — 4 ට, (මි: ලී: 15,36 — 3.84) සිඳුවන්න.
මීතෙල් නැළි 11 යි. (මි: ලී: 960 යි.)

කල්කය :—
කළුදුරු,
සුදුදුරු,
ජයපාල,
රිදීතුත්ථන්,
පුස්කර,
හිරියල්,
අංජනකැට,
තිප්පිලි — කර්ෂ 1 (ගු: 15) බැගිනි.

සංස්කරණය :— කල්ක යොද, දෙඩම දරින් ගිනි දී කල්කය රත්වන් පාට වනතුරු, පැසවා තෙල සිඳ ගත යුතු යි.

ප්‍රයෝග :— මෙය අංජන යෙදීමට සුදුසු තෙලකි. සියලු සර්ප විෂට ගුණ යි. බීමට, ගෑමට යහපති.

21. යෝග නාමය :— **ගුග්ගුලාදි තෛලය.**

යෝගය :—

ගුගුල්	පලං	8 යි.	(ගු: 480 යි.)
දෙහි ඇඹුල්	නැළි	4 යි.	(ලී: 3.84)
විනාකිරි	නැළි	4 යි.	(ලී: 3.84 යි.)
එරඩුතෙල්	නැළි	1 යි.	(මි: ලී: 960 යි.)

සංස්කරණය :— මේවා සියල්ල එකට මිශ්‍රකර තෛල පාක ක්‍රමය අනුව පදමට තෙල සිඳුවා බා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— ඇම්මට, ඇවිලිල්ලට, හන්දි ඉදිමුමට, නහර කැක්කුමට ප්‍රත්‍යක්ෂ යි.

22. යෝග නාමය :— **ගුඩුච්‍යාදි තෛලය.**

යෝගය :—

රසකිඳ	පල	100 යි.	(ගු: 6000 යි.)
ජලය	ද්‍රෝණ	2 යි.	(ලී: 30.72 යි.) 4—1 ට සිඳුවා පෙරාගත යුතුය.
තලතෙල්	ප්‍රස්ථ	2 යි.	(ලී: 1.92 යි.)
එලකිරි	ප්‍රස්ථ	2 යි.	(ලී: 1.92 යි.)
රසකිඳ චූර්ණය	ප්‍රස්ථ	1/2 යි.	(ගු: 480 යි.)

සංස්කරණය :— තෛල පරිභාෂා අනුව සැකසිය යුතු වේ.

ප්‍රයෝග :— වාතරක්ත රෝගාවස්ථා සඳහා යෝග්‍ය වේ. අභ්‍යංග සඳහා යි.

23. යෝග නාමය :— **ගුරුළුරාජ තෛලය.**

යෝගය :—
ලුණුවරණ මුල්
කරඳ මුල්,
නිකකොළ,
වරාකොළ,
දළුක්පලු — මේ වර්ග වෙන වෙනම කොටා යුෂ නැළි 1. (මි: ලී: 960) බැගිනි.
දුම්මල තෙල් කලං 5 යි. (මි: ලී: 25 යි.)
එරඩුතෙල් නැළි 1 යි. (මි: ලී: 960 යි.)
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
සුදුලූනු,
පෙරුම්කායම්,
සුදුරු,
කළුදුරු,
අසමෝදගම්,
මේවා කලං 2 1/2 (ගු: 12.5) බැගිනි.
ශුද්ධ ජයපාල කලං 3 යි. (ගු: 15 යි.)

සංස්කරණය :— මේ සියල්ල කුඩුකර අඹරා කල්ක කොට, පළමු යුෂට, දමා පස් රැයක් (දින පහක්) මඳ ගිනිකර කකාරා පදමට තෙල සිඳ ගන්න.

ප්‍රයෝග :— බඩේ සියලු ලෙඩට ද, වායුවට ද, සන්ධිගත අස්ථිගත ජවිගත සියලු වාතයට ද, සර්ප විෂට ද යොදනු ලැබේ. මේ තෙල වාත රෝගීන්ගේ පපුවේ සෙම උත්සන්න අවස්ථාවේ ගෑමෙන් විශිෂ්ට ගුණ ලැබේ. පාන, අඤ්ජන, අභ්‍යංග සඳහා යොදති.

24. යෝග නාමය :— **ග්‍රහණී චන්ද්‍රකාන්ති තෛලය.**

යෝගය :—

රතුලූනු	ප්‍රස්ථ	16 යි.	
ජලය	නැළි	256 යි.	64 ට සිඳුවනු. (ලී: 245.76 — 61.44 යි.)
එලකිරි	නැළි	16 යි.	(ලී: 15.36 යි.)
තලතෙල්	නැළි	16 යි.	(ලී: 15.36 යි.)

කල්කය :—
සුවඳකොට්ටන්,
තිප්පිලි,
කරාබු,
වසාවාසි,
සාදික්කා,
වැල්මී,
වළහයාල්,
කළුදුරු,
සුදුරු,
වදකහ,
අසමෝද,
දේවදර,
පෙරුම්කායම්,
හිඟුරුපියලි,
කොල්ලන්කොළ,
කුරුඳුපොතු,
එන්සාල්,
නාමල්රේණු,
සපුකැකුළු — පලං 3 බැගින් (ගු: 80) ගෙන චූර්ණකොට ගත යුතු යි.

සංස්කරණය :— සිඳුවාගත් රතුලූනු කෂායට එළකිරි හා තලතෙල් යොද මඳ ගිනිකර කල්කය අඹරා යොද තෛල පාක ක්‍රමය අනුව තෙල සිඳ ගත යුතු යි.

ප්‍රයෝග :— මාන්දම් රෝගීන්ගේ හිසේ, ඇගේ ගෑමට හා බීමට ද යොදති. ග්‍රහණි මාන්දම්, උණ, ඇස්, කොරල, බඩයාම, හම ගෝරෝසු වී මාන්දම් කටු ඇතිවීම නසාලයි. ක්‍රිමි රෝග ද ගුණ කෙරේ.

25. යෝග නාමය :— **චන්ද්‍රකාන්ති තෛලය.**

යෝගය :—
මුගුනුවැන්න සහමුලින්,
කෙකටිය සහමුලින්,
කිකිරිඳිය සහමුලින්,
වැටකෙයියා සහමුලින්,
/ එකින් යුෂ නැළිය බැගිනි. (මි: ලී: 960)
එළකිරි, නැළි 2 යි. (ලී.192 යි.)
තලතෙල්,
ගිතෙල්,
එරඬු තෙල් — මනා 1 (මි: ලී: 480) බැගිනි.)

කල්කය :—
දේවදර,
වැල්මී,
ඉරිවෙරිය,
මුගුනුවැන්න මුල්,
සැවැන්දරා මුල්,
බැබිල මුල්,
පඹුරු මුල්,
කුප්පමේනියමුල්,
හිඟුරුපියලි,
බිම්තඹුරු මුල්,
ඉඟිනි ඇට,
උරුලෑසවටම,
නාමල්රේණු,
එළඹලිඳමුල්,
කයිප්පු,
කළුදුරු,
සුදුරු,
තිප්පිලි,
සුදුහඳුන්,
අරළු,
බුළු,
නෙල්ලි — කලන් 3 (ගු: 15) බැගිනි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය වර්ග පිරිසිදුව ගෙන හොඳින් කොටා ,වෙන වෙනම යුෂ ගෙන එකට මිශ්‍ර කරන්න. ඊට, එළකිරි සහ තෛලවර්ග ද උරුලෑසවටම ද වෙන්කොට, ඇඹරූ කල්කය ද යොද, සම පාකාවසානයේදී පෙරා, දිය මතුපිටට බාන්න.

ප්‍රයෝග :— අක්ෂි, කාච පටල ආදි නේත්‍ර රෝගීන්ට ප්‍රත්‍යක්ෂ යි. තද හිසරදයට ප්‍රත්‍යක්ෂ තෙලකි.

26. යෝග නාමය :— **චිත්‍රකරඤ්ජ තෛලය**

යෝගය :—
මහුල් කරඳ මුල් යුෂ නැළි 1 යි. (මි: ලී: 960 යි.)
දියනුමුසු පොල්කිරි නැළි 1 යි. (මි: ලී: 960 යි.)
එරඬුතෙල් නැළි 1 යි. (මි: ලී: 960 යි.)

කල්කය :—
වදකහ,
සුදුළූනු,
ලුණුවරණ පොතු,
වරාමුල්,
කුඹුරුඇට මද,
තිකුළු,
තිපල්,
පෙරුම්කායම්,
ඇහැළපොතු හෝ කරල් පැණි,
ඉඟුරු,
සව්දලුණු — එකින් කලන් 3 බැගිනි. (ගු: 15)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් මහුල්කරඳ යුෂට, පොල්කිරි සහ එරඬු තෙල් මිශ්‍රකොට සුදුසු බඳුනක බහා ,ඇඹරූ කල්කය ද ඊට යොද පාක පරිභාෂාවෙන් සිඳුවා ගත යුතුය.

ප්‍රයෝග :— අණ්ඩවායු, කුක්ෂිශූල, ගුල්ම, උදර රුජා, සන්ධිගත වාත, ක්‍රිමි ශූල සඳහා විශේෂයෙන් යෙදේ.

මාත්‍රාව :— තේ හැඳි 4 දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

සැ: යු :— මේ කල්කය සමග ශුද්ධ ජයපාල ද කලන් 3 ක් (ගු: 15) ගෙන තෙල සිඳුවීම වෘද්ධ වෛද්‍ය ව්‍යවහාරයෙහි විරේචනයෙහි ශ්‍රේෂ්ඨ ය.

මාත්‍රාව :— එහි මාත්‍රාව බින්දු 5 — 60 දක්වා ය.

27. යෝග නාමය :— **ජාත්‍යාදි තෛලය.**

යෝගය :—
සමන්පිච්ච කොළ යුෂ
ශංඛපුෂ්පි යුෂ
මූනමල් පොතු කෂාය, — එකින් සේරු 16 (ලී: 15.36) බැගින්,
තලතෙල් සේරු 4 යි. (ලී: 3.84 යි.)

කල්කය :—
රත්කිහිරි, කොට්ටන්, ලෝධ්‍ර,
අඹඇටමද, වැල්මී, සින්දූර,
අරළු, බුළු, නෙල්ලි, වෙනිවැල්ගැට, සිවංගුරු,
ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, කහ, නුගඅරළු,
සිවිය, කලාදුරු අල, ලෞහ භස්ම,
නිල්උපුල්, බාලක, — (මිලිතව) සේරු 1 යි. (පලං 16 = ග්‍රෑ: 960)

සංස්කරණය :— තෛල පරිභාෂාව අනුව තෙල සිඳගත යුතු යි.

28. ප්‍රයෝග :— මුඛ රෝග නසයි. භගන්දර, උපදංශ, දුෂ්ට ව්‍රණ නසයි.

යෝග නාමය :— **තෝර වතුරෙ තෙල.**

යෝගය :—
එලකටරොළු ඉස්ම සේරු 30 යි. (ලී: 28.8 යි.)
පොල්තෙල් සේරු 7 1/2 යි. (ලී: 7.2 යි.)

කල්කයට වළගසාල් සහ වෙඩිලුණු පලම් 3 යි. කලං 4 (ග්‍රෑ: 200) බැගින්.
කල්කය යොද නො දැවෙන සේ පදමට බා ගන්න.

ප්‍රයෝග :— මූත්‍රකාරක යි. පුරාතන වෘක්ක රෝග සඳහා ශ්‍රේෂ්ඨ ය.
මාත්‍රාව :— තේ හැඳි 1 යි.

29. යෝග නාමය :— **ත්‍රිඵලා තෛලය.**

යෝගය :—
සුරසාදී ගණය කෂාය ප්‍රස්ථ 4 යි. (ලී: 3.84)
තලතෙල් ප්‍රස්ථ 1 යි. (මි: ලී: 960)
තිපල්, කොහොඹපොතු, රසකිඳ,
අතිවඩයන්, ඇහැළපොතු, මහගොන් කැකිරි අල,
(හෝ නිකමුල්)
මුරුවමුල්, වදකහ, තිප්පිලි,
තිරුස්සවාලු. රුක්අත්තනපොතු, කොට්ටම්,
රත්නිටුල්, කහ, අබ,
ආඩතෝඩ, වෙනිවැල්ගැට, ඉඟුරු,
කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගිනි

ප්‍රයෝගය :— පාන, අභ්‍යඞ්ග, ගණ්ඩූෂ, නස්‍ය, වස්ති, සඳහා යොදති.

අතිස්ථූලනාශක **යි.** කණ්ඩු රෝග හා කඵජ රෝග සඳහා හිත යි.

30. යෝග නාමය :— **දශපාක අණු තෛලය.**

යෝගය :—
තලතෙල්,
එලකිරි,
එළුකිරි,
වැල්මී සුණු, තලතෙල් වලින් 1/4 යි.
දසමුල් කෂාය තෙල මෙන් සිවු ගුණය යි.

කල්කය :—
අරත්ත,
වැල්මී,
සවිඳලුණු,

සංස්කරණය :— කළුතල එලකිරෙන් භාවනා දී එළු කිරෙන් අඹරා, එළුකිරි යෙදූකඩ පිඹමෙ තම්බා රැගෙන සැලියෙහි යෙදූ උණුසුම් එළුකිරෙන් ඇණූ වැල්මී සුණු සමග මිශ්‍ර කොට මිරිකා තෙල් ගෙන දසමුල් කෂාය ද, කල්කය තෙලින් සතරෙන් කොටසක් ද යොද, තෙල සිඳ ගන්න. මෙසේ සිඳගත් තෙල දසමුල් කෂාය හා අරත්ත ආදියේ කල්කය ද යොදමින් දශවාරයක් ම සිඳුවාගත් තෙල දශපාක අණු තෛලය නම්.

ප්‍රයෝග :— සියලු රෝගවලට අභ්‍යංගයට හිත යි. ඌර්ධවජත්‍රු රෝග වලට නස්‍ය සඳහා ශ්‍රේෂ්ඨ යි.

31. **යෝග නාමය :—** **දශපාක බලා තෛලය.**

යෝගය :—

බැවිලමුල්	පල	100	— (ග්‍රෑ: 6000)
ජලය	ද්‍රෝණ	2 යි.	— 1 ට සිඳවා ගත යුතු යි.
තලතෙල්	ප්‍රස්ථ	2 යි.	(ලී: 1.92)
එලකිරි	ප්‍රස්ථ	2 යි.	(ලී: 7.68)
බැවිල්මුල් කල්කය	ප්‍රස්ථ	1/2	(ග්‍රෑ: 480)

සංස්කරණය :— තෛලපාක පරිභාෂා අනුව සිද්ධ කට යුතු ය. එම තෙලට නැවත බැවිල කෂාය කල්කය හා එලකිරි යොද පාක කටයුතු ය. මේ අනුව දශවරක් පාකය දිය යුතු වේ.

ප්‍රයෝගය :— වාතරක්ත — වාත පිත්තජ රෝග — වාත විකාර, ශුක්‍ර දෙෂ, රේතො දෝෂ නස යි.

32. **යෝග නාමය :—** **දශ බලා තෛලය.**

යෝගය :—

බැබිල මුල්	කෂාය
දසමුල්	,,
කොල්ලු	,,
යව,	,,
මසන්	,,
කිරි,	
	භාග 1 බැගින්,
තලතෙල්,	භාග 1 යි.

කල්කය :—

ජීවනීය ගණය,
හාතාවාරිය අල,
මහගොන් කැකිරි අල,
වැල්මදට,
සුවඳකොට්ටම්,
ශිලාජතු,
තුවරලා,
අගිල්,
සව්දලුණු,
වදකහ,
සාරණ,
ජටාමාංස,
හින්ඉරමුසු,
මහඉරමුසු,
තේජපත්‍ර,
ශතපුෂ්ප,
අමුක්කරා,
එන්සාල්,
මේවා කල්කය සාද ගත යුතු යි.

සංස්කරණය :— කල්කය විධි සේ තෙලට යොද තෙල සිඳ ගත යුතු යි.

ප්‍රයෝග :— ගර්භිනීන්ට, ක්ෂීණ රේතස් ඇති අයට, ක්ෂීණ අභ-පයහ ඇති අයට, සූතිකාවන්ට යෙදේ. ස්වස්ථ අයට ද මෙය ගුණ දයක ය.

33. **යෝග නාමය :—** **දශමූල තෛලය (1)**

යෝගය :—

දශමූල	පලං	100 යි.	(ග්‍රෑ: 6000)
වතුර	සේරු	64 - 16 ට සිඳ පෙරා,	(ලී: 61.44 - 15.36)
තලතෙල්	සේරු	4 යි.	(ලී: 3.84)
දශමුල් (මිලිතව)	සේරු	1 යි.	(ග්‍රෑ: 960)

කල්කය :— තෛල පරිභාෂා අනුව සිඳ ගන්නේ ය.

ප්‍රයෝග :— බධිරතා, පූතිකර්ණ, කර්ණ රෝගයන්හි යෙදේ.

(1) සමන්පිච්ච කොල යුෂ, මීපැණි හා දශමූල තෛලය සමග ද,
(2) දශමූල තෛලය ගොමුත්‍ර සමග ද කර්ණපූරණය පිණිස යෙදේ.

යෝග නාමය :— **දශමූල තෛලය අංක (2)**

යෝගය :—

දශමූල ක්වාථය	සේරු	16 යි.	(ලී: 15.36)
තලතෙල්	,,	4 යි.	(ලී: 3.84)
එලකිරි	,,	16 යි.	(ලී: 15.36)
දශමූල කල්කය	,,	1 යි.	(ග්‍රෑ: 960)

ප්‍රයෝග :—

අකාල පලිතයට, ජ්වර, අරුචි, සඳහා නස්‍යය පිණිස යෙදේ.
වාතාධික සූර්යාවර්තයෙහි — අභ්‍යංග, නස්‍ය.
අර්ධාව භේදයෙහි,
සියලුම ශිරෝරෝග සඳහා — ,, ,, පිණිස යෙදේ.

34. **යෝග නාමය :—** **දශවග ප්‍රමෙහ තෛලය.**

යෝගය :—

බෙලිමුලේ පොතු,
ඇහැළමුලේ පොතු,
රණවරාමුලේ පොතු,
ආඩාතෝඩා මුලේ පොතු,
බෙත්එරඩු මුලේ පොතු,
බැබිල මුල්,
කටුකරඩු මුල්,
නෙරෙංචි,
රසකිඳ,
අමුනෙල්ලි.

යන මේවා අමුවෙන් පලම් 10 බැගිනි. (ග්‍රෑ: 600)
කොටා දිය නැලි 20 (ලී: 19.2) ක් දමා මිරිකා ගත යුතු ය.
තැඹිලි කස පැන් ලොදන් සමග නැලි 20 (ලී: 19.2) යි. තැඹිලි පොල් කිරි නැලි 4 (ලී: 3.84)
තලතෙල් නැලි 3 (ලී: 2.88) යි. එරඩු තෙල් නැලි 1 (මි: ලී: 960)

කල්කය :—

කළුදුරු,
සුදුදුරු,
කරාබු,
වසාවාසි,
සාදික්කා,
එන්සාල්,
කුරුඳුපොතු,
කොල්ලන්කොළ,
අරළු,
බුළු,
නෙල්ලි,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
දේවදර,
සුවඳකොට්ටං,
ජටාමාංස,
හිඟුරුපියලි,
උඳු,
වැල්මී,
අරත්ත,
සුදුලූනු,
ඇද්දෙමටමුලේ පොතු,
පළොල්මුලේ පොතු,
වෙලාමුල්,
බැබිල මුල්,
බටුමුල්,
සස්සඳමුල්,
කොල්ලු,
ශතපුෂ්ප,
සෙන්කොට්ටන්,
ඉඟිනි ඇට,
එන්සාල්,
ඉරමුසු මුල්,
හරන්කහ,
වියලිකහ,
වෙනිවැල්ගැට,
අමුකහ,
වදකහ,
ඉරිවේරිය,
සාරණ,
කළුවා අල,
හාතාවාරිය අල,
කිරිබදු අල,
බින්තල් අල,
කලාදුරු අල,
වළහසාල්,
අසමෝදගම්,
කුඹුරුඇට මද,
පෙරුංකායම්,
රත්නෙවුල්,
රත්කිහිරිය,
වැල්මදට,
අබ,
උළුහාල්, — කලං 2 (ග්‍රෑ: 10) බැගින් ගෙන උක් පැණියෙන් අඹරා ගත යුතු යි.

සංස්කරණය :— අමුවෙන් ගත් මුල් ආදිය ගෙන කපා කොටා සැලක ලා, නියමිත දිය බහා පොළොව යට තෙදිනක් තබා පෙරා ගෙන තැඹිලි දිය ඊට මිශ්‍රකර, තෛල සහ කිරි වර්ග කල්ක බහා සමපාකයට තෙල සාද ගන්න.

ප්‍රයෝග :— පාන, අභ්‍යංග, සඳහා යෙදීමෙන් විසි ප්‍රමෙහ, මූත්‍රදෝෂ, රත්පිත, ශ්‍රෝණිත, පාණ්ඩු, අණ්ඩවායු, කටිවායු, අර්ශස්, කපාල වාත, සර්වාංග, වාත, ගුල්ම, ශෝථ, උදවර්ත, හතිය, බරවා, නෂ්ටකාම, ප්‍රමෙහ පිඩකා, සියළු සන්නි, කාස, ශ්වාස, සියළු හෘද්රෝග, හිසරුද, කණ්ඩමාල, සියළු ස්ත්‍රී රෝග. සෙම් බැඳීම යනාදියට ප්‍රත්‍යක්ෂ යි.

35. **යෝග නාමය :—** **දිව්‍ය නාග තෛලය.**

යෝගය :—

කපුකොළ	රාත්තල් 15	යි.	(ග්‍රෑ: 7200)	
එරබදු පොතු	රාත්තල් 15	යි.	(ග්‍රෑ: 7200)	
මුරුංගා පොතු	රාත්තල් 10	යි.	(ග්‍රෑ: 4800)	යුෂ බෝතල් 18 (ලී: 12.96)
කොහොඹ පොතු	රාත්තල් 25	යි.	(ග්‍රෑ: 12000)	
තැඹිලි පොල්කිරි	බෝතල් 5 1/2	යි.	— (ලී: 3.96)	
තලතෙල්	බෝතල් 1 1/2	යි.	— (ලී: 1.08)	
මීතෙල්	බෝතල් 1 1/2	යි.	— (ලී: 1.08)	
කොහොඹ තෙල්	බෝතල් 1 1/2	යි.	— (ලී: 1.08)	

කල්කය :—

දේවදර	කලං	9	(ග්‍රෑ: 45)	පෙරුංකායම්	කලං	9	(ග්‍රෑ: 45)
අබ	කලං	9	(ග්‍රෑ: 45)	කුඹුරුඇට මද	කලං	9	(ග්‍රෑ: 45)
වදකහ	කලං	9	(ග්‍රෑ: 45)	පුස්ඇට මද	කලං	9	(ග්‍රෑ: 45)
				කොකුම් පොතු	කලං	9	(ග්‍රෑ: 45)

ප්‍රයෝග :— මෙම තෙල සියලු විෂට, පානය සඳහා ද තද ඉදිමුමට හා තැත ගෑමට ද යෙදේ.

මාත්‍රාව :— වරකට බිංදු 60 කි.

36. යෝග නාමය :— **දිව්‍යාංගනාදි තෛලය.**

යෝගය :—
කුරුඳුමුල්, පොතු, ඇට, හුඹුම්රිය මුල්,
එඬරු මුල්, මලබුලත් නැටි,
මඟුල්කරඳ මුල්, අරළු,
හික්මුල්, බුළු,
ගම්මිරිස් මුල්, නෙල්ලි.
කරවිල මුල් — පලම 1 (ගු: 60) බැගිනි.
ජලය — නැළි 16 යි. (ලී: 15.36)
එරඬු තෙල්,
මීතෙල්,
පොල්තෙල් — එකින් නැලිය (මී: ලි: 960) බැගිනි.

කල්කය :—
දේවදර, ශතපුෂ්ප, පත්පාඩගම්,
අසමෝදගම්, ඉඟුරු, හිඟුරුපියලි,
දේවදුරු, ගජතිප්පිලි,
ගම්මිරිස්, තිප්පිලි — එකින් කලං 3 (ගු: 15) බැගිනි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය වර්ග පිරිසිදුව කිරා ගෙන කොටා, සුදුසු බඳුනක බහා ජලය නැළි 16 නැළි 4 ට (ලී: 15.36-3.84) සිඳුවා පෙරා, ඊට තෙල් වර්ග ද මිශ්‍රකොට අඹරන ලද කල්කය ද යොද, තෛල, පරිභාෂාව අනුව සිඳුවා දියපිටට පෙරා ගන්න. සුවඳ කොට්ටම් කබලින් බැද කුඩුකර, පෙරූ තෙලට බහා සුවඳවත් කරන්න.

ප්‍රයෝග :— නස්‍ය, පාන, අභ්‍යංග, සඳහා යෙදේ. සන්ධිගත වාත, ශීර්ෂ රුජා, කටී ශූල, සූතිකාරෝග, දසට සන්නිරෝග, සර්පවිෂ, උන්මාද, අපස්මාර, ආදියට නස්‍ය, පාන, අභ්‍යංග කිරීම සඳහා යෙදේ.

මාත්‍රාව :— තේ හැඳි 1—2 දක්වා බීමට ද බිංදු 5 — 10 නස්‍යයට ද යෙදේ.

37. යෝග නාමය :— **දූර්වාදී තෛලය.**

යෝගය :—
ඊතණ යුෂ සේරු 4 යි. (ලී: 3.84 යි.)
තලතෙල් සේරු 1 යි. (මී: ලී: 960 යි.)

කල්කය :—
ඊතණ චූර්ණය සේරු 1/4 යි. (ගු: 240 යි.)
තෛල පාක පරිභාෂාවෙන් තෙල සිඳවා ගන්නේ ය.

ප්‍රයෝග :— කච්ඡු, පාමා, කුෂ්ඨ සහ පීනස සඳහා යෙදේ.

38. යෝග නාමය :— **නයන කේතකී තෛලය.**

යෝගය :—
වැටකේ අරළු යුෂ නැළි 12 යි. (ලී: 11.52)
එලකිරි නැළි 6 යි. (ලී: 5.76)
එරඬුතෙල් නැළි 3 යි. (ලී: 2.88)
තලතෙල් නැළි 3 යි. (ලී. 2.88)

කල්කය :—
වැල්මී, බැබිල,
ඉරිවේරිය, මුඟුනුවැන්න,
සැවැන්දරා, කීකිරිඳිය,
දේවදර, කුප්පමේනිය,
ලුණුවරණ, එලබිංතඹුරු,
ඉඟිනි ඇට, කළුදුරු,
කයිප්පු, අරළු,
උරුලෑසවටම්, බුළු,
හිඟුරුපියලි, නෙල්ලි,
ඔලිඳ මුල්, සුදුහඳුන්,
සෙම්කොට්ටන්, — කලං 8 (ගු: 40) බැගිනි.

සංස්කරණය :— තෛල පාක ක්‍රමය අනුව තෙල පදමට සිඳුවා පෙරා ගන්න.

ප්‍රයෝග :— අක්ෂි, නීල කාච, පටල, තිමිර, කඳුළු යාම හා කපාල වාතයට ද විශේෂයෙන් යෙදේ.

39. යෝග නාමය :— **නයනාභරණ තෛලය.**

යෝගය :—
රසකිඳ කොළ, වැල් යුෂ නැළි 4 යි. (ලී: 3.84)
කෝමාරිකා යුෂ නැළි 4 යි. (ලී: 3.84)
වැටකේ අරළු යුෂ නැළි 4 යි. (ලී: 3.84)
අඹුනෙල්ලි යුෂ නැළි 4 යි. (ලී: 3.84)

හාතාවාරිය යුෂ	නැළි 4 යි.	(ලී: 3.84)
අමුනෙළුන් දඬු යුෂ	නැළි 4 යි.	(ලී: 3.84)
තලතෙල්	නැළි 4 යි.	(ලී: 3.84)
එළකිරි	නැළි 4 යි.	(ලී: 3.84)

කල්කය :—
වංඇපල,
නෙළුන් අල,
එන්සාල්,
ජටාමාංශ,
ගල්සෙවෙල්,
ලොත්සුඹුළු,
අංජන කැට,
කොකුම් පොතු,
කුරුඳුපොතු,
ඇටිකෙහෙල් මැලියම්,
නාමල්රේණු,
අගිල්,
සුදුහඳුන්,
රුක්මල්,
සුවඳකොට්ටන්,
මානෙල් අල,
දෙඹ මල්,
තුවරලා,
ඉරිවේරිය,
කොල්ලන් කොළ,
මුද්දිරප්පලම්, තිකුළු, තිපල්, වම්මුතු, ජීවක, ඍෂභක, මේද, මහමේද, කංවෙළු, කිරිකංවෙළු, මේවා, එකින් කලං 4 (ග්‍රෑ: 20) බැගිනි.

සංස්කරණය :— තෛල පාක ක්‍රමය අනුව තෙල සිඳ ගත යුතු ය.

ප්‍රයෝග :— නස්‍ය, ශිර්ෂාභ්‍යංග වශයෙනි. අක්ෂි රෝග (අධිමන්ථ), අඳුරුපටල, දහ රෝග හා ඇසේ නොයෙකුත් රෝග නසයි. රත්පිත් උන්මාද නාශක යි.

40. යෝග නාමය :— **නවපටල තෛලය.**

යෝගය:—
කේශරබැබිල,
කුප්පමේනිය,
කලාඳුරු අල,
නිකකොළ,
වැටකේ අරළු,
කොහොඹ මුල්,
මුඟුනුවැන්න,
මකුළුවැන්න,
සැවැන්දරා මුල්,
ගස්බැබිල,
ඔලිඳ,
සමදරා,
සස්සඳ,
සිරිවැඩි බැබිල,
ඉරමුසු,
ඉරිවේරිය සහ මදරා,
කරල්සැබෝ, — එකින් පලම් 1 (ග්‍රෑ: 60) බැගිනි.

සංස්කරණය:— ජලය නැළි 18 ක් (ලී: 17.22) දමා ඌරු වීමට දින තුනක් තබා මිරිකා පෙරා ගන්න.

එළකිරි	නැළි 4 යි.	(ලී: 3.84)
තලතෙල්	නැළි 2 යි.	(ලී: 1.92)
එරඬු තෙල්	නැළි 2 යි.	(ලී: 1.92)

කල්කය :—
සුදු නෙළුන් රේණු,
සපුමල්,
ත්‍රිවර්ග,
තිප්පිලි,
අසමෝද,
වියලිකහ,
වදකහ,
ඉඟුරු,
රටතෝර්මුල්,
තිපල්,
අබ,
දෙදුරු,
ශතපුෂ්ප,
කොතඹුරු,
වැල්මී,
සුවඳකොට්ටම්,
සුදුළූනු,
දේවදර,
එන්සාල්,
වෙනිවැල්,
කුරුඳුපොතු,
නාමල්රේණු,
ඉඟුරුපියලි — මේවා එකින් කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගිනි.

සුදුහඳුන් කුඩු	කලං 8 යි.	(ග්‍රෑ: 40)
උරුලෑ සට්ටම	කලං 4 යි.	(ග්‍රෑ: 20)

සංස්කරණය — තෛලපාක ක්‍රමයට අනුව තෙල සිඳිනු.

ප්‍රයෝග :— උකුණුවල හිරිවැටීම සහිත කපාල වායු, ශීර්ෂ රුජා, හා හොටු ගලන පීනසට ද යෙදේ. අක්ෂි රෝග යන්ට විශේෂයෙන් යෙදේ. තිමිර, පටල, ඇසරුජා, ඇඳිරි ආදිය නසන්නේ ය.

සැ: යු:— කේසරසිංහ නවපටල රාජ තෛලය යනු ද මෙයම වේ.

41. යෝග නාමය :— **නාරායණ තෛලය.**

යෝගය :—

අමුක්කරා,
බැබිල.
බෙලි,
පලොල්,
ඇද්දෙමට
දෙබටු,
අස්වැන්න,
සිරිවැඩි බැබිල.
කොහොඹ,
තොටිල පොතු,
සාරණමුල්,
ගන්ධප්‍රසාරණී.
සිහින් මිදි,
පොල්පලා,
ගොකටු — එකින් පලම 10 (ග්‍රෑ: 600) බැගිනි.

ජලය	ද්‍රෝණ	4 යි	(ලී: 61.44)
තලතෙල්	ආඪක	1 යි.	(ලී: 3.84)
හාතාවාරිය යුෂ	ආඪක	1 යි.	(ලී: 3.84)
එලකිරි	ආඪක	4 යි.	(ලී: 15.36)

කල්කය :—

කොට්ටම,
හීන්එන්සාල්,
සුදුහඳුන්,
බැවිල මුල්,
ජටාමාංශ,
පර්ණිචතුෂ්කය (ශාලපර්ණී, පෘෂ්ණිපර්ණී, මුද්ගපර්ණී, මාෂපරණී)
ශෛලය,
සවිඳලුණු.
වදකහ,
හීන්අරත්ත අල.
ශතපුෂ්ප.
දේවදර,
තුවරලා.
අමුක්කරා — එකින් පලම 2 (ග්‍රෑ: 120) බැගිනි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය ගෙන හොඳින් කොටා ජලය ද්‍රෝණ හතර ද්‍රෝණයට සිඳුවා පෙරා ඊට එලකිරි, හාතාවාරිය යුෂ සහ තලතෙල් මිශ්‍රකොට, ඇඹරූ කල්කය බහා තෛලපාක පරිභාෂා අනුව සිඳුවා තෙල (දිය පිටට) බා ගන්න.

ප්‍රයෝග :— නස්‍ය, පාන, අභ්‍යඞ්ග, වස්ති, සඳහා යොදති. පක්ෂඝාත, බාලක පක්ෂඝාත ආදි වාත රෝගයනට ප්‍රත්‍යක්ෂ යි. මාංසක්ෂය නැතිවී ශරීර බලය වඩයි. අණ්ඩ වෘද්ධි, පාර්ශව ශූල. ගෘධ්‍රසී. අර්දිත ආදි රෝග. (වාත රෝග) නසයි.

42. යෝග නාමය :— **නාරායණ තෛලය (මහා)**

යෝගය :—

බෙලිමුල්,
අමුක්කරා,
එලබටු,
ගොකටු,
තොටිල,
බැබිල,
කටුවැල්බටු,
සාරණමුල්,
අතිබලා,
හීන්මිදි,
ප්‍රසාරණී,
පලොල් මුල්,
එරබදු මුලේ පොතු — එකින් ප්‍රස්ථ 1 1/4 (ග්‍රෑ: 1200) බැගිනි.

ජලය	ද්‍රෝණ	8 යි.	(ලී: 122.88)
එලකිරි හෝ එළුකිරි	ආඪක	2 යි.	(ලී: 7.68)
තලතෙල්	ආඪක	2 යි.	(ලී: 7.68)
හාතාවාරිය යුෂ	ආඪක	2 යි.	(ලී: 7.68)

හීන්අරත්ත,
අමුක්කරා,
ශතපුෂ්ප,
දේවදර,
කොට්ටම,
අගිල්,
නාමල්රේණු.
සෛන්ධව,
ජටාමාංශ,
වියලිකහ
වෙනිවැල්ගැට,
ශෛලය,
සුදුහඳුන්,
හීන්එන්සාල්,
වැල්මදට,
රත්හඳුන්,
වැල්මී,
තුවරලා,
කලාඳුරු අල.
තේජපත්‍ර,
කුරුඳු පොතු.
වදකහ,
කැල මුල්.
ස්ථෞණෙය (ග්‍රන්ථිපර්ණී).
සාරණමුල්.
ශාලපර්ණී,
පෘෂ්ණි පර්ණී.
මාෂ පර්ණී.
මුද්ග පර්ණී.
මේද,
මහාමේද,
කාකෝලි.
ක්ෂීර කාකෝලි.
ඍද්ධි,
වෘද්ධි,
ඍෂභක.
ජීවක,
පුෂ්කර ,(සුවඳ කොට්ටන්), හිඟුරු පියලි එකින් පලම 2 (ග්‍රෑ: 120) බැගිනි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය පිරිසිදුව කිරා ගෙන කොටා, සුදුසු භාජනයකට දමා ජලය ද්‍රෝණ 8 ක් (ලී: 122.88) දමා ද්‍රෝණ 2 ට (ලී: 30.72) සිඳුවා පෙරා ගන්න. ඊට තලතෙල්, එළකිරි, හාතාවාරිය යුෂ මිශ්‍රකර, ඇඹරූ කල්කය ද බහා තෛලපාක ක්‍රමයට සිඳුවා (දිය පිටට) පෙරා ගන්න.

ප්‍රයෝග :— නස්‍ය, පාන, වස්ති, අභ්‍යඞ්ග, අනුවාසන සඳහා යොදයි. පක්ෂඝාත, අර්දිත, වෙපථු, ශුක්‍රක්ෂය මන්‍යාස්තම්භ, ශිරෝරෝග නසයි. බල, වර්ණකරයි. වඳ බව නසයි. මේධාකර යි. කෝෂ්ඨ ගත වායු, වෘද්ධි රෝග, ජිහ්වා රෝග, උන්මාද, ජ්වර කාර්ශ්‍ය නසා ලක්ෂමීකරයි.

43. යෝග නාමය :— **නිම්බාදි තෛලය.**

යෝගය :—

කොහොඹකොළ යුෂ	ප්‍රස්ථ 45 යි.	(ලී: 43.2)
වැටකේ අරළු යුෂ	ප්‍රස්ථ 75 යි.	(ලී: 72.00)
පොල්කිරි	ප්‍රස්ථ 90 යි.	(ලී: 86.4)
තලතෙල්	ප්‍රස්ථ 90 යි.	(ලී: 86.4)

කල්කය :—
දෙදුරු,
කොට්ටම්,
ශතපුෂ්ප,
කරාබු,
පල්මානික්කම්,
අරළු,
තෙල්ලි,
සාදික්කා,
වැල්මී,
ඉඟුරු,
අතිවිඩයන්,
තිප්පිලි,
වසාවාසි — මේවා එකින් පලං 12 යි. (ගු: 720)

සංස්කරණය :— තෛලපාක ක්‍රමය අනුව තෙල සිඳිනු.

ප්‍රයෝග :— පීනස් රෝගයන්ට විශේෂයෙන් ගුණ යි.

44. යෝග නාමය :— **නිර්ගුණ්ඩ්‍යාදි තෛලය.**

යෝගය :—

නිකකොළ යුෂ	නැළි 16 යි.	(ලී: 15.36)
තලතෙල්	නැළි 4 යි.	(ලී: 3.84)

කුරුඳුපොතු,
එන්සාල්,
තේජපත්‍ර,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
සූදුරු,
කළුදුරු,
සහිඳලුණු,
සාරණමුල්,
තෝර පරිප්පු මුල් (රතු මයිසූර් පරිප්පු මේ සඳහා යෙදීම වෘද්ධ වෛද්‍ය ව්‍යවහාරය වේ.)
දේවදර,
වදකහ,

සංස්කරණය :— මෙම ද්‍රව්‍ය කලං 8 (ගු: 40) බැගින් චූර්ණකර කල්කය බහා තෛලපාක විධියෙන් සිඳුවා ගන්නේ ය.

ප්‍රයෝග :— වාත ශ්ලේෂ්මජ ශිරෝ රෝග, පීනස, කර්ණනාද, බධිරතාදියෙහි ශ්‍රේෂ්ඨ ය., නස්‍ය අභ්‍යංග සඳහා ය.

සැ: යු:— කල්කටාවේ දෙස්තර, කේ. සී. බසුගේ රසායනාගාරයෙහි නිකගහ සහමුලින් කෂාය කර තෙල සිඳුව යි. එහි කල්කයක් නැත. එම පාමා ආදි චර්මරෝගයන්හි ද ව්‍යවහාර ය. එය චක්‍රදත්ත නාඩීව්‍රණධිකාර යෙහි සඳහන් නිර්ගුණ්ඩි තෛලය ම වේ. ඔඩු වණ හා දුෂ්ඨ වණ සඳහා පාන අභ්‍යංග විසින් යෙදේ.

45. යෝග නාමය :— **නිශාදි තෛලය.**

යෝගය :—

අමුකහ යුෂ	නැළි 4 යි.	(ලී: 3.84)
කීකිරිදිය යුෂ	නැළි 4 යි.	(ලී: 3.84)
මුකුණුවැන්න යුෂ	නැළි 4 යි.	(ලී: 3.84)
තලතෙල්	නැළි 1 1/2 යි.	(ලී: 1.44)
මීතෙල්	නැළි 1 1/2 යි.	(ලී: 1.44)

කල්කය :—
දේවදුරු,
වැල්මී,
කොත්තමල්ලි,
රතුලූනු,
සුදුලූනු,
අක්‍රපට්ටා,
කළුදුරු,
සූදුරු,
අසමෝදගම්,
සුවඳකොට්ටං – පලං 1 (ගු: 60) බැගිනි.

තෛල පරිභාෂාව අනුව තෛලය සිඳුවා ගන්නේ ය.

ප්‍රයෝග :— සර්ව විධ පීනස් රෝගයන්හි නස්‍ය අභ්‍යංග පාන සඳහා ය.

46. යෝග නාමය :— **නීල්‍යාදිය.**

යෝගය :—

මදටිය කොළ යුෂ	නැළි 15 යි.	(ලී: 14.4)
මදටිය පොතු යුෂ	නැළි 15 යි.	(ලී: 14.4)
අංකෙන්ද කොළ යුෂ	නැළි 15 යි.	(ලී: 14.4)
අංකෙන්ද පොතු යුෂ	නැළි 15 යි.	(ලී: 14.4)
වැල්කැප්පෙටිය කොළ සහ පොතු		
දෙවගේ යුෂ	නැළි 30 යි.	(ලී: 28.8)
දියහබරල යුෂ	නැළි 30 යි.	(ලී: 28.8)
පොල්කිරි	නැළි 30 යි.	(ලී: 28.8)
පොල්තෙල්	නැළි 30 යි.	(ලී: 28.8)

සුදුලූනු,
දෙදුරු, — කලං 60 බැගින්. (ගු: 300)

කල්කය :—

සාදික්කා,
වසාවාසි,
කරාබු,
සූදුරු,
අසමෝදගම් — කලං 130 (ගු: 50 බැගිනි.)
අතිවිඩයම්,
තිප්පිලි,
කළුදුරු,
කටුකරෝසන,

සංස්කරණය :— දිය හබරල සහ නිල් අවරිය හැර ඉතිරි ද්‍රව්‍ය සුදුලූනු සහ දෙදුරු සමග කොටා රැයක් තබා පසුදින උදැසන පෙරා යුෂ ගෙන ඊට තෙල් සමග දිය හබරල යුෂ දමා පාකයට ආසන්න වූ විට නිල් අවරිය යුෂ දැමිය යුතු ය.

ප්‍රයෝග :— බඩවැලෙන් ලේ යෑමට, ලේ රත, මහ ගඩු, කොර, සන්නි ගෙඩි, කුෂ්ඨ, බඩ මළ දරුවන් (වැටීමට) රත්තජ ශොථ ආදියෙහි යෙදේ. ගැබිණි මව් වරුන්ට පෙවීමෙන් දරුවාට රතය නො සෑදේ. ළදරු රතගාය හා ගැබිණියන්ගේ ලේකෝපරෝග, ක්ලාන්ත, කරකැවිල්ල, ඇස් දැවිල්ල, කබ කඳුළු ගැලීම ආදිය නිවාරණය කෙරේ.

47. යෝග නාමය :— **නීලරාජ තෛලය**

යෝගය :—

කපු,
අත්තන,
අමුකහ,
එරබදු,
තල,
කරඳ,
සිවිය,
බටු,
කටුවැල්බටු,
කරිවිල,
පාවට්ටා
පුවක්,
තොලබෝ,
ගිරිතිල්ල වැල්,
තිප්පිලි,
වදකහ,
මහකළුවා,
වරා,
බුලත්ගිරිද,
ගැටතුඹ,
කීකිරිදිය,
මාරා,
කළුකැම්බේරිය,
කතුරු,
අලුකෙහෙල්,
රසතැල්, (තැල්කොළ)
කරිවිල,
කරල්සෑබෝ,
සෙප්පාඩිය,
සස්සඳ,
දළුක් — මෙකී දේ මිලිතව නැළි 8 ක් (ගු: 7680) ගෙන කොටා මුත්‍රයෙන් අනා යුෂ සතර නැළියක් ගෙන තලතෙල් නැළි 1 ක් (මි: ලී: 960) යොද,

සරක්කු :—

ලශුනු,
එන්සාල්,
කොල්ලං කොළ,
කුරුඳු පොතු,
ගම්මිරිස්,
සිද්ධිභූරු,
තිප්පිලි,
පෙරුංකායම්,
වදකහ,
සාරණ,
එළකටරොළු ඇට,
එළ ඔළිඳ ඇට,
සෑබෝ ඇට,
මහකළුවා,
වරා මුල්,
අමුක්කරා මුල්,

කලං 2 (ගු: 10) බැගින්, තෙලට යොද තුන් දිනක් ගිනිකර සිද්ධියෝගයෙන් සමපාකයට තෙල පෙරා සර්ප විෂට මද්ටිය 1 (මි: ලී: 250) ක් බීමට සහ කැ මුකේ ගෑමට යෙදේ. ගෝනුසු. බූපණු, මීවිෂ හා පිස්සු බලු විෂට මනා ය.

48. යෝග නාමය :— **නෙත්‍ර පටල කාන්තිරත්න තෛලය.**

යෝගය :—

මහ බැව්ල මුල්,
සිරිවැඩි බැව්ල මුල්,
අමුතෙල්ලි,
රසකිඳ — පලම් 1 බැගිනි. (ග්‍රෑ: 60)
තැඹිලි පැන් කුරුණි අටක් බහා 1/8 ට සිඳුවනු

කුරමුල්	යූෂ	කෝමාරික	යූෂ
හින්මුගුනුවැන්න	,,	වැටකේ අරළු	,,
මහමුගුනුවැන්න	,,	වැටකේ ගෙඩි	,,
ඔලිඳ වැල්,	,,	පුහුල්	,,
වැල්පෙනෙල,	,,	එලකිරි,	
මීකිරි,			

මෙවා එකින් කුරුණි දෙක බැගින් (එලකිරි, මීකිරි හැර) ඉතිරි යූෂ බහා 1/4 ට සිඳුවනු. 1/8 ට හා 1/4 ට සිඳුවා ගත් කෂාය දෙක එකට මිශ්‍ර කරනු.

තලතෙල්,
එඬරුතෙල්,
ගිතෙල් — නැළි 4 1/2 (ලී: 4.32) බැගිනි.

ඉහත සඳහන් බෙත් යූෂ හා කිරි කෂායට එක් කර දින තුනක් ඌරුවෙන්ට තබනු.

ඉරිවේරිය,
සැවැන්දරා,
ඉරමුසු,
සුදුහඳුන්,
වැල්මී — පලම් 1 බැගිනි. (ග්‍රෑ: 60)
ඉඟුරුපියලි,
කෙකටිය අල,
නෙළුම් අල — කලං 6 බැගිනි. (ග්‍රෑ: 30)
කළුදුරු,
සූදුරු,
කලාදුරු අල,
අරළු,
බුළු,
නෙල්ලි,
බින්තල් අල,
කරාබු,
වසාවාසි,
සාදික්කා,
දෙව්දුරු,
රත්හඳුන්,
කපුරු,
කුරුඳුපොතු,
සුවඳකොට්ටම,
ශතපුෂ්ප,
උළුවාහාල්,
අසමෝදගම්,
උරුලෑසවටම,
පිතකරෝසන,
ඉඟිනි ඇට,
වෙනිවැල්ගැට,

මෙවා එකින් කලං 3 (ග්‍රෑ: 15) බැගිනි. සතියකින් තෙල සිඳ ගත යුතු ය.

ප්‍රයෝග :— පාන, අභ්‍යංග, ශීර්ෂාභ්‍යංග සඳහා යොදති. රත්පටල, කාච, ඇඳිරි, උල්වාරත්, ආදි නෙත්‍ර රෝග සඳහා විශේෂයෙන් හිස ගෑමට යොදති.

49. යෝග නාමය :— **පක්ෂඝාත වායු සූන්‍ය තෛලය.**

යෝගය :—

සුවසලුණු,
යවකාර ලුණු,
සහිඳලුණු,
බළල් ලුණු, — කලං 4 (ග්‍රෑ: 20) බැගිනි.
තිප්පිලි,
කළුදුරු,
සූදුරු,
සුවඳකොට්ටම,
අමුක්කරා අල,
කරාබු,
වයාවාසි,
පෙරුම්කායම් — කලං 2 (ග්‍රෑ: 60) බැගිනි.
සුදුලූනු (පොතුහැර) රාත්තල් 15 යි. (ග්‍රෑ: 7200 යි.)
අබ රාත්තල් 2 1/4 1/8 කලං 2 යි.
කුරුඳුපොතු, රාත්තල් 2 1/4 1/8 කලං 2 යි.
තලතෙල්,
ගිතෙල් එකින් බෝතල 7 1/8 බැගිනි.

සංස්කරණය :— තෛලපාක ක්‍රමයට සිඳ ගන්න. තෙල් මෙන් සිව්ගුණයක් වතුර දමා (කෂාය) 1/4 ට සිඳුවා ගන්නේ ය.

ප්‍රයෝග :— බීමට මාත්‍රාව බලා දෙන්න. පක්ෂඝාත වායු හා ඉදිමුම් වාත සුව කෙරේ. පක්ෂඝාත රෝගයේ මුල් (ආම) අවස්ථාවට විශේෂයෙන් ගුණ යි.

50. යෝග නාමය :— **පසකුරු තෛලය.**

යෝගය :—
නුගපොතු, අත්තික්කා පොතු,
ඇහැටු පොතු, මාදම් පොතු,
බෝ පොතු — එකින් පලම (ගු: 60) බැගිනි.
ජලය නැළි 8 — 4 ට (ලී: 7.68 — 3.84) සිඳුවනු.

කල්කය :—
එන්සාල්, සුදුහඳුන්,
කුරුඳු පොතු, රත්හඳුන්,
නාමල්රේණු, පියුම්අල,
තගර, ඉරමුසු මුල්,
වැල්මී, ඉඟුරුපියලි,
දේදුරු — කල· 1 1/2 බැගිනි. (ගු: 7.5)
තලතෙල් නැළි 1 යි. (මි: ලී: 960 යි.)

සංස්කරණය :— තෙල් පදමට සිඳින්න.

ප්‍රයෝගය :— කැපුම්, කෙටුම්, කැඩුම්, බිඳුම්, අවහන්දි, උළුක්කු ආදියට යෙදේ.

පිණ්ඩ තෛල I, II, III, IV

51. යෝග නාමය :— **පිණ්ඩ තෛලය (I)**

යෝගය :—
ආරණල (කාඩි) ආඪක 1 යි. (ලී: 3.84)
ගිතෙල් ප්‍රස්ථ 1/2 යි. (ගු: 480 යි.)
තලතෙල් ප්‍රස්ථ 1/2 යි. (මි: ලී: 480 යි.)
හල් දුම්මල කුඩව 1 යි. (ගු: 240 යි.)

සංස්කරණය :— තෛල පරිභාෂාවෙනි.

ප්‍රයෝග :— අධික ප්‍රමාණයක් වූ ජලය හා මිශ්‍ර කොට කලතා ගෑමෙන් උණ, දහ, වේදනා සංසිඳේ.

යෝග නාමය :— **පිණ්ඩ තෛලය (II)**

යෝගය :—
තලතෙල් ප්‍රස්ථ 1 යි. (මි: ලී: 960 යි.)
මී ඉටි
වැල්මදට චූර්ණය
සුදු දුම්මල (හල්)
ඉරමුසු මුල්
මේවා මිලිතව කුඩව 1 යි. (ගු: 240 යි.)
මෙම චූර්ණය තලතෙල් සමග හොඳාකාර කලතා මිශ්‍රකොට සම්පූර්ණ දවසක් තබා ඉන් පසු වස්ත්‍රයෙකින් පෙරා ගන්නේ ය.

යෝග නාමය :— **පිණ්ඩ තෛලය (III)**

ඉරමුසු මුල්
හල් (සුදු) දුම්මල
වැල්මදට
වැල්මී
මී ඉටි * මිලිතව ප්‍රස්ථ 1 යි. (ගු: 960 යි.)
එලකිරි ප්‍රස්ථ 16 යි. (ලී: 15,36 යි.)
තලතෙල් ප්‍රස්ථ 4 යි. (ලී: 3.84)

සංස්කරණය :— තෛල පරිභාෂාවෙනි. *මී ඉටි තෙල පෙරීමට ආසන්න වූ කල්හි දියකර පෙරා ගන්නේ ය.

52. යෝග නාමය :— **පිණ්ඩ තෛලය. (IV)**

යෝගය :—
ඉරමුසු මුල්
*මී ඉටි
හල් (සුදු)දුම්මල
වැල්මී මිලිතව ප්‍රස්ථ 1 යි. (ගු: 960 යි.)
එලකිරි ප්‍රස්ථ 16 යි. (ලී: 15.36)
එරඬු තෙල් ප්‍රස්ථ 4 යි. (ලී: 3.84 යි.)

සංස්කරණය :— තෛල පරිභාෂාවෙනි. -මී ඉටි තෙල පෙරීමට ආසන්න වූ කල්හි දිය කර පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— II, III සහ IV යෝග තුන ම දහාධික කුෂ්ඨ, හම පිපිරීම, පතුල්, රත්-කලු වීම හා ශොථ සහිත උග්‍ර වාත රක්තයෙහි අභ්‍යංගය සඳහා යෙදේ.

53. යෝග නාමය :— **පිළිස්සුම් තෛලය.**

යෝගය :—

නවසි පොල්කිරි	නැළි 4 යි.	(ලී: 3.84)
රතුලූනු යුෂ	නැළි 1 යි.	(මි: ලී: 960 යි.)
බුරුල්ල මද, කොළ, පොතු යුෂ	නැළි 1 යි.	(මි: ලී: 960 යි.)
බළුදම් කොළ, පොතු යුෂ	නැළි 1 යි.	(මි: ලී: 960 යි.)
මාදම් කොළ, පොතු යුෂ	නැළි 1 යි.	(මි: ලී: 960 යි.)

කල්කය :—

සුදුරු,
කළුදුරු,
අසමෝදගම,
මාදුරු — කලන් 8 (ගු: 40) බැගිනි.
තැඹිලි පොල්තෙල් නැළි 2 යි. (ලී: 1.92)

සංස්කරණය :— තෛලපාක ක්‍රමයට තෙල සිඳ පෙරා ගත යුතු ය.

ප්‍රයෝග :— සුළු වශයෙන් පිළිස්සුනු විගස ම බිත්තර සුදුමදය තල තෙල් සමග ගාන්න. බිබිලි නො නගී. බිබිලි නැගීම් ආදිය ආවොත් මේ තෙල පුළුන්වල ගල්වා පිළිස්සුනු තැන්වල තබන්න.

විශෙෂ ගුණ :— මුළු ඇඟ ම හෝ ඇඟෙන් වැඩි කොටසක් ගින්නෙන් පිළිස්සුන වහා ම, ටින් එකක් පමණ පොල් තෙල් වලින් ඒ කොටස හොඳට නාවා, දිය නුමුසුව කෙහෙල් කඳේ පතුරු ගෙන හැකිතාක් යුෂ මිරිකා කන හුණු බුළු ගෙඩියක් පමණ ඊට දියකර ඇඟ ගල්වනු. බිබිලි නොනගී. පසුව ඇතිවන උපද්‍රව සඳහා ඉහත සඳහන් පිළිස්සුම් තෛලය පුළුනේ රඳවා ගානු.

සුළු වශයෙන් සෑම පිළිස්සුමකට ම කහ කුඩු දෙහි ඇඹුලෙන් අනා ගෑමෙන් ද දැවිල්ල හා විෂ ගතිය ද අඩු වී බිබිලි ද නො නගී.

ඇසිඩ් වර්ගයකින් පිළිස්සුන කල්හි බිත්තර සුදුමදය ඔලිව් තෙල් සමග ගෑම හා කෙහෙල් පතුරු යුෂ හුණු මිශ්‍රකොට ගෑම ද ගුණ ය.

54. යෝග නාමය :— **බවුතෙල.**

යෝගය :—

කොහොඹ කොළ,
කොහොඹ පොතු,
රසතැල් සහමුලින්,
හිඟුරුපට වැල්,
එරබදු කොළ,
එරබදු පොතු,

කෝමාරිකා මද,
එලබටු පංචාංගය,
නිකකොළ,
නිකපොතු,
ඔලිද සහමුලින්,
කුප්පමේනිය මුල්.

හිංමදුරුතලා සහමුලින්,
වැල්පෙනෙල සහමුලින්,
කහපෙනෙල පොතු,
කහපෙනෙල කොළ,
කප්පරවල්ලිය,
මීමුරු,

(මීමුරු, තම්බා මිරිකා ගන්නේ ය.)
මෙම ද්‍රව්‍ය කොටා යුෂ නැළිය (මි: ලී: 960 බැගිනි).

දෙහි ඇඹුල්	නැළි 1 යි.	(මි: ලී: 960 යි.)
තලතෙල්	නැළි 6 යි.	(ලී: 5.76 යි.)
තැඹිලි පොල්කිරි	නැළි 6 යි.	(ලී: 576) යි.යි.
කිතුල් හකුරු	රාත්තල් 1 1/2 යි.	(ගු: 720 යි.)

කල්කය :

සුදුදුරු,
කළුදුරු,
කරාබු,
වසාවාසි,
සාදික්කා,
ගම්මිරිස්,
සුදුලූනු,
සිනක්කාරං — පලං (ගු: 60) බැගිනි.

අරළු,
බුළු,
නෙල්ලි,
කොත්තමල්ලි,
ඉඟුරු,
අතිවිඩයම්,
හිඟුරුපියලි,

ප්‍රයෝග :— ළදරුවන්ගේ සියලු ම සෙම් රෝගවලට හිස ගැල්වීමට, පපුවේ ගෑමට, කැස්සට ඇදුමට, කක්කල් කැස්සට පානය සඳහා යෙදේ. ළදරුවන්ගේ හිස ගැල්වීමට පොදු තෙලකි.

55. යෝග නාමය :— **බලාකෝරණ්ඩ තෛලය. (මහා)**

යෝගය :—

බැබිල මුල්.	පලම් 50 යි.	(ගු: 3000 යි.)
කටුකරඬු මුල්.	පලම් 50 යි.	(ගු: 3000 යි.)
ජලය	නැළි 64–16 ට,	(ලී:61.44–15.36) සිඳුවා ගත යුතුයි.
එලකිරි	නැළි 16 යි.	(ලී: 15.36 යි.)
තලතෙල්	නැළි 4 යි.	(ලී: 3.84 යි.)

කල්කය :—
සුදුහඳුන්,
හොරඅරටු,
කොට්ටන්,
එත්සාල්,
හිඟුරුපියලි,
ඉරමුසු,
අගිල්,
අරත්ත,
ශතපුෂ්ප,
අමුක්කරා අල,
ජීවක,
සෘෂභක,
ජටාමාංස,
වැල්මී,
දේවදර,
සවිඳලුණු,
රත්නෙටොල්,
අසමෝදගම්,
පෙරුම්කායම්,
තිප්පිලි,
මුංවැන්න,
මස්වැන්න,
ඉඟුරු,
වාල්මොලඟු — මේවා පලං 1/2 බැගිනි,

සංස්කරණය :— නියමිත පරිදි කෂාය සිඳුවාගෙන එයට එළකිරි, තලතෙල් දමා කල්කය යොද තෙල සිඳ ගත යුතු යි.

ප්‍රයෝග :— කලායඛංජ, ගෘධරසි, පිටගැසිම, මන්‍යාස්තම්භ, හනුස්තම්භ, ග්‍රීවා ස්තම්භ, වලිප්පු, හිසේ රෝග, පිටේ රෝග, දැලවර වාත, අවබාහුක, සම-ශිරා-ඇට යන මේ තන්හි හැසිරෙන වායුව, සන්ධි-ස්නායුගත වායු, යකෘත්, අෂ්ඨීලා, ගුල්ම, ප්ලීහ-උදර, මහොදර, ආඪ්‍යවාත, සුප්තවාත, තූණි, ප්‍රතූනි, මූත්‍රකෘච්ඡ්‍ර, උදාවර්ත, වෘද්ධි, ගදකෘමි නසයි. වඳබව නසයි.

56. යෝග නාමය :— **බුද්ධරාජ තෛලය.**

යෝගය :—
පාවට්ටා,
බිත්තල් අල,
ගම්මිරිස් වැල්,
කලාඳුරු අල යුෂ,
රසකිඳ යුෂ,
වැකොඳ වැල් යුෂ — නැළි 1 (මි: ලී: 960) බැගින්.
වල් ඉඟුරු අල යුෂ,
හරන් කහ යුෂ,
කස යුෂ,
තැඹිලි පොල් කිරි,
එළගිතෙල්,
කොහොඹ තෙල්,
එළකිරි — පත 1 (මි: ලී: 240) බැගිනි.
තලතෙල්,
දුන්තෙල්,
එඬරු තෙල්,
එඬරු තෙල් — නැළි 1 (මි: ලි: 960) බැගිනි.

කල්කය :—
රිදීතුත්තං,
පල්මානික්කම,
ඕන්කාරන්,
නවසාරන්,
සීනක්කාරං,
පුෂ්කර,
සවුක්කාරං,
කොත්තමල්ලි,
තිප්පිලිමුල්,
වැල්මී,
මනෝසිල,
හිරියල්,
කාන්දම්,
සාදිලිංගම්,
පෙරුංකායම්,
ගලිස්,
එත්සාල්,
කොල්ලන් කොළ,
සැවැන්දරා,
වල්ගම්මිරිස්,
සුවසලුණු,
ගල්මද,
ගල්නහර,
කුරුඳුපොතු,
සුදුහඳුන්,
රත්හඳුන්,
බළල්ලුණු,
වදකහ,
සිරිවටු (හොර මැලියම්)
දේවදර,
අගිල්,
ශතපුෂ්ප,
ශුද්ධ ගෙන්දගම් — කළඳ (ග්‍රෑ: 5) බැගිනි.)
කොට්ටං,
හිඟුරුපියලි,
අක්‍රපට්ටා,
වෙඩිලුණු,
සවිඳලුණු,

සංස්කරණය :— පෙරකී ඖෂධ යුෂ හා කල්කය යොද පදමට තෙල සිඳ ගත යුතු යි.

ප්‍රයෝග :— කෝල, වලිප්පු, ශ්වාස, සූතිකා, සන්නි, උණ, හිසරදය, තුන්දෙස් සන්නි, ගොතබව, කෝල-ඉලප්පු. කළුකෝපකාස නසයි. දහ අට කෝල වලිප්පු, ඇම්ම ආදි රෝගයන්හි යෙදේ.

සැ: යු:— පාන අභ්‍යංගය සඳහා යි.

57. යෝග නාමය :— **බෝධිසත්ව තෛලය.**

යෝගය :—
බැබිල,
එළබලිඳ මුල්.
කුප්පමේනිය මුල්,
කලාඳුරු අල.

මේවා එකින් පලම් 3 (ග්‍රෑ: 180) බැගින් මිලිතව පලම් 12 (ග්‍රෑ: 720) ක් ගෙන. තැඹිලි. කසපැන් නැළි 10 ක් (ලී: 9.6) දමා මදගින්නෙන් මදක් කකාරා ගත යුතු ය.

මුගුනුවැන්න,
හාතාවාරිය අල,
කීකිරිදිය,
එලබිංතඹුරු,
පඹුරු,
නෙළුම් අල,
වැටකේ අරළු,
කිතුල් මල්,
දියමිත්ත,
හිඟුරු කොළ,
රසකිඳ,
දියපරඬැල්,
නැනහිල් අල,
සියඹලා කොළ,
කෝමාරිකා,
පොල්පලා,
වැල්පෙනෙල,
සපුමල්,
උඳුපියලිය,
අත්කෙහෙල් මුහ,
තරකොළ,
සමදරා කොළ,

මේවා වෙන වෙන ම කොටා එක එක වගෙන් යුෂ නැළි එක (මි: ලි: 960) බැගින් සියල්ලෙන් නැළි 22 ක් (ලි: 21.12) ගෙන පළමු යුෂ සමග නැළි 8 ට (ලි: 7.68) මදගින්නෙන් සිඳුවා ගත යුතු යි.

එලකිරි නැළි 4. . (ලි: 3.84)

කල්කය :—

සැවැන්දරා,
පැපිළිය,
වැල්මී,
කස්තුරි,
දෙවදර,
නාමල්රේණු,
ඉරිවේරිය,
සමදරා,
සපුමල්,
කොල්ලන්මල්,
සමන්පිච්ච මල්,
රත්හඳුන්,

මේවා එකින් කලන් 3 (ගු: 15 බැගින්.)
(හෙල්බිනු) සුදුලූනු පතයි.
ඉඟිනි ඇට,
වෙල්ලොත්තිර (එළලොත්) — එකින් පලම් 2 බැගින්. (ගු: 120)
උරුලැසට්ටම්, කයිප්පු, හිඟුරුපියලි — මේවා සියල්ලෙන් පලං 4 යි.
අරළු බුළු, නෙල්ලි — කලන් 2 (ගු: 10) බැගින්. හිඟුරු පට්ට යුෂ දෙපතකින් අඹරා කල්කයට අයත් ඖෂධ තෙලට යෙදිය යුතු ය.

තලතෙල්	නැළි 4 යි.	(ලි: 3.84)
ගිතෙල්	නැළි 1 යි.	(ගු: 960) යි.)
එරඬුතෙල්	නැළි 1 යි.	(මි: ලි: 960 යි.)
තනකිරි	නැළි 1 යි.	(මි: ලි: 960).

සංස්කරණය :— තෛලපාක ක්‍රමයට තෙල සිඳ ගත යුතු ය. ගිනි කිරීම සඳහා කුරුඳු දර, පස් පැහිරි, දර, මිදෙල්ල දර, විශෙෂයෙන් ගත යුතු ය. නෙළුම් මලක් තරමට මදගිනි දීමෙන් සිඳගන්න. පෙරාගත් තෙලට,

කට්ටකුමංජල්,
අසමෝදගම්,
තිප්පිලි,
වසාවාසි,
සාදික්කා,
බිම්මමල
කළුදුරු,
කොට්ටන්,

සමභාගව ගෙන, කුඩුකර තෙලට යොද, එම තෙල් පුරවන ලද බඳුන භූමදන කොට දින 7ක් තබා පෙරා ගත යුතු ය.

ප්‍රයෝග :— අභ්‍යංග, පාන සඳහා යොදති. අක්ෂි රෝග, කාච, තිමිර, දුෂ්ටවාත, රත්පිත්, සෙම්වාත, සන්නිරෝග ආදිය නසයි. පක්ෂඝාත රෝගීන්ගේ හිස ගැල්වීමට යෝග්‍ය ය.

58. **යෝග නාමය :—** **භානුපාක කුෂ්ඨ තෛලය.**

යෝගය :—
කලං 4 යි. (ගු: 20) හොරි ගෙන්දගම් කලං 2 යි. (ගු: 10)
සුදුදුරු කලං 4 යි. (ගු: 20) ශෝධිත පල්මාණික්කම් කලං 1 යි. (ගු: 5)
තලතෙල් නැළි 1/2 යි. (මි: ලි: 480)

සංස්කරණය :— සියල්ල සිනිඳුව චූර්ණකොට තෙලට බහා අව්වේ තබා තකාරා ගානු.

ප්‍රයෝග :— ඉකිලි කැසීම, වනවීම, තුවාලවීම් සඳහා ද වෙනත් චර්ම රෝගවලට ද ගුණ යි.

59. **යෝග නාමය :—** **භෘංගරාජ තෛලය.**

යෝගය:—

කිකිරිදිය යුෂ	නැළි 4 යි.	(ලි: 3.84)
අමුනෙල්ලි යුෂ	නැළි 4 යි.	(ලි: 3.84)
එලකිරි	නැළි 5 යි.	(ලි: 4.8)
හාතාවාරිය යුෂ	නැළි 4 යි.	(ලි: 3.84)
බැබිල යුෂ	නැළි 4 යි.	(ලි: 3.84)
වැටකේ අරළු යුෂ	නැළි 4 යි.	(ලි: 3.84)
රතුලූනු යුෂ	නැළි 1 යි.	(මි: ලි: 960)
තලතෙල්	නැළි 4 යි.	(ලි: 3.84)
ගිතෙල්	නැළි 1 යි.	(මි: ලි: 960)

කල්කය :—

දෙදුරු,
උළුහාල්,
සැවැන්දරා,
ඉරමුසු,
කොකුම් පොතු,
ඉඟිනිඇට,
උරුලෑසවටන්,
කපුකිනිස්ස ඇට,
— එකින් කලන් 4 (ගු: 20) බැගිනි.

සංස්කරණය :— තෛල පාක ක්‍රමය අනුව තෙල සිදින්න.

ප්‍රයෝග :— අක්ෂිරෝග, මල්පොල, තිමිර, රතවලට යෙදේ. ඇස් ඇදිරිය, කපාලවායු සඳහා යෝග්‍යය ය. කෙශ වර්ධනය ද වේ.

60. **යෝග නාමය :—** **මංජිෂ්ඨාදි තෛලය.**

යෝගය :—

වැල්මදට,			
වැල්මී,			
ලාක්ෂා,			
ලප්නාරං මුල්,			
වැල්මී —	කර්ෂ	2 යි.	(ගු: 30 බැගිනි.)
තලතෙල්	පලම්	1 යි.	(මි: ලී: 60 යි.)
එළුකිරි	පල	8 යි.	(මි: ලී: 480 යි.)
ජලය	පල	32 යි.	(ලී: 1.92යි.)

සංස්කරණය :— යෝග්‍ය පරිදි කල්ක යොදා තෙල සිඳ ගත යුතු යි.

ප්‍රයෝග :— නිලිකා, තාරුණ්‍ය පිඩකා, (කුරුලෑ සහ ව්‍යංග) ආදි රෝගයන්හි යෙදේ. මුව ප්‍රසන්න කෙරේ. වලීපලිත නසයි.

61. **යෝග නාමය :—** **මහා කොරණ්ඩ තෛලය.**

යෝගය :—

කටුකරඬු සහමුල	පලම්	64 යි.	(ගු: 3840 යි.)
ජලය	නැළි	16 යි.	(ලී: 15.36 යි.)
එළුකිරි	නැළි	4 යි.	(ලී: 3.84 යි.)
තලතෙල්	නැළි	1 යි.	(මි: ලී: 960)

කල්කය :—

වැල්මී,
සිද්ධිඟුරු,
පෙරුංකායම්,
කරාබු,
ශතපුෂ්ප,
සුදුහඳුන්,
අමුක්කරා,
අගිල්,
දේවදරු,
එන්සාල්,
අසමෝදගම්,
සව්දලුණු,
ජීවක,
කලාඳුරු අල,
කොට්ටං,
කපුකිනිස්ස ඇට,
තිප්පිලි,
තිප්පිලිමුල්,
සෘෂභක,
ඉරමුසු,
වාල්මොලඟු,
තිපල්,
මෙ සියල්ල කලං 1 1/2 (ගු: 7.5) බැගින් ගෙන, අඹරා කල්ක කළ යුතු යි.

සංස්කරණය :— කටුකරඬු නියමිත ජලය බහා 4 — 1 ට සිඳවා කෂාය සාද ගන්නේ ය. එයට කිරි, තෙල් බහා පදමට එන විට කල්කය යොදා තෙල පිස ගන්නේ ය.

ප්‍රයෝග :— නස්‍ය, පාන, භොජන, අභ්‍යංග, වස්ති ආදියට හිත යි. බල්‍ය යි. වර්ණ්‍ය යි. කොරවූවනට ශ්‍රේෂ්ඨ යි. මූත්‍රකෘච්ජ්‍ර, දැලවර වේදනා, බඩ රුජා, හෘදය රුජා, පිටගැස්ම, අන්තරායාම, බහිරායම, වාතරක්ත ගුල්ම, වෘද්ධි, ක්ෂය, කාස, ශ්වාස, හික්කා, ශූල ප්ලීහ, උදර හනුස්තම්භ, ශිරෝරෝග, මන්‍යා ස්තම්භ, කටිවායු, පෘෂ්ට වායු, නසා ලන්නේ ය.

62. **යෝග නාමය :—** **මහා නාරායණ තෛලය.**

යෝගය :—

බැවිල මුල්.	පලම්	100 යි.	(ගු: 6000 යි.)
දශමුල්,	පලම්	100 යි.	(ගු: 6000 යි.)

හාතාවාරිය අල,
රයකිඳ
ලාකඩ,
වැල්මී,
දේවද,ර
උඳු,
අමුක්කරා අල.
එරඬු මුල්,
මුරුවා මුල්,
කුඹුක්,
අරත්ත අල.
කපුඇට මද,
දේවදර,
මහ බැවිල මුල්,
මහුල්කරද,
සිරිල,

කොල්ලු,
මසන්,
යව හාල්,
සිහින් මොර,
මිදිමුල්, (වෛජයන්ති),
වැල්මුරුංගා, (මධුශිග්රු)
සාරණ මුල්,
මහා සාරණ මුල්,
ලුණුවරණ පොතු,
නිකමුල්,
මුවකිරිය,
හෙළවරා,
ප්‍රසාරණී,
ගස්කැලිය.
කළුකොල්ලු, (වල්කොල්ලු)
රත්නිවුල්,
හපුෂා, (ප්‍රතිනිධි ගම්මිරිස්)
තිරැස්සවාලු,
වදකහ,
කටුකරඬු,
හෙළකටුකරඬු,
දළුක් (මහාවෘක්ෂ) මුල්,
සක්බෙරු, (ශංඛනි) යක්බෙරිය,
රත්කටුකරඬු,
වෙලිච්ච ඉඟුරු,
(තණ පස) තෘණ පංච මූලය.
ඇහැළ පොතු,
අත්දර,
තලා,
මැඩහඟු,
වැල්තිබ්බොටු (අලර්ක),
වේලා මුල්,
රම්මනිස්ස මුල්,
ආඩතෝඩා,
බෙහෙත්එඩරු,
ගම්මිරිස්,
සිවියමුල්,
උණකපුරු,
පත්පාඩගම්,
ඉරමුසු මුල්,
වෙලිච්ච කහ,
කිහිරි
කෙළිඳසාල්,
දියමිත්ත,
කළුකැම්මෙරිය,

මේවා පලම් 5 (ග්‍රෑ: 300) බැගින් ගෙන කපා, කොටා දිය ද්‍රෝණ අටක් දමා, (ලී: 122.88 ලී: 15.36 ට) ද්‍රෝණ 1 ට සිඳුවා ගන්නේ ය.

කල්කය :—

දේවදර,
වදකහ,
කොට්ටං,
සිරිවටු (සොර අරටු)
සුදුදුරු
කළුදුරු,
වෙනිවැල්ගැට,
තිප්පිලි මුල්,
කටුකරෝසන,
අස්වැන්න,
පොල්පලා,
බැවිල මුල්,
මීපුප්,
ලොඩ්ර,
වළහසාල්,
දුම්මල,
ගුගුල්,
වැල්මී,
සැවැන්දරා මුල්,
වැල්මදට,
කටුවැල්බටු,
(ක්‍රෞන්ති) වල්ගාමිරිස්),
නබ,
අසමෝදගම්,
සහිදලුණු,
දියමිත්ත,
ශිලාජතු,
වෙලිච්ච ඉඟුරු,
වෙලිච්ච කහ,
එත්සාල්,
කුරුඳු පොතු,
ජටාමාංස,
අරත්ත අල,
ශතපුෂ්ප,
කටුකරඬු,
අගිල්,
හිඟුරුපියලි,
කොල්ලන් කොළ,
නාමල් රේණු,
තුවරලා,
නෙළුම්රේණු,
ගම්මිරිස්,
අතිවිඩයන්,
සිවියමුල්,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
ගජතිප්පිලි.
දියතිප්පිලි,
අමුක්කරා අල,
පෙරුංකායම්,
සුවසලුණු,
සිහින් එත්සාල් (මාගධ)
සුවඳකොට්ටම්,
සිරිතේක්කු,
කොරාසානි,
සුදුලූණු
යවකාර ලුණු,
බළල් ලුණු,
හබ (අබ)
තිප්පිලි මුල්,
මුරුංගා මුල්,

සංස්කරණය :— කල්කය කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් ගෙන චූර්ණ කොට කෂාය වතුරෙන් අඹරා එම වතුරට කලතා තලතෙල් සිව් නැලියක් ඊට බහා තෛල පරිභාෂා අනුව පිස ගන්න.

ප්‍රයෝග :— වාතරෝග, හනුස්තම්භ, කලායඛඤ්ජ, ගුප්තවාත, ආක්ෂේප, ශිර්ෂරෝග, පක්ෂාඝාත, අර්දිත. ඌරුස්ථම්භ, වාත කඵ රෝග, යෝනි ශූල, වස්ති ශූල විශෙෂයෙන් වාත රෝග නසන්නේ ය.

63. යෝග නාමය :— **මහා බලා තෛලය.**

යෝගය :—

බැබිල මුල්	පලං 100 යි. (ග්‍රෑ: 6000 යි.)
අරත්ත	පලං 10 යි. (ග්‍රෑ: 6000 යි.)
රසකිඳ	පලං 20 යි. (ග්‍රෑ: 1200 යි.)
ජලය	ද්‍රෝණ 4 — 1 ට සිඳුවා ගන්නේ ය. (ලී: 61.44 — 15.36)
කිරි	—
දීපෙරලි දිය	—
කාඩි	—
මෝරු	—
මාංස රය	— කෂායට සමව.

තලතෙල් නැළි 4 යි. (ලී: 3.48 යි.)

ශතපුෂ්ප,
පුවඟු,
වම්මුතු,
ශඨී,
සුවඳකොට්ටං,
වියලිඉඟුරු,
කිරිහඟුලු,
මරුතලා,
තේජපත්‍ර,
සුවඳ හොට,
වෙනිවැල්ගැට,
බැබිල,
සිරිවැඩි බැබිල,
හාතාවාරිය,

කිරිබදු,
කාකෝලි,
හරේණුක,
වදකහ,
එන්සාල්,
හත ඇට,
අස්වැන්න,
සුවඳ තණ (ධ්‍යාමක)
මහ වංමුතු,
කහ,
හොර අරටු,
දේවදර,
වැල්මී,
සඳුන්,

පද්මකාෂ්ඨ,
අගිල්,
නාමල්රේණු,
මස්වැන්න,
මේද,
ජීවක,
සක්නැබ,
ව්‍යාඝ්‍රනඛ,
ඉරිවේරිය,
කොට්ටං,
තිප්පිලි මුල්,
පර්ණික (දියපරඬලා),
වැල්මදට,
ජටාමාංස,

තුවරලා — මේ ද්‍රව්‍ය අඩ පලම (ග්‍රෑ: 30) බැගින් චූර්ණකොට ගත යුතු යි.

සුගන්ධ ප්‍රක්ෂෙප ද්‍රව්‍ය — කොකුම්, අගිල්, කපුරු,

සංස්කරණය :— විධි ලෙස කෂාය සිඳ කල්ක යොදා තෙල සමපාකයට සිඳ ප්‍රක්ෂේප ද්‍රව්‍ය බහා තබා ගන්නේ ය.

ප්‍රයෝග :— අභ්‍යංග, වස්ති, පාන, නස්‍ය, උත්තර වස්ති සඳහා යෙදිය හැකි යි. වාත බහුල රෝග නසයි. ලේ, මස්, මේදෝ ධාතු, අස්ථි, මජ්ජ, ශුක්‍ර යන මේ ඇසුරු කළ රෝග නසයි. ඌර්ද්ධවජත්‍රුගත රෝග, අධඃකාය ගත සහ මධ්‍ය කායගත රෝග නසයි. කාස, ශ්වාස, වෘද්ධි, රෝග, වාතවෘද්ධි, ස්වරක්ෂය, අපස්මාර, උන්මාද, යෝනි රෝග, අර්ශස් රෝග, ඌරුස්තම්භ, හන්ස්තම්භ, ඛඤ්ජවාත, පංගු, වෙව්ලීම, ශෘධරසි, ත්‍රික ශූල ශුක්‍ර ක්ෂය යන මේවා නසයි. වඳ ස්ත්‍රිය ඍතුමත් වූවා මෙය ගතහොත් දරුවන් ලබයි.

64. යෝග නාමය :— **මහා වාතමේස තෛලය.**

යෝගය :—

හීන්බෝවිටිය,
සාරණ,
කුරුඳු,
කොසඹ කොළ,
මුරුංගා,
හරන් කහ,
ලුණුවරණ,
නිකමුල්,
එලබටු මුල්,

මඟුල්කරඳ,
තොටිල,
බැවිල,
හීන්අරත්ත,
රත්කිහිරිය,
එරබදු,
වල් ඉඟුරු,
ඇද්දෙමට මුල්,
පඹුරු මුල්,

ගැටකුඹ මුල්. — මේවා එකින් පලම් 2 (ග්‍රෑ: 120) බැගිනි.

තල වඩී (හැලි අරක්කු) කුරුණි 4 යි.

දින 7 ක් ඌරු වෙන්ට තබා ගත යුතු ය. ඉන්පසු ජලය කුරුණි 4 ක් ද බහා කුරුණියට සිඳුවා පෙරා ඊට,

කහ යුෂ	නැළි 1 යි. (මි: ලී: 960 යි.)
කිඩාරන් අල යුෂ	නැළි 2 යි. (ලී: 1.92 යි.)
කාඩි	නැළි 1 යි. (මි: ලී: 960 යි.)
විනාකිරි	මනා 4 යි. (ලී: 1.92) යි.)

පොල් රා	මනා 2 යි. (මි: ලී: 960 යි.)
වරාකොළ යුෂ	මනා 4 යි. (ලී: 1.92 යි.)

තලතෙල්,
කොහොඹ තෙල්,
එඬරු තෙල්,
මීතෙල්,
ගිතෙල් — පත 1 (මි:ලී: 240) බැගින් ගත යුතු යි. (ලී: 1.2)

සුවඳ කොට්ටං,
නාකෙසරු,
සාරණ,
සඳුන්,
ලමග,
ශතපුෂ්ප,
අබ,
සන්නිනායම්,
මොනරපිල්,
අසමෝදගම්,
ඉඟුරු,
තිප්පිලි,
තිපල්,
පුස්කර,
මිරිස්,
උළුවා,
පෙනෙල ගෙඩි,
පැපිලිය,
වළගසාල්,
එන්සාල්,
කොතඹුරු,
ගල්නහර,
ගල්මද,
දේවදර,
ලුණු පස,
රත්නෙටොල්,

මේවා එකින් කලං 3 (ගුෑ: 15) බැගිනි.

සංස්කරණය :— සියල්ල බරට සුදුලූනු ගෙන වියලා, කුඩුකර, ඇඹුල් දෙඩම් යුෂින් අඹරා තිරුස්සවාලූ චූර්ණය ද පතක් ඊට දමා, නැවත අඹරා තෙලට යොද තෛලපාක ක්‍රමයට තෙල සිඳ ගත යුතු ය.

ප්‍රයෝග :— නස්‍ය, පාන, වස්ති, ඇඟ-හිස-ගැල්වීමට යොදති. සන්නි දහ අට (18), ඇඹුම, කෝල, ශිර්ෂරෝග, ශීත, වෙව්ලුම් සන්නි, ඇඟපත රුද, ඇවිලිලි නසයි. භගන්දර, ගුල්ම ගණ්ඩමාලා. කරමල් ගෙඩි, දැලේ දෙකන් ගෙඩි, සඳහා තෙල නස්න කිරීමට ද, තෙල් ගා තැවීමට ද යහපති. අසූවක් වාතරෝග වැදූ ගෙයි සන්නි, සියලු විෂඝොර සැම විෂට ද උපදංශ, හොරි, කුෂ්ඨ, ආදියට ද ශ්‍රෙෂ්ඨ යි.

සැයු :—

1. හීන් බෝවිටිය ආදිය මද්‍යසාරය දමා ඌරුවෙන්ට දින 7 ක් වෙනම තබන්න.
2. එසේම හීන් බෝවිටිය ආදිය වෙනම කෂායකර පෙරා ගත යුතු යි. පසුව ඌරුවෙන්ට තබා පෙරා ගත් කොටස හා කෂාය ද එකට සම්මිශ්‍රණ කොට ගෙන අනික් යුෂ හා කල්කය යොද මඳ ගින්නෙන් තෛලපාක ක්‍රමය අනුව තෙල සිඳ ගත යුතු යි.

65. **යෝග නාමය :—** **මහා මාෂ තෛලය.**

යෝගය :—

*උඳු	ආඪක 1/2 යි. (ගුෑ: 1920)
දස මුල් මිලිතව	තුලා 1/2 යි. (ගුෑ: 3000)
* එළුමස්	පලං 30 යි. (ගුෑ: 1800)
ජලය	සේරු 64 — 16 ට සිඳ ගන්න (ලී: 61.44 — 15.36)
තලතෙල්	සේරු 4 (ලී: 3.84)
කිරි	සේරු 16 යි. (ලී: 15.36)

කල්කය :—

වඳුරු මෑ ඇට,
එරඬුමුල්,
හාතාවාරිය අල,
ත්‍රිලවණ,
ජීවනිය ගණය,
වැල්මදට,
සිව්ය,
රත්නෙටොල්,
කට්ඵල,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
තිප්පිලි මුල්,
අරත්ත,
වැල්මී,
සවිඳ ලුණු,
දේවදර,
රසකිඳ,
කොට්ටං,
අමුක්කරා,
වදකහ,
ශටී,

එකින් කර්ෂ 2 (ගුෑ: 30) බැගින් කල්කය සාද ගත යුතු ය.

සංස්කරණය :— විධි සේ සාදගත් යෝගයෙහි සඳහන් කල්කය යොද තෙල සමපාකයට සිඳවා ගත යුතු යි.

ප්‍රයෝග :— පක්ෂාඝාත, අර්දිත, වාත, බාධිර්‍ය, හනුසංග්‍රහ, කර්ණනාද, ශිරඃ ශූල, (ත්‍රිදෝෂජ) තිමිර, හස්තකම්ප, පාදකම්ප, ශිරඃකම්පන, ශ්‍රම, ග්‍රීවාකම්පන, කලායඛංජ, පාංගුල්‍ය, ගෘධ්‍රසී, අවබාහුක, යන රෝග නසයි. පාන, අභ්‍යංග, නස්‍ය කර්ණපූරණ, අක්ෂිපූරණ සඳහා යෙදේ.

අනුපාන :— උණුසුම් කිරි සමඟ ය.

* උඳු සහ එළුමස් ලිහිල් පොට්ටනි බැඳ දශමූල සමග කෂාය කරන්නේ ය.

66. යෝග නාමය :— **මහා වායුරාක්ෂස තෛලය.**

යෝගය :—

හරත්කහ,
කළුවා අල,
නිකමුල්,
පැඟිරිමාන් මුල්,
කොහොඹ මුල්,
මහුල්කරඳ මුල්, පලං 16 බැගිනි. (ගු: 960)
පඹුරු මුල්,
මුවකිරියවැල්,

වතුර ද්‍රෝණ 4 — 1 (ලී: 61.44 — 15.36) ට සිඳුවා පෙරන්න.

තලතෙල්,
එලගි තෙල්,
එරඬු තෙල් — නැළිය (මි: ලී: 960 බැගිනි.)
කොහොඹ තෙල්,
මීතෙල්,

ඉඟුරු,
වදකහ,
පෙරුම්කායම්,
සහිඳලුණු,
අබ,
ශතපුෂ්ප,
සුදුලූනු,
රත්නෙටොල් මුල්,
සස්සඳ මුල්,
ගම්මිරිස්,
තිප්පිලි,

මේවා එකින් පලම 2 (ගු: 120) බැගින් ගෙන අඹරා තෙලට දමා තුන් දිනක් තෛලපාක ක්‍රමයට තෙල සිඳිනු.

ප්‍රයෝග :— විවිධ වාතරෝග, කොරවාත, අර්දිත, වැදූගෙයි සන්නිවලට හා කෝල වලිප්පු ආදියට යෙදේ.

මාත්‍රාව :— තෙල් කලං 1/2 (ගු: 2.5) බැගින් පානය පිණිස යෙදේ.

67. යෝග නාමය :— **මහවිකාර තෛලය.**

යෝගය :—

නෙළුම් අල,
හාතාවාරිය,
බැබිල,
කටුකරඬු,
ඉරිවේරිය,
සැවැන්දරා,
මානෙල් අල,
නිකපොතු,
රත්නිවුල්,
මුස්වැන්න,
කලාඳුරු අල,
මුගුනුවැන්න,
කීකිරිඳිය,
යක්වනස්ස,
යක්බෙරිය,
ඉරමුසු,
කුප්පමේනිය,
මුරුංගා පොතු,
ආඩතෝඩා කොළ,
දෙහිකොළ,
ඔලිඳ කොළ,
මදුරුතලා,
රම්මනිස්ස,
වෙලා මුල්,
කරඳ පොතු,
ලුණුවරණ පොතු,
කුඹුරු කොළ,
කුඩුම්රිය කොළ,
දෙඬම් කොළ — මේවා එකින් පලං 12 (ගු: 720) බැගින් ගෙන කොටා ගත යුතු යි.

ජලය නැළි 128 ක් දමා නැළි 32 ට සිඳුවා ගත යුතු ය. (ලී: 122.88 — 30.72)

මුරුංගා පොතු යුෂ	නැළි	12 යි.	(ලී: 11.52)
එළකිරි	නැළි	8 යි.	(ලී: 7.68)
කළුලක් යුෂ	නැළි	3 යි.	(ලී: 2.88)
තලතෙල්	නැළි	3 යි.	(ලී: 2.88)
එරඬු තෙල්	නැළි	1 යි.	(මි: ලී: 960)

කල්කය :—

වැල්මී,
හිඟුරුපියලි,
කටුකරෝසන,
දේවදර,
ඉඟුරු,
බුළු,
සුවඳකොට්ටම්,
සුදුදුරු,
දේවදර,
පෙරුම්කායම්,
ගම්මිරිස්,
තෙල්ලි,
කොත්තමල්ලි,
කළුදුරු,
තිප්පිලි,
වදකහ,
සුදුලූනු,
සාදික්කා,
වලහයාල්,
සුදුහඳුන්,
ශතපුෂ්ප,
තලිස්පතුරු,
නෙළුම්රේණු. — මේවා එකින් කලං 8 (ගු: 40) බැගිනි.

සංස්කරණය :— කොළ වර්ග කොටා, වතුර ගයා අත්ගයා තබා පසුද මිරිකා යුෂ නැළි 12 ක් (ලී: 11.52) ගෙන, එළකිරි ආදිය මිශ්‍රකොට ලිප තබා, පළමුව තද ගිනි දී පසුව මඳ ගිනිකොට කල්කය යොද තෛල පාක ක්‍රමය අනුව තෙල සිඳ ගන්න

ප්‍රයෝග :— ශීර්ෂාභ්‍යංග නස්‍ය සඳහා ය. සියළු උන්මාද රෝගයන්හි යෙදේ.

68. යෝග නාමය :— **මාෂ තෛලය.**

යෝගය :—

උඳු	ප්‍රස්ථ	1 යි.	(ග්‍රෑ: 960 යි.)
ජලය*	ආඪක	4 යි.	4 — 1 ට සිඳුවා ගත යුතු යි. (ලී: 3.84 යි.)
එමෙන් 4 ගුණයක් එළකිරි	ප්‍රස්ථ	1 යි.	(ලී: 3.84 යි.)
තලතෙල්	ප්‍රස්ථ	1 යි.	(මි: ලී: 960 යි.)

කල්කය :—

ජීවනීය අෂ්ටකය,
ශතපුෂ්ප
සවිඳලුණු,
අරත්ත,
වදුරුමෑ ඇට,
වැල්මී,
බැවිල,
තිකුළු,
ගොකටු, කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් යෙදිය යුතු ය.

සංස්කරණය :— තෛල පරිභාෂා අනුව සිඳුවා ගත යුතු ය. *ජලය දෙගුණ කරන්නේ ය.

ප්‍රයෝගය :— පක්ෂාඝාතය, අර්දිත, කර්ණ ශූල, බාධිර්‍ය්‍ය, ත්‍රිදෝෂජතිමිර, අත්-පා වෙවුලුම, විශ්වාචි, අවබාහුක, කලාය ඛඤ්ජ හා ඌර්ධ්වජත්‍රුගත රෝගයන්හි යෙදේ.

69. යෝග නාමය :— **යමදේවරාජ තෛලය.**

යෝගය :—

පඹුරු මුල්,
මහුල්කරඳ මුල්,
වැල්රුක්අත්තන මුල්,
එරබදු මුල්,
යක්බෙරිය,
ලුණුවරණ මුල්-පොතු,
එලබටු මුල්,
හිරුපට්ට වැල්,
වරාමුල්,
තොටිල මුල්,
මදුරුතලා මුල්,
මුරුංගා මුල්,
යකවනස්ස මුල්,
සස්සඳ මුල්,
ඇත්අඟුන මුල්,
තුඹකරවිල අල,
නවහන්දි,
නියඳ අල,
කොහොඹ මුල්, පොතු,
වේලා,
කුරුඳු මුල්,
බෙලි මුල්,
රත්නෙවුල් මුල්, — එකින් පලම 1 බැගිනි. (ග්‍රෑ: 60)
ජලය නැළි 16 නැළි 4ට, (ලී: 15.36 — 3.84) සිඳුවා පෙරා ගත යුතු යි.
මීතෙල්,
තලතෙල්,
එරඩු තෙල්,
කොහොඹ තෙල්,
එකින් නැළි 1 බැගිනි. (මි: ලී: 960)

කල්කය :—

මූනමල් ඇට, (මුහුළු ඇට)
වියලි නෙල්ලි,
සිවිය මුල්,
අසමෝදගම්,
දළුක් ඇට,
සහිඳ ලුණු,
ගම්මිරිස්,
තුඹකරවිල ඇට,
ගස්පෙනෙල ඇට,
දූත්ත ඇට,
කළුදුරු,
සුදුදුරු,
තිරස්සවාලු මුල්,
යවකාර ලුණු,
වදකහ,
මිදෙල්ල ඇට,
පෙරුංකායම්,
අළුපුහුල් ඇට,
සිනක්කාරම්,
තිප්පිලි,
ගම්මිරිස්,
ඉඟුරු,
බළල් ලුණු,
මූදු ලුණු,
වෙඩිලුණු,
සුවස ලුණු,
පල්මානික්කම් — මෙවා කලං 8 බැගිනි. (ග්‍රෑ: 40)

සංස්කරණය :— මෙම කල්කය ලා තෛල පරිභාෂා අනුව සිඳුවා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :—

1. විශේෂයෙන් සෙම්ගෙඩි, මස්දළු සඳහා වලිප්පුවට ද ප්‍රත්‍යක්ෂ ය.
2. ශ්ලේෂ්මජ රෝග සඳහා නස්‍ය, පාන, වශයෙන් යොදන්න.
3. ගලගණ්ඩ, උගුර කරමල් ඉදිමී හුස්ම හිරවන ගලක්‍රාවට විශෙෂයෙන් යෙදේ.

70. යෝග නාමය :— **රත්පිත් කේතකී තෛලය.**

යෝගය :—

වැටකේ අරළු යුෂ	නැළි	12 යි.	(ලී: 11.52)
එළකිරි	නැළි	12 යි.	(ලී: 11.52)
තලතෙල්	නැළි	12 යි.	(ලී: 11.52)

කල්කය :—
සුවදකොට්ටම්,
කළුදුරු,
කෙකටිය,
සැවැන්දරා මුල්,
සපුමල්,
වැල්මී,
එන්සාල්,
හිඟුරුපියලි,
නෙළුම්රේණු. — මේවා එකින් පලම් 1 1/2 (ගු: 90) බැගිනි.
උරුලෑයවටම්, කලං 3 (ගු: 15 යි.)
ඉරිවේරිය,
නාමල් රේණු,
සුදුහඳුන්,
කොල්ලන් කොළ,
කලාදුරු අල,
දේවදර,
සිරිවැඩි බැවිල මුල්.

සංස්කරණය :— තෛල පාක ක්‍රමය අනුව තෙල සම්පාකව සාද ගත යුතු යි.

ප්‍රයෝග :— නින්ද නොයාමට විශේෂයෙන් යෙදේ. පිත්තජ ඇස්රෝග සඳහා ද, හිස් හොරිවලට ද, හිසේ ගැමට හා නස්‍යය සඳහා යෙදේ.

71. යෝග නාමය :— **රත තෙල.**

යෝගය :—
ඉදුනු කැප්පෙටියා කොළ,
රත්මල් කැකුළු,
කපු කොළ,
අමු පොල් කොළ යුෂ පත 1 (මි: ලී: 240) බැගිනි.
තලතෙල් පත 1 යි. (මි: ලී: 240)

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල අමු පොල්කොළ යුෂින් අඹරා තලතෙල් මිශ්‍රකොට තැටියක බහා අව්වේ තබා සිඳුවා ගන්නේ ය.

ප්‍රයෝග :— බාලයින්ගේ ලේ කෝපයෙන් හටගත් බිබිලි, රතපලු ආදිය සඳහා යෙදේ.

72. යෝග නාමය :— **රතිකාම රත්න තෛලය.**

යෝගය :—

සපු	කොළ,	පොතු,	යුෂ,	අට්ටික්කා	කොළ,	පොතු,	යුෂ,
පළොල්	කොළ,	පොතු,	යුෂ,	තොට්ල	කොළ,	පොතු,	යුෂ,
හාතාවාරිය	කොළ,	අල,	යුෂ	රණවරා	කොළ,	පොතු,	යුෂ,
නික	කොළ,	පොතු,	යුෂ,	ඇද්දෙමට	කොළ,	පොතු,	යුෂ,
කරඳ	කොළ,	පොතු,	යුෂ,	කපු	කොළ,	පොතු,	යුෂ,
මුරුංගා	කොළ,	පොතු,	යුෂ,	එඬරු	කොළ,	පොතු,	යුෂ,
පුපුල	කොළ,	වැල්,	යුෂ,	කීකිරිඳිය	සහමුලින්,		යුෂ,
කුඹුරු,	කොළ,	පොතු,	යුෂ,	රසකිඳ	කොළ,	වැල්,	යුෂ,
වෙල්ලිප්පරිත්ති			යුෂ,	ලුණුවරණ	කොළ,	පොතු,	යුෂ,

නැළි 1 බැගින් (මි: ලී: 960)

එලකිරි,
ගිතෙල්,
එඬරු තෙල්,
තලතෙල්,
කොසඹ තෙල්,
උක්පැණි,
තැඹිලි වතුර,
දෙහි ඇඹුල් — නැළි 1 බැගින් (මි: ලී: 960)

කල්කය :—
දේදුරු,
කොරාසානි,
බිම් දුම්ල,
පෙරුංකායම්,
පෙතන් මල්,
වතුසුද්ද මල්,
නාමල්,
රත්මල්,
මයිලමල්,
සාරණ,
ගොකටු මුල්,
කහදෙමට මල්,
කහමල්,
නවසාරන්,
දෙගල්,
ගලිස්,
ඉද්දමල්,
ඕලුමල්,
තිකුළු,
ඉඟුරු,
පිච්චමල්,
මදර මල්,
තිවග,
ඉඟුරු මල්,
පස්ලුණු,
උළුවා,
අසමෝද,
සපුමල්,
වැටකේ මල්,
කිණිහිරි මල්,
තිපල්,
නෙළුම් මල්,
අරලිය මල්,
එලකටරොළු මල්,
කටුකරෝසන,
ත්‍රස්තවාලු,
ජයපාල,
පල්මානික්කම්,
වැල්මී,
අගිල්,
අරත්ත,
වළහසාල්,
කොට්ටං,
දෙසඳුන්,
කැකුණ ඉටි,
පුස්කර,
දෙවදර,
දෙකසා,
ගොඩමානිල් මල්,
කොත්තමල්ලි,
ඉඟිනි ඇට,

දූහුකේ මල්,
තිප්පිලි,
බෝලිද්ද මල්,
නිල්කටරොළු මල්,
සවඳෙකන්ද මල්,
වල් ඉඟුරු,
හොරඟුවි,
අක්‍රපට්ටා,
අතිවිඩයත්,
ශතපුෂ්ප — මේවා කලං 1 1/2 (ග්‍රෑ: 7.5) බැගින් ගෙන කල්කය සාද ගත යුතු යි.

සංස්කරණය :— කල්කය තෙලට යොද සමපාකයට තෙල සිඳ ගන්න.

ප්‍රයෝග :— සූතිකා රෝග, යෝනි දෝෂ, ඖපසර්ගික මෙහ, (සුද බින්දුම), යෝනි වණ ආදියට ගෑමට සහ බීමට යෙදේ.

73. යෝග නාමය :— **රතුලූනු තෙල (පීනස් තෙල)**

යෝගය :—
රතුලූණු යුෂ නැළි 4 යි. (ලී: 3.84)
තලතෙල් නැළි 1 යි. (මි:ලී: 960)

කල්කය :—
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
කළුදුරු,
කරාබු,
වසාවාසි.
යාදික්කා,
සුදුදුරු,
පෙරුංකායම්,
කලං 2 බැගිනි. (ග්‍රෑ: 10)

ප්‍රයෝග :— සර්වප්‍රකාර පීනස් රෝගයන්හි විශෙෂ යි. නස්‍ය, පාන, අභ්‍යංග සඳහා ය.

74. යෝග නාමය :— **ලඝුතෛරණ්ඩ තෛලය.**

යෝගය :—
සුදුලූනු, පලම් 13 යි. (ග්‍රෑ: 780 යි.)
එරඬු මුල්, පලම් 13 යි. (ග්‍රෑ: 780 යි.)
මහ එරඬු මුල්,
තිරස්සවාලු මුල්,
රත්නිවුල්,
පුලිල,
මහුල් කරඳ,
හීන් සාරණ,
මහසාරණ,
හීන් එරඬු මුල්,
ලුණුවරණ පොතු,
නිකමුල්,
දූත්ත අල,
දේවදර,
අරළු,
බුළු,
නෙල්ලි — මේ සියල්ලෙන් පලම් 34 යි. (ග්‍රෑ: 2040 යි.)
ජලය ද්‍රෝණ 1 යි. (ලී: 15.36) ,
එලකිරි ද්‍රෝණ 1/4 යි. (ලී: 3.84)
එරඬු තෙල් නැළි 1 යි. (මි: ලී: 960)

කල්කය :—
තිරස්සවාලු මුල්,
සුදුලූනු,
තිප්පිලි,
ගජතිප්පිලි,
අසමෝදගම්,
දියමිත්ත මුල්,
වළහසාල්,
රත්නෙටොල්,
සුවස ලුණු,
ගම්මිරිස්,
ඉඟුරු,
පෙරුම්කායම්,
යවක්ෂාර,
අබ,
කටුකරෝසන,
කෙළිඳසාල්, — එකින් කලන් 3 (ග්‍රෑ: 15) බැගිනි.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය සියල්ල වෙන වෙනම කිරාගෙන කොටා, ජල ද්‍රෝණයක් දමා, දිනක් ඌරු වෙන්ට තබා ද්‍රෝණ 1/4 ට සිඳුවා, පෙරා ගෙන ඊට එලකිරි සහ එරඬු තෙල් ද ඇඹරූ කල්කය ද මිශ්‍ර කොට, තෛලපාක ක්‍රමය අනුව මඳගින්නෙන් තුන් දිනකින් තෙල පදම් කර පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— පාන, අභ්‍යංග, වස්ති, අනුවාසන සඳහා යෙදේ. විරෙක තෙලකි. රෝගියාගේ රෝග අවස්ථාව හා කාය බලය බලා යොදන්නේ ය. ගුල්ම, ශ්වාස, කාස, ශොථ, උදර ශූල, ප්ලීහවෘද්ධි, අන්ත්‍රවෘද්ධි, අර්ශස්, ග්‍රහණිදෙෂ, යෝනි ශූල, භගන්දර නසා ලයි.

මාත්‍රාව :— තේ හැඳි 1 — 4 දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

75. යෝග නාමය :— **ලෝකනාථ තෛලය.**

යෝගය :—
කවුඩු උඩත්තා යුෂ නැළි 4 යි. (ලී: 3.84)
තලතෙල් නැළි 1 යි. (මි: ලී: 960)
කොහොඹ තෙල් නැළි 1 යි. (මි: ලී: 960)
බවුමුල්,
වදකහ,
ගම්මිරිස්,
ගලිස්, — කලං 6 (ග්‍රෑ: 30) බැගින් ගත යුතු යි.

ප්‍රයෝග :— තද සෙම සන්නි, පක්ෂාඝාත, අර්දිත රෝගයන්හි යෙදේ. විශේෂයෙන් වලිප්පුවට ගුණදායක වේ.

76. යෝග නාමය :— **පුළුකඩ වැල්ලේ පිනස් තෛලය.**

යෝගය :—

බෙලිමුල්,
කපුමුල්,
සැවැන්දරා මුල්,
කුඩුමිරිස් මුල්,
නිකමුල්,
යකිනාරංමුල්,
කොහොඹ මුල්,
සේරු 1 (ගු: 960) බැගින්.
ජලය නැළි 80 — 20 ට (ලී: 76.8 — 19.2 ට) සිඳුවා ගන්න.

තලතෙල්,
කොහොඹ තෙල්,
එඬරු තෙල්,
එලගිතෙල්,
මීතෙල් — නැළි 1 බැගිනි. (මී: ලී: 960)

කලාඳුරු,
දේවදරු,
කරාබු,
සාදික්කා,
එන්සාල්,
වළගසාල්,
සුදුදුරු,
අසමෝදගම,
වසාවාසි,
තිප්පිලි,
ශතපුෂ්ප,
කොරාසානි,
උක්පැණි,
මීපැණි,
කතෙයියා පැණි,
බඹර පැණි,
දඹුවැල්බැ පැණි,
පත 1 (ගු: 240) බැගිනි.

කටුකරෝසන,
ඉඟුරු,
ගම්මිරිස්,
වදකහ,
කුරුඳුපොතු,
සුදුදුනු,
කොත්තමල්ලි,
කොට්ටං කලං 3 (ගු: 15) බැගිනි.

සංස්කරණය:— කෂාය සහිත තෙල් භාජනය, වැලි පිරවූ භාජනයක තබා ගිනි දී දින 2 ක් සිඳුවා තුවැනි දින මී පැණි ආදී පැණි වර්ග ද කල්කය ද දමා ලණු ඇදෙන පදමට තෛලපාක අනුව සකස් කර ගත යුතු ය.

ප්‍රයෝග:— විවිධ පිනස් රෝග සඳහා යෝග්‍ය වේ. පාන අභ්‍යංග සඳහා ය.

77. යෝග නාමය:— **වජ්‍රකන්ද තෛලය.**

යෝගය:—

වල් කිඩාරං යුෂ නැළි 4 යි. (ලි: 3.84)
බැවිල යුෂ නැළි 4 යි. (ලී: 3.84)
කුරුම්බා වතුර නැළි 4 යි. (ලී: 3.84)
තලතෙල් නැළි 1 යි. (මී:ලී: 960)

කල්කය :—

දේවදර,
වදකහ,
කලාඳුරු,
ඉඟුරු,
ශතපුෂ්ප,
වියලිකහ,
වෙනිවැල්ගැට,
කොට්ටං,
කුරුඳුපොතු,
තුවරලා,
අබ,
නාමල්රේණු,
හීන්එන්සාල්,
සුදුහඳුන්,
නෙළුම්රේණු,
හොර අරටු — කලං 3 (ගු: 15) බැගිනි.

සංස්කරණය :— තෛලපාක පරිභාෂාවෙනි.

ප්‍රයෝග :— අර්ශස්, ප්‍රමේහ, ගුල්ම, උදර, වාත රෝගයන්හි යෙදෙයි. නස්‍ය, පාන අභ්‍යංග, සඳහා ය.

78. යෝග නාමය :— **වාත තෛලය.**

යෝගය :—

ඇද්දෙමට මුල්,
හීන්දෙමට මුල්,
බෙලිමුල්,
කුරුඳු මුල්,
කුඩුමිරිස් මුල්,
පඟිරු මුල්,
ඕවියමුල්,
බුලත් මුල්,
වැල්කැප්පෙටි මුල්,
ලුණුවරණ මුල්,
හරන්කහ,
අමුඉඟුරු,
වදකහ,
වල් ඉඟුරු — එකින් ලාහ (ලි: 3.84) බැගිනි.
ජලය ද්‍රෝණ 4 ද්‍රෝණ 1 ට (ලි: 61.44 — 15.36 ට) සිඳුවා ගත යුතු යි.

කල්කය :—

හොරමල,
කැකුන මල,
ගලිස්,
බිම් දුම්මල,
කරාබු,
වසාවාසි,
තිප්පිලි,
ගම්මිරිස්,
උළුවහාල්,
පෙරුංකායම්,
පල්මානික්කම්,
සහිඳලුණු.

සාදික්කා,
කළුදුරු,
සුදුදුරු,
අසමෝදගම්,
වියලි ඉඟුරු,
වදකහ,
තැඹිලි තෙල්,
තලතෙල්,
කොහොඹ තෙල්.
මීතෙල්,
එරඬු තෙල් — මේවා නැළිය බැගිනි. (මි: ලී: 960)

අරළු,
බුළු,
නෙල්ලි,
කයිප්පු,
එන්සාල්,
වියලි කහ — මේවා කලං 6 (ග්‍රෑ: 40) බැගිනි.

සංස්කරණය :— ඇද්දෙමට මුල් සිට වල් ඉඟුරු දක්වා වල් ඖෂධ එක් වගෙන් ලාහ බැගින් ගෙන කොටා ජලය ද්‍රෝණ 4 ක් ලී: 61 (44) බහා දින තුනක් පල්කර, ද්‍රෝණයට සිඳුවා පෙරා, තෛල පාක ක්‍රමයට සිඳුවා ගන්නේ ය.

ප්‍රයෝග :— වාතරෝග සඳහා අභ්‍යංගය පිණිසය. පපුවේ ඇම්ම, ඇවිලිලි ආදියට හා හන්දි වේදනා සඳහා විශේෂයෙන් යෙදේ.

79. යෝග නාමය :— **වාතරාක්ෂස තෛලය.**

යෝගය :—

කටුකරඬු	පලම්	1200	යි.	(ග්‍රෑ: 200)
බැබිල මුල්,	පලම්	10	යි.	(ග්‍රෑ: 600)
ලුණුවරණ පොතු,	පලම්	10	යි.	(ග්‍රෑ: 600)
පාවට්ට මුල්,	පලම්	10	යි.	(ග්‍රෑ: 600)
වරා මුල්,	පලම්	10	යි.	(ග්‍රෑ: 600)
කොහොඹ මුල්,	පලම්	10	යි.	(ග්‍රෑ: 600)
දෙහි මුල්,	පලම්	5	යි.	(ග්‍රෑ: 300)
ඇඹුල් දෙඩම් මුල්	පලම්	5	යි.	(ග්‍රෑ: 300)
අමු ඉඟුරු	පලම්	3	යි.	(ග්‍රෑ: 180)
වදකහ	පලම්	3	යි.	(ග්‍රෑ: 180)
අමුකහ	පලම්	3	යි.	(ග්‍රෑ: 180)
රම්මනිස්ස	පලම්	3	යි.	(ග්‍රෑ: 180)
මහුල් කරඳ මුල්	පලම්	3	යි.	(ග්‍රෑ: 180)
ජලය	ලාස්	8	යි.	2 ට සිඳවා පෙරා (ලි: 30.72 — 7.68 ට)
එළකිරි	නැළි	1	යි.	(මි: ලී: 960)
එරඬු තෙල්	නැළි	1	යි.	(මි: ලී: 960)
තලතෙල්	නැළි	1	යි.	(මි: ලී: 960)
එළගිතෙල්	නැළි	1	යි.	(මි: ලී: 960)

කල්කය :—

තිපල්,
ත්‍රිකටු,
ත්‍රිජාත,
වැල්මී,
දේවදර,
දේවදුරු,
සෙවකොට්ටම්,
කුළුරුණ,
අබ — එකින් පලම් 1/2 බැගින් (ග්‍රෑ: 30)

සෛන්ධවලුණු,
කෙළිඳසාල්,
පෙරුම්කායම්,
උළුහාල්,
දෙදුරු,
සුදුහඳුන්,
ඉඟිනි ඇට,
දෙගල්,

සංස්කරණය :— යෝගයෙහි සඳහන් ද්‍රව්‍ය වර්ග පිරිසිදුව කිරාගෙන සියුම්ව කොටා, ජලය ලාස් 8 කට දමා ලාස් 2 ට සිඳුවා පෙරා ඊට ඉහත සඳහන් එළකිරි, සහ තෛල වර්ග මිශ්‍රකොට, ඇඹරූ කල්කය ද බහා තෛල පරිභාෂාවෙන් සිඳුවා (දියපිටට) පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— නස්‍ය, පාන, අභ්‍යංග සඳහා යෙදේ. විශේෂයෙන් ගදිසියෙන් පැන නගින ධනුස්තම්භ, හනුස්තම්භ, මන්‍යාස්තම්භ, දණ්ඩාපතානක, ආක්ෂේප, පිට ගැස්ම, ආදියට ප්‍රත්‍යක්ෂ යි. දීර්ඝකාලීන වශයෙන් පවතින හස්තකම්ප, ශිරඃකම්ප, කම්පවායු, අර්ධ වායු ආදියට ද උන්මාදයට ද යහපති. සියළු වාත රෝග නසයි. සන්ධි වාත සඳහා ශ්‍රේෂ්ඨ යි.

මාත්‍රාව :— තේ හැඳි 1 සිට 2 දක්වා බීමට යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය.

80. යෝග නාමය :— **වාත (වරණ) විදූරංගාදි තෛලය.**

යෝගය :—

බැවිල මුල්	පලං	12 යි.	(ග්‍රෑ: 720)
දශමූල මිලිතව	පලං	10 යි.	(ග්‍රෑ: 600)
පුවක් මුල්	පලං	1 යි.	(ග්‍රෑ: 60)
අයමෝදගම්	පලං	1 යි.	(ග්‍රෑ: 60)
ඉඟුරු	පලං	1 යි.	(ග්‍රෑ: 60)
කොල්ලු	පලං	1 යි.	(ග්‍රෑ: 60)

සංස්කරණය :— සියල්ල හොඳින් කොටා වතුර නැළි 16 — 4 ට, (ලී: 15.36 — 3.84) සිඳුවා පෙරා,

තලතෙල්	නැළි	1 යි.	(මි: ලී: 960)
එලකිරි	නැළි	4 යි.	(ලී: 3.84)

කල්කය :—

සහිදලුණු,
දුම්මල,
දේවදර,
වදකහ,
අමුක්කරා අල,
කොට්ටං,
හොර මැලියම්,
වැල්මදට,
ඉරමුසු මුල්,
සාරණ මුල්,
එත්සාල්,
සුදුහඳුන්,
හිඟුරු පියලි,
කොල්ලන් කොළ,
ශතපුෂ්ප,
දෙළුම් ගෙඩි,
අගිල්,
ගල්සෙවෙල්,
කට්ටකුමංජල්,
ජටාමාංස,

මේවා කලං 3 යි මංචාඩි 10 (ග්‍රෑ: 17.5) බැගින්.
සිනිඳුව චූර්ණකර අඹරා යොදන්නේ ය.

ප්‍රයෝග :— අභ්‍යංග, පානය සඳහා ය. ගැබිණියන්ගේ සියලු වාත සහ ප්‍රසූතය අපහසු හා ප්‍රමාදයෙහි අභ්‍යංග, පාන සඳහා ද, හිසරුජා සහිත රත්පිත් විකාර, ගොළු-බිහිරි බවට, පාන අභ්‍යංග සඳහා ද මර්මස්ථානයන්හි හෝ කුමන ස්ථානයන්හි හෝ තද බල කැපුං, කෙටුං සඳහා ලේ පිටින් තෙල පුලුන් තෙමා තැබීම පිණිස ද කැඩුං, බිඳුන්, ඇට නහර, පෙරලීමට ද විශිෂ්ට ගුණදයක ය.

81. යෝග නාමය :— **විෂ්ණු තෛලය.**

යෝගය :—

ශාලපර්ණී,
පෘෂ්ණිපර්ණී,
බැවිල මුල්,
ශතාවරී,
එරඬු මුල්,
කටුවැල්බටු,
එලබටු මුල්,
කරඳ මුල්,
බෙත් අනෝද මුල්,
කටුකරඬු මුල්,

මේවා පලං 1 බැගින්. (ග්‍රෑ: 60)

ජලය	ප්‍රස්ථ	16 — 4 ට සිඳුවා පෙරා, (15.36 — 3.84) ට,
තලතෙල්	ප්‍රස්ථ	2 යි. (ලී: 1.92)
එළකිරි	ප්‍රස්ථ	8 යි. (ලී: 7.68)

ප්‍රයෝග :— අභ්‍යංග සඳහා මූර්ච්ඡා, අපස්මාර, ශිරෝඃසූ ර්ණන, අනිද්‍රා, උන්මාද, හෘද්‍රෝග, යන විකෘතීන්හි යෙදේ. හෘත් ශූල, පාර්ශව ශූල, අර්ධාවභෙද, යනාදිය නසයි. වාතරක්තයෙහි අභ්‍යංගය සඳහා යෙදේ.

82. යෝග නාමය :— **විෂගර්භ තෛලය.**

යෝගය :—

අත්තන,
නික,
දියලබු (තුම්බ)
සාරණ මුල්,
එරඬු මුල්,
අමුක්කරා,
ප්‍රපුන්නාඩ, (ඇත්තෝර)
රත්නිවුල් මුල්,
මුරුංගා පොතු,
කළුකැම්බෙරිය,
නියඟලා, (කලිකාරී)
කොහොඹ පොතු,
මහානිම්බ,, (ලුනුමිදෙල්ල)
සස්සඳ, (ඊශ්වරී)
බෙලිමුල්,
මීදිමුල්,
තොට්ල් මුල්,
පළොල් මුල්,
ඇද්දෙමට මුල්,
අස්වැන්න,
පොල්පලා,
නෙරෙංචි,
එලබටු මුල්,
කටුවැල්බටු,
හාතාවාරිය,
කරිවිල මුල්,
ඉරමුසු මුල්,
කළු ඉරමුසු මුල්,
ශ්‍රීපර්ණී,
කිරිබඳු අල — පලං 2 (ග්‍රෑ: 120) බැගින්.
දළුක්මුල්,
වරාමුල්,
මේෂශෘංගී, (මස්බැද්ද)
සුදු කනේරු මුල්,
රතුකනේරු මුල්,
ගුරුල්ල, (කාකජඞ්ඝා)
කරල්හැබ මුල්,
ප්‍රසාරණී,
අරළු,
බුළු,
නෙල්ලි,

ජලය නැළි 32 ක් දමා නැළි 8 ට (ලී: 30.72 — 7.68 ට) සිඳුවා ගත යුතු යි.
කළුතල ගෙන සිඳ ගත් තෙල්
එරඬු තෙල්
අබතෙල් මිලිතව නැළි 2 යි. (ලී: 1.92)

කල්කය :—

ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
යවක්ෂාර,
ස්වර්ජිකක්ෂාර,
සහිදලුණු,
දියමිත්ත,
භාර්ගී (සිරිතේක්කු)
තවසාදර — තවසාරන්

අමුක්කරා,
අරත්ත අල,
කොට්ටං,
කොහොඹ පොතු,
දේවදර,
කෙළිඳසාල්,
වච්චනාවි,
සුවඳලූණු,
බළල් ලූණු,
කළුලූණු,
මූදු ලූණු,
පල්මානික්කම්,
ගෙන්දගම්,
සුවඳකොට්ටං,
ශිලාජතු,
ශයී,
වදකහ,
කච්චල — එකින් තෝලා 1 (ගු: 12) බැගින් ගත යුතු ය.
තෝලා 10 යි. (ගු: 120)

සංස්කරණය :— තෛලපාක ක්‍රමය අනුවතෙල සාද ගන්නේ ය.

ප්‍රයෝග :— සන්ධිවාත, සන්ධි ශොථ, ගෘධ්‍රසී, ශීර්ෂවාත, සර්වාංගය පිපිරීම, දණ්ඩාපතානක, කර්ණ නාද, ශුන්‍යතා, කම්පවාත, අර්ධාංගවාත, බධිරතා, ශීර්ෂකම්ප ආදියෙහි අභ්‍යංගය සඳහා යෙදේ.

83. **යෝග නාමය :—** **විෂඝනනිලි තෛලය.**

යෝගය :— (1)
බෙදුරු,
අරත්ත අල,
එරබදු,
නික,
දළුක්,
මඟුල් කරඳ,
කරිවිල,
පාවට්ට,
පුවක්,
ගජතිප්පිලි,
කළුකැම්මෙරිය,
ගැට තුඹ,
වේලා,
කොහොඹ,
කිකිරිඳිය,
තැල්කොල,
කතුරු මුරුංගා,
තොට්ල,
ගොඩමානෙල්,
කරල්හැබ,
අස්වැන්න — මේවායේ කොළ වෙන වෙන ම ගත යුතු ය.

(2)
පොල් බඩ,
අමුක්කරා,
කහ,
සුදුළූනු,
සිවිය,
ලූනල,
කෙළිඳසාල්,
තෙලකිරිය — මේවා සම භාගව ගත යුතු ය.

1. 2.	යුෂ	නැළි 4 යි.	(ලී. 3.84)
	නරමුත්‍ර	නැළි 4 යි.	(ලී: 3.84)
	තලතෙල්	නැළි 4 යි.	(මි: ලී: 960)

ත්‍රිජාත,
ත්‍රිමද,
තිකුළු,
පෙරුම්කායම්,
සුදුළූනු
සාරණ,
වදකහ,
ඔලිඳ,
තලා,
කටරොළු,
පතුක්,
අමුක්කරා අල—එකින් කලං 3 (ගු: 15) බැගිනි.

සංස්කරණය :— යුෂ නැළි 4 ට (ලී: 3.84) නරමුත්‍ර සහ තලතෙල් මිශ්‍රකොට යෝග්‍ය බඳුනෙක්හි බහා අඹරූ කල්කය ද යොද තෛලපාක ක්‍රමය අනුව කරපාකයට පෙරා ගන්න.

ප්‍රයෝග :— නස්‍ය, පාන, අභ්‍යංග හා අංජන සඳහා යෙදේ. සියලු උග්‍ර සර්පවිෂ, ස්ථාවර විෂ, ලූතා විෂ, ගෝනුසු, සිකනල් ආදි විෂ නාශක යි.

මාත්‍රාව :— බිංදු 10 සිට තේ හැඳි 2 දක්වා, යථා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

84. **යෝග නාමය :—** **විෂහරණාදි තෛලය.**

යෝගය :—

දෙමටගෙඩි	යුෂ
කොහොඹ කොළ	,,
මදුරුතලා කොළ	,,
කුඹුරු කොළ	,, — නැළි 1 බැගින් (මි: ලී: 960)
තැඹිලි පොල්කිරි	නැළි 8 යි. (ලී: 768)

කල්කය :—
ත්‍රිවර්ග,
පුස්කර,
සවිඳලුණු,
ගෙන්දගම්,
දෙදුරු,
කොත්තමල්ලි,
සුදුළූනු,
පිඩිතුත්තං,
පල්මානික්කම්,
වළහසාල්,
කර්ෂය බැගින් (ගු. 15) ගෙන කල්කය සාද ගත යුතු යි.

සංස්කරණය :— තෛල පරිභාෂාව අනුව තෙල සිද ගන්නේ ය.

ප්‍රයෝග :— ඇඟ රලුවීම, ගෝමර, ගජචර්ම, උදුගොවවත් කැම, ගුල්ම, පොලොන් විෂ, දෙබර විෂ, සිකනල් විෂ නයිවිෂ, ශරීරය කැසීම, ඉරුවාරද, දිවි යුෂ, මූෂික විෂ, ඉස්සොරි, ගලක්‍රා, දත්වැයා යනාදි රෝගවලට ඒ ඒ අනුපාන සමග යෙදීමෙන් ඉතා ගුණ ලැබේ.

85. යෝග නාමය :— **විසර්පහර තෛලය.**

යෝගය :—

මනෝසිල,
නෙල්ලික්කා ගෙන්දගම්,
කළුදුරු,
අසමෝදගම්,
කරාබු,
සාදික්කා,
සිවංගුරු,
කරොල් අරිසි,
ශතපුෂ්ප,
වීන අල,
පල්මානික්කම්,
හීන්අරත්ත,
සුදුදුරු,
තිප්පිලිමුල්,
හොරිගෙන්දගම්,
වසාවාසි,
මාසක්කා,
උලාඅරිසි,
වළගසාල්,
තිප්පිලි,
කටුකරෝසන,
උළුහාල් — කර්ෂ 2 බැගින් (ගු: 30)
පොල්තෙල් නැළි 4 යි. (ලී: 3.84)

සංස්කරණය :— කල්ක ද්‍රව්‍ය සිනිඳුව චූර්ණ කොට තෙලට යොද සතියක් අව්වෙන් කකාරා පෙරා ගන්නේ ය.

ප්‍රයෝගය :— (පිටතින් ගැමට පමණයි). හොරි, දද, ආදි චර්මරෝග සඳහා යොදන්නේ ය.

86. යෝග නාමය :— **වෘහත් සෛන්ධවාදි තෛලය.**

යෝගය :—

එරඬු තෙල්	සේරු 4 යි. (ලී: 3.84)	කාංජික (කාඩි)	සේරු 8 යි. (ලී: 7.68)
ශතපුෂ්ප ක්වාථ	සේරු 4 යි. (ලී: 3.84)	දධිමස්තු	සේරු 8 යි. (ලී: 7.68)

කල්කය :—

සෛන්ධව ලුණු,
ගජතිප්පිලි,
අරත්ත අල,
ශතපුෂ්ප,
අසමෝදගම්,
සවර්ජික්ෂාර,
ගම්මිරිස්,
කොට්ටම්,
ඉඟුරු,
සුවසලුණු,
බළල්ලුණු,
වදකහ,
වල් අසමෝදගම්,
වැල්මී,
සුදුරු,
කොට්ටම්,
තිප්පිලි,
— එකින් තෝලා 4 (ගු: 48) බැගිනි.

සංස්කරණය :— තෛල පාක ක්‍රමය අනුව තෙල සිඳින්නේ ය.

ප්‍රයෝග :— පාන, අභ්‍යංග, වස්ති සඳහා යෙදේ. පැරණි ආමවාතයෙහි අභ්‍යංග පිණිස යෙදේ.

87. යෝග නාමය :— **ශ්වාසවජ්ර තෛලය.**

යෝගය :—

ගස් පෙනෙල ගෙඩි යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
සුදු හබරල අල යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
හීන් දෙමට ගෙඩි යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
හිඟුරුපට්ට යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
කුකුරුමාන් ගෙඩි යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
ඇඹුල් දොඩම් යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
කෝමාරිකා යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
ඇඹුල් දොඩම් පැඟිරි	පත	4	යි.	(මි: ලී: 960)
හිරැස්ස පලු යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
එලබටු ගෙඩි යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
අක්මැල්ල යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
තොල බෝ අල යුෂ	පත	4	යි.	(මි: ලී: 960)
තලතෙල්	නැළි	1 1/2	යි.	(ලී: 1.44)
එරඬු තෙල්	නැළි	1 1/2	යි.	(ලී: 1.44)

කල්කය :

තිප්පිලි,
වැල්මී,
කළුදුරු,
සුදුරු,
අක්‍රපට්ට,
කොත්තමල්ලි,
සහිඳලුණු
මීමුරු,
සීනක්කාරං,
ශෝධිත පල්මානික්කම්,
මෙවා එකින් කලං 9 1/2 (ගු: 47.5) බැගිනි.

ප්‍රයෝග :— තේ හැඳි 1/2 සිට 1 දක්වා ශ්වාස රෝගයෙහි, පානය පිණිස යෝග්‍ය වේ.

සංස්කරණය :— තෛල පාක ක්‍රමය අනුව තෙල සිද ගන්නේ ය.

88. **යෝග නාමය :— ශ්විත්‍රහර තෛලය.**

යෝගය :—

මනෝසිල,
වරාකිරි,
දළුක්කිරි,
අවරිය ස්වරස,
ගෙන්දගම්,
හරිතාල,
කාසීස,
හයමාර, (කනේරු)
රත්නිවුල්,
රිදීතුත්තං,
කලාදුරු අල,
ගම්මිරිස්,
කහ,
වෙනිවැල්ගැට,
අරළු,
බුළු,
නෙල්ලි,
කිකිරිදිය,
ලියනහලා,
දහන -(රත්නිවුල්),
තිලුපුල් අල,
ලෞහ චූර්ණය,
බාකුචි ඇට,
සේපාලිකා ඇට,
විෂ (වච්චනාවි),
ක්ෂාරත්‍රය,
කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් (සමභාගව) ගෙන කල්කය සාද ගන්නේ ය.
ගිරිකන්‍යා (කටරොළු) ස්වරස,
දේවදලී (තිත්ත වැටකොළු) ස්වරස,
ජ්වාලාමුඛී ස්වරස (සූර්යකාන්ත),
ප්‍රපුන්නාට රස, (ඇත් තෝර කොළ යුෂ)
තලතෙල් — සේරු 3 (ලී: 2.88) බැගිනි.

සංස්කරණය :— තෛල පරිභාෂාව අනුව තෙල සාද ගන්නේ ය.

ප්‍රයෝග :— ශ්විත්‍ර, මණ්ඩල, කුෂ්ට, සිධ්ම, ගජචර්ම, දද, පාමා, විසර්ප, ආදි කුෂ්ඨ නසයි.

89. **යෝග නාමය :— ශුද්ධබලා තෛලය.**

යෝගය :—	බැබිල මුල්	පලම්	100 යි. (ග්‍රෑ: 6000)
	ජලය	ද්‍රෝණ	4 – 1ට සිඳවා ගන්නේ ය. (ලී: 61.44 — 15.36)
කල්කය :—	බැබිල මුල්	පලම්	10 යි. (ග්‍රෑ: 600)
	තලතෙල්	ආඪක	2 යි. (ලී: 7.68)
	එළකිරි	ද්‍රෝණ	4 යි. (ලී: 61.44)

සංස්කරණය :— තෛල පරිභාෂාව අනුව මඳ ගින්නෙන් තෙල සිඳ ගන්නේ ය.

ප්‍රයෝග :— සියලු වාත, රත්පිත්, රක්තජ රෝග, නෂ්ට රජස්, තාලු ශොෂ, පිපාස, දහ, පාර්ශව ශූල, අසෘග්දර, ශොෂ, ක්ෂය, අපස්මාර, විසර්ප, ශිරොග්‍රහ සුව කෙරේ. ආයුෂ වඩයි. බලකාරක යි.

90. **යෝග නාමය :— ශුෂ්කමුලකාදි තෛලය.**

යෝගය :—

රාබු අල යුෂ,
දස මුල්,
තිප්පිලි මුල්,
සාරණ මුල්, — ප්‍රස්ථ 1 (ග්‍රෑ: 960) බැගිනි.
ජලය ප්‍රස්ථ 32 – 8 ට, (ලී: 30.72 – 7.68) ට සිඳුවා ගත යුතු යි.
තලතෙල් ආඪක 1/2 යි. (ලී: 1.92)
ගොමුත්‍ර ආඪක 1/2 යි. (ලී: 1.92)

කල්කය :—

රාබු අල,
රසකිඳ,
වියලි ඉඟුරු,
දුම්මැල්ල,
තිප්පිලි,
බැබිල මුල්,
දියමිත්ත,
සාරණ මුල්,
සැවැන්දරා, (හේත්‍රබාලා),
සැවැන්දරා,
මුරුංගා මුල්,
නිකමුල්,
වදකහ,
සුවදකොට්ටං,
අරත්ත,
වළගසාල්,
සිවිය,
කහ,
දරුහරිද්‍රා,
කොත්තමල්ලි,
යවක්ෂාර,
ස්වර්ජික්ෂාර,
සවිඳ ලුණු,
දේවදර,

ඉන්ද්‍රාසන, (කංසා කොල)
ශ්‍යාමා (ඉරමුසු),
මඟුල්කරඳ,
ආඩතෝඩා මුල්,
තිප්පිලි,
පද්මකාෂ්ඨ,
ශඨී,
ගජතිප්පිලි,
බෙලිමද,
වැල්මදට,
අරළු — කර්ෂ, 1 (ග්‍රෑ: 15) බැගින් ගෙන කල්කය සාද ගත යුතු යි.

සංස්කරණය :— ප්‍රථම කෂාය සමග තෛල, කල්ක යොද සමපාකයට තෙල සිද ගන්නේ ය.

ප්‍රයෝග :— වාත, පිත්ත සහ කඵජ ශෝථ, මල දූෂිත රෝග, දූෂිත ජලය ස්නානය කිරීමෙන් ඇතිවන නොයෙක් ප්‍රකාර ශෝථ ආදියෙහි අභ්‍යංගය සඳහා යෙදේ. චර්ම රෝග නසා සම ප්‍රභා සම්පන්න කෙරේ.

91. යෝග නාමය :— **ෂඩ්බින්දු තෛලය.**

යෝගය :—
එරඩු මුල්,
තුවරලා,
ශතපුෂ්ප,
ජීවන්ති,
මුද්දිරප්පලම්,
සහිඳ ලුණු,
කුරුඳු පොතු,
වළහසාල්,
වැල්මී,
ඉඟුරු — මිලිතව සේරු 1 යි. (ග්‍රෑ: 960)
තලතෙල් සේරු 4 යි. (ලී: 3.84)
එළු හෝ එලකිරි සේරු 16 යි. (ලී: 15.36)
කිකිරිදිය යුෂ සේරු 16 යි. (ලී: 15.36)

සංස්කරණය :— තෛලපාක ක්‍රමය අනුව තෙල සිදවා ගන්නේ ය.

මාත්‍රාව :— බින්දු 6 ක් නස්‍යය සඳහා යෙදේ.

ප්‍රයෝග :— නස්‍ය කිරීමෙන් ශිරෝ රෝග දුරු වේ. බුරුල් වූ දත් දෘඩ වේ. දෘෂ්ටිය හා බාහු බලය වැඩේ.

92. යෝග නාමය :— **සත්තවාදි තෛලය.**

යෝගය :—
පතහි,
රසකිඳ,
සස්සඳ මුල්,
දෙඩන්පණා මුල්,
නාරංමුල්,
රත්තෙටුල්,
වේලා මුල්,
යක්බෙරිය මුල්,
යක්වනස්ස මුල්,
පාවට්ට මුල්,
ලුණුවරණ මුල්,
මදුරුතලා මුල්,
ගම්මිරිස් ඇට,
වදකහ,
කුඹුරු මුල්,
මී මුල්,
කුප්පමේනිය මුල්,
අරළු,
නෙල්ලි,
බුළු,
අබ,
නිකමුල්,
දෙහිමුල්,
දෙඩම් මුල්,
ඉඹුල් මුල්,
අවරිය මුල්,
කොහොඹමුල්, පොතු,
කලාඳුරු අල,
මුකුනුවැන්න මුල්,
මුරුංගා මුල්,
වෙල්ලංගිරියමුල්, කොළ
උදත්තා,
සුදුඳුනු,
වරා මුල්,
කුඩුමිරිස් මුල්,
දිවුල් පොතු,
ඉඟුරු,
පලං 2 (ග්‍රෑ: 120) බැගින් වතුර සේරු 80–20 ට (ලී: 76.8 – 192 ට) සිඳ,
දෙහි ඇඹුල්,
දෙඩම් ඇඹුල්,
ගොරක යුෂ,
හරංකහ යුෂ,
නැළි 2 (ලී: 1.92) බැගින්,
කොහොඹ තෙල්,
තලතෙල්,
එරඩු තෙල්,
ගිතෙල්,
මී තෙල් — නැළි 2 බැගින් (ලී: 19.2)

කල්කය :—
කොට්ටං,
අතිවිඩයං,
කොත්තමල්ලි,
ගලිස්,
පල්මානික්කම්,
ශතපුෂ්ප,
පෙරුංකායම්,
උලුහාල්,
කටුකරෝසන,
දේවදර,
දේවදුරු,
කළුදුරු,
මනෝශිල,
අසමෝද,
තිප්පිලි,
නවසාරං,
අලබෙත් (චීන අල)
සුදුලූනු — කලං 12 1/2 බැගින් (ග්‍රෑ: 62-5)

සංස්කරණය :— තෛල පාක විධිය අනුව ය.

ප්‍රයෝග :— හික්කාවට විශිෂ්ට යි. උන්මාද රෝග නසයි. තියුණු අපස්මාර රෝගයට ද යෝග්‍ය වේ. සූතිකෝන්මාදයට යහපති. නිද්‍රාකාරක යි. අභ්‍යංග-පාන-නස්‍ය සඳහා යි.

93. යෝග නාමය :— **සර්වවිෂාදි තෛලය.**

යෝගය :—
මුරුංගා කොළ පොතු, මුල්,
අත්කෙන්ද පොතු,
ගස්කැප්පෙටිය පොතු,
එරබදු පොතු,
සියඹලා පොතු,
අමුක්කරා කොළ පොතු,

මී කොළ, පොතු,
සපු පොතු,
නා පොතු,
දිවුල් පොතු,
හම්පිල පොතු–කොළ,
ආඩතෝඩ කොළ – පොතු,
නික කොළ පොතු,
යක්බෙරිය,
හාතාවාරිය අල, කොළ වැල්,
එරඬු කොළ, පොතු,
මහුල්කරඳ කොළ, පොතු,
පොල්කිරි පත 1 යි. (මි: ලී: 240)
තලතෙල්,
එරඬු තෙල්,
මී තෙල්,
කොහොඹ තෙල්,
එලගි තෙල් — පත 1 බැගිනි. (මි: ලී: 240)

ගිරිතිල්ල කොළ සහ වැල්,
අමු ඉඟුරු,
කපු කොළ,
වල්කැප්පෙටිය කොළ
මදටිය කොළ, පොතු,
කොහොඹ කොළ, පොතු,
වෙල්ලන්ගිරිය,
කුරුඳු කොළ, පොතු,
වේලා,
යකවනස්ස,
කටුකරඬු,
රම්මනිස්ස — එකින් යුෂ පත 1 බැගින් (මිලි: 240)

කල්කය :—

කළුදුරු,
සූදුරු,
අසමෝදගම්,
අරළු,
බුළු,
නෙල්ලි,
ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
සුදුලූනු,
පල්මානික්කම්
කරාබු,
වසාවාසි,
සාදික්කා;
සීනක්කාරම්,
හරන්කහ,
රත්හඳුන්,
සුදුහඳුන්,
පෙරුම්කායම් — එකින් කලං 3 මදට 3 (ග්‍රෑ: 15.75) බැගින්.

සංස්කරණය :— ඒ ඒ ද්‍රව්‍ය යෝගයෙහි සඳහන් පරිදි ගෙන, කොටා මිරිකා, යුෂ පත 20 ක් ගෙන එකට මිශ්‍රකොට, ඊට පොල් කිරි සහ තෙල් පස් පංගුව ද නියමිත පරිදි යොදු තෛල පාක පරිභාෂාව අනුව සිඳ ගන්නේ ය.

ප්‍රයෝග :— නස්‍ය, පාන, අභ්‍යංග සඳහා යෙදේ. සෙම් ගෙඩි, මස්දළු, ආදි උගුරේ හටගත් නොයෙකුත් රෝග වනසා ලයි. විසප්පු, ගඩු, කුද්දෙටි, කර්ණමූල, ග්‍රන්ථි හා කර්ණපාක නාශක යි. වලිප්පුව, රතගාය, මී විෂ, සර්පවිෂ ආදි සියළු විෂට ම යෙදේ. ගැබිණි අවස්ථාවෙහි මේ තෙල බීමෙන් දරුවා ලේ කෝප රෝග වලින් රැකේ යනු ශාස්ත්‍ර නියමය වේ.

මාත්‍රාව :— වරකට තේ හැඳි 1 — 2 දක්වා පානය පිණිස යෝග්‍ය යි.

94. යෝග නාමය :— **සිද්ධාර්ථ තෛලය. (1)**

යෝගය :—

(1) හාතාවාරිය අල (පලං 100 = ග්‍රෑ: 6000 කින්) යුෂ නැළි 24 යි. (ලී: 23.04)

(2) දශ මූල,
බැවිල මුල්,
*තෙල් එරඬු මුල් — මිලිතව පලං 100 යි. (ග්‍රෑ: 6000)
වතුර නැළි 96–24 (ලී: 92.16 — 23.04 ට) සිඳුවා පෙරා කෂාය, නැළි 24 යි. (ලී: 23.04)
එළකිරි නැළි 24 යි. (ලී: 23.04)
තලතෙල් නැළි 6 යි. (ලී: 5.76)

කල්කය :—

ශතපුෂ්ප,
සහිඳ ලුණු,
සුදුහඳුන්,
අමුක්කරා අල,
වැල්මදට,
ජටාමාංස,
වදකහ,
එන්සාල්,
රත්හඳුන්,
ගල්මද,
හීන් අරත්ත අල,
අසමෝදගම්,
ඉඟුරු,
දේවදර,
කොට්ටම්,
ගම්මිරිස්,
තිප්පිලි,
ශිලාජතු,
පලං 1 (ග්‍රෑ: 60) බැගින් චූර්ණකර තෛලට යොදු, තෛල පරිභාෂාව අනුව සිඳුවා පෙරා ගන්නේ ය.
–තෙල් එරඬු මුල් යෙදීම වෘද්ධ වෛද්‍ය ව්‍යවහාරයෙකි.

ප්‍රයෝග :— පක්ෂාඝාතාදි සියළු වාත රෝගයන්හි නස්‍ය, පාන, අභ්‍යංග සඳහා යෙදේ. වාත රෝගයන්ගේ ආම අවස්ථාවෙහි නො යෙදේ. හෘදය රෝගයන්හි පාන අභ්‍යංග සඳහා විශිෂ්ට ය.

95. යෝග නාමය :— **සිද්ධාර්ථක තෛලය.** (2)

යෝගය :—

හාතාවාරිය (යුෂ) ප්‍රස්ථ 2 යි. (ලී: .92)
*තලතෙල් ප්‍රස්ථ 1 යි. (මි: ලී: 960)
කිරි ප්‍රස්ථ 4 යි. (ලී: 3.84)
අමු ඉඟුරු යුෂ ප්‍රස්ථ 2 යි. (ලී: 1.92)

කල්කය :—

ශතපුෂ්ප,
දේවදාර,
ජටාමාංස,
ශෛලෙය,
බැබිල මුල්,
රත්හඳුන්,
තුවරලා,
කොට්ටම්,
හීන් එන්සාල්,
ශාල පර්ණි,
හීන් අරත්ත,
අමුක්කරා,
වැල්මදට,
කළු ඉරමුසු,
සුදු ඉරමුසු,
පෘෂ්ණිපර්ණි,
වදකහ,
එරඬු මුල්,
සෛන්ධව,
ඉඟුරු — කර්ෂ (ගු: 15) බැගින්.

සංස්කරණය :— යෝගයෙහි සඳහන් යුෂ වර්ග හා තලතෙල් ද, එලකිරි ද මිශ්‍රකොට ඇඹරූ කල්කය ඊට යොදා තෛල පාක ක්‍රමයට තෙල සිඳ ගන්නේ ය.

ප්‍රයෝග :— නස්‍ය, පාන, අභ්‍යංග, අනුවාසන සඳහා යෙදේ. සන්ධිවාත, පුරාතන ආමවාත සඳහා විශේෂ යි ජිහ්වාස්තම්භ ක්ෂීණ–නෂ්ට ශුක්‍ර. වාතරෝග නසයි.
*ඇතැම් කෙනෙක් අබතෙල් යොදති.

96. යෝග නාමය :— **සීතෝදක තෛලය.**

යෝගය :—

අමුකහ,
කොහොඹ කොළ,
හාතාවාරිය අල යුෂ, නැළි 4 යි. (ලී: 3.84) බැගින්.
පොල්කිරි නැළි 4 යි. (ලී: 3.84)

කල්කය :—

කොත්තමල්ලි,
කළුදුරු,
සුදුදුරු,
වෙද, (පෙරුම්කායම්)
අබ (සිදු)
තිප්පිලි,
වාල්මොලගු,
කුරුඳු පොතු,
ශතපුෂ්ප,
ත්‍රිවර්ග,
අසමෝද — කර්ෂ (ගු: 15) බැගින්.

සංස්කරණය :— තෛල පරිභාෂාව අනුව පිළියෙල කර ගන්නේ ය.

ප්‍රයෝග :— සදොෂාවරණ සඳහා යෝග්‍ය වේ. තෙල් යොද ඇල්දියෙන් තෙම්ම ක්‍රමය යි.

97. යෝග නාමය :— **සෛන්ධවාදී තෛලය.**

යෝගය :—

එරඬු තෙල් සේරු 4 යි. (ලී: 3.84)
ශතපුෂ්ප ක්වාථය සේරු 4 යි. (ලී: 3.84)
කාඩි සේරු 8 යි. (ලී: 7.68)
දධි මස්තු සේරු 8 යි. (ලී: 7.68)

කල්කය :—

සවිද ලුණු,
ගජතිප්පිලි,
අරත්ත අල,
ශතපුෂ්ප,
අසමෝදගම්,
ස්වර්ජික්ෂාර,
ගම්මිරිස්,
කොට්ටං,
ඉඟුරු,
සුවස ලුණු,
බළල් ලුණු,
වදකහ,
වල් අසමෝද,
වැල්මී,
සුදුදුරු,
කොට්ටං,
තිප්පිලි — චූර්ණය තෝලා 4 (ගු: 48) බැගින්.

සංස්කරණය :— තෛල පරිභාෂාව අනුව වේ.

ප්‍රයෝග :— පාන, අභ්‍යංග, වස්ති, සඳහා යෙදේ. පුරාතන ආම වාතයට යෝග්‍ය වේ.

98. යෝග නාමය :— **සෝමරාජි තෛලය.**

යෝගය :—
බාකුචි,
කහ,
දරුහරිද්‍ර,
එළ අඹ,
ඇහැළ කොළ,
කොට්ටම්,
කරඳ ඇට,
ඇත්තෝර ඇට,
යන මේවා මිලිතව සේරු 1 යි. (ග්‍රෑ: 960)
අබ තෙල් සේරු 4 යි. (ලී: 3.84)
ජලය සේරු 16 යි. (ලී: 15.36)

සංස්කරණය :— සියල්ල එක්කොට සමපාකයට තෙල සිඳ ගන්නේ ය.

ප්‍රයෝග :— අටලොස් වැදෑරුම් කුෂ්ඨ, නාඩිව්‍රණ, පිඩකා, ව්‍යංග, වාතරක්ත, කණ්ඩු, කච්ඡුර, දද්‍රු, පාමා රෝග යන්හි අභ්‍යංගය සඳහා යෙදේ. ශ්විත්‍ර රෝගයෙහි විශේෂ යි.

99. යෝග නාමය :— **හිංගුත්‍රිගුණ තෛලය.**

යෝගය :—
සුදුලූනු පලම් 64 යි. (ග්‍රෑ: 3840)
ජලය නැළි 64 — නැළි 16 ට සිඳුවා පෙරාගත යුතුය. (ලී: 61.44–15.36)

කල්කය :—
පෙරුම්කායම් පලම් 8 යි. (ග්‍රෑ: 480)
සහිඳලුණු, පලම් 8 යි. (ග්‍රෑ: 480)
එරඬු තෙල්, නැළි 4 යි. (ලී: 3.84)

සංස්කරණය :— සහිඳලුණු සහ පෙරුම්කායම් අඹරා දමා තෛලපාක ක්‍රමය අනුව තෙල සිඳුවා ගන්නේ ය.

ප්‍රයෝග :— උදරවාත රෝග, අණ්ඩවෘද්ධි, අන්ත්‍ර වෘද්ධි නසයි.

මාත්‍රාව :— අවුන්ස 1/2 — අවුන්ස 1 දක්වා.

100. යෝග නාමය :— **හිමසාගර තෛලය.**

යෝගය :—
හාතාවාරිය අල සවරස,
කිරිබද්දු අල සවරස,
පුහුල් යුෂ,
තෙල්ලි යුෂ,
ගොක්ෂුර යුෂ,
පොල්කිරි,
අලුකෙහෙල් අල යුෂ,
ඉඹුල් මුලේ පොතු යුෂ, — ප්‍රස්ථ 2 බැගිනි. (ලී: 1.92)
කිරි ප්‍රස්ථ 8 යි. (ලී: 7.68)
තලතෙල් ප්‍රස්ථ 2 යි. (ලී: 1.92)

කල්කය :—
රත්හඳුන්,
තුවරලා,
සුවඳකොට්ටං,
වැල්මදට,
හොර අරටු,
අගිල්,
ජටාමාංස,
මුරාමාංසි,
ශිලාජතු,
වැල්මී,
කලාඳුරු,
කුරුඳුපොතු,
හින්එන්සාල්,
තේජ පත්‍ර,
නාමල්රේණු,
කරාබු,
දේවදර,
නබ,
හිඟුරුපියලි,
අරළු,
කුණු කරඳ, (කුඹුරු)
පිතිකා පත්‍ර (තේජපත්‍ර හෝ කහ කොල)
කුන්දුරුක්කම්,
උණකපුරු,
හාතාවාරිය,
ලොධ්‍ර,
වසාවාසි,
ශතපුෂ්ප,
ශටී,
සුදුහඳුන්,
ග්‍රන්ථිපර්ණි,
කපුරු,
කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් කල්කය සාද ගත යුතු යි.

සංස්කරණය :— තෛලපාක පරිභාෂාවෙනි.

ප්‍රයෝග :— වාතරෝග වලට විශේෂයෙන් ගුණ යි. ඒකාංගශොෂ, සර්වාංග ශොෂ, ක්ෂීණ, දරුණු ක්ෂය රෝග. හනුස්තම්භ, මන්‍යාස්තම්භ, දුර්වලතා, ශොෂ රෝග, ජිහ්වා රෝග, මින්මිනත්ව, අධික දහ—ක්ෂීණ වාතරෝග යනාදියට ඉතා ම ශ්‍රේෂ්ඨ යි. පිත්තජ රෝග ද මධ්‍යශරීර, හස්තපාද ආදියේ ඇති වන සියලු රෝග ද ශාන්තියට පමුණුවා ලයි.

සැ: යු:— නබ—සත්නැබ—පූතිකා—උරුලැසට්ටං සහ තාලිශ පත්‍ර ගැනීම වෘද්ධ වෛද්‍ය ව්‍යවහාරයකි.

* ඇතැම් කෙනෙක් පොල් වතුර ද ගනිත්.

ඝෘත ඛණ්ඩය.

1. යෝග නාමය :— **අමෘතප්‍රාශ ඝෘතය.**

යෝගය :—

(1)	එළමස්	තුලා 1 යි. (ගු: 6000)
	වතුර	සේරු 64 – 16 ට සිඳුවා පෙරා ගන්නේ ය. (ලී: 61.44 – 15.36 ට)
(2)	අමුක්කරා අල	තුලා 1 යි. (ගු: 6000)
	වතුර	සේරු 64 – 16 ට සිඳුවා පෙරා ගන්නේ ය. (ලී: 61.44 – 15.36 ට)
(3)	එළකිරි	සේරු 16 යි. (ලී: 15.36)
	ගිතෙල්	ප්‍රස්ථ 1 යි. (කුංකුම කර්ෂ 4 ක් (ගු: 60) ක් යොද මූර්ච්ඡා කොට ගන්නේ ය.)

(4) කල්කය :—

බැබිල මුල්,
නෙරංචි,
තිප්පිලි,
බූළු,
මේද,
ඍෂභක,
වැල්මදට,
තේජපත්‍ර,
වාල්මොලගු,
හිං එන්සාල්,
ඍධි,
තිරිහු ඇට,
කශෙරු,
කොත්තමල්ලි,
නෙල්ලි,
මහාමේද,
ශටී,
තුවරලා,
කුරුඳු පොතු,
කොවක්කා අල,
නිල් මානෙල් අල,
වෘධි,
අමුක්කරා අල,
ඉඟුරු,
තල්මොටෙයියා,
කස්තූරි,
කොට්ටං,
දරුහරිද්‍රා,
තාලිශපත්‍ර,
නාමල්රේණු,
හොර අරටු,
ඉරමුසු මුල්,
අට්ටික්කා පොතු,
රසකිඳ,
ගම්මිරිස්,
අරළු,
වඳුරු මෑ ඇට,
ජීවක,
ප්‍රියංගු,
මහඑන්සාල්,
සමන්පිච්ච මල්,
වසාවාසි,
ජීවන්ති,

මෙම ද්‍රව්‍ය කර්ෂ 1 (ගු: 15) බැගින් චූර්ණකොට ගන්නේ ය.

(5) ඝෘතපාක පරිභාෂාවෙන් සිද්ධ කරන්නේ ය. ඝෘතය සිසිල් වූ පසු සිනි ශරාව (ගු: 480 ක්) එකක් ඊට මිශ්‍ර කර ගන්නේ ය.

ප්‍රයෝග :— ප්‍රමේහ, ද්වජභංග, ශිර්ෂරෝග, ශුක්‍ර—ආර්තව ක්ෂය, යන රෝගයන්හි යෙදේ. අතිශයින් ම පුෂ්ටි කාරක වේ.

මාත්‍රාව :— කර්ෂ 1 — 2 දක්වා ය. (ගු: 15 — 30)

අනුපාන :— උණුසුම් කිරි හා සිනි ය.

2. යෝග නාමය :— **අර්ජුන ඝෘතය.**

යෝගය :—

ඝෘත	ප්‍රස්ථ 1 යි. (ගු: 960)
කුඹුක් පොතු,	ප්‍රස්ථ 2 යි. (ගු: 1920)
ජලය	ප්‍රස්ථ 16 (ලී: 15.36) ක් දමා ප්‍රස්ථ 4 ට සිඳුවා ගත යුතු ය.
කුඹුක් පොතු,	ප්‍රස්ථ 1/4 (ගු: 240) ක් සුණුකොට කල්කය යොදන්නේ ය.

සංස්කරණය :— ඝෘත පරිභාෂාව අනුව සකසා ගත යුතු යි.

ප්‍රයෝග :— සියලු ප්‍රකාර හෘද්‍රෝගවලට ශ්‍රේෂ්ඨ යි.

මාත්‍රාව :— කලං 1/2 – 1 (ගු: 2,5–5) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු ය.

3. යෝග නාමය :— **අශ්වගන්ධා ඝෘතය.**

යෝගය :—

අශ්වගන්ධා කෂාය	භාග 1 යි.
අශ්වගන්ධා කල්කය	භාග 1/4 යි.
කිරි	භාග 4 යි.
ඝෘත	භාග 1 යි.

ප්‍රයෝගය :— වාත රෝග නසයි, වෘෂ්‍ය යි, මාංස වර්ධනය කරයි.

මාත්‍රාව :— තේ හැඳි 1/2 — 1 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය.

4. යෝග නාමය :— **අශෝක ඝෘතය.**

යෝගය :—

අශෝක පොතු,	ප්‍රස්ථ 1 යි. (ගු: 960)
ජලය	ආඪක 1 ක් 1/4 ට සිඳුවනු. (ලී: 3.84)

ගිතෙල්,
සුදුදුරු කෂාය,
හාල්පානු දිය,
එළකිරි,
කෙසරාජ (කළු කීකිරිඳිය) ස්වරස ප්‍රස්ථ 1 බැගින්. (මි: ලී: 960)

ජීවනීය ගණය,
ප්‍රියාල (කොට්ටම්බ ප්‍රතිනිධි),
පරූෂක,
රසාඤ්ජන,
වැල්මී,
අශෝක පොතු,
මුද්දිරප්පලම්,
සුළුකුර පලං 1/2 බැගිනි. (ග්‍රෑ: 30)

සංස්කරණය :— ඝෘත පරිභාෂාව අනුව සකස් කළ යුතු යි.

ප්‍රයෝග :— ත්‍රිදෝෂජ ප්‍රදර නාශක යි. කුක්ෂි ශූල, කටි ශූල, මන්දග්නි, අරුචි, පාණ්ඩු, කෘශතා, ශ්වාස, කාස යන මේවා නස යි. ආයුෂ්‍ය යි. බල්‍ය යි. වර්ණ්‍ය යි.

අනුපාන :— සුදුසු අනුපානයකින් දෙනු.

මාත්‍රාව :— තේ හැඳි 1/2 — 1 දක්වා යි.

5. යෝග නාමය :— **ඉන්ද්‍රකාන්ත ඝෘතය.**

යෝගය :—
කුණුකරඳ මුල් (කුඹුරු)
දේවදර,
දශමූල, — පලං 2 බැගිනි. (ග්‍රෑ: 120)
ජලය පලං 96 යි. (ග්‍රෑ: 5760)
ශේෂය පලං 24 යි. (ග්‍රෑ: 1440)
ඝෘත පලං 6 යි. (ග්‍රෑ: 360)
එළකිරි පලං 6 යි. (ග්‍රෑ: 360)
තිප්පිලි
තිප්පිලි මුල්,
සිවිය මුල්,
රත්නිවුල්,
ඉඟුරු,
සහිඳ ලුණු — පලං 1 බැගිනි. (ග්‍රෑ: 60)

ප්‍රයෝග :— වාතරෝග, ක්ෂය, මහෝදර, ගුල්ම, ශූල යන මේවා නසයි. විෂමජ්වර නාශක යි.

මාත්‍රාව :— තේ හැඳි 1/2 — 1 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

6. යෝග නාමය :— **කල්‍යාණක ඝෘතය.**

යෝගය :—
තිපල්,
ගොන්කැකිරි,
මහ එන්සාල්,
දේවදර,
ඒලවාලුක,
ඉරමුසු, (සුදු)
කළු ඉරමුසු,
කහ,
දරුහරිද්‍ර,
ශාලපර්ණි,
පෘෂ්ණි පර්ණි,
ප්‍රියංගු,
තගර,
එළබටු,
සුවඳකොට්ටම,
වැල්මදට,
නාමල් රේණු,
දෙළුම් ඇට,
වළගසාල්,
තලිස්පතුරු,
හීන් එන්සාල්,
දැසමන්මල්,
නිල් මහනෙල් මල්,
දන්ත,
පද්මකාෂ්ඨ,
සුදුහඳුන් — කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගිනි.
ගිතෙල් ප්‍රස්ථ 1 යි. (ග්‍රෑ: 960)
ජලය ප්‍රස්ථ 4 යි. (ලී: 3.84)

සංස්කරණය :— ඝෘත පරිභාෂාව අනුව ය.

ප්‍රයෝග :— භූත-ග්‍රහ උන්මාද, අපස්මාර, පාණ්ඩු, විෂ, ශෝථ, මූර්ච්ඡා, ප්‍රමේහ, ගරවිෂ, ජ්වර නස යි. ශුක්‍ර වඩයි. වඳ බව නසයි.

මාත්‍රාව :— කලං 1 — 2 (ග්‍රෑ: 5 — 10) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

7. යෝග නාමය :— **කාමදේව ඝෘතය.**

යෝගය :—

අමුක්කරා පලං 100 යි. (ග්‍රෑ: 6000)
ගොකටු,
හාතාවාරිය,
කිරිබදු අල,
ශාලපර්ණි,
බැවිල—මෙම ද්‍රව්‍ය පලං 50 (ග්‍රෑ: 3000) බැගිනි.

අශ්වත්ථශෘංග (බෝකරටි),
පද්මබීජ, (නෙළුන් ඇට)
සාරණ,
ඇද්දෙමට ගෙඩි,
උඳු ඇට,
මෙම ද්‍රව්‍ය පලම් 10 බැගිනි. (ග්‍රෑ: 600)

ජලය ද්‍රෝණ 4 ක් දමා, ද්‍රෝණ 1 ට කෂාය සිඳුවා ගන්නේ ය. (ලී: 61.44–15.36 ට)

මුද්දිරප්පලම්,
පද්මකාෂ්ඨ,
කොට්ඨං,
තිප්පිලි,
රත්හඳුන්,
හ්‍රිවේර,
මාෂපර්ණි,

නාමල්,
වඳුරු මෑ ඇට,
නිල් මානෙල්,
සුදු ඉරමුසු,
කළු ඉරමුසු,
ජීවක,
ජීවන්ති,

ඍෂභක,
මේද,
මහාමේද,
කාකෝලි,
ක්ෂීරකාකෝලි,
මුද්ගපර්ණි,
යෂ්ටි මධු,

කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගිනි.

ශර්කරා පලං 2 යි. (ග්‍රෑ: 120) එළකිරි ආඪක 4 යි. (ලී: 15.36)
ප්‍රපෞණ්ඩරීකයුෂ (උක්රස) ආඪක 1 යි. (ලී: 3.84) ඝෘත ප්‍රස්ථ 1 යි. (ග්‍රෑ: 960)

සංස්කරණය :— ඝෘත පරිභාෂාවෙනි.

ප්‍රයෝග :— රත්පිත, ක්ෂතක්ෂීණ, කාමලා, වාතරක්ත, හලීමක, ශොථ, ස්වරභෙද, බලක්ෂීණතාව, අරුචි, මූත්‍රකාච්ඡර, පාර්ශ්ව ශූල, යන රෝගයන්හි යෙදේ.
වන්ධ්‍යාත්වය, දුර්වල අල්ප වීර්‍ය, නපුංසක, අය කෙරෙහි ඉතාම ප්‍රශස්ත ය. වෘද්ධ අය සහ යක්ෂ්මා රෝගයෙන් පෙළෙන අයගේ බල වඩයි. හෘදය ශක්තිය ඇති කරයි. වාජීකරණ යි. ඕජස් වඩයි. තේජස්කර යි.

අනුපාන :— ශෘත ශීත හෝ ධාරෝෂ්ණ කිරි සමග ය.

මාත්‍රාව :— කලං 1/2 — 1 (ග්‍රෑ: 2.5 — 5) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය.

8. යෝග නාමය :— **කුමාර කල්‍යාණ ඝෘතය.**

යෝගය :—

එළගිතෙල් සේරු 4 යි. (ග්‍රෑ: 3840)
කටුවැල්බටු පංචාංගය සේරු 8 යි. (ග්‍රෑ: 7680)
ජලය සේරු 64, 16 ට සිඳුවා ගන්නේ ය. (ලී: 61.44 — 15.36)
එළකිරි සේරු 16 යි. (ලී: 15.36)

කල්කය :—

ශංඛ පුෂ්පි,
වදකහ,
බ්‍රාහ්මී,
සුදු අබ,
සුවඳකොට්ටං,
තිපල්,
මුද්දිරප්පලම්,

උක්හකුරු,
වියලි ඉඟුරු,
ජීවන්ති,
ජීවක,
බැබිල,
ශඨී,
දුරාලභා (කහඹිලියා මුල්)

බෙලිගැට මද,
දෙළුම් ලෙලි,
හින් එන්සාල්,
කොට්ටම්,
ගජතිප්පිලි,
තුලසි,
ශාලපර්ණි,

කළාදුරු — කර්ෂ 2 (ග්‍රෑ: 30) බැගිනි.

සංස්කරණය :— ඝෘත පාක ක්‍රමයට ඝෘතය සාද ගන්නේ ය.

ප්‍රයෝග :— බල, වර්ණ, පුෂ්ටිකර යි. පාචකාග්නිය හා රුචිය ඇති කරයි. අලක්ෂ්මී, කෘමිරෝග, විශේෂයෙන් දන්තොද්භෙද රෝග හා බාල රෝග නසන්නේ ය. බල වඩ යි.

අනුපාන :— එළකිරි හෝ නිවුණු උණුදිය.

9. යෝග නාමය :— **වචාදි ඝෘතය.**

යෝගය :—

සිවිය,
ත්‍රිකටු,
දියමිත්ත,
යවක්ෂාර,
කොත්තමල්ලි,
අසමෝදගම්

තිප්පිලි මුල්,
විඩලවණ,
සවිද ලුණු,
රත්නෙවුල් මුල්,
බෙලිගැට මද,
අරළු — මිලිතව සේරු 1 යි. (ග්‍රෑ: 960)

ගිතෙල් සේරු 4 යි. (ග්‍රෑ: 3840)
දධි සේරු 16 යි. (ලී: 15.60)
ජලය සේරු 16 යි. (ලී: 15.36)

සංස්කරණය :— ඝෘත පරිභාෂාවට අනුව පිළියෙල කර ගන්නේ ය.

ප්‍රයෝග :— මල-වාත අනුලෝමනය කරයි. ප්‍රවාහිකා, ගුදභ්‍රංශ, මූත්‍රකෘච්ඡ්‍ර, පරිස්‍රව, ගුදශූල සහ වඞ්ක්ෂණශූල නසයි. විශේෂයෙන් මලවාත අනුලෝම කරයි. ගුදභ්‍රංශයට වෙසෙසින් යෙදේ.

මාත්‍රාව :— කලං 1 — 2 (ග්‍රෑ: 5 — 10) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

10. **යෝග නාමය :—** චාංගේරි ඝෘතය.

යෝගය :—

වියලි ඉඟුරු,
තිප්පලි මුල්,
රත්නෙටොල්,
ගජතිප්පලි,
සිවිය මුල්,
ගොකටු,
තිප්පලි,
කොත්තමල්ලි,
බෙලිගැට මද,
දියමිත්ත,
අසමෝදගම් — මිලිතව සේරු 1 යි. (ග්‍රෑ: 960)
එළගිතෙල් සේරු 4 යි. (ග්‍රෑ: 3840)
ඇඹුල් ඇඹිලිය යුෂ සේරු 16 යි. (ලී: 15.36)
දී පෙරලිදිය සේරු 16 යි. (ලී: 15.36)

සංස්කරණය :— ඝෘත පරිභාෂාවට අනුව පිළියෙල කර ගන්නේ ය.

ප්‍රයෝග :— සෙම් වා නසයි. ග්‍රහණී, අර්ශස්, ආනාහ, ගුදභ්‍රංශ, මූත්‍රකෘච්ඡ්‍ර, ප්‍රවාහිකා සුව කරයි. ග්‍රහණී රෝග යනට විශේෂ යි.

මාත්‍රාව :— කලං 1 — 2 (ග්‍රෑ: 5 — 10) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

11. **යෝග නාමය :—** ජාගලාදිඝෘතය (I)

යෝගය :—

එළුමස් තුලා 1/2 යි. (ග්‍රෑ: 3000)
ජලය ද්‍රෝණ 1—ද්‍රෝණ 1/4 ට (ලී: 3.84) සිඳුවා ගන්නේ ය.
දසමුල පලම් 50 යි. (ග්‍රෑ: 3000)
ජලය ද්‍රෝණ 1 — ද්‍රෝණ 1/4 ට සිඳුවා ගන්නේ ය.
ඝෘත ප්‍රස්ථ 2 යි. (ග්‍රෑ: 1920)
ජීවක,
ඍෂභක,
මේද,
මහමේද,
කාකෝලි,
ක්ෂීරකාකෝලි,
ඍද්ධි,
වෘද්ධි,
ජීවන්ති,
මුද්ගපර්ණී,
මාෂපර්ණී,
වැල්මී,
යන මේවායේ කල්කය මිලිතව ප්‍රස්ථ 1/2 යි. (ග්‍රෑ: 480)
එළකිරි ප්‍රස්ථ 2 යි. (ලී: 1,92)
හාතාවාරිය ස්වරස ප්‍රස්ථ 2 යි. (ලී: 1.92)

සංස්කරණය :— ඝෘත පරිභාෂා අනුව පිළියෙල කරන්නේ ය.

ප්‍රයෝග :— සියලු වාතරෝග, අර්දිත, කර්ණ ශූල, බිහිරිබව, මූකතා, මින්මින, ගද්ගදතා, රාජයක්ෂ්මා, පඞ්ගු, ඛඤ්ජ, ගෘධ්‍රසි, කුබ්ජ, අපතානක, අපතන්ත්‍රක ආදි සියලු රෝගයන්හි යෙදේ.

මාත්‍රාව :— තේ හැඳි 1/2 — 1 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු ය.

අනුපාන :— එළකිරෙන් හෝ සුදුසු අනුපානයකින් යොදන්නේ ය.

යෝග නාමය :— ජාගලාද්‍ය ඝෘතය (II) (ක්ෂය රෝගයෙහි ශ්‍රේෂ්ඨ යෝගය)

(1) නපුංසක එළුවකුගේ මස් පලං 100 යි. (ග්‍රෑ: 6000)
වතුර සේරු 64 — 16 ට සිඳුවා ගන්නේ ය. (ලී: 61.44–15.36 ට)
(2) ආඩතෝඩා පොතු පලං 100 යි. (ග්‍රෑ: 6000)
වතුර සේරු 64–16 ට සිඳුවා ගන්නේ ය. (ලී: 61.44–15.36 ට)
(3) අමුක්කරා අල පලං 100 යි. (ග්‍රෑ: 6000)
වතුර සේරු 64–16 ට සිඳුවා ගන්නේ ය. (ලී: 61.44–15.36 ට)
(4) මෙම කෂාය තුන ම සංයෝග කොට,
ගිතෙල් සේරු 8 යි. (ග්‍රෑ: 7680)
එළකිරි සේරු 8 යි. (මි: 7.68) මිශ්‍ර කරන්නේ ය.
(5) කල්කය :—
මේද,
මහාමේද,
බෙලිමුල්,
මිදිමුල්,
තාමල්රේණු,
හාතාවාරිය අල,

කාකොලි,
ක්ෂිරකාකෝලි,
ජීවක,
ඍෂභක,
ඍද්ධි,
වෘද්ධි,
වැල්මී,
කිරිබද්ද අල,
ඉබුල් මුල්,
වදකහ,
ශංඛපුෂ්පි,

තොටිල මුල්,
පළොල් මුල්,
ඇද්දෙමට මුල්,
කුරුඳුපොතු,
එන්සාල්,
තේජපත්‍ර,
ශාලාමිශ්‍රි,
බිංතල් අල,
සිවිය මුල්,
වඳුරු මෑ ඇට,
අසමෝදගම්,

ඉඟුරු,
ගම්මිරිස්,
තිප්පිලි,
අරළු,
බුළු,
නෙල්ලි,
රත්කිහිරිය,
කළුදුරු,
හිං එන්සාල්,
උළුහාල්,
භාර්ගි මූල, (සිරිතේක්කු ප්‍රතිනිධි)

මෙම ද්‍රව්‍ය අර්ධපලම (ග්‍රෑ: 30) බැගින් චූර්ණකර ගන්නේ ය.

සංස්කරණය :— ඝෘත පරිභාෂාවෙනි.
ප්‍රයෝග :— දුඃසාධ්‍ය ක්ෂය රෝගයෙහි යොදන්නේ ය. සියලු ආකාර කාස, ස්වර, භෙදයන්හි යෙදේ.

12. යෝග නාමය :— **ජාත්‍යාදි ඝෘතය.**

යෝගය :—

ජාති (දැසමන්) කොළ,
කොහොඹ කොළ,
පටොල පත්‍ර,
හරිද්‍රා,
දරු හරිද්‍රා,
කටුකරෝසන,
වැල්මදට,

වැල්මී,
මී ඉටි,
සැවැන්දරා,
කරඳ ඇට,
ඉරමුසු,
තුත්ථ (පල්මානික්කම්),

මෙම ද්‍රව්‍ය කල්කය සඳහා සමභාගව ගත යුතු යි.
ගිතෙල් කල්කය මෙන් චතුර් ගුණය යි.

සංස්කරණය :— ගිතෙල් මෙන් සතර ගුණයක් ජලය ලා ඝෘත පරිභාෂාව අනුව සකසා ගත යුතු වේ.
සැ: යු :— මෙය බාහිර ප්‍රයෝග සඳහා පමණ යි.
ප්‍රයෝගය :— මෙය ලේපනය කිරිමෙන් සූක්ෂ්ම නාඩිව්‍රණ, මර්මාශ්‍රිත ව්‍රණ, ඉස්ම ගලන ව්‍රණ, ගම්භිර–රුජා සහිත ව්‍රණ නස යි.

13. යෝග නාමය :— **දශමූල ෂට්ඵල පානය.**

යෝගය :—
දසමුල් සේරු 6 යි. (ග්‍රෑ: 5760)
ජලය සේරු 48 යි. (ලි: 64,08) 4–1 ට කෂාය කර ගත යුතුයි.

කල්කය :—

තිප්පිලි,
තිප්පිලි මුල්,
වියලි ඉඟුරු,

සිවිය,
රත්නෙටොල් මුල්,
යවක්ෂාර — පල (ග්‍රෑ: 60) බැගිනි.

කිරි සේරු 4 යි. (ග්‍රෑ: 3.84)
ගිතෙල් සේරු 4 යි. (ලි: 3.84)
දීපෙරලිය (දධිමස්තු) ගිතෙල් මෙන් දෙගුණයකි. (සේරු 8 යි.) (ලි: 7.68)

සංස්කරණය :— කල්කය සමග යෝගයෙහි සඳහන් අනෙක් ද්‍රව ද්‍රව්‍ය ද එක්කොට ඝෘත පරිභාෂාව අනුව ඝෘතය සාද ගත යුතු යි.
ප්‍රයෝග :— සියලු උදර සහ ගුල්ම රෝග නස යි.
අනුපාන :— සුදුසු අවස්ථාවට යෝග්‍ය අනුපානයකින් යෙදිය යුතු යි.
මාත්‍රාව :— කලං 1/2 — 1 (ග්‍රෑ: 2.5 — 5) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය.

14. යෝග නාමය :— **පංචගව්‍ය ඝෘතය. (වෘහත්)**

යෝගය :—

දසමූල,
ත්‍රිඵලා,
හරිද්‍රා,
දරුහරිද්‍රා,
කෙළිඳ පොතු,
රුක් අත්තන පොතු,

කරල්හැබ, පංචාංගය
අවරිය,
කටුකරෝසන,
ශම්පාක (ඇහැළ කරල්)
උදුම්බර (එල්ඟු) මුලේ පොතු,
පෞෂ්කර (සුවඳ කොට්ටම්)

දුරාලභා, (වැල් කහඹිලියා) — පලම් 2 බැගිනි. (ග්‍රෑ: 120)
ජලය ද්‍රෝණ 1 යි. (ලි: 15.36) ද්‍රෝණ 1/4 ට සිඳුවා,

සිරිතේක්කු, (භාර්ගී)
දියමිත්ත,
ත්‍රිකටු,
තිරැස්සවාලු,
දියමිදෙල්ල ඇට,
ගජතිප්පිලි,
අරළු, බුළු, නෙල්ලි,
රටතෝර මුල්,
මූර්වා,
දන්ත මුල්,
බිංකොහොඹ,
රත්නෙටොල් මුල්,
සුදු ඉරමුසු,
කළු ඉරමුසු,
රෝහිතක (හිඳුල්)
භූතිකා (අසමෝදගම්)
මදයන්තිකා (ඉද්ද) — තෝලා 1 (ග්‍රෑ: 12) බැගින් කල්කයට ගත යුතු යි.
ගිතෙල් ප්‍රසථ 1 යි. (ග්‍රෑ: 960)
අඹලදයි,
කිරි,
ගොම යුෂ,
ගොමූත්‍ර, ප්‍රසථ 1 බැගිනි. (මි: ලී: 960)

සංස්කරණය :— ඝෘත පරිභාෂාව අනුව පිළියෙල කර ගත යුතු යි.

ප්‍රයෝග :— අපස්මාර, ජ්වර, කාස, ශොථ, උදර, ගුල්ම, අර්ශස්, කාමලා, හලීමක යන රෝග නසයි. අලක්ෂ්මිය සහ ග්‍රහ දෝෂ, රාක්ෂසදෝෂ, චාතුර්ත්ථක ජ්වර විනාශ කරයි.

මාත්‍රාව :— කලං 1 — 2 (ග්‍රෑ: 5 — 10) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු ය.

15. යෝග නාමය :— **පංචතික්ත ඝෘතය.**

යෝගය :—
ආඩාතෝඩා මුල්,
කොහොඹ පොතු,
රසකිඳ,
කටුවැල්බටු,
පටොලපත්‍ර (දුම්මැල්ල) — පලම 10 බැගිනි. (ග්‍රෑ: 600)
ජලය සේරු 64 — 16 (ලී: 61,44 — 15.36 ට) සිඳුවා ගත යුතු යි.

කල්කය :— ත්‍රිඵලා සේරු 1 යි. (මිලිතව) (ග්‍රෑ: 960)

සංස්කරණය :— ඝෘත පරිභාෂාව අනුව සකස් කරනු.

ප්‍රයෝග :— පාණ්ඩු, කුෂ්ඨ, විසර්ප, කෘමි, අර්ශස්, නසයි.

අනුපාන :— උණුදිය හෝ සුදුසු අනුපානයකින් යොදන්න.

මාත්‍රාව :— තේ හැඳි 1/2 — 1 දක්වා යෙදිය යුතු යි.

16. යෝග නාමය :— **පංචතික්ත ඝෘත ගුග්ගුලුව.**

යෝගය :—
කොහොඹ පොතු,
දුම්මැල්ල (පටොල),
කටුවැල්බටු,
රසකිඳ,
පාවට්ටා,
සිවිය මුල්,
කුෂ්ඨ (කොට්ටන්),
ජ්‍යොතිෂ්මති (දූහුදු),
ගම්මිරිස්,
කෙළිඳහාල්,
සුදුදුරු, — පලම 10 බැගිනි. (ග්‍රෑ: 600)
ජල ද්‍රෝණ 2 යි. 1/4 ට සිඳුවා ගත යුතු යි.
ගිතෙල් ප්‍රසථ 2 (ග්‍රෑ: 1920)
දියමිත්ත,
වළහසාල්,
දේවදර,
ගජතිප්පිලි,
ස්වර්ජික්ෂාර,
යවක්ෂාර,
ඉඟුරු,
හරිද්‍රා,
ශතපුෂ්ප,
රත්නෙටුල්,
කටුකරෝසන,
ශුද්ධභල්ලාතක,
වදකහ,
තිප්පිලි මුල්,
වැල්මදට,
අතිවිෂා,
අරළු,
බුළු,
නෙල්ලි,
යමානි,
කර්ෂ 1 බැගින්
ශුද්ධ ගුගුල්,
පලම 5 යි. ලිහිල් පොට්ටනිය බැඳ කෂායට යොදන්නේ ය.

සංස්කරණය :— ඝෘත පරිභාෂා අනුව ගව.

ප්‍රයෝග :— විෂදෝෂ, ප්‍රබල වාතරෝග, සන්ධි-අස්ථි-මජ්ජාදි ගම්භීරධාතු ගත කුෂ්ඨ විකාර, නාඩිව්‍රණ, අර්බුද, භගන්දර, ගණ්ඩමාලා, ඌර්ධ්වජත්‍රුගත සියලු විකාර, ගුල්ම, ගුද රෝග, ප්‍රමේහ, රාජයක්ෂ්මා, අරුචි, ශ්වාස, පීනස, කාස, හෘදය රෝග, පාණ්ඩුරෝග, ගල විද්‍රධි සහ වාත රක්ත යන රෝග නස යි.

මාත්‍රාව :— මාෂ 3-6 (ග්‍රෑ: 3-6) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්නේ ය.

17. යෝග නාමය :— **ඵල ඝෘතය.**

යෝගය :—
තිපල්,
නිල් කටු කරඬු මුල්,
කහ කටු කරඬු මුල්,
රසකිඳ,
සාරණ මුල්,
තොටිල මුල්,
වෙනිවැල්ගැට,
අරත්ත අල,
මේද,
හාතාවාරිය — යන ද්‍රව්‍යයන්ගේ කල්කය, මිලිතව සේරු /4 යි. (ග්‍රෑ: 240)
කිරි සේරු 4 යි. (ලී: 3.84)
ගිතෙල් සේරු 1 යි. (ග්‍රෑ: 960)

සංස්කරණය :— ඝෘත පරිභාෂාව අනුව පිළියෙල කර ගත යුතු යි.

ප්‍රයෝගය :— යොනි ශූල, යොනිරෝග නසයි.

මාත්‍රාව :— තෝලා 1/2 — 1 යි. (ග්‍රෑ: 6 — 12).

18. යෝග නාමය :— **ඵල කල්‍යාණ ඝෘතය.**

යෝගය :—
*ගිතෙල් සේරු 4 යි. (ග්‍රෑ: 3840)
හාතාවාරිය ස්වරස හෝ ක්වාථය සේරු 16 යි. (ලී: 15.37)
එලකිරි සේරු 16 යි. (ලී: 15.36)

කල්කය :—
වැල්මදට,
වැල්මී,
කොට්ටං,
තිපල්,
ශර්කරා,
බැබිල,
මේද,
කිරිබදු අල,
ක්ෂීරකාකෝලි,
අමුක්කරා,
අසමෝදගම්,
කහ,
වෙනිවැල්,
පෙරුංකායම්,
කටුකරෝසන,
රත්තොත්පල = රත් මහනෙල් අල,
කුමුදු,
මුද්දිරප්පලම්,
කාකෝලි,
සුදුහඳුන්,
රත්හඳුන්,
ලක්ෂ්මණමූල,
කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගින් ගෙන කල්කය සාද ගත යුතු යි.

සංස්කරණය :— ඝෘත පරිභාෂාවට අනුව ඝෘතය සාද ගත යුතු යි.

ප්‍රයෝග :— කාමශක්තිය වඩයි. අකාලයේ පහවන හෝ මෘත දරුවන් ලබන ස්ත්‍රීන් විෂයෙහි මේ ඝෘතය ප්‍රයෝග කට යුතු යි. යෝනි දෝෂ, රජෝ දෝෂ, යෝනිස්‍රාව නසයි. බුද්ධිය වඩ යි. ආයුෂට හිත යි. සර්ව ග්‍රහ දෝෂ නස යි.

අනුපාන :— එලකිරි හෝ සුදුසු අනුපානයක් යොදන්නේ යි.

මාත්‍රාව :— කලං 1/2 — 1 (ග්‍රෑ: 2,5–5) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

*පැටියා ජීවත්ව සිටින, පැටියාට සමාන වර්ණවත් දෙනකගේ කිරෙන් ලබාගත් ගිතෙල වියැ යුතු ය.

19. යෝග නාමය :— **බලාදි ඝෘතය.**

යෝගය :—
බලා,
නාගබලා,
කුඹුක් පොතු, — මිලිතව සේරු 8 යි. (ග්‍රෑ: 7680)
ජලය සේරු 64 – 16 ට සිඳින්න. (ලී: 61.44 — 15.36 ට)
ගිතෙල් සේරු 4 යි. (ග්‍රෑ: 3840)

කල්කය :— වැල්මී සේරු 1 යි. (ග්‍රෑ: 960)

සංස්කරණය :— සියලු ද්‍රව්‍ය විධි සේ ගෙන ඝෘත පරිභාෂාව අනුව ඝෘතය සාද ගන්නේ ය.

ප්‍රයෝග :— හෘදය රෝග, ශූල, උරඃක්ෂත, රක්තපිත්ත, කාස සහ වාත රක්ත නසයි.

මාත්‍රාව :— තෝලා 1/2 — 1 (ග්‍රෑ: 6—12) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

20. යෝග නාමය :— **බ්‍රාහ්මී ඝෘතය (සාරස්වත ඝෘතය).**

කල්කය :—
1.—වියලි කහ,
සමන්පිච්ච මල්,
කොට්ඨං,
තිරස්සවාලු,
අරළු — පලම් 1 (ග්‍රෑ: 60) බැගිනි.

2.—තිප්පිලි,
වළගසාල්,
සහිඳලුණු,
සීනි,
වදකහ කර්ෂ 1 (ග්‍රෑ: 15) බැගිනි.

බ්‍රාහ්මී (ලුණුවිල) පංචාංගය සෝද පවිත්‍ර කොට, කොටා මිරිකා යුෂ සේරු 16 යි. (ලී: 15.36)
ගිතෙල් සේරු 4 යි. (ග්‍රෑ: 3840)

සංස්කරණය :— ඝෘත පරිභාෂාව අනුව සකස් කර ගත යුතු යි.

ප්‍රයෝග :— උන්මාද රාජයක්ෂ්මා, අපස්මාර, කුෂ්ඨ, අර්ශස්, ස්වරභේද හා විශේෂයෙන් මානසික රෝග සඳහා යෙදේ.

අනුපාන :— කිරි හෝ සුදුසු අනුපානයක් යොදන්නේ ය.

මාත්‍රාව :— තේ හැඳි 1/2 — 1 දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යොදන්න.

21. යෝග නාමය :— **මහා චෛතස ඝෘතය.**

යෝගය :—
හණ ඇට,
තිරස්සවාලු,
එරඬු මුල්,
දසමුල,
භාතාවාරිය,
අරත්ත,
තිප්පිලි,
මුරුංගා මුල් — පලං 2 (ග්‍රෑ: 120) බැගිනි.
ජලය සේරු 64–16 ට (ලී: 61.44–15.36) සිඳුවා කෂාය කර ගත යුතු යි.

කල්කය :—
කිරිබදු,
වැල්මී,
මෙවන් = මේද,
මහමෙවන්,
කවෙලු,
කිරිකවෙලු,
ගොන්කැකිරි,
තිපල්,
රුහැණිය (වාල්මොලහු)
දේවදර,
ඒල වාලුක,
ශාලපර්ණි,
තුවරලා,
කහ,
දරුහරිද්‍රා,
කළු ඉරමුසු,
පුවඟු,
නිලුපුල්,
එන්සාල්,
වැල්මදට,
දත්ත,
දෙළුම් ලෙලි,
සීනි,
පිණ්ඩඛර්ජුර (රටඉඳි)
මුද්දිරප්පලම්,
භාතාවාරිය,
මුඤ්ජාත,
ගොකටු,
නාමල්රේණු,
තලිස්පතුරු,
එළබටු,
අළුත් දැසමන්මල්,
වළගසාල්,
පෘශ්ණි පර්ණි,
සුවඳ කොට්ටම්,
රත්හඳුන්,
පද්මකාෂ්ඨ — මිලිතව සේරු 1 යි. (ග්‍රෑ: 960)
ගිතෙල් සේරු 4 යි. (ග්‍රෑ: 3840)
එම ද්‍රව්‍යයන්ගේ කල්කය ද යොද, ඝෘත පරිභාෂාව අනුව, සාද ගත යුතු යි.

ප්‍රයෝග :— ප්‍රතිශ්‍යාය, තෘතියක ජ්වර. චාතුර්ත්ථක ජ්වර, ශ්වාස, කාස යන මේවා නැසේ. පාපය, අලක්ෂ්මිය හා සියලු ග්‍රහ දෝෂ නසයි. ශුක්‍ර—ආර්තව ශෝධනය කෙරේ.

22. යෝග නාමය :— **මහාතික්තක ඝෘතය.**

යෝගය :—
රුක්අත්තන පොතු,
අතිවිෂා,
ශ්‍යාමා, (ඇහැළ කරල්),
කටුකරෝසන,
දියමිත්ත,
කලාඳුරු,
සැවැන්දරා,
ත්‍රිඵලා,
පත්පාඩගම,
පටොල, (දුම්මැල්ල),
කොහොඹපොතු,
වැල්මදට,
තිප්පිලි,
රත්හඳුන්,
දුරාලභා (කහඹිලියා,)
ගොන්කැකිරි,
කහ,
වෙනිවැල්ගැට,
රසකිඳ,
සුදු ඉරමුසු,
කලු ඉරමුසු,
මූර්වා,
ආඩතෝඩා,
භාතාවාරිය,
ත්‍රායන්ති (ලුණුවිල, ප්‍රතිනිධි)
කෙළිඳ සාල්,

පද්මකාෂ්ඨ, වැල්මී,
බිංකොහොඹ,
ගජතිප්පිලි,
වදකහ, — කර්ෂ 1 — ග්‍රෑ 15 බැගිනි.
ගිතෙල් සිව් ගුණය යි.
තෙල්ලි යූෂ ගිතෙල් මෙන් දෙගුණය යි.
ජලය ගිතෙල් මෙන් අට ගුණය යි.

සංස්කරණය :— ඝෘත පරිභාෂා අනුව සකසා ගත යුතු ය.

ප්‍රයෝග :— සියලු වාත රක්ත, පාමා, කුෂ්ඨ, කණ්ඩු, රත්පිත, රක්තාර්ශස්, පාණ්ඩු, අසාධ්‍ය පාණ්ඩු, ගුල්ම, විසර්ප, ප්‍රදර ගණ්ඩමාලා, ක්ෂුද්‍ර රෝග, ජ්වර, අම්ලපිත්ත, උන්මාද, කාමලා යන රෝග නසයි.

අනුපාන :— යෝග්‍ය පරිදි සුදුසු අනුපානයක් යොදන්නේ ය.

මාත්‍රාව :— කලං 1/2 — 1 (ග්‍රෑ: 2.5–5) දක්වා යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

යෝග නාමය :— **වාසා ඝෘතය.**

අවශ්‍ය ඖෂධ :—
වං ඇපල කොළ
වං ඇපල පොතු
වං ඇපල මුල්
වං ඇපල දළු
වං ඇපල මල්

සෑදීම :— මෙවා මැඩගත් යුස හෝ කකාල කෂාය හෝ සිවු නැළියක් තඹ බඳුනක බහා එළඟිතෙල් නැළි 1 යි. එක්කොට කකාරා එම මුල් කොළ ආදි පස්වගෙන් කලං 40 ක් අඹරා එහිලා දිවුල්, ඇසවු, කැල, වං ඇපල, ගොම වැරටි, යන මින් එක්තරා දර වර්ගයකින් ගිනි දී මඳ ගින්නේ කාකාරා කරඳ ලීයෙන් කළ හැන්දකින් හැඳිගාමින් පදමට සිඳුවා තබා වමන විරේක කරවා ඉක්බිති සුබ නැකතින් මෙම ඝෘතය මී පැණි එක්ව වලඳනු.

මාත්‍රාව :— වරකට මේස හැඳි 2 යි.

ගුණ :— සියලු රත්පිත් සුව වේ. කැසි, උණ, ක්ෂය, කාමලා පාණ්ඩු ගුල්ම, උදර, මන්දග්නි, ස්වරභෙද, ඇඳිරි සුවපත් වෙයි.

24. යෝග නාමය :— **වෘහත් අශ්වගන්ධාදි ඝෘතය.**

යෝගය :—

ගිතෙල්	සේරු	4 යි. (ග්‍රෑ: 3840)
එලකිරි	සේරු	16 යි. (ලී: 15.36)
අමුක්කරා	පල	100 යි. (ග්‍රෑ: 6000)
ජලය	සේරු	64–16 ට (ලී 61.44–15.36) සිඳුවා ගත යුතු යි.
එළුමස්	පලම්	100 යි. (ග්‍රෑ: 6000)
ජලය	සේරු	128 — සේරු 32 ට සිඳුවා ගත යුතු ය.

කල්කය :—
කාකෝලි,
ක්ෂිරකාකෝලී,
ඍද්ධි,
වෘද්ධි,
මේද,
මහාමේද,
ජීවක,
වඳුරුමෑ ඇට,
ඍෂභක,
හීන්එන්සාල්,
වැල්මී,
මුද්දිරප්පලම්,
මුද්ගපර්ණි,
මාෂපර්ණි,
ජීවන්ති,
තිප්පිලි,
බැබිල මුල්,
භාතාවාරිය අල,
කිරිබදු අල — මිලිතව සේරු 1 (ග්‍රෑ: 960) යි.
සීනි සහ මීපැණි තෝලා 20 (ග්‍රෑ: 240) බැගිනි.

සංස්කරණය :— ප්‍රථම සඳහන් කෂාය විධි ලෙස සිඳුවා කල්ක යොද ඝෘතය සකස් කොට ශීතල වූ පසු සීනි මී පැණි යොද ගත යුතු යි.

ප්‍රයෝග :— ක්ෂිණෙන්ද්‍රිය–ක්ෂිණවීර්‍ය්‍ය වෘද්ධ, බාල අයට, ස්ත්‍රීන්ට, හීනමාංස ඇති අයට ගුණ යි. ඕජස, ස්වාස්ථ්‍යය, බලය නිර්මලතාව ඇති කරයි. වලී පලිත නසයි. ධාලිත්‍ය, තිමිර, වාතව්‍යාධි, කළු පිත්ත රෝග, මහා රෝග, පංචවිධ කාස, ක්ෂය, ශ්වාස, හික්කා, විෂමජ්වර නසයි.

අනුපාන :— එලකිරි,

මාත්‍රාව :— ශාණ 1 යි (ග්‍රෑ: 4).

25. යෝග නාමය :— **වෘහත් ඡාගලාදි ඝෘතය.**

යෝගය :—

එළුමස්,	තුලා	1 යි. (ග්‍රෑ: 6000)
ජලය	සේරු	64–16 ට සිඳුවා ගත යුතු යි. (ලී: 61.44–15.36)
දසමූල මිලිතව	පලං	100 යි. (ග්‍රෑ: 6000) ජලය සේරු 64–16 ට සිඳුවා

අමුක්කරා	පලං	100 යි.	(ග්‍රෑ: 6000)	ජලය	සේරු 64–16 ට සිඳුවා,
බැබිල පංචාංගය	පලං	100 යි.	(ග්‍රෑ: 6000)	ජලය	සේරු 64–16 ට සිඳුවා,
ගිතෙල්	සේරු	16 යි.	(ග්‍රෑ: 15360)		
එලකිරි	සේරු	16 යි.	(ලී: 15.36)		
හාතාවාරිය යුෂ	සේරු	16 යි.	(ලී: 15.36)		

කල්කය :—

ජීවන්ති,
වැල්මී,
මුද්දිරපප්ලම,
කාකෝලී,
ක්ෂිරකාකෝලී,
නිල්මහනෙල් අල,
කළාඳුරු අල,
රත්හඳුන්,
අරත්ත අල,
මාෂපර්ණි,
මුද්ගපර්ණි,
සුදු ඉරමුසු,
කළු ඉරමුසු,

මේද,
මහාමේද,
කොට්ටං,
ජීවක,
ඍෂභක,
ශයී,
වෙනිවැල්ගැට,
ප්‍රියංගු,
තිපල්,
තුවරලා,
තාලිසපත්‍ර,
පද්මකාෂ්ඨ,
හීන් එන්සාල් — තෝලා 4 (ග්‍රෑ: 48) බැගිනි.

තේජපත්‍ර,
හාතාවාරිය,
නාගකේශර,
සමන්පිච්ච මල්,
කොත්තමල්ලි,
වැල්මදට,
දෙළුම් ලෙලි,
දේවදර,
හරේණුක (වාල්මොලගු)
ඒලවාලුක,
වළහසාල්,
සුදුදුරු,

සංස්කරණය :— යෝගයෙහි සඳහන් කෂාය වර්ග, ඝෘත, කිරි, හාතාවාරිය, ස්වරස හා කල්ක තඹ බඳුනෙක්හි බහා, මඳ ගින්නෙන් ඝෘත පාකය දිය යුතු යි. ලිපෙන් බා නිවුනු පසු සීනි ප්‍රස්ථ 1 (ග්‍රෑ: 960) මිශ්‍රකොට තබා, ගත යුතු යි.

පළමුවෙන් දසමුල් ආදි කෂාය තුන තඹ භාජනයකට දමා, අවසානයට එළුමස් කෂාය හාතාවාරිය යුෂ සහ කිරි ද, කල්කය ද යොද ඝෘතය සකස් කර ගත යුතු යි.

ප්‍රයෝග :— සියළු වාත විකාර, අපස්මාර, උන්මාද, පක්ෂඝාත, ආධ්මාන, කොෂ්ඨබද්ධ, කර්ණ රෝග, ශිරෝ රෝග, බාධිර්‍ය්‍ය, අපතන්ත්‍රක, භූතෝන්මාද, ගෘධ්‍රසි, උද්ගාර, අක්ෂිපාත, පාර්ශ්ව ශූල, හෘදය ශූල, බාහ්‍යායාම අර්දිත, වාතකණ්ටක, හෘදය රෝග, මූත්‍රකෘච්ඡ්‍ර, පඞ්ගුතා, ක්‍රොෂ්ටුක,ශීර්ෂ, ඛඤ්ජ කුබ්ජ, මින්මින, අපතානක, අන්තරායාම, රක්තපිත්ත, ඌර්ද්ධවජත්‍රුගත රෝග, ආනාහ, අර්ශොවිකාර, චාතුර්ත්ථක ජ්වර, හනුග්‍රහ, ශොෂ, ක්ෂීණ, අවබාහුක, දණ්ඩාපතානක, භග්න, දහ, ආක්ෂෙප, ජීර්ණ ජ්වර, විෂ, කුෂ්ඨ, ශොථ, ස්ථම්භ, මදත්‍යය, ආඪ්‍යවාත, අග්නිමාන්ද්‍ය, වාත රක්ත, ඒකාංග රෝග, සර්වාංග රෝග, හස්තකම්ප, ශිරඃකම්ප, ජිහ්වාස්තම්භය, ජඩබව, භ්‍රමය, ක්ෂිණේන්ද්‍රිය, නෂ්ටශුක්‍ර, ශුක්‍ර වැගිරීම, ස්ත්‍රීන්ගේ වාත රක්තය නිසා රක්ත පිටවීම, පටල, අක්ෂිස්පන්දන යන මේ රෝග සුව කෙරේ.

26. **යෝග නාමය :—** **සිද්ධාර්ත්ථක ඝෘතය.**

යෝගය :—

අබ,
වදකහ,
පෙරුම්කායම්,
ප්‍රියංගු,
කහ,
වෙනිවැල්,
වැල්මදට,
ශ්වේතකටභී, (එල ඔලිඳ)

වදකහ,
තිපල්,
ශුක්ලගිරිකර්ණික, (ගිරිතිල්ල)
කොහොඹ කොළ,
කරඳ ඇට,
(ශිරීෂ) මහරි ඇට,
දේවදර,
ත්‍රිකටු — මිලිතව කල්කය සේරු 1 යි. (ග්‍රෑ:960)

ගීතෙල්	සේරු	4 යි.	(ග්‍රෑ: 3840)	
ගොමුත්‍ර	සේරු	16 යි.	(ලී: 15.36)	ඝෘත පරිභාෂාවෙනි.

ප්‍රයෝග :— අලක්ෂ්මී, විෂ, උන්මාද, ජ්වර, අපස්මාර, යන මේවා නස යි. පාන, නස්‍ය, අභ්‍යංග යන අයුරින් මේ ඝෘතය ප්‍රයෝග කරන්නේ ය.

අනුපාන :— නිවුණු උණු දිය, එලකිරි, හෝ අවස්ථාවට සුදුසු අනුපානයක් යොදන්නේ ය.

මාත්‍රාව :— කලං 1 - 2 (ග්‍රෑ: 5–10) දක්වා, යෝග්‍ය පරිදි සුදුසු අවස්ථාවට යෙදිය යුතු යි.

27. **යෝග නාමය :—** **ශාතාවරී ඝෘතය.**

යෝගය :—

හාතාවාරිය අල කල්කය	සේරු	1 යි.	(ග්‍රෑ: 960)	
ගිතෙල්	සේරු	4 යි.	(ග්‍රෑ: 3840)	
එලකිරි	සේරු	16 යි.	(ලී: 1.36)	— ඝෘතය සාද ගන්නේ ය.

ප්‍රයෝග :— අම්ලපිත්ත, වාත පිත්ත දෙකින් ඇතිවූ විවිධ රෝග, රක්ත පිත්ත, මූර්ච්ඡා, ශ්වාස, සන්තාප යන මේවා නැසේ.

මාත්‍රාව :— තෝලා 1/2 — 1 දක්වා. (ග්‍රෑ: 6-12).

ආලේප බණ්ඩය

ආලේප :— ලිප්ත, ලෙප, ලේපන යන නම් ආලේපය සඳහා සාමානාර්ථ වේ. දෝෂඝ්න, විෂහර වර්ණකර ය යි භේද තුනකි. මින් දෙස් නැසීම පිණිස උපයෝගී වන දෝෂඝ්න ලේපය අඟල් කාලක් ද, විෂ නැසීම පිණිස ආලේප කරන විෂහරාලේපය අඟල් තුනෙන් පංගුවක් ද මුඛ වර්ණය උපදනා පිණිස අලෙප දෙන මුඛ වර්ණකර ලේපය අඟල් භාගයක් ද ගනකමට ආලේප කිරීමට නියමිත ය.

ගාන ලද ආලේපය වියලි නම් ඉන් සම පිට සිවිය දූෂණය වේ. (එ නිසා ආලේපයක් ගෑ කල එය වියලෙන්ට ඉඩ නොතබා වරින් වර එම ආලේපයට යොද ගත් ද්‍රවයෙන්ම තෙමීම මැනවි. (සාරංගධරය)

1. යෝග නාමය :— **අනෝද කොළ ආලේපය.**

යෝගය :—
බෙත් අනෝද කොළ,
කැකුළු හාල්,
අමුකහ සමභාගව ගන්නේ ය.

සංස්කරණය :— පොල් කිරෙන් තම්බා අඹරා ගන්නේ ය.

ප්‍රයෝග :— ව්‍රණ ශොධනය කරයි.

2. යෝග නාමය :— **කජ්ජලි කෝදය මලහර.**

යෝගය :—

සික්ථ තෛලය	තෝලා	48 යි.	(ග්‍රෑ: 576 යි.)
කජ්ජලි	තෝලා	2 යි.	(ග්‍රෑ: 24 යි.)
මෘද්දරශෘංග	තෝලා	2 යි.	(ග්‍රෑ: 24 යි.)
කම්පිල්ලක	තෝලා	8 යි.	(ග්‍රෑ: 96 යි.)
තුත්ථක (පල්මාණික්කම්)	මාෂක	3 යි.	(ග්‍රෑ: 3 යි.)

සංස්කරණය :— සියල්ල බල්වයෙහි ලා සියුම්ව අඹරා ගන්නේ ය. මෙය කට ලොකු කුප්පියකබහා ලිය යුතු ය.

ප්‍රයෝග :— ව්‍රණ ශොධක යි; රොපණ යි: නාඩිව්‍රණ නාශක යි. සුව නොවන ව්‍රණ මේ කජ්ජලිකොදය ගෑල් වීමෙන් ඉක්මණින් සුව වේ.

තිත්ත පටෝල ආදි ලේපය (ඉන්ද්‍ර ලුප්ත)

තිත්ත පටෝල, දූම්මැල්ල කොළ ඉස්ම, තෙදිනක් හිස ගානු. ඉන්ද්‍ර ලුප්ත සුව වේ. (උඳුගොව්වන් කැම)

3. යෝග නාමය :— **තිලාදි ලේපය. (1)**

යෝගය :—
තල,
ශතපුෂ්ප,
එරඬු ඇට මද,
සුදු හඳුන් — සමභාගව ගන්නේ ය.
රත්හඳුන්,
වැල්මී,
වී පොරි,

සංස්කරණය :— සියල්ල චූර්ණකර තබා ගත යුතු ය. ප්‍රයෝගයෙහි දී එලකිරෙන් තම්බා එලගිතෙලින් අඹරා ගත යුතු යි.

ප්‍රයෝග :— ව්‍රණ ශොථ, සන්ධිශොථ, ප්‍රදහ ගුණ කරයි.

යෝග නාමය :— **තිලාදි ලේපය (2)**

යෝගය :—
තල
ශතපුෂ්ප, } බැද
වී පොරි — සමභාගව ගන්නේ ය.

සංස්කරණය :— එල කිරෙන් තම්බා අඹරා ගත යුතු ය.

ප්‍රයෝග :— ව්‍රණ ශොධන යි.; ව්‍රණ රොපණ යි. වාතරක්තශොථයෙහි යෙදේ.

4. යෝග නාමය :— **දශාංග ලේපය.** (ශාරංගධර — ලේප බණ්ඩය)

යෝගය :— මාරා පොතු, වැල්මී, තුවරලා, රත් හඳුන්, එන්සාල්, ජටාමාංශ, වියලි කහ, වෙනිවැල්ගැට, සුවඳ කොට්ටන්, ඉරිවේරිය හෝ සැවැන්දරා මුල්

සංස්කරණය :— මේවා සම සමව ගෙන චූර්ණ කොට වතුරින් අඹරා බෙහෙත් බරින් 1/5 ක් ගිතෙල් යොද අඹරා ආලේප කරනු.

ප්‍රයෝග :— විසර්ප, විෂ, විස්ඵොට, ශොථ, දූෂිත ව්‍රණ සුව වේ.

5. යෝග නාමය :— **දරුහෙමති ලේපය.**

යෝගය :—
දේවදර,
වදකහ,
කොට්ටං,
ශතපුෂ්ප,
පෙරුංකායම්,
සහිඳලුණු,
මේවා චූර්ණකොට කාඩියෙන් අඹරා ලේපය සාදගන්නේ ය.

ප්‍රයෝග :— උදරාධ්මානයෙහි ප්‍රයෝග කෙරේ.

6. යෝග නාමය :— **දෙෂඝන ලේපය.**

යෝගය :—
සාරණ මුල්,   ඉඟුරු,
දේවදර,   අබ,
මුරුංගා පොතු,

සංස්කරණය :— චූර්ණකොට ආරණාලයෙන් (කාඩියෙන්) අඹරා ගන්නා ලද්දේ

ප්‍රයෝග :— සියළු ශොථ නසයි. ආමවාතජ සන්ධිශොථයෙහි විශිෂ්ට ය.

7. යෝග නාමය :— **ධුස්තුරාදි ලේපය, (ශ්ලීපදයෙහි) (1)**

යෝගය :—
අත්තන,   සාරණ මුල්,
එරඬු මුල්,   මුරුංගා පොතු,
නික පොතු,   අබ,

සංස්කරණය :— මෙවා චූර්ණ කොට එල මුත්‍රයෙන් අඹරා ලේපය සාදන්නේ ය.

ප්‍රයෝග :— බරවා රෝගයෙහි යෙදේ.

යෝග නාමය :— **ධුස්තුරාදි ලේපය. (2)**

යෝගය :—
දූලි පොතු,   පෙරුම්කායම්,
තිත්ත අබිං,   වියන් දුඹුලු   සමභාගව ගන්නේ ය.

සංස්කරණය :— අත්තන කොළ යුෂින් අඹරා එම යුෂින් ම කකාරා ගන්නේ ය.

ප්‍රයෝග :— ආම වාතජ සන්ධි ශොථයෙහි යෙදේ.

8. යෝග නාමය :— **පුනර්ණවාදරු ශුණ්ඩිලේපය.**

සාරණ මුල්, දේවදර, ඉඟුරු, මුරුංගා මුල්, අබ, කාංජිකයෙන් අඹරා ලේහය ආමවාත, සන්ධිශෝථ ආදි ආම සහිත ශෝථයන්හි යෙදේ.

9. යෝග නාමය :— **එල වර්ති (I).**

යෝගය :—
කුකුරුමාන් ගෙඩි,
කොට්ටං,   තිප්පිලි,
එල අබ — මෙවා සම භාගව ගත යුතු ය.   වදකහ,
සියල්ල බරට ගුඩ.

සංස්කරණය :— ගුඩ සමග ජලය ස්වල්පයක් යොද ගින්නෙන් පැසවා, ඊට චූර්ණය හා එලකිරි යොද වර්තිය සාද ගන්නේ ය.
උදවර්තයෙහි ගුදද්වාරයෙහි යෙදේ.

යෝග නාමය :— **එල වර්ති (II).**

යෝගය :—
තිරස්සවාලු 2,
තිප්පිලි 4,
අරළු 5,
ගුඩ 11,
මලරොධයෙහි වර්තිය යෙදේ.

10. යෝග නාමය :— **මකුළු ඇට ආදි ලේපය.**

යෝගය :—
මකුළු ඇට,
කොහොඹ කොළ,   ඇත්තෝර කොළ,
සන්හිනායම්,   පුපුල කොළ,
ඇහැළ දළු — සමභාගව ගන්නේ ය.

සංස්කරණය :— සියල්ල ඇල්දියෙන් අඹරා ගන්නේ ය.

ප්‍රයෝග :— කැසුම් සහිත වරණ ගුණ කරයි.

11. යෝග නාමය :— **මුරුංගාදි ලේපය.**

යෝගය :—
හරන්කහ,
ලුණුවරණ පොතු,

සංස්කරණය :— මුරුංගා පොතු යුෂින් අඹරා ගත යුතු යි. — සමභාගව ගන්නේ ය.

ප්‍රයෝග :— උග්‍ර ආමවාත ශොථයෙහි යෙදේ.

12. යෝග නාමය: — **රක්ත චන්දනාදී ලේපය.**
යෝගය :— රත්හඳුන්, වැල් මදට, ලෝධ්‍ර පොතු, කොට්ටම්, පුවඟු, නුගකරටි, පරිප්පු.
සංස්කරණය :— මෙවා සමසේ රැගෙන ඇල් වතුරෙන් අඹරා ගත යුතුයි.
ප්‍රයෝග :— සියලු ව්‍යඞ්ග නැසේ. මුහුනෙහි කාන්තිය වඩයි.

13. යෝග නාමය :— **රණවරාදී ලේපය.**
යෝගය :—
රණවරා දළු, එම මල්,
හින්දෙමට දළු, එම මල්,
රතඹලා දළු, එම මල්,
නාපිරිත්ත දළු, එම මල්,
අනෝද කොළ,
කැකුළු හාල්,
අමු කහ — සමභාගව ගන්නේ ය.
සංස්කරණය :— සියල්ල පොල් කිරෙන් තම්බා අඹරා ගත යුතු යි.
ප්‍රයෝග :— විසර්ප, ව්‍රණ, හා ව්‍රණශොථ ගුණ කරයි.

14. යෝග නාමය :— **රසපුෂ්පාද්‍ය මලහර.**
යෝගය :—
රසපුෂ්ප ගුඤ්ජා 4 යි. (ග්‍රෑ: 5)
සික්ථ තෛල තෝලා 1 යි. (ග්‍රෑ: 12)
සංස්කරණය :— රසපුෂ්ප සික්ථ තෛලය සමග දෘඪ සේ බල්වයෙක්හි ලා අඹරා ගන්නේ ය.
ප්‍රයෝග :— ගුදව්‍රණ, ලිංගව්‍රණ, විචර්චිකා, නඛ-දන්තෝද්භවක්ෂත නාශක යි. **පිටතින් ආලේප කිරීම පමණ යි.**

15. යෝග නාමය :— **ලාක්ෂාදී ලේපය.**
යෝගය :— ලාක්ෂා (කැප්පෙටි ලාකඩ) කොට්ටම, අබ, හොරමැලියම්, හෝ හල් දුම්මල, වියලිකහ, ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, ඇත්තෝර ඇට, රාබු ඇට,
සංස්කරණය: — මේ ද්‍රව්‍ය සමභාග වැ සූක්ෂ්ම චූර්ණය ආලේප කරන අවස්ථාවෙහි දී මෝරුවෙන් අඹරා ආලේප කරන්නේ ය.
ප්‍රයෝග :— දද්‍රු රෝගයෙහි යෙදේ.

16. යෝග නාමය :— **ලෝධ්‍රාදී ලේපය.**
යෝගය :— ලෝධ්‍ර පොතු, කොත්තමල්ලි, වදකහ,
සංස්කරණය :— මෙවා සමසේ ගෙන ඇල් දියෙන් අඹරා මුහුණේ ගෑමෙන්
ප්‍රයෝග :— කුරුලෑ නැසේ.

17. යෝග නාමය :— **රසෝත්තමාදී ලේපය.**
යෝගය :—
මී ඉටි රාත්තල් 1 1/2 යි. (ග්‍රෑ: 720)
පොල්තෙල් රාත්තල් 6 යි. (ලී: 2.88)
සංස්කරණය :— මේ දෙවර්ගය එකට කකාරා පෙරා ශීතල වෙන්ට හැර පහත සඳහන් වර්ග එකතු කර හොඳාකාර කළුපාට වනතුරු ඇඹරියැ යුතු ය.
චූර්ණය :— රස, ගන්ධක, කජ්ජලිකර ගන්න.
ගිරිසින්දූර, සුදුදුරු, කළුදුරු, ගම්මිරිස්, වෙනිවැල්ගැට, කහ, මනෝසිල, යන මෙවා චූර්ණකර ඉහත සඳහන් මී ඉටි,-පොල්තෙලට මිශ්‍රකර යටත් පිරිසෙයින් දින 5 ක් වත් කළුපාට වනතුරු අඹරන්න.
ප්‍රයෝග :— කුෂ්ඨ වලට විශෙෂ යි.

18. යෝග නාමය :— **වියන්දුඹුලු ආදි ආලේපය.**
යෝගය :—
වියන්දුඹුලු, කුඹුරුඇට මද,
ගෙරි පස්, ඔලිද ඇට මද,
තිත්ත අබිං, ඇඹුල් දෙඩම් ඇට මද,
මෙවා සම භාගව ගන්නේ ය.
සංස්කරණය :— ඇඹුල් දෙඩම් ඇඹුලෙන් අඹරා ගත යුතු ය.
ප්‍රයෝග :— ගෙඩි ඉහිරි කුඩා වෙයි.

19. යෝග නාමය :— **(I) ශ්විත්‍රලේපය (තාලකාදි ලේපය).**

යෝගය :—
හිරියල් ගාණ 1 යි. (ග්‍රෑ: 4 යි.)
බාකුචි ගාණ 4 යි. (ග්‍රෑ: 16 යි.)

සංස්කරණය :— චූර්ණකොට ගෝ මූත්‍රයෙන් අඹරා ලෙපය සාදන්නේ ය.

ප්‍රයෝග :— ශ්විත්‍ර.

20. යෝග නාමය:— **ශ්විත්‍ර හර ලේප.**

යෝගය :— ස්වර්ණ පුෂ්පි, (රත්කිරිගොකටු), කසිස්, වලහසාල්, මනෝසිල, ගෝරෝචන, සිඳු ලුණු, සමභාගව වතුරෙන් අඹරා සෑදූ ආලේපය ගැමෙන් ශ්විත්‍ර (කබර) සුව වේ.

21. යෝග නාමය:— **(II) ශ්විත්‍ර ලේපය.**

යෝගය :—
බාකුචි,
වේබොඩ,
ලාක්ෂා,
කොටදිඹුලා ගෙඩි,
තිප්පිලි,
රසාංජන,
ලෞහ චූර්ණය,
කළුතල — සම භාගව ගත යුතු ය.

සංස්කරණය :— ගව පිතෙන් හෝ අභාවයෙහි ගෝමූත්‍රයෙන් අඹරා ලේපය සාදන්නේ ය.

ප්‍රයෝග :— බාහිරාලේප.

22. යෝග නාමය :— **සික්ථ තෛලය.**

යෝගය :—
තලතෙල් භාග 5 යි.
මී ඉටි භාග 1 යි.

සංස්කරණය :— ඊයම් ගාන ලද තඹ භාජනයෙහි තලතෙල් බහා උණුකොට පසුව මී ඉටි දමා දිය වූ පසු පෙරා ගන්නේ ය.

නේත්‍ර බිංදු

යෝග නාමය :— **නේත්‍ර බිංදු (1)**

යෝගය :—
තිපල්,
වෙනිවැල්,
කහගොබ,
රත්හඳුන්,
වැල්මී — කලං 5 මදටිය 3 බැගිනි.

සංස්කරණය :— වතුර බෝතල 6-1 ට සිඳ පෙරා මී පැණි බෝතල කාලක් දමා තබා පෙරා ගන්නේ ය.

ප්‍රයෝග :— (ඇස තුළට දැමීමට යි) රත, සුදු, බිබිලි, පොල, අර්ම නාශක යි.

මාත්‍රාව :— බින්දු 2 — 5 දක්වා.

යෝග නාමය :— **නේත්‍ර බිංදු (2).**

යෝගය :—
අරළු,
වැටකේ බඩ,
වෙනිවැල් ගැට — කලං 6 බැගිනි.

සංස්කරණය :— රත් හඳුන් කලං 18 යි.
වතුර බෝතල 6-1 ට සිඳ පෙරා මී පැණි බෝතල 1/4 ක් මුසුකර තබා ගත යුතු යි. ඇසට වැක් කිරීම සඳහා ය.

ප්‍රයෝග :— ඇහේ රත, අභිෂ්‍යන්ද, අධිමන්ථ, පැසවුම, ව්‍රණ ශුක්ල ආදිය නසයි.

මාත්‍රාව :— බින්දු 2 – 5 දක්වා.

යෝග නාමය :— **නේත්‍ර බිංදු (3).**

යෝගය :—
තිපල්,
සියඹලා කොළ,
දෙසඳුන්,
මුදු පෙන,
වෙනිවැල්ගැට,
වැල්මී,
කොරකහ කොළ,
නවසි කහකඩ — කලං 3 මදටිය 6 බැගිනි.

සංස්කරණය :— නැඹිලි වතුර බෝතල 5 යි, කළු උක් පැණි බෝතලය යි. බෝතලයට සිඳ පෙරා, මී පැණි බෝතල 1/4 ක් බහා තබා ගන්නේ ය.

ප්‍රයෝග :— ඇහැට වැක්කිරීම සඳහා ය. කාච, තිමිර, පටල නසයි.

මාත්‍රාව :— බින්දු 2 – 5 දක්වා.

යෝග නාමය :— **නේත්‍ර බිංදු (4).**

යෝගය :—
මානෙල් මල්,
සමන්පිච්ච මල්,
දෙළුම් මල්,
සපුමල්,
නාමල් — කලං 4 (ගු: 20) බැගිනි.
තිප්පිලි,
ඉඟිනි ඇට,
රත්හඳුන්,
සුදුහඳුන්,

සංස්කරණය :— තැඹිලි වතුර බෝතල හතර, බෝතලයට සිඳ පෙරා මී පැණි බෝතල 1/4 ක් මිශ්‍ර කොට තබා ගන්නේ ය.
ප්‍රයෝග :— පැසවුම්, තුවාල, උල්වාරම, අයිමන්ථ ආදිය නසයි.
මාත්‍රාව :— බිංදු 1 – 2 දක්වා. (ඇසට වත් කිරීම සඳහා ය.)

යෝග නාමය :— **නේත්‍ර බිංදු (5).**

යෝගය :—
රත්හඳුන්,
සියඹලා කොළ — කලං 18 බැගිනි. (ගු: 90 යි.)

සංස්කරණය :— තැඹිලි වතුර බෝතල 6 – 1 ට සිඳ පෙරා සීනක්කාරන් අළු කලන් 3 යි. සූකිරි හෝ පිටි සීනි කලං 24 යි. (ගු: 120) එකට දිය කර පෙරා තබා ගන්නේ ය. ඇසට වැක් කිරීමට යි.
ප්‍රයෝග :— අභිෂ්‍යන්ද, උෂ්ණයෙන් එන වෙනත් ඇස් ලෙඩ ගුණ කරයි.

ඖෂධ සංග්‍රහ ග්‍රන්ථ ගත ද්‍රව්‍ය ලේඛනය.

උද්භිද ද්‍රව්‍ය

අක්ෂොට,
අක්කපාන,
අක්කරපට්ටා,
අක්මැල්ල,
අංකෙන්ද,
අංගුර,
අගිල්,
අට්ටික්කා,
අත්තන,
අතසි,
අතිබලා,
අතිවිඩයම්,
අන්දර,
අන්නාසි,
අනෝද,
අපාමාර්ග,
අබ,
අබතෙල්,
අබපලා,
අබින්,
අඹ,
අඹඇට මද,
අම්ලවෙතස,
අමු,
අමු ඉඟුරු,
අමුක්කරා,
අමුකහ,
අමුකපුරු,
අමු තෙල්ලි.
අරත්ත,
ඉඟිනි ඇට,
ඉඟුරු,
ඉඟුරු පියලි.
අරලිය,
අරළු,
අරළුප්පිටි,
අලුකෙසෙල්,
අලුපුහුල්,
අවරිය,
අශෝක,
අස්වැන්න,
අසන,
අසමෝදගම්,
අහු,
ආඩතෝඩා,
ඇට්ටෙරිය,
ඇටඹ,
ඇටි කෙහෙල්, (මැලියම්)
ඇත්අඟුණ,
ඇත් තුත්තිරි,
ඇත්තෝර,
ඇත්සොඬ,
ඇද්දෙමට,
ඇඹරැල්ලා,
ඇඹුල්ඇඹිලිය,
ඇඹුල් දෙඩම්,
ඇඹුල් මසන්,
ඇල් වී,
ඇසතු,
ඇසළ,
ඇහැළ කරල් පැණි,

ඉකිරිය,
කට්ටකුමන්ජල්,
කටරොළු,
කටු ඉඹුල්. (මැලියම්)

ඉංගුදි,
ඉද්ද,
ඉදි,
ඉන්සල්,
ඉඹුල්, (මැලියම්)
ඉරමුසු,
ඉරිමෙද,
ඉරිවේරිය,
ඉලුක්,
ඊතණ,

උක්,
උක්සීනි,
උක්හකුරු,
උගුරැස්ස,
උත්පල,
උදත්තා,
උඳු,
උඳුපියලිය,
උදම්බර,
උණ,
උණකපුරු,
උණගොබ,
උළුහාල්,

එන්සාල්,
එරබදු,
එරඬු,
එරඬුතෙල්,
එල්වලු,
එල අබ,
එල ඉඹුල් මැලියම්,
එළඹළිද,
එළකටරොළු,
එළ ගම්මිරිස්,
එළ පිටවක්කා,
එළබටු,
එළවරා,
ඒකාවේරිය,
ඔළිඳ,
ඔසබිය,
ඕලු (මල්),

සෘෂභක,

කංසා,
ක්ෂවත,
ක්ෂීරකාකෝලී,
කක්කෝල,
කංකෝල,
කකුළුසුඟ,
කච්චුක්කායි,
කට්ඵල,
කැහිපිත්තන්,
කෑල,
කිඩාරම් අල,
කිතුල්,
කිතුල් පැණි,

කටුකරඬු දෙවගය,
කටුකරෝසන,
කටුපෙඳ,
කටුවැල්බටු.
කත්තිරික්කා බටු,
කතුරුමුරුංගා,
කනේරු,
කප්පරවල්ලිය,
කපුකිනිස්ස,
කපු (ඇට),
කපුරු,
කබරස (මුල්),
කම්පිල්ල.
කයිප්පු,
කර්කටකශෘංගී,
කරඳ,
කර්දමුංගු,
කරපිංචා,
කරඹ,
කරල්සැබෝ,
කරාබු,
කරිවිල,
කරුංකා පුවක්,
කරොල් අරිසි,
කලාදුරු අල,
කලු අගිල්,
කලු අත්තන,
කලු ඉරමුසු,
කලුකැම්මෙරිය,
කලුකොල්ලු,
කලු තිරැස්සවාලු,
කළුදුරු,
කළුවදුරු මෑ,
කලුවා අල,
කවුඩු උඩත්තා,
කවෙලු,
කසඹිලියා,
කහ්ලාර,
කහ කටුකරඬු,
කහ දෙමට (ගෙඩි),
කහ කීකිරිඳිය,
කහ,
කහපෙනෙල,
කහ බැබිල,
කාමරංගා,
කාලාදනා, (නිලකලම්),
කැකිරි,
කැකුණ ඉටි,
කැකුණ,
කැකුළු හාල්,
කැප්පෙටි ලාකඩ,
කැලෑමසන්,
කැලෑහණ,
ගංසූරිය,
ගජතිප්පිලි,
ගන්ධප්‍රසාරණී
ගම්මාලු,
ගම්මිරිස්,

කිතුල් හකුරු,
කිනිහිරි,
කිරිඅඟුන,
කිරිකවෙලු,
කිරිබදු,
කිහිරි,
කීකිරිදිය,
කීන, (අරටු,)
කුකුරුමුවන්,
කුඩාමසන්,
කුඩා මාදම්,
කුඩුමිරිස,
කුණුකරඳ,
කුන්දුරුක,
කුප්පමෙනිය,
කුඹුක්,
කුඹුරු,
කුමුදු,
කුරිඤ්ඤං,
කුරුඳු,
කුරුම්බා වතුර,
කුළුබඩු පස,
කුශතණ,
කුසුම්භ පුෂ්ප,
කූර තම්පලා,
කෘමිශත්‍රු,
කෙකටිය අල,
කේබුක,
කෙම්වැල්,
කෙළිඳ,
කෙසෙල්,
කෙසර බැබිල,
කෛවර්තමුස්තක,
කොකුම්පොතු,
කොට්ටම්,
කොට්ටම්බා,
කොටදිඹුලා,
කොත්තමල්ලි,
කොතලහිඹුටු,
කොබුගස්,
කොබෝවක්කා,
කොබෝලීල,
කොරාසානි,
කොල්ලත්,
කොල්ලු,
කොළොම්,
කොවක්කා,
කොහොඹ,
කෝමාරිකා,
ඛණ්ඩශර්කරා,
තිත්ත වැටකොලු,
තිත්ත වැල්,
තිප්පිලි,
තිප්පිලි මුල්,
තිරස්සවාලු,
තිඹිරි,
තිරිඟු,
තිලෝගුරු,

ගල්කුර,
ගලිස්,
ගස්කැප්පෙටියා,
ගස්කැලිය,
ගස්පෙනෙල,
ගැටතුඹ,
ගැටනෙටුල්,
ගිරිතිල්ල,
ගුඩුචි සත්ව,
ගුගුල්,
ගුරුල්ල,
ගුරුන්ද,
ගොකටු,
ගොටුකොළ,
ගොන්කැකිරි,
ගොඩකදුරු,
ගොඩමානිල්,
ගොඩපර,
ගොලෑ පුවක්,
ගොපසෝණ්ටා,
ගොපිචන්දන,
ගෘද්ධරනබ,

චාතුර්ජාත,
චාල්මුග්‍රා,
චිරතා,
චීන අල,
චෝච,
චොරක,
චොරපුෂ්පි,
ජටාමාංස,
ජයන්ති,
ජයපාල,
ජලවේතස,
ජීවක,
ජීවන්ති,

ත්‍රායමාණා,
තකුල්,
තගර,
තල්ගොබ,
තල, (හා එම තෙල)
තලා,
තලිස්පතුරු,
තැඹිලි,
තැල්,
තිකුළු,
තිත්ත අබිං,
තිත්ත කපුරු,
තිත්ත ලබු,
තුන්දුරුක,
තුන්පත් කුරුඳු,
තුඹ,
තුවරලා,
තුවරි,
තෙබු,
තෙල් ඇහැටු,
තෙල් එරබු මුල්.

තෙලකිරිය,
තේක්ක,
තේජපත්‍ර,
තොටිල,
තොලබෝ,
තෝරපරිප්පු,
තෝර
දඹ,
දම්,
දළුක්, (පලු)
දරුහරිද්‍රා, (සහ සෞවිරාඤ්ජන)
දූත්ත,
දූව,
දැසමන්,
දිඹුල්,
දියපරඬලා,
දියමිත්ත,
දියමිදෙල්ල,
දියලබු,
දිය හබරල,
දිව,
දිවුල්,
දුනුකේ,
දුටුසතුටු,
දුම්මල,
දුම්මැල්ල,
දුරාලභා,
දුරු,
දුහුදු,
දෙමට,
දෙළුම්,
දෙවිදුරු,
දෙහි,
දේවදර,
දෙඩම්,
දෙඩම්, (ඇඹුල්)
දෙඹ,
ධන්වයාස,
ධාන්‍ය,
නබී,
නවසි පොල්,
නවහන්දි,
නස්නාරං,
නාගබලා,
නාමල් රේණු,
නාපිරිත්ත,
නාරම්,
නිකුව,
නික,
නියඟලා,
නිදිකුම්බ,
නියද,
නිල් අවරිය,
නිල් කටරොළු,
නිල්කටුකරඬු,
නිල්මානෙල්,
නුග අරළු,
නුග,

නෙරිවිෂ,
නෙරෙංචි,
නෙල්ලි,
නෙළුම්,
පත්පාඩගම්,
පතඟි,
පද්මකාෂ්ඨ,
පඹුරු,
පරිප්පු,
පරුෂක,
පලු,
පළොල්,
පස් කුළු බඩු, (පංචකෝල),
පාරසීක යමානිකා,
පාවට්ට,
පාෂාණභෙද,
පැඟිරිමාන්,
පැපිලිය,
ප්‍රියංගු,
පික්මල්,
පිච්ච,
පිටවක්කා,
පිලිල,
පීතකරෝසන,
පුපුල,
පුලිල,
පුවක්,
පුවඟු,
පුෂ්ප ප්‍රියංගු,
පුස්වැන්න,
පුස්වැල්,
පුහුල්,
පූඩලු දෙහි,
පෘෂ්ණි පර්ණි,
පෙතිතෝර,
පෙනෙල,
පෙරුම්කායම්,
පොකුරු මුල්,
පොඩරු,
පොල්, (හා එම තෙල්)
පොල්පලා,
පොල් රා,
ප්‍රසාරණී,
පෘෂ්ණි පර්ණි,

බක්මී,
බට,
මස්වැන්න,
මසන්,
මහ අරත්ත,
මහ අසමෝද,
මහ එන්සාල්,
මහ කටුවැල්බටු,
මහදද,
මහදුරු,
මහ බැබිල,
මහ මසන්,
මහමෙවන්,

බටු,
බදුල්ල,
බබ්බුල,
බලුදම්,
බාකුචි,
බාදම් ඇට,
බාලක,
බැබිල,
බැම්තිරිය,
බිංකොහොඹ,
බීංතල්,
බිං දුම්මල,
බිම්කරල් හැබ,
බිංතඹුරු,
බුරුල්ල,
බුලත්,
බුලු,
බෙලි,
බෙහෙරු,
බෙත් අනෝද,
බේදනම් ඇට,
බේදුරු,
බොරළුදමුනු,
බෝ,
බෝලිද්ද,
හල්ලාතක,
හාර්ංගී,

මකුළු ඇට,
මකුළුවැන්න,
මඟුල්කරඳ,
මණ්ඩුකපර්ණී,
මත්ස්‍යණ්ඩිකා,
මදුරුතලා,
මද්‍යසාර,
මධුරිකා,
මදටිය,
මදුර,
මයිල මල්,
මයිසූර් පරිප්පු,
මල්කහ බැබිල,
මල්සුදු බැබිල,
මලබටු,
මල බුලත්,
මලිත මල්,
රතුකොබෝලීල,
රතු මුරුංගා,
රතුලූනු,
රතුවරා,
රතුසාරණ,
රදලිය,
රත්කිරිගොකටු,
රඹුක්,
රම්මනිස්ස,
රසකිඳ,
රසකිඳපිටි,
රසකිඳ පිටි සනසාර,
රසතැල්,

මහරාෂ්ට්‍රි (මල්),
මහබලා,
මාළුරම්ණියා,
මාදම්,
මාදුරු,
මානෙල් අල,
මාරා, (හුරි මාර-මහරි)
මාෂපර්ණී,
මාසක්කා,
මැඩහඟු,
මිදි,
මීදෙල්ල,
මීකන්පලා,
මී,
මීමුරුවට,
මී තෙල්,
මුංවැන්න,
මුකුණුවැන්න,
මුඩමහණ,
මුද්දිරප්පලම්,
මුද්ගපර්ණී,
මුරාමාංසි,
මුරුංගා,
මුවකීරිය,
මුරුවා,
මූනමල්,
මෙවන්,
මොණරකුඩුම්බිය,
මොර,

යක්බෙරිය,
යකිනාරං,
යකුවනසු,
යව,
යවාස,

රටඉදි,
රටතෝර,
රණවරා,
රත් ඇල්,
රත්කිහිරිය,
රත්තෙවුල්,
රත්මල්, (රතඹලා)
රත්මහනෙල්,
රත්හඳුන්,
වැල්තිබ්බටු,
වැල්මදට,
වැල්මී,
වැල්මුරුංගා,
වැල් රුක්අත්තන,
වැලුක්,
වැකොඳ,
විෂ්ණු ක්‍රාන්ති,
විශ්වදේවා,
විලඳ,
වෘක්ෂාම්ල,
වෘද්ධදරක,
වෘද්ධි,

රාස්නා, (අරත්ත)
ඍහැණිය,
රුක්අත්තන,
රුක්මල්,
රුදන්ති,
රෝස,
රෝහිතක,

ලක්ෂ්මණ,
ලජ්නාරං,
ලියනහලා,
ලූනල,
ලුණු අඹ ඇට,
ලුණුදෙහි ඇට,
ලුණුමිදෙල්ල,
ලුණුවරණ,
ලුණුවිල,
ලොත්,
ලෝලු.

වංඇපල, (ආඩතෝඩ)
වගපුල්,
එවනාවි,
වටඍහැණි,
වදකහ,
වඳුරු මෑ,
වනකපු,
වරා,
වල් අබ,
වල් අසමෝදගම්,
වල් ඉඟුරු,
වල් කීඩාරම්,
වල් ගම්මිරිස්,
වල් තිප්පිලි,
වල් දෙල්,
වළහසාල්,
වසාවාසි,
වාරාහිකන්ද,
වාල්මොළඟු,
වැටකෙයියා,
වැටකේ අරළු,
වැල්කහඹිලියා,
වැල්කැප්පෙටියා,
සුගන්ධබාකුචි,
සුගන්ධබාලා,
සුගන්ධවචා,
සුදර්ශන,
සුදු අබ,
සුදු කොබෝලීල,
සුදුදුරු,
සුදු බිංතල්,
සුදුමල් මදුරුතලා,
සුදුළූනු,
සුදු වඳුරු මෑ,
සුදු සාරණ,
සුදුහඳුන්,
සුරා,
සුරා බීජ,

වෙනිවැල්ගැට,
වෙල්ලන්ගිරිය,
වෙල්ලිපරිත්ති,
වේ,
වේලා,

ශංඛිණි,
ශ්වේතදූර්වා,
ශයී,
ශතපුෂ්ප,
ශර්කරා,
ගල්ලකි,
ශාර්ංගෂ්ඨා,
ශාලපර්ණි,
ශාලාමිශ්‍රී,
ශීතලවිනි,
ශෛලෙය,
සන්නිනායම්,
සප්තලා,
සපු,
සමදරා,
සමන්පිච්ච, (දෑසමන්)
සල්,
සල්මැලියම්,
සවරලොත්,
සවුකෙන්ද,
සස්සඳ,
සහදේවා,
සාතලා,
සාදික්කා,
සාරණ,
සැටදවි,
සැවැන්දරා,

සියඹලා,
සිරිතේක්කු,
සිරිල,
සිරිවටු,
සිරිවැඩි බැවිල,
සිවිය,
සිහින් මිදි,
සිහින් මොර,
සිහලීජටා,
හරන්කහ,
හරේණුක,
හල්,
හාතාවාරිය,
හාල්පාතු දිය,
හික්,
හිඟුරුපට වැල්,
හිඟුරුපියලි,
හිතණ, (ඊතණ)
හීන් අරත්ත,
හීන් එන්සාල්,
හීන් කටුවැල්බටු,
හීන් කුරුඳු පොතු.
හීන් ගොකටු,
හීන්දද.

සුවදකොට්ටං,
සුවදතලා,
සුවද තණ,
සූකිරි,
සෙංකොට්ටං,
සෙප්පාඩිය,
සේපාලිකා,
හංසපාදි,
හණ ඇට,
හපුෂා,
හබරල,

හින්දම්,
හින් දෙමට,
හින් නිදිකුම්බා,
හිනටි හාල්,
තිරස්සපලු,
හෙල්මැලි,
හෙළ කටුකරඬු,
හෙළනිටුල්,
හෙළ නෙළුම්,
හොඬල,
හොර,

පාර්ථිව ද්‍රව්‍ය.

අඤ්ජන කැට,
අභ්‍රක,
ඉෂ්ටිකා,
උද්භිද ලුණු,
ඌසිකාන්දම්,
කළු ඊයම්,
කළුලුණු,
කසිස් දෙවගය,
කාන්ත ලෞහ,
කිරිගරුඬ ගල්,
ඛර්පර,
ගඩොලු,
ගල්ලුණු,
ටංගණ,
තඹ,
තීක්ෂ්ණලෞහ,
තුත්තනාගම්,
දැවුණුමැටි,
දෝරවැලි,
නවසාරං,
නිල්කැට,
නෙල්ලික්කා, ගෙන්දගම්,
පංකපර්පටි,
පංචලවණ,
රිදී,
රිදීතුත්තම්,
රෞප්‍යමාක්ෂික,
රුවක ලුණු,
රෝම ලුණු,
ලේවා ලුණු,
ලෝකඩ,
ලෝහමල,
ලෞහ,
වංග,
වජ්‍ර,
වානේ,
විඩ ලවණ,
විද්‍රැම,
විමල,
වියන්දුඹුලු,
වියලි පුපුරණ ලද මඩ,
වෙඩි ලුණු,

පන්නා, (භස්ම)
ප්‍රවාල,
පබලු,
පල්මානික්කම්,
පාංශුලවණ,
පාෂාණම්,
පුෂ්පරාග,
පෝරන් ලුණු,
බළල් ලුණු,
මඩපුෂ්කර,
මණ්ඩුල,
මනෝසිල,
මරකත,
මාණික්‍ය,
මූදු පෙන,
මූදු ලුණු,
මුද්‍රාශංඛ,
යසද,
යපුණු,
යවකාර,
රත්තරන්,
රත්මැසිදැ,
රසදිය,
රසාඤ්ජන,
වෛදූර්‍ය,
වෛක්‍රාන්ත,
ශිලාජතු,
ස්වර්ණ ලවණ,
සවර්ජීක්ෂරු,
සවුක්කාරම්,
සින්දූර,
සිදුලුණු,
සිවංගුරැ,
සිනක්කාරං,
සිස,
සුදුපාෂාණම්,
සුරත්මැටි,
සුවසලුණු,

හිංගුල,
හිරියල්,
හුණු.

ජාන්තව ද්‍රව්‍ය.

ඇටමිදුළු,
ඇත්කිරි,
උරුලෑසට්ටම,
ඌරුතෙල්,
එලකිරි,
එලගව ගොම,
එළුකිරි,
එළුමස්,
කණවෙයි පැණි,
කවඩි,
කස්තුරි,
කිරි,
කුකුළු බිත්තර,
කොටළු මූත්‍ර,
ගිතෙල්,
ගොමූත්‍ර,
ගෝරෝචන,
තණකිරි,
දඬුවැල් බැ පැණි,
දිඹිබිජු,
දී කිරි,
දියපෙරලි දිය,
නවනීත,
පිත,
බඹර ඉටි,
බඹර පැණි,
බැටළු කිරි,
මාංශ, (මස්)
මීකිරි,
මීගව මූත්‍ර,
මීඉටි,
මී පැණි,
මුතු,
මුතු බෙලි කටු, (ශුක්ති)
මුව අං,
මුව හං,
මුහුදු පෙණ,
මොණරා,
මෝරු,
වෙඩරු,
වුරුනු තෙල්,
සක්, (හක්)

මෙම අරිෂ්ට-ආසව ලේඛනයේ සිට 335 පිටෙ අවසන දක්වා ඇති යෝග සහ ද්‍රව්‍ය 1963 ඔක්තෝබර් 8 දින අංක 13,796 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරණ ලද ලේඛනය බව සැලකිය යුතු ය.

අරිෂ්ට - ආසව.

1. අංගුරාරිෂ්ටය
2. අභයාරිෂ්ටය.
3. අමෘතාරිෂ්ටය
4. අර්ජුනාරිෂ්ටය
5. අරවින්දසවය
6. අහිඵේනාසවය
7. අශ්වගන්ධාරිෂ්ටය
8. අශෝකාරිෂ්ටය.
9. උශීරාසවය
10. කනකාසවය
11. කර්පූරාරිෂ්ටය
12. කර්පූරාසවය
13. කිරාතාරිෂ්ටය
14. කුටජාරිෂ්ටය
15. කුමාරි ආසවය
16. ඛදිරාරිෂ්ටය
17. ඛර්ජූරාරිෂ්ටය
18. චන්දනාසවය
19. චවිකාසවය
20. ජම්බාසවය
21. ජිරකාද්‍යරිෂ්ටය
22. ත්‍රිඵලාසවය
23. දන්ත්‍යරිෂ්ටය
24. දශමූලාරිෂ්ටය
25. දශමූලාරිෂ්ටය (කස්තූරි මිශ්‍ර)
26. දශමූලාසවය
27. දේවදර්ව්‍යාද්‍යරිෂ්ටය
28. ද්‍රාක්ෂාරිෂ්ටය
29. ධාත්‍ර්‍යරිෂ්ටය
30. නිම්බාරිෂ්ටය
31. පත්‍රාංගාසවය
32. පිප්පල්‍යාසවය
33. පුනර්නවාරිෂ්ටය
34. පුනර්නවාසවය
35. බබ්බුලාරිෂ්ටය
36. බාලරිෂ්ටය
36. බලාරිෂ්ටය
37. මුස්තකාරිෂ්ටය
38. රෝහිතකාරිෂ්ටය
39. ලොධ්‍රාසවය
40. ලෞහාසවය
41. වාසකාසවය
42. විඩංගාරිෂ්ටය
43. සාරස්වතාරිෂ්ටය
44. සාරිවාද්‍යාසවය
45. හරිතක්‍යාසවය

අවලේහ-ලේහ්‍යම්-මෝදක-ගුඩ

1. අගස්ති හරිතකී
2. අභයාමලක අවලේහ
3. අභයාමෝදක
4. අභයා හරිතකී
5. අමෘත භල්ලාතක
6. අශ්වගන්ධ
7. කංටකාරි අවලේහය
8. කරුණා ලේහියම්
9. කරිසාලෙයි
10. කල්‍යාණ ගුඩ
11. කංකායන මෝදක
12. කුටජාව ලේහ
13. කුෂ්මාණ්ඩ කාවලේහ
14. ගන්ධක රසායන
15. ච්‍යවනප්‍රාශාව ලේහ
16. ච්‍යවනප්‍රාශාව ලේහ (අෂ්ටවර්ග මිශ්‍ර)
17. කොට්ටාන් කොට්ටෙයි
18. දඩිමාෂ්ටකලේහ
19. ධාත්‍රී ලේහ
20. නාරිකෙලඛණ්ඩ
21. පිප්පල්‍යාදි ලේහ
22. බිල්වාදි
23. භාර්ංගි ගුඩ
24. මහාභල්ලාතක
25. මාණිභද්‍ර ලේහ
26. වාසාකණ්ටකාරී ලේහ
27. වාසාව ලේහ
28. විඩංගාදි ලේහ
29. ව්‍යාඝ්‍රී හරිතකී
30. සුපාරිකා
31. සූරණ වටක
32. සෞභාග්‍ය ශුණ්ඨිමෝදක
33. හරිද්‍රාඛණ්ඩ
34. හරිතකී ලේහ

තෙල් වර්ග (තෛල)

1. අංඩ තෛලය
2. අණු තෛලය
3. අපාමාර්ගක්ෂාර තෛලය
4. අපාමාර්ග තෛලය
5. අරක්කු තෛලය
6. අවල්ගුජාදි තෛලය
6. අවල්ගුජාදි තෛලය
7. අශ්වගන්ධාදි තෛලය
8. ඉරිමේද තෛලය
9. ක්ෂාර තෛලය
10. ක්ෂීරබලා තෛලය
11. ක්ෂීරබලා (ශතපාක) තෛලය
12. කනක තෛලය
13. කර්පූරාදි තෛලය
14. කරප්පන් තෛලය
15. කලච්චි තෛලය
16. කුංකුමාදි තෛලය
17. කුබ්ජ ප්‍රසාරණී තෛලය
18. කෘඳු නෝයි එන්නෙයි
19. කාසිනාදි තෛලය
20. ගුංජා තෛලය
21. ගුඩුච්‍යාදි තෛලය
22. ගෙන්දක සුදූර් තෛලය
23. චක්‍රමර්ද තෛලය
24. චන්දනබලා තෛලය
25. චන්දනාදි තෛලය
26. චිත්‍රකාදී තෛලය
27. චෞල්මුග්‍රා (තෙල්)
28. ජාත්‍යාදී තෛලය
29. දශමූල තෛලය
30. දූර්වාදී තෛලය
31. ධාන්වන්තර තෛලය
32. ධාන්වන්තර තෛලය (ශතපාක)
33. නාරායන තෛලය
34. නාරිකේලාංජන තෛලය
35. නිර්ගුණ්ඩි තෛලය
36. පාර්වතී විලාස තෛලය
37. පිංඩ තෛල I, II, III, IV
38. පුංගු එන්නෙයි
39. බලා අශ්වගන්ධා තෛලය
40. බිල්වාදි ,,
41. බෘහත් මිරිවාදි ,,
42. බෘහත් සෝමරාජ
43. බ්‍රාහ්මී
44. භෘංගරාජ ,,
45. භෘංගාමලක ,,
46. මංජිෂ්ඨාදි ,,
47. මයනා තෛල ,,
48. මහා නාරායණ
49. මහාමරිචාදි ,,
50. මහා මාෂ ,,
51. මාංද එන්නෙයි ,,
52. මේගනාත
53. මෙරු කුල්ලි
54. ලශුවිෂමුෂ්ටි
55. ලාක්ෂාදි තෛලය
56. ලාක්ෂාදි තෛලය (මහා)
57. වාතකේශරී තෛලය
57. විරණ සංජීවි තෛලය
59. විෂ්ණු තෛලය
60. විෂගර්භ තෛලය
61. වෙල්ලෙයි එන්නෙයි

62. සිද්ධාර්ථ (මහා) තෛලය
63. සිද්ධාර්ථක තෛලය
64. සිද්ධාර්ති එන්නෙයි
65. සුක්කු තෛල
66. සුලෙයි කුමාර
67. සෛන්ධවාදි
68. ශිරෝබාර එන්නෙයි

ඝෘත

1. අභයාදි ඝෘත
2. අමෘතප්‍රාශ ඝෘත
3. අර්ජුන ඝෘත
4. අශ්වගන්ධාදි ඝෘත
5. අශෝක ඝෘත
6. ඉන්ද්‍රකාන්ත ඝෘත
7. කල්‍යාණක ඝෘත
8. චව්‍යාදි ඝෘත
9. චාංගේරි ඝෘත
10. ජාත්‍යාදී ඝෘත
11. ත්‍රිඵලා ඝෘත
12. දශමූල ෂට්ඵල ඝෘත
13. දශමූලාදී ඝෘත
14. ධාන්වන්තරී ඝෘත
15. පංචගව්‍ය ඝෘත
16. පංචතික්ත ඝෘත
17. පංචතික්ත ඝෘත ගුග්ගුලු
18. ඵල ඝෘත
19. වෘහත් ජාගලාද්‍ය ඝෘත
20. බ්‍රාහ්මී ඝෘත
21. මහා කල්‍යාණක ඝෘත
22. මහා තික්ත ඝෘත
23. මහා ශ්‍රීතාරාම ඝෘත

චූර්ණ-පෙති.

1. අග්නිමුඛ චූර්ණය
2. අජමෝදදී
3. අමලාදී චූර්ණය
4. අමුක්‍රා චූර්ණය
5. අවල්ගුජාදි ලේප
6. අවිපත්තිකර
7. අශ්වගන්ධ චූර්ණ
8. අෂ්ටාංග ලවණ
9. ආවලකාදි
10. ඒලාදී චූර්ණ
11. ඒලාදී ලවණ
12. කකුභාදි
13. කටුකි

14. කටුකරෝහිණී
15. කුෂ්ටම්භාවාදි ලේප
16. කුෂ්ටාදි ලේප
17. ගංගාධර
18. ගණ්ඩමාල
19. ගෝක්ෂුරාදි
20. චන්දනාදි
21. චොපචින්යාදි
22. චෞසෂ්ටි පිප්පිලි
23. ජටාමාන්ෂි
24. ජම්බු
25. තසිර් සුන්යී චූර්ණ
26. තාලිසාදි
27. ත්‍රිකටු
28. ත්‍රිවෘතාදි
29. දන්තධාවන චූර්ණ
30. දන්තිමුල
31. දශාංග ලෙපය
32. දඩිමාෂ්ටක
33. දෝෂග්න ලේප
34. ධාත්‍රි ලෞහ
35. නවායස ලෞහ
36. නිම්බාදි
37. නාරසිංහ
38. නාරායන
39. නාරිකේල ලවණ
40. පංචසම
41. පිප්පල්‍යාදි චූර්ණ
41. පිප්පල්‍යාදි චූර්ණ
42. පිප්පල්‍යාදි පතිසාරණ
43. පුෂ්‍යානුග
44. බිඩාලක ලේපය
45. භාස්කර ලවණ
46. ශ්‍රීනිම්බාදි
47. මංජිෂ්ටාදි චූර්ණ
48. මදනාදි වමන
49. මයිල් ඉරිඟු
50. රසායන
51. ලවංගාදි චූර්ණ
52. ලෝධරාදි
53. වජ්‍රක්ෂාර
54. ශංඛ පුෂ්පි
55. ශ්වාසහර
56. ශතාවාර්යාදි
57. ශිරෝ විරේචන
58. ශිවා
59. ශිවක්ෂාරපාචන
60. ශුක්‍රශෝධන
61. ශුණ්ඨ්‍යාදි
62. ශෝථහර ලේප
63. ශෘංග්‍යාදි
64. සප්තාමෘත
65. සරස්වතී
66. සිතෝපලාදි
67. (1) සින්දූරාදි ලේප
68. (2) සින්දූරාදි ලේප
69. සුදර්ශන
70. සෞවචාදි
71. හිංග්වාදි
72. හිංග්වෂ්ටක

ගුටිකා — වටිකා.

1. අග්නිතුණ්ඩි වටි
2. අමෘතාදි ගුග්ගුලු
3. අශ්වගන්ධාදි ගුටි
4. අශෝකාදි වටි
5. ආයුෂවර්ධනි
6. ඒලාදි
7. එලියකාට
8. කයිශෝර ගුග්ගුලු
9. කර්පූරාදි වටි
10. කර්පූර් හිංගුවටි
11. කස්තුරියාදි මාත්තිරෛ
12. කස්තුරි මාත්තිරෛ
13. කාංචනාර ගුග්ගුලු
14. කාශිසාදි
15. කෝඩසූරි මාත්තිරෛ
16. ඛදිරාදි
17. ගොක්ෂුරාදි
18. ගෝරෝචනාදි
19. චන්දනාදි
20. චන්ද්‍රප්‍රභාපෙති (1, 2, 3)
21. චිත්‍රකාදි ගුටි

22. ත්‍රයෝදශාංග ගුග්ගුලු
23. ත්‍රිකටවදි ගුටිකා
24. ත්‍රිඵලා ගුග්ගුලු
25. ත්‍රිලෝක රක්ෂණාම
26. දශාංග අභ්‍රක ගුටි
27. ධාත්‍රි ලෞහ
28. නවායස ලෞහ
29. නිර්කෝචිමාතිරෛ
30. ප්ලිහාරි
31. පංචාමෘත කුසුමාදි වටි
32. පඨසදි ගුග්ගුලු
33. පක්ෂවාද ගුග්ගුලු
34. පාචන වටි
35. පාඨාදි ගුටිකා
36. ප්‍රදරාන්ති ගුටිකා
37. ප්‍රදරාන්තක ලෞහ
38. ප්‍රදරාරි ලෞහ
39. බාල ගුටි
40. බිල්වාදි
41. බ්‍රහ්මානන්ද භෛරව
42. මණ්ඩූර ලෞහ
43. මන්දග්නි වටි
44. මහාශංඛ
45. මුශල්‍යාදි
46. යෂ්ට්‍යාදි වටි
47. යෝගරාජ ගුග්ගුලු
48. රජඃප්‍රවර්තනි ගුටිකා
49. රසභූපති
50. රසපර්පටි

51. රසේන්ද්‍ර ගුටිකා
52. රාස්නා ගුග්ගුලු
53. ලවංගාදි වටී (කාස) වටී
54. ලවංගාදි (කාස)
55. ලසුනාදි වටී
56. ලිංගපුපුති
57. ලොද්ධරාදි
58. ලෝහ ගුග්ගුලු
59. විෂ්ණුහ්රාසකු මාත්තිරෛ
60. විෂතින්දුක වටී
61. ශාරිවාදි වටී
62. ශීර්ෂ ශූලහරි වටී
63. ශොථග්නි වටී
64. ශොථහර ලෞහ
65. ස්වයංභූවා ගුග්ගුලු
66. සංජීවි මාත්තිරෛ
67. සර්පගන්ධ වටී
68. සිංහනාද ගුග්ගුලු
69. සුවාසකුයෝරි
70. සුලකුඩොරම්
71. සෞභාග්‍ය වටී (සූතිකා)
72. හිංග්වාදි
73. හිංග්වෂ්ටක පෙති
74. හිංගුල්‍යාදි

ක්වාථ

1. අභයාදි ක්වාථ
2. අම්බස්ථාදි
3. අමෘතාදි
4. අර්කාදි
5. අර්ජුනත්වක්
6. කඵහර
7. කලිංගකාදි
8. කිරාතාදි
9. ක්‍රිමි
10. ගුඩූච්‍යාදි
11. ත්‍රිඵලාදි
12. ත්‍රිවෘතාදි
13. දශමූල
14. දර්ව්‍යාදි
15. දේවදර්ව්‍යාදි
16. නිම්බාදි
17. පංචවල්කල
18. පටෝල්‍යාදි
19. පථ්‍යාදි
20. පුනර්නවාදි
21. බෘහත්‍යාදි
22. භූනිම්බාදි
23. මංජිෂ්ටාදි
24. මහාරාස්නාදි
25. මූත්‍ර විරේචන
26. මූත්‍ර සංග්‍රහණීය
27. රක්තශෝධන
28. රාස්නාදි
29. ලඝුපංචමූල
30. වචාදි
31. වරුණාදි
32. විදූර්යාදි ගණ
33. සප්තපර්ණ
34 සුදර්ශන (මහා)
35. ශඨ්‍යාදි
36. ශාරිබා

රස

1. අග්නි කුමාර
2. අග්නි මුඛ
3. අග්නි රස
4. අගස්ති සූතරාජ
5. අජීර්ණ කණ්ටක
6. අමරසුන්දර
7. අමෘතකලානිධි
8. අමෘතාංකුර ලෞහ
9. අර්ජුනාභ්‍ර
10. අර්ශකුඨාරි
11. අශ්වකංචුක
12. අෂ්ටමූර්ති
13. අෂ්ටවක්‍ර
14. ආනන්ද භෛරව
15. ආමවාතාරි
16. ඉච්ඡාභේදි
17. ඒකාංගවීර
18. ක්ෂාර පර්පටී
19. කනක සුන්දර
20. කඵකේතු
21. කඵචින්තාමණි
22. කර්පූර රස
23. කස්තූරි භෛරව (ස්වල්ප)
24. කාංචනාභ්‍ර
25. කාමදුග්ධා
26. කාලකූට
27. කුමාර කල්‍යාණ
28. කුෂ්ඨ කුඨාර
29. කෘමිකුඨාර
30. කෘමි මුද්ගර
31. කෘෂ්ණ චතුර්මුඛ
32. ගංගාධර
33. ගන්ධක රසායන
34. ගර්භ චින්තාමණි
35. ගර්භපාල
36. ගුඩූච්‍යාදි ලෞහ
37. ගුල්මකාලානල
38. ග්‍රහණී වජ්‍රකපාට
39. චන්ද්‍රෝදය
40. චතුර්මුඛ
41. චන්දනාදි ලෞහ
42. චන්ද්‍රාමෘත (කාස)
43. චන්ද්‍රකලා
44. චිත්‍රී
45. චින්තාමණි
46. ජයමංගල

47. ජලෝදරාරි
48. ජ්වරමුරාරි
49. ජ්වරාංකුස
50. තාම්‍රපර්පටි
51. ත්‍රිපුර භෛරව
52. ත්‍රිභුවන කීර්ති
53. දේව කුසුමාදි
54. ධාත්‍රි ලෞහ
55. නවලෝක අග්නිකුමාර
56. නවායස ලෞහ
57. නාගාර්ජුනාභ්‍ර
58. නාරදීය ලක්ෂ්මිවිලාශ
59. නාරාච
60. නාරායන ජ්වරාංකුස
61. නිත්‍යානන්ද
62. පංචවක්ත්‍ර
63. පංච මූර්ත පර්පටි
64. පීයූෂවල්ලි
65. පුනර්නවාදි ගුග්ගුලු
66. පුනර්නවාදි මණ්ඩූර
67. පුෂ්පධන්වා
68. පූර්ණචන්ද්‍ර
69. ප්‍රතාපලංකේශ්වර
70. ප්‍රදරාරිලෞහ
71. ප්‍රමෙහගජ කෙශරි
72. බාලාර්ක
73. බාලරෝගාන්තක
74. බෝල පර්පටි
75. බෝලබද්ධ
76. බෘහත්කස්තුරි භෛරව
77. බෘහත් චන්ද්‍රෝදය මකරධවජ
78. බෘහත් වංගේශ්වර
79. බෘහත් වංගේශ්වර
80. බෘහත් වාතගජාංකුස
81. බෘහත් වාත චින්තාමණි
82. බෘහත් ස්වර්ණ වසන්ත මාලතී
83. බෘහත් සූතිකා විනෝද
84. බෘහත් ශොමනාථ
85. බ්‍රාහ්මී
86. මහා ගන්ධක
87. මහා ජ්වරාංකුස
88. මහා මෘත්‍යුංජය
89. මහා යෝගරාජ ගුග්ගුලු
90. මහාරාජ නෘපති වල්ලභ
91. මහා ලක්ෂ්මිවිලාශ රස
92. මහාවාතරාජ
93. මහා වසන්ත කුසුමාකර
94. මහාශංඛ වටී
95. මහා ශ්වාසාරි ලෞහ
96. මාණික්‍ය රස
97. මෘගාංක වටී
98. මෘතසංජීවනී
99. මෘත්‍යුංජය
100. යෝගරාජ
101. යෝගේන්ද්‍ර රස
102. යෝගේශ්වර
103. රත්නගිරි
104. රසරාජ (රත්තරන් සහිත)
105. රස රාජ
106. රස සින්දූර
107. රාජමෘගාංක
108. රාමබාණ
109. ලක්ෂ්මී නාරායණ
110. ලක්ෂ්මී විරාග
111. ලඝුවසන්තමාලතී
112. ලෝකනාථ
113. ලෞහපර්පටි
114. ලෞහ භූපති
115. වසන්ත කුසුමාකර
116. වසන්තමාලතී
117. වාතගජාන්කුස
118. වාතගජේන්ද්‍රසිංහ
119. වාත චින්තාමණි
120. වාතාරි
121. වාතරක්තාංතක
122. විද්‍යාධරාභ්‍ර
122. විෂමජ්වරාන්තක ලෞහ
124. ශ්වාසකාස චින්තාමණි
125. ශ්වාසකුඨාර
126. ශ්වාස චින්තාමණි
127. ශංඛ වටී
128. ශිලාජතු වටී
129. ශීර්ෂ ශූලාරි වටී
130. ශූලකුඨාර
131. ශෝථකාලානල
121. ශෘංගාර අභ්‍රක
133. සුවර්ණ පර්පටි
134. සුවර්ණ භූපති
135. සුවර්ණ රාජ වංගේශ්වර
136. සප්තපර්ණි වටී
137. සර්වාංග සුන්දර
138. සර්වාංගසුන්දර
139. සිද්ධප්‍රාණේශ්වර
140. සිද්ධමකරද්වජ
141. සූතශේඛර
142. සූතිකාභරණ
143. සෝමනාථ
144. සෞභාග්‍ය වටී
145. හිංගුලේශ්වර
146. හෘදයාර්ණව

සිරප්

1. බ්‍රාහ්මී සිරප්
2. ශංඛ පුෂ්පි
3. වාසක

භස්මවර්ග

1. අභ්‍රක භස්ම
2. අභ්‍රක භස්ම (ශතපුට)
3. ආමෙයි මඩු

4. කරුවංග භස්ම
5. කල්නාර් භස්මම
6. කාන්ත සින්දූර
7. කාන්ත ලෞහ
8. ගෙන්දක භස්මම
9. ගෝදන්ති හරිතාල
10. තාම්ර
11. තාල
12. තාල සින්දූර
13. ත්‍රිවංග
14. නංඩුකාල්
15. නාග
16. පංච ලවණ භස්ම
17. ප්‍රවාල
18. ප්‍රවාල පංචාමෘත
19. මංඩූර
20. මකරධවජ ස්වර්ණ ගුටිකා
21. මයූරපංක භස්ම
22. මාක්ෂික
23. මුක්තා
24. මෘගශෘංගි
25. යසද භස්ම
26. රස භස්මම්රි
27. රස සින්දූරම්
28. රූප්‍ය
29. ලෞහ භස්ම
30. ලෞහ භස්ම (ශතපුට)
31. වංග
32. වරාටිකා
33. වෙඩි උප්පු චුන්නාම්
34. ශංඛ
35. ශබර ශෘංගි
36. ශිලාජිත් භස්ම
37. ශුක්ති
38. ෂඩගුණ මකරධවජ
39. ස්වර්ණ මාක්ෂික
40. ස්වර්ණ වංග
41. සූතභස්ම

පදංගම්.

1. ත්‍රිමූර්ති පදංගම්
2. පරංගි කිලංගු පදංගම්
3. ලිංග පදංගම්
4. සාම්බ්‍රාණි පදංගම්

චෙන්දූරම්.

1. අබ්‍රක චෙන්දූරම්
2. අය චෙන්දූරම්
3. අය කාන්ත චෙන්දූරම්
4. අය වීර චෙන්දූරම්
5. ආරුමුග චෙන්දූරම්
6. ක්ෂය කුලාන්තක චෙන්දූරම්
7. කස්තූරි කරුප්පු චෙන්දූරම්
8. කඩීත්තාර චෙන්දූරම් (I)
9. කඩීත්තාර චෙන්දූරම් (II)
10. චන්ඩාමෘත චෙන්දූරම්
11. ගෞරි චින්තාමණි චෙන්දූරම්
12. පචිග ලිංග චෙන්දූරම්
13. පචවුක්කරුප්පු චෙන්දූරම්
14. පූර්ණ චන්ද්‍රෝදය චෙන්දූරම්
15. ජල මංජරි චෙන්දූරම්
16. තංග චෙන්දූරම්
17. තාලග චෙන්දූරම්
18. තාම්බ්‍ර චෙන්දූරම්
19. රස චෙන්දූරම්
20. ලිංග චෙන්දූරම්
21. ලෝහ මංඩූරම්
22. වෙල්ල චෙන්දූරම්
23. සූයමාග්නි චෙන්දූරම්

මෙලගු — කුලම්බු

1. අගස්තියාර් කුලම්බු
2. ඉඩි හල්ලාදි කුලම්බු
3. කුල්මකුඩෝරි
4. කෞෂිගාර් කුලම්බු
5. ජාඩි ජම්බිර කුලම්බු
6. පංච සූත කුලම්බු
7. වාත මෙළගු
8. වීර මෙළගු
9. රස ගෙන්දි කුලම්බු
10. සිවවාන්ධ මෙළගු

ටින්චර්ස් ඇක්ස්ට්‍රැක්ට්ස් (තරල සාර සහ සාර ද්‍රව)

1. අනන්තමූල (ඉරමුසු)
2. අපාමාර්ග (ගස්කරල්හැබ)
3. අර්ක මූල (එලවරා)
4. අර්ජුන (කුඹුක්)
5. අශෝක
6. අශ්වගන්ධ (අමුක්කරා)
7. අතිවිෂා (අතිවිඩයම්)
8. අජාජි (සුදුරු)
9. අජිප (මාදුරු)
10. ආරග්වධ (ඇහැළ)
11. ඇබ්රෝමා ඔගස්ටා (පිවරි)
12. ඇල්ස්ටෝනියා (රුක්අත්තන)
13. උශීර (සැවැන්දරා)
14. කංටකාරි (කටුවැල්බටු)
15. කමලා
16. කාලමේඝ (වල් බින්කොහොඹ)
17. කැප්සසි (මිරිස්)
18. කොරියන්ඩර් (කොත්තමල්ලි)
19. ගාර්ලික් (සුදුළූනු)
20. ගොරඛමුන්ඩි (මුඩමහණ)
21. ඉජ්ජල් (ඉඟුරු)
22. ගුලන්චා (රසකිඳ)
23. ගෝක්ෂුර (ගොකටු)
24. බෙල්-ඉන්දියව (බෙලිසංයෝග)

25. ටයිකෝටිස් (අසමෝදගම්)
26. තුලසි (මදුරුතලා)
27. දශමූල (දසමුල්)
28. ධන්වයාස
29. ධාත්‍රී (නෙල්ලි)
30. නිම්බ (කොහොඹ පොතු)
31. නිම්ලීවස් (කොහොඹ කොළ)
32. පික්රොරයිසා (කටුකරෝසන)
33. පිප්පල් (තිප්පිලි)
34. පුනර්නවා (සාරණ)
35. පෘෂ්ණිපර්ණි
36. බලැක්පිරක (කළුරු)
37. බාබචි (කරොල්අරිසි)
38. බෙල් (බෙලි)
39. බෙර්බෙරිඩිස් (දරුහරිද්‍රා)
40. බෙහෙඩා (බුලු)
41. බෘහති (එලබටු)
42. බ්‍රාහ්මී (ලුණුවිල)
43. මංජිෂ්ඨා (වැල්මදට)
44. මුස්තක (කලාඳුරු)
45. මොෂ්කි (කස්තූරි)
46. රාස්නා (අරත්ත)
47. ලෝධ්‍රා (ලොත්)
48. වචා (වදකහ)
49. වාසක (ආඩතෝඩ)
50. වවඩිංග් (වළගසාල්)
51. හරිතකී (අරළු)
52. හ්‍රිවේර

ආනයනය කරනු ලබන ආයුර්වේද, සිධ සහ යුනානි (අමු) ඖෂධ සහ පිළියෙල කළ ආයුර්වේද ඖෂධ.

අංක 1 ලැයිස්තුව :—

අමු ඖෂධ — (උද්භිද)

1. අක්‍රපට්ටා,
2. අගිල්,
3. අතයි ඇට (අතයි),
4. අති මදුරම පාල්,
5. අතිවිඩයම්,
6. අදි අති විඩයම්,
7. අබතෙල්,
8. අමුක්කරා අල,
9. අයිල් පට්ටෙයි,
10. අරත්ත අල (හීන් අරත්ත සහ මහ අරත්ත)
11. අරළු,
12. අලිවිඩෙයි,
13. අශෝක පොතු,
14. අසමෝදගම්,
15. ඉකිරි,
16. ඉඟුරුපියලි,
17. ඉඩම්පූර්,
18. ඉඹුල් මැලියම්,
19. ඉරමුසු (හීන් ඉරමුසු සහ මහ ඉරමුසු),
20. ඉරිවී,
21. ඉස්සප්පො ඇට,
22. උඳු,
23. උලාඅරිසි (උළුහාල්),
24. එරඬු තෙල්,
25. එරඬු ඇට,
26. එලබලිඳ ඇට,
27. එලනෙටුල් මුල්,
28. එලබටු මුල්,
29. ඒලවාලූකා,
30. කටඑල,
31. කටුකරෝසන,
32. කටුවැල්බටු,
33. කපුකිනිස්ස ඇට,
34. කයිප්පු (එළ කයිප්පු සහ කළු කයිප්පු)
35. කරද තෙල්,
36. කරොල් අරිසි (බාකුචි),
37. කර්කටකශෘංගි,
38. කලිස්,
39. කළුදුරු,
40. කළුනාබි,
41. කාකෝලි ක්ෂිර (කාකෝලි),
42. කැකිරි ඇට,
43. කැප්පෙටිය ලාකඩ,
44. කැල ඇට,
45. කිලිසාරල් පට්ටෙයි,
46. කුඹුරු ඇට,
47. කුංකුමප්පු,
48. කෙළිඳ පොතු,
49. කෙළිඳ සාල්,
50. කොරාසානි,
51. කොට්ටං සහ සුවඳ කොට්ටන්,
52. කොත්තමල්ලි
53. කොහොඹ තෙල්,
54. ක්‍රිමිශත්‍රු,
55. ගජ තිප්පිලි,
56. ගැට අරළු,
57. ගුගුල්,
58. ගුරුන්ද,
59. ගෝක්ෂුර, (ගොකටු)
60. චීන අල,
61. ජටා මකුට,
62. ජටාමාංස,
63. ජීවක,
64. ජීවන්ති,
65. තලිස්පත්‍ර,
66. තල් සූකිරි,
67. තිත්ත අබිං,
68. තිප්පිලි,
69. තිප්පිලි මුල්,
70. තිරුස්සවාලු,
71. තුවරලා,
72. දූත්ත අල,
73. දූරාලභා,
74. දේවදර,
75. දේවදුරු,
76. දෙළුම් ලෙලි,
77. දෙඹ තෙල්,
78. නාමල් රේණු,
79. නෙරිවිෂ,
80. නෙලවග,
81. පත්පාඩගම්,
82. පීතකරෝසන,
83. පෙති කපුරු ඇට,
84. පෙරුම්කායම්,
    (කිරිකායම්, පෙරුම්කායම් කුඩු)
85. බිත්තල්,
86. බෙදනම්,
87. බෝදි ඇට,
88. මදන කාමපූ,
89. මලිතමල්,
90. මස්තගී,
91. මසන් ගෙඩි,
92. මහ එන්සාල් ඇට,
93. මහ නෙරෙන්චි,
94. මායක්කා,
95. මුරුක්කු තිප්පිලි,
96. මෙද සහ මහ මෙද,
97. රණවරා ඇට,
98. රත්කිහිරි,
99. රත්නිටුල්,

100. රත්හඳුන්,
101. ඍෂභක (සෘෂභක)
102. රුක් අඟුන ඇට,
103. රුද්‍රාපටක,
104. ලොත් සුඹුලු,
105. ලොධර,
106. වචවනාවි,
107. වදකහ,
108. වන්ධුකපුරු,
109. වල්ගම්මිරිස්,
110. වළහසාල්,
111. වලම්පුරි,
112. වලුවායි ඇට,
113. වැල්මී,
114. වැල්මදට,
115. වියලි තෙල්ලි,
116. විෂ්ණුක්‍රාන්තිය,
117. වෙට්ටිවේර,
118. වෙලිච්ච ඉඟුරු,
119. වෙලිච්ච කහ,
120. වෘද්ධදරු,
121. වෘද්ධි,
122. සතකුප්ප,
123. සන්නිනායම්,
124. සාරණ අල,
125. සාලාමිශ්‍රී,
126. සාලිය,
127. සැවැන්දරා මුල්,
128. සිරිතේක්කු,
129. සුදුලූනු,
130. සුදුහඳුන්,
131. සුදුහඳුන් කුඩු,
132. සෙනෙහෙ කොල,
133. සෙංකොට්ටම්,
134. හඳුන් තෙල්,
135. හරන් කහ,
136. හීන් අරත්ත,
137. හීන් නෙරෙංචි,
138. හීන් බිං කොහොඹ,

අංක 2 ලැයිස්තුව :—

අමු ඖෂධ ඛනිජ.

1. අඤ්ජන කැට,
2. අශ්වදත් පාෂාණම්,
3. උලත්තලිංගම්,
4. ඌසිකාන්දම්,
5. කඩල් නායෙයි,
6. කඩික්කාරම්,
7. කර්පූර ශිලාජතු,
8. කළු ඊයම්,
9. කළුලුණු,
10. කාන්දම්,
11. කාසිය,
12. කිරිතුත්තම්,
13. ගරුඩපච්ච,
14. ගරුඩ පාෂානම්,
15. ගල් නහර,
16. ගල්මද,
17. ගල් ලුණු,
18. ගල් සෙවෙල්,
19. ගල් හිරියල්,
20. ගෝමුත්‍ර ශිලාජතු,
21. ගෞරි පාෂාණම්,
22. තුත්තනාගම්,
23. තොට්ටි පාෂාණම්,
24. දියරත්තරන්,
25. නන්ධු කල්ලු,
26. නවසාරම්,
27, පල්මානික්කම්,
28. පුනීර්,
29. ප්‍රවාල (කොරල්),
30. බළල්ලුණු,
31. මඩ පුස්කර,
32. මනෝසිල,
33. මී ඉටි,
34. මී දත් පාෂාණම්,
35. මුදු පෙන,
36. මෘද්දරශෘංග,
37. යවක්ෂාර,
38. රන්හිරියල්,
39. රසකර්පූර,
40. රසාඤ්ජන,
41. රිදී තුත්තම්,
42. රෝම ලුණු,
43. ලන්සි පුස්කර,
44. වන්ධු කපුරු,
45. සර්ජික්ෂාර,
46. සව් වීරම්,
47. සවිදලුණු,
48. සාදිලිංගම්,
49. සිලාර,
50. සිවංගුරු,
51. සිනක්කාරම්,
52. සුදු ඊයම්,
53. සුදු පාෂාණම්,
54. සුවසලුණු,
55. ස්වර්ණ මාක්ෂික,
56. ශාස්ත්‍ර බෙදි,
57. හක්පාෂාණම්,
58. හොරි ගෙන්දගම්,
59. හිරියල්,

අංක 3 ලැයිස්තුව :—

අමු ඖෂධ — සත්ත්ව.

1. උරුලෑ සට්ටම්,
2. කහවෙන අං,

3. කස්තුරි,
4. ගෝරෝචන,
5. පුනුගු,
6. සච්වාදූ,

අංක 4 ලැයිස්තුව :—

අමු ඖෂධ — යුනානි.

1. අක්රොට,
2. අක්ලක්කයා,
3. අක්ලි උල්මුල්ක්,
4. අෆ්සාන්තික්,
5. අබ්‍රෙසම්,
6. අසරුන්,
7. ඇනිසූන්
8. ඇෆ්ටමූන්,
9. ඇම්බරයාෂා,
10. ඉනා බුස් සලිබ,
11. ඉර්සා,
12. උන්ත්කාතාරා,
13. උනාබ,
14. උෂ්නා,
15. උෂාක්,
16. උස්නාකුඩුස්,
17. උස්සාරායි රාවන්ද්,
18. ඌදෙයි කටාරා,
19. ඌදයි බල්සන්,
20. ඌදෙයි සාලිබ,
21. කබාබීචිනි,
22. කයාබයායිෂමායි,
23. කාමීලා,
24. ගරිබූන්,
25. ගුල්කන්ද්,
26. ගුලෙයි අනාර්,
27. ගුලෙයි කත්ම්,
28. ගුලෙයි ගෞෂබාන්,
29. ගුලෙයි ජ්ලාස්,
30. ගුලෙයි බබුනා,
31. ගුලෙයි බැනොප්ෂා,
32. ගුලෙයි මුන්ඩි,
33. ගුලෙයි සූර්ක්,
34. ගුලෙයි සූෆා,
35. ජද්වාර්,
36. ජවාකාර්,
37. ජාර්ජ්වාද්,
38. ජුංඩ් බාදෙස්තාර්,
39. ජුන්තියානා,
40. තුක්මෙයි අංජරා,
41. තුක්මෙයි ඉස්පිස්ත්,
42. තුක්මෙයි කරාෆ්ස්,
43. තුක්මෙයි කත්මී,
44. තුක්මෙයි කස්නි,
45. තුක්මෙයි කර්බුසා,
46. තුක්මෙයි කිර්ද්මානා,
47. තුක්මෙයි කුඹබායි,
48. තුක්මෙයි කුර්ෆා,
49. තුක්මෙයි තපූස්,
50. තුක්මෙයි තුර්බුද්,
51. තුක්මෙයි ෆ්‍රාන්ජ් මිස්ක්,
52. තුක්මෙයි බලංගෝ,
53. තුක්මෙයි මුරාද්,
54. තුක්මෙයි රිහාන්,
55. තුක්මෙයි හලියුන්,
56. තුක්මෙයි ගාන්දනා,
57. තුරාන්ජබීන්,
58. තුද්‍රියෙ ෂාර්ද්,
59. තුද්‍රියෙ සූෆායිද්,
60. තුද්‍රියෙ සූර්සා,
61. දම්මුල් අක්වෙන්,
62. දරුනාද්ජායි අබරාබ්,
63. නමාකෙයිලහුරි,
64. නාර්ජ්ලෙයි දර්යායි,
65. නිෂාස්තා,
66. නමාකෙයි ලහුරි,
67. පපඩ්බාර්,
68. පපිතා,
69. පර්ෂියා ඕෂාන්,
70. පලාස්,
71. ෆඩසාරි නඩානි,
72. ෆඩසාරි හයිවානි,
73. පිරංගා,
74. ෆින්දක්,
75. පොස්තෙයි තුරාන්ජ්,
76. පොස්තෙයි බායිරුනෙයි පිස්තා,
77. පොස්තෙයි බීකෙයි කිබර්,
78. බදරන්ජ් බෝයා,
79. බයිද්මිස්ක්,
80. බර්නාත්,
81. බර්ගෙයි ගෞසබාන්,
82. බර්ගෙයි බැනප්ෂා,
83. බර්ගෙයි සදම්,
84. බර්රෝෂාක්වසක්,
85. බහමනෙයි සූෆායිඩ,
86. බහමෙනෙයි සූෆායිඩ,
87. බහමනෙයි සූර්ක්,
88. බාදම්තල්ක්,
89. බිස්ෆායිජ්,
90. බීකෙයිකස්නි,
91. බීකෙයි බදියාන්,
92. බීකෙයි බබුනා,
93. බුලුන්,
94. මග්ෂායි තුක්මෙයි කඩු,
95. මග්ෂායි හබ්බුල් බුහ්ලාබ,
96. මර්ෂාන් ජෝෂ්,
97. මිස්තතා මිරෝම,
98. මුර්මන්කි,
99. මුරාබ්බෙ අද්රාත්,
100. මුරාබ බිහි,
101. මුරාබ හලීලා,
102. මුරාබ හලිලෙයි කබලි,
103. මොමියායි.

104. මිඩාල් ආඩී,
105. මෙද ලක්ඩී,
106. මුසාලියායි සූපයිඩ,
107. මුසාලියායි සියා,
108. රස්වත්,
109. රිෂෙයි කත්මී,
110. රෙවන්ද් විනි,
111. රොග්නෙයි බාදම,
112. වල්ගුස,
113. ෂක්මොනියා,
114. ෂකාකුල්,
115. ෂහතරා,
116. ෂරන්බාද්,
117. ෂරනාබ,
118. ෂරවන්දිගිර්ද්,
119. ෂාරිස්ක්,
120. ෂිරායික්ෂන්,
121. සංග්දනෙයි මුර්ක්.
122. සංගෙයි ජරහත්,
123. සංගෙයි බස්රි,
124. සංගෙයි යෙෂාඩ,
125. සංගෙයි සරෙහිමාහි,
126. සංගෙයි හජ්රුල් යහුඩ,
127. සක්රෙයි තියභාල්,
128. සපිස්තාන්,
129. සර්පුකා,
130. සුපෙයිද් බස්ගර්,
131. සුරින්ජාන් තල්ක්,
132. සුරින්ජාන් ෂිරින්,
133. සබුසා ඉසබගෝල්,
134. සංග් දනෙයි මුර්ක්,
135. හබබෙයි ආස්,
136. හබබෙයි කබලි,
137. හලීලෙ කබලි,

පරිශිෂ්ට සංග්‍රහය.

මාන පරිභාෂා (මැණුම් - කිරුම්)

ඖෂධ සංයෝග සංස්කරණය (භෛෂජ්‍ය කල්පනා) සඳහා එක් නිවැරැදි මැනීම් ක්‍රමයක් අවශ්‍ය ය. වෙනස් වෙනස් මැනීම් ක්‍රම කීපයක් පැවැත්ම ඖෂධ සංයෝගයන්ගේ සමතාව ආරක්ෂා වීමට බාධාවකි. එක් ප්‍රදේශයක තෝලාව කර්ෂ එකකි. තවත් ප්‍රදේශයෙක්හි තෝලා දෙක කර්ෂයෙකි. අයෙක් ශතයේ කාසියක බර කළඳ වශයෙන් ගනිති. අනික් අයෙක් ශත පනහේ කාසියක බර කළඳ වශයෙන් ගනිති. මාප (මාශ) එක-ගුංජා පහ, හය හත, අට, දහය, දොළහ යන ගණන් වලින් සැදෙන මානචක්‍ර කීපයක් ඇති බව ග්‍රන්ථාන්තරයෙහි දක්නා ලැබේ.

> " මාපස්තු පඤ්චභිඃ ෂඩ්භිස්තථා සප්තභිරෂ්ටභිඃ
> දශභිර්ද්වාදශභිශ්ච රක්තිභිර්මාෂකො මතඃ
> චරකස්‍යතු මාෂශ්ච දශගුංජාභිරෙව ච " (භෛ. ර. පරිභාෂා ඛණ්ඩය)

මේ තත්ත්වය නුසුදුසු බව විද්වතුන්ගේ පිළිගැනීම ය. බුද්ධදස රජතුමාගේ කෘතියෙකැයි බොහෝ දෙනා විශ්වාස කරන සාරාර්ථ සංග්‍රහය මැනීම් ක්‍රම පිළිබඳ විවිධත්වය නැති කොට ලංකාවට සුදුසු මානචක්‍රයක් පිළියෙල කර ඇත. සිංහල යෝගරත්නාකරයත් සාරාර්ථ සංග්‍රහයත් එක ම මාන ක්‍රමයක් පිළිගෙන ඇත්තේ ය. එහෙත් ඒ දෙකෙහි මැ පදනම මාගධමානය වේ. අපිදු ඒ මඟින් ඉවතට නො පැන එම පදනම මත මැ සිට කලට සුදුසු වඩා පැහැදිළි මානචක්‍රයක් පිළියෙල කෙළෙමු. එය මෙම ග්‍රන්ථයෙහි මුලැ දී මැ පෙන්වා ඇත.

නියමිත පරිමාණ (මාන) යෙකින් තොරවැ ද්‍රව්‍ය සමූහයක්හුගේ සංයෝගයෙක් සිද්ධ නොවේ.

(" නමානෙන විනා යුක්තිර් ද්‍රව්‍යාණං ජායතෙක්වචිත්") (ශා. සං.) චරක සංහිතාවෙහි සහ සුශ්‍රැත සංහිතාවෙහි මානචක්‍ර දෙකක් සඳහන් ය. චරක මානචක්‍රය මාගධමාන නමින් ද සුශ්‍රැත මාන චක්‍රය කාලිඞ්ගමාන නමින් ද සුප්‍රසිද්ධ ය. ඒ දෙකින් මාගධ මානය ශ්‍රේෂ්ඨ යැ යි මානවිධි පිළිබඳ මනා දැනීමක් ඇති විද්වතුන්ගේ පිළිගැනීම බව චරකය ම සඳහන් කරයි.

> " මානංච ද්විධං ප්‍රාහුඃ කාලිඞ්ගං මාගධං තථා
> කාලිඞ්ගාන්මාගධං ශ්‍රේෂ්ඨමෙවං මානවිදෝ විදුඃ " (ච.ක. 12. අ. 102) එම මානචක්‍ර දෙක මෙහි අවසනැ පළ වේ.

ආර්ෂ (ඍෂි) යුගයෙහිදු වත්මන්හි මෙන් මැ නොයෙක් ප්‍රදේශයන්හි වෙනස් වෙනස් මැනීම් ක්‍රම පැවැති බවට කරුණු දක්නා ලැබේ. එහෙත් ආත්‍රෙය (චරක) ධන්වන්තරි (සුශ්‍රැත) යන ප්‍රධාන සම්ප්‍රදය දෙක්හි ව්‍යවහෘත වූ මානචක්‍ර දෙක ප්‍රමුඛ වශයෙන් සලකන ලදී. මගධ දේශයෙහි භාවිත වූ ආත්‍රෙය සාම්ප්‍රදයික මානචක්‍රය මාගධමාන නම් විය. කාලිඞ්ග දේශයෙහි භාවිත වූ ධන්වන්තරි සාම්ප්‍රදයික මානචක්‍රය කාලිඞ්ග මාන නමින් ප්‍රසිද්ධ විය. ඒ යුගයෙහි විසූ මැනීම් ක්‍රම පිළිබඳ මනා දැනීමක් ඇති විදවත්හු මේ දෙකින් මාගධමාන ක්‍රමය වඩා උසස් යැ යි පිළිගත්හ. කාලිඞ්ග දේශයෙහි භාවිත වූ සුශ්‍රැතෝක්ත කාලිඞ්ග මානය පහත් යැ යි වැරදි ඇඟීමක් පහළ වීමට මෙයින් අවකාශ ලැබේ. එහෙත් සත්‍යය එය නො වේ. මැනීම් ක්‍රම පිළිබඳ විශේෂඥ විද්වතුන්ගේ අවංක අදහස, ආත්‍රෙය සාම්ප්‍රදයික චරකය ආදි ග්‍රන්ථයන්හි සඳහන් යෝග සංස්කරණයෙහි ලා චරකෝක්ත මාගධමානය ම ශ්‍රේෂ්ඨ බව ය. සුශ්‍රැතය ආදි ධන්වන්තරි සාම්ප්‍රදයික ග්‍රන්ථයන්හි එන යෝග සංස්කරණය පිණිස කාලිඞ්ග මානය භාවිත කළ යුතු බව පැහැදිළි අර්ථය වේ යැ යි බරණැස කාශී හින්දු විශ්ව විද්‍යාලයයෙහි රස ශාස්ත්‍ර ප්‍රශික්ෂක ආයුර්වේදචාර්ය අවධ බිහාරි අග්නිහෝත්‍රි ප්‍රකාශ කරයි.

මානක්‍රමයෙහි එක මැ ස්වරූපයක් ඇතිකිරීම පිණිස ඉන්දියාවේ මධ්‍යම රජය මඟින් 1956 අංක 69 දරණ කිරුම් මැනුම්වල ප්‍රමාණ සම්බන්ධ ආඥපනත (තෞල එවං මාපෝං කා ප්‍රමාණ සම්බන්දි නියම 1956–අංක 89) වලංගු කිරිමට පෙර පටන් දුරාතීතය දක්වා නොයෙක් මැනීම් ක්‍රම ව්‍යවහාරයෙහි පැවතින. මුද්‍රණ ශිල්පය ගමන් පහසුව ආදි වශයෙන් සමාජ සම්බන්ධතාව වඩ වඩා ලංවෙත් මැ නොයෙක් ඇදුරු පරපුර වලට අයත් ග්‍රන්ථ පරිශීලනයෙන් එම ග්‍රන්ථයන්හි ඇතුළත් සංයෝග සංස්කරණයෙහි ලා වෛද්‍ය සමාජය උද්යෝගිමත් වූහ. වෙනස් වෙනස් මැනීම් ක්‍රමයන්ගේ පැවැත්ම ඔවුන්ගේ අපහසුවට කරුණෙක් විය. ලංකාවේ වෛද්‍යවරයන් හට මෙම අපහසුව දෙගුණ විය. ඉන්දියාවේ නොයෙක් මානචක්‍ර මතක තබා ගැනීමත් එම චක්‍ර අපේ දේශීය මංචාඩි කලංචක්‍රයට පරිවර්තනය කර ගැනීමත් වශයෙනි. එබඳු අත්‍යාවශ්‍යක මානචක්‍ර මෙහි අවසනැ ප්‍රකාශයට පත් කෙරේ.

ඉන්දියාවේ නොයෙක් ප්‍රාන්තරාජ්‍යයන්හි විශෙෂඥ වෛද්‍යවරු සාකච්ඡා කොට සමස්ත භාරතයෙහි මැ වෛද්‍යකීය කිරුම් මැනුම් සඳහා එක මැ මානචක්‍රයක් සම්පාදනය පිණිස මෑත දී ක්‍රියා කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් දශමික (දශම ක්‍රමයට පරිවර්තිත-මෙට්රික්) මානචක්‍රය පිළිගෙන ඇත්තේ ය. සෛද්ධාන්තික වශයෙන් පරමාණුව පළමුවෙනි මානය වුව ද ප්‍රායෝගික අංශයෙන් රක්තිකාව (රති, ගුංජා-ඔළිඳ ඇටය) ප්‍රමුඛ ය. වෛද්‍යකීය කිරුම් මැනුම් පිළිබඳව තීරණයක් ගැනීම අරභයා පත්කැරුණු සියලු ම කාරක සභා විසින් ගුංජා එක මිලිග්‍රෑම් 125 ට සමාන බව තීරණය කර ඇත. (සමස්ත ඉන්දියා ආයුර්වේද-යුනානි විද්‍යාපීඨ සම්බන්ධ මධ්‍යම කාරක සභාවේ සභාපති, ආයුර්වේදචාර්ය පණ්ඩිත ශ්‍රී දුර්ගා ප්‍රසාද් ශර්මාගේ 1969.11.19 දරණ ලිපිය, "you want to clarify about the equivalent measurement of "Gunja" described in Ayurvedic Literature. The gunja is equivalent to 125 mg. This has been accepted by all committees constituted for this purpose in india" D. P. Sharma-)

ලංකාවේ ආයුර්වේද ඖෂධ සංග්‍රහ කමිටුව ද ගුංජා එක මිලිග්‍රෑම් 125 ට සමාන බව පිළිගෙන එය පදනම් කොට මංචාඩි-කලං (ලංකා) මානචක්‍රය සපයන ලදී. මෙම ග්‍රන්ථයෙහි මුලැ දී මැ පෙන්වා දී ඇත්තේ එම මානචක්‍රය යි.

භාරතීය, ලංකා මානචක්‍ර දෙක්හි සුලු වෙනස්කම් විද්‍යමාන වුව ද පදනම එකක් මැ යි. වෙනස් තැන් ඉදිරියේ සඳහන් වන චක්‍රවලින් අනාවරණය වේ. වෙනසට හේතුව ලංකා චක්‍රය මංචාඩි කලං වශයෙන් ගැනීමේ දී සිදු වන වෙනස ය. 'කලඳ' ඈත අතීතයේ පටන් මෙ රට භාවිත වූ (ඓතිහාසික) ඒකකයෙකි. පෙරවදනෙහි මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ ප්‍රකාශය බලන්න. 'මංචාඩිය 'ද එ සේ මැ යි. මදටිය ගස ද්‍රවිඩ භාෂාවෙන් 'මංජඩි' යි හැඳින් වේ. මදටිය ඇටය ද එ නමින් ගැනේ. මලයාලි බසින් 'මංජෙට' නමි. (නාද්කර්ණිගේ ඉන්ඩියන් මැටීරියා මැඩිකා) (එම මානචක්‍ර දෙක මෙහි අවසනැ පළ වේ. 'පලපංච' ශබ්දය ක්‍රමයෙන් බිඳී අවුත් ද්‍රවිඩයෙහි 'කලංජු' වී එයින් බිඳී 'කලඳ' යන ශබ්දය සැදුනාක් මෙන් මැ 'මංජෙඩි' ශබ්දයෙන් 'මංචාඩි' යන ශබ්දය වී යැයි පිළිගත හැකි ය. මදටිය ඇටය බර කිරීමේ ඒකකයක් විසින් භාවිත විය. මංජෙඩි ඒකක බර ග්‍රෙන් සතරකැ යි භාරතීය වනෞෂධිය (කල්කටා විශ්ව විද්‍යාලය) සඳහන් කරයි. සංස්කෘතික හා ඓතිහාසික වටිනා කමෙකින් යුත් 'මංචාඩි' කලං–(ලංකා) මානය' එක් වරැ මැ අත්හැර දැමීම නුසුදුසුයැ යි සැලකූ ඖෂධ සංග්‍රහ කමිටුව, ගුංජාව ඒකකයක් වශයෙන් ගෙන ඊට සමාන නිවැරැදි මිලිග්‍රෑම් ගණන සොයා ඒ අනුව ලංකාමාන චක්‍රය දශමික (මෙට්‍රික්) ක්‍රමයට පරිවර්තනය කළාය. කොළඹ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයේ ඖෂධ විද්‍යා මහාචාර්ය, ඇස්. ආර්. කෝට්ටේගොඩ මහතා විසින් ඔලිඳ ඇට 392 ක් හා මදටිය ඇට 251 ක් ඉතා සියුම් තරාදි වලින් කිරවා බලා සකස් කැරුණු සටහන් මෙහි ඉදිරියේ ඇතුළත් කර ඇත. එම පරීක්ෂණයෙන් ගුංජා එකක ශුද්ධ බර මිලිග්‍රෑම් 121 හා මදටිය ඇටයක ශුදධ බර මිලිග්‍රෑම් 238 ක් බව ද පැහැදිළි විය.

ඉන්දියාවේ කරණ ලද පරීක්ෂණ වලින් ගුංජා එකක බර මිලිග්‍රෑම 121.50 වශයෙන් පිළිගෙන ඊට අනුව මාන චක්‍රයක් පිළියෙල කරණ ලදී. (ආයුර්වේද සාරසංග්‍රහ 6 මුද්‍රණය, 1966) එහෙත් ආයුර්වේදය කිරුම් මැනුම් සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කිරීම සඳහා පත් කැරුණු නොයෙක් ප්‍රාන්තරාජ්‍යයන්ට අයත් මාන පරිභාෂා කමිටු මගින්, භාගාංශ හැකි තරම් අඩු, සරල මානචක්‍රයක් සඳහා ගුංජා එක මිලිග්‍රෑම් 125 ක් වශයෙන් සම්මත කර ඇත්තේ ය. (සචිත්‍ර ආයුර්වේද 1967 දෙසැම්බර් කලාපය. නව දිල්ලියේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රධාන ආයුර්වේද පර්යේෂණ නිලධාරි වෛද්‍ය ශිව කුමාර් මිශ්‍ර (එම්. ඒ.) ගේ ලිපිය)

මහාචාර්ය කෝට්ටේගොඩ මහතා සහ නියෝජ්‍ය සම්මත ප්‍රමාණ භාරකාර මද්නායක මහතා ද එම සම්මතය වඩා සුදුසු බව පිළිගත්හ. භාරතීය සහ ලංකා මානචක්‍ර හැකි තරමින් ආසන්නව පැවැත්ම අත්‍යාවශ්‍යක හෙයින් අපි ද ගුංජා එක මිලිග්‍රෑම් 125 ට සමාන ලෙස සලකා මෙම මංචාඩි-කලං (ලංකා) මානචක්‍රය පිළියෙල කෙළෙමු. භාරතීය ග්‍රන්ථාන්තරයන්හි එන නොයෙක් මානචක්‍ර අපේ මානචක්‍ර සමග සසඳා ගැනීම බොහෝ දෙනකුට අපහසු වන හෙයින් එබඳු චක්‍ර බොහෝ ගණනක් මෙහි අවසනැ ඇතුළත් කරමු.

උද්භිද හා පාර්ථිව (රස) ඖෂධ සංයෝග සංස්කරණය පිණිස මානක්‍රම සතරක් අනුගමනය කළ යුතු වන්නේ ය. එනම් : (1) යෞතව (පෞතව) මාන (2) ද්‍රැවය මාන (3) පාය්‍ය මාන (4) කාල මාන යන චතුෂ්කය යි.

1. යෞතව (පෞතව), කඨීන–දඩි ද්‍රව්‍ය කිරුම.
2. ද්‍රැවය, කුඩුව ආදි බඳුන් වලින් ද්‍රව මැනීම.
3. පාය්‍ය, අත් ආදියෙන් අංගුලි විතස්ති (අහල් වියත්) වශයෙන් දිග මැනීම, (අමරකෝශ, කෞටිලීය අර්ථශාස්ත්‍රම්, අභිධාන චන්ද්‍රිකා).
4. නිමේෂ (ඇසිපිය හෙළීම්) ආදියෙන් කාල මානය ද යන සිව් වැදැරුම් මානක්‍රමය වේ. (සු.සු. 6. අ. 5.)

යෞතව (පෞතව) මානය : තරාදියෙහි ලා රක්තිකා මාෂ ආදි විසින් කඨින ද්‍රව්‍ය කිරුම මෙයින් ගැනේ. ඒ සඳහා ප්‍රායෝගික අංශයෙන් භාවිත වූ සූක්ෂ්ම මාධ්‍යය සර්ෂපය (අබ ඇටය) විය. තල, අබ, අමු, යව, වී, ඔලිඳ, උඳු, තිරිඟු, මදටිය, මසන් (කෝල), බුළු (කර්ෂඵල) ආදි ධාන්‍ය හා ඇට, ගෙඩි වර්ග ඈත අතීතයෙහි පටන් ම ද්‍රව්‍ය කිරීමේ මාධ්‍යය විය. රන්මසු, රිදීමසු, තඹමසු, ශත, පණම්, ඇණ, රුපියල් ආදි කාසි වර්ග අනික් මාධ්‍යය වේ. රතු අබ, එල අබ, කහ අබ ආදි වශයෙන් අබ ජාති කීපයෙකි. වී වර්ග මහත් සංඛ්‍යාවෙකි. රතු ඔලිඳ, එල ඔලිඳ, කලු ඔලිඳ, ඇත් ඔලිඳ, ආදි ගුංජා වර්ග සතරක් දක්නා ලැබේ. මේ ඇට වර්ග විවිධ බර ප්‍රමාණයන්ගෙන් යුක්තය. එක් ඇට වර්ගයෙකින් ඇට දහසක් ගත්විට සමාන බර ඇති ඇට කීපයක් වත් සපයා ගැනීම අපහසු ය. එ හෙයින් ධාන්‍ය හෝ ඇට හෝ ගෙඩි වර්ග, කිරීමේ මාධ්‍යය වශයෙන් ගැනීම අප්‍රවේශම් සහිත ය. රටක ආර්ථික ශක්තිය අනුව කාසි වර්ගවල බර ප්‍රමාණය ද කලින් කල වෙනස්වන සුලුය කාලිඞ්ග මාගධ මාන දෙක්හි වෙනසට එක් හේතුවක් නම් ඒ, දෙ රටේ ආර්ථික තත්ත්වයෙහි වෙනස ය. ආර්ථික අංශයෙන් දුබල රාජ්‍යයන්හි රත්රන් කිරීම සඳහා අඩු බර ප්‍රමාණයක් භාවිත කර තිබේ. එ නිසා කාසි වර්ග ප්‍රතිමානයන් වශයෙන් භාවිත කිරීම ද අස්ථිර අප්‍රවේසම් ක්‍රමයෙකි. මේ කරුණු නිසා නො වෙනස්වන සුලු දශමික (මෙට්‍රික්) මානචක්‍රය භාවිත කිරීම ඉතා ප්‍රවේශම් සහිත ය; පහසුය; ප්‍රයෝජන පක්ෂයෙන් අධික ය. ඖෂධ සංයෝග සංස්කරණයෙහි ලා මුල පටන් අවසනැ දක්වා මොකක් නමුත් එක් මාන ක්‍රමයක් අනුගමනය කිරීම සුදුසු බව හා එයින් යෝගයන්ගේ විෂමතාවක් නො වන බව ආචාර්ය සම්මතය වේ. ('' යෙන කෙනාපි මානෙන ව්‍යවහාරො න දුෂ්‍යති''වෛද්‍යක පරිභාෂා ප්‍රදීප)

ද්‍රැවය මානය : කුඩුව, මානිකා, ප්‍රස්ථ ආදි පාත්‍රයන්ගෙන් ද්‍රව පදර්ථ මැනීම මෙයින් අදහස් කෙරේ. ද්‍රව පදර්ථ මැනීමේ ප්‍රථම මාධ්‍යය දබරැහිල්ල ය. දබරැහිල්ල පුරුක් දෙකක් ගිලෙනතෙක් දියෙහි ගිල්වා ඉවතට ගත් කලැ ඇඟිල්ලෙන් පතිත (drop) වන ප්‍රමාණය බින්දු-බිංදුව ය. මුතුබෙලි කටුවක් පුරා අල්ලන ප්‍රමාණය ශුක්ති නමි. මිනිසකුගේ අත්ල පිරෙන ප්‍රමාණය ''පාණිශුක්ති' නමි. (සු.චි. 40. අ. 28 සහ අ. හෘ. සං, සූ. 20. අ. 9) එක් එක් පුද්ගලයකුගේ දබරැහිල්ල වෙනස් ප්‍රමාණයන්ගෙන් යුක්ත ය. වෙනස් මුතු බෙලිකටු, සියල්ල එක සමාන මහතින් යුක්ත නො වේ. එක් එක් පුද්ගලයෙකුගේ අත්ලෙහි පිරෙණ ප්‍රමාණය ද සමාන විය නොහේ. එහෙයින් ස්ථිර ද්‍රව්‍යමාන ක්‍රමයක් අවශ්‍ය ය. ඒ සඳහා ද දශමික (මෙට්‍රික්) ක්‍රමය අනුව මිලිලීටර්–ලීටර් චක්‍රය සම්පාදනය කෙළෙමු. එය ද මෙම ග්‍රන්ථයෙහි මුලැ දී මැ සඳහන් කර ඇත.

පාය්‍ය මානය : අර්ක, සුරා ආදිය වාෂ්පීකරණය සඳහා යන්ත්‍ර නිර්මාණයෙහි ද රස භස්ම නිෂ්පාදනය සඳහා ගජපුට ආදිය සඳහා ද දිග මැනීම නිරතුරුව මැ අවශ්‍ය වේ. ඒ සඳහා අංගුලි, විතස්ති, අරත්නි, හස්ත, ව්‍යාම ආදි දිග ප්‍රමාණයෙන් ශාස්ත්‍රයෙහි නියමිත ය. දිග මැනීම සඳහාත් නො වෙනස්වන සුලු මිනුම් ක්‍රමයක් අවශ්‍ය ය. අංගුලි, විතස්ති ආදිය නූතන සෙන්ටිමීටර් ක්‍රමයට පරිවර්තනය කොට එම මානවක්‍රය මුලැ දී මැ යෙදින.

කාල මානය : රසකර්ම ආදි ඖෂධ සංස්කරණයෙහි ලා ඝටි, ප්‍රහර, අහෝරාත්‍ර ආදි කාල ප්‍රමාණයන් නියමිත ය. ඒ සඳහා තත්පර, මිනිත්තු, පැය ආදි චක්‍රය යොදන ලදී.

විවිධ මානවක්‍ර

(1) චරක මාගධමාන චක්‍රය (මුල් පිටපත)

6 වංශි = 1 මරිචි
6 මරිචි = 1 සර්ෂප (රතු අබ ඇට)
8 සර්ෂප = 1 තණ්ඩුල
2 තණ්ඩුල = 1 ධාන්‍යමාෂ
2 ධාන්‍යමාෂ = 1 යව
4 යව = 1 අණ්ඩිකා–අණ්ඩකා = (KidneyBean) = ගුංජා 2 බර = මංචාඩි එක)
4 අණ්ඩිකා = 1 මාෂක (හේම, ධාන්‍යක)
3 මාෂක = 1 ශාණ
2 ශාණ = 1 ද්‍රංක්ෂණ (කෝල, බදර–වදර)
2 ද්‍රංක්ෂණ = 1 කර්ෂ (සුවර්ණ, අක්ෂ, බිඩාලපාදක, පිචු, පාණිතල, තින්දුක, කවලග්‍රහ)
2 කර්ෂ = 1 පලාර්ධ (ශුක්ති, අෂ්ටමිකා)
2 පලාර්ධ = 1 පල (මුෂ්ටි, ප්‍රකුඤ්ච, චතුර්ථිකා, බිල්ව, ෂොඩශිකා, ආම්‍ර)
2 පල = 1 ප්‍රසෘත, අෂ්ටමාන, ප්‍රසෘති
4 පල (ප්‍රසෘති 2) = 1 කුඩව, අඤ්ජලි
4 පල (ප්‍රසෘති 2) = 1 කුඩව, අංජලි
2 කුඩව = 1 මානිකා
2 මානිකා = 1 ප්‍රස්ථ (කුඩව 4)
4 ප්‍රස්ථ = 1 ආඪක (පාත්‍ර, කංස, පාත්‍රි, අෂ්ටශරාව)
4 ආඪක = 1 ද්‍රෝණ (අර්මණ, නල්වන, කලශ. ඝට, උන්මාන)
2 ද්‍රෝණ = 1 ශූර්ප (කුම්භ)
2 ශූර්ප = 1 ශෝණි (බාරි, භාර)
32 ශූර්ප = 1 වාහ (ශෝණි 16)
100 පල = 1 තුලා

මත භෙදයක් :

ධාන්‍යමාෂ 1 යව 1 ට සමානය යනු ආචාර්ය ආර්. ආර්. පාඨක්ගේ නිගමනය යි. චරක ''ධාන්‍යමාෂද්වයං යවඃ'' යන පාඨය අශුද්ධ ය. ශුද්ධ පාඨය ''ධාන්‍යමාෂසමොයංච'' යනු වේ ය යි ඒ මහතා කියයි. (ආචාර්ය ආර්. ආර්. පාඨක්ගේ කායචිකිත්සා 1 භාග)

(2) ආචාර්ය ශාර්ඞ්ගධර විසින් සංස්කරණය කළ චරක මාගධ මානය (ග්‍රෙන්ස්, තෝලා, රුපියල් ආදිය හා තුලනාත්මක වූ මෙම චක්‍රය ඉන්දියාවේ බහුල වශයෙන් ප්‍රචලිත විය.)

30 පරමාණු = 1 ත්‍රසරේණු
6 ත්‍රසරේණු (ධවංශී,වංශී) = 1 මරිචි
6 මරිචි = 1 රාජිකා (රාජී)
3 රාජිකා = 1 සර්ෂප
8 සර්ෂප = 1 යව
4 යව = 1 ගුංජා (රති, රක්තිකා, ඔළිඳ = ග්‍රෙ: 1, 7/8)
6 ගුංජා = 1 මාෂක—මාශා (ග්‍රෙන්ස් 11 1/4)
4 මාෂක-මාශ = 1 ශාණ (ග්‍රෙන්ස් 45 = චවන්නි = ඇනා 4 පිදී කාසිය)
2 ශාණ = 1 කෝල (ග්‍රෙන්ස් 90 = අඨන්නි = ඇනා 8 පිදී කාසිය)
2 කෝල = 1 කර්ෂ (ග්‍රෙන්ස් 180 = තෝලා 1 = ඉන්දියානු රු. 1)
2 කර්ෂ = 1 අර්ධපල (ග්‍රෙන්ස් 360 = රු. 2 = තෝලා 2)
2 අර්ධපල = 1 පල (ග්‍රෙන්ස් 720 තෝලා = 4 = රු. 4)
2 පල = 1 ප්‍රසෘති-ප්‍රසෘත (ග්‍රෙන්ස් 1440 = තෝලා 8 = රු. 8)
2 ප්‍රසෘති-ප්‍රසෘත = 1 අඤ්ජලි -කුඩව (ග්‍රෙන්ස් 2880 = තෝලා 16 = රු. 16)
2 කුඩව-අර්ධශරාව = 1 මානිකා-ශරාව (ග්‍රෙන්ස් 5760 = තෝලා 32 = රු. 32)

2 මානිකා-ශරාව = 1 ප්‍රස්ථ (ග්‍රෙන්ස් 11520 = තෝලා 64 = රු. 64)
4 ප්‍රස්ථ = 1 ආඪක (ග්‍රෙන්ස් 46080 = තෝලා 256 = රු. 256)
4 ආඪක = 1 ද්‍රෝණ (ග්‍රෙන්ස් 184320 = තෝලා 1024 = රු. 1024)
2 ද්‍රෝණ = 1 ශූර්ප (තෝලා 2048 = පල 512 = රු. 2048)
2 ශූර්ප = 1 ද්‍රෝණි (තෝලා 4096 = පල 1024)
4 ද්‍රෝණි = 1 ඛාරී (තෝලා 16384 = පල 4096)
100 පල = 1 තුලා = තෝලා 400 = රාත්තල් 10 = පල 100)

සැ: යු: =රුපියල ඉන්දියාවේ සහ ලංකාවේ පැරණි රිදී රුපියල බව සැලැකියැ යුතු ය.

කාලිංග මානය (සුශ්‍රැතය සංහිතා-වි. 31. අ. 7.)

12 මධ්‍යම නිෂ්පාව = 1 සුවර්ණමාෂක
16 සුවර්ණ මාෂක = 1 සුවර්ණ (කර්ෂ)
19 මධ්‍යම නිෂ්පාව = 1 ධරණ
2 1/2 ධරණ = 1 කර්ෂ
4 කර්ෂ = 1 පල
4 පල = 1 කුඩව
4 කුඩව = 1 ප්‍රස්ථ
4 ප්‍රස්ථ = 1 ආඪක
4 ආඪක = 1 ද්‍රෝණ
100 පල = 1 තුලා
20 තුලා = 1 භාර

නිෂ්පාව : සිහින් උඳු විශේෂයෙකි. මධ්‍යම නිෂ්පාව; වඩා මහත් නොවූ ද කුඩා ම නො වූ ද මධ්‍යම ප්‍රමාණයේ එම උඳු ඇට.

තෝලා චක්‍රය (අෂ්ටාඞ්ග සංග්‍රහයෙනි)

6 අණු = 1 ත්‍රැටි
6 ත්‍රැටි = 1 ලික්ෂා
6 ලික්ෂා = 1 යූකා
6 යූකා = 1 රජස් (කණ)
6 කණ = 1 සර්ෂප
6 සර්ෂප = 1 යව
6 යව = 1 ගුංජා
2 ගුංජා = 1 නිෂ්පාව
3 ගුංජා = 1 වල්ල
2 වල්ල = 1 මාශා-මාෂ
2 මාෂා = 1 ධරණ
2 ධරණ = 1 ශාණ (නිෂ්ක, කලා)
2 නිෂ්ක = 1 වටක (කෝල)
3 කෝල = 1 තෝලා
4 *නිෂ්ක = 1 වටක (කෝල)
3 කෝල = 1 තෝලා
4 නිෂ්ක = 1 කර්ෂ (පර්යාය නාම මාගධ මානයෙහි මෙනි)
2 පාණිතල (කර්ෂ) = 1 ශුක්ති
2 ශුක්ති = 1 පල (ඇතැම් ආචාර්ය කෙනෙක් ශුක්ති 3 පල එකකැ යි යෙති.)
2 පල = 1 ප්‍රසෘත
2 ප්‍රසෘත = 1 කුඩව (අඤ්ජලි)
2 කුඩව = 1 මානිකා
2 මානිකා = 1 ප්‍රස්ථ
2 ප්‍රස්ථ = 1 ශුභ
2 ශුභ = 1 පාත්‍රක
2 පාත්‍රක = 1 ආඪක
4 ආඪක = 1 ද්‍රෝණ
100 පල = 1 තුලා

තෝල, තෝලා, තෝලක සමානාර්ථත්ව ය. රක්තිකා 96 (ග්‍රෙන්ස් 180 ක බර ප්‍රමාණය) වේ.

*නිෂ්ක ශබ්දය කලඳ වශයෙන් ලංකාවේ යන්ත්‍රපොත් වල අර්ථ දී ඇත. එහෙත් නිෂ්කය ශාණ එකට සමාන ය. ශාණ එක ගුංජා 24 කි. එය මංචාඩි දෙළොසකට සමාන ය. (සාරසංක්ෂේප ජ්වර චිකිත්සා 43 බිල්වෝරාස්නාදි ක්වාථයෙහි නිෂ්කය කලඳ වශයෙන් සඳහන් වේ.) ලංකා මානචක්‍රය අනුව නිෂ්කය මංචාඩි 15 ට සමාන ය: හෙවත් කර්ෂ 1/4 කි.

නිෂ්ක නියමය :—භෛෂජ්‍යරත්නාවලියෙහි

> '' **නිෂ්කත්‍රයං ශුද්ධසූතං නිෂ්කද්වාදශ ගන්ධකම්,**
> **ගුඤ්ජා බීජඤ්ච ෂඩ්නිෂ්කං නිෂ්කං ජෛපාලබීජකම්** '' (උරුස්තම්භ චිකිත්සා)

ටීකාව :—''නිෂ්කඃ ශාණං '' ''චතුර්භිර් මාෂකෛඃශාණඃ ස නිෂ්කෝෂ්ටක එව ච '' මෙම ප්‍රමාණයන්ගෙන් 'නිෂ්කය' ශාණ එකට සමාන බව පැහැදිලි වෙයි. එහෙත් භෛෂජ්‍යරත්නාවලි අනුවාදක විනෝදලාල් සේනයෝ 'නිෂ්කය' තෝලා 1/2 යි යෙති. එය ලංකාවේ සාරසංක්ෂේපාදියෙහි පරිවර්තනය මෙන් ම සැදෙස් ය. නිදෙස් වහර නම් 'නිෂ්ක' එක ගුංජා 24 යනු යි.

තෝල චක්‍රය (නූතන ව්‍යවහාරයෙහි)

4 ධාන්‍ය = 1 රති (ගුංජා)
6 රති = 1 ඇනා
16 ඇනා = 1 තෝලා
180 ග්‍රෙන්ස් = 1 තෝලා
1 තෝලා = 1 රිදී රුපියල්
90 ග්‍රෙන්ස් = 1/2 රුපියල් (ඇනා 8)
45 ග්‍රෙන්ස් = රුපියල් (ඇනා 4)

භාරතීය භෛෂජ්‍යතත්ත්ව (කේ. සී. බසු) හා නාදකර්ණිගේ ඉන්ඩියන් මැටිරියා මැඩිකා ඇසුරෙනි.

තෝලා-සේර් චක්‍රය (ආයුර්වේද සාරසංග්‍රහය ඇසුරෙනි)

4 ධාන්‍ය = 1 රති (ගුංජා)
8 රති = 1 මාෂ
12 මාෂ = 1 තෝලා
5 තෝලා = 1 ජටාංක (=කන්වාං)
4 ජටාංක = 1 පාව (=පෞවා)
16 ජටාංක = 1 සේර් (සේරු 1 = තෝලා 80)
40 තෝලා = 1 රාත්තල්
2 රාත්තල් = 1 සේර් – සේරු
40 සේර් = 1 මන් (mond මෝන්ඩ)

හිංදි, 'පාව' ශබ්දය වංග, 'පෝයා' ශබ්දය හා සමානාර්ථවත් ය. ''චතුර්ථාංශ'' 1/4 යනු අර්ථ යි. මානචක්‍රයන්හි එය සේර්–සේරු 1/4 යන අර්ථවත් ය. ''සිකි'' ශබ්දය ද එම අර්ථයෙහි මැ යෙදේ. මාන චක්‍රයන්හි සිකි ශබ්දය ද දක්නා ලැබේ. ඉන්දියාවේ තෝලා 80 කින් පරිමිත සේර් එකක් ද, තෝලා 64 කින් පරිමිත සේර් එකක් ද, ව්‍යවහාරයෙහි පවතී.

වරිහ්‍යාදිමානය (පණම් රුපියල් මානය) (ශාර්ඞ්ගධරය ඇසුරෙනි.)

4 වරිහි-වී ඇට = 1 ගුංජා
5 ගුංජා = 1 පණ (පණම, මෙය ඇනාවට ඉතාම කිට්ටු ය.)
8 පණ = 1 ධරණ (පණම් අට = පැරණි රිදී ශත පනහේ කාසිය, මෙය ඇනා 8 ට සමානය.)
2 ධරණ = 1 කර්ෂ (පණම් 16 = රිදී රුපියල, මෙය ඇනා 16 රුපියලට සමාන ය.)
4 කර්ෂ = 1 පල

බිංදු-බින්දු චක්‍රය

1 බින්දු = දබරැඟිල්ල දෙපුරුකක් දියේ ගිල්වා පිටතට ගත් පසු වරකට පතිත වන ද්‍රව ප්‍රමාණය
8 බින්දු = 1 ශාණ වෘද්ධභාරිත මතය යි. (ද්‍රවපදර්ථ සම්බන්ධ)
32 බින්දු = 1 ශුක්ති
64 බින්දු = 1 පාණිශුක්ති (සුශ්‍රැත. චි. 40 අ. 28 ඇසුරෙනි.)

නූතන-බින්දු චක්‍රය.

1 බින්දු = 1 මිනිම = ද්‍රව ඩ්‍රැමයෙකින් 1/60
60 බින්දු = 1 ද්‍රවඩ්‍රැම
8 ද්‍රවඩ්‍රැම = 1 ද්‍රව අවුන්ස
16 ද්‍රව අවුන්ස = 1 ද්‍රව රාත්තල්
20 ද්‍රව අවුන්ස = 1 පයින්ට
8 පයින්ට = 1 ගැලොන්

ඉන්දියාවේ යෝජිත ආයුර්වේද මානය සමහ තුල්‍ය-සමැන දශමික (මෙට්‍රික්) මානචක්‍රය

(1)	1	ගුංජා	=	125	මිලිග්‍රෑම්ස්			
	8	ගුංජා	=	1	මාශා	=	1	ග්‍රෑම්
	3	මාශා	=	1	ශාණ	=	3	ග්‍රෑම්
	4	ශාණ (මාශා 12)	=	1	කර්ෂ	=	12	ග්‍රෑම්
	2	කර්ෂ	=	1	ශුක්ති (අර්ධපල)	=	24	ග්‍රෑම්
	4	කර්ෂ	=	1	පල	=	48	ග්‍රෑම්
	2	පල	=	1	ප්‍රසෘති	=	96	ග්‍රෑම්
	2	ප්‍රසෘති	=	1	කුඩව (අඤ්ජලි)	=	192	ග්‍රෑම්
	2	කුඩව	=	1	මානිකා	=	384	ග්‍රෑම්
	2	මානිකා	=	1	ප්‍රස්ථ	=	768	ග්‍රෑම්
	4	ප්‍රස්ථ	=	1	ආඪක	=	3	කිලෝ 72 ග්‍රෑම්ස්
	4	ආඪක	=	1	ද්‍රෝණ	=	12	කිලෝ 288 ග්‍රෑම්ස්
	2	ද්‍රෝණ	=	1	ශූර්ප	=	24	කිලෝ 676 ග්‍රෑම්ස්
	2	ශූර්ප	=	1	ද්‍රෝණී	=	49	කිලෝ 152 ග්‍රෑම්ස්
	4	ද්‍රෝණී	=	1	ඛාරි	=	196	කිලෝ 608 ග්‍රෑම්ස්
	100	පල	=	1	තුලා	=	4	කිලෝ 300 ග්‍රෑම්ස්
	20	තුලා	=	1	භාර	=	96	කිලෝ

ඉන්දියාවේ, යෝජිත ආයුර්වේදීය මානය සමහ තුල්‍ය දශමික ද්‍රවමානය ග්‍රෑම්ස් මිලිලීටර් වලට හා කිලෝ ග්‍රෑම්ස් ලීටර් වලට පරිවර්තිත ය.

(2)	1	ගුංජා	=	1/8	මිලිලිටර්			
	1	මාශා	=	1	මිලිලිටර්	=	1	ග්‍රෑම්
	1	ශාණ	=	3	මිලි ලිටර්ස්	=	3	ග්‍රෑම්ස්
	1	කර්ෂ	=	12	මිලිලිටර්ස්	=	12	ග්‍රෑම්ස්
	1	ශුක්ති	=	24	මිලිලිටර්ස්	=	24	ග්‍රෑම්ස්
	1	පල	=	48	මිලිලිටර්ස්	=	48	ග්‍රෑම්ස්
	1	ප්‍රසෘති	=	96	මිලිලිටර්ස්	=	48	ග්‍රෑම්ස්
	1	කුඩව	=	192	මිලිලිටර්ස්	=	192	ග්‍රෑම්ස්
	1	මානිකා	=	384	මිලිලිටර්ස්	=	384	ග්‍රෑම්ස්
	1	ප්‍රස්ථ	=	768	මිලිලිටර්ස්	=	768	ග්‍රෑම්ස්
	1	ආඪක	=	3	ලිටර් 72 මි.ලි.	=	3	කිලෝ 72 ග්‍රෑම්ස්
	1	ද්‍රෝණ	=	12	ලිටර් 288 මි.ලි.	=	12	කිලෝ 288 ග්‍රෑම්ස්
	1	ශූර්ප	=	24	ලිටර් 576 මි.ලි.	=	24	කිලෝ 576 ග්‍රෑම්ස්
	1	ද්‍රෝණී	=	49	ලිටර් 152 මි.ලි.	=	49	කිලෝ 152 ග්‍රෑම්ස්
	1	ඛාරි	=	196	ලිටර් 608 මි.ලි.	=	196	කිලෝ 608 ග්‍රෑම්ස්
	1	තුලා	=	4	ලිටර් 800 මි.ලි.	=	4	කිලෝ 800 ග්‍රෑම්ස්
	1	භාර	=	96	ලිටර්ස්	=	96	කිලෝ

(1) හා (2) මෙම චක්‍ර දෙක නවදිල්ලියේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රධාන ආයුර්වේද පර්යේෂණ නිලධාරි වෛද්‍ය ශිව කුමාර් මිශ්‍ර මහතා ගේ අනුමැතියෙන් පළ කරණ ලදි. (සවිත්‍ර ආයුර්වේද සංග්‍රහ 1967 දෙසැම්බර් සහ 1968 අප්‍රේල්-මැයි කලාප)

වාණිජ හා වෙළෙඳ අමාත්‍යාංශය
තැ. පෙ. 560,
27, ගෝල් ෆේස් කෝට්,
කොළඹ 3.
1970 අප්‍රේල් මස 22 වැනි දින.

මගේ අංකය : වානි/කිම්/80/14
ඔබේ අංකය : එච්ඊ. 32

රහසිගතයි.

සභාපතිතුමා,
ඖෂධ සංග්‍රහ සම්පාදක මණ්ඩලය,
කොළඹ.

මාන පරිභාෂා වක්‍රය නිතිගත කිරීම.

ලංකා මාන වක්‍රයක් පිළියෙල කිරිම සම්බන්ධව ආයුර්වේද කොමසාරිස් තුමා සහ ඖෂධ සංග්‍රහ මණ්ඩලයේ නියෝජිතයන් තිදෙනෙක් සමඟ මා කළ සාකච්ඡාව හා සම්බන්ධ යි.

එම සාකච්ඡාවේ දී එළි වූ පරිදි මාන වක්‍රය පිළියෙල කිරීමේ දී ගුංජා, මංචාඩි, මාෂ වැනි ඒකකයන් අතර ඇති අනුපාතයන් රැකීම ඉතා වැදගත් ය. එහෙයින් ලංකා මාන වක්‍රය පිළියෙල කිරීමේදී එය හැකි තරම් දුරට රැකීමට මුලින් ම සන්ටුහන් කරනු යුතු ය.

අලුතින් මාන වක්‍රයක් පිළියෙල කර ගත්තායින් පසු එම ප්‍රමාණයන් හා දැනට පාවිච්චි වන ප්‍රමාණයන් අතර විශාල වෙනස්කම් ඇති නොවන විදිහට මෙම මාන වක්‍රය පිළියෙල කිරීමේ දී සැලකිලිමත් විය යුතු ය.

ලංකාවේ සියලු ම මැනුම් කටයුතු සඳහා ජාත්‍යන්තර මීටර් ක්‍රමය යෙදවීමට කැබිනට් මණ්ඩලය තීරණය කර ඇති හෙයින් නුදුරු අනාගතයේදී ම සියලු ම වාණිජ්‍ය කටයුතු මැට්‍රික් ඒකකවලින් (කිලෝ ග්‍රෑම්, ග්‍රෑම් වැනි) කිරීමට ද සිදුවනු ඇත. එ හෙයින් මෙම නව මාන වක්‍රය පරිමෙය කරණය කළ යුත්තේ මැට්‍රික් ක්‍රමය හා ගැලපෙන අයුරිනි.

මැට්‍රික් ක්‍රමය පාවිච්චි කිරීමට රට සම්පූර්ණයෙන් ම හැරෙන තුරු බෙහෙත් බඩු යනාදිය මිළයට ගැනීමේ දී රාත්තල් පාවිච්චි කිරීමට සිදු වේ. එ හෙයින් බෙහෙත් නිෂ්පාදනය කරන්නා වෙනුවෙන් දැනට පාවිච්චි කිරීම සඳහා දළ වශයෙන් අලුතින් සාදන ලංකා මාන වක්‍රයට සමාන වූ අඩු, රාත්තල් ක්‍රමයක් මත ගොඩ නැංවූ වක්‍රයක් සෑදීම ද උචිත බව පෙනී යයි.

ගතානුගතිකව ඖෂධ මැනීම පිළිබඳ මාන වක්‍රය ගොඩනැංවීමේ දී යව යම් ඇට වර්ග වල බර පදනම් කොට ගෙන ඇති බැවින් අලුතින් මාන වක්‍රය ගොඩ නැංවීමේ දී ද එහි ඒකකය හැකි තරම් දුරට එම ඇට වර්ග වල බර හා සැසඳීම මනා බව පෙනේ.

මේ සම්බන්ධයෙන් මහාචාර්ය, කෝට්ටේගොඩ මහතා විසින් කරන ලද පරීක්ෂණය ගැන සලකා බැලිම වටී. ඔහු ඔලිඳ ඇට 392 ක බර කිරා ඇත. මෙම 392 අතුරෙන් ඇට 110 ක සෑම ඇටයක් ම බරින් මිලිග්‍රෑම් 120 හා 130 අතර බව පෙනී යයි. ඒ අනුව ඔලිඳ ඇටයෙහි බර මිලිග්‍රෑම් 125 යැ යි සැලකීමේ වරදක් නැත. ඉන්දියාවේ මාන පරිභාෂා අනුකාරක සභාව මගින් ද ඔලිඳ ඇටයක බර මිලිග්‍රෑම් 125 වශයෙන් තෝරාගෙන ඇති බව පෙනී යන බැවින් ලංකා මාන වක්‍රය සඳහා ද එය ම තෝරා ගැනීම සුදුසු ය. මේ හැරත් එසේ තෝරා ගැනීමෙන් මැට්‍රික් ක්‍රමය හා පරිමේය වූ මාන වක්‍රයක් ඉබේ ම ලැබේ. මේ අනුව පිළියෙල වූ කඨින ද්‍රව්‍ය මාන වක්‍රය පහත සඳහන් පරිදි වේ.

කඨින ද්‍රව්‍ය මාන වක්‍රය (මීටර ක්‍රමයට පරිමේය කරණය කළ)

රක්තිකා (ඔලිඳ ඇට)	1	=			=	මිලිග්‍රෑම්	125	ග්‍රෙන්ස්		1.924
රක්තිකා	2	=	මංචාඩි	1	=	මිලිග්‍රෑම්	250	ග්‍රෙන්ස්		3.856
මංචාඩි	4	=	මාෂ	1	=	ග්‍රෑම්	1	ග්‍රෙන්ස්		15.43
මාෂ	3	=	ශාණ	1	=	ග්‍රෑම්	3	ග්‍රෙන්ස්		46.29
ශාණ	2	=	කෝල	1	=	ග්‍රෑම්	8	ග්‍රෙන්ස්		92.58
මංචාඩි	20	=	කලං	1	=	ග්‍රෑම්	5	ග්‍රෙන්ස්		77.16
කලං	3	=	කර්ෂ	1	=	ග්‍රෑම්	15	ග්‍රෙන්ස්		231.55
කලං	3	=	කර්ෂ	1	=	ග්‍රෑම්	15	ග්‍රෙන්ස්		231.5
කර්ෂ	2	=	අර්ධපල	1	=	ග්‍රෑම්	30	ග්‍රෙන්ස්		463.0
අර්ධපල	2	=	පලං	1	=	ග්‍රෑම්	60	ග්‍රෙන්ස්		925.9
පලං	2	=	ප්‍රසෘති (කුලුදුල්)	1	=	ග්‍රෑම්	120	ග්‍රෙන්ස්		1852.0
ප්‍රසෘති	2	=	අර්ධශරාව (අංජලි	1	—	ග්‍රෑම්	240	ග්‍රෙන්ස්		3704
අර්ධශරාව	2	=	ශරාව (මානිකා)	1	—	ග්‍රෑම්	480	ග්‍රෙන්ස්	7407 රා.	1.058
ශරාව	2	=	ප්‍රස්ථ (නැලි)	1	—	ග්‍රෑම්	950	රාත්තල්		2.116
ප්‍රස්ථ	4	=	ආඪක (ලාස්)	1	—	ග්‍රෑම්	3840	රාත්තල්		8.464
ආඪක	4	=	ද්‍රෝණ	1	—	ග්‍රෑම්	15360	රාත්තල්		33.86
ද්‍රෝණ	2	=	ශූර්ප	1	—	ග්‍රෑම්	30720	රාත්තල්		67.71
ශූර්ප	2	=	ද්‍රෝණී	1	—	ග්‍රෑම්	61440	රාත්තල්		135.4
පලං	100	=	තුලා	1	—	ග්‍රෑම්	6000	රාත්තල්		13.23

ද්‍රවමාන වක්‍රය සෑදීමේ දී ගුංජා 1 මිලිලීටර් 1/8 වශයෙන් සැලකීම සුදුසු ය. මෙසේ කිරීමෙන් ජලය නැලියක් මැන ගතහොත් එහි බර නැලියක් ද වේ. මේ අනුව පිළියෙල කරගත් ද්‍රව ද්‍රව්‍ය මානවක්‍රය පහත සඳහන් වේ.

ද්‍රව මාන වක්‍රය (මීටර ක්‍රමයට පරිමේය කරණය කළ)

රක්තිකා (ඔලිඳ ඇට)	1	=	මිලිලීටර්	125
මංචාඩි	1	=	මිලිලීටර්	250
මාෂ	1	=	මිලිලීටර්	1,000

ශාණ	1	=	මිලිලීටර්	3,000
කෝල	1	=	මිලිලීටර්	6,000
කලං	1	=	මිලිලීටර්	5,000
කර්ෂ	1	=	මිලිලීටර්	15,000
අර්ධපල	1	=	මිලිලීටර්	30.00
පලං	1	=	මිලිලීටර්	60.00
ප්‍රසෘති	1	=	මිලිලීටර්	120.00
අර්ධශරාව	1	=	මිලිලීටර්	240.00
ශරාව	1	=	මිලිලීටර්	480.00
ප්‍රස්ථ	1	=	මිලිලීටර්	960.00
ආඪක	1	—	ලීටර්	3,840
ද්‍රෝණ	1	—	ලීටර්	15.36
ශූර්ප	1	—	ලීටර්	30.72
ද්‍රෝණි	1	—	ලීටර්	61.44
තුලා	1	—	ලීටර්	6,000

මේ අනුව මෙසේ පිළියෙල කරගත් මාන චක්‍රය ගැන සළකා බැලිමේදී එය මීටර් ක්‍රමයට මනා සේ පරිමේය කරණය වී ඇති බව පෙනේ. එසේ ම ඒකකයන් අතර ඇති ශාස්ත්‍රානුකූල අනුපාතයන් නොවෙනස්ව පවතියි. මේ හැර විද්‍යාත්මක පදනමක් මත මානවක්‍රයක් ඔලිඳ ඇටයේ බරට සම්පාත කර ඇති හෙයින් දැනට පාවිච්චි වන මිම් හා විශාල වෙනස්කම් ඇති විමට ද ඉඩක් නැත. කළඳක් මැනිම සඳහා සාමාන්‍යයෙන් භාවිත වන සතයේ කාසියක බර ග්‍රෑම් 4.7 ක් පමණ වන බැවින්, අලුතින් ඇති කර ඇති චක්‍රයෙහි හා මෙහි ලොකු වෙනසක් නැත. මේ හැරත් බර බෙහෙත් ද්‍රව්‍ය කිරිම සඳහා මෙට්‍රික් පඩි පෙට්ටි මිළයට ගෙන පාවිච්චිකිරිමට ඉඩක් ඇති විම ද තවත් වාසියෙකි. ද්‍රව මැනිම සඳහා දැනට මිලිලීටර් 5, 10 හැඳි මිළයට ගැනිමට ඇති බැවින් බෙහෙත් පාවිච්චිය සඳහා නියම කිරිමේ දී කලං ගණනට පාවිච්චි කිරිමට නියම කිරිම ද මෙයින් පුලුවන් වේ. දැනට සාමාන්‍යයෙන් සිදු වන්නේ අරිෂ්ට ආදිය සඳහා මේස හැන්දක් හෝ මේස හැඳි දෙකක් බිමට නියම කිරිම ය. මේස හැන්ද නියම මිමක් නො වන අතර එහි ප්‍රමාණය ස්ථිර නොවේ. නමුත් මෙම මාන චක්‍රයට අනුව කලඳ මිලිලීටර් 5 ක් වන බැවින් ද මිලි ලීටර් 5 හා 10 ප්‍රමාණ මැන ගැනීම සඳහා සාද ඇති ප්ලාස්ටික් හැඳි ලබා ගැනිමට හැකි නිසාත් මින් මහත් වාසියක් සැලසේ. මෙම මාන චක්‍රය ග්‍රෙන්ස් වලට පෙරලුව හොත් කලඳට ග්‍රෙන්ස් 77.1 ක් වැටෙන බව පෙනේ. දැන් සාමාන්‍යයෙන් කලඳට ග්‍රෙන්ස් 75 වශයෙන් ගණන් ගන්නා බව පෙනේ. මේ දෙක අතරේ ඇත්තේ ඉතාමත් සුලු වෙනසකි. නමුත් මෙම ක්‍රම දෙක එකට පාවිච්චි කිරිමෙන් වැළකි සිටිය යුතු ය. බොහෝ ඖෂධ වර්ග රාත්තල් ක්‍රමයෙන් මිළයට ගැනිමට සිදුවන බැවින් අලුත් මාන චක්‍රය පාවිච්චි කරන වෛද්‍යවරුනට හෝ වෛද්‍යායතනවලට පොත් තැබිමේ දී කරදරයක් සිදුවිමට ඉඩ ඇත. මේ සඳහා කඨින මාන පරිභාෂා චක්‍රයෙහි එන සියලු ම ඒකකයන් සඳහා බ්‍රිතාන්‍ය ක්‍රමයේ සමකයන් පෙන්නුම් කර ඇත.

සාමාන්‍ය වාණිජ කටයුතු සඳහා මැට්‍රික් ක්‍රමය යෙදවිම මුල් බැස ගන්නා තුරු විශාල වශයෙන් ඖෂධ වර්ග සෑදීමේ දී ඉහත දක්වා ඇති මාන පරිභාෂා චක්‍රය පාවිච්චි කිරිම අපහසු ය යි කෙනෙකුට හැඟෙන්නට පුලුවන. දැනට රාත්තල් ගණනින් බෙහෙත් කිරා මිශ්‍ර කරන අවස්ථාවක් සඳහා අලුතින් යෝජනා කර ඇති මාන පරිභාෂා චක්‍රය පාවිච්චි කිරිමට ගියහොත් ඒ සඳහා කිලෝග්‍රෑම් වැනි ලොකු මැට්‍රික් පඩි පාවිච්චි කිරිමට සිදු වේ. මේවා දැනට වෙළඳ පොලෙහි ලබා ගැනිමට නොමැති ය. එහෙයින් එවැනි ලොකු මැට්‍රික් පඩි වෙළෙඳ පොලෙහි ලබාගැනීමට හැකිවන අවස්ථා වනතුරු මේ සඳහා රාත්තල් අවුන්ස ක්‍රමයට යෙදවිමට සිදුවන බව පෙනේ. එ හෙයින් තාවකාලිකව ක්‍රියාවේ යෙදෙන බෙහෙත් බඩු විශාල වශයෙන් නිෂ්පාදනය කිරිම සඳහා පමණක් යෙදවිම සඳහා මාන පරිභාෂා චක්‍රයක් පිළියෙල කිරිමට ද සිදු වේ. බෙහෙත් බඩු නිපදවිමේ දී දැන් ද ශරාවය රාත්තල හා සමාන කර ඇති බව ඔබ මා හා කළ සාකච්ඡාවේ දී හෙළි විය. මෙය ග්‍රෑම් වලින් ගත් කල ග්‍රෑම් 453.59 කි. කලින් යෝජනා කර ඇති ශරාවෙහි හා රාත්තල අතරේ මේ අනුව ග්‍රෑම් 26 ක පමණ වෙනසක් ඇත. එනම් එය 5% ක පමණ වෙනසකි. මීට කලින් යෝජනා කළ මාන චක්‍රය පිළියෙල වී තිබුණේ ඔලිඳ ඇටයේ බර පදනම් කර ගෙන ය. දැනට පාවිච්චි වන ප්‍රායෝගික ක්‍රමයෙහි 5%ක වෙනසක් ඇති බව මෙයින් පෙනී යයි. නමුත් එක ම මාන චක්‍රය පාවිච්චි කරන්නේ නම් මෙවැනි වෙනසකින් මෙහි ඖෂධ වර්ග නරක් නො වන බව මා සමඟ පැවැත් වූ සාකච්ඡාවේ දී ඔබ හෙළි කලේ ය. එ හෙයින් තාවකාලික ව පාවිච්චි කිරිම සඳහා ශරාවය රාත්තලකට සමාන කිරිම මැනැවැයි මගේ හැඟිම යි. මේ අනුව පිළියෙල වුණු පරිභාෂා චක්‍රයක් පහත සඳහන් කර ඇත. මෙහි අවුන්ස යනුවෙන් හඳුන්වා ඇත්තේ ඇවුරුදුපොයි අවුන්සය බව ද සලකන්න. ඔබ මා වෙත කලින් එවා තිබුණු පරිභාෂා චක්‍රයෙහි ශරාවය රාත්තලකට සමකර තිබුණු අතර ශාණය ග්‍රෙන්ස් 60 නොහොත් ඩ්‍රැම්ස් 1 ට සමාන කර තිබුණි. මෙය ඇවුරුදුපොයි ඩ්‍රැමය නොව ඇපොතිකරි ඩ්‍රැමය වේ. මේ අනුව ගොඩ නැඟුව හොත් ශරාවය ඇපොතිකරි අවුන්ස 16 ක් වේ. එය ඇවුරුදුපොයි රාත්තලකට වඩා වැඩි ය. එහෙයින් ශාණයට වඩා කුඩා වන ඒකකයන් සඳහා ඇවුරුදුපොයි අවුන්ස හා ඩ්‍රැම්ස් පාවිච්චි කිරීමට තීරණය වී ඇත. මේ අනුව කලඳකට ග්‍රෙන්ස් 72.91 වැටේ. මෙම කළඳ හා කලින් යෝජනා කරන මාන චක්‍රයෙහි කළඳ අතරේ 5% පමණ වෙනසක් ඇත. පදනම් දෙක අතරේ වෙනසක් ඇතිවිම මෙයට හේතුව යි. නමුත් එක ම මාන චක්‍රය පාවිච්චි කරන්නේ නම් රාත්තලකට ඇති ග්‍රෙන්ස් ගණන පිළිබඳ ගැටවක් දැන් ඇති නො වේ. මක්නිසා ද? රාත්තල ශරාවට සමකර ඇත්තේ තාවකාලිකව පාවිච්චි කිරිමට පමණක් සීමිත ඇවුරුදුපොයි ක්‍රමයට පරිමේය කරණය කර ඇති මාන චක්‍රයේ ම වෙයි. මේ අනුව රාත්තලකට ග්‍රෙන්ස් 7000 කි. එය, සාමාන්‍ය වාණිජ කටයුතුවලට පාවිච්චි කරන ඇවුරුදුපොයි රාත්තල ම ය.

කඨින ද්‍රව්‍ය මාන චක්‍රය (තාවකාලික පාවිච්චිය සඳහා)

ගුංජා	1	=	ග්‍රෙන්ස්	1,825	1.8
මංචාඩි	1	=	ග්‍රෙන්ස්	3,645	3.6
මාෂ	1	=	ග්‍රෙන්ස්	14,580	14.6
ශාණ	1	=	ග්‍රෙන්ස්	43,740	43.7
කෝල	1	=	ග්‍රෙන්ස්	87,480	87.5
කලං	1	=	ග්‍රෙන්ස්	87,480	87.5
කලං	1	=	ග්‍රෙන්ස්	72.91	73

කර්ෂ	1	=	ඇවුරුදුපොයි ඩ්‍රැම්	8
අඩපලම්	1	=	ඇවුරුදුපොයි අවුන්ස	1
පලං	1	=	ඇවුරුදුපොයි අවුන්ස	2
ප්‍රසෘති	1	=	ඇවුරුදුපොයි අවුන්ස	4
අඤ්ජලි	1	=	ඇවුරුදුපොයි අවුන්ස	8
මානිකා (ශරාව)	1	=	රාත්තල්	1
ප්‍රස්ථ	1	=	රාත්තල්	2
ආඪක	1	=	රාත්තල්	8
ද්‍රෝණ	1	=	රාත්තල්	32
ශූර්ප	1	=	රාත්තල්	64
ද්‍රෝණි	1	=	රාත්තල්	128
තුලා	1	=	රාත්තල්	12 1/2

ද්‍රව ද්‍රව්‍ය මාන වක්‍රය සඳහා ද ප්‍රායෝගික යෙදවීම් සඳහා තාවකාලික පාවිච්චිය උදෙසා බ්‍රිතාන්‍ය ක්‍රමයට පරිමේය කරණය කළ මාන වක්‍රයක් පිළියෙල කර ගැනීමට සිදු වේ. වර්තමානයෙහි සමහර අවස්ථාවල නැලිය, සේරුවට සම කර ගණන් ගන්නා බව ද තවත් විටෙක ශරාව රාත්තලේ බෝතලය යන මිම්මට සමාන වශයෙන් ද ගණන් ගන්නා බව පෙනේ. සේරුව, ගැලුමෙහි 1/4 කි. රාත්තලේ බෝතලය යනුවෙන් ගණන් ගනු ලබන්නේ ද්‍රව අවුන්ස 16 හෙවත් ගැලුමෙන් 1/10 කි. මේ අනුව ශරාව එක ක්‍රමයකට ගැලුමකින් 1/10 ක් වන අතර අනෙක් ක්‍රමයට ගැලුමකින් 1/8 කි. ද්‍රව මැනීම සඳහා රාත්තල පාවිච්චි කිරීම නුසුදුසු ය. එ හෙයින් එය ගැලුම්, කාර්තු (හෙවත් සේරු) පයින්ට්, ජිල්, ද්‍රව අවුන්ස, ද්‍රව ඩ්‍රැම්, ඩ්‍රැම්, මිනිම් (බින්දු) යනාදියෙන් මැනීමට අවශ්‍ය වේ. ඔබ මා වෙත එවා ඇති ද්‍රව ද්‍රව්‍ය මාන වක්‍රයට අනුව ශරාව ගැලුම් 1/10 ක් පමණ වේ. ගැලුම් 1/10 මිණුම් දැනට වෙළඳ පොළෙහි මිළ දී ගැනීමට නො මැත. අවශ්‍ය වුවහොත් සාද ගැනීමට පුලුවන. ශරාව සේරු 1/2 හැටියට සැලකුව හොත් මෙය අවශ්‍ය නොවේ. නමුත් බෙහෙත් ද්‍රව්‍ය නරක් නොවීම පිණිස මේ දෙකින් වඩා හොඳ කුමක් දැ යි තෝරා ගත යුත්තේ ඔබ විසිනි. කෙසේ නමුත් ද්‍රව මැනීම සඳහා රාත්තල යන වචනය යොදා ගැනීම නොමනා බැවින් රාත්තල් 1 —ගැලුම් 1/10 වශයෙන් සලකා එය ගැලුම් වලින් දී ඇත.

ද්‍රව ද්‍රව්‍ය මාන වක්‍රය (තාවකාලික ප්‍රයෝජන සඳහා)

ශරාව = රාත්තලේ බෝතල 1 නම්, නැලිය = සේරු නම්

ගුංජා	1	=	මිනිම්				
මංචාඩි	1	=	මිනිම්	4		මිනිම්	4.8 = 5
මාෂ	1	=	මිනිම්	15		මිනිම්	18.75 = 19
ශාණ	1	=	මිනිම්	45	= ද්‍රව ඩ්‍රැම් 1	මිනිම්	56.25
කෝල	1	=	මිනිම්	90	= ද්‍රව ඩ්‍රැම් 2	මිනිම් 112.5 ද්‍රව ඩ්‍රැම්	1 1/2
කලං	1	=	මිනිම්	80		මිනිම්	100
කර්ෂ	1	=	මිනිම්	240	= ද්‍රව ඩ්‍රැම්	4 ද්‍රව ඩ්‍රැම්	5
අර්ධපල	1	=	ද්‍රව ඩ්‍රැම්	8	= ද්‍රව අවුන්ස	1 ජිල්	1/4
පලම්	1	=	ද්‍රව අවුන්ස	2		ජිල්	1/2
ප්‍රසෘති	1	=	ද්‍රව අවුන්ස	4		ජිල්	1
අර්ධ ශරාව	1	=	ද්‍රව අවුන්ස	8		පයින්ට්	1/2
ශරාව	1	=	ද්‍රව අවුන්ස	16	= ගැලුම් 1/10	පයින්ට්	1
ප්‍රස්ථ	1	=	ගැලුම්	2		සේරු (කාර්තු)	1
ආඪක	1	=	ගැලුම්	8		ගැලුම්	1
ද්‍රෝණ	1	=	ගැලුම්	3.2		ගැලුම්	4
ශූර්ප	1	=	ගැලුම්	6.4		ගැලුම්	8
ද්‍රෝණි	1	=	ගැලුම්	12.8		ගැලුම්	16
තුලා	1	=	ගැලුම්	1.25		ගැ: 1 ක්වාර්ට් 2 ජිල් 2	

වඩා සුදුසු මාන වක්‍රය යොදා ගන්න. දැනට මෙම ක්‍රම දෙකෙහි ම පදනම් වශයෙන් ගෙන ඇති ඒකකයන් පාවිච්චි වන බැවින් දෙකින් කුමක් හොඳ දැයි කීමට මට අපහසු ය. මීටර ක්‍රමයට පරිමේය කරණය කරණ ලද වක්‍රය මේ දෙක අතර පිහිටයි. ජිල් 1 පටන් ගැලුම් 8 දක්වා මිනුම් වෙළඳ පොලෙහි මිළයට ගැනීමට ඇති බව ද සඳහන් කරනු කැමැත්තෙමි. මෙම වක්‍ර දෙකින් වඩා සුදුසු යයි ඔබට හැඟෙන වක්‍රය භාවිතයට ගන්න.

මුලින් දී ඇති මාන වක්‍ර දෙක වඩා විද්‍යාත්මක වූ. මැට්‍රික් ක්‍රමයට පරිමේය කරණය කර සෙසු නවීන විද්‍යාවන් හා ආයුර්වේදය ගැලපීමට නම් ඒ සඳහා ආධාරයක් වන පරිද්දෙන් සැකසුනු මාන ක්‍රමය වේ. ඖෂධ සංග්‍රහය සඳහා යොදා ගත යුත්තේ එම වක්‍රයන් යැ යි මගේ හැඟීම යි. මැට්‍රික් ක්‍රමයට හැරෙන තුරු ප්‍රායෝගික වැඩ සඳහා පමණක් බ්‍රිතාන්‍ය ක්‍රමයට පරිමේය කරණය කළ අනෙක් මාන වක්‍රය අවශ්‍ය නම් යොදා ගත හැකි ය. නමුත් මාන වක්‍ර වර්ග දෙක ම එක විට පාවිච්චියෙන් වැලකී සිටීම ද ඉතා මත් වැදගත් ය.

ඖෂධ සංග්‍රහය සඳහා නිර්දේශ කරනුයේ මැට්‍රික් ක්‍රමයට පරිමේය කරණ ලද්දවූ වක්‍රදෙක බවත් බ්‍රිතාන්‍ය ක්‍රමයට පරිමේය කරණය කළ වක්‍ර දෙක තාවකාලික ව විශාල වශයෙන් බෙහෙත් සාදන අයගේ පහසුව සඳහා පමණක් බවත් මෙම නිර්දේශ කරන්නේ එක ම වක්‍රය භාවිත කරන්නේ නම් ඒකකයන්ගේ ප්‍රමාණ වල සුළු වෙනස්කම් ඇති වුවත් බෙහෙත් වල ගුණයට හානි යක් ඇති නො වේ ය යන ඔබගේ මතය මත එල්බ ගෙන බව ද අවසාන වශයෙන් සඳහන් කරමි. ඔබ මා හා තබා ගිය සියලූ ලිය කියවිලි මේ හා එවමි.

අ.ක./එච්. ඇල්. ආර්. ඩබලිව්. මදනායක.
සම්මත ප්‍රමාණ භාරකරු වෙනුවට.

ලංකා විශ්ව විද්‍යාලයයේ (කොළඹ) ඖෂධ විද්‍යා මහාචාර්ය ඇස්. ආර්. කෝට්ටෙගොඩ මහතා විසින් ඔලිඳ ඇට සහ මදටිය ඇට කිරවා බැලීමෙන් කළ පරීක්ෂණයේ ප්‍රතිඵල සටහන

ඔලිඳ		මදටිය	
මිලිග්‍රෑම	වාර ගණන	මිලිග්‍රෑම	වාර ගණන
57	1	131	1
60	1	150	1
65	1	155	1
68	1	160	1
70	4	170	3
70	4	170	3
72	1	173	1
74	2	175	1
75	2	180	8
80	4	182	1
83	2	185	5
85	5	186	1
86	2	190	8
88	6	192	1
89	2	194	1
90	6	195	7
91	2	196	2
92	1	200	8
93	4	203	3
94	4	207	5
95	3	208	4
96	3	213	6
97	4	220	11
98	4	223	1
99	3	234	2
100	6	226	3
101	2	230	17
102	5	232	4
103	7	238	10
104	1	240	6
105	11	242	1
106	2	242	1
107	3	247	1
108	12	249	2
109	4	250	10
110	18	252	3
111	5	254	7
112	4	256	1
113	8	258	6
114	3	268	5
115	16	269	1
116	4	270	13
117	7	272	1
118	6	277	1
119	2	282	2
120	28	288	2
121	6	290	10
122	13	292	3
123	14	295	4
124	5	300	8
125	12	305	4
126	8	307	3

මිලිග්‍රෑම	වාර ගණන	මිලි ග්‍රෑම	වාර ගණන
127	10	309	1
128	12	310	4
129	2	315	1
130	9	320	9
132	6	325	4
133	7	330	7
134	3	335	3
135	6	338	1
136	7	342	1
137	5	348	1
138	8	350	4
139	5	355	1
140	8	358	1
142	3		
143	1		
144	3		
145	5		
147	6		
148	2		
149	2		
150	2		

කිරාගත් ඔලිඳ ඇට සහ මදටිය ඇට වලින් සමහරක බර ප්‍රමාණයන් සමානව යෙදෙන අවස්ථා මෙහි දැක්වේ. සමහර මදටිය ඇටයක බර මි. ග්‍රෑම්ස් 131 ක් වන අතර තව සමහරක මි. ග්‍රෑටස් 358 ක් බව ඔබට මෙයින් අවබෝධ වනු ඇත. එසේ ම සමහර ඔලිඳ ඇටයක බර මි.ග්‍රෑම්ස් 57 ක් වන අතර තව ඇටයක මි.ග්‍රෑම්ස් 150 ක බර ප්‍රමාණය ඇති බව මෙයින් පෙනේ.

ලංකා මාන ක්‍රමය මිලි ග්‍රෑම්ස්, ග්‍රෑම්ස්, මිලි ලීටර් සහ ලීටර් බවට පරිවර්තනය කිරීම.

ඔලිඳ ඇටයක		නියම බර	=	මිලිග්‍රෑම්ස්	121
මංචාඩි (මදටිය) ඇටයක		නියම බර	=	මිලිග්‍රෑම්ස්	238
මංචාඩි ඇට	5	නියම බර	=		1.19
මංචාඩි ඇට	10	නියම බර	=	ග්‍රෑම්ස්	2.38
මංචාඩි ඇට	20	නියම බර	=	ග්‍රෑම්ස්	4.76
මංචාඩි ඇට	30	නියම බර	=	ග්‍රෑම්ස්	7.14
මංචාඩි ඇට	40	නියම බර	=	ග්‍රෑම්ස්	9.52
මංචාඩි ඇට	·60	නියම බර	=	ග්‍රෑම්ස්	14.28
කලන්	6	නියම බර	=	ග්‍රෑම්ස්	28.56
කලන්	12	නියම බර	=	ග්‍රෑම්ස්	57.12
කලන්	24	නියම බර	=	ග්‍රෑම්ස්	114.24
කලන්	48	නියම බර	=	ග්‍රෑම්ස්	228.48
කලන්	96	නියම බර	=	ග්‍රෑම්ස්	456.96
රාත්තල්	1	නියම බර	=	ග්‍රෑම්ස්	456.96
රාත්තල්	2	නියම බර	=	ග්‍රෑම්ස්	913.92
රාත්තල්	8	නියම බර	=	ග්‍රෑම්ස්	3655.68
රාත්තල්	32	නියම බර	=	ග්‍රෑම්ස්	14622.72
රාත්තල්	128	නියම බර	=	ග්‍රෑම්ස්	58490.88

1.9	ග්‍රෙන්ස්	=	කලං	1/4
3.8	ග්‍රෙන්ස්			
18.6	ග්‍රෙන්ස්	=	කලං	1/4
37.2	ග්‍රෙන්ස්	=	කලං	1/2
74.4	ග්‍රෙන්ස්	=	කලං	1
111.6	ග්‍රෙන්ස්	=	කලං	1 1/2
148.8	ග්‍රෙන්ස්	=	කලං	2
223.2	ග්‍රෙන්ස්	=	අවු.	1/2
446.4	ග්‍රෙන්ස්	=	අවු.	1
892.8	ග්‍රෙන්ස්	=	අවු.	2
1785.0	ග්‍රෙන්ස්	=	අවු.	4
3570.0	ග්‍රෙන්ස්	=	අවු.	8
7140.0	ග්‍රෙන්ස්	=	අවු.	16
7140.0	ග්‍රෙන්ස්	=	අවු.	16
14208.0	ග්‍රෙන්ස්	=	ප්‍රස්ථ	1
57120.0	ග්‍රෙන්ස්	=	ආඪක	1
228480.0	ග්‍රෙන්ස්	=	ද්‍රෝණ	1
913920.0	ග්‍රෙන්ස්	=	ද්‍රෝණ	1

මංචාඩි	20	=	ග්‍රෑම්ස්	4.76
කලන්	3	=	ග්‍රෑම්ස්	14.28
කලන්	6	=	ග්‍රෑම්ස්	28.56
කලන්	12	=	ග්‍රෑම්ස්	57.12
කලන්	24	=	ග්‍රෑම්ස්	114.24
කලන්	48	=	ග්‍රෑම්ස්	228.48

74.4	ග්‍රෙන්ස්	=	කලන්	1			
223.2	ග්‍රෙන්ස්	=	කර්ෂ	1	=	පලම්	1/4
446.4	ග්‍රෙන්ස්	=	කර්ෂ	2	=	පලම්	1/2
892.8	ග්‍රෙන්ස්	=	කර්ෂ	4	=	පලම්	1
1785. 0	ග්‍රෙන්ස්	=	කර්ෂ	8	=	පලම්	2
3570.0	ග්‍රෙන්ස්	=	කර්ෂ	16	=	පලම්	1

මිලි ග්‍රෑම්ස් 1000 = ග්‍රෑම්ස් 1

කලන්	1	=	4.76	ග්‍රෑම්ස්	74.4	ග්‍රේන්ස්
කලන්	1 1/2	=	7.14	ග්‍රෑම්ස්	111.6	ග්‍රේන්ස්
කලන්	3	=	14.28	ග්‍රෑම්ස්	223.3	ග්‍රේන්ස්
කලන්	6	=	28.56	ග්‍රෑම්ස්	446.4	ග්‍රේන්ස්
පලම්	1	=	57.12	ග්‍රෑම්ස්	892.8	ග්‍රේන්ස්
පලම්	2	=	114.24	ග්‍රෑම්ස්	1785.0	ග්‍රේන්ස්
පලම්	16	=	913.92	ග්‍රෑම්ස්	14280.0	ග්‍රේන්ස්
පලම්	64	=	3655.68	ග්‍රෑම්ස්	57120.0	ග්‍රේන්ස්
පලම්	256	=	14622.72	ග්‍රෑම්ස්	228480.0	ග්‍රේන්ස්
පලම්	512	=	29245.44	ග්‍රෑම්ස්	45660.0	ග්‍රේන්ස්
පලම්	1024	=	58490.88	ග්‍රෑම්ස්	913920.0	ග්‍රේන්ස්

ද්‍රව මානය

පත	1	=	200 මිලිලීටර් (හෝ සිසි)	=	නැලි	1
පත	4	=	800 මිලිලීටර්	=	නැලි	1
නැලි	4	=	3.2 ලීටර්	=	ලාස්	1
ලාස්	4	=	12.8 ලීටර්	=	ද්‍රෝණ	1
ද්‍රෝණ	2	=	25.6 ලීටර්	=	ශූර්ප	1
සූර්ප	2	=	51.2 ලීටර්	=	වාහ	1
වාහ	4	=	204.8 ලීටර්	=	බාරි	1

මිලි ලීටර 1000 = ලීටර 1 යි.

පත, නැලි, ලාස්, ද්‍රෝණ ශූර්ප හා වාහ යනාදියෙන් මැනීම සඳහා අමුතුවෙන් භාජන පිළියෙල කිරීමට අවශ්‍ය නැත. මේ සඳහා මිලි ලීටර හා ලීටර වශයෙන් ලකුණු කර තිබෙන භාජන (Measuring Cylinders) පාවිච්චි කිරීමට පුළුවන.

ග්‍රේන්ස් භාවිතා නොකිරීමට හේතු

මෙම ලේඛනවල මිලිග්‍රෑම්ස් ග්‍රේන්ස් බවට පරිවර්තනය කර තිබෙන නමුත්, එසේ පරිවර්තනයෙන් ලබාගන්නා අගයන් නිවැරදි බව නවීන විද්‍යාව අනුව කිසිසේත් සිදුවිය නොහැක. එයට හේතුව නම් ග්‍රේන්ස් සුළු ප්‍රමාණයක් මිලිග්‍රෑම්ස් බවට ගෙන ඒමේදී 60 වැඩි කිරීම සිදු කරන අතර ග්‍රේන්ස් විශාල ප්‍රමාණයක් මිලිග්‍රෑම්ස් බවට ගෙන ඒමේදී 64 න් වැඩි කිරීම සිදු කෙරෙන නිසා බොහෝ විශාල සංඛ්‍යාවක් වැඩි කරන විට 60 සහ 64 අතරේ තිබෙන වෙනස ඉතා විශාල වන බැවිනි. මෙහි ග්‍රේන්ස් වලින් අප දක්වා තිබෙන්නේ ඔබගේ ඉල්ලීම පරිදි මිස එය ක්‍රියාවේ යෙදවීමට නොවේ. තවද වර්තමානයේ ග්‍රේන්ස් සහ අවුන්ස පාවිච්චිය ක්‍රමයෙන් අභාවයට යන බවත් ඔබ වටහා ගත යුතු යි.

අ.ක./ඇස්. ආර්. කෝච්චේගොඩ.

ටින්ක්චර්ස්, ලික්විඩ් ඇක්ස්ට්‍රැක්ට්ස් සහ ක්වාථ.

ඉන්දියාවේ සහ ලංකාවේ ආයුර්වේද වෛද්‍යවරු ඉහත නම් සඳහන් නවීන මුහුණුවරක් ඇති සංස්කරණ පසුගිය තිස් වසරකට අධික කාලයක් මුළුල්ලේ රෝග ව්‍යපශමනය සඳහා භාවිත කළහ. මෙම සංස්කරණයන් ආයුර්වේද භෛෂජ්‍ය කල්පනා සමඟ නො සැසඳේය යි ඇතැම් අය තුළ සැකයෙක් පවතී. එම සැකය යුක්ති සහගත නො වේ. මෙම සංස්කරණයන් පිළිබඳව කල්පනය ආයුර්වේද භෛෂජ්‍ය කල්පනයන්හි ඉතා පැහැදිලිව ඇතුළත් ය. නූතන ටින්ක්චර්ස්, ලික්විඩ්, ඇක්ස්ට්‍රැක්ට්ස් සහ ක්වාථ සංස්කරණ ආයුර්වේදීය ආසව–අරිෂ්ට සංස්කරණ මූලසූත්‍රයේ මැ විකාශනයෙක් විනා සම්පූර්ණ නව සංස්කරණ විධියෙක් නො වේ. සුරා (මද්‍ය) සන්ධානය, ක්වාථයන්හි සුරා ස්වයංජාත කොට ද්‍රව්‍ය ශක්තිය සංරක්ෂණය හා ක්වාථයන්හි සුරා සංයෝග කොට ද්‍රව්‍ය ශක්තිය සංරක්ෂණය කිරීම යන ක්‍රම තුන චරක සංහිතාවෙහි පැහැදිලිව දක්නා ලැබේ.

ආසවයෝනි (ආසවයන්ට උත්පත්තිස්ථාන) :—

ධාන්‍ය, ඵල, මූලසාර= අරටු, පුෂ්ප, කාණ්ඩ= අතුරිකිලි, පත්‍ර, ත්වක්= පොතු ශර්කරා යන මේ නවය ආසවයෝනිහු වෙති. මෙම ආසවයෝනීන් පදනම් කොට සිද්ධ කළ හැකි ආසව අපරිසංඛ්‍යෙයය . එහෙත් මිනිස් සිරුරට හිතකර (පථ්‍යතම) ආසවයන්ගේ ගණන අසූහතරකි.

(1) **ධාන්‍යාසව :** සුරා, සෞවීර, තුෂෝදක, මෛරේය, මේදක, ධාන්‍යාම්ල මේ සය (6) ධාන්‍යාසවයෝ වෙති.

(2) **ඵලාසව :** මෘද්වීකා, කාශ්මර්ය, ඛර්ජූර, ධන්වන, රාජාදන, කේතකීඵල, පරූෂක, හරීතකී, ආමලකී, විභීතක, ජම්බීර, කපිත්ථ, කුවල, බදර, කර්කන්ධු, පීලු, පියාල, පනස, න්‍යග්‍රෝධ, අශ්වත්ථ, ප්ලක්ෂ, ආම්රාතක, උදුම්බර, අජමෝද, ශෘංගාටක, ශංඛිනී, යන මේ (26) විසිහය වැදැරුම් පලතුරු වලින් සෑදෙන ආසවයෝ ඵලාසව නම් වෙති.

(3) **මූලාසව :** විදරිගන්ධා, අශ්වගන්ධා, කෘෂ්ණගන්ධා, ශතාවරී, ශ්‍යාමා, ත්‍රිවෘත්, දන්තීමූල, ද්‍රවන්තීමූල, බිල්වමූල, ඒරණ්ඩ මූල, චිත්‍රකමූල, යන මේ එකොළොස් (11) වැදැරුම් මුල් වලින් සෑදෙන ආසවයෝ මූලාසව නම් වෙති.

(4) **සාරාසව :** ශාල, ප්‍රියක, අශ්වකර්ණ, චන්දන, ස්‍යන්දන, ඛදිර, කදර, සප්තපර්ණී, අර්ජුන, අසන, අරිමේද, තින්දුක, කිණිහි, සමී, ශුක්ති, ශිංශපා, ශිරීෂ, වඤ්ජුල, (අශෝක), ධන්වක, මධූක යන මේ විසි (20) වැදැරුම් අරටු වලින් සෑදෙන ආසවයෝ සාරාසව නම් වෙති.

(5) **පුෂ්පාසව :** පද්ම, උත්පල, නලින, කුමුද, සෞගන්ධික, පුණ්ඩරීක, ශතපත්‍ර, මධූක, ප්‍රියංගු, ධාතකී, යන මේ දස (10) වැදැරුම් පුෂ්පයන්ගෙන් සෑදෙන ආසවයෝ පුෂ්පාසව නම් වෙති.

(6) **කාණ්ඩාසව :** ඉක්ෂු, කාණ්ඩේක්ෂු, ඉක්ෂුබාලිකා, පුණ්ඩරක, යන මේ සිව් (4) වැදැරුම් උක්දඬුවලින් සෑදෙන ආසවයෝ කාණ්ඩාසව නම් වෙති.

(7) **පත්‍රාසව :** පටෝල, තාඩක යන මේ දෙවැදැරුම් (2) පත්‍රයන්ගෙන් සෑදෙන ආසවයෝ පත්‍රාසව නම් වෙති.

(8) **ත්වගාසව :** තිල්වක, ලොධර, ඒලවාලුක, ක්‍රමුක (පුවක්) යන මේ සිව් (4) වැදැරුම් වෘක්ෂයන්ගේ පොතු වලින් සෑදෙන ආසවයෝ ත්වගාසව නම් වෙති.

(9) **ශර්කරා** වලින් සිද්ධ ආසවය ශර්කරාසව නමි. සියල්ල අසූහතරෙකි. (84) (ච.සූ. 25. අ. 48) මෙම අසූ හතර චරක යුගයෙහි දී සිරුරට හිතවත් ලෙස සැලකූ ආසවයෝ වෙති. ආසව–අරිෂ්ට සංස්කරණයාගේ මූලසූත්‍රය ආසුත කිරීම සංඛ්‍යාත මද්‍ය පදර්ථය නිපදවීම ය. ආසුත කිරීම නම් ජල, ක්වාථ, ශර්කරා, මීදී, ධාතකී, මීමල්, ආදී ද්‍රව්‍යයන්ගේ සංයෝගයෙන් කෙරෙන සන්ධානය යි. (''ආසුක්ත්වාදිති සන්ධානරූපත්වාත්'' එම චක්‍රපාණිදත්ත ටීකා)

සුරාසව : ජලය වෙනුවට සුරාව යොද සිද්ධ කෙරෙණ ආසවය සුරාසව නම් වේ. (''සුරාසවඃ සුරයා සූයතෙ තොයකාර්‍යං ක්‍රියතෙ යස්මින් සඃ සුරාසවඃ සු.සූ. 45. මද්‍යවර්ග 187.) අරිෂ්ටය, ක්වාථ–මධුර පදර්ථ–ප්‍රක්ෂේප–සන්ධාන ද්‍රව්‍ය යන මොවුන්ගේ සංයෝගයෙන් සංස්කරණය කෙරේ. ආසවය, ජල–සන්ධාන පදර්ථ–මධුර ද්‍රව්‍ය හා ඖෂධ චූර්ණ සංයෝගයෙන් සංස්කරණය කෙරේ. ක්වාථය සමඟ සමභාග වූ සුරා සංයෝගකොට අරිෂ්ට පරිභාෂාවෙන් සංස්කරණය කෙරෙණුයේ සුරායුක්ත ක්වාථය වේ. සුරාසව, සුරායුක්ත ක්වාථ සම්බන්ධ වැඩි විස්තර චරක කල්පස්ථාන 2,4,10,12 අධ්‍යායයන්හි විමසන්න. (ච. ක. 9. අ.) වාරුණී, නාඩිකා ආදී යන්ත්‍ර උපයෝගයෙන් පෙරා ගන්නා ලද්දේ සුරා නමි. (අර්ක පෙරීම ද එම යන්ත්‍ර මගින් කෙරේ.).

සුරාප්‍රභේද : මාධ්වික මද්‍ය =මුද්දරම්පලම් වලින් සිද්ධ කළ මද්‍ය, ඛාර්ජූරමද්‍ය =රට ඉඳි වලින් පෙරූ මද්‍ය, ශ්වේතසුරා= සුදු සාරණ, ඇල්සහල්පිටි හා මුහුං යොද පෙරණ මද්‍ය ප්‍රසන්නා, මධූලක =මීමල් හෝ සිහින් තිරිඟු වලින් සිද්ධ කළ මද්‍ය, ආක්ෂිකී බුලු පොතු වලින් සිද්ධ කරන ලද මද්‍ය, කෝහල =බැදගත් බාර්ලි (යව) චූර්ණයෙන් හෝ බතින් පෙරා ගත් සුරා, ගෞඩසිධු=උක්රස කකාරා ධාතකී ආදිය යොද සිද්ධ කළ සුරා, ශර්කරාසිධු, ශීතරසික සිධු=උක්රස නො පැසවා සකස් කළ සුරා, ආක්ෂිකී=බුලු පොතු කෂාය හා ගුඩ–ධාතකී ආදියෙන් සංස්කරණය කළ සිධුව, ජාම්බවසිධු. =ඉදුනු මාදංගෙඩි යූෂ–ධාන්‍යක්වාථය–ගුඩ–ධාතකී සංයෝගයෙන් සංස්කරණය කළ සිධුව, මධ්වාසව, මෛරේය යනාදිය මද්‍ය–සුරා ප්‍රභේදයෝ වෙති. (සු.සූ. 45. අ. මද්‍ය වර්ගය), කොහල (''ත්‍රිදෝෂ භෙද්‍යවෘෂ්‍යශ්ච කොහලො වදනප්‍රියඃ'') එම මෛරෙය, වෙන් වෙන්ව නිෂ්පාදිත සුරා ආසව යනදෙවගය එකට මිශ්‍රකොට නැවතත් සන්ධානය කළ මද්‍යය, (සු.සූ.45. අ. 189) වේ. ආචාර්ය සුශ්‍රැතගේ කෝහල (කෞහලිකා) ශබ්දය නවීන ඇල්කොහොල් ශබ්දයට යොද සිද්ධ කෙරෙණ සුරාසව ආදිය අතිශයින් ම ප්‍රකට හෙයින් ඒ හා සමාන ටින්ක්චර් ලික්විඩ් ක්වාථ, ජලය වෙනුවට සුරා සහ ඖෂධ යොද සිද්ධ කෙරෙන සුරාසව ආදිය අතිශයින් ම ප්‍රකට හෙයින් ඒ හා සමාන ටින්ක්චර්, ලික්විඩ්, ඇක්ස්ට්‍රැක්ට්ස්, සුරායුක්ත ක්වාථ යන සංස්කරණ යන් මෙම ඖෂධ සංග්‍රහයට ඇතුළත් කෙළෙමු.

ප්‍රවාහී ක්වාථ (කාඪා) සිද්ධ කරගන්නා ලද ක්වාථයෙකින් සියයට 5–10 අතර ප්‍රමාණයක් මද්‍යසාර හෝ හලි (Alcoholy or Rectifid Spirit) මිශ්‍ර කිරීම, ක්වාථයන්හි මද්‍යසාර ස්වයංජාත කිරීම යන ක්‍රම දෙකින් සිද්ධ කෙරේ. ප්‍රථම ක්‍රමය මද්‍යසාර හෝ හලි ලබා ගැනීමට ඇති දුෂ්කරතා නිසාත් නීතිගත දුෂ්කරතා නිසාත් අපහසු වුව ද දෙවෙනි ක්‍රමය අතිශයින් ම පහසු හා පොදු වෛද්‍ය සමාජයට සුදුසු බව ද කිව හැකි ය.

නිදර්ශනයක් : මහාමංජිෂ්ඨාදි ක්වාථය (ප්‍රවාහී, කාඪා) ක්වාථ ඛණ්ඩයෙහි සඳහන් එම ක්වාථයට අයත් ද්‍රව්‍යයන් එක් වගයෙන් තෝලා 14 මාශා 3 බැගින් ගෙන දළ ලෙස චූර්ණ කොට ජලය සේරු 64 ක් (රාත්තල් 128) ලා සේරු 16 ට සිඳුවා ගත යුතු ය. ඉන්පසු ඊට ගුඩ සේරු 6 1/4 ක් සහ ධාතකී ජටාංක 10 (තෝලා 50) ක් ද යොද ආසවාරිෂ්ට සන්ධාන විධියෙන් මසක් තබා ඉන්පසු පෙරා සුරක්ෂිත කෙරේ. (සන්ධාන පරිභාෂාව බලන්න.)

මාත්‍රාව : වරකට තෝලා 1–2 දක්වා උදේ සවස ආහාරයට පසු සමාන භාගයක් ජලය සමග යෙදේ. (ආයුර්වේද සාර සංග්‍රහ 7 මුද්‍රණය 1971).

මහාසුදර්ශන කාඪා : චූර්ණ ඛණ්ඩයෙහි සඳහන් මහාසුදර්ශන චූර්ණයට අයත් ද්‍රව්‍යයන් එක් වගයෙන් තෝලා 8 මාශා 8 රක්තිකා 4 බැගින්, චිරතා (හුනිම්බ) සේරු 2 ජටාංක 10 තෝලා 3 මාශා 4 බැගින්, ජලය සේරු 64 යි; ශෙෂය සේරු 16 යි; ගුඩ හා ධාතකී මහාමංජිෂ්ඨාදියෙහි මෙනි. සංස්කරණය ද එපරිදි මැ යි. (ආයුර්වේද සාරසංග්‍රහ 7 මුද්‍රණය, 1971.).

වාලුකෂාය.

ආයුර්වේදිය භෛෂජ්‍ය කල්පනා ශීර්ෂයෙහි වාලුකෂාය විධිය සඳහන් නැත. එය ලංකාවේ දේශීය කල්පනා විශේෂයෙකි. දරු ප්‍රසූතයෙන් දින දෙළොසක් පමණ ගත වූ සූතිකෝන්මාද ආදි විෂම සූතිකාරෝග අවස්ථාවන්හි පැරණි දේශීය වෛද්‍යවරු යොදති.

1. වාලුකෂාය:

ලූනු ද ඉඟුරුත් අරළු ද මිරිසුත් අසමෝදගම කළුදුරු   කිඳිගත්
ජීරක තිප්පිලි සාතාවාරිය ඉරමුසු සස්සඳ මුල්   ගනිමින්
මෙම ඕසු පොට්ටනි බැඳලා බඳනේ ජලපිට ලා   ගනිමින්
ඕවැලි කබලක බැඳලා දෙවනුව එහි ජලපිට ලා   ගනිමීන්

සිඳුවා අටිනෙක උදය තුනක් ගෙන පානය කළහොත් යමෙක්   මෙයින්
වැදුවා ලෙඩ ගිස දය රුදවද උණ හිසරද නිතරම   වෙවුලුත්
කලවා අතපය හිරිගත් වායු ද පිස්සු බැල්ම යන රෝග   මෙයින්
බිඳුවා පලයෙයි රිවි දුටු පිණි ලෙස වාලු කෂායේ සත්ත   මෙයින්

2. වාලුකෂාය:

දෙදුරුත් වම්මුතු මෝදක දෙසඳුන් ඉරිවේරියෙන්   ද
තිකුළුත් පැපිළිය ලඟනා නිඹ සස්සඳ මුලින්   ද
වළහත් උණකුඩු ඉරමුසු වාරිය කිරිඅඟුන මුලින්   ද
මෙහැමත් පොට්ටනි බඳිමින් සැලට දමා දිය අටින්   ද

සිඳ අටිනෙක පතක් පමණ වැඩියේ බාගෙන මිම්ම   ට
සුදු වැලි බැද සැලට දමා කඩබැඳ දුම් නොයන ලෙස   ට
වැදූ අඟනට දුන සතියක් තද ලේ කුණු මල බැඳුම   ට
තද ලෙඩ ගුණ කරවා දෙන වාලු කෂායකි තිර කො   ට

තද උණගැනි තිගැස්සියට සිහිපත් නැති විපරිතය   ට
බැඳ මල–මූ අඩස්සියට කන් කැක්කුම වෙව්ලීම   ට
ඇදවී කට බෙල්ල ඇකුළ පිටට නැමෙන යක්ෂ ලෙඩ   ට
හොඳ වෙයි තද සියලු සන්නි වැදූ අයට දුන තුන්වි   ට

සංස්කරණය:—

ක්වාථ්‍ය ද්‍රව්‍ය පලං එකයි. කොටා වතුර අට පතෙක්හි පොට්ටනිය බැඳ ලා මනාවට සිඳුන විට ගඟකින් හෝ ඔයකින් ලබාගත් ශුද්ධ වැලි ගිනියම් වනසේ කබලෙක්හි බැද කෂාය භාජනය පුනීලයෙකින් හෝ හිල් පොල් කටුවකින් තදින් වසා ගිනියම් වූ වැලි ක්‍රමයෙන් දමන්නේ ය. ප්‍රවේශමින් කළ යුතු ය. ස්වල්ප පමාවෙකින් ගිනියම් වැලි වැටෙන විට කැකැරුණු කෂාය මුහුණට ඉසන්නට හැකි ය. එය පෙරා පානය සඳහා යොදන්නේ ය. ගිනියම් වූ වැල්ලෙහි ඇති කිසියම් රසායනික පදර්ථයක් නිසා සූතිකා විෂ නැසෙන බව සළකා ගත හැකි ය. විමසිමට භාජන කළ යුතු ය.

ආස්රාණ වමනයෝග හා ආස්රාණ විරේචන යෝග.

ජීවක තෙමේ බෙහෙත් ගැල්වූ මහනෙල් මල් තුනක් ආඝ්‍රාණය කරවා බුදුරදුන්ට විරේචනය කරවූ බව ජීවක කථාවෙන් අනාවරණය වෙයි. චරක සංහිතා කල්පස්ථාන 4 වෙනි අධ්‍යායයෙහි මහනිල්, නෙළුම් ආදි යම්කිසි මලෙක්හි ධාමාර්ගව ගෙඩි වලින් කළ චූර්ණය බෙහෙවින් ගල්වා, මස්රස-එළකිරි-යවාගු ආදිය තෘප්තිය ඇති වන තෙක් භෝජනය කළ පුද්ගලයා ආඝ්‍රාණය කරවීමෙන් පහසුවෙන් වමනය වන බව සඳහන් ය. (''චූර්ණෛර්වාපයුත්පලාදීය භාවිතානි ප්‍රශ්‍රිතගඃ රසක්ෂිරයවාග්වාදිතෘප්තො ඝ්‍රාත්වා වමෙක්සුඛම'' ච. ක. 4. අ. 7)

ආඝ්‍රාණ විරේචන යෝගයක් : චරක කල්ප, 10 අධ්‍යායයෙහි 14–16 පද්‍යයන්හි සඳහන් ය. එය මල්දමෙක්හි තවරා, ආඝ්‍රාණය කරවීමෙන් මෘදුකෝෂ්ඨය සහිත රජදරුවන්ට සුවසේ විරේචනය සිදුවේ යි කියති. (චූර්ණ ඛණ්ඩයෙහි බලන්න.)

" ත්‍රිවෘතාරාග්වධං දන්තිං ශංඛිනී සප්තලාං සමාම්
නිශිස්ථිතං ගවාං මූත්‍රෙ ගොෂයෙදතපෙ තතඃ
සප්තාහං භාවයිත්වෛවං ස්නුක්ක්ෂිරෙණාපරං පුනඃ
සප්තාහං භාවයෙච්ජුෂ්කං තතස්තෙනාපි භාවිතම්
ගන්ධමාල්‍යං තදඝ්‍රාය ප්‍රාවෘත්‍ය පටමෙව ච
සුඛමාශු විරිච්‍යන්තෙ මෘදුකොෂ්ඨා නරාධිපාඃ " (ච. ක. 10. අ. 13–14–15–16).

3. ආඝ්‍රාණ වමන යෝගයක්:

තිත්තලබු ගෙඩි යූෂයෙහි එම මල් බහා තබා වියැලුනු පසු සුණු කොට ඒ චූර්ණය මල්මාලාවක ගල්වා ආඝ්‍රාණය කරවීමෙන් සුඛිත පුද්ගලයාට වමන සිදු වෙයි.

" තුම්බ්‍යා ඵලරසෛඃ ශුෂ්කෛ සපුෂ්පෛරවචූර්ණිතම්
ඡර්දයෙන්මාල්‍යමාඝ්‍රාය ගන්ධසංපත්සුඛොබොචිතඃ " (ච.ක.3.අ.10)

ශ්වසන ව්‍යුහයෙහි නාඩි මණ්ඩලය උත්තේජනය කරවීමෙන් වමන විරේචන සිදුවන මෙම ආඝ්‍රාණ යෝග ක්‍රමය දැන් ව්‍යවහාරයෙන් ඇත් ව, නැතහොත් සම්පූර්ණයෙන් නැති වී ගොස් ඇත. ආයුර්වේදීය භෛෂජ්‍ය කල්පනාවන්හි අතිසූක්ෂ්ම උසස් ක්‍රමයක් වන මෙම යෝග ක්‍රමය ක්‍රියාත්මක කිරීම මැනවි.

මාන පරිභාෂා පර්යාය නාම.

රක්තිකා = රති, ගුඤ්ජා, (ඔලිඳ*)
මාෂක = මාශා, හේම, ධාන්‍යක, ධානක, හේමධාන්‍ය
ශාණ = ධරණ, වර්ධක, නිෂ්ක, චවන්නි, (වාන්දි කී චවන්නි)
කෝල = ද්‍රංක්ෂණ, වදර, වටක, ක්ෂුද්‍රක, ගද්‍යාන, අයින්නී
කර්ෂ = සුවර්ණ, අක්ෂ, පිචු, පාණිතල, උදුම්බර, විඩාලපද, කිංචිත්පාණි, තින්දුක, පාණිමානිකා, ෂොඩශිකා, කරමධ්‍ය, කවලග්‍රහ, හංසපාද, බිලාලපාද, (හුණ)*
පලාර්ධ = ශුක්ති, අෂ්ටමිකා, (අඩපලම*)
පල මුෂ්ටි, ප්‍රකුඤ්ච, චතුර්ථිකා, බිල්ව, ෂොඩශි, ආම්ර, (පලම*)
ප්‍රසෘත = ප්‍රසෘති, අෂ්ටමාන, (කුළුදුල*)
කුඩව = අඤ්ජලී, අර්ධශරාව, (පත*)
මානිකා = ශරාව, අෂ්ටපල, (මනාව, මනා*)
ප්‍රස්ථ = (නැලිය, නැඹුඹ*)
ආඪක = වට, අෂ්ටශරාව, පාත්‍රි, චතුඃෂෂ්ටිපල, පාත්‍ර, කංසපාත්‍ර, කංස භාජන, (ලහ, ලහස, කුරුණිය*)
ද්‍රෝණ = කලස, ඝට, උන්මාන, අර්මන, නල්වන, රාශි, ඝටරාශි, (තිඹ*)
ශූර්ප = කුම්භ, චතුඃෂෂ්ටිශරාව
ද්‍රෝණි = බාරි, භාර, භාරි, ගොණි, වාහි

– සිංහල ව්‍යවහාර්ය වේ.

ලංකාවේ දේශීය ව්‍යවහාරය

කර්ෂ	1	=	හුණ	1			
හුණ	2	=	අඩපලං	1			
අඩපලං	2	=	පලං	1			
පලං	2	=	කුළුඳුල්	1			
කුළුඳුල්	2	=	පත	1			
පත	2	=	මනා	1			
මනා	2	=	නැඩුබ	1	=	නැලි	1
නැඩුබ	4	=	ලාස්	1	=	කුරුණි	1
ලාස්	4	=	ද්‍රෝණ	1	=	තිඹ	1
කුරුණි	5	=	ලාස්	5	=	බෙර	1
බෙර	2	=	පැල්	1			
නැලි	32	=	බුසල්	1			
පැල්	2	=	අමුණු	1			

(පරිශිෂ්ට සංග්‍රහය ඖෂධ සංග්‍රහ සම්පාදක මණ්ඩලය වෙනුවෙන් සභාපති, වෛද්‍යාචාර්ය, ඩී. එම්. ජයසිංහ මහතා විසින් ලියන ලදී.)

විෂ ද්‍රව්‍ය, අබිං හා අන්තරාදයක ඖෂධ වර්ග ආඥා පනතේ උඩෘතය.

(42) වගන්තිය.

අබිං සහතික ලබාගැනීම් සඳහා වූ ඉල්ලුම් පත්‍ර ගැන කටයුතු කිරීමට මණ්ඩල පත් කිරීම

(1) එක් එක් පළාත සඳහා හෝ සුදුසු ය යි ඇමතිවරයා අදහස් කළහොත් එක් එක් පාලන දිස්ත්‍රික්කය සඳහා සභාපති විය යුතු දිසාපතිගෙන් ද පත්කිරීමට සුදුසු ය යි ඇමතිවරයා අදහස් කරන වෙනත් තැනැත්තන්ගෙන් ද සමන්විත මණ්ඩලයක් ඔහු විසින් කලින් කල පත් කළ යුතු ය. 1910 අබිං ආඥ පනතෙහි අනුරූප විධි විධාන යටතේ පත්කරනු ලැබූ යම් මණ්ඩලයක් මේ වගන්තිය යටතේ පත්කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(2) ''ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අබිං සහතික ''ගැන කටයුතු කිරීමත් ස්වකීය අභිමතය පරිදි එබඳු ඉල්ලුම් පත්‍ර සඳහා අවසරදීම හෝ ප්‍රතික්ෂේප කිරීම ලියාපදිංචි කළ යම් ''ආයුර්වේද වෛද්‍යවරයෙකුට'' සැපයිය යුතු අබිං ප්‍රමාණය කලින් කල නිශ්වය කිරීමක් එබඳු සෑම මණ්ඩලයකම යුතුකම විය යුතුයි.

(3) වෘත්තියෙහි යෙදීම අවසන් කරන හෝ මණ්ඩලයේ මතය අනුව අබිං බාර දෙනු ලැබීමට නුසුදුසු බව දක්වෙන වරදකට වරදකරු කරනු ලැබූ ''ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයෙකුගේ අබිං සහතිකය'' මණ්ඩලය විසින් අවලංගු කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ කරනු ලබන මණ්ඩලයේ හැම තීරණයක්ම ඇමතිවරයා වෙත ඉදිරිපත් කෙරෙන ඇපෑලකට යටත් විය යුතු ය.

(5) ''අබිං සහතික නිකුත් කරනු ලැබ සිටින ඔහුගේ ප්‍රදේශයෙහි ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නාම ලේඛනයක් තබා ගැනීමත් කලින් කල එය ප්‍රති ශොධනය කිරීමත් දිසාපති විසින් කළ යුතුය.

(43) වගන්තිය.

ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයන්හට අබිං සැපයීම.

(1) ලියා පදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයකු විසින් අබිං සහතිකයක් සඳහා කරනු ලැබූ ඉල්ලීමකට මණ්ඩලය විසින් ඉඩ දෙනු ලබන අවස්ථාවකදී ආණ්ඩුවේ දිසාපතිවරයා විසින් ඒ සහතිකය ඒ වෛද්‍යවරයා වෙත නිකුත් කළ යුතු ය.

(2) ''ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරයෙකුගේ අබිං සහතිකය'' අවලංගු කරනු ලබන හෝ ඔහුට ලැබෙන අබිං ප්‍රමාණය වෙනස් කරනු ලබන කවර විටෙක වුව ද දිසාපති විසින් ඒ වෛද්‍යවරයාට ඒ බව වහාම දැනුම් දිය යුතු අතර එසේ දැනුම් දීමෙන් දින දහතරක් ඇතුලත ඒ වෛද්‍යවරයා විසින් ස්වකීය සහතිකය දිසාපති වෙත ආපසු භාර දිය යුතුයි.

(3) (අ) තමා වෙත නිකුත් කරන ලද ''අබිං සහතිකයෙහි'' නිශ්චිතව සඳහන් ගණන හෝ ප්‍රමාණය පදනම් කොට ගෙන ගණන් බලනු ලැබූ මාස අටක සැපයීම් වලට අතිරේකව කිසිම අබිං ප්‍රමාණයක් ලියා පදිංචිකළ ආයුර්වේද වෛද්‍යවරයෙකු විසින් කිසිම අවස්ථාවක තමන් සන්තකයෙහි තබා නොගත යුතු ය.

(ආ) රෝගවලට ප්‍රතිකාර කිරීම හැර කෑම සඳහා හෝ දුම්බීම සඳහා හෝ අන්කිසි කාර්‍යයක් සඳහා අබිං සැපයීම කිසිම ලියාපදිංචි කළ ''ආයුර්වේද වෛද්‍යවරයකු'' විසින් නො කළ යුතු ය. තවද රෝගවලට ප්‍රතිකාර කිරීමේදී යම් රෝගියකුට දෙන ඖෂධ සංයෝගයක් වශයෙන් හැර වෙන යම් ආකාරයකින් හෝ යම් රෝගියෙකුට දින තුනකට නියම කරනු ලැබූ අබිං වේල්වල මුලු ගණනට වැඩි වන යම් අබිං ප්‍රමාණයක් කිසියම් අවස්ථාවකදී රෝගියාට නො දිය යුතු ය.

යන්ත්‍ර ඛණ්ඩය



තාපන ඛල්වය

1. අග්නිය
2. ඛල්වය
3. බෝල



වර්තුල ඛල්වය

1. ඛල්වය
2. බෝල



1. ගිනි උදුන
2. තාප මානය
3. කාෂාය ද්‍රව්‍ය බඳුන
4. වාෂ්ප (තඹ) නලය
5. සිසිල් දිය බඳුන (අර්ක නලය සහිත)
6. අතිරේක සිසිල් දිය බඳුන
7. සිසිල් දිය නලය
8. අර්ක භාජනය



වාලුකා යන්ත්‍රය.

1. අග්නිය – 3. බෝතලය
2. ඖෂධය – 4. වැලි:



භූධර යන්ත්‍රය.

1. ගොම වැරටි
2. බඳු ශරාව.
3. අග්නිය.



ඌර්ධ්ව පාතන යන්ත්‍රය

1. අග්නිය.
2. පාරද
3. ජලය.



දෝලා යන්ත්‍රය.

1. අග්නිය. – 2. ජලය.
3. ඖෂධය.


ශ්‍රී රාමනාරායන යන්ත්‍රය
3
4
5
2
පාරද පිණ්ඩය
1
10
11
9
6
7
8

ශ්‍රී රාමනාරායන යන්ත්‍රය.

1. ගිනි දමන භාජනය
2. නලය (Bent Pipe)
3. } තෙත රෙදි එතූ
4. } සිසිල්
5. } ආවරණ නලය

6. ජලය
7. ජල පාත්‍රය
8. පාරද පතිත වන බෝතලය හා පාරද
9. ජල පාත්‍රය
10. වායුද්වාරය
11. අගනිය


ශ්‍රීමද් ගණනාථ රසාකර්ෂණ යන්ත්‍රය.
හිංගුල
ගිනිඋදුන
1
2
3
4

ශ්‍රීමත් ගණනාථ රසාකර්ෂණ යන්ත්‍රය

1. ලෞහ බෝතලය (ලෞහකූපි)
2. ලෞහමය වක්‍රනාලය
3. දිය බඳුන
4. රසදිය පතිත වන විදුරු, බෝතලය


වාසුදේව යන්ත්‍රය.
ජලය
පාරද පිණ්ඩය
1
2
3
4
5
6
7
8
9
10

වාසුදේව යන්ත්‍රය

1. අගනිය
2. ඌර්ධව පාත නලය
3. තිර්යක් පාත නලය
4. රබර්නාලිකාව
5. ජලය
6. 7. අධඃපතිත රසදිය
8. ජලය
9. ගල් අඟුරු දමන දෙර
10. වායුද්වාරය

සුරාසව වර්ග පහත සඳහන් ක්‍රම අනුව පිළියෙල වේ.

(අ) මැසරේෂන් :—

මෙම ක්‍රමය අනුව සුරාසව (ටිංචර) සාද ගැනීමට ගන්නා ඝන ද්‍රව්‍ය සහ ද්‍රාවකය (සොල්වන්ට්) භාජනයක දමා වසා දින 7 ක් එක් තැනක තබනු ලැබේ. මේ කාලය තුළ දී වරින් වර භාජනය සෙළවීමෙන් එහි අන්තර්ගත ද්‍රව්‍ය මිශ්‍ර කරයි. දින හතකට පසු ද්‍රාවකය ඝන ද්‍රව්‍යයෙන් පෙරා වෙන්කරනු ලැබේ. පෙරීමෙන් පසු ශෙෂ වන ඝන ද්‍රව්‍ය නැවත වරක් මිරිකා පෙරා ගැනීමෙන් ලැබෙන ස්‍රාවය ද මුලින් පෙරාගත් ද්‍රාවකය හා මිශ්‍රකරනු ලබයි. මෙම මිශ්‍රණය නිසි පරිදි පෙරා ගැනීමෙන් සුරාසවය සකස් කර ගනී.

(ආ) පර්කොලේෂන් :—

මෙම ක්‍රමයේ දී ඝන ද්‍රව්‍ය සුදුසු පරිදි චූර්ණකර ගත යුතුයි. එම චූර්ණිත ද්‍රව්‍යයන් ද්‍රාවකයෙන් නියමිත ප්‍රමාණයකට තෙමා භාජනයක බහා පැය හතරක කාලයක් වසා තැබිය යුතු යි. ඉන්පසු එම තෙත් වූ චූර්ණය එයින් ගෙන පර්කොලේටරයක අසුරා ඝන ද්‍රව ද්‍රවයක් සාදගන්නට අවශ්‍ය ප්‍රමාණ ද්‍රාවකය ද ඊට එක්කරනු ලබයි. පර්කොලේටරයෙන් ද්‍රව්‍ය කාන්දුවීම ආරම්භ වූ විට පර්කොලේටරයේ විවරය වසා ඝන ද්‍රව්‍ය වැසෙන සේ ද්‍රාවකයෙන් පුරවා පැය විසිහතරක කාලයක් පල්වීමට සළස්වන්න. අවශ්‍යවන ප්‍රමාණයෙන් 3/4 කොටසක් දක්වා පර්කොලේටරයෙන් ද්‍රව්‍ය කාන්දුවීමට ඉඩ හරින්න. අනතුරුව පර්කොලේටරයේ ශෙෂව ඇති මණ්ඩි ගෙන මිරිකා එහි අඩංගු ද්‍රවය ද ලබාගෙන කාන්දුවීමෙන් ලබාගත් ද්‍රවය සමඟ මිශ්‍ර කරන්න. මෙම මිශ්‍රණයට සුරාසව ලබාගැනීමට බලාපොරොත්තු වන ප්‍රමාණයට සමාන ද්‍රාවකයක් එක්කරන්න. පසුව එය පෙරාගැනීමෙන් නියමිත සුරාසවය ලබාගත හැක.

(ඇ) සිරප් (පැණි වර්ග) මෙවායේ සුක්රෝස් 66.7 ක් අඩංගුව ඇත.

ශර්කරා (සුක්රෝස්) ග්‍රෑම 66.7.

ග්‍රෑම් 1000 ක් නිපදවා ගැනීමට අවශ්‍ය ප්‍රමාණ පිරිසිදු කරන ලද ජලය මෙම දෙවගය මිශ්‍රකොට සුක්රෝස් සම්පූර්ණයෙන් දිය වන තෙක් උණුකර නැවත ග්‍රෑම් 1000 ක් සාද ගැනීමට අවශ්‍ය ප්‍රමාණ උතුරුවා පිරිසිදු කර ගත් ජලය එක් කරන්න.

තරලසාර :—තරල සාර යනු රළු ඖෂධවල ක්‍රියාකාරී කොටස් පමණක් අඩංගු වනසේ සාදගත් ද්‍රවය යි. මෙවා මැසරේෂන් සහ පර්කොලේෂන් යන ක්‍රම අනුව, ද්‍රාවක වශයෙන් ජලය මද්‍යසාරය හෝ ද්‍රාවක ඊතර් යොද ගැනීමෙන් පිළියෙල කෙරේ. එසේ සාදගත් පසුව එම ද්‍රවය සාන්ද්‍ර කරණු ලැබේ.

ද්‍රව සාරය :—ද්‍රවසාරයක ශක්තිය එහි ඝනත්වය අනුව එක කොටසක් රළු ඖෂධයේ බරින් එක කොටසකට සමාන ය. ඖෂධයේ ක්‍රියාකාරී කොටස ඉතා ශක්තිමත් වුව ද කළවම් කිරීමක් කළ හැකි වුව ද එහි ශක්තිය අනුව මිශ්‍ර කිරීමකින් දියාරු සමකතත්වයකට පිළියෙල කරගනු ලැබේ. මෙසේ කරන්නේ රළු ද්‍රව්‍යයේ අඩංගු වී තිබුණු ක්‍රියාකාරී පදර්ථ අඩුම ප්‍රමාණයක් ද්‍රව-සාරයේ අඩංගු වන ලෙසට ය.

වියළි තරලසාර :—(ඩරයි එක්ස්ට්‍රැක්ට්ස්)

සාමාන්‍යයෙන් වියළි තරලසාර සාදගන්නේ ද්‍රව පදර්ථ වාෂ්ප වීමෙන් ක්‍රියාකාරී කොටස් වියළි තත්ත්වයට යන සේ රත් කිරීමෙනි. මෙසේ රත්කරන්නේ අඩු පීඩනයක් ඇති පරිසරයක ය. එමෙන් ම ක්‍රියාකාරී කොටස් ඉතා ශක්තිමත් නම් වෙනත් නිෂ්ක්‍රිය ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් සමක තත්ත්වයක් ලැබෙන අයුරිනි.

ආමෝදිත දියර (ඇරොමැටික් වෝටර්ස්)

. සාන්ද්‍ර කරණ ලද ජලය එක් කොටසකට, කොටස් 39 ක් පිරිසිදු කරන ලද ජලය එක්කොට තනුක තත්ත්වයට සකස් කර ගන්න.

2. තෙල් එක් කොටසකට පිරිසිදු කරණ ලද ජලය කොටස් 500 ක් මිශ්‍රකර විනාඩි පහලොවක් හොඳින් සොළවන්න. පැය 12 ක කාලයක් හෝ මුළු රාත්‍රියක් එය එක තැනක තබා පෙරා ගන්න.

3. පිරිසිදු කරණ ලද ටැල්ක් හෝ කිසෙල්ගර් හෝ පල්ප් කරණ ලද පෙරහන් කඩදසි (පිල්ටර් පේපර්) අවශ්‍ය ප්‍රමාණයක් සහ පිරිසිදු කරන ලද වතුර කොටස් 500 ක් ගෙන තෙල ට්‍රයිට්‍රෙට් කරන්න. මෙසේ ලබාගන්නා ද්‍රව්‍ය පෙරාගන්න.

ආඩතෝඩා තරල සාරය :—

වියළි ආඩතෝඩ කොළ ගෙන මද්‍යසාර 60% ක් මිශ්‍රකර පර්කොලේට් කරන්න. මෙයින් එකට එකක් ඝන ද්‍රව්‍ය ලබාගත හැක. (1: 1)

වැල්මී තරලසාර:—

පොතු ඉවත් නො කළ වැල්මී දළ චූර්ණය ග්‍රෑම් 1000 යි. ක්ලෝරෆෝම් ද්‍රව සහ මද්‍යසාර අවශ්‍ය ප්‍රමාණයක් ගන්න.

ක්ලෝරෆෝම් ද්‍රවය සමග වැල්මී දළ චූර්ණය මිශ්‍රකර පර්කෝලේට් කර ලබාගත් ද්‍රවය විනාඩි පහක් හොඳින් උතුරුවා පැය දෙළහකට නො අඩු කාලයක් පසෙකින් තබන්න. ඉන්පසු පැදී ඇති ද්‍රව කොටස පෙරා වෙනත් භාජනයකට ගන්න. මෙසේ ලබාගත් ද්‍රව මිශ්‍රකර සිඳවන්න. සෙන්ටිග්‍රේඩ් අංශක 20 දී ද්‍රවයෙන් එක මිලි ලීටරයක බර ඩ්‍රෑම් 1,198 වන සේ සිඳවිය යුතුය. උනුකර ලබාගත් මෙම ද්‍රවය ශීතල වූවාට පසු එහි ඝන ප්‍රමාණයෙන් 1/4 ක් 90% මද්‍යසාරය එකතු කරන්න. පසුව එය සති 4 ක් පසෙක තබා පෙරා ගන්න.

කොත්තමල්ලි තරල සාරය :—කොත්තමල්ලි චූර්ණය සමග 70% මද්‍යසාර ය.

ඉරමුසු තරල සාරය :—20% මද්‍යසාරය සමඟ පර්කොලේට් කර නිශ්චිත ප්‍රමාණය ලබා ගැනීමේ දී 10% යේ ග්ලිසරින් එක් කරන්න

ඉඟුරු තරල සාරය :—තරමක් රළු ලෙස චූර්ණ කරගත් ඉඟුරු ග්‍රෑම් 500.90% වෙ මද්‍යසාරය මිලිලීටර් 1000 දක්වා පර්කොලේට්, ක්‍රමයට සාදගන්න.

සුදුලූනු යුෂ :—(බී.පී.සී)

සුදුලූනු ග්‍රෑම් 80 ක් තලා ස්වරස ගන්න. ඉන් ශේෂවන රොඩුවලට ජලය මිලිලීටර් 20 ක් එක්කර නැවත මිරිකා යුෂ ලබා ගන්න. ලබාගත් සම්පූර්ණ ස්වරස ප්‍රමාණය මිලි ලීටර් 80 ක් වන සේ මෙම ක්‍රමය නැවත නැවතත් කරන්න.

මෙම මිලිලීටර් 80 ට 90% මද්‍යසාර මිලිලීටර් 20 ක් එක්කර දින 14 ක් තබන්න. දින 14 ට පසු පෙරීමෙන් හෝ මතුපිට පැදෙන ජලය පෙරා ගැනීමෙන් හෝ අවශ්‍ය ද්‍රවය ලබාගත හැක.

TINCTURES ARE PREPARED BY THE FOLLOWING PROCESSES

(*a*) Maceration

In this case the solid material together with the whole of the Menstruum (solvent) is placed in a closed vessel and allowed to stand for 7 days. The solid material and the menstruum is subjected to occasional agitation. At the end of the 7 days the menstruum is strained the marc (solid materials) pressed and the liquids thus obtained mixed. The products is clarified by subsidence or filtration.

(*b*) Percolation

In this process the solid material in suitable powder form is moistened with sufficient quantity of the solvent and allowed to stand for 4 hours in a closed vessel. At the end of this period the moistened powder is packed in a percolater and sufficient menstruum added to saturate the material. When the liquid commences to drip from the percolator, close the outlet, add sufficient of the Menstruum to leave a layer above the drug and allow to macerate for twenty four hours. Allow percolation to proceed slowly until the percolate measures about 3/4 of the volume required for the finished tincture.

Press the marc, mix the expressed liquid with the percolate and add sufficient of the menstruum to produce the required volume, clarify by subsidence or filtration.

Syrups

Contains 66.7 w/w of sucrose.

Sucrose	66.7 gms.
Purified water sufficient to produce	1000 gms.

Heat together until dissolved and add sufficient boiling purified water to produce 1000 gms.

Extracts

Extracts are preparations containing the active principles of crude drugs. They are prepared by maceration or percolation with suitable solvents such as water, alcohol or solvent ether followed by concentration.

Liquid extracts

The strength of a liquid extract is such that 1 part by volume of the preparation is equivalent to 1 part by weight of the crude drug. If, however, the active principle is of a potent nature and permits of an assay, the liquid extrct is adjusted to a definite strength which usually represents the minimum content of active principle required in the Standard for the crude drug.

Dry extracts are usually produced by evaporating the extractive to dryness under reduced pressure and, if the active principle is of a potent nature, assaying and adjusting to a standard by dilution with an inert substance.

Aromatic Waters

1. Dilute the concentrate water with 39 times its volume of purified water.
2. Shake the oil with 500 times its volume of purified water several times during a period of about fifteen minutes, allow to stand for twelve hours or overnight, and filter.
3. Triturate oil with a sufficient quantity of purified Talc, Kieselguhr, or pulped filter paper and 500 times its volume of purified water and filter.

Liquid Extract of Adatoda

Take dried leaves of Adatoda and percolate with alcohol 60% to give a 1 in 1 solution.

Liquid Extract of Liquorice

Liquorice, unpeeled, in coarse powder 1000 g.
Chloroform water Alcohol (90%) of each a sufficient quantity.

Exhaust the liquorice with chloroform water by percolation. Boil the percolate for five minutes and set aside for not less than twelve hours. Decant the clear liquid, filter the remainder. Mix the two liquids, and evaporate until the weight per ml of the liquid, at 20° C is 1.198. Add to this liquid, when cold, one fourth of its volume of alcohol (90%). Allow to stand for not less than four weeks. filter.
Alcohol (90%).

Liquid Extract of Coriander

Extract powder with Alcohol 70%

Liquid Extract of Sarasparille

Percolate with alcohol 20% glycerine 10%) being added when adjusting to final volume.

Strong Ginger Tincture

Ginger in moderately coarse powder 500 g. Alcohol (90%). Sufficient to produce 1000 ml. Prepare by percolation.

Garlic Juice B.P.C.

Bruise garlic 80 g. and express the juice, mix the more with water 20 ml. and again express the liquid, repeat the operation until volume of the mixed juice and washings amount to 80 ml. add alcohol (90%) 20 ml. allow to stand for 14 days and decant or filter.

පාරද අෂ්ට සංස්කාර ප්‍රත්‍යක්ෂ විචාරණය

සංස්කාර නාමය	ප්‍රාරම්භ දිනය	යෙදූ පාරද ප්‍රමාණය	උපයුක්ත යන්ත්‍රය	උපයුක්ත ද්‍රව්‍ය	ක්‍රියා විධිය (ප්‍රක්‍රියා)	සංස්කාර ප්‍රතිඵලය	ලැබුන පාරද ප්‍රමාණය	විශේෂ කරුණු
1. ශෝධනය	11.7.66	කිලෝ 4 ග්‍රෑම්ස් 665	දෝලා යන්ත්‍රය	ග්‍රෑ. මි. ග්‍රෑ. අබ 291 060 සහිදලුණු 291 060 ඉඟුරු 291 060 ගම්මිරිස් 291 060 තිප්පිලි 291 060 රත්නිටුල් 291 060 අමුකහරු 291 060 රාබු අල 291 060	උපයුක්ත ද්‍රව්‍ය කාඩියෙන් ඉතා සිහිදුව අඹරා ගන්නේය. ඉන්පසු පලාශ පත්‍ර ගොටුවක් යාද සතරට නැමූ රෙදි කඩක් එලා ඊපිට කෙසෙල්දළුවක් එලා පළමු කල්කය ආලේපකොට එහි පාරද බහාලීය. එම පොට්ටනිය තදින් බැඳ ලෝහ දණ්ඩක මධ්‍යයෙහි එල්ලා දෝලා යන්ත්‍රයෙහි කාඩියෙන් දින තුනක් දිවා රාත්‍රි ශෝධනයකොට පසුව වස්ත්‍රය මර්දනය කොට රසදිය උණු දියෙන් හා උණු කාඩියෙන්සෝද වෙන් කර ගන්නේය. සංස්කාර කාලය :— දින 3 යි.	මලශෛථිල්‍යය	කිලෝ 4 ග්‍රෑ: 595	1. මදකින්නේ ශෝධනය කැරිණ 2. පාරද 070 ග්‍රෑ: හානිය. 3. එක් එක් ද්‍රව්‍යය පාරදයෙන් 1/16බැගිනි.
2. මර්දනය	15.7.66	කිලෝ 4 ග්‍රෑම්ස් 595	තප්ත බල්වය	ගුඩ දූවිලි මෙෂ ලෝම සහිද ලුණු වියත් දුඹුලු ගඩොල් කුඩු අබ	ගුඩ හැර අනික් ද්‍රව්‍ය සියුම් ලෙස චූර්ණ කර ඉන්පසු ගුඩ පාරද හා චූර්ණයතප්ත බල්වයෙහි කාඩියෙන් දින 3ක් අඹරන ලදී. පසුව උණුදිය හා උණු කාඩියෙන් සෝද වස්ත්‍රයෙන් මිරිකා පාරද වෙන් කර ගැණින. සංස්කාර කාලය :— දින 3 යි.	බහිර් මල විනාශනය	කිලෝ 4 ග්‍රෑ: 528	1. එක් එක් ද්‍රව්‍යය පාරදයෙන් 1/16 බැගිනි. 2. 067 ග්‍රෑ: හානිය.
3. මූර්ච්ඡනය	18.7.66	කිලෝ 4 ග්‍රෑම්ස් 528	බල්ව යන්ත්‍රය	කෝමාරිකා ස්වරස ත්‍රිඵලා චූර්ණය රත්නිටුල් චූර්ණය	ත්‍රිඵලා චූර්ණය හා රත්නිටුල් චූර්ණය පාරද සමග කෝමාරිකා ස්වරසයෙන් නෂ්ට පිෂ්ට වනතෙක් ඇඹිරිණ. සංස්කාර කාලය :— දින 3 යි.	දේෂ්‍ය විනාශනය	කල්කය සහිතව උත්ථාපනයට යෙදිනි.	1. එක් එක් ද්‍රව්‍යය පාරදයෙන් 1/16බැගිනි 2. කෝමාරිකා ස්වරසය අවශ්‍ය පමණට
4. උත්ථාපනය	21-22-23 7.66	මූර්ච්ඡනය කළ පාරද සහිත කල්කය	පාතන යන්ත්‍රය (කල්කය සහිත පාරද ස්ථාලියක් සඳහා)	උෂ්ණ ජලය උෂ්ණ කාංජික වස්ත්‍ර ඛණ්ඩ	මූර්ච්ඡිත කල්කය සහිත පාරද උණු දියෙන් හා උෂ්ණ කාංජිකයෙන් වස්ත්‍ර නිෂ්පීඩන සහිතව සෝද (පාරද) වෙන් කැරිණ. ඉතිරි කල්කය වෙලා පාතනය කිරීමෙන් පාරද වෙන් කැරිණ. සංස්කාර කාලය :— දින 3 යි.	මූර්ඡා ව්‍යාපත්ති නාශනය	කිලෝ 4 ග්‍රෑ: 520	1. පේදීමෙන් ලැබුණ පාරද කි.4 ග්‍රෑ:450 2. අර්ධක කල්කයෙන් සෝදලැබුණ ග්‍රෑ: 032 ඉතිරි කල්කය වෙලා සෝද පාතනය කර ගැනීමෙන් ලැබුණ ග්‍රෑ: 038– කි: 4 ග්‍රෑ: 520
5. පාතනය (1)	26.7.66	කිලෝ 4 ග්‍රෑම්ස් 520	පාතන යන්ත්‍රය	තාම්‍ර, ලවණ. (සෛන්ධව) දෙහි ඇඹුල්	පාරදයෙන් 1/3 ක් තඹ සුණු හා 1/20 ක් සහිදලුණු සමග (පාරද) අවශ්‍ය ප්‍රමාණ දෙහි ඇඹුල් සමග ඇඹිරිණි. දෙදිනක් 24, 25 ඇඹරීමෙන් වෙඬරු (නවනීත) වැනි පිණ්ඩයක් (Amalgam.) සැදිණ. 26.7.63 පාතනය කැරිණ. ඉන් පසු සෝද ගන්නා ලදී. සංස්කාර කාලය :— දින 1/2 යි.	නාග, වංග දෝෂ නාශනය	කිලෝ 4 ග්‍රෑ: 520	1. තඹ සුණු කිලෝ 1 ග්‍රෑ: 507 සහිදලුණු කිලෝ 0 ග්‍රෑ: 226. 2. පාතන ක්‍රියාව පැය 1 කින් සම්පූර්ණ විය.

පාතනය (2)	29.7.66	කිලෝ 4 ග්‍රෑම් 520	පාතන යන්ත්‍රය	තාම්‍ර (තඹපුණු) 1/3 සහිඳලුණු 1/20 දෙහිඇඹුල් අවශ්‍ය ප්‍රමාණ	ඉහත ශීර්ෂයේ පරිදි 26-27-28 දින තුනෙහි මර්දනය කොට පාරද පිෂ්ටය සැපයින. සංස්කාර කාලය :— පැය 2 යි.	නාග, වංග දෝෂ නාශනය	කිලෝ 4 ග්‍රෑ: 420	විදුරු බෝතලය (receiver සහ සම්බන්ධ) පුපුරා [illegible] නාලය නැති වීමෙන් පාරද ග්‍රෑම් 100 ක් හානි විම එම 100 ද්‍රව්‍ය සමග මිශ්‍රවිය. තුන්වැනි පාතනයේදී එය එකතු කැරිණ.
පාතනය (3)	1.8.66	කිලෝ 4 ග්‍රෑම් 420	පාතන යන්ත්‍රය	තාම්‍ර (තඹපුණු) 1/3 සහිද ලුණු 1/20 දෙහි ඇඹුල්	පෙර පරිදිය. 29.7.66 දින සිට 30.7.66 දින රාත්‍රිය තෙක් මර්දනය කැරිණි. 1.8.66 දින උදෑසන පාතනය කැරිණ. සංස්කාර කාලය :— පැය 5 යි.	නාග, වංග දෝෂ නාශනය.	කිලෝ 4 ග්‍රෑ: 430	මැටි, ද්‍රව්‍ය සමග මුසුවූ පාරද ග්‍රෑ 100 එක් කිරීම නිසා එයින් ග්‍රෑම් 10ක් එකතු වී ග්‍රෑ: 430 ලෙස විය. (2) මෙම පාතනයට රංචි නාරායන පාතන යන්ත්‍රය උපයෝගී කැරිණ.
6. රෝධනය (බොධන)	1.8.66	කිලෝ 4 ග්‍රෑම් 430	චීන මැටි ජාරය	සහිඳලුණු කිලෝ 1/2 යි. ජලය ප්‍රස්ථ 3 යි.	තෙවැනි පාතනයේ ලද පාරද උණු දියෙන් සෝද සහිඳලුණු ජලයෙහි (5 තීරයේ සඳහන්) දින 3 ක් අවුවේ තැබිණ. (අව්ව නැතිවිට 100⁰ මද ගින්නේ ලෝහ බඳුනෙක්හි ලා තැබිය යුතු ය.) සංස්කාර කාලය :— දින 3 යි.	ෂණ්ඪ භාවය නැතිවීම හා මහාමුඛ කරණය	කිලෝ 4 ග්‍රෑ: 430 කිලෝ 4 ග්‍රෑ: 430	රස ප්‍රමාණ හානියක් නොවිය. ලවණ, ජල ප්‍රමාණයන් හා භාජනය රසප්‍රකාශ ග්‍රන්ථයට අනුව ය
7. නියමනය	5.8.66	කිලෝ 4 ග්‍රෑම් 430	දෝලා යන්ත්‍රය	මුලත් සුදුලූණු තුඹකරවිල අල සියඹලා සහිඳලුණු කීකිරිඳිය	දින දෙකකට පෙර කල්කය ලෝහ බඳුනෙක්හි අඟල් 3/4 ක් ඝනව ලේප කර තබා 5.8.66 දින පාරද එහිලා, ඉතිරි කල්කය ඊපිට බහා සතරකට නමාගත් වස්ත්‍රයෙක්හි පොට්ටනිය බැඳ දෝලා යන්ත්‍රයෙහි දින 3 ක් කාඩියෙන් දිවාරාත්‍රී සෝද දිනි. සංස්කාර කාලය :— දින 3 යි.	චපලත්වය නැවතීම හා අග්නි මිත්‍රත්වය දනවීම	කිලෝ 4 ග්‍රෑ: 430	ප්‍රමාණයෙහි හානියක් නොවී ය
8. දීපනය	8.8.66	කිලෝ 4 ග්‍රෑම් 430	දෝලා යන්ත්‍රය	සිනක්කාරං කාසීස පුස්කර ගම්මිරිස් සහිඳලුණු අබ මුරුංගා පොතු	නියමනයෙහි සඳහන් අයුරු සෝදනය කැරිණ. සංස්කාර කාලය :— දින 3 යි.	ග්‍රාසාර්ථී තීවර්තව වේගකාරිත්ව ව්‍යාපිත්තව හා බුභුක්ෂතා	කිලෝ 4 ග්‍රෑ: 415	1. ද්‍රව්‍ය පාරදයෙන් 1/16 බැගිනි 2. ග්‍රෑ: 15 ක් හානි විය 3. 11.8.66 දින පිරිසුදු කොට අනුවාසනය සඳහා තැබිණ.
9. අනුවාසනය	11.8.66	කිලෝ 4 ග්‍රෑම් 415	චීන මැටි ජාරය	දෙහි ඇඹුල්	දීපනය කළ පාරද සුදුසු පමණ වූ දෙහි ඇඹුලෙහි ලා දින 3 ක් තැබිණ. සංස්කාර කාලය :— දින 3 යි.	මුඛකරණය	කිලෝ 4 ග්‍රෑ: 415	පාරද ප්‍රමාණයෙහි හානියක් නොවී ය

ප්‍රාරම්භ දිනය :—	11.7.66
අවසන් කළ දිනය :—	14.8.66
ප්‍රාරම්භ පාරද ප්‍රමාණය :—	කිලෝ 4 ග්‍රෑ: 685
අවසානයෙහි ලද ප්‍රමාණය :—	කිලෝ 4 ග්‍රෑ: 415
හානිය :—	කිලෝ 0 ග්‍රෑ: 250

ග්‍රන්ථ නිර්දේශය :— 1 — 8 රසහෘදය,
9 ආයුර්වේද ප්‍රකාශ

පරිවර්තනය:—වෛද්‍යාචාර්ය ඩී. එම්. ජයසිංහ මහතා

වෛද්‍ය වාසුදේව මූලශංකර් ද්විවේදි (රසාචාර්‍ය) ගේ අනුග්‍රහයෙනි.
ශ්‍රී ශර්මා ආයුර්වේද මන්දිර, දතියා (මධ්‍ය ප්‍රදේශ ඉන්දියා)

ආයුර්වේද ඖෂධ සංග්‍රහය

(ප්‍රථම පියවර පළමුවන කොටස)

විෂය හා යෝගනාම අනුක්‍රමණිකාව

පිටු අංකය

ආයුර්වේද ඖෂධ සංග්‍රහය හැඳින්වීම xi
එම ඉංග්‍රීසි පරිවර්තනය xvii
ආයුර්වේද ඖෂධ සංග්‍රහය - පෙරවදන xxiii
එම ඉංග්‍රීසි පරිවර්තනය xxx
ආයුර්වේද ඖෂධ සංග්‍රහ සම්පාදක මණ්ඩලය xxxvii
සහායක ග්‍රන්ථ xxxix
විෂයානුක්‍රමණිකාව xli
මානපරිභාෂා-වෛද්‍යකීය ව්‍යවහාරය සඳහා සම්මත ලංකා (මංචාඩී කලං) මාන චක්‍රය 1
දීපන – පාචනාදී වර්ගය (සංකේත පරිභාෂාව) 4
සංඛ්‍යා වාචක ද්‍රව්‍ය පරිභාෂාව 7
ප්‍රතිනිධි පරිභාෂාව 9
පඤ්චාශත් මහාකෂාය ද්‍රව්‍ය ගණය 13
ද්‍රව්‍ය ග්‍රහණ නිර්දේශය 26
භෛෂජ්‍ය කල්පනා පරිභාෂාව 30
සන්ධාන කල්පනා 37
ඇකුවා-ටින්ක්චර්ස්-ලික්විඩ් එක්ස්ට්‍රැක්ට් සහ ක්වාථ (අර්ක කල්පනා) 42
රස-උපරස ද්‍රව්‍ය ශොධන මාරණ විධිය 60
යොග සංග්‍රහය 76
ඖෂධ සංග්‍රහ ගත ද්‍රව්‍ය ලේඛනය 317
1963.10.13-අංක 13,796 ගැසට් පත්‍රයේ පළ වූ අරිෂ්ට ආසව ආදි සම්පාදිත සංයෝග ලේඛනය 325
ආනයනය කෙරෙන ආයුර්වේද, සිද්ධ, යුනානි, අමු හා පිළියෙල කළ ඖෂධ ලේඛනය 332
පරිශිෂ්ට සංග්‍රහය 336
යන්ත්‍ර ඛණ්ඩය 355
සුරාසව වර්ග පිළියෙල වන ක්‍රම (සිංහල හා ඉංග්‍රීසි) 359
පාරද අෂ්ට සංස්කාර ප්‍රත්‍යක්ෂ විවරණය 363
323

සප්ත ත්‍රිංශත් ද්‍රව්‍ය ගණය.

	යෝග නාමය	පිටු අංකය
1.	අඤ්ජනාදි ගණය	19
2.	අම්බෂ්ඨාදි ගණය	19
3.	අර්කාදි ගණය	19
4.	ආමලක්‍යාදි ගණය	19
5.	ආරග්වධාදි ගණය	19
6.	උත්පලාදි ගණය	19
7.	ඌෂකාදි ගණය	20
8.	එලාදි ගණය	20
9.	කාකෝල්‍යාදි ගණය	20
10.	කටුපස්මුල	23
11.	ගුඩුච්‍යාදි ගණය	20
12.	තණපස්මුල	20
13.	ත්‍රප්වාදි ගණය	20
14.	ත්‍රිකටු-ත්‍රියූෂණ	21
15.	ත්‍රිඵලා-තිපල්	21
16.	දසමුල්	21
17.	න්‍යග්‍රෝධාදි ගණය	21
18.	පටෝලාදි ගණය	21
19.	පරූෂකාදි ගණය	21
20.	පිප්පල්‍යාදි ගණය	21
21.	ප්‍රියංග්වාදි ගණය	22
22.	මහ පස්මුල්	22
23.	මුස්තකාදි ගණය	22
24.	ලාක්ෂාදි ගණය	22
25.	ලොද්ධරාදි ගණය	23
26.	වචාදි ගණය	23
27.	වරුණාදි ගණය	23
28.	වැල් පස්මුල	23
29.	විදරිගන්ධාදි ගණය	23
30.	විරතර්වාදි ගණය	24
31.	වෘහත්‍යාදි ගණය	24
32.	ශාරිවාදි ගණය	24
33.	ශ්‍යාමාදි ගණය	24
34,	සාලසාරාදි ගණය	24
35.	සුරසාදි ගණය	25
36.	සුළු පස්මුල	25
37.	හරිද්‍රාදි ගණය	25

ද්‍රව්‍ය ග්‍රහණ නිර්දේශය

1. ද්‍රව්‍ය ග්‍රහණ විධිය 26
2. ද්‍රව්‍ය මාන ක්‍රමය 27
3. යෝග ගුණහීනත්වය 28
4. ඖෂධ ප්‍රයෝග කාලය 29
5. ඖෂධ සංරක්ෂණ නියමය 29
6. චරක මතානුකූලව 29
7. වර්ජනීය ඖෂධ ග්‍රහණය 27

භෛෂජ්‍යකල්පනා පරීක්ෂාව

1. අවලේහ 35
2. කල්ක කෂාය 30
3. ක්ෂාර නිර්මාණය 33
4. ක්වාථ – ශෘත කෂාය 30
5. ක්ෂාර වෘක්ෂ–ඖෂධි 34
6. ගුටිකා 34
7. ඝෘත – තෛල කල්පය 35
8. චූර්ණය 33
9. තෛල මූර්ච්ඡා 36
10. ඵාණ්ඩ කෂාය 32
11. භාවනා 33
12. ස්වරස (කෂාය) 30
13. හිම – ශීත කෂාය 32

සන්ධාන කල්පනා

1. අරිෂ්ට 37
2. ආසව 37
3. වක්තව්‍යය 39

ඇකුවා–ටින්ක්චර්ස්–ලික්විඩ–එක්ස්ට්‍රැක්ට්ස් සහ ක්වාථ

ඖෂධ ද්‍රව්‍ය සාර ගණය.

1. අජමෝද ද්‍රවසාරය 42
2. කර්පූර සාරය 43
3. ත්වක් ද්‍රවසාරය 42
4. පුදිනා ද්‍රවසාරය 42
5. මිශ්‍රෙයා ද්‍රවසාරය 42
6. සුරා (මද්‍ය) ආසව 42

ඖෂධ සාර ගණය.

	යෝග නාමය	පිටු අංකය		යෝග නාමය	පිටු අංකය
1.	අජ්වාන් සාරය	45	8.	චිරතා සාරය	45
2.	අහිඵේන සාරය	44	9.	මාංසි සංයෝග සාරය	43
3.	ඒලා සාරසංයෝගය	44	10.	ලශුන සාරය	45
4.	කනක සාරය	45	11.	විෂතින්දුක සාරය	44
5.	කර්පූර සාරසංයෝගය	44	12.	ශුණ්ඨී සාරය	43
6.	කුෂ්ඨ සාරය	45	13.	හිංගු සාරය	43
7.	ගුග්ගුලු සාරය	45			

ඖෂධ තරල සාර ගණය.

1.	අජමෝදා තරල සාරය	51	17.	පර්පටක තරලසාරය	47
2.	අර්කමූල සාරය	48	18.	පුනර්නවා තරලසාරය	50
3.	අර්ජුන තරලසාරය	49	19.	බිල්ව තරලසාරය	48
4.	අශ්වගන්ධා තරලසාරය	51	20.	බ්‍රාහ්මී තරලසාරය	50
5.	අශෝක තරලසාරය	51	21.	භූනිම්බ තරලසාරය	47
6.	කණ්ටකාරි තරලසාරය	49	22.	මඤ්ජිෂ්ඨා තරලසාරය	48
7.	කිරාතතික්ත තරලසාරය	47	23.	යෂ්ටිමධු තරලසාරය	45
8.	කුටජ තරලසාරය	48	24.	ලොධ්‍ර තරලසාරය	48
9.	කුෂ්ට තරලසාරය	50	25.	වාසක තරලසාරය	49
10.	ගුඩුචි තරලසාරය	46	26.	විඩංග තරලසාරය	50
11.	ගොක්ෂුර තරලසාරය	49	27.	වෙනිවැල් තරලසාරය	48
12.	තුලසි තරලසාරය	47	28.	ශතාවරි තරලසාරය	51
13.	දශමූල තරලසාරය	49	29.	ශාරිබා තරලසාරය	48
14.	ධන්වයාස තරලසාරය	47	30.	සප්තපර්ණි තරලසාරය	46
15.	ධාන්‍යක තරලසාරය	46	31.	සර්පගන්ධා තරලසාරය	50
16.	නිම්බත්වක් තරලසාරය	48	32.	ස්වර්ණපත්‍රී තරලසාරය	46

ක්වාථ සංස්කරණ

1.	ක්වාථ කල්පනා	51	2.	දසමූල ක්වාථය	51

ක්වාථ තරලසාර

1.	මහාරාස්නාදි ක්වාථ තරලසාරය	52	2.	මහාමඤ්ජිෂ්ඨාදි ක්වාථ තරලසාරය	52

1.	අමෘතෝශිරාදි තරලසාර ක්වාථය	53	21.	පටෝලකටුකාදි තරලසාර ක්වාථය	54
2.	අභයාකණාදි තරලසාර ක්වාථය	54	22.	පංචමූලිලඝුද්‍රාක්ෂාදි තරලසාර ක්වාථය	56
3.	ඒරණ්ඩක සප්තක තරලසාර ක්වාථය	54	23.	පිප්පල්‍යාදි තරලසාර ක්වාථය	56
4.	කඵහර තරලසාර ක්වාථය	55	24.	පුනර්නවාෂ්ටක තරලසාර ක්වාථය	54
5.	කාලශාකාභයාදි තරලසාර ක්වාථය	53	25.	ප්‍රාණදජමොදවිශ්වාදි තරලසාර ක්වාථය	53
6.	ක්ෂුද්‍රාමෘතාදි තරලසාර ක්වාථය	53	26.	බලාබිල්ව ශුණ්ඨී තරලසාර ක්වාථය	54
7.	ගුඩුච්‍යාදි තරලසාර ක්වාථය	55	27.	බාකුචි තරලසාර ක්වාථය	55
8.	චිරබිල්ව පුනර්නවාදි තරලසාර ක්වාථය	53	28.	බිල්ව ඉන්ද්‍රායවාදි තරලසාර ක්වාථය	55
9.	තාමලක්‍යාදි තරලසාර ක්වාථය	56	29.	බෘහත්‍යාදිගණ තරලසාර ක්වාථය	56
10.	ත්‍රිකටුකාදි තරලසාර ක්වාථය	55	30.	මහාරාස්නාදි තරලසාර ක්වාථය	55
11.	තිකුළු හිංග්වාදි තරලසාර ක්වාථය	56	31.	මංජිෂ්ඨාදි තරලසාර ක්වාථය	54
12.	ත්‍රිවෘත්ද්‍රාක්ෂාභයාදි තරලසාර ක්වාථය	53	32.	මුස්තාබුකර්ණ්‍යාදි තරලසාර ක්වාථය	54
13.	දන්තිමූලබලාදි තරලසාර ක්වාථය	54	33.	මූර්වාදි තරලසාර ක්වාථය	55
14.	දශමූලබලාරාස්නා තරලසාර ක්වාථය	54	34.	යක්ෂාක්ෂ්‍යාදි තරලසාර ක්වාථය	56
15.	දර්ව්‍යාදි තරලසාර ක්වාථය	56	35.	රාස්නාපංචක තරලසාර ක්වාථය	54
16.	දරුපර්පටාදි තරලසාර ක්වාථය	53	36.	රාස්නාදි තරලසාර ක්වාථය	55
17.	දෙහිඹාදි තරලසාර ක්වාථය	55	37.	ශතාවරිගොපකන්‍යාදි තරලසාර ක්වාථය	53
18.	දෙවදර්ව්‍යාදි තරලසාර ක්වාථය	55	38.	ශඨ්‍යාදි තරලසාර ක්වාථය	56
19.	ධාන්‍යපංචක තරලසාර ක්වාථය	53	39.	ශුණ්ඨිදර්ව්‍යාදි තරලසාර ක්වාථය	56
20.	නිදිග්ධිකාදි තරලසාර ක්වාථය	53	40.	සප්තපර්ණ්‍යාදි තරලසාර ක්වාථය	56

(1) රස උපරස ද්‍රව්‍ය ශොධන මාරණ විධිය.

	යෝග නාමය	පිටු අංකය		යෝග නාමය	පිටු අංකය
1.	උත්ථාපන සංස්කරණය	61	6.	මර්දන සංස්කරණය	60
2.	කාංජිකය	62	7.	මූර්ච්ඡන සංස්කරණය	60
3.	දීපන සංස්කරණය	61	8.	රෝධන බෝධන සංස්කරණය	61
4.	නියමන සංස්කරණය	61	9.	පක්ෂච්ඡය	62
5.	පාතන සංස්කරණය	61	10.	ස්වේදන සංස්කරණය	60

(2) රස උපරස ශොධන මාරණ විධිය.

1.	මාරණ විධිය	63	2.	සාධාරණ විධිය	63

උපරස ශෝධන මාරණ - විධිය

1.	අභ්‍රක - තලාතු මිනිරන්	65	13.	රජත මාක්ෂික ශොධනය	67
2.	අංජන	67	14.	රිදී තුත්ථං	68
3.	කාන්ත පාෂාණ	67	15.	වජ්‍ර (දියමන්ති)	65
4.	කාශිස	67	16.	වජ්‍ර භස්ම	65
5.	ඛර්පර	66	17.	වරාටිකා	67
6.	ගන්ධක	65	18.	වෛක්‍රාන්ත	65
7.	ගෛරික	68	19.	ශංඛ	68
8.	ගෞරි පාෂාණ	68	20.	ශිලාජතු	68
9.	චපල	67	21.	ස්ඵටිකා	68
10.	ටංගණ	68	22.	ස්වර්ණ මාක්ෂික	67
11.	තුත්ථක	66	23.	හරිතාල	66
12.	මනඃශිලා	66	24.	හිංගුල	66

ධාතු - උපධාතු ශෝධන මාරණ විධිය.

1.	කාංසය	71	12.	යශද	70
2.	ගල්මද ගල් නහර	72	13.	රජත	69
3.	තාම්‍ර	69	14.	රස පරිභාෂා	73
4.	නව සාදර	72	15.	(I) ලවණ ශුද්ධිය	72
				(II) සහිද ලුණු ශුද්ධිය	72
5.	පිත්තල	71	16.	ලෞහ	70
6.	ප්‍රවාල	71	17.	වංග	70
7.	මණ්ඩූර	71	18.	ශුක්ති	72
8.	මාණික්‍ය	71	19.	සමුද්‍ර ඵේන	72
9.	මුක්තා	71	20.	සීසක	70
10.	මෘග ශෘංග	71	21.	සෞරක	72
11.	මෘද්දර ශෘංග	71	22.	ස්වර්ණ	69

විෂ - උපවිෂ ශෝධනය.

1.	අහිඵේන	75	8.	භල්ලාතක	74
2.	කංසා	74	9.	වත්සනාභ	74
3.	ගුග්ගුලු	75	10.	විෂතින්දුක	74
4.	ගුංජා	75	11.	වෘද්ධදරක	75
5.	චිත්‍රක	75	12.	ස්නුහික්ෂීර	75
6.	ජයපාල බීජ	74	13.	හිංගු	75
7.	ධුස්තූර බීජ	74			

ස්වරස අනුපාන මණ්ඩය

1.	ඇහැළදළු අනුපානය	78	5.	කුම්බුරුදළු අනුපානය	78
2.	උක්පැණි අනුපානය	76	6.	කුවෙර ලඳුනාදී අනුපානය	76
3.	එරබුදළු, නිකදළු අනුපානය	77	7.	කොහොඹ, රතිත් අනුපානය	76
4.	ඔලිද ආදී දළු අනුපානය	77	8.	කොහොඹ දළු අනුපානය	77

රස ඛණ්ඩය

යෝග නාමය — පිටු අංකය

1. අග්නි කුමාර රසය 166
2. අග්නිතුණ්ඩි රසය 166
3. අග්නි රසය 166
4. අර්ශස්කුඨාර රසය 167
5. ආනන්ද භෛරව රසය (1) 167
6. ආනන්ද භෛරවය (2) 167
7. ආනන්ද භෛරවය (3) 167
8. ආරොග්‍යවර්ධනි වටිය 168
9. ඉච්ඡාභේදි රසය 168
10. ඉන්ද්‍ර වටිය 168
11. උන්මාද ගජාංකුශය 168
12. කනකසුන්දර රසය 169
13. කන්දර්ප රසය 169
14. කඵකෙතු රසය (1) 169
15. කඵකෙතු රසය (2) 169
16. කර්පූර රසය 170
17. කස්තූරිභෛරව රසය 170
18. කාඤ්චනාභ්‍ර රසය 170
19. කීටමර්ද රසය 170
20. කීටාරි රසය 171
21. කුමාර කල්‍යාණක රසය 171
22. කුෂ්ඨඝ්නි වටිකාව 171
23. ක්‍රිමිකාලානල රසය 171
24. ක්‍රිමිඝ්න රසය 171
25. ක්‍රිමිනාශක රසය 172
26. ක්‍රිමිමුද්ගර රසය 172
27. (කෘෂ්ණ) චතුර්මුඛ රසය 172
28. ගගන සුන්දර රසය 173
29. චන්ද්‍රප්‍රභා වටි (1) 173
30. චන්ද්‍රප්‍රභා වටි (2) 173
31. චතුර්භුජ රසය 174
32. චන්ද්‍රාමෘත වටිය 174
33. චන්ද්‍රාමෘත රසය 174
34. චින්තාමණි රසය 175
35. ජයමංගල රසය 175
36. ජලොදරාරි රසය 175
37. ජ්වරමුරාරි රසය 176
38. ජ්වරකේශරිකා රසය 176
39. තාලකේශ්වර රසය (1) 176
40. තාලකේශ්වර රසය (2) 176
41. ත්‍රිභුවන කීර්ති රසය 176
42. නිත්‍යානන්ද රසය 177
43. නිද්‍රොදය වටි 177
44. පුෂ්පධන්වා රසය 177
45. පියුෂවල්ලි රසය 178
46. පූර්ණචන්ද්‍ර රසය, වෘහත් 178
47. ප්‍රලාපාන්තක රසය 179
48. බාලරෝගාන්තක රසය 179
49. මහාභ්‍රවටිකාව 179
50. මහා මෘගාංක රසය 179
51. මහා ශංඛවටි රසය 180
52. මාණික්‍ය රසය 180
53. මේහවජ්‍ර රසය 180
54. රත්නගර්භපොට්ටලි රසය 181
55. රාමබාණ රසය 181
56. රාජ මෘගාංක රසය 181
57. ලක්ෂ්මිවිලාශය (1) 182
58. ලක්ෂ්මිවිලාශය (2) (නාරදීය) 182
59. ලසවානන්ද රසය 182
60. ලොකනාථ රසය 183
61. වසන්ත මාලතී රසය 183
62. වසන්ත කුසුමාකර රසය (1) (2) 183
63. වංගාෂ්ටකය 184
64. වාතකුලාන්තක රසය 184
65. වාතාරි රසය 184
66. වාතගජේන්ද්‍රසිංහ රසය 184
67. වාතගජාංකුශ රසය 185
68. වාතනාගාංකුශය 185
69. විද්‍යාධරාභ්‍ර රසය 186
70. වෘහත් කනකසුන්දර රසය 186
71. වෘහත් කස්තූරිභෛරව රසය 186
72. වෘහත් සෝමනාථ රසය 187
73. වෘහත් කාඤ්චනාභ්‍ර රසය 187
74. වේද්‍යාන්තක රසය 187
75. වෛශ්වානර වටිය 187
76. ශංඛපුෂ්පාදි රසය 188
77. ශ්වාසකුඨාර රසය 188
78. ශම්බුනාථ රසය 188
79. ශෘංගාරාභ්‍ර රසය 189
80. ශූලහරණ වටි 189
81. ශ්‍රී ජයමංගල රසය 189
82. ශ්‍රීමත් ජයතිලක රසය 190
83. ශ්‍රී මෘත්‍යුඤ්ජය රසය 190
84. ශ්ලෙෂ්මශෛලෙන්ද්‍ර රසය 190
85. ස්වර්ණවංගපඤ්චක රසායනය 191
86. සර්වතොභද්‍ර රසය 191
87. සර්වතොභද්‍ර වටිය 191
88. සර්වාංග සුන්දර රසය 192
89. සිද්ධ ප්‍රාණෙශ්වර රසය 192
90. සෞභාග්‍ය වටිය 192
91. සොමෙශ්වර රසය 193
92. හිඞ්ගුලෙශ්වර රසය 193
93. හෘදයාර්ණව රසය 199

15 අවලෙහ ඛණ්ඩය

1. අෂ්ටාඞ්ගාව ලේහය 194
2. කණ්ටකායඝාව ලේහය 194
3. කල්‍යාණක ලේහය 194
4. කුටජාව ලේහය 195
5. කුෂ්මාණ්ඩාව ලේහය 195
6. ච්‍යවන ප්‍රාශය 195
7. රක්ත කල්‍යාණාව ලේහය 196
8. ශ්වාසාරි ලේහය 197
9. ශොථහර ලේහය (ඉන්චි කුලම්බුව) 197
10. වාසාවලේහය, 11. වෘහත් වාසාවලේහය 197

16 ආසව බණ්ඩය

යෝග නාමය — පිටු අංකය

1. අංගුරාසවය (1) (2) 198
2. අයස්කෘතිය 200
3. අරවින්දාසවය 200
4. අහිඵේනාසවය 200
5. උශීරාසවය 201
6. කනකාසවය 201
7. කර්පූරාසවය 201
8. කුමාර්‍යාසවය 202
9. ඛර්ජූරාසවය 203
10. චන්දනාසවය 203
11. චවිකාසවය 203
12. ජම්බවාසවය 204
13. ත්‍රිඵලාසවය 204
14. ද්‍රාක්ෂාසවය 204
15. පත්‍රාංගාසවය 205
16. පිප්පල්‍යාද්‍යාසවය 205
17. පුනර්නවාසවය 206
18. මධූකාසවය 206
19. මෘගමදාසවය 206
19. මෘගමදාසවය 206
20. ලෝධ්‍රාසවය (ඛධවාසවය) 207
21. ලෝහාසවය 207
22. වාසකාසවය 208
23. සෝමරාජ්‍යාසවය 208
24. ශාරිවාද්‍යාසවය 208
25. ශ්‍රීඛණ්ඩාසවය 209

17 අරිෂ්ට බණ්ඩය

1. අභයාරිෂ්ටය (1) 210
2. අභයාරිෂ්ටය (2) 210
3. අමෘතාරිෂ්ටය 211
4. අශ්වගන්ධාරිෂ්ටය 211
5. අශෝකාරිෂ්ටය 212
6. කනකාරිෂ්ටය 212
7. කිරාතාදි අරිෂ්ටය 213
8. කුටජාද්‍යාරිෂ්ටය 214
9. ඛදිරාරිෂ්ටය 214
10. ඛර්ජූරාරිෂ්ටය 214
11. ජීරකාද්‍යාරිෂ්ටය 215
12. තක්‍රාරිෂ්ටය (1) 215
13. තක්‍රාරිෂ්ටය (2) 215
14. දන්ත්‍යරිෂ්ටය 216
15. දශමූලාරිෂ්ටය 216
16. දේවදාර්වරිෂ්ටය 217
17. ද්‍රාක්ෂාරිෂ්ටය 217
18. ධාත්‍ර්‍යරිෂ්ටය 218
19. නිම්බාරිෂ්ටය (1) 218
20. නිම්බාරිෂ්ටය (2) 218
21. පාර්පටාද්‍යාරිෂ්ටය 218
22. පාර්ථාද්‍යාරිෂ්ටය (අර්ජුනාරිෂ්ටය) 219
23. පුනර්නවාද්‍යරිෂ්ටය 219
24. ප්‍රසාරිණී සන්ධානය 219
25. බබ්බුලාරිෂ්ටය 219
26. බලාරිෂ්ටය 220
27. මුස්තකාරිෂ්ටය 220
28. මෘතසංජීවනී සුරාව 220
29. රෝහිතකාරිෂ්ටය (1) 221
30. රෝහිතකාරිෂ්ටය (2) 221
31. වාසකාරිෂ්ටය 221
32. ලවංගාසවය 222
33. විඩංගාරිෂ්ටය 222
34. ශිරීෂාරිෂ්ටය 222
35. සාරස්වතාරිෂ්ටය 222

දේශීය බස්න බණ්ඩය

1. පුහුල් බස්නය 223
2. රා බස්නය 223
3. එළපිකුදු බස්නය 223
4. තෝර බස්නය 224
5. හා බස්නය 224

තෛල බණ්ඩය

1. අණු තෛලය 225
2. අම්බාදි තෛලය 225
3. අමුක්කු තෛලය 225
4. අර්ක තෛලය 226
5. අර්ශස් තෛලය 226
6. අශ්වගන්ධා තෛලය (1) 226
7. අශ්වගන්ධා තෛලය (2) 227
8. අශ්වගන්ධා තෛලය (3) 227
9. ඉරිමේදදි තෛලය 227
10. උශීරාදි තෛලය (1) (2) 227, 228
11. කනක තෛලය 228
12. කාර්පාසාදි තෛලය 229
51. පිණ්ඩ තෛලය (1) (2) (3) 243
52. පිණ්ඩ තෛලය (4) 243
53. පිළිස්සුම් තෛලය 244
54. බටු තෙල 244
55. බලා කෝරණ්ඩ තෛලය (මහා) 244
56. බුද්ධරාජ තෛලය 245
57. බෝධිසත්ව තෛලය 245
58. භානුපාක කුෂ්ඨ තෛලය 246
59. භෘංගරාජ තෛලය 246
60. මංජිෂ්ඨාදි තෛලය 247
61. මහා කොරණ්ඩ තෛලය 247
62. මහා නාරායණ තෛලය 247

	යෝග නාමය	පිටු අංකය
13.	කාසිසාදි තෛලය (1) (2)	229
14.	කැඩුම් බිඳුම් තෙල	229
15.	කුංකුමාදි තෛලය	230
16.	කුබ්ජප්‍රසාරණ තෛලය	230
17.	කුමාරි තෛලය	230
18.	කෙණ්ඩා පෙරලුම් තෛලය	231
19.	කෝලශ්ලේෂ්මා තෛලය	231
20.	ගරුඩ රාජ තෛලය	231
21.	ගුග්ගුලාදි තෛලය	232
22.	ගුඩූච්‍යාදි තෛලය	232
23.	ගුරුළු රාජ තෛලය	232
24.	ග්‍රහණී චන්ද්‍රකාන්ති තෛලය	232
25.	චන්ද්‍රකාන්ති තෛලය	233
26.	චිත්‍රකරඤ්ජ තෛලය	234
27.	ජාත්‍යාදි තෛලය	234
28.	තෝරවතුරෙ තෙල	234
29.	ත්‍රිඵලා තෛලය	234
30.	දශපාක අණු තෛලය	234
31.	දශපාක බලා තෛලය	235
32.	දශබලා තෛලය	235
33.	දශමූල තෛලය (1) (2)	235
34.	දශවග ප්‍රමේහ තෛලය	236
35.	දිව්‍යනාග තෛලය	236
36.	දිව්‍යාංගනාදි තෛලය	237
37.	දූර්වාදි තෛලය	237
38.	නයනකේතකී තෛලය	237
39.	නයනාභරණ තෛලය	237
40.	නවපටල තෛලය	238
41.	නාරායණ තෛලය	239
42.	නාරායණ තෛලය (මහා)	239
43.	නිම්බාදි තෛලය	240
44.	නිර්ගුණ්ඩ්‍යාදි තෛලය	240
45.	නිශාදි තෛලය	240
46.	නීල්‍යාදිය	241
47.	නීලරාජ තෛලය	241
48.	නෙත්‍රපටලකාන්තිරත්න තෛලය	242
49.	පක්ෂාඝාතවායුසූත්‍ය තෛලය	242
50.	පසතුරුතෛලය	243

	යෝග නාමය	පිටු අංකය
63.	මහා බලා තෛලය	249
64.	මහා වාතමේඝ තෛලය	249
65.	මහා මාෂ තෛලය	250
66.	මහා වායු රාක්ෂස තෛලය	251
67.	මහා විකාර තෛලය	251
68.	මාෂ තෛලය	252
69.	යම දේවරාජ තෛලය	252
70.	රත්පිත් කේතකී තෛලය	252
71.	රත තෛලය	253
72.	රතිකාමරත්න තෛලය	253
73.	රතුදූනු තෙල (පීනස් තෙල)	254
74.	ලඝුතෛරණ්ඩ තෛලය	254
75.	ලෝකනාථ තෛලය	254
76.	ලුණුකඩවැල්ලේ පීනස් තෛලය	255
77.	වජ්‍රකන්ද තෛලය	255
78.	වාත තෛලය	255
79.	වාත රාක්ෂස තෛලය	256
80.	වාත (වරණ) විදූරංගාදි තෛලය	257
81.	විෂ්ණු තෛලය	257
82.	විෂගර්භ තෛලය	257
83.	විෂසනශීලි තෛලය	258
84.	විෂහරනාදි තෛලය	258
85.	විසර්පහර තෛලය	259
86.	වෘහත් සෛන්ධවාදි තෛලය	259
87.	ශ්වාසවජ්‍ර තෛලය	259
88.	ශ්විත්‍රහර තෛලය	260
89.	ශුද්ධබලා තෛලය	260
90.	ශුෂ්ක මූලකාදි තෛලය	260
91.	ෂඩ්බින්දු තෛලය	261
92.	සත්තවාදි තෛලය	261
93.	සර්වවිෂාදි තෛලය	261
94.	සිද්ධාර්ථ තෛලය 1	262
95.	සිද්ධාර්ථ තෛලය 2	263
96.	සීතොදක තෛලය	263
97.	සෛන්ධවාදි තෛලය	263
98.	සෝමරාජි තෛලය	264
99.	හිංගුත්‍රිගුණ තෛලය	264
100.	හිමසාගර තෛලය	264

ඝෘත බණ්ඩය

1.	අමෘතප්‍රාශ ඝෘතය	265
2.	අර්ජුන ඝෘතය	265
3.	අශ්වගන්ධා ඝෘතය	265
4.	අශෝක ඝෘතය	265
5.	ඉන්ද්‍රකාන්ත ඝෘතය	266
6.	කල්‍යාණක ඝෘතය	266
7.	කාමදේව ඝෘතය	267
8.	කුමාර කල්‍යාණ ඝෘතය	267
9.	වච්‍යාදි ඝෘතය	267
10.	චාංගේරි ඝෘතය	268
11.	ජාගලාදි ඝෘතය (1) (2)	268
12.	ජාත්‍යාදි ඝෘතය	269
13.	දශමූල ෂට්පල ඝෘතය	269
14.	පංචගව්‍ය ඝෘතය (වෘහත්)	269
15.	පංචතික්ත ඝෘතය	270
16.	පංචතික්ත ඝෘත ගුල්ලුව	270
17.	ඵල ඝෘතය	271
18.	ඵලකල්‍යාණ ඝෘතය	271
19.	බලාදි ඝෘතය	271
20.	බ්‍රාහ්මී ඝෘතය (සාරස්වත ඝෘතය)	272
21.	මහා චෛතස ඝෘතය	272
22.	මහා තික්තක ඝෘතය	272
23.	වෘහත් අශ්වගන්ධාදි ඝෘතය	273
24.	වෘහත් ජාගලාදි ඝෘතය	273
25.	සිද්ධාර්ථක ඝෘතය	274
26.	ශාතාවරී ඝෘතය	274

ආලේප ඛණ්ඩය

	යෝග නාමය	පිටු අංකය		යෝග නාමය	පිටු අංකය
1.	අනෝදකොළ ආලේපය	275	12.	රක්ත චන්දනාදි ලේපය	277
2.	කජ්ජලිකෝදය මලහර	275	13.	රණවරාදි ලේපය	277
3.	තිලාදි ලේපය (1) (2)	275	14.	රසපුෂ්පාද්‍ය මලහර	277
4.	දශාංග ලේපය	275	15.	ලාක්ෂාදි ලේපය	277
5.	දරුහෛමවතී ලේපය	275	16.	ලොධ්‍රාදි ලේපය	277
6.	දෙෂඝන ලේපය	276	17.	රසොත්තමාදි ලේපය	277
7.	ධුස්තුරාදි ලේපය (ශ්ලීපදයෙහි) (1) (2)	276	18.	වියන් දුඹුලු ආදි ලේපය	277
8.	පුනර්ණවාදරු ශුණ්ඨි ලේපය (2)	276	19.	(1) ශ්විත්‍ර ලේපය (තාලකාදි ලේපය)	278
9.	එල වර්ති (1) (2)	276	20.	ශ්විත්‍රහර ලේප	278
10.	මකුළු ඇට ආදි ආලේපය	276	21.	(2) ශ්විත්‍ර ලේපය	278
11.	මුරුංගාදි ලේපය	276	22.	සික්ථ තෛලය	278

නේත්‍ර බිංදු

1.	නෙත්‍ර බිංදු (1)	278	4.	නෙත්‍ර බිංදු (4)	279
2.	නෙත්‍ර බිංදු (2)	278	5.	නෙත්‍ර බිංදු (5)	279
3.	නෙත්‍ර බිංදු (3)	278			

013726
GWAIL